සිංහල සන්න සහිත

# පාලි ත්‍රිපිටක ධර්මය.

රාජකීය ආසියාතික සමාගමේ සාමාජිකාවූ ඩබ්ලිව්, ආර්තර් ද සිල්වා
සමාදෘත විනිශ්චයකාර මැතිතුමාගේ අනුමැතියපිට
සකස්කරණලදී.

සමස්ත ලංකා
බෞද්ධ මහා සම්මේ
380, බෞද්ධාලෝක මා
කොළඹ 7.

## 2. කාණ්ඩය.

දීඝනිකායේ මහාවග්ගය.

ඩබ්ලිව්. ඒ. සමරසේකර මහතා විසින් භාවසන්නලියා
සංශොධනයකරණලදි.

ඩබ්ලිව්, ස්ටිවන් ද සිල්වා මහතාවිසින්
කොළඹ සිහලසමය යන්ත්‍රාලයේ
මුද්‍රාපිතයි.

2448.

# Buddhist Pali Texts.

*With a translation into Sinhalese.*

EDITED UNDER THE DIRECTION OF

**W. ARTHUR DE SILVA, J. P.**

*Member, Royal Asiatic Society, Ceylon Branch.*
*President, Provincial Committee, Buddhist Temporalities, Colombo.*

# Vol. 2.—DIGHA NIKAYA,

සමස්ත ලංකා
බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත
කොළඹ 7.

SINGHALESE TRANSLATION
BY
W. A. SAMARASEKERA.

PUBLISHED BY
W. STEPHEN DE SILVA
SIHALA SAMAYA PRESS
COLOMBO.

LUZAC & CO.,
GREAT RUSSEL STREET
LONDON.

2448 A. B. 1905

# Buddhist Pali Texts.

---

*With a translation into Sinhalese.*

The following well-known Buddhist Scholars in Ceylon render valuable help in the preparation of this work:—

The Very Rev: Hikkaduwe Sri Sumangala Nayaka Thero, *Principal Vidyodaya Oriental College, Maligakanda, Colombo.*

The Very Rev: Weligama Sri Sumangala Nayaka Thero, *Pulinatalarama, Kalutara.*

The Very Rev: Waskaduwe Subhti Nayaka Thero, *Waskaduwa.*

The Very Rev: Ratmalane Dharmakirti Sri Dharmarama Nayaka Thero, *Principal Vidyalankara Oriental College, Peliyagoda.*

The Very Rev: Piyaratana Tissabhidhana Nayaka Thero, *Dodanduwa.*

Pundit M. Dharmaratne Esq, *Editor Vissuddhimarga &c, Colombo.*

E. R. Gunaratne Esq, J. P. Mudliar, *Local Secretary London Pali Text Society—Galle.*

No. 20

සිංහල සන්නසඟිත

# පාලි ත්‍රිපිටක ධර්මය.

දීඝනිකාය.

## 2. කාණ්ඩය.

මේ භාවසන්නසහිත ත්‍රිපිටකධර්මය සම්බන්ධ ගුඪිපත්‍රාදියසම්පාදනයකිරීමසඳහා උපකාරකරණුපිණිස අපගේ ආරාධනාව පිළිගෙණ ඊට කැමැත්තදුන් උතුමන්ගේ නාමලේඛනය මෙහි පහත දක්වනුලැබේ.

කොළඹ මාලිගාකන්දේ විද්‍යොදය පරිවෙණාධිපති ත්‍රිපිටක
වාගීශ්වරාචාර්ය සිප්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන
නායකස්ථවිරපාදයන්වහන්සේ.

---

පෑලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති රත්මලානේ
ධ ර්ම කී ර්ති ශ්‍රී ධ ර්මා රා මා භි ධා න
නායකස්ථවිරපාදයන්වහන්සේ.

---

කළුතර පුලිනතලාරාමාධිපති ශාසනවංශාලඞ්කාර කවිධජ
විනයාචාර්ය වැලිගම ශ්‍රී සුමඞ්ගලාභිධාන
නායකස්ථවිරපාදයන්වහන්සේ.

---

වස්කඩුවේ අභිනවාරාමාධිපති පවරනෙරුත්තිකාචරිය
මහාවිහාරී රාජගුරු වස්කඩුවේ සුභූති
නායකස්ථවිරපාදයන්වහන්සේ.

---

දෙඩන්දූවේ ශෛලබිම්බාරාමාධිපති අරියවංශාලඞ්කාර
ශාසනධජ විනයාචාර්ය පියරතනතිස්සාභිධාන
නායකස්ථවිරපාදයන්වහන්සේ.

---

ලක්මිණිපහන් කර්තෘභූත බුද්ධශාසනමහාසුරසේනාපති රාජදත්තිය
නාමොපලක්ෂිත ඇම්. ධර්මරත්න පණ්ඩිතුමා.

---

ලොන්ඩන්නුවර පාලිපොත් සමාගමේ ගරු ලේකම්තැන්පත්
සමාදන විනිශ්චයකාරධුරන්ධර ගාල්ලේ ඇඞ්මන්ඩ්. ආර්.
ගුණරත්න. වාසලමුදලිමැතිතුමා.

---

මේ කාණ්ඩයේ ඇතුළත්වූ ඇතැම් සූත්‍රවලට සන්න ලියා එවීමෙන් මෙහි පහත නම්සඳහන්වෙන ස්වාමීන්විසින් උපකාරකරණලදි.

---

විද්‍යොදය පිරිවෙණේ උපාචාර්ය කහවේ රතනසාර
ස්වාමිපාදයන්වහන්සේ.

---

කළුතර පුලිනතලාරාමවාසී බේරුවල සිරිනිවාස
ස්වාමිපාදයන්වහන්සේ.

"Sabban rasan Dhamma rasó jiñáti."

---

P. D. R a t n a t u n g a,

Registrar of Lands,

A N U R Á D H A P U R A.

20 March 1905.

No. 20

Shelf 12

Date 20 March 1905

Ratnatunga

අසජ්ඣායමලා මන්තා.

—ධම්මපද 241.

Who readeth much, and never meditates,
Is like the greedy eater of much food,
Who so surcloys his stomach with his cates,
That commonly they do him little good.

—JOSHUA SYLVESTER, *Tetrasticha*

## ප ටු න.

14 මහාපදාන සූත්‍රය.

භාග්‍යවතුන්වහන්සේගේ පූර්වේනිවාසානුස්මෘතිඥානකථාව අරබයා ඒ පූර්වේනිවාසය ප්‍රකාශකිරීම් වශයෙන් විපස්සිආදී බුදුවරයන්වහන්සේලාගේ සහ තමන්වහන්සේගේත් ජාති, ගොත්‍ර, ආයු, බොධි, ශ්‍රාවකයුග, ශ්‍රාවකසන්නිපාත, උපස්ථායක, මාතෘ පිතෘ, පරිච්ඡෙදාදිය සහ විපස්සී බුද්ධචරිතයද ප්‍රකාශිතයි. 545.

15 මහානිදාන සූත්‍රය.

පටිච්චසමුප්පාදයේ ගම්භීරභාවයද ඒ ධර්මය ප්‍රතිවෙධ නොකිරීමෙන් සත්වයන් සසරසැරිසරණබවද උපනිශ්‍රයප්‍රත්‍යය වශයෙන් අකුශල ධර්මසමුදයවනපරිදි සහ සප්තවිඥානස්ථිතිය අෂ්ටවිමොක්ෂධර්මය යනමොවුන්පිළිබඳ විස්තරකථාද ප්‍රකාශවේ. 645,

16 මහාපරිනිර්වාණ සූත්‍රය.

අපරිහාණීයධර්මය, ශීලසමාධිප්‍රඥාව, චෙතොපරියායඥානය, ශීලවිපත්තිය, ශීලසම්පත්තිය, නගරවස්තුපරිග්‍රහණය, චතුස්සත්‍යය, ධර්මාදශපර්‍යායය, සතරසතිපට්ඨානය, අම්බපාලිගණිකාය, ලිච්ඡවිරජ්ජුන්ය, ජීවිතසංස්කාරඅධිෂ්ඨානය, ඍද්ධිපාදමහිමය, ආයුසංස්කාරපරිත්‍යාගය, අෂ්ටභූමිචාලනහෙතුය, අෂ්ටපාරිෂද්‍යය, අෂ්ටඅභිභායතනසමාපත්තිය, අෂ්ටවිමොක්ෂය, ආනන්ද තෙරුන් කෙරෙහි දෙස්පහළකිරීමය, මාගීධර්මය, අප්‍රමාදපදානිසංසය, විසල්පුරබැලීමය, චතුර්විධමහාප්‍රදෙශය, චුන්දකර්මාරපුත්‍රයාගේ දන් පිළිගැණිම හා රොගඉපදීමය, බුද්ධානුභාවය, ශාන්තවිහරණය, තථාගතකායපාරිසුද්ධිය, චුන්දකර්මාරපුත්‍රයා පැහැදවීමය, පරිනිර්වාණමඤ්චකයෙහි සයනයකිරීමය, ආනන්දස්ථවිර අනුශාසනාය, උපවාණස්ථවිරඅපසාදනය, දෙවියන්ගේ හෙළාදූකීමය, සංවෙගජනක කරුණුසතරය, මාගමුන්කෙරෙහි පිළිපදනා නියාය, බුද්ධශරීරයෙහි පිළිපදනානියාය, චතුර්විධ ථූපාහීකථාය, සංස්කාරානිත්‍යතාවය, බුද්ධොපස්ථායකය, සිව්අසීරිමත්දහම්ය, කුශාවතීරාජධානිය, මල්ලරජුන්ට පිරිනිවන්පානා බව දැන්වීමය, මල්ලරජපිරිස තථාගතයන්වැඳීමය, සුභද්‍රනම්පිරිවැජියාය, භික්ෂූන්සමග කථා පවත්වන පරිදිය, ශික්ෂාපද යටපත්කිරීමය, බ්‍රහ්මදණ්ඩනාය පැමිණවීමය, සැක දුරුකිරීමය, සර්වඥයන්වහන්සේ පිරිනිවන්පෑවදාළපරිදිය, බුද්ධශරීරපූජාය, මහසුප් තෙරහුගේ පැමිණීමය, සුභද්‍රනම් මහලු පැවිද්දහුවිසින් සතුටපහළකිරීමය, තථාගතශරීර ආදහනය, ධාතුබෙදීමය, ශාරීරිකචෛත්‍ය කරවීමය, බුදුවරයන් දුලබපරිදිය, සාදරයෙන් පිළිවෙත්හි යෙදියයුතුබවය යන මේ මාතෘකාපද පිළිබඳ විස්තර කථා ප්‍රකාශ වෙත්. 681.

**17 මහාසුදර්ශන සූත්‍රය.**

අප බුදුරජාණන්වහන්සේ මහාසුදස්සනනම් සක්විතිරජව සම්පත්ලදපරිද්ද කුසිනාරා රාජධානිය බුද්ධපරිනිර්වාණයට සුදුසු බවද සංස්කාරධර්මයන්ගේ අනිත්‍යතාව හා නිවන්ලැබීමේ උතුම් බවද ප්‍රකාශවේ. 887.

**18 ජනවසභ සූත්‍රය.**

භාග්‍යවතුන්වහන්සේ නිසා ආර්‍ය්‍ය මාර්ගාදිය ලැබූවන් දිව්‍යඥානයෙන් දැකීමේ සොම්නසින් ඉදුරන් පැහැදුනුබවද ජනවසභ දෙව්පුත්හුගේ බුදුගුණවැණුම්ද දෙවාදීන්ගේ බුද්ධවන්දනාදියද දෙව්සෙබෙහිදී සනත්කුමර බඹරදහුගේ බුදුගුණවැණුම් ආදියද සෘද්ධිපාදධර්මමහිමයද ත්‍රිවිධඅවකාශාධිගමය සතරසතිපට්ඨානය සප්තසමාධියයනමේ සියල්ල නිර්වාණලාභයට හේතුවන බවද මගධජනපදවාසී ආර්‍ය්‍යපුද්ගලයන් සුවිසිලක්ෂයක්බවද සනත්කුමාරබඹරදය වෙසමුණුමහරජය ජනවසභදෙව්පුත්‍ය යනමේ උතුමන්අතර පැවැතිකථාව සර්වඥයන්වහන්සේවෙතින් අසා දැනගත් ආනන්දස්ථවිරයන්විසින් සිව්පිරිසෙහි ප්‍රකාශකිරීම සහ ධර්මය ප්‍රකාශකිරීමෙන් ශාසනය ස්ථිරභාවයට පැමිණෙන බවද පහළවේ. 943.

**19 මහාගොවින්ද සූත්‍රය.**

දෙව්ලොව දෙවේන්ද්‍රාදීන්විසින් බුද්ධගුණවර්ණනාකිරීමය බුදුවරයන් ලොවපහළවනපරිද්ද දෙව්පිරිසෙහි සනත්කුමාරබඹරදහුගේ පහළවීම හා උහු බුදුගුණ වැණුම්ය භරතරජුන් රාජ්‍යානුශාසනාකලපරිද්ද මහාගොවින්ද බමුණුපෙරවිහුගේ සිව්බඹවිහරණවැඩීමාදිය බඹලොවට පමුණුවනමාර්ගය. මහාගොවින්දබ්‍රාහ්මණයා පස්කම් සැපතෙහි පොළඹවීමය පිරිවර සහිත ඔහුගේ පැවිද්ද සහසමවත් උපදවා විසීමය මගබඹසර නිවණට හේතුවනබව ය බුදුසස්නෙහි පැවිද්ද ඵලසහිතවනබව හා අභිනන්දනාදියද ප්‍රකාශවේ. 985.

**20 මහාසමය සූත්‍රය.**

දසදහස්ලෝදැහි දෙවතාවන් මහරහතන්දැක්මට කිඹුල්වත්පුර මහවනවෙහෙරට පැමිණිපරිද්ද එහිදී ආර්‍ය්‍යදේවතා සතරදෙනෙක් භාග්‍යවතුන්වහන්සේ ගාථාසතරකින් අභිභාෂණය කළබවද ඒ දේවසමූහයාගේ නාමාදියද බුද්ධාදි උතුමන්වෙතට පැමිණි වසවත්මරහු පැරදුනුබවසහ දෙව්බ්‍රහ්මාදීන්සමග බුද්ධශ්‍රාවකයන් සතුටටපැමිණෙනබවද ප්‍රකාශවේ. 1055.

**21 සක්කපඤ්හසූත්‍රය.**

පිරිවරසහිත දෙවෙන්‍ද්‍රයා භාග්‍යවතුන්වහන්සේ දක්ම සඳහා රජගහනුවර ඉන්දසාලගුහාවට එළඹීමද එහිදී පඤ්චශිඛගන්ධර්වපුත්‍රයා විසින් රත්නත්‍රය හා කාමයන් නිශ්‍රිතවූ ගාථා ප්‍රකාශ කිරීමද දෙවෙන්‍ද්‍රාදීන්ගේ පැමිණීමද බුද්ධොත්පාදය නිසා දිව්‍යනිකාය සම්පූර්ණවනබවද ගොපිකා නම් දෙව්දුව්ගේ ධර්මානුශාසනාවද පැණ පිළිවිසීමට දෙව්රජහට අවසරදීමද ඒ දෙව්රජවිසින් කෙලෙස්උපදනාපරිදි විචාරීමද දෙවාසුරසංග්‍රාමයද සක්දෙව්රජහට ධර්මචක්ෂුසඋපන්පරිදි හා සූත්‍රනාම නිගමනයද ප්‍රකාශවේ. 1070.

22 මහාසතිපට්ඨාන සූත්‍රය.

එකායනමාර්ගී නම්ලද සතරසතිපට්ඨානය නිවන්ලැබීමපිණිස පවත්නාබවහා ඒ නෛර්යාණිකමාර්ගය විස්තරකිරීම්වශයෙන් චතුර්දශ කායානුපස්සනාය නවවිධ වෙදනානුපස්සනාය ෂොඩශවිධචිත්තානුපස්සනාය පඤ්චවිධධර්මානුපස්සනාය යනමොවුන් හා ධර්මාභිනන්දනයද ප්‍රකාශවේ. 1110.

23 පායාසිසූත්‍රය.

නාස්තිකදෘෂ්ටියට පැමිණි පායාසිරාජන්‍යයා කුමරකසුප් මහතෙරුන්ගෙන් පැණපිළිවිසීම සහ ඒ පැණවිසඳීමද ඉන්පසු ඒ දෘෂ්ටිය බැහැරලූ පායාසිරාජන්‍යයාගේ තෙරුවන්සරණයාමය මහදන්දීමය ඔහුදෙව්ලොව උපන් පරිදිය ගවම්පති නම් තෙරකෙනෙකුන් දෙව්ලොව වැඩ කරුණුවිචාළ පරිදිහා අභිනන්දනයද ප්‍රකාශවේ. 1161.

**ප්‍රධානකාරණා** 1235–1237.

**පුද්ගලනාම** 1238.

**ස්ථානනාම** 1239.

# ශුද්ධි පත්‍රය.

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 473 | 5 | අරහ | අරහං |
| 547 | 20 | සිඛි | සිඛී |
| 552 | 24 | ඇනි | ඇති |
| ,, | 28 | භාග්‍යවතුන් | භාග්‍යවතුන් |
| 554 | 22 | වස්සභූ | වෙස්සභූ |
| 555 | 10 | ජනේත්ති | ජනෙත්ති |
| 559 | 22 | ආශවයෘයි | ආශවයියි |
| 567 | 15 | බොඩිසත්ව | බොධිසත්ව |
| 575 | 31 | ආඟිලි | ඇඟිලි |
| 580 | 27 | සොඳුන් සියයක් | සොඳුනක් |
| 594 | 6 | බ්‍රහ්මණානං | බ්‍රාහ්මණානං |
| ,, | 9 | බහුනනං | බහුනානං |
| 600 | 12 | මබොධිසත්තස්ස | බොධිසත්තස්ස |
| 610 | 8 | ඨනං | ඨානං |
| ,, | 26 | තෘෂ්ණාවර්ණීය | තෘෂ්ණාවර්ණීය |
| 627 | 10 | තෙනුපසංකිමිංසුං | තෙනුපසඞ්කමිංසු |
| 629 | 2 | භික්ඛනතං | අභික්කන්තං |
| 633 | 11 | උපඞ්ඛපිතබ්බා | උපසඞ්කමිතබ්බා |
| 641 | 3 | අභිනික්ඛමානං | අභිනික්ඛමනං |
| 642 | 11 | ධම්මාචක්ක | ධම්මචක්ක |
| 645 | 5 | මහානසුත්තං | මහානිදාන සුත්තං |
| 646 | 16 | පතිතව්වි | පතිතවීම් |
| 649 | 5 | ජාතීපීහි | ජතිවති |
| 651 | 15 | සීලවතුහදනය | සීලබ්බතුපාදනය |
| ,, | 22 | ප්‍රත්‍ය | ප්‍රත්‍යය |
| 652 | 9 | නරොධා | නිරොධා |
| ,, | 31 | එසනම්සිතගා | 0 0 |
| 653 | 3 | ආරක්ඛාදිකරණං | ආරක්ඛාධිකරණං |
| 659 | 14 | තුෂණාව | තෘෂ්ණාව |
| 661 | 21 | ප්‍රත්‍යකොට | ප්‍රත්‍යයකොට |
| 663 | 14 | ප්‍රත්‍යවේ | ප්‍රත්‍යය වේ |
| 664 | 33 | දෘෂ්ටිගතිය | දෘෂ්ටිගතිකයන් |
| 669 | 3 | වෙදානා | වෙදනා |
| 675 | 6 | ආකාසණඤ්චායතන | ආකාසානඤ්චායතන |
| 676 | 25 | විඤ්ඤානාස්ථිත්යක් | විඤ්ඤනස්ථිතියක් |
| 688 | 6 | අරහන්ත | අරහන්තො |
| 691 | 10 | ගර | ගරු |
| 700 | 7 | එවං | එවං |

| පිට | පෙළ. | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 704 | 2 | අරහත් ෂතසු | අරහතෙනසු |
| 705 | 11 | සබෙබාධිං | සමේබාධිං |
| ,, | 16 | දෙරටුපාලතමෙ | දෙරටුපාලතෙම |
| ,, | 18 | විවෘතතසථානයක් | විවෘතසථානයක් |
| 709 | 3 | එම්හං | එම්හං |
| ,, | 17 | ආවාථාගාරයට | ආවසථාගාරයට |
| 723 | 19 | භික්ෂුතොමෝ | භික්ෂුතෙමේ |
| 725 | 11 | යංයොජනානං | සංයොජනානං |
| 727 | 1 | බිණපායද්‍රගගති | බීණාපායදුගගති |
| 733 | 6 | පිතාලඹකාරා | පීතාලඹකාරා |
| 736 | 17 | හණිකාතොමෝ | ගණිකාතොමෝ |
| 740 | 6 | නයාව | නියාව |
| ,, | 25 | ආන්න්දය | ආනඥය |
| 744 | 21 | සාරතැද | සාරඳැද |
| 745 | 16 | ත්ල්පාඩියක් | කලපාඩියක් |
| ,, | 4 | ආවිකඛිස්සනති | ආවීකඛිස්සනති |
| ,, | 22 | මනානොට | මනාකොට |
| 751 | 19 | ධම්මවාවාදය | ධම්මවවාදය |
| 752 | 11 | මිථ්‍යාවදය | මිථ්‍යාවාදය |
| 753 | 11 | එම්බලය්‍යාපීමාරයා | එම්බල පාපී මාරය |
| ,, | 25 | ලොහිතලීයක් | ලෝහතලියක් |
| 754 | 13 | මූලකරණවූ | මූලකාරණාවූ |
| 756 | 15 | ආනුභාට | ආනුභාව |
| 757 | 26 | තථොථගතම | තථාගතතෙම |
| ,, | 14 | කම්පාවත්නීය | කම්පාවන්නීය |
| ,, | 27 | දෙව්පරිස් | දෙව්පිරිස් |
| 760 | 1 | තත්‍රාල | තත්‍රාපි |
| ,, | 1 | සලලපීතපුණ්හ | සලලපිත පුබ්බණ්හ |
| ,, | 2 | තාදිසංකො | තාදිසකො |
| 760 | 13 | සාකච්ඡා | සාකච්ඡා |
| 762 | 5 | දුබ්බණ්ණාති | දුබ්බණ්ණාති |
| ,, | 5 | අරූපඤ්ඤී | අරූපසඤ්ඤී |
| ,, | 14 | සවණ්ණවණ්ණප්‍රභා | සවණ්ණවණ්ණප්‍රභා |
| ,, | 15 | මටවූ | වටවූ |
| ,, | 18 | අරූපංඥ | අරූපසංඥ |
| 766 | 3 | අද්ධිභිනොයතනානි | අභිභායතනානි |
| ,, | 7 | පානි | පාති |
| ,, | 19 | සම්පත්ති | සමාපත්ති |
| 767 | 5 | ආකිඤ්චඤ්ඤඤ්ඤායතනං | ආකිඤ්චඤ්ඤායතනං |
| ,, | 8 | උපසම්ජජ | උපසම්පජ්ජ |

| පිට. | පෙල | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 768 | 3 | එතදවංවොච | එතදවොචං |
| 770 | 17 | ව්‍යක්තයො | ව්‍යක්තයෝ |
| ,, | 23 | කීරීම් | කිරීම් |
| 773 | 31 | කල්පපයක් | කල්පයක් |
| 774 | 13 | නිමෙන | නිම්නෙන |
| ,, | 15 | ලොකානුකම්පතාය | ලොකානුකම්පකාය |
| ,, | 25 | පුරප්‍රවරාය | පුරප්‍රවරය |
| 775 | 1 | තථගතො | තථාගතො |
| ,, | 29 | කරෙමි | කෙරෙමි |
| 776 | 4 | සිතවතෙ | සීතවනෙ |
| ,, | 9 | දුක්කතුං | දුක්කතං |
| ,, | 18 | සප්පසෙණ්ඩික | සප්පසොණ්ඩික |
| 778 | 2 | කපපාව | කපපාව |
| ,, | 19 | සිටින්නේයයි | සිටින්නේයයි |
| 780 | 1 | වමිස්සතිති | ගමිස්සතිති |
| 781 | 23 | වශනේය | විසයෙන් |
| 788 | 30 | සූත්‍රයෙහි | සූත්‍රයෙහි |
| 790 | 22 | ඒකාත්තයන් | ඒකාන්තයෙන් |
| 793 | 21 | බුඩටවන | බුඩවචන |
| 794 | 17 | අභිප්‍රා කාලයක් | අභිප්‍රායකාලයක් |
| 801 | 25 | ආනන් සථවිර | ආනන්දසථවිර |
| 806 | 7 | ඇතුමයං | ආතුමායං |
| 808 | 26 | ආශුවායියෙකට | ආශුවායීයක |
| 809 | 12 | යුක්තයේමවූ | යුක්තවූයේම |
| 812 | 25 | දෙකක්හිම | දෙකෙක්හිම |
| 818 | 22 | කුසිනරා | කුසිනාරා |
| ,, | 27 | උපබත්තනනම් | උපවත්තනනනම් |
| 821 | 1 | චන්දචුණ්ණාති | චන්දනචුණ්ණානි |
| ,, | 4 | වත්තත්ති | වත්තන්ති |
| 827 | 15 | කුබුත් | කාබුත් |
| 829 | 4 | රක්ෂෂා | රක්ෂෂා |
| ,, | 18 | සිවඳ දරන් | සුවඳ දරින් |
| 832 | 19 | එල්වගෙණ | එල්බගෙණ |
| 834 | 22 | භික්ෂූහුමාහුය | භික්ෂූහු වූවාහුය |
| 836 | 21 | කිමෛත්ද | කිමෙක්ද |
| 838 | 8 | සෙය්‍යථපි | සෙය්‍යථාපි |
| 841 | 4 | අවෙට්ටෙනහි | ආවට්ටෙන්ති |
| 842 | 7 | වදින්නේ | වඳින්නේ |
| 843 | 16 | තථාගතවරයෙ | තථාගතවරයෝ |
| 849 | 27 | වතුක්සේ | වහන්සේ |

| පිට. | පෙළ. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| 853 | 6 | ගොතෙතනවං | ශොතොතනවා |
| ,, | 11 | ශස්තෲන් | ශාස්තෲත් |
| ,, | 17 | ශාසනා | ශාස්තෘ |
| ,, | 25 | යුත්තේය | යුත්තීය |
| 855 | 20 | එක්ෂූහු | භික්ෂූහු |
| 857 | 19 | නාසඤ්ඤඤ්ඤතන | නාසඤ්ඤඤ්ඤායතන |
| 858 | 25 | චතුවීය්‍යාන | චතුවිධ්‍යාන |
| 862 | 9 | විවටටෙනති | විවට්ටෙනති |
| 865 | 9 | ක්ඛාපෙස්සාවාති | ඛාපෙස්සාමාති |
| ,, | 29 | ගරුකැරත්තෝ | ගරුකරත්තෝ |
| ,, | 29 | බුහුහත් | බුහුමත් |
| 866 | 5 | මල්ලාකං | මල්ලානං |
| 867 | 7 | නසකෙකනති | නසක්කොනති |
| ,, | 19 | ශිම්ස්නාකය | ශිම්ස්නානය |
| 868 | 1 | ත්ඛාපෙස්සාමාති | ඛාපෙස්සාමාති |
| ,, | 17 | නැත්‍යවලින්ද | නෘත්‍යවලින්ද |
| ,, | 19 | සේස | සෙස්ස |
| 870 | 8 | පටිකුත්වා | පටිකුජ්ජිත්වා |
| 873 | 7 | බුඞීස | බුඞීඝ |
| 874 | 8 | සකකකානති | සක්කොනති |
| 875 | 28 | චෛත්‍යසථනය | චෛත්‍යස්ථානය |
| 877 | 1 | සප්පිස්සව | සප්පිස්සවා |
| ,, | 15 | තොදක්කා | තොදූක්කා |
| 880 | 1 | මයම්හගවතො | මයම්පි භගවතො |
| ,, | 20 | කොඞීසයක් | කොඩංසයක් |
| 881 | 4 | මයපි | මයම්පි |
| 888 | 12 | නාහමක් | නාහමක් |
| 894 | 11 | කමේසු | කාමේසු |
| ,, | 18 | පුවදීශාවෙහි | පූර්විදිශාවෙහි |
| 900 | 30 | ගෘහපතිරත්නානයේ | ගෘහපතිරත්නයේ |
| ,, | 31 | කර්මවිපාකයතේ | කර්මවිපාකයෙන් |
| 901 | 13 | ගපහතීති | ගහපතීති |
| 902 | 20 | මන්දෙහොත්සාහි | මන්දොත්සාහි |
| 903 | 20 | ආබාධා ඇත්තේ | ආබාධ ඇත්තේ |

| පිට. | පෙල. | අශුඩ. | ශුඩ. |
| --- | --- | --- | --- |
| 910 | 4 | එම්භං | එම්භං |
| 914 | 28 | සවර්ණමයවූශයේ | සවර්ණමයවූයේ |
| 915 | 27 | රිදීමශ වියවූටැම් | රිදීමයවූ ටැම් |
| 916 | 16 | සවර්ණමශ | සවර්ණමය |
| 934 | 6 | මහාබ්‍යූකූාගරං | මහාබ්‍යූහ කූටාගාරං |
| ,, | 14 | වවූහුශග් | වූවහුගේ |
| 936 | 20 | කොසය්‍යය්‍ය | කොසෙය්‍ය |
| 937 | 4 | උසපජ්ජි | උපපජ්ජි |
| 938 | 24 | වස්ත්‍රවයක් | වස්ත්‍රයන් |
| 939 | 21 | ප්‍රසාදයන් | ප්‍රාසාදයන් |
| 941 | 8 | ත්‍රිකෙබාපො | තිකෙබපො |
| 945 | 14 | පුනරුපත්තියට | පුනරුත්පත්තියට |
| 946 | 18 | උපතනේය | උපන්නේය |
| 964 | 15 | සිව්රවම් | සිව්වරම් |
| ,, | 24 | තෙමේ | තෙමේ |
| 966 | 3 | පක්තිවණ්ණෙණ | පකතිවණ්ණෙණා |
| ,, | 5 | බ්‍රහම | බ්‍රහමා |
| ,, | 5 | තාවතිංසානං | තාවතිංසානං |
| 967 | 5 | මුඩාවසිතේතො | මුඩාවසිතොතා |
| 968 | 5 | ගථාහි | ගාථාහි |
| 969 | 17 | සුප්‍රතිපතම් | සුප්‍රතිපනන |
| 971 | 2 | දෙවංතං | දෙවානං |
| ,, | 2 | රත්තීනං | රතීනං |
| 978 | 6 | සුඛස්සාධිගාමය | සුඛස්සාධිගමාය |
| 979 | 11 | කුසලඞඛ්‍යාත | කුසල සඞඛ්‍යාත |
| 981 | 9 | සාමාධි | සමාධි |
| 83 | 22 | ශාසන | ශාසනා |
| 990 | 1 | ලොකානුතම්පකාය | ලොකානුකම්පකාය |
| ,, | 8 | මනුපස්සාමි | සමනුපස්සාමි |
| 991 | 12 | ලාමධර්මය | ලාමක ධර්මය |
| 996 | 9 | මහරාජා | මහාරාජා |
| 1005 | 26 | භාය්‍යවතුන් | භාග්‍යවතුන් |
| 1008 | 28 | ඉත | ඉතා |
| 1009 | 12 | වේද | දෙව |

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1017 | 6 | හවනත | හවනතං |
| 1019 | 14 | බාරණසී | බාරාණසී |
| 1021 | 12 | කරණකොගෙණ | කරණකොටගෙණ |
| ,, | 20 | බ්‍රාහ්මමණතෙමේ | බ්‍රාහමණතෙමේ |
| 1023 | 17 | නෙතිරම් | නොකරම් |
| 1024 | 11 | බ්‍රහ්මණතේමේ | බ්‍රාහමණතෙමේ |
| ,, | 26 | ඔනුහ | ඔහු හා |
| 1039 | 6 | අමාගන්ධ | ආමගන්ධ |
| 1042 | 17 | බලාපොත්තු | බලාපොරොත්තු |
| ,, | 29 | සිල්ල | සියල්ල |
| 1050 | 17 | සම්පත්තිහ | සම්පත්තිය |
| 1051 | 6 | අවක්ඣ්ජඣ්‍රා | අවඣ්ජඣා |
| 1053 | 1 | සමබං | සබබං |
| ,, | 8 | සොතාපනතා | සොතාපනනා |
| 1058 | 2 | නමානි | නාමානි |
| 1059 | 2 | අමනස්සාන | අමනුස්සාන |
| ,, | 10 | සසසසිනො | යසස්සිනො |
| 1060 | 2 | යසසසිනො | යසස්සිනො |
| ,, | 5 | යසසසිනො | යසසසිනො |
| 1064 | 8 | අපොච | ආපොච |
| 1072 | 3 | රාජහහස්ස | රාජගහස්ස |
| 1074 | 15 | බිහෙතක් | බෙහෙතක් |
| 1079 | 25 | දෙවෙන්ද්‍රිආට | දෙවෙන්ද්‍රයාට |
| 1080 | 9 | නියද | යද |
| 1083 | 28 | දූනාගණින් | දූනාගණින් |
| 1085 | 2 | සභායු විට්ඨිතො | සභායු විඨිතා |
| ,, | 11 | කිංඩ්බති | කඞ්ඛති |
| ,, | 29 | රණය | තරණය |
| 1086 | 8 | දෙවනම්න්දං | දෙවානම්න්දං |
| 188 | 9 | ඉස්සමච්ඡරියං | ඉස්සාමච්ඡරියං |
| ,, | 30 | ඊෂ්‍රීහාව | ඊෂීහාව |
| 1091 | 3 | අභිවඩ්ඪන්තිති | අභිවඩ්ඪනාතිති |
| 1094 | 1 | වචීසමාචාරං | වචීසමාචාරය |
| 1095 | 2 | වචීා | වචී |

| පිට. | පෙළ. | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 1098 | 10 | කඨංකළු | කඨංකපි |
| 1100 | 5 | සඹුණබ්‍රහ්මණා | සමණබ්‍රාහ්මණා |
| ,, | 13 | දෙවෙන්‍ද්‍රිය | දෙවෙන්‍ද්‍රය |
| 1102 | 3 | අයුෂ්මත් | ආයුෂ්මත් |
| 1113 | 12 | තුෂ්ප්‍රටිතිලාභයක් | තුෂ්ටිප්‍රතිලාභයක් |
| 1107 | 5 | විචිකච්ඡා | විචිකිච්ඡා |
| ,, | 19 | පය්‍යුපාසන | පර්‍ය්‍යුපාසන |
| 1ɪ08 | 6 | පාණීත | පාණීතා |
| ,, | 11 | ධම්මක්ඛුං | ධම්මචක්ඛුං |
| ,, | 24 | සම්බුයන් | සම්බුඩයන් |
| 1109 | 3 | සසක්කපසොභා | සක්කපසොභා |
| 1112 | 17 | ප්‍රාශවාට | ප්‍රාශවාස |
| 1117 | 9 | පපඵාසං | පප්ඵාසං |
| 1118 | 4 | කාස්මිං | කායස්මිං |
| 1120 | 4 | විනීලකං | විනිලකං |
| ,, | 7 | විහරු | විහරති |
| ,, | 12 | මනාකො | මනාකොට |
| ,, | 26 | කරන්ෟතේය | කරන්තේය |
| ,, | 27 | දක්තේහෙ | දක්නේහෝ |
| 1121 | 26 | භවනාවෙන් | භාවනාවෙන් |
| ,, | 27 | පසසත | පසසනා |
| ,, | 28 | අනත්ගේ | අනුත්ගේ |
| 1122 | 7 | සඞ්කලිකං | සඞ්ඛලිකා |
| ,, | 22 | ඇටසැලකිල්ලක් | ඇටසැකිල්ලක් |
| ,, | 27 | සාහොණෙහි | සොහොණෙහි |
| ,, | 29 | ෛදී | යෙදී |
| 1124 | 7 | අජ්ඣුත්තං වා | අජ්ඣත්තං වා |
| ,, | 29 | කාමානුසසපනා | කායානුපස්සනා |
| ,, | 30 | භායාගතාසති | කායගතාසති |
| 1125 | 9 | වෙදීයනො | වෙදියානො |
| ,, | 10 | වෙදනං | වෙදනං |
| ,, | 19 | වාසකෙරේ | වාසුයකෙරේ |
| ,, | 28 | වෙදනාමක් | වෙදනාවක් |

| පිට. | පෙල. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| 1126 | 16 | මහණවීම | මහණවීම |
| 1127 | 28 | පවත්නා | පවත්නා |
| 1130 | 3 | අනුපපන්නස්ස | අනුපපන්නස්ස |
| ,, | 22 | පීහම්ඩය | පීනම්ඩය |
| 1135 | 19 | රූපයන | රූපයත් |
| 1136 | 27 | චාදශැයතන | චාදශායතන |
| 1137 | 14 | උපබා | උපෙබා |
| 1138 | 6 | පච්චුපඝින | පච්චුපඝිත |
| 1140 | 13 | කිරීය | කිරීමය |
| 1141 | 7 | පරිදෙවහා | පරිදෙවනා |
| ,, | 7 | ඉදවිතනත්තං | දෙවිතත්තං |
| ,, | 15 | ශරීරාභ්‍යත්තරය | ශරීරාභ්‍යන්තරය |
| ,, | 28 | දුංඛනම්වූයේ | දුඃඛනම්වූ |
| 1147 | 9 | ශ්‍රොතාතන | ශ්‍රොතායතන |
| ,, | 11 | ලබත්නාවූ | ලබන්නාවූ |
| ,, | 2 | භික්ඛවච | භික්ඛවෙ |
| ,, | 17 | ගැලවිවක් | ගැලවීමක් |
| ,, | 6 | අරහති | ආරහති |
| ,, | 21 | ශණිද | ගණිද |
| ,, | 25 | කායගාතාසති | කායගතාසති |
| ,, | I8 | චිත්තාසමාධියෙත් | චිත්තසමාධියෙන් |
| ,, | 27 | ඇතිචිතුපිධ්‍යානයට | ඇතුවතුපිධ්‍යානයට |
| 1158 | 3 | බහිඩවා | බහිඩාවා |
| ,, | 3 | බහිඩ | බහිඩා |
| 1159 | 6 | කොභි | කොචි |
| ,, | 11 | මෙමාසති | මෙමාසාති |
| 1185 | 10 | සම්විසවං | සමවිසමං |
| 1190 | 2 | වසසුදෙදසිකොචා | වසසුදෙදසිකොවා |
| 1194 | 7 | අභිජානාමහ | අභිජානාමහං |
| ,, | I0 | ජජාපි | අජජාපි |
| 1199 | 4 | ආග්චාරී | ආගුචාරී |
| ,, | 19 | සෙරෙක | සොරෙක |
| 1213 | 5 | කච්චිහෙ | කච්චිතෙ |
| 1216 | 11 | ඡඩ්ඩිතං | ඡඩ්ඩිතං. |

Sabba dánan Dhamma danan jináti

Sabban rasan Dhamma rasó jináti

Sabban ratin Dhamma ratí jináti

Tanhakkayó sabba dukkhan jináti.

Sabba pápassa akaranan

Kusalassa upasampadá

Sachitta pariyódapanan

Étan Buddhánu sásanan.

# දී ඝ නි කා යො.

## XIV මහාපදාන සුත්තං.

නමො තසස භගවතො අරහතො
සමමා සමබුදධසස.

1 ඒවමෙම සුතං. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ කරෙරිකුටිකායං අථ ඛො සම්බහුලානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං කරෙරිමණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං පුබ්බෙනිවාසපටිසංයුත්තා ධම්මී කථා උදපාදි ඉති පුබ්බෙනිවාසො ඉතිපි පුබ්බෙනිවාසොති.

2. අස්සොසි ඛො භගවා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය තෙසං භික්ඛූනං ඉමං කථාසල්ලාපං. අථ ඛො භගවා උට්ඨායාසනා යෙන කරෙරිමණ්ඩලමාළො තෙනුපසඞ්කමි.

---

### මහාපදාන සූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

1. මේ සූත්‍රධර්මය මා විසින් මෙසේ අසනලදි. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬුමහසිටානන් විසින් කරවා පිළිගන්වනලද දෙව්රම්මහවෙහෙර කරෙරිකුටියෙහි වාසයකරණසේක. (ලුණුවරණ වෘක්ෂයන්ගේ ඝනභාවයට පැමිණි අතුවිතානකාරණකොටගෙණ මණ්ඩපාකාරයෙන් වැසිසිටි පෙදෙස කරෙරිමණ්ඩපනම් විය. ඒ ලුණුවරණ රුක් සමීපයෙහි කරවනලද ගෘහය කරෙරිකුටිකානම් විය.) ඉක්බිත්තෙන් පසුබත්කාලයෙහි පිණ්ඩපාතභොජනයෙන් වැළැක්කාවූ හෙවත් බත්කිසකොට නිමවා නැගීසිටියාවූ කරෙරිමණ්ඩප සමීපයෙහිවූ නිසිදනශාලාවෙහි එක්වඋන්නාවූ රැස්වූ බොහෝ භික්ෂූන් අතරෙහි අතීතයෙහි පැවති ස්කන්ධපරම්පරාව මෙසේ විය. අතීතයෙහි පැවති ස්කන්ධපරම්පරාව මෙසේත් වීයයි හෙවත් භාග්‍යවතුන්වහන්සේගේ පූර්වේනිවාසානුස්මෘතිඥානය ආශ්චර්යයීයයි. පූර්වේනිවාසානුස්මෘතිඥානප්‍රතිසංයුක්තවූ ධාර්මික කථාවක් භාග්‍යවතුන්වහන්සේ අරබයාම උපන්නේය.

2. භාග්‍යවතුන්වහන්සේ පිරිසිදුවූ මනුෂ්‍යඥානය ඉක්මපැවැත්තාවූ දිව්‍යශ්‍රොත්‍රධාතුවෙන් ඒ භික්ෂූන්ගේ මේ කථාසල්ලාපය ඇසූසේක්මය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ හුනස්නෙන්නැගිට කරෙරිමණ්ඩපසමීපයෙහිවූ නිසීදනශාලාව යම්තැනෙක්හිද එතනට එළඹිසේක.

උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි,කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා, කාච පන වො අන්තරා කථා විප්පකතාති.

3. එවං වුත්තෙ තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං. ඉධ භන්තෙ අම්හාකං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං කරෙරිමණ්ඩලමාලෙ සන්නිසින්නානං සන්නිපතිතානං පුබ්බෙනිවාසපටිසංයුත්තා ධම්මී කථා උදපාදි.ඉති පුබ්බෙ නිවාසො ඉතිපි පුබ්බෙ නිවාසොති.අයං ඛො නො භන්තෙ අන්තරා කථා විප්පකතා.අථ භගවා අනුප්පත්තොති.

4. ඉච්ඡෙය්‍යාථ නො තුම්හෙ භික්ඛවෙ පුබ්බෙනිවාසපටිසංයුත්තං ධම්මිං කථං සොතුන්ති. එතස්ස භගවා කාලො එතස්ස සුගත කාලො යං භගවා පුබ්බෙ නිවාසපටිසංයුත්තං ධම්මිං කථං කරෙය්‍ය. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. තෙනහි භික්ඛවෙ සුණාථ.සාධුකං මනසිකරොථ භාසිස්සාමීති.

---

එළඹ පැණවූ අස්නෙහි වැඩඋන්සේක. භාග්‍යවතුන්වහන්සේ වැඩහිඳම මහණෙනි මෙහි තෙපි කිනම් කථාවකින් යුක්තව උන්නහුද, තොපගේ කිනම් කථාන්තරයෙක් අඩාලවීද'යි විචාලසේක.

3. මෙසේ විචාලකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළෝ. ස්වාමීන්වහන්ස, මෙහි පසුබත් කාලයෙහි හෙවත් බත්කිස කොට නිමවා නැඟීසිටියාවූ කරේරිමණ්ඩපසමීපයෙහිවූ නිසීදනශාලාවෙහි එක්ව උන්නාවූ රැස්වූ අපඅතරෙහි අතීතයෙහි පැවති ස්කන්ධපරම්පරාව මෙසේය. අතීතයෙහි පැවති ස්කන්ධපරම්පරාව මෙසේත් වියයි හෙවත් භාග්‍යවතුන්වහන්සේගේ පූර්වේනිවාසානුස්මෘතිඥානය ආශ්චර්‍ය්‍යයයි. පූර්වේනිවාසානුස්මෘතිඥානප්‍රතිසංයුක්තවූ ධාර්මිකකථාවක් භාග්‍යවතුන්වහන්සේ අරබයාම උපන්නේය. ස්වාමීන්වහන්ස, අපගේ මේ කථාන්තරය අඩාල වීය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ වැඩිසේකැයි සැලකළෝ.

4. මහණෙනි, තෙපි පූර්වේනිවාසප්‍රතිසංයුක්තවූ දැහැමි කථාවක් අසන්නට කිමෙක කැමැත්තහුදැයි විචාලසේක. යම්හෙයකින් භාග්‍යවතුන්වහන්සේ පූර්වේනිවාසප්‍රතිසංයුක්තවූ ධාර්මිකකථාවක් වදාරණසේක්නම් භාග්‍යවතුන්වහන්ස, මේ ඊට සුදුසු කාලයයි. සුගතයන්වහන්ස, මේ ඊට සුදුසු කාලයයි. භාග්‍යවතුන්වහන්සේවෙතින් අසා භික්ෂූහු දරාගන්නාහුයයි සැලකළෝ. මහණෙනි, එහෙනම් අසව්. මනාකොට මෙනෙහිකරව්. කියන්නෙම්යි වදාළෝ.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතද වොච.

5. ඉතො සො භික්ඛවෙ එකනවුතිකප්පෙ යං විපස්සී භගවා අරහ සම්මා සම්බුද්ධො ලොකෙ උදපාදි. ඉතො සො භික්ඛවෙ එකතිංසෙ කප්පෙ යං සිඛී භගවා අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උදපාදි.තස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ එකතිංසෙ කප්පෙ වෙස්සභූ භගවා අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උදපාදි. ඉමස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ භද්දකප්පෙ කකුසන්ධො භගවා අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උදපාදි. ඉමස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ භද්දකප්පෙ කොණාගමනො භගවා අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උදපාදි. ඉමස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ භද්දකප්පෙ කස්සපො භගවා අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උදපාදි. ඉමස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ භද්දකප්පෙ අහං එතරහි අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උප්පන්නො.

6. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි ඛත්තියකුලෙ උදපාදි.

---

ස්වාමීන්වහන්ස, එසේයයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්හ.භාග්‍යවතුන්වහන්සේ මේ වක්ෂ්‍යමාණධර්මය වදාළසේක.

5. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ ඒ මේ විපස්සී භාග්‍යවතුන් වහන්සේ මෙයින් අනූඑක්වෙනි කල්පයෙහි ලොව පහළවූසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ ඒ මේ ශිඛීභාග්‍යවතුන් වහන්සේ මෙයින් එක්තිස්වෙනි කල්පයෙහි ලොව පහළවූසේක. මහණෙනි, ඒ එක්තිස්වෙනි කල්පයෙහිම අර්හත් සම්‍යක්සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේ ලොව පහළවූසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කකුසන්ධනම් භාග්‍යවතුන්වහන්සේ මේ මහා භද්‍රකල්පයෙහිම ලොව පහළවූසේක. මහණෙනි, මේ මහා භද්‍රකල්පයෙහිම අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කොණාගමනනම් භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවූසේක. මහණෙනි, මේ මහා භද්‍රකල්පයෙහිම අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේ ලොව පහළවූසේක. මහණෙනි, මේ මහා භද්‍රකල්පයෙහිම දැන් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ මම උපන්නෙමි.

කල්පපරිච්ඡේදකථායි,

---

6. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ ජාතියෙන් ක්‍ෂත්‍රිය වූසේක. ක්‍ෂත්‍රියකුලයෙහි උපන්සේක.

සිඛී භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි. ඛත්තියකුලෙ උදපාදි. වෙස්සභූ භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි ඛත්තියකුලෙ උදපාදි. කකුසන්ධො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො බ්‍රාහ්මණො ජාතියා අහොසි බ්‍රාහ්මණකුලෙ උදපාදි. කොණාගමනො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො බ්‍රාහ්මණො ජාතියා අහොසි බ්‍රාහ්මණකුලෙ උදපාදි. කස්සපො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො බ්‍රාහ්මණො ජාතියා අහොසි බ්‍රාහ්මණකුලෙ උදපාදි. අහං භික්ඛවෙ එතරහි අරහං සම්මා සම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසිං ඛත්තියකුලෙ උප්පන්නො.

7. විපස්සි භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො කොණ්ඩඤ්ඤො ගොත්තෙන අහොසි. සිඛී භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො කොණ්ඩඤ්ඤො ගොත්තෙන අහොසි. වෙස්සභූ භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො කොණ්ඩඤ්ඤො ගොත්තෙන අහොසි. කකුසන්ධො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො කස්සපො ගොත්තෙන අහොසි.

---

මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන්වහන්සේ ජාතියෙන් ක්‍ෂත්‍රිය වූසේක. ක්‍ෂත්‍රියකුලයෙහි උපන්සේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේ ජාතියෙන් ක්‍ෂත්‍රිය වූසේක. ක්‍ෂත්‍රියකුලයෙහි උපන්සේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කකුසන්ධභාග්‍යවතුන්වහන්සේ ජාතියෙන් බ්‍රාහ්මණ වූසේක. බ්‍රාහ්මණකුලයෙහි උපන්සේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන්වහන්සේ ජාතියෙන් බ්‍රාහ්මණ වූසේක. බ්‍රාහ්මණකුලයෙහි උපන්සේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යපභාග්‍යවතුන්වහන්සේ ජාතියෙන් බ්‍රාහ්මණ වූසේක. බ්‍රාහ්මණකුලයෙහි උපන්සේක. මහණෙනි, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ මම ජාතියෙන් ක්‍ෂත්‍රියවූයෙමි. ක්‍ෂත්‍රියකුලයෙහි උපන්නෙමි.

ජාතිපරිච්ඡේදකථායි.

---

7. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤනම්වූසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන්වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤනම්වූසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤනම්වූසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කකුසන්ධභාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් කාශ්‍යපනම්වූසේක.

කොණාගමනො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො කස්සපො ගොත්තෙන අහොසි. කස්සපො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො කස්සපො ගොත්තෙන අහොසි. අහං භික්ඛවෙ එතරහි අරහං සම්මා සම්බුද්ධො ගොතමො ගොත්තෙන අහොසිං

8. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස අසීතිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. සිඛිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස සත්තතිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසිං. වෙස්සභුස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස සට්ඨිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. කකුසන්ධස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස චත්තාරීසවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. කොණාගමනස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස තිංසවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. කස්සපස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස වීසතිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. මය්හං භික්ඛවෙ එතරහි අප්පකං ආයුප්පමාණං

---

මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් කාශ්‍යපනම්වූසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කාශ්‍යපභාග්‍යවතුන්වහන්සේ ගොත්‍රයෙන් කාශ්‍යප නම්වූසේක. මහණෙනි, දැන් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ මම ගොත්‍රයෙන් ගෞතමනම් වූයෙමි.

ගොත්‍රපරිච්ඡෙදකථායි.

8. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට අසූදහසක් අවුරුදු ආයුප්‍රමාණ වීය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ සිඛි භාග්‍යවතුන්වහන්සේට සැත්තෑදහසක් අවුරුදු ආයුප්‍රමාණ වීය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේට සැටදහසක් අවුරුදු ආයුප්‍රමාණ වීය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කකුසන්ධභාග්‍යවතුන්වහන්සේට සතළිස්දහසක් අවුරුදු ආයුප්‍රමාණ වීය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන්වහන්සේට තිස්දහසක් අවුරුදු ආයුප්‍රමාණ වීය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේට විසිදහසක් අවුරුදු ආයුප්‍රමාණ වීය. මහණෙනි, දැන් මට ආයුප්‍රමාණය ස්වල්පවේ.

පරිත්තං ලහුකං. සො චිරං ජීවති සො වස්සසතං අප්පං වා භියෙ‍්‍යා.

9. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො පාටලියාමූලෙ අභිසම්බුද්ධො. සිඛී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො පුණ්ඩරීකස්සමූලෙ අභිසම්බුද්ධො වෙස්සභූ භික්ඛවෙ භගවා අරහං සම්බුද්ධො සාලස්සමූලෙ අභිසම්බුද්ධො. කකුසන්ධො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො සිරීසස්සමූලෙ අභිසම්බුද්ධො. කොණාගමනො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො උදුම්බරස්සමූලෙ අභිසම්බුද්ධො. කස්සපො භික්ඛවෙ භගවා අරහං සම්මා සම්බුද්ධො නිග්‍රොධස්ස මූලෙ අභිසම්බුද්ධො. අහං භික්ඛවෙ එතරහි අරහං සම්මා සම්බුද්ධො අස්සත්ථස්සමූලෙ අභිසම්බුද්ධො.

10. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ඛණ්ඩතිස්සංනාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං.

---

සැහැල්ලුයි හෙවත් කොටයි. යමෙක් කලක් ජීවත්වේනම් හෙතෙමේ අවුරුදු සියයක් ජීවත්වේ. අවුරුදු සියයකින් වැඩිවන්නේනම් ඒ ඉතා සවල්පයකි. (අවුරුදු එකසිය විසක් හෝ සතළිසක් හෝ පණසක් හෝ සැටක් හෝ ජීවත්වෙයි. කිසිසේත් අවුරුදු දෙසියයක් සම්පූර්ණ නොකෙරේය යනුයි.)

ආයුපරිච්ඡෙදකථායි.

9. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේ පළොල්රුකමුල චතුස්සත්‍යාවබොධකළසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන්වහන්සේ ඇටඹ (සුදු අඹ) රුක්මුලදී චතුස්සත්‍යාවබොධකළසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේ සල්රුකමුලදී චතුස්සත්‍යාවබොධකළසේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන්වහන්සේ මහරිරුක්මුලදී චතුස්සත්‍යාවබොධකළසේක. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන්වහන්සේ දිඹුල්රුකමුලදී චතුස්සත්‍යාවබොධ කළසේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේ නුගරුකමුලදී චතුස්සත්‍යාවබොධකළසේක. මහණෙනි, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ මම ඇසතුරුකමුලදී චතුස්සත්‍යාවබොධකෙළෙමි.

බොධිපරිච්ඡෙදකථායි.

10. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට සර්වඥයන්වහන්සේ හැර අවශෙෂ රහතුන්ට වඩා අධික ගුණවත් හෙයින් ශ්‍රෙෂ්ඨවූ එහෙයින්ම යහපත්යුගලයක්වූ ඛණ්ඩය තිස්සය යන ශ්‍රාවක යුග්මයක් වූයේය.

සිඛිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අභිභූසම්භවං නාමසාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. වෙස්සභුස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සොණුත්තරංනාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. කකුසන්ධස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස විධුරසඤ්ජීවංනාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. කොණාගමනස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස භියෙ‍ාසුත්තරංනාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. කස්සපස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තිස්සභාරවාජංනාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. මය්හං භික්ඛවෙ එතරහි සාරිපුත්තමොග්ගල්ලානංනාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං.

11. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයොසාවකානං සන්නිපාතා අහෙසුං, එකො සාවකානං සන්නිපාතො අහොසි අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං.

---

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛි භාග්‍යවතුන්වහන්සේට ශ්‍රේෂ්ඨවූ එහෙයින්ම යහපත් යුගලයක්වූ අභිභූ සම්භවය යන නම් ඇති ශ්‍රාවකයුග්මයක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේට ශ්‍රේෂ්ඨවූ එහෙයින්ම යහපත් යුගලයක්වූ සොණය උත්තරය යන ශ්‍රාවක යුග්මයක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන්වහන්සේට ශ්‍රේෂ්ඨවූ එහෙයින්ම යහපත් යුගලයක්වූ විධුරය, සඤ්ජීවය, යනනම්ඇති ශ්‍රාවකයුග්මයක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන් වහන්සේට ශ්‍රේෂ්ඨවූ එහෙයින් යහපත් යුගලයක්වූ භියෝසොය, උත්තරය, යන නම්ඇති ශ්‍රාවක යුග්මයක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේට ශ්‍රේෂ්ඨවූ එහෙයින්ම යහපත් යුගලයක්වූ තිස්සය, භාරවාජය, යන නම්ඇති ශ්‍රාවක යුග්මයක් වූයේය. මහණෙනි, දැන්මට ශ්‍රේෂ්ඨවූ එහෙයින්ම යහපත් යුගලයක්වූ සාරිපුත්තය, මොග්ගල්ලානය, යන නම්ඇති ශ්‍රාවක යුග්මයක් වූයේය.

ශ්‍රාවකයුග පරිච්ඡේද කථායි.

---

11. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක්වූහ. සැටඅටලක්‍ෂයක් භික්‍ෂූන්ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක්වීය.

එකො සාවකානං සන්නිපාතො අහොසි භික්ඛුසතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි අසීති භික්ඛුසහස්සානි. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතොසම්මාසම්බුද්ධස්ස ඉමෙ තයොසාවකානං සන්නිපාතා අහෙසුං සබ්බෙසංයෙව ඛීණාසවානං. සිඛිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයොසාවකානං සන්නිපාතා අහෙසුං.එකො සාවකානං සන්නිපාතො අහොසි භික්ඛුසතසහස්සං. එකොසාවකානංසන්නිපාතොඅහොසි අසීති භික්ඛුසහස්සානි.එකො සාවකානං සන්නිපාතො අහොසි සතතතිංස භික්ඛුසහස්සානි. සිඛිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නිපාතා අහෙසුං සබ්බෙසංයෙව ඛීණාසවානං. වෙස්සභුස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයොසාවකානං සන්නිපාතා අහෙසුං. එකො සාවකානං සන්නිපාතො අහොසි අසීති භික්ඛුසහස්සානි. එකොසාවකානං සන්නිපාතො අහොසි සතතතිභික්ඛුසහස්සානි. එකො සාවකානං සන්නිපාතො අහොසි සට්ඨිභික්ඛු සහස්සානි. වෙස්සභුස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නිපාතා අහෙසුං සබ්බෙසංයෙව ඛීණාසවානං.

---

භික්ෂූන් ලක්ෂයක්ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක්විය. අසූදහසක් භික්ෂූන්ඇතිඑක්ශ්‍රාවකසන්නිපාතයෙක්විය,මහණෙනි,අර්හත්සම්‍යක් සම්බුද්ධවූවිපස්සීභාග්‍යවතුන්වහන්සේටසියල්ලන්මරහත්වූමේශ්‍රාවක සන්නිපාත තුණවූහ.මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූසිඛීභාග්‍යවතුන්වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක්වූහ. අර්හත් භික්ෂූන් ලක්ෂයක් ඇතිඑක් ශ්‍රාවක සන්නිපාතයෙක්විය. අර්හත් භික්ෂූන් අසූදහසක්ඇති එක් ශ්‍රාවකසන්නිපාතයෙක්විය. සැත්තෑදහසක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක්විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන්වහන්සේට සියල්ලන්ම රහත්වූ මේ ශ්‍රාවක සන්නිපාත තුණවූහ. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක්වූහ. අසූදහසක් භික්ෂූන්ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක් විය. සැත්තෑදහසක් භික්ෂූන්ඇති එක් ශ්‍රාවකසන්නිපාතයෙක් විය. සැටදහසක් භික්ෂූන්ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක්විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේට සියල්ලන්ම රහත්වූ මේශ්‍රාවකසන්නිපාත තුණ වූහ.

කකුසන්ධස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එකො සාවකානං සන්නිපාතො අහොසි චත්තාළීසභික්ඛුසහස්සානි. කකුසන්ධස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සබ්බෙසංයෙව ඛීණාසවානං. කොණාගමනස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එකො සාවකානං සන්නිපාතො අහොසි තිංසභික්ඛුසහස්සානි. කොණාගමනස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සබ්බෙසංයෙව ඛීණාසවානං. කස්සපස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එකො සාවකානං සන්නිපාතො අහොසි වීසති භික්ඛුසහස්සානි. කස්සපස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සබ්බෙසංයෙව ඛීණාසවානං. මය්හං භික්ඛවෙ එතරහි එකො සාවකානං සන්නිපාතො අහොසි අඩ්ඪතෙළසානි භික්ඛුසතානි. මය්හං භික්ඛවෙ අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සබ්බෙසංයෙව ඛීණාසවානං.

---

මහණෙනි, අර්හත්සම්‍යක්සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන්වහන්සේට සතළිස් දහසක් භික්‍ෂූන් ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන්වහන්සේට සියල්ලම රහත්වූ මේ එකම ශ්‍රාවකසන්නිපාතය වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන්වහන්සේට තිස්දහසක් භික්‍ෂූන් ඇතිඑක් ශ්‍රාවකසන්නිපාතයෙක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන්වහන්සේට සියල්ලන්ම රහත්වූ මේඑකම ශ්‍රාවක සන්නිපාතයවූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේට විසිදහසක් භික්‍ෂූන්ඇති එක් ශ්‍රාවකසන්නිපාතයෙක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යපභාග්‍යවතුන්වහන්සේට සියල්ලන්ම රහත්වූ මේඑකම ශ්‍රාවකසන්නිපාතය වූයේය. මහණෙනි, දැන්මට එක්දහස් දෙසිය පණසක් භික්‍ෂූන්ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේය, මහණෙනි මට සියල්ලන්ම රහත්වූ මේ එකම ශ්‍රාවක සන්නිපාතය වූයේය,

ශ්‍රාවක සන්නිපාත පරිච්ඡෙද කථායි,

12. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසොකො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. සිඛිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඛෙමඞ්කරො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. වෙස්සභුස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස උපසන්තොනාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. කකුසන්ධස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බුද්ධිජොනාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. කොණාගමනස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සොත්ථිජොනාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. කස්සපස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සබ්බමිත්තො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. මය්හං භික්ඛවෙ එතරහි ආනන්දො භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො.

13. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බන්ධුමානාම රාජා පිතා අහොසි. බන්ධුමතීනාම දෙවී මාතා අහොසි ජනෙත්ති.

---

12. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන් වහන්සේට උතුම්ලෙස උපස්ථාන කරන්නාවූ අසොකනම් භික්‍ෂු කෙනෙක් උපස්ථායක වූයේය. මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ සිඛිභාග්‍යවතුන්වහන්සේට උතුම්ලෙස උපස්ථානකරන්නාවූ ඛෙම ඞ්කරනම් භික්‍ෂුකෙනෙක් උපස්ථායකවූයේය. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේට උතුම්ලෙස උපස්ථානකරන්නාවූ උපසන්තනම් භික්‍ෂුකෙනෙක් උපස්ථායකවූයේය. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කකුසන්ධභාග්‍යවතුන්වහන්සේට උතුම්ලෙස උපස්ථානකරන්නාවූ බුද්ධිජනම් භික්‍ෂුකෙනෙක් උපස්ථායකවූයේය, මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කොණාගමන භාග්‍යවතුන්වහන්සේට උතුම්ලෙස උපස්ථානකරන්නාවූ සොත්ථිජ නම් භික්‍ෂුකෙනෙක් උපස්ථායක වූයේය, මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යපභාග්‍යවතුන්වහන්සෙට උතුම්ලෙස උපස්ථාන කරන්නාවූ සබ්බමිත්තනම් භික්‍ෂුකෙනෙක් උපස්ථායක වූයේය. මහණෙනි දැන් මට උතුම්ලෙස උපස්ථානකරන්නාවූ ආනන්ද භික්‍ෂුතෙමේ උපස්ථායක වූයේය.

උපස්ථායකභික්‍ෂුපරිච්ඡේදකථායි.

---

13. මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන් වහන්සේට බන්ධුමානම් රජතෙම පියවූයේය. බන්ධුමතීනම් දේවි ඇක් ජනකමව්විය.

බන්ධුමස්ස රඤ්ඤො බන්ධුමතීනාම නගරං රාජධානි අහොසි. සිඛිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අරුණො නාම රාජා පිතා අහොසි, පභාවතීනාම දෙවිමාතා අහොසි ජනෙත්ති. අරුණස්ස රඤ්ඤො අරුණවතීනාම නගරං රාජධානි අහොසි. වෙස්සභුස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සුප්පතීතො නාම රාජා පිතා අහොසි. යසවතීනාම දෙවී මාතා අහොසි ජනෙත්ති. සුප්පතීතස්ස රඤ්ඤො අනොපමංනාම නගරං රාජධානි අහොසි, කකුසන්ධස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අග්ගිදත්තොනාම බ්‍රාහ්මණො පිතා අහොසි. විසාඛානාම බ්‍රාහ්මණී මාතා අහොසි ජනෙත්ති. තෙනඛොපන භික්ඛවෙ සමයෙන ඛෙමො නාම රාජා අහොසි. ඛෙමස්ස රඤ්ඤො ඛෙමවතීනාම නගරං රාජධානි අහොසි. කොණාගමනස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස යඤ්ඤදත්තොනාම බ්‍රාහ්මණො පිතා අහොසි. උත්තරා නාම බ්‍රාහ්මණී මාතා අහොසි ජනෙත්ති. තෙන ඛො පන භික්ඛවෙ සමයෙන සොභො නාම රාජා අහොසි, සොභස්ස රඤ්ඤො සොභවතීනාම නගරං රාජධානි අහොසි. කස්සපස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බ්‍රහ්මදත්තොනාම බ්‍රාහ්මණො පිතා අහොසි. ධනවතීනාම බ්‍රාහ්මණී මාතා අහොසි ජනෙත්ති.

---

බන්ධුමානම් රජහට බන්ධුමතීනම් නුවර රාජධානිය විය. මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන්වහන්සේට අරුණනම් රජතෙම පියවිය. පභාවතීනම් දේවී ජනකමව්විය. අරුණරජහට අරුණවතීනම්නුවරක් රාජධානිවිය, මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්වහන්සේට සුප්පතීතනම් රජතෙම පියවිය, යසවතීනම් දේවියක් ජනකමව් විය. සුප්පතීතරජහට අනොපමනුවර රාජධානිවිය. මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කකුසන්ධභාග්‍යවතුන්වහන්සේට අග්ගිදත්තනම් බ්‍රාහ්මණයෙක් පියවිය, විශාඛානම් බැමිණියක් ජනක මව්විය, මහණෙනි ඒ කාලයෙහිදී ඛෙමනම් රජෙක්වූයේය, ඛෙමරජහට ඛෙමවතීනම් නුවරක් රාජධානිවීය. මහණෙනි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කොණාගමනනම් භාග්‍යවතුන්වහන්සේට යඤ්ඤදත්තනම් බ්‍රාහ්මණතෙම පියවූයේය. උත්තරානම් බැමිණිතොමෝ ජනක මව්විය. මහණෙනි ඒකාලයෙහිදී සොභනම් රජෙක්වූයේය, සොභරජහට සොභවතීනම් නුවරක් රාජධානිවූයේය, මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන්වහන්සේට බ්‍රහ්මදත්තනම් බ්‍රාහ්මණතෙම පියවිය. ධනවතීනම් බැමිණිතොමෝ ජනක මව්විය.

තෙන ඛො පන භික්ඛවෙ සමයෙන කිකීනාම රාජා අහොසි. කිකිස්ස
රඤ්ඤො බාරාණසීනාම නගරං රාජධානී අහොසි. මය්හං භික්ඛවෙ
එතරහි සුද්ධොදනො රාජා පිතා අහොසි. මායාදෙවී මාතා ජනෙත්ති.
කපිලවත්ථුනාම නගරං රාජධානීති. ඉදමවොච භගවා, ඉදං වත්වා
සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

14. අථ ඛො තෙසං භික්ඛූනං අචිරපක්කන්තස්ස භගවතො අය
මන්තරා කථා උදපාදි. අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො. තථා
ගතස්ස මහිද්ධිකතා, මහානුභාවතා, යත්‍රහිනාම තථාගතො අතීතෙ
බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ
සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුස්සරිස්සති නාමතොපි අනුස්ස
රිස්සති ගොත්තතොපි අනුස්සරිස්සති ආයුප්පමාණතොපි අනුස්සරිස්සති
සාවකයුගතොපි අනුස්සරිස්සති සාවකසන්නිපාතතොපි අනුස්සරිස්සති
එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං නාමා එවං ගොත්තා.

---

මහණෙනි ඒකාලයෙහිදී කිකිනම් රජෙක්වූයේය, කිකිරජ
හට බරණැස්නම් නුවරක් රාජධානිවූයේය, මහණෙනි, දැන්මට
සුද්ධොදනනම් රජතෙම පියවූයේය, මායාදෙවිතොමෝ ජනක මව්විය,
කපිලවත්ථුනම් නගරයක් රාජධානිවිය, භාග්‍යවතුන්වහන්සේ මේ
කරුණු පදළසේක, සුගතයන්වහන්සේ පූර්වේනිවාසප්‍රතිසංයුක්තවූ
මේ ධර්මදේශනාව වදාරා හුනස්නෙන් නැගිට වෙහෙරට වැඩිසේක.

මාතෘපිතෘපරිච්ඡෙදකථායි.

---

14. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ වැඩනාබෝවේලාවූකල්හි
ඒ භික්ෂූන්ගේ මේකථාන්තරයෙක් පහලවිය ආයුෂ්මත්නි, තථාගත
යන්වහන්සේගේ මහත් ඍද්ධිමත්භාවය හා මහත් ආනුභාව ඇති බව
ආශ්චර්යයි අද්භූතයි. යම් තථාගතකෙනෙක් පරිනිර්වාණයට පැමි
ණියාවූ අර්හත්මාර්ග ඥානනැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණා දෘෂ්ටි
මාන ප්‍රපඤ්චඇති සිඳිනලද කුශලාකුශලකර්ම වර්ත ඇති වනසනලද
සකලකර්මාවෘතඇති සකල විපාකාවෘතසඞ්ඛ්‍යාත දුඃඛස්කන්ධය
ඉක්ම පැවැත්තාවූ අතීත බුදුවරයන් ජාතිවශයෙනුත් සිහිකළසේක්ද
ආයුප්‍රමාණවශයෙනුත් සිහිකළසේක්ද ශ්‍රාවක යුග්මවශයෙනුත් සිහික
ළසේක්ද ශ්‍රාවක සන්නිපාතවශයෙනුත් සිහිකළසේක්ද, කෙසේද ඒ,
භාග්‍යවතුන්වහන්සේලා මෙබඳු ජාති ඇත්තෝවූහයි කියාද, මෙබඳු
නම්ඇත්තෝය කියාද, මෙබඳු ගොත්ඇත්තෝයයි කියාද

එවං සීලා එවං ධම්මා එවං පඤ්ඤා එවං විහාරී එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති.

15. කින්නුඛො ආවුසො තථාගතස්සෙවනුඛො එසා ධම්ම ධාතු සුප්පටිවිද්ධා, යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීති වත්තෙ, ජාතිතොපි අනුස්සරති, නාමතොපි අනුස්සරති, ගොත්තතොපි අනුස්සරති, ආයුප්පමාණතොපි අනුස්සරති සාවකයුගතොපි අනුස්සරති සාවකසන්නිපාතතොපි අනුස්සරති එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවං නාමා එවංගොත්තා එවං සීලා එවංධම්මා එවං පඤ්ඤා එවංවිහාරී එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති.

---

ඒ භාග්‍යවතුන්වහන්සේලා මාර්ගඵලශීලාදිවශයෙන් මෙබඳු සිල්ඇත්තෝයකියාද මාර්ගඵලසමාධීන්ගේ වශයෙන් මෙබඳු සමාධිඇත්තෝය කියාද මාර්ගඵල ප්‍රඥාදිවශයෙන්මෙබඳුප්‍රඥා ඇත්තෝය කියාද මෙබඳු නිරොධ සමාපත්ති විහරණ ඇත්තෝයකියාද පටිප්පස්සද්ධි ආදි පඤ්ච විමුක්තීන්ගේ වශයෙන් මෙබඳු විමුක්තිඇත්තෝදවූහයි කියායි.

15. ආයුෂ්මත්නි, කිමෙක්ද තථාගතයන්වහන්සේ විසින්ම මේ ධර්මධාතු තොමෝසම්‍යක්කාරයෙන් ප්‍රතිවෙධකරණලද්දිදඒනම්,යම් ධර්මධාතුවක් තමා සම්‍යක්කාරයෙන් ප්‍රතිවෙධකළබැවින් තථාගතයන් වහන්සේ පරිනිර්වාණයට පැමිණියාවූ අර්හත්මාර්ගඥානනැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණාමාන දෘෂ්ටි ප්‍රපඤ්චඇති සිඳිනලද කුශලාකුශල කර්මවර්තඇති වනසනලද සකල කර්මාවෘතඇති සකලවිපාකාවෘතසඞ්ඛ්‍යාත දුඃඛස්කන්ධය ඉක්මපැවැත්තාවූ අතීත බුදුවරයන් ජාතිවශයෙන් සිහිකළසේක්ද, ආයු ප්‍රමාණවශයෙන් සිහිකළසේක්ද, ශ්‍රාවක යුග්මවශයෙන් සිහිකළසේක්ද, ශ්‍රාවක සන්නිපාතවශයෙනුත් සිහිකළසේක්ද,කෙසේද,ඒභාග්‍යවතුන්වහන්සේලා මෙබඳුජාති ඇත්තෝවූහයි කියාද, මෙබඳු නම් ඇත්තෝය කියාද. මෙබඳු ගොත් ඇත්තෝය කියාද, ඒ භාග්‍යවතුන්වහන්සේලා මාර්ගඵල ශීලාදිවශයෙන් මෙබඳු සිල් ඇත්තෝයකියාද, මාර්ගඵල සමාධීන්ගේ වශයෙන් මෙබඳු සමාධි ඇත්තෝය කියාද, මාර්ගඵල ප්‍රඥාදීන්ගේ වශයෙන් මෙබඳු ප්‍රඥා ඇත්තෝය කියාද, මෙබඳු නිරොධ සමාපත්ති විහරණ ඇත්තෝය කියාද, පටිප්පස්සද්ධිආදි පඤ්චවිමුක්තීන්ගේ වශයෙන් මෙබඳු විමුක්ති ඇත්තෝවූහයිදකියායි.

16. උදාහු දෙවතා තථාගතස්ස තමත්ථං ආරොචෙසුං යෙන තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුස්සරති නාමතොපි අනුස්සරති ගොත්තතොපි අනුස්සරති ආයුප්පමාණතොපි අනුස්සරති සාවකයුගතොපි අනුස්සරති සාවකසන්නිපාතතොපි අනුස්සරති එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං නාමා එවං ගොත්තා එවං සීලා එවං ධම්මා එවං පඤ්ඤා එවං විහාරී එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති. අයඤ්චහිදං තෙසං භික්ඛූනං අන්තරා කථා විප්පකතා හොති, අථ ඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන කරෙරිමණ්ඩලමාලො තෙනුපසඞ්කමි.

16. නැතහොත්, දෙවතාවෝ තථාගතයන්වහන්සේට මේ කාරණය සැළකළාහුද, ඒනම්, යම්හෙයකින් තථාගතයන්වහන්සේ පරිනිර්වාණයට පැමිණියාවූ අර්හත් මාර්ගඥාන නැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණා මාන දෘෂ්ටි ප්‍රපඤ්චඇති සිඳිනලද කුශලාකුශලකර්මඇති වනසනලද සකලකර්මාවෘතඇති සකලවිපාකාවෘත සඞ්ඛ්‍යාත දුඃඛස්කන්ධය ඉක්ම පැවැත්තාවූ අතීත බුදුවරයන් ජාතිවශයෙන් සිහිකළසේක්ද, ආයුප්‍රමාණවශයෙන් සිහිකළසේක්ද, ශ්‍රාවකයුග්මවශයෙන් සිහිකළසේක්ද, ශ්‍රාවක සන්නිපාතවශයෙනුත් සිහිකළසේක්ද, කෙසේද ඒ භාග්‍යවතුන්වහන්සේලා මෙබඳු ජාති ඇත්තෝවූහයි කියාද, මෙබඳුනම් ඇත්තෝය කියාද, මෙබඳු ගොත් ඇත්තෝය කියාද, ඒ භාග්‍යවතුන්වහන්සේලා මාර්ගඵලශීලාදි වශයෙන් මෙබඳු සිල් ඇත්තෝය කියාද, මාර්ගඵල සමාධීන්ගේ වශයෙන් මෙබඳු සමාධි ඇත්තෝය කියාද, මාර්ගඵල ප්‍රඥාදීන්ගේ වශයෙන් මෙබඳු ප්‍රඥා ඇත්තෝය කියාද, මෙබඳු නිරොධ සමාපත්ති විහරණ ඇත්තෝය කියාද, පටිප්පස්සද්ධි ආදි පඤ්චවිමුක්තීන්ගේ වශයෙන් මෙබඳු විමුක්ති ඇත්තෝවූහයිද කියායි. ඒ භික්ෂූන්ගේ සර්වඥයන්වහන්සේ සම්බන්ධි පූර්වේනිවාසානුස්මෘති ඥානය හා මහත් සෘද්ධිමත්භාවයපිළිබඳ මේ කථාන්තරය අඩාලවූවාවේ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ සවස්වේලෙහි එකීභාවයෙන් නැගී සිටිසේක් කරෙරිමණ්ඩපසමීපයෙහිවූ නිසීදනශාලාව යම්තැනෙක්හිද එතනට එළඹිසේක

උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා කාච පනවො අන්තරා කථා විප්පකතාති.

17. එවං වුත්තෙ තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං. ඉධ භන්තෙ අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො අයමන්තරාකථා උදපාදි. අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා, යත්‍රහිනාම තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොති අනුස්සරිස්සති නාමතොපි අනුස්සරිස්සති ගොත්තතොපි අනුස්සරිස්සති ආයුප්පමාණතොපි අනුස්සරිස්සති සාවකයුගතොපි අනුස්සරිස්සති සාවකසන්නිපාතතොපි අනුස්සරිස්සති එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං නාමා එවං ගොත්තා එවංසීලා

---

එළඹ පණවනලද අස්නෙහි වැඩඋන්සේක. භාග්‍යවතුන්වහන්සේ වැඩහිඳම ඒ භික්ෂූන් අමතූසේක. අමතා මහණෙනි, මෙහි තෙපි කිනම් කථාවකින් උන්නහුද, තොපගේ කිනම් කථාවක් අඩාල විදූයි විචාලසේක.

17. මෙසේ විචාලකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළෝස. ඒනම්, ස්වාමීන්වහන්ස. භාග්‍යවතුන්වහන්සේ වැඩ නොබෝ වේලාවූකල්හි මෙහි අපඅතුරෙහි මේ කථාන්තරය උපන්නේය. ඒකවරේදයත්, ආයුෂ්මත්නි. තථාගතයන්වහන්සේගේ මහත් සෘද්ධිමත් භාවයහාමහත් ආනුභාවඇතිබවආශ්චය්‍යයිඅද්භූතයි. යම් තථාගතකෙනෙක් පරිනිර්වාණයට පැමිණියාවූ අර්හත් මාර්ගඥාන නැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණා දෘෂ්ටිමාන ප්‍රපඤ්ච ඇති සිඳින ලද කුශලා කුශල කර්මවර්තඇති සකලවිපාකවෘත සඞ්ඛ්‍යාත දුඃඛස්කන්ධය ඉක්ම පැවැත්තාවූ අතීත බුදුවරයන් ජාතිවශයෙනුත් සිහිකළසේක්ද, ආයුප්‍රමාණවශයෙන්ද සිහිකළසේක්ද, ශ්‍රාවක යුග්මවශයෙනුත් සිහිකළසේක්ද, ශ්‍රාවක සන්නිපාතවශයෙනුත් සිහිකළසේක්ද, කෙසේද, ඒ භාග්‍යවතුන්වහන්සේලා මෙබඳු ජාති ඇත්තෝවූහයි කියාද, මෙබඳුනම් ඇත්තෝය කියාද, මෙබඳු ගොත් ඇත්තෝයයි කියාද, ඒභාග්‍යවතුන්වහන්සේලා මාර්ග ඵල ශීලාදිවශයෙන් මෙබඳු සිල්ඇත්තෝය කියාද.

එවං ධම්මා එවං පඤ්ඤා එවං විහාරී එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති.

18. කින්නුඛො ආවුසො තථාගතස්සෙව නුඛො එසා ධම්මධාතු සුප්පටිවිද්ධා. යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්න වට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුස්සරති නාමතොපි අනුස්සරති ගොත්තතොපි අනුස්සරති ආයුප්පමාණතොපි අනුස්සරති සාවකයුගතොපි අනුස්සරති සාවකසන්නිපාතතොපි අනුස්සරති. එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි. එවං නාමා එවං ගොත්තා එවං සීලා එවං ධම්මා එවං පඤ්ඤා එවං විහාරී එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති. උදාහු, දෙවතා තථාගතස්ස එතමත්ථං ආරොචෙසුං.

---

මාර්ගඵල සමාධින්ගේ වශයෙන් මෙබඳු. සමාධිඇත්තෝය කියාද, මාර්ගඵල ප්‍රඥාදිවශයෙන් මෙබඳු ප්‍රඥා ඇත්තෝය කියාද, මෙබඳු නිරොධසමාපත්ති විහරණ ඇත්තෝය කියාද,පටිප්පස්සද්ධිආදි පඤ්ච විමුක්තින්ගේ වශයෙන් මෙබඳු විමුක්ති ඇත්තෝදවූහයි කියායි.

18. ආයුෂ්මත්නි, කිමෙක්ද,තථාගතයන්වහන්සේවිසින්ම මේ ධර්‍මධාතුතොමෝ සර්‍වාකාරයෙන් ප්‍රතිවෙධකරණලද්දීද. ඒනම්, යම් ධර්‍මධාතුවක් තමා සර්‍වාකාරයෙන්ප්‍රතිවෙධකළබැවින් තථාගතයන්වහන්සේ පරිනිර්‍වාණයටපැමිණියාවූ අර්හත්මාර්ගඥානනැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණාමානදෘෂ්ටිප්‍රපඤ්චඇති සිඳිනලද කුශලාකුශලකර්‍මවර්ත්ත ඇති වනසනලද සකලකර්‍මාවෘතඇති සකලවිපාකාවෘත සඞ්ඛ්‍යාත දුඃඛස්කන්ධය ඉක්මපැවැත්තාවූ අතීත බුදුවරයන් ජාතිවශයෙන් සිහිකළසේක්ද, ආයුප්‍රමාණවශයෙන් සිහිකළසේක්ද, ශ්‍රාවකයුග්මවශයෙන් සිහිකළසේක්ද, ශ්‍රාවකසන්නිපාතවශයෙනුත් සිහිකළසේක්ද. කෙසේද, ඒ භාග්‍යවතුන්වහන්සේලා මෙබඳු ජාතිඇත්තෝය කියාද, මෙබඳු නම්ඇත්තෝය කියාද, මෙබඳු ගොත්ඇත්තෝය කියාද. ඒ භග්‍යවතුන්වහන්සේලා මාර්ගඵලශීලාදිවශයෙන් මෙබඳු සිල්ඇත්තෝය කියාද, මාර්ගඵලසමාධින්ගේවශයෙන් මෙබඳු සමාධි ඇත්තෝය කියාද, මාර්ගඵල ප්‍රඥාදින්ගේ වශයෙන් මෙබඳු ප්‍රඥාඇත්තෝය කියාද, මෙබඳු නිරොධසමාපත්තිවිහරණඇත්තෝය කියාද, පටිප්පස්සද්ධි ආදිපඤ්චවිමුක්තීන්ගේ වශයෙන් මෙබඳු විමුක්ති ඇත්තෝවූහයි කියායි. නැතහොත් දෙවතාවෝ තථාගතයන්වහන්සේට මේ කාරණය සැලකළාහුද.

යෙන තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුස්සරති, නාමතොපි අනුස්සරති, ගොත්තතොපි අනුස්සරති, ආයුප්පමාණතොපි අනුස්සරති, සාවකයුගතොපි අනුස්සරති, සාවකසන්නිපාතතොපි අනුස්සරති. එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවං නාමා එවං ගොත්තා එවං සීලා එවං ධම්මා එවං පඤ්ඤා එවං විහාරී එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති. අයං ඛො නො භන්තෙ අන්තරා කථා විප්පකතා, අථ භගවා අනුප්පත්තොති.

19. තථාගතස්සෙවෙසා භික්ඛවෙ ධම්මධාතු සුප්පටිවිද්ධා. යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ.

---

ඒනම්, යම්හෙයකින් තථාගතයන්වහන්සේ පරිනිර්වාණයට පැමිණියාවූ අර්හත්මාර්ගඥානනැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණාමානදෘෂ්ටිප්‍රපඤ්චඇති සිඳිනලද කුශලාකුශලකර්මවර්‍තඇති වනසනලද සකලකර්මාවර්‍තඇති සකලවිපාකාවර්‍තසඞ්ඛ්‍යාත දුඃඛසකන්ධය ඉක්මපැවැත්තාවූ අතීත බුදුවරයන් ජාතිවශයෙන් සිහිකෙරේද, ආයුප්‍රමාණ වශයෙන් සිහිකෙරේද, ශ්‍රාවකයුග්මවශයෙන් සිහිකෙරේද, ශ්‍රාවකසන්නිපාතවශයෙනුත් සිහිකෙරේද. කෙසේද, ඒ භාග්‍යවතුන්වහන්සේලා මෙබඳු ජාතිඇත්තෝවූහයි කියාද, මෙබඳු නම්ඇත්තෝය කියාද, මෙබඳු ගොත්ඇත්තෝය කියාද. ඒ භාග්‍යවතුන්වහන්සේලා මාර්ගඵලශීලාදි වශයෙන් මෙබඳු සිල් ඇත්තෝය කියාද, මාර්ගඵලසමාධීන්ගේ වශයෙන් මෙබඳු සමාධි ඇත්තෝය කියාද, මාර්ගඵලප්‍රඥාදීන්ගේ වශයෙන් මෙබඳු ප්‍රඥාඇත්තෝය කියාද, මෙබඳු නිරොධසමාපත්තිවිහරණ ඇත්තෝය කියාද, පටිප්පස්සද්ධිආදි පඤ්චවිමුක්තීන්ගේ වශයෙන් මෙබඳු විමුක්ති ඇත්තෝවූහයිද කියායි. ස්වාමීන්වහන්ස, සර්වඥයන්වහන්සේ සම්බන්ධි පූර්වේනිවාසානුස්මෘතිඥානය හා මහත් ඍද්ධිමත්භාවය පිළිබඳ අපගේ මේ කථාන්තරය අඩාලවූයේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වැඩිසේකැයි සැලකළෝය.

19. මහණෙනි, තථාගතයන්වහන්සේවිසින්ම මේ ධර්මධාතුතොමෝ සර්වාකාරයෙන් ප්‍රතිවෙධකරණලද්දීය. ඒනම්, යම් ධර්මධාතුවක් තමා සර්වාකාරයෙන් ප්‍රතිවෙධකළබැවින් තථාගතයන්වහන්සේ පරිනිර්වාණයට පැමිණියාවූ.

ඡිනනපපඤෙච ඡිනනවටුමෙ පරියාදිනනවටෙට සබබදුකඛවීතිවතෙත ජාතිතොපි අනුස්සරති,නාමතොපි අනුස්සරති, ගොතතතොපි අනුස්සරති,ආයුපපමාණතොපිඅනුස්සරති,සාවකයුගතොපි අනුස්සරති,සාවක සන්නිපාතතොපි අනුස්සරති. එවං ජච්චා තෙ භගවනෙතා අහෙසුං ඉතිපි, එවං නාමා,එවං ගොතතා, එවං සීලා,එවං ධම්මා, එවං පඤ්ඤා, එවං විහාරී එවං විමුතතා තෙ භගවනෙතා අහෙසුං ඉතිපීති. දෙවතාපි තථාගතස්ස එතමත්ථං ආරොචෙසුං, යෙන තථාගතො අතීතෙ බුඞෙ පරිනිබ්බුතෙ ඡිනනපපඤෙච ඡිනනවටුමෙ පරියාදිනනවට්ටෙ සබබදුකඛවීතිවතෙත ජාතිතොපි අනුස්සරති නාම තොපි අනුස්සරති ගොතතතොපි අනුස්සරති ආයුප්පමාණතොපි අනුස්සරති සාවකයුගතොපි අනුස්සරති.

අර්හත්මාර්ගඥානනැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණාමානදෘෂ්ටිප්‍රපඤ්ච ඇති සිඳිනලද කුශලාකුශලකර්මවර්ත්තඇති වනසනලද සකලකර්මවෘතඇති සකලවිපාකාවෘතසඞ්ඛ්‍යාත දුඃඛස්කන්ධය ඉක්මපැවැත් තාවූ අතීත බුදුවරයන් ජාතිවශයෙන් සිහිකෙරේද, ආයුප්‍රමාණ වශයෙන් සිහිකෙරේද, ශ්‍රාවකයුග්මවශයෙන් සිහිකෙරේද, ශ්‍රාවක සන්නිපාතවශයෙනුත් සිහිකෙරේද. කෙසේද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ජාතිඇත්තෝවූහයි කියාද, මෙබඳු නම් ඇත් තෝවූහයි කියාද, මෙබඳු ගොත්ඇත්තෝය කියාද, ඒ භාග්‍ය වතුන්වහන්සේලා මාර්ගඵලශීලාදි වශයෙන් මෙබඳු සිල්ඇත්තෝය කියාද, මාර්ගඵලසමාධීන්ගේ වශයෙන් මෙබඳු සමාධිඇත්තෝය කියාද, මාර්ගඵල ප්‍රඥාදීන්ගේ වශයෙන් මෙබඳු ප්‍රඥාඇත්තෝය කියාද, මෙබඳු නිරොධසමාපත්තිවිහරණ ඇත්තෝය කියාද, පටිප්පස්සඬි ආදි පඤ්චවිමුක්තීන්ගේ වශයෙන් මෙබඳු විමුක්ති ඇත්තෝවූහයිද කියායි. දෙවතාවෝද තථාගතයන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඒනම්, යම්හෙයකින් තථාගතයන්වහන්සේ පරි නිර්වාණයට පැමිණියාවූ අර්හත්මාර්ගඥානනැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණාමානදෘෂ්ටිප්‍රපඤ්චඇති සිඳිනලද කුශලාකුශලකර්මවර්ත්තඇති වනසනලද සකලකර්මාවර්ත්තඇති සකලවිපාකාවෘතසඞ්ඛ්‍යාත දුඃඛස්ක න්ධය ඉක්මපැවැත්තාවූ අතීතබුදුවරයන් ජාතිවශයෙන් සිහිකෙරේද, ආයුප්‍රමාණ වශයෙන් සිහිකෙරේද, ශ්‍රාවකයුග්ම වශයෙන් සිහි කෙරේද.

සාවකසන්නිපාතතොපි අනුස්සරති, එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි. එවං නාමා එවං ගොත්තා එවං සීලා එවං ධම්මා එවං පඤ්ඤා එවං විහාරී එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති. ඉච්ඡෙය්‍යාථ නො තුම්හෙ භික්ඛවෙ භීය්‍යොසොමත්තාය පුබ්බෙනිවාසපටිසංයුත්තං ධම්මිං කථං සොතුන්ති. එතස්ස භගවා කාලො එතස්ස සුගත කාලො යං භගවා භිය්‍යොසොමත්තාය පුබ්බෙනිවාසපටිසංයුත්තං ධම්මිං කථං කරෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති, තෙනහි භික්ඛවෙ සුණාථ. සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

---

ශ්‍රාවකසන්නිපාතවශයෙනුත් සිහිකෙරේද. කෙසේද, ඒ භාග්‍යවතුන්වහන්සේලා මෙබඳු ජාතිඇත්තෝවූහයි කියාද, මෙබඳු නම් ඇත්තෝය කියාද, මෙබඳු ගොත් ඇත්තෝය කියාද, ඒ භාග්‍යවතුන්වහන්සේලා මාර්ගඵලශීලාදි වශයෙන් මෙබඳු සිල්ඇත්තෝය කියාද, මාර්ගඵලසමාධීන්ගේ වශයෙන් මෙබඳු සමාධි ඇත්තෝය කියාද, මාර්ගඵලප්‍රඥාදීන්ගේ වශයෙන් මෙබඳු ප්‍රඥාඇත්තෝය කියාද, මෙබඳු නිරොධසමාපත්තිවිහරණ ඇත්තෝය කියාද, පටිප්පස්සද්ධිආදී පඤ්චවිමුක්තීන්ගේ වශයෙන් මෙබඳු විමුක්ති ඇත්තෝවූහයිද කියායි. මහණෙනි, තෙපි බොහෝසෙයින්ම පූර්වේනිවාස ප්‍රති සංයුක්තවූ ධාර්මික කථාවක් අසන්නට කිමෙක කැමැත්තහු දැයි විචාළසේක. යම්හෙයකින් භාග්‍යවතුන්වහන්සේ බොහෝසෙයින් පූර්වේනිවාසප්‍රතිසංයුක්තවූ ධාර්මිකකථා කරණසේක් නම් භාග්‍යවතුන්වහන්ස, මේ ඊට සුදුසුකාලයයි. සුගතයන්වහන්ස, මේ ඊට සුදුසුකාලයයි. භාග්‍යවතුන්වහන්සේ වෙතින් අසා භික්ෂූහු දරාගන්නාහුයයි සැලකළෝය. මහණෙනි, එසේනම් අසව්. මනාකොට මෙනෙහිකරව්. කියන්නෙමියි වදාළෝ. පින්වතුන්වහන්ස, එසේ මැනවැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන්වහන්සේ පූර්වේනිවාසප්‍රතිසංයුක්තවූ මේ වක්ෂ්‍යමානධර්ම කථාව වදාළසේක.

20 ඉතො සො භික්ඛවෙ එකනවුතො කප්පො යං විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි, ඛත්තියකුලෙ උදපාදි. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො කොණ්ඩඤ්ඤො ගොත්තෙන අහොසි. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසීතිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො පාටලියා මූලෙ අභිසම්බුද්ධො. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඛණ්ඩතිස්සංනාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස තයො සාවකානං සන්නිපාතා අහෙසුං. එකො සාවකානං සන්නිපාතො අහොසි අඩ්ඪඅට්ඨභික්ඛුසතසහස්සං, එකො සාවකානං සන්නිපාතො අහොසි භික්ඛුසතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි අසීතිභික්ඛුසතසහස්සානි, විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නිපාතා අහෙසුං සබ්බෙසංයෙව ඛීණාසවානං.

20. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සීභාග්‍යවතුන්වහන්සේ යම්කලෙක ලොවපහලවූසේක්ද ඒ මෙයින් අනූඑක්වෙනිකල්පයයි. මහණෙනි, අර්හත්සම්‍යක්සම්බුද්ධවූ විපස්සීභාග්‍යවතුන්වහන්සේ ජාතියෙන් ක්‍ෂත්‍රිය වූයේය. ක්‍ෂත්‍රියකුලයෙහි උපන්සේක. මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤනම් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සීභාග්‍යවතුන්වහන්සේට අසූදහසක් අවුරුදු ආයුප්‍රමාණ විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේ පළොල් රුකමුලදී චතුස්සත්‍යාවබොධකළසේක. මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේට ශ්‍රෙෂ්ඨයුග්මයක්වූ ඛණ්ඩය, තිස්සය, යන නම්ඇති ශ්‍රාවකයුග්මයක් වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සීභාග්‍යවතුන්වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක් වූයේය. අටසැටලක්‍ෂයක් භික්ෂූන් ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක් විය. භික්ෂූන් ලක්‍ෂයක් ඇති එක් ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේය, අසූදහසක් භික්‍ෂූන් ඇති එක්ශ්‍රාවකසන්නිපාතයෙක්වූයේය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේට සියල්ලන්ම අර්හත් භික්‍ෂූන්ගෙන් යුක්තවූ මේ ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණවූයේය.

විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසොකො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බන්ධුමා නාම රාජා පිතා අහොසි, බන්ධුමතී නාම දෙවී මාතා අහොසි ජනෙත්ති, බන්ධුමස්ස රඤ්ඤො බන්ධුමතී නාම නගරං රාජධානී අහොසි.

21. අථ ඛො භික්ඛවෙ විපස්සී බොධිසත්තො තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමි. අයමෙත්ථ ධම්මතා. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමති. අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති. අතික්කම්ම දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා.

---

මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේට අග්‍රලෙස උපස්ථානකරන්නාවූ අශොකනම් භික්ෂුකෙනෙක් උපස්ථායක වූයේය. මහණෙනි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන්වහන්සේට බන්ධුමානම් රජතෙම පියවූයේය. බන්ධුමතීනම්දේවී තොමෝ ජනකම්මවීය, බන්ධුමා රජහට බන්ධුමතීනම් නුවර රාජධානීවීය.

21. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බොධිසත්වයන්වහන්සේ තුෂිතදිව්‍යනිකායෙන් චුතව සමෘතිසම්ප්‍රඥඇතිසේක් හෙවත් ඥානයෙන් පිරිසිඳදත්සේක් මව්කුසට බැසගත්තේය හෙවත් එකුන්විස්සක් ප්‍රතිසන්ධිචිත්තයන් අතුරෙන් මෛත්‍රීපූර්වභාගීයවූ සොම්නස්සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික කුසලචිත්තයට සමානවූ මහාවිපාක සිතින් මව්කුස පිළිසිඳගත්තේය. මේ බොධිසත්වයන්වහන්සේලා මව්කුස පිළිසිඳගැන්ම පිළිබඳ ධර්මතාවයි හෙවත් නියමයයි. මහණෙනි, මේ කියනුලබන්නේද ධර්මතාවයකි. ඒනම්, යම්කලෙක බොධිසත්වතෙමේ තුෂිතදිව්‍යනිකායෙන් චුතව මව්කුස පිළිසිඳගත්තේවේද එකල්හි දෙවියන්සහිතවූ, මරුන්සහිතවූ, බඹුන්සහිතවූ, ලොකයෙහිද මහණබමුණන්සහිතවූ දෙව්මිනිසුන්සහිතවූ ප්‍රජාවගකරෙහිද දසදහසක්සක්වල පැතිරෙණහෙයින් ප්‍රමාණාතික්‍රාන්තවූ ආලොකයක් දෙවියන්ගේ දිව්‍යානුභාවය හෙවත් අතිශයින් බබලන හෙයින් මහත්වූ දිව්‍යප්‍රභාව ඉක්මවා පහලවූයේය. වෘක්ෂාදීන්ගේ වශයෙන් කිසිතැනක ගැටීමක්නැතිහෙයින් නිරන්තරයෙන් විවතවූ යටපිහිටීමක්නැත්තාවූ නොහොත් කිසිවකින්නොවසනලද්දවූ.

අන්ධකාරා අන්ධකාරතිමිසා, යත්ථපිමෙ චන්දිමසුරියා එවං මහිද්ධිකා එවං මහානුභාවා ආභාය නානුභොන්ති. තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති. අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති. අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නාති. අයඤ්ච දසසහස්සිලොකධාතු සංකම්පති සම්පකම්පති සම්පවෙධති අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. අයමෙත්ථ ධම්මතා,

22. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. චත්තාරො නං දෙවපුත්තා චතුද්දිසං රක්ඛාය උපගච්ඡන්ති.

---

අඳුරඇත්තාවූ චක්ෂුර්විඥානයාගේ ඉපදීම වළක්වනහෙයින් ඝණඳුරු ඇත්තාවූ සක්වළවල් තුණක් අතුරෙහි එක්ලොකාන්තරිකයක් බැගින්වූ යම්පමණ ලොකාන්තරික නරකයෝ වෙද්ද. එකක්ෂණයෙහි විපත්‍රයෙහි පෙණෙනුලබනහෙයින් ප්‍රසිද්ධ සෘද්ධිඇත්තාවූ එක් දිශාවක් පාසා නවලක්ෂයක් පමණ තැන අන්ධකාර විධ්වංශනය කොට ආලොකකරණහෙයින් ප්‍රසිද්ධ ආනුභාව ඇත්තාවූ මේ සඳහිරු පවාත් යම්තැනෙක්හි තමන්ගේ ආලොකයෙන් බබුලුවන්ට නොහැකිවෙත්ද. ඒ ලොකාන්තරික නරකයෙහිද දෙවියන්ගේ දිව්‍ය ප්‍රභාවට වැඩිවූ ප්‍රමාණාතික්‍රාන්තවූ මහත් ආලොකය පහලවෙයි. ඒ ලොකාන්තරික නරකයෙහි යම් ඒ සත්ත්වකෙනෙක් උපන්නාහුද. ඒ සත්ත්වයෝද ඒ ආලොකයෙන් ඔවුනොවුන් හඳුනත් හෙවත් දැන ගනිත්. කෙසේද, පින්වත්නි, යම්සේ අපි මෙහි මහදුක් අනුභවකර මුද. එපරිද්දෙන් දුක්විඳින්නාවූ මෙහි උපන් අන්‍ය සත්ත්වයෝද, ඇත් තාහයි කියායි. (මව්පියන්ට හා දැහැමි මහණබමුණන්ට අපරාධ කිරීමය, අන්‍යවූද දවසක්පාසා පැවති ප්‍රාණවධාදි කර්මය යන බලවත් අකුශලකර්මහෙතුවෙන් ඒ ලොකාන්තරික නරකයෙහි උපදිත්.) මේ දශසහස්‍ර ලොකධාතුවද කම්පිතවෙයි. ඉතාවැඩියක් කම්පාවෙයි. වැඩියක් වෙව්ලයි. ප්‍රමාණාතික්‍රාන්තවූ මහත්ආලොකය දෙවියන්ගේ දිව්‍යප්‍රභාව ඉක්මවා පහලවෙයි. මේ කියනලද්දේ මෙහි ධර්මතාවයි,

22. මේ කියනුලබන්නීද ධර්මතාවකි. ඒනම්, යම්කලෙක, බොධිසත්ත්වයන්වහන්සේ මව්කුස පිළිසිඳගත්සේක්ද, එකල්හි දිව්‍යපුත්‍රයෝ සතරදෙනෙක් සිව්දිග ආරක්ෂාවපිණිස එළඹෙත්.

---

මාතාං බෝධිසත්තං වා බොධිසත්තමාතරං වා මනුස්සො වා අමනුස්සො වා කොචි වා විහෙඨෙසීති, අයමෙත්‍ථ ධම්මතා.

23. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. පකතියා සීලවතී බොධිසත්තමාතා හොති විරතා පාණාතිපාතා, විරතා අදින්නාදානා, විරතා කාමෙසුමිච්ඡාචාරා, විරතා මුසාවාදා, විරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා, අයමෙත්‍ථ ධම්මතා.

24. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති න බොධිසත්තමාතුපුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං. අනතික්කමනීයාච බොධිසත්තමාතා හොති කෙනචි පුරිසෙන රත්තචිත්තෙන. අයමෙත්‍ථ ධම්මතා.

25. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. ලාභිනී බොධිසත්තා මාතා හොති පඤ්චන්නං කාමගුණානං. සා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙති. අයමෙත්‍ථ ධම්මතා.

---

ඒ බොධිසත්වයන්වහන්සේ හෝ බොධිසත්වයන්වහන්සේගේ මව මනුෂ්‍යයෙක් හෝ අමනුෂ්‍යයෙක් හෝ පාංශුපිශාචාදි අන්කිසිවෙක් නොපෙළාවායි කියායි. මේ මෙහි ධර්මතාවයි.

23. මේ කියනුලබන්නීද ධර්මතාවකි. මහණෙනි, යම්කලෙක බොධිසත්වයන්වහන්සේ මව්කුසට පැමිණියේ වේද, ස්වභාවයෙන්ම බොධිසත්ව මාතෘතොමෙ සිල්ඇත්තියක් වේ. ප්‍රාණඝාතයෙන් වැළැක්කී වෙයි. අයිනාදනින් වැළැක්කී වෙයි. කාමමිථ්‍යාචාරයෙන් වැළැක්කී වෙයි. බොරුකීමෙන් වැළැක්කා වෙයි. මදප්‍රමාද දෙකට කාරණාවූ රහමෙරපානයෙන් වැළැක්කා වෙයි. මේ මෙහි ධර්මතාවයි.

24 මේ කියනුලබන්නීද ධර්මතාවකි. මහණෙනි, යම්කලෙක බොධිසත්වයන්වහන්සේ මව්කුසට පැමිණියේ වේද; එකල්හි බොධිසත්වයන්වහන්සේගේ මවට බොධිසත්වයන්ගේ පියානන් ආදිකොට ඇති කිසියම් පුරුෂයන් කෙරෙහි පඤ්චකාමගුණ සහගතවූ සිතක් නොඋපදී. රාගසිත්ඇති කිසියම් පුරුෂයෙකුවිසින් බොධිසත්වයන්වහන්සේගේ මව්තොමෝ අභිභවනය නොකටහැක්කීද වෙයි. මේ ගර්භාවක්‍රමණයෙහි ධර්මතාවයි.

25. මේ කියනුලබන්නීද ධර්මතාවකි. මහණෙනි, යම්කලෙක බොධිසත්වයන්වහන්සේ මව්කුසට බැසගත්තේ වේද, එකල්හි බොධිසත්ව මාතෘතොමෝ පඤ්චකාමගුණයන් සම්බන්ධ ලාභඇත්තියක් වේ. ඕතොමෝ පඤ්චකාමගුණයන්ගෙන් පමුණුවනලද්දී සමඟිවූවාවූ ඉන්ද්‍රියයන් හසුරුවාලයි. මේ මෙහි ධර්මතාවයි.

26. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති. න බොධිසත්තමාතු කොචිදෙව ආබාධො උප්පජ්ජති, සුඛිනී බොධිසත්තමාතා හොති. අකිලන්තකායා බොධිසත්තංච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. සෙය්‍යථාපි භික්ඛවෙ මණී වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො සබ්බාකාරසම්පන්නො. තත්‍රාස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය, අයං ඛො මණී වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො සබ්බාකාරසම්පන්නො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වාති. එවමෙව ඛො භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති න බොධිසත්තමාතු කොචිදෙව ආබාධො උප්පජ්ජති.

---

26. මේ කියනුලබන්නීද ධර්මතාවකි. මහණෙනි, යම්කලෙක බෝධිසත්වයන්වහන්සේ මව්කුසට ඇතුළත්වූයේ වේද, එකල්හි බෝධිසත්ව මාතෘහට කිසියම් ආබාධයක් නූපදී, බෝධිසත්ව මාතෘතොමෝ සැපඇත්තියක් වේ. බෝධිසත්ව මාතෘතොමෝ ක්ලාන්ත නොවූ ශරීර ඇත්තිම කුසතුළට පැමිණියාවූ හීනනොවූ හෙවත් සම්පූර්ණ ඉන්ද්‍රියයන්ඇති සියලු අඟපසඟ ඇත්තාවූ බෝසත්හු දකී. මහණෙනි, යහපත්වූ ජාතිමත්වූ අටැස්වූ මනාකොට පරිකර්ම කරණලද්දාවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ සියලු අයුරින් සම්පූර්ණවූ වෙරළුමිණියක් යම්සේද ඒ මැණික පිළිබඳ සිදුරෙහි නිල්හුයක් හෝ රන්වන්හුයක් හෝ ලෙහෙවන් හුයක් හෝ සුදුහුයක්හෝ පඬුවන් හුයක් හෝ අමුණනලද්දේ වේද ඒ හුය සහිත මැණික චක්ෂුර්විඥාන බලය ඇති පුරුෂයෙක් අතටගෙණ නුවණින් සලකන්නේද, කෙසේද මේ වෛඩූර්‍ය්‍යමාණික්‍යයවූකලී යහපත්ය. යහපත් ජාති ඇත්තේය අටැස්ය මනාකොට ඔපදැමීමාදියෙන් පරිකර්මකරණලද්දේය. නිර්මලය විශෙෂයෙන් ප්‍රසන්නය, සර්වාකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නිල්හුයහෝ මේ රන්වන්හුයහෝ මේ සුදුහුයහෝ මේපඬුවන්හුය හෝ අමුණනලද්දේය කියායි. මහණෙනි, එපරිද්දෙන්ම යම්කලෙක බොධිසත්වයන්වහන්සේ මව්කුසට ඇතුළත්වූයේවේද එකල්හි බොධිසත්ව මාතෘහට කිසියම් ආබාධයක් නූපදී.

සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා බොධිසත්තඤ්ච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති, සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. අයමෙත්ථ ධම්මතා.

27. ධම්මතා එසා භික්ඛවෙ සත්තාහජාතෙ බොධිසත්තෙ බොධිසත්තමාතා කාලංකරොති. තුසිතං කායං උපපජ්ජති, අයමෙත්ථ ධම්මතා.

28. ධම්මතා එසා භික්ඛවෙ යථා අඤ්ඤා ඉත්ථිකා නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරිත්වා විජායන්ති, න හෙවං බොධිසත්තං බොධිසත්තමාතා විජායති. දසෙව මාසානි බොධිසත්තං බොධිසත්තමාතා කුච්ඡිනා පරිහරිත්වා විජායති. අයමෙත්ථ ධම්මතා.

29. ධම්මතා එසා භික්ඛවෙ යථා අඤ්ඤා ඉත්ථිකා නිසින්නාවා නිපන්නාවා විජායන්ති. නහෙවං බොධිසත්තං බොධිසත්තමාතා විජායති. ඨිතාව බොධිසත්තං බොධිසත්තමාතා විජායති. අයමෙත්ථ ධම්මතා.

30. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති දෙවා පඨමං පතිගණ්හන්ති පච්ඡා මනුස්සා. අයමෙත්ථ ධම්මතා.

---

බොධිසත්ව මාතෘතොමෝ සැපඇත්තියක්වේ. බොධිසත්ව මාතෘතොමෝ ක්ලාන්තනුවූ ශරීරඇත්තියක්වෙයි. බොධිසත්ව මාතෘතොමෝ සියලු අඟපසඟ ඇත්තාවූ හීනනුවූ හෝ සම්පූර්ණඉන්ද්‍රියයන් ඇති කුශතුලටපැමිණියාවූ බොධිසත්වයන් දකී. මේමෙහි ධර්මතාවයි.

27. මේ කියනුලබන්නීද ධර්මතාවකි, මහණෙනි, බොධිසත්වයන් උපන් සත්වෙනිදිනයෙහි බොධිසත්ව මාතෘතොමෝ කලුරියකෙරේ. තුෂිතදිව්‍යනිකායෙහි උපදී, මේ මෙහි ධර්මතාවයි.

28. මේ කියනුලබන්නීද ධර්මතාවකි, අන්‍ය ස්ත්‍රීහු නවමාසයක් හෝ දසමාසයක් ගැබක්කුසින් පරිහරණයකොට යම්සේ වදත්ද එපරිද්දෙන්ම බොධිසත්ව මාතෘතොමෝ බොධිසත්වයන් නොවදයි බොධිසත්ව මාතෘතොමෝ බොධිසත්වයන් දසමසක් මුලුල්ලේහි කුසින් පරිහරණයකොට වදයි. මේ මෙහි ධර්මතාවවූ නිශ්චයයි.

29. මේ කියනුලබන්නීද ධර්මතාවකි, මහණෙනි, යම්සේ අන්‍ය ස්ත්‍රීහු නිසීදනය කලෝ හෝ ශයනයට පැමිණියෝ වදත්ද, එපරිද්දෙන් බොධිසත්ව මාතෘතොමෝ බොධිසත්වයන් නොවදයි, බොධිසත්ව මාතෘතොමෝ සිටියාම බොධිසත්වයන් වදයි. මේ මෙහි ධර්මනිශ්චයයි.

30. මේ කියනුලබන්නීද ධර්මතාවකි, මහණෙනි යම්කලක බොසත්වතෙමේ මව්කුසින් නික්මේද දෙවියෝ පළමුකොටම පිළිගණිත්, පසුව මනුෂ්‍යයෝ පිළිගණිත්, මේමෙහි ධර්මතාවයි.

31. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතු කුච්ඡිස්මා නික්ඛමති. අප්පත්තොව බොධිසත්තො පඨවිං හොති. චත්තාරො නං දෙවපුත්තා පටිග්ගහෙත්වා මාතු පුරතො ඨපෙන්ති, අත්තමනා දෙවී හොහි මහෙසක්ඛො තෙ පුත්තො උප්පන්නොති. අයමෙත්ථ ධම්මතා.

32. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති විසදෙව නික්ඛමති අමක්ඛිතො උද්දෙන අමක්ඛිතො සෙම්හෙන අමක්ඛිතො රුහිරෙන අමක්ඛිතො කෙනචි අසුචිනා. සුද්ධො විසදො. සෙය්‍යථාපි භික්ඛවෙ මණිරතනං කාසිකෙ වත්ථෙ නික්ඛිත්තං නෙව මණිරතනං කාසිකං වත්ථං මක්ඛෙති නපි කාසිකං වත්ථං මණිරතනං මක්ඛෙති. තං කිස්ස හෙතු. උභින්නං සුද්ධත්තා. එවමෙව බො භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති විසදෙව නික්ඛමති අමක්ඛිතො උදෙදන අමක්ඛිතො සෙම්හෙන.

31. මේ කියනුලබන්නීද ධර්මතාවකි. මහණෙනි, යම්කලෙක බෝධිසත්වතෙමේ මව්කුසින් නික්මේද, එකල්හි බෝධිසත්වතෙමේ පෘථිවියට නොපැමිණියේම වේ. දිව්‍යපුත්‍රයෝ සතරදෙනෙක් ඒ බෝධිසත්වයන් පිළිගෙණ මෑනියන්ගේ ඉදිරියෙහි තබති, දේවිනි තිට මහානුභාව ඇති පුතෙක් උපන්නේය, දේවිය සතුටුවෙවයි, මේ මෙහි ධර්මතාවයි.

32. මේ කියනුලබන්නිද ධර්මතාවකි, මහණෙනි, යම්කලෙක බෝධිසත්වතෙමේ මව්කුසින් නික්මේද එකල්හි අලග්නව හෙවත් මලරහිතව නික්මෙයි. ජලයෙන් නොතැවරෙණ ලද්දේවේ. සෙමින් නොතැවරෙණලද්දේ වේ, ලෙයින් නොතැවරෙණලද්දේ වේ, එසේම අන්‍යවූ කිසියම් අසූචියකින් නොතැවරෙණ ලද්දේවේ, පිරිසිදුවෙයි අත්‍යර්ථයෙන් නිර්මලවේ. මහණෙනි, කසිරට වස්ත්‍රයෙක්හි බහාලද්දාවූ මාණික්‍යරත්නයක් යම්සේද ඒ මාණික්‍යරත්නයතෙම කසිදෙශයෙහි උපන්වස්ත්‍රය ඒ මාණික්‍ය කාන්තියෙන් ගැල්වීම නොකෙරේමය, කාසික වස්ත්‍රයතෙමේද ඒ මාණික්‍යය වස්ත්‍රකාන්තියෙන් ගැල්වීම නොකෙරේමය. ඊට හෙතු කවරේදයත්, මාණික්‍යය කාසිකවස්ත්‍රය යන දෙදෙනාගේම පිරිසිදු බැවිනි. මහණෙනි, එපරිද්දෙන්ම යම් කලෙක බෝධිසත්වතෙමේ මව්කුසින් නික්මේද, නිර්මලවම නික්මෙයි. ජලයෙන් නොතැවරෙණලද්දේය. සෙමින් නොතැවරෙණ ලද්දේය.

අමක්ඛිතො රුහිරෙන අමක්ඛිතො කෙනචි අසුචිනා. සුද්ධො විසදෙ. අයමෙත්ථ ධම්මතා.

33, ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති වෙ උදකස්සධාරා අන්තලික්ඛා පාතුභවන්ති. එකා සීතස්ස එකා උණ්හස්ස. යෙන බොධිසත්තස්ස උදකකිච්චං කරොන්ති මාතුච්ච. අයමෙත්ථ ධම්මතා.

34, ධම්මතා එසා භික්ඛවෙ සම්පති ජාතො බොධිසත්තො සමෙහි පාදෙහි පතිට්ඨහිත්වා උත්තරාභිමුඛො සත්තපදවීතිහාරෙ ගච්ඡති. සෙතම්හි ඡත්තෙ අනුහීරමානෙ සබ්බාච දිසා විලොකෙති. ආසභිඤ්ච වාචම්භාසති අග්ගො හමස්මි ලොකස්ස, ජෙට්ඨො හමස්මි ලොකස්ස, සෙට්ඨො හමස්මි ලොකස්ස, අයමන්තිමා ජාති, නත්ථි දානි පුනබ්භවොති. අයමෙත්ථ ධම්මතා.

35, ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිස්මා නික්ඛමති. අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං.

---

ලෙයින් නොතැවරෙණ ලද්දේය. අන්‍යවූද කිසියම් අසුචියකින් නො තැවරෙණ ලද්දේය. පිරිසිදුවෙයි. අත්‍යපීයෙන් නිර්මලවෙයි. මේ මෙහි ධර්මතාවයි.

33, මේ කියනුලබනකාරණයද ධර්මතාවකි. යම්කලෙක බොධිසත්වතෙම මව්කුසින් නික්මේද, එකල්හි යමකින් බොධිසත්ව යන්ගේ හා මවගේ ජලකිස කෙරෙත්ද, එබදුවූ ජලධාරා දෙකක් අහසින් පහලවෙත්. එයින් එකක් සීත ජලයයි. එකක් උෂ්ණ ජල යයි. මේ මෙහි ධර්මතාවයි.

34, මේ කියනුලබන්නීද ධර්මතාවකි. බොධිසත්වයන්වහන්සේ උපන්සේක්ම බ්‍රහ්ම දෙවමනුෂ්‍යයන්ගේ අතින් පොළවට බැස සම පාදයන්ගෙන් පොළවේ පිහිටා උතුරු දිගට අභිමුඛවූයේ ශ්වෙතච්ඡත්‍රය දරණු ලබමින් සත්පියවරක් ඉදිරියට ගමන්කෙරේ. සියලු දිගුන් විලොකනයකෙරේ. මම ලොවට අග්‍රවෙමි. මම ලොවට ජ්‍යෙෂ්ඨවෙමි. මම ලොවට ශ්‍රෙෂ්ඨවෙමි. මේ අවසාන ජාතියයි. දැන්මට මෙයින්මත්තෙහි පුනර්භවසඞ්ඛ්‍යාත පුනරුත්පත්තියක් නැතැයි උතුම් වදන් කියනසේක. මේ මෙහි ධර්මතාවයි.

35, මේ කියනුලබන්නීද ධර්මතාවකි. යම්කලෙක බොධිසත්ව තෙමේ මව්කුසින් නික්මේද එකල්හි දෙවියන්සහිතවූ මරුන්සහිතවූ බඹුන්සහිතවූ ලොකයෙහිද මහණබමුණන්සහිතවූ දෙවිමිනිසුන්සහිතවූ ප්‍රජාව කෙරෙහිද ප්‍රමාණාතික්‍රාන්තවූ මහත් ආලොකයක් දෙවියන්ගේ දිව්‍යප්‍රභාව ඉක්මවා පහලවේ.

36. යා පිතා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාර තිමිසා, යත්ථපි මෙ චන්දිමසුරියා එවං මහිද්ධිකා එවංමහානුභාවා ආභාය නානුභොන්ති. තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති. අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති. අඤ්ඤෙපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නාති. අයඤ්ච දසසහස්සි ලොකධාතු සංකම්පති, සම්පකම්පති, සම්පවෙධති, අප්පමාණොච උළාරො ඔභාසො ලොකෙ පාතුභවති. අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. අයමෙත්ථ ධම්මතා.

37 ජාතෙ ඛො පන භික්ඛවෙ විපස්සිම්හි කුමාරෙ.

---

36. වෘක්ෂාදීන්ගේ වශයෙන් කිසිතැනක ගැටීමක්නැතිහෙයින් නිරන්තරයෙන් විවෘතවූ යටපිහිටීමක් නැත්තාවූ හෙවත් කිසිව කින් නොවසනලද්දවූ අඳුරඇත්තාවූ චක්ෂුර්විඥනයාගේ ඉපදීම වළක්වනහෙයින් ඝණඳුරුඇත්තාවූ සක්වළවල් තුණක් අතුරෙහි එක් ලොකාන්තරිකයක් බැගින්වූ යම්පමණ ලොකාන්තරික නරක යෝ වෙද්ද, එකසෂණයෙහි විපත්‍රයෙහි පෙණෙනුලබනහෙයින් ප්‍රසිධ්ධ සෘධිඇත්තාවූ එක්දිශාවක් පාසා නවලක්‍ෂයක්පමණ තැන අන්ධකාර විධ්වංශනයකොට ආලොකකරණහෙයින් ප්‍රසිධ්ධ ආනුභාව ඇත්තාවූ මේ සඳහිරු පවාත් යම්තැනෙක්හි තමන්ගේ ආලොක යෙන් බබුලුවන්ට නොහැකිවෙත්ද. ඒ ලොකාන්තරික නරකයෙහිද දෙවියන්ගේ දිව්‍යප්‍රභාව ඉක්මවා ප්‍රාමාණාතික්‍රාන්තවූ මහත්වූ ආලොකය පහළවෙයි. ඒ ලොකාන්තරික නරකයෙහි යම් ඒ සත්ව කෙනෙක් උපන්නාහුද ඒ සත්වයෝද ඒ ආලොකයෙන් ඔවුනොවුන් හඳුනත් හෙවත් දැනගනිත්. කෙසේද, පින්වත්නි, යම්සේ අපි මෙහි මහදුක් අනුභවකරමුද. එපරිද්දෙන් දුක්විඳින්නාවූ මෙහි උපන් අන්‍ය සත්වයෝද ඇත්තාහයි කියායි. (මව්පියන්ට හා දැහැමි මහණ බමුණන්ට අපරාධකිරීමය. අන්‍යවූද දවසක් පාසා පැවති ප්‍රාණවධාදි කර්‍මය යන බලවත් අකුශලකර්‍මහෙතුවෙන් මේ ලොකාන් තරික නරකයෙහි උපදිත්.) මේ දශසහශ්‍රී ලොකධාතුවද කම්පිත වෙයි. ඉතා වැඩියක් කම්පාවෙයි. වැඩියක් වෙව්ලයි. ප්‍රාමාණාති ක්‍රාන්තවූ මහත් ආලොකය දෙවියන්ගේ දිව්‍යප්‍රභාව ඉක්මවා පහළ වෙයි. මේ කියනලද්දේහි ධර්‍මතාවයි.

37. මහණෙනි, විපස්සීකුමාරයා ලොවපහළවූ කල්හිම.

බන්ධුමතො රඤ්ඤො පටිවෙදෙසුං. පුත්තො තෙ දෙව ජාතො. තං දෙවො පස්සතූති. අද්දසා ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිං කුමාරං. දිස්වා නෙමිත්තෙ බ්‍රාහ්මණෙ ආමන්තාපෙත්වා එතදවොච. පස්සන්තු භොන්තො නෙමිත්තා බ්‍රාහ්මණා කුමාරන්ති. අද්ද සාසුං ඛො භික්ඛවෙ නෙමිත්තා බ්‍රාහ්මණා විපස්සිං කුමාරං. දිස්වා බන්ධුමං රාජානං එතදවොචුං. අත්තමනො දෙව හොහි. මහෙසක්ඛො තෙ දෙවපුත්තො උප්පන්නො. ලාභා තෙ මහාරාජ. සුලද්ධං තෙ මහා රාජ, යස්ස තෙ කුලෙ එවරූපො පුත්තො උප්පන්නො, අයංහි දෙව කු මාරො ද්වත්තිංස මහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො. යෙහි සමන්නා ගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො භවන්ති. අනඤ්ඤා. සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්තී ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති.

---

දේවයන්වහන්ස, ඔබට පුතෙක් උපන්නේය දේවයන්වහන්සේ, ඒපුත්‍ර දකිවායි බන්ධුමා රජහට දැන්වූහ. මහණෙනි, බන්ධු මා නම් රජතෙම විපස්සි කුමාරයා දුටුයේමය. දැක ලක්‍ෂණ නිමිත්ත පාඨක බ්‍රාහ්මණයන් අමතා මෙය කීයේය. පින්වත්වූ නිමිත්තලක්‍ෂ ණපාඨක බ්‍රාහ්මණයෝ මේ කුමාරයා බලත්වායි. මහණෙනි, නිමිත්තපාඨක බ්‍රාහ්මණයෝ විපස්සි කුමාරයා දුටුවාහුමය. දැක බන්ධුමන්තු රජහට මේ කාරණය කීහ. දේවයන්වහන්ස, නුඹවහන්සේ සතුටුසිත්ඇත්තෙක් වුවමැනව. දේවයන්වහන්ස. නුඹවහන්සේට මහානුභාවඇති පුතෙක් උපන. යම්බඳුවූ නුඹ වහන්සේගේ කුලයෙහි මෙබඳු කුමාරයෙක් උපන්නේද, මහරජ නුඹවහන්සේට ලාභයි. මහරජ නුඹවහන්සේවිසින් යහපතක් ලබනලද්දේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම දෙතිස්මහ පුරිස්ලකුණෙන් යුක්තසේක. ඒ කවරහුදයත්, යම් ලක්‍ෂණයන් ගෙන් යුක්තවූ මහාපුරුෂයෙකුගේ ගතිදෙකක්ම වෙත්ද, අනික් ගතියක් නොවේද. ඒනම්, ඉදින් ගිහිගෙයි වාසයකෙරේනම් ධාර්මිකවූ ධර්මරාජන්වූ චාතුර්ද්වීපාධිපතිවූ හෙවත් සාර්වභෞමවූ දිනනලද ප්‍රති භයකාරණා ඇත්තාවූ ජනපදයන්හි ස්ථාවරබවට පැමිණියාවූ සප්ත රත්නයෙන් යුක්තවූ සක්විතිරජවෙයි. ඒ රජහුගේ මේ සප්තරත්න කෙනෙක් වෙත්.

සෙය්‍යථිදං, චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවට්ටච්ඡද්දො.

38. කතමෙහි චායං දෙවකුමාරො ද්වත්තිංස මහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො. යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො භවන්ති අනඤ්ඤා. සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති. සෙය්‍යථිදං, චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං.

---

ඔව්හු කවරහුදයත්, චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මාණික්‍යරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත්වෙනි කොට ඇති පරිනායකරත්නය යන මොව්හුයි. ඕහට වනාහි බියසුලු නොවූ වියයීයෙන් කරණලද්දක්වැනි රූපඇත්තාවූ පරසෙන් මඩින්නාවූ පුත්‍රයෝ දහසකට වැඩිවෙත්. ඒ සක්විතිරජතෙමේ සයුරකෙළවරකොටඇති මේ පෘථිවිය දණ්ඩනරහිතවූ සැත්රහිතවූ; දැහැමින් ජයගෙණ අධිපතිව වෙසේ. ඉදින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේනම් ලොකයෙහි විවෘතකරණලද රාගාදිකෙලෙස් නැමති සෙවෙනි ඇති අහිත් සම්‍යක්සම්බුඩ වෙයි.

38. දේවයන්වහන්ස, මේ කුමාරතෙම කවරනම් දෙතිස්මහපුරිස් ලකුණුවලින් යුක්තසේක්දයත්, යම් ලකුණුවලින් යුක්තවූ මහාපුරුෂයෙකුගේ ගති දෙකක්ම වෙත්ද, අනික් ගතියක් නොවේද ඒනම්, ඉදින් ගිහිගෙයි වාසයකෙරේනම් ධාර්මිකවූ ධර්මරජත්වූ චාතුර්ද්වීපාධිපතිවූ හෙවත් සාර්වභෞමවූ දිනනලදැ; ප්‍රතිභය කාරණා ඇත්තාවූ ජනපදයන්හි ස්ථාවර බවට පැමිණියාවූ; සප්තරත්නයන්ගෙන් යුක්තවූ සක්විතිරජ වෙයි. ඒ රජහුගේ මේ සප්තරත්නකෙනෙක් වෙත්. ඒනම්, චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මාණික්‍යරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත්වෙනිකොට ඇති පරිනායකරත්නය,-යන මොහුයි,

පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරාවීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගර පරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡද්දො. අයංහි දෙවකුමාරො සුප්පතිට්ඨිතපාදො, යම්පායං දෙවකුමාරො සුප්පතිට්ඨිතපාදො, ඉදම්පිස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති. ඉමස්ස දෙවකුමාරස්ස හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරාණි, යම් පි දෙව ඉමස්ස කුමාරස්ස හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සරාණි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරාණි, ඉදම්පිස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති. අයංහි දෙවකුමාරො ආයතපණ්හි අයංහි දෙවකුමාරො දීඝඞ්ගුලි. ...පෙ...

---

ඔහට වූකලි බියසුලුනොවූ විශීයෙන්කරණ ලද්දක් වැනි රූපඇත්තාවූ පරසෙන් මඩින්නාවූ පුත්‍රයෝ දහසකට වැඩිවෙත්. ඒ සක්විති රජතෙමේ සයුරකෙළවරකොටඇති මේ පෘථිවිය දණ්ඩනරහිතවූ සැත්රහිතවූ දැහැමින් ජයගෙණ අධිපතිව වෙසේ. ඉදින් ගිහිගෙන්නික්ම සස්නෙහි පැවිදිවේනම් ලොකයෙහි විවෘතකරණලද රාගාදි කෙලෙස්නැමති සෙවෙනිඇති අර්හත් සම්‍යක්සම්බුඩ වෙයිද එබදු ලක්‍ෂණයෝයි. දේවයන්වහන්ස, මේ කුමාරතෙම යහපත්ලෙස පිහිටි පාද තල ඇත්තේය දේවයන්වහන්ස, යම්හෙයකින් මේ කුමාරතෙම රන්මරවැඩිතලයක්මෙන් එකපහරින් භූමිය පහස්නා යහපත්ලෙස පිහිටි පාදතල ඇතිසේක්ද මේද ඒ මහාපුරුෂයාගේ මහාපුරුෂයයි දැනගන්නා ලක්‍ෂණවේ, දේවයන්වහන්ස මේ කුමාරයාගේ යටිපතුල්හි දහසක් අරයන් ඇත්තාවූ නිම්වලලු සහිතවූ චක්‍රමධ්‍යපිණ්ඩ සහිතවූ සර්වාකාරයෙන් සම්පූර්ණවූ චක්‍ර දෙකක් හටගත්තාහු වෙත්. දේවයන්වහන්ස, යම්හෙයකින් මේ කුමාරයාගේ යටිපතුල්හි දහසක් අරඇත්තාවූ නිම්වලලුසහිතවූ චක්‍රමධ්‍යපිණ්ඩසහිතවූ සර්වාකාරයෙන් සම්පූර්ණවූ චක්‍රයෝ උපන්නාහුද මේද ඒ මහා පුරුෂයාගේ මහා පුරුෂලක්‍ෂණයක් වේ. දේවයන්වහන්ස, මේ කුමාරතෙම දිඝීවූ සම්පූර්ණ විලුඹක් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම දික්වූ අත්පාඅඟිලිඇත්තේය. සෙස්සකීනයින් දතයුතුයි.

අයංහි දෙවකුමාරො මුදුතලුනහත්ථපාදො. අයංහි දෙවකුමාරො ජාලහත්ථපාදො. අයංහි දෙවකුමාරො උස්සඞ්ඛපාදො. අයංහි දෙවකුමාරො එණිජඞ්ඝො. අයංහි දෙවකුමාරො ඨිතකොව අනොනමන්තො උභොහි පාණිතලෙහි ජන්නුකානි පරිමසති පරිමජ්ජති. අයංහි දෙවකුමාරො කොසොහිතවත්ථගුය්හො. අයංහි දෙවකුමාරො සුවණ්ණවණ්ණො කඤ්චනසන්නිභත්තචො. අයංහි දෙවකුමාරො සුඛුමච්ඡවි සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිම්පති. අයංහි දෙවකුමාරො එකෙකලොමො, එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි. අයංහි දෙවකුමාරො උඩග්ගලොමො, උඩග්ගානි ලොමානි ජාතානි නිලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලවත්තානි දක්ඛිණාවත්තකජාතානි. අයංහි දෙවකුමාරො බ්‍රහ්මුජ්ජුගත්තො. අයංහි දෙවකුමාරො සත්තුස්සදො,

දේවයන්වහන්ස, මේ කුමාරතෙම මෘදුවූ මොලොක් අත්පා ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම ජාලලක්ෂණයෙන් යුක්තවූ අත්පා ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම උස්වසිටි බොලටයක් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම ඒණිමුවන්ගේ කෙණ්ඩාසමාන කෙණ්ඩා ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම සිටිසේක්ම නොනැමෙමින් අත්තල දෙකින් දනමඬල පරාමර්ශනය කෙරේ. පිරිමදී. දේවයන්වහන්ස, මේ කුමාරතෙම කොශයෙන් සැඟවුනාවූ හෙවත් කයතුළට වැදසිටියාවූ පුරුෂලක්ෂණ ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම ස්වර්ණවර්ණ වෙයි. රත්රන් සමානවූ සිහින් සම ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම සියුම් සිවි ඇත්තේය. සිවිය සියුම් බැවින් සිරුරෙහි රජස්දූලි නොඇලේ. දේවයන්වහන්ස, මේ කුමාරතෙම එක එක ලොම් ඇත්තේය. එක එක ලොමයෝ ලොමකූපස්ථානයන්හි හටගත්තාහුය, දේවයන්වහන්ස, මේ කුමාරතෙම උඩබලා සිටි ලොම ඇත්තේය. උඩුකුරුවූ අග්භාගඇති නිල්වූ අඳුන්වන්වූ කොඬොල්වත්වූ දකුණටකරකැවී හටගත්තාවූ ලොමයෝ ඇත්තාහුය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම බඹරුසෙයින් සෘජුවූ ශරීර ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම දෙඅත්පා පිටය දෙවුරය හා කඳය යන සප්තස්ථානයෙහි නහර හා ඇට නොපෙණෙන පරිද්දෙන් උස්වපිරුණු මස්ඇත්තේය.

අයංහි දෙව කුමාරො සීහපුබ්බද්ධකායො, අයංහි දෙව කුමාරො චිතන්තරංසො. අයංහි දෙව කුමාරො නිග්‍රොධපරිමණ්ඩලො, යාවත ක්වස්ස කායො තාවත ක්වස්ස ව්‍යාමො. යාවත ක්වස්ස ව්‍යාමො. තාවත ක්වස්ස කායො. අයංහි දෙව කුමාරො සමවත්තක්ඛන්ධො. අයංහි දෙව කුමාරො රසග්ගසග්ගී. අයංහි දෙව කුමාරො සීහහනු. අයංහි දෙව කුමාරො චත්තාළීසදන්තො. අයංහි දෙව කුමාරො සමදන්තො. අයංහි දෙව කුමාරො අවිවරදන්තො. අයංහි දෙව කුමාරො සුසුක්කදාඨො. අයංහි දෙව කුමාරො පහූතජිව්හො. අයංහි දෙව කුමාරො බ්‍රහ්මස්සරො කරවීකභාණී. අයංහි දෙව කුමාරො අභිනීලනෙත්තො. අයංහි දෙව කුමාරො ගොපඛුමො.

---

දේවයන්වහන්ස, මේ කුමාරතෙම සිංහයෙකුගේමෙන් සම්පූර්ණ පූර්වාර්ධකයක් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම කටියේපටන් කඳට දක්වා රත්පලසක්සෙයින් පිහිටි මස් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම නුගරුකකමෙන් හාත්පස මඬුල්ලක් ඇත්තේය. ඔහුගේ කය යම්පමණවේද පලල එපමණම වේ. ඔහුගේ පුළුල යම්පමණ වේද, ඔහුගේ කය එපමණම වේ, දේවයන්වහන්ස, මේ කුමාරතෙම රත්රන් මිහිඟුබෙරයක් මෙන් දහම්දෙසනකල්හි නොගිපිලි නහරඇති මනාසේ පිහිටි කරක් ඇත්තේය, දේවයන්වහන්ස, මේ කුමාරතෙම උඩුකුරුව ග්‍රීවයෙහි බැඳීසිටි සත්දහසක් රසනහර ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම සිංහයෙකුගේ හනුයුවලක්සෙයින් පිරුණු හනුයුවලක් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම සමසතළිස් දත්කෙනෙක් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම උස්මිටි නොව සමවපිහිටි දත් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම විවෘතනුවූ දත් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම පිරිසිදුබැවින් ඉතා සුදුරැස් විහිදෙන්නාවූ දළ ඇත්තේය, දේවයන්වහන්ස, මේ කුමාරතෙම පුළුල් දිවක් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම කුරවිකෙවිල්ලන්ගේ හඬසේ මියුරුවූ බ්‍රහ්මස්වර ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම ඉඳුනිල්මිණිසේ අතිශයින් නිලවණීවූ නෙත්‍රයුග්මයක් ඇත්තේය. දේවයන්වහන්ස, මේ කුමාරතෙම උපන් ඇසිල්ලෙහි රතුවස්සෙකුගේ ඇස්වැනි මොලොක් සිනිඳු ඇස්ගඩු දෙකක් ඇත්තේය.

ඉමස්ස දෙව කුමාරස්ස උණ්ණා භමුකන්තරෙ ජාතා ඔදාතා මුදු තූලා
සන්නිභා. යම්පි දෙව ඉමස්ස කුමාරස්ස උණ්ණා භමුකන්තරෙ ජාතා
ඔදාතා මුදු තූලා සන්නිභා. ඉදම්පිස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං
භවති. අයං හි දෙවකුමාරො උණ්හීසසීසො. යම්පායං දෙව කුමාරො
උණ්හීසසීසො ඉදම්පිස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

39. ඉමෙහි ඛො අයං දෙව කුමාරො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි
සමන්නාගතො. යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො
භවන්ති අනඤ්ඤා, සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්ක
වත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථා
වරියප්පත්තො සත්තරතන සමන්නාගතො. තස්සිමානි සත්තරත
නානි භවන්ති, සෙය්‍යථීදං, චක්කරතනං හත්ථිරතනං අස්සරතනං
මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිණායකරතනමෙව
සත්තමං.

---

දේවයන්වහන්ස, මේ කුමාරයාගේ බැමයුවල අතරෙහි පිරිසිදුවූ
මොලොක්වූ පුලුන්පෙදක් සමානවූ ඌර්ණාවක් හටගත්තේය
හෙවත් දෙබැම මැද නලල්තෙලෙහි හටගත් රොමයක් ඇත්
තේය. දේවයන්වහන්ස, යම්හෙයකින් මේ කුමාරයාගේ බැම
යුවල අතරෙහි පිරිසිදුවූ මොලොක්වූ පුලුන්පෙදක් සමානවූ ඌර්ණා
රොමයක් හටගත්තීද මේද ඒ මහාපුරුෂයාගේ මහාපුරුෂලක්ෂණ
යක් වෙයි. දේවයන්වහන්ස, මේ කුමාරතෙම අතිශය සම්පූර්ණවූ
දියබුබුලක් සමානවූ නිල්වන් හිසක් ඇත්තේය. දේවයන්වහන්ස,
යම්හෙයකින් මේ කුමාරතෙම නළල්පටින් වටකළාක්වැනි පිරිමඬුලු
සහිත හිසක් ඇතිසේක්ද, මේද ඒ මහාපුරුෂයාගේ මහාපුරුෂ ලක්ෂ
ණයක් වේ.

39. දේවයන්වහන්ස, මේ කුමාරතෙම මේ දෙතිස්මහපුරිස් ලකුණු
වලින් යුක්තසේක. ඒනම්, යම් ලක්ෂණයන්ගෙන් යුක්තවූ මහා
පුරුෂයෙකුගේ ගතිදෙකක්ම වෙත්ද, අනික් ගතියක් නොවේද.
කවරදෙකක්දයත්, ඉදින් ගිහිගෙයි වාසයකෙරේනම් ධාර්මිකවූ ධම්
රජන්වූ චාතුර්දීපාධිපතිවූ හෙවත් සාර්වභෞමවූ දිනනලද ප්‍රතිභය
කාරණා ඇත්තාවූ ජනපදයන්හි ස්ථාවර බවට පැමිණියාවූ සප්ත
රත්නයෙන් යුක්තවූ සක්විතිරජ වෙයි. ඒ රජහුගේ මේ සප්තරත්න
කෙනෙක් වෙත්. ඔව්හු කවරහුදයත්, චක්‍රරත්නය, හස්තිරත්නය,
අශ්වරත්නය, මාණික්‍යරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත්
වෙනිකොට ඇති පරිනායකරත්නය යන මොව්හුයි.

පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති, සචෙ ඛොපන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡද්දොති,අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා නෙමිත්තෙ බ්‍රාහ්මණෙ අහතෙහි වත්ථෙහි අච්ඡාදාපෙත්වා සබ්බකාමෙහි සන්තප්පෙසි,

40. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස ධාතියො උපට්ඨාපෙසි.අඤ්ඤා සුදං ඛීරං පායෙන්ති.අඤ්ඤා නහාපෙන්ති.අඤ්ඤා ධාරෙන්ති අඤ්ඤා අඞ්කෙන පරිහරන්ති.ජාතස්ස ඛො පන භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස සෙතච්ඡත්තං ධාරයිත්ථ දිවාචෙව රත්තිංච මා නං සීතං වා උණ්හං වා තිණං වා රජො වා උස්සාවො වා බාධයිත්ථාති. ජාතො ඛො පන භික්ඛවෙ විපස්සී කුමාරො බහුනො ජනස්ස පියො අහොසි මනාපො

---

ඕහට වනාහි බියසුලුනොවූ වීර්‍ය්‍යයෙන් කරණලද්දක්වැනි රූපඇත්තාවූ පරසෙන්මඩින්නාවූ පුත්‍රයෝ දහසකට වැඩිවෙත්.ඒ සක්විතිරජතෙමේ සයුරකෙළවරකොටඇති මේ පෘථිවිය දණ්ඩනරහිතවූ සැත්රහිතවූ දැහැමින් ජයගෙණ අධිපතිව වෙසේ. ඉදින් ගිහිගෙන් නික්මසස්නෙහිපැවිදිවේනම් ලොකයෙහි විවෘතකරණලද රාගාදි කෙලෙස් නැමති සෙවෙනිඇති අර්හත් සම්‍යක්සම්බුඩ වෙයිද එබඳු ලක්‍ෂණයෝයි.මහණෙනි,ඉක්බිත්තෙත් බන්ධුමානම්රජතෙම නිමිත්තපාඨක බ්‍රාහ්මණයන් අභිනව වස්ත්‍රයන්ගෙන් අන්දවා සියලුකාමයන්ගෙන් සන්තර්පණය කළේය.(මෙයින් ලක්‍ෂණපාඨකයන් පසුව සන්තර්පණය කළ බැව් හැඟෙතත් එසේ නොපිළිගතයුතුයි. පළමුකොට ලක්‍ෂණ පාඨකයන් සන්තර්පණය කොට පසුව නිමිති විචාළබැව් දතයුතු.)

40. මහණෙනි, ඉක්බිත්තෙත් බන්ධුමන්තුරජතෙමේ විපස්සී කුමාරයාට කිරිමවුන් එළඹසිටවීය. අන්‍යස්ත්‍රීහු කිරිපොවත්, අන්‍යස්ත්‍රීහු නහවත්, අන්‍යස්ත්‍රීහු දරත්, අන්‍යස්ත්‍රීහු ඇකයෙන් පරිහරණයකෙරෙත්. මහණෙනි, උපන්නාවූ විපස්සීකුමාරයාට රෑදවල් දෙක්හි ස්වෙතච්ඡත්‍ර දැරූහ. ඒ බෝසත්හු සීතලක්හෝ උෂ්ණයක්හෝ තෘණහෝ රජස්හෝ පිනි හෝ පීඩානොකෙරේවායි කියායි.මහණෙනි උපන්නාවූ විපස්සීකුමාරතෙම බොහොදෙනාට ප්‍රියවූයේය,මනවඩන්නෙක්ද වීය.

සෙය්‍යථාපි භික්ඛවෙ උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා බහුනො ජනස්ස පියං මනාපං, එවමෙව ඛො භික්ඛවෙ විපස්සී කුමාරො බහුනො ජනස්ස පියො අහොසි මනාපො ස්වාස්සුදං අඞ්කෙනෙව අඞ්කං පරිහරීයති.

41. ජාතො ඛො පන භික්ඛවෙ විපස්සී කුමාරො මඤ්ජුස්සරො ච අහොසි වග්ගුස්සරො ච මධුරස්සරො ච. පෙමනියස්සරො ච. සෙය්‍යථාපි භික්ඛවෙ හිමවන්තෙ පබ්බතෙ කරවීකා නාම සකුණජාති මඤ්ජුස්සරා ච වග්ගුස්සරා ච මධුරස්සරා ච පෙමනියස්සරා ච. එවමෙව ඛො භික්ඛවෙ විපස්සී කුමාරො මඤ්ජුස්සරො ච අහොසි වග්ගුස්සරො ච මධුරස්සරො ච පෙමනියස්සරො ච.

42. ජාතස්ස ඛො පන භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස කම්මවිපාකජං දිබ්බං චක්ඛුං පාතුරහොසි යෙන සුදං සමන්තා යොජනං පස්සති දිවා චෙව රත්තිඤ්ච.

---

මහණෙනි, උපුල්හෝ පියුම් හෝ හෙළපියුම් හෝ යම්සේ බොහෝ දෙනාට ප්‍රියවේද මනවඩන්නේ වේද, මහණෙනි, එපරිද්දෙන්ම විපස්සීකුමාරතෙම බොහෝදෙනාට ප්‍රියවිය, මනවඩන්නේ විය. ඒ විපස්සීකුමාරතෙම ඇකයෙන් ඇකයට හෝ අංසකූටයෙන් අංසකූටයට මාරුකිරීමෙන් පරිහරණය කරණුලැබේ.

41. මහණෙනි, උපන්නාවූ විපස්සීකුමාරතෙමෙ සිත්කලුස්වර ඇත්තේද මනොඥස්වර ඇත්තේද මිහිරිස්වර ඇත්තේද ප්‍රෙමකටයුතු ස්වරඇත්තේදවිය. මහණෙනි, හිමාලය පර්වතයෙහි කුරවිකෙවිල්ලෝ යම්සේ සිත්කලු ස්වරඇත්තෝද මනොඥස්වරඇත්තෝද මිහිරිස්වර ඇත්තෝද ප්‍රෙමකටයුතු ස්වරඇත්තෝත්වෙත්ද. මහණෙනි, එපරිද්දෙන්ම විපස්සී කුමාරතෙම සිත්කලුස්වර ඇත්තේද මනොඥස්වර ඇත්තේද මිහිරි ස්වරඇත්තේද ප්‍රෙමකටයුතු ස්වරඇත්තේද විය.

42. මහණෙනි, උපන්නාවූ විපස්සීකුමාරයාට යම් ඇසකින් රෑ දවල්දෙක්හි හාත්පස යොදුන්සිය්සක්තැනපෙණේද එබඳුවූ භාවනාමයකර්මවිපාකයෙන් හටගත්තාවූ දිවැස පහළවිය.

43. ජාතො ඛො පන භික්ඛවෙ විපස්සී කුමාරො අනිමිසන්තො පෙක්ඛති. සෙය්‍යථාපි දෙවා තාවතිංසා. අනිමිසන්තො කුමාරො පෙක්ඛතීති ඛො භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස විපස්සී විපස්සීත්වෙව සමඤ්ඤා උදපාදි, අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා අත්ථකරණෙ නිසින්නො විපස්සීකුමාරං අඞ්කෙ නිසීදාපෙත්වා අත්ථෙ අනුසාසති. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සීකුමාරො පිතුඅඞ්කෙ නිසින්නො විචෙය්‍ය විචෙය්‍ය අත්ථෙ පනායති ඤායෙන. විචෙය්‍ය විචෙය්‍ය කුමාරො අත්ථෙ පනායති ඤායෙනාති ඛො භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස භිය්‍යොසො මත්තාය විපස්සී විපස්සීත්වෙව සමඤ්ඤා උදපාදි.

44. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස තයො පාසාදෙ කාරාපෙසි. එකං වස්සිකං, එකං හෙමන්තිකං, එකං ගිම්හිකං, පඤ්චකාමගුණානි උපට්ඨාපෙසි. තත්‍රසුදං භික්ඛවෙ විපස්සි කුමාරො වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරොමාසෙ නිප්පුරිසෙහි තුරියෙහි පරිචාරය මානො න හෙට්ඨාපාසාදං ඔරොහතීති.

ජාතිකණ්ඩං නිට්ඨිතං.

---

43. මහණෙනි, උපන්නාවූ විපස්සිකුමාරතෙම තව්තිසා වැසි දෙවියන්මෙන් ඇස්පියනොහෙළමින් බලයි. මහණෙනි, කුමාරතෙම ඇස්පියනොහෙලමින් පිරිසිදුලෙස බලායයි, එයම අර්ථකොටගෙණ විපස්සිකුමාරයාට විපස්සිය විපස්සීයයන නාමය උපන්නේය. මහණෙනි, ඉක්බිත්තෙන් බන්ධුමන්තු රජතෙම, අර්ථානුශාසනාකරණ තැන්හි උන්නේ විපස්සිකුමාරයා ඇකයෙහි හිඳුවාගෙණ අර්ථානුශාසනාකෙරේ. මහණෙනි, විපස්සිකුමාරතෙම එකල්හි පිය මහරජුගේ ඇකයෙහි උන්නේ විශෙෂයෙන් පරික්ෂාකරමින් යුක්තිලෙස කාරණයන් පමුණුවයි. මහණෙනි, කුමාරතෙම පරීක්ෂාකරමින් යුක්තිලෙස අර්ථයන් පමුණුවායයි යනමේ කාරණයෙන් විපස්සිය විපස්සියයන මේනාමය උපන්නේය.

44. මහණෙනි, ඉක්බිත්තෙන් බන්ධුමන්තු රජතෙම විපස්සිකුමාරයාට ප්‍රාසාද තුණක්කරවිය. එක් ප්‍රාසාදයක් වර්ෂාඍතුවට සුදුසුවේ. එක් ප්‍රාසාදයක් හිම ඍතුවට සුදුසුවෙයි. එක් ප්‍රාසාදයක් ග්‍රීෂ්මඍතුවට සුදුසුවෙයි, පඤ්චකාම ගුණයෝද එළඹසිටවිය. මහණෙනි, එකල්හි විපස්සිකුමාරතෙම වස්සිකනම් ප්‍රාසාදයෙහි වර්ෂාඍතුවටඅයත් සාරමස මුලුල්ලෙහි පුරුෂයන්රහිතවූ තූර්‍ය්‍යයන්ගෙන් හෙවත් තූර්‍ය්‍යයන්ගත් ස්ත්‍රීන්විසින්ම පිරිවරණලද්දේ යටපහයට නොබසී,

ජාතිඛණ්ඩය නිමියේයි.

---

**2.** 1. අථ ඛො භික්ඛවෙ විපස්සි කුමාරො බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන සාරථිං ආමන්තෙසි. යොජෙහි සම්ම සාරථි භද්දානි භද්දානි යානානි, උය්‍යාන භූමිං ගච්ඡාම භූමිං දස්සනායාති. එවං දෙවාති ඛො භික්ඛවෙ සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා භද්දානි භද්දානි යානානි යොජාපෙත්වා විපස්සිස්ස කුමාරස්ස පටිවෙදෙසි. යුත්තානි ඛො තෙ දෙව භද්දානි භද්දානි යානානි යස්සදානි කාලං මඤ්ඤසීති. අථ ඛො භික්ඛවෙ විපස්සී කුමාරො භද්දං යානං අභිරූහිත්වා භද්දෙහි භද්දෙහි යානෙහි උය්‍යානභූමිං නිය්‍යාසි.

2. අද්දසා ඛො භික්ඛවෙ විපස්සි කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තො පුරිසං ජිණ්ණං ගොපානසිවඞ්කං භොග්ගං දණ්ඩපරායනං පවෙධමානං ගච්ඡන්තං ආතුරං ගතයොබ්බනං. දිස්වා සාරථිං ආමන්තෙසි. අයම්පන සම්ම සාරථි පුරිසො කිං කතො, කෙසාපිස්ස න යථා අඤ්ඤෙසං.

---

**2.** 1. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සිකුමාරතෙම බොහෝ වර්ෂයන්ගේද, බොහෝ වර්ෂ සියයන්ගේද, බොහෝ වර්ෂ සහස්‍රයන්ගේද, ඇවෑමෙන් රථාචාර්‍ය්‍යයා ඇමතුයේය. යහලුව සාරථිය, යහපත් යහපත් යානාවන් යොදව. භූමිදර්ශනයපිණිස උයන්බිමට යන්නෙමියි කියේය. මහණෙනි, දේවයන්වහන්ස, එසේයයි ඒ සාරථිතෙමේ විපස්සී කුමාරයාට පිළිවදන්දී යහපත් යහපත් යානාවන් යොදවා විපස්සි කුමාරයාට දැන්වීය. දේවයන්වහන්ස, නුඹවහන්සේට යහපත් යහපත් යානාවෝ යොදනලද්දාහුය. යමක්සඳහා නුඹවහන්සේ දැන් කල්දන්නාසේක්නම් එය කරනුමැනවයිද සැලකළේය. මහණෙනි, ඉක්බිති විපස්සී කුමාරතෙම යහපත් යානාවකට නැගී යහපත් යහපත් යානාවලින් උයන්බිමට ගියේය.

2. මහණෙනි, විපස්සී කුමාරතෙම උයන්බිමට යන්නේ ජරපත්වූ ගොණැස්සේ වක්වූ මැදින් බිඳුනාවූ දණ්ඩක් පිහිටකොට ඇත්තාවූ හෙවත් සැරයටියක්ගත් අත්ඇත්තාවූ වෙව්ලමින් යන්නාවූ ජරාවෙන් පීඩිතවූ පහවගිය යොවුන්බැව් ඇත්තාවූ පුරුෂයෙකු දුටුයේමය. දැක සාරථියා ඇමතුයේය. යහලුව සාරථිය, මේ පුරුෂතෙම කුමක්කරණලද්දේද. ඔහුගේ කෙස්ද අන්‍ය පුරුෂයන්ගේ කෙස් මෙන් නොවෙත්.

කායො පිඅස්ස න යථා අඤ්ඤෙසන්ති. එසො ඛො දෙව ජිණ්ණො නාමාති. කිම්පනෙසො සම්මසාරථි ජිණ්ණො නාමාති. එසො ඛො දෙව ජිණ්ණොනාම. නදානි තෙන චිරං ජීවිතබ්බං භවිස්සතීති. කිම පන සම්මසාරථි අහම්පි ජරාධම්මො ජරං අනතීතොති. ත්වඤ්ච දෙව මයඤ්චම්හා සබ්බෙ ජරාධම්මා ජරං අනතීතාති. තෙනහි සම්මසාරථි අලන්දානජ්ජ උය්‍යානභූමියා, ඉතොව අන්තෙපුරං පච්චනියාහීති. එවං දෙවාති ඛො භික්ඛවෙ සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතොව අන්තෙපුරං පච්චනියාසි. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සී කුමාරො අන්තෙපුරගතො දුක්ඛී දුම්මනො පජ්ඣායති. ධිරත්ථු කිර භො ජාතිනාම, යත්‍රහිනාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සතීති.

3. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා සාරථිං ආමන්තාපෙත්වා එතද වොච. කච්චි සම්මසාරථි කුමාරො උය්‍යානභූමියා අභිරමිත්ථ.

---

ඔහුගේ කයද අන්‍ය පුරුෂයන්ගේ කය මෙන් නොවේයයි කීයේය. දේවයන්වහන්ස, මේ තැනැත්තේනම් ජීර්ණයෙකැයි සැලකළේය. කිමෙක්ද සාරථිය, මෙතෙමේ ජීර්ණයාදැයි විචාළේය. දේවයන් වහන්ස, එසේය. මේතෙමේ ජීර්ණයාය යන නම් ඇත්තේය. දැන් ඔහුවිසින් බොහෝකලක් ජීවත්වියයුතුනොවන්නේ යයි දත්වී. යහලුව සාරථිය, කිමෙක්ද මමත් ජරාව ස්වභාවකොට ඇත්තෙම්ද මාවිසින් ජරාව නොයික්මවනලද්දීදැයි විචාළේය. දේවයන්වහන්ස, තුඹවහන්සේද අපිද යන සියල්ලෝම ජරාව ස්වභාව කොට ඇත්තෝ වෙමු. අපවිසින් ජරාව නොයික්මවනලද්දීයයි කීයේය. යහලුව සාරථිය, එසේනම් අද උයන්කෙළි ගමනින් කම් නැත. මෙතනින් හෙවත් දැන්ම ඇතුළුනුවරට පෙරළා රිය ගෙණ යවයි කීයේය. මහණෙනි, දේවයන්වහන්ස ඒ මැනවැයි සාරථි තෙමේ විපස්සී කුමාරයාට පිළිවදන්දී එතනින්ම ඇතුළුනුවරට පෙරළා ගියේය. මහණෙනි, ඒකාලයෙහි විපස්සී කුමාරතෙම ඇතුළු නුවරට පැමිණියේම දුක්ඇත්තේ නොසතුටුසිත් ඇත්තේ නන්අයුරින් විපිළිසර සිතිවිලි සිතයි. පින්වත්නි, යම් ජාතියක් ඇතිකල්හි උපන්නහුගේ දිරීම පෙණේන්නේද ඒ ජාතියට හෙවත් උත්පත්තියට නින්දාවේවා යනුයි.

3. මහණෙනි, ඉක්බිත්තෙන් බන්ධුමාතම් රජතෙම රියැදුරා අම තවා මේ කාරණය විචාළේය. යහලුව සාරථිය, කිමෙක්ද කුමාර තෙමේ උද්‍යාන භූමියෙහි අභිරමනයකෙළේද.

කච්චි සම්මසාරථි කුමාරො උය්‍යානභූමියා අත්තමනො අහොසීති. න ඛො දෙවකුමාරො උය්‍යානභූමියා අභිරමිත්ථ, න ඛො දෙව කුමාරො උය්‍යානභූමියා අත්තමනො අහොසීති. කිම්පන සම්මසාරථි අද්දස කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තොති. අද්දසා ඛො දෙවකුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තො පුරිසං ජිණ්ණං ගොපානසිවඞ්කං භොග්ගං දණ්ඩපරායනං පවෙධමානං ගච්ඡන්තං ආතුරං ගතයොබ්බනං. දිස්වා මං එතදවොච. අයම්පන සම්මසාරථි පුරිසො කිං කතො, කෙසාපිස්ස න යථා අඤ්ඤෙසං. කායොපිස්ස න යථා අඤ්ඤෙසන්ති, එසො ඛො දෙව ජිණ්ණො නාමාති. කිම්පන සො සම්මසාරථි ජිණ්ණො නාමාති, එසො ඛො දෙව ජිණ්ණො නාම, නදානි තෙන චිරං ජීවිතබ්බං භවිස්සතීති. කිම්පන සම්මසාරථි අහම්පි ජරාධම්මො ජරං අනතීතොති. ත්වඤ්ච දෙව මයඤ්චම්හා සබ්බෙ ජරාධම්මා ජරං අනතීතාති. තෙනහි සම්මසාරථි අලන්දානි උය්‍යානභූමියා, ඉතොව අන්තෙපුරං පච්චනිය්‍යාහීති.

---

යහලුව සාරථිය කිමෙක්ද, කුමාරතෙම උද්‍යාන භූමියෙහිදී සතුටුවූයේදැයි විචාළේය. දේවයන්වහන්ස, කුමාරතෙමේ උද්‍යාන භූමියෙහි අභිරමනය නොකෙළේය. දේවයන්වහන්ස, කුමාරතෙම උද්‍යාන භූමියෙහිදී නොසතුටුවූයේයයි සැලකළේය. යහලුව සාරථිය, කිමෙක්ද කුමාරතෙම උයන්බිමට යන්නේ අතරමගදී කුමක්නම් දුටුයේදැයි විචාළේය. දේවයන්වහන්ස, කුමාරතෙමේ උයන්භූමියට යන්නේ අතරමගදී ජරපත්වූ ගොණැස්සේ වක්වූ මැදින් බිඳුනාවූ දණ්ඩක් පිහිටකොට ඇත්තාවූ වෙව්ලමින් යන්නාවූ ජරාවෙන් පීඩිතවූ පහවගිය යොවුන්බැව් ඇත්තාවූ පුරුෂයෙකු දුටුයේමය. දැක මට මෙය කීයේය. යහලුව සාරථිය, මේ පුරුෂතෙම කුමක්කරණලද්දේද. ඔහුගේ කෙස්ද අන්‍ය පුරුෂයන්ගේ කෙස් මෙන් නොවෙත්. ඔහුගේ කයද අන්‍ය පුරුෂයන්ගේ කය මෙන් නොවේය යනුයි. දේවයන්වහන්ස, මෙතෙමේනම් ජීර්ණයෙකැයි කීයෙමි. කිමෙක්ද සාරථිය, ඒ තැනැත්තේ ජීර්ණය යන නම්ඇත්තේදැයි විචාළේය. දේවයන්වහන්ස, මේතෙමේ ජීර්ණයානම් වේ. දැන් ඔහුවිසින් බොහෝ කාලක් මුළුල්ලෙහි ජීවත්වියයුතු නොවන්නේයයි කීයෙමි. සාරථිය, කිමෙක්ද මමත් ජරාව සවභාවකොට ඇත්තෙම්ද, මාවිසින් ජරාව නොයික්මවනලද්දීදැයි විචාළේය. දේවයන්වහන්ස, ඔබද අපිද යන සියල්ලෝම ජරාව සවභාවකොට ඇත්තෝ වෙමු. අපවිසින් ජරාව නොයික්මවනලද්දීයයි කීයෙමි. යහලුව සාරථිය, එහෙනම් අද උයන්කෙළියට යාමෙන් කම්නැත. මෙතනින්ම හෙවත් දැන්ම ඇතුළු නුවරට පෙරළා රිය ගෙණයවයි කීයේය.

එවං දෙවාති ඛො අහං දෙව විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතොව අන්තෙපුරං පච්චනියාසිං. සො ඛො දෙව කුමාරො අන්තෙපුරගතො දුක්ඛී දුම්මනො පජ්ඣායති ධිරත්ථු කිර භො ජාතිනාම යත්‍රහි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සතීති.

4. අථ ඛො භික්ඛවෙ බන්ධුමස්ස රඤ්ඤො එතදහොසි. මාහෙව ඛො විපස්සී කුමාරො න රජ්ජං කාරෙසි. මාහෙව විපස්සී කුමාරො අගාරස්මා අනගාරියං පබ්බජි, මාහෙව නෙමිත්තානං බ්‍රාහ්මණානං සච්චං අස්ස වචනන්ති. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස භීයොසොමත්තාය පඤ්චකාමගුණානි උපට්ඨාපෙසි. යථා විපස්සී කුමාරො රජ්ජං කාරෙය්‍ය, යථා විපස්සී කුමාරො න අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය, යථා නෙමිත්තානං බ්‍රාහ්මණානං මිච්ඡා අස්ස වචනන්ති. තත්‍රසුදං භික්ඛවෙ විපස්සී කුමාරො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගිභූතො පරිචාරෙති.

---

දේවයන්වහන්ස, මම දේවයෙනි, ඒ මැනවැයි විපස්සී කුමාරයාහට පිළිවදන්දී එතනින්ම ඇතුළුනුවරට පෙරළා ආයෙමි. දේවයන්වහන්ස, ඒ මේ කුමාරතෙම ඇතුළුනුවරට පැමිණියේම දුක්ඇත්තේ නොසතුටුසිත්ඇත්තේ නන්අයුරින් විපිළිසර සිතිවිලි සිතයි. පින්වත්නි, යම්තැනෙක්හිනම් උපන්නහුගේ දිරීම පෙණේන්නේද ඒ ජාතියටහෙවත් උත්පත්තියට නින්දාවේවායි කියායි.

4. මහණෙනි, එකල්හි බන්ධුමානම් රජහට මේ අදහස වීය. විපස්සී කුමාරතෙමේ රාජ්‍යයකරන්නෙක්ම වේවා. විපස්සී කුමාරතෙම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නක් නොවේවා. නිමිත්තපාඨක බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍යනොවේවායි කියායි. මහණෙනි, ඉක්බිත්තෙන් බන්ධුමන්තු රජතෙමේ බොහෝසෙයින්ම විපස්සී කුමාරයාට පඤ්චකාමගුණයන් එලඹසිටවීය. කෙබඳුවූදයත්, යම්සේ විපස්සී කුමාරතෙම රජය කරවන්නේද, යම්සේ විපස්සී කුමාරතෙම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිනොවන්නේද, යම්සේ නිමිත්තපාඨක බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍යනොවන්නේද, එබඳු පස්කම් කොටස් හුයි. මහණෙනි, එහි විපස්සී කුමාරතෙම පස්කම්ගුණයන්ගෙන් පමුණුවනලද්දේ එයින් යුක්තවූයේම ඉන්ද්‍රියයන් හසුරුවාලයි.

5. අථ ඛො භික්ඛවෙ විපස්සී කුමාරො බහුන්නං වස්සානං
—පෙ—

6. අද්දසා ඛො භික්ඛවෙ විස්සී කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තො පුරිසං ආබාධිකං දුක්ඛිතං බාළ්හගිලානං සකෙ මුත්තකරීසෙ පලිපන්නං සෙමානං අඤ්ඤෙහි වුට්ඨාපියමානං අඤ්ඤෙහි සංවෙසියමානං, දිස්වා සාරථිං ආමන්තෙසි. අයම්පන සම්මසාරථි පුරිසො කිං කතො. අක්ඛීනිපිස්ස න යථා අඤ්ඤෙසං සරොපිස්ස න යථා අඤ්ඤෙසන්ති. එසො ඛො දෙව ව්‍යාධිතො නාමාති. කිම්පනෙසො සම්මසාරථි ව්‍යාධිතො නාමාති, එසො ඛො දෙව ව්‍යාධිතොනාම, අප්පෙවනාම තම්හා ආබාධා වුට්ඨහෙය්‍යාති. කිම්පන සම්මසාරථි අහම්පි ව්‍යාධිධම්මො ව්‍යාධිං අනතීතොති. ත්වඤ්චදෙව මයඤ්චම්හා සබ්බෙ ව්‍යාධිධම්මා ව්‍යාධිං අනතීතාති.

---

5. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි කුමාරතෙම බොහෝ වර්ෂයන්ගේද, සෙස්ස කීක්‍රමයෙන් විස්තර කටයුතුයි.

6. මහණෙනි,විපපස්සිකුමාරතෙම උද්‍යානභූමියට යන්නේ අතර මගදී හටගත් ලෙඩඇත්තාවූ දුක්ඇත්තාවූ දැඩි ගිලන්බැව් ඇත්තාවූ තමාගේ මලමුත්‍රයෙහි ගැලුනාවූ සයනයකරන්නාවූ අන්‍යයන්විසින් නැඟීසිටවනු ලබන්නාවූ අන්‍යයන්විසින් සයනයකරවනුලබන්නාවූ පුරුෂයෙකු දුටුයේමය. දැක සාරථියා ඇමතුයේය. යහලුව සාරථිය මේපුරුෂතෙම කුමක්කරණලද්දේද ඔහුගේ ඇස්ද අන්‍යයන්ගේ ඇස්මෙන් නොවෙත්, ඔහුගේ ශබ්දයද අන්‍යයන්ගේ ශබ්දයමෙන් නොවේ, දේවයන්වහන්ස, මේතෙමේනම් ව්‍යාධි නැත්තේයයි කීයේය. කිමෙක්ද, සාරථිය, මේතෙම ලෙඩඇත්තේදැයි විචාලේය. දේවයන්වහන්ස, මේතෙම ලෙඩ ඇත්තේනම්වේ. ඒ ආබාධයෙන් නැගා සිටුවන්නේනම් ඉතායෙහෙකැයි කීයේය, කිමෙක්ද යහලුරියැදුර, මමත් ව්‍යාධිය සවභාවකොට ඇත්තෙම්ද, මාවිසින් ව්‍යාධිය නොඉක්මවන ලද්දේදැයි විචාලේය. දේවයන්වහන්ස, නුබවහන්සේද අපිද යනසියල්ලෝම ව්‍යාධිය සවභාවකොට ඇත්තෝ වම්හ. අප විසින් ව්‍යාධිය නොඉක්මවන ලද්දේයයි.

තෙනහි සම්මසාරථි අලං දානජ්ජ උය්‍යානභූමියා ඉතොව අන්තෙ පුරං පච්චනියාහීති. එවං දෙවාති ඛො භික්ඛවෙ සාරථි විප ස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතොව අන්තෙපුරං පච්චනියාසි.තත්‍ර සුදං භික්ඛවෙ විපස්සීකුමාරෙ අන්තෙපුරගතො දුක්ඛි දුම්මනො පජ්ඣායති ධිරත්ථුකිරභො ජාතිනාම. යත්‍රහිනාම ජාතස්ස ජරා පඤ්ඤා යිස්සති ව්‍යාධි පඤ්ඤායිස්සතීති.

7. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා සාරථිං ආමන්තාපෙත්වා එතද වොච. කච්චි සම්මසාරථි කුමාරෙ උය්‍යානභූමියා අභිරමිත්ථ. කච්චි සම්මසාරථි කුමාරෙ උය්‍යානභූමියා අත්තමනො අහොසීති. න ඛො දෙව කුමාරෙ උය්‍යානභූමියා අභිරමිත්ථ.න ඛො දෙවකුමාරෙ උය්‍යාන භූමියා අත්තමනො අහොසීති. කිම්පන සම්මසාරථි අද්දස කුමාරෙ උය්‍යානභූමිං නීයන්තොති, අද්දසාඛො දෙව කුමාරෙ උය්‍යානභූමිං නිය්‍යන්තො පුරිසං ආබාධිකංදුක්ඛිතං බාල්හගිලානං සකෙ මුත්තක රීසෙ පලිපන්නං සෙමානං.

යහලුව සාරථිය, එහෙනම් දැන් අද උයන් බිමට යාමෙන් කම්නැත. මෙතනින්ම ඇතුළුනුවරට පෙරළා රියගෙණියවයි කීයේය. මහ ණෙනි, එකල්හි විපස්සී කුමාරතෙම ඇතුළුපුරයටගියේ දුක්ඇත්තේ නොසතුටු සිත් ඇත්තේ තන්අයුරින් විපිළිසර සිතිවිලි සිතයි. පින්වත්නි, යම්තැනෙක්හිනම් උපන්නාහුගේ දිරීම පෙණෙන්නේද ලෙඩපෙණෙන්නේද,එබඳුවූ ජාතියට නින්‍දාවේවායි කියායි.

7. මහණෙනි, ඉක්බිත්තෙන්, බන්ධුමානම්රජතෙම රියැදුරා අම තවා, මේකාරණය විචාළේය,යහලුව සාරථිය කිමෙක්ද,කුමාරතෙමේ උද්‍යානභූමියෙහි අභිරමනය කෙළේද,යහලු සාරථිය,කිමෙක්දකුමාර තෙම උද්‍යානභූමියෙහිදී සත්වුවූයේදැයි විචාළේය. දේවයන්වහන්ස, කුමාරතෙමේ උද්‍යානභූමියෙහි අභිරමනයනොකෙළේය. දේවයන්ව හන්ස කුමාරතෙම උද්‍යානභූමියෙහිදී නොසතුටුවූයේයයි සැලකෙ ළේය. යහලුව සාරථිය, කිමෙක්ද කුමාරතෙම උයන්බිමට යන්නේ අතරමගදී කුමක්නම්දුටුයේදැයි විචාළේය, දේවයන්වහන්ස, කුමාර තෙමේ උද්‍යානභූමියට යන්නේ අතරමගදී ලෙඩඇත්තාවූ දුඃඛිතවූ දැඩි ගිලන්බැව් ඇත්තාවූ තමාගේ මලමුත්‍රයෙහි ගැලුනාවූ සයනය කරන්නාවූ.

අඤ්ඤෙහි වුට්ඨාපියමානං අඤ්ඤෙහි සංවෙසියමානං. දිස්වා මං එතදවොච. අයං පන සම්ම සාරථි පුරිසො කිං කතො, අක්ඛීනිපිස්ස න යථා අඤ්ඤෙසං, සරොපිස්ස න යථා අඤ්ඤෙසන්ති. එසො ඛො දෙව ව්‍යාධිතො නාමාති. කිම්පනෙසො සම්මසාරථි ව්‍යාධිතො නාමාති. එසො ඛො දෙව ව්‍යාධිතොනාම. අප්පෙවනාම තම්හා ආබාධා වුට්ඨහෙය්‍යාති, කිම්පන සම්මසාරථි අහම්පි ව්‍යාධිධම්මො ව්‍යාධිං අනතීතොති. ත්වඤ්ච දෙව මයඤ්චම්හා සබ්බෙ ව්‍යාධි ධම්මා ව්‍යාධි අනතීතාති. තෙනහි සම්මසාරථි අලංදානජ්ජ උය්‍යානභූමියා. ඉතොව අන්තෙපුරං පච්චනිය්‍යාහීති. එවං දෙවාතිඛො අහං දෙව විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතොව අන්තෙපුරං පච්චනී ය්‍යාසිං. සොඛො දෙව කුමාරො අන්තෙපුරගතො දුක්ඛිදුම්මනො පජ්ඣායති ධිරත්ථුකිර භො ජාතිනාම.යත්‍රහිනාම ජාතස්ස ජරා පඤ්ඤා යිස්සති ව්‍යාධි පඤ්ඤායිස්සතීති.

---

අන්‍යයන්විසින් ඔසවතුලබත්නාවූ අන්‍යයන්විසින් හොවනු ලබන්නාවූ පුරුෂයෙකු දුටුයේමය. දැක මට මෙසේ කීයේය, යහලුව සාරථිය, මේ පුරුෂතෙම කුමක්කරණලද්දේද, ඔහුගේ ඇස්ද අන්‍යපුරුෂයන්ගේ ඇස්මෙන් නොවෙත් ඔහුගේ හඬද අන්‍යපුරුෂයන්ගේ හඬමෙන්නොවේය යතුයි, දේවයන්වහන්ස මෙතෙමේ ව්‍යාධිතැනැත්තෙකැයි කියෙමි. කිමෙක්ද සාරථිය, ඒ තැනැත්තේ ලෙඩාය යන නම්ඇත්තේදැයි, විචාලේය.දේවයන්වහන්ස,මේතෙමේ ලෙඩා නම්වේ, ඔහු ඒ ආබාධයෙන් නගාසිටුවන්නේනම් ඒ ඉතා යෙහෙකැයි කියේය. සාරථිය, කිමෙක්ද,මමත් ව්‍යාධිය සවභාවකොට ඇත්තෙම්ද මාවිසින් ව්‍යාධිය නොයික්මවනලද්දේදැයි විචාලේය. දේවයන්වහන්ස,නුබවහන්සේද අපිද යන සියල්ලෝම ව්‍යාධියසවභාවකොට ඇත්තෝවෙමු. අපවිසින් ව්‍යාධිය නොයික්මවනලද්දේයයි කීයෙමි. යහලුව සාරථිය, එහෙනම් අද උයන්කෙළියට යාමෙන් කම් නැත. මෙතනින්ම හෙවත් දූන්ම ඇතුළුනුවරට පෙරළා රියගෙණයවයි කීයේය. දේවයන්වහන්ස, මම දේවයෙනි, ඒ මැනවයි, විපස්සිකුමාරයාහට පිළිවදන්දී එතනින්ම ඇතුළුනුවරට පෙරළා ආයෙමි. දේවයන්වහන්ස, ඒ කුමාරතෙම ඇතුළුනුවරට පැමිණියේම දුක් ඇත්තේ නොසතුටු සිත්ඇත්තේ නන්අයුරින් විපිළිසර සිතිවිලි සිතයි. පින්වත්නි, යම්තැනෙක්හිනම්, උපන්නහුගේ දිරීම පෙණේන්නේද ව්‍යාධිය පෙණේන්නේද ඒ ජාතියට හෙවත් උත්පත්තියට නින්දාවේවායි කීයායි.

8. අථ ඛො භික්ඛවෙ බන්ධුමස්ස රඤ්ඤො එතදහොසි. මාහෙව ඛො විපස්සීකුමාරො න රජ්ජං කාරෙසි. මාහෙව විපස්සීකුමාරො අගාරස්මා අනගාරියං පබ්බජි. මාහෙව නෙමිත්තානං බ්‍රාහ්මණානං සච්චං අස්ස වචනන්ති. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස භියොසොමත්තාය පඤ්චකාමගුණානි උපට්ඨාපෙසි. යථා විපස්සීකුමාරො රජ්ජං කාරෙය්‍ය. යථා විපස්සීකුමාරො න අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය, යථා නෙමිත්තානං බ්‍රාහ්මණානං මිච්ඡා අස්ස වචනං තත්‍ර සුදං භික්ඛවෙ විපස්සීකුමාරො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති.

9. අථ ඛො භික්ඛවෙ විපස්සීකුමාරො බහුන්නං වස්සානං

—පෙ—

10. අද්දසා ඛො භික්ඛවෙ විපස්සීකුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තො මහාජනකායං සන්නිපතිතං නානා රත්තානඤ්ච දුස්සානං විලාතං කයිරමානං. දිස්වා සාරථිං ආමන්තෙසි.

---

8. මහණෙනි, එකල්හි බන්ධුමානම් රජහට මේ අදහස වීය. විපස්සිකුමාරතෙමේ රාජ්‍යයකරන්නෙක්ම වේවා, විපස්සිකුමාරතෙම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙක් නොවේවා, නිමිත්තපාඨක බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍යනොවේවායි කියායි. මහණෙනි, ඉක්බිත්තෙන් බන්ධුමන්නම් රජතෙම් බොහෝසෙයින්ම විපස්සි කුමාරයාට පඤ්චකාමගුණයන් එලඹ සිටවීය. කෙබඳුවූදයත්, යම්සේ විපස්සිකුමාරතෙම රජයකරවන්නේද, යම්සේ විපස්සිකුමාර තෙම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිනොවන්නේද, යම්සේ නිමිත්තපාඨක බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍යනොවන්නේද එබඳුපස්කම් කොටස්හුයි. මහණෙනි, එහි විපස්සි කුමාරතෙම පස්කම් ගුණයන්ගෙන් පමුණුවනලද්දේ එයින් යුක්තවූයේම ඉන්ද්‍රියයන් හසුරුවාලයි.

9. මහණෙනි, ඉක්බිති විපස්සිකුමරතෙම බොහෝ වෂියන්ගේ. සෙස්සකීනයින් දතයුතුයි.

10. මහණෙනි, විපස්සිකුමාරතෙම උද්‍යානභූමියට යන්නේ නොයෙක් රක්තවස්ත්‍රයන්ගෙන් සිවිගෙයක් කරන්නාවූ රැස්වූ ජන සමූහයක් දුටුයේමය, දැක රියැදුරා ඇමතුයේය.

කින්නු ඛො සො සම්මසාරථි මහාජනකායො සන්නිපතිතො නානාරත්තානඤ්ච දුස්සානං විලාතං කයිරතීති. එසො ඛො දෙව කාලකතො නාමාති. තෙනහි සම්මසාරථි යෙන සො කාලකතො තෙන රථං පෙසෙහීති. එවං දෙවාති ඛො භික්ඛවෙ සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා යෙන සො කාලකතො තෙන රථං පෙසෙසි. අද්දසා ඛො භික්ඛවෙ විපස්සිකුමාරො පෙතං කාලකතං. දිස්වා සාරථිං ආමන්තෙසි. කිම්පනායං සම්මසාරථි කාලකතො නාමාති. එසො ඛො දෙවකාලකතොනාම. න දානි තං දක්ඛින්ති මාතා වා පිතා වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා, සොපි න දක්ඛිස්සති මාතරං වා පිතරං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙති. කිම්පන සම්මසාරථි අහම්පි මරණධම්මො මරණං අනතීතොති. මම්පි න දක්ඛින්ති දෙවො වා දෙවී වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා, අහම්පි න දක්ඛිස්සාමි දෙවං වා දෙවිං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙති. ත්වඤ්ච දෙවමයඤ්චම්හා සබ්බෙ මරණධම්මා මරණං අනතීතා.

---

යහලුව සාරථිය, රැස්වූ මේ මහජනසමූහතෙම කුමක්සඳහා නොයෙක් රක්තවස්ත්‍රයන්ගෙන් සිවිගෙයක් කෙරේදැයි විචාලේය. දේවයන්වහන්ස, මෙතෙමේනම් කළුරියකළ තැනැත්තෙකැයි කී. යහලුව සාරථිය, එහෙනම්. ඒකළුරියකළ තැනැත්තේ යම්තැනෙක්හිද එතනටරථය ගෙණයවයි කීයේය. මහණෙනි, දේවයන්වහන්ස ඒ මැනවැයි ඒසාරථිතෙමේ විපස්සී කුමාරයාට පිළිවදන්දී ඒකළුරියකළ තැනැත්තේ යම්තැනෙක්හිද එතනට රථය යැවිය. මහණෙනි, විපස්සී කුමාරතෙමේ පරලොවගියාවූ කළුරියකළ තැනැත්තා දුටුයේමය. දැක සාරථියා ඇමතූයේය. යහලුව සාරථිය, කිමෙක්ද මෙතෙම කළුරියකළ තැනැත්තේදැයි විචාලේය. දේවයන්වහන්ස, මෙතෙමේ කළුරියකළ තැනැත්තාය. ඔහුගේ මව හෝ පියා හෝ අන්‍යවූ නෑසහලේ නෑයෝ හෝ ඔහු නොදක්නාහ. ඒ කළුරියකළ තැනැත්තේද මව හෝ පියා හෝ අන් නෑසහලේ නෑයන් හෝ නොදක්නේය. යහලුව සාරථිය, කිමෙක්ද මමත් මරණය ස්වභාවකොට ඇත්තෙම්ද මාවිසින් මරණය නොයික්මවනලද්දේදැයි විචාලේය. දේවයන්වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූ නෑසහලේ නෑයෝ හෝ මාත් නොදකිත්ද. මමත් දේවයන්වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූ නෑසහලේ නෑයන් හෝ නොදක්නෙම්දැයි විචාලේය. දේවයන්වහන්ස, නුඹවහන්සේද අපිද යන සියල්ලෝ මරණය ස්වභාවකොට ඇත්තෝවම්හ. අපවිසින් මරණය නොයික්මවනලද්දේයයි කීයේය.

තම්පි න දක්ඛින්ති දෙවො වා දෙවී වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා.
තම්පි. න දික්ඛිස්සසි දෙවං වා දෙවිං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහි
තෙති, තෙනහි සම්මසාරථි අලං දානජ්ජ උය්‍යානභූමියා, ඉතොව
අන්තෙපුරං පච්චනියාහීති. එවං දෙවාති ඛො භික්ඛවෙ සාරථි විපස්
සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතොව අන්තෙපුරං පච්චනියාසි.
තත්‍රසුදං භික්ඛවෙ විපස්සී කුමාරො අන්තෙපුරගතො දුක්ඛී දුම්මනො
පජ්ඣායති. ධිරත්ථු කිර භො ජාතිනාම යත්‍රහිනාම ජාතස්ස ජරා
පඤ්ඤායිස්සති, ව්‍යාධි පඤ්ඤායිස්සති, මරණං පඤ්ඤායිස්සතීති,

11. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රජා සාරථිං ආමන්තාපෙත්වා
එතදවොච. කච්චි සම්මසාරථි කුමාරො උය්‍යානභූමියං අභිරමිත්ථ.
කච්චි සම්ම සාරථි කුමාරො උය්‍යානභූමියා අත්තමනො අහොසීති. න
ඛො දෙවකුමාරො උය්‍යානභූමියා අභිරමිත්ථ, න ඛො දෙව කුමාරො
උය්‍යානභූමියා අත්තමනො අහොසීති.

---

දේවයන්වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූ නෑසහලේ
නෑයෝ හෝ නුඹවහන්සේද නොදක්නාහ. නුඹවහන්සේද දේව
යන්වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූ නෑසහළේ නෑ
යන් හෝ නොදක්නෙහිය. යහළුව සාරථිය, එහෙනම් දැන් අද
උද්‍යාන භූමියට ගමනින් කම්නැත. මෙතැනින්ම ඇතුළුනුවරට පෙ
රළා රියපදවයි කීයේය. මහණෙනි, දේවයන්වහන්ස, එසේයයි
සාරථිතෙමේ විපස්සී කුමාරයාට පිළිවදන්දී එතනින්ම පෙරළා
ඇතුළුනුවරට ගියේය. මහණෙනි, එකල්හි විපස්සීකුමාරතෙම
ඇතුළුනුවරට ගියේම දුක්ඇත්තේ නොසතුටුසිත්ඇත්තේ නත්
අයුරින් විපිළිසර සිතිවිලි සිතයි. පින්වත්නි, යම්ජාතියෙක්හි
උපන්නාහුගේ දිරීම පෙණෙන්නේද, ව්‍යාධිය පෙණෙන්නේද,
මරණය පෙණෙන්නේද ඒ ජාතියට නින්දාවේවා කියායි.

11. මහණෙනි, ඉක්බිත්තෙන් බන්ධුමානම් රජතෙමේ රියැදුරු
අමතා මේ කාරණය කීයේය. යහළුව සාරථිය, කිමෙක්ද කුමාරතෙම
උද්‍යානභූමියෙහි අභිරමනයකෙළේදැයි විචාළේය. යහළුව සාරථිය,
කිමෙක්ද කුමාරතෙම උද්‍යානභූමියෙහි සතුටුවූයෙහිදැයි විචාළේය.
දේවයන්වහන්ස, කුමාරතෙම උද්‍යානභූමියෙහි අභිරමනය නොකෙ
ළේය. දේවයන්වහන්ස, කුමාරතෙම උද්‍යානභූමියෙහිදී නොසතුටුවූ
යේයයි කීයේය.

කිම්පන සම්මසාරථි අද්දස කුමාරො උය්‍යානභූමිං නීයමානොති. අද්දසා ඛො දෙව කුමාරො උය්‍යානභූමිං නීයමානො මහාජනකායං සන්නිපතිතං නානා රත්තානඤ්ච දුස්සානං විලාතං කයිරමානං දිස්වාන මං එතදවොච, කින්නුඛො සො සම්මසාරථි මහාජනකායො සන්නිපතිතො, නානාරත්තානඤ්ච දුස්සානං විලාතං කයිරතීති. එසො ඛො දෙවකාලකතො නාමාති. තෙනහි සම්මසාරථි යෙන සො කාලකතො තෙන රථං පෙසෙහීති. එවං දෙවාති ඛො අහං දෙව විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා යෙන සො කාලකතො තෙන රථං පෙසෙසිං. අද්දසා ඛො දෙව කුමාරො පෙතං කාලකතං. දිස්වා මං එතදවොච. කිම්පනායං සම්මසාරථි කාලකතො නාමාති. එසො ඛො දෙව කාලකතො නාම. න දානි තං දක්ඛින්ති මාතා වා පිතා වා අඤ්ඤෙ වා ඤාති සාලොහිතා, සොපි න දක්ඛිස්සති මාතරං වා පිතරං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙති. කිම්පන සම්මසාරථි අහම්පි මරණධම්මො මරණං අනතීතොති.

---

යහළුව සාරථිය, කුමාරතෙම උයන්බිමට යන්නේ අතරමගදී කුමක් දුටුයේදැයි විචාලේය. දේවයන්වහන්ස, කුමාරතෙම උද්‍යානභූමියට යන්නේ නොයෙක් රක්තවස්ත්‍රයන්ගෙන් සිවිගෙයක් කරන්නාවූ රැස්වූ මහත් ජනසමූහයක් දුටුයේය. දැක මට මෙය කීයේය. යහළුව සාරථිය, රැස්වූ මේ මහජනසමූහතෙම නානාවිධවූ රක්තවස්ත්‍රයන්ගෙන් කුමක්පිණිස සිවිගෙයක් කරන්නේදැයි විචාලේය. දේවයන්වහන්ස, මෙතෙමේ මළතැනැත්තෙකැයි කීයෙමි. යහළුව සාරථිය, එහෙනම්, ඒ කළුරියකළතැනැත්තේ යම් තැනෙක්හිද එතනට රථය ගෙණයවයි කීයේය. දේවයන්වහන්ස, මම දේවයෙනි ඒ මැනවැයි විපස්සි කුමාරයාට පිළිවදන්දී ඒ කළුරිය කළ තැනැත්තේ යම්තැනෙක්හිද එතනට රථය යැව්වෙමි. දේවයන්වහන්ස, කුමාරතෙමේ පරලොවගියාවූ කළුරියකළතැනැත්තා දුටුයේය. දැක මට මෙය කීයේය. යහළුව සාරථිය, කිමෙක්ද මෙතෙම කළුරියකළතැනැත්තේදැයි විචාලේය, දේවයන්වහන්ස, මේතෙම කළුරියකළතැනැත්තේය. මව්තොමෝ හෝ පියතෙමේ හෝ අන්‍යවූ නෑසහලේ නෑයෝ හෝ ඔහු නොදකිත්. ඒ කළුරියකළතැනැත්තේද මව හෝ පියා හෝ අන්‍යවූ නෑසහලේ නෑයන් හෝ නොදක්නාහ. යහළුව සාරථිය, කිමෙක්ද මමත් මරණය ස්වභාවකොට ඇත්තෙම්ද මාවිසින් මරණය නොයික්මවනලද්දේද.

මම්පි න දක්ඛින්ති දෙවො වා දෙවී වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා. අහම්පි න දක්ඛිස්සාමි දෙවං වා දෙවිං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙති. තුම්හෙ ච දෙව මයඤ්චම්හා සබ්බෙ මරණධම්මා මරණං අනතීතා. තම්පි න දක්ඛින්ති දෙවො වා දෙවී වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතාති. ත්වම්පි න දක්ඛිස්සසි. දෙවං වා දෙවිං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙති. තෙනහි සම්මසාරථි අලංදානජ්ජ උය්‍යානභූමියා ඉතො ච අන්තෙපුරං පච්චනීයාහීති. එවං දෙවාති ඛො අහං දෙව විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතොව අන්තෙපුරං පච්චනීයාසිං. සො ඛො දෙව කුමාරො අන්තෙපුරගතො දුක්ඛී දුම්මනො පජ්ඣායති ධිරත්ථු කිර භො ජාති නාම යත්‍රහි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සති, ව්‍යාධි පඤ්ඤායිස්සති, මරණං පඤ්ඤායිස්සතීති.

12. අථ ඛො භික්ඛවෙ බන්ධුමස්ස රඤ්ඤො එතදහොසි. මාහෙව ඛො විපස්සී කුමාරො න රජ්ජං කාරෙසි.

---

දේවයන්වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූ නෑසහලේ නෑයෝ හෝ මාත් නොදකිත්ද, මමත් දේවයන්වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූ නෑසහලේ නෑයන් නොදක්නෙම්දැයි විචාළේය. දේවයන්වහන්ස, ඔබවහන්සේද අපිද යන සියල්ලෝ මරණය ස්වභාවකොට ඇත්තෝ වම්හ. අපවිසින් මරණය නොයික්මවනලද්දේය. දේවයන්වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූද නෑසහලේ නෑයෝ හෝ නුබවහන්සේද නොදක්නාහ. නුබවහන්සේද දේවයන්වහන්සේ හෝ දේවීන්වහන්සේ හෝ අන්‍යවූද නෑසහලේ නෑයන් නොදක්නෙහියයි කීයේය. යහලුව සාරථිය, එසේ නම් දැන් උද්‍යානභූමියට ගමනින් කම්නැත. මෙතනින්ම ඇතුළුනුවරට පෙරළා යවයි කීයේය. දේවයන්වහන්ස, මම දේවයෙනි ඒමැනවැයි විපස්සී කුමාරයාට පිළිවදන්දී එතනින්ම ඇතුළුනුවරට පෙරළා ගියෙමි. දේවයන්වහන්ස, ඒ මේ කුමාරතෙම ඇතුළුනුවරට පැමිණියේම දුක්ඇත්තේ නොසතුටු සිත් ඇත්තේ නන්අයුරින් විපිළිසර සිහිවිලි සිතයි. පින්වත්නි, යම්ජාතියෙක්හි උපන්නාහුගේ ජරාව පෙණෙන්නේද, ව්‍යාධිය පෙණෙන්නේද, මරණය පෙණෙන්නේද, ඒ ජාතියට නින්දාවේවායි කියායි.

12. ඉක්බිත්තෙන් බන්ධුමන්තු රජහට මේ අදහස වීය. විපස්සී කුමාරතෙම රාජ්‍යය කෙරේවා,

මාහෙව විපස්සී කුමාරො අගාරස්මා අනගාරියං පබ්බජි, මාහෙව නෙමිත්තකානං බ්‍රාහ්මණානං සච්චං අස්ස වචනන්ති. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස භිය්‍යො සොමත්තාය පඤ්ච කාමගුණානි උපට්ඨාපෙසි. යථා විපස්සී කුමාරො රජ්ජං කාරෙය්‍ය, යථා විපස්සිකුමාරො න අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය, යථා නෙමිත්තකානං බ්‍රාහ්මණානං මිච්ඡා අස්ස වචනන්ති. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සී කුමාරො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගිභූතො පරිචාරෙති.

13. අථ ඛො භික්ඛවෙ විපස්සිකුමාරො බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන සාරථිං ආමන්තෙසි. යොජෙහි සම්ම සාරථි භද්‍රානි භද්‍රානි යානානි උය්‍යානභූමිං ගච්ඡාම භූමිං දස්සනායාති. එවං දෙවාති ඛො භික්ඛවෙ සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා.

---

විපස්සී කුමාරතෙම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිනොවේවා. නිමිත්තපාඨක බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍ය නොවේවායි. මහණෙනි, ඉක්බිත්තෙන් බන්ධුමන්තු රජතෙම විපස්සී කුමාරයාට බොහෝසෙයින්ම පඤ්චකාමගුණයන් එළඹසිටවිය. කෙසේද, යම්සේ විපස්සී කුමාරතෙම රාජ්‍යය කරවන්නේද, යම්සේ විපස්සී කුමාරතෙම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි නොවන්නේද, යම්සේ නිමිත්තපාඨක බ්‍රාහ්මණයන්ගේ වචනය බොරුවන්නේද, එබඳු පඤ්චකාමගුණයෝයි. මහණෙනි, ඒකාලයෙහි විපස්සී කුමාරතෙම පඤ්චකාමගුණයන්ගෙන් පිණාගියේ එයින්ම යුක්තවූයේ ඉන්ද්‍රියයන් හසුරුවාලයි.

13. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී කුමාරතෙම බොහෝ වර්ෂයන්ගේද, බොහෝ වර්ෂ සියයන්ගේද, බොහෝ වර්ෂ සහශ්‍රයන්ගේද, ඇවෑමෙන් රථාචාර්‍ය්‍යයා ඇමතුයේය. යහළුව සාරථිය, යහපත් යහපත් යානාවන් යොදව. උද්‍යානභූමියට භූමිය දැකීමපිණිස යන්නෙමියි. දේවයන්වහන්ස, ඒ මැනවැයි ඒ සාරථිතෙමේ විපස්සී කුමාරයාට පිළිවදන්දී යහපත් යහපත් යානාවන් යොදවා,

විපස්සිස්ස කුමාරස්ස පටිවෙදෙසි. යුත්තානි ඛො තෙ දෙව භද්‍රානි භද්‍රානි යානානි, යස්සදානි කාලං මඤ්ඤසීති. අථ ඛො භික්ඛවෙ විපස්සී කුමාරො භද්‍රං යානං අභිරුහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි උය්‍යානභූමිං නිය්‍යාසි.

14. අද්දසා ඛො භික්ඛවෙ විපස්සී කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තො පුරිසං භණ්ඩුං පබ්බජිතං කාසායවසනං. දිස්වා සාරථිං ආමන්තෙසි. අයං පන සම්ම සාරථි පුරිසො කිං කතො, සීසම්පිස්ස න යථා අඤ්ඤෙසං, වත්ථානිපිස්ස න යථා අඤ්ඤෙසන්ති. එසො ඛො දෙව පබ්බජිතො නාමාති. කිංපනෙසො සම්ම සාරථි පබ්බජිතො නාමාති. එසො ඛො දෙව පබ්බජිතො නාම සාධු ධම්මචරියා සාධු සමචරියා සාධු කුසලචරියා සාධු පුඤ්ඤකිරියා සාධු අවිහිංසා සාධු භූතානුකම්පාති. සාධු ඛො සො සම්ම සාරථි පබ්බජිතො නාම. සාධුහි සම්ම සාරථි ධම්මචරියා සාධු සමචරියා සාධු කුසලචරියා සාධු පුඤ්ඤකිරියා සාධු අවිහිංසා සාධු භූතානුකම්පා.

---

විපස්සී කුමාරයාට දැන්වීය. දේවයන්වහන්ස, තුඹවහන්සේට යහපත් යහපත් යානාවෝ සොදනලද්දාහුය. දැන් තුඹවහන්සේ යම් ගමනකට කල්දන්නාසේක්නම් එය කරණුමැනවැයි කීයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී කුමාරතෙම යහපත් යානාවකට නැගී යහපත් යහපත් යානාවලින් උද්‍යානභූමියට පිටත්ව ගියේය.

14. මහණෙනි, විපස්සී කුමාරතෙම උද්‍යානභූමියට යන්නේ හිස මුඩුකළාවූ පැවිදිවූ කාසායවස්ත්‍රාච්ඡාදනයකළාවූ පුරුෂයෙකු දැක රියැදුරා ඇමතුයේය. යහළුව සාරථිය, මේ පුරුෂතෙම කුමක්කරණලද්දේද, ඔහුගේ හිසද සෙස්සන්ගේ හිසමෙන් නොවේ. ඔහුගේ වස්ත්‍රයෝද අන්‍යයන්ගේ වස්ත්‍රමෙන් නොවෙත්යයි කීයේය. දේවයන්වහන්ස, මෙතෙමේ ප්‍රව්‍රජිතනමැයි කීයේය. යහළුව සාරථිය, කිමෙක්ද, මේතෙමේ ප්‍රව්‍රජිතනම්දැයි විචාළේය. දේවයන්වහන්ස, මෙතෙමේ ධර්මයෙහි හැසිරීම මැනවැයි කියාද, සමචරියාව මැනවැයි කියාද, කුශලචර්‍ය්‍යාව මැනවැයි කියාද, පුණ්‍යක්‍රියාව මැනවැයි කියාද, සත්වහිංසානොකිරීම හෙවත් කරුණාපූර්වභාගය මැනවැයි කියාද, සත්වානුකම්පාව හෙවත් මෛත්‍රීපූර්වභාගය මැනවැයි කියාද, පැවිදිවූයේය. යහළුව සාරථිය, හෙතෙමේ ධර්මචර්‍ය්‍යාව මැනවැයි කියාද, සමචර්‍ය්‍යාව මැනවැයි කියාද, කුශලචර්‍ය්‍යාව මැනවැයි කියාද, පුණ්‍යක්‍රියාව මැනවැයි කියාද, සත්වහිංසානොකිරීම මැනවැයි කියාද, සත්වානුකම්පාව මැනවැයි කියාද, පැවිදිවූයේද.

තෙනහි සම්ම සාරථි යෙන සො පබ්බජිතො තෙන රථං පෙසෙහීති. එවං දෙවාති බො භික්ඛවෙ සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා යෙන සො පබ්බජිතො තෙන රථං පෙසෙසි. අථ බො භික්ඛවෙ විපස්සී කුමාරො තං පබ්බජිතං එතදවොච. ත්වං පන සම්ම කිංකතො සීසම්පි තෙ න යථා අඤ්ඤෙසං. වත්ථානිපි තෙ න යථා අඤ්ඤෙසන්ති. අහං බො දෙව පබ්බජිතො නාමාති. කිං පන ත්වං සම්ම පබ්බජිතො නාමාති. අහං බො දෙව පබ්බජිතො නාම. සාධු ධම්මචරියා සාධු සමචරියා සාධු කුසලචරියා සාධු පුඤ්ඤකිරියා සාධු අවිහිංසා සාධු භූතානුකම්පාති. සාධු බො ත්වං සම්ම පබ්බජිතො නාම සාධුහි සම්ම ධම්මචරියා සාධු සමචරියා සාධු කුසලචරියා සාධු පුඤ්ඤකිරියා සාධු අවිහිංසා සාධු භූතානුකම්පාති.

15 අථ බො භික්ඛවෙ විපස්සීකුමාරො සාරථිං ආමන්තෙසි. තෙනහි සම්ම සාරථි රථං ආදාය ඉතොව.

---

යහළුව සාරථිය, එහෙනම් ඒ ප්‍රව්‍රජිතතෙමේ යම්තැනෙක්හිද එතනට රථය යවවයි කීයේය. මහණෙනි, දේවයන්වහන්ස, ඒ මැනවැයි සාරථිතෙමේ විපස්සි කුමාරයාට පිළිවදන්දී ඒ පැවිදි තෙමේ යම්තැනෙක්හිද, එතනට රථය යැව්වේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී කුමාරතෙම ඒ ප්‍රව්‍රජිතයා මේ කාරණය විචාළේය. යහළුව, ඔබ කුමක්කරණලද්දෙහිද, ඔබගේ හිසද අන්‍යයන්ගේ හිසමෙන් නොවේ. ඔබගේ වස්ත්‍රයෝද අන්‍යයන් ගේ වස්ත්‍රමෙන් නොවෙත්. දේවයෙනි, මම ප්‍රව්‍රජිතනමැයි කීයේය. යහළුව කිමෙක්ද, යහළුව, ඔබ ප්‍රව්‍රජිතනම්දැයි විචාළේය. දේව යෙනි, මම ධර්මචර්‍ය්‍යාව මැනවැයි කියාද, සමචර්‍ය්‍යාව මැනවැයි කියාද, කුශලචර්‍ය්‍යාව මැනවැයි කියාද, පුණ්‍යක්‍රියාව මැනවැයි කියාද. අවිහිංසාසඞ්ඛ්‍යාත පූර්වභාගිය කරුණාව මැනවැයි කියාද, සත්වානු කම්පාව මැනවැයි කියාද, පැවිදිවූයෙමියි දැන්වීය. යහළුව, ධර්ම චර්‍ය්‍යාව මැනවැයි කියාද, සමචර්‍ය්‍යාව මැනවැයි කියාද, කුශලචර්‍ය්‍යාව මැනවැයි කියාද, පුණ්‍යක්‍රියාව මැනවැයි කියාද, අවිහිංසාව මැනවැයි කියාද, සත්වානුකම්පාව මැනවැයි කියාද, කිමෙක්ද ඔබ පැවිදිවූ යෙහිද.

15. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සිකුමාරතෙම රථාචාර්‍ය්‍යයා ඇමතුයේය. යහළුව රියැදුර එහෙනම් රථය රැගෙණ මෙතනින්ම.

අන්තෙපුරං පච්චනියාහි. අහං පන ඉධෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සා මීති. එවං දෙවාති ඛො භික්ඛවෙ සාරථී විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා රථං ආදාය තතොව අන්තෙපුරං පච්චනියාසි. විපස්සීපන කුමාරො තත්ථෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි.

16. අස්සොසි ඛො භික්ඛවෙ බන්ධුමතියා රාජධානියා මහාජනකායො චතුරාසීති පාණසහස්සානි. විපස්සී කිර කුමාරො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතොති. සුත්වාන තෙසං එතදහොසි. නහනූන සො ඔරකො ධම්මවිනයො, න සා ඔරිකා පබ්බජ්ජා, යත්ථ විපස්සී කුමාරො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො. විපස්සීපි නාම කුමාරො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සති. කිමඞ්ගපන න මයන්ති.

---

ඇතුළුනුවරට පෙරළාසව, මමවූකලි කෙස් දැලිරැවුලු හරවා කාසාය වස්ත්‍රයන් අන්දවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කීයේය. මහණෙනි, දේවයන්වහන්ස ඒ මැනවැයි සාරථිතෙමේ විපස්සිකුමාරයාට පිළිවදන්දී රථය රැගෙණ එතනින්ම ඇතුළුනුවරට පෙරළාගියේය. විපස්සිකුමාරතෙමේවූකලි එහිදීම කෙස් දැලිරැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්වා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වූයේය.

16. මහණෙනි, බන්ධුමතීනම් රාජධානියෙහි අසූසාරදහසක් ප්‍රාණීන්වූ මහත් ජනසමූහතෙමේ විපස්සී කුමාරතෙමේ කෙස් දැලි රැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූයේයයි ඇසුයේමය. අසා ඔවුන්ටද මේ අදහස වීය. විපස්සී කුමාරතෙම කෙස් දැලිරැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූයේනම් ඒ ධර්මවිනයසඞ්ඛ්‍යාත ශාසනයතෙමේ එකාන්තයෙන් ලාමක නොවන්නේමය. ඒ ප්‍රව්‍රජ්‍යා තොමෝද ලාමක නොවන්නිය. ප්‍රසිද්ධවූ විපස්සි කුමාරතෙමේත් කෙස් දැලිරැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූයේනම් අපි පැවිදිනොවෙමුය යනු කියනුම කවරේදැයි සිතීය.

අථ ඛො සො භික්ඛවෙ මහාජනකායො චතුරාසීතිපාණසහස්සානි කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා විපස්සිං බොධිසත්තං අගාරස්මා අනගාරියං පබ්බජිතං අනුපබ්බජිංසු. තාය සුදං භික්ඛවෙ පරිසාය පරිවුතො විපස්සී බොධිසත්තො ගාමනිගම රාජධානිසු චාරිකං චරති.

17. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. න ඛො මෙතං පතිරූපං යො'හං ආකිණ්ණො විහරාමි. යන්නූනාහං එකො ගණස්මා වූපකට්ඨො විහරෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සී බොධිසත්තො අපරෙන සමයෙන එකො ගණස්මා වූපකට්ඨො විහාසි. අඤ්ඤෙනෙව තානි චතුරාසීති පබ්බජිතසහස්සානි අගමංසු. අඤ්ඤෙන විපස්සී බොධිසත්තො.

---

මහණෙනි, අසූසාරදහසක් ප්‍රාණීන්වූ ඒ මහාජනසමූහතෙමේ කෙස් දැළිරැවුලු හරවා කාෂායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූ විපස්සී බොධිසත්වයන්වහන්සේ සමීපයෙහි පැවිදිවූහ. මහණෙනි, එකල්හි විපස්සී බොධිසත්වයන්වහන්සේ ඒ මහද් භික්ෂුපිරිසවිසින් පිරිවරණලදුව ගම්නියම්ගම් රජදනව්හි සැරිසරණසේක.

17. මහණෙනි, ඉක්බිත්තෙන් රහසිගතවූ එකීභාවයට පැමිණියාවූ විදර්ශී බොධිසත්වයන්වහන්සේට සිතපිළිබඳ මෙබඳු විශෙෂ කල්පනාවෙක් පහලවිය. ඒනම්, යම්බඳුවූ මම මෙබඳු සමූහයාවිසින් පිරිවරණලදුව වාසයකෙරෙම්ද, මට මෙය සුදුසුනොවෙයි. එකාන්තයෙන් මම හුදකලාවූයෙම් සමූහයාකෙරෙන් වෙන්ව වාසයකෙරෙම් නම් යෙහෙකැයි කියායි. (වෛශාඛ ශුක්ලපක්ෂය සම්බන්ධී චාතුද්දශී දිනයෙහි විදර්ශී බොධිසත්වයන්වහන්සේට මේ අදහස පහලවිය.) මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බොධිසත්වයන්වහන්සේ ඉන්මැතකලකදී තනිවූයේ ගණසඞ්ගණිකාවෙන් බැහැරව වාසයකෙළේය. ඒ අසූසාරදහසක් භික්ෂූහු අන්මගකින් ගියාහුය. විපස්සී බොධිසත්වයන්වහන්සේ අන්මගකින් ගියේය.

18. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස වාසූපගතස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. කිච්ඡං වතා'යං ලොකො ආපන්නො ජායති ච ජීයති ච චවති ච උපපජ්ජති ච. අථ ච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති ජරාමරණස්ස. කුදාස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සාති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති ජරාමරණං හොති. කිං පච්චයා ජරාමරණන්ති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා, අහු පඤ්ඤාය අභිසමයො. ජාතියා ඛො සති ජරාමරණං හොති, ජාතිපච්චයා ජරාමරණන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතද හොසි, කිම්හි නු ඛො සති ජාති හොති කිම්පච්චයා ජාතීති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා.

18. මහණෙනි, ඉක්බිත්තෙන් බෝමැඩ එක්රැයක් විසීමට පැමිණියාවූ රහසිගතවූ එකීභාවයට පැමිණියාවූ විදර්ශිබොධිසත්වයන් වහන්සේට මෙසේ සිතපිළිබඳ විශෙෂකල්පනාවක් පහළවිය, එකාන්තයෙන් මේ ලෝවැසිතෙමේ දුකට පැමිණියේය. උපදින්නේද වෙයි, දිරන්නේද වෙයි, මැරෙන්නේද වෙයි, චුතවන්නේද වෙයි, නැවත උපදින්නේද වෙයි, එසේදළුවත් මේ දුඃඛයාගේ නිගීමනයක් හෙවත් දුක්කෙළවරකිරීමක් නොදනී. ජරා මරණ දෙදෙනාගේ නිගීමනයක් නොදනි, කෙසේද, කවරකලකනම් මේ දුඃඛයාගේද මේ ජරාමරණ දෙදෙනාගේද නිගීමනයක් පෙණේදැයි කියායි. මහණෙනි, ඉක්බිත්තෙන් විදර්ශි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවිය, කුමක්නම් ඇතිකල්හි ජරා මරණවේද, කුමක් ප්‍රත්‍යයකොටගෙණ ජරා මරණ දෙකවේදැයි කියායි. මහණෙනි, එකල්හි විදර්ශි බොධිසත්වයන්වහන්සේට උදව්‍යයානු දශීනවශයෙන් ප්‍රඥසහගත සංකල්පනාව හෙතුකොටගෙණ උත්පත්තිය ඇතිකල්හි ජරා මරණ දෙකවෙයි. ජාතිප්‍රත්‍යයකොටගෙණ ජරා මරණ දෙකවේයයි. මෙසේ කාරණා පරිග්‍රාහික ප්‍රඥහුගේ සමාගමය විය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බොධිසත්වයන්වහන්සේට කුමක්නම් ඇතිකල්හි උත්පත්තියවේද, කුමක් ප්‍රත්‍යයකොටගෙණ උත්පත්තිය වේදැයි මේ කල්පනාවවිය, මහණෙනි එකල්හි විපස්සීබොධිසත්වයන්වහන්සේට ප්‍රඥසහගත මනස්කාරය හෙතුකොටගෙණ.

අහු පඤ්ඤාය අභිසමයො. භවෙ ඛො සති ජාති හොති භවප්පච්චයා ජාතීති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති භවො හොති කිම්පච්චයා භවොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. උපදානෙ ඛො සති භවො හොති උපාදානපච්චයා භවොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි, කිම්හිනු ඛො සති උපදානං හොති කිම්පච්චයා උපාදානන්ති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. තණ්හාය ඛො සති උපාදානං හොති තණ්හාපච්චයා උපාදානන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හිනු ඛො සති තණ්හා හොති කිම්පච්චයා තණ්හාති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො වෙදනාය ඛො සති තණ්හා හොති වෙදනාපච්චයා තණ්හාති.

---

භවයඇතිකල්හි ජාතියවෙයි, භවය ප්‍රත්‍යයකොටගෙණ ජාතියවේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමය විය. මහණෙනි, ඉක්බිත්තෙන් විදර්ශි බොධිසත්වයන්වහන්සේට මෙබඳු අදහසක් විය. කුමක්නම් ඇතිකල්හි භවයවේද, කුමක් ප්‍රත්‍යයකොටගෙණ භවයවේදැයි කියායි, මහණෙනි, එකල්හි විපස්සී බොධිසත්වයන්වහසේට ප්‍රඥාසහගත මනස්කාරය හෙතුකොටගෙණ උපාදානය ඇතිකල්හිම භවය වෙයි. උපාදානය ප්‍රත්‍යයකොටගෙණ භවයවේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බොධිසත්වයන්වහන්සේට මේ අදහස විය. කුමක්නම් ඇතිකල්හි උපාදානය වේද, කුමක් ප්‍රත්‍යයකොටගෙණ උපාදානයවේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සී බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගත මනස්කාරය හෙතුකොටගෙණ තෘෂ්ණාව ඇතිකල්හිම උපාදානය වෙයි, තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානයවේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බොධිසත්වයන්වහන්සේට මේ අදහස විය. කුමක්නම් ඇතිකල්හි තෘෂ්ණාව වේද, කුමක්ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාවවේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සී බොධිසත්වයන්වහන්සේට සුඛ දුඃඛ උපෙක්‍ෂා යන ත්‍රිවිධ වෙදනාව ඇතිකල්හිම තෘෂ්ණාවවෙයි. වෙදනාව ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාව වේයයි කාරණාපරිග්‍රාහිකප්‍රඥාහුගේ සමාගමය වූයේය.

අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති වෙදනා හොති කිම්පච්චයා වෙදනාති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො ඵස්සෙ ඛො සති වෙදනා හොති ඵස්සපච්චයා වෙදනාති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති ඵස්සො හොති කිම්පච්චයා ඵස්සොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. සළායතනෙ ඛො සති ඵස්සො හොති සළායතනපච්චයා ඵස්සොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො සති සළායතනං හොති කිම්පච්චයා සළායතනන්ති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. නාමරූපෙ ඛො සති සළායතනං හොති. නාමරූපපච්චයා සළායතනන්ති.

---

මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවිය, කුමක්නම් ඇතිකල්හි වෙදනාවවේද, කුමක් ප්‍රත්‍යයකොට ගෙණ වෙදනාවවේදැයි. මහණෙනි එකල්හි විපස්සිබොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගත මනස්කාරය හෙතුකොටගෙණ ස්පර්ශය ඇතිකල්හි වෙදනාව වෙයි, ස්පර්ශය ප්‍රත්‍යයකොටගෙණ වෙදනාව වේයයි උදව්‍යයානුදර්ශිනාදී වශයෙන් කාරණා පරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සීබොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය, කුමක්නම් ඇතිකල්හි ස්පර්ශයවේද කුමක් ප්‍රත්‍යයකොටගෙණ ස්පර්ශයවේදැයි. මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට චක්ෂුරාදි ෂඩායතනයඇතිකල්හිම ස්පර්ශය වෙයි. ෂඩායතනය ප්‍රත්‍යයකොටගෙණ ස්පර්ශයවේයයි උදව්‍යයානුදර්ශිනාදීවශයෙන් කාරණා පරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය. කුමක්නම් ඇතිකල්හි ෂඩායතනයවේද, කුමක් ප්‍රත්‍යයකොටගෙණ ෂඩායතනයවේදැයි කියායි. මගණෙනි, එකල්හි විදර්ශී බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගත මනස්කාරය හෙතුකොටගෙණ නාමරූපදෙක ඇතිකල්හි ෂඩායතනය වෙයි. නාමරූපදෙක ප්‍රත්‍යයකොටගෙණ ෂඩායතනයවේයයි කාරණා පරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය.

අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හිනුඛො සති නාමරූපං හොති කිම්පච්චයා නාමරූපන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො විඤ්ඤාණෙඛො සති නාමරූපං හොති විඤ්ඤාණපච්චයා නාමරූපන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හිනුඛො සති විඤ්ඤාණං හොති කිම්පච්චයා විඤ්ඤාණන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. නාමරූපෙ ඛො සති විඤ්ඤාණං හොති නාමරූපපච්චයා විඤ්ඤාණන්ති.

19. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. පච්චුදාවත්තති ඛො ඉදං විඤ්ඤාණං නාමරූපම්හා නාපරං ගච්ඡති.

---

මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බොධිසත්වයන්වහන්සේට මේ අදහස විය, කුමක්නම් ඇතිකල්හි නාමරූපදෙක වේද, කුමක් ප්‍රත්‍යයකොටගෙණ නාමරූපදෙක වේදැයි. මහණෙනි, එකල්හි විපස්සී බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගත මනස්කාරය හෙතුකොටගෙණ විඥානය ඇතිකල්හිම නාමරූපදෙක වෙයි, විඥානය ප්‍රත්‍යයකොටගෙණ නාමරූපදෙක වේයයි කාරණා පරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමය වූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බොධිසත්වයන්වහන්සේට මේ අදහසවිය. කුමක්නම් ඇතිකල්හි විඥානයවේද, කුමක් ප්‍රත්‍යයකොටගෙණ විඥානයවේදැයි කියායි. මහණෙනි එකල්හි විපස්සී බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගත මනස්කාරය හෙතුකොටගෙණ නාමරූපදෙක ඇතිකල්හි විඥානය වෙයි. නාමරූප ප්‍රත්‍යයකොටගෙණ විඥානයවේයයි කාරණා පරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමය වූයේය.

19. මහණෙනි, ඉක්බිත්තෙන් විදර්ශී බොධිසත්වයන්වහන්සේට මේ අදහස විය. ප්‍රතිසන්ධිවිඥානය විදර්ශනාවිඥානය යන මේ දෙක ප්‍රත්‍යය ආරම්මණ දෙකින් පෙරළා නවතී, මේ විඥානදෙකම නාමරූපදෙකින් බැහැරනොයේ හෙයින් නාමරූප දෙක නොයික්මවයි.

එත්තාවතා ජායෙථ වා ජීයෙථ වා මීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා, යදිදං නාමරූපපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. සමුදයො සමුදයොති ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

20. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො අසති ජරාමරණං න හොති,

---

මෙපමණකින් හෙවත් විඥානය නාමරූපදෙකට ප්‍රත්‍යයවනකල්හි නොහොත් නාමරූපද්වය විඥානවයට අන්‍යොන්‍යප්‍රත්‍යයවන කල්හි උපදින්නේ හෝ දිරන්නේ හෝ චුතවන්නේ හෝ නැවත උපදින්නේ හෝ වෙයි. ඒනම්, නාමරූපයන් ප්‍රත්‍යයකොටගෙණ විඥානය හෙවත් පිළිසිඳගන්නා සිත වන්නේය. විඥානය ප්‍රත්‍යයකොට ගෙණ නාමරූපදෙක වන්නේය. නාමරූපදෙක ප්‍රත්‍යයකොටගෙණ චක්ෂුරාදි ෂඩායතනය වන්නේය. ෂඩායතනය ප්‍රත්‍යයකොටගෙණ ෂඩ්වාරික ස්පර්ශය වන්නේය. ස්පර්ශය ප්‍රත්‍යයකොටගෙණ ත්‍රිවිධ වෙදනාව වන්නේය. වෙදනාව ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාව වන්නේය. තෘෂ්ණාව ප්‍රත්‍යයකොටගෙණ අරමුණුදැඩිකොටගැණීමයයි කියූ උපාදානය වන්නේය. උපාදානය ප්‍රත්‍යයකොටගෙණ භවය වන්නේය. භවය ප්‍රත්‍යයකොටගෙණ ජාතිය වන්නේය. ජාතියප්‍රත්‍යයකොටගෙණ ජරාව හා මරණයද ශොකකිරීමය, වැලපීමය, කායිකදුකය, දෞර්මනසය, දැඩිආයාසය යන මොව්හු පහලවෙත්. මෙසේ මේ සියලුදුක්රාශිහුගේ පහලවීම වේ. මහණෙනි, සමුදය සමුදයයි හෙවත් පහලවීම පහලවීමයයි විදර්ශී බොධිසත්වයන්වහන්සේට පෙරනොඇසුවිරූ දහම් නිමිත්තකොටගෙණ සත්‍යඥානචක්ෂුස පහලවිය. තත්වාවිඥානය පහලවිය. ප්‍රඥාව පහලවිය. විද්‍යාව පහලවිය. ප්‍රඥාලොකය පහලවීය.

20. මහණෙනි, ඉක්බිත්තෙන් විදර්ශී බොධිසත්වයන්වහන්සේට මේ අදහස වීය. කුමක්නම් නැතිකල්හි ජරාමරණදෙක නොවේද.

කිස්ස නිරොධා ජරාමරණ නිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො ජාතියා ඛො අසති ජරාමරණං න හොති ජාතිනිරොධා ජරාමරණ නිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො අසති ජාති න හොති කිස්ස නිරොධා ජාතිනිරොධොති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, භවෙ ඛො අසති ජාති න හොති භවනිරොධා ජාති නිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො අසති භවො න හොති, කිස්ස නිරොධා භවනිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. උපාදානෙ ඛො අසති භවො න හොති. උපාදාන නිරොධා භවනිරොධොති, අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි.

---

කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් ජරාමරණනිරොධය වේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගතමනස්කාරය හෙතුකොටගෙණ උත්පත්තියනැතිකල්හි ජරාමරණ දෙක නොවෙයි. ජාතිහුගේ නිරවශෙෂ නිරොධයෙන් ජරාමරණ නිරොධය වේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විදර්ශි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය. කුමක්නම් නැතිකල්හි ඉපදීම නොවේද. කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් ජාතිනිරොධය වේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගතමනස්කාරය හෙතුකොටගෙණ භවය නැතිකල්හි ජාතිය නොවෙයි. භවනිරොධයෙන් ජාතිනිරොධය වේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය. කුමක්නම් නැතිකල්හි භවය නොවේද, කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් භවනිරොධය වේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට උපායමනස්කාරය හෙතුකොටගෙණ උපාදානය නැතිකල්හිම භවය නොවෙයි. උපාදානනිරොධය හෙතුකොටගෙණ භවනිරොධය වේයයි. කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය.

කිම්හි නුඛො අසති උපාදානං න හොති. කිස්ස නිරොධා උපාදාන නිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. තණ්හාය ඛො අසති උපාදානං න හොති. තණ්හා නිරොධා උපාදාන නිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නුඛො අසති තණ්හා න හොති. කිස්ස නිරොධා තණ්හා නිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. වෙදනාය ඛො අසති තණ්හා න හොති. වෙදනානිරොධා තණ්හා නිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නුඛො අසති වෙදනා න හොති, කිස්ස නිරොධා වෙදනා නිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො ඵස්සෙ ඛො අසති වෙදනා න හොති. ඵස්සනිරොධා වෙදනානිරොධොති,

---

කුමක්නම් නැතිකල්හි උපාදානය නොවේද, කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් උපාදානයන්ගේ නිරොධය වේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගතමනස්කාරයහෙතුකොටගෙණ තෘෂ්ණාව නැතිකල්හි උපාදානය නොවෙයි. තෘෂ්ණා නිරොධය හෙතුකොටගෙණ උපාදානනිරොධය වේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, ඉක්බින්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය. කුමක්නම් නැතිකල්හි තෘෂ්ණාව නොවේද. කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් තෘෂ්ණානිරොධය වේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සී බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගතමනස්කාරය හෙතුකොටගෙණ ත්‍රිවිධවෙදනාව නැතිකල්හි තෘෂ්ණාව නොවෙයි. වෙදනාහුගේ නිරවශෙෂ නිරොධයෙන් තෘෂ්ණානිරොධය වේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය. කුමක්නම් නැතිකල්හි වෙදනාව නොවේද. කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් වෙදනානිරොධය වේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සී බොධිසත්වයන්වහන්සේට උපායමනස්කාරය හෙතුකොටගෙණ ස්පර්ශයනැතිකල්හි වෙදනාව නොවෙයි. ස්පර්ශනිරොධයෙන් වෙදනානිරොධය වේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමය වූයේය.

අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධි සත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො අසති ඵස්සො න හොති. කිස්ස නිරොධා ඵස්සනිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො. සළායතනෙ ඛො අසති ඵස්සො න හොති. සළායතන නිරොධා ඵස්සනිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො අසති සළායතනං න හොති. කිස්ස නිරොධා සළායතනනිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො, නාමරූපෙ ඛො අසති සළායතනං න හොති. නාමරූපනිරොධා සළායතනනිරොධොති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නු ඛො අසති නාමරූපං න හොති. කිස්ස නිරොධා නාමරූප නිරොධොති

---

මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය. කුමක්නම් නැතිකල්හි ස්පර්ශය නොවේද. කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් ස්පර්ශනිරොධය වේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට උපායමනස්කාරය හෙතුකොටගෙණ ෂඩායතනය නැතිකල්හි ස්පර්ශය නොවෙයි. ෂඩායතනයන්ගේ නිරවශෙෂ නිරොධයෙන් ස්පර්ශනිරොධය වේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමය වූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය. කුමක්නම් නැතිකල්හි ෂඩායතනය නොවේද, කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් ෂඩායතනනිරොධය වේදැයි කියායි. මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට ප්‍රඥාසහගතමනස්කාරය හෙතුකොටගෙණ චතුර්විධ අරූපස්කන්ධසඞ්ඛ්‍යාත නාමය හා රූපස්කන්ධසඞ්ඛ්‍යාත රූපය නැතිකල්හි ෂඩායතනය නොවෙයි. නාමරූප නිරොධය හෙතුකොටගෙණ ෂඩායතනනිරොධය වේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමය වූයේය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අදහසවූයේය. කුමක්නම් නැතිකල්හි නාමරූප දෙක නොවේද, කුමක්හුගේ නිරවශෙෂ නිරොධයෙන් නාමරූපනිරොධයවේදැයි කියායි.

අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා.
අහු පඤ්ඤාය අභිසමයො. විඤ්ඤාණෙ ඛො අසති නාමරූපං න
හොති. විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධොති. අථ ඛො භික්ඛවෙ
විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි. කිම්හි නුඛො අසති
විඤ්ඤාණං න හොති. කිස්ස නිරොධා විඤ්ඤාණනිරොධොති. අථ
ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා
අහු පඤ්ඤාය අභිසමයො. නාමරූපෙ ඛො අසති විඤ්ඤාණං න
හොති. නාමරූපනිරොධා විඤ්ඤාණ නිරොධොති.

21. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි.
අධිගතො ඛො මෙ අයං මග්ගො බොධාය, යදිදං නාමරූප
නිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො

---

මහණෙනි, එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට ප්‍රඥා
සහගතමනස්කාරය හෙතුකොටගෙණ විඥානය නැතිකල්හි නාම
රූපය නොවෙයි. විඥානයාගේ නිරවශෙෂ නිරොධයෙන් නාමරූප
නිරොධය වේයයි කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය. මහ
ණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට මේ අද
හසවූයේය. කුමක්නම් නැතිකල්හි විඥානය නොවේද, කුමක්හුගේ
නිරවශෙෂ නිරොධයෙන් විඥානනිරොධය වේදැයි කියායි. මහණෙනි,
එකල්හි විපස්සි බොධිසත්වයන්වහන්සේට උපායමනස්කාරය හෙතු
කොටගෙණ නාමරූපදෙක නැතිකල්හි විඥානය නොවෙයි නාම
රූප දෙදෙනාගේ නිරවශෙෂ නිරොධයෙන් විඥානනිරොධය වේයයි
උදව්‍යායාදි වශයෙන්කාරණාපරිග්‍රාහික ප්‍රඥාහුගේ සමාගමයවූයේය.

21. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේට
මේ අදහසවූයේය. ඒනම්, මාවිසින් මේ විදර්ශනාමාර්ගයතෙම චතුස්
සත්‍යාවබොධයපිණිස හෙවත් ආර්‍ය්‍යමාර්ගඥානලාභයපිණිස ලබනලද්
දේමය හෙවත් අවබොධකරණලද්දේමය. ඒ කවරමාර්ගයෙක්දයත්,
චතුර්විධ අරූපස්කන්ධසඞ්ඛ්‍යාත නාමයාගේ හා රූපස්කන්ධසඞ්ඛ්‍යාත
රූපයාගේ නිරවශෙෂ නිරොධය හෙතුකොටගෙණ විඥාන නිරොධය
වෙයි. විඥානයාගේ නිරවශෙෂ නිරොධය හෙතුකොටගෙණ නාම
රූපදෙදෙනාගේ නිරොධය වෙයි.

නාමරූපනිරොධා සළායතනනිරොධො. සළායතනනිරොධා ඵස්සනිරොධො. ඵස්සනිරොධා වෙදනානිරොධො. වෙදනානිරොධා තණ්හානිරොධො. තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො. භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. නිරොධො නිරොධොති ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

22. අථ ඛො භික්ඛවෙ විපස්සී බොධිසත්තො අපරෙන සමයෙන පඤ්චසු පාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහාසි.

---

නාමරූප දෙදෙනාගේ නිරවශෙෂ නිරෙධය හෙතුකොටගෙණ ෂඩායතනයන්ගේ නිරෙධය වෙයි. ෂඩායතනයන්ගේ නිරවශෙෂ නිරොධය හෙතුකොටගෙණ ස්පර්ශ නිරෙධය වෙයි. ස්පර්ශනිරෙධය හෙතුකොටගෙණ ත්‍රිවිධවෙදනාහුගේ නිරෙධය වේ. වෙදනානිරෙධය හෙතුකොටගෙණ එකසියඅටක් ප්‍රභෙදඇති තෘෂ්ණාහුගේ නිරෙධය වේ. තෘෂ්ණානිරෙධය හෙතුකොටගෙණ කාමූපාදනාදි උපාදනයන්ගේ නිරෙධය වෙයි. උපාදනනිරොධය හෙතුකොටගෙණ කර්ම්භවනිරෙධය වෙයි. භවනිරෙධය හෙතුකොටගෙණ ජාතිනිරෙධය වෙයි. ජාතිනිරෙධය හෙතුකොටගෙණ ජරාව හා මරණයද සොකකිරීමය, වැළපීමය, කායිකදුක්ඛය දෞර්මනස්‍යය, දැඩිආයාසය යන මොව්හු අනුත්පාද නිරෙධයෙන්නිරුද්ධවෙත්. මෙසේ මේ සියලු දුක්රාශීහුගේ අනුත්පාදනිරොධය වේයයි. මහණෙනි, නිරොධය නිරොධයයි විදර්ශි බොධිසත්වයන්වහන්සේට පෙරනොඇසුවිරූ දහම්නිමිත්තකොටගෙණ සත්‍යඥානචක්ෂුස පහළවිය. තත්‍වාවබොධඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ප්‍රඥාලොකය පහළවිය.

22. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බොධිසත්වයන්වහන්සේ ප්‍රත්‍යයහා ප්‍රත්‍යය නිරෙධය දැන ඉන් මැතකලකදී උපාදනග්‍රහණයට ප්‍රත්‍යයවූ ස්කන්ධපඤ්චකයෙහි උදයසඞ්ඛ්‍යාත උත්පත්තිය හා ව්‍යයසඞ්ඛ්‍යාත විනාශය නැවත නැවත නුවණින් සලකමින් හෙවත් සම්පූර්ණත්වයට පැමිණියාවූ උට්ඨානගාමිනි විදර්ශනාව උසුලමින් වාසයකළේය.

ඉතිරූපං ඉතිරූපස්ස සමුදයො ඉතිරූපස්ස අත්ථගමො ඉති වෙදනා ඉතිවෙදනාය සමුදයො ඉතිවෙදනාය අත්ථගමො ඉතිසඤ්ඤා ඉති සඤ්ඤාය සමුදයො ඉතිසඤ්ඤාය අත්ථගමො ඉතිසංඛාරා ඉතිසංඛාරානං සමුදයො ඉතිසංඛාරානං අත්ථගමො. ඉතිවිඤ්ඤාණං ඉතිවිඤ්ඤාණස්ස සමුදයො ඉතිවිඤ්ඤාණස්ස අත්ථගමොති, තස්සපඤ්චසු පාදානක්ඛන්ධෙසු උදයව්‍යයානුපස්සිනො විහරතොන චිරස්සෙවඅනුපාදාය ආසවෙහි චිත්තංවිමුච්චි.

දුතියක භාණවාරං නිට්ඨිතං.

---

කෙසේදයත්, මේ රූපයයි හෙවත් භූත උපාදායාදී භෙදය ආදිකොට ලක්ෂණ රස පච්චුපට්ඨානාදිවශයෙන් වැනසීම සවභාව කොට ඇත්තේ රූපයයි. (මෙයින් රූප පරිග්‍රහණය කියන ලදී. සෙස්සද මෙම ක්‍රමයෙන් විස්තරයට පැමිණවියයුතු,) රූපයාගේ පහලවීම මෙසේයි හෙවත් අවිද්‍යාහුගේ පහලවීමෙන් රූපසමුදය වෙයි. තෘෂ්ණාසමුදයෙන් කර්‍මසමුදය වෙයි. ආහාරසමුදයෙන් රූපසමුදය වෙයි. මෙසේ රූපයාගේ අස්තඞ්ගමය වෙයි හෙවත් අවිද්‍යාදීන්ගේ නිරොධයෙන් රූපනිරොධය වෙයි. සුඛදුඃඛ උපෙක්ෂා යන මේ ත්‍රිවිධ ප්‍රභෙදඇත්තේ වෙදනාවයි. මෙසේ වෙදනාහුගේ පහලවීම වෙයි. මෙසේ වෙදනාහුගේ අස්තඞ්ගමය වෙයි. මේ සංඥාවයි. මෙසේ සංඥාහුගේ පහලවීම වෙයි. මෙසේ සංඥාහුගේ නිරොධය වෙයි. මේ සංස්කාරයෝයි. මෙසේ සංස්කාරයන්ගේ පහලවීම වෙයි. මෙසේ සංස්කාරයන්ගේ අස්තඞ්ගමය වෙයි. මේ විඥානයයි. මෙසේ විඥානයාගේ පහලවීම වෙයි. මෙසේ විඥානයාගේ අස්තඞ්ගමය වෙයි කියායි, උපාදානයට ප්‍රත්‍යයවූ පඤ්චස්කන්ධයන්හි සම්‍යක් ප්‍රඥාවෙන් උදයව්‍යයලක්ෂණය අනුවදකිමින් වාසයකරන්නාවූ ඒ විපස්සි බොධිසත්වයන්වහන්සේගේ සිත නොබෝකලකින්ම උපාදානයනොකොට කාමාදි ආශ්‍රවයන් කෙරෙන් විශෙෂයෙන් මිදුනේය. (මෙපමණකින් මහාපුරුෂයන්වහන්සේ සියලුබන්ධනයන්ගෙන් වෙසෙසින් මිදුනාවූ සූර්‍ය්‍යරශ්මියෙන් පහස්නාලද පියුමක්මෙන් අත්‍යර්ථයෙන් ප්‍රබොධවූ චිත්තසන්තානඇතිසේක් චතුර්විධමාර්ගඥානය චතුර්විධඵලඥානය චතුස්ප්‍රතිසම්භිදාඥානය යනාදි සකල බුද්ධ ගුණයන් හස්තප්‍රාප්තකල බැව් සැලකියයුතු.)

දෙවෙනි බණවර නිමියේයි.

**3.** 1. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස එතදහොසි. යන්නූනාහං ධම්මං දෙසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එතද හොසි. අධිගතො ඛො මෙ අයං ධම්මො ගම්භීරො දුද්දසො දුරනු බොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙද නියො. ආලයරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසමුදිතා. ආලය රාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසමුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො. ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛ යො විරාගො නිරොධො නිබ්බාණං.

---

**3.** 1. මහණෙනි, ඉක්බිත්තෙන් හෙවත් සම්‍යක්සම්බොධියෙන් අටවෙනි සතියෙහි අජපල්නුගරුකමුල වැඩඋන්නාවූ අභිත් සම්‍යක් සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන්වහන්සේට ඒකාන්තයෙන් මම ධර්‍ම දෙශනාකරන්නෙම්දෝහෝයි මෙබඳු කල්පනාවෙක් උපන්නේය. මහණෙනි, එකල්හිදී අභිත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට මේ අදහස පහලවිය. මාවිසින් මේ දුඃඛසත්‍යය යනාදින් නිර්‍වෙදයටපැමිණි ස්වයම්භූඥානයෙන් යථාස්වභාවයෙන් ප්‍රතිවෙධ කරණලද මේ චතුස්සත්‍යධර්‍මයතෙම අල්පබුද්ධීන්විසින් නොලැබිය හැකි පිහිටඇතිහෙයින් ගැඹුරුවෙයි. දුකසේ දක්කයුතු වෙයි. එහෙ සින්ම දුකසේ අවබොධකටයුතු වෙයි. සාන්තයි හෙවත් නිවුණේ වෙයි. ශ්‍රේෂ්ඨ වෙයි, තර්කඥානයෙන් බැසගතනොහැකි වෙයි හෙවත් ඥානයෙන් බැසගතයුතු වෙයි. සියුම්වෙයි. සම්‍යක්ප්‍රතිපදානුයොගීවූ පණ්ඩිතයන්විසින්ම දතයුතුවෙයි. මේ ප්‍රජාතොමෝ ආලයසඞ්ඛ්‍යාත පඤ්චකාමගුණයෙහි අභිරමනය ඇත්තිය. පඤ්චකාමගුණයන්හි ඇලුනාහුය. පඤ්චකාමගුණාලයෙහි අතිශයසම්මුදිතා ඇත්තීය. පඤ්චකාමගුණයෙහි අභිරමනය ඇත්තාවූ පඤ්චකාමගුණයන්හි ඇලුනාවූ පඤ්චකාමගුණයෙහි අතිශය සම්මුදිතා ඇත්තාවූ සත්ව වර්ගයාවිසින් මේ සංස්කාරාදීන්ට ප්‍රත්‍යයවූ අවිද්‍යාදිලක්‍ෂණයවූ ප්‍රතීත්‍යසමුත්පාදය යන මේ කාරණය දුකසේ දක්කයුතු වෙයි. සියලු සංස්කාරයන්ගේ සංසිඳීම ඇත්තාවූ සියලු කාමාදි උපධීන්ගේ වෙසෙසින් දුරලීම ඇත්තාවූ තෘෂ්ණාහුගේ ගෙවීමවූ රාගාදිරජස් නැත්තාවූ ක්ලෙශනිරොධයවූ වාණසඞ්ඛ්‍යාත තෘෂ්ණාහුගේ අභාව යෙන් නිර්‍වාණය යන යමක් ඇද්ද මේ කාරණයද දුකසේ දක්ක යුතු වෙයි.

අහඤ්චෙව ඛො පන ධම්මං දෙසෙය්‍යං, පරෙච මෙ න ආජානෙය්‍යුං සො මම'ස්ස කිලමථො, සා මම'ස්ස විහෙසාති.

2. අපිස්සු භික්ඛවෙ විපස්සිං භගවන්තං අරහන්තං සම්මා සම්බුද්ධං ඉමා අනච්ඡරියා ගාථා පටිභංසු පුබ්බෙ අස්සුතපුබ්බා.

කිච්ඡෙන මෙ අධිගතං හලං'දානි පකාසිතුං
රාගදොසපරෙතෙහි නා'යං ධම්මො සුසම්බුධො,
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධෙන ආවටාති.

ඉතිහ භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස පටිසංචික්ඛතො අප්පොස්සුක්කතාය චිත්තං නමි.

---

මම ධර්මය දෙශනාකරන්නෙම්නමුත් අන්‍යයෝත් මාගේ ධර්මය අවබොධ නොකරන්නාහුනම් ඒ ව්‍යාපාරය මට ක්ලාන්තයක් වන්නේය. ඒ ධර්මදෙශනාතොමෝ මට වෙහෙස වන්නිය.

2 මහණෙනි, තවද අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන් වහන්සේට පෙර නොඇසූවිරූ මේ ආශ්චර්‍ය්‍යානුකාරීවූ ගාථාවෝ ප්‍රතිභාණසඞ්ඛ්‍යාත ඥානයට ගොචරවූහ. හෙවත් සර්වප්‍රකාරයෙන් විතර්කණය කටයුතු බවට පැමිණියාහුය. මාවිසින් පාරමී සම්භරණය කරණ කාලයෙහි දුකින් හෙවත් දුඃඛප්‍රතිපදාවෙන් ප්‍රතිවෙධ කරණලද ධර්මය දැන් ප්‍රකාශකරන්ට නුසුදුසුයි හෙවත් දෙශනාකිරීමෙන් ප්‍රයොජන නැත්තේය, රාගවෙෂාදීන්ගෙන් පීඩිතවූ හෝ රාගාදි ක්ලෙශානුගතවූවන්විසින් මේ ධර්මයතෙම සුවසේ අවබොධකටහැකි නොවන්නේය. ප්‍රතිශ්‍රොතස අනුවයන්නාවූ නොහොත් නිත්‍යසුඛාදියට ප්‍රතිපක්‍ෂවූ නිර්වේදඥානදර්ශනලාභාදියපිණිස පවත්නාවූ සියුම්වූ ගැඹුරුවූ එහෙයින්ම දුකසේ දැක්කයුතුවූ දුකසේ අවබොධකටයුතුවූ අණුතරවූ ධර්මය කාමරාග භවරාගාදීන් රඳනාලද්දාවූ තමස්කන්ධ සඞ්ඛ්‍යාත අවිද්‍යාරාශියෙන් අජ්ඣොත්ථරණය කරණලද්දාවූ හෙවත් යටකරණලද්දාවූ සත්වයෝ අනිත්‍යදුඃඛඅනාත්මාදිවශයෙන් නොදක්නාහුයයි. මහණෙනි, මෙසේ මේ ධර්මගම්භීරභාවය නිමිතිකොට නුවණින් සලකන්නාවූ අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ සිත මන්දොත්සාහීත්වයට නැමුනේය.

නො ධම්මදෙසනාය. අථ ඛො භික්ඛවෙ අඤ්ඤතරස්ස මහාබ්‍රහ්මුනො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය එතදහොසි. නස්සති වත භො ලොකො, විනස්සති වත භො ලොකො, යත්‍රහි නාම විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති, නො ධම්මදෙසනායාති.

3. අථ ඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා, සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුරතො පාතුරහොසි. අථ ඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණං ජානුමණ්ඩලං පඨවියං නිහන්ත්වා යෙන විපස්සි භගවා අරහං සම්මාසම්බුද්ධො තෙන'ඤ්ජලිං පණාමෙත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච.

---

ධර්මදෙසනාවපිණිස සිතනොනැමුනේය. මහණෙනි, ඉක්බිත්තෙන් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේගේ සිත පිළිබඳවූ සර්වප්‍රකාර විතර්කය සිතින්දැනගෙණ එක්තරු (මේසක්වල ශ්‍රෙෂ්ඨ) බ්‍රහ්මරාජයෙකුට මේ අදහසවිය, යම් ලොකයෙක්හිනම් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේගේ සිත අල්පොත්සාහිභාවයට නැමේද, ධර්මදෙශනාවපිණිස නොනැමේද, පින්වත්නි, එකාන්තයෙන් ඒ ලොකයතෙම නස්නේය. පින්වත්නි, එකාන්තයෙන් ඒ ලොකයතෙම වැනසෙන්නේය කියාසි.

3. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ මහාබ්‍රහ්මතෙම බලවත් පුරුෂයෙක් වක්කළ අතක් දික්කරන්නේ හෝ යම්සේද, දික්කළ අතක් වක්කරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම බඹලොවදී අතුරුදහන්වූයේම අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේගේ ඉදිරියෙහි පහළවූයේය. මහණෙනි, එකල්හි ඒ මහාබ්‍රහ්මතෙම උතුරුසළුව එකස්කොට දකුණු දනමඬල පෘථිවියෙහි ඔබා අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිනම් ඒ දෙසට අඤ්ජලිප්‍රණාමය කොට අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය.

දෙසෙතු භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං, සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා, අස්සවනතා ධම්මස්ස පරිහායන්ති, භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරොති.

4. එවං වුත්තෙ භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො මහාබ්‍රහ්මානං එතදවොච. මය්හම්පි බො බ්‍රහ්මෙ එතදහොසි. යන්නූනාහං ධම්මං දෙසෙය්‍යන්ති. තස්ස මය්හං බ්‍රහ්මෙ එතදහොසි. අධිගතො ඛො මෙ අයං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො. ආලයරාමා ඛො පනා'යං පජා ආලයරතා ආලයසමුදිතා. ආලයරාමාය ඛොපන පජාය ආලයරතාය ආලයසමුදිතාය.

---

ස්වාමිනි, භාග්‍යවතුන්වහන්සේ ධර්මදේශනාකරණ සේක්වා, සුගතයන්වහන්සේ ධර්මදේශනාකරණ සේක්වා. ප්‍රඥාචක්‍ෂුසෙහි ස්වල්පවූ රාගාදිරජස් ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හෙතුකොටගෙණ සත්වයෝ පිරිහෙත්. ධර්මය අවබොධකරන්නෝ ඇතිවන්නාහයි කියායි.

4. මහණෙනි, මෙසේ ආරාධනාකළකල්හි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විපස්සීභාග්‍යවතුන්වහන්සේ ඒ මහාබ්‍රහ්මයාට මේ කාරණය වදාළේය, බ්‍රහ්මය, ඒකාන්තයෙන් මම ධර්මදේශනා කරන්නෙම්දෝ හෝයි මටද මේ අදහසවීය, බ්‍රහ්මය ඒ මට, නැවත මේඅදහසවූයේය. මාවිසින් දුඃඛසත්‍යය යනාදීන් නිර්වේදයට පැමිණ ස්වයම්භූඥානයෙන් ප්‍රතිවෙධ කරණලද මේ චතුඃසත්‍ය ධර්මයතෙම අල්පබුද්ධීන් විසින් නොලැබියහැකි පිහිට ඇතිහෙයින් ගැඹුරුවෙයි, දුකසේ දක්කයුතුවෙයි, එහෙයින්ම දුකසේ අවබොධ කටයුතුවෙයි. ශාන්තයි ශ්‍රේෂ්ඨවෙයි, තර්කඥානයෙන්බැසගතනොහැකිවෙයි, හෙවත්ඥානයෙන් බැසගතයුතුවෙයි. සියුම්වෙයි, සම්‍යක්ප්‍රතිපදානුයොගීවූ පණ්ඩිතයන්විසින්ම දතයුතුවෙයි. මේප්‍රජාතොමෝ ආලයසඞ්ඛ්‍යාත පඤ්චකාමගුණයෙහි අභිරමනය ඇත්තීය. පඤ්චකාමගුණයන්හි ඇලුනාහුය. පඤ්චකාමගුණාලයෙහි අතිශය සම්මුදිතා ඇත්තීය, පඤ්චකාමගුණයෙහි අභිරමණය ඇත්තාවූ පඤ්චකාමගුණයන්හි ඇලුනාවූ පඤ්චකාමගුණයෙහි අතිශය සම්මුදිතා ඇත්තාවූ සත්වවර්ගයා විසින්.

දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදෙ. ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාණං. අහංඤ්චෙව ඛො පන ධම්මං දෙසෙය්‍යං පරෙච මෙ න ආජානෙය්‍යුං සො මමස්ස කිලමථො, සා මමස්ස විහෙසාති, අපිස්සු මං බ්‍රහ්මෙ ඉමා අනච්ඡරියා ගාථා පටිභංසු පුබ්බෙ අස්සුතපුබ්බා

කිච්ඡෙන මෙ අධිගතං හලන්දානි පකාසිතුං
රාගදොසපරෙතෙහි නා'යං ධම්මො සුසම්බුධො,
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා නදක්ඛින්ති තමොක්ඛන්ධෙන ආවටාති'.

ඉතිහ මෙ බ්‍රහ්මෙ පටිසංචික්ඛතො අප්පොස්සුක්කතාය චිත්තං නමති, නො ධම්මදෙසනායාති.

---

මේ සංස්කාරාදීන්ට ප්‍රත්‍යයවූ අවිද්‍යාදිලක්‍ෂණයවූ ප්‍රතීත්‍ය සමුත්පාදය යනමේ කාරණයදුකසේ දක්කයුතුවෙයි. සියලු සංස්කාරයන්ගේ සංසිඳිම ඇත්තාවූ සියලු කාමාදි උපධීන්ගේ දුරලීමඇත්තාවූ තෘෂ්ණාක්‍ෂයවූ රාගාදි රජස්නැත්තාවූ ක්ලේශ නිරොධයවූ වාණසඞ්ඛ්‍යාත තෘෂ්ණාහුගේ අභාවයෙන් නිර්වාණය යන යමක් ඇද්ද මේකාරණය දුකසේ දක්කයුතුවෙයි. මම ධර්මය දෙශනාකරන්නෙම්නමුත් අන්‍යයෝත් මාගේ ඒ ධර්මය අවබොධනොකරන්නාහුනම්ඒව්‍යාපාරය මට ක්ලාන්තයක්වන්නේය, ඒ ධර්මදෙශනාතොමෝ මට වෙහෙසවන්නීය. බ්‍රහ්මය, තවද පෙරනොඇසූවිරූ මේ ආශ්චය්‍ය්‍යානුකාරී ගාථාවෝ ප්‍රතිභාණසඞ්ඛ්‍යාත ඥනයට ගොචරවූහ. ඒනම් මාවිසින් පාරමී සම්භරණය කරණකාලයෙහි දුඃඛප්‍රතිපදාවෙන් අවබොධ කරණලද ධර්මය දැන්ප්‍රකාශකරන්නටනුසුදුසුයි හෙවත්දෙශනාකිරිමෙන් ප්‍රයොජන නැත්තේය. රාගද්වෙෂාදීන්ගෙන් පීඩිතවූ හෝ රාගාදි ක්ලෙශානුගතවූවන් විසින් මේධර්මය සුවසේ අවබොධකටහැකි නොවන්නේය. ප්‍රතිශ්‍රොතස අනුවයන්නාවූ නොහොත් නිත්‍ය සුඛාදියට ප්‍රතිපක්‍ෂවූ නිර්වේදඥනදශිනලාභාදියපිණිස පවත්නාවූ සියුම්වූ ගැඹුරුවූ එහෙයින්ම දුක්සේ දක්කයුතුවූ දුකසේ අවබොධකටයුතුවූ අණුතරවූ ධර්මය කාමරාග භවරාගාදියෙන් රඤ්ජනාලද්දාවූ තමස්කන්ධසඞ්ඛ්‍යාත අවිද්‍යාරාශියෙන් යටකරණලද්දාවූ සත්වයෝ අනිත්‍යදුඃඛඅනාත්මතාදිවශයෙන් නොදක්නාහුය කියායි. බ්‍රහ්මය, මෙසේ ධර්මගම්භීරභාවය නිමිතිකොට නුවණින් සලකන්නාවූ මාගේ සිත මන්දොත්සාහිත්වයට නැමුනේය. ධර්මදෙශනාව පිණිස සිත නොනැමුනේය.

5. දුතියම්පි ඛො භික්ඛවෙ සො මහාබ්‍රහ්මා....පෙ....

6. තතියම්පි ඛො භික්ඛවෙ සො මහාබ්‍රහ්මා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච. දෙසෙතු භන්තෙ භගවා ධම්මං. දෙසෙතු සුගතො ධම්මං. සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා අස්සවනතා ධම්මස්ස පරිහායන්ති භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරොති. අථ ඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා සත්තෙසු ච කාරුඤ්ඤතං පටිච්ච බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙසි. අද්දසා ඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ.

---

5. මහණෙනි, දෙවනුවද ඒ මහාබ්‍රහ්මතෙම. සෙස්ස ප්‍රථම වාරයෙහි කී ක්‍රමයෙන් දතයුතු.

6. මහණෙනි, තුන්වෙනිවරද ඒ මහාබ්‍රහ්මතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. ස්වාමිනි, භාග්‍යවතුන්වහන්සේ ධර්මදේශනාකරණසේක්වා. සුගතයන්වහන්සේ ධර්මදේශනාකරණසේක්වා. ප්‍රඥාචක්ෂුසෙහි ස්වල්පවූ රාගද්වේෂාදි රජස්ඇති සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හෙතු කොටගෙණ සත්වයෝ පිරිහෙත්. ධර්මාවබොධ කරන්නෝවන්නාහුය කියායි. මහණෙනි, ඉක්බිත්තෙන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ ඒ මහාබ්‍රහ්මයාගේ ආරාධනාවද දූනවදුරා සත්වයන් කෙරෙහි කරුණාභාවයදනිසා (බුදු ඇසින්) බුද්ධඥානයෙන් ලොව බලාවදාළසේක. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ බුද්ධඥානයෙන් ලොව බලාවදාරණසේක් ප්‍රඥාචක්ෂුසෙහි ස්වල්පවූ රාගාදිරජස් ඇත්තාවූද, මහාරජස්කාවූද, තියුණු ඉඳුරන් ඇත්තාවූද, මෘදුවූ ඉන්ද්‍රියයන් ඇත්තාවූද, යහපත්ආකාර ඇත්තාවූද,නපුරු අයුරු ඇත්තාවූද, සුවසේ අවබොධකටහැක්කාවූද, දුකසේ අවබොධකටයුතුවූ, සත්වයන්ද පරලොව වරදෙහි බිය දක්නාසුලුව වාසයකරන්නාවූ සමහර සත්වයන්ද දුටුසේක.

සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසීනි. අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි සමොදකං ඨිතානි. අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අච්චුග්ගම්මතිඨන්ති අනුපලිත්තානි උදකෙන. එවමෙව ඛො භික්ඛවෙ විපස්සි භගවා අරහං සම්මා සම්බුද්ධො බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ.

7. අථ ඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා විපස්සිස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය.

---

උපුල්විලෙක්හි හෝ පියුම්විලෙක්හි හෝ හෙලපියුම් විලෙක්හි හෝ ජලයෙහි හටගත්තාවූ ජලයෙහි වැඩුනාවූ ජලයෙන් උඩට නොනැංගාවූ ජලයතුළගැලී පොෂනයවන්නාවූ සමහර උපුල් හෝ සමහර පියුම් හෝ සමහර හෙලපියුම් හෝ යම්සේද, ජලයෙහි හටගත්තාවූ ජලයෙහි වැඩුනාවූ ජලතලාමතුභාගයට සමවසිටියාවූ සමහර උපුල් හෝ සමහර පියුම් හෝ සමහර හෙලපියුම් හෝ යම්සේද, ජලයෙහි හටගත්තාවූ ජලයෙහි වැඩුනාවූ සමහර උපුල් හෝ සමහර පියුම හෝ සමහර හෙලපියුම් හෝ ජලය හා ආලෙපනොව ජලයෙන් උඩට නැගී යම්සේ සිටිත්ද. මහණෙනි, එපරිද්දෙන්ම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ බුද්ධඥානයෙන් ලොව බලාවදාරණසේක් ප්‍රඥාචක්‍ෂුසෙහි ස්වල්පවූ රාගාදිරජස් ඇත්තාවූද, මහාරජස්කවූද, තියුණු ඉඳුරන් ඇත්තාවූද, මෘදු ඉන්‍ද්‍රියයන් ඇත්තාවූද, යහපත් අයුරු ඇත්තාවූද, නපුරු අයුරු ඇත්තාවූ සත්වයන්ද, පරලොව වරදෙහි බියදක්නා ස්වභාවඇතිව වාසය කරන්නාවූ සමහර සත්වයන්ද දුටුසේක.

7. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ මහාබ්‍රහ්මතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේගේ සිතපිළිබඳ හාත්පස විතර්කය දැනගෙණ.

විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං ගාථාහි අජ්ඣභාසි.

සෙලෙ යථා පබ්බතමුද්ධනි ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාදමාරුය්හ සමන්තචක්ඛු.

සොකාවතිණ්ණං ජනත මපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූතං
උට්ඨෙහි වීර විජිතසඞ්ගාම සත්ථ-වාහ අනණ විචරලොකෙ,
දෙසතු භගවා ධම්මං අඤ්ඤාතාරො භවිස්සන්ති'ති.

අථඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො තං මහාබ්‍රහ්මානං ගාථාය පච්චභාසි.

---

අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට ගාථාවලින් අභිභාෂනයකෙළේය. යම්සේ ශෛලමය ඒකඝනපර්වත මස්තකයෙක්හි සිටියාවූ පුරුෂයෙක් ඒ පර්වතය හාත්පස සිටියාවූ ජනසමූහයා යම්සේ සුවසේ දක්නේද, සුන්දර ප්‍රඥඇත්තාවූ සමන්තචක්ෂු සඞ්ඛ්‍යාත සර්වඥතාඥනඇත්තාවූ භාග්‍යවතුන්වහන්ස නුබවහන්සේද ඒ ශෛලපර්වතයට බඳු උපමා ඇත්තාවූ ප්‍රඥමයප්‍රාසාදයට නැගී නුබවහන්සේ පහවූ සොකඇතිසේක් සොකයට බටුවාවූ ජාතිජරාදීන් මඩනාලද්දාවූ ජනසමූහයා ප්‍රඥාභොගවශයෙන් නැවත නැවත පරීක්ෂාකරණුමැනව. දිනනලද ක්ලේශමාරාදිසඞ්ග්‍රාමඇති ජාතිකාන්තාරාදීන් විනෙය සත්වයන් නිර්වාණනැමති ශාන්තමාර්ගයට පමුණුවන්නාවූ කාමච්ඡන්ද නැමති නය නැත්තාවූ මහාවීරයන්වහන්ස නැගිටිනු මැනව. ලොකයෙහි හැසිරෙනු මැනව. භාග්‍යවතුන්වහන්ස ධර්මය දෙශනාකරණු මැනව. ධර්මාවබොධකරන්නෝ හෙවත් ඒ ධර්මානුගත සම්‍යක්ප්‍රතිපදාවෙන් ක්ලෙශක්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණධර්මාවබොධකරන්නෝ ඇතිවන්නාහුයයි සැලකළේය. මහණෙනි, ඉක්බිත්තෙන් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශීභාග්‍යවතුන්වහන්සේ ඒ බ්‍රහ්මයාහට ගාථාවකින් ප්‍රතිභාෂනයකෙළේය. හෙවත් ප්‍රත්‍යුත්තර වදාළේය.

අපාරුතා තෙසං අමතස්ස ද්වාරා
යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං,
විහිංසසඤ්ඤී පගුණං නභාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ'ති

අථඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා කතාවකාසො බො'ම්හි විපස්සිනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මදෙසනායාති. විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙ'වන්තරධායි.

8. අථඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එතදහොසි. කස්සනුඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං, කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතීති.

බ්‍රහ්මය, යම්කෙනෙක් ධර්‍මශ්‍රවණය කරන්නෝනම් ඔවුන්ට අමෘතද්වාර සඞ්ඛ්‍යාත ආර්‍ය්‍යමාර්ගයතෙම සම්‍යක්සම්බුද්ධවූ මාවිසින් විවෘතකරණලද්දේය, හෙවත් විවෘතකොට තබනලද්දේය. සියලු සත්වයෝ ශ්‍රද්ධාව මුදත්වා, බ්‍රහ්මය මම විහෙස සංඥා ඇත්තෙම් හෙවත් ධර්‍මදෙශනාව මට කායවාක්ක්ලමථයට කාරණයක්ය යන අදහස් ඇත්තෙම් ප්‍රගුණවූ ශ්‍රෙෂ්ඨවූ ධර්‍මය මනුෂ්‍යයන් විෂයෙහි නොකියෙම්හි වදාළෝ. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ මහාබ්‍රහ්ම තෙම අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේවිසින් ධර්‍මදෙශනාව පිණිස මම කරණලද අවසරඇත්තෙම් හෙවත් ප්‍රතිඥාඇත්තෙම්යි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශිභාග්‍යවතුන් වහන්සේ සකසාවැද පැදකුණුකොට ඒ අජපල් නුගරුක සමීපයෙහි දීම අතුරුදහන්වූයේය,

8. මහණෙනි, එකල්හි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍ය වතුන්වහන්සේට මේ මතු කියනුලබන අදහසවූයේය, මම කවරෙ කුට නම් ප්‍රථමකොට ධර්‍මදෙශනාකරන්නෙම්ද,කවරෙක්නම් මේධර්‍මය වහාදැනගන්නේද හෙවත් යථාස්වභාවයෙන් ප්‍රතිවෙධකරන්නේද යනුයි.

අථඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එතදහොසි. අයංඛො ඛණ්ඩොච රාජපුත්තො තිස්සොච පුරොහිතපුත්තො බන්ධුමතියා රාජධානියා පටිවසන්ති පණ්ඩිතා වියත්තා මෙධාවිනො දීඝරත්තං අප්පරජක්ඛජාතිකා. යන්නූනාහං ඛණ්ඩස්සච රාජපුත්තස්ස තිස්සස්සච පුරොහිතපුත්තස්ස පඨමං ධම්මං දෙසෙය්‍යං, තෙ ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සන්තීති.

9. අථඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතංවා බාහං පසාරෙය්‍ය, පසාරිතංවා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවඛො බොධිරුක්ඛමූලෙ අන්තරහිතො බන්ධුමතියා රාජධානියා ඛෙමෙ මිගදායෙ පාතුරහොසි. අථඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො දායපාලං ආමන්තෙසි. එහි ත්වං සම්ම දායපාල බන්ධුමතිං රාජධානිං පවිසිත්වා ඛණ්ඩඤ්ච රාජපුත්තං තිස්සඤ්චපුරොහිතපුත්තං එවං වදෙහි.

---

මහණෙනි, ඉක්බිත්තෙන් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේට මේ අදහස උපන. පණ්ඩිතවූ ව්‍යක්තවූ ප්‍රඥා ඇත්තාවූ බොහෝකලක්මුලුල්ලෙහි ප්‍රඥාචක්‍ෂුසෙහි සවල්පවූ රාගාදිරජස් ඇත්තාවූ රාජපුත්‍රවූ මේ ඛණ්ඩතෙමේද පෙරවි බමුණුපුත්වූ තිස්සතෙමේද යන දෙදෙනා බන්ධුමතිනම් රාජධානියෙහි වාසයකෙරෙත්. මම ඛණ්ඩනම් රාජපුත්‍රයාහට හා තිස්සනම් පුරොහිතපුත්‍රයාටත් පළමුකොට දහම්දෙසන්නෙම්නම් ඉතා යෙහෙක. ඔව්හු මේධර්මය වහාම දැනගන්නාහුය හෙවත්, අවබොධකරන්නාහුය යනුයි.

9. මහණෙනි, ඊට අනතුරුව අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ බලවත් පුරුෂයෙක් වක්කළ අතක් දික්කරන්නේහෝ යම්සේද, දික්කළ අතක් වක්කරන්හෝ යම්සේද එපරිද්දෙන්ම බොධිවෘක්‍ෂසමීපයෙහිවූ අජපාලනිග්‍රොධමූලයෙහිදී අතුරුදහන්වූසේක් බන්ධුමතිරාජධානියෙහිවූ මුවන්ට අභයපිණිස දෙනලද ඛෙමනම් උයනෙහි පහලවූසේක. අපබුදුන්දවස ඉසිපතනය විදර්ශී සම්ඥයන් දවස ඛෙමඋයනයයි ප්‍රසිද්ධවිය. මහණෙනි එකල්හි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ අරණ්‍යපාලයා ඇමතූසේක, යහලුව අරණ්‍යපාලය මෙහි එවතෝබන්ධුමතීරාජධානීයට ගොස් ඛණ්ඩරාජපුත්‍රයාට හා තිස්සනම් පුරොහිතපුත්‍රයාටත් මෙසේ කියව.

විපස්සී භනෙත භගවා අරහං සමමා සම්බුධො බන්ධුමතිං රාජ ධානිං අනුපපතෙතා ඛෙමෙ මිගදායෙ විහරති. සො තුම්හාකං දස්සනකාමොති. එවං භනෙතති ඛො භික්ඛවෙ දුයපාලො විපස්සිස්ස භගවතො අරහතොසමමා සම්බුධස්ස පටිස්සුත්වා බන්ධුමතිං රාජධානිං පවිසිත්වාඛණ්ඩඤ්චරාජපුත්තං තිස්සඤ්චපුරොහිතපුත්තං එතදවොච. විපස්සී භනෙත භගවා අරහං සමමා සම්බුධො බන්ධුමතිං රාජධානිං අනුප්පත්තො ඛෙමෙමිගදායෙවිහරති. සොතුම්හාකං දස්සනකාමොති.

10. අථ ඛො භික්ඛවෙ ඛණ්ඩොච රාජපුතෙතා තිස්සොච පුරොහිත පුතෙතා භද්දානි භද්දානි යානානි යොජාපෙත්වා භද්දං යානං අභිරුහිත්වා භද්දෙහි භද්දෙහි යානෙහි බන්ධුමතියා රාජධානියා නියාසිංසු. යෙන ඛෙමො මිගදායො තෙන පායංසු. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකාව.

---

ස්වාමිනි අර්හත් සම්‍යක්සම්බුධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේ බන්ධුමතිරාජධානියට වැඩිසේක් මුවන්ට අභයපිණිස දුන් ඛෙමනම් උයනෙහි වාසයකරණසේක. ඒ භාග්‍යවතුන්වහන්සේ තොපගේ දක්ම කැමතිසේකැ යනුයි. මහණෙනි, ස්වාමින්වහන්ස ඒ මැනවැයි දුයපාලතෙම අර්හත් සම්‍යක්සම්බුධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දී බන්ධුමතී රාජධානියට ගොස් ඛණ්ඩරාජපුත්‍රයාට හා තිස්සනම් පුරොහිතපුත්‍රයාටත් මේකාරණය දැන්වීය, ස්වාමින්වහන්ස අර්හත් සම්‍යක්සම්බුධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේ බන්ධුමතී රාජධානියට පැමිණිසේක් මුවන්ට අභයපිණිසදුන් ඛෙමනම් උයනෙහි වාසයකරණසේක. ඒ භාග්‍යවතුන්වහන්සේ තොපගේ දක්ම කැමතිසේකයනුයි.

10. මහණෙනි, ඉක්බිත්තෙන් ඛණ්ඩනම් රාජපුත්‍රතෙමේද තිස්සනම් පුරොහිත පුත්‍රතෙමේද යහපත් යහපත් යානාවන් යොදවා යහපත් යානාවකට නැගී යහපත් යහපත් යානාවලින් බන්ධුමතී රාජධානියෙන් පිටත්ව ගියාහුය. මිගදාය නම්වූද ඛෙමනම් උයන යම් තැනෙක්හිද එතනට ගියාහුය. යානාවෙන් යාහැකි භූමිය යම්පමණද එපමණතැන යානාවෙන් ගොස් යානාවෙන් බැස පයින්ම.

යෙන විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

11. තෙසං විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො ආනුපුබ්බිකථං කථෙසි, සෙය්‍යථීදං, දානකථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං, ඔකාරං, සංකිලෙසං, නෙක්ඛම්මෙ ආනිසංසං, පකාසෙසි. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි දුක්ඛං සමුදයං නිරොධං මග්ගං, සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙවං ඛණ්ඩස්සච රාජපුත්තස්ස තිස්සස්සච පුරොහිතපුත්තස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.

---

අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්හ.

11 අර්හත්සම්‍යක් සම්බුද්ධවූ විදර්ශීභාග්‍යවතුන්වහන්සේ ඔවුන්ට පිළිවෙළ කථාව වදාළේය. ඒ කවරේද, දානකථාය, ශීලකථාය, ස්වර්ග කථාය, කාමයන්ගේ දෝෂය, ලාමක බවය, කෙලෙසෙන බවය නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස්ද ප්‍රකාශකළසේක. යම්කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ යහපත්සිත් ඇත්තාවූද, මෘදුසිත් ඇත්තාවූද, නිවරණයන්ගෙන් පහවූසිත් ඇත්තාවූද, ඔදවැඩිසිත් ඇත්තාවූද, ප්‍රසන්නසිත් ඇත්තාවූද, ඒ දෙදෙනා දූන වදාළසේක්ද, එකල්හි බුදුවරයන්වහන්සේලාගේ යම්බඳුවූ තෙමේම උසස්බවට පමුණුවනලද්දවූ යම් ධර්මදේශනාවක් ඇත්තිද, දුඃඛය සමුදය, නිරොධය මාර්ගයයන ඒ ධර්මය ප්‍රකාශකළසේක. යම්සේ පහවූ කෘෂ්ණවර්ණයඇති පිරිසිදුවූ වස්ත්‍රයක්මනාකොටසායම අල්වාගන්නේද,එසේමඛණ්ඩරාජපුත්‍රයාටහා තිස්සනම් පුරොහිත පුත්‍රයාටත් ඒ අස්නෙහිදීම පහවූරජස්ඇති පහවූ රාගාදිමලඇති ධර්මචක්ෂුස හෙවත් ශ්‍රොතආපත්ති මාර්ගඥානය පහළවූයේය. කෙසේදයත්, යම්කිසිවක් සමුදය ස්වභාවඇත්තේ වේද ඒ සියල්ල නිරොධය හෙවත් වැනසීම ස්වභාවකොට ඇත්තේය කියායි.

12. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ විපස්සිං භගවන්තං අරහන්තං සම්මා සම්බුද්ධං එතද වොචුං. අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච. ලභෙය්‍යාම මයං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යාම උපසම්පදන්ති.

13. අලත්ථුං ඛො භික්ඛවෙ ඛණ්ඩො ච රාජපුත්තො තිස්සො ච පුරොහිතපුත්තො විපස්සිස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං. අලත්ථුං උපසම්පදං.

---

12. දක්නාලද ධර්මඇත්තාවූ පැමිණි මාර්ගධර්ම ඇත්තාවූ දන්නාලද ධර්මඇත්තාවූ සර්වප්‍රකාරයෙන් ඥානයෙන් බැසගත් ධර්මඇත්තාවූ තරණයකරණලද විචිකිත්සා ඇත්තාවූ පහවූ කෙසේ කෙසේදැයි පැවති සැකඇත්තාවූ විශාරදභාවයට හෙවත් බියරහිතබවට පැමිණියාවූ ශාස්තෲශාසනයෙහි පරප්‍රත්‍යයරහිතවූ හෙවත් අන්‍ය ශාස්තෲ කෙනෙකුන් කෙරෙහි ඇදහීමක් නැත්තාවූ ඔව්හු අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය දැන්වූහ. භවද් ගෞතමයන්වහන්ස, යටිකුරුකරණලද්දක් උඩුකුරුකොට තබන්නේ හෝ යම්සේද, තෘණපර්ණාදියෙන් වසනලද්දක් විවෘත කොට දක්වන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මගකියන්නේ හෝ යම්සේද, චක්ෂුරින්ද්‍රිය දර්ශනශක්තිය ඇත්තෝ නිලපීතාදි රූප යන් දකිත්වායි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භවද් ගෞතමයන්වහන්සේවිසින් නොයෙක්ප්‍රකාර යෙන් ධර්මයදෙශනාකරණලද්දේය. ස්වාමීන්වහන්ස, මේ අපි භවද් ගෞතමයන්වහන්සේද නවලොකොත්තර ධර්මයද පිහිටකොටයමු. ස්වාමීන්වහන්ස, අපි භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාවද ලබන්නෙමුයි සැලකළෝ.

13. මහණෙනි, රාජපුත්‍රවූ ඛණ්ඩතෙමේද පුරොහිතපුත්‍රවූ තිස්ස තෙමේද යන දෙදෙන අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලැබූහ. උපසම්පදාවද ලැබූහ.

තෙ විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො ධම්මියා කථාය සන්ද
ස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි සංඛාරානං ආදීනවං
ඔකාරං සංකිලෙසං නිබ්බාණෙ ආනිසංසං පකාසෙසි. තෙසං විපස්
සිනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මියා කථාය සන්දස්සි
යමානානං සමාදපියමානානං සමුත්තෙජියමානානං සම්පහංසියමා
නානං න චිරස්සෙව අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

14. අස්සොසි ඛො භික්ඛවෙ බන්ධුමතියා රාජධානියා මහාජන
කායො චතුරාසීති පාණසහස්සානි. විපස්සී කිර භගවා අරහං සම්මා
සම්බුද්ධො බන්ධුමතිං රාජධානිං අනුප්පත්තො ඛෙමෙ මිගදායෙ විහ
රති. ඛණ්ඩො ච කිර රාජපුත්තො තිස්සො ච පුරොහිතපුත්තො විපස්
සිස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස සන්තිකෙ කෙසමස්සුං
ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං
පබ්බජිතොති.

---

අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ ඔවුන්ට දහම්
කථාවෙන් කරුණුදක්වූසේක. එහි සමාදන්කරවූසේක. එහි තෙද
ගැන්වූසේක. එහි වැඩියක් සතුටුකරවූසේක. සංස්කාරයහි කියූ
ප්‍රත්‍යය නිෂ්පන්නධර්මයන්ගේ දෝෂයද, ලාමක බවද, කෙලෙසන
බවද, නිර්වාණයෙහි අනුසස්ද, ප්‍රකාශකළසේක. අර්හත් සම්‍යක් සම්
බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ ධාර්මිකකථාවෙන් කරුණුදක්
වනුලබන්නාවූ එහි සමාදානයකරවනුලබන්නාවූ එහි තෙදගන්වනු
ලබන්නාවූ එහි ප්‍රහර්ෂකරණුලබන්නාවූ ඒ ඛණ්ඩරාජපුත්‍ර තිස්ස පුරෝ
හිත පුත්‍ර දෙදෙනාගේ සිත් නොබෝකලකදීම උපාදානග්‍රහණය
නොකොට' කාමාදි ආශ්‍රවයන් කෙරෙන් සර්වප්‍රකාරයෙන් මිදුනාහ.

14. මහණෙනි, බන්ධුමතී රාජධානියෙහි අසූසාරදහසක් ප්‍රාණීන්වූ
මහත්ජනසමූහතෙමේ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍ය
වතුන්වහන්සේ බන්ධුමතී රාජධානියට පැමිණිසේක් මෘගදාය නම්
ලද ඛෙමඋයනෙහි වාසයකරණසේක්ල, ඛණ්ඩරාජපුත්‍රතෙමේද
තිස්සපුරෝහිතපුත්‍රතෙමේද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍ය
වතුන්වහන්සේගේ සමීපයෙහි කෙස්දැලිරැවුලු හරවා කාසායවස්ත්‍ර
යන් අන්දවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූයේයි ඇසුයේමය.

සුත්වා තෙසං එතදහොසි. නහනූන සො ඔරකො ධම්ම විනයො න සා ඔරිකා පබ්බජ්ජා යත්‍ථබො ඛණ්ඩොච රාජපුත්තො තිස්සොච පුරොහිතපුත්තො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතා. ඛණ්ඩොචහි නාම රාජපුත්තො තිස්සොච පුරොහිතපුත්තො කෙසමස්සුං ඔහා රෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සන්ති. කිමඞ්ගපන න මයන්ති. අථ ඛො සො භික්ඛවෙ මහා ජනකායො චතුරාසීති පාණසහස්සානි බන්ධුමතියා රාජධානියා නික්ඛමිත්වා යෙන ඛෙමො මිගදායො යෙන විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මා සම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

15. තෙසං විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො ආනුපුබ්බිකථං කථෙසි, සෙය්‍යථිදං දානකථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි.

---

අසා ඔවුන්ට මේ අදහස විය. යම් සස්නෙක්හි ඛණ්ඩනම් රාජපුත් හා තිස්සනම් පෙරවිපුත්තෙමේත් කෙස්දැලිරැවුලු හරවා කාසායවස්ත්‍ර යන් අන්දවා ගිහිගෙන් නික්ම පැවිදිවූවාහුනම් එකාන්ත යෙන් ඒ ධම්විනයසඞ්ඛ්‍යාත ශාසනයතෙමේ ලාමක නොවේමය. ඒ ප්‍රව්‍රජ්‍යාතොමෝද ලාමකනොවන්නීය. ප්‍රසිද්ධවූ ඛණ්ඩරාජපුත්‍ර තෙමේද තිස්ස පුරොහිතපුත්‍රතෙමේත් කෙස්දැලිරැවුලු හරවා කාසාය වස්ත්‍රයන් අන්දවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නාහුනම් අපි පැවිදිනොවෙමුය යනු කියනුම කවරේදැයි කියාඇ. මහණෙනි, එකල්හි අසූසාරදහසක් ප්‍රාණීන්වූ ඒ මහාජනසමූහතෙමේ බන්ධු මතී රාජධානියෙන් නික්ම මිගදායනම්වූද ඛෙමඋයන යම් තැනෙක්හිද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එලඹියේය. එළඹ අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේට අභිවාදනයකොට එකත්පසෙක උන්හ.

15. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ ඔවුන් ට පිළිවෙළ කථාව වදාළසේක. ඒ කවරේදයත්, දානකථාය, සීලකථාය, ස්වර්ගකථාය, කාමයන්ගේ දොෂය, ලාමකබවය, කෙලෙසෙන බවය, නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස්ද ප්‍රකාශකළසේක.

යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි දුක්ඛං සමුදයං නිරොධං මග්ගං, සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං චතුරාසීතිපාණසහස්සානං තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි යං කිඤ්චිසමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.

16. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හ ධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතද වොචුං.

---

යම්කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ යහපත්සිත් ඇත්තාවූ මෘදුසිත් ඇත්තාවූ නීවරණයන් කෙරෙන් තොරවූසිත් ඇත්තාවූ, ඔදවැඩිසිත් ඇත්තාවූ, පහන්සිත් ඇත්තාවූ, ඔවුන් දැන වදාලසේක්ද. එකල්හිදී බුදුවරයන්ගේතෙමේම උසස්බවට පමුණුවනලද්දාවූ යම් ධර්මදෙශනා වක් වේද. දුඃඛය, සමුදය, නිරොධය, මාර්ගය යන ඒ ධර්මදෙශනාව ප්‍රකාශකලසේක. පහවගිය කෘෂ්ණවර්ණයඇති පිරිසිදු වස්ත්‍රයක් යම්සේ මනාකොට සායමඅල්වාගන්නේද, එපරිද්දෙන්ම ඒ අසූසාරදහසක් ප්‍රාණීන්ට ඒ අස්නෙහිදීම හෙවත් ඒ ධර්මදෙශනා සමයෙහිදීම රාගාදි රජස් රහිතවූ පහවූ ක්ලෙශමලඇති ධර්මචක්ෂුස හෙවත් ශ්‍රොත ආපත්ති මාර්ගඥානය පහලවූයේය. යම්කිසිවක් සමුදය හෙවත් ප්‍රත්‍ය යෙන් රැස්වීම සවභාවකොට ඇත්තේ වේද, ඒ සියල්ල නිරොධය සවභාවකොට ඇත්තේය කියායි.

16. දක්නාලද ධර්ම ඇත්තාවූ පැමිණිමාර්ගධර්ම ඇත්තාවූ දන්නාලද ධර්මඇත්තාවූ සර්වප්‍රකාරයෙන් බැසගැණිම් වශයෙන් අවබොධ කරණලද ධර්ම ඇත්තාවූ තරණයකරණලද විචිකිත්සා ඇත්තාවූ නිර්භයභාවයට පැමිණියාවූ ශාස්තෘ ශාසනයෙහි පරප්‍රත්‍යය රහිතවූ ඒ අසූසාරදහසක් ප්‍රාණීහු අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශීභාග්‍යවතුන් වහන්සේට මේකාරණය සැලකලාහුය.

අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙව භගවතා අනෙක පරියායෙන ධම්මො පකාසිතො එතෙ මයං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච. ලභෙය්‍යාම මයං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යාම උපසම්පදන්ති.

17. අලත්ථුං ඛො භික්ඛවෙ තානි චතුරාසීතිපාණසහස්සානි විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං. අලත්ථුං උපසම්පදං. තෙ විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි සඞ්ඛාරානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නිබ්බාණෙ ආනිසංසං පකාසෙසි.

---

ස්වාමින්වහන්ස, දම්දෙසුම ඉතා මැනව, ස්වාමින්වහන්ස, දම් දෙසුම ඉතාමැනව, ස්වාමින්වහන්ස, යටිකුරුකොට තබනලද් දක් උඩුකුරුකරන්නේ හෝ යම්සේද තෘණපර්ණාදියෙන් වැසු නක් විවෘතකොට දක්වන්නේ හෝ යම්සේද මංමුළාවූවෙකුට මගකියන්නේ හෝ යම්සේද චක්ෂුරින්ද්‍රිය දර්ශනශක්තිය ඇත්තෝ නිලපීතාදී රූපයන් දකිත්වායි අඳුරෙහි තෙලප්‍රදීපයක් දරන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේ විසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය ප්‍රකාශකරණලද්දේය. ස්වාමින් වහන්ස මේ අපි භාග්‍යවතුන්වහන්සේද නවලොකොත්තර ධර්මයද පිහිටකොටයමු. ස්වාමින්වහන්ස, අපි භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි පැවිදිද ලබන්නෙමු. උපසම්පදාවද ලබන්නෙමුයි සැල කළාහුය.

17. මහණෙනි, ඒ අසූසාරදහසක් ප්‍රාණීහු අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශීභාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි පැවිදි ලැබුවාහුය. උප සම්පදාවද ලැබූහ. අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශීභාග්‍යවතුන්ව හන්සේ ඔවුන්ට දැහැමිකථාවෙන් කරුණුදක්වූසේක, සමාදානය කරවූසේක. එහි තෙදගැන්වූසේක. වැඩියක් සතුටුකරවූසේක, සංස්කාරයන්ගේ දොෂයද, ලාමක බවද, කෙලෙසෙන බවද නිර්වාණයෙහි අනුසස්ද ප්‍රකාශකළසේක.

තෙසං විපස්සිනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මියා කථාය සන්දස්සීයමානානං සමාදපියමානානං සමුත්තෙජීයමානානං සම්පහංසියමානානං නචිරස්සෙව අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

18. අස්සොසුං ඛො භික්ඛවෙ තානි පුරිමානි චතුරාසීතිපබ්බජිත සහස්සානි විපස්සී කිර භගවා අරහං සම්මා සම්බුද්ධො බන්ධුමතිං රාජධානිං අනුප්පත්තො ඛෙමෙ මිගදායෙ විහරති, ධම්මඤ්ච කිර දෙසෙතීති. අථ ඛො භික්ඛවෙ තානි චතුරාසීති පබ්බජිතසහස්සානි යෙන බන්ධුමතී රාජධානි යෙන ඛෙමො මිගදායො යෙන විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු

19. තෙසං විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො ආනුපුබ්බීකථං කථෙසි, සෙය්‍යථීදං, දානකථං සීලකථං සග්ගකථං.

---

අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේවිසින් ධාර්මික කථාවෙන් කරුණුදක්වනුලබන්නාවූ එහි සමාදන්කරණු ලබන්නාවූ එහිතෙදගන්වනු ලබන්නාවූ එහි වැඩියක් සතුටුකරවනු ලබන්නාවූ ඒ අසූසාරදහසක් භික්ෂූන්ගේ සිත් උපාදාන ග්‍රහණය නොකොට ආශ්‍රවයන්කෙරෙන් මිදුනාහුය.

18. මහණෙනි, පළමුකොට විදර්ශි බොධිසත්වයන්වහන්සේ සමී පයෙහි පැවිදිවූ ඒ අසූසාරදහසක් භික්ෂූහු අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේ බන්ධුමතීරාජධානියට වැඩිසේක් මිග දාය නම්වූ ඛෙමනම් උයනෙහි වාසයකරණසේක්ල, ධර්මයත් දෙශ නාකරණසේක්ලයි ඇසූහ. මහණෙනි ඉක්බිත්තෙන් ඒ ඇසූ සාර දහසක් ප්‍රව්‍රජිතයෝ බන්ධුමතීරාජධානිය යම්තැනෙක්හිද,මිගදාය නම්වූ ඛෙමඋයන යම්තැනෙක්හිද, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර් භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට අභිවාදනය කොට එකත්පසෙක උන්හ.

19. අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේ ඔවුන්ට පිළිවෙළ කථාව වදාළසේක. ඒ කවරේදයත්, දානකථාය, සීලකථාය' සවර්ගකථාය.

කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ,අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්‍ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං චතුරාසීතිපබ්බජිතසහස්සානං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි. යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.

20. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්‍ථුසාසනෙ.

---

කාමයන්ගේ දෙෂය, ලාමක බවය, කෙලෙසන බවය, නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස්ද ප්‍රකාශකළසේක. භාග්‍යවතුන්වහන්සේ භව්‍යසිත්ඇත්තාවූ, මෘදු සිත්ඇත්තාවූ, නිවරණයන්කෙරෙන් මිදුනු සිත් ඇත්තාවූ, ඔදවැඩිසිත් ඇත්තාවූ, පහන් සිත්ඇත්තාවූ, ඔවුන් යම්කලෙක්හි දැනගත්සේක්ද,එකල්හි බුද්ධවරයන්ගේ තෙමේම උසස් බවට පමුණුවනලද්දාවූ යම් ධර්මදෙශනාවක්වීද, දුඃඛය සමුදය නිරොධය මාර්‍ගය යන ඒ ධර්මදෙශනාව ප්‍රකාශකළසේක, පහවූ කෘෂ්ණවර්‍ණයඇති පිරිසිදු වස්ත්‍රයක් සායම අල්වාගන්නේ යම්සේද, එපරිද්දෙන්ම ඒ අසූසාරදහසක් ප්‍රව්‍රජිතයන්ට ඒ අස්නෙහිදීම රාගාදී රජස්සහිතවූ පහවගිය රාගාදී මලඇත්තාවූ ධර්මචක්‍ෂුසහෙවත් ශ්‍රොතආපත්තිමාර්‍ගඥානය පහළවූයේය. යම්කිසිවක් සමුදය සවභාව ඇත්තේද ඒ සියල්ල නිරොධය හෙවත් වැනසීම් සවභාවකොට ඇත්තේය කියායි.

20. දක්නාලද ධර්මඇත්තාවූ පැමිණි මාර්‍ගඵල ඇත්තාවූ අවබොධකරණලද ධර්මඇති සර්වප්‍රකාරයෙන් බැසගත්ධර්ම ඇත්තාවූ තරණයකළ විචිකිච්ඡා ඇත්තාවූ කෙසේ කෙසේදැයි පැවති සැක නැත්තාවූ විශාරදභාවයට පැමිණියාවූ ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යයරහිතවූ ඒ භික්‍ෂූහු.

විපස්සිං භගවන්තං අරහන්තං සම්මා සම්බුද්ධං එතදවොචුං, භික්කන්තං භන්තෙ. අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූල්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච. ලභෙය්‍යාම මයං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යාම උපසම්පදන්ති.

21. අලත්ථුං ඛො භික්ඛවෙ තානි චතුරසීතිපබ්බජිතසහස්සානි විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථුං උපසම්පදං. තෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි, සඞ්ඛාරානං ආදිනවං ඔකාරං සංකිලෙසං නිබ්බානෙ ආනිසංසං පකාසෙසි.

---

අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. ස්වාමීනි, දම්දෙසුම ඉතා මැනව. ස්වාමීනි, දම්දෙසුම ඉතා මැනව. ස්වාමීන්වහන්ස, යටිකුරුකරණ ලද්දක් උඩුකුරුකරන්නේ හෝ යම්සේද, තෘණපර්ණාදියෙන් වැසුනක් විවෘතකොට දක්වන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස්ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේවිසින් නොයෙක්ප්‍රකාරයෙන් ධර්මය දෙශනාකරණලද්දේය. ස්වාමීන්වහන්ස, මේ අපි භාග්‍යවතුන්වහන්සේද, ධර්මයද, සරණකොට යමු. ස්වාමීන්වහන්ස, අපි භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාවද ලබන්නෙමුයි සැල කළෝ.

21 මහණෙනි, ඒ අසූසාරදහසක් පැවිද්දෝ අභිත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි නැවත පැවිද්ද ලැබූහ. උපසම්පදාවද ලැබූහ. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට ධාර්මිකකථාවෙන් කරුණුදක්වූසේක. සමාදන්කර වූසේක. එහි තෙදගැන්වූසේක. එහි වැඩියක් සතුටුකරවූසේක. සංස්කාරයන්ගේ දෙෂයද, ලාමකබවද, කෙලෙසෙන බවද, නිර්වාණයෙහි අනුසස්ද, ප්‍රකාශකළසේක.

තෙසං විපස්සිනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මියා කථාය සන්දස්සියමානානං සමාදපියමානානං සමුත්තෙජියමානානං සම්පහංසියමානානං න චිරස්සෙ'ව අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

22. තෙන ඛො පන භික්ඛවෙ සමයෙන බන්ධුමතියා රාජධානියා මහාභික්ඛුසඞ්ඝො පටිවසති අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. මහා ඛො එතරහි භික්ඛුසඞ්ඝො බන්ධුමතියා රාජධානියා පටිවසති. අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං. යන්නූනාහං භික්ඛූ අනුජානෙය්‍යං චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන ද්වෙ අගමත්ථ, දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ.

---

අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේවිසින් ධාර්මික කථාවෙන් කරුණුදක්වනු ලබන්නාවූ සමාදනයකරවනු ලබන්නාවූ එහි තෙදගන්වනු ලබන්නාවූ එහි වැඩියක් සතුටුකරණු ලබන්නාවූ ඔවුන්ගේ සිත් නොබෝකලකින් උපාදානග්‍රහණය නොකොට කාමාදි ආශ්‍රවයන් කෙරෙන් වෙසෙසින් මිදුනාහුය.

22. මහණෙනි, ඒකාලයෙහිදී බන්ධුමතී රාජධානියෙහි හැටඅට ලක්‍ෂයක් භික්‍ෂූන්වූ මහද් භික්‍ෂුසඞ්ඝයා වාසයකරණසේක. මහණෙනි, ඉක්බිත්තෙන් රහසිගතවූ ප්‍රතිසංලීනයට පැමිණියාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට සිත පිළිබඳ මෙබදු විතර්කණයක් පහලවූයේය. මේකාලයෙහි බන්ධුමතී රාජධානියෙහි සැටඅටලක්‍ෂයක් භික්‍ෂූන්වූ මහද් භික්‍ෂුසඞ්ඝයා වාසයකෙරෙයි. මම භික්‍ෂූන්ට මෙසේ අනුඥකරන්නෙම්නම් ඉතා යෙහෙක. කෙසේද, මහණෙනි, බොහෝදෙනාට හිතපිණිස බොහෝදෙනාට සැපපිණිස ලොවට අනුකම්පාපිණිස දෙවිමිනිසුන්ට හිතපිණිසද, වැඩපිණිසද, සැපපිණිසද, චාරිකාකරව්. දෙදෙනෙක් එක්මගින් නොයව්. මහණෙනි, මුලයහපත්වූද, මැදයහපත්වූද, අගයහපත්වූද, අර්ථසහිතවූ ව්‍යඤ්ජනපරිපූර්ණතා සහිතවූ ධර්මය දෙශනාකරව්. සර්වප්‍රකාරයෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශකරව්.

සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා. අස්සවනතා ධම්මස්ස පරිහායන්ති, භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අපිච ඡන්නං ඡන්නං වස්සානං අච්චයෙන බන්ධුමතී රාජධානිං උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායාති.

23. අථ ඛො භික්ඛවෙ අඤ්ඤතරො මහාබ්‍රහ්මා විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය, සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය,එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුරතො පාතුරහොසි. අථ ඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන විපස්සි භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනඤ්ජලිම්පණාමෙත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච.එවමෙතං භගවා. එවමෙතං සුගත,මහා ඛො භන්තෙ එතරහි භික්ඛුසඞ්ඝො බන්ධුමතියා රාජධානියා පටිවසති අඪසට්ඨි භික්ඛුසතසහස්සං.

---

ප්‍රඥාචක්‍ෂුසෙහි ස්වල්පවූ රාගාදිරජස් ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්‍මය නොඇසීම හෙතුකොටගෙණ සත්වයෝ පිරිහෙත්.ධර්‍මාවබොධ කරන්නෝ ඇතිවන්නාහුද එහෙයිනි. තවද ෂඩ් ෂඩ් වර්‍ෂයන්ගේ ඇවෑමෙන් බන්ධුමතී රාජධානිතොමෝ පාමොක්උදෙසීමපිණිස එලඹියයුත්තීය යනුයි.

23. මහණෙනි, ඉක්බිත්තෙන් එක්තරා මහාබ්‍රහ්මයෙක් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේගේ සිතපිළිබඳ විතර්‍කය තමාගේ සිතින් දැනගෙණ බලවත් පුරුෂයෙක් හකුළුවන ලද අතක් දිගහරින්නේ හෝ යම්සේද,දික්කළ අතක් හකුළුවන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම බ්‍රහ්මලොකයෙහි අතුරුදහන්වූයේම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේගේ ඉදිරියෙහි පහලවූසේක. මහණෙනි, ඒ මහාබ්‍රහ්මතෙම උතුරුසළුව එකස්කොට අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද ඒදෙසට අඤ්ජලිප්‍රණාමය කොට අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. භාග්‍යවතුන්වහන්ස, නුඹවහන්සේවිසින් විතර්‍කණය කරණලද මේ කාරණය එසේමැයි. සුගතයන්වහන්ස, මේ කාරණය එසේමැයි. ස්වාමීන්වහන්ස, දැන් බන්ධුමතී රාජධානියෙහි සැටඅටලක්‍ෂයක්වූ මහද් භික්‍ෂුසඞ්ඝයා වාසයකරණසේක.

අනුජානාතු භන්තෙ භගවා භික්ඛූ. චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන වෙ අගමිත්ථ, දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජණං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා, අස්සවනතා ධම්මස්ස පරිහායන්ති, භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අපිච භන්තෙ මයං තථා කරිස්සාම යථා භික්ඛූ ඡන්නං ඡන්නං වස්සානං අච්චයෙන බන්ධුමතිං රාජධානිං උපසඞ්කමිස්සන්ති පාතිමොක්ඛුද්දෙසායාති. ඉදමවොච භික්ඛවෙ සො මහාබ්‍රහ්මා. ඉදං වත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන් තරධායි.

24. අථඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො සායන්හසමයං පතිසල්ලානා වුට්ඨිතො භික්ඛූ ආමන්තෙසි.

---

ස්වාමිනි, භාග්‍යවතුන්වහන්සේ භික්‍ෂූන්ට මෙසේ අනුඥාකරණ සේක්වා. කෙසේද. මහණෙනි, බොහෝදෙනාට වැඩපිණිසද, බොහෝදෙනාට සැපපිණිසද, ලොවට අනුකම්පාපිණිසද, දෙව් මිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද, වැඩපිණිසද, සැපපිණිසද, චාරිකාකරව්. එක්මගකින් දෙදෙනෙක් නොයව්. මුල යහපත් වූද, මැදයහපත්වූද, අගයහපත්වූද, අවසානයෙහි යහපත්වූද, අර්ථසහිතවූ ව්‍යඤ්ජනපරිපූර්ණතා සහිතවූ ධර්මය දෙශනාකරව්. සර්වප්‍රකාරයෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ මගබඹසර ප්‍රකාශකරව්. ප්‍රඥාචක්‍ෂුසෙහි ස්වල්පවූ රාගාදිරජස් ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හෙතුකොටගෙණ සත්වයෝ පිරිහෙත්. ධර්මය දැනගන්නෝවන්නාහුය කියායි. තවද ස්වාමීන් වහන්ස, ෂඩ් ෂඩ් වර්ෂයන්ගේ ඇවෑමෙන් භික්‍ෂූහු පාමොක් උදෙසීමපිණිස බන්ධුමතී රාජධානියට එලඹෙන්නාහුද අපි එසේ කරමු යනුයි. මහණෙනි, ඒ මහාබ්‍රහ්මතෙම මේ කාරණය දැන්වීය, මේ කාරණය කියා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන් වහන්සේ අභිවාදනය කොට පැදකුණුකොට එහිම අතුරුදහන් වූයේය.

24. මහණෙනි, ඉක්බිත්තෙන් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ ඵල සමාපත්තියෙන් නැගීසිටිසේක් භික්‍ෂූන් ඇමතූසේක.

ඉධ මය්හං භික්ඛවෙ රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. මහා ඛො එතරහි භික්ඛුසඞ්ඝො බන්ධුමතියා රාජධානියා පටිවසති අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං. යන්නුනාහං භික්ඛූ අනුජානෙය්‍යං චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන වෙ අගමිත්ථ. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා අස්සවනතා ධම්මස්ස පරිහායන්ති, භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො, අපිච ඡන්නං ඡන්නං වස්සානං අච්චයෙන බන්ධුමතී රාජධානී උපඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායාති

25. අථඛො භික්ඛවෙ අඤ්ඤතරො මහාබ්‍රහ්මා මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය.

---

මහණෙනි, මෙහි රහසිගතවූ ප්‍රතිසංලීනයට පැමිණියාවූ මට සිත පිළිබඳ මෙබඳු විතර්කයෙක් උපන්නේය. මේ කාලයෙ බන්ධුමතී රාජධානියෙහි සැටඅටලක්‍ෂයක් භික්‍ෂූන්වූ මහත් භික්‍ෂු සඞ්ඝයා වාසයකෙරෙයි. මම භික්‍ෂූන්ට මෙසේ අනුඥාකරන්නෙම් නම් ඉතා යෙහෙක. කෙසේද, මහණෙනි, බොහෝදෙනාට හිතපිණිස බොහෙදෙනාට සැපපිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව්මිනිසුන්ගේ හිත පිණිසද, වැඩ පිණිසද, සැප පිණිසද චාරිකාකරව් දෙදෙනෙක් එක්මගින් නොයව්,. මහණෙනි, මුල යහපත්වූද මැද යහපත්වූද අග යහපත්වූද අර්‍ථසහිතවූ ව්‍යඤ්ජන පරිපූර්‍ණතා සහිතවූ ධර්‍මය දෙශනාකරව්. සර්‍ව ප්‍රකාරයෙන් සම්පූර්‍ණවූ පිරිසිදුවූ මාර්‍ගී බ්‍රහ්මචරියර්‍ථාව ප්‍රකාශ කරව්. ප්‍රඥාචක්‍ෂුසෙහි ස්වල්පවූ රාගාදී රජස් ඇත්තාවූ සත්‍වයෝ ඇත්තාහ. ධර්‍මය නොඇසීම හෙතුකොටගෙණ සත්වයෝ පිරිහෙත්. ධර්‍මාවබොධකරත්තෝ ඇතිවන්නාහුද එහෙයිනි, තවද ෂඩ් ෂඩ් වර්‍ෂයන්ගේ ඇවෑමෙන් බන්ධුමතී රාජධානි තොමෝ පාමොක් උදෙසීම පිණිස එලඹිය යුත්තීය යනුයි.

25. මහණෙනි, ඉක්බිත්තෙන් එක්තරා මහා බ්‍රහ්මයෙක් මාගේ සිත පිළිබඳ විතර්‍කය තමාගේ සිතින් දැනගෙණ.

සෙය්‍යථාපිනාම බලවා පුරිසො සම්මිඤ්ජිතං ව බාහං පසාරෙය්‍ය. පසාරිතංවා බාහංසම්මිඤ්ජෙය්‍ය. එවමෙව බ්‍රහ්මලොකෙ අන්තර හිතො මම පුරතො පාතුරහොසි. අථ බො සො භික්ඛවෙ මහා බ්‍රහ්මා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙනාහං තෙනඤ්ජලිම්පණා මෙත්වා මං එතදවොච. එවමෙතං භගවා,එවමෙතං සුගත මහා බො භන්තෙ එතරහි භික්ඛුසඞ්ඝො බන්ධුමතියා රාජධානියා පටිවසති අඪසට්ඨිභික්ඛුසතසහස්සං. අනුජානාතු භන්තෙ භගවා භික්ඛූ චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන වෙ අග මත්‍ථ. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්‍ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ.සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා අස්සවනතා ධම්මස්ස පරිහායන්ති,

බලවත් පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගහරින්නේ හෝ යම්සේද දිගුකල අතක් හකුළුවන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම බ්‍රහ්මලොකයෙහි අතුරුදහන්වූයේම මාගේ ඉදිරියෙහි පහලවූයේය. මහණෙනි,ඒ බ්‍රහ්මයාතෙම උතුරුසළුවක් එකස්කොට මම යම්තැනෙක්හිද ඒදෙසට අඤ්ජලිප්‍රණාමයකොට මට මේ කාරණය සැලකළේය. භාග්‍යවතුන්වහන්ස, නුඹවහන්සේ විසින් විතර්කණය කරණලද මේ කාරණය එසේමැයි, සුගතයන්වහන්ස,මේකාරණය එසේ මැයි, ස්වාමීන්වහන්ස බන්ධුමතීරාජධානියෙහි සැටඅටලක්‍ෂයක්වූ මහත් භික්‍ෂුසඞ්ඝයා වාසයකරණසේක. ස්වාමීනි භාග්‍යවතුන්වහන්සේ භික්‍ෂූන්ට මෙසේ අනුඥකරණසේක්වා, කෙසේද මහණෙනි, බොහොජනයාට වැඩ පිණිසද, බොහොදෙනාට සැපපිණිසද, ලොවට අනුකම්පා පිණිසද, දෙව් මිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද, වැඩ පිණිසද සැපපිණිසද චාරිකාකරව්,එක්මගකින් දෙදෙනෙක් නොයව්. මුල යහපත්වූද මැද යහපත්වූද අග යහපත්වූද, අවසානයෙහි යහපත්වූද අර්‍ථසහිතවූ ව්‍යඤ්ජන පරිපූර්‍ණතා සහිතවූ ධර්‍මය දෙශනාකරව්, සර්‍වප්‍රකාරයෙන් සම්පූර්‍ණවූ පිරිසිදුවූ මගබඹසර ප්‍රකාශකරව්. ප්‍රඥචක්‍ෂුසෙහි ස්වල්පවූ රාගාදී රජස් ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්‍මය නොඇසීම හෙතුකොට සත්වයෝ පිරිහෙත්

භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අපිච භන්තෙ මයං තථාකරිස්සාම යථා භික්ඛූ ජනපදං ජනපදං වස්සානං අච්චයෙන බන්ධුමතිං රාජධානිං උපසංකමිස්සන්ති පාතිමොක්ඛුද්දෙසායාති. ඉදමවොච සො භික්ඛවෙ මහාබ්‍රහ්මා, ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

26. අනුජානාමි භික්ඛවෙ චරථ චාරිකං බහුජනහිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන වෙ අගමිත්ථ, දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං. කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා අස්සවනතා ධම්මස්ස පරිහායන්ති, භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො, අපිච භික්ඛවෙ ජනපදං ජනපදං වස්සානං අච්චයෙන බන්ධුමතී රාජධානී උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායාති. අථ ඛො භික්ඛවෙ භික්ඛූ යෙභුය්‍යෙන එකාහෙනෙව ජනපදචාරිකං පක්කාමිංසු.

---

ධර්මය දැනගන්නෝ වන්නාහයි කියායි. තවද ස්වාමීන්වහන්ස, ෂඩ් ෂඩ් වර්ෂයන්ගේ ඇවෑමෙන් භික්ෂූහු පාමොක් උදෙසීම පිණිස බන්ධුමතීරාජධානියට එලඹෙන්නාහුද, අපි එසේ කරමුයි යනුයි. මහණෙනි, ඒ මහාබ්‍රහ්මතෙම මේකාරණය කීයේය, මේකාරණය කියා මා අභිවාදනයකොට පැදකුණුකොට එහිදීම අතුරුදහන් වූයේය.

26. මහණෙනි, මම් මෙසේ තොපට අනුඥකරමි. කෙසේද මහණෙනි, බොහෝදෙනාට හිතපිණිසද බොහෝදෙනාට සැපපිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවි මිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩ පිණිසද සැප පිණිසද චාරිකා කරව්. දෙදෙනෙක් එක්මගින් නොයව්. මහණෙනි, මුලයහපත්වූද මැදයහපත්වූද අවසානයෙහි යහපත්වූද අර්ථ සහිතවූ ව්‍යඤ්ජන පරිපූර්ණතාසහිත වූ ධර්මදෙශනාකරව්, සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බඹසර ප්‍රකාශකරව්. ප්‍රඥාචක්ෂුසෙහි ස්වල්පවූ රාගාදී රජස්ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ධර්මය නොඇසීම හෙතුකොටගෙණ සත්වයෝ පිරිහෙත්. ධර්මාවබොධකරන්නෝ වන්නාහුද එහෙයිනි. තවද ෂඩ් ෂඩ්වර්ෂයන්ගේ ඇවෑමෙන් පාමොක් උදෙසීම පිණිස බන්ධුමතීරාජධානි තොපමෝ එලඹිය යුත්තිය යනුයි. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ භික්ෂූහු බොහෝසෙයින් එක්දවසකින්ම දනව් සැරිසැරීමට පිටත්වූහ.

---

27. තෙනඛොපන භික්ඛවෙ සමයෙන ජම්බුදීපෙ චතුරසීති ආවාසසහස්සානි හොන්ති, එකම්හි වස්සෙ නික්ඛන්තෙ දෙවතා සද්දමනුස්සාවෙසුං. නික්ඛන්තං ඛො මාරිසා එකං වස්සං, පඤ්ච'දානි වස්සානි සෙසානි. පඤ්චන්නං වස්සානං අච්චයෙන බන්ධුමතී රාජධානී උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායාති. ද්වීසු වස්සෙසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං නික්ඛන්තානි ඛො මාරිසා ද්වෙ වස්සානි. චත්තාරි දානි වස්සානි සෙසානි, චතුන්නං වස්සානං අච්චයෙන බන්ධුමති රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායාති. තීසු වස්සෙසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං නික්ඛන්තානිඛො මාරිසා තීණි වස්සානි, තීනි'දානි වස්සානි සෙසානි. තිණ්ණං වස්සානං අච්චයෙන බන්ධුමතී රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායාති. චතූසු වස්සෙසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං නික්ඛන්තානි ඛො මාරිසා චත්තාරි වස්සානි. ද්වේ'දානි වස්සානි සෙසානි ද්වින්නං වස්සානං අච්චයෙන බන්ධුමතී රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායාති. පඤ්චසු වස්සෙසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං.

---

27. මහණෙනි, ඒකාලයෙහිදී දඹදිව අසූහතරදහසක් ආවාසයෝ වෙත්, එක්වසක් ඉක්මුණුකල්හි දෙවතාවෝ ශබ්දානුශ්‍රාවණය කළාහුය. කෙසේද, නිදුකානෙනි එකවසක් ඉක්මුණේය. දැන් මින් ඔබ පස්වසක් ඉතුරුවූහ, පස්වසක්හුගේ ඇවෑමෙන් පාමොක් උදෙසීම පිණිස බන්ධුමතීනම් රාජධානීතොමෝ එළඹිය යුත්තීය කියායි, වස්දෙකක් ඉක්මුණුකල්හි දෙවතාවෝ ශබ්දානුශ්‍රාවණය කළාහුය, නිදුකානෙනි, වස්දෙකක් ඉක්මුණාහුය, දැන්මින් ඔබ සිව්වසක් ඉතුරුවූහ, සිව්වසක්හුගේ ඇවෑමෙන් පාමොක් උදෙසීම පිණිස බන්ධුමතී රාජධානීතොමෝ එළඹිය යුත්තීය. වස්තුණක් ඉක්මුණුකල්හි දෙවතාවෝ ශබ්දානුශ්‍රාවණය කළාහුය. කෙසේද නිදුකානෙනි වස්තුණක් ඉක්මුණාහුය. දැන්මින් ඔබ වස්තුණක් ඉතුරුවූහ, වස්තුණක්හුගේ ඇවෑමෙන් බන්ධුමතීරාජධානීතොමෝ පාමොක් උදෙසීම පිණිස එළඹිය යුත්තීයකියායි. සිව්වසක් ඉක්මුණුකල්හි දෙවතාවෝ ශබ්දානුශ්‍රාවණය කළාහුය. කෙසේද, නිදුකානෙනි, සිව්වසක් ඉක්මුණාහුය, දැන්මින් ඔබ වස්දෙකක් ඉතුරුවූහ. වස්දෙකක්හුගේ ඇවෑමෙන් බන්ධුමතීරාජධානී තොමෝ පාමොක් උදෙසීම පිණිස එළඹිය යුත්තීය කියායි. පස්වසක් ඉක්මුණුකල්හි දෙවතාවෝ ශබ්දානුශ්‍රාවණය කළාහුය.

නික්ඛන්තානිඛො මාරිසා පඤ්චවස්සානි, එකං 'දානි වස්සං සෙසං, එකස්ස වස්සස්සඅච්චයෙනබන්ධුමතී රාජධානී උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායාති. ඡස්සු වස්සෙසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං, නික්ඛන්තානි ඛො මාරිසා ඡවස්සානි.සමයො'දානි බන්ධුමතිං රාජධානිං උපසඞ්කමිතුං පාතිමොක්ඛුද්දෙසායාති.අථඛො තෙ භික්ඛවෙ භික්ඛූ අප්පෙකච්චෙ සකෙනෙව ඉද්ධානුභාවෙන, අප්පෙකච්චෙ දෙවානං ඉද්ධානුභාවෙන,එකාහෙනෙව බන්ධුමතිං රාජධානිං උපසඞ්කමිංසු පාතිමොක්ඛුද්දෙසායාති.

28. තත්‍රසුදං භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො භික්ඛුසඞ්ඝෙ එවං පාතිමොක්ඛං උද්දිසති.

ඛන්ති පරමං තපො තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා,
නහි පබ්බජිතො පරූපඝාතී
සමණො හොති පරං විහෙඨයන්තො.

---

කෙසේද, නිදුකානෙනි, පස්වසක් ඉක්මුණාහුය, දැන් මින් ඔබ එක්වසක් ඉතුරුවූයේය. එක්වසක්හුගේ ඇවෑමෙන් බන්ධුමතී රාජධානීතොමෝ පාමොක් උදෙසීම පිණිස එළඹිය යුත්තීය කියායි. ෂඩ්වර්ෂය ඉක්මුණුකල්හි දෙවතාවෝ ශබ්දානුශ්‍රාවණය කළාහුය,කෙසේද,නිදුකානෙනි වස් සයක් ඉක්මුණාහුය, දැන් බන්ධුමතීරාජධානියට පාමොක් උදෙසීම පිණිස එළඹෙන්ට සුදුසුකාලය කියායි. මහණෙනි, ඉක්බින්තෙන් ඒ භික්ෂූහු ඇතැම්කෙනෙක් ස්වකීය ඍද්ධ්‍යනුභාවයෙන්ද ඇතැම්කෙනෙක් දෙවියන්ගේ දෙවානුභාවයෙන්ද බන්ධුමතීරාජධානියට පාමොක් උදෙසීම පිණිස එළඹියාහුය.

28. මහණෙනි, එකල්හි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේ බන්ධුමතී රාජධානියෙහිවූ සඞ්ඝසමාගමයෙහි මෙසේ පාමොක් උදෙසනසේක. අනුන්ගේ අපකාර හා අපවාද ඉවසීමයයි කියනලද අධිවාසන ක්‍ෂාන්තිතොමෝ අකුශලධර්මයන් තවනහෙයින් මේ නෛර්‍යාණිකවූ ශාසනයෙහි උතුම් තපසේක. සියලු බුදුවරයෝ නිර්වාණය ශාන්තප්‍රණීතාදි වශයෙන් උතුම්යයි කියත්. පරහට හිංසාකරණ ස්වභාවඇති තැනැත්තේ ප්‍රව්‍රජිතනම් නොවේ. අනුන්ට වෙහෙසකරණ තැනැත්තේද ශ්‍රමණලක්‍ෂණයන්ගෙන් පරිබාහ්‍ය හෙයින් ශ්‍රමණනොවේ.

සබ්බපාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං
එතං බුද්ධාන සාසනං.

අනූපවාදෙ අනූපඝාතො
පාතිමොක්ඛෙච සංවරො,
මත්තඤ්ඤුතාච භත්තස්මිං
පන්තඤ්ච සයනාසනං,
අධිචිත්තෙච ආයොගො
එතං බුද්ධාන සාසනං'ති.

29. එකමිදාහං භික්ඛවෙ සමයං උක්කට්ඨායං විහරාමි සුභගවනෙ සාලරාජමූලෙ. තස්ස මය්හං භික්ඛවෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි,

---

ප්‍රාණඝාතාදි සකලඅකුශල කර්‍මයාගේ නොකිරීමද, ලෞකික ලොකොත්තර කුශලයාගේ ඉපදවීම හා උපන් කුසල් වැඩීමද, නිවරණධර්‍මයන් කෙරෙන් තමාගේ සිත පිරිසිදුකිරීමද, යන මේ සියල්ල සියලු බුදුවරයන්ගේ අනුශාසනායි. ක්‍රොධසිතින් යුක්තව අනුන්ට වචනයෙන් උපවාද නොකිරීමද, පරහට කයින් උපඝාතයක් නොකිරීමද, ප්‍රාතිමොක්‍ෂසංවරසීලයෙහි සංවරසඞ්ඛ්‍යාත ආරක්‍ෂාවද, ආහාරයෙහි මාත්‍රඥතාවද හෙවත් ආහාරපර්‍යෙෂණාදියෙහි පමණ දන්නා බවද, දෝහෝ නොහොත් දැහැමින්සෙමින් උපන් සිව්පසය පස්විකා වළඳන බවද, ජනරහිතවූ ප්‍රාන්තසයනාසනයෙහි අභිරමනයද, හෙවත් ඉතා දුර වන සෙනසුන්හි ඇල්මද, අධිචිත්තසඞ්ඛ්‍යාත රූපාරූප අෂ්ටසමාපත්තියෙහි නිරන්තරානුයොගයද, යන මේ සියල්ල සියලු බුදුවරයන්ගේ අනුශාසනායි.

29. මහණෙනි, මම එක්කාලයෙක්හි උක්කට්ඨානුවර සුභගනම් වනයෙහිවූ සාලවෘක්‍ෂරාජ සමීපයෙහි වාසයකරමි. මහණෙනි, රහසිගතවූ එකී භාවයට පැමිණියාවූ ඒ මට සිතපිළිබඳ මෙබඳු විතර්කයෙක් පහළවිය, කෙසේදයත්.

න ඛො සො සත්තාවාසො සුලභරූපො යො මයා අනාවුත්ථ
පුබ්බො ඉමිනා දීඝෙන අද්ධුනා අඤ්ඤත්‍ර සුද්ධාවාසෙහි දෙවෙහි. යන්නූ
නා'හං යෙන සුද්ධාවාසා දෙවා තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො අහං
භික්ඛවෙ සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසා
රෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව උක්කට්ඨායං සුභග
වනෙ සාලරාජමූලෙ අන්තරහිතො අවිහෙසු දෙවෙසු පාතුරහොසිං.
තස්මිං භික්ඛවෙ දෙවනිකායෙ අනෙකානි දෙවතාසහස්සානි යෙනා හං
තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු.
එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ තා දෙවතා මං එතදවොචුං. ඉතො
සො මාරිස එකනවුතො කප්පෙ'යං විපස්සි භගවා අරහං සම්මාසම්
බුද්ධො ලොකෙ උදපාදි. විපස්සි මාරිස භගවා අරහං සම්මාසම්බුද්ධො
ඛත්තියො ජාතියා අහොසි. ඛත්තියකුලෙ උදපාදි. විපස්සි මාරිස
භගවා අරහං සම්මාසම්බුද්ධො කොණ්ඩඤ්ඤො ගොත්තෙන අහොසි.

---

පාරමීධර්මයන් පුරන්නාවූ මාවිසින් මේ දීර්ඝකාලයතුළ ශුද්ධා
වාස දෙවියන් හෙවත් සුදවැසි බඹතලය හැර වාසය නොකළවිරූ
යම් සත්වනිකායක් වේද, ඒ සත්වාවාසයතෙම සුවසේ
නොලැබියහැකි ස්වභාව ඇත්තේය. ඒකාන්තයෙන් මම සුදවැසි
දෙවියෝ යම්තැනෙක්හිද එතනට එළඹෙන්නෙම්නම් ඉතා යෙහෙක
යනුයි. මහණෙනි, ඉක්බිත්තෙන් මම ශක්තිසම්පන්න පුරුෂයෙක්
හකුළුවනලද අතක් දික්කරන්නේ හෝ යම්සේද, දික්කළ අතක්
වක්කරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම උක්කට්ඨානුවර සුභග
නම් වනයෙහි සාලවෘක්ෂරාජ සමීපයෙහිදී අතුරුදහන්වූයෙම් අවිහ
දෙවියන් විසයෙහි පහලවූයෙමි. මහණෙනි, ඒ දිව්‍යනිකායෙහි
නොයෙක් දහස්ගණන් දෙවතාවෝ මම යම්තැනෙක්හිද එතනට
එළඹියාහුය. එළඹ මට අභිවාදනයකොට එකත්පසෙක සිටියාහුය.
මහණෙනි, එකත්පසෙක සිටියාවූම ඒ දෙවතාවෝ මට මේ කාරණය
දැන්වූහ. නිදුකානෙනි, යම්කලෙක අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි
භාග්‍යවතුන්වහන්සේ ලොව පහලවූසේක්ද, එය මෙයින් අනූඑක්
වෙනි කල්පයයි. නිදුකානන්වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ
විදර්ශි භාග්‍යවතුන්වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රියවූසේක. ක්ෂත්‍රියකුල
යෙහි උපන්සේක. නිදුකානන්වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ
විදර්ශි භාග්‍යවතුන්වහන්සේ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤනම් වූසේක.

විපස්සිස්ස මාරිස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසීති වස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. විපස්සී මාරිස භගවා අරහං සම්මාසම්බුද්ධො පාටලියා මූලෙ අභිසම්බුද්ධො, විපස්සිස්ස මාරිස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඛණ්ඩතිස්සං නාම සාවක යුගං අහොසි අග්ගං භද්දයුගං විපස්සිස්ස මාරිස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයො සාවකානං සන්නිපාතා අහෙසුං, එකො සාව කානං සන්නිපාතො අහොසි. අඪසට්ඨි භික්ඛුසතසහස්සං එකො සාව කානං සන්නිපාතො අහොසි භික්ඛුසතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි අසීතිභික්ඛුසහස්සානි. විපස්සිස්ස මාරිස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නි පාතා අහෙසුං සබ්බෙසං යෙව ඛීණාසවානං. විපස්සිස්ස මාරිස භග වතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසොකො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. විපස්සිස්ස මාරිස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බන්ධුමානාම රාජා පිතා අහොසි.

---

නිදුකානන්වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන් වහන්සේට අසූදහසක් අව්රුදු ආයුප්‍රමාණ වූයේය. නිදුකානන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේ පලොල්රුකමුලදී චතුසත්‍යාවබොධකළසේක. නිදුකානන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට ඛණ්ඩය, තිස්සය යන නම්ඇත්තාවූ භද්‍රයුග්මයක්වූ ශ්‍රාවකයුග්මයක් වූයේය. නිදුකානන්වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍ය වතුන්වහන්සේට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණක් වූහ. සැටඅටලක්ෂ යක් භික්ෂූන්වූ ශ්‍රාවකයන්ගේ එක්රැස්වීමක් වූයේය. භික්ෂූන් ලක්ෂ යක් ඇත්තාවූ ශ්‍රාවකයන්ගේ එක්රැස්වීමක් වූයේය. අසූදහසක් භික්ෂූන්ඇති ශ්‍රාවකයන්ගේ එක්රැස්වීමක් වූයේය. නිදුකානන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට සියල්ලම අර්හද් භික්ෂූන්ගෙන් යුක්තවූ මෙ ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුණ වූයේය. නිදුකානන්වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට උතුම්ලෙස උපස්ථානකරන්නාවූ අසොකනම් භික්ෂුකෙනෙක් උපස්ථායක වූයේය. නිදුකානන්වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශි භාග්‍යවතුන්වහන්සේට බන්ධුමානම් රජ තෙම පියවූයේය.

බන්ධුමතී නාම දෙවී මාතා අහොසී ජනෙත්ති, බන්ධුමස්ස රඤ්ඤො බන්ධුමතී නාම රාජා නගරං රාජධානි අහොසි. විපස්සිස්ස මාරිස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එවං අභිනික්ඛමනං අහොසි, එවං පබ්බජ්ජා, එවං පධානං, එවං අභිසම්බොධි, එවං ධම්මචක්කප්පවත්තනං. තෙ'මයං මාරිස විපස්සිම්හි භගවති බ්‍රහ්මචරියං චරිත්වා කාමෙසු කාමච්ඡන්දං විරාජෙත්වා ඉධූපපන්නාති.

30. තස්මිං යෙව ඛො භික්ඛවෙ දෙව නිකායෙනෙකානි දෙවතා සහස්සානි—පෙ—නෙකානි දෙවතා සතානි යෙනා 'හං තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ තා දෙවතා මං එතදවොචුං. ඉමස්මිං යෙව ඛො මාරිස භද්දකප්පෙ භගවා එතරහි අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො. භගවා මාරිස ඛත්තියො ජාතියා ඛත්තියකුලෙ උප්පන්නො. භගවා මාරිස ගොතමො ගොත්තෙන.

---

බන්ධුමතීනම් දේවීතොමෝ ජනක මව් වීය. බන්ධුමානම් රජහට බන්ධුමතීනම් නුවර අග්‍රරාජධානී විය. නිදුකානන්වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන්වහන්සේ අභිනිෂ්ක්‍රමණය මෙසේ වූයේය. මෙසේ පැවිද්දවූයේය. මෙසේ පධන් වීර්‍ය්‍යය වූයේය, මෙසේ සම්‍යක්සම්බෝධිය වූයේය. දම්සක් පැවැත්වීම මෙසේ වීය. නිදුකානන්වහන්ස, ඒ අපි විදර්ශී භාග්‍යවතුන්වහන්සේගේ සස්නෙහි බඹසරකොට කාමයන්හි කාමච්ඡන්දය අනාගාමී මාර්ගයෙන් සමූලඝාතනයෙන් දුරුකොට මේ බඹතලයෙහි උපන්නම්හයි සැලකළාහුය.

30. මහණෙනි, ඒ දිව්‍යනිකායෙහිම නොයෙක් දහස්ගණන් දෙවතාවෝද—සෙස්ස ප්‍රථමවාරයෙහි මෙන් විස්තරයට පැමිණවියයුතු. නොයෙක් සියගණන් දෙවතාවෝද මම යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ මට අභිවාදනය කොට එකත්පසෙක සිටියාහුය. මහණෙනි, එකත්පසෙක සිටියාවූ ඒ දෙවතාවෝ මට මේ කාරණය සැලකළාහුය. නිදුකානන්වහන්ස, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන්වහන්සේ මේ භද්‍රකල්පයෙහිම ලොව පහළවූයේය. නිදුකානන්වහන්ස, ඒ භාග්‍යවතුන්වහන්සේ ජාතියෙන් ක්ෂත්‍රිය වූයේය, කැත්කුලයෙහි උපනි. නිදුකානන්වහන්ස, ගෞතම භාග්‍යවතුන්වහන්සේ ගොත්‍රයෙන් ගෞතමවූසේක.

භගවතො මාරිස අප්පකං ආයුප්පමාණං පරිත්තං ලහුසං, යො චිරං ජීවති සො වස්සසතං අප්පං වා භීය්‍යො. භගවා මාරිස අස්සත්ථස්ස මූලෙ අභිසම්බුද්ධො. භගවතො මාරිස සාරිපුත්තමොග්ගල්ලානං නාම සාවකයුගං අග්ගං භද්දයුගං. භගවතො මාරිස එකො සාවකානං සන්නිපාතො අහොසි අඩ්ඪතෙළසානි භික්ඛුසතානි. භගවතො මාරිස අයං එකොසාවකානං සන්නිපාතො අහොසි සබ්බෙසං යෙව ඛීණාසවානං. භගවතො මාරිස ආනන්දො භික්ඛු උපට්ඨාකො අහොසි. අග්ගුපට්ඨාකො. භගවතො මාරිස සුද්ධොදනො රාජා පිතා මායාදෙවී මාතා ජනෙත්ති, කපිලවත්ථු නගරං රාජධානි. භගවතො මාරිස එවං අභිනික්ඛමනං අහොසි, එවං පබ්බජ්ජා, එවං පධානං එවං අභිසම්බොධි, එවං ධම්මචක්කප්පවත්තනං. තෙ මයං මාරිස භගවති බ්‍රහ්මචරියං චරිත්වා කාමෙසු කාමච්ඡන්දං විරාජෙත්වා ඉධූපපන්නානි.

---

නිදුකානන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේගේ ආයුප්‍රමාණය ස්වල්ප වූයේ ඉතාස්වල්පයි. සැහැල්ලුයි හෙවත් කොටයි. යමෙක් කලක් ජීවත් වේනම් හෙතෙමේ අවුරුදු සියයක් ජීවත්වේ. අවුරුදු සියයකින් වැඩිවන්නේනම් ඒ ඉතා ස්වල්පයකි. අවුරුදු එකසියතිසක් හෝ සතළිසක් හෝ පණසක් හෝ සැටක් හෝ ජීවත්වෙයි. කිසිසේත් අවුරුදු දෙසියයක් සම්පූර්ණනොකෙරේයයනුයි. නිදුකානන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ ඇසතුරුකමුලදී චතුස්සත්‍යාවබොධකළසේක. නිදුකානන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේට භද්‍රයුග්මයක්වූ සැරියුත් මුගලන් නම් ශ්‍රාවකයුග්මයක් වූයේය. නිදුකානන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේට එක්දහස් දෙසියපණසක් භික්ෂූන්වූ එක් ශ්‍රාවක සන්නිපාතයක් වූයේය. නිදුකානන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේට සියල්ලන්ම රහත්භික්ෂූන්ගෙන් යුක්තවූ මේ එකම ශ්‍රාවක සන්නිපාතය වූයේය. නිදුකානන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේට උතුම්ලෙස උපස්ථානකරන්නාවූ ආනන්දභික්ෂුතෙමේ අග්‍ර උපස්ථායක වූයේය. නිදුකානන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේට සුද්ධොදන රජතෙමේ පියවූයේය. මායාදෙවීතොමෝ ජනකමව් විය. කිඹුල්වත් නුවර රාජධානී විය. නිදුකානන්වහන්ස, මෙසේ භාග්‍යවතුන්වහන්සේගේ අභිනිෂ්ක්‍රමණය වූයේය. මෙසේ ප්‍රව්‍රජ්‍යාව වීය. මෙසේ පධන්වීර්‍ය්‍යය විය. මෙසේ සම්‍යක්සම්බොධිය වීය. මෙසේ දම්සක් පැවැත්වීම වූයේය. නිදුකානන්වහන්ස, ඒ අපි භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි බඹසර කොට කාමයන්හි කාමච්ඡන්දය අනාගාමි මාර්ගයෙන් සමූලඝාතනවශයෙන් දුරුකොට මේ බඹතෙලෙහි උපන්නාහුයයි සැලකළාහුය.

31. අථ ඛො හං භික්ඛවෙ අවිහෙහි දෙවෙහි සද්ධිං යෙන අතප්පා දෙවා තෙනුපසඞ්කමිං. අථ ඛ්වාහං භික්ඛවෙ අවිහෙහිච දෙවෙහි අතප්පෙහිච දෙවෙහි සද්ධිං යෙන සුදස්සා දෙවා තෙනුපසඞ්කමිංසු. අථ ඛ්වාහං භික්ඛවෙ අවිහෙහි ච දෙවෙහි අතප්පෙහි ච දෙවෙහි සද්ධිං සුදස්සෙහි ච දෙවෙහි සද්ධිං යෙන සුදස්සී දෙවා තෙනුපසඞ්කමිං. අථ ඛ්වාහං භික්ඛවෙ අවිහෙහි ච දෙවෙහි අතප්පෙහි ච දෙවෙහි සුදස්සෙහි ච දෙවෙහි සුදස්සීහි ච දෙවෙහි සද්ධිං යෙන අකනිට්ඨා දෙවා තෙනුපසඞ්කමිං. තස්මිං භික්ඛවෙ දෙවනිකායෙ නෙකානි දෙවතා සහස්සානි යෙනා'හං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු එකමන්තං ඨිතො ඛො භික්ඛවෙ තා දෙවතා මං එතද වොචුං. ඉතො සො මාරිස එකනවුතෙ කප්පෙ යං විපස්සි භගවා අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උදපාදි......පෙ......

32. තස්මිං යෙව ඛො භික්ඛවෙ දෙවනිකායෙ නෙකානි දෙවතා සහස්සානි......පෙ......නෙකානි දෙවතාසතානි යෙනාහං තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ තා දෙවතා මං එතදවොචුං.

---

31. මහණෙනි, ඉක්බිත්තෙන් මම අවිහදෙවියන් සමග අතප්ප දෙවියෝ යම්තැනෙක්හිද එතනට එළඹියෙමි. මහණෙනි, තවද මම අවිහදෙවියෝය අතප්පදෙවියෝය යන මොවුන් සමග සුදස්සදෙවියෝ යම්තැනෙක්හිද එතනට එළඹියෙමි. මහණෙනි, තවද මම අවිහදෙවියන් සමගද අතප්පදෙවියන් සමගද සුදස්සදෙවියන් සමගද සුදස්සිදෙවියෝ යම්තැනෙක්හිද එතනට එළඹියෙමි. මහණෙනි, තවද මම අවිහදෙවියන් සමගද අතප්පදෙවියන් සමගද සුදස්සදෙවියන් සමගද සුදස්සිදෙවියන් සමගද අකනිට්ඨදෙවියෝ යම්තැනෙක්හිද එතනට එළඹියෙමි, මහණෙනි, ඒ දිව්‍යනිකායෙහි නොයෙක් දහස් ගණන් දෙවතාවෝ මම යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ මට අභිවාදනය කොට එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටියාවූ ඒ දෙවතාවෝ මට මේ කාරණය සැලකළාහුය නිදුකානන් වහන්ස, යම්කලෙක්හි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ විදර්ශී භාග්‍යවතුන් වහන්සේ ලොව පහලවූසේක්ද. ඒ මෙයින් අනූඑක්වෙනි කල්පයයි. සෙස්ස කීනයින් විස්තරයට පැමිණවියයුතු.

32. මහණෙනි, ඒ දිව්‍යනිකායෙහිම නොයෙක් දහස්ගණන් දෙවතාවෝද, නොයෙක් සියගණන් දෙවතාවෝද, මම යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ මට අභිවාදනයකොට එකත්පසෙක සිටියාහුය. මහණෙනි, එකත්පසෙක සිටියාවූ ඒ දෙවතාවෝ මට මේ කාරණය දැන්වූහ.

ඉමස්මිං යෙව ඛො මාරිස භද්දකප්පෙ භගවා එතරහි අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උප්පන්නො—පෙ—

33. ඉති ඛො භික්ඛවෙ තථාගතස්සෙවෙසා ධම්මධාතු සුප්පටිවිද්ධා යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුස්සරති, නාමතොපි අනුස්සරති, ගොත්තතොපි අනුස්සරති, ආයුප්පමාණතොපි අනුස්සරති, සාවකයුගතොපි අනුස්සරති, සාවකසන්නිපාතතොපි අනුස්සරති, එවං ජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි එවං නාමා එවං ගොත්තා එවං සීලා එවං ධම්මා එවං පඤ්ඤා එවං විහාරී එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපීති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති,

**මහාපදාන සුත්තං නිට්ඨිතං චතුද්දසමං.**

---

නිදුකානන්වහන්ස, දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ මේ භද්‍රකල්පයෙහිම උපන්සේක. සෙස්ස කී ක්‍රමයෙන් අවබෝධකටයුතු.

33. මහණෙනි, මෙසේ මේ ධර්‍මධාතු තොමෝ තථාගතයන්වහන්වහන්සේ විසින් මනාකොට ප්‍රතිවෙධ කරණලද්දී. ඒනම් ධර්‍මධාතුවක් තමා සර්‍වාකාරයෙන් ප්‍රතිවෙධකළබැවින් තථාගතතෙමේ පරිනිර්‍වාණයට පැමිණියාවූ අර්හත් මාර්ගඥාන නැමති කඩුවෙන් සිඳිනලද තෘෂ්ණාමාණ දෘෂ්ටිප්‍රපඤ්චඇති සිඳිනලද කුශලාකුශල කර්‍ම වර්‍ත්ත ඇති වනසනලද සකල කර්‍මාවෘත ඇති සකලවිපාකාවර්‍ත්තසඞ්ඛ්‍යාත දුඃඛස්කන්ධය ඉක්ම පැවැත්තාවූ අතීත බුද්ධවරයන් ජාතිවශයෙන් සිහිකෙරේද, ආයුප්‍රමාණවශයෙන් සිහිකෙරේද, ශ්‍රාවකයුග්මවශයෙන් සිහිකෙරේද, ශ්‍රාවක සන්නිපාතවශයෙනුත් සිහිකෙරේද, ඒ ධර්‍මධාතුවයි. කෙසේ සිහිකෙරේදයත්, ඒ භාග්‍යවතුවහන්සේලා මෙබඳු ජාතිඇත්තෝවූහයිද මෙබඳුනම් ඇත්තෝවූහයිද, මෙබඳු ගොත්ඇත්තෝවූහයිද මෙබඳු සීලඇත්තෝවූහයිද, මෙබඳු ධර්‍ම ඇත්තෝවූහයිද, මෙබඳු ප්‍රඥාඇත්තෝවූහයිද, මෙබඳු විහරණඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන්වහන්සේලා මෙබඳු විමුක්ති ඇත්තෝවූහයි කියායි. භාග්‍යවතුන්වහන්සේ පූර්‍වෙනිවාස ප්‍රතිසංයුක්තවූ මෙම ධර්‍මදේශනාව වදාළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේගේ මේ ධර්‍මය භාෂිතය සතුටින් පිළිගත්හ.

**තුදුස්වෙනිවූ මහාපදානසූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව**
**මෙතෙකින් නිමියේයි.**

## මහානිදාන සුත්තං.

—෴—

1. එවමෙමසුතං. එකං සමයං භගවා කුරූසු විහරති, කම්මාසස ධම්මංනාම කුරූනංනිගමො. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච, අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ යාව ගම්භීරො චායං භන්තෙ පටිච්චසමුප්පාදො ගම්භීරාවභාසො ච. අථච පන මෙ උත්තානකුත්තානකො විය ඛායතීති. මාහෙවං ආනන්ද අවච, මාහෙවං ආනන්ද අවච. ගම්භීරොචායං ආනන්ද. පටිච්චසමුප්පාදො ගම්භීරාවභාසො ච.

## මහානිදාන සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යා.

——෴෴——

1. මේ සූත්‍රධර්මය මාවිසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ කුරුදනව්හි කම්මාසදම්‍යනම්වූ කුරුදනව් වැස්සන්ගේ නියම්ගමක් වීද, එහි වාසයකරණසේක. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතනට එළඹියේය, එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. ස්වාමීන්වහන්ස, මේ පටිච්චසමුප්පාදය පමණ ඉක්මවා ගැඹුරු වේද හෙවත් ඉතා ගැඹුරු වේද, ගැඹුරුදක්නාම් ඇත්තේත් වේද ස්වාමීන්වහන්ස, මේ කාරණය ආශ්චර්‍ය්‍යයි. ස්වාමීන්වහන්ස, මේ කාරණය අද්භුතයි. එසේනමුත් මට ඉතා ප්‍රකටවූවක්මෙන් හෙවත් ඉතා පහසුකාරණයෙක් මෙන් වැටහේයයි සැලකළේය. ආනන්දය, මෙසේ නොකියව. ආනන්දය, මෙසේ නොකියව. ආනන්දය, මේ පටිච්චසමුප්පාදයතෙම ගැඹුරුද වෙයි. ගැඹුරුදක්නාම් ඇත්තේද වෙයි.

එතස්ස ආනන්ද ධම්මස්ස අනනුබොධා අප්පටිවෙධා එව මයං පජා තන්තාකුලකජාතා ගුලාගුණ්ඨිකජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති.

2. අත්ථි ඉදප්පච්චයා ජරාමරණන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථීතිස්සවචනීයං. කිම්පච්චයා ජරාමරණන්ති ඉති චෙ වදෙය්‍ය, ජාතිපච්චයා ජරාමරණන්ති ඉච්චස්සවචනීයං. අත්ථි ඉදප්පච්චයා ජාතීති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථීති'ස්ස වචනීයං. කිම්පච්චයා ජාතීති. ඉති චෙ වදෙය්‍ය, භවපච්චයා ජාතීති ඉච්චස්ස වචනීයං.

---

ආනන්දය, මේ ප්‍රතීත්‍යසමුත්පාදධර්මය තමා ඥාතපරිඥාත වශයෙන් අවබොධනොකිරීම හෙතුකොටගෙණ තීරණප්‍රහාණ වශයෙන් ප්‍රතිවෙධනොකිරීම හෙතුකොටගෙණ මෙසේ මේ ප්‍රජාතොමෝ පිළිවියන්නන්ගේ හුයක්මෙන් අවුල්වූවා දෙසැටදෘෂ්ටීන්ගේ වශයෙන් හටගත් ගැටබැඳුම් ඇත්ති එහෙයින්ම මුදුතණ හා බබුස්තණ මෙන් දික්වූවා හෙවත් මිථ්‍යාලබ්ධීන්ගේ .වශයෙන් හටගත් අවුල් ඇත්ති අයසඩ්ඛ්‍යාත සැපයෙන්පහවූ හෙයින් අපායනම්වූ නපුරුගති ඇත්තාවූ විවශවපතිතවීම් ඇත්තාවූ සසරනොයික්මවයි. (මෙසේ ඇතිකල්හි චුතියෙන් පසු ප්‍රතිසන්ධියද ප්‍රතිසන්ධියෙන් චුතියදැයි මෙසේ නැවත නැවත චුතිප්‍රතිසන්ධි ගණ්‍හුලබන්නාහු භවත්‍රයෙහිද චතුර්විධ යොනියෙහිද පඤ්චගතියෙහිද සප්තවිඥානස්ථිතියෙහිද නව සත්තාවාසයෙහිද මහාසමුද්‍රයෙහි වාතයෙන් පහරණලද නැවක් මෙන්ද යන්ත්‍රයෙහි යොදනලද ගොනෙක් මෙන්ද සර්වප්‍රකාරයෙන් භ්‍රමණය කෙරේමය.)

2. ආනන්දය, මෙය ප්‍රත්‍යයකොටගෙණ යම්කාරණයක් හෙතුකොටගෙණ ජරාව හා මරණය වේනම් ඒ ප්‍රත්‍යය කිමෙක ඇත්තේදැයි මෙසේ විචාරණලද්දවූ ප්‍රාඥපුද්ගලයාවිසින් ඒකාන්තයෙන් ඇත්තේමයයි ඕහට කියයුතුයි. යමක් හෙතුකොටගෙණ ජරාමරණ දෙක වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් ජාතිය ප්‍රත්‍යය කොටගෙණ ජරාමරණ දෙක වේයයි ඕහට මෙසේ කියයුතු. ආනන්දය, යමක් ප්‍රත්‍යයකොටගෙණ ජාතියවේනම් ඒ ප්‍රත්‍යය කිමෙක ඇත්තේදැයි මෙසේ විචාරණලද්දවූ ප්‍රාඥපුද්ගලයාවිසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය ඇත්තේමයයි ඕහට මෙසේ කියයුතු. යමක් ප්‍රත්‍යයකොටගෙණ ජාතිය වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් භවය ප්‍රත්‍යකොටගෙණ ජාතිය වේයයි ඕහට මෙසේ කියයුතුයි.

අත්ථි ඉදප්පච්චයා භවොති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථීති'ස්ස වචනීයං. කිම්පච්චයා භවොති, ඉතිචෙ වදෙය්‍ය, උපාදානපච්චයා භවොති. ඉච්චස්ස වචනීයං. අත්ථි ඉදප්පච්චයා උපාදානන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථී'තිස්ස වචනීයං. කිම්පච්චයා උපාදානන්ති. ඉති චෙ වදෙය්‍ය, තණ්හාපච්චයා උපාදානන්ති. ඉච්චස්ස වචනීයං. අත්ථි ඉදප්පච්චයා තණ්හාති. ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථීතිස්ස වචනීයං. කිම්පච්චයා තණ්හාති ඉති චෙ වදෙය්‍ය, වෙදනාපච්චයා තණ්හාති ඉච්චස්ස වචනීයං. අත්ථි ඉදප්පච්චයා වෙදනාති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථීතිස්ස වචනීයං. කිම්පච්චයා වෙදනාති. ඉති චෙ වදෙය්‍ය, ඵස්සපච්චයා වෙදනාති ඉච්චස්ස වචනීයං. අත්ථි ඉදප්පච්චයා ඵස්සොති. ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථී'තිස්ස වචනීයං.

---

ආනන්දය, යමක් ප්‍රත්‍යයකොටගෙණ භවය වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ විචාරණලද්දාවූ ප්‍රාඥපුද්ගලයාවිසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය ඇත්තේමයයි කියයුතුයි. යමක් ප්‍රත්‍යයකොටගෙණ භවය වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් උපාදානය ප්‍රත්‍යයකොටගෙණ භවය වේයයි ඔහට මෙසේ කියයුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යයකොටගෙණ උපාදානය වේනම් ඒ ප්‍රත්‍යය ඇත්තේදැයි මෙසේ විචාරණලද්දාවූ ප්‍රාඥපුද්ගලයාවිසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය ඇත්තේමයයි ඔහට මෙසේ කියයුතුයි. යමක් ප්‍රත්‍යයකොටගෙණ උපාදානය වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් තෘෂ්ණාව ප්‍රත්‍යයකොටගෙණ උපාදානය වේයයි ඔහට මෙසේ කියයුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාව වේනම් ඒ ප්‍රත්‍යය කිමෙක ඇත්තේදැයි මෙසේ විචාරණලද්දාවූම ප්‍රාඥපුද්ගලයාවිසින් ඇත්තේමයයි ඔහට මෙසේ කියයුතු. යමක් ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාව වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් වෙදනාව ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාව වේයයි ඔහට මෙසේ කියයුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යයකොටගෙණ වෙදනාව වේනම් ඒ ප්‍රත්‍යය කිමෙක ඇත්තේදැයි මෙසේ වදාරණලද්දාවූම ප්‍රාඥපුද්ගලයාවිසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය ඇත්තේමයයි ඔහට මෙසේ කියයුතුයි. යමක් ප්‍රත්‍යයකොටගෙණ වෙදනාව වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් ස්පර්ශය ප්‍රත්‍යයකොටගෙණ වෙදනාව වේයයි ඔහට මෙසේ කියයුතු. ආනන්දය, යමක් ප්‍රත්‍යයකොටගෙණ ස්පර්ශය වේනම් ඒ ප්‍රත්‍යය කිමෙක ඇත්තේදැයි මෙසේ විචාරණලද්දාවූම ප්‍රාඥපුද්ගලයාවිසින් ඒකාන්තයෙන් ඒ ප්‍රත්‍යය ඇත්තේමයයි ඔහට මෙසේ කියයුතුයි.

කිම්පච්චයා ඵස්සොති. ඉති චෙ වදෙය්‍ය, නාමරූපපච්චයා ඵස්සොති ඉච්චස්ස වචනීයං. අත්‍ථි ඉදප්පච්චයා නාමරූපන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්‍ථී'තිස්ස වචනීයං. කිම්පච්චයා නාමරූපන්ති ඉති චෙ වදෙය්‍ය, විඤ්ඤාණපච්චයා නාමරූපන්ති ඉච්චස්ස වචනීයං. අත්‍ථි ඉදප්පච්චයා විඤ්ඤාණන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්‍ථී'තිස්ස වචනීයං. කිම්පච්චයා විඤ්ඤාණන්ති ඉති චෙ වදෙය්‍ය, නාමරූපපච්චයා විඤ්ඤාණන්ති ඉච්චස්ස වචනීයං.

3. ඉති ඛො ආනන්ද නාමරූපපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං.

---

යමක් ප්‍රත්‍යයකොටගෙණ ස්පර්ශය වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් නාමරූපදෙක ප්‍රත්‍යයකොටගෙණ ස්පර්ශය වේයයි ඔබට මෙසේකියයුතු. ආනන්දය, යමක් ප්‍රත්‍යයකොටගෙණ නාමරූපදෙක වේනම් ඒප්‍රත්‍යය කිමෙක ඇත්තේදැයි මෙසේ විචාරණලද්දාවූම ප්‍රාඥපුද්ගලයාවිසින් ඒකාන්තයෙන් ඒප්‍රත්‍යය ඇත්තේමයයි ඔබට මෙසේ කියයුතු. යමක්ප්‍රත්‍යයකොටගෙණ නාමරූපදෙකවේනම් ඒප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් විඥානය ප්‍රත්‍යයකොටගෙණ නාමරූප දෙක වේයයි ඔබට මෙසේ කියයුතුයි. ආනන්දය, යමක් ප්‍රත්‍යය කොටගෙණ විඥානය වේනම් ඒ ප්‍රත්‍යය කිමෙක ඇත්තේදැයි මෙසේ විචාරණලද්දාවූම ප්‍රාඥපුද්ගලයාවිසින් ඒ ප්‍රත්‍යය ඇත්තේමයයි ඔබට මෙසේ කියයුතු. යමක් ප්‍රත්‍යයකොටගෙණ විඥානය වේනම් ඒ ප්‍රත්‍යය කවරේදැයි මෙසේ කියන්නේනම් නාමරූප දෙක ප්‍රත්‍යය කොටගෙණ විඥානය වේයයි, මෙසේ ඔබට කියයුතු.

3. ආනන්දය, මෙසේ ඇතිකල්හි නාමරූපදෙක ප්‍රත්‍යයකොටගෙණ විඥානයවෙයි, විඥානය ප්‍රත්‍යයකොටගෙණ නාමරූපදෙකවෙයි, නාමරූප ප්‍රත්‍යයකොටගෙණ ස්පර්ශයවෙයි, ස්පර්ශය ප්‍රත්‍යයකොටගෙණ වේදනාවවෙයි, වේදනාව ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාවවෙයි, තෘෂ්ණාව ප්‍රත්‍යයකොටගෙණ උපාදානයවෙයි, උපාදානය ප්‍රත්‍යයකොටගෙණ භවය වෙයි, භවය ප්‍රත්‍යයකොටගෙණ ජාතියවෙයි, ජාතිය ප්‍රත්‍යයකොටගෙණ ජරාව හා මරණයවෙයි.

ජරාමරණපච්චයා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

4. ජාතිපච්චයා ජරාමරණන්ති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථාජාතිපච්චයා ජරාමරණං. ජාතිචහි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සෙය්‍යථීදං දෙවානං වා දෙවත්තාය, ගන්ධබ්බානං වා ගන්ධබ්බත්තාය, යක්ඛානං වා යක්ඛත්තාය, භූතානං වා භූතත්තාය, මනුස්සානං වා මනුස්සත්තාය, චතුප්පදානං වා චතුප්පදත්තාය, පක්ඛීනං වා පක්ඛිත්තාය සිරිංසපානංවා සිරිංසපත්තාය, තෙසං තෙසඤ්චහි ආනන්ද සත්තානං තථත්තාය ජාතිනාභවිස්ස.

---

ජරාමරණ දෙක ප්‍රත්‍යයකොටගෙණ ශෝකකිරීමය වැලපීමය කායික දුක්ය, දොම්නස්ය දැඩිආයාසය යනමොව්හු පහලවෙත්. මෙසේ මේ සියලු දුක්රාශිහුගේ පහලවීමවේ.

4. ආනන්දය, ජාතිය ප්‍රත්‍යයකොටගෙණ ජරාමරණදෙකවේය මෙසේ මෙය කියනලද්දේය. ඒ හේතුඵල දෙදෙනාගේ සම්බන්ධතාවයවූ මෙය යම්සේ ජාතිය ප්‍රත්‍යයකොටගෙණ ජරාමරණ දෙකවේ මේකාරණයෙන්ම දතයුතු. ආනන්දය ජාතිතොමෝ දෙවත්වාදි සජීස්වභාවයෙන්හා එහිදු චාතුර්මහාරාජිකාදි සජීකාරයෙන් ඉදින් නොවන්නීනම් දෙවාදීන් අතුරෙන් යම්කිසිවෙකු සම්බන්ධව කාමභවාදීනව භවයන් අතුරෙන් යම්කිසි භවයෙක්හි ඒනම්, උත්පත්ති දෙව්යන්ගේ දෙවභාවය පිණිස හෙවත් ස්කන්ධයන්ගේ පහලවීම පිණිස හෝ ගන්ධර්වයන්ගේ ගන්ධර්වභාවය පිණිස හෙවත්, ස්කන්ධයන්ගේ පහලවීම පිණිසහෝ යක්ෂයන්ගේ යක්ෂභාවය පිණිස හෝ අවශෙෂභූතයන්ගේ භූතභාවය පිණිස හෝ, මනුෂ්‍යයන්ගේ මනුෂ්‍යභාවයපිණිස හෙවත්, ස්කන්ධයන්ගේ පහලවීම පිණිසහෝ, චතුෂ්පදීන්ගේ චතුෂ්පාද භාවයපිණිස හෝ, පක්ෂීන්ගේ පක්ෂීභාවය පිණිස හෝ, දීර්ඝජාතීන්ගේ දීර්ඝජාතිභාවය පිණිස හෝ, ආනන්දය, ඒ ඒ දෙවගන්ධර්වාදි සත්වයන්ගේම දෙවගන්ධර්වාදීභාවය පිණිස ජාතිතොමෝ නොවන්නේය. (යථා ස්වරූපවූ ස්කන්ධයන් පවත්නාකල්හි දෙවයක්ෂගන්ධර්වාදීන්ගේ වශයෙන්) ලෝක ව්‍යවහාරයවේ.

සබ්බසො ජාතියා අසති ජාතිනිරොධා අපිනුඛො ජරාමරණං පඤ්ඤායෙථාති. නොහෙතං භන්තෙ. තස්මාතිහානන්ද එසෙ ව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො ජරාමරණස්ස, යදිදං ජාති.

5. භවපච්චයාජාතීති ඉතිඛොපනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථාභවපච්චයා ජාති. භවොවහි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සෙය්‍යථිදං කාමභවො රූපභවො අරූපභවො වා, සබ්බසො භවෙ අසති භවනිරොධා අපිනුඛො ජාති පඤ්ඤායෙථාති. නොහෙතං භන්තෙ. තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො ජාතියා, යදිදං භවො.

6. උපාදානපච්චයා භවොති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා උපාදානපච්චයා භවො.

---

සර්වප්‍රකාරයෙන් උත්පත්තියනැතිකල්හි ජාතිනිරොධයහෙතුකොටගෙණ ජරාමරණයන්ගේ නිරොධය කිමෙක්දපෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමින්වහන්ස, මේකාරණය නොවේමය හෙවත් ජාති නිරොධය වූයේනම් ජරාමරණ නොපෙණෙත්මයයි සැලකලේය. ආනන්දය, එහෙයින්, මෙසේ මේහෙතුඵල ධර්මවිෂයෙහි යම් මේජාතියක්වේද ජරාමරණදෙක ලැබීමට මේ උත්පත්තිතොමෝම හෙතුවෙයි, මේඉපදීමට මුල්කාරණයවෙයි, මේ ඉපදීමට සමුදය ධර්මයවේ හෙවත් ජරාමරණ උපදවන්නේයයි වදාලේය.

5. භවය ප්‍රත්‍යයකොටගෙණ ජාතියවේයයි මෙසේ මෙයකියනලදී ආනන්දය, ඒ මේකාරණයද යම්සේ ප්‍රත්‍යයකොටගෙණ ජාතිය වේද මේ කාරණයෙන් දතයුතුයි. ආනන්දය, ඉදින් භවයතෙමේ සර්වස්වභාවයෙන්හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසි භවයෙක්හි ඒනම් කාමභවය, රූපභවය, අරූපභවය, යනුවෙන් නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් භවය නැතිකල්හි භවනිරොධය හෙතුකොටගෙණ කිමෙක්ද ජාතිය පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමින්වහන්ස, මේකාරණය නොවේමය. ආනන්දය, එහෙයින් මෙහි ජාතිය හෙතුකොටගෙණ යම් භවයක් වේනම් මේ ජාතිතොමෝම ඊට හෙතුවයි මේ ඉපදීමට මූලකාරණාවෙයි, මේ ඉපදීමට සමුදය ධර්මයවේයයි වදාලෝ.

6. උපාදානය ප්‍රත්‍යයකොටගෙණ භවයවේයයි මෙසේ මෙයකියනලදී. ආනන්දය, යම්සේ උපාදානය ප්‍රත්‍යයකොටගෙණ භවය වේද ඒ මේකාරණයද මේකාරණයෙන් දතයුතුයි.

උපාදානංවහිආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සෙය්‍යථීදං කාමූපාදානං වා දිට්ඨූපාදානං වා සීලබ්බතූපාදානං වා අත්තවාදූපාදානං වා,සබ්බසො උපාදානෙ අසති උපාදානනිරොධා අපිනුඛො භවො පඤ්ඤායෙථා'ති. නොහෙතං භන්තෙ. තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො භවස්ස, යදිදං උපාදානං.

7. තණ්හාපච්චයා උපාදානන්ති, ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා තණ්හා පච්චයා උපාදානං. තණ්හාවහි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සෙය්‍යථීදං රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා පොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා, සබ්බසො තණ්හාය අසති තණ්හානිරොධා අපිනුඛො උපාදානං පඤ්ඤායෙථා'ති. නොහෙතං භන්තෙ.

---

ආනන්දය, සර්වස්වභාවයෙන්හා සර්වාකාරයෙන් උපාදානය කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඒනම් කාමූපාදානය,දෘෂ්ට්‍යුපාදානය,සීලව්‍රතූපාදානය,ආත්මවාදූපාදානය,කියාහෝ උපාදානය නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් උපාදානය නැතිකල්හි උපාදාන නිරොධය හෙතුකොටගෙණ කිමෙක්ද භවය පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, මේකාරණය නොවේ, හෙවත් උපාදාන නිරොධය වූවහොත් භවය නොවේමයයි සැලකළෝ. ආනන්දය, එහෙයින් මෙසේ මෙහි යම් මේ උපාදානයක්වේද භවයලැබීමට මෙයම හෙතුවවෙයි, මෙයම මූල කාරණා වෙයි. මෙසම සමුදය ධර්මයවෙයි, මෙයම ප්‍රත්‍යයවේයයි වදාළෝ.

7, තෘෂ්ණාව ප්‍රත්‍යයකොටගෙණ උපාදානය වේයයි මෙසේ මෙය කියනලදී. ආනන්දය, යම්සේ තෘෂ්ණාව ප්‍රත්‍යයකොටගෙණ උපාදානය වේද,ඒ මේ ධර්මයද මේ කාරණයෙන් දතයුතුයි.ආනන්දය,සර්වස්වභාවයෙන් හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඒනම් රූපාරම්මණයන් පිළිබඳ තෘෂ්ණාය, ශබ්දාරම්මණයන් පිළිබඳ තෘෂ්ණාය, ගන්ධාරම්මණයන් පිළිබඳ තෘෂ්ණාය, රසාරම්මණයන් පිළිබඳ තෘෂ්ණාය, ස්ප්‍රෂ්ටව්‍යයන් පිළිබඳ තෘෂ්ණාය, ධර්මාරම්මණයන් පිළිබඳ තෘෂ්ණාය, යනුවෙන් තෘෂ්ණාව නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාව නැතිකල්හි තෘෂ්ණා නිරොධය හෙතුකොටගෙණ කිමෙක්ද උපාදානය පෙණෙන්නේදැයි විචාලසේක, ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළෝය.

තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො උපාදානස්ස, යදිදං තණ්හා,

8. වෙදනාපච්චයා තණ්හාති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනා පෙතං පරියායෙන වෙදිතබ්බං යථා වෙදනාපච්චයා තණ්හා වෙදනාවහි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සෙය්‍යථිදං චක්ඛුසම්ඵස්සජා වෙදනා, සොතසම්ඵස්සජා වෙදනා ඝානසම්ඵස්සජා වෙදනා ජිව්හාසම්ඵස්සජා වෙදනා කායසම්ඵස්සජා වෙදනා මනොසම්ඵස්සජා වෙදනා, සබ්බසො වෙදනාය අසති වෙදනානිරොධා අපිනුඛො තණ්හා පඤ්ඤායෙථාති. නොහෙතං භන්තෙ. තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො, තණ්හාය, යදිදං වෙදනා.

9. ඉති ඛො ආනන්ද වෙදනං පටිච්ච තණ්හා, තණ්හං පටිච්ච පරියෙසනා, පරියෙසනං පටිච්ච ලාභො.

---

ආනන්දය, එහෙයින් මෙසේ මෙහි යම් මේතෘෂ්ණාවක් වේද, උපාදානයට මෙයම හෙතුවවේ. මෙයම මූලකාරණයවේ. මෙයම සමුදය ධර්‍මය වේ. මෙයම ප්‍රත්‍යයවේයයි වදාළෝ.

8. වේදනාව ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාව වේයයි මෙසේ මෙය කියනලදි. ආනන්දය, යම්සේ වෙදනාව ප්‍රත්‍යයකොටගෙණ තෘෂ්ණාව වේද, ඒ මේ ධර්‍මය මේ කාරණයෙන් දතයුතුයි. ආනන්දය, සර්‍ව්ව සවභාවෙන් හා සර්‍ව්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි එනම්, චක්‍ෂුඃස්පර්‍ශයෙන් හටගත් වෙදනාය, ශ්‍රොත්‍රස්පර්‍ශයෙන් හටගත් වෙදනාය, ඝ්‍රාණස්පර්‍ශයෙන් හටගත් වෙදනාය, ජිහ්වාස්පර්‍ශයෙන් හටගත් වෙදනාය, කායස්පර්‍ශයෙන් හටගත් වෙදනාය, මනස්පර්‍ශයෙන් හටගත් වෙදනායයි වෙදනාව ඉදින් නොවන්නේනම් සර්‍ව්වප්‍රකාරයෙන් වෙදනාව නැතිකල්හි වෙදනා නිරොධය හෙතුකොටගෙණ කිමෙක්ද, තෘෂ්ණාව පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස මේ කාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, එහෙයින් මෙහි යම් මේ වෙදනාවක්වේද, තෘෂ්ණාලාභයපිණිස මෝතොමෝම හෙතුව වෙයි. මෙයම මූලකාරණය වෙයි. මෙයම සමුදය ධර්‍මය වෙයි. මෙයම ප්‍රත්‍යය වේයයි වදාළෝ.

9. ආනන්දය, මෙසේ ඇතිකල්හි වෙදනාවනිසා එසනම්සිත යන විප්‍රකාර තෘෂ්ණාව වේ. තෘෂ්ණාවනිසා හෙවත් තෘෂ්ණාව ඇතිකල්හි රූපාදි අරමුණුසෙවීම ඇතිවන්නේය. පර්‍ය්‍යෙෂනය ඇතිකල්හි රූපාදි අරමුණු ලැබීමවේ.

ලාභං පටිච්ච විනිච්ඡයො, විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො, ඡන්දරාගං පටිච්ච අජ්ඣොසානං, අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛො, ආරක්ඛාදිකරණං දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්ගහ විවාද තුවංතුව පෙසුඤ්ඤ මුසාවාදා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.

10. ආරක්ඛාධිකරණං දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්ගහ විවාද තුවංතුව පෙසුඤ්ඤ මුසාවාදා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. ඉති ඛො පනෙතං වුත්තං තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං, යථා ආරක්ඛාධිකරණං දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්ගහ විවාද තුවංතුව පෙසුඤ්ඤ මුසාවාදා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.

---

ලාභය ඇතිකල්හි ඉෂ්ටානිෂ්ටාදිවශයෙන් විනිශ්චය වෙයි. විනිශ්චය ඇතිකල්හි විතර්කණයකරණලද වස්තුව නිමිතිකොට ගෙණ ඡන්දරාගය හෙවත් දුබලවූ රාගයඋපදී. ඡන්දරාගය ඇතිකල්හි මමය මාගේය යනාදිවශයෙන් සම්පූර්ණ නිෂ්ඨානයට පැමිණීම වෙයි. සන්නිෂ්ඨානය ඇතිකල්හි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් දැඩිකොට ගැණීම වෙයි. පරිග්‍රහය ඇතිකල්හි මේ ආශ්චර්‍ය්‍යය අනිකෙකුට නොවේවායි පැවති මසුරුබව වේ, මාත්සර්‍ය්‍යය ඇතිකල්හි ආරක්ෂාසංවිධානය වේ. ආරක්ෂාසංවිධානය ඇතිකල්හි දඬුගැන්මය, ශස්ත්‍රගැන්මය, කය වචන දෙක පිළිබඳ කලහය, විග්‍රහසංඛ්‍යාත ප්‍රථම විරොධය, පශ්චිමවූ විරුද්ධවාදසංඛ්‍යාත විවාදය, තෝ තා යනාදින් ප්‍රියසූන්‍ය වචන කීමය, බොරුබස් කීමය, යනාදි නානාවිධ ලාමක අකුශල ධර්‍මයෝ පහලවෙත්.

10. ආරක්ෂාසංවිධානය කරණකොටගෙණ දඬුගැන්මය, ශස්ත්‍රගැන්මය, කලහය, විග්‍රහය, විවාදය, තෝ තා යනාදීන් ප්‍රියසූන්‍ය වචන කීමය, බොරුබස් කීමය යනාදිවූ නානාවිධ ලාමක අකුශල ධර්‍මයෝ පහලවෙත්යයි මෙසේ මෙය වදාරණලදී. ආනන්දය, ඒ මේ ධර්‍මයද යම්සේ ආරක්ෂාසංවිධානය කාරණකොටගෙණ දඬුගැන්මය, ශස්ත්‍රගැන්මය, කලහය, විග්‍රහයවිවාදය, තෝ තා යනුවෙන් පැවති ප්‍රියසූන්‍ය වචනය, මුසාවාදය යනාදි නානාවිධ ලාමකඅකුශලධර්‍මයෝ පහලවෙත් යන මේ කාරණයෙන් දතයුතුයි.

ආරක්‍ඛො ‘වහි ආනන්‍ද නාභවිස්‍ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්‍සචි කිම්හිචි, සබ්බසො ආරක්‍ඛෙ අසති ආරක්‍ඛනිරො ධාපි අපිනුඛො දණ්ඩාදාන සත්‍ථාදාන කලහ විග්‍ගහ විවාද තුවං තුව පෙසුඤ්ඤ මුසාවාදා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවෙය්‍යුන්ති. නො’හෙතං භන්‍තෙ. තස්මා තිහානන්‍ද එසෙ’ව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො දණ්ඩාදාන සත්‍ථාදාන කලහ විග්‍ගහ විවාද තුවංතුව පෙසුඤ්ඤ මුසාවාදානං අනෙකෙසං පාපකානං අකුසලානං ධම්මානං සම්භවාය, යදිදං ආරක්‍ඛො.

11. මච්ඡරියං පටිච්ච ආරක්‍ඛො’ති ඉති ඛො පනෙතං වුත්‍තං තද නන්‍ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං, යථා මච්ඡරියං පටිච්ච ආරක්‍ඛො, මච්ඡරියං’වහි ආනන්‍ද නාභවිස්‍ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්‍සචි කිම්හිචි, සබ්බසො මච්ඡරියෙ අසති මච්ඡරිය නිරොධා අපිනුඛො ආරක්‍ඛො පඤ්ඤායෙථාති. නො හෙතං භන්‍තෙ.

---

ආනන්දය, සර්වස්වභාවයෙන් හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ආරක්‍ෂාව ඉදින් නොවන්නේනම් සර්වප්‍රකාර යෙන් ආරක්‍ෂාව නැතිකල්හිආරක්‍ෂා නිරොධය හෙතුකොටගෙණ දඬු ගැන්මය, ශස්ත්‍රගැන්මය, කලහය, විග්‍රහය, විවාදය, තෝ තා යනා දීන් පැවති ප්‍රියසුන්‍ය වචනය, මුසාවාදය යනාදි නානාවිධ ලාමක අකුශලධර්මයෝ කිමෙක පහලවන්නාහුදැයි විචාලසේක. ස්වාමින්ව හන්ස,මේ කාරණය නොවේමය. ආනන්දය,එහෙයින් මෙහි යම් මේ ආරක්‍ෂාවක්වේනම් මෙතෙමේ දඬුගැන්මය, ශස්ත්‍රගැන්මය, කලහය, විග්‍රහය, විවාදය, තෝ තා යනාදීන් පැවති ප්‍රියසුන්‍ය වචනය, මුසා වාදය යන නානාවිධ ලාමක අකුශලධර්මයන්ගේ පහලවීමපිණිස හෙතුව වේ. මෙයම මූලකාරණය වේ. මෙයම සමුදය ධර්මය වේ. මෙ යම ප්‍රත්‍යය වේයයි වදාළෝ.

11. මාත්සර්‍ය්‍යයනිසා ආරක්‍ෂාව වේයයි මෙසේ මෙය වදාරණලදී. ආනන්දය, යම්සේ මාත්සර්‍ය්‍යයනිසා ආරක්‍ෂාව වේද, ඒ ධර්මයද මේ කාරණයෙන් දතයුතුයි. ආනන්දය, සර්වස්වභාවයෙන් හා සර්වාකාර යෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි මාශ්චර්‍ය්‍යය ඉදින් නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් මාශ්චර්‍ය්‍යය නැතිකල්හි මාශ් චර්‍ය්‍යය නිරොධය හෙතුකොටගෙණ ආරක්‍ෂාව කිමෙක පෙණෙන්නේ දැයි විචාලසේක.ස්වාමින්වහන්ස,මේකාරණය නොවේමයයි වදාළෝ.

තස්මා තිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො ආරක්ඛස්ස, යදිදං මච්ඡරියං.

12. පරිග්ගහං පටිච්ච මච්ඡරියන්ති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං, යථා පරිග්ගහං පටිච්ච මච්ඡරියං. පරිග්ගහො'ව හි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සබ්බසො පරිග්ගහෙ අසති පරිග්ගහනිරොධා අපිනු ඛො මච්ඡරියං පඤ්ඤායෙථා'ති. නො හෙතං භන්තෙ. තස්මාතිහානන්ද එසෙ'ව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො මච්ඡරියස්ස, යදිදං පරිග්ගහො.

13. අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො'ති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං. යථා අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො. අජ්ඣොසානං'ව හි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි,කිම්හිචි සබ්බසො අජ්ඣොසානෙ අසති අජ්ඣොසානනිරොධා අපිනු ඛො පරිග්ගහො පඤ්ඤායෙථාති.

---

ආනන්දය, එහෙයින් ආරක්ෂාවට යම් මේ මාශ්චර්ය්‍යයක් වේනම් මෙතෙමේම හෙතුවවෙයි. මෙයම මූලකාරණා වෙයි. මෙයම සමුදය ධර්මයවෙයි. මෙයම ප්‍රත්‍යය වේයයි වදාළෝ.

12. පරිග්‍රහණයනිසා මාශ්චර්ය්‍ය වේයයි මෙසේ මෙය වදාරණලදී. ආනන්දය, යම්සේ පරිග්‍රහණයනිසා මාත්සර්ය්‍ය වේද, ඒ මේ ධර්මය මේ කාරණයෙන් දතයුතුයි. ආනන්දය, සර්වස්වභාවයෙන් හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඉදින් පරිග්‍රහණයක් නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් පරිග්‍රහය නැතිකල්හි පරිග්‍රහනිරොධය හෙතුකොටගෙණ කිමෙක මාශ්චර්ය්‍ය පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමින්වහන්ස, මේ කාරණය නොවේමයයි සැල කළෝය ආනන්දය, එහෙයින් මෙහි මාශ්චර්ය්‍යයට යම් මේ පරිග්‍රහයක් වේනම් මෙතෙමේම හෙතුව වෙයි. මෙයම මූලකාරණා වෙයි. මෙයම සමුදයධර්මය වේ. මෙතෙමේම ප්‍රත්‍යයවේයයි වදාළෝ.

13. අධ්‍යවසානයයි කියූ සන්නිඨානයනිසා තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් දැඩිකොටගැන්ම වේයයි මෙසේ මෙය වදාරණලදී. ආනන්දය, යම්සේ සන්නිඨානයනිසා පරිග්‍රහය වේ. ඒ මේ ධර්මයද මේ කාරණයෙන් දතයුතුයි. ආනන්දය, සර්වස්වභාවයෙන් හා සර්වකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඉදින් නිෂ්ඨාවට පැමිණීම නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් නිෂ්ඨාවට පැමිණීම නැතිකල්හි අධ්‍යවසානනිරොධය හෙතුකොටගෙණ තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් දැඩිකොටගැණීම කිමෙක පෙණෙන්නේදැයි විචාළසේක.

නොහෙතං භන්තෙ. තස්මා'තිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො පරිග්ගහස්ස, යදිදං අජ්ඣොසානං.

14. ඡන්දරාගං පටිච්ච අජ්ඣොසාන'න්ති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං, යථා ඡන්දරාගං පටිච්ච අජ්ඣොසානං ඡන්දරාගො'වහි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සබ්බසො ඡන්දරාගෙ අසති ඡන්දරාග නිරොධා අපිනුඛො අජ්ඣොසානං පඤ්ඤායෙථා'ති. නො හෙතං භන්තෙ. තස්මා'තිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො අජ්ඣොසානස්ස, යදිදං ඡන්දරාගො.

15. විනිච්ඡයං පටිච්ච ඡන්දරාගොති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං. යථා විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො.

---

ස්වාමීන්වහන්ස, මේ කාරණය මෙසේ නොවේමය. ආනන්දය, එහෙයින් මෙහි තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් දැඩිකොටගැන්මට අධ්‍යවසානය යනයමක් වේනම් මෙයම හෙතුව වේ. මෙයම මූලකාරණා වේ. මෙයම සමුදයධර්මය වේ, මෙයම ප්‍රත්‍යයවේයයි වදාළෝ.

14. දුර්වලවූ රාගයනිසා නිශ්ඨාවට පැමිණීම වේයයි මෙසේ මෙය වදාරණලදි. ආනන්දය, යම්සේ ඡන්දරාගයනිසා සන්නිඪානය වේද, ඒ මේ ධර්මයද මේකාරණයෙන් දතයුතුයි. ආනන්දය, සර්වස්වභාවයෙන් හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඉදින් දුර්වලරාගය නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් ඡන්දරාගය නැතිකල්හි ඡන්දරාග නිරොධය හෙතුකොටගෙණ කිමෙක්ද සන්නිඪානය පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, එහෙයින් අධ්‍යවසානසඞ්ඛ්‍යාත සන්නිඪානයට යම් මේ ඡන්දරාගයක් වේනම් මෙතෙමම හෙතුවෙයි. මෙයම මූලකාරණා වෙයි. මෙයම සමුදයධර්මය වෙයි. මෙයම ප්‍රත්‍යය වේයයි වදාළෝ.

15. විනිශ්චයනිසා ඡන්දරාගය වේයයි මෙසේ මෙය වදාරණලදී. ආනන්දය, යම්සේ විනිශ්චයනිසා ඡන්දරාගය වේද, ඒ මේ ධර්මයද මේ කාරණයෙන් දතයුතුයි.

විනිච්ඡයො'ව හි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි සබ්බසො විනිච්ඡයෙ අසති විනිච්ඡය නිරොධා අපිනු ඛො ඡන්දරාගො පඤ්ඤායෙථා'ති නො හෙතං භන්තෙ. තස්මා'තිහානන්ද එසෙ'ව හෙතු එතං නිදානං එස සමුදයො එසපච්චයො ඡන්දරාගස්ස, යදිදං විනිච්ඡයො.

16. ලාභං පටිච්ච විනිච්ඡයොති ඉතිඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනා පෙතං පරියායෙන වෙදිතබ්බං, යථාලාභං පටිච්ච විනිච්ඡයො. ලාභො'ව හි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සබ්බසො ලාභෙ අසති ලාභනිරොධා අපිනුඛො විනිච්ඡයො පඤ්ඤායෙථා'ති. නොහෙතං භන්තෙ. තස්මා'තිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො විනිච්ඡයස්ස, යදිදං ලාභො.

17. පරියෙසනං පටිච්ච ලාභො'ති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනා පෙතං පරියායෙන වෙදිතබ්බං, යථා පරියෙසනං පටිච්ච ලාභො.

---

ආනන්දය, සර්වස්වභාවයෙන් හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඉදින් විනිශ්චයක් නොවේනම් සර්වප්‍රකාරයෙන් විනිශ්චය ඇතිකල්හි විනිශ්චයනිරොධය හෙතුකොටගෙණ කිමෙක්ද ඡන්දරාගය පෙණෙන්නේදැයි විචාලසේක, ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, එහෙයින් ඡන්දරාගයට යම් මේ විනිශ්චයක්වේනම් මෙතෙමේම හෙතුවෙයි. මෙයම මූලකාරණා වෙයි. මෙයම සමුදයධර්මය වෙයි. මෙයම ප්‍රත්‍යයවේයයි වදාළෝ.

16. ලාභයනිසා විනිශ්චය වේයයි මෙසේ මෙය වදාරණලදී. ආනන්දය, යම්සේ ලාභයනිසා විනිශ්චයවේද මෙසේමෙය මේකාරණයෙන්ද දතයුතුයි, ආනන්දය, සර්වස්වභාවයෙන් හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඉදින් ලාභයනොවේනම් සර්වප්‍රකාරයෙන් ලාභනිරොධය හෙතුකොටගෙණ කිමෙක විනිශ්චය පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, මේකාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, එහෙයින් විනිශ්චයට, යම් මේ ලාභයක් වේනම් මෙතෙමේම හෙතුවෙයි. මෙයම මූලකාරණාවෙයි මෙයමසමුදයධර්මය වෙයි. මෙයම ප්‍රත්‍යවේයයි වදාළෝ.

17. පර්යෙෂණය නිසා ලාභයවේයයි මෙසේ මෙය වදාරණලදී ආනන්දය, යම්සේ පර්යෙෂණය නිසා ලාභයවේද ඒ මේධර්මයද මේකාරණයෙන් දතයුතුයි.

පරියෙසනා’ වහි ආනන්ද නාහවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සබ්බසො පරියෙසනාය අසති පරියෙසනා නිරොධා අපිනු බො ලාභො පඤ්ඤායෙථා’ති. නො හෙතං භන්තෙ. තස්මා’තිහානන්ද එසෙ’ව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො ලාභස්ස, යදිදං පරියෙසනා.

18. තණ්හං පටිච්ච පරියෙසනා’ති ඉතිඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං, යථාතණ්හං පටිච්ච පරියෙසනා. තණ්හා’වහි ආනන්ද නාහවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සෙය්‍යථිදං, කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, සබ්බසො තණ්හාය අසති තණ්හානිරොධා අපිනුබො පරියෙසනා පඤ්ඤායෙථා’ති නොහෙතං භන්තෙ.තස්මා’තිහා නන්ද එසෙ’ව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො පරියෙසනාය, යදිදං තණ්හා.

---

ආනන්දය, සර්වසවභාවයෙන් හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඉදින්ලාභය නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් පර්යෙෂණාව නැතිකල්හි පර්යෙෂණා නිරොධය හෙතුකොටගෙණ කිමෙක ලාභය පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමින්වහන්ස, මේකාරණය නොවේමයයි සැලකළේය.ආනන්දය, එහෙයින් මෙහිලාභයටයම් මේ පර්යෙෂණාවක් වේනම් මෙයමහෙතුවෙයි, මෙයම මූලකාරණාවෙයි, මෙයම සමුදය ධර්මයවෙයි, මෙයම ප්‍රත්‍යයවේයයි වදාලෝ.

18. තෘෂ්ණාව නිසා සෙවීමවන්නේයයි මෙසේ මෙය වදාරණලදී, ආනන්දය, ඒ මේ ධර්මයද යම්සේ තෘෂ්ණාවනිසා පර්යෙෂණාව වේද, මේකාරණයෙන් දතයුතුයි. ආනන්දය, සර්වසවභාවයෙන්හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි කාමතෘෂ්ණාවය, භවතෘෂ්ණාවය, විභවතෘෂ්ණාවය, යනමේ තෘෂ්ණාව ඉදින්නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාව නැතිකල්හි තෘෂ්ණා නිරොධයෙන් කිමෙක පර්යෙෂණාව පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමින්වහන්ස, මේකාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය,එහෙයින් මෙහි පර්යෙෂණාවට යම් මේ තෘෂ්ණාවක් වේනම් මෝ තොමෝම හෙතුවෙයි මෙයම මූලකාරණාවෙයි, මෙයම සමුදය ධර්මයවෙයි, මෙයම ප්‍රත්‍යයවේයයි වදාළසේක.

ඉති ඛො ආනන්ද ඉමෙ ද්වෙ ධම්මා ද්වයෙන වෙදනාය එකසමොසරණා භවන්ති.

19. ඵස්සපච්චයා වෙදනාති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං, යථා ඵස්සපච්චයා වෙදනා. ඵස්සො'ච හි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සෙය්‍යථීදං, චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝාණසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොසම්ඵස්සො, සබ්බසො ඵස්සෙ අසති ඵස්සනිරොධා අපිනු ඛො වෙදනා පඤ්ඤායෙථා'ති නො හෙතං භන්තෙ. තස්මා'තිහානන්ද එසෙ'ව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො වෙදනාය යදිදං ඵස්සො.

20. නාමරූපපච්චයා ඵස්සො'ති ඉති ඛො පනෙතං වුත්තං තදානන්ද ඉමිනා පෙතං පරියායෙන වෙදිතබ්බං, යථා නාමරූපපච්චයා ඵස්සො.

---

ආනන්දය, මෙසේ ඇතිකල්හිවතිමූලකතෘෂ්ණාවසමුදාචාරතෘෂ්ණාවය, යනමේ ධර්මදෙක, වතීමූල සමුදාචාරවශයෙන් ද්විප්‍රකාරවූ වේදනාව හා, එකට ඇතුළත්වන්නාහුවෙත්, වෙදනා ප්‍රත්‍යයහා එක් ප්‍රත්‍යයක් වේයයි වදාළෝ.

19. ස්පර්ශය ප්‍රත්‍යයකොටගෙණ වෙදනාව වේයයි මෙසේ මේය වදාරණලදී. ආනන්දය, යම්සේ ස්පර්ශය ප්‍රත්‍යයකොටගෙණ වෙදනාව වේද යන ඒ මේ ධර්මයද මේ කාරණයෙන් දතයුතුයි. ආනන්දය, සර්වස්වභාවයෙන් හා සර්වාකාරයෙන් කිසිවෙකු සම්බන්ධව කිසිතැනෙක්හි ඒනම්, චක්ෂුස්පර්ශය, ශ්‍රොතස්පර්ශය, ඝ්‍රාණස්පර්ශය, ජිහ්වාස්පර්ශය, කායස්පර්ශය, මනස්පර්ශය යන ස්පර්ශය ඉදින් නොවන්නේනම් සර්වප්‍රකාරයෙන් ස්පර්ශය නැතිකල්හි ස්පර්ශ නිරොධය හෙතු කොටගෙණ කිමෙක්ද, වෙදනාව පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, එහෙයින් මෙහි වෙදනාවට යම් මේ ස්පර්ශයක් වේනම් මෙතෙමේම හෙතුවෙයි, මෙයම මූලකාරණා වෙයි. මෙයම සමුදයධර්මය වෙයි. මෙයම ප්‍රත්‍යය වේයයි වදාළෝ.

20. නාමරූප දෙක ප්‍රත්‍යයකොටගෙණ ස්පර්ශය වේයයි මෙසේ මේය වදාරණලදී. ආනන්දය, ඒ මේ ධර්මයද යම්සේ නාමරූප ප්‍රත්‍යය කොටගෙණ ස්පර්ශය වේද, මේ කාරණයෙන්ම දතයුතුයි.

යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි යෙහි උද්දෙසෙහි නාමකායස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසෙසු අසති, අපිනුඛො රූපකායෙ අධිවචනසම්ඵස්සො. පඤ්ඤායෙථා'ති, නො හෙතං භන්තෙ. යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි යෙහි උද්දෙසෙහි රූපකායස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසෙසු අසති, අපිනුඛො නාමකායෙ පටිඝසම්ඵස්සො පඤ්ඤායෙථා'ති, නො හෙතං භන්තෙ. යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි යෙහි උද්දෙසෙහි නාමකායස්ස ච රූපකායස්ස ච පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසෙසු අසති, අපිනුඛො අධිවචනසම්ඵස්සොවා පටිඝසම්ඵස්සොවා පඤ්ඤායෙථා'ති

---

ආනන්දය, යම් ආකාරයන්ගෙන් හෙවත් යම් අසදෘශභාවයකින් වැසිසිටි අර්ථයන් ප්‍රකාශකිරිමයයි කියන ලද යම් ලිඞ්ගයන්ගෙන් ඒ ඒ අර්ථාවබෝධයට හෙතුවූ යම් යම් නිමිතිවලින් යම් යම් උදෙසුම්වලින් නාමසමූහයාගේ පැණවීම වේද, ඒ ආකාරයන්ද, ඒ ලිඞ්ගයන්ද, ඒ නිමිතිද, ඒ උදෙසුම්ද, නැතිකල්හි කිමෙක්ද, රූපකයෙහි අධිවචනස්පර්ශය පෙණෙන්නේද, චතුර්විධ ස්කන්ධය අරමුණුකොට මනොද්වාරයෙහි ස්පර්ශය උපදනේද. කිමෙක්ද, ඒ මනස්පර්ශයතෙම රූපකයෙහි පඤ්ච ප්‍රසාදයන් අරමුණුකොට උපදින්නේදැයි විචාලසේක. ස්වාමින්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, යම් අයුරුවලින්ද යම් ලක්ෂණයන්ගෙන්ද, යම් නිමිතිවලින්ද, යම් උදෙසුම්වලින්ද, රූපකාය සම්බන්ධී ප්‍රඥප්තිය වේද, ඒ ආකාරයන්ද, ඒ ලක්ෂණයන්ද, ඒ නිමිතිද, ඒ උදෙසුම්ද, නැතිකල්හි නාමකායෙහි ප්‍රතිඝසහිතවූ රූපස්කන්ධය අරමුණුකොට උපදනා ස්පර්ශය කිමෙක්ද, පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමින්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, යම් අයුරුවලින් යම් ලක්ෂණවලින් යම් නිමිතිවලින් යම් උදෙසුම්වලින් නාමකායයාගේ හා රූපකායයාගේ පැණවීම වේද, ඒ ආකාරයන්ද, ඒ ලක්ෂණද, ඒ නිමිතිද, ඒ උදෙසුම්ද, නැතිකල්හි අධිවචන ස්පර්ශය හෝ ප්‍රතිඝ සහිතවූ රූපස්කන්ධය අරමුණුකොට උපදනා ස්පර්ශය කිමෙක පෙණෙන්නේදැයි විචාලසේක.

නො හෙතං භන්තෙ. යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි යෙහි උද්දෙසෙහි නාමරූපස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසෙසු අසති, අපිනු ඛො ඵස්සො පඤ්ඤායෙථා'ති. නො හෙතං භන්තෙ. තස්මා'තිහානන්ද එසෙ'ව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො ඵස්සස්ස, යදිදං නාමරූපං.

21. විඤ්ඤාණපච්චයා නාමරූප'න්ති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා විඤ්ඤාණපච්චයා නාමරූපං. විඤ්ඤාණං'ව හි ආනන්ද මාතුකුච්ඡිස්මිං න ඔක්කමිස්සථ, අපිනු ඛො නාමරූපං මාතුකුච්ඡිස්මිං සමුච්ඡිස්සථා'ති. නො හෙතං භන්තෙ. විඤ්ඤාණං'ව හි ආනන්ද මාතුකුච්ඡිං ඔක්කමිත්වා.

---

ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, යම් ආකාරවලින්ද, යම් ලක්ෂණයන්ගෙන්ද, යම් නිමිතිවලින්ද, යම් උදෙසුම්වලින්ද, නාමරූපය පිළිබඳ පැණවීම වේද, ඒ ආකාරයන්ද, ඒ ලක්ෂණයන්ද, ඒ නිමිත්තයන්ද, ඒ උදෙසුම්ද, නැතිකල්හි කිමෙක්ද, ස්පර්ශය පෙණෙන්නේදැයි විචාළසේක. ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළේය. ආනන්දය, එහෙයින් මෙහි ස්පර්ශයට යම් මේ නාමරූපයක් වේනම් මෙතෙමේම හෙතුවෙයි. මෙයම මූලකාරණා වෙයි. මෙයම සමුදයධර්මය වෙයි. මෙතෙමේම ප්‍රත්‍යය වේයයි වදාළසේක.

21. විඥානය ප්‍රත්‍යකොටගෙණ නාමරූපදෙක වේයයි මෙසේ මෙය වදාරණලදී. ආනන්දය, ඒ මේ ධර්මයද යම්සේ විඥානය ප්‍රත්‍යයකොටගෙණ නාම රූපය වේද. මේකාරණයෙන්ම දතයුතුයි, ආනන්දය, විඥානයතෙමේම මව්කුසට ප්‍රතිසන්ධිවශයෙන් ඇතුළත්ව නොපවත්නේනම් කිමෙක්ද මව්කුසෙහි ප්‍රතිසන්ධිවිඥානය නැතිකල්හි ශුද්ධාවශෙෂවූ නාමරූපය කුසතුළ කලලරූපාදිභාවයෙන් මිශ්‍රව පවත්නේදැයි විචාළසේක, ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි වදාළසේක. ප්‍රතිසන්ධි සිත හා සමගම සමතිස් කර්මජ රූපයෝ පහලවෙත්. ඒ කර්මජරූපයන් පවත්නාකල්හිම සොළොස් භවාඞ්ගසිත් ඉපද නිරුද්ධවෙත්. මේ අතර පිළිසිඳගත් දරුවාට හෝ ඔහුගේ මවට හෝ අන්තරායක් නැත්තේය. ආනන්දය, විඥානය තෙමේම මව්කුසයට බැසගෙණ.

වොක්කමිස්සථ, අපිනුඛො නාමරූපං ඉත්ථත්තාය අභිනිබ්බත්තිස්සථා'ති. නො හෙතං භන්තෙ. විඤ්ඤාණං වහි ආනන්ද දහරස්සෙව සතො වොච්ඡිජ්ජිස්සථ කුමාරස්ස වා කුමාරිකාය වා, අපිනුඛො නාමරූපං වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සථා'ති. නොහෙතං භන්තෙ. තස්මා'තිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො නාමරූපස්ස යදිදං විඤ්ඤාණං.

22. නාමරූපපච්චයා විඤ්ඤාණන්ති ඉති ඛො පනෙතං වුත්තං, තදානන්ද ඉමිනා පෙතං පරියායෙන වෙදිතබ්බං යථා නාමරූපපච්චයා විඤ්ඤාණං. විඤ්ඤාණං'වහි ආනන්ද නාමරූපෙ පතිට්ඨං නාලභිස්සථ, අපිනුඛො ආයතිං ජාති ජරාමරණදුක්ඛසමුදයසම්භවො පඤ්ඤායෙථා'ති. නොහෙතං භන්තෙ. තස්මා'තිහානන්ද,

---

ඇතුළත්ව නිරුද්ධවන්නේනම්, කිමෙක්ද නාමරූපය තෙමේ මේ බව පිණිස හෙවත් මෙසේ සම්පූර්ණ පඤ්චස්කන්ධයන්ගේ ලැබීම් බවපිණිස කිමෙක උපදින්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි සැලකළේය. ඉදින් ප්‍රතිසන්ධි සිත සමග පහළවූ රූපයෝ සතලොස්වෙනි භවාඞ්ගයට ප්‍රත්‍යයදෙන්ට හැකිවෙද්ද, ප්‍රවෘත්තිතොමෝ පවතී. පරම්පරාතොමෝ ඝටනයවනුලැබේ. ඉදින් එසේ නොහැකිවෙන්නම් ප්‍රවෘත්තිතොමෝ නොපවතී පරම්පරාතොමෝ ඝටනයවනු නොලැබේ. එසේ පරම්පරා අඝටනය වොක්ක්‍රමනයයි කියනුලැබේ. ආනන්දය, මන්දබාලවූ කුමාරයෙකුගේ හෝ කුමරියෙකුගේ විඥානය වැනසෙන්නේ නම් කිමෙක්ද විඥානය මුල්සුන්කල්හි ශුද්ධනාමරූපයම නැඟිට පළමුවෙනි වයසින් වැඩීමටද මධ්‍යම වයසින් විරූඪිභාවයටද පැසුළුවයසින් විපුලබවටද කිමෙක පැමිණෙන්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමය. ආනන්දය, එහෙයින් මෙහි නාමරූපයට යම් මේවිඥානයක්වේනම් මේතෙමේමහෙතුවෙයි. මෙයම මූලකාරණාවෙයි මෙයම සමුදය ධර්මයවෙයි, මෙයම ප්‍රත්‍යයවේයයි වදාළසේක.

22. නාමරූපදෙක ප්‍රත්‍යයකොටගෙණ විඥානය වේයයි මෙසේ මෙය වදාරණලදී. ආනන්දය, ඒ මේධර්මයද යම්සේ නාමරූප ප්‍රත්‍යයකොටගෙණ විඥානයවේද මේකාරණයෙන්ම දතයුතු. ආනන්දය, විඥානයතෙමේම නාමරූපයෙහි පිහිටනොලබන්නේනම් මත්තෙහි ජාතිජරාමරණ දුක්රාශිහුගේ පහළවීම කිමෙක පෙණෙන්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, මේ කාරණය නොවේමයයි වදාළසේක. ආනන්දය, එහෙයින් මෙහි.

ඵසෙ'ව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො විඤ්ඤාණස්ස, යදිදං නාමරූපං. එත්තාවතා ඛො ආනන්ද ජායෙථ වා ජීයෙථ වා මීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා, එත්තාවතා අධිවචනපථො, එත්තාවතා නිරුත්තිපථො, එත්තාවතා පඤ්ඤත්තිපථො එත්තාවතා පඤ්ඤාවචරං, එත්තාවතා වට්ටං වත්තති ඉත්ථත්තං පඤ්ඤා, පණාය, යදිදං නාමරූපං සහවිඤ්ඤාණෙන.

23. කිත්තාවතාච ආනන්ද අත්තානං පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති. රූපිං වා හි ආනන්ද පරිත්තං අත්තානං පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති රූපී මෙ පරිත්තො අත්තාති. රූපිං වා හි ආනන්ද අනන්තං අත්තානං පඤ්ඤාපෙන්තො, පඤ්ඤාපෙති රූපී මෙ අනන්තො අත්තාති. අරූපිං වා හි ආනන්ද පරිත්තං අත්තානං පඤ්ඤාපෙන්තො, පඤ්ඤාපෙති අරූපී මෙ පරිත්තො අත්තාති.

---

යම් මේ නාමරූපයෙක් වේනම් විඥානයට මෙතෙමේම හෙතුවෙයි. මෙයම මූලකාරණාවෙයි, මෙයම සමුදය ධර්මයවෙයි, මෙයම ප්‍රත්‍යයවේ යයි වදාළෝ. ආනන්දය, විඥානය නාමරූපයට ප්‍රත්‍යයවනකල්හි හෝ නාමරූපය විඥානයට ප්‍රත්‍යයවනකල්හි හෙවත් නාමරූප විඥානයට අන්‍යොන්‍ය ප්‍රත්‍යයව පවත්නාකල්හි මෙපමණකින් උපදින්නේහෝ දිරන්නේහෝ මැරෙන්නේහෝ චුතවන්නේහෝ නැවත උපදින්නේ හෝවෙයි. මෙපමණකින් වාඩ්මාත්‍රයනිසා පැවති ව්‍යවහාරකථා මාර්ගය වේ. මෙපමණකින් නිරුක්ති ලක්ෂණය අනුව අභිවත්වාඩ්මාර්ගයවේ. මෙපමණකින් ව්‍යවහාර ප්‍රඥප්තිමාර්ගයවේ. මෙපමණකින් ප්‍රඥාවෙන් දැනගතහැක්කවෙයි. මෙපමණකින් සංසාරවර්තය පවතී, මෙපමණකින් විඥානය සහිතවූ යම්මේ නාමරූපයක්වේනම් මෙය මේස්කන්ධපඤ්චකය පැණවීම පිණිස පවතී.

23. ආනන්දය, කොපමණකින්නම් ආත්මය පණවන්නේ පණවාදයත්. ආනන්දය, යමෙක් නොවඩනලද කසිණනිමිත්ත ආත්මයයි ගණීද, හෙතෙමේ රූපඇත්තේ ස්වල්ප ආත්මයයි පණවන්නේ රූපඇත්තාවූ මාගේ ස්වල්ප ආත්මයයි පණවයි. ආනන්දය, යමෙක් වඩනලද කසිණනිමිත්ත ආත්මයයිගණීද, ඒ පුද්ගලතෙමේ රූපඇත්තාවූ අනන්තරහිතයක් ආත්මයයි පණවන්නේ රූපඇත්තාවූ මාගේ අනන්තරහිතවූයේ ආත්මයයි පණවයි. ආනන්දය, යමෙක් නොවඩනලද කසිණ නිමිත්ත උද්ඝාටනයකොට නිමිත්ත්පහස්නාලද අවකාශය හෝ එහි පැවති චතුර්විධ ස්කන්ධයන් හෝ ඔවුන් කෙරෙහි විඥානමාත්‍රය හෝ ආත්මයයි ගණීද, ඒ පුද්ගලතෙමේ රූප නැත්තාවූ ස්වල්ප ආත්මයයි පණවන්නේ රූපනැත්තාවූ ස්වල්පවූ ආත්මයයි පණවයි.

අරූපිං වාහි ආනන්ද අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො, පඤ්ඤපෙති අරූපී මෙ අනන්තො අත්තාති.

24. තත්‍රානන්ද යො සො රූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති, එතරහි වා සො රූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති, තත්ථ භාවිං වා සො රූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති, අතථං වා පන සන්තං තථත්තාය උපකප්පෙස්සාමීති ඉතිවා පනස්ස හොති. එවං සන්තං ඛො ආනන්ද රූපිං.පරිත්තත්තානුදිට්ඨි අනුසෙතීති. ඉච්චලං වචනාය තත්‍රානන්ද යො සො රූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති, එතරහි වා සො රූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති,

---

ආනන්දය, යංම්ක් වඩනලද කසිණ නිමිත්තෙන් පහස්නාලද. අවකාශය හෝ එහි පැවති චතුර්විධ ස්කන්ධයන් හෝ ඔවුන්කෙරෙහි පැවති විඥනමාත්‍රය හෝ ආත්මයයි ගණිද, ඒ පුද්ගලතෙමේ රූපනැත්තාවූ අන්තරහිතවූවක් ආත්මයයි පණවන්නේ රූපනැත්තාවූ අන්තරහිතයක් ආත්මයයි පණවයි.

24. ආනන්දය, ඒ චතුර්විධ දෘෂ්ටිගතිකයන් අතුරෙහි යම් ඒ පුද්ගලයෙක් රූපඇත්තාවූ සවල්පවූ ආත්මයයි පණවන්නේ පණවාද, ඒ පුද්ගලතෙම පවත්නා කල්හි හෝ රූපඇත්තාවූ සවල්පවූවක් ආත්මයයි පණවන්නේ පණවයි. ඒ පුද්ගලතෙම එහි පරලොව ඇතිවන්නාවූ හෝ රූපඇත්තාවූ සවල්පවූවක් ආත්මයයි පණවන්නේ පණවයි. කෙසේදයත්, විද්‍යමාන භාවය පිණිස නොපවත්නක් හෙවත් උච්ඡෙදයක් හෝ විද්‍යමානභාවය පිණිස හෙවත් ශාශ්වත බව පිණිස පමුණුවන්නෙම්යි කියායි. මෙසේන් විවාදයක් දක්වයි. උච්ඡෙදවාදී පුද්ගලතෙමේ ශාශ්වත වාදීහුගේ ඒ ශාශ්වත වාදය දුරුකරවා උච්ඡෙදවාදයම ඕහට ගන්වම්යි සිතුයේය. ශාශ්වතවාදී පුද්ගලතෙමේද උච්ඡෙදවාදීහුගේ ඒ වාදයහරවා ශාශ්වතවාදයම ගන්වන්නෙම්යි සිතුයේය යනුයි. ඒ දෘෂ්ටිගතික පුද්ගලයාහට මෙසේන් අදහසක් වේ. ආනන්දය, මෙබඳුවූ මේ රූප කසිණලාභි පුද්ගලයා කෙරෙහි සවල්පවූ ආත්මය යන මේ දෘෂ්ටිතෝමෝ වැදහෙව පවතී හෙවත් ප්‍රහාණයට නොපැමිණ ඌවතීය යනුයි. ඒ පුද්ගලයා කෙරෙහි මේ සවල්පාත්ම දෘෂ්ටිය සුත්නොවපවතිය යනමෙය කීමට සුදුසුයයි වදාළේය. ආනන්දය. ඒ දෘෂ්ටිගතිකයන් අතුරෙන් යම් ඒ පුද්ගලයෙක් රූපඇත්තාවූ අන්තරහිතයක් ආත්මයයි පණවන්නේ පණවාද,

එතරහි වා සො රූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති තත්‍ථ භාවිං වා සො රූපිං අනන්තං අත්තානං පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති, අතථං වා පන සන්තං තථත්තාය උපකප්පෙස්සාමීති ඉතිවා. පනස්ස හොති. එවං සන්තං ඛො ආනන්ද රූපිං අනන්තත්තානුදිඨි අනුසෙතීති ඉච්චලං වචනාය. තත්‍රානන්ද යො සො අරූපිං පරිත්තං අත්තානං පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති. එතරහි වා සො අරූපිං පරිත්තං අත්තානං පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති. තත්‍ථ භාවිං වා සො අරූපිං පරිත්තං අත්තානං පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති—පෙ—තත්‍ථ භාවිංවාසො අරූපිං අනන්තං අත්තානං පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති, අතථං වා පන සන්තං තථත්තාය උපකප්පෙස්සාමීති ඉතිවා පනස්ස හොති.

---

ඒ පුද්ගලතෙම වර්තමානකාලයෙහි හෝ රූපඇත්තාවූ අන්තරහිතයක් ආත්මයයි පණවන්නේ පණවාද, ඒ පුද්ගලතෙම එහි අනාගතයෙහි ඇතිවන්නාවූ හෝ රූපවත්වූ අන්තරහිතයක් ආත්මයයි පණවන්නේ පණවාද, කෙසේද, විද්‍යමානභාවය පිණිස නොප වත්නක්ම හෝ විද්‍යමානභාවය පිණිස පමුණුවන්නෙමියි කියායි. ඒ දෘෂ්ටිගතික පුද්ගලයාහට මෙසේත් අදහසක්වේ. ආනන්දය, මෙබ ඳුවූම මේ රූප කසිණලාභි පුද්ගලයාකෙරෙහි අනන්තවූ ආත්මය යන දෘෂ්ටිතොමෝ ප්‍රහාණයට නොපැමිණ වැදහෙවපවතීය යනුයි. ඒ පුද්ගලයාකෙරෙහි අනන්තාත්ම දෘෂ්ටිය සුන්නොව පවතීය යන මෙයකීමට සුදුසුයයි වදාළේය. ආනන්දය, ඒ දෘෂ්ටිගතකයන් අතු රෙන් යම් ඒ පුද්ගලයෙක් රූපනැත්තාවූ සවල්පවූ ආත්මයයි පණ වන්නේ පණවාද, ඒ පුද්ගලතෙම වර්තමානයෙහි හෝ රූප නැත් තාවූ සවල්පාත්මයයි පණවන්නේ පණවයිද, ඒ පුද්ගලතෙම එහි පරලොව අනාගතයෙහි ඇතිවන්නාවූ හෝ රූපනැත්තාවූ සවල්පවූ ආත්මයයි පණවන්නේ පණවයිද, සෙස්ස ප්‍රථමවිතිය වාරයන්හි විස් තර කාලපරිච්ඡෙදන් විස්තරයට පැමිණවියයුතු. ඒ පුද්ගලතෙම එහි පරලොව අනාගතයෙහි ඇතිවන්නාවූ හෝ රූපනැත්තාවූ අන්තර හිතවූ ආත්මයයි පණවන්නේ පණවාද, කෙසේද, උච්ඡෙද භාවය පිණිස පවත්නක් හෝ ශාශ්වත භාවය පිණිස පමුණුවන්නෙමියි කියායි. මෙසේද ඒ පුද්ගලයාහට අදහසක් වේ.

එවං සන්තං ඛො ආනන්ද අරූපිං අනන්තත්තානුදිට්ඨි අනුසෙතීති ඉච්චලං වචනාය. එත්තාවතා ඛො ආනන්ද අත්තානං පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති.

25. කිත්තාවතා ච ආනන්ද අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති, රූපිං වා හි ආනන්ද පරිත්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති, රූපී මෙ පරිත්තො අත්තාති. රූපිං වා හි ආනන්ද න අනන්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති, රූපී මෙ අනන්තො අත්තාති. අරූපිං වා හි ආනන්ද පරිත්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති, අරූපී මෙ පරිත්තො අත්තාති. අරූපිං වා හි ආනන්ද අනන්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති අරූපී මෙ අනන්තො අත්තාති.

26. තත්‍රානන්ද යො සො රූපිං පරිත්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති, එතරහි වා සො රූපිං පරිත්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති.

---

ආනන්දය, මෙබඳුවූම මේ අරූප කසිණලාභී පුද්ගලයා කෙරෙහි අනන්තාත්මයයන දෘෂ්ටිතොමෝ ප්‍රහාණයට නොපැමිණ වැදහෙව පවතියැ යනුයි. ඒ පුද්ගලයා කෙරෙහි මේ අනන්තාත්ම දෘෂ්ටිය සුන් නොව පවතියයන මෙය කීමට සුදුසු වෙයි. ආනන්දය, මෙපමණකින් නම් ආත්මය පණවන්නේ පණවයි.

25. ආනන්දය, කොපමණකින් නම් ආත්මය නොපණවන්නේ නොපණවාදයත්, ආනන්දය, රූපඇත්තාවූ හෝ ස්වල්පආත්මයයි නොපණවන්නේ රූපඇත්තාවූ මාගේ ස්වල්පවූ ආත්මයයි නොපණවයි. ආනන්දය, රූපඇත්තාවූහෝ අනන්තනොවූවක් ආත්මයයි නොපණවන්නේ රූපඇත්තාවූ මාගේ අනන්තවූ ආත්මයයි නොපණවයි. ආනන්දය, රූපනැත්තාවූ හෝ ස්වල්පවූ ආත්මයයි නොපණවන්නේ රූපනැත්තාවූ මාගේ ස්වල්පවූ ආත්මයයි නොපණවයි. ආනන්දය, රූපනැත්තාවූ හෝ අනන්තවූ ආත්මයයි නොපණවන්නේ රූපනැත්තාවූ මාගේ අනන්තආත්මයයි නොපණවයි.

26. ආනන්දය, යම් ඒ පුද්ගලයෙක් රූපවත්වූ ස්වල්පවූ ආත්මයයි නොපණවන්නේ නොපණවයිද, වර්තමානකාලයෙහි හෝ ඒ පුද්ගල තෙම රූපවත්වූ ස්වල්පවූ ආත්මයයි නොපණවන්නේ නොපණවයිද,

තථභාවිං වා සො රූපිං පරිත්තං අත්තානං න පඤ්ඤා
පෙන්තො න පඤ්ඤාපෙති, අතථං වා පන සන්තං තථත්තාය උප
කප්පෙස්සාමීති. ඉති වා පනස්ස න හොති. එවං සන්තං ඛො ආනන්ද
රූපිං පරිත්තත්තානුදිට්ඨි නානුසෙතීති ඉච්චලං වචනාය. තත්‍රානන්ද
යො සො රූපිං අනන්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න
පඤ්ඤපෙති, එතරහි වා සො රූපිං අනන්තං අත්තානං න පඤ්ඤ
පෙන්තො න පඤ්ඤාපෙති. තථභාවිං වා සො රූපිං අනන්තං අත්
තානං න පඤ්ඤපෙන්තො න පඤ්ඤාපෙති, අතථං වා පන සන්තං
තථත්තාය උපකප්පෙස්සාමීති. ඉති වා පනස්ස න හොති, එවං සන්තං
ඛො ආනන්ද රූපිං අනන්තත්තානුදිට්ඨි නානුසෙතීති ඉච්චලං වච
නාය. තත්‍රානන්ද යො සො අරූපිං පරිත්තං අත්තානං න පඤ්ඤා
පෙන්තො න පඤ්ඤපෙති, එතරහි වා සො අරූපිං පරිත්තං අත්
තානං න පඤ්ඤපෙන්තො න පඤ්ඤාපෙති, තථ භාවිං වා සො
අරූපිං පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තො න පඤ්ඤාපෙති.

---

ඒ පුද්ගලතෙම එහි පරලොව අනාගතයෙහි ඇතිවන්නාවූ හෝ රූප
වත්වූ සවල්පවූ ආත්මයයි නොපණවන්නේ නොපණවයිද, උච්ඡෙද
යපිණිස පවත්නක් හෝ ශාශ්වත භාවය පිණිස පමුණුවන්නෙමියි ඒ
දෘෂ්ටිගතිකයාහට මෙසේත් අදහස්නොවෙයි. ආනන්දය, මෙබඳුවූම
රූපකසිණලාභී පුද්ගලයාකෙරෙහි සවල්පවූ ආත්මයයන දෘෂ්ටි
තොමෝ වැදහෙව නොපවතියයි, ඒ දෘෂ්ටිගතික පුද්ගලයා සම්බ
න්ධවමෙසේ කීමට සුදුසුනොවේ. ආනන්දය,ඒ දෘෂ්ටිගතිකයන් අතු
රෙන් යම් ඒ පුද්ගලයෙක් රූපවත්වූ අනන්තාත්මයයි නොපණවන්
නේනොපණවයිද,ඒ පුද්ගලතෙම එසේ පරලොව ඇතිවන්නාවූ හෝ
රූපවත්වූ අනන්තආත්මයයි නොපණවන්නේ නොපණවයි.ඒ භාව
යපිණිස නොපවත්නක්ම හෝ ඒ බවපිණිස පමුණුවන්නෙමියි කි
යයි. ඒ දෘෂ්ටිගතිකයාහට මෙසේත් අදහස් නොවේ. ආනන්දය,
මෙබඳුවූම මේරූපකසිණලාභී පුද්ගලයාකෙරෙහි අනන්තාත්මය
යන දෘෂ්ටිතොමෝ අනුසයනය නොකෙරේයයි ඒ දෘෂ්ටිගති
කයා සම්බන්ධව මේවචනය කීමට සුදුසුයි. ආනන්දය, ඒ දෘෂ්ටි
ගතිකයන් අතුරෙන් යම් ඒ පුද්ගලයෙක් අරූපවත්වූ සවල්පාත්මයයි
නොපණවන්නේ නොපණවයිද. ඒ පුද්ලතෙම වර්තමානකාලයෙහි
හෝ අරූපවත්වූ ස්වල්පාත්මයයි නොපණවන්නේ නොපණවයිද,ඒ
පුද්ගලතෙම එහිපරලොව අනාගතයෙහි වන්නාවූ හෝ අරූපවත්වූ
සවල්පාත්මයයි නොපණවන්නේ නොපණවයිද.

අතථං වා පන සන්තං තථත්තාය උපකප්පෙස්සාමීති ඉති වා පනස්ස න හොති එවං සන්තං ඛො ආනන්ද අරූපිං පරිත්තත්තානුදිට්ඨි නානුසෙතීති ඉච්චාලං වචනාය. තත්‍රානන්ද යො සො අරූපිං අනන්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති, එතරහි වා සො අරූපිං අනන්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති, තත්‍ථභාවිං වා සො අරූපිං අනන්තං අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති, අතථං වා පන සන්තං තථත්තාය උපකප්පෙස්සාමීති. ඉති වා පනස්ස න හොති. එවං සන්තං ඛො ආනන්ද අරූපිං අනන්තත්තානුදිට්ඨි නානුසෙතීති ඉච්චාලං වචනාය. එත්තාවතා ඛො ආනන්ද අත්තානං න පඤ්ඤාපෙන්තො න පඤ්ඤාපෙති.

27. කිත්තාවතා ච ආනන්ද අත්තානං සමනුපස්සමානො සමනුපස්සති.

---

උච්ඡේදභාවයපිණිස හෝ පවත්නක් ශාශ්වතභාවයපිණිස පමුණුවන්නෙමියි මෙසේ ඒ දෘෂ්ටිගතිකපුද්ගලයාහට අදහසක්නොවේ. ආනන්දය, මෙබඳුවූම අරූපකසිණලාභිවූ පුද්ගලයාකෙරෙහි සවල්පවූ ආත්මය යන දෘෂ්ටිතොමෝ අනුසයනයනොකෙරේයයි, ඒ දෘෂ්ටිගතිකයා සම්බන්ධව මේවචනය කීමට සුදුසුයි. ආනන්දය, එහි යම් ඒ පුද්ගලයෙක් අරූපවත් ආත්මයයි නොපණවත්තේ නොපණවාද, මේ වර්තමානකාලයෙහි හෝ ඒ පුද්ගලතෙම අරූපවත්වූ අනන්තරහිතයක් ආත්මයයි නොපණවත්තේ නොපණවාද, එසේම අනාගත කාලයෙහි හෝ ඒ පුද්ගලතෙම අරූපවත්වූ අනන්තරහිතයක් ආත්මයයි නොපණවත්තේ නොපණවාද, ශාශ්වත නොවූවක්ම ශාශ්වත භාවය පිණිස පමුණුවන්නෙමියි, මෙසේත් ඒ පුද්ගලයාහට අදහස් නොවේ. ආනන්දය, මෙබඳුවූම අරූපකසිණලාභී පුද්ගලයාකෙරෙහි අනන්ත ආත්මය යන දෘෂ්ටිතොමෝ අනුසයනය නොකෙරේයයි ඒ දෘෂ්ටිගතික පුද්ගලයා සම්බන්ධව මෙසේත් කීමට සුදුසුවෙයි. ආනන්දය, මෙපමණකින් නම් ආත්මයයි නොපණවන්නේ නොපණවායයි වදාළේය.

27. ආනන්දය, කෙපමණකින්නම් ආත්මයයි මනාකොට දක්නා පුද්ගලතෙම මනාකොට දකීද යත්,

වෙදනං 'වාහි ආනන්ද අත්තානං සමනුපස්සමානො සමනුපස්සති වෙදනා මෙ අත්තාති. න හෙව ඛො මෙ වෙදනා අත්තා, අප්පටිසංවෙදනො මෙ අත්තාති, ඉති වාහි ආනන්ද අත්තානං සමනුපස්සමානො සමනුපස්සති න හෙව ඛො මෙ වෙදනා අත්තා, නොපි අප්පටිසංවෙදනො මෙ අත්තා, අත්තා මෙ වෙදියති වෙදනා ධම්මොහි මෙ අත්තාති. ඉතිවාහි ආනන්ද අත්තානං සමනුපස්සමානො සමනුපස්සති.

28. තත්‍රානන්ද යො සො එවමාහ, වෙදනා මෙ අත්තාති සො එවමස්ස වචනීයොති. තිස්සො ඛො ඉමා ආවුසො වෙදනා, සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, ඉමාසං ඛො තිස්සන්නං වෙදනානං කතමං අත්තතො සමනුපස්සතීති. යස්මිං ආනන්ද සමයෙ සුඛං වෙදනං වෙදෙති නෙව තස්මිං සමයෙ දුක්ඛං වෙදනං වෙදෙති න අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති සුඛංයෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති.

---

ආනන්දය, වෙදනාව හෝ ආත්මයයි මනාකොට දක්නේ වෙදනාතොමෝ මාගේ ආත්මයයි මනාකොටදකී. වෙදනාතොමෝ මාගේ ආත්මය නොවෙයි මාගේ ආත්මය තෙම නොවිඳින සබනාව ඇත්තේය කියයි. ආනන්දය, මෙසේත් ආත්මයයි මනාකොට දක්නාපුද්ගලතෙම මනාකොට දකී. වෙදනාතොමෝ මාගේ ආත්මය නොවේමය. ආත්මයද විඳීමක් නැත්තේය. මාගේ ආත්මයතෙම විඳිනු ලබයි. මාගේ ආත්මයතෙම විඳීම සබභාවකොට ඇත්තේය කියායි. ආනන්දය, මෙසේද ආත්මයයි මනාකොට දක්නාපුද්ගලතෙම මනාකොට දකී.

28. ආනන්දය, එහි යම් ඒ පුද්ගලයෙක් වෙදනාව මාගේ ආත්මයයි මෙසේ කියාද, ඒ පුද්ගලතෙම මෙසේ කියයුතුවන්නේය. ඇවැත්නි, මේ වෙදනා තුණක් වෙත්. සුඛ වෙදනාවය, දුඃඛවෙදනාවය, උපෙක්‍ෂා වෙදනාවය," යන මොව්හුයි. මේ ත්‍රිවිධ වෙදනාවන් අතුරෙන් කවරනම් වෙදනාවක් ආත්මවශයෙන් දකීදැයි. ආනන්දය, යම් කලෙක්හි සැපවිඳීමක් ලබාද. එකල්හි දුක්විඳීමක් නොලබයි. උපෙක්‍ෂා වෙදනාවක්ද නොලබයි. ඒකාලයෙහි සැපවිඳීමක්ම ලබයි.

යස්මිං ආනන්ද සමයෙ දුක්ඛං වෙදනං වෙදෙති නෙව තස්මිං සමයෙ සුඛං වෙදනං වෙදෙති න අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති දුක්ඛං යෙව තස්මිං සමයෙවෙදනං වෙදෙති. යස්මිං ආනන්ද සමයෙ අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති නෙව තස්මිං සමයෙ සුඛං වෙදනං වෙදෙති න දුක්ඛං වෙදනං වෙදෙති, අදුක්ඛමසුඛං යෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති.

29. සුඛාපි ඛො ආනන්ද වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. දුක්ඛාපි ඛො ආනන්ද වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. අදුක්ඛමසුඛාපි ඛො ආනන්ද වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. තස්ස සුඛං වෙදනං වෙදියමානස්ස එසො මෙ අත්තාති හොති,

ආනන්දය, යම් කාලයක්හි දුක්විඳීමක් විඳීද, ඒකාලයෙහි සැපවිඳීමක් නොවිඳීමය, උපෙක්‍ෂා වෙදනාවක්ද නොවිඳී. ඒකාලයෙහි දුක්විඳිමක්ම විඳී. ආනන්දය, යම් කලෙක්හි උපෙක්‍ෂාවෙදනාවක් විඳීද, ඒකාලයෙහි සැපවිඳිමක් නොවිඳී. දුක්විඳිමක්ද නොවිඳී. ඒකාලයෙහි උපෙක්‍ෂා වෙදනාවක්ම විඳී.

29. ආනන්දය, සැපවිඳීමද හැමදා එකසේ නොපවත්නෙන් අනිත්‍යයයි. ඒ ඒ කාරණයන්ගෙන් රැස්වනලද්දීය. ප්‍රත්‍යයහෙතුවෙන් උපන්නීය. ගෙවීයාම සවභාවකොට ඇත්තීය. වැනසීම සවභාවකොට ඇත්තීය. නොඇලීම සවභාවකොට ඇත්තීය. නිරොධය සවභාවකොට ඇත්තීය, ආනන්දය, දුක්විඳීමද හැමදා එකසේ නොපවත්නෙන් අනිත්‍යයයි. ඒ ඒ කාරණයන්ගෙන් රැස්වනලද්දීය. ප්‍රත්‍යයහෙතුවෙන් උපන්නීය. ගෙවීයාම සවභාවකොට ඇත්තීය. වැනසීම සවභාවකොට ඇත්තීය. නොඇලීම සවභාවකොට ඇත්තීය. නිරොධය සවභාවකොට ඇත්තීය. ආනන්දය, දුක්නොවූ සැපනොවූ විඳීමද හැමදා එකසේ නොපවත්නෙන් අනිත්‍යයයි. ඒ ඒ කාරණයන්ගෙන් රැස්වන ලද්දීය. ප්‍රත්‍යයහෙතුවෙන් උපන්නීය. ගෙවීයාම සවභාවකොට ඇත්තීය. වැනසීම සවභාවකොට ඇත්තීය. නොඇලීම සවභාවකොට ඇත්තීය. නිරොධය සවභාවකොට ඇත්තීය. සැපවිඳිමක් ලබන්නාවූ ඒ පුද්ගලයාහට මෙතෙමේ මාගේ ආත්මයයි අදහස් වේ.

තස්සා යෙව සුඛාය වෙදනාය නිරොධා ව්‍යාගා මෙ අත්තාති හොති. දුක්ඛං වෙදනං වෙදියමානස්ස එසො මෙ අත්තාති හොති, තස්සායෙව දුක්ඛාය වෙදනාය නිරොධා ව්‍යාගා මෙ අත්තාති හොති. අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානස්ස එසො මෙ අත්තාති හොති,තස්සායෙව අදුක්ඛමසුඛාය වෙදනාය නිරොධා ව්‍යාගා මෙ අත්තාති හොති. ඉතිසො දිට්ඨෙව ධම්මෙ අනිච්චං සුඛදුක්ඛං වොකිණ්ණං උප්පාදවයධම්මං අත්තානං සමනුපස්සමානො සමනුපස්සති. යොසො එවමාහ, වෙදනාමෙ අත්තාති. තස්මාතිහානන්ද එතෙන පෙතං නක්ඛමති වෙදනා මෙ අත්තාති සමනුපස්සිතුං.

30. තත්‍රානන්ද යො සො එවමාහ, නහෙවඛො මෙ වෙදනා අත්තා අප්පටිසංවෙදනො මෙ අත්තාති, සො එවමස්ස වචනීයො,

---

ඒ සැපවෙදනාහුගේ නිරොධයෙන්ම මාගේ ආත්මය පහව ගියේය. හෙවත් නිරුද්ධවූයේයයි මේඅදහස වෙයි, දුක්විඳීමක් විඳින්නාවූ පුද්ගලයාහටද මෙතෙම මාගේ ආත්මයයි මේ අදහස වෙයි, ඒ දුඃඛවෙදනාහුගේ නිරොධයෙන්ම මාගේ ආත්මය පහවගියේය හෙවත් නිරුද්ධවූයේයයි මේ අදහස වේයි. උපෙක්ෂා වෙදනාවක් විඳින්නාහටද මෙතෙම මාගේ ආත්මයයිමේ අදහස වෙයි, ඒ උපෙක්ෂාවෙදනාහුගේ නිරොධයෙන් මාගේආත්මය පහවගියේය, හෙවත් නිරුද්ධවූයේයයි මේඅදහස වෙයි. මෙසේ ඒ පුද්ගලතෙම දෘෂ්ටධර්මසඞ්ඛ්‍යාත ඉහාත්මභාවයෙහිම අනිත්‍යවූ සැපදුක් ඇත්තාවූ ඒ දෙකින්ම මිශ්‍රවූද ඉපදීමහා වැනසීම ස්වභාවකොට ඇත්තක් ආත්මයයි මනාකොට දක්නේ මනාකොට දකී. යම් ඒ පුද්ගලයෙක් වෙදනාව මාගේ ආත්මයයි මෙසේ කියයිද, ආනන්දය, එහෙයින් මෙහි වෙදනාව මාගේ ආත්මයයි මනාකොට දකින්නටය යන මේය මේදුක්වූකාරණයෙන්ද නුසුදුසුයි,

30. ආනන්දය. එහි යම් ඒ පුද්ගලයෙක් වෙදනාතොමෝ මාගේ ආත්මය නොවේමය. මාගේ ආත්මය විඳිනස්වභාවයක් නැත්තේයයි මෙසේ කියයිද, ඒ පුද්ගලතෙම මෙසේ කියයුතුවන්නේය.

යත්ථපනාවුසො සබ්බසො වෙදයිතං අත්ථි, අපි නු ඛො තත්ථ අස්මීති සියාති, නො හෙතං භන්තෙ. තස්මාතිහානන්ද එතෙන පෙතං නක්ඛමති, නෙව ඛො වෙදනා අත්තා, අප්පටිසංවෙදනො මෙ අත්තාති සමනුපස්සිතුං.

31. තත්‍රානන්ද යොසො එවමාහ, නහෙව ඛො මෙ වෙදනා අත්තා, නොපි අප්පටිසංවෙදනො අත්තා, අත්තා මෙ වෙදියති. වෙදනාධම්මොහි මෙ අත්තාති, සො එවමස්ස වචනියො. වෙදනාවහි ආවුසො සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අපරිසෙසා නිරුජ්ඣෙය්‍යුං, සබ්බසො වෙදනාය අසති වෙදනා නිරොධා, අපිනුඛො තත්ථ අහමස්මීති, සියාති, නො හෙතං භන්තෙ. තස්මාතිහානන්ද එතෙන පෙතං නක්ඛමති. නහෙවඛො මෙ වෙදනා අත්තා, නොපි අප්පටිසංවෙදනො මෙ අත්තා, අත්තා මෙ වෙදියති වෙදනාධම්මොහි මෙ අත්තාති සමනුපස්සිතුං.

---

ඇවැත්නි, යම්තැනෙක්හි සර්වප්‍රකාරයෙන් විදිනලද්දක් ඇත්තේද කිමෙක එහි මම වෙමියි යන මේඅදහස වන්නේදැයි කියායි, ස්වාමීන්වහන්සමේකාරණය නොවේමය. ආනන්දය, එහෙයින් මෙහි වෙදනාතොමෝ මාගේ ආත්මය නොවේමය, මාගේආත්මයතෙම විදිනස්වභාව නැත්තේයයි මනාකොට දක්නට සුදුසුය යනමෙය මේකාරණයෙන්ද නුසුදුසුයි.

31. ආනන්දය, යම් ඒ පුද්ගලයෙක් මෙසේ කියයිද, කෙසේද, වෙදනාතොමෝ මාගේ ආත්මයනොවෙයි. මාගේ ආත්මයතෙම නොවිදින්නේත් නොවෙයි. මාගේ ආත්මයතෙම විදිනුලබයි මාගේ ආත්මයතෙම විදීම ස්වභාවකොට ඇත්තේය කියායි. ඒ පුද්ගලතෙම මෙසේ කියයුතුවන්නේය. ඇවැත්නි, වෙදනාතොමෝම සර්වස්වභාවයෙන් හා සර්වාකාරයෙන් නිරවශෙෂයෙන් නිරුද්ධවන්නාහුනම් සර්වප්‍රකාරයෙන් වෙදනාව නැතිකල්හි වෙදනා නිරොධයෙන් ඒ වෙදනාවකෙරෙහි මම වෙමියියන දෘෂ්ටිතොමෝ කිමෙක වන්නේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, මේකාරණය නොවේමය. ආනන්දය, එහෙයින් මෙහි වෙදනාතොමෝ, මාගේආත්මය නොවෙයි ආත්මයතෙම නොවිදින්නේත් නොවෙයි, මාගේ ආත්මයතෙම විදිනුලබයි. මාගේ ආත්මයතෙම විදීම ස්වභාවකොට ඇත්තේයයි මනාකොට දක්නටය යනමෙය මේකාරණයෙන්ද නුසුදුසුයි.

32. යතො ඛො ආනන්ද භික්ඛු නෙව වෙදනං අත්තානං සමනුපස්සති, නොපි අප්පටිසංවෙදනං අත්තානං සමනුපස්සති, නොපි අත්තා වෙදියති, වෙදනාධම්මොහි මෙ අත්තාති සමනුපස්සති, සො එවං අසමනුපස්සන්තො, න කිඤ්චි ලොකෙ උපාදියති, අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තං යෙව පරිනිබ්බායති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. එවං විමුත්තචිත්තං ඛො ආනන්ද භික්ඛුං යො එවං වදෙය්‍ය හොති තථාගතො පරම්මරණාති, ඉතිස්ස දිට්ඨීති තදකල්ලං, න හොති තථාගතො පරම්මරණාති ඉතිස්ස දිට්ඨීති තදකල්ලං. හොති ච නච හොති තථාගතො පරම්මරණාති, ඉතිස්ස දිට්ඨීති තදකල්ලං. නෙව හොති න නහොති තථාගතො පරම්මරණාති, ඉතිස්ස දිට්ඨීති තදකල්ලං. තං කිස්ස හෙතු.

---

32. ආනන්දය, යම් කලෙක්හි භික්‍ෂුතෙමේ වෙදනාව ආත්මයයි නොදකීද. ආත්මය නොවිඳින ස්වභාවඇත්තක් නොවේයයිත් නොදකිද ආත්මයතෙම විඳිනුලබයි මාගේ ආත්මයතෙම විඳීම ස්වභාව කොට ඇත්තේය කියාත්. නොදකීද, ඒපුද්ගලතෙමදෘෂ්ටිවශයෙන් මෙසේ නොදක්නේ ස්කන්ධ සමූහතාදිවශයෙන් ප්‍රභෙදවත්වූ ලොකයෙහි රූපාදි එකම ධර්‍මයකුත් විපරීතවශයෙන් නොගණී. එසේ නොගන්නේ පරිත්‍රස්තතාවට නොපැමිණේ. තෘෂ්ණාදිවශයෙන් පරිත්‍රස්තතාවට නොපැමිණෙන්නේ තෙමේම ක්ලෙශ පරිනිර්‍වාණය කෙරේ. ජාතිතොමෝ ක්‍ෂයවීය, මගබ්‍රහ්මචර වැසනිමවන ලද්දේය. කටයුතුකොට නිමවනලද්දේය. මේ පඤ්චස්කන්ධලාභයපිණිස හෝ මේ මාගී භාවනාවපිණිස අනිකක් නැතැයි සර්‍වප්‍රකාරයෙන් දැනගණී. ආනන්දය, මෙසේ ක්ලෙශයන් කෙරෙන් මිදුනුසිත් ඇත්තාවූ භික්‍ෂුහට යමෙක් සත්‍වතෙමේ මරණින්මතු වේයයි මෙසේ කියන්නේයයි එසේ ක්ලෙශයන්කෙරෙන් මිදුනාවූ යම් අර්හත් කෙනෙක් වේද, උත්වහන්සේට මෙබඳු දෘෂ්ටියක්වෙයි කියන්ට සුදුසුනොවෙයි. වදාළේය, සත්‍වතෙම මරණින්මතු නොවේයයි ඒ රහතන්වහන්සේට මෙබඳු දෘෂ්ටියක් වේයයි කියන්ට සුදුසු නොවෙයි වදාලේය. සත්‍වතෙම මරණින්මතු වන්නේද නොවන්නේද නොවේයයි ඒ රහතන්වහන්සේට මෙබඳු දෘෂ්ටියක්වේයයි කියන්ට සුදුසුනොවේයයි වදාලේය. සත්‍වතෙම මරණින්මතුනොවේමය. නොවන්නේත් නොවේයයි ඒ රහතන්වහන්සේට මෙබඳු දෘෂ්ටියක් වේයයි කියන්ට සුදුසුත්නොවෙයි වදාළසේක. ඊට හෙතුකවරේදයත්,

යාවතානන්ද අධිවචනං යාවතා අධිවචනපථො, යාවතා නිරුත්ති, යාවතා නිරුත්තිපථො, යාවතා පඤ්ඤත්ති, යාවතා පඤ්ඤත්තිපථො, යාවතා පඤ්ඤා, යාවතා පඤ්ඤාවචරං, යාවතා, වට්ටං යාවතා වට්ටං වට්ටති, තදභිඤ්ඤා විමුත්තො භික්ඛු තදභිඤ්ඤා විමුත්තො භික්ඛු න ජානාති න පස්සති ඉතිස්ස දිඨිති තදකල්ලං.

33. සත්තඛො ඉමා ආනන්ද විඤ්ඤාණඨිතියො, ද්වෙච ආයතනානි. කතමා සත්ත, සත්තානන්ද සත්තා නානත්තකායා නානත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි මනුස්සා එකච්චෙච දෙවා එකච්චෙච විනිපාතිකා. අයං පඨමා විඤ්ඤාණඨිති. සත්තානන්ද සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා. අයං දුතියා විඤ්ඤාණඨිති.

---

ආනන්දය, ව්‍යවහාරය යම්පමණ ඇත්තේද, අධිවචනමාර්‍ගය යම්පමණ ඇත්තේද, නිරුත්තිලක්‍ෂණය යම් පමණවේද නිරුත්තිමාර්‍ගය යම්පමණ වේද, ප්‍රඥප්තිය යම්පමණ වේද, ප්‍රඥප්ති මාර්‍ගය යම්පමණ වේද, ප්‍රඥාව යම්පමණ වේද, ප්‍රඥාවෙන් දතහැකිවූ ස්කන්ධ පඤ්චකය යම්පමණ වේද, සංසාරවර්‍තය යම්පමණ වේද, යම්පමණ වර්‍තපව ත්‍නිද, ඒ සියල්ල විශිෂ්ටඥනයෙන් දැනගෙණ භික්‍ෂුතෙමේ ක්ලෙශයන් කෙරෙන් මිදුනේද එහෙයින් ඒ සියල්ල විශිෂ්ටඥනයෙන් දැනගෙණ කෙලෙසුන්කෙරෙන් මිදුනු භික්‍ෂුතෙමේ නොදනී නොදකී. රහතන් වහන්සේට මෙබඳු දෘෂ්ටියක් වේයයි කියන්ට සුදුසුනොවෙයි වදාළසේක.

33. ආනන්දය, විඥානස්ථිති හෙවත් විඥනය පිහිටනතැන් සතක් වෙත්. ආයතන හෙවත් නිවාසනස්ථානද මේ දෙකක් වෙත්. ඒ විඥනස්ථිති සත කවරහුදයත්, ආනන්දය, කායනානාත්වය ඇත්තාවූද සංඥනානාත්වය ඇත්තාවූද, සත්වයෝ ඇත්තාහ. ඒනම් මනුෂ්‍යයෝද ෂඩ්කාමාවචරාදි සමහර දෙවියෝද, සමහර විනිපාතික ප්‍රෙතයෝද, යන මොව්හුයි. මේ කියනලද්දේ ප්‍රථම විඥනස්ථිතියයි. ආනන්දය, කායනානාත්වය හා සංඥහුගේ එකත්වය ඇත්තාවූද, සත්වයෝ ඇත්තාහ. ඒනම් ප්‍රථමධ්‍යානයෙන් මනාකොට උපන්නාවූ බ්‍රහ්මපාරිෂද්‍ය බ්‍රහ්මපුරොහිත මහාබ්‍රහ්ම යන බ්‍රහ්මකායික දෙවියෝයි. මේ කියනලද්දේ දෙවෙනි විඥනස්ථිතියයි. මෙයින් ප්‍රථමධ්‍යාන බ්‍රහ්මතලය දක්වනලදි.

සන්තානන්ද සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං තතියා විඤ්ඤාණට්ඨිති. සන්තානන්ද සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි දෙවා සුභකිණ්ණා. අයං චතුත්ථා විඤ්ඤාණට්ඨිති. සන්තානන්ද සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනූපගා. අයං පඤ්චමී විඤ්ඤාණට්ඨිති. සන්තානන්ද සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගා. අයං ඡට්ඨා විඤ්ඤාණට්ඨිති. සන්තානන්ද සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථිකිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගා. අයං සත්තමී විඤ්ඤාණට්ඨිති. අසඤ්ඤසත්තායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනමෙව දුතියං,

34. තත්‍රානන්ද යායං පඨමා විඤ්ඤාණට්ඨිති නානත්තකායා නානත්තසඤ්ඤිනො, සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා.

---

ආනන්දය, කායඑකත්වය හා සංඥා නානාත්වය ඇත්තාවූ සත්වයෝ ඇත්තාහ. ඒනම් පරිත්තාභය, අප්පමාණාභය, ආභස්සරය, යන ආභාශ්වර දෙවියෝයි. මේ තුන්වෙනිවූ විඥානස්ථිතියයි මෙයින් ද්විතීයධ්‍යාන බ්‍රහ්මතලය දක්වනලදි. ආනන්දය, කායඑකත්වය හා සංඥාහුගේ එකත්වය ඇති සත්වයෝ ඇත්තාහ. ඒනම් පරිත්තසුභ අප්පමාණසුභ සුභකිණ්ණක යන ශුභකිණ්ණක දෙවියෝයි. මේකියනලද්දේ සතරවෙනි විඥානස්ථිතියයි. මෙයින් තෘතීයධ්‍යාන බ්‍රහ්මතලය සඞ්ග්‍රහකරණලදි. ආනන්දය, සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ දුරලීමෙන් නානාත්වය පිළිබඳ සංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තයයිආකාශානඤ්චායතනයට පැමිණියාවූසත්වයෝ ඇත්තාහ. මේ සවෙනි විඥානස්ථිතියයි. ආනන්දය, සර්වප්‍රකාරයෙන් විඥානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි භාවනාවඩා ආකිඤ්චඤ්ඤයතනයට පැමිණියාවූ සත්වයෝ ඇත්තාහ. මේ සත්වෙනි විඥානස්ථිතියයි. අසංඥසත්වබ්‍රහ්මතලය පළමුවෙනි ආයතනය වෙයි. නෙවසංඥානාසංඥායතනය දෙවෙනි ආයතනය වෙයි.

34. ආනන්දය, ඒ සප්තවිඥානස්ථිතීන් අතුරෙන් කායනානාත්වය හා සංඥානානාත්වය ඇත්තාවූ යම් මේ ප්‍රථම විඥානස්ථිතියක් වේද, ඒනම් මනුෂ්‍යයෝද සමහර දෙවියෝද සමහර විනිපාතික ප්‍රේතයෝද, යන මොව්හුයි.

යොනු ඛො ආනන්ද තඤ්චපජානාති, තස්සාච සමුදයං පජානාති, තස්සාච අත්ථගමං පජානාති, තස්සාච අස්සාදං පජානාති, තස්සාච ආදීනවං පජානාති, තස්සාච නිස්සරණං පජානාති, කල්ලංනු ඛො තෙන තදභිනන්දිතුන්ති. නොහෙතං භන්තෙ ...පෙ... තත්‍රානන්ද යායං සත්තමී විඤ්ඤාණට්ඨිති සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගා, යොනු ඛො ආනන්ද තඤ්ච පජානාති, තස්සාච සමුදයං පජානාති, තස්සාච අත්ථගමං පජානාති, තස්සාච අස්සාදං පජානාති තස්සාච ආදිනවං පජානාති, තස්සාච නිස්සරණං පජානාති, කල්ලංනු ඛො තෙන තදභිනන්දිතුන්ති. නොහෙතං භන්තෙ. තත්‍රානන්ද යදිදං අසඤ්ඤසත්තායතනං, යොනු ඛො ආනන්ද තඤ්ච පජානාති, තස්සච සමුදයං පජානාති, තස්සච අත්ථගමං පජානාති, තස්සච අස්සාදං පජානාති, තස්සච ආදිනවං පජානාති, තස්සච නිස්සරණං පජානාති, කල්ලංනුඛො තෙන තදභින්දිතුන්ති. නොහෙතං භන්තෙ. තත්‍රානන්ද යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං,

---

ආනන්දය, යම්කෙනෙක් ඒ ප්‍රථම විඥනස්ථිතියත් දනිද, ඒ විඥනස්ථිතිහුගේ පහළවීමත් දනිද, ඒ විඥනස්ථිතිහුගේ අස්තඞ්ගමයත් දනිද, ඒ විඥනස්ථිතිහුගේ ආශ්වාදයත් දනිද, ඒ විඥනස්ථිතිහුගේ දොෂයත් දනිද, ඒ විඥනස්ථිතිහුගේ නිර්ගමනයත් දනිද, ඒ පුද්ගලයා විසින් ඒ විඥනස්ථිතිය පිළිබඳව අභිනන්දයකරන්ට හෙවත් ප්‍රණිධිවශයෙන් එහි අභිරමනයකරන්ට කිමෙක සුදුසුදැයි විචාළසේක. ස්වාමින්වහන්ස, මේකාරණය නුසුදුසුමයයි සැලකළේය. ද්විතීයධ්‍යානස්ථිතිවාරාදියෙහිද මෙසේම විස්තරයට පැමිණවියයුතු. ආනන්දය, ඒ සප්තවිඥනස්ථිතීන් අතුරෙන් යම් මේ සත්වෙනි විඥානස්ථිතියක්වේද. ඒනම් සර්වප්‍රකාරයෙන් විඥනඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි බවුන්වඩා ආකිඤ්චඤ්ඤායතනතලයට පැමිණියාවූ දේවියෝයි. ආනන්දය, යමෙක් ඒ සප්තවිඥනස්ථිතියත් දනිද, ඔහුගේපහලවීමත් දනිද, ඔහුගේ අස්තඞ්ගමයත් දනිද, ඔහුගේ ආශ්වාදයත් දනිද, ඔහුගේ දොෂයත් දනිද, ඔහුගේ නිර්ගමනයත් දනිද, ඒ පුද්ගලයා විසින් එය අභිනන්දනයකරන්ට කිමෙක සුදුසුදැයි විචාළසේක, ස්වාමීන්වහන්ස, මේකාරණය නුසුදුසුයයි සැලකළේය. ආනන්දය, එහි යම් ඒ නෙවසංඥනාසංඥායතනයක් වේද.

යොනු ඛො ආනන්ද තඤ්ච පජානාති, තස්සච සමුදයං පජානාති, තස්සච අත්ථගමං පජානාති,තස්සච අස්සාදං පජානාති, ආදිනවං පජානාති,තස්සච නිස්සරණං පජානාති, කල්ලංනු ඛො තෙන තදභිනන්දිතුන්ති. නොහෙතං භන්තෙ. යතො ඛො ආනන්ද භික්ඛු ඉමාසඤ්ච සත්තන්නං විඤ්ඤාණට්ඨිතීනං ඉමෙසඤ්ච ද්වින්නං ආයතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තො හොති, අයං වුච්චති ආනන්ද භික්ඛු පඤ්ඤාවිමුත්තො.

35. අට්ඨඛො ඉමෙ ආනන්ද, විමොක්ඛා. කතමෙ අට්ඨ. රූපී රූපානි පස්සති. අයං පඨමො විමොක්ඛො.

---

ආනන්දය, යමෙක් ඒ නෙවසංඥා නාසංඥායතනයත් දනීද, ඔහුගේ පහලවීමත් දනිද, ඔහුගේ අස්තඞ්ගමයත් දනීද, ඔහුගේ ආශ්වාදයත් දනිද, ඔහුගේ දෙෂයත් දනීද, ඔහුගේ නිර්ගමනයත් දනීද, ඒ පුද්ගලයා විසින් එය අභිනන්දනයකරන්ට කිමෙක සුදුසුදැයි විචාළසේක, ස්වාමීන්වහන්ස, මේ කාරණය නුසුදුසු යයි සැලකළේය. ආනන්දය, යම්කලෙක්හි භික්ෂුතෙමේ මේ සප්තවිඥනස්ථිතීන්ගේද මේ විවිධ ආයතනයන්ගේද පහලවීමද අස්තඞ්ගමයද ආශ්වාදයද දෙෂයද නිර්ගමනයද තත්වූපරිද්දෙන් දැන රූපාදී එක ධර්මයකුත් දැඩිකොට තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් නොගෙණ කෙලෙසුන් කෙරෙන් මිදුනේවේද, ආනන්දය, මේ භික්ෂුතෙමේ ප්‍රඥවහෙතු කොටගෙණ කෙලෙසුන්කෙරෙන් මිදුනේයයි හෙවත් අෂ්ටවිමොක්ෂයන් ප්‍රත්‍යක්ෂ නොකොට ප්‍රඥාබලයෙන්ම නාමකාය රූපකාය දෙදෙනාගේ නොපැවැත්මකොට මිදුනේයයි කියනුලැබේ.

35. ආනන්දය, මේ විමොක්ෂඅටක් වෙත්, ඒ අටකවරහුදයත්. සියසතන් තුළ නීලකසිණාදිවශයෙන් උපදවනලද රූපධ්‍යාන ඇත්තේ පිටතවූ නීලකසිණාදී රූපයන් ධ්‍යානචක්ෂුසින් බලයි, මෙයින් ආධ්‍යාත්මික බාහිරවස්තුකවූ කසිණයන් නිමිතිකොට උපදවනලද ධ්‍යානඇති පුද්ගලයාගේ රූපාවචර ධ්‍යාන චතුස්කය දක්වනලද්දේය. මේ දක්වනලද්දේ පළමුවෙනි විමොක්ෂයයි.

අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධාරූපානි පස්සති, අයං දුතියො විමොක්ඛො. සුභන්තෙව අධිමුත්තො හොති. අයං තතියො විමොක්ඛො. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථො විමොක්ඛො. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමො විමොක්ඛො. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථිකිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජවිහරති. අයං ඡට්ඨො විමොක්ඛො. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමො විමොක්ඛො.

---

සියසතන්තුළ කෙසාදීවස්තූන් නිමිතිකොට නූපදවනලද රූපාවචර ධ්‍යාන නැත්තේ පිටතවූ රූපයන් දකී. මෙසින් පිටත පරිකර්මකොට පිටතම උපදවනලද ධ්‍යානයසම්බන්ධව රූපාවචරධ්‍යානයෝ දක්වන ලදහ, මේකියනලද්දේ දෙවෙනි විමොක්ෂයයි, සුභයයි අධිමුක්තියට පැමිණියේවේද මේතුන්වෙනි විමොක්ෂයයි,(අත්‍යන්ත නිර්මලවූ නීලාදී වර්ණවත් කසිණයන් නිමිතිකොට ඇති ධ්‍යානයෝ දක්වනලදහ,එහි කිසිසේත් අර්පණාසමයෙහි සුභයයි මනස්කාරයක් නැත්තේද යමෙක් අත්‍යන්ත නිර්මලවූ සුභකසිණයක් අරමුණුකොට වාසයකෙරේද ඒ පුද්ගලතෙම යම්හෙයකින්සුභයයි අධිමුක්තියට පැමිණියේනම් එසේ කීමට සුදුසුවෙයි සේයි.) සර්ව්ප්‍ර කාරයෙන් රූපසංඥවන් ඉක්මවී මෙත්ප්‍රතිඝ සංඥවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්‍වය පිළිබඳ සංඥවන්ගේ මෙනෙහිනොකිරීමෙන් ආකාශය අනන්තයයි ආකාශානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසයකෙරේද,මේ සතරවෙනි විමොක්ෂයයි,සර්ව්ප්‍රකාරයෙන් ආකාශානඤ්චායතන සමාපත්තිය ඉක්මවා විඥානය අනන්තයයි විඥානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසයකෙරේද මේ පස්වෙනි විමොක්ෂයයි. සර්ව්ප්‍රකාරයෙන් විඥානඤ්චායතනය ඉක්මවා කිසිවක්නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසයකෙරේද, මේ සවෙනි විමොක්ෂයයි. සර්ව්ප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියටපැමිණ වාසයකෙරේද මේ සත්වෙනි විමොක්ෂයයි,

සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමො විමොක්ඛො. ඉමෙ ඛො ආනන්ද අට්ඨවිමොක්ඛා.

36. යතො ඛො ආනන්ද භික්ඛු ඉමෙ අට්ඨවිමොක්ඛෙ අනුලොමම්පි සමාපජ්ජති, පටිලොමම්පි සමාපජ්ජති, අනුලොම පටිලොමම්පි සමාපජ්ජති යත්ථිච්ඡකං යදිච්ඡකං යාවදිච්ඡකං සමාපජ්ජතිපි වුට්ඨාතිපි ආසවානඤ්ච ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති ආනන්ද භික්ඛු උභතොභාගවිමුත්තො,

---

සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා සංඥාවෙදනාවන්ගේ නිරොධය ඇති නිරොධසමාපත්තියට පැමිණ වාසය කෙරේද මේ අටවෙනි විමොක්ෂයයි. ආනන්දය, මේ දක්වනලද්දේ අෂ්ට විමොක්ෂයයි හෙවත් උත්තම ක්ලෙශ විමුක්තියයි කියනු ලැබේ.

36. ආනන්දය, යම්කලෙක්හි භික්ෂුතෙමේ මේ විමොක්ෂ අටට හෙවත් ක්ලෙශ විමොක්ෂයයි කියනලද මේ සමවත් අටට ප්‍රථම විමොක්ෂයේ පටන් පිළිවෙළින් අවසාන විමොක්ෂය දක්වා අනුලොම් වසයෙන් සමවදීද, අවසානයේ පටන් පිළිවෙළින් ප්‍රථම විමොක්ෂය දක්වා පිළිලොම්වසයෙන් සමවදීද, අනුලොම ප්‍රතිලොමවශයෙනුත් සමවදීද, යම්තැනෙක්හි කැමතිනම් ඒ සියලුතන්හිද යම් සමවතක් කැමතිනම් ඊටදඃම්පමණකල් කැමතිනම් ඒතාක්කලුත් සමවදීද එයින් නැගීසිටීද ආශ්‍රවක්ෂය කිරීමෙන් ආශ්‍රවයන් රහිතවූ චිත්ත විමුක්තියද ප්‍රඥාවිමුක්තියද ඉහාත්මභාවයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට වාසයකෙරේද, ආනන්දය, මේ භික්ෂුතෙමේ දෙකොටසින් හෙවත් අරූපසමාපත්තියෙන් රූපකායින්ද මාර්ගයෙන් නාමකායින්ද මිදුනේයයි කියනුලැබේ, මේසස්නෙහි යම් භික්ෂුකෙනෙක් අෂ්ටවිමොක්ෂයන් කායින් ස්පර්ශකොට වාසයකෙරේද, ඔහුවිසින් ප්‍රඥාවෙන් දැක ආශ්‍රවයෝ ක්ෂයකරණලද්දාහුත් වෙද්ද, ඒ භික්ෂුතෙම උභතොභාගවිමුක්තයයි කියනුලැබේ,

ඉමායච ආනන්ද උභතො භාගවිමුත්තියා අඤ්ඤා උභතො භාගවිමුත්ති උත්තරීතරාවා පණීතතරාවා නත්‍ථීති. ඉදමවොච භගවා අත්තමනො ආයස්මාආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

**මහානිදාන සුත්තං නිට්ඨිතං පඤ්චදසමං,**

---

ආනන්දය, මේ උභතොභාගවිමුක්තියට වඩා අතිශයින් උසස්වූ හෝ අතිශයින් ප්‍රණීතවූ අන්‍ය උභතොභාගවිමුක්තියක් නැත්තේයයි වදාළසේක. භාග්‍යවතුන්වහන්සේ මේ සූත්‍රධර්මය වදාළසේක, සතුටුසිත් ඇතිආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේගේ දේශනාව සතුටින්පිළිගත්තේය.

**පසළොස්වෙනිවූ මහානිදාන සූත්‍රාර්ථව්‍යාඛ්‍යාව**

**මෙතෙකින් නිමියේයි.**

## XVI මහාපරිනිබ්බාණ සුත්තං.

1 එවමෙමසුතං. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වජ්ජී අභියාතුකාමො හොති. සො එවමාහ, අහං ඉමෙ වජ්ජී එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ උච්ඡෙච්ඡාමි වජ්ජී විනාසෙස්සාමි වජ්ජී අනයව්‍යසනං අපාදෙස්සාමි වජ්ජීති..

2. අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වස්සකාරං බ්‍රාහ්මණං මගධමහාමත්තං ආමන්තෙසි. එහි ත්වං බ්‍රාහ්මණ, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ.

---

## මහාපරිනිබ්බාණ සූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

1. මේ සූත්‍රධර්මය මාවිසින් මෙසේ අසනලදි. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර ගිජුකුළුපව්වෙහි වාසයකරණසේක. ඒ කාලයෙහිදී මගධෙශ්වරවූ විදෙහ රාජපුත්‍රවූ අජාසත්රජ තෙමේ වැදෑ රජුන් මැඩපවත්වන්නට යනුකැමැත්තේ වේ. ඒ අජාසත් රජතෙමේ ස්ථානනිෂාද්‍යාදියෙහිදී මෙසේ කියයි. ඒනම්, මොව්හු වැදෑරජහුවෙති. මමවූකලිසාමග්‍රිතාදි ප්‍රසිද්ධරාජර්ද්ධි ඇත්තාවූ හස්තිශිල්පාදියෙහි දක්ෂභාවාදී ප්‍රසිද්ධ මහානුභාවඇත්තාවූ මේ වැදෑ රජුන් මුල්සුන්කරන්නෙමි. වැදෑරජුන් වනසන්නෙමි. වැදෑ රජුන් අක්‍රමවිනාශයයයි කියූ අවැඩට පමුණුවන්නෙමි යනුයි.

2. ඉක්බිත්තෙන් මගධෙශ්වරවූ විදෙහ රාජපුත්‍රවූ අජාසත්රජ තෙමේ මගධරට මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණයා ඇමතුයේය. බ්‍රාහ්මණය, තෝ මෙහි එව, භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹෙව. එළඹ මාගේ වචනයෙන් භාග්‍යවතුන්වහන්සේගේ පාදයන් හිසින් වඳුව. භාග්‍යවතුන්වහන්සේගේ නිරෝගිබවද, නිදුක් බවද සැහැල්ලු පැවතුම් ඇතිබවද ශරීර බලයද පහසු විහරණයද විචාරව.

රාජා භන්තෙ මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවතො පාදෙ සිරසා වන්දති, අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතීති, එවංච වදෙහි, රාජා භන්තෙ මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වජ්ජී අභියාතුකාමො. සො එවමාහ, අහං ඉමෙ වජ්ජී එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ, උච්ඡෙච්ඡාමි වජ්ජී විනාසෙස්සාමි වජ්ජී අනයව්‍යසනං ආපාදෙස්සාමි වජ්ජීති. යථා ච තෙ භගවා ව්‍යාකරෙති තං සාධුකං උග්ගහෙත්වා මමං ආරොචෙය්‍යාසි, නහි තථාගතා විතථං භණන්තීති.

3. එවං හොති ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස පටිස්සුත්වා, භද්දානි භද්දානි යානානි යොජාපෙත්වා, භද්දං භද්දං යානං අභිරුහිත්වා භද්දෙහි භද්දෙහි යානෙහි රාජගහම්හා නිය්‍යාසි.

---

නැවතද ස්වාමීන්වහන්ස, මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත් රජතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ සිරිපා හිසින් වඳී. භාග්‍යවතුන්වහන්සේගේ නිරෝගිබවද, නිදුක් බවද, සැහැල්ලු පැවතුම්ඇති බවද, ශරීර බලයද, පහසු විහරණයද, විචාරයයි දන්වව. තවද මෙසේත් කියව. ස්වාමීන්වහන්ස, මගධෙශ්වරවූ විදෙහරාජපුත්‍රවූ අජාසත් රජතෙමේ වැද්දරජුන් මැඩපවත්වන්නට යනු කැමැත්තේ වේ. ඒ අජාසත්රජතෙමේ ස්ථානනිෂාද්‍යාදියෙහිදී මෙසේ කියයි. මම ප්‍රසිඬ මහත් රාජර්ඬි ඇත්තාවූ ප්‍රසිඬ මහත් ආනුභාවඇත්තාවූ මේ වැද්දරජුන් මූල්සුන් කරන්නෙමි. වැදී රජුන් වනසන්නෙමි. වැද්දරජුන් අක්‍රම විනාශයයි කියූ අවැඩට පමුණුවන්නෙමි යනුයි. භාග්‍යවතුන්වහන්සේ තට යම් පරිද්දෙකින් ප්‍රකාශ කරණසේක්ද ඒ ප්‍රකාශකළපරිද්ද මනාකොට ඉගෙණ මට කියව. තථාගතයන්වහන්සේලා අවැඩට හිතවූහිස් වචනයක් නොවදාරන්නාහුයසිද කීයේය.

3 පින්වතුන්වහන්ස, ඒ මැනවයි මගධමහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණතෙමේ මගධෙශ්වරවූ විදෙහරාජපුත්‍රවූ අජාසත්රජහටපිළිව දන්දී යහපත් යහපත් යානාවන් යොදවා යහපත් යහපත් යානාවකට නැගී. යහපත් යහපත් යානාවලින් රජගහනුවරින්පිටත්විය

යෙන ගිජ්ඣකූටො පබ්බතො තෙන පායාසි, යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව යෙනභගවා තෙනුපසඞ්කමි, උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථංසාරාණීයංවීතිසාරෙත්වාඑකමන්තංනිසීදි, එකමන්තංනිසින්නො ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවන්තං එතදවොච. රාජා භො ගොතම මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භොතො ගොතමස්ස පාදෙ සිරසා වන්දති, අප්පාබාධංඅප්පාතඞ්කංලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවං වදෙති රාජා භො ගොතම මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වජ්ජී අභියාතුකාමො. සො එවමාහ, අහං ඉමෙ වජ්ජී එවංමහිද්ධිකෙ එවං මහානුභාවෙ, උච්ඡෙච්ඡාමි වජ්ජී විනාසෙස්සාමි වජ්ජී අනයව්‍යසනං ආපාදෙස්සාමි වජ්ජීති.

4. තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො භගවතො පිට්ඨිතො ඨිතො හොති. භගවන්තං වීජයමානො,

---

ගිජුකුළුපව්ව යම් තැනෙක්හිද එතනට ගියේය. යානාවෙන් යායුතු භූමියයම්පමණද ඒ පමණතැන් යානාවෙන්ගොස් යානාවෙන් බැස පයින්ම භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවියයුතුවූ එහෙයින්ම සිහිකටයුතුවූ කථාවකොටනිමවා එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ මගධමහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. භවද් ගෞතමයන්වහන්ස, මගධේශ්වරවූ වෛදෙහි පුත්‍රවූ අජාසත්රජතෙමේ භවද් ගෞතමයන්වහන්සේගේ පාදයන් හිසින්වඳී. මෙයින් ගෞරවාතිශය ප්‍රණිපාතය දක්වනලදී. භාග්‍යවතුන්වහන්සේගේ නිරෝගී බවද, නිදුක් බවද, සැහැල්ලු පැවතුම් ඇතිබවද, ශරීරබලයද, පහසු විහරණයද විචාරයි. භවද් ගෞතමයන්වහන්ස, මගධේශ්වරවූ වෛදෙහිපුත්‍රවූඅජාසත්රජතෙමේවැදෑරජුන්මැඩපවත්වන්ට යනුකැමැත්තේවේ. ඒරජතෙමේමෙසේකියයි. මොව්හුවැදෑරජහුවෙති. ප්‍රසිද්ධමහත්රාජර්ද්ධිඇත්තාවූප්‍රසිද්ධමහානුභාවඇත්තාවූ මේවැදෑරජුන් මුල්සුන්කරන්නෙමි. වැදෑරජුන් නසන්නෙමි. වැදූරජුන් අක්‍රම විනාශයයි කියූ ඇවැඩට පමුණුවන්නෙමියි කියායි.

4. ඒකාලයෙහිදී ආනන්‍දආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේටපවන්සලමින්භාග්‍යවතුන්වහන්සේගේපිටිපස වැඩඋන්නේවේ.

අථඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. කින්ති තෙ ආනන්ද සුතං, වජ්ජී අභිණ්හං සන්නිපාතා සන්නිපාතබහුලාති. සුතමෙතං භන්තෙ වජ්ජී අභිණ්හං සන්නිපාතා සන්නිපාතබහුලාති. යාවකීවඤ්ච ආනන්ද වජ්ජී අභිණ්හං සන්නිපාතා සන්නිපාතබහුලා භවිස්සන්ති, වුඩ්ඪියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි. කින්ති තෙ ආනන්ද සුතං, වජ්ජී සමග්ගා සන්නිපතන්ති සමග්ගා වුට්ඨහන්ති සමග්ගා වජ්ජීකරණීයානි කරොන්තීති. සුතමෙතං භන්තෙ ....පෙ.... සමග්ගා වජ්ජී කරණීයානි කරොන්තීති. යාවකීවඤ්ච ආනන්ද වජ්ජී සමග්ගා සන්නිපතිස්සන්ති. සමග්ගා වුට්ඨහිස්සන්ති සමග්ගා වජ්ජී කරණීයානි කරිස්සන්ති, වුඩ්ඪියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.

---

ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ ඇමතූසේක. ආනන්දය, වැදූරජහු නිතර රැස්වීම් ඇත්තෝ එහෙයින් ම රැස්වීම් බහුලකොට ඇත්තෝයයි මේ කාරණය තොප විසින් කෙසේ නම් අසනලද්දේදැයි විචාලසේක. ස්වාමින්වහන්ස, වැදූරජහු නිතර රැස්වීම් ඇත්තෝ රැස්වීම් බහුලකොට ඇත්තෝයයි මේ කාරණය මා විසින් අසනලද්දේය. ආනන්දය, යම්තාක්කල් වැදූරජහු නිතර රැස්වීම් ඇත්තෝ රැස්වීම් බහුලකොට ඇත්තෝ වන්නාහුද ආනන්දය, ඒ වැදූරජුන්ගේ අභිවෘඩ්ඩියම කැමතිවිය යුතුයි. හෙවත් අවශ්‍යයෙන් දියුණුවවන්නේයයි බලාපොරොත්තුවියයුතු. පිරිහීමක් නොවේමය. ආනන්දය, වැදූරජහු සමගිව රැස්වෙත්ද. සමගිව නැගිටිත්ද වැදූරජහු සමගිව කටයුතු කෙරෙත්ද යන මේ කාරණය තා විසින් කෙසේනම් අසනලද්දේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, සෙස්ස ප්‍රථමවාරයෙහි මෙනි. වැදූරජහු සමගිව කටයුතු කෙරෙත්යයි මේ කාරණය මා විසින් අසනලද්දේය. ආනන්දය, යම්තාක්කල් වැදූරජහු සමගිව රැස්වන්නාහුද, සමගිව නැගිටින්නාහුද, වැදූරජහු සමගිවකටයුතු කරන්නාහුද, ආනන්දය, ඒ වැදූරජුන්ගේ අභිවෘඩ්ඩියම අවශ්‍යයෙන් කැමතිවියයුතු. පිරිහීමක් නොවේමයයි වදාළේය.

කින්ති තෙ ආනන්ද සුතං වජ්ජී අප්පඤ්ඤත්තං න පඤ්ඤාපෙන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දන්ති, යථා පඤ්ඤත්තෙන පොරාණෙ වජ්ජිධම්මෙ සමාදාය වත්තන්තීති. සුතං මෙතං භන්තෙ වජ්ජී අප්පඤ්ඤත්තං න පඤ්ඤාපෙන්ති, පඤ්ඤත්තං න. සමුච්ඡින්දන්ති, යථා පඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදාය වත්තන්තීති. යාවකීවඤ්ච ආනන්ද වජ්ජී අප්පඤ්ඤත්තං න පඤ්ඤාපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථා පඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදාය වත්තිස්සන්ති, වුඩ්ඩියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි. කින්ති තෙ ආනන්ද සුතං වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා තෙ සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති තෙසඤ්ච සොතබ්බං මඤ්ඤන්තීති. සුතං මෙතං භන්තෙ වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා තෙ සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති තෙසඤ්ච සොතබ්බං මඤ්ඤන්තීති.

---

ආනන්දය, වැදූරජහු නොපණවනලද නීතියක් නොපණවත්ද. හෙවත්අමුතු බලිදනාදියක් නියම නොකෙරේද, පණවනලද නීතියක් සමුච්ඡෙදනොකෙරෙත්දපණවනලද්දවූපෞරාණිකවජ්ජීරාජධර්මයන් සමාදන්ව හෙවත් පිළිගෙණ පවතින්ද යන මේ කාරණය තා විසින් කෙසේ නම් අසන ලද්දේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, වැදූරජහු නොපණවනලද්දක් නොපණවත්ය. පණවනලද්දක් සමුච්ඡෙද නොකෙරෙත්ය පණවනලද වජ්ජීරාජ ධර්මයන් පිළිගෙණ පවතිත්ය යන මේ කාරණය මා විසින් අසනලද්දේය. ආනන්දය, යම්තාක්කල් වැදූරජහු නොපණවනලද බලිදනාදී නීතියක් නොපණවත්නාහුද පණවනලද්දක් සමුච්ඡෙදත් නොකරන්නාහුද පණවනලද වජ්ජීරාජ ධර්මයන් පිළිගෙණ පවත්නාහුද ආනන්දය, ඒ වැදූරජුන්ගේ අභිවෘද්ධියම කැමතිවිය යුත්තිය. පිරිහීමක් නොවේයයි වදාළසේක. ආනන්දය, වැදූරජහු වැදූරජුන්ගේ යම් ඒ මහලු වැදූරජහුවෙත්ද ඔවුන්ට සත්කාර කෙරෙත්ය, ගරු කෙරෙත්ය, බුහුමන් කෙරෙත්ය, ඔවුන් පුදත්ය ඔවුන්ගේ අනුශාසනාදිය ඇසියයුතුකොට සිතත්ය යන මේ කාරණය තා විසින් කෙසේනම් අසනලද්දේදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, වැදූරජහු වැදූරජුන්ගේ යම් ඒ මහලු වැදූරජහු වෙත්ද, ඔවුන්ට සත්කාර කෙරෙත්ය, ගරු කෙරෙත්ය, බුහුමන් කෙරෙත්ය, ඔවුන් පුදත්ය, ඔවුන්ගේ අනුශාසනාදිය ඇසියයුතුකොට සිතත්ය, යන මේ කාරණය මා විසින් අසනලද්දේය.

යාවකීවඤ්ච ආනන්ද වජ්ජීයෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා තෙ සක්කරිස්සන්ති ගරුකරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුඩ්ඪියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහාති. කින්ති තෙ ආනන්ද සුතං වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො තා න ඔක්කස්ස පසය්හ වාසෙන්තීති. සුතං මෙතං භන්තෙ වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො තා න ඔක්කස්සපසය්හ වාසෙන්තීති. යාවකීවඤ්ච ආනන්ද වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො තා න ඔක්කස්ස පසය්හ වාසෙස්සන්ති, වුඩ්ඪියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි. කින්ති තෙ ආනන්ද සුතං වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජීචෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච, තානි සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙන්තීති.

---

ආනන්දය, යම්තාක්කල් වැදෑරජහු වැදෑරජුන්ගේ යම් ඒ මහලු වැදෑරජහු වෙත්ද, ඔවුන්ට සත්කාර කරන්නාහුද, ගරුකරන්නාහුද, බුහුමන් කරන්නාහුද, ඔවුන් පුදන්නාහුද, ඔවුන්ගේ අනුශාසනාදියත් ඇසියයුතුකොට සිතන්නාහුද මේ කාරණයෙන් ඒ වැදෑරජුන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු වියයුතු. පිරිහීමක් නොවේයයි වදාළෝ. ආනන්දය, වැදෑරජහු පුරුෂාන්තරගතවූ යම් ඒ කුලස්ත්‍රීහුවෙත්ද, පුරුෂාන්තරගතනොවූ යම් ඒ කුලකුමාරිහු වෙත්ද, ඔවුන් තර්ජනයකොට බලාත්කාරයෙන් වාසය නොකරවත්ය යන මේ කාරණය තා විසින් කෙසේනම් අසන ලද්දේදැයි විචාළසේක. ස්වාමීන්වහන්ස, වැදෑරජහු යම් ඒ කුලස්ත්‍රීහුවෙද්ද, යම් ඒ කුල කුමාරිහුවෙද්ද, ඔවුන්ට තර්ජනයකොට බලාත්කාරයෙන් වාසය නොකරවත්ය යන මේ කාරණය මා විසින් අසනලද්දේය. ආනන්දය, යම් තාක්කල් වැදෑරජහු යම් ඒකුලස්ත්‍රීහුවෙද්ද කුලකුමාරීහු වෙද්ද, ඔවුන්ට තර්ජනයකොට බලාත්කාරකොට වාසයනොකරවන්නාහුද. ආනන්දය, ඒ වැදෑරජුන්ගේ අභිවෘද්ධියම කැමතිවිය යුත්තීය. පිරිහීමක් නොවේමයයි වදාළේය. ආනන්දය, වැදෑරජහු වැදෑරජුන්ගේ නුවරතුළවූද, නුවරින් පිටතවූද, දෙවාලයයි සම්මත යම්ඒ වජ්ජි චෛත්‍යයෝ වෙත්ද, ඒ චෛත්‍යාදීන්ට සත්කාරකෙරෙත්ය. ගරුකෙරෙත්ය. බුහුමන් කෙරෙත්ය. ඒ චෛත්‍යයන් පුදත්ය කියාද. ඒ චෛත්‍යාදියට පෙර දුන්නාවූද, පෙර කරණලද්දාවූද, දැහැමි බිලි පූජාවන් නොපිරිහෙලත්ය යන මේකාරණය තාවිසින් කෙසේනම් අසනලද්දේ දැයි විචාළසේක.

සුතමෙතං භන්තෙ වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජීචෙතියානි, අබ්භන්තරානි චෙව බාහිරානිච, තානි සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙන්තීති. යාවකීවඤ්ච ආනන්ද වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජීචෙතියානි, අබ්භන්තරානි චෙව බාහිරානිච, තානි සක්කරිස්සන්ති ගරුකරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති, තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙස්සන්ති, වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි. කින්ති තෙ ආනන්ද සුතං වජ්ජීනං අරහන්තෙසු ධම්මිකාරක්ඛාවරණගුත්ති සුසංවිහිතා. කින්ති අනාගතාච අරහන්තො විජිතං ආගච්ඡෙය්‍යුං ආගතාච අරහන්තො විජිතෙ ඵාසුං විහරෙය්‍යුන්ති.

---

ස්වාමීන්වහන්ස, වැදැරජහු වැදැරජුන්ගේ නුවරතුළවූද නුවරින් පිටතවූද, යම් ඒ වජ්ජී චෛත්‍යයෝ වෙත්ද; ඔවුන්ට සත්කාරකෙරෙත්ය, ගරුකෙරෙත්ය, බුහුමන් කෙරෙත්ය, ඔවුන් පුදත්ය. ඒ චෛත්‍යාදීන්ට පෙරදුන්නාවූද, පෙරකරණ ලද්දාවූද, දැහැමි බිලිපූජා නොපිරිහෙලත්යයන මේ කාරණය මා විසින් අසනලද්දේය. ආනන්දය, යම්තාක්කල් වැදැරජහු වැදැරජුන්ගේ නුවරතුළවූද, නුවරින් පිටතවූද යම් ඒ චෛත්‍යයෝ වෙත්ද, ඔවුන්ට සත්කාරකරන්නාහුද, ගරුකරන්නාහුද, බුහුමන්කරන්නාහුද, ඔවුන් පුදන්නාහුද, මේ චෛත්‍යාදීන්ට පෙරරජදින් විසින් දෙනලද්දාවූද පෙරකරණලද්දාවූද, දැහැමි බිලි පූජා නොපිරිහෙලන්නාහුද, ආනන්දය ඒ වැදැරජුන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු වියයුතු. පිරිහීමක් නොවේයයි වදාළේය. ආනන්දය, වැදැරජුන්ගේ රහතුන් කෙරෙහි හෙවත් දක්ෂිණාවට සුදුසුවූ මහණබමුණන් කෙරෙහි ධාර්මිකවූ ආරක්ෂාවරණයයි කියූ රක්ෂාකිරීම මනාකොට පිහිටුවන ලද්දීයකියාද, කිමෙක්ද නොපැමිණියාවූද රහත්හු සියරටට එන්නහුයකියාද පැමිණියාවූද රහත්හු සියරටෙහි පහසුසේ වාසය කරන්නාහුය කියාද මේකාරණය තාවිසින් කෙසේ අසනලද්දේදැයි විචාළසේක.

සුතං මෙතං භන්තෙ වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණ
ගුත්ති සුසංවිහිතා, කින්ති අනාගතා ච අරහන්තො විජිතං ආගච්ඡෙ
ය්‍යුං ආගතා ච අරහන්තො විජිතෙ ඵාසුං විහරෙය්‍යුන්ති. යාවකීවඤ්ච
ආනන්ද වජ්ජීනං අරහන්තෙසු ධම්මිකාරක්ඛාවරණගුත්ති සුසං
විහිතා භවිස්සති, කින්ති අනාගතා ච අරහන්තො විජිතං ආග
ච්ඡෙය්‍යුං ආගතා ච අරහන්තො විජිතො ඵාසුං විහරෙය්‍යුන්ති. වුඩ්ඪි
යෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානීති.

5. අථ ඛො භගවා වස්සකාරං බ්‍රාහ්මණං මගධමහාමත්තං ආමන්
තෙසි, එකමිදාහං බ්‍රාහ්මණ සමයං වෙසාලියං විහරාමි සාරන්දදෙ චෙ
තියෙ, තත්‍රාහං වජ්ජීනං ඉමෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙසිං,
යාවකීවඤ්ච බ්‍රාහ්මණ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා වජ්ජීසු ඨස්ස
න්ති, ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු වජ්ජී සන්දිස්සන්ති,

---

ස්වාමීන්වහන්ස, වැදෑරජුන්ගේ රහතුන්කෙරෙහි ධාර්මිකවූ ආරක්ෂා
වරණයයි කියූ ගොපනය මනාකොට විධානකරණලද්දීදැයිද
පෙරනොපැමිණියාවූද, රහත්හු සියරටට එන්නාහුය කියාද
පැමිණියාවූද, රහත්හු සියරටෙහි පහසුසේ වාසයකරන්නාහුය කි
යාද මේ කාරණය මා විසින් අසනලද්දේය, ආනන්දය, යම්තාක්
කල් වැදෑරජුන්ගේ රහතුන්කෙරෙහි ධාර්මික ආරක්ෂාවරණයයි
කියනලද ගොපනය මනාකොට විධානකරණලද්දීවන්නීද කිමෙක.
පෙරනොපැමිණියාවූද. රහත්හු සියරටට එන්නාහුද; ආවාවූද.
රහත්හු සියරටෙහි පහසුසේ වාසයකරන්නාහුද, ආනන්දය, ඒ
වැදෑරජුන්ගේ අභිවෘද්ධියම කැමතිවිය යුත්තිය. පිරිහීමක් නොවේ
යයි වදාළසේක.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මගධමහාමාත්‍යවූ වස්ස
කාර බ්‍රාහ්මණයා ඇමතූසේක. බ්‍රාහ්මණය, මම එක්කාලයෙක්හි
විසාලාමහනුවර සාරන්දදනම් යක්ෂයාගේ නිවාසස්ථානයෙහි කළ
හෙයින් සාරන්දදනම්වූ චෛත්‍යයෙහි වාසයකෙළෙමි. මම එහිදී
වැදෑරජුන්ට මේ අපරිහාණීය ධර්මසත දෙශනාකෙළෙමි. බ්‍රාහ්මණය,
යම්තාක්කල් මේ අපරිහාණීය ධර්මසත වැදෑරජුන්කෙරෙහි සිටින්නා
හුද වැදෑරජහු මේ අපරිහාණීය ධර්මසතෙහි මනාකොට පිහිටීම්වශ
යෙන් දක්නාලැබෙද්ද.

වුඩ්ඪියෙව බ්‍රාහ්මණ වජ්ජීනං පාටිකංඛා නො පරිහානීති. එවං වුත්තෙ වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවන්තං එතද වොච. එකමෙකෙනපි භො ගොතම අපරිහානියෙන ධම්මෙන සමන්නාගතානං වජ්ජීනං වුඩ්ඪියෙව පාටිකංඛා නො පරිහානි, කො පන වාදො සත්තහි අපරිහානියෙහි ධම්මෙහි. අකරණීයාව භො ගොතම වජ්ජීනං රඤ්ඤා මාගධෙන අජාතසත්තුනා වෙදෙහිපුත්තෙන යදිදං යුද්ධස්ස අඤ්ඤත්‍ර උපලාපනාය අඤ්ඤත්‍ර මිථුභෙදා. හන්ද චදානි මයං භො ගොතම ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති. යස්සදානි ත්වං බ්‍රාහ්මණ කාලං මඤ්ඤසීති. අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි.

6. අථ ඛො භගවා අචිරපක්කන්තෙ වස්සකාරෙ බ්‍රාහ්මණෙ මගධමහාමත්තෙ ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි.

---

බ්‍රාහ්මණය, ඒ වැදූරජුන්ගේ අභිවෘඩියම කැමතිවිය යුත්තීය, පිරිහීමක් නොවේයයි වදාළසේක. මෙසේ වදාළකල්හි මගධමහාමාත්‍ය වූ වස්සකාරබ්‍රාහ්මණතෙම භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. භාග්‍යවතුන්වහන්ස, එකි එකි අපරිහාණීය ධර්මයකින්ත්‍යුක්තවූ වැදැරජුන්ගේ අභිවෘඩිය බලාපොරොත්තු වියයුත්තීය. පිරිහීමක්නොවෙයි, යථොක්ත අපරිහාණීය ධර්‍මසතින්ම සමන්විතවූ වැදැරජුන්ගේ පිරිහීමක් නොව අභිවෘඩියක්ම වෙයි යනු කියනුම කවරේද. භවද් ගෞතමයන්වහන්ස, මගධෙශ්වරවූ වෙදෙහි පුත්‍රවූ අජාසත්රජහු විසින් වැදැරජුන්සමග යුඩයෙන් යම් මේ පසමිතුරන් ගැණීමක් වේනම් එය හිරණ්‍ය සවණීාදිය යවා සඞ්ග්‍රහකිරීමක් නැතිව ඔවුනොවුන් භෙදයටපැමිණවීමක් නැතිව නොකටයුත්තීය. භවද් ගෞතමයන්වහන්ස අපි බොහෝ කටයුතු ඇත්තම්හ, බොහෝවූ අවශ්‍යකතිව්‍යදෑ ඇත්තම්හ, එබැවින් දැන් අපි යම්හයි සැලකළේය. බ්‍රාහ්මණය, දැන් තෝ යමක් සම්බන්ධව සුදුසුකල්යයි දන්නෙහිනම් එය හෙවත් ඒ ගමන කරවයි වදාළේය. ඉක්බිත්තෙන් මගධමහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතයට අභිනන්දනයකොට අනුමොදන්ව හුනස්නෙන් නැගිටගියේය.

6. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මගධමහාමාත්‍යවූ වස්සකාරබ්‍රාහ්මණයා බැහැරගිය නොබෝවේලාවූකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් ඇමතූසේක,

ගච්ඡ ත්වං ආනන්ද යාවතිකා භික්ඛූ රාජගහං උපනිස්සාය විහරන්ති,තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙහීති.එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යාවතිකා භික්ඛූ රාජගහං උපනිස්සාය විහරන්ති තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි.එකමන්තං ඨිතො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච.සන්නිපතිතො භන්තෙ භික්ඛුසඞ්ඝො,යස්ස'දානි භන්තෙ භගවා කාලං මඤ්ඤසීති. අථ ඛො භගවා උට්ඨායාසනා යෙන උපට්ඨානසාලා තෙනුපසඞ්කමි,උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. සත්තවො භික්ඛවෙ අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි, තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං.

---

ආනන්දය, තෝ යව, යම්පමණ භික්ෂූහු රජගහනුවර ඇසුරු කොට වාසයකෙරෙත්ද ඒ සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවෙහි රැස්කරවයි වදාළේය. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි කියා ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දී යම්පමණ භික්ෂූහු රජගහනුවර ඇසුරුකොට වාසය කෙරෙද්ද, ඒ සියලු භික්ෂූන් උපස්ථාන ශාලායෙහි රැස්කරවා භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය, එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ ආනන්දආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. ස්වාමීන්වහන්ස, භික්ෂුසඞ්ඝතෙමේ රැස්කරවනලද්දේය, භාග්‍යවතුන්වහන්සේ දැන් යමක්සම්බන්ධව කල් දන්නාසේක්නම් එය කරණුමැනවයි සැලකළේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ හුනස්නෙන් නැගිටඋපස්ථානශාලාව යම්තැනෙක්හිද එතනට එළඹිසේක. එළඹ පණවනලද අස්නෙහි වැඩහුන්සේක, භාග්‍යවතුන්වහන්සේ වැඩහිඳ භික්ෂූන් ඇමතූසේක, මහණෙනි,මේ අපරිහාණීය ධර්මසතක් දෙශනාකරන්නෙමි.එය අසව්. මනාකොට මෙනෙහිකරව් කියන්නෙමියි වදාළෝ. ස්වාමීන්වහන්ස, ඒ මැනවයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දුන්හ.

භගවා එතදවොච. යාවකීවඤ්ච බො භික්ඛවෙ භික්ඛූ අභිණ්හං සන්නිපාතා සන්නිපාතබහුලා භවිස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකංඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ සමග්ගා සන්නිපතිස්සන්ති සමග්ගා වුඪහිස්සන්ති සමග්ගා සඞ්ඝකරණීයානි කරිස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකංඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ අප්පඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති; යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තිස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකංඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ යෙතෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා තෙ සක්කරිස්සන්ති ගරුකරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති.

---

භාග්‍යවතුන්වහන්සේ මේ ධර්මය වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් නිතර රැස්වන්නාහු වෙත්ද, බොහෝසෙයින් රැස්වන්නාහු වෙද්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘඬියක්ම කැමතිවියයුතුයි, පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් සමගිව රැස්වන්නාහුවෙද්ද, සමගිව නැගීසිටින්නාහුද සමගිව සඞ්ඝයාවිසින් කටයුතුකර්මකරන්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘඬියක්ම කැමතිවිය යුත්තීය. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් තථාගතයන්වහන්සේවිසින් නොපණවනලද්දක් නොපණවන්නාහුද, පණවනලද ශික්ෂාධර්මය මුල්සුන්නොකරන්නාහුද, පණවනලද පරිදිවූ ශික්ෂාපදයන්හි සමාදන්ව, හෙවත් ආභිසමාචාරික ශික්ෂාය ආදිබ්‍රහ්මචරියක ශික්ෂාය යන ද්විප්‍රකාර ශික්ෂාධර්මයන් නොපිරිහෙලා පවත්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘඬියක්ම කැමතිවියයුත්තීය. පිරිහීමක් නොවේයයි වදාළේය, මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් චිරරාත්‍රිඥන්නාවූ පැවිදිවූ බොහෝකල් ඇත්තාවූ සඞ්ඝයාගේ පියනතුරේ පිහිටියාවූ සඞ්ඝයා ඒ ඒ ශාසනකෘත්‍යයන්ට පමුණුවන හෙයින් සඞ්ඝපරිනායකවූ යම් ඒ ස්ථවිරභික්ෂූහුවෙද්ද, උන්වහන්සේලාට සත්කාර කරන්නාහුද ගරු කරන්නාහුද බුහුමන්කරන්නාහුද, උන්වහන්සේලා පුදන්නාහුද.

තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං
පාටිකඞ්ඛා, නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ උප්ප
න්නාය තණ්හාය පොනොභවිකාය න වසං ගච්ඡන්ති, වුඩ්ඪියෙව භික්ඛ
වෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ
ආරඤ්ඤකෙසු සෙනාසනෙසු සාපෙඛා භවිස්සන්ති, වුඩ්ඪියෙව
භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ
භික්ඛූ පච්චත්තං යෙව සතිං උපට්ඨාපෙස්සන්ති. කින්ති අනාගතා ච
පෙසලා සබ්‍රහ්මචාරී ආගච්ඡෙය්‍යුං, ආගතා ච පෙසලා සබ්‍රහ්මචාරී ඵාසුං
විහරෙය්‍යුන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරි
හානි. යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛූසු
ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්
දිස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

---

උන්වහන්සේලාගේ ධර්මානුශාසනාදිය ඇසියයුතුකොමත් සිතත්
නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ ශාසනාභිවෘද්ධියම කැමතිවිය
යුත්තීය. පිරිහීමක් නොවේයයි වදාළසේක, මහණෙනි, භික්
ෂූහු යම්තාක්කල් පුනර්භවය ඇතිකරන්නාවූ උපන්තෘෂ්ණා
හුගේ වසයට නොපැමිණෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම
කැමතිවිය යුත්තීය. පිරිහීමක් නොවේයයි වදාළසේක, මහණෙනි,
භික්ෂූහු යම්තාක්කල් වනසෙනසුන්හි අපෙක්ෂාසහිත වන්නාහු
වෙද්ද හෙවත් භාවනාභියොගීව වාසයකරන්නාහුද, මහණෙනි, ඒ භික්
ෂූන්ගේ අභිවෘද්ධියක්ම කැමතිවියයුක්තීය පිරිහීමක්නොවේයයි වදාළ
සේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් සියසතන්තුළම සිහිය
එළඹ සිටුවා වාසයකෙරේද පෙරනොපැමිණියාවූ ප්‍රියශිලි සබ්‍රහම
චාරීහු එන්නාහුනම් ඉතා යෙහෙක පැමිණියාවූද ප්‍රියශිලි සබ්‍රහ්මචා
රීහු පහසුසේ වාසයකරන්නාහුනම් යෙහෙක්යයි සලකන්නාහුද,
මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභවෘද්ධියම කැමතිවිය යුත්තීය. පිරිහී
මක්නොවේයයි වදාළසේක. මහණෙනි, යම්තාක්කල් මේ සප්ත අප
රිහාණීය ධර්මයෝ භික්ෂූන්කෙරෙහි ස්ථිරව සිටින්නාහුද මේ සප්ත
අපරිහාණීය ධර්මයන්කෙරෙහි භික්ෂූහු දක්නාලැබෙත්ද, මහණෙනි,
ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවිය යුත්තීය. පිරිහීමක් නො
වේයයි වදාළසේක.

7. අපරෙපි බො භික්ඛවෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති බො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච, යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ න කම්මාරාමා භවිස්සන්ති, න කම්මරතා. න කම්මාරාමතං අනුයුත්තා, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ න භස්සාරාමා භවිස්සන්ති න භස්සරතා න භස්සාරාමතං අනුයුත්තා, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ න නිද්දාරාමා භවිස්සන්ති න නිද්දාරතා න නිද්දාරාමතං. අනුයුත්තා, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ න සඞ්ගණිකාරාමා භවිස්සන්ති න සඞ්ගණිකරතා න සඞ්ගණිකාරාමතං අනුයුත්තා.

---

7. මහණෙනි, අන්‍යවූද අපරිහාණීය ධර්ම සතක් දෙසනාකරන්නෙමි. ඒ ධර්මය අසව් මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි වදාළසේක. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්හ, භාග්‍යවතුන්වහන්සේ මේ ධර්මය වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් කර්මයන්හි ඇලෙන්නෝ නොවන්නාහුද, කර්මයන්හි අභිරතිඇත්තෝ නොවන්නාහුද, කර්මාභිරමනයෙහි නොයෙදුනාහු වන්නාහුද. මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුත්තීය. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් ක්‍රීඩාභාෂ්‍යවිනොදයයි කියනලද මහාකථායෙහි ඇලෙන්නෝ නොවන්නාහුද, මහාකථාවෙහි ඇලුනාහු නොවන්නාහුද, හාස්‍යක්‍රීඩාසඞ්ඛ්‍යාත මහාකථායෙහි නොයෙදුනාහු වෙසෙත්ද මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියක්ම කැමතිවියයුතු. පිරිහීමක් නොවේයයි වදාළේය. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් ඊනම්ඩයෙන් මැඩිම්වශයෙන් නිද්‍රාභිරමනයඇත්තෝ නොවන්නාහුද, නිද්‍රාවෙහි ඇලුනෝ නොවන්නාහුද, නිද්‍රාරාමතාවයෙහි නොයෙදුනෝ වන්නාහුද. මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුත්තීය. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් සමූහයාකෙරෙහි සිත්අලවා වාසයකිරීමක් නැත්තෝවන්නාහුද, ගණසඞ්ගණිකාවෙහි ඇලුනෝ නොවන්නාහුද, ජනසමූහයාකෙරෙහි ඇලීම්බවෙහි නොයෙදුනාහු වෙද්ද.

වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ න පාපිච්ඡා භවිස්සන්ති න පාපිකානං ඉච්ඡානං වසං ගතා, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ න පාපමිත්තා භවිස්සන්ති න පාපසහායා. න පාපසම්පවඞ්කාත වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ න ඔරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරා වොසානං ආපජ්ජිස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛූසු ඨස්සන්ති ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

---

මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තුවියයුතු. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් සිය සතන්තුළ විද්‍යමානනොවූ ගුණසම්භාවනා වශයෙන් ලාමකවූ පවිටු අදහස්ඇත්තෝ නොවන්නාහුද, ලාමක.ඊර්ෂ්‍යාඇත්තවුන්ගේ වසයට නොපැමිණියාහු වන්නාහුද. මහණෙනි,ඒ භික්ෂූන්ගේඅභිවෘද්ධියක්ම කැමතිවියයුත්තිය. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි,භික්ෂූහු යම්තාක්කල් පවිටු මිතුරන්ඇත්තෝ නොවන්නාහුද, පාපී යහලුවන්ඇත්තෝ නොවන්නාහුද,පාපයන්කෙරෙහි නැම්මබැවීඇත්තෝ නොවන්නාහුද.මහණෙනි,ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුත්තීය. පිරිහීම්ක්නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් ස්වල්පමාත්‍රවූ විශෙෂාධිගමයකින් අර්හත්ඵලයෙන් මොබ පවත්නා ධ්‍යානමාර්ගාදියකින් අතර හෙවත් රහත්බවට නොපැමිණ අවසානයයි කියූ නිෂ්ඨාවට නොපැමිණෙන්නාහුද. මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුතුයි.පිරිහීමක්නොවේයයි වදාළසේක. මහණෙනි, යම්තාක්කල් මේ අපරිහාණීය ධර්ම සත භික්ෂූන්කෙරෙහි සිටින්නාහුද,මේ සප්තාපරිහාණීය ධර්මයන්කෙරෙහි භික්ෂූහු දක්නාලැබෙත්ද මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුතුයි. පිරිහීමක් නොවේයයි වදාළසේක.

8. අපරෙපි බො භික්ඛවෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි
තං සුණාථ සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති බො
තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුංභගවා එතදවොච. යාවකීවඤ්ච
භික්ඛවෙ භික්ඛූ සද්ධාභවිස්සන්ති, හිරිමනා භවිස්සන්ති, ඔත්තාපි නො
භවිස්සන්ති, බහුස්සුතා භවිස්සන්ති, උපට්ඨිතසතී භවිස්සන්ති, පඤ්ඤ
වන්තො භවිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො
පරිහානි............පෙ.............යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා
ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු සත්තසු අපරිහානියෙසු ධම්මෙසු
භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො
පරිහානි.

9. අපරෙපි බො භික්ඛවෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි
තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති
බො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුංභගවා එතදවොච.

---

8. මහණෙනි, අන්‍යවූද අපරිහාණීය ධර්‍ම සතක් තොපට දෙසනා
කරන්නෙමි. ඒ ධර්‍මය අසව්. මනාකොට මෙනෙහිකරව්. කියන්නෙ
මියි වදාළෝ. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන්
වහන්සේට පිළිවදන්දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මේ ධර්‍මය වදාළ
සේක. මහණෙනි, භික්‍ෂූහු යම්තාක්කල් ශ්‍රද්ධාඇත්තෝ වන්නාහුද,
පාපයෙහිලජ්ජාඇත්තෝ වන්නාහුද, පාපයට බියඇත්තෝ වන්නා
හුද, බොහෝ ඇසූපිරූතැන්ඇත්තෝ වන්නාහුද, පටන්ගත්වීර්‍ය්‍යී
ඇත්තෝ වන්නාහුද, එළඹසිටි සිහිඇත්තෝ වන්නාහුද, ප්‍රඥාඇත්
තෝ වන්නාහුද. මහණෙනි, ඒ භික්‍ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවිය
යුත්තීය. පිරිහීමක් නොවන්නේයයි වදාළසේක. මහණෙනි, යම්
තාක්කල් මේ සප්තඅපරිහාණීය ධර්‍මයෝ භික්‍ෂූන්කෙරෙහි සිටින්නා
හුද, මේ සප්ත අපරිහාණීය ධර්‍මයන්කෙරෙහි භික්‍ෂූහු දක්නාලැබෙත්ද,
මහණෙනි, ඒ භික්‍ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුතු. පිරිහීමක්
නොවේයයි වදාළසේක.

9. මහණෙනි, අන්‍යවූද, අපරිහාණීය ධර්‍ම සතක් දෙසනාකරන්
නෙමි, ඒ ධර්‍මය අසව්. මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි
වදාළසේක. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන්
වහන්සේට පිළිවදන්දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මේ ධර්‍මය වදාළ
සේක.

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ සතිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, විරියසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, උපෙඛාසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛූසු ඨස්සන්ති ඉමෙසු ච සත්තසු අපරහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

10. අපරෙපි බො භික්ඛවෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි, තං සුණාථ සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති බො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුම්භගවා එතදවොච.

---

මහණෙනි, යම්තාක්කල් භික්ෂූහු ස්මෘතියවූ සම්‍යක්සම්බොධිහුගේ අඞ්ගය වඩන්නාහුද, ධර්මයෙන් රුස්කිරීමවූ සම්‍යක්සම්බොධිහුගේ අඞ්ගය වඩන්නාහුද, වීර්ය්‍යසම්බොධ්‍යඞ්ගය වඩන්නාහුද, ප්‍රීතියවූ සම්‍යක්සම්බොධිහුගේ අඞ්ගය වඩන්නාහුද, ක්ලෙශයන් මැඩලීමවූ සම්‍යක්සම්බොධිහුගේ අඞ්ගය වඩන්නාහුද, චිත්තසමාධියවූ සම්‍යක්සම්බොධිහුගේ අඞ්ගය වඩන්නාහුද, මධ්‍යස්ථතාවවූ සම්‍යක්සම්බොධිහුගේ අඞ්ගය වඩන්නාහුද. මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුත්තිය. පිරිහීමක් නොවෙයි වදාළසේක. මහණෙනි, යම්තාක්කල් මේ අපරිහාණීය ධර්ම සත භික්ෂූන්කෙරෙහි සිටින්නාහුද, මේ සප්තඅපරිහාණීය ධර්මයන්කෙරෙහිත් භික්ෂූහු දක්නාලැබෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුත්තිය. පිරිහීමක්නොවෙයි වදාළසේක.

10. මහණෙනි, අන්‍යවූද අපරිහාණීය ධර්ම සතක් දෙශනාකරන්නෙමි. ඒ ධර්මය අසව්. මනාකොට මෙනෙහිකරව්. කියන්නෙමියි වදාළසේක. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මේ ධර්මය වදාළසේක.

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ අනිච්චසඤ්ඤං භාවෙස්සන්ති, අනත්ත සඤ්ඤං භාවෙස්සන්ති, ආදීනවසඤ්ඤං භාවෙස්සන්ති, පහාණසඤ්ඤං භාවෙස්සන්ති, විරාගසඤ්ඤං භාවෙස්සන්ති, නිරොධසඤ්ඤං භාවෙස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛූසු ඨස්සන්ති ඉමෙසුච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුඩ්ඪි යෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

11. අපරෙපි භික්ඛවෙ ඡ අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි, තං සුණාථ සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ මෙත්තං කායකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති සබ්‍රහ්මචාරීසු ආවිචෙවරහොච.

---

මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් අනිත්‍යානුදර්ශනය සමගවූ අනිත්‍යසංඥාව වඩන්නාහුද, අනාත්මදර්ශනයසමග උපන් අනාත්මසංඥාව වඩන්නාහු වෙත්ද, අශුභසංඥාව වඩන්නාහු වෙද්ද, සංසාරය හෝ ස්කන්ධයන්ගේ දෝෂසංලක්ෂණයවූ ආදීනවසංඥාව වඩන්නාහු වෙද්ද, ප්‍රහාණසංඥාව වඩන්නාහු වෙද්ද, භවයෙහි අනභිරතියවූ විරාගසංඥාව වඩන්නාහු වෙද්ද, ක්ලේශනිරොධයවූ නිරොධසංඥාව වඩන්නාහු වෙද්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියක්ම කැමති වියයුතු. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, යම්තාක්කල් මේ සප්තවිධ අපරිහාණීය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පිහිටාසිටින්නාහුද, මේ සප්තවිධ අපරිහාණීය ධර්මයන්කෙරෙහින් භික්ෂූහු දක්නාලැබෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුත්තීය. පිරිහීමක් නොවේයයි වදාළසේක.

11. මහණෙනි, අන්‍යවූද ෂඞ්අපරිහාණීය ධර්මයන් දෙසනාකරන්නෙමි එය අසව් මනාකොට මෙනෙහිකරව් කියන්නෙමියි වදාළෝ. ස්වාමින්වහන්ස, ඒ මැනවැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මේ ධර්මය වදාළසේක. මහණෙනි භික්ෂූහු යම්තාක්කල් සමාන බඹසරඇත්තන් කෙරෙහි ප්‍රකාශයෙහි හෙවත් සම්මුඛයෙහිද. අප්‍රකාශවද හෙවත් අසම්මුඛයෙහිද, මෛත්‍රී කායකර්මයයි කියූ ආභිසමාචාරික ධර්මයන්ගේ පිරීම එළඹසිටුවත්ද හෙවත් පිහිටුවා සිටින්නාහුද,

වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ මෙත්තං වචීකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති සබ්‍රහ්මචාරීසු ...පෙ... මෙත්තං මනොකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්තභොගී භවිස්සන්ති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො හානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි.

---

මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුත්තිය. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් සබ්‍රහ්මචාරීන් කෙරෙහි මෛත්‍රීවාක්කර්මය එළඹසිටුවන්නාහුද, සෙස්ස කී ක්‍රමයෙන් විස්තරයට පැමිණවියයුතු. මෛත්‍රීමනඃකර්මය සබ්‍රහ්මචාරීන් කෙරෙහි ප්‍රකාශව හා අප්‍රකාශවත් එළඹසිටුවන්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියක්ම කැමතිවියයුත්තිය. පිරිහීමක්නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් යටත්පිරිසෙයින් පාත්‍රයෙහි බහාලනලද ස්වල්පමාත්‍ර ආහාරය පමණවූද ධාර්මිකවූ එහෙයින්ම මිථ්‍යාජීවයහැර භික්ෂාචාර වෘත්තියෙන් දැහැමින් ලබනලද්දවූ චීවරාදී යම් ඒ ලාභයෝ වෙද්ද, එබඳුවූ ධාර්මික ලාභප්‍රත්‍යයන් ආමිසප්‍රතිවිභජනය, පුද්ගලප්‍රතිවිභජනය යන ද්විප්‍රකාර ප්‍රතිවිභාගනැත්තෝ සිල්වත්වූ සබ්‍රහ්මචාරීන් වහන්සේලා සමග සාධාරණ පරිභොගඇත්තෝ වන්නාහුද. මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියක්ම කැමතිවියයුතු. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් ආදියෙහි හෝ අන්තයෙහි හෝ බිඳුනු සිකපදනැත්තාවූ සිදුරුනැත්තාවූ මධ්‍යයෙහි බිඳුනු ශික්ෂාපද නැත්තාවූ සබලනොවූ හෙවත් පිළිවෙළින් දෙකක් තුණක් බිඳුනු ශික්ෂාපද නැත්තාවූ කැලලක් නැත්තාවූ තෘෂ්ණාදාසභාවයෙන් මුදා නිදහස්භාවය කරන්නාවූ බුද්ධාදි ප්‍රාඥයන්විසින් පසසනලද්දාවූ තෘෂ්ණාදෘෂ්ටි දෙකින් පරාමර්ශනය නොකරණලද්දාවූ අර්පණෝපචාර භෙදවත්වූ චිත්තසමාධිය පිණිස පවත්නාවූ යම් ඒ ශීලයෝ වෙද්ද,

තථාරූපෙසු සීලෙසු සීලසාමඤ්ඤගතා විහරිස්සන්ති සබ්‍රහ්මචාරීහි ආවිචෙව රහොච, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතා විහරිස්සන්ති සබ්‍රහ්මචාරීහි ආවිචෙව රහොච, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ ඡ අපරිහානියා ධම්මා භික්ඛූසු ඨස්සන්ති ඉමෙසුච ඡසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුඩ්ඪියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානීති.

12, තත්‍ර සුදං භගවා රාජගහෙ විහරන්තො ගිජ්ඣකූටෙ පබ්බතෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති.

---

එබඳුවූ ශීලයන්හි සබ්‍රම්සරුන්වහන්සේලා සමග සම්මුඛයෙහි හා අසම්මුඛයෙහිත් ශීලයෙන් සමානභාවයට පැමිණ වාසයකරන්නාහුද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුතුයි. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, භික්ෂූහු යම්තාක්කල් ශ්‍රේෂ්ඨවූ ක්ලේශක්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණය පිණිස පවත්නාවූ යම් මේ මාර්ගසම්ප්‍රයුක්ත සම්‍යක්දෘෂ්ටියක් එය කරන්නාහුගේ හෙවත් ඒ සම්‍යක් ප්‍රතිපදානුගතව පිළිපදින්නහුගේ හේතුවූ කාරණයෙන් සියලු දුක් රාසිහුගේ ගෙවීමපිණිස පමුණුවාද හෙවත් නිවන්පසක්කිරීමපිණිස පවතීද එබඳුවූ මාර්ගසම්ප්‍රයුක්ත සම්‍යක්දෘෂ්ටියෙන් සබ්‍රම්සරුන්වහන්සේලා සමග සම්මුඛයෙහි හා අසම්මුඛයෙහිත් දෘෂ්ටිශ්‍රාමණ්‍යභාවයට පැමිණ වාසයකෙරෙද්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුතු. පිරිහීමක් නොවේයයි වදාළසේක. මහණෙනි, යම්තාක්කල් මේ ෂඩ්විධ අපරිහාණීය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පිහිටා සිටින්නාහුද, මේ ෂඩ්විධ අපරිහාණීය ධර්මයන් ෂකෙරෙහිත් භික්ෂූහු දක්නාලැබෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියම කැමතිවියයුතු. පිරිහීමක් නොවේයයි වදාළසේක.

12, ඒ කාලයෙහි භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර ගිජ්ජකූළුපව්වෙහි වාසයකරණසේක් බොහෝකොට භික්ෂූන්ට මේ ධර්මකථාව කරණසේක. කෙසේදයත්,

ඉති සීලං ඉති සමාධි ඉති පඤ්ඤා, සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො, සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා, පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථිදං, කාමාසවා භවාසවා දිට්ඨාසවා අවිජ්ජාසවාති.

13. අථ ඛො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ආයාමානන්ද යෙන අම්බලට්ඨිකා තෙනුපසඞ්කමිස්සාමාති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන අම්බලට්ඨිකා තදවසරි.

---

සීලය මෙපමණයි හෙවත් මේ චතුපාරිසුද්ධි සීලයම සීලයයි. සමාධිය මෙපමණයි හෙවත් චිත්තෙකාග්‍රතාවම සමාධියයි. ප්‍රඥාව මෙපමණයි හෙවත් විදර්ශනාප්‍රඥාවම ප්‍රඥානම් වෙයි. චතුපාරිශුද්ධි ශීලයෙහි පිහිටා වඩනලද හෝ පුරුදුකරණලද මාර්ගඵල සමාධිය මහත්ඵල ඇත්තේ වේ. මහත් අනුසස් ඇත්තේ වේ. සමාධියෙහි පිහිටා වඩනලද මාර්ගඵල ප්‍රඥතොමෝ මහත්ඵලඇත්තී වෙයි. මහත් අනුසස් ඇත්තීද වෙයි. ප්‍රඥාවෙහි පිහිටා වඩනලද චිත්තය මාර්ගඵලනියාම වශයෙන් ආශ්‍රවයන් කෙරෙන් ඒනම්, කාමාශ්‍රවය භවාශ්‍රවය දෘෂ්ටිආශ්‍රවය අවිද්‍යාශ්‍රවය යන මොවුන් කෙරෙන් සම්ප්‍රකාරයෙන් මිදේයයි වදාළසේක.

13. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර අභිරති කාලයක් අධ්‍යාශය පරිද්දෙන් වාසයකොට ආනන්ද ආයුෂ්මතුන් ඇමතූසේක. ආනන්දය, මෙහි එවයමු. අම්බලඝිකා උයන යම්තැනෙක් හිද එතනට එලඹෙන්නෙමුයයි වදාළසේක. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මහද් භික්ෂුසඞ්ඝයා සමග අම්බලඝිකා උයන යම්තැනෙක්හිද එතනට පැමිණිසේක.

14. තත්‍ර සුදං භගවා අම්බලට්ඨිකායං විහරති රාජාගාරකෙ. තත්‍රාපි සුදං භගවා අම්බලට්ඨිකායං විහරන්තො රාජාගාරකෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති ඉති සීලං ඉති සමාධි ඉති පඤ්ඤා, සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො, සමාධි පරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා, පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති සෙය්‍යථීදං, කාමාසවා භවාසවා දිට්ඨාසවා අවිජ්ජාසවාති.

15. අථ ඛො භගවා අම්බලට්ඨිකායං යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ආයාමානන්ද යෙන නාලන්දා තෙනුපසඞ්කමිස්සාමාති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

14. ඒ කාලයෙහි භාග්‍යවතුන්වහන්සේ අම්බලට්ඨිකා උයනෙහි රජහට සුදුසුකොට කරණලද ගෘහයෙහි වාසයකරණසේක. එහි භාග්‍යවතුන්මහන්සේ අම්බලට්ඨිකා උයනෙහිවූ රාජාගාරයෙහි වාසය කරණසේක් භික්ෂූන්ට බොහෝකොට මේ ධර්මකථාවම කරණසේක. ඒනම්, සීලය මෙපමණයි හෙවත් චතුපාරිසුද්ධි සීලයම සීලයයි. සමාධිය මෙපමණයි හෙවත් චිත්තෛකාග්‍රතාවම සමාධියයි. ප්‍රඥාව මෙපමණයි විදර්ශනාප්‍රඥාවම ප්‍රඥානම් වෙයි. චතුපාරිසුද්ධි සීලයෙහි පිහිටා වඩනලද හෝ පුරුදුකරණලද මාර්ගඵල සමාධිය මහත්ඵල ඇත්තේය. මහත් අනුසස්ද ඇත්තේය. සමාධියෙහි පිහිටා වඩනලද මාර්ගඵලප්‍රඥාතොමෝ මහත්ඵලඇත්තී වෙයි. මහත් අනුසස් ඇත්තීද වෙයි. ප්‍රඥාවෙහි පිහිටා වඩනලද චිත්තය මාර්ගඵලනියාම වශයෙන් ආශ්‍රවයන් කෙරෙන් ඒනම්, කාමාශ්‍රවය භවාශ්‍රවය දෘෂ්ටිආශ්‍රවය අවිද්‍යාශ්‍රවය යන මොවුන් කෙරෙන් සර්වප්‍රකාරයෙන් මිදේයයි වදාළසේක.

15. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ අම්බලට්ඨිකා උයනෙහි අභිරතිකාලයක් අධ්‍යාශය පරිද්දෙන් වාසයකොට ආනන්ද ආයුෂ්මතුන් ඇමතූසේක. ආනන්දය, මෙහි එව. නාලන්දාපුරය යම්තැනෙක් හිද එතනට එලඹෙන්නෙමුයයි වදාළේය, ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්නේය.

අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන නාලන්දා තදවසරි. තත්‍ර සුදං භගවා නාලන්දායං විහරති පාවාරිකම්බවනෙ.

16. අථඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච. එවං පසන්නො අහං භන්තෙ න චාහු න ච භවිස්සති නචෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො භිඤ්ඤතරො යදිදං සම්බොධියන්ති. උළාරො ඛො තෙ අයං සාරිපුත්ත ආසභී වාචා භාසිතා, එකංසො ගහිතො සීහනාදො නදිතො එවං පසන්නො අහම්භන්තෙ භගවති න චාහු න ච භවිස්සති නචෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො භිඤ්ඤතරො යදිදං සම්බොධියන්ති.

---

එකල්හි භාග්‍යවතුන්වහන්සේ මහද් භික්‍ෂුසඞ්ඝයාසමග නාලන්දා පුරය යම්තැනකද එතනට වැඩිසේක. ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ නාලන්දාපුරයෙහිවූ පාවාරිකනම් අඹවනයෙහිවාසයකරණ සේක.

16 ඉක්බිත්තෙන් ශාරිපුත්‍ර ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන් නාවූ ශාරිපුත්‍ර ආයුෂ්මතුන්වහන්සේභාග්‍යවතුන්වහන්සේටමේකාර ණය සැලකළේය. ස්වාමින්වහන්ස, යම් මේ සම්‍යක්සම්බොධිය නිමිති කොටගෙණහෙවත්සර්‍වඥතාඥනයනිමිතිකොටභාග්‍යවතුන්වහන්සේ ටවඩා සම්බොධිඥනයෙන් උසස්වූකිසියම් ශ්‍රමණයෙක් හෝ කිසියම් බ්‍රාහ්මණයෙක් හෝ අතීතකාලයෙහිද නොවූයේය. අනාගතයෙහිත් නොවන්නේය. මේවත්මන් කල්හිද නැත්තේමයයි භාග්‍යවතුන් වහන්සේකෙරෙහි මම මෙසේ ප්‍රසන්නයෙමියි සැලකළේය. ශාරිපුත්‍රය තා විසින් මේඋදාරවූ නිර්භීත වචනයක් කියනලද්දේය. සර්‍වප්‍රකාරයෙන් ප්‍රතිවෙධ කළාක්මෙන් එකාන්ත සඞ්ඛ්‍යාත නිෂ්ඨා කථාවම කියනලද්දේය, කිසිවෙකුන් විසින් මැඩලිය නොහැක්කාවූ ශ්‍රෙෂ්ඨනාදය නාදකරණ ලද්දේය. ඒනම් ස්වාමින්වහන්ස, යම් මේ සම්‍යක් සම්බොධිය නිමිතිකොට භාග්‍යවතුන්වහන්සේට වඩා අධික ඥනඇත්තෙක් අතීතකාලයෙහිත්නොවීය. අනාගතයෙහිත් නොවන් නේය. මේ වර්තමානයෙහිත් නොවේයයි මෙසේ භාග්‍යවතුන්වහන් සේ කෙරෙහි මම මෙසේ පහන්වූයෙමියි කියායි.

කින්නු සාරිපුත්ත යෙතෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො
සම්මාසම්බුද්ධො, සබ්බෙ තෙ භගවන්තො චෙතසා චෙතො
පරිච්ච විදිතා එවංසිලා තෙ භගවන්තො අහෙසුං ඉතිපි,එවං
ධම්මා එවං පඤ්ඤා එවං විහාරි එවං විමුත්තා තෙ භගවන්තො
අහෙසුං ඉතිපීති. නොහෙතං භන්තෙ. කිං පන සාරිපුත්ත යෙ තෙ
භවිස්සන්ති අනාගත මද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, සබ්බෙ
තෙ භගවන්තො චෙතසා චෙතො පරිච්ච විදිතා, එවංසීලා තෙ භග
වන්තො භවිස්සන්ති ඉතිපි, එවං ධම්මා එවං පඤ්ඤා එවං විහාරී
එවං විමුත්තා තෙ භගවන්තො භවිස්සන්ති ඉතිපීති, නොහෙතං
භන්තෙ. කිම්පන සාරිපුත්ත අහං තෙ එතරහි අරහං සම්මාසම්බු
ද්ධො චෙතසා චෙතො පරිච්ච විදිතො එවංසිලො භගවා ඉතිපි, එවං
ධම්මො එවං පඤ්ඤො එවං විහාරී එවං විමුත්තො භගවා ඉතිපීති.

---

ශාරිපුත්‍රයකිමෙක්දඅතීතවූදීර්ඝකාලයෙහි යම්ඒඅර්හත් සම්‍යක්සම්බුද්ධ
කෙනෙක්වූවාහුද ඒ සියලුභාග්‍යවතුන්වහන්සේලා සිතකරණකොට
ගෙණ සිතින්පිරිසිඳදන්නාලද්දේදැයි විචාලසේක.කෙසේද,ඒ භාග්‍ය
වතුන්වහන්සේලාමෙබඳුසිල්ඇත්තෝවූහයිකියාදමෙබඳු ධර්ම ඇත්
තෝවූහයිකියාද,මෙබඳුප්‍රඥාඇත්තෝවූහයිකියාද,මෙබඳුවිහරණඇත්
තෝවූහයි කීයාද, ඒභාග්‍යවතුන්වහන්සේලා මෙබඳු ක්ලෙශවිමුක්ති
ඇත්තෝවූහයිද කියායි. ස්වාමීන්වහන්ස,මේ කාරණය පිරිසිඳ නො
දන්නාලද්දේයයි සැලකළේය. කිමෙක්ද, ශාරිපුත්‍රය නොපැමිණි
දීර්ඝකාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වන්නාහුද,
ඒ සියලු භාග්‍යවතුන්වහන්සේලාසිත කරණකොට සිතින් පිරිසිඳ
දන්නාලද්දේදැයි විචාලසේක. කෙසේද, ඒ භාග්‍යවතුන්වහන්සේලා
මෙබඳු සිල් ඇත්තෝවන්නාහුය කියාද. මෙබඳු ධර්මඇත්තෝ වන්
නාහුය කියාද, මෙබඳු ප්‍රඥාඇත්තෝ වන්නාහුය කියාද, මෙබඳු
ආශ්‍රී විහරණඇත්තෝ වන්නාහුය කියාද, ඒ භාග්‍යවතුන්වහන්
සේලා මෙබඳු ක්ලෙශ විමුක්ති ඇත්තෝ වන්නාහුය කියායි. ස්වාමීන්
වහන්ස, මේ කාරණය පිරිසිඳ නොදන්නාලද්දේමයයි සැලකළේය.
ශාරිපුත්‍රය කිමෙක්ද. දැන් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ මම තාවිසින්
සිතකරණකොටගෙණ සිතින් පිරිසිඳ දන්නාලද්දේදැයි විචාලසේක.
කෙසේදභාග්‍යවතුන්වහන්සේමෙබඳුසිල්ඇත්තේය කියාද,මෙබඳුධර්ම
ඇත්තේය කියාද, මෙබඳු ප්‍රඥාඇත්තේය කියාද, මෙබඳු ආශ්‍රීවි
හරණ ඇත්තේය කියාද, භාග්‍යවතුන්වහන්සේ මෙබඳු ක්ලෙශ
විමුක්තිඇත්තේයයිද කියායි.

නොහෙතං භන්තෙ. එත්ථහි තෙ සාරිපුත්ත අතීතානාගතපච්චුප්පන්නෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු චෙතොපරියඤාණං නත්ථි. අථ කිඤ්චරහි තෙ අයං සාරිපුත්ත උළාරා ආසභි වාචා භාසිතා එකංසො ගහිතො සීහනාදො නදිතො එවං පසන්නො අහං භන්තෙ භගවති නචාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො භිඤ්ඤතරො යදිදං සම්බොධියන්ති.

17. නඛො මෙ භන්තෙ අතීතානාගතපච්චුප්පන්නෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු චෙතොපරියඤාණං අත්ථි. අපිච ධම්මන්වයො විදිතො. සෙය්‍යථාපි භන්තෙ රඤ්ඤො පච්චන්තිමං නගරං දළ්හුද්දාපං දළ්හපාකාරතොරණං එකද්වාරං.

---

ස්වාමින්වහන්ස, මේ කාරණය නොදන්නාලද්දේමයයි සැලකළේය. ශාරිපුත්‍රය තට අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙහිවූ අර්හත් සම්‍යක්සම්බුද්ධයන්වහන්සේලා කෙරෙහි මෙපමණ චේතොපරියාය ඥානයක් හෙවත් ස්වයම්භූඥානයක් නැත්තේද, එසේ නැති කල්හි කවර කාරණයකින් තා විසින් මේ නිර්භීත වචන කියන ලද්දේද, සන්නිෂ්ඨානය ගන්නාලද්දේද, ශ්‍රේෂ්ඨනාදය නාදකරණ ලද්දේයි. විචාලසේක. කෙසේද, ස්වාමින්වහන්ස, මේ සම්‍යක් සම්බෝධිය නිමිතිකොට භාග්‍යවතුන්වහන්සේට අධිකඥාන ඇත්තාවූ කිසියම් ශ්‍රමණයෙක් හෝ කිසියම් බ්‍රාහ්මණයෙක් හෝ අතීතයෙහිත් නොවිය. අනාගතයෙහිත් නොවන්නේය. මේ කාලයෙහිත් නැතැයි මෙසේ මේ ගුණප්‍රබන්ධසංලක්‍ෂණයෙන් භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි පහන්වූයෙමියි කීයායි.

17. ස්වාමින්වහන්ස,අතීතානාගතවර්තමානයන කාලත්‍රයෙහිවූඅර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා කෙරෙහි මාගේ පිරිසිඳ දැන ගන්නා ඥානයක් නැත්තේය. එසේ නමුත් ප්‍රත්‍යක්‍ෂඥානය අනුව ගොස් ධර්මානුගත බුද්ධියෙන් දන්නාලද්දෙමියි සැලකළේය. ස්වාමින්වහන්ස, දෘඪවූ ප්‍රාකාරපාදඇති දෘඪවූ පව්රු හා තොරන් ඇති එක් දොරක්ඇති රජහුගේප්‍රත්‍යන්ත නගරයක් වේද,

තත්‍රස්ස දොවාරිකො පණ්ඩිතො වියත්තො මෙධාවී අඤ්ඤාතානං නිවාරෙතා ඤාතානං පවෙසෙතා. සො තස්ස නගරස්ස සමන්තා අනුපරියාය පථං අනුක්කමමානො න පස්සෙය්‍ය පාකාරසන්ධිං වා පාකාරවිවරං වා අන්තමසො බිළාරනිස්සක්කනමත්තම්පි. තස්ස එවමස්ස, යෙ ඛො කෙචි ඔළාරිකා පාණා ඉමං නගරං පවිසන්ති වා නික්ඛමන්ති වා, සබ්බෙ තෙ ඉමිනාව ද්වාරෙණ පවිසන්ති වා නික්ඛමන්ති වාති. එවමෙව ඛො මෙ භන්තෙ ධම්මන්වයො විදිතො. යෙ තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා සබ්බෙ තෙ භගවන්තො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතූසු සතිපට්ඨානෙසු සුප්පතිට්ඨිතචිත්තා සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිංසු. යෙපි තෙ භන්තෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා.

---

එහි පණ්ඩිතවූ ව්‍යක්තවූ ප්‍රඥාඇත්තාවූ නොහඳුනන ජනයන් වළක්වන්නාවූ අඳුනන ජනයන් ඇතුළට ප්‍රවේශකරන්නාවූ දොරටුපාලයෙක් වන්නේද, ඒ දොරටුපාලතෙමේ ඒ නුවරට හාත්පස ඔබ මොබ ඇවිද මාර්ගයක් බලන්නේ පවුරු සන්ධියක් හෝ ප්‍රාකාරයාගේ විවෘත තස්ථානයක් හෝ යටත් පිරිසෙයින් බළලෙකුට ඇතුල්වීමට ප්‍රමාණවූද ස්ථානයක් නොදක්නේනම් ඕහට මේ අදහස වන්නේය. ඖදාරිකවූද කිසියම් ප්‍රාණීකෙනෙක් මේ නුවරට ඇතුල්වන්නේ හෝ නුවරින් නික්මෙන්නෝ හෝ වෙද්ද, ඒ සියල්ලෝ මේ දොරින්ම ප්‍රවිෂ්ටවන්නෝ හෝ නික්මෙන්නෝ වෙත්ය කියායි. ස්වාමින්වහන්ස, එපරිද්දෙන්ම මාවිසින් ප්‍රත්‍යක්ෂඥානවශයෙන් ධර්මානුගත බුද්ධියෙන් මේ කාරණය දැනගන්නා ලද්දේය, කෙසේද, අතීතවූ දීර්ඝකාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධවරයන්වහන්සේලාවූවාහුද, ඒ සියලු භාග්‍යවතුන්වහන්සේලා සිතට නැවත නැවත කෙලෙසිලි උපදවන්නාවූ ප්‍රඥාහුගේ දුර්වලභාවය ඇතිකරන්නාවූ සගමොක් මුවහකරණ පඤ්චනීවරණධර්මයන් දුරුකොට සතරසතිපට්ඨානධර්මවිෂයෙහි ස්මෘති සම්ප්‍රඥවශයෙන් එලඹ සිටුවනලද සිත්ඇත්තෝ සප්තබොධ්‍යඞ්ගධර්මයන් තත්වූපරිද්දෙන් වඩා, ශ්‍රෙෂ්ඨවූ සම්‍යක්ඥානය අවබොධ කළාහුය කියාද, ස්වාමින්වහන්ස, අනාගතවූ දීර්ඝකාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධකෙනෙක් වන්නාහුද.

සබ්බෙ තෙ භගවන්තො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතුසු සතිපට්ඨානෙසු සුපතිට්ඨිතචිත්තා සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිස්සන්ති. භගවාපි භන්තෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතුසු සතිපට්ඨානෙසු සුපතිට්ඨිතචිත්තො සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති.

18. තත්‍රසුදං භගවා නාළන්දායං විහරන්තො පාවාරිකම්බවනෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති. ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා, සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො, සමාධි පරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා.

---

ඒ සියලු භාග්‍යවතුන්වහන්සේලා සිතට නැවත නැවත කෙලෙසිලි උපදවන්නාවූ ප්‍රඥාහුගේ දුර්වලභාවය ඇතිකරන්නාවූ පඤ්චනීවරණ ධර්මයන් දුරුකොට සතරසතිපට්ඨානධර්මවිෂයෙහි මනාකොට එළඹ සිටුවනලද සිත්ඇත්තෝ සප්තබොධ්‍යඞ්ගධර්මයන් තත්වූපරිද්දෙන් වඩා ශ්‍රෙෂ්ඨවූ සර්වඥතාඥානය මනාකොටඅවබොධකරන්නාහුයකියාද,ස්වාමීන්වහන්ස,දැන් මේකාලයෙහි අර්හත් සම්‍යක්සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේද සිතට නැවත නැවත කෙලෙසිලි ඇතිකරන්නාවූ ප්‍රඥාහුගේ දුර්වලභාවය ඇතිකරන්නාවූ පඤ්චනීවරණධර්මයන් දුරුකොට සතරසතිපට්ඨාන ධර්මවිෂයෙහි මනාකොට එළඹසිටුවනලද සිත්ඇතිසේක් සප්තබොධ්‍යඞ්ගධර්මයන් තත්වූපරිද්දෙන් වඩා ශ්‍රෙෂ්ඨසම්‍යක්බොධිය හෙවත් සර්වඥතාඥානය අවබොධ කළේයයි කියායි.

18 ඒ කාලයෙහි භාග්‍යවතුන්වහන්සේ නාළන්දා පුරියෙහිවූ පාවාරිකනම් අඹවනයෙහි වාසයකරණසේක් බොහෝකොට භික්ෂූන්ට මේ ධර්මකථාව කරණසේක, කෙසේදයත්, මේ චතුපාරිසුද්ධි ශීලයම ශීලයයි, මේ චිත්තෙකාග්‍රතාවම සමාධියයි.මේ විදර්ශනාප්‍රඥාවම ප්‍රඥාවයි. චතුපාරිසුද්ධිශීලයෙහි පිහිටාවඩනලද මාර්ගඵලසමාධිය මහත්ඵල ඇත්තේය, මහත්අනුසස්ද ඇත්තේය. චිත්තසමාධියෙහි පිහිටාවඩනලද ප්‍රඥතොමෝ මහත්ඵල ඇත්තේවේ, මහත් අනුසස්ද ඇත්තේ වෙයි.

පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථීදං, කාමාසවා භවාසවා දිට්ඨාසවා අවිජ්ජාසවාති.

19, අථ ඛො භගවා නාලන්දායං යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ආයාමානන්ද යෙන පාටලිගාමො තෙනුපසංකමිස්සාමීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන පාටලිගාමො තදවසරි.

20. අස්සොසුං ඛො පාටලිගාමියා උපසකා භගවා කිර පාටලිගාමං අනුප්පත්තොති. අථ ඛො පාටලිගාමියා උපාසකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො පාටලිගාමියා උපසකා භගවන්තං.

ප්‍රඥාවෙහි පිහිටාවඩනලද මාගීඵලචිත්තය මනාකොටම ආශ්‍රවයන්කෙරෙන්, ඒනම්, කාමශ්‍රාවය, භවාශ්‍රවය, අවිද්‍යාශ්‍රවය, යනමොවුන්කෙරෙන් සර්‍වප්‍රකාරයෙන් මිදේයයි වදාළේය.

19. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ නාලන්දාපුරියෙහි අභිරතිකාලයක් අධ්‍යාශයපරිද්දෙන් වැසයකොට ආනන්ද ආයුෂ්මතුන් ඇමතූසේක. ආනන්දය, මෙහි එව, යමු. පාලිගම යම්තැනෙක්හිද එතනට එළඹෙන්නෙමුයි වදාළේය. ස්වාමින්වහන්ස, ඒ මැනවයි, ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මහත් භික්ෂුසඞ්ඝයා සමග පාටලිගම යම්තැනෙක්හිද එතනට වැඩිසේක.

20. පාටලිගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන්වහන්සේ පාටලිගමට වැඩිසේක්ලයි ඇසුවාහුමය. ඉක්බිත්තෙන් පාටලිගම්වැසි උපාසකයෝභාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියාහුය, එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ එකත්පසෙක උන්හ. එකත්පසෙක උන්නාවූ පාටලිගම්වැසි උවසුවෝ භාග්‍යවතුන්වහන්සේට.

එතදවොචුං. අධිවාසෙතු නො හනෙත භගවා ආවසථාගාරන්ති. අධිවාසෙසි භගවා තුණ්හි භාවෙන.

21. අථ ඛො පාටලිගාමිකා උපාසකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන ආවසථාගාරං තෙනුපසඞ්කමිංසු. උපසංකමිත්වා සබ්බසන්ථරිං ආවසථාගාරං සන්ථරිත්වා ආසනානි පඤ්ඤපෙත්වා උදකමණිකං පතිට්ඨාපෙත්වා තෙලප්පදීපං ආරොපෙත්වා යෙන භගවා තෙනුපසංකමිංසු. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො පාටලිගාමිකා උපාසකා භගවන්තං එතදවොචුං. සබ්බසන්ථරිං සන්ථතං භන්තෙ ආවසථාගාරං. ආසනානි පඤ්ඤත්තානි. උදකමණිකො පතිට්ඨාපිතො. තෙලප්පදීපො ආරොපිතො. යස්සදානි භන්තෙ භගවා කාලං මඤ්ඤතීති.

මේ කාරණය සැලකළාහුය. ස්වාමිනි, භාග්‍යවතුන්වහන්සේ අපගේ ආවසථාගාරය පිළිගන්නා සේක්වායි, භාග්‍යවතුන්වහන්සේ නිශ්ශබ්දභාවයෙන් ඉවසා වදාළසේක.

21. ඉක්බිත්තෙන් පාටලිගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන්වහන්සේ ඉවසා වදාළබව දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ පැදකුණුකොට ආවසථාගාරය යම්තැනෙක්හිද, එතනට එළඹියාහුය, එළඹ අවසථාගාරය සියලල වස්ත්‍රයෙන් අතුරණලද්දක්කොට අතුරා අසුන්පණවා පැන්බඳුන් තබ්බවා සුවඳතෙල් පහන්(දල්වා)තන්වා භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටියාවූ පාටලිගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැලකළාහුය. ස්වාමින්වහන්ස ආවසථාගාරය සියලල අතුරණලද්දක්කොට වස්ත්‍රයෙන් අතුරණලද්දේය, අසුන් පණවනලද්දාහුය. ජලභාජන පිහිටුවනලද්දේය. තෙලප්‍රදීප දල්වනලද්දේය. දැන් භාග්‍යවතුන්වහන්සේ යමක් සම්බන්ධව කල්යයි දන්නාසේක්නම් එයකරණුමැනවයි සැලකළේය.

x fresh sans in Rh. Davids

22. අථඛො භගවා සායණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන ආවසථාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථිමාභිමුඛො නිසීදි, භික්ඛුසඞ්ඝොපි පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පච්ඡිමං භිත්තිං නිස්සාය පුරත්ථිමාභිමුඛො නිසීදි භගවන්තං යෙව පුරක්ඛත්වා, පාටලිගාමියාපිඛො උපාසකා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පුරත්ථිමභිත්තිං නිස්සාය පච්ඡිමාභිමුඛො නිසීදිංසු භගවන්තං යෙව පුරක්ඛත්වා,

23. අථඛො භගවා පාටලිගාමියෙ උපාසකෙ ආමන්තෙසි. පඤ්චිමෙ ගහපතයො ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා. කතමෙ පඤ්ච. ඉධ ගහපතයො දුස්සීලො සීලවිපන්නො පමාදාධිකරණං මහතිං භොගජානිං නිගච්ඡති. අයං පඨමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

---

22. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ සවස්කාලයෙහි හැඳ පොරවා අතින් පාත්‍රය හා කයින් සිව්රුගෙණ භික්ෂුසඞ්ඝයා සමග ආවසථාගාරය යම්තැනෙක්හිද එතනට එලඹිසේක, එලඹ පාදයන්සෝදා ආවසථාගාරයට ප්‍රවිෂ්ටව මධ්‍යයෙහිවූ කණුව ඇසුරුකොට පෙරදිගට අභිමුඛව වැඩහුන්සේක. භික්ෂුසඞ්ඝතෙමේද පාදයන් සෝදා ආවසථාගාරයට ප්‍රවිෂ්ටව පශ්චිම භිත්තිය ඇසුරුකොට පෙරදිගට අභිමුඛව භාග්‍යවතුන්වහන්සේම පෙරටුකොට උන්නේය, පාටලිගම්වැසි උපාසකයෝද පාදයන්සෝදා ආවසථාගාරයට ප්‍රවිෂ්ටව පෙරදිග භිත්තිය ඇසුරුකොට පැසුලුදිගට අභිමුඛව භාග්‍යවතුන්වහන්සේම පෙරටුකොට උන්නාහ.

23. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පාටලිගම්වැසි උපාසකයන් ඇමතුසේක, ගෘහපතීනි, දුස්සීලයාගේ සීලවිපත්තිය සම්බන්ධ මේ දෙෂ පසක්වෙත්. ඒ පස කවරහුදයත්! ගෘහපතීනි, මේ සස්නෙහි විපතට පැමිණි සිල්ඇත්තාවූ දුස්සීලතෙම ප්‍රමාදය කාරණාකොට ගෙණ මහත්වූ සම්පත්තීන්ගේ හානියට පැමිණේයි, හෙවත් අවශ්‍යයෙන් කටයුතුකම්යෙහි ප්‍රමාදභාවය හෙතුකොටගෙණ පිරිහිමට පැමිණේ, දුස්සීලයාගේ සීලවිපත්තිය සම්බන්ධවූ මේ පළමුවෙනි දෙෂයයි වදාළසේක.

පුනචපරං ගහපතයො දුස්සීලස්ස සීලවිපන්නස්ස පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, අයං දුතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා, පුනචපරං ගහපතයො දුස්සීලො සීලවිපන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං අවිසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො, අයං තතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා. පුනචපරං ගහපතයො දුස්සීලො සීලවිපන්නො සම්මූළ්හො කාලංකරොති, අයං චතුත්ථො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා, පුනචපරං ගහපතයො දුස්සීලො සීලවිපන්නො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති. අයං පඤ්චමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා. ඉමෙ ඛො ගහපතයො පඤ්ච ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා.

24. පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදාය, කතමෙ පඤ්ච, ඉධ ගහපතයො සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං.

නැවතද අනිකක් කියමි, ගෘහපතිනි, සීලවිපත්තියට පැමිණි සාවූ දුස්සීලයාගේ අකීර්ති ඝොෂාවක් අති ශයින් උස්ව නැගෙයි, මේ දුස්සීලයාගේ සීලවිපත්තිය පිළිබඳ දෙවෙනිදොෂයයි වදාළසේක. නැවතද අනිකක්කියමි, ගෘහපතිනි, විපතටපැමිණිසිල්ඇති දුස්සීලතෙම ක්ෂත්‍රිය රජාදීන් පිළිබඳ පිරිසකටහෝ බ්‍රාහමණ පිරිසකටහෝ, ගෘහපතීන්ගේ පිරිසකටහෝ, ශ්‍රමණ පිරිසකටහෝ යම් යම් පිරිසකට එළඹේද සැකසහිතවූයේ භයසහිතවම එළඹෙයි. දුස්සීලයාගේ සීලවිපත්තිය පිළිබඳ මේ තුන්වෙනි දොෂයයි වදාළසේක. නැවතද අනිකක් කියමි, ගෘහපතිනි, විපතටපැමිණි සිල් ඇත්තාවූ දුස්සීලතෙම සිහිමුළාවට පැමිණියේ කලුරියකෙරේ. දුස්සීලයාගේ සීලවිපත්තිය පිළිබඳ මේ සතරවෙනි දොෂයයි වදාළසේක. නැවතද අනිකක් කියමි, ගෘහපතිනි, විපතට පැමිණි සිල් ඇත්තාවූ දුස්සීලතෙම කාබුන් මරණින්මතු සැපයෙන් තොරවූ නපුරුගති ඇත්තාවූ විවශව පතිතවීම් ඇත්තාවූ නරකයෙහි උපදී. දුස්සීලයාගේ සීලවිපත්තිය පිළිබඳ මේ පස්වෙනි දොෂයයි වදාළසේක. ගෘහපතිනි, දුස්සීලයාගේ සීලවිපත්තිය පිළිබඳ මේදොෂපසවෙන්යයි වදාළසේක.

24. ගෘහපතීනි, සිල්වත්හුගේ සීලසම්පත්තිය පිළිබඳ මේ අනුසස් පසක් වෙත්. ඒපස කවරහුදයත්.ගෘහපතීනි, මේ සස්නෙහි සිල්වත් තෙම සීලයෙන් සම්පූර්ණවූයේ නොපමාබව කාරණාකොටගෙණ,

මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති. අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය. පුනචපරං ගහපතයො සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය. පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති, යදි ඛත්තියපරිසං යදි බ්‍රාහමණපරිසං යදි ගහපතිපරිසං යදිසමණපරිසං, විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො. අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය. පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො අසංමූල්හො කාලංකරොති. අයං චතුත්‍ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය. පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො කායස්ස භෙදා පරමමරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. අයං පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදාය. ඉමෙ ඛො ගහපතයො පඤ්ච ආනිසංසා සීලවතො සීලසම්පදායාති.

---

මහත්වූ භොගරාශියට පැමිණෙයි, හෙවත් බොහෝ සම්පත් ලබයි. සිල්වත්හුගේ සීලසම්පත්තිය පිළිබඳ මේ පළමුවෙනි අනුසසයයි වදාළසේක. නැවතද අනිකක් කියම්. ගෘහපතීනි, සම්පූර්ණ සිල්ඇත්තාවූ සිල්වත්හුගේ ශ්‍රෙෂ්ඨවූ හෝ යහපත් කීර්ති ඝොෂාවක් විශෙෂයෙන් උස්වනැගේ. සිල්වත්හුගේ සීලසම්පත්තියපිළිබඳ මේදෙවෙනි අනුසසයයි වදාළසේක. නැවතද අනිකක් කියම්. ගෘහපතීනි, සම්පූර්ණ සිල්ඇත්තාවූ සිල්වත්තෙම ක්‍ෂත්‍රියරාජාදීන්ගේ පිරිසකට හෝ බ්‍රාහ්මණයන්ගේ පිරිසකට හෝ ගෘහපතීන්ගේ පිරිසකට හෝ ශ්‍රමණයන්ගේ පිරිසකට හෝ යම් යම් පිරිසකට පැමිණේද සැකරහිතව නිර්භයභාවයෙන් යුක්තව එලඹෙයි. සිල්වත්හුගේ සීලසම්පත්තිය පිළිබඳ මේ තුන්වෙනි අනුසසයයි වදාළසේක. නැවතද අනිකක් කියම්. ගෘහපතීනි, සම්පූර්ණ සිල්ඇත්තාවූ සිල්වත්තෙම සිහිමුලානොවූයේම කලුරිය කෙරේ. සිල්වත්හුගේ සීලසම්පත්තිය පිළිබඳ මේ සතරවෙනි අනුසසයයි වදාළසේක. නැවතද අනිකක් කියම්. ගෘහපතීනි, සම්පූර්ණ සිල්ඇත්තාවූ සිල්වත්තෙම කාබුන් මරණින්මතු යහපත්ගති ඇත්තාවූ ස්වර්ගලොකයෙහි උපදී. සිල්වත්හුගේ සීලසම්පත්තිය පිළිබඳ මේ පස්වෙනි අනුසසයයි වදාළසේක. ගෘහපතීනි, සිල්වත්හුගේ සීලසම්පත්තිය පිළිබඳ මේ අනුසස් පසවෙත්යයි වදාළසේක.

25. අථ ඛො භගවා පාටලිගාමියෙ උපාසකෙ බහුදෙව රත්තිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උය්‍යොජෙසි. අභික්කන්තා ඛො ගහපතයො රත්ති, යස්ස දානි කාලං මඤ්ඤථාති. එවං භන්තෙති ඛො පාටලිගාමියා උපාසකා භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු. අථ ඛො භගවා අචිරපක්කන්තෙසු පාටලිගාමියෙසු උපාසකෙසු සුඤ්ඤාගාරං පාවිසි.

26. තෙන ඛො පන සමයෙන සුනිධවස්සකාරා මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහාය. තෙන ඛො පන සමයෙන සම්බහුලා දෙවතායො සහස්සස්සෙව පාටලිගාමෙ වත්ථූනි පරිගණ්හන්ති.

---

25. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පාටලිගම්වැසි උපාසකයන් රාත්‍රිය පිළිබඳ බොහෝවේලාවක් දැහැමිකථාවෙන් හෙවත් අන්‍යවූද පාලියෙන් තොරවූ ධර්මකථාවෙන් හා ආවාසදානානුමොදනා කථා වශයෙන් මනාකොට කරුණුදක්වා එහි සමාදන්කරවා හෙවත් ඒ ධර්මාවවාදයෙහි පිහිටුවා එහි තෙදගන්වා හෙවත් වැඩියක් ඊට මෙහෙයා වැඩියක් සතුටුකරවා හැරිසේක. හෙවත් මෙසේ නියොග කළසේක. ගෘහපතිනි, රාත්‍රිතොමෝ අතික්‍රාන්තවූවාය හෙවත් පහව ගියාය. දැන් තොපි යමක් සම්බන්ධව කල්යයි දන්නාහුනම් එය කරව්යයි වදාළසේක. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි පාටලිගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ පැදකුණුකොට ගියාහුය. ඉක්බිත් තෙන් භාග්‍යවතුන්වහන්සේ පාටලිගම්වැසි උපාසකයන් බැහැර ගිය නොබෝවේලාවූකල්හි ශූන්‍යාගාරයට වන්සේක. හෙවත් එහිම පසෙක්හි සයනගතවූසේක් සිංහසෙය්‍යාව කළසේක.

26. ඒකාලයෙහිදී සුනිධය වස්සකාරය යන මගධරජහුගේ මහාමාත්‍යයෝ පාටලිනම් ගමෙහි වැදෑරජුන් ප්‍රතිබාහනය හෙවත් මැඩලීම පිණිස නුවරක් කරවන්නාහුය. ඒ කාලයෙහිදී දහස දහස බැගින්වූම බොහෝ දෙවතාවෝ පාටලිගමෙහි ගෘහවස්තූන් පරිග්‍රහණය කෙරෙත්.

යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති නීචානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං.

27. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන තා දෙවතායො සහස්සසෙව පාටලිගාමෙ වත්ථූනි පරිගණ්හන්තියො. අථ ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි, කො නු ඛො ආනන්ද පාටලිගාමෙ නගරං මාපෙතීති. සුනිධවස්සකාරා භන්තෙ මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහායාති.

---

යම්පෙදෙසෙක්හි මහෙශාක්‍ය දෙවතාවෝ ගෘහවස්තූන් පරිග්‍රහණය කෙරෙත්ද, ඒ පෙදෙසෙහි මහෙශාක්‍යරජුන්ගේද රජමහඇමතියන්ගේද සිත් වාසස්ථානකරවන්ට නැමෙත්. යම්පෙදෙසෙක්හි මධ්‍යමදෙවතාවෝ ගෘහවස්තු පරිග්‍රහණය කෙරෙත්ද, ඒ පෙදෙසෙහි වාසස්ථානයන්කරවන්ටමධ්‍යමරජුන්ගේද,රජමහඇමතියන්ගේද, සිත් නැමෙත්.යම්පෙදෙසෙක්හිනීචදෙවතාවෝ ගෘහවස්තු පරිග්‍රහණය කෙරෙත්ද. ඒ පෙදෙසෙහි වාසස්ථානයන් කරවන්ට පහත්රජුන්ගේද රජමහඇමතියන්ගේද සිත්නැමෙත්.

27. භාග්‍යවතුන්වහන්සේ පිරිසිදුවූ මිනිසැස ඉක්මපැවැත්තාවූ දිවැසින් පාටලිගමෙහි වස්තුපරිග්‍රහණය කරන්නාවූ එක එක වර්ගයෙන් දහසක් බැගින්වූ ඒ දෙවතාවන් දුටුසේක්මය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ රාත්‍රිය පිළිබඳ අලුයම්කාලයෙහි නැගීසිට ආනන්ද ආයුෂ්මතුන් ඇමතූසේක. ආනන්දය, කවරෙක්නම් පාටලිගමෙහි නුවරක් කරවාදැයි විචාලසේක. ස්වාමීන්වහන්ස, සුනිධය වස්සකාරය යන මගධරාජමහාමාත්‍යයෝ වැදෑරජුන් මැඩලීමපිණිස පාටලිගමෙහි නුවරක් කරවත්යයි සැලකළේය.

28. සෙය්‍යථාපි ආනන්ද දෙවෙහි තාවතිංසෙහි සද්ධිං මන්තෙත්වා, එවමෙව ඛො ආනන්ද සුනිධවස්සකාරා මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහාය. ඉධා'හං ආනන්ද අද්දසං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සම්බහුලා දෙවතායො සහස්සස්සෙව පාටලිගාමෙ වත්ථූනි පරිග්ගණ්හන්තියො. යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, නීචානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යාවතා ආනන්ද අරියං ආයතනං යාවතා වණිප්පථො ඉදං අග්ගනගරං භවිස්සති පාටලිපුත්තං පුටභෙදනං.

---

28. ආනන්දය, තව්තිසාවැසි දෙවියන් සමග මන්ත්‍රණයකොට යම්සේද,එපරිද්දෙන්ම සුනිධයවස්සකාරය යන මගධරජමහාමාත්‍යයෝ වැදූරජුන් මැඩලීමපිණිස පාටලිගමෙහි නුවරක් කරවත්. ආනන්දය, මම මෙහි පිරිසිදුවූ මිනිසැස ඉක්මපැවැත්තාවූ දිවැසින් පාටලිග්‍රාමයෙහි වස්තුපරිග්‍රහණය කරන්නාවූ දහසක්බැගින්වූ බොහෝ දෙවතාවන් දුටුයෙමි. යම් පෙදෙසෙක්හි මහෙශාක්‍ය දෙවතාවෝ වස්තුපරිග්‍රහණය කෙරෙත්ද, ඒ පෙදෙසෙහි නිවෙසනයන් කරවන්ට මහෙශාක්‍ය රජුන්ගේද රජමහඇමතියන්ගේද සිත් නැමෙත්. යම් පෙදෙසෙක්හි මධ්‍යමදෙවතාවෝ වස්තුපරිග්‍රහණය කෙරේත්ද, ඒ පෙදෙසෙහි නිවෙසනයන් කරවන්ට මධ්‍යමරජුන්ගේද රජමහඇමතියන්ගේද සිත් නැමෙත්, යම් පෙදෙසෙක්හි නීචදෙවතාවෝ වස්තුපරිග්‍රහණය කෙරෙත්ද,ඒපෙදෙසෙහි නිවෙසනයන් කරවන්ට පහත් රජුන්ගේද රජමහඇමතියන්ගේද සිත් නැමෙත්. ආනන්දය, ආර්‍ය්‍ය මනුෂ්‍යයන්ගේ යම්පමණ ස්ථාන වෙත්ද, වෙළඳුන්ගේ වණික්කර්මයට සුදුසු යම්පමණ ස්ථාන ඇත්ද, ඒ සියල්ලන් අතුරෙන් මෙය භාණ්ඩපුටබිඳීම් ඇත්තාවූ හෙවත් නොයෙක්දෙසින් පමුණුවන බඩුමිටි ආදිය මුදා විකිණීමකරණහෙයින් ප්‍රසිද්ධවූ පාටලිපුත්‍රනම් ශ්‍රෙෂ්ඨ නුවරක් වන්නේයයි වදාළේය.

පාටලිපුත්තස්ස ඛො ආනන්ද තයො අන්තරායා භවිස්සන්ති, අග්ගිතො වා උදකතො වා මිථුභෙදතො වාති.

29. අථ ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනියං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං එතදවොචුං. අධිවාසෙතු නො භවං ගොතමො අජ්ජතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන

30. අථ ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා භගවතො අධිවාසනං විදිත්වා යෙන සකො ආවසථො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා සකෙ ආවසථෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසුං කාලො භො ගොතම නිට්ඨිතං භත්තන්ති.

---

ආනන්දය, පැළලුප් නුවරට ගින්නෙන්ද ජලයෙන්ද අන්‍යොන්‍ය භෙදයයි කියනලද මිත්‍රභෙදයෙන්දැයි අන්තරාය තුණක්වන්නාහුයයි වදාළසේක.

29. ඉක්බිත්තෙන් සුනිධය වස්සකාරය යන මගධරාජමහාමාත්‍ය යෝ භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූහ. සතුටුවියයුතුවූ සිහි කටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක සිටියාහුය. එකත් පසෙක සිටියාවූ සුනිධය වස්සකාරය යන මගධරාජමහාමාත්‍යයෝ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. භවද් ගෞතම යන්වහන්සේ අද්‍දවසට අපගේ බත භික්‍ෂුසඞ්ඝයා සමග ඉවසන සේක්වා යනුයි. භාග්‍යවතුන්වහන්සේ නිශ්ශබ්දභාවයෙන් ඉවසා වදාළසේක.

30. ඉක්බිත්තෙන් සුනිධය වස්සකාරය යන මගධරාජමහාමාත්‍ය යෝ භාග්‍යවතුන්වහන්සේ ඉවසා වදාළ බව දැන සවකීය ආවාසය යම්තැනෙක්හිද, එතනට එළඹියාහුය. එළඹ සවකීය ආවාසයෙහි ප්‍රණීතවූ කෑයුතු දෙයද, බුදියයුතු දෙයද, පිළියෙළකරවා භාග්‍ය වතුන්වහන්සේට කල්දැන්විය. භවද් ගෞතමයන්වහන්ස, බත නිම වන ලද්දේය මේ ඊට සුදුසුකාලය කියායි.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්ත චීවරමා දාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සුනිධවස්සකාරානං මගධමහා මත්තානං ආවසථො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්ත පෙපසුං, සම්පවාරෙසුං. අථ ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදිංසු.

31. එකමන්තං නිසින්නෙ ඛො සුනිධවස්සකාරෙ මගධමහා මත්තෙ භගවා ඉමාහි ගාථාහි අනුමොදි.

යස්මිං පදෙසෙ කප්පෙති
වාසං පණ්ඩිතජාතියො
සීලවන්තෙත්ථ භොජෙත්වා
සඤ්ඤතෙ බ්‍රහ්මචාරයො.

---

එකල්හි භාග්‍යවතුන්වහන්සේ පෙරවරුකාලයෙහි හැඳපොරවා අතින් පාත්‍රය හා කයින් සිවුරු ගෙණ භික්ෂුසඞ්ඝයා සමග සුනිධය වස්සකාරය යන මගධරාජමහා මාත්‍යයන්ගේ ආවාසය යම්තැනෙක්හිද එතනට වැඩිසේක. එළඹ පැණවූ අස්නෙහි වැඩඋන්සේක. ඉක්බිත්තෙන් සුනිධයවස්සකාරය යන මගධරාජ මහාමාත්‍යයෝ බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂුසඞ්ඝයා ප්‍රණීතවූ කෑයුතු දෙයින්ද, බුදියයුතු දෙයින්ද, සියතින් සන්තර්පණය කළේය. මනාකොට පවාරණයද කරවූහ. තවද සුනිධය වස්සකාරය යන මගධරාජමහාමාත්‍යයෝ වළඳා අවසන්කළාවූ පාත්‍රයෙන් බැහැර කරණලද අත්ඇති භාග්‍යවතුන්වහන්සේ දූන එක්තරා මිටි අසුන් ගෙණ එකත්පසෙක උන්හ.

31. එකත්පසෙක උන්නාවූ සුනිධය වස්සකාරය යන මගධරාජ මහාමාත්‍යයන්ට භාග්‍යවතුන්වහන්සේ මේ දක්වන ගාථාවලින් භුක්තානුමොදනා කළසේක. ප්‍රඥාවන්තයෙක් යම් පෙදෙසෙක්හි වාසයකෙරේද, ඒ මේ ප්‍රඥාවන්තයාගේ වාසභවනයෙහිදී සංයමඇත් තාවූ එහෙයින් බඹසරඇත්තාවූ සිල්වතුන්වහන්සේලා වළඳවා.

යා තත්ථ දෙවතා ආසුං
තාසං දක්ඛිණමාදිසෙ,
තා පූජිතා පූජයන්ති
මානිතා මානයන්ති නං.

තතො නං අනුකම්පන්ති
මාතා පුත්තං'ව ඔරසං,
දෙවතානුකම්පිතො පොසො
සදා භද්‍රානි පස්සතී'ති.

අථ ඛො භගවා සුනිධවස්සකාරෙ මගධමහාමත්තෙ ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි.

32. තෙන ඛො පන සමයෙන සුනිධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා හොන්ති. 'යෙන'ජ්ජ සමණො ගොතමො ද්වාරෙන නික්ඛමිස්සති තං ගොතමද්වාරං නාම භවිස්සති, යෙන තිත්ථෙන ගඞ්ගං නදිං තරිස්සති තං ගොතමතිත්ථං නාම භවිස්සතීති. අථ ඛො භගවා යෙන ද්වාරෙන නික්ඛමි තං ගොතමද්වාරං නාම අහොසි.

---

ඒපෙදෙස්හි යම් දෙවතාකෙනෙක් වූවාහුද,ඒ දෙවතාවන්ට දක්ෂිණාමය කුසලය පමුණුවන්නේද, එහෙයින් මනුෂ්‍යයන්විසින් පුදනලද්දාවූ ඒ දෙවතාවෝ ඒ මිනිසුන් පුදත්. බුහුමන්කරණලද්දාවූ ඒ දෙවියෝ ඔවුන්ටබුහුමන්ද කෙරෙත්.ඊට අනතුරුව මව්තොමෝ උරෙසිදා පුතෙකුට මෙන් ඒ දෙවතාවෝ ඔවුන්ට අනුකම්පාකෙරෙත්. දෙවියන් විසින් අනුකම්පාකරණලද පුරුෂතෙම හැමකල්හි යහපත්කාරණයන් දකියයි කියායි.එකල්හි භාග්‍යවතුන්වහන්සේ සුනිධය වස්සකාරය යන මගධරාජමහාමාත්‍යයන් මේ ගාථාවලින් අනුමෝදන් කොට හුනස්නෙන් නැගී වැඩිසේක.

32. ඒකාලයෙහිදී සුනිධය වස්සකාරය යන මගධරාජමහාමාත්‍යයෝ භාග්‍යවතුන්වහන්සේ පිටිපසින් පිටිපසින් ලුහුබැන්දෝ වෙත්. අද ශ්‍රමණගෞතමයන්වහන්සේ යම් දොරකින් නික්මෙන්නේද, එය ගොතමද්වාර නම් වන්නේය. යම් තොටකින් ගඞ්ගානදියට තරණයකරන්නේද,එය ගොතමතිත්ථනම් වන්නේය කියායි.එකල්හි භාග්‍යවතුන්වහන්සේ යම් දොරකින් නික්මුණුසේක්ද, එය ගොතම ද්වාරනම්වූයේය.

33. අථ බො භගවා යෙන ගඞ්ගානදී තෙනුපසඞ්කමි. තෙන බො පන සමයෙන ගඞ්ගානදී පූරා හොති සමතිත්තිකා කාකපෙය්‍යා. අප්පෙකච්චෙ මනුස්සා නාවං පරියෙසන්ති. අප්පෙකච්චෙ උලුම්පං පරියෙසන්ති. අප්පෙකච්චෙ කුල්ලං බන්ධන්ති අපාරාපාරං ගන්තුකාමා. අථ බො භගවා සෙය්‍යථාපිනාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ගඞ්ගාය නදියා ඔරිමතීරෙ අන්තරහිතො පාරිමතීරෙ පච්චුට්ඨාසි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

34. අද්දසා බො භගවා තෙ මනුස්සෙ අප්පෙකච්චෙ නාවං පරියෙසන්තෙ, අප්පෙකච්චෙ උලුම්පං පරියෙසන්තෙ, අප්පෙකච්චෙ කුල්ලං බන්ධන්තෙ අපාරාපාරං ගන්තුකාමෙ. අථ බො භගවා එතමත්ථං විදිත්වා, තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

---

33. තවද භාග්‍යවතුන්වහන්සේ ගඞ්ගානම් නදිය යම්තැනෙක් හිද එතනට වැඩිසේක. ඒකාලයෙහිදී ගඞ්ගානම් නදීතොමෝ පිරුණු ජලයෙන් සමවූ තොට ඇත්ති ගංතෙරසිටි කවුඩන්විසින් බොන්නටහැකි ජලයඇත්තිද වෙයි, ඇතැම් මිනිස්සු ඔබ්මොබ යනු කැමැත්තෝ නැව් සොයත්. ඇතැම්කෙනෙක් පසුරු සොයත්, ඇතැම් කෙනෙක් පසුරු බදිත්. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ බලවත් පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගුකරන්නේ හෝ යම්සේද, දිගුකළ අතක් හකුළුවන්නේ හෝ යමසේද, එපරිද්දෙන්ම භික්‍ෂුසඞ්ඝයා සමග ගඞ්ගානදිහුගේ මෙතෙරදී අතුරුදහන්වූසේක් එතෙර එළඹසිටිසේක.

34. භාග්‍යවතුන්වහන්සේ ඒ මනුෂ්‍යයන් දුටුසේක්මය. ඒනම්, ඔබමොබ යනු කැමැතිව නැව්සොයන්නාවූ සමහර මිනිසුන්ද, පසුරු සොයන්නාවූ සමහර මිනිසුන්ද, පසුරු බදින්නාවූ සමහර මිනිසුන්ද යන මොව්හුයි. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මේ කාරණය දැන වදාරා ඒ වේලාවෙහි මේ ප්‍රීතිවාක්‍යය උදන් උදහරණයකළසේක

යෙ තරන්ති අණ්ණවං සරං
සෙතුං කත්වාන විසජ්ජපල්ලලානි,
කුල්ලංහි ජනො පබන්ධති
තිණ්ණා මෙධාවිනො ජනාති.

ප්‍රථමකභාණවරං නිට්ඨිතං.

2 1. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ආයාමානන්ද යෙන කොටිගාමො තෙනුපසඞ්කමිස්සාමාති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන කොටිගාමො තදවසරි. තත්‍ර සුදං භගවා කොටිගාමෙ විහරති.

---

යම්කෙනෙක් ඉතා ගැඹුරුවූද, පුළුල්වූද, තෘෂ්ණාසාගරය හෝ නදිය. තරණයකෙරෙත්ද. ඒ උතුමෝ ආයඞ්මාගීයයි කියනලද හෙය කොට මඩසහිතවූ නිම්නස්ථානයහැර තරණයකෙරෙත්, මහජනතෙමේ පසුරුබඳිත්, බුඬාදි ප්‍රඥවත් ජනයෝ ද්‍රව්‍යසම්භාරයෙන් කරණලද පසුරු හැර තරණයකලාහුය හෙවත් භවසාගරය තරණයකොට නිවන්නැමති ක්‍ෂෙමපුරයට පැමිණියෝයයි වදාළසේක.

මෙතෙකින් පළමුවෙනි බණවර කියා
නිමවනලදි.

2 1. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආනන්ද ආයුෂ්මතුන් ඇමතුසේක. ආනන්දය, මෙහි එව. යමු. මහාපනාද මිහිපල්හුගේ පහකෙලවර කළහෙයින් ලබනලද නම්ඇති කෝටිගම යම් තැනෙක්හිද එතනට එලඹෙන්නෙමුයි වදාළේය. ස්වාමින්වහන්ස, ඒ මැනවැයි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිව දන් දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මහද් භික්‍ෂු සඞ්ඝයා සමග කෝටිගම යම් තැනෙක්හිද එතනට වැඩිසේක. ඒකාලයෙහි භාග්‍යවතුන්වහන්සේ කෝටිග්‍රාමයෙහි වාසයකරණ සේක.

2. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. චතුන්නං භික්ඛවෙ අරියසච්චානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. කතමෙසං චතුන්නං, දුක්ඛස්ස භික්ඛවෙ අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. දුක්ඛසමුදයස්ස භික්ඛවෙ අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා .එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච, දුක්ඛනිරොධස්ස භික්ඛවෙ අරියසච්චස්ස ... පෙ ... දුක්ඛනිරොධගාමිනියා පටිපදාය භික්ඛවෙ අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං, මමඤ්චෙව තුම්හාකඤ්ච. තයිදං භික්ඛවෙ දුක්ඛං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං.

---

2. එහිදිද භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, චතුර්විධ ආර්‍ය්‍යසත්‍යයන්ගේ අවබොධ නොකිරීමෙන් හෙවත් නොදැනිමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන් මෙසේ මේ දිඝීකාලයක්මුලුල්ලෙහි මාවිසින්ද, තොපවිසින්ද. භවයෙන් භවයට ගමනාකිරීම් වශයෙන් දුවනලද්දේය. නැවත නැවත ගමනා ගමන වශයෙන් සැරිසරණ ලද්දේය. දෙ හෝ නොහොත් භවයෙන් භවයට මාගේ හා තොපගේ සන්ධාවන සංසරණදෙක වූයේයයි වදාළෝ. ඒ කවරනම් චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේදයත්! මහණෙනි, දුඃඛාර්‍ය්‍ය සත්‍යයාගේ අවබොධ නොකිරිම හෙතුකොටගෙණ ප්‍රතිවෙධ නොකිරිම හෙතුකොටගෙණ මෙසේ මේ දීඝීකාලයක් මුලුල්ලෙහි මාවිසින්ද, තොපවිසින්ද, සන්ධාවනය කරණලදි, සංසරණයද කරණලදී. මහණෙනි, දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යයාගේඅවබොධනොකිරීමහෙතුකොටගෙණ හාප්‍රතිවෙධ නොකිරිම හෙතුකොටගෙණ මෙසේ මේ දිඝීකාලයක් මුලුල්ලෙහි මාවිසින්ද තොපවිසින්ද, සන්ධාවනයකරණලදි. නැවත නැවත ගමනා ගමන වශයෙන් සංසරණයද කරණලදි. මහණෙනි, දුඃඛනිරොධාර්‍ය්‍ය සත්‍යයාගේ. සෙස්ස කී ක්‍රමයෙන් විස්තරයට පැමිණවියයුතු. මහණෙනි, දුඃඛනිරොධයට පමුණුවන සුලුවූ ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයාගේ අවබොධ නොකිරීමෙන් හා ප්‍රතිවෙධ නොකිරීමෙන් මාවිසින්ද තොපවිසින්ද, මෙසේ මේ දිඝීකාලයක් මුලුල්ලෙහි සන්ධාවනය කරණලද්දේය. සංසරණයද කරණලද්දේය. මහණෙනි, ඒ මේ දුඃඛාර්‍ය්‍යසත්‍යය අවබොධකරණ ලද්දේය. ප්‍රතිවෙධ කරණලද්දේය,

දුක්ඛසමුදයං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං, දුක්ඛනිරොධං අරිය සච්චං අනුබුද්ධං පටිවිද්ධං, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං, උච්ඡින්නා භවතණ්හා ඛීණා භවනෙත්ති, නත්‍ථි දානි පුනබ්භවොති.

3. ඉදමවොච භගවා, ඉදං වත්‍වා සුගතො අථාපරං එතදවොච සත්‍ථා.

> චතුන්නං අරියසච්චානං යථාභූතං අදස්සනා
> සංසිතං දීඝමද්ධානං තාසු තාසෙව ජාතිසු,
> තානි එතානි දිට්ඨානි භවනෙත්ති සමූහතා
> උච්ඡින්නමූලං දුක්ඛස්ස නත්‍ථි දානි පුනබ්භවොති.

---

දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යය අවබොධ කරණලද්දේය. ප්‍රතිවෙධ කරණ ලද්දේය, දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය අවබොධ කරණලද්දේය. ප්‍රති වෙධ කරණලද්දේය. දුඃඛනිරොධයට පමුණුවන සුලුවූ ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය අවබොධ කරණලද්දේය. ප්‍රතිවෙධ කරණලද්දේය. භව තෘෂ්ණා තොමෝ සහමුලින් සිඳිනලද්දීය. සත්‍වයන්භවයෙන් භව යට ගෙණයාමට සමර්‍ථවූ තෘෂ්ණා තොමෝ සර්‍වප්‍රකාරයෙන් ක්‍ෂයවීය. දැන් පුනර්භවයක් හෙවත් නැවත භවයෙහි ඉපදීමක් නැතැයි කියායි.

3. භාග්‍යවතුන්වහන්සේ මේ ධර්‍මය වදාළසේක. සුගතනම්ලද ශාස්තෘවරයන්වහන්සේ මෙ ධර්‍මයවදාරා නැවතඅනිකක්වූ මේ ගාථා ධර්‍මද වදාළේය. දුඃඛ, සමුදය, නිරොධ. මාර්‍ග, යන චතුරාර්‍ය්‍යසත්‍යයන් ගේ තත්වූ පරිද්දෙන් නොදැක්ම හෙතුකොටගෙණ දීර්‍ඝකාලයක් මුලුල්ලෙහි ඒ ඒ ජාතිවල ඔබ්මොබ සැරසරා ඇවිද්දෙම්. ඒ මේ චතුස්ස ත්‍ය ධර්‍මයෝ දක්නාලද්දාහුය. සත්‍වයන් සසර ප්‍රපඤ්චකරණභව නෙත්තිනම්ලද තෘෂ්ණාතොමෝ සහමුලින් නසනලද්දීය. සකල වර්‍තදුඃඛයාගේ උදුරාහරණලද මුල්ඇත්තේය, නැවත පුනරුත්පත් තියක් නැතැයි වදාළසේක.

4. තත්‍රාපි සුදං භගවා කොටිගාමෙ විහරන්තො එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කථෙති. ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා, සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො, සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා, පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යපිදං, කාමාසවා භවාසවා අවිජ්ජාසවාති.

5. අථඛො භගවා කොටිගාමෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ආයාමානන්ද යෙන නාදිකා තෙනුපසඞ්කමිස්සාමාති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන නාදිකා තදවසරි. තත්‍රසුදං භගවා නාදිකෙ විහරති ගිඤ්ජකාවසථෙ.

---

4. එතැන්හිද භාග්‍යවතුන්වහන්සේ කොටිග්‍රාමයෙහි වාසයකරණසේක් භික්ෂූන්ට බොහොසෙයින් මේ ධර්මකථාවම කරණසේක. මේ සීලයයි මේ සමාධියයි මේ ප්‍රඥාවයි. චතුපාරිශුද්ධිශීලයෙහි පිහිටාවඩනලද සමාධිය මහත්ඵල ඇත්තේය, මහත් අනුසස්ද ඇත්තේය, සමාධියෙහි පිහිටා වඩනලද ප්‍රඥතොමෝ මහත්ඵල ඇත්තිවෙයි, මහත් අනුසස්ද ඇත්තීය. ප්‍රඥාවෙහි පිහිටා වඩනලද සිත මනාකොට ආශ්‍රවයන්කෙරෙන්, ඒ නම් කාමාශ්‍රවය, භවාශ්‍රවය, දෘෂ්ටිආශ්‍රවය, අවිද්‍යාශ්‍රවය, යන මොවුන් කෙරෙන් විශෙෂයෙන් මිදේයයි කියාසි.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ කෝටිගමෙහි අභිරතිකාලයක් මුලුල්ලෙහි අධ්‍යාශය පරිද්දෙන් වාසයකොට ආනන්ද අයුෂ්මතුන් ඇමතූසේක. මෙහි එව, ආනන්දය, යමු. නාදිකානම් ගම යම්තැනෙක්හිද එතට එලඹෙන්නෙමුයි වදාළේය. ස්වාමින්වහන්ස, ඒ මැනවයි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මහත් භික්ෂුසඞ්ඝයා සමග නාදිකාගම යම්තැනෙක්හිද එතනට පැමිණියේය. එහි භාග්‍යවතුන්වහන්සේ නාදිකානම් ගමෙහි ගිඤ්ජකාවස්ථානම්වූ උළුගෙයක වාසයකරණසේක.

6. අථඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. සාළ්හො නාම භන්තෙ භික්ඛු නාදිකෙ කාලකතො, තස්ස කා ගති කො අභිසම්පරායො, නන්දා නාම භන්තෙ භික්ඛුනී නාදිකෙ කාලකතා, තස්සා කා ගති කො අභිසම්පරායො. සුදත්තො නාම භන්තෙ උපසකො නාදිකෙ කාලකතො, තස්ස කා ගති කො අභිසම්පරායො. සුජාතා නාම භන්තෙ උපාසිකා නාදිකෙ කාලකතා, තස්සා කා ගති කො අභිසම්පරායො. කකුධො නාම භන්තෙ උපාසකො නාදිකෙ කාලකතො තස්ස කා ගති කො අභිසම්පරායො. කාලිඞ්ගො නාම භන්තෙ උපාසකො—පෙ—නිකටො නාම. භන්තෙ උපාසකො කටිස්සභො නාම භන්තෙ උපාසකො.

---

6. ඉක්බිත්තෙන් ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය, එළඹ භාග්‍යවතුන්වහන්සේ සකස්වැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. ස්වාමීන්වහන්ස, නාදිකනම් ඥාතිග්‍රාමයෙහි සාල්හනම් භික්ෂුතෙමේ කලුරියකළේය, ඔහුගේ ගතිය කවරීද, පරලොව කවරේදැයි විචාළේය. ස්වාමීන්වහන්ස, නන්දානම් භික්ෂුතොමෝ නාදිකනම් ගමෙහි කලුරියකළාය, ඇගේ ගතිය කවරීද, පරලොව කවරේදැයි විචාළේය. ස්වාමීන්වහන්ස, නාදිකගමෙහි සුදත්තනම් උපාසකතෙමේ කලුරිය කළේය, ඔහුගේ ගතිය කවරීද, පරලොව කවරේදැයි විචාළසේක. ස්වාමීන්වහන්ස, නාදික ගමෙහි සුජාතානම් උපාසිකාතොමෝ කලුරිය කළාය, ඇගේ ගතියකවරීද, පරලොව කවරේදැයි විචාළේය. ස්වාමීන්වහන්ස නාදිකාගමෙහි කකුධනම් භික්ෂුතෙමේ කලුරියකළේය, ඔහුගේ ගතියකවරීද, පරලොව කවරේදැයි විචාළේය. ස්වාමීන්වහන්ස, කාලිඞ්ගනම් උපාසකතෙමේද, සෙස්ස ප්‍රථම වාරාදියෙහි මෙනි. ස්වාමීන්වහන්ස, නිකටනම් උපාසකතෙමේද, ස්වාමීන්වහන්ස, කටිස්සභනම් උපාසකතෙමේද.

තුඨොනාම භන්තෙ උපාසකො, සන්තුඨොනාම භන්තෙ උපාසකො, භද්‍රොනාම භන්තෙ උපාසකො, සුභද්‍රොනාම භන්තෙ උපාසකො, නාදිකෙ කාලකතො, තස්ස කා ගති කො අභිසම්පරායොති.

7. සාළ්හො ආනන්ද භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. නන්‍ද ආනන්ද භික්ඛුනි පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්‍ථ පරිනිබ්බායිනි අනාවත්තිධම්මා තස්මාලොකා. ......පෙ...... සුදත්තො ආනන්ද උපාසකො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමි සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සති.

---

ස්වාමීන්වහන්ස, තුඨනම් උපාසකතෙමේද, ස්වාමීන්වහන්ස, සන්තුඨනම් උපාසකතෙමේද, ස්වාමීන්වහන්ස, භද්‍රනම් උපාසකතෙමේද, ස්වාමීන්වහන්ස, නාදිකගමෙහි සුභද්‍රනම් උපාසකමේද කලුරියකළේය. ඔහුගේ ගතියකවරිද, පරලොව කවරේදැයි විචාළසේක.

7. ආනන්දය, සාළ්හ භික්‍ෂුතෙමේ කාමාශ්‍රවාදි චතුරාශ්‍රවයන්ගේ ක්‍ෂයකිරීමෙන් කාමාදි ආශ්‍රවරහිතවූ චිත්තවිමුක්තියද, ප්‍රඥාවිමුක්තියද, හෙවත් අර්හත්ඵල ඥානයද මේ අත්බැව්හි තෙමේම ස්වයම්භූ ඥානයෙන් ප්‍රත්‍යක්‍ෂකොට ඊට පැමිණ වාසයකළේය. ආනන්දය, නන්‍දනම් භික්‍ෂුනි තොමෝ කාමධාතුව භජනය කරන්නාවූ සත්කාය දෘෂ්ටිආදි පඤ්චවිධ සංයොජනයන්ගේ අනාගාමි මාර්ගයෙන් ක්‍ෂය කිරීමහෙතුකොටගෙණ සුදවැසි බඹතෙලෙහි ඔපපාතිකවූවා ඒ රූප ලොකයෙන් පුනරුත්පත්තියට පැමිණීම්වශයෙන් නැවත පෙරළෙන ස්වභාවනැත්තී. ඒ සුදවැසි බඹතෙලෙහිදීම ක්ලෙශ පරිනිර්වාණය හා ස්කන්ධ පරිනිර්වාණයද කරන්නීයයි වදාළේය ආනන්දය, සුදත්තනම් උපාසකතෙම කාමරාගාදි ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්‍ෂය කිරීමෙන් රාග ද්වේෂ මොහයන්ගේ තුනීබව හෙතුකොටගෙණ සකෘදාගාමි මාර්ගඵල ප්‍රාප්තවූයේ එකවරක්ම උත්පත්ති වශයෙන් මේ මිනිස්ලොවට අවුත් සංසාරික දුඃඛස්කන්ධයාගේ කෙළවරකරන්නේයයි වදාළසේක.

සුජාතා ආනන්ද උපාසිකා තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායනා. කකුධො ආනන්ද උපාසකො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්‍ථ පරිනිබ්බායී අනාවත්ති ධම්මා තස්මා ලොකා. කාලිඞ්ගො ආනන්ද උපාසකො ...පෙ... නිකටො ආනන්ද උපාසකො. කටිස්සභො ආනන්ද උපාසකො, තුට්ඨො ආනන්ද උපාසකො, සන්තුට්ඨො ආනන්ද උපාසකො. භද්දෙ ආනන්ද උපාසකො. සුභද්දො ආනන්ද උපාසකො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො තත්‍ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. පරො පඤ්ඤාස ආනන්ද නාදිකෙ උපාසකා කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්‍ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා.

---

ආනන්දය, සුජාතානම් උපාසිකාතොමෝ සත්කාය දෘෂ්ටි ආදි ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්‍ෂයකිරීමහෙතුකොට ශ්‍රොතආපත්ති මාර්ගඵල ප්‍රාප්තවූවා පෙරළෙන ස්වභාවනැත්ති නිර්වාණ ධර්මාව බොධය නියතවූවා සම්‍යක් සම්බොධිය හෙවත් අර්හත් මාර්ගඥාන යයි පිහිටකොට ඇත්තීයයි වදාළසේක. ආනන්දය, කකුධනම් උපාසකතෙමේ කාමධාතු භජනයකරන්නාවූ පඤ්චවිධ සංයොජනයන්ගේ ක්‍ෂයකිරීමෙන් ඔපපාතිකවූයේ ඒ ශුද්ධාවාස බ්‍රහ්මතලයෙන් පුනරුත්පත්ති වශයෙන් නොපෙරළෙන ස්වභාවඇත්තේ ඒ ශුද්ධාවාස බ්‍රහ්මතලයෙහිදීම පිරිනිවන් පාන්නේයයි වදාළේය. ආනන්දය, කාලිඞ්ගනම් උවසු තෙමේද, ආනන්දය, නිකටනම් උවසුතෙමේද, ආනන්දය, කටිස්සභනම් උවසුතෙමේද ආනන්දය, තුට්ඨනම් උවසුතෙමේද ආනන්දය, සන්තුට්ඨනම් උවසුතෙමේද ආනන්දය, භද්දනම් උවසුතෙමේද ආනන්දය, සුභද්දනම් උවසුතෙමේද ඔරම්භාගියසංයොජනපස ක්‍ෂයකිරීමෙන් ඔපපාතිකවූයේ ඒ ශුද්ධාවාසබ්‍රහ්මලොකයෙන් පෙරළෙන ස්වභාවනැත්තේ එහිදීම පිරිනිවන් පාන්නේයයි වදාළේය. ආනන්දය, නාදිකනම් ග්‍රාමයෙහි පණසකට වැඩිවූ උපාසකයෝ කළුරියකළාහුය. ඔව්හු පඤ්චවිධ ඔරම්භාගීය සංයොජනයන්ගේ ක්‍ෂයකිරීමෙන් ඔපපාතිකවූවාහු ඒ බ්‍රහ්මලොකයෙන් පුනරුත්පත්තිවශයෙන් පෙරළෙන ස්වභාව නැත්තාහු ඒ ශුද්ධාවාස බ්‍රහ්මතලයෙහිදීම පිරිනිවන් පාන්නාහුයයි වදාළසේක.

සාධිකා න වුති ආනන්ද නාදිකෙ උපාසකා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. සාතිරෙකානි ආනන්ද පඤ්චසතානි නාදිකෙ උපාසකා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායනා.

8. අනච්ඡරියං ඛො පනෙතං ආනන්ද යං මනුස්සභූතො කාලං කරෙය්‍ය, තස්මිං තස්මිඤ්ඤෙව කාලකතෙ තථාගතං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡිස්සථ, විහෙසා වෙසා ආනන්ද තථාගතස්ස. තස්මාතිහානන්ද ධම්මාදසං නාම ධම්මපරියායං දෙසෙස්සාමි යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය. ඛීණනිරයොම්හි.

---

ආනන්දය, නාදිකනම් ඥාතිග්‍රාමයෙහි අනුවකට වැඩිවූ උපාසකයෝ කලුරිය කළාහුය. ඔව්හු ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්‍ෂය කිරීමෙන් රාග ද්වේෂ මොහයන්ගේ තුනීකිරීම හෙතුකොටගෙණ සකෘදාගාමි මාර්ගඵල ප්‍රාප්තවූවෝ එකවරක්ම මේ මිනිස්ලොවට උත්පත්ති වශයෙන් පැමිණ දුක්රාශිහුගේ කෙළවර කරන්නාහුය. ආනන්දය, වැඩියක් සහිතවූ පන්සියයක් උපාසකයෝ නාදික ගමෙහි කලුරිය කළාහුය. ඔව්හු සත්කාය දෘෂ්ටිආදි ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්‍ෂයකිරීමෙන් ශ්‍රොතආපත්ති මාර්ගඵල ප්‍රාප්තවූවෝ නොපෙරළෙන ස්වභාව ඇත්තෝ නිර්වාණාවබොධය නියමවූවෝ හෙවත් අර්හත් ඵලඥානය පිහිටකොට ඇත්තෝ වන්නාහුයයි වදාළසේක.

8. ආනන්දය, මිනිසත්බවට පැමිණි යමෙක් කලුරියකරන්නේද, ඒඒසත්වයන් කලුරිය කළකල්හි තථාගතයන්වෙතට පැමිණ මේ අර්ථය හෙවත් ඔහුගේ ගතිආදිය විචාරන්නාහුනම් මෙය ආශ්චර්‍ය්‍ය නොවේමය. ආනන්දය, මෝ තොමෝ තථාගතයන්වහන්සේට වෙහෙසක්ම වේයයි වදාළේය. ආනන්දය, එහෙයින් ධර්මාදසනම්ධර්ම ක්‍රමයක් දෙශනා කරන්නෙමි. යම් ධර්මදෙශනාවකින් යුක්තවූ ආර්ය්‍ය ශ්‍රාවකතෙම ඉදින් කැමතිවන්නේනම් ක්‍ෂයවූ නිරුදුක්ඇත්තෙම් වෙමි.

ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්ති විසයො ඛීණාපායදුග්ගති විනිපාතො, සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

9. කතමොච සො ආනන්ද ධම්මාදාසො ධම්මපරියායො යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය, ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්ති විසයො ඛීණාපායදුග්ගති විනිපාතො, සොතාපන්නොහමස්මි අවිනි පාත ධම්මො නියතො සම්බොධි පරායනොති. ඉධානන්ද අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති. ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

---

ක්‍ෂයවූ තිරශ්චීන දුක්ඇත්තෙම් වීමි. ක්‍ෂයවූ ප්‍රෙත දුක් ඇත්තෙම් වීමි. ක්‍ෂයවූ අපාය දුර්ගතිවිනිපාතයන් ඇත්තෙම් වෙමි. මම ශ්‍රොත ආපන්නවෙමි. නොපෙරළෙන ස්වභාව ඇත්තෙක්මි. නිර්වාණාවබොධය නියතවෙමි. අර්හත්ඵලඥානලාභය පිහිටකොට ඇත්තෙම්වෙමියි කියායි.

9. ආනන්දය, ධර්මාදශනම්වූ ඒ ධර්මක්‍රමය කවරේදයත්, යම් ධර්මක්‍රමයකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඉදින් කැමතිවන්නේනම් තෙමේම තමා ප්‍රකාශකරන්නේය. කෙසේද, ක්‍ෂයවූ නිරාදුක් ඇත්තෙමි. ක්‍ෂයවූ තිරිසන්යොනි ඇත්තෙමි. ක්‍ෂයවූ ප්‍රෙතවිසය ඇත්තෙමි. ක්‍ෂයවූ අපායදුර්ගති විනිපාතයන් ඇත්තෙමි. මම නොපෙරළෙන ස්වභාව ඇත්තාවූ නියතගති ඇත්තාවූ සම්‍යක් සම්බොධිය පිහිට කොට ඇත්තාවූ සෝවාන්වෙමි කියායි. ආනන්දය, මේ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම බුදුන්කෙරෙහි ගුණ දැන පැහැදීමයයි කියනලද අචලප්‍රසාදයෙන් යුක්තවේද. කෙසේදයත්, මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන්වහන්සේ අර්හත්ය, චතුස්සත්‍යාවබොධකළසේක. අෂ්ට විද්‍යා පසළොස්චරණධර්මයන්ගෙන් සමන්විතසේක. ශොභන ගමන් ඇතිසේක. ලොකත්‍රය දන්නාසේක. ශ්‍රෙෂ්ඨවූ චණ්ඩපුරුෂයන් හික්මවීමෙහි ප්‍රධානසේක. දෙවිමිනිසුන්ට අනුශාසනාකරණසේක. සම්‍යක් සම්බුද්ධසේක. භාග්‍යවත්සේකැයි කියායි.

ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති. ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති. සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා, එසභගවතො සාවකසඞ්ඝො, ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති. අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති. අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤූප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි.

ධර්මයෙහි ගුණදන්න පැහැදීමෙන් යුක්තවේද, භාග්‍යවතුන්වහන්සේ විසින්ධර්මයතෙම මනාකොට දෙශනාකරණලද්දේය. ඉහාත්මයෙහි දක්කහැකි ඵල ගෙණදෙන්නේය. කල්නොයවාදියයුතු ඵල ඇත්තේය.මෙහි එව. මේ ධර්මයෙහි ගුණය බලව කියා දක්වීමට සුදුසුය. උපනයනයට සුදුසුය. නුවනැත්තන්විසින් තමතමන් කෙරෙහිලා දතයුතු ගුණ ඇත්තේය කියායි, සඞ්ඝයාකෙරෙහි ගුණදන පැහැදීමෙන් යුක්තවේද. කෙසේද, භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝතෙමේ මනාකොට පිළිපන්නේය, භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝතෙමේ සෘජුවූ ප්‍රතිපත්තියෙන් පිළිපන්නේය. භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝතෙමේ න්‍යායවූ පරිද්දෙන් පිළිපන්නේය, භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝතෙමේ ඉදුරුම ආයර්‍ය්‍යමාර්ගයට පමුණුවන මැදුම්පිළිවෙතින් යහපත්ව පිළිපන්නේය ඒනම්, පුරුෂ පුද්ගල අටදෙනෙක්වූ යම් මේ පුරුෂයුග සතරක් වේනම් එයයි. භාග්‍යවතුන්වහන්සේගේ මේ සව්සඟතෙමේ පූජාවට සුදුසුය. දුරසිට පමුණුවාලන සැදැහැතියන්ගේ උත්තම පූජාවට සුදුසුය, දක්ෂිණාවට සුදුසුය, දෙවබ්‍රහ්මාදින්විසින් ඇඳිලිකටයුත්තේ වෙයි, ලෝවැස්සාගේ උත්තම පුණ්‍යක්ෂෙත්‍රයක කියාය, කඩනොවූ සිදුරුනැත්තාවූ කාලවර්ණාදි වශයෙන් සබලනොවූ කැලල්නැත්තාවූ දසත්වයෙන් මිදුනාවූ නුවණැත්තන්විසින් පසස්නාලද්දවූ පරාමර්ශනය නොකරණලද්දවූ චිත්තසමාධියපිණිස පවත්නාවූ ආර්‍ය්‍යයන් විසින් මැනවැයි සම්මතකරණලද්දවූ සීලයන්ගෙන් සමන්විත වේද, (අඛණ්ඩතාදියපිළිබඳ විස්තරය ප්‍රථම භාණවාරයෙහි කියූ පරිද්දෙන් දතයුතු.)

අයං ඛො සො ආනන්ද ධම්මාදාසො ධම්මපරියායො යෙන සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය ඛීණනිරයොම්හි, 'ඛීණතිරච්ඡානයොනියො,ඛීණපෙත්තිවිසයො, ඛීණාපායදුග්ගති විනිපාතො, සොතාපන්නො'හමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

10. තත්‍ර සුදං භගවා නාදිකෙ විහරන්තො ගිඤ්ජකාවසථෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති. ඉති සීලං, ඉති සමාධි ඉති පඤ්ඤා......පෙ......සෙය්‍යථිදං කාමාසවා භවාසවා දිට්ඨාසවා අවිජ්ජාසවාති.

11. අථ ඛො භගවා නාදිකෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි'ආයාමානන්ද යෙන වෙසාලී තෙනුපසඞ්කමිස්සාමාති.

---

ආනන්දය, මේ ධර්මාදශනම් ඒ ධර්මක්‍රමයයි කියනුලැබේ. ඒනම් යම් ධර්මක්‍රමයකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම ඉදින් කැමතිවන්නේනම් තෙමේම තමන් ප්‍රකාශකරන්නේය. කෙසේද, ක්‍ෂයවූ, නිරාදුක් ඇත්තෙමි, ක්‍ෂයවූ තිරශ්චීනයොනියෙහිවූ දුක්ඇත්තෙමි, ක්‍ෂයවූ ප්‍රෙතවිසය ඇත්තෙමි, ක්‍ෂයවූ අපායදුර්ගතිවිනිපාතයන් ඇත්තෙමි, මම නොපෙරළෙන සවභාව ඇත්තාවූ නියතගති ඇත්තාවූ සම්‍යක් සම්බොධිය පිහිටකොට ඇත්තාවූ සෝවාන්මගපල පැමිණියෙක් වෙමි කියායි.

10. භාග්‍යවතුන්වහන්සේ ඒ නාදිකගමෙහිවූ ගිඤ්ජකාවසථනම් විහාරයෙහි වාසයකරණසේක් භික්‍ෂූන්ට බොහෝසෙයින් මේ ධර්මදෙශනාව කරණසේක. මේ සීලයයි, මේ සමාධියයි, මේ ප්‍රඥාවයි, සෙස්ස පෙර පරිද්දෙන් විස්තරකටයුතු, ඒනම්, කාමාශ්‍රවය, භවාශ්‍රවය, අවිද්‍යාශ්‍රවය යන මොවුන්කෙරෙන් මිදුනේය කියායි,

11, ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ නාදිකගමෙහි අභිරතිකාලයක් අධ්‍යාශය පරිද්දෙන් වාසයකොට, ආනන්ද ආයුෂ්මතුන් ඇමතූසේක, මෙහි එව, ආනන්දය, යමු විසාලී පුරිය යම්තැනෙක්හිද එතනට එළඹෙන්නෙමුයයි වදාළේය,

එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන වෙසාලී තදවසරි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති අම්බපාලිවනෙ.

12. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. සතො භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය සම්පජානො, අයං ඛො අම්හාකං අනුසාසනී. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සතො හොති. ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති. ආතාපීසම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං වෙදනාසු—පෙ—චිත්තෙ—පෙ—ධම්මෙසු ධම්මානුපස්සී විහරති. ආතාපීසම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං,එවං ඛො භික්ඛවෙ භික්ඛු සතො හොති.

---

ස්වාමින්වහන්ස, ඒ ඉතා මැනවැයි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්නේය, එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහද් භික්ෂුසඞ්ඝයා සමග විසාලිපුරිය යම්තැනෙක්හිද එතනටවැඩිසේක, භාග්‍යවතුන්වහන්සේ ඒවිසාලිපුරියෙහි අම්බපාලී නම් ගණිකාවගේ අඹවන උයනෙහි වාසයකරණසේක,

12, එහිදී භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන් ඇමතූසේක, මහණෙනි භික්ෂුතෙම ස්මෘතිමත්ව හෙවත් සිහිඇතිව සම්‍යක්ප්‍රඥාවෙන් සලකා කරණ කටයුතු ඇත්තෙක්ව වාසයකෙරේද, මේ තොපට අපගේ අනුශාසනාවයයි වදාළසේක, මහණෙනි, භික්ෂුතෙම කෙසේනම් සිහි ඇත්තේ වේද, මහණෙනි, මේ සස්නෙහි භික්ෂුතෙම බඹයක් පමණවූ මේ කයෙහි සර්වප්‍රකාරයෙන් අසුභරාශියෙන් සම්පූර්ණ දුඃඛස්කන්ධයක්යයි අසුබහෙයින් දුන කෙලෙස්තවන වීර්‍ය්‍යඇතිව සම්‍යක්ප්‍රඥා ඇතිව සිහියෙන් යුක්තවූයේ ලොකනම්වූ මේ පඤ්චස්කන්ධයෙහි කාමච්ඡන්දයයි කියූ ලොභයද, ව්‍යාපාදයයිකියූ දොම්නසද,යන මේ පාපධර්මයන් දුරුකොට හෙවත් ක්ලෙශදුහය මැඩගෙණ කායගතා සති භාවනාව වඩමින්වාසයකෙරේද,වෙදනාවන්කෙරෙහි, සිතෙහි සෙස්ස ප්‍රථමවාරයෙහි මෙනි, පඤ්චනිවරණාදි ධර්මයන්කෙරෙහි කෙලෙස්තවන වීර්‍ය්‍යඇතිව සම්‍යක්ප්‍රඥාඇතිවස්මෘතිමත්ව නීවරණාදි ධර්මලොකයෙහි ලොභය හා දොම්නස සංසිඳුවාගෙණ ධර්මානුදර්ශීව වාසයකෙරේද, මහණෙනි, භික්ෂුතෙමේ මෙසේ සිහිඇත්තේ වේයයි වදාළසේක,

13. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සම්පජානො හොති. ඉධ භික්ඛවෙ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු සම්පජානො හොති. සතො භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය සම්පජානො, අයං ඛො අම්හාකං අනුසාසනීති.

14. අස්සොසි ඛො අම්බපාලීගණිකා භගවා කිර වෙසාලියං අනුප්පත්තො වෙසාලියං විහරති මය්හං අම්බවනෙති,

13. මහණෙනි, භික්ෂුතෙමේ කෙසේනම් සම්‍යක් ප්‍රඥාඇත්තේවේද, මහණෙනි, මේ සස්නෙහි භික්ෂුතෙමේ ඉදිරියට ගමනෙහිද, පෙරලා ගමනෙහිද සම්‍යක් ප්‍රඥාවෙන් දැන කරන්නේවේද, ඉදිරිය බැලීමෙහිද නත්දිගුන් බැලීමෙහිද සම්‍යක්ප්‍රඥාවෙන් දැනකරන්නේවේද, අත් පා හැකිලවීමෙහිද දිගුකිරීමෙහිද, සම්‍යක් ප්‍රඥාවෙන් දැන කටයුතුක රන්නේවේද, සඟලසිවුරු පා දැරීමෙහිද සම්‍යක් ප්‍රඥාවෙන් දැනක රන්නේවේද. අනුභවකිරීමෙහිද, පානයකිරීමෙහිද, කඩාකෑමෙහිද, රසාස්වාදනය කිරීමෙහිද සම්‍යක් ප්‍රඥාවෙන් දැනකරන්නේවේද, මල මූත්‍ර, බැහැරකිරීමෙහිද සම්‍යක් ප්‍රඥාවෙන් දැනකරන්නේවේද, ගමනෙහිද සිටීමෙහිද, හිඳීමෙහිද, සයනයකිරීමෙහිද, නිදි නොරකිරීමෙහිද, කථාකිරීමෙහිද, නිශ්ශබ්ද භාවයෙහිද, සම්‍යක් ප්‍රඥාවෙන් දැන කරන්නේවේද. මහණෙනි, භික්ෂුතෙමේ මෙසේනම් සම්‍යක්ප්‍රඥා ඇත්තේවේයයි වදාළේය. මහණෙනි, භික්ෂුතෙමේ සිහිඇත්තේ, සම්‍යක් ප්‍රඥාඇතිව වාසයකෙරේද, මේ තොපට අපගේ ධර්මානුශාසනායයි වදාළසේක.

14. භාග්‍යවතුන්වහන්සේ වෙසාලීපුරියට පිළිවෙළින්වැඩිසේක් වෙසාලීපුරියෙහිවූ මාගේ අඹවන වෙහෙර වාසයකරණසේක්ලයි අම්බපාලීගණිකාතොමෝ ඇසුවාමය.

අථ ඛො අම්බපාලිගණිකා භද්දානි භද්දානියානානි යොජාපෙත්වා,භද්දං යානං අභිරූහිත්වා භද්දෙහි භද්දෙහි යානෙහි වෙසාලියංනිය්‍යාසි, යෙනසකො ආරාමො තෙනපායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකාව යෙන භගවා තෙනුපසඞ්කමි, උසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අම්බපාලිංගණිකං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි, අථ ඛො අම්බපාලිගණිකා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං එතදවොච. අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන, අථ ඛො අම්බපාලීගණිකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

---

ඉක්බිත්තෙන් අම්බපාලීගණිකාතොමෝ යහපත් යහපත් යානාවන් යොදවා යහපත් යානාවකට නැගීයහපත්යහපත්යානාවලින්වෙසාලීපුරියට පිටත්ව ගියාය.තමාගේ අඹවන උයන යම්තැනෙක්හිද එතනටගියාය. යානාවෙන් යායුතුභූමියම්පමණද එපමණතැන් යානාවෙන්ගොස්යානාවෙන්බැස පයින්ම භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිදඑතනටඑලඹියාය.එලඹභාග්‍යවතුන්වහන්සේසකසාවැඳ එකත්පසෙකඋන්නීය.එකත්පසෙක උන්නාවූ අම්බපාලීගණිකාවට භාග්‍යවතුන්වහන්සේදැහැමිකථාවෙන් කරුණුදක්වා වදාළසේක. එහිසමාදන්කරවූසේක.එහිතෙදගැන්වූසේක,එහි වැඩියක්සතුටුකරවූසේක. එකල්හි අම්බපාලීගණිකාතොමෝ භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මකථාවෙන් මනාකොට කරුණුදක්වනලද්දී, සමාදානය කරවනලද්දී ඒ ධර්මයෙහි මනාකොට තෙදගන්වන ලද්දී වැඩියක් සතුටුකරවනලද්දී භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැලකළාය. ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග සෙට දවස මාගේ බත ඉවසනසේක්වා යනුයි, භාග්‍යවතුන්වහන්සේ නිශ්ශබ්දභාවයෙන් ඉවසාවදාළසේක. ඉක්බිත්තෙන් අම්බපාලීගණිකාතොමෝ භාග්‍යවතුන්වහන්සේ ඇයගේ ආරාධනාව ඉවසා වදාළබව දැන හුනස්නෙන්නැගිට භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ පැදකුණුකොට ගියාය.

15. අස්සොසුංඛො වෙසාලිකා ලිච්ඡවී භගවා කිර වෙසාලියං අනුප්පත්තො වෙසාලියං විහරති අම්බපාලිවනෙති. අථ ඛො තෙ ලිච්ඡවී භද්දානි භද්දානි යානානි යොජාපෙත්වා භද්දං භද්දං යානං අභිරූහිත්වා භද්දෙහි භද්දෙහි යානෙහි වෙසාලියං නියිංසු. තත්‍රෙකච්චෙ ලිච්ඡවී නීලාහොන්ති නීලවණ්ණා නීලවත්ථා නීලාලඞ්කාරා, එකච්චෙ ලිච්ඡවී පීතා හොන්ති පීතවණ්ණා පීතවත්ථා පීතාලඞ්කාරා, එකච්චෙ ලිච්චවී ලොහිතකා හොන්ති ලොහිතකවණ්ණා ලොහිතකවත්ථා ලොහිතාලඞ්කාරා, එකච්චෙ ලිච්ඡවී ඔදාතා හොන්ති ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරා.

16. අථ ඛො අම්බපාලිගණිකා දහරානං දහරානං ලිච්ඡවීනං අක්ඛෙන අක්ඛං චක්කෙන චක්කං යුගෙන යුගං පටිවට්ටෙසි.

---

15. වෙසාලිපුරියෙහි ලිච්ඡවිරජහු මේකාරණ ඇසුවාහුමය. කුමක්ද, භාග්‍යවතුන්වහන්සේ වෙසාලිපුරියට පිලිවෙළින් වැඩිසේක්, වෙසාලිපුරියෙහිවූ අම්බපාලිගණිකාවගේ උයනෙහි වාසයකරණසේකයනුයි. එකල්හි ඒ ලිච්ඡවිරජහු යහපත් යහපත් යානාවන්යොදවා යහපත් යහපත් යානාවලට නැගී යහපත් යහපත් යානාවලින් වෙසාලිපුරියට පිටත්ව ගියාහුය. ඔවුන් අතුරෙන් සමහර ලිච්ඡවිකෙනෙක් නිල්වස්ත්‍රඇත්තෝ නිල්වෙත්. නිලවණී ආභරණ පැලැත්දෙ නීලවණීඇත්තෝද වෙත්, සමහර ලිච්ඡවිකෙනෙක් රන්වන්වස්ත්‍ර ඇත්තෝ රන්වන්වෙත්, රන්වන් මැණික් ආබරණ ආදිය ඇත්තෝ රන්වන්වෙත්. සමහර ලිච්ඡවිකෙනෙක් රක්ත වස්ත්‍රඇත්තෝ රක්තවණීවෙත්, රක්තවණීආභරණ ඇත්තෝ රක්තවණීවෙත්. සමහරලිච්ඡවි කෙනෙක් සුදුවස්ත්‍ර ඇත්තෝ සුදුවෙත්, සුදුආභරණ පැලැත්දෙ ශුභ්‍රවණීවෙත්.

16. ඉක්බිත්තෙන් අම්බපාලිගණිකාතොමෝ ඉතා තරුණ ලිච්ඡවී රජුන්ගේ රථහිස්වලට තමාගේ රථහිසින්ද තමාගේ රථචක්‍රයෙන් ඔවුන්ගේ රථචක්‍රයටද තමාගේ රථවියෙන් ඔවුන්ගේ රථවියටද ගැසුවාය හෙවත් ඇන්නාය.

අථ ඛො තෙලිච්ඡවී අම්බපාලිං ගණිකං එතදවොචුං. කිඤ්ජෙ අම්බපාලිදහරානං දහරානං ලිච්ඡවීනං අක්ඛෙන අක්ඛං චක්කෙන චක්කං යුගෙන යුගං පතිවට්ටෙසීති. තථාහි පන මෙ අය්‍යපුත්තා භගවා නිමන්තිතො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. දෙහිජෙ අම්බපාලි එතං භත්තං සතසහස්සෙනාති. සචෙපි මෙ අය්‍යපුත්තා වෙසාලිං සාහාරං දස්සථ, එවං මහන්තං භත්තං න දස්සාමීති. අථ ඛො තෙ ලිච්ඡවී අඞ්ගුලිං පොඨෙසුං ජිතම්හා වතභො අම්බිකාය, වඤ්චිතම්හා වතභො අම්බකායාති. අථ ඛො තෙ ලිච්ඡවී යෙන අම්බපාලිවනං තෙන පායිංසු.

17. අද්දසා ඛො භගවා තෙ ලිච්ඡවී දූරතොව ආගච්ඡන්තෙ, දිස්වා භික්ඛූ ආමන්තෙසි. යෙසං භික්ඛවෙ භික්ඛූනං දෙවා තාවතිංසා අදිට්ඨා,

---

එකල්හි ඒ ලිච්ඡවීරජහු අම්බපාලිගණිකාවට මේ කාරණය කීවාහුය. එම්බල අම්බපාලිය කවරහෙයකින් තී තරුණාති තරුණ ලිච්ඡවීරජුන්ගේ රථහිසට තීගේ රථහිසින්ද ඔවුන්ගේ රථචක්‍රවලට තීගේ රථචක්‍රයෙන්ද, ඔවුන්ගේ වියදඬුවලට තීගේ රථවියදන්ඩෙන්ද, ඇන්නෙහිද හෙවත් එසේ අනිමින් කුමකට ශීඝ්‍රව යන්නෙහිදැයි විචාලාහුය. ඒ එසේමය. ආර්‍ය්‍යපුත්‍රයෙනි, මාවිසින් සෙටදවස බතපිණිස භික්ෂුසඞ්ඝයා සහිතවූ භාග්‍යවතුන්වහන්සේ පවරණලද්දේය. එම්බල අම්බපාලිය, මේ බත හෙවත් මේ නිමන්ත්‍රණය ලක්ෂයක් මිලගෙණ අපට දෙවයි ඉල්වූහ. ආර්‍ය්‍යපුත්‍රයෙනි, පරිභොග ව්‍යවහාරයෙහි දක්වනලද ජනපද සහිතවූ වෙසාලීපුරිය දෙන්නහු නමුත් මෙසේ මහත් අනුසස්ඇත්තාවූ මේ බත නොදෙමියි කීවාය. එකල්හි ඒලිච්ඡවීරජහු පින්වත්නි, එකාන්තයෙන් අම්බපාලිගණිකාව විසින් අපි පරදවනලද්දම්හයිද, පින්වත්නි, එකාන්තයෙන් අම්බිකාව විසින් අපි වඤ්චාකරණලද්දම්හයි කියාද, අසුරගැසූහ. තවද ඒ ලිච්ඡවීහු අම්බපාලි වනය යම්තැනෙක්හිද එතනට ගියාහුය.

17. භාග්‍යවතුන්වහන්සේ තමන්වහන්සේවෙත එන්නාවූ ලිච්ඡවී රජුන් දුරදීම දැක වදාළේය. දැක භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, යම් භික්ෂූන්විසින් තව්තිසාවැසි දෙවියෝ නොදක්නාලද්දාහුනම්.

ඔලොකෙථ භික්ඛවෙ ලිච්ඡවී පරිසං, අවලොකෙථ භික්ඛවෙ ලිච්ඡවි පරිසං, උපසංහරථ භික්ඛවෙ ලිච්ඡවි පරිසං තාවතිංසපරිසන්ති.

18. අථ ඛො තෙ ලිච්ඡවී යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා, පත්තිකාව යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ ලිච්ඡවී භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො තෙ ලිච්ඡවී භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං එතදවොචුං, අධිවාසෙතු නො භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවුත්ථං ඛො මෙ ලිච්ඡවී ස්වාතනාය අම්බපාලිගණිකාය භත්තන්ති. අථ ඛො තෙ ලිච්ඡවී අඞ්ගුලී පොඨෙසුං ජිතම්හා වත භො අම්බකාය, වඤ්චිතම්හා වත භො අම්බකායාති.

---

මහණෙනි, මේ එන ලිච්ඡවීරාජපිරිස බලව්. මහණෙනි, මේ එන්නාවූ ලිච්ඡවීරාජපිරිස නැවත නැවත බලව්. මහණෙනි, ලිච්ඡවීරජපිරිස තව්තිසාවැසි දෙව්පිරිසය කියා හෙවත් තව්තිසාවැසි දෙවියන් හා සමකොට පමුණුවා බලව්යයි වදාළේය.

18. ඉක්බිත්තෙන් ඒ ලිච්ඡවීරජහු යානාවෙන් යායුතුභූමිය යම්පමණද එපමණතැන් යානාවෙන් ගොස් යානාවෙන් බැස පයින්ම භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්හ. එකත්පසෙක උන්නාවූ ඒ ලිච්ඡවිරජුන් භාග්‍යවතුන්වහන්සේ ධර්මිකකථාවෙන් මනාකොට කරුණුදක්විය. එහි සමාදන්කරවූයේය. තෙදගැන්වීය. වැඩියක් සතුටුකරවූයේය. එකල්හි ඒ ලිච්ඡවිරජහු භාග්‍යවතුන්වහන්සේවිසින් ධාර්මිකකථාවෙන් මනාකොට කරුණුදක්වනුලබන්නෝ සමාදන්කරවනුලබන්නෝ මනාකොට තෙදගන්වනුලබන්නෝ වැඩියක් සතුටුකරණලද්දෝ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. ස්වාමින්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග සෙට දවසට අපගේ බත ඉවසා වදාළමැනව යනුයි. ලිච්ඡවිනි, සෙට දවසට මාවිසින් අම්බපාලි ගණිකාවගේ බත ඉවසනලද්දේයයි වදාළෝය. එවිට ඒ ලිච්ඡවීහු පින්වත්නි, එකාන්තයෙන් අපි අම්බපාලී ගණිකාවවිසින් පරදවනලද්දම්හ. පින්වත්නි, එකාන්තයෙන් අම්බපාලී ගණිකාවවිසින් අපි වඤ්චාකරණලද්දම්හයි අසුරගැසූහ.

අථ ඛො තෙ ලිච්ඡවී භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

19. අථ ඛො අම්බපාලිගණිකා තස්සා රත්තියා අච්චයෙන සකෙ ආරාමෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි, කාලො භන්තෙ නිට්ඨිතං භත්තන්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන අම්බපාලිගණිකාය පරිවෙසනා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො අම්බපාලිගණිකා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො අම්බපාලිගණිකා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො අම්බපාලිගණිකා භගවන්තං එතදවොච.

---

ඉක්බිත්තෙන් ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතයට සතුටුව අනුමෝදන්ව හුනස්නෙන්නැගිට භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ පැදකුණුකොට ගියාහුය.

19. ඉක්බිත්තෙන්, අම්බපාලී ගණිකාතොමෝ ඒ රාත්‍රිහුගේ ඇවෑමෙන් තමාගේ අරමෙහි ප්‍රණීතවූ කෑයුතුදෙයද බුදියයුතුදෙයද පිළියෙළකරවා, භාග්‍යවතුන්වහන්සේට කල්දැන්වීය. භවද් ගෞතමයන්වහන්ස, බත නිමවනලද්දේය ඊට වඩිනුසඳහා මේ සුදුසුකාලය පැමිණියේය කියායි. ඊට අනතුරුව භාග්‍යවතුන්වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා අතින් පාත්‍රය හා කයින් සිව්රු ගෙණ භික්ෂුසඞ්ඝයා සමග අම්බපාලී ගණිකාවගේ නිවෙසනය යම්තැනෙක්හිද එතනට වැඩියේය. එලඹ පැණවූ අස්නෙහි වැඩහුන්සේක. එකල්හි අම්බපාලී ගණිකාතොමෝ බුදුන්ප්‍රධානකොට ඇති භික්ෂු සඞ්ඝයා ප්‍රණීතවූ කෑයුතු දෙයින්ද බුදියයුතු දෙයින්ද, සියතින් සන්තර්පණයකරවූයේය. මනාකොට පවාරණයද කරවූයේය. ඉක්බිති අම්බපාලී ගණිකාතොමෝ වලඳා අවසන්වූ පාත්‍රයෙන් ඉවත්කරණලද අත්ඇති භාග්‍යවතුන්වහන්සේ දැන එක් මිටි අස්නක් ගෙණ එකත්පසෙක උන්නීය. එකත්පසෙක උන්නාවූ අම්බපාලී ගණිකාතොමෝ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාය.

ඉමාහං භන්තෙ ආරාමං බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස දම්මීති. පටිග්ගහෙසි භගවා ආරාමං. අථ ඛො භගවා අම්බපාලිං ගණිකං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

20. තත්‍ර පි සුදං භගවා වෙසාලියං විහරන්තො අම්බපාලිවනෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති. ඉති සීලං, ඉති සමාධි. ඉති පඤ්ඤා, සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති. මහානිසංසො, සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති. මහානිසංසා, පඤ්ඤා පරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති. සෙය්‍යථීදං, කාමාසවා භවාසවා දිට්ඨාසවා අවිජ්ජාසවාති.

21. අථ ඛො භගවා අම්බපාලිවනෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ආයාමානන්ද යෙන බෙලුවගාමකො තෙනුපසඞ්කමිස්සාමාති.

---

ස්වාමීන්වහන්ස, මම මේ අරම බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂුසඞ්ඝයාට දෙමියි සැලකළේය. භාග්‍යවතුන්වහන්සේ ආරාමය පිළිගත්සේක. තවද භාග්‍යවතුන්වහන්සේ අම්බපාලි ගණිකාවට දැහැමිකථාවෙන් කරුණුදක්වා එහි සමාදන්කරවා තෙදගන්වා වැඩියක් සතුටුකරවා හුනස්නෙන් නැගිට වැඩිසේක.

20. භාග්‍යවතුන්වහන්සේ ඒ විසාලාමහනුවර අම්බපාලී වනයෙහි වැඩවාසයකරණසේක් බොහෝකොට භික්ෂූන්ට මේ දැහැමිකථාව කෙරෙයි. මේ සීලයයි, මේ සමාධියයි, මේ ප්‍රඥාවයි, සීලයෙහි පිහිටා වඩනලද සමාධිය මහත්ඵල ඇත්තේය. මහත් අනුසස්ද ඇත්තේය. සමාධියෙහි පිහිටා වඩනලද ප්‍රඥතොමෝ මහත්ඵල ඇත්තීය. මහත් අනුසස්ද ඇත්තීය. ප්‍රඥවෙහි පිහිටා වඩනලද සිත මනාකොටම ආශ්‍රවයන් කෙරෙන් ඒනම්, කාමාශ්‍රවය, භවාශ්‍රවය, දෘෂ්ටිආශ්‍රවය, අවිද්‍යාශ්‍රවය යන මොවුන් කෙරෙන් සර්වප්‍රකාරයෙන් මිදේය කියායි.

21. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ අම්බපාලී වනයෙහි අධ්‍යාශය පරිද්දෙන් අභිරතිකාලයක් මුලුල්ලෙහි වාසයකොට ආනන්ද ආයුෂ්මතුන් ඇමතූසේක. ආනන්දය, මෙහි එව. බේලුවගම යම්තැනෙක්හිද එතනට එලඹෙන්නෙමුයයි වදාළෝ.

එවංභන්තෙති බො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ බො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන බෙලුවගාමකො තදව සරි. තත්‍ර සුදං භගවා බෙලුවගාමකෙ විහරති.

22. තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි. එථ තුම්හෙ භික්ඛවෙ, සමන්තා වෙසාලියං යථාමිත්තං යථාසන්දිට්ඨං යථා සම්භත්තං වස්සං උපෙථ, අහං පන ඉධෙව බෙලුවගාමකෙ වස්සං උපගච්ඡාමීති. එවං භන්තෙති බො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා සමන්තා වෙසාලියං යථා මිත්තං යථා සන්දිට්ඨං යථා සම්භත්තං වස්සං උපගඤ්ඡුං. භගවා පන තත්ථෙව බෙලුවගාමකෙ වස්සං උපගඤ්ඡි.

23. අථ බො භගවතො වස්සූපගතස්ස ඛරො ආබාධො උප්පජ්ජි, පබාළ්හා වෙදනා වත්තන්ති මාරණන්තිකා.

---

ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දුන්නේය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මහද් භික්ෂුසඞ්ඝයා සමග බේලුවගම යම්තැනෙක්හිද එතනට වැඩිසේක. භාග්‍යවතුන්වහන්සේ බේලුවගම වාසයකරණසේක.

22. එහිදී භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, තෙපි එව. වෙසාලිපුරය හාත්පස බොහෝසෙනසුන් ඇත්තාහ. ඒ සෙනසුන්හි යම්සේ දැඩි මිත්‍රවූද, දෘෂ්ට මිත්‍රවූද, ස්වභාව මිත්‍රවූද, භික්ෂූහු වෙද්ද; ඒ භික්ෂූන් සමීපයෙහි තෙපි වස්එලඹෙව්. මමවූකලී මේ බේලුවනම් ගමෙහිම වස්එලඹෙමියි වදාළසේක. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දී විසාලා මහනුවරට හාත්පස දැඩි මිතුරුවූද, දෘෂ්ට මිත්‍රවූද, ස්වභාව මිත්‍රවූද, භික්ෂූහු විසුවාහුද, උන්වහන්සේලා වෙත වස්එලඹුනාහුය. භාග්‍යවතුන්වහන්සේවූකලී ඒබේලුවගමෙහිම වස්එලඹිසේක.

23. ඉක්බිත්තෙන් වස්එලඹියාවූ භාග්‍යවතුන්වහන්සේට කෘෂරවූ රොගයෙක් උපන්නේය. මරණයට පැමිණවීමට සමර්ථතරම්වූ අතිසයින් බලවත් වෙදනාවෝ පවතිත්.

තාසුදං භගවා සතො සම්පජානො අධිවාසෙසි අවිහඤ්ඤමානො. අථ ඛො භගවතො එතදහොසි. න ඛො මෙතං පතිරූපං යොහං අනාමන්තෙත්වා උපට්ඨාකෙ අනපලොකෙත්වා භික්ඛුසඞ්ඝං පරිනිබ්බායෙය්‍යං. යන්නූනාහං ඉමං ආබාධං විරියෙන පටිප්පණාමෙත්වා ජීවිතසඞ්ඛාරං අධිට්ඨාය විහරෙය්‍යන්ති. අථ ඛො භගවා තං ආබාධං විරියෙන පටිප්පණාමෙත්වා ජීවිතසඞ්ඛාරං අධිට්ඨාය විහාසි. අථ ඛො භගවතො සො ආබාධො පටිප්පස්සම්භි.

24. අථ ඛො භගවා ගිලානාවුට්ඨිතො අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා විහාරා නික්ඛම්ම විහාරපච්ඡායායං පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

---

එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඔබිමොබ පෙරළීම් ආදි වශයෙන් නොපෙළෙමින් සිහිඇත්තේ සම්‍යක් ප්‍රඥාඇත්තේ හෙවත් නුවණින් පිරිසිඳ දැන ඒ දුඃඛවේදනාව ඉවසා වදාළසේක. එවිට භාග්‍යවතුන් වහන්සේට මේ අදහසවිය. යම්බඳුවූ මම උපස්ථායකයන්ට කථා නොකොට භික්ෂුසඞ්ඝයාට නොදන්වා ධර්මානුශාසනා නොකොට පරිනිර්වාණය කළෙම්නම් ඒ පරිනිර්වාණය මට සුදුසු නොවේමය. මම බලවත් දුඃඛවේදනා ඇති රොගය පූර්වභාගවීර්‍ය්‍ය ඵලසමාපත්ති වීර්‍ය්‍ය යන විප්‍රකාරවීර්‍ය්‍යබලයෙන් මැඩපවත්වා ඵලසමාපත්ති ධර්මයයි කියූ ජීවිතසංස්කාරය මනාකොට පිහිටුවීම් වශයෙන් ජීවිතය තැබීමට සමර්ථවූ ඵලසමාපත්තීන්යුක්තව වාසයකරන්නෙම්නම් ඉතා යෙහෙකැයි සිතා වදාළසේක. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඒ ආබාධය වීර්‍ය්‍යයෙන් මැඩපවත්වා ජීවිතසංස්කාරය අධිෂ්ඨාන කොට වාසයකළසේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේගේ ඒ ආබාධය මැඩපැවැත්තේය.

24. ඊට අනතුරුව භාග්‍යවතුන්වහන්සේ ගිලානභාවයෙන් නැගී සිටිසේක්. ගිලානභාවයෙන් නැගීසිටි නොබෝකල්ඇත්තේ වෙහෙරින් නික්ම විහාරය පිළිබඳ සෙවනැල්ලෙහි පණවනලද අස්නෙහි වැඩහුන්සේක. එකල්හි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්නේය.

එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතද වොච. දිට්ඨා භන්තෙ භගවතො ඵාසු, දිට්ඨං මෙ භන්තෙ භගවතො ඛමනියං, අපිහි මෙ භන්තෙ මධුරක ජාතො විය කායො, දිසාපි මෙ න පක්ඛායන්ති, ධම්මාපි මං න පටිභන්ති භගවතො ගෙලඤ්ඤෙන, අපිච මෙ භන්තෙ අහොසි කාචිදෙව අස්සා සමත්තා, නතාව භගවා පරිනිබ්බායිස්සති. නයාව භගවා භික්ඛු සඞ්ඝං අරබ්භ කිඤ්චිදෙව උදාහරතීති.

25. කිම්පනානන්ද භික්ඛු සඞ්ඝො මයි පච්චා සිංසති. දෙසිතො ආනන්ද මයා ධම්මො අනන්තරං අබාහිරං කරිත්වා, නත්ථානන්ද තථාගතස්ස ධම්මෙසු ආචරියමුට්ඨි. යස්ස නූන ආනන්ද එවමස්ස අහං භික්ඛුසඞ්ඝං පරිස්සාමිති වා.

---

එකත්පසෙක උන්නාවූ ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේකාරණය සැලකළේය. ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ඵාසුව දක්නාලද්දීය. ස්වාමීන්වහන්ස, මාවිසින් භාග්‍ය වතුන්වහන්සේගේ ආබාධ සහනයවියයුතත දක්නාලද්දේය. ස්වාමීන් වහන්ස, මෙසේ සවසත්තාව පවත්නාකල්හි මාගේ සිරුර ඉතා මිහිරිව සිහිල්වූවාක් මෙන් විය. භාග්‍යවතුන්වහන්සේගේ ගිලානභාවය හෙතුකොටගෙණ පූර්වපශ්චිමාදි දිසාවෝද මට නොවැටහෙන්නාහුය. සතරසතිපට්ඨානාදි ධර්මයෝද මට ප්‍රකටනොවන්නාහුය. ස්වාමීන් වහන්ස, තවද මට කිසියම් අස්වැසිලි පමණෙක් පහලවූයේය. ඒනම් භාග්‍යවතුන්වහන්සේ යම්තාක්කල් භික්ෂුසඞ්ඝයා අරබයා පැසුලු බව දන් වදාරණසේක්ද, ඒතාක් භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන් නොපානාසේකැයි කියාය.

25. ආනන්දය කිමෙක්ද, භික්ෂුසඞ්ඝතෙමේ මාකෙරෙහි ප්‍රාර්ථනා කරන්නාහුදැයි විචාලසේක. ආනන්දය, මාවිසින් පුද්ගලවශයෙන් හෝ ධර්මවශයෙන් හෝ අභ්‍යන්තර බාහිරනොකොට ධර්මය දෙශනා කරණලද්දේයයි වදාළෝ. ආනන්දය, ඒ ධර්මයන් කෙරෙහි තථාගත යානන්ගේ ආචාර්යමුෂ්ටියක් හෙවත් නොවදාළ සාරාංශ කාරණයක් නැත්තේය. ආනන්දය, යමෙකුට මෙබඳු අදහසක් වන්නේද, කෙසේද, මම භික්ෂුසඞ්ඝයා පරිහරණයකෙරෙමි කියා හෝ.

මමුද්දෙසිකො භික්ඛුසඞ්ඝොති වා, සො නූන ආනන්ද භික්ඛු
සඞ්ඝං ආරබ්භ කිඤ්චිදෙව උදාහරෙය්‍ය. තථාගතස්ස ඛො
ආනන්ද න එවං හොති අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමීති වා
මමුද්දෙසිකො භික්ඛුසඞ්ඝොති වා, කිං ආනන්ද තථාගතො
භික්ඛුසඞ්ඝං ආරබ්භ කිඤ්චිදෙව උදාහරිස්සති, අහං ඛො පනානන්ද
එතරහි ජිණ්ණොවුඩ්ඪො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො.
ආසීතිකො මෙ වයො වත්තති, සෙය්‍යථාපි ආනන්ද ජජ්ජරසකටං වෙඨ
මිස්සකෙන යාපෙති, එවමෙව ඛො ආනන්ද වෙඨමිස්සකෙන මඤ්ඤෙ
තථාගතස්ස කායො යාපෙති, යස්මිං ආනන්ද සමයෙ තථාගතො
සබ්බනිමිත්තානං අමනසිකාරා එකච්චානං වෙදනානං නිරොධා අනි
මිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති, ඵාසුකතො ආනන්ද
තස්මිං සමයෙ තථාගතස්ස කායො හොති.

---

භික්ෂුසඞ්ඝතෙමේ මාඋදෙසා වාසයකරන්නේය කියා හෝයි. ආනන්
දය, එකාන්තයෙන් මෙබඳු අදහස්ඇති ඒ මහණතෙම බික්සඟන අර
බයා කිසියම් වචනයක් ගෙණහැරදක්වන්නේය, ආනන්දය, තථා
ගතයානන්ට වූකලි මෙබඳු අදහසක් නොවෙයි, කෙසේද, මම භික්ෂු
සඞ්ඝයා පරිහරණයකෙරෙයි කියා හෝ භික්ෂුසඞ්ඝතෙමේ මාඋදෙසා
වාසයකරන්නේය කියා හෝයි. ආනන්දය, කිමෙක්ද, තථාගතතෙම
බික්සඟන අරබයා කිසියම් කරුණක් ගෙණහැර දක්වන්නේද.
ආනන්දය, මම දැන් ජරාවෙන් දිරුණේ වෙමි. වයසින් වැඩිසිටියේ
වෙමි. ජාතියෙන් මහලුබවට පැමිණියෙමි. බොහෝකල් ඉක්මවූයෙමි.
වයස්හුගේ කෙළවරට පැමිණියෙමි නොහොත් ශතවර්ෂයාගේ තෘතීය
භාගයට පැමිණියෙමි, මාගේ වයස දැන් අසූවක්ව පවතී, ආනන්දය,
ජරපත් රියක් චක්‍රබන්ධනාදියෙන් ප්‍රතිසංස්කරණයකිරීමෙන් යම්සේ
පවතීද ආනන්දය, එපරිද්දෙන්ම තථාගතයන්වහන්සේගේ කය
අර්හත්ඵලවෙගයෙන් බඳනාලදුව යැපේයයි සිතමි වදාළේය.
ආනන්දය, යම්කලෙක්හි තථාගතතෙමේ රූපනිමිත්තාදි සියලු
නිමිති මෙනෙහිනොකිරීමෙන් සමහර වෙදනාවන්ගේ නිරොධයෙන්
නිමිත්තරහිතවූ චිත්තසමාධියට පැමිණ හෙවත් එය උපදවාගෙණ
වාසයකෙරේද, ආනන්දය, එකල්හි තථාගතයන්ගේ කය සමවත්
සුවවිහරණයෙන් පහසුකරණලද්දේ වෙයි.

26 තස්මාතිහානන්ද අත්තදීපා විහරථ අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා. කථඤ්ච ආනන්ද භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො. ඉධානන්ද භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු...පෙ...චිත්තෙ...පෙ...ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, එවං ඛො ආනන්ද භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො.

---

26. ආනන්දය, එහෙයින් මේ සස්නෙහි තොපි ස්වකීය තමා පිහිටකොට ඇත්තෝව වාසයකරව්. තෙමේ පරමප්‍රතිෂ්ඨාකොට ඇත්තෝවව් හෙවත් ආත්මගතිකවව්, අන්‍යගතියක් පිහිටකොට ඇත්තෝ නොවව්, ධර්‍මයම පිහිටකොටඇත්තෝ වව්, ධර්‍මයම පරමප්‍රතිෂ්ඨාකොටඇත්තෝ වව්, අනිකක් සරණකොටඇත්තෝ නොවව්, ආනන්දය, භික්‍ෂුතෙමේ කෙසේනම් ආත්මය දිවයිනක්මෙන් පිහිටකොට ඇත්තේ ආත්මය උතුම්පිහිටකොට ඇත්තේ අනිකක් පිහිටකොට නැත්තේ ධර්‍මය දිවයිනක්මෙන් පිහිටකොට ඇත්තේ ධර්‍මය උතුම් පිහිටකොට ඇත්තේ අනිකක් පිහිටකොටනැත්තෙක්ව වාසයකෙරේදැයත්, ආනන්දය, මේ සස්නෙහි මහණතෙම කයෙහි කෙලෙස්තවන වීර්‍ය්‍යඇතිව සම්‍යක්ප්‍රඥාඇතිව ස්මෘතිමත්ව කායසඞ්ඛ්‍යාත ලොකයෙහි ලොභය හා දොම්නස මැඩපවත්වා කය නැවත නැවත දක්නා ස්වභාව ඇතිව වාසයකෙරේද, වේදනාවන්හි-සිතෙහි-විස්තරය සංක්‍ෂෙප කරණලදි, පඤ්චනිවරණාදි ධර්‍මයන්කෙරෙහි කෙලෙස්තවනවීර්‍ය්‍ය ඇතිව සම්‍යක්ප්‍රඥාඇතිව ස්මෘතිමත්ව ධර්‍මලොකයෙහි ලොභය, දොම්නස යන දෙක මඩපවත්වා ධර්‍මානුදර්ශීව වාසයකෙරේද, ආනන්දය, මෙසේ භික්‍ෂුතෙමේ තමාම පිහිටකොට ඇත්තේ තමාම උතුම් පිහිටකොට ඇත්තේ අනිකක් පිහිටකොට නැත්තේ ධර්‍මය පිහිට කොට නැත්තේ ධර්‍මයම උතුම්පිහිටකොට ඇත්තේ අනිකක් පිහිට කොට නැත්තෙක්ව වාසයකෙරේයයි වදාළේය.

යෙහිකෙචි ආනන්ද එතරහි වා මමං වා අච්චයෙන අත්තදීපා විහරිස්සන්ති, අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා, තමතග්ගෙ මෙතෙ ආනන්ද භික්ඛු භවිස්සන්ති යෙ කෙචි සික්ඛා කාමාති.

**දුතියකභාණවාරං නිට්ඨිතං.**

---

**3.** 1. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර මාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි, වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ගණ්හාහි ආනන්ද නිසීදනං යෙන චාපාලං චෙතියං තෙනුපසඞ්කමිස්සාම දිවාවිහාරායාති. එවං භන්තෙ ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා නිසීදනං ආදාය භගවන්තං පිට්ඨිතො අනුබන්ධි.

---

ආනන්දය, යම්කිසි භික්ෂුකෙනෙක් දැන් හෝ මාගේ ඇවෑමෙන් හෝ ආත්මය දිවයිනක්මෙන් පිහිටකොට ඇත්තෝව ආත්මයම උතුම් පිහිටකොට ඇත්තෝව අනිකක් පිහිටකොට නැත්තෝව වාසය කරන්නාහු වෙද්ද; ධර්මය දිවයිනක්මෙන් පිහිටකොට ඇත්තෝව ධර්මයම උතුම් පිහිටකොට ඇත්තෝව අනිකක් පිහිටකොට නැත්තෝව වාසයකරන්නාහු වෙද්ද; ආනන්දය, ශික්ෂාකාමිවූ යම් භික්ෂු කෙනෙක් වෙද්ද; සතරසතිපට්ඨානාදිය ගොචරකොට ඇති ඒ මෙ භික්ෂුහුම මාගේ සස්නෙහි අතිශ්‍රෙෂ්ඨභාවයෙහි පිහිටියෝ වෙත්යයි වදාළසේක.

**මෙතෙකින් දෙවෙනි බණවර කියා නිමවනලදී.**

---

**3.** 1. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා අතින් පාත්‍රය හා කයින් සිවුරු රැගෙණ වෙසාලීපුරියට පිඩු පිණිස වැඩිසේක. වෙසාලීපුරියෙහි පිඩු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළැක්කෝ ආනන්ද ආයුෂ්මතුන් ඇමතූසේක. ආනන්දය, නිසීදනය හෙවත් පත්කඩ ගණුව. චාපාල යක්ෂයාගේ චෛත්‍යස්ථානයෙහි කරවනලද හෙයින් ලබනලද නම් ඇත්තාවූ චාපාල චෛත්‍යය යම්තැනෙක්හිද දවල්කාලයෙහි වාසය කිරීම පිණිස එතනට එළඹෙන්නෙම්යි කියාසි. ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දී නිසීදනය රැගෙණ භාග්‍යවතුන්වහන්සේගේ පසුපස්සෙන් ගියේය.

2. අථ ඛො භගවා යෙන චාපාලං චෙතියං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ආයස්මාපි ඛො ආනන්දො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච. රමණීයා ආනන්ද වෙසාලි, රමණීයං උදෙනං චෙතියං, රමණීයං ගොතමකං චෙතියං, රමණීයං සත්තම්බකං චෙතියං, රමණීයං බහුපුත්තං චෙතියං, රමණීයං සාරන්දදං චෙතියං, රමණීයං චාපාලං චෙතියං.

3. යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සො ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා.

---

2. එකල්හි භාග්‍යවතුන්වහන්සේ චාපාල චෛත්‍යය යම්තැනෙක්හිද එතනට එළඹිසේක. එළඹ පැණවූ අස්නෙහි වැඩඋන්සේක. ආනන්ද ආයුෂ්මතුන්වහන්සේද භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්නේය. එකන්පසෙක උන්නාවූ ආනන්ද ආයුෂ්මතුන්වහන්සේට භාග්‍යවතුන්වහන්සේ මේ කාරණය වදාළේය. ආනන්දය, විසාලානුවර අභිරමනයට සුදුසුයි. උදෙන යක්‍ෂයාගේ වාසභවනයෙහිකළ හෙයින් ලබනලද නම් ඇත්තාවූ උදෙන චෛත්‍යය අභිරමනයට සුදුසුයි. ගොතමක චෛත්‍යය සිත්කළුයි. සත්තම්බකනම් චෛත්‍යය සිත්කළුයි. බහුපුත්ත චෛත්‍යය සිත්කළුයි. සාරන්දද චෛත්‍යය සිත්කළුයි. චාපාල චෛත්‍යය සිත්කළුයි.

3. ආනන්දය, යම්කිසිවෙකු විසින් සෘද්ධිපාදධර්මසතර වඩනලද්දාහුද; නැවත නැවත පුරුදුකිරීම්වශයෙන් බහුලකරණලද්දාහුද; යානාවක්මෙන් කරණලද්දාහුද; ගෘහ වස්තුවක්මෙන් සපිරකරණලද්දාහුද; මනාකොට පිහිටාසිටිනලද්දාහුද; සර්වප්‍රකාරයෙන් පුරුදුකරණලද්දාහුද; යහපත්ලෙස පටන්ගන්නාලද්දාහුද; ඒ සෘද්ධිපාද ධර්මසමඞ්ගි පුද්ගලතෙම ඉදින් කැමතිවන්නේ නම් කල්පයක් හෝ සිටින්නේය. කල්පාශේෂයක් හෝ සිටින්නේය. ආනන්දය, තථාගතයානන් විසින් ඡන්දිද්ධිපාදාදි චතුර්විධ සෘද්ධිපාද ධර්ම වඩනලද්දාහුය.

බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පංවා තිට්ඨෙය්‍ය කප්පා'ව සෙසං වාති.

4. එවං බො ආයස්මා ආනන්දො භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං, න භගවන්තං යාචි. තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති, යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො.

5. දුතියම්පි බො භගවා ... පෙ ... තතියම්පි බො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි.

---

බහුලකරණලද්දාහුය, යානාවක්මෙන් කරණලද්දාහුය. ගෘහවස්තුවක්මෙන් කරණලද්දාහුය. මන්නාකොට පිහිටුවනලද්දාහුය. සම්‍යක්ප්‍රකාරයෙන් පුරුදුකරණලද්දාහුය. යහපත්ලෙස පටන්ගන්නාලද්දාහුය. ආනන්දය, ඉදින් ඒ තථාගතතෙමේ කැමතිවන්නේනම් කල්පයක් හෝ කල්පාවශේෂයක් සිටින්නේයයි වදාළේය.

4. මෙසේ භාග්‍යවතුන්වහන්සේවිසින් ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ මේ යථොක්ත ප්‍රකාරයෙන් ඖදාරික නිමිත්තයන් කර වදාරණකල්හිද හෙවත් ලාමක ලකුණු ප්‍රකාශකරණ කල්හිද; ඖදාරිකාවභාෂයකර වදාරණකල්හි හෙවත් සම්‍යක්ප්‍රකාරයෙන් කාරණයට සම්පවූ අනුගත කථාකර වදාරණකල්හි ප්‍රතිවෙධකරන්නට හෙවත් යථාර්ථය දැනගන්නට නොහැකිවිය, බොහෝදෙනාට වැඩපිණිසද බොහෝදෙනාට සැපපිණිසද ලොවට අනුකම්පාපිණිසද දෙව්මිනිසුන්ගේ ප්‍රයොජනයපිණිසද වැඩපිණිසද සැපපිණිසද ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ කල්පයක් මුලුල්ලෙහි වැඩසිටිනසේක්වා. ස්වාමීනි, සුගතයන්වහන්සේ කල්පයක් මුලුල්ලෙහි වැඩසිටිනසේක්වායි භාග්‍යවතුන්වහන්සේට ආයාචනා නොකළේය. කවරහෙයකින්දයත්; යම්සේ මාරයාවිසින් මැඩපවත්වනලද සිත් ඇත්තේ අවීනාවී සැලකීමට නොහැකිවිද එහෙයිනි.

5. දෙවනවරද භාග්‍යවතුන්වහන්සේ. සෙස්ස ප්‍රථමවාරයෙහිමෙන් විස්තරයට පැමිණවියයුතු. තුන්වනවරද භාග්‍යවතුන්වහන්සේ ආනන්ද ආයුෂ්මතුන් ඇමතූසේක.

රමණීයා ආනන්දවෙසාලී රමණීයංඋදෙනංචෙතියං රමණීයංගොතමං චෙතියං. රමණීයං සත්තම්බකංචෙතියංරමණීයං බහුපුත්තං චෙතියං. රමණීයං සාරන්දදං චෙතියං.රමණීයං චාපාලංචෙතියං.යස්සකස්සචි ආනන්දචත්තාරො ඉද්ධිපාදාභාවිතාබහුලීකතා යානිකතා වත්ථුකතා අනුට්ඨිතාපරිචිතා සුසමාරද්ධා.සො ආකඞ්ඛමානො කප්පංවාතිට්ඨෙය්‍යකප්පාවසෙසංවා.තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතායානිකතාවත්ථුකතාඅනුට්ඨිතා පරිචිතාසුසමාරද්ධා.සොආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පංවා තිට්ඨෙය්‍ය කප්පාවසෙසංවාති. එවම්පි ඛො ආයස්මා ආනන්දො භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙකයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං නභගවන්තං යාචි. තිට්ඨතු භන්තෙ භගවා කප්පං තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති යථාතං මාරෙනපරියුට්ඨිතචිත්තො.

---

ආනන්දය, විශාලානුවර සිත්කලුයි.උදෙනනම් චෛත්‍යය සිත්කලුයි. ගොතම චෛත්‍යය සිත්කලුයි.සත්තම්බක චෛත්‍යය සිත්කලුයි. බහුපුත්ත චෛත්‍යය සිත්කලුයි. සාරන්දද චෛත්‍යය සිත්කලුයි. චාපාල චෛත්‍යය සිත්කලුයි.ආනන්දය, යම්කිසිවෙකුවිසින් ඍද්ධිපාදධර්මසතර වඩනලද්දාහුදබහුලකරණලද්දාහුදයනාවක්මෙන්කරණලද්දාවූදගෘහවස්තුවක්මෙන්කරණලද්දාහුදසිඅලු අයුරින් සපිරවපිහිටුවනලද්දාහුද පුරුදුකරණලද්දාහුද මනාකොට පටන්ගන්නාලද්දාහුදඉදින්හෙතෙම කැමතිවන්නේනම් කල්පයක් හෝ සිටින්නේය. කල්පාඪියක් හෝ සිටින්නේය කියායි මෙසේත් ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේ විසින් ලාමක නිමිති කරණලබනකල්හි ඖදාරිකවූ අවභාසයන්කරණලබනකල්හි ඒ කාරණය ප්‍රතිවෙධ කරන්නට නොහැකිවිය. බොහෝදෙනාට වැඩපිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩපිණිසද ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ කල්පයක් සිටිනසේක්වා ස්වාමීනි, සුගතයන්වහන්සේ කල්පයක්සිටිනසේක්වායි භාග්‍යවතුන්වහන්සේට ආයාචනා නොකෙළේය. කවරහෙයකින්ද; මාරයාවිසින් මැඩපවත්වනලද සිත්ඇත්තේ අභිප්‍රාය සැලකීමට නොහැකිවීද එහෙයිනි.

6. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ගච්ඡ ත්වං ආනන්ද යස්සදානි කාලං මඤ්ඤසීති. එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි.

7. අථ ඛො මාරො පාපිමා අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ආනන්දෙ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො මාරො පාපිමා භගවන්තං එතදවොච. පරිනිබ්බාතු දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බාණකාලො දානිභන්තෙ භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා.

---

6. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආනන්‍ද ආයුෂ්මතුන් ඇමතූසේක. ආනන්‍දය, තෝ යව. දැන් තෝ යමක් සම්බන්‍ධව සුදුසු කල්යයි සිතන්නෙහිනම් එය කරවයි වදාළසේක. ස්වාමීන්වහන්ස ඒ මැනවැයි ආනන්‍ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ පැදකුණුකොට භාග්‍යවතුන්වහන්සේට නුදුරුතැන්හි එක්තරා රුකක් මුල වැඩඋන්සේක.

7. එකල්හි පාපිවූ මාරතෙම ආනන්‍ද ආයුෂ්මතුන් බැහැරගිය නොබෝවේලාවූකල්හි භාග්‍යවතුන්වහන්සේයම්තැනෙක්හිදඑතනට එළඹියේය. එළඹ සමීපවූ එක්පෙදෙසෙක්හි සිටියේය. එකත්පසෙක සිටියාවූ පාපීමාරතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය දැන් කීය. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ දැන් පරිනිර්‍වාණයකරණසේක්වා. සුගතයන්වහන්සේ පරිනිර්‍වාණයකරණ සේක්වා. ස්වාමීනි, දැන් භාග්‍යවතුන්වහන්සේට පරිනිර්‍වාණයට සුදුසුකාලයයි ආරාධනා කළේය. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ විසින් මේ වචනය වදාරණ ලද්දේමය. කුමක්ද.

න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාවමෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානිං කරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තීති.

8. එතරහි ඛො පන භන්තෙ භික්ඛූ භගවතො සාවකා වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො

---

මාරය යම්තාක්කල් මාගේ ශ්‍රාවකවූ භික්ෂූහු ව්‍යක්ත නොවන්නාහුද මනාලෙස හික්මුනෝ නොවන්නාහුද චතුර්වෛශාරද්‍යාදි වශයෙන් විසාරදනොවන්නාහුද බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝ නොවන්නාහුද ධර්මධරනොවන්නාහුද ධර්මානුධර්ම ප්‍රතිපදාවෙන් යුක්තවූවෝ නොවන්නාහුද ඉදුරාම නිවන්මගට පමුණුවන යහපත් ප්‍රතිපදාවෙන්යුක්ත නොවන්නාහුද ධර්මයෙහි අනුව හැසිරෙන්නෝ නොවන්නාහුද තමන්ගේ ආචාර්‍ය්‍යයන්ට අයත් ධර්මාවවාදාදිය ඉගෙණ නොකියන්නාහුද දෙශනානොකරන්නාහුද නොමපණවන්නාහුද ධර්මයාගේ පිහිටීම නොකරන්නාහුද විවෘත කොට දක්වන්නාහු නොවෙද්ද මනාකොට බෙදීම් වශයෙන් විභාග නොකරන්නාහු වෙද්ද් උඩුකුරු නොකරන්නාහු වෙද්ද උපන්නාවූ අන්‍යවාදයන් කාරණාසහිතව මනානොට නිග්‍රහකිරීම් වශයෙන් මැඩපවත්වා නෛර්‍ය්‍යාණිකකොට ධර්මය දෙශනා නොකරන්නාහුද ඒතාක් පිරිනිවන්නොපාන්නෙමියි භාග්‍යවතුන්වහන්සේ විසින් මේ වචනය වදාරණලද්දේමය.

8. ස්වාමින්වහන්ස, මේකාලයෙහි වනාහි භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක භික්ෂූහු ව්‍යක්තවූවෝ ආර්‍ය්‍යධර්මයෙහි මනාකොට හික්මුණෝ පහවූ බියඇත්තෝ බොහෝ ඇසූ පිරූතැන්ඇත්තෝ ධර්මධරවූවෝ ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි මනාකොට පිළිපන්නෝ යහපත්ලෙස පිළිපන්නෝ ධර්මානුගතව ක්‍රියාකරන්නෝ.

සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානි කරොන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු දානි භන්තෙ භගවා. පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බාණ කාලො දානි භන්තෙ භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛුනියො න සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා.....පෙ.....යාව මෙ උපාසකා න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්ම පටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති.

---

තමන්ගේ ආචාර්‍ය්‍යයන්ගේ ධර්‍මාවවාදාදිය ඉගෙණ ප්‍රකාශ කෙරෙත්. දෙශනා කෙරෙත්. පණවත්. පිහිටුවත්. විවෘත කෙරෙත්. සර්‍ව ප්‍රකාරයෙන් විභාග කෙරෙත්. ප්‍රකට කෙරෙත්. උපන්නාවූ පරප්‍රවාද සඞ්ඛ්‍යාත මිථ්‍යාවාදය ධර්‍මානුගත යුක්තිපරිද්දෙන් කාරණාසහිතව මනාකොට නිග්‍රහකොට කෙලෙසුන් හෝ ප්‍රතිපක්ෂයන් බැහැර කිරීමට සමර්ථවූ නෛර්‍ය්‍යාණික ධර්‍මය දෙශනා කෙරෙත්. ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ දැන් පරිනිර්‍වාණය කරණසේක්වා. සුගතයන්වහන්සේ පරිනිර්‍වාණය කරණසේක්වා. ස්වාමීන්වහන්ස, දැන් භාග්‍යවතුන්වහන්සේට පිරිනිවීමට සුදුසුකාලයයි සැලකළේය. ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින් මේවචනය වදාරණලද්දේමය. කෙසේද යම්තාක් මාගේ භික්ෂුණීහු අවවාද අසන්නියෝ නොවන්නාහුද ව්‍යක්ත නොවන්නියෝද නොහික්මුණෝ වන්නියෝද. සෙස්ස ප්‍රථම වාරයෙහි මෙනි. මාරයඒතාක් මම පිරිනිවන් නොපාන්නෙමියි යනුයි. යම්තාක් මාගේ උපාසකයෝ යහපත්ලෙස අවවාද අසන්නෝ නොවන්නාහුද. ව්‍යක්ත නොවන්නාහුද නොහික්මුණෝ වන්නාහුද පහවූබිය ඇත්තෝ නොවන්නාහුද බොහෝ ඇසූපිරූතැන්ඇත්තෝ නොවන්නාහුද ධර්‍මධර නොවන්නාහුද ධර්‍මානුධර්‍මප්‍රතිපත්තියෙන්යුක්තයෝ නොවන්නාහුද යහපත්පිළිවෙතින් යුක්තයෝ නොවන්නාහුද ධර්‍මයෙහි අනුවහැසිරෙන්නෝ නොවන්නාහුද තමන්ගේ ආචාර්‍ය්‍යයන්ගේ ධර්‍මානුශාසනා ක්‍රමය නොවරදවා ඉගෙණ ප්‍රකාශකරන්නෝ නොවෙද්ද.

දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානිකරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තීති. එතරහි ඛො පන භන්තෙ උපාසකා භගවතො සාවකා වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානි කරෙන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මංදෙසෙන්ති. පරිනිබ්බාතු දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො පරිනිබ්බානකාලො දානි භන්තෙ භගවතො. භාසිතා ඛො පනෙ සා භන්තෙ භගවතා වාචා.

---

දෙශනානොකරන්නාහුදනොපණවන්නාහුදනොපිහිටුවන්නාහුද විවෘතනොකරන්නාහුද විභාගනොකරන්නාහුද ප්‍රකට නොකරන්නාහුදඋපන්නාවූපරප්‍රවාදයයි කියනලදමිථ්‍යාවාදය කාරණාසහිතවමනාකොටනිග්‍රහකරණලද්දක්කොටසම්ප්‍රකාරයෙන් මැඩපවත්වාමෙනෙර්‍යාණිකධර්මය දෙශනානොකරන්නාහුදැයිකියායි. ස්වාමීන්වහන්ස, දැන්වනාහි භාග්‍යවතුන්වහන්සේගේඋපාසකයෝයහපත්ලෙස ධර්මශ්‍රවණය කරන්නෝ ව්‍යක්තවූවෝ හික්මුණෝ භයරහිතවූවෝ බොහෝ ඇසූපිරුතැන්ඇත්තෝ ධර්මධරවූවෝ ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තවූවෝ යහපත් ප්‍රතිපත්තියෙන් යුක්තවූවෝ ධර්මානුගත හැසුරුම් ඇත්තෝ තමන්ගේ ආචාර්යයන්ට අයිති ධර්මාවවාදාදිය ඉගෙණ ප්‍රකාශකෙරෙත්. දෙශනාකෙරෙත්. පණවත්. මනාකොට පිහිටුවත්. විවෘතකෙරෙත්. නානා නය වශයෙන් විභාගකෙරෙත්. ප්‍රකටකෙරෙත්. උපන්නාවූ පරප්‍රවාද සඞ්ඛ්‍යාත මිථ්‍යාධර්මය සකාරණයෙන් මනාකොට නිග්‍රහ කරණලද්දක්කොට මැඩපවත්වා නෛර්‍යාණික ධර්මයදෙශනාකෙරෙත්, ස්වාමීන්වහන්සදැන්භාග්‍යවතුන්වහන්සේපිරිනිවන් පානාසේක්වා. සුගතයන්වහන්සේ පිරිනිවන්පානාසේක්වා. ස්වාමීන්වහන්ස, දැන් භාග්‍යවතුන්වහන්සේගේ පරිනිර්වාණයට මේ සුදුසු කාලයයි දැන්විය. ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින් මේ වචනය වදාරණලද්දේමය.

නතා වාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාවමෙ උපාසිකා න
සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා
ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනි
යො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති
පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානී
කරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං
නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තීති. එතරහි ඛො
පන භන්තෙ උපාසකා භගවතො සාවිකා වියත්තා විනීතා විසා
රදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා
අනුධම්මචාරිනියො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙ
සෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානි
කරොන්ති.

---

මාරය, යම්තාක්කල් මාගේ උපාසිකාවෝ මනාකොට ධර්‍මශ්‍රවණය
කරන්නියෝ නොවන්නාහුද ව්‍යක්ත නොවන්නාහුද හික්මු
ණෝනොවන්නාහුද භයරහිතයෝ නොවන්නාහුද බොහෝ ඇසූ
පිරූතැන් ඇත්තෝනොවන්නාහුද ධර්‍මධර නොවන්නාහුද ධර්‍මයෙහි
ධර්‍මානුධර්‍ම ප්‍රතිපදාවෙන් යුක්ත නොවන්නාහුද යහපත් පිළිවෙතසෑ
ජුව නොපිළිපන්නාහුද ධර්‍මයෙහි අනුව හැසුරුම් ඇත්තියෝ නොව
න්නාහුද තමන්ගේ ආචාර්‍ය්‍යයයිකියූ සර්‍වඥයන්වහන්සේගේ ධර්‍මාව
වාදය ඉගෙණප්‍රකාශනොකරන්නාහුද,දෙශනානොකරන්නාහුද,පණ
වන්නාහුද, පිහිටුවන්නාහුද, විවෘතනොකරන්නාහුද, නානානයවශ
යෙන්විභාගනොකරන්නාහුද,ප්‍රකටනොකරන්නාහුද,උපන්නාවූ පර
ප්‍රවාදසඞ්ඛ්‍යාත මිථ්‍යාවාදය සකාරණයෙන් මනාකොටනිග්‍රහකරණ
ලද්දක්කොට මැඩපවත්වන්නාහු නෛර්‍ය්‍යාණික ධර්‍මයදෙශනානොක
රන්නාහුද ඒතාක් මම පිරිනිවන් නොපාන්නෙමියි යනුයි. ස්වාමීන්
වහන්ස දැන්වූකලි භාග්‍යවතුන්වහන්සේගෙ උපාසිකාවෝ මනා
කොට ධර්‍මශ්‍රවණයකරන්නියෝ ඒ ධර්‍මයෙහි ව්‍යක්තවූවෝඒධර්‍මයෙහි
හික්මුණෝ,භයරහිතවූවෝ බොහෝ ඇසූපිරූතැන් ඇත්තියෝ ධර්‍ම
ධරවූවෝ,ධර්‍මානුධර්‍ම ප්‍රතිපත්තියෙහි යෙදුනෝ, මැදුම්පිළිවෙත යහ
පත්ලෙසපිළිපන්නෝ, ධර්‍මයෙහි අනුව හැසුරුම් ඇත්තියෝ,ස්වකීය
ආචාර්‍ය්‍යවූ සර්‍වඥයන්වහන්සේ විසින් වදාරණලද ධර්‍මාවවාදය මනා
ලෙස ඉගෙණ ප්‍රකාශකෙරෙත්. දෙශනාකෙරෙත්.පණවත් පිහිටුවත්
විවෘතකෙරෙත්. නානා නය වශයෙන් විභාගකෙරෙත්. ප්‍රකට
කෙරෙත්. හෙවත් විස්තර කෙරෙත්.

උප්පන්නං පරප්පවාං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙනති. පරිනිබ්බාතු දානි භන්තෙ භගවා පරිනිබ්බාතු සුගතො පරිනිබ්බාණකාලො දානි භන්තෙ භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා. නාහං තාව පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ ඉමං බ්‍රහ්මචරියං න ඉද්ධඤ්චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතනති එතරහි ඛො පන භන්තෙ භගවතො බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙව මනුස්සෙහි සුප්පකාසිතං පරිනිබ්බාතු දානි භන්තෙ භගවා පරිනිබ්බාතු සුගතො.පරිනිබ්බාණකාලො.දානි භන්තෙ භගවතොති.

---

උපන්නාවූ පරප්‍රවාද සඞ්ඛ්‍යාත මිථ්‍යාවාදය සකාරණයෙන්මනා කොට නිග්‍රහකරණලද්දක්කොට මැඩ පවත්වා නෛර්‍යාණික ධර්මය දෙශනා කෙරෙත්.ස්වාමීන්වහන්ස දැන් භාග්‍යවතුන්වහන්සේ පිරිනිවත් පානාසේක්වාසුගතයන්වහන්සේ පිරිනිවන් පානාසේක්වා.දැන් භාග්‍යවතුන්වහන්සේගේ පිරිනිවන්පෑමට මේ සුදුසු කාලයයි ආරාධනාකළේය.ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින්මේවදන් වදාරණලද්දහුමය.මාරය, යම්තාක්කල් මාගේ මේ සකලශාසනමාගී බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධභාවයට නොපැමිණෙන්නේද බොහෝසෙයින් වැඩීමට නොපැමිණෙන්නේද පතලනොවූයේ වේද? බොහෝදෙන විසින් ප්‍රතිවෙධ නොකරණලද්දේවේද පෘථුලභාවයට හෙවත් බොහෝබවට නොපැමිණියේවේද යම්තාක්කල් දෙවිමිනිසුන් විසින් මනාකොට ප්‍රකාශනොකරණ ලද්දේවේද ඒතාක්කල් පරිනිර්‍වාණය නොකරන්නෙමියි කියායි. ස්වාමීන්වහන්ස, දැන් වනාහි භාග්‍යවතුන්වහන්සේගේ සකල ශාසනමාගී බ්‍රහ්මචර්‍ය්‍යාව ධ්‍යානාදීන්ගේ ලැබීම්වශයෙන් සමෘද්ධියට පැමිණියේය. අභිඥසම්පත්තීන්ගේ වශයෙන් බොහෝ සෙයින් වැඩීමට පැමිණියේය. පතලවූයේය. බොහෝ දෙනාගේ ප්‍රතිවෙධවශයෙන් මනාපිහිටීමට පැමිණියේය. සර්‍ව ප්‍රකාරයෙන් බොහෝබවට පැමිණියේය. යම්පමණ පැණගුණවත් දෙවිමිනිස් කෙනෙක් වෙත්ද ඒ සියලු දෙවිමිනිසුන්විසින් මනාකොට ප්‍රකාශකරණ ලද්දේය. ස්වාමීන්වහන්ස, දැන් භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන් පානාසේක්වා. සුගතයන්වහන්සේ පිරිනිවන් පානාසේක්වා. භාග්‍යවතුන්වහන්සේගේ පරිනිර්‍වාණයට මේ සුදුසු කාලයයි සැලකළේය.

9. එවං වුත්තෙ භගවා මාරං පාපිමන්තං එතදවොච අප්පොස්සුක්කො ත්වං පාපිම හොහි න චිරං තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සන්ති.

10. අථ ඛො භගවා චාපාලෙ චෙතියෙ සතො සම්පජානො ආයුසඞ්ඛාරං ඔස්සජි ඔස්සට්ඨෙච භගවතො ආයුසඞ්ඛාරෙ මහාභූමිචාලො අහොසි භිංසනකො ලොමහංසනො දෙවදුන්දුභියොච ඵලිංසු. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

---

9. ඒ පාපී මාරයා විසින් සම්බුදුන්වහන්සේගේ පරිනිර්වාණයට මෙසේ ආරාධනා කළකල්හි භාග්‍යවතුන්වහන්සේ පාපී මාරයාට මේ කාරණය වදාළේය. එම්බල පාපී මාරය! තෝ මාගේ පිරිනිවන්පෑමට මන්දෝත්සාහිවෙව. හෙවත් ආසාරහිත වෙව. තථාගතයන්වහන්සේලාගේ පිරිනිවන්පෑම නොබෝ කලකින් වන්නේය. තුන් මසක්හුගේ ඇවෑමෙන් තථාගතතෙමේ පරිනිර්වාණය කෙරේයයි වදාළසේක.

10. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ චාපාල චෛත්‍යස්ථානයෙහි සිහියෙන් යුක්තවූයේ යහපත් ප්‍රඥා ඇතිසේක්ම හෙවත් සිහියෙන් යුක්තව නුවණින් පිරිසිඳදැනම ආයුසංස්කාරය පහළකළසේක. එතැන්හිදි භාග්‍යවතුන්වහන්සේ කෙසේනම් ආයුසංස්කාරය හැරවදාළසේක්දයත් මෙතැන්පටන් තුන්මසක් පමණකල් සමවත් සුවයෙන් කල්යවා එයින්මතු සමනොවිඳිමියි යනාසිත ඉපදවීම්වශයෙන් ආයුසංස්කාරය හැරවදාළබැව් දතයුතු. මෙසේ භාග්‍යවතුන්වහන්සේගේ ආයුසංස්කාරයහැර වදාළකල්හි මහත්වූ පෘථිවි කම්පාවක් වූයේය. හෙවත් දසදහස් ලෝදශී මිහපොළව යදන්ඩෙන් ලොහිතලියක්මෙන් සියදහස්වර ශබ්දපවත්වමින් සම්ප්‍රකාරයෙන් කම්පාවූයේය. භිසුණාවූ හෙවත් අතිශය භයජනකවූ ලොමුදැහැගැණීමෙක්වූයේය. අහස්කුසපුරා මේඝගර්ජනාවන්ගේ පහළවීමෙන් නොකල් වැසිද පහළවූහ. එකල්හි භාග්‍යවතුන්වහන්සේ මේකාරණය දැනවදාරා ඒ ආයුසංස්කාරය හැරවදාළ වේලායෙහි මේදක්වන ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළසේක.

තුලමතුලඤ්ච සම්භවං
භවසඞ්ඛාර ඔස්සජි මුනි,
අජ්ඣත්තරතො සමාහිතො
අභින්දිකවචමිවත්තසම්භවන්ති.

11. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි. අච්ඡරියං වත භො අබ්භුතං වත භො මහා වතායං භූමිචාලො සුමහා වතායං භූමිචාලො භිංසනකො සලොමහංසො, දෙවදුන්දුභියොච ඵලිංසු. කොනු ඛො හෙතු කො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය දෙවදුන්දුභිනඤ්ච ඵාලිතුන්ති.

---

පඤ්චස්කන්ධයන්ගේ අනිත්‍යතා හෙයින් තුලාවන්නේය. ඔවුන්ගේ නිරොධයවූ නිර්වාණධර්මය නිත්‍යබැවින් අතුල්‍යවන්නේයයි සමාන අසමානභාවය කෙරෙමින් ඒ වනිමූලක දුඃඛස්කන්ධයාගේ ඉපදීමට මූලකාරණාවූ භවයෙන් භවයටසම්භවයන් පමුණුවන්නාවූ කර්මයද ඒ බුද්ධමුනිතෙමේ සර්වප්‍රකාරයෙන් නිරාලයව හැරවදාලසේක. සිය සතන්තුල උපදනා සියලු කෙලෙසුන්ද විදර්ශනාවශයෙන් අධ්‍යාත්මයෙහි අභිරමණය ඇතිවසසමථ භාවනාවශයෙන් සංසිඳුනේ සඞ්ග්‍රාම මණ්ඩලයෙහිදී මහායොධයෙකුවිසින් බිඳිනලද සන්නාහයක් මෙන්බිඳපිසේක. යථොක්ත ප්‍රකාරයෙන් ප්‍රහිනවූ කෙලෙස් ඇත්තාහට භවහිනියක්නම් නැත්තේය. එසේ හෙයින් භයරහිතවම ආයුසංස්කාරය හැරවදාලේයයි දතයුතු.

11. ඉක්බිත්තෙන් ආනන්ද ආයුෂ්මතුන්වහන්සේට මේ අදහස වීය. පින්වත්නි, ඒකාන්තයෙන් මේ කාරණය අසිරිමත්ය. පින්වත්නි, ඒකාන්තයෙන් මේකාරණය අද්භූතයි. ඒනම් මේ පෘථිවිකම්පාව ඒකාන්තයෙන් මහත්වෙයි. මේ පෘථිවිකම්පාව ඒකාන්තයෙන් ඉතාමහත්වෙයි. මේපෘථිවිකම්පාව බිහිසුණුවෙයි. අතිශයින් ලොමුදැහැගැණුම් ඇත්තේය. අකාශයෙහි මෙඝගර්ජනාවෝ ශබ්ද පැවැත්වූහ. මහත්වූ මේපෘථිවි කම්පාහුගේ පහලවීම පිණිසද, මෙඝ ගර්ජනා ශබ්දකිරීම පිණිසද, හේතුකවරේද ප්‍රත්‍යය කවරේදැයි කියායි.

12. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ මහාවතායං භන්තෙ භූමිචාලො සුමහා වතායං භන්තෙ භූමිචාලො භිංසනකො සලොමහංසො දෙවදුන්දුභියො ච ඵලිංසු. කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවායාති.

13. අට්ඨ ඛො ඉමෙ ආනන්ද හෙතු අට්ඨ පච්චයා මහතො භූමිචාලස්ස පාතුභාවාය කතමෙ අට්ඨ. අයං ආනන්ද මහා පථවී උදකෙ පතිට්ඨිතා, උදකං වාතෙ පතිට්ඨිතං, වාතො ආකාසට්ඨො හොති. සො ඛො ආනන්ද සමයො යං මහා වාතා වායන්ති, මහා වාතා වායන්තා උදකං කම්පෙන්ති උදකං කම්පිතං පථවිං කම්පෙති. අයං පඨමො හෙතු පඨමො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

---

12. එකල්හි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැලකළේය. ස්වාමීන්වහන්ස, මේකාරණය අසිරිමත්වේ. ස්වාමීන්වහන්ස, මේකාරණය අද්භූතයි. මේපෘථිවිකම්පාව එකාන්තයෙන් මහත් වෙයි. ස්වාමීන්වහන්ස, එකාන්තයෙන් මේපෘථිවිකම්පාව ඉතා මහත්වෙයි. බිහිසුණුවෙයි. ලොමුදූහැගැණුම් සහිතවෙයි. ආකාශයෙහි මෙඝශබ්ද පැවැත්වූහ. ස්වාමීන්වහන්ස, මෙමහත්වූ පෘථිවිකම්පාහුගේ පහලවීමපිණිස හෙතුකවරේද ප්‍රත්‍යය කවරේදැයි විචාලසේක.

13. ආනන්දය, මහත්වූ පෘථිවිකම්පාහුගේ පහලවීමපිණිස මේ හේතු අටක් වෙත්. මේ ප්‍රත්‍යය අටක්ද වෙත්. ඒ අට කවරහුදයත්; ආනන්දය, මේ මහාපෘථිවිතොමෝ ජලයෙහි පිහිටියාය. ජලය වාතයෙහි පිහිටියේය. වාතයතෙම අවකාශයෙහි සිටියේ වෙයි. ආනන්දය, යම්කාලෙක්හි මහාසුළං හමත්ද හෙවත් උක්ඛෙපක නම් වාතයෝ නැඟිසිටිත්ද; ඒ මහපවන් හමන්නාහු ජලය කම්පාකෙරෙත්. ජලය කම්පාකරණලද්දේ පෘථිවිය කම්පිත වෙයිද ඒ කාලයයි. මහත්වූ පෘථිවි කම්පාහුගේ පහලවිමපිණිස මේ පළමුවෙනි හෙතුව වෙයි. මේ පළමුවෙනි ප්‍රත්‍යය වෙයි වදාළේය.

I4. පුනචපරං ආනන්ද සමණො වා හොති බ්‍රාහ්මණො වා ඉද්ධිමා චෙතොවසිප්පත්තො, දෙවතා වා මහිද්ධිකා මහානුභාවා, යස්ස පරිත්තා පඨවිසඤ්ඤා භාවිතා හොති අප්පමාණා ආපොසඤ්ඤා, සො ඉමං පඨවිං කම්පෙති සංකම්පෙති සම්පකම්පෙති සම්පවෙධෙති. අයං දුතියො හෙතු දුතියො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

15. පුනචපරං ආනන්ද යදා බොධිසත්තො තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, තදායං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං තතියො හෙතු තතියො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

I6. පුනචපරං ආනන්ද යදා බොධිසත්තො සතො සම්පජානො මාතුකුච්ඡිස්මා නික්ඛමති,

---

14. ආනන්දය, නැවතද අනිකක්නම් සෘද්ධිඇත්තාවූ චිත්තවසීභාවයට පැමිණියාවූ මහණෙක් හෝ බමුණෙක් හෝ වේද මහත් සෘද්ධි ඇත්තාවූ මහත් ආනුභාව ඇත්තාවූ දෙවිකෙණෙක් හෝ වේද; ඔවුන් අතුරෙන් යමෙකුවිසින් සවල්මාත්‍රවූ පෘථිවිසංඥතොමෝ වඩන ලද්දීද අප්‍රමාණවශයෙන් ආපොසංඥව වඩනලද්දීද ඒ සෘද්ධ්‍යානුභාව ඇති පුද්ගලතෙම මේ මහපොළව කම්පාකෙරේ. ඌර්ධ්වදිශාභාගය සවමින් වැඩියක් කම්පාකෙරේ. උඩ යට දෙදිශාවට සවමින් වැඩියක් කම්පාකෙරේ. වැඩියක් වෙවුලවයි. මහත් පෘථිවි කම්පාහුගේ පහලවීමපිණිස මේ දෙවෙනි කාරණයයි. මේ දෙවෙනි ප්‍රත්‍යයයයි වදාළසේක.

15. ආනන්දය, නැවතද අනිකක්නම් යම්කලෙක්හි බොධිසත්ව යන්වහන්සේ තුෂිත දිව්‍යනිකායෙන් චුතව සිහියෙන්යුක්තවූයේ සම්‍යක්ප්‍රඥඇත්තේ මව්කුසයට ප්‍රවිෂ්ටවේද, එකල්හි මේපෘථිවිතොමෝ කම්පාවෙයි. වැඩියක් කම්පාවෙයි. අත්‍යර්ථයෙන් කම්පාවෙයි. වැඩියක් වෙව්ලයි. මහත්වූ පෘථිවිකම්පාහුගේ පහලවීමපිණිස මේ තුන්වෙනි හෙතුවෙයි. තුන්වෙනි ප්‍රත්‍යය වෙයි වදාළසේක.

16. ආනන්දය, නැවතද අනිකක්නම් යම්කලෙක්හි බොධිසත්ව යන්වහන්සේ සිහිඇත්තේ සම්‍යක්ප්‍රඥ ඇත්තේම මව්කුසින් නික්මේද.

තදයං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං චතුත්ථො හෙතු චතුත්ථො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

17. පුනචපරං ආනන්ද යදා තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, තදයං පඨවී කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං පඤ්චමො හෙතු පඤ්චමො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

18. පුනචපරං ආනන්ද යදා තථාගතො අනුත්තරං ධම්මචක්කං පවත්තෙති, තදයං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං ඡට්ඨො හෙතු ඡට්ඨො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

19. පුනචපරං ආනන්ද යදා තථාගතො සතො සම්පජානො ආයුසඞ්ඛාරං ඔස්සජති, තදයං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං සත්තමො හෙතු සත්තමො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

---

එකල්හි මේ පෘථිවිතොමෝ කම්පාවෙයි. වැඩියක් කම්පාවෙයි අත්‍යර්ථයෙන් කම්පාවෙයි. වැඩියක් වෙව්ලයි. මහත්වූ පෘථිවිකම්පාහුගේ පහලවිමපිණිස මේසතරවෙනි හෙතුව හා ප්‍රත්‍යයයි වදාළසේක.

17. ආනන්දය, නැවතද අනිකක්නම් යම්කලෙක්හි තථාගත තෙම නිරුත්තරවූ සම්‍යක්සම්බොධිය අවබොධකෙරේද; එකල්හි. සෙස්ස කී ක්‍රමයෙනි. මහත්වූ පෘථිවිචාලනයාගේ පහළවීමට මේ පස් වෙනිවූ කාරණය හා ප්‍රත්‍යයවන්නේය.

18. ආනන්දය, නැවතද අනිකක්නම් යම්කලෙක්හි තථාගත තෙම නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වාද; එකල්හි—පෙ—මහත්වූ පෘථිවිචාලනයාගේ පහළවීමට මේ සවෙනිවූ කාරණය හා ප්‍රත්‍යයවන් නේය.

19. ආනන්දය, නැවතද යම්කලෙක්හි තථාගතතම් සිහියෙන් යුක්තව දැනම ආයුසංස්කාරය හරිද;එකල්හි—පෙ—මහත්වූ පෘථිවි චාලනයාගේ පහළවීමට මේ සත්වෙනිවූ කාරණය හා ප්‍රත්‍යය වන්නේය.

20. පුනචපරං ආනන්ද යදා තථාගතො අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා පරිනිබ්බායති, තදායං පඨවී කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං අට්ඨමො හෙතු අට්ඨමො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවායාති. ඉමෙ ඛො ආනන්ද අට්ඨ හෙතු අට්ඨ පච්චයා මහතො භූමිචාලස්ස පාතුභාවායාති.

21. අට්ඨ ඛො ඉමා ආනන්ද පරිසා. කතමා අට්ඨ. ඛත්තියපරිසා බ්‍රාහ්මණපරිසා ගහපතිපරිසා චාතුමමහාරාජිකපරිසා තාවතිංසපරිසා මාරපරිසා බ්‍රහ්මපරිසා.

22. අභිජානාමි ඛො පනාහං ආනන්ද අනෙකසතං ඛත්තියපරිසං උපසඞ්කමිතා. තත්‍රපි යො සන්නිසින්න පුබ්බඤ්චෙව සල්ලපිත පුබ්බඤ්චසාකච්ඡාච සමාපජ්ජිතපුබ්බා.

---

20. ආනන්දය, නැවතද අනිකක් නම් යම්කලෙක්හි තථාගත තෙම නිරුපධිශෙෂවූ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පාන්නේද; එකල්හි මේ මහාපෘථිවිතොම කම්පාවන්නීය. ඌර්ධ්වදිසාභාගයට යමින් කම්පාවන්නීය. ඌර්ධ්වදිසාභාගයට හා හෙට්ඨිමදිසාභාගයට යමින් කම්පාවන්නීය. වැඩියක් චංචලවන්නීය. මහත්වූ පෘථිවිචාල නයාගේ පහළවීමට මේ අටවෙනිවූ කාරණය හා ප්‍රත්‍යයවන්නේය. 20. ආනන්දය, මහත්වූ පෘථිවීචාලනයාගේ පහළවීමට මේ යථොක්තවූ අටකාරණයන් හා ප්‍රත්‍යය වන්නාහුයයි වදාළසේක.

21. ආනන්දය, පිරිස්හු මේ අටදෙනෙක් වන්නාහුය. ඒ අට පිරිස්හුනම් කවරහුද; ක්ෂත්‍රිය පිරිසය බ්‍රාහ්මණ පිරිසය, ගෘහපති පිරිසය, ශ්‍රමණ පිරිසය, චාතුර්මහාරාජික දෙව්පිරිසය, තව්තිසාවැසි දෙව්පිරිසය, මාරපිරිසය, බ්‍රහ්මපිරිසය යන මේ අටපිරිස්නම් වන්නාහුය.

22. ආනන්දය, මම වනාහි නොයෙක් සියගණන් ක්ෂත්‍රිය පර්ෂත් කරා එළඹුනෙමි, ඒ ක්ෂත්‍රිය පර්ෂත්කෙරෙහි මාවිසින් පෙරහුන් බවද; ඔවුන් හා සමග කථාකරමින් හුන් බවද, ධර්මාන්විත කථාවෙන් යුක්ත බවද, මනාකොට දනිමි.

තත්ථයාදිසකො තෙසං වණ්ණොහොති තාදිසකො මය්හං වණ්ණො හොති, යාදිසකොතෙසං සරොහොති තාදිසකො මය්හං සරො හොති, ධම්මියාච කථායසන්දස්සෙමි සමාදපෙමි සමුත්තෙජෙමි සම්පහංසෙමි. භාසමානඤ්චමංන ජානන්ති කො නුඛො අයං භාසති දෙවොවා මනුස්සොවාති. ධම්මියාච කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා අන්තරධායාමි, අන්තරහිතඤ්චමං න ජානන්ති කොනුඛො අයං අන්තරහිතො දෙවො වා මනුස්සො වාති.

23. අභිජානාමි ඛො පනාහං ආනන්ද අනෙකසතං බ්‍රාහ්මණ පරිසං...පෙ...ගහපති පරිසං සමණපරිසං චාතුම්මහාරාජික පරිසං තාවතිංස පරිසං මාරපරිසං බ්‍රහ්මපරිසං උපසඞ්කමිතා,

---

ඒ පර්ෂත්හි ඔවුන්ගේ යම්බඳුවූ ශරීරවර්ණයක් වීද, මාගේ ශරීරවර්ණයද, එබඳුම වෙයි. ඔවුන්ගේ යම්බඳුවූ ස්වරයයි කියනලද භාෂාවෙක් වේද; මාගේභාෂාවද එබඳුමවන්නේය. ධර්මයෙන් යුක්තවූ කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වන්නෙමි. දැක්වූ වැඩෙහි සිත් සමාදන් කරවමි. සමාදන්කල වැඩෙහි සිත්තියුණු කරවමි. එහිම සිත යහපත යහපතැයි ප්‍රශංසාකරවමි. මේකථාකරන්නේ දෙවිකෙනෙක්ද මනුෂ්‍යකෙනෙක්දැයි කියා කථාකරන්නාවූද මා නොදැනගන්නාහුය. ධර්මාන්විතවූ කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වා දක්වාලූ වැඩෙහි සමාදන්කරවා සමාදන්කල වැඩෙහි සිත් තියුණුකරවා ඒ පිළිවෙතම යහපත යහතැයි කියා ප්‍රශංසාවකරවා අන්තර්ධානවෙමි. අන්තර්ධානවනලද මෙතෙම දෙවිකෙනෙකැයි කියා හෝ මිනිස් කෙනෙකැයි කියා හෝ අන්තර්ධානවූ මා කවරෙක්දැයි කියා නොදන්නාහුය.

23. ආනන්දය, මම නොයෙක් සියගණන් ගෘහිපති පර්ෂත්කරාද නොයෙක් සියගණන් ශ්‍රමණ පර්ෂත්කරාද නොයෙක් සියගණන් චාතුර්මහාරාජික දෙවතා පර්ෂත්කරාද නොයෙක් සියගණන් තව්තිසාවාසි දෙව්පිරිස්කරාද නොයෙක් සියගණන් මාරපර්ෂත්කරාද-පෙ-කවරෙක්දැයි නොදන්නාහුය.

තත්‍රාපි මයා සන්නිසින්නපුබ්බඤ්චෙව සල්ලපිත පුඤ්ඤච සාකච්ඡාච සමාපජ්ජිතපුබ්බා, තත්ථ යාදිසකො තෙසං වණ්ණො හොති තාදිසකො මය්හං වණ්ණො හොති, යාදිසකො තෙසං සරො හොති තාදිසකො මය්හං සරො හොති, ධම්මියා ච කථාය සන්දස්සෙමි සමාදපෙමි සමුත්තෙජෙමි සම්පහංසෙමි. භාසමානඤ්ච මං න ජානන්ති කො නු ඛො අයං භාසති දෙවො වා මනුස්සො වාති. ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා අන්තරධායාමි, අන්තරහිතඤ්ච මං න ජානන්ති කො නු ඛො අයං අන්තරහිතො දෙවො වා මනුස්සො වාති. ඉමා ඛො ආනන්ද අට්ඨ පරිසා.

24. අට්ඨ ඛො ඉමානි ආනන්ද අභිභායතනානි. කතමානි අට්ඨ.

---

ආනන්දය, මම නොයෙක් සියගණන් බ්‍රහ්ම පර්ෂත්කරා එළඹ පෙර මාවිසින් ඒ බ්‍රහ්මපර්ෂත් මධ්‍යයට පැමිණහුන් බවද පෙර උන් හා සමග කථාකරමින් හුන් බවද ධර්මසාකච්ඡාවෙන් යෙදී හුන් බවදැයි කියනලද සාකච්ඡා සමාපජ්ජිතපූර්බවද මනාකොට විශෙෂයෙන් දනිමි. ඒ බ්‍රහ්මපර්ෂද්හි ඔවුන්ගේ යම්බඳුවූ ශරීරවර්ණයක්වූයේවේද මාගේ ශරීරවර්ණයද එබඳුම වන්නේය. ඔවුන්ගේ යම්බඳුවූ භාෂාවක් වේද මාගේ භාෂාවද එබඳුම වන්නේය. ධර්මාන්විතවූ කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වන්නෙමි. දක්වූ වැඩෙහි සිත් සමාදන්කරවමි. සමාදන්කළ වැඩෙහි සිත් තියුණුකරවමි. ඒ සමාදන්කළ පිළිවෙතෙහි යහපත යහපතැයි කියා ප්‍රශංසාකරවමි. මේ කථාකරන්නේ කවරෙක්ද දෙවිකෙනෙක්ද මනුෂ්‍යකෙනෙක්දැයි කියා කථාකරන්නාවූද ඒ මා නොමදූන ගන්නාහුය. ධර්මාන්විතවූ කථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වා දක්වාලූ වැඩෙහි සිත් සමාදන්කරවා සමාදන්කළ වැඩෙහි සිත් තියුණුකරවා ඒ පිළිවෙතම යහපත යහපතැයි කියා ප්‍රශංසාකරවා අන්තර්ධාන වෙමි. අන්තර්ධානවූ මෙතෙම දෙවිකෙනෙකැයි කියා හෝ මනුෂ්‍යයෙකැයි කියා හෝ අන්තර්ධානවනලද මා කවර කෙනෙකැයි කියාත් නොදන්නාහුය. ආනන්දය, මේ අටපිරිස්නම් වන්නාහුයයි වදාළසේක.

24. ආනන්දය, පච්චනික ධර්මයන් හා ආරම්මන ධර්මයන්ගේ අභිභවනයකරණ අර්ථයෙන් අභිභායතන නම්වූ අභිභවන කාරණයෝ වන්නාහුය. ඒ අෂ්ටප්‍රකාරවූ අභිභායතන සමාපත්තිහුනම් කවරහුද.

25. අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි, සුවණ්ණ දුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති. එවං සඤ්ඤීහොති, ඉදං පඨමං අභිභායතනං.

26. අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති. එවං සඤ්ඤී හොති, ඉදං දුතියං අභිභායතනං

---

25. අධ්‍යාත්මික රූපයෙහි පරිකම්වශයෙන් අධ්‍යාත්මික නීල පීතාදි රූපසංඥාඇත්තාවූ නොවැඩෙන ස්වභාව ඇති බැවින් යහපත් වූද නපුරුවූද වර්ණයන් ඇත්තාවූ සමහර යොගාවචරයෙක්තෙම බාහිරවූ අර්පණසමාධියගේ වශයෙන් බාහිරවූ රූපයක් දක්නේය. ඒපරිත්තාරම්මණරූපධර්මයන් අභිභවනයකොට විසඤ්ඤෙපලක්ෂිතවූ අතිකුත් ඤාණුත්තරික යොගාවචරයෙක්තෙම ස්වල්පමාත්‍රවූ මේ පරිත්තාරම්මණ රූපධර්මයෙහි හෙවත් මේ පළමුවෙනිවූ අභිභායතන සමාපත්තියෙහි යම් සමවැදියයුත්තෙක් ඇද්ද එයම බැරුරුම් නොවන්නේයයි කියා මෙයට වඩා අප්‍රමාණ වශයෙන් වැඩුනාවූ අතිකුත් ආරම්මණ රූපධර්ම කෙනෙක් ඇත්තේය ඒ මම දනිමි. දකිමි යන ආභොගසංඥවෙනුදු ධ්‍යානසංඥවෙනුදු මෙබඳුවූ සංඥවක් ඇතිවන්නේය. මේ පළමුවෙනිවූ අභිභායතනනම් සමාපත්තිය වන්නේය.

26. අධ්‍යාත්මික රූප සංඥ ඇත්තාවූ වැඩෙනලද ප්‍රමාණවූ හෙවත් මහත් බැවින් යහපත්වූද නපුරුවූද වර්ණයන් ඇත්තාවූ යොගාවචරයෙක්තෙම බාහිරවූ අර්පණ සමාධියගේ වශයෙන් බාහිරවූ රූපයන් දක්නේය ඒ අප්‍රමාණාරම්මණ රූපධර්මයන් හෙවත් විතියාභිභායතන රූපධර්මයන් අභිභවනයකොට මෙයටවඩා අප්‍රමාණ වශයෙන් වැඩුනාවූ ආරම්මණ රූපධර්ම කෙනෙක් ඇත්තේය. ඒමම විශෙෂයෙන්ම දනිමි දකිමි යන මෙබඳුවූ සංඥවක් ඇතිවන්නේය. මේ දෙවෙනිවූ අභිභායතන සමාපත්තිධර්මය නම් වන්නේය.

96

27. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති. එවං සඤ්ඤී හොති, ඉදං තතියං අභිභායතනං.

28. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධාරූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති. එවං සඤ්ඤී හොති ඉදං චතුත්ථං අභිභායතනං.

---

27. අධ්‍යාත්මිකරූපයෙහි පරිකම් සංඥාවිරහිත බැවින් අධ්‍යාත්මික අරූපසංඥා ඇත්තාවූ ස්වල්පමාත්‍රවූ යහපත්වූද නපුරුවූද වර්ණයන් ඇත්තාවූ යම් යොගාවචරයෙක්හුගේ පරිකර්මයද ආරම්මණනිමිත්තද බාහිරවම උපන්නේවේද, ඒයොගාවචරතෙම මෙසේ බාහිරවූ පරිකර්මයාගේ හා අර්පණසමාධියගේ වශයෙන් බාහිරවූ රූපයන් දක්නේය. ඒපරිත්තාරම්මණ රූපධර්මයන්ගේ වශයෙන් තෘතීයාභිභායතන රූපධර්මයන් අභිභවනයකොට මෙයට වඩා අප්‍රමාණවශයෙන් වැඩුනාවූ අනිඃඝුත් ආරම්මණ රූපධර්මකෙනෙක් ඇත්තේය. ඒ මම දනිමි දකිමි යන මෙබඳු සංඥාවෙක් ඇතිවන්නේය. මේ තුන්වෙනිවූ අභිභායතන සමාපත්තියනම්වන්නේය.

28. අධ්‍යාත්මික අරූප සංඥා ඇත්තාවූ වැඩෙනලද ප්‍රමාණවූ හෙවත් මහත් බැවින් අප්‍රමාණවූ යහපත්වූද නපුරුවූද වර්ණයන් ඇත්තාවූ යම් යොගාවචරයෙක්හුගේ පරිකර්මයද ආරම්මණ නිමිත්තද බාහිරවම උපන්නේවේද හෙතෙම මෙසේ බාහිරවූ පරිකර්මයාගේ හා අර්පණ සමාධියගේ වශයෙන් බාහිරවූ රූපයන් දක්නේය. ඒ අප්‍රමාණාරම්මණ රූපධර්මයන් අභිභවනයකොට මෙයටවඩා අතිශයින් පිරිසිදුවූ නිල කසිණාරම්මණ රූපධර්මකෙනෙක් ඇත්තේය. ඒ මම දනිමි දකිමි යන ආභොග සංඥාවෙනුදු ධ්‍යානසංඥාවෙනුදු මෙබඳු සංඥාවෙක් ඇතිවන්නේය. මේ සතරවෙනිවූ අභිභායතන සමාපත්තිය නම් වන්නේය.

29. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි. සෙය්‍යථාපි නාම උම්මා පුප්ඵං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං සෙය්‍යථාපිවා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතො භාගවිමට්ඨං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධාරූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති ඉදං පඤ්චමං අභිභායතනං.

30. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධාරූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි.

---

29. අධ්‍යාත්මික රූපයෙහි පරිකර්ම සංඥා විරහිත බැවින් අධ්‍යාත්මික අරූපසංඥා ඇත්තාවූ සර්වසඞ්ග්‍රාහිකවශයෙන් නිල්වූ වර්ණවශයෙන් නීලවර්ණවූ දර්ශනවශයෙන් දක්නාලැබෙන බැවින් නීල නිදර්ශනවූ නිල්වූ ඕභාෂ ඇත්තාවූ යම්සේ මෘදු සිනිඳු දියබෙරලියමල නිල්වන්නේවේද වර්ණවශයෙන් නීලවර්ණමවේද දර්ශනවශයෙන් නීලනිදර්ශනමවේද ඕභාෂවශයෙන් නිලොභාෂවවේද දෙපාර්ශව බැවින් බාරාණසෙය්‍යකනම්වූ ඒ වස්ත්‍රය වනාහි යම්සේ නීලවන්නේවේද වර්ණවශයෙන් නීලවර්ණමවේද නීලනිදර්ශනමවේද ප්‍රභාවශයෙන් නීලොභාෂවේද එපරිද්දෙන්ම නිල්වූ නීලවර්ණවූ නීලනිදර්ශනවූ නීලප්‍රභා ඇත්තාවූ අධ්‍යාත්මික අරූපසංඥා ඇත්තාවූ සමහර යොගාවචරයෙක් තෙම බාහිරවූ පරිකර්මයාගේ හා අර්පණ සමාධියගේ වශයෙන් බාහිරවූ සුවිසුද්ධාතිනිර්මලවූ නීල කසිනාරම්මණ රූපයන් දක්නේය. ඒ නීල කසිනාරම්මණ රූපධර්මයන් අභිභවනයකොට මෙයටවඩා අතික්‍රාන් ආරම්මණ රූපධර්ම කෙනෙක් ඇත්තේය. ඒ මම දනිමි දකිමි යන මෙබඳුවූ සංඥාවෙක් ඇතිවන්නේය. මේ පස්වෙනිවූ අභිභායතන සමාපත්තියනම්වන්නේය.

30. අධ්‍යාත්මික රූපසංඥා ඇත්තාවූ පීතවර්ණවූ හෙවත් සර්වසඞ්ග්‍රාහික වශයෙන් රන්වන්වූ වර්ණවශයෙන් සුවර්ණවර්ණවූ දර්ශනවශයෙන් පීතනිදර්ශනවූ ප්‍රභාවශයෙන් සුවර්ණවර්ණ ප්‍රභා ඇත්තාවූ.

සෙය්‍යථාපි නාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං සෙය්‍යථාපිවා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතො භාගවිමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීත වණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති, ඉදං ඡට්ඨං අභිභායතනං

31. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි සෙය්‍යථාපි නාම බන්ධුජීවකපුප්ඵං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං. සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතො භාගවිමට්ඨං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං.

---

යම්සේ කිණිහිරිමල රන්වන්වන්නේවේද වර්ණවශයෙන් පීතවර්ණවේද දර්ශනවශයෙන් පීතනිදර්ශිතවේද ඕභාෂවශයෙන් ස්වර්ණවර්ණප්‍රභාඇත්තේවේද දෙපාර්ශ්වයෙන් මට්ටවූ බාරාණසෙය්‍යකනම්වූ ඒවස්ත්‍රයවනාහි යම්සේ රන්වන්වන්නේවේද පීතවර්ණවේද පීතනිදර්ශිතවේද ස්වර්ණවර්ණ ප්‍රභාඇත්තේවේද එපරිද්දෙන්ම රන්වන්වූ ස්වර්ණවර්ණවූ පීතනිදර්ශිතවූ ස්වර්ණවර්ණ ප්‍රභාඇත්තාවූ අධ්‍යාත්මික අරූපසංඥා ඇත්තාවූ සමහර යොගාවචරයෙක්තෙම බාහිරවූ පීත කසිනාරම්මණ රූපයන් දක්නේය. ඒ පීත කසිනාරම්මණ රූපධර්මයන් අභිභවනයකොට මෙයට වඩා අනිකුත් ආරම්මණ රූපධර්මකෙනෙක් ඇත්තේය. ඒ මම දනිමි දකිමි යන මෙබඳු සංඥාවෙක් ඇතිවන්නේය. මේ සවෙනිවූ අභිභායතන සමාපත්තියනම්වන්නේය.

31. අධ්‍යාත්මික අරූපසංඥා ඇත්තාවූ රක්තවර්ණවූ වර්ණවශයෙන් ලොහිතක වර්ණවූ දර්ශනවශයෙන් ලොහිතක නිදර්ශිතවූ ඕභාෂවශයෙන් රක්තවර්ණ ප්‍රභාඇත්තාවූ යම්සේ බන්ධූජීවකයයි කියනලද බඳුවදමල රක්තවර්ණවන්නේවේද ලොහිතකවර්ණවේද ලොහිතක නිදර්ශිතවේද රක්තවර්ණ ප්‍රභාඇත්තේවේද.

එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධාරූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි තානි අභිභුය්‍යජානාමි පස්සාමීති, එවං සඤ්ඤීහොති, ඉදං සත්තමං අභිභායතනං.

32. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. සෙය්‍යථාපි නාම ඔසධිතාරකා ඔදාතා ඔදාතවණ්ණා ඔදාතනිදස්සනා ඔදාතනිභාසා සෙය්‍යථාපිවා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ඔදාතං ඔදාතවණ්ණං ඔදාතනිදස්සනං ඔදාතනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො.

---

එපරිද්දෙන්ම රක්තවර්ණවූ ලොහිතකවර්ණවූ ලොහිතකනිදර්ශනවූ රක්තවර්ණ ප්‍රභාඇත්තාවූඅධ්‍යාත්මික අරූප සංඥා ඇත්තාවූ සමහර යොගාවචරයෙක්තෙම බාහිරවූ ලොහිතක කසිනා රම්මණ රූපයන් දක්නේය. ඒ ලොහිතක කසිනාරම්මණ රූප ධර්මයන් අභිභවනය කොට මෙයට වඩා අනිකුත් ආරම්මණ රූප ධර්මකෙනක් ඇත්තේය. ඒ මම දනිමි දකිමි යන මේබඳු සංඥාවෙක් ඇතිවන්නේය. මේ සත්වෙනිවූ අභිභායතන සමාපත්තියනම් වන්නේය.

32. අධ්‍යාත්මික අරූප සංඥා ඇත්තාවූ ශ්වෙතවූ වර්ණවශයෙන් ශුභ්‍රවර්ණවූ දර්ශනවශයෙන් ඔදාත නිදර්ශනවූ ඕභාෂවශයෙන් ශුභ්‍ර වර්ණ ප්‍රභාඇත්තාවූ යම්සේ ඔෂධීතාරකාතොම ශ්වෙතවර්ණවන්නේවේද ශුභ්‍ර වර්ණවන්නේවේද ඔදාත නිදර්ශනවන්නේවේද ශුභ්‍රවර්ණ ප්‍රභා ඇතිවන්නේවේද දෙපාර්ශ්වයෙන්ම වටවූ බාරාණසෙය්‍යක නම්වූ ඒ වස්ත්‍රය යම්සේ ශ්වෙතවර්ණවන්නේද ඔදාතවර්ණවන්නේද ඔදාතනිදර්ශනවන්නේද ශුභ්‍රවර්ණ ප්‍රභාඇතිවන්නේවේද එපරිද්දෙන්ම ශ්වෙත වර්ණවූ වර්ණවශයෙන් ශුභ්‍රවර්ණවූ ඔදාතනිදර්ශනවූ ඕභාෂවශයෙන් ශුභ්‍රවර්ණප්‍රභා ඇත්තාවූ අධ්‍යාත්මික අරූප සංඥා ඇත්තාවූ සමහර යොගාවචරයෙක්තෙම.

බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති, ඉදං අට්ඨමං අභිභායතනං ඉමානි ඛො ආනන්ද අට්ඨ අභිභායතනානි.

33. අට්ඨ ඛො ඉමෙ ආනන්ද විමොක්ඛා. කතමෙ අට්ඨ. රූපී රූපානි පස්සති, අයං පඨමො විමොක්ඛො. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධං පානි පස්සති අයං දුතියො විමොක්ඛො......සුභන්තෙව අධිමුත්තො හොති. අයං තතියො විමොක්ඛො. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති අකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති

---

බාහිරවූ පරිකර්මයාගේ හා අර්පණා සමාධියගේ වශයෙන් බාහිරවූ සුවිශුද්ධතරවූ නිර්මලවූ ඔදාත කසිනාරම්මණ රූපයන් දක්නේය. ඒ ඔදාතකසිනාරම්මණ රූපයන් අභිභවනයකොට ඒ මම දනිමි දකිමි යන එබඳු සංඥවෙක් ඇතිවන්නේය. මේ අටවෙනිවූ අභිභායතන සමාපත්තියනම් වන්නේය. ආනන්දය මේ අභිභායතන සමාපත්ති අටනම්වන්නේයයිවදාළසේක.

33. ආනන්දය පච්චනිකධර්මයන් කෙරෙන් විශෙෂයෙන් මනාකොට මිදීමෙන් පැමිණෙන්නාවූ විමොක්ෂසමාපත්තිධර්මයෝ මේ අටදෙනෙක් වන්නාහුය. ඒ අෂ්ට ප්‍රකාර විමොක්ෂ සම්පත්තිධර්මයෝ කවරහුදයත්. අධ්‍යාත්මිකවූ කෙසාදිය නිමිත්තකොට නිලකසිනාදි වශයෙන් උපදවාගන්නාලද රූපධ්‍යාන ඇතිබැවින් රූපවත්වූයේ බාහිරවූද නිලකසිනාදිවූ රූපයන් ධ්‍යානචක්ෂුසයෙන් දක්නේය. මේ පළමුවෙනිවූ විමොක්ෂ සම්පත්තිධර්මයනම් වන්නේය. අධ්‍යාත්මික රූප සංඥ ඇත්තේ බාහිරවූ රූපයන් දක්නේය. මේ දෙවෙනිවූ විමොක්ෂසමාපත්ති ධර්මයනම් වන්නේය. ඉතා පිරිසිදුවූ නිලාදිකසිනාරම්මණයන් ධ්‍යානයෙන් දක්නාලද බැවින් සුභ කසිනයක් අරමුණුකොට වාසය කරන්නේය, මේ තුන්වෙනිවූ විමොක්ෂසමාපත්ති ධර්මයනම් වන්නේය. සර්වප්‍රකාරයෙන් රූපසංඥවන්ගේ ඉක්මීම හෙතුකොටගෙණ ප්‍රතිඝයයි කියනලද වෙෂසංඥවන්ගේ විනාශයෙන්ද නානත්ත සංඥවන්ගේ සිහි නොකිරීමෙන්ද අනන්ත ආකාසයයි කියා ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ නොහොත් එය උපදවා වාසය කරන්නේය.

අයං චතුත්ථො විමොක්ඛො. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති අයං පඤ්චමො විමොක්ඛො. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති අයං ඡට්ඨො විමොක්ඛො. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති අයං සත්තමො විමොක්ඛො. සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, අයං අට්ඨමො විමොක්ඛො. ඉමෙ ඛො ආනන්ද අට්ඨ විමොක්ඛා.

34. එකමිදාහං ආනන්ද සමයං උරුවෙලායං විහරාමි නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො.

---

මේ සතරවෙනිවූ විමොක්ෂ සමාපත්ති ධර්‍මයනම් වන්නේය. සර්‍වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතන සමාපත්තිය ඉක්මවා අනන්තවූ විඤ්ඤාණයයි කියා විඤ්ඤාණඤ්චායතනසමාපත්තියට පැමිණ වාසය කරන්නේය. මේ පස්වෙනිවූ විමොක්ෂ සමාපත්ති ධර්‍මයනම් වන්නේය. සර්‍වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ඉක්මවා කිසිවක් නැතැයි කියා ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කෙරේද. මේ සවෙනිවූ විමොක්ෂ සමාපත්ති ධර්‍මය නම්වෙයි. සර්‍වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කෙරේද. මේ සත්වෙනිවූ විමොක්ෂ සමාපත්ති ධර්‍මයනම් වෙයි. සර්‍වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසයකෙරේද, මේ අටවෙනිවූ විමොක්ෂ සමාපත්ති ධර්‍මය නම් වන්නේය. ආනන්දය මේ විමොක්ෂ සමාපත්ති අටනම් වන්නේයි වදාළසේක.

34. ආනන්දය මම බුදුවී පළමුවෙනි අවුරුද්දෙහි මේ එක්තරා කාලයෙක්හි උරුවෙල්දනව්වෙහි නෙරඤ්ජරා නම් ගඞ්ගා තීරයෙහිවූ අජපාලනම් නිග්‍රොධ මූලයෙහි වාසය කෙරෙමි.

අථ ඛො ආනන්දමාරො පාපිමා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආනන්ද මාරො පාපිමා එතද මං වොච. පරිනිබ්බාතු දානි භන්තෙ භගවා. පරිනිබ්බාතු සුගතො පරි නිබ්බාණකාලො දානි භන්තෙ භගවතොති.

35. එවං වුත්තෙ අහං ආනන්ද මාරං පාපිමං එතදවොචං න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාවමෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්ම පටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ න භික්ඛුනියො න සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනියො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි.

---

ඉක්බිත්තෙන් ආනන්දය පවිටුවූ මාරතෙම මම යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ එකත් පසෙක්හි සිටියේය. ආනන්දය එකත් පසෙක්හි සිටියාවූ පවිටුවූ මාරතෙම මට මෙසේ කීයේය. ස්වාමීන්වහන්ස භාග්‍යවන්තෙම දැන් පිරි නිවන් පාවදාරණ සේක්වා. සුගතොත්තම තෙම පිරිනිවන් පාවදාරණ සේක්වා. ස්වාමින් වහන්ස භාග්‍යවතුන් වහන්සේගේ දැන් පිරිනිවන් පෑමට කල්වන්නේයයි යාච්ඤා කළේය.

35. පවිටු වසවර්ති මාරයා මට මෙසේ කිකල්හි ආනන්දය මම පවිටුවූ ඒ වසවර්තිමාරයාහට මෙසේ කීයෙමි. එම්බා පවිටුවූ මාරය යම්තාක්කල් මාගේ භික්ෂූහු ශ්‍රාවක නොවන්නාහු වෙද්ද. සෙස්ස ප්‍රථම වාරයෙහි මෙනි.

යාවමෙ උපාසකා න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති යාවමෙ ඉදං බ්‍රහ්මචරියං න ඉද්ධඤ්චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකඤ්ච බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙවමනුස්සෙහි සුප්පකාසිතන්ති.

36. ඉදානෙව ඛො ආනන්ද අජ්ජ චාපාලෙ චෙතියෙ මාරො පාපිමා යෙනාහං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආනන්ද මාරො පාපිමා මං එතදවොච.

---

යම්තාක්කල් මාගේ උපාසකවරහු ශ්‍රාවක නොවන්නාහු වෙද්ද. ව්‍යක්තනොවෙද්ද නොහික්මෙද්ද විසාරද නොවෙද්ද බහුශ්‍රැත නොවෙද්ද ධර්මධරනොවෙද්ද ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යුක්ත නොවෙද්ද යහපත්ව පිළිපදින්නෝ නොවෙද්ද ධර්මානුචාරි නොවෙද්ද ස්වකීය ආචාර්‍ය්‍ය ධර්මය ඉගෙණ කියන්ද දෙසන්ද පණවත්ද. පිහිටවත්ද විවෘතකෙරෙද්ද විභාගකෙරෙද්ද ප්‍රකට කෙරෙද්ද යම්තාක්කල් මාගේ උපාසිකාවෝ ශ්‍රාවිකා නොවන්නාහු වෙද්ද. සංක්‍ෂෙපකරණලදි. යම්තාකල් මාගේ සකල ශාසනමාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව ධ්‍යානාස්වාද වශයෙන් සමෘඬ භාවයට නොපැමිණියේවේද. අභිඥා සමාපත්ති වශයෙන් වෘඩියට නොපැමිණියේවේද. ඒ ඒ දිශාභාගයෙහි පැතිර නොපවත්නේවේද. බාහුජඤ්ඤ භාවයට නොපැමිණියේවේද. යම් පමණ දිව්‍ය මනුෂ්‍යයන්විසින් සුප්‍රකාශිත නොවන්නේවේද. ඒතාක්කල් පිරිනිවන් නොපාන්නෙමි කියෙමි.

36. ආනන්දය දැන් අද මේ චාපාල නම් චෛත්‍යයෙහිදී පවිටුවූ වසවර්තිමාරතෙම මම යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ එකත්පසෙක්හි සිටියේය. ආනන්දය එකත්පසෙක්හි සිටියාමවූ පවිටුවූ වසවර්තිමාරයා මා මෙසේ යාච්ඤාකෙළේය.

පරිනිබ්බාතු දානි භන්තෙ භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බාණ කාලො දානි භන්තෙ භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා. නතාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්ම පටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්තීති යාවමෙ භික්ඛුනියො ......පෙ......යාවමෙ උපාසකා යාවමෙ උපාසිකා යාවමෙඉදං බ්‍රහ්මචරියං න ඉද්ධඤ්චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං.

ස්වාමීන්වහන්ස දැන් භාග්‍යවත්තෙම පිරිනිවන්පා වදාරණසේක්වා. සුගතොත්තමතෙම පිරිනිවන්පාවදාරණසේක්වා. ස්වාමීන්වහන්ස භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන්පෑමට මේ කල්වන්නේය. ස්වාමීන්වහන්ස භාග්‍යවතුන්වහන්සේ විසින් මේ වචනය වදාරණ ලද්දේමය. එම්බා පවිටුවූ මාරය, මාගේ භික්ෂූහු යම්තාක්කල් ශ්‍රාවක නොවන්නාහු වෙද්ද. ව්‍යක්තනොවෙද්ද නොහික්මුණෝවෙද්ද විසාරද නොවෙද්ද බහුශ්‍රැතනොවෙද්ද ධර්මධරනොවෙද්ද ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තනොවෙද්ද යහපත් පිළිවෙතින් යුක්තනොවෙද්ද ධර්මානුචාරි නොවෙද්ද ස්වකීය ආචාර්ය්‍ය ධර්මය ඉගෙණ නොකියත්ද නොදෙසද්ද නොපණවත්ද නොපිහිටුවත්ද විවෘතනොකෙරෙද්ද විභාගනොකෙරෙද්ද ප්‍රකටනොකෙරෙද්ද උපන් පරප්‍රවාදය සකාරණයෙන් නිග්‍රහකිරීම් වශයෙන් මැඩපවත්වා නෛර්‍ය්‍යාණික ධර්මය දෙසනා නොකරන්නාහුද සංක්‍ෂෙපකරණලදි. මාගේ භික්ෂුනීහු යම්තාක්කල් ශ්‍රාවිකාවෝ නොවන්නාහුවෙද්ද—පෙ—යම්තාක්කල් මාගේ උපාසකවරහු ශ්‍රාවකනොවන්නාහුද. පළමුවෙනි වාරයෙහිමෙනි. මාගේ උපාසිකාවෝ යම්තාක්කල් ශ්‍රාවිකාවෝ නොවන්නාහුවෙද්ද—පෙ—යම්තාක්කල් මේ සකල ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධභාවයට නොපැමිණියේවේද වෘද්ධි ප්‍රාප්ත නොවන්නේවේද විස්තීර්ණ නොවන්නේවේද.

බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙවමනුස්සෙහි සුප්පකාසිතනානි. එතරහිඛො පන භන්තෙ භගවතො බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතං. පරිනිබ්බාතු දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බාණ කාලො දානි භන්තෙ භගවතොති.

37. එවං වුත්තෙ අහං ආනන්ද මාරං පාපිමන්තං එතදවොචං. අප්පොස්සුක්කො ත්වං පාපිම හොහි, න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති, ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතීති. ඉදානෙව ඛො ආනන්ද අජ්ජ චාපාලෙ චෙතියෙ තථාගතෙන සතෙන සම්පජානෙන ආයුසඞ්ඛාරො ඔස්සට්ඨොති.

---

බොහෝදෙනා විසින් දැන ප්‍රතිවෙධ නොකරන්නේවේද පෘථුලත්වයට නොපැමිණියේවේද යම්තාක් දෙවිමිනිසුන්විසින් සුප්‍රකාශිත නොවූයේවේද ඒතාක්කල් පිරිනිවන් නොපාන්නෙමි කියා භාග්‍යවත්තුන් වහන්සේවිසින් මේ වචනය වදාරණලද්දේමය. ස්වාමීන්වහන්ස දැන් වනාහි භාග්‍යවතුන්වහන්සේගේ ශාසනමාර්ගීබ්‍රහ්මචර්‍ය්‍යාව ධ්‍යානාභිඥාදිවශයෙන් සමෘද්ධවූයේය. වෘද්ධිප්‍රාප්තවූයේය. පැතිර පවත්නේය. බොහෝදෙනා විසින් දැනගන්නාලද්දවූ සම්ප්‍රකාරයෙන් පෘථුලත්වයට පැමිණියේය. යම්පමණ ප්‍රාඥවූ දිව්‍යමනුෂ්‍යකෙනෙක් ඇත්තාහුවෙද්ද, ඒ සියලුම දිව්‍යමනුෂ්‍යාදීන්විසින් සුප්‍රකාශිත වූයේය. ස්වාමින්වහන්ස දැන් භාග්‍යවත්තෙම පිරිනිවන්පා වදාරණ සේක්වා. සුගතොත්තම තෙම පිරිනිවන්පා වදාරණසේක්වා. ස්වාමින් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන්පෑමට කල්වන්නේයයි යාච්ඤාකෙළේය.

37. මෙසේ කීකලහි ආනන්දය, ඒ පාපිවූ මාරයාට පවිටුවූ මාරය තෝ මන්දොත්සාහඇති වෙව. තථාගතයන්වහන්සේගේ පිරිනිවන් පෑම නොබෝකලකින්ම වන්නේය. තුන්මාසයක්හුගේ ඇවෑමෙන් තථාගතතෙම පිරිනිවන්පානාසේකැයි වදාළසේක. ආනන්දය දැන් වනාහි අද මේ චාපාලනම් චෛත්‍යයෙහිදී තථාගතයන්වහන් සේ විසින් සිහියෙන් යුක්තව දැනම ආයුසංස්කාරය හරණලද්දේයයි කියා වදාළසේක.

38. එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං, බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති. අලං ආනන්ද මා තථාගතං යාචි, අකාලො දානි ආනන්ද තථාගතං යාචනායාති.

39. දුතියම්පි ඛො ආයස්මා ආනන්දො...පෙ...තතියම්පි ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං, බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති. සද්දහසි ත්වං ආනන්ද තථාගතස්ස බොධින්ති, එවං භන්තෙ. අථ කිඤ්චරහි ත්වං ආනන්ද තථාගතං යාවතතියකං අභිනිප්පිළෙහිසි.

---

38. මෙසේ වදාළකල්හි ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළසේක. ස්වාමිවූ භාග්‍යවතුන් වහන්ස. බොහෝ ජනයාට හිතපිණිස බොහෝ ජනයාට සැපපිණිස ලොවට අනුකම්පා පිණිස දිව්‍යමනුෂ්‍යයන්ගේ සමෘද්ධි සංසිද්ධිය පිණිස හා හිතසැප පිණිස කල්පයක් මුලුල්ලෙහි ජීවත්ව වැඩසිටින සේක්වා.

39. දෙවෙනිවරෙහිද–පෙ–තුන්වෙනිවරෙහිද ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැලකළසේක. ස්වාමිනි භාග්‍යවතුන්වහන්ස බොහෝ ජනයාට හිතසැප පිණිස ලොවට අනුකම්පා පිණිස දිව්‍යමනුෂ්‍යයන්ගේ සමෘද්ධි සංසිද්ධිය හා හිතසැප පිණිස භාග්‍යවතුන්වහන්සේ කල්පයක් මුලුල්ලේ ජීවත්ව වැඩසිටින සේක්වායි කියාද සුගතොත්තම තෙම කල්පයක් මුලුල්ලෙහි ජීවත්ව වැඩසිටින සේක්වායි කියාද සැලකළසේක. ආනන්දය තෝ තථාගතයන් වහන්සේගේ සම්‍යක් සම්බොධිය අදහන්නෙහිදැයි අසා වදාළසේක. එසේය ස්වාමිනියි සැලකළේය. ආනන්දය තෝ දැන් එසේ අදහන්නෙහිනම් යම්තාක් තුන්වෙනිවර දක්වා කුමක්නිසා තථාගතයන්වහන්සේ අභියසින් පීඩාකරන්නෙහිදැයි විචාරා වදාළසේක.

40. සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං. යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානිකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො කප්පංවා තිට්ඨෙය්‍ය කප්පාවසෙසංවා. තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාදා—පෙ—කප්පාවසෙසංවාති. සද්දහසි ත්වං ආනන්දාති. එවම්භන්තෙ. තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කටං තුය්හෙවෙතං අපරද්ධං. යංත්වං තථාගතෙන එවං ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං න තථාගතං යාචි තිට්ඨතු භගවා කප්පං තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

40. ස්වාමීන්වහන්ස භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙන්ම අසන ලද්දෙමි. බුදුරජානන්වහන්සේගේම ශ්‍රී සම්මුඛයෙන්ම මනාකොට පිළිගන්නාලද්දෙම්වීමි. ආනන්දය, යම්කිසිවෙකු විසින් චතුර්විධ සෘද්ධිපාදධර්මයෝ වඩනලද්දාහු වෙත්ද, බහුලීකෘත වන්නාහු වෙද්ද, යුක්ත ස්ථානයක්මෙන් කරණලද්දාහු වෙත්ද ගෘහවස්තුවක් මෙන් කරණලද්දාහුවෙත්ද මනාකොට පිහිටා සිටින ලද්දාහු වෙත්ද සහපත්කොට වඩන ලද්දාහු වෙත්ද මනාකොට පටන්ගන්නා ලද්දාහු වෙත්ද ඒ චතුර් සෘද්ධිපාදධර්මයන් මනාකොට වඩනාලද පුද්ගල තෙම ඉදින් කැමතිවූයේ වීනම් කල්පයක්හෝ කල්පාධියක්හෝ ජීවත්ව සිටින්නේයයි කියා නැවත වදාරණසේක. තථාගතයන් වහන්සේට වනාහි—පෙ—කල්පයක් හෝ කල්පාධියක් හෝ ජීවත්ව වැඩ සිටින්නේයයි කියා වදාළසේක. ආනන්දය තථාගතයන්වහන්සේ මෙසේ වදාළබව අදහන්නෙහිද්දැයි විචාළසේක. එසේය ස්වාමීන්වහන්ස අදහන්නෙමියි සැලකළේය. ආනන්දය එසේ අදහන්නෙහිනම් මේ කාරණය තොපිම නපුරුකොට කරණ ලද්දේය. මේකාරණය තොපිම වරද වන ලද්දේය. ඉදින් තෝ තථාගතයන් වහන්සේ විසින් මෙබඳුවූ ඖදාරික නිමිත්තයන්කරවදාරණකල්හිද ඖදාරිකවූ ඕභාෂයන් කර වදාරණකල්හිද ප්‍රතිවෙධ කරන්ට හෙවත් දැනගන්ට නොහැකිවූයෙහිය. බොහෝ ජනයාට හිත සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දිව්‍යමනුෂ්‍යයන්ගේ සමෘද්ධි සංසිද්ධිය පිණිස හා හිත සැප පිණිස භාග්‍යවන්තෙම කල්පයක් මුලුල්ලෙහි ජීවත්ව වැඩ සිටිනා සේක්වයි කියාද සුගතොත්තම තෙම කල්පයක් මුලුල්ලෙහි ජීවත්ව වැඩ සිටිනා සේක්වයි කියාද තථාගතයන්වහන්සේට යාච්ඤා නොකළේය.

සචෙත්වං ආනන්ද තථාගතං යාචෙය්‍යාසි ද්වෙව තෙ වාචා තථාගතො පටික්ඛිපෙය්‍ය.අථ තතියකං අධිවාසෙය්‍ය. තස්මාතිහානන්ද තුය්හෙ වෙතං දුක්කතං තුය්හෙ වෙතං අපරද්ධං.

41. එකමිදාහං ආනන්ද සමයං රාජගහෙ විහරාමි ගිජ්ඣකූටෙ පබ්බතෙ තත්‍රාපි ඛො තාහං ආනන්ද ආමන්තෙසිං.රමණීයං ආනන්ද රාජගහං, රමණීයො ගිජ්ඣකූටො පබ්බතො.යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සො ආකංඛමානො කප්පංවා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වාති. තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පංවා තිට්ඨෙය්‍ය කප්පාවසෙසංවාති. එවම්පිඛො ත්වං ආනන්ද තථාගතෙන ඔළාරිකෙ නිමිත්තෙන කයිරමානෙනාසක්ඛි පටිවිජ්ඣිතුං න තථාගතං යාචි තිට්ඨතු භගවා කප්පං තිට්ඨතු සුගතො කප්පං බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පනාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

---

ආනන්දය, තෝ ඉදින් තථාගතයන්වහන්සේට යාච්ඤාකළෙහි නම් තොපගේ වචනය දෙවරක්ම තථාගතතෙම ප්‍රතික්ෂෙප කරන්නේය. ඉක්බිත්තෙන් තුන්වෙනි වචනය ඉවසන්නේය ආනන්දය එසේ අදහන්නෙහි නම් මේ කාරණය තොපිම නපුරුකොට කරණ ලද්දේය. මේ කාරණය තොපිම වරදවන ලද්දේය.

41. ආනන්දය, මම මේ එක්තරා කාලයෙක්හි රජගෘහ නම් පුර ප්‍රවරාසන්න යෙහිවූ ගිජ්ඣකූටනම් පර්වතයෙහි වාසය කරමි. එතැන් හිද ආනන්දය,මම තොපට ආමන්ත්‍රණය කෙළෙමි. ආනන්දය රජගෘහනම් පුරප්‍රවරය සිත්කලුවන්නේය. ගිජුකුළුපව්ව සිත්කලුවන්නේය ආනන්දය, යම්කිසි වෙකුන්ගේ—පෙ—කල්පයක් හෝ කල්පාඞයක් හෝ ජීවත්වසිටින්නේය.ආනන්දය, තථාගතයන් වහන්සේගේ—පෙ- කල්පයක්හෝ කල්පාඞයක් හෝ ජීවත්වසිටින්නේයයි කියා වදාළසේක.ආනන්දය, තෝතථාගතයන්වහන්සේ විසින්. පළමුවාරණයෙහි මෙනි.

සචෙ ත්වං ආනන්ද තථාගතං යාචෙය්‍යාසි ද්වෙව තෙ වාචා තථාගතො පටික්ඛිපෙය්‍ය අථ තතියකං අධිවාසෙය්‍ය. තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කතං තුය්හෙවෙතං අපරද්ධං.

42. එකමිදාහං ආනන්ද සමයං තත්‍රෙව රාජගහෙ විහරාමි නිග්‍රොධාරාමෙ ...පෙ... තත්‍රෙව රාජගහෙ විහරාමි චොරපපාතෙ. තත්‍රෙව රාජගහෙ විහරාමි වෙභාරපස්සෙ සත්තපණ්ණි ගුහායං. තත්‍රෙව රාජගහෙ විහරාමි ඉසිගිලිපස්සෙ කාළසිලායං තත්‍රෙව රාජගහෙ විහරාමි සීතවනෙ සප්පසොණ්ඩික පබ්භාරෙ. තත්‍රෙව රාජගහෙ විහරාමි තපොදාරාමෙ. තත්‍රෙව රාජගහෙ විහරාමි වෙළුවනෙ කලන්දක නිවාපෙ. ...පෙ... තත්‍රෙව රාජගහෙ විහරාමි ජීවකම්බවනෙ. තත්‍රෙව රාජගහෙ විහරාමි මද්දකුච්ඡිස්මිං මිගදායෙ.

---

ඉදින් ආනන්දය, තෝ තථාගතයන්වහන්සේට යාච්ඤාකළෙහිනම් තොපගේ වචනය දෙවරක්ම තථාගත තෙමේ ප්‍රතික්ෂේප කරන්නේය. ඉක්බිති තුන්වෙනි වචනය ඉවසන්නේය. ආනන්දය, එහෙයින් මේ කාරණය තොපිම නපුරුකොට කරණ ලද්දේය. මේකාරණය තොපිම වරදවන ලද්දේය.

42. ආනන්දය, මම මේ එක්තරා කාලයක්හි එම රජගහ නම් පුරප්‍රවරාසන්න යෙහිවූ නිග්‍රොධාරාමයෙහි. සංක්ෂෙප කරණලදී. එම රජගෘහනාම් පුරප්‍රවරාසන්න යෙහිවූ චොරප්‍රපාතයෙහි වාසය කරමි. එම රජගහ නුවරට ආසන්නවූ වෙභාරපර්වත ප්‍රාන්ත යෙහිවූ සප්තපර්ණී ගුහාවෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරට ආසන්නවූ ඉසිගිලි පර්වත ප්‍රාන්ත යෙහිවූ ශෛලයෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරට ආසන්නවූ සීතවනයෙහිවූ සප්පසොණ්ඩිකනම් ප්‍රාග්භාරයෙහි වාසය කෙරෙමි එම රජගහ නුවරට ආසන්නවූ තපොදාරාමයෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරට ආසන්නවූ කලන්දක නිවාපනම්වූ වෙළුවනාරාමයෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරට ආසන්නවූ ජීවකාම්බවනයෙහි වාසය කෙරෙමි. එම රජගහ නුවරට ආසන්නවූ මද්දකුච්ඡි නම්වූ මිගදායෙහි වාසය කෙරෙමි.

43. තත්‍ර ඛො තාහං ආනන්ද ආමන්තෙසිං රමනීයං ආනන්ද රාජගහං. රමනීයො ගිජ්ඣකූටො පබ්බතො, රමනීයො ගොතම නිග්‍රොධො රමනීයො චොරපපාතො රමනීයා වෙභාරපස්සෙ සත්ත පණ්ණිගුහා. රමනීයා ඉසිගිලිපස්සෙ කාලසිලා. රමනීයො සීතවනෙ සප්පසොණ්ඩික පබ්භාරො රමනීයො තපොදාරාමො. රමනීයො වෙලු වනෙ කලන්දකනිවාපො. රමනීයං ජීවකම්බවනං රමනීයො මද්ද කුච්ඡිස්මිං මිගදායො

44. යස්සකස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාද——පෙ——තසමාගි හානන්ද තුය්හෙවෙතං දුක්කතං තුය්හෙවෙතං අපරද්ධං

45. එකමිදාහං ආනන්ද සමයං ඉධෙව වෙසාලියං විහරාමි උදෙනෙ චෙතියෙ.තත්‍රපිඛො.

---

43. ආනන්දය, එකල්හිද මම තොපට මෙසේ ආමන්ත්‍රණය කෙළෙමි. ආනන්දය, රාජගෘහ නම් පුරප්‍රවරය සිත්කලු වන්නේය. ගිජ්ඣකූටනම් පර්වතයතෙම සිත්කලු වන්නේය. ගෞතමනිග්‍රොධා රාමයතෙම සිත්කලුවන්නේය, චොර ප්‍රපාතය තෙම සිත්කලුවන් නේය. වෙභාරපර්වත ප්‍රාන්තයෙහිවූ සප්තපර්ණීගුහාව සිත්කලු වන්නේය, ඉසිගිලි පර්වත ප්‍රාන්තයෙහිවූ කාලශෛලයතෙම සිත් කලු වන්නේය. සීතවනයෙහිවූ සප්පසොණ්ඩිකනම් ප්‍රාග්භාරය තෙම සිත්කලු වන්නේය, තපොදාරාමයතෙම සිත්කලු වන්නේය. වෙලු වනයෙහිවූ කලන්දක නිවාපයතෙම සිත්කලුවන්නේය. ජීවකාම්බ වනයතෙම සිත්කලුවන්නේය. මද්දකුච්ඡි නම්වූ මිගදායතෙම සිත් කලුවන්නේය.

44. ආනන්දය, යම්කිසි කෙනෙකුන්ගේ—පෙ—ආනන්දය, එහෙයින් මේ කාරණය තොපිම නපුරුකොට කරණ ලද්දේය. තොපිම මේ කාරණය වරදවන ලද්දේය.

සුගතොත්තම තෙම කල්පයක් මුලුල්ලෙහි පිරිණිවන් නොපා වැඩ සිටින සේක්වා කියා ආරධනාකලසේක. ආනන්දය, තථාගත යන් වහන්සේට යාච්ඤානොකරව, තථාගතයන් වහන්සේට යාච්ඤා කිරීමට දැන් මේ කල්නොවන්නේයයි වදාලසේක.

45. ආනන්දය මම එක්තරා කාලයෙක්හි මේ වෙසාලීනම් පුරප්‍රව රයෙහිවූ උදෙන නම් චෛත්‍යයෙහි වාසය කරමි.

ත්‍යාහං ආනන්ද ආමන්තෙසිං රමනියා ආනන්ද වෙසාලි,රමනියං උදෙනං චෙතියං,යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාද...පෙ ...තස්මාතිහා නන්ද තුය්හෙ වෙතං දුක්කතං තුය්හෙ වෙතං අපරද්ධං.

46. එකමිදාහං ආනන්ද සමයං ඉධෙව වෙසාලියං විහරාමි ගොතමකෙ චෙතියෙ ...පෙ...ඉධෙව වෙසාලියං විහාරාමි සත්තම්බචෙතියෙ,ඉධෙව වෙසාලියං විහාරාමි බහුපුත්තෙ චෙතියෙ ඉධෙව වෙසාලියං විහාරාමි සාරන්දදෙ චෙතියෙ.

47. ඉදානෙව. ඛොතාහං ආනන්ද අජ්ජ චාපාලෙ චෙතියෙ,අමන්තෙසිං.රමනීයා ආනන්ද වේසාලි,යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා.
බහුලිකතා යානිකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා සො ආකඞ්ඛමානො කප්පං වා තිඨෙය්‍ය කප්පාවසෙසංවා. තථාගතස්සඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා.

---

එතැන්හිදු ආනන්දය මම තොපට ආමන්ත්‍රණය කෙළෙම්. ආනන්දය මේ වෙසාලිනම් පුර ප්‍රවරය තෙම සිත්කලුවන්නේය. ආනන්දය යම්කිසි කෙනෙකුන්ගේ=පෙ-ආනන්දය එහෙයින් මේකාරණය තොපිම නපුරුකොට කරණ ලද්දේය. තොපිම මේකාරණය වරදවනලද්දේය.

46. ආනන්දය මම මේ එක්තරා කාලයෙක්හි මේ වෙසාලි නම් පුරප්‍රවරයෙහිවූ ගොතමකනම් චෛත්‍යයෙහි—පෙ—මේ වෙසාලි නම් පුරප්‍රවරයෙහිවූ සත්තම්බක නම් චෛත්‍යයෙහි වාසය කෙරෙමි මේ වෙසාලිනම් පුර ප්‍රවරාසන්නයෙහිවූ බහුපුත්තනම් චෛත්‍යයෙහි වාසයකෙරෙමි.මෙ වෙසාලිනම් පුර ප්‍රවරාසන්නයෙහිවූ සාරන්දද නම් චෛත්‍යයෙහි වාසය කෙරෙමි

47. දැන් වනාහි ආනන්දය අද මම මේ චාපාලනම් චෛත්‍යයෙහිදි තොපට ආමන්ත්‍රණය කෙළෙම්.ආනන්දය මේ වෙසාලී නම් පුරප්‍රවරය තෙම සිත්කළු වන්නේය-පෙ-ආනන්දය යම් කිසි කෙනෙකුන් විසින් චතුර්විධ සෘද්ධි පාද ධර්මයෝ වඩනාලද්දාහු වෙද්ද.

බහුලීකතා යානිකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. ආකංඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වාති. එවම්පි ඛො ත්වං ආනන්ද තථාගතෙන ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං න තථාගතං යාචි තිට්ඨතු භගවා කප්පං තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

---

බහුලී කෘතවත්තාහු වෙද්ද, යුක්ත ස්ථානයක් මෙන් කරණලද්දාහු වෙද්ද, ගෘහවස්තුවක් මෙන් කරණලද්දාහු වෙත්ද, මනාකොට පිහිටා සිටිනලද්දාහු වෙත්ද, සහපත්කොට වඩනලද්දාහු වෙත්ද, මනාකොට පටන්ගන්නා ලද්දාහුද, ඒ චතුර්විධ ඍද්ධිපාද ධර්මයන් වඩනලද පුද්ගලතෙම ඉදින් කැමතිවූයේ නම් කල්පයක් හෝ කල්පාවශේෂයක් හෝ ජීවත්ව සිටින්නේයයි කියා වදාළසේක. ආනන්දය තථාගතයන් වහන්සේවිසින් චතුර්විධ ඍද්ධිපාදයෝ වඩනලද්දාහුය නැවත නැවත පුරුදුකරණ ලද්දාහුය. යුක්තස්ථානයක් මෙන් කරණ ලද්දාහුය. ගෘහවස්තුවක් මෙන් කරණ ලද්දාහුය. මනාකොට පිහිටා සිටින ලද්දාහුය. මනාකොට වඩනා ලද්දාහුය. සහපත්ව පටන්ගන්නා ලද්දාහුය. ආනන්දය ඒ තථාගතතෙම ඉදින් කැමති සේක් වී නම් කල්පයක්හෝ කල්පාවශේෂයක් ජීවත්ව වැඩසිටින්නේයයි වදාළසේක. ආනන්දය තෝ තථාගතයන් වහන්සේවිසින් මෙබඳුවූ ඖදාරික නිමිත්තයන් කරවදාරණ කල්හිද ඖදාරිකවූ ඕභාසයන් කරවදාරණ කල්හිද ප්‍රතිවේධ කිරීමෙන් දැනගන්ට නොහැකිවූයේය. භාග්‍යවතුන් වහන්සේ බොහෝ ජනයාට හිත සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දිව්‍ය මනුෂ්‍යයන්ගේ සමෘද්ධි සංසිද්ධිය පිණිස හා හිතසැප පිණිස කල්පයක් මුලුල්ලෙහි ජීවත්ව වැඩ සිටින සේක්වයි කියාද සුගතනාමතෙම කල්පයක් මුලුල්ලෙහි ජීවත්ව සිටින සේක්වයි කියාද තථාගතයන් වහන්සේට යාච්ඤා නොකළෙහිය.

සචෙ ත්වං ආනන්ද තථාගතං යාචෙය්‍යාසි ද්වෙව තෙ වාචා තථාගතො පටික්ඛිපෙය්‍ය අථ තතියකං අධිවාසෙය්‍ය. තස්මාතිහ ආනන්ද තුය්හෙවෙතං දුක්කතං තුය්හෙවෙතං අපරද්ධං.

48. නනු එවං ආනන්ද මයා පටිගච්චෙව අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො තං කුතෙත්ථ ආනන්ද ලබ්භා යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මාපලුජ්ජීති නෙතං ඨානං විජ්ජති යං ඛො පනෙතං ආනන්ද තථාගතෙන චත්තං වන්තං මුත්තං පහීණං පටිනිස්සට්ඨං ඔස්සට්ඨො ආයුසංඛාරො එකංසෙන වාචා තථාගතෙන භාසිතා නචිරං තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතීති තං වචනං.

---

ඉදින් ආනන්දය තෝ තථාගතයන් වහන්සේට යාච්ඤාකළෙහි නම් තොපගේ වචනය දෙවරක්ම තථාගතතෙම ප්‍රතික්ෂෙප කරන්නේය. ඉක්බිති තුන්වෙනි යාච්ඤාව ඉවසන්නේය. ආනන්දය එහෙයින් මේ කාරණය තොපිම නපුරුකොට කරණලද්දේය. තොපිම මේ කාරණය වරදවන ලද්දේයයි කියා වදාළසේක.

48. ආනන්දය මා විසින් සියලුම ප්‍රියමනාප වස්තුවෙන් වෙන්වීම් වශයෙන් අන්‍යථාභාවයට පැමිණ නානා ස්වභාවඇති වනබව මීට ප්‍රථමයෙන්ම කියන ලද්දේනොවේද, ඒ කාරණය මෙතැන්හි දූන් කොයින්ලබමෝද, ජාතභූතසංඛතාදිවූ යම් පලුජ්ජන ධර්මයෙකෙක් ඇද්ද,ඒ නට මනාවස්තුව එකාන්තයෙන් විනාශ නොවෙයි නොනසී වයි යන යමක් ඇද්ද මේ කාරණය විද්‍යමාන නොවන්නේය. ආනන්දය තථාගතයන් වහන්සේ විසින් ආයුසංස්කාරයතෙම හරනලද්දේය. තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නොබෝ කලකින්මවන්නේය. මෙයින් තුන්මාසයක්හුගේ ඇවෑමෙන් තථාගතතෙම පිරිණිවන් පාන්නේයයි කියා තථාගතයන් වහන්සේ විසින් එකාන්ත වශයෙන් නියමකොට වදාරණලද්දේය. එසේ නියමකොට වදාරණලද ඒ වචනය තථාගතයන් වහන්සේවිසින්ත්‍යාගය වමිනයම්දීමයප්‍රහීණය යනාදි වශයෙන් එකාන්තයෙන් නියමකොට වදාරණලද එම වචනය.

තථාගතො ජීවිත හෙතුපි පුනපච්චාගමිස්සතීති නෙතං ඨානං විජ්ජති. ආයාමානන්ද යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසංකමිස්සාමාති. එවංභන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

49. අථ ඛො භගවා ආයස්මතා ආනන්දෙන සද්ධිං යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසංකමි. උපසංකමිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ගච්ඡ ත්වං ආනන්ද යාවතිකා භික්ඛූ වෙසාලිං උපනිස්සාය විහරන්ති තෙ සබ්බෙ උපට්ඨාන සාලායං සන්නිපාතෙහීති.—පෙ—යස්සදානි භන්තෙ භගවා කාලංමඤ්ඤතීති

50. අථ ඛො භගවා යෙන උපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා, පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

---

තථාගතතෙම ජීවිතයරක්නා පිණිසද නැවත යමක්හු විසින් නිරුලයව මවිතාහාරයක් සාලයව නැවත අනුභව කරන්නාක් මෙන් ඒ වදාළ ඒකාන්තවචනය නැවත අනිත්‍යතකිරීමය යන යමක් ඇද්ද මේ කාරණය වනාහි විද්‍යමාන නොවන්නේය. ආනන්දය එව යම්හ. මහා වනයෙහි කූටාගාර ශාලාව යම් තැනෙක්හිද එතනට එළඹෙම්හයි වදාළසේක. එසේය ස්වාමින් වහන්සැයි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නේය.

49. ඉක්බිත්තෙන් භාග්‍යවත් බුදුරජතෙම ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ හා සමග මහාවනයෙහි කූටාගාරශාලාව යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ආමන්ත්‍රණයකර වදාළසේක. ආනන්දය තෝ යව ගොස් යම් පමණ භික්ෂූහු විසාලාමහ නුවර නිසා වාසයකරන්නාහු වෙද්ද, ඒ සියලු භික්ෂූහුම උපස්ථාන ශාලාවට රැස්කරවයි වදාළසේක.—පෙ—සෙස්ස පළමුවෙන් විස්තරකටයුතු. දැන් භාග්‍යවතුන්වහන්සේ යමක් සම්බන්ධව කල්යයි දන්නාසේක්නම් එය කරනුමැනවයි සැලකළේය.

50. ඉක්බිත්තෙන් භාග්‍යවත් බුදුරජතෙම උපස්ථානශාලාව යම් තැනෙක්හිද එතනට එළඹිසේක. එළඹ පණවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩඋන්සේක.

නිසජ්ජබො භගවා භික්ඛූ ආමන්තෙසි. තස්මාතිහ භික්ඛවෙ යෙ වො මයා ධම්මා අභිඤ්ඤාය දෙසිතා තෙ වො සාධුකං උග්ගහෙත්වා ආසෙවිතබ්බා භාවෙතබ්බා බහුලීකාතබ්බා යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතායසුඛාය දෙවමනුස්සානං. කතමෙච තෙ භික්ඛවෙ ධම්මා මයා අභිඤ්ඤාතා දෙසිතා යෙ වො සාධුකං උග්ගහෙත්වා ආසෙවිතබ්බා භාවෙතබ්බා බහුලීකාතබ්බා යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛායදෙවමනුස්සානං, සෙය්‍යථිදං චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්තබොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

---

වැඩහිඳ භාග්‍යවත්තෙම භික්ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළ සේක. මහණෙනි, තොපට මාවිසින් යම් ධර්මකෙනෙක් දැනිමෙන් දෙශනාකරණලද්දාහු වෙද්ද, එහෙයින් තොප විසින් ඒ ධර්මයෝ මනාකොට ඉගෙණගෙණ සෙවනය කටයුත්තාහුය. වඩිනාද කටයුත්තෝය. බාහුල්‍ය කටයුත්තෝය. යම්සේ මේ ශික්ෂාත්‍රය සඞ්ගෘහිතවූ සකලශාසනමාගී බ්‍රහ්මචය්‍යාව අඩනිසව වේද බොහෝ කලක් පැවතීම් වශයෙන් චිරස්ථායී වේද බොහෝ ජනයාට හිතපිණිසද බොහෝ ජනයාට සැපපිණිසද ලොවට අනුකම්පාපිණිසද දිව්‍ය මනුෂ්‍යයන්ට වැඩපිණිසද හිතසැපපිණිසද ඒ ධර්මය වන්නේය. මහණෙනි, මාවිසින් දැනිමෙන් දෙශනාකරණලද්දාවූ ඒ ධර්මයෝ කවරහුද; යම් ධර්මකෙනෙක් මනාකොට ඉගෙණගෙණ සේවනය කට යුතුවූ වැඩියක් භජනය කටයුතුවූ නැවත නැවත පුහුණුකිරීම් වශයෙන්ද බාහුල්‍යකටයුතුවූ යම්සේ මේ ශාසනමාගී බ්‍රහ්මචය්‍යාව අඩානෂ්ඨමවීමෙන් සමෘද්ධභාවයට පැමිණෙන්නාවූ චිරස්ථායීව පවත්නාවූ බොහෝ ජනයාට සැපපිණිස පවත්නාවූ දිව්‍යමනුෂ්‍යයන්ට උභය ලොකාභිසිද්ධියට හා කායික චෛතසිකාදී හිතසැපපිණිස පවත්නේද තොපි විසින් සාදරව භාවිතාකටයුතුවූ ඒ ධර්මයෝනම් කවරහුද; සතරසතිපට්ඨාන ධර්මයෝය, සතරසම්‍යක්ප්‍රධාන ධර්මයෝය, චතුර්විධ ඍද්ධිපාද ධර්මයෝය, පඤ්චෙන්ද්‍රිය ධර්මයෝය, පඤ්චබලයෝය, සප්ත බොධ්‍යඞ්ග ධර්මයෝය, ආය්‍යීඅෂ්ටාඞ්ගිකමාගී ධර්මයෝය.

ඉමෙ ඛො භික්ඛවෙ ධම්මා මයා අභිඤ්ඤාය දෙසිතා, තෙ වො සාධුකං උග්ගහෙත්වා අසෙවිතබ්බා භාවෙතබ්බා බහුලීකාතබ්බා යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

51. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො. වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ න චිරං තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතීති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

---

යන මේ යථොක්ත ධර්‍මයෝ මාවිසින් ස්වයම්භූඥානයෙන් දැන මනා කොට දෙශනාකරණලද්දාහුය. මහණෙනි, ඒ සතරසතිපට්ඨානාදී ධර්‍මයෝ තොප විසින් මනාකොට ඉගෙණගෙණ සෙවනය කටයුත්තාහුය. වඩිනාය කටයුත්තෝය. බහුලකටයුත්තෝය. යම්සේ මේ ශාසනමාර්‍ගී බ්‍රහ්මචර්‍ය්‍යව අධ්වානක්‍ෂමවන්නේ වේද; චිරස්ථායීව සිටින්නේ වේද බොහෝජනයාට හිතපිණිසද බොහෝජනයාට සැපපිණිසද ලොවට අනුකම්පාපිණිසද දිව්‍යමනුෂ්‍යයන්ට වැඩපිණිසද හිතසැපපිණිසද ඒ යථොක්තවූ ධර්‍මය වන්නේයයි වදාළසේක.

51. ඉක්බිත්තෙන් භාග්‍යවත්තෙම භික්‍ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක. දැන් වනාහි මහණෙනි, තොපට ආමන්ත්‍රණයකරමි. සියලු සංස්කාර ධර්‍මයෝ නස්නාසුලුය. අප්‍රමාදවීමෙන් ශ්‍රමණධර්‍මය සම්පාදනය කරව්. තථාගතයන්වහන්සේගේ පරිනිර්‍වාණය නොබෝ කලකින්ම වන්නේය. මෙයින් තුන්මාසයක්හුගේ ඇවෑමෙන් තථාගතතෙම පිරිනිවන්පාණාසේකැයි වදාළසේක. භාග්‍යවතුන්වහන්සේ මේ වචනය වදාළසේක. මේ වචනය මෙසේ වදාරා ශොභනගතිඇති හෙයින් ශාස්තෘවූ බුදුරජතෙම එයින් මත්තෙහි මේ මතුකියන ගාථා ත්‍රයෙන් මෙසේ වදාළසේක.

පරිපක්කො වයො මය්හං පරිත්තං මම ජීවිතං,
පහාය වො ගමිස්සාමි කතමෙම සරණමත්තනො.
අප්පමත්තා සතීමන්තො සුසීලා හොථ භික්ඛවො,
සුසමාහිත සංකප්පා සචිත්ත මනුරක්ඛථ.

යො ඉමස්මිං ධම්මවිනයෙ
අප්පමත්තො විහෙස්සති,
පහාය ජාතිසංසාරං
දුක්ඛස්සන්තං කරිස්සතීති.

**තතියකභාණවාරං නිට්ඨිතං.**

---

මාගේ වයසමුහුකුරායාමට පැමිණියේය. මාගේ ජීවත්වීම ස්වල්ප මාත්‍රකාලයක්ම වන්නේය. මාවිසින් තමාටපිහිටකරණ ලද්දේය. මහණෙනි, තොප හැර තොපකෙරෙන් වෙන්ව නිවන්පුර යෙමි කියා වදාළසේක

මහණෙනි, යහපත් සිහියෙන් යුක්තව අප්‍රමාදීව සුසීලවන්නාහු වෙව්. මනාකොට සංසිඳුනාවූ චිත්තසංකල්පනා ඇතිව තමතමන්ගේ ස්වකීය චිත්තය සුරක්ෂිතව මනාකොට රක්ෂාකරව් කියා වදාළසේක.

යම්පුද්ගලයෙක්තෙම මාගේ මේ ධර්මවිනය දෙක්හි අප්‍රමාදව වාසයකරන්නේද ජාතියයි කියනලද භවොත්පත්තිය නොහොත් සසරහැසිරීමද හැර සංසාරදුඃඛයාගේ කෙළවරකරන්නේයයි කියා වදාළසේක.

**මෙතෙකින් තුන්වෙනි බණවර කියා**

**නිමවනලදි.**

**4.** 1. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර මාදාය වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නාගාපලොකිතං වෙසාලිං අපලොකෙත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉදං පච්ඡිමකං ආනන්ද තථාගතස්ස වෙසාලිදස්සනං භවිස්සති. ආයාමානන්ද යෙන භණ්ඩගාමො තෙනුපසඞ්කමිස්සාමාති එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන භණ්ඩගාමො තදවසරි තත්‍ර සුදං භගවා භණ්ඩගාමෙ විහරති.

2. තත්‍රඛො භගවා භික්ඛූ ආමන්තෙසි. චතුණ්ණං භික්ඛවෙ ධම්මානං අනනුබොධාඅප්පටිවෙධාඑවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච.

---

**4.** 1. ඉක්බිත්තෙන් භාග්‍යවත්තෙම පෙරවරුකාලයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙණ විසාලාමහනුවරට පිඬුපිණිස ප්‍රවිෂ්ටවූසේක. වෙසාලීනම් පුරප්‍රවරයෙහි පිඬුපිණිස හැසිර පිණ්ඩපාතයෙන් වැළක හස්තිනාගයෙක්හු මෙන් සකලශරීරයෙන් පරිවර්තිතයව් මෙන් වෙසාලිනම් පුරප්‍රවරය නිරීක්‍ෂණයකර වදාරා ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්වහන්සේට ආමන්ත්‍රණයකර වදාළසේක ආනන්දය,තථාගතයන්වහන්සේගේ මේ වෙසාලිනම් පුරප්‍රවරයාගේ පශ්චිමදර්ශනය නම් වන්නේයයි කියා වදාළසේක. ආනන්දය, එව. යමහ. භණ්ඩනම් ග්‍රාමය යම්තැනෙක්හිද එතනට එලඹෙම්හයි කියා වදාළසේක. එසේය, පින්වතුන්වහන්සැයි කියා ආයුස්මත්වූ ආනන්දස්ථවිර තෙම භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචන දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවත්තෙම මහත්වූ භික්‍ෂුසඞ්ඝයාසමග භණ්ඩනම් ග්‍රාමය යම් තැනෙක්හිද එතනට පැමිණ වදාළසේක. එතැන්හි භාග්‍යවත්තෙම භණ්ඩනම් ග්‍රාමයෙහි වැඩවාසයකර වදාරණසේක.

2. එකල්හි භාග්‍යවත් බුදුරජතෙම භික්‍ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක. මහණෙනි චතුර්විධ ධර්‍ම කෙනෙකුන්ගේ අවබොධ නොකිරීම හෙතුකොට ගෙණ ප්‍රතිවෙධ නොකිරීමෙන් මෙසේ මේ දීර්ඝකාලයක් මාගේද තොපගේද භවයෙන් භවයට යාම් වශයෙන් සන්ධාවනය කිරීමද සසර හැසිරීමදවූයේය.

කතමෙසං චතුන්නං. අරියස්ස භික්ඛවෙ සීලස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. අරියස්ස භික්ඛවෙ සමාධිස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. අරියාය භික්ඛවෙ පඤ්ඤාය ...පෙ... අරියාය භික්ඛවෙ විමුත්තියා ...පෙ... තයිදං භික්ඛවෙ අරියං සීලං අනුබුද්ධං පටිවිද්ධං, අරියො සමාධි අනුබුද්ධො පටිවිද්ධො. අරියා පඤ්ඤා අනුබුද්ධා පටිවිද්ධා. අරියා විමුත්ති අනුබුද්ධා පටිවිද්ධා උච්ඡින්නා භවතණ්හා ඛීණා භවනෙත්ති නත්ථිදානි පුනබ්භවොති.

3. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

---

කවරනම් චතුර්විධ ධර්මකෙනෙකුන්ගේදැයත්, මහණෙනි, ආර්‍ය්‍යශීලයාගේ අවබොධනොකිරීමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන්මෙසේ මේ දීර්‍ඝ කාලයක් මාගේද තොපගේද සසරදිවීමද හැසිරීමදවූයේය. මහණෙනි, ආර්‍ය්‍යසමාධියගේ. අවබොධය හා ප්‍රතිවෙධය නොකිරීමෙන් මෙසේ මේ දිර්‍ඝකාලයක් මාගේද තොපගේද සසරදිවීමද හැසිරීමද වූයේය.. මහණෙනි, ආර්‍ය්‍යප්‍රඥාවගේ. ප්‍රථමවාරයෙහිමෙනි. මහණෙනි, ආර්‍ය්‍යවිමුක්තියගේ ප්‍රථමවාරයෙහිමෙන් දතයුතු, මහණෙනි, ඒ මේ ආර්‍ය්‍යශීලය අවබොධකෙළෙමි. ප්‍රතිවෙධ කෙළෙමි. ආර්‍ය්‍යසමාධි ධර්මය අවබොධ කිරීම් වශයෙන් ප්‍රතිවෙධ කෙළෙමි. ආර්‍ය්‍ය ප්‍රඥතොම අවබොධ කරණ ලද්දීය. ප්‍රතිවෙධ කරණ ලද්දීය. ආර්‍ය්‍ය විමුක්ති තොම අවබොධ කිරීම් වශයෙන් ප්‍රතිවෙධ කෙළෙමි. භවතෘෂ්ණා තොම මූලච්ඡින්න වශයෙන් ඡේද්‍යය කෙළෙමි. සර්‍වශා භවයෙන් භවයට පමුණුවන්නාවූ භවගාමික කර්මයක්ෂයවූයේය. දැන් පුනර්භවයක් හෙවත් නැවත භවොත්පත්තියක් නැත්තේයයි කියා වදාළසේක.

3. භාග්‍යවතුන්වහන්සේ මෙසේ මේ ධර්මය වදාළසේක. මෙසේ වදාරා ශොභනගති ඇති හෙයින් සුගතනම්වූ ශාස්තෘන්වහන්සේ එයින් මත්තෙහි මේ මතුකියනා ගාථාවයෙන් මෙසේ වදාළසේක.

සීලං සමාධි පඤ්ඤාච විමුත්තිච අනුත්තරා
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා
ඉති බුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං
දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතොති.

4. තත්‍රපිසුදං භගවා භණ්ඩගාමෙ විහරන්තො එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති ඉතිසීලං ඉතිසමාධි ඉතිපඤ්ඤා සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති සෙය්‍යථීදං, කාමාසවා භවාසවා, දිට්ඨාසවා අවිජ්ජාසවාති.

5. අථඛො භගවා භණ්ඩගාමෙ යථාභිරන්තංවිහරිත්වාආයස්මන්තං ආනන්දං ආමන්තෙසි.

---

ආර්‍ය්‍ය ශීලයද සමාධියද ආර්‍ය්‍ය ප්‍රඥාවද නිරුත්තරවූආර්‍ය්‍ය විමුක්තිධර්මයද යනමේ චතුර්විධධර්මයෝයසශ්‍රීඇත්තාවූ ගෞතම ගොත්‍රෝද්භූත භාග්‍යවතුන්වහන්සේ විසින් අවබොධකරණලද්දාහුය. සර්වඥතෙම මෙසේ ස්වයම්භූඥානයෙන් දැන භික්ෂූන්ට ධර්මය දෙශනාකර වදාළසේක. සසරදුක් කෙළවර කළාවූ පසැස් ඇත්තාවූ දෙවිමිනිසුන්ට අනුශාසනාකරණ හෙයින් ශාස්තෘනම්වූ බුදුරජතෙම ක්ලෙශ පරිනිර්වාණය කරවදාළසේක.

4. එකල්හිද භාග්‍යවතුන්වහන්සේ භණ්ඩනම් ග්‍රාමයෙහි වැඩ වාසයකරණසේක් බාහුල්‍ය වශයෙන් මේ ධර්ම කථාවම කරණසේක. කෙසේද මේ සීලයයි. මේ සමාධියයි. මේ ප්‍රඥාවයි, සීලයෙහි පිහිටා වඩනලද සමාධිය මහත් ඵල ඇත්තේය. මහත් අනුසස් ඇත්තේය. සමාධියෙහි පිහිටා වඩනලද ප්‍රඥාව මහත් ඵල ඇත්තීය. මහත් අනුසස්ද ඇත්තීය. ප්‍රඥාවෙහි පිහිටා වඩනලද සිත මනාකොට ආශ්‍රවයන් කෙරෙන් ඒනම්, කාමාශ්‍රවය, භවාශ්‍රවය, දෘෂ්ටිආශ්‍රවය අවිද්‍යාශ්‍රවය යනමොවුන් කෙරෙන් මිදේ.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භණ්ඩනම් ග්‍රාමයෙහි යම්සේ අභිප්‍රාය කාලයක්වාසයකොට ආයුෂ්මත්වූආනන්දස්ථවිරයන් වහන්සේට ආමන්ත්‍රණයකර වදාළසේක.

ආයාමානන්ද යෙන හත්ථිගාමො ...පෙ... යෙන අම්බගාමො යෙන ජම්බුගාමො යෙන භොගනගරං තෙනුපසඞ්කමිස්සාමාති.

6. එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසංඝෙන සද්ධිං යෙන භොගනගරං තද වසරි.

7. තත්‍රසුදං භගවා භොගනගරෙ විහරති ආනන්දචෙතියෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. චත්තාරො මෙ භික්ඛවෙ මහාපදෙසෙ දෙසිස්සාමි තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවම් භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතද වොච.

ආනන්දය, එව. යමහ. හස්තිනම් ග්‍රාමය යම්තැනෙක්හිද, අම්බනම් ග්‍රාමය යම් තැනෙක්හිද, ජම්බුනම් ග්‍රාමය යම්තැනෙක්හිද, භොග නම්නුවර යම්තැනෙක්හිද එතැනට එලඹෙම්හයි වදාළසේක.

6. එසේය ස්වාමීන්වහන්සැයි කියා ආයුෂ්මත්වූ ආනන්දස්ථවිර තෙම භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචන දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මහත්වූ භික්ෂුසඞ්ඝයා සමග භොග නුවර යම්තැනෙක්හිද එතනට එලඹිසේක.

7. එතැන්හිද භාග්‍යවතුන්වහන්සේ භොගනම් පුරප්‍රවරයෙහි ආනන්දනම් චෛත්‍යයෙහි වැඩවාසයකරවදාරණසේක. එකල්හිද භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක. මහණෙනි, මේ චතුර්විධවූ මහා ප්‍රදෙශ ධර්මයන් දෙශනාකරන්නෙමි. ඒ මහාප්‍රදෙශ ධර්මය මනාකොට අසව්. යහපත්ව සිත්හිකරව්. දෙශනා කරන්නෙම්යි වදාළසේක. එසේය ස්වාමීන්වහන්සැයි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචන දුන්නාහුය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

8. ඉධ භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය, සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනන්ති. තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානිපදව්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානිචෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි නචෙව සුත්තෙ ඔතරන්ති න විනයෙ සන්දිස්සන්ති. නිට්ඨමෙත්ථ ගන්තබ්බං අද්ධා ඉදං නචෙව තස්ස භගවතො වචනං ඉමස්සච භික්ඛුනො දුග්ගහිතන්ති. ඉති'හිමං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ. තානි සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙචෙව ඔතරන්ති.

---

8. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේද, ඇවැත්නි, මාවිසින් මේ වදාළ පාලිධර්‍මයයි කියාද, මේ විනයප්‍රඥප්තියයි කියාද, මේශාස්තෘන්වහන්සේගේ අවවාදානුශාසනාවයයි කියාද, භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රී සම්මුඛයෙන් අසනලද්දෙමි, භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීසම්මුඛයෙන්ම ප්‍රතිග්‍රහණයකරණ ලද්දෙමි, හෙවත් පිළිගන්නාලද්දෙමි කියායි. මහණෙනි, මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට තුටුපහටු සිතින් සාධුකාරදී ප්‍රථමයෙන්ම සතුටුනොවිය යුත්තේය. මේ අඥනතෙම කුමක් කියන්නේදැයි ආක්‍රොශ වශයෙන් පළමුකොටම ප්‍රතික්‍ෂෙපද නොකටයුත්තේය, සතුටුත් නොව ප්‍රතික්‍ෂෙපත් නොකොට ඒ පද සඞ්ඛ්‍යාතවූ ව්‍යඤ්ජනයන් මනාකොට ඉගෙණගෙණ ත්‍රිපිටක බුද්ධවචනයෙහි බහාලියයුත්තේය. විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය කටයුත්තේය. ඉදින් ඒ වචනයන් සූත්‍රයෙහි අවතරණය කරන්නේ විනය ප්‍රඥප්තිය හා සංසන්දනය කරන්නේ ඉදින් සූත්‍රයෙහි අවතරණය නොවන්නේ වේද, විනය ප්‍රඥප්තිය හා සංසන්දනය නොවන්නේ වේද, එකාන්තයෙන් මේ වචනය ඒ භාග්‍යවතුන්වහන්සේගේ වචනයක් නොවේයයි මෙ වචනයෙහි නිශ්චයට යායුත්තේය. මේ මහණහුගේ මේ වචනය නපුරුකොට ග්‍රහණයකරණ ලද්දේය කියායි. මහණෙනි, මෙසේ පවිටුවූ මේ නපුරු ග්‍රහණය දුරුකටයුත්තේයයි වදාළසේක. සූත්‍රයෙහි බහාලීම් වශයෙන් අවතරණයකරණලද්දේ විනයප්‍රඥප්තිය හා සංසන්දනායකරණලද්දේ ඒ වචන සූත්‍රනම්ලද ත්‍රිපිටක බුද්ධවචනයෙහි අවතරණය වන්නාහු වෙද්ද.

විනයෙච සන්දිස්සන්ති නිට්ඨමෙත්ථ ගන්තබ්බං. අද්ධා ඉදං තස්ස භගවතො වචනං ඉමස්සච භික්ඛුනො සුග්ගහිතන්ති. ඉමං භික්ඛවෙ පඨමං මහාපදෙසං ධාරෙය්‍යාථ.

9. ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය අමුකස්මිං නාම ආවාසෙ සඞ්ඝො විහරති සථෙරො සපාමොක්ඛො තස්ස මෙ සඞ්ඝස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං අයං විනයො ඉදං සත්ථුසාසනන්ති. තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං න පටික්කොසිතබ්බං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දෙස්සතබ්බානි.

---

විනය ප්‍රඥප්තියෙහි සංසන්දනයවීමෙන් සදෘශව දක්නාලද්දහු වෙද්ද, මේ වචනය ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන්වහන්සේගේ බුඩවචනයෙක්මය. මේ භික්ෂුහුගේ වචන ග්‍රහණයද මනාවූ යහපත් ග්‍රහණය කැයි කියා මෙවචනයෙහි නිෂ්ඨාවට යායුත්තේය. මහණෙනි, සද්ධර්ම ප්‍රතිෂ්ඨාපනාවකාශභූතවූ බුඩප්‍රදෙශනම්වූ මේ පළමුවෙනි මහාප්‍රදෙශ ධර්මයනම් වත්නේයයි කියාසිත්හි ලා දරාගණිත්වයි වදාළසේක.

9. මහණෙනි, මේ ශාසනයෙහි යම්කිසි භික්ෂුකෙනෙක් අසවල් නම් ආවාසයෙහි ප්‍රධානත්වයට පැමිණි සථවිරයන් සහිතවූ භික්ෂුසඞ්ඝ තෙමේ වාසයකෙරෙයි. මා විසින් මේ වදාළ පාලිධර්මයයි කියාද පණවනලද මේ විනය ප්‍රඥප්තියයිකියාද මේ ශාස්තෲන්වහන්සේගේ අවවාදනුශාසනාවයයිකියාද ඒ සඞ්ඝයාවහන්සේගේ සම්මුඛයෙන්ම අසන ලද්දේය. භික්ෂුසඞ්ඝයාවහන්සේගේ සම්මුඛයෙන්ම පිළිගන්නා ලද්දේයයි මෙසේ කියන්නේවේද, මහණෙනි, මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට සතුටුනොවිය යුත්තේය. ප්‍රතික්ෂෙපද නොකට යුත්තේය. සතුටුත්නොව ප්‍රතික්ෂෙපත් නොකොට ඒ පදව්‍යඤ්ජනයන් මනාකොට ඉගෙණගෙණ ත්‍රිපිටක බුඩවචනයෙහි බහාලිය යුත්තේය. විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය කටයුත්තේය.

තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දිස්සියමානානි නචෙව සුත්තෙ ඔතරන්ති න විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං අද්ධා ඉදං නචෙව තස්ස භගවතො වචනං තස්සච සඞ්ඝස්ස දුග්ගහිතන්ති. ඉතිහෙතං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ. තානිචෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දිස්සියමානානි සුත්තෙචෙව ඔතරන්ති විනයෙච සන්දිස්සන්ති නිට්ඨමෙත්ථ ගන්තබ්බං අද්ධා ඉදං තස්ස භගවතො වචනං. තස්සච සඞ්ඝස්ස සුග්ගහිතන්ති. ඉදං භික්ඛවෙ දුතියං මහාපදෙසං ධාරෙය්‍යාථ.

10. ඉධපන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය. අමුකස්මිං නාම ආවාසෙ සම්බහුලා ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා.

---

ඉදින් ඒ වචනයන් සූත්‍රයෙහි අවතරණය කරන්නෝ විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය කරන්නෝ සූත්‍රයෙහි අවතරණය නොවන්නෝනම්. විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය නොවන්නෝනම් ඒකාන්තයෙන් මේ වචනය ඒ භාග්‍යවතුන්වහන්සේගේ වචනයක් නොවන්නේයයි කියාද ඒ සඞ්ඝයාගේද මේ වචනය නපුරුකොට ග්‍රහණයකරණ ලද්දේයයි කියාද මේ වචනයෙහි නිශ්ඨාවට යායුත්තේය. මහණෙනි, මෙසේ පවිටුවූ මේනපුරු ග්‍රහණය මේ බුඩවචනයෙකැයි කියා නොගෙණ දුරුකට යුත්තේයයි වදාළසේක. ඉදින් ඒ වචනයන් සූත්‍රයෙහි අවතරණය කරන්නෝ විනය ප්‍රඥප්තියෙහි සංසන්දනයකරන්නෝ ඒ වචන සූත්‍රයෙහි අවතරණයවන්නෝවෙත්ද විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය වන්නෝවෙත්ද ඒකාන්තයෙන් මේවචනය ඒ භාග්‍යවතුන්වහන්සේගේ වචනයක්මයයි කියාද ඒ සඞ්ඝයාගේද යහපත් වචන ග්‍රහණයකැයි කියා මේ වචනයෙහි නිශ්ඨාවට යායුත්තේය. මහණෙනි, මේ දෙවෙනි මහාප්‍රදෙශයනම් වන්නේයයිකියා සිත්හිලා දරාගණින්වායි වදාළසේක.

10. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේද අසවල් නම්වූ ආවාසයෙහි බහුශ්‍රැතවූ ආගම ප්‍රතිපත්‍යාදියෙහි මනාකොට පිළිපැදීම්වශයෙන් ආගතාගමවූ ධර්මධරවූ විනයධරවූ මාතෘකාධරවූ බොහෝවූ ස්ථවිර භික්ෂූහු වාසයකරන්නාහුය.

තෙසං මෙ ථෙරානං සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනන්ති. තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං න පටික්කොසිතබ්බං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදව්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි විනයෙ සන්දස්සෙතබ්බානි තානිචෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි නචෙව සුත්තෙ ඔතරන්ති න විනයෙ සන්දිස්සන්ති නිට්ඨමෙත්ථ ගන්තබ්බං අද්ධා ඉදං නචෙව තස්ස භගවතො වචනං තෙසඤ්ච ථෙරානං දුග්ගහිතන්ති. ඉතිහෙතං භික්ඛවෙ ජහෙය්‍යාථ තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙචෙව ඔතරන්ති.

---

මා විසින් මේ වදාළ පාළිධර්මයයි කියාද මේ විනය ප්‍රඥප්තියයි කියාද මේ ශාස්තෘන්වහන්සේගේ අවවාදානුශාසනාවයයි කියාද ඒ තෙරුන්වහන්සේලාගේ සම්මුඛයෙන් අසන ලද්දෙමි. ඒ තෙරුන්වහන්සේලාගේ සම්මුඛයෙන්ම පිළිගන්නා ලද්දෙමියි මෙසේ කියාද මහණෙනි, මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට සතුටුනොවියයුත්තේය. ප්‍රතික්ෂෙපද නොකටයුත්තේය. සතුටුත්නොව ප්‍රතික්ෂෙපත් නොකොට ඒ පදහා ව්‍යඤ්ජනයන් මනාකොට ඉගෙණගෙණ ත්‍රිපිටක බුද්ධවචනයෙහි බහාලිය යුක්තේය. විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය කටයුත්තේය. ඉදින් ඒ වචනයන් සූත්‍රයෙහි අවතරණය කරණකල්හිද විනය ප්‍රඥප්තියෙහි සංසන්දනයකරණකල්හිද ඉදින් සූත්‍රයෙහි අවතරණය නොවන්නේවේද විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය නොවන්නේවේද ඒකාන්තයෙන් මේ වචනය ඒ භාග්‍යවතුන්වහන්සේගේ වචනයක් නොවන්නේයයිකියා මේ වචනයෙහි නිෂ්ඨාවට යායුක්තේය. ඒ ස්ථවිරයන්වහන්සේලාගේ මේ වචනය නපුරුකොට ග්‍රහණය කරණලද්දේයයි කියා මහණෙනි, මේ කාරණයෙන් පමිටුවූ මේ නපුරු ග්‍රහණය බුද්ධවචනයකැයි කියා නොගෙණ දුරුකටයුක්තේය. ඉදින් ඒ වචනයන් සූත්‍රයෙහි බහාලීම්වශයෙන් අවතරණයකරණලද්දේ විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය කරණලද්දේ ඒ වචනයෝ ත්‍රිපිටක බුද්ධවචනයෙහි අවතරණය වන්නාහුවෙද්ද.

විනයෙච සන්දිස්සන්ති නිට්ඨමෙත්ථ ගන්තබ්බං අද්ධා ඉදං තස්ස භගවතො වචනං තෙසඤ්ච ථෙරානං සුග්ගහිතන්ති, ඉදං භික්ඛවෙ තතියං මහාපදෙසං ධාරෙය්‍යාථ.

11. ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය. අමුකස්මිං නාම ආවාසෙ එකො ථෙරෙ භික්ඛු විහරති බහුස්සුතො අගතාගමො ධම්මධරො විනයධරෙ මාතිකාධරෙ. තස්ස ථෙරස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනන්ති. තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදව්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි විනයෙ සන්දස්සෙතබ්බානි.

---

විනය ප්‍රඥප්තියෙහි සංසන්දනයවීමෙන් සදෘශව දක්නාලද්දහුවෙද්ද මේ වචනය ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන්වහන්සේගේ සුවිසුද්ධ බුද්ධ වචනයක්යයි කියා මෙහි නිශ්චයට යායුක්තේය. මහණෙනි, මේ තුන්වෙනි මහාප්‍රදේශ ධර්මයනම් වන්නේයයිකියා සිත්හිලා දරාගණ්න්වයි වදාළසේක.

11. මහණෙනි, මේ සර්වඥශාසනයෙහි යම්කිසි භික්ෂුකෙනෙක් අසවල් නම් ආවාසයෙහි බහුශ්‍රැතවූ අගතාගමවූ ධර්මධරවූ විනයධරවූ මාතෘකාධරවූ එක්තරා ස්ථවිර භික්ෂුනමක් වාසයකරන්නේය. මා විසින් මේ වදාළ පාලිධර්මයයි කියාද මේ විනයප්‍රඥප්තියයි කියාද මේ ශාස්තෘන්වහන්සේගේ අවවාදානුශාසනාවය කියාද ඒ තෙරුන්වහන්සේගේ සම්මුඛයෙන් අසනලද්දෙමි. ඒ තෙරුන්වහන්සේගේ සම්මුඛයෙන්ම පිළිගන්නාලද්දෙමිකියා මෙසේ කියන්නේවේද, මහණෙනි, මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට සතුටු නොවියයුක්තේය. එය ප්‍රතික්ෂෙපද නොකටයුත්තේය. සතුටුත්නොව ප්‍රතික්ෂෙපත් නොකොට ඒ පද ව්‍යඤ්ජනයන් මනාකොට ඉගෙණ ගෙණ ත්‍රිපිටක බුද්ධවචනයෙහි බහාලියයුත්තේය. විනයප්‍රඥප්තියෙහි සංසන්දනය කටයුත්තේය.

තානිචෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි නචෙව සුත්තෙ ඔතරන්ති න විනයෙ සන්දිස්සන්ති නිට්ඨමෙත්ථ ගන්තබ්බං අද්ධා ඉදං නචෙව තස්ස භගවතො වචනං තස්සච ථෙරස්ස දුග්ගහිතන්ති. ඉතිහෙතං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ. තානිචෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙචෙව ඔතරන්ති විනයෙච සන්දිස්සන්ති නිට්ඨමෙත්ථ ගන්තබ්බං. අද්ධා ඉදං තස්ස භගවතො වචනං තස්සච ථෙරස්ස සුග්ගහිතන්ති. ඉදං භික්ඛවෙ චතුත්ථං මහාපදෙසං ධාරෙය්‍යාථ. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො මහා පදෙසෙ ධාරෙය්‍යාථාති.

12. තත්‍රපි සුදං භගවා භොගනගරෙ විහරන්තො ආනන්දචෙතියෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති ඉතිසීලං ඉතිසමාධි.

---

ඉදින් ඒ වචනයන් සූත්‍රයෙහි අවතරණය කරණකල්හිද විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය කරණකල්හිද ඉදින් සූත්‍රයෙහි අවතරණය නොවේද්ද, විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය නොවේද්ද, ඒකාන්තයෙන් මේ වචනය ඒ භාග්‍යවතුන්වහන්සේගේ වචනයක් නොවන්නේයයිකියා මේ වචනයෙහි නිෂ්ඨාවට යායුත්තේය. ඒ ස්ථවිරයන්වහන්සේගේ මේ වචනය නපුරුකොට ග්‍රහණය කරණලද්දේයයිකියා මහණෙනි, මේ කාරණයෙන් පවිටුවූ මේනපුරු ග්‍රහණය මේ බුධ වචනයෙකැයි කියානොගෙණ දුරුකටයුත්තේය. ඉදින් ඒ වචනයෝ සූත්‍රයෙහි අවතරණය කරණලද්දෝ විනය ප්‍රඥප්තියෙහි සංසන්දනයකරණලද්දෝ ඒ වචනයෝ ත්‍රිපිටක බුධවචනයෙහි අවතරණය වන්නාහුවේද්ද, විනය ප්‍රඥප්තියෙහි සංසන්දනය විමෙන් සදෘශව දක්නාලද්දාහුවේද්ද මේ වචනය ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන්වහන්සේගේ සුවිශුධවූ බුධ වචනයක්මයයි කියාද ඒ තෙරුන්වහන්සේගේ මනාවූ යහපත් ග්‍රහණයකැයි කියාද මේ වචනයෙහි නිෂ්ඨාවට යායුත්තේය. මහණෙනි, ධර්‍මයාගේ ප්‍රතිෂ්ඨාපන ස්ථානයයි කියනලද මේ සතරවෙනිවූ මහාප්‍රදෙශධර්‍මය මෙසේ සිත්හිලා දරාගණිව්. මහණෙනි, මේ දක්වනලද්දේ චතුර්විධ මහා ප්‍රදෙශ ධර්‍මයයි දරාගණිව්යයි වදාළෝ.

12. එතැන්හිද භාග්‍යවතුන්වහන්සේ භොගනම්පුරප්‍රවරයෙහි ආනන්දනම් චෛත්‍යයෙහි වැඩවාසයකරවදාරණසේක් භික්‍ෂූන්ට බාහුල්‍යවශයෙන් නොහොත් බොහෝසේම මේ ධර්‍මාන්විතවූ කථාවම කරවදාරණසේක. කෙසේද, මේ ශීලයයි, මේ සමාධියයි.

ඉතිපඤ්ඤා සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථිදං කාමාසවා භවාසවා දිට්ඨාසවා අවිජ්ජාසවාති.

13. අථඛො භගවා භොගනගරෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ආයාමානන්ද යෙන පාවා තෙනුපසංකමිස්සාමාති. එවංභන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන පාවා තදවසරි. තත්‍රසුදං භගවා පාවායං විහරති චුන්දස්ස කම්මාරපුත්තස්ස අම්බවනෙ.

---

මේ ප්‍රඥාවයි,ශිලයෙහි පිහිටා වඩනලද සමාධිය මහන්ඵල ඇත්තේය. මහත් අනුසස්ද ඇත්තේය. සමාධියෙහි පිහිටාවඩනලද ප්‍රඥතොමෝ මහත්ඵල ඇත්තිය. මහත් අනුසස්ද ඇත්තිය. ප්‍රඥවෙහි පිහිටා වඩනලද සිතමනාකොටම ආශ්‍රවයන්කෙරෙන්. ඒනම් කාමාශ්‍රවය භවාශ්‍රවය දෘෂ්ටිආශ්‍රවය අවිද්‍යාශ්‍රවය මොවුන්කෙරෙන් මිදේය කියායි.

13. ඉක්බින්තෙන් භාග්‍යවන්තෙම භොගනම් පුරප්‍රවරයෙහි යම්සේ අභිප්‍රා කාලයක් වාසයකොට ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්වහන්සේට අඬගාවදාළසේක. ආනන්දය එව යම්හ. පාවානම් නුවර යම්තැනෙක්හිද එතනට එලඹෙම්හයි වදාළසේක. එසේය ස්වාමින්වහන්සැයිකියා ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ප්‍රතිවචන දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවත්තෙම මහත්වූ භික්‍ෂු සඞ්ඝයාවහන්සේ සමග පාවානම් නුවර යම්තැනෙක්හිද එතනට පැමිණිවදාළසේක. එතැන්හිද භාග්‍යවතුන්වහන්සේ පාවානම්පුරප්‍රවරසන්තයෙහි චුන්දනම් කර්මාර පුත්‍රයාගේ අඹවනඋයනෙහි වැඩවාසයකර වදාරණසේක.

14. අස්සොසිඛො චුන්දො කම්මාරපුත්තො භගවා කිරපාවං අනුප්පත්තො පාවායං විහරති මය්හං අම්බවනෙති. අථඛො චුන්දො කම්මාර පුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චුන්දං කම්මාර පුත්තං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි.

15. අථඛො චුන්දො කම්මාරපුත්තො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවන්තං එතදවොච.

---

14. ඒ චුන්ද නම් කම්මාර පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේ පාවා නුවරට වැඩිසේක් පාවා නම් නුවර සමීපයෙහිවූ මාගේ ආම්‍රවනොද්‍යානයෙහි වැඩවාසයකර වදාරණසේකැයිකියා ඇසුයේමය. ඉක්බිත්තෙන් චුන්ද නම් කම්මාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ මනාකොට වැඳ එකත් පසෙක්හි උන්නේය. එකත්පසෙක්හි උන්නාමවූ චුන්දනම් කම්මාර පුත්‍රයාට භාග්‍ය වතුන්වහන්සේ ධර්මාන්විතවූ කථාවෙන් මෙලොව පරලොව වැඩදක්වා වදාළසේක. දක්වූ වැඩෙහි සිත් සමාදන්කරවා වදාළ සේක. සමාදම්කළ වැඩෙහි සිත නියුණුකරවා වදාළසේක, එහිම යහපත යහපතැයි ප්‍රසංසාකරවා වදාළසේක.

15. ඉක්බිත්තෙන් චුන්දනම් කම්මාර පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේවිසින් ධර්මකථාවෙන් මෙලොව පරලොව වැඩ දක්වා වදාරණලද්දාවූ දැක්වූ වැඩෙහි සිත් සමාදන්කරවා වදාරණලද්දාවූ සමාදන්කළ වැඩෙහි සිතනියුණුකරවා වදා රණලද්දාවූ එහිම සිත යහපත යහපතැයිකියා ප්‍රශංසාකරවා වදාරණ ලද්දාවූ භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැලකෙළේය.

අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

16. අථ ඛො චුන්දො කම්මාරපුත්තො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

17. අථ ඛො චුන්දො කම්මාරපුත්තො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා පහුතඤ්ච සූකරමද්දවං භගවතො කාලං ආරොචාපෙසි කාලො භන්තෙ නිට්ඨිතං භත්තන්ති.

18. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන චුන්දස්ස කම්මාරපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසම්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසිදි.

---

ස්වාමිවූ භාග්‍යවත් බුදුරජානන්වහන්ස භික්ෂු සඞ්ඝයාවහන්සේ හා සමග සෙට දවස පිණිස මාගේ බත ඉවසා වදාරණසේක්වයි නිමන්ත්‍රණය කෙළේය. භාග්‍යවතුන්වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදාළසේක.

16. ඉක්බිත්තෙන් චුන්දනම් කම්මාර පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගී භාග්‍යවතුන්වහන්සේ වැඳ ප්‍රදක්ෂිණාකොට ගියේය.

17. ඉක්බිත්තෙන් චුන්දනම් කම්මාර පුත්‍රයා ඒරාත්‍රිහුගේ ඇවෑමෙන් ස්වකීය ගෘහයෙහි ප්‍රණීතවූ ඛාද්‍යභොජ්‍යාදියද බොහෝවූ සූකර මද්දවද මනාකොට පිළියෙළකරවා ස්වාමීන්වහන්ස, පිළියෙළකොට නිමවනලද බත් ඇත්තේය, භත්තාග්‍රයට වඩනාකාලයයි භාග්‍යවතුන්වහන්සේට කල්දැන්වූයේය.

18 ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පෙරවරු කාලයෙහි මනාකොට හැඳපොරවා පා සිවුරුගෙණ භික්ෂු සඞ්ඝයා සමග චුන්දනම් කම්මාර පුත්‍රයාගේ වාසභවනය යම් තැනෙක්හිද එතනට එළඹිසේක. එළඹ පණවනලද බුද්ධාසනමස්තකයෙහි වැඩහුන්සේක.

නිසජ්ජ ඛො භගවා චුන්දං කම්මාරපුත්තං ආමන්තෙසි. යන්තෙ චුන්ද සූකරමද්දවං පටියත්තං තෙන මංපරිවිස. යංපනඤ්ඤං ඛාදනීයං භොජනීයං පටියත්තංතෙන භික්ඛුසඞ්ඝං පරිවිසාති. එවම්භන්තෙති ඛො චුන්දො කම්මාරපුත්තො භගවතො පටිස්සුත්වා යං අහොසි සූකර මද්දවං පටියත්තං තෙන භගවන්තං පරිවිසි. යං පනඤ්ඤං ඛාදනීයං භොජනීයං පටියත්තං තෙන භික්ඛුසඞ්ඝං පරිවිසි.

19. අථඛො භගවා චුන්දංකම්මාරපුත්තං ආමන්තෙසි. යන්තෙ චුන්ද සූකරමද්දවං අවසිට්ඨං තං සොබ්භෙ නිඛණාහි. නාහංතං චුන්ද පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යස්ස තං පරිභුත්තං සම්මා පරිනාමං ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතස්සාති. එවම්භන්තෙතිඛො

වැඩහිඳ භාග්‍යවත්තෙම චුන්දනම් කම්මාරපුත්‍රයාට ආමන්ත්‍රණයකර වදාළසේක. එම්බා චුන්ද කම්මාර පුත්‍රය තා විසින් යම් සූකර මද්දවයක් පිළියෙළ කරණලද්දේවේද ඒ සූකර මද්දවයෙන් මා අනුභවකරව. එබඳුවූ අනිකුත් ඛාද්‍යභොජ්‍යාදියක් පිළියෙළකරණ ලද්දේවේද ඒ අනිකුත් ඛාද්‍යභොජ්‍යාදියෙන් භික්ෂුසඞ්ඝයා අනුභවකරවයි වදාළසේක. එසේය ස්වාමීන්වහන්සැයිකියා චුන්දනම් කම්මාර පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ප්‍රතිවචනදී යම් සූකරමද්දවයක් පිළියෙළකරණලද්දේවේද ඒසූකරමද්දවයෙන් භාග්‍යවතුන්වහන්සේ වැළඳවූයේය; යම් බඳුවූ අනිකුත් ඛාද්‍යභොජ්‍යාදියක් පිළියෙළකරණ ලද්දේවේද එයින් භික්ෂුසඞ්ඝයා වැළඳවූයේය.

19. ඉක්බින්තෙන් භාග්‍යවත්තෙම චුන්දනම් කම්මාර පුත්‍රයාට ආමන්ත්‍රණයකර වදාළසේක. එම්බා චුන්දය මා වළඳවා ඉතිරිවූ යම් සූකරමද්දවයක් ඇද්ද ඒ සූකරමද්දවය වළක්කැණ එහි වළලවයිකියා වදාළසේක. එම්බා චුන්දය දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ මහණ බමුණන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ ප්‍රජාව ඇති මෙ සත්වලොකයෙහි තථාගතයන්වහන්සේගේ ජඨරාග්නියහැර ඒ සූකරමද්දවය අනුභවකලාවූ යමක් හුගේ ජඨරාග්නියෙන් මනාකොට ජිරණභාවයට පැමිණේද එබඳු පුද්ගලයෙක් මමනොදක්නෙම්සි කියා වදාළසේක. එසේය ස්වාමීන්වහන්සැයි

චුන්දො කම්මාරපුත්තො භගවතො පටිස්සුත්වා යං අහොසි සූකරමද්දවං අවසිට්ඨං තං සොබ්භෙ නිඛණිත්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චුන්දං කම්මාරපුත්තං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

20. අථ ඛො භගවතො චුන්දස්ස කම්මාර පුත්තස්ස භත්තං භුත්තාවිස්ස ඛරො ආබාධො උප්පජ්ජි. ලොහිත පක්ඛන්දිකා පබාළ්හා වෙදනා වත්තන්ති මාරණන්තිකා. තාසුදං භගවා සතොසම්පජානො අධිවාසෙසි අවිහඤ්ඤමානො.

---

චුන්දනම් කර්මාර පුත්‍රයා භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ප්‍රතිවචනදී බුදුන්වලඳවා යම්සූකරමද්දවයක් ඉතිරිවූයේවේද එය වළෙක්හි වළලවා භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක් හිඳ එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ මනා කොට වැඳ එකත්පසෙක්හි උන්නේය. එකත්පසෙක්හි උන්නාවූ චුන්දනම් කර්මාරපුත්‍රයාට භාග්‍යවතුන්වහන්සේ ධර්මාන්විතවූ කථාවෙන් මොලොව පරලොව වැඩ දක්වා කරුණු වදාරණලදුව දැක්වූ වැඩෙහි සිත්සමාදන්කරවනලදුව සමාදන්කළ වැඩෙහි සිත නිපුණුකරවනලදුව ඒවදාළ පිළිවෙළට යහපත යහපතැයිකියා ප්‍රශංසාකර වදාරණලදුව හුනස්නෙන්නැඟී වැඩිසේක.

20. ඉක්බිත්තෙන් චුන්දනම් කර්මාර පුත්‍රයාගේ බත වළඳා අවසන්වූ භාග්‍යවතුන්වහන්සේට කෲර ආබාධයෙක් උපන්නේය. ලේ වහනය වන බැවින් ලොහිත පක්ඛන්දිකා නම් වූයේය. මරණයට පැමිණවීමට තරම්වූ බලවත් වේදනාවෝ පවත්නාහ. භාග්‍යවතුන්වහන්සේ සිහියෙන්යුක්තසේක් ඔබ්මොබ පරිවර්තනය වීම් වශයෙන් නොගැටෙමින් ඒ වේදනාවන් ඉවසාවදාළසේක.

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං. ආමන්තෙසි. ආයාමානන්ද යෙන කුසිනාරා තෙනුපසඞ්කමිස්සාමාති එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

චුන්දස්ස භත්තං භුඤ්ජිත්වා
කම්මාරස්සාති මෙ සුතං,
ආබාධං සම්ඵුසි ධීරො
පබාළ්හං මාරණන්තිකං.

භුත්තස්ස ච සූකරමද්දවෙන
ව්‍යාධිප්පබාළ්හා උදපාදි සත්ථුනො,
විරිච්චමානො භගවා අවොච
ගච්ඡාමහං කුසිනාරං නගරන්ති.

21. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන'ඤ්ඤතරං රුක්ඛමූලං තෙනුපසඞ්කමි.

---

ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට ආමන්ත්‍රණයකර වදාළසේක. ආනන්දය, කුසිනාරානම් නුවර යම්තැනකද එතනට එලඹෙම්හයි වදාළසේක. එසේය ස්වාමින්වහන්සැයි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචන දුන්නේය. චුන්දනම් කර්මාර පුත්‍රයාගේ බත වළඳා ධෛර්‍ය්‍යවත්තවූ බුදුරජතෙම මරණාන්තවූ ඉතා බලවත් ආබාධය ස්පර්ශකෙළේයයි මාවිසින් අසනලද්දේය. වළඳා වදාරණලද සූකරමද්දවය හේතුකොටගෙණ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේට අතිශයින් බලවත්වූ ලොහිතපක්ඛන්දිකානම් ව්‍යාධියෙක් පහළවූයේය. හෙවත් හටගත්තේය. නිරන්තරුව පවත්නා ලොහිතවිරෙචන ඇත්තාවූ භාග්‍යවතුන්වහන්සේ කුසිනාරා නුවරට මම යනු කැමැත්තෙමියි වදාළසේක.

21. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මගින් ඉවත්ව එක්තරා වෘක්ෂමූලයක් යම්තැනෙක්හිද එතනට එළඹිසේක.

උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙහි කිලන්තොස්මි ආනන්ද නිසීදිස්සාමීති. එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙසි.

22. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද පානීයං ආහර පිපාසිතොස්මි ආනන්ද පිවිස්සාමීති. එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච· ඉදානි භන්තෙ පඤ්චමත්තානි සකටසතානි අතික්කන්තානි තං චක්කච්ඡින්නං උදකං පරිත්තං ලුළිතං ආවිලං සන්දති. අයං භන්තෙ කකුත්ථා නදී අවිදූරෙ අච්ඡොදිකා සාතොදිකා සීතොදිකා සෙතකා සුපතිත්ථා රමනීයා. එත්ථ භගවා පානීයඤ්ච පිවිස්සති ගත්තානිච සීතං කරිස්සතීති.

---

එලඹ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්වහන්සේට අඩගා වදාළසේක. ආනන්දය, නෙපි මගේ සඟලසිවුර සතරපටින් ආසනයක් කොට පණවව. ආනන්දය, ක්ලාන්තවූයෙමි හිඳිමියි වදාළසේක. එසේය ස්වාමින්වහන්සැයි ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙම භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචනදී සඟලසිවුර සතරපටින් ආසනයක් කොට පැණවූසේක.

22. භාග්‍යවත්තෙම පණවනලද ඒ ආසනයෙහි වැඩඋන්සේක. වැඩහිඳ භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරයන්වහන් සේට අඩගාවදාළසේක. ආනන්දය, නෙපි මට පැන් ගෙණෙව. ආනන්දය, පිපාසිතයෙමි පැන් පානයකරමියි වදාළසේක. භාග්‍ය වතුන්වහන්සේ මෙසේ වදාළකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙම භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැලකළසේක. ස්වාමීන් වහන්ස, දැන් පන්සියයක් පමණ ගැල් ඉක්මවා ගියාහුය. ගැල් සකින් ඡේද්‍යවූ පසින් මිශ්‍රවූ ස්වල්පමාත්‍රවූ ඒ ජලය කැලඹී බොරව වහනය වන්නේය. ස්වාමින්වහන්ස, පැහැදි දිය ඇත්තාවූ රසවත්වූ මිහිරි පැන් ඇත්තාවූ ඉතා සිහිල් පැන් ඇත්තාවූ ශුභ්‍රවර්ණ පැන් ඇත්තාවූ මනාවූතොට ඇති සිත්කලුවන්නාවූ මේ කකුත්ථානදිය ඉතා දුරනොවන්නිය. මේ කකුත්ථානදීයෙහි භාග්‍යවතුන්වහන්සේ පැන් පානයද කරන්නේය. ස්වාමින්වහන්සේගේ ගාත්‍රයයි කියන ලද ශ්‍රී ශරීරයද සිහිල්කරන්නේයයි සැලකළසේක.

23. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද පානීයං ආහර පිපාසිතොස්මි ආනන්ද පිවිස්සාමීති. දුතියම්පි ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. ඉදනි භන්තෙ පඤ්චමත්තානි සකටසතානි අතික්කන්තානි තං චක්කච්ඡින්නං උදකං පරිත්තං ලුළිතං ආවිලං සන්දති. අයං භන්තෙ කකුත්ථා නදී අවිදූරෙ අච්ඡොදිකා සාතොදිකා සීතොදිකා සෙතකා සුපතිත්ථා රමණීයා. එත්ථ භගවා පානීයඤ්ච පිවිස්සති ගත්තානි ච සීතිං කරිස්සතීති.

21. තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද පානීයං ආහර පිපාසිතො'ස්මි ආනන්ද පිවිස්සාමීති.

---

23. දෙවනවරද භාග්‍යවතුන්වහන්සේ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ ඇමතූසේක. ආනන්දය, එහෙයින් තෝ මට පැන් ගෙණ එව. ආනන්දය පවස්ඇත්තෙමි පැන් පානයකරන්නෙමියි වදාළෝ. දෙවනවරද ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකෙළේය. ස්වාමින්වහන්ස, දැන් පන්සියයක් පමණ ගැල් නදිය ඉක්මවා ගියාහුය. චක්‍රසඞ්ඝට්ටනය හේතුකොටගෙණ ඒ ස්වල්පමාත්‍රවූ ජලය කැලඹුණේය. බොහෝසෙයින් බොරව ගලාබසී. ස්වාමින්වහන්ස, මේ කකුත්ථානම් නදීතොමෝ මිට නුදුරු තන්හි පිහිටියාය. ඕතොමෝ නිර්මලජලය ඇත්තීය. සැපජලය ඇත්තිය. සිහිල්ජලය ඇත්තීය. සුදුවැලිතලා ඇත්තීය. යහපත් තොටවල් ඇත්තීය. අභිරමනයට සුදුසුවෙයි. භාග්‍යවතුන්වහන්සේ මේ ගඞ්ගාවෙහි පැන් පානයකරන්නේය. ශරිරාවයවයන්ද සිහිල්කරන්නේයයි සැලකෙළේය.

24. තුන්වෙනිවරද භාග්‍යවත්තෙම ආයුෂ්මත්වූ ආනන්ස්ථවිරයන්ට අඬගා වදාළසේක. ආනන්දය, තෙපි මට පැන් ගෙණෙව. ආනන්දය, පිපාසිතයෙමි. පැන් පානයකෙරෙමියි වදාළසේක.

එවමහනෙතති බො ආයස්මා ආනනෙද භගවතො පටිස්සුණිවා පත්තං ගහෙත්වා යෙන සා නදිකා තෙනුපසඞකාමි. අථ බො සා නදිකා චක්කච්ඡින්නා පරිත්තා ලුළිතා ආවිලා සන්දමානා ආයස්මනෙත ආනනෙද උපසඞකමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දිත්ථ.

25. අථ බො ආයස්මතො ආනනදස්ස එතදහොසි. අච්ඡරියං වත භො අබ්භුතං වත භො තථාගතස්ස මහිඞිකතා මහානුභාවතා. අයංහි සා නදිකා චක්කච්ඡින්නා ලුළිතා ආවිලා සන්දමානා මයි උප සඞකමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දතීති පත්තෙන පානීයං ආදය යෙන භගවා තෙනුපසඞකාමි. උපසඞකමිත්වා භගවන්තං එතද වොච. අච්ඡරියං භනෙත. අබ්භුතං භනෙත. තථාගතස්ස මහිඞිකතා මහානුභාවතා.

---

එසේය ස්වාමින්වහන්සැයි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍ය වතුන්වහන්සේට ප්‍රතිවචනදී පාත්‍රය ගෙණ ඒ ක්‍ෂුද්‍ර නදීතොම යම් තැනෙක්හිද එතනට එළඹිසේක. එකල්හි ගැල්සකින් ඡේද්‍යවනලද් දවූ පසින්මිශ්‍රවූ කැළඹී බොරව වහනයවන්නාවූ ඒ ක්‍ෂුද්‍ර නදිය ආයුෂ් මත් ආනන්දස්ථවිරයන්වහන්සේ සමීපයට එළඹෙනකල්හි ප්‍රසන් නව විශෙෂයෙන්ම ප්‍රසන්නව නොකැළඹී පැහැදී වහනය වූවාය.

25. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට මෙසේවූ සිතෙක්වූයේය. තථාගතයන්වහන්සේගේ මහත්වූ සෘද්ධිඇති බැව් මහත්වූ ආනුභාවඇති බව එකාන්තයෙන් ආශ්චර්‍ය්‍යවන්නේම ය. එකාන්තයෙන් අද්භූතවන්නේමය. ගැල්සකින් ඡේද්‍යවනලද්දවූ කැළඹී බොරව වහනයවන්නාවූ මේ ක්‍ෂුද්‍ර නදීතොම මාගේ එළඹීම වනකල්හි ප්‍රසන්නව විශෙෂයෙන්ම ප්‍රසන්නව පැහැදිලිව වහනය වන්නේයයි කියා පාත්‍රයෙන් පැන් ගෙණ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැලකෙළේය. ස්වාමීන්වහන්ස, තථාගතයන්වහන්සේගේ මහත්වූ සෘද්ධිඇති බවද මහත්වූ ආනුභාවඇති බවද ආශ්චර්‍ය්‍යවන්නේමය. ස්වාමීන්වහන්ස, අද්භූතවන්නේය.

ඉදානි සා භන්තෙ නදිකා චක්කච්ඡින්නා පරිත්තා ලුළිතා ආවිලා සන්දමානා මයි උපසඞ්කමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දති. පිවතු භගවා පානීයං. පිවතු සුගතො පානියන්ති. අථ ඛො භගවා පානීයං අපායී.

26. තෙන ඛො පන සමයෙන පුක්කුසො මල්ලපුත්තො ආළාරස්ස කාලාමස්ස සාවකො කුසිනාරාය පාවං අද්ධානමග්ගප්පටිපන්නො හොති. අද්දසා ඛො පුක්කුසො මල්ලපුත්තො භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං, දිස්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පුක්කුසො මල්ලපුත්තො භගවන්තං එතදවොච. අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ සන්තෙන වත භන්තෙ පබ්බජිතා විහාරෙණ විහරන්ති.

---

ස්වාමීන්වහන්ස, ගැල්සකින් ඡේද්‍යවනලද්දාවූ කැලඹී බොරව වහනයවන්නාවූ ඒ ක්ෂුද්‍ර නදිය දැන් මාගේ එළඹීමවනකල්හි ප්‍රසන්නව විශේෂයෙන් ප්‍රසන්නව නොකැලඹී පැහැද වහනය වූවාය. භාග්‍යවතුන්වහන්සේ පැන් පානයකර වදාළමැනව. සුගතනම්වූ බුදුරජතෙම පැන් පානයකර වදාරණසේක්වායි සැලකෙළේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පැන් පානයකරවදාළසේක.

26. එසමයෙහිදී ආලාරකාලාමනම් තවුසාගේ ශ්‍රාවකවූ පුක්කුස නම් මල්ලරාජපුත්‍රයෙක් කුසිනාරා නුවරින් පාවානම් නුවරට යන දීර්ඝමාර්ගයවූ අන්තරමාර්ගයට පිළිපන්නේ වෙයි. පුක්කුසනම් මල්ලරාජ පුත්‍රතෙම එක්තරා රුකක්මුල වැඩඋන්නාවූ භාග්‍යවතුන්වහන්සේ දුටුයේය. දැක භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක්හි උන්නේය, එකත්පසෙක්හි උන්නාමවූ පුක්කුසනම් මල්ලරාජපුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැලකෙළේය. ස්වාමීන්වහන්ස, ආශ්චර්‍ය්‍යයෙක. ස්වාමීන්වහන්ස, පෙර නොවූ දෙයක. ස්වාමීන්වහන්ස, ඒකාන්තයෙන් ප්‍රව්‍රජිතයෝ මෙසේ ශාන්තවූ විහරණයෙන් යුක්තව වාසයකරන්නාහු වෙති.

27. භූතපුබ්බං භන්තෙ ආළාරො කාලාමො අද්ධානමග්ගපටිපන්නො මග්ගා ඔක්කම්ම අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරෙ නිසීදි. අථ ඛො භන්තෙ පඤ්චමත්තානි සකටසතානි ආළාරං කාලාමං නිස්සාය නිස්සාය අතික්කමිංසු. අථ ඛො භන්තෙ අඤ්ඤතරො පුරිසො තස්ස සකටසත්ථස්ස පිට්ඨිතො පිට්ඨිතො ආගච්ඡන්තො යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොච. අපි භන්තෙ පඤ්චමත්තානි සකටසතානි අතික්කමන්තානි අද්දසාති. න ඛො අහං ආවුසො අද්දසන්ති, කිම්පන භන්තෙ සද්දං අස්සොසීති, න ඛො අහං ආවුසො සද්දං අස්සොසින්ති. කිම්පන භන්තෙ සුත්තො අහොසීති. න ඛො අහං ආවුසො සුත්තො අහොසින්ති. කිම්පන භන්තෙ සඤ්ඤී අහොසීති එවමාවුසොති, සො ත්වං භන්තෙ සඤ්ඤී සමානො ජාගරො පඤ්චමත්තානි සකටසතානි නිස්සාය නිස්සාය අතික්කමන්තානි නෙව අද්දස න පන සද්දං අස්සොසි, අපිහි තෙ භන්තෙ සඞ්ඝාටි රජෙන ඔකිණ්ණාති. එවමාවුසොති.

---

27. පෙර මෙබන්දක් වූයේය. ස්වාමීන්වහන්ස, ආළාරකාලාමනම් තාපසතෙම දීර්ඝමාර්ගයට පිළිපන්නේ මඟින් ඉවත්ව මාර්ගයට නුදුරු එක්තරා රුක්මූලෙක්හි දිවාවිහරණයෙන් යුක්තව උන්නේය. ඉක්බිත්තෙන් ස්වාමීන්වහන්ස, ගැල් පන්සියයක් පමණ ආළාරකාලාම නම් තාපසයන්නිසාම නික්ම ගියාහුය. ඉක්බිත්තෙන් ස්වාමීන්වහන්ස, එක්තරා පුරුෂයෙක් ඒ ගැල් ශාස්තෘවාහකයන් පන්සියය ගේ පසුපස්සෙහි එන්නේ ආළාරකාලාමනම් තාපසයා යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ ආළාරකාලාමනම් තවුසානන්ට මෙසේ කීයේය. කිමෙක්ද ස්වාමීනි, පන්සියයක් පමණ ගැල් ඉක්ම යන්නා දුටුසේක්දැයි විචාළේය, ඇවත මම නුදුටුයෙමියි කීයේය. කිමෙක්ද ස්වාමීනි, එහි ශබ්දශ්‍රවණය කළසේක්දැයි විචාළේය. ඇවත මම ශබ්දද නොඇසූයෙමියි කීයේය. කිමෙක්ද ස්වාමීනි, එකල්හි නිද්‍රාපගතවූයෙහිදැයි විචාළේය. ඇවත මම නිද්‍රොපගතනොවූයෙමියි කීයේය. කිමෙක්ද ස්වාමීනි, සංඥාඇතිවූයෙහිදැයි විචාළේය. එසේය ඇවතැයි කීයේය. ස්වාමීන්වහන්ස, නිද්‍රොපගතනොව සිහියෙන් යුක්තවූ ඒ නුඹවහන්සේ සමීප සමීපව නික්මගියාවූ පන් සියයක් පමණවූ ඒ ගැල් නුදුටුයෙහිද, ඒ ගැල් හඬද නොඇසූයෙහිද; එසේදවුවත් ස්වාමීනි; නුඹවහන්සේගේ සඟලසිවුර පසින් ගැවසීගත්තේදැයි විචාළේය. ඇවත එසේයයි කීයේය.

අථ ඛො භන්තෙ තස්ස පුරිසස්ස එතදහොසි. අච්ඡරියං වත භො අබ්භුතං වත භො සන්තෙන වත භො පබ්බජිතා විහාරෙන විහරන්ති. යත්‍ර හි නාම සඤ්ඤී සමානො ජගරො පඤ්චමත්තානි සකටසතානි නිස්සාය නිස්සාය අතික්කමන්තානි නෙව දක්ඛිති න පන සද්දං සොස්සතීති. ආළාරෙ කාලාමෙ උළාරං පසාදං පවෙදිත්වා පක්කාමිති.

28. තං කිම්මඤ්ඤසි පුක්කුස කතමං නු ඛො දුක්කරතරං වා දුරභිසම්භවතරං වා යො සඤ්ඤී සමානො ජගරො පඤ්චමත්තානි සකටසතානි නිස්සාය නිස්සාය අතික්කමන්තානි නෙව පස්සෙය්‍ය න පන සද්දං සුණෙය්‍ය. යො වා සඤ්ඤී සමානො ජගරො දෙවෙ වස්සන්තෙ දෙවෙ ගළගළායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසනියා ඵලන්තියා නෙව පස්සෙය්‍ය න පන සද්දං සුණෙය්‍යාති.

---

ඉක්බිත්තෙන් ස්වාමින්වහන්ස, ඒ පුරුෂයා හට මෙසේවූ සිතෙක් වූයේය. පින්වත්නි, එකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙක. පින්වත්නි, එකාන්ත අද්භූතවන්නේය. පින්වත්නි, එකාන්තයෙන් පැවිද්දෝ මෙසේ ශාන්තව සිහියෙන් යුක්තව වාසයකරන්නේය. යම්බඳුවූ නිද්‍රොපගතනොව සිහියෙන් යුක්තවූ ඒ නුඹවහන්සේ සමීප සමීපව නික්මගියාවූ පන්සියයක් පමණවූ ඒ ග ල් නොදක්නාලද්දෙහිය. ගැල් හඬද නොඅසනලද්දෙහියයි කියා ආළාරකාලාමනම්වූ තවුසාකෙරෙහි මහත්වූ පැහැදිම ප්‍රකාශකිරීමෙන් ප්‍රශංසාකොට ගියේය.

28. පුක්කුසනම් මල්ලරාජපුත්‍රය යමෙක්තෙම සිහියෙන්යුක්තව නොනිදාගිඳම තමන්නිසාසමීපව නික්මගියාවූ පඤ්චශතප්‍රමාණවූ ගැල් නොදක්නේ වේද, එහි පවත්නා ගැල්හඬ නොඅසන්නේ වේද, අනිකුත් යමෙක්වනාහි සිහියෙන්යුක්තව නොනිදාගිඳම මහත්වූ වර්ෂාව වස්නාකල්හි එසේ වස්නාලද වර්ෂාජලය පෘථිවියෙහි පැතිර එකලාව ගලාගණඝන කල්හි මහත්වූ ඒ වර්ෂාවන්ගේ අන්තරන්තරයෙහි විදුලිය පැහැරපවත්නා භයානකවූ සෙනහඬ හා මහත්වූ මේඝගර්ජනාවන් නොදක්නේ වේද, ඒ මේඝගර්ජනාදි ශබ්දය නොඅසන්නේ වේද.

29. කිංහි භන්තෙ කරිස්සන්ති පඤ්චවා සකටසතානි ඡවා සකට සතානි සත්තවා සකටසතානි අට්ඨවා සකටසතානි. නවවා සකටසතානි සකටසහස්සංවා. අථඛො එතදෙව දුක්කරතරංචෙව දුරභිසම්භවතරඤ්ච. යොච ඛො සඤ්ඤී සමානො ජාගරො දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසනියා ඵලන්තියා නෙවපස්සෙය්‍ය නසද්දං සුණෙය්‍යාති.

30. එකමිදාහං පුක්කුස සමයං ආතුමායං විහරාමි භුසාගාරෙ. තෙනඛො පන සමයෙන දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසනියා ඵලන්තියා භුසාගාරස්ස චෙ කස්සකා භාතරො හතා චත්තාරො ච බලිබද්දා.

---

29. [ඒ කුමකැයි සිතන්නෙහිද, මේ දෙයාකාරයෙන් කවරකාරණ යෙක් අතිශයින් ඉතා දුෂ්කරවේද දුරභි සම්භවතරවන්නේ දැයි විචාරවදාළසේක] ස්වාමින්වහන්ස, ඒ කියනලද ගැල්පන්සිය යක් හෝ සසියයක්හෝ සත්සියයක්හෝ නවසියයක්හෝ ගැල් දහසක් හෝ කුමක්කරන්නාහුවේද්ද' යම් ප්‍රව්‍රජිතයෙක්තෙම සිහියෙන් යුක්තවම නොනිදාහිද වැසි වසිනකල්හි මේඝගර්ජනා කරණකල්හි විදුලි නික්මෙණකල්හි නොමදක්නේද ඒ මේඝගර්ජි නාදි ශබ්දයද නොඅසන්නේවේද ඉක්බිත්තෙන් මේ කාරණයම අත්‍යර්ථයෙන් දුකසේම කරණුලබන බැවින් දුෂ්කරවන්නේය. දුරභි සම්භවතරද වන්නේයයි කීයේය.

30. එම්බා පුක්කුස මල්‍ය රාජපුත්‍රය මම මේ එක්තරා කාල යෙක්හි ආතුමා නම් පුරප්‍රවරාසන්නයෙහිවූ භූසාගාරනම් ඛලාගාර යෙහි වාසයකෙරෙමි. එසමයෙහිදී මහත්වූ වර්ෂාව වසිනකල්හි අන්ත රාන්තරයෙහි විදුලිය පැහැර පවත්නා භයානකවූ මහත් හෙන පිපිරි වැදිමෙන් භූසාගාරනම් එහි ඛලාගාරය සමීපයෙහිවූ ක්ෂේත්‍ර යෙක්හි සිටින්නාවූ සහෝදර ගොවි දෙදෙනෙකු හා ගොන් සතරදෙනෙක්ද අසනිපාතයයි කියනලද හෙනවැදීමෙන් මැරු ණාහුය.

අථඛො පුක්කුස ආතුමායා මහජනකායො නික්ඛමිත්වා යෙන තෙ වෙකස්සකා භාතරො හතා චත්තාරොච බලිවද්දා තෙනුපසඞ්කමි.

31. තෙනඛො පනාහං පුක්කුස සමයෙන භුසාගාරා නික්ඛමිත්වා භුසාගාරද්වාරෙ අබ්භොකාසෙ චඞ්කමාමි. අථඛො පුක්කුස අඤ්ඤතරො පුරිසො තම්හා මහාජනකායා යෙනාහං තෙනුපසංකමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතංඛො අහං පුක්කුස තං පුරිසං එතදවොචං.

32 කින්නුඛො සො ආවුසො මහාජනකායො සන්නිපතිතොති. ඉදනි භන්තෙ දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තිසු අසනියා ඵලන්තියා වෙ කස්සකා භාතරෙ හතා චත්තාරොච බලිවද්දා. එත්ථෙසො මහාජනකායො සන්නිපතිතො.

---

ඉක්බිත්තෙන් පුක්කුස මල්‍යරජ පුත්‍රය ආතුමාවෙන් මහාජන සමූහයා නික්ම ඒ සහොදර ගොවියෝ දෙදෙනාහා ගොන් සතරදෙන යම්තැනෙක්හි නැසුනාහුද එතැනට එළඹියේය.

31. එම්බා පුක්කුසය. එසමයෙහිදී මම භූසාගාරයෙන් පිටතට නික්ම භූසාගාර වාර සමීපයෙහිවූ අභ්‍යවකාශයෙහි සක්මන් කෙරෙමි. ඉක්බිත්තෙන් පුක්කුසනම් මල්‍යරජ පුත්‍රය එක්තරා පුරුෂයෙක් ඒ මහත්වූ ජනසමූහයා කෙරෙන් නික්ම මම යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ මට මනාකොට වැඳ එකන් පසෙක සිටියේය. පුක්කුස රාජපුත්‍රය එකන් පසෙක්හි සිටියාවූ ඒ පුරුෂයාට මම මෙසේ කියෙමි.

32. ඇවත මේජනසමූහයා කුමක් පිණිස රැස්වූයේදැයි කීයෙමි. ස්වාමින්වහන්ස, දැන් වර්‍ෂාව වසිනකල්හි මෙඝගර්ජනා කරණකල්හි හෙනපුපුරණකල්හි සිසාන්නාවූ සහෝදර දෙදෙනෙක්ද ගොන් සතරදෙනෙක්ද විදුලිය පැහැර මහත්වූ හෙනපුපුරා වැදීමෙන් නැසුනාහුය. ඒ කාරණයෙන් මෙතැන්හි මහාජන සමූහතෙම රැස්වූයේ යයි කීයේය.

ත්වං පන භන්තෙ කුහිං අහොසීති. ඉධෙව ඛො අහං ආවුසො අහොසින්ති. කිම්පන භන්තෙ අද්දසාති. නඛො අහං ආවුසො අද්දසන්ති. කිම්පන භන්තෙ සද්දං අස්සොසීති. නඛො අහං ආවුසො සද්දං අස්සොසින්ති. කිම්පන භන්තෙ සුත්තො අහොසීති. නඛො අහං අවුසො සුත්තො අහොසින්ති. කිංපන භන්තෙ සඤ්ඤී අහොසීති. එවමාවුසොති. සො ත්වං භන්තෙ සඤ්ඤී සමානො ජාගරො දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසනියා ඵලන්තියා නෙව අද්දසං න පන සද්දං අස්සොසීති. එවමාවුසොති.

33. අථඛො පුක්කුස තස්ස පුරිසස්ස එතදහොසි. අච්ඡරියං වත භො අබ්භුතං වත භො සන්තෙන වත භො පබ්බජිතා විහාරෙණ විහරන්ති.

---

ස්වාමින්වහන්ස, නුඹවහන්සේ කොතැන්හි වැඩහුන්සේක්දැයි විචාළේය. ඇවත මම මෙහිම උන්නෙමියි කීමි. කිමෙක්ද ස්වාමින්වහන්ස ඒ මහත්වැසීව හා අසනිපාතාදිය දුටුසේක්දැයි විචාළේය. ඇවත මම නුදුටුයෙමියි කීමි. කිමෙක්ද ස්වාමින්වහන්ස, එහි පැවති ශබ්දය ඇසූසේක්දැයි විචාළේය. ඇවත මම ඒ ශබ්දයද නොඇසුයෙමියි කීමි. කිමෙක්ද ස්වාමීනි සයනයකළසේක්දැයි විචාළේය. ඇවත මම සයනයද නොකෙළෙමියි කීයෙමි. කිමෙක්ද ස්වාමිනි, සිහියෙන් යුක්තවූසේක්දැයි විචාළේය. එසේය ඇවතැයි කීයෙමි. ස්වාමිනි, ඒ නුඹවහන්සේ සිහියෙන් යුක්තසේක් නිද්‍රා නොකෙළේ වැසීව වසිනකල්හි මේඝගර්ජනාකරණකල්හි විදුලිය නික්මෙනකල්හි හෙනපිපිරිමත් නුදුටුසේහිද අසනිපාතාදියත් නොම දුටුසේක්ද එහි පවත්වනලද ශබ්දයද නොඇසූයෙහිදැයි කියා විචාළේය. එසේය ඇවිත ශබ්දයද නොමඇසුයෙමියි කීමි.

33. පුක්කුසය. ඉක්බිත්තෙන් ඒ පුරුෂයාහට මෙසේවූ කල්පනාවෙක්වූයේය. පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකැ පින්වත්නි, ඒකාන්තයෙන් ප්‍රව්‍රජිතොත්තමයෝ මෙසේ ශාන්තවූ විහරණයෙන් යුක්තව වාසය කරන්නාහුය.

යත්‍රහි නාම සඤ්ඤී සමානො ජාගරො දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසනියා ඵලන්තියා නෙවද්දක්ඛිස්සති නපන සද්දං සොස්සතීති මයි උළාරං පසාදං. පවෙදෙත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමීති.

34. එවංවුත්තෙ පුක්කුසො මල්ලපුත්තො භගවන්තං එතදවොච. එසාහං භන්තෙ යො මෙ ආළාරෙ කාලාමෙ පසාදෙ තං මහාවාතෙ වා ඔපුණාමි. සීඝසොතාය වා නදියා පවාහෙමි. අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූල්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති.

---

යමෙක් නම් සිහියෙන් යුක්තයේමවූ නිදිනොරකෙලේ වැසි වසනකල්හි මෙඝගර්ජනාකරණකල්හි විදුලිය නික්මෙනකල්හි හෙනපුපුරණකල්හි අසනිපාතාදිය නොම දක්නේයයිද ඒ අසනිපාතාදියෙහි ශබ්දය නොමඅසාද ඒ හෙයින්. මේකරුණුනිසා මාකෙරෙහි මහත්වූ පැහැදීම ප්‍රකාශකොට මා මනාකොට වැඳ ප්‍රදක්ෂිණාකොට ගියේයයි වදාළසේක.

34. මෙසේ වදාළකල්හි පුක්කුසනම් මල්ලරාජපුත්‍රතෙම භාග්‍ය වතුන්වහන්සේට මෙසේ සැලකෙළේය. ස්වාමිවූ භාග්‍යවත් බුදුර ජානන්වහන්ස, මේමම ආළාරකාලාමනම් තවුසානන්කෙරෙහි මාගේ යම් පැහැදිමක් ඇද්ද ඒ පැහැදීම මහසැඩසුලහෙහි හෝ ගසාහරිමි. ශීඝ්‍රවූ ජලශ්‍රොතස්ඇති ගඞ්ගාවෙක්හි හෝ පාකොටහරිමියි කියායි. ස්වාමින්වහන්ස, වදාළ ධර්මය ඉතායහපත. ස්වාමින්වහන්ස, ධර්මදෙශනාව ඉතාමැනවි. ස්වාමින්වහන්ස, යටිකුරුකොට තබනලද බඳුනක් උඩුකුරුකොට තබන්නේ හෝ යම්සේද තෘණ පර්ණාදියෙන් ප්‍රතිච්ඡන්නාවූවක් විවෘතකොට දක්වන්නේ හෝ යම් සේද මංමුළාවූවෙකුට මගකියන්නේ හෝ යම්සේද අන්ධකාරයෙහි ඇස්ඇන්තෝ රූපාදි අරමුණු දකිත්වායි තෙල්පහනක් දරන්නේ හෝ යම්සේද

එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

35. අථ ඛො පුක්කුසො මල්ලපුත්තො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං භණෙ සිඞ්ගිවණ්ණං යුගං මට්ටං ධාරණීයං ආහරාති. එවං භන්තෙති ඛො සො පුරිසො පුක්කුසස්ස මල්ලපුත්තස්ස පටිස්සුත්වා තං සිඞ්ගිවණ්ණං යුගං මට්ටං ධාරණීයං ආහරි. අථ ඛො පුක්කුසො මල්ලපුත්තො තං සිඞ්ගිවණ්ණං යුගං මට්ටං ධාරණීයං භගවතො උපනාමෙසි ඉදං භන්තෙ සිඞ්ගිවණ්ණං යුගං මට්ටං ධාරණීයං. තං මෙ භන්තෙ භගවා පටිග්ගණ්හාතු අනුකම්පං උපාදායාති.

---

එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේවිසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්ම්ය වදාරණ ලද්දේය. මේ මම භාග්‍යවතුන්වහන්සේද නවලොකොත්තර ශ්‍රීසද්ධර්මයද, අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහාසඞ්ඝ රත්නයද, සරණකොටයෙමි. ස්වාමීන්වහන්ස, අදපටන් දිවිහිම්කොට සරණගිය උපාසකයෙකැයි මා භාග්‍යවතුන්වහන්සේ දරාගන්නාසේක්වායි සැලකළේය.

35. ඉක්බිත්තෙන් පුක්කුසනම් මල්‍යරාජපුත්‍රතෙම එක්තරා පුරුෂයෙකු ඇමතුයේය. එම්බල පුරුෂය තෝ යව. ගොස් මාගේ සිඞ්ගීස්වර්ණවර්ණවූ දූරියසුතුවූ මට සිලුටු සිනිඳුවස්ත්‍ර යුගලය ගෙණෙවයි කීයේය. එසේය වහන්සැයි කියා ඒපුරුෂතෙම පුක්කුසනම් මල්‍යරාජ පුත්‍රයාගේ වචනයට ප්‍රතිවචනදී ඒ දූරියයුතුවූ සිංගිවර්ණ වස්ත්‍ර යුගලයගෙණවුත් දුන්නේය. ඉක්බිත්තෙන් පුක්කුසනම් මල්‍යරාජ පුත්‍රතෙම ඒ සිඞ්ගිස්වර්ණවර්ණවූ මට සිලුටු සිනිඳු වස්ත්‍රයුගලයවූභාග්‍යවතුන්වහන්සේට එලවූයේය. ස්වාමීන්වහන්ස, දූරියයුතු මාගේ මේ සිංගිස්වර්ණවර්ණවූ මට සිලුටු සිනිඳුවූ වස්ත්‍රයුගලය ස්වාමීන්වහන්සේ මට අනුකම්පා පිණිස පිළිගෙණ වදාරණසේක්වායි නිමන්ත්‍රණය කෙළේය.

තෙනහි පුක්කුස එකෙන මං අච්ඡාදෙහි. එකෙන. ආනන්දන්ති.එවං භන්තෙති ඛො පුක්කුසො මල්ලපුත්තො භගවතො පටිස්සුත්වා එකෙන භගවන්තං අච්ඡාදෙසි එකෙන ආයස්මන්තං ආනන්දං.

36. අථඛො භගවා පුක්කුසං මල්ලපුත්තං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථඛො පුක්කුසො මල්ලපුත්තො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

37. අථඛො ආයස්මා ආනන්දො අචිරපක්කන්තෙ පුක්කුසෙ මල්ලපුත්තෙ තං සිඞ්ගිවණ්ණං යුගං මට්ටං ධාරණියං භගවතො කායං උපනාමෙසි.

---

පුක්කුස මල්ලරාජ පුත්‍රය එසෙනම් එක්වස්ත්‍රයකින් මා අන්දවව. එකකින් ආනන්දස්ථවිරයන් අන්දවයි වදාළේය. එසේය ස්වාමින් වහන්සැයි පුක්කුස මල්ලරාජ පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ප්‍රතිවචනදී එක්වස්ත්‍රයකින් භාග්‍යවතුන්වහන්සේ ඇන්දවූයේය. එක්වස්ත්‍රයකින් ආයුෂ්මත්ආනන්දස්ථවිරයන් ඇන්දවීය.

36. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පුක්කුසනම් මල්ලරාජ පුත්‍රයාට දැහැමිකථාවෙන් කරුණු දක්වූසේක. එහි සමාදන් කරවූසේක. එහි තෙද ගැන්වූසේක. එහි වැඩියක් සතුටුකරවූසේක. ඉක්බිත්තෙන් පුක්කුස රාජපුත්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේවිසින් ධර්මකථාවෙන් කරුණු දක්වනලද්දේ සමාදන්කරවනලද්දේ තෙද ගන්වනලද්දේ ප්‍රහර්ෂිතකරවනලද්දේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසාවැඳ පැදකුණුකොට ගියේය.

37. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම පුක්කුස මල්ලරාජ පුත්‍රයා ගිය නොබෝකලකින් ඒ මට සිලුටු සිංගීස්වර්ණවර්ණවූ වස්ත්‍රයුගලය භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීදේහයට එළවූයේය.

තං භගවතො කායං උපනාමිතං වීතසිකං විය ඛායති අථඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. අච්ඡරියං භන්තෙ අබ්භූතං භන්තෙ. යාව පරිසුද්ධො භන්තෙ තථාගතස්ස ඡවිවණ්ණො පරියොදාතො. ඉදං භන්තෙ සිඞ්ගිවණ්ණං යුගං මට්ටං ධාරණීයං භගවතො කායං උපනාමෙසිං. තං භගවතො කායං උපනාමිතං වීතසිකං විය ඛායතීති. එවමෙතං ආනන්ද. විසු ඛො ආනන්ද කාලෙසු අතිවිය තථාගතස්සකායොපරිසුද්ධොහොති. ඡවිවණ්ණො පරියොදාතො. කතමෙසු ද්වීසු. යඤ්ච ආනන්ද රත්තිං තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති යඤ්ච රත්තිං තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති. ඉමෙසු ඛො ආනන්ද ද්වීසු කාලෙසු අතිවිය තථාගතස්ස කායො පරිසුද්ධො හොති. ඡවිවණ්ණො, පරියොදාතො.

---

භාග්‍යවතුන්වහන්සේගේශ්‍රීදෙහයට එලවනලදුඒ ස්වර්ණවර්ණවූ වස්ත්‍රයුගලය යම්සේ පහවූ වන්නිශිඛා ඇති වීතාච්චිකාඞ්ගාරයෝතුමූ ඇතුලත්හි ඇතුලත්හිම බබලද්ද ඒ අඞ්ගාර ප්‍රභාවෝතුමූ පිටතට නැද්ද එමෙන් එහි ප්‍රභාවිරහිතව ඇතුලත්හිම විරාජමානව බබලමින් සිටියේය. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේටමෙසේසැලකෙළේය. ස්වාමීන්වහන්ස,ආශ්චර්‍ය්‍යයෙක. ස්වාමීන්වහන්ස, අද්භූතයෙක.ස්වාමීන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේගේ ඡවිවර්ණයතෙම ස්වර්ණවර්ණව සැමකල්හිශුද්ධපිරිසිදුවන්නේය. ස්වාමීන්වහන්ස, මේසිංගිවර්ණවූ මට සිලුටුවූ සිනිඳුවස්ත්‍රයුගලය භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රී ශරීරයට එලවූයේය. භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රී ශරීරයට පලඳවනුලද්දාවූ ඒ වස්ත්‍රයුගලය වීතච්චිකාඞ්ගාරයක්මෙන් දීප්තිමත්ව බබලන්නේයයි සැලකළසේක. ආනන්දය ඒකාරණය එසේමය. ආනන්දය කල්දෙකක්හිම තථාගතයන්වහන්සේගේඡවිවර්ණයතෙමඅතිශයින්පිරිසිදුව බබලන්නේවෙයි ඒකවරනම් කාලදෙකෙක්හිද.ආනන්දයතථාගතතෙමයම්රාත්‍රියෙක්හි නිරුත්තරවූ සම්‍යක්සම්බෝධිය මනාකොට අවබොධ කෙරේද යම් රාත්‍රියෙක්හි තථාගතතෙම නිරුපධිශෙෂනිර්වාණධාතුවෙන් පිරිනිවන් පානාසේක්ද, ආනන්දය මේකාල දෙක්හිම තථාගතයන්වහන්සේගේ ඡවිවර්ණයතෙම අතිශයින් පිරිසිදුව වෙසෙසින් බබලන්නේයයිවදාළසේක.

38. අජ්ජ ඛො පනානන්ද රත්තියා පච්ඡිමෙ යාමෙ කුසිනාරායං උපවත්තනෙ මල්ලානං සාලවනෙ අන්තරෙන යමකසාලානං තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති. ආයාමානන්ද යෙන කකුත්ථා නදී තෙනුපසඞ්කමිස්සාමාති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

සිඞ්ගිවණ්ණං යුගං මට්ටං
පුක්කුසො අභිහාරයි,
තෙන අච්ඡාදිතො සත්ථා
හෙමවණ්ණො අසොභථාති.

39. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන කකුත්ථා නදී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කකුත්ථං නදිං අජ්ඣොගාහෙත්වා නහාත්වා ච පිවිත්වා ච පච්චුත්තරිත්වා යෙන අම්බවනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං චුන්දකං ආමන්තෙසි.

---

38. ආනන්දය, මේ රෑයපිළිබඳවූ පශ්චිමයාමයෙහි කුසිනාරානුවර සමීපයෙහිවූ මල්ලරජ දරුවන්ගේ උපවත්තන නම් සල්වෙනෙහි යමකසාල වෘක්ෂයන් දෙදෙනා අතුරෙහි පණවනලද උතුම්වූ ශ්‍රියහන්හි වැදහෙව තථාගතයන්වහන්සේගේ පිරිනිවන්පෑම වන්නේයයි වදාළසේක. ආනන්දය, එව යම්හ. කකුත්ථානම් නදිය යම්තැනෙක්හිද එතනට එළඹෙම්හයි වදාළසේක. එසේය ස්වාමින්වහන්සැයි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ප්‍රතිවචන දුන්නේය. සිඞ්ගීස්වර්ණවර්ණවූ මට සිලුටුවස්ත්‍ර යුගලයද, අභිහරණය කෙළේය. හෙවත් පිළිගැන්විය. ඒ සිඞ්ගීස්වර්ණවර්ණවූ වස්ත්‍ර යුගලයෙන් අන්දවනලද්දාවූ ශාස්තෘන්වහන්සේ ස්වර්ණවර්ණයෙන් විරාජමානවූසේක් අතිශයින් භ්‍රාජිතවූසේක.

39. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මහත්වූ භික්ෂුසඞ්ඝයා සමග කකුත්ථා නම් ගඞ්ගාතොම යම් තැනකද එතනට එළඹිසේක. එළඹ කකුත්ථානදියට බැස පැන්නහා පැන්පානය කොට එයින් ගොඩ නැගී එම ගංතෙර පිහිටි අඹවනය යම් තැනකද එතනට එළඹිසේක, එළඹ ආයුෂ්මත් චුන්දකස්ථවිරයන්ට අඬගාවදාළසේක.

ඉඞ්ඝ මෙ ත්වං චුන්දක චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙහි කිලන්තොස්මි චුන්දක නිපජ්ජිස්සාමීති. එවම්භන්තෙති ඛො ආයස්මා චුන්දකො භගවතො පටිස්සුත්වා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙසි.

40. අථ ඛො භගවා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා, ආයස්මා පන චුන්දකො තත්ථෙව භගවතො පුරතො නිසීදි.

41. ගන්ත්වාන බුද්ධො නදියං කකුත්ථං
අච්ඡොදිසා තොදික විප්පසන්නං;
ඔගාහි සත්ථා සුකිලන්තරූපො
තථාගතො අප්පටිමොව ලොකෙ.

එම්බා චුන්දකය. තෙපි මාගේ සඟල සිවුර සතර පටින් ආසනයක් කොට පණවව; චුන්දකය. ක්ලාන්තවීමි. සයනය කෙරෙමියි. වදාළසේක. එසේය ස්වාමීන් වහන්සැයි ආයුෂ්මත් චුන්දකස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ප්‍රතිවචනදී සඟලසිවුර සතර පටින් ආසනයක් කොට පැණවූසේක.

40. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ දකුණු ශ්‍රීපාදය මස්තකයෙහි වාම ශ්‍රීපාදය තබමින් සිහියෙන් යුක්තව දැනම මෙයින් නැඟිසිටිමි යන සිතින් යුක්තව දකුණැලයෙන් උතුම්වූ සිංහසෙය්‍යාවෙන් සැතපී වදාළ සේක. ආයුෂ්මත් චුන්දක ස්ථවිරයන් වහන්සේද; එතැන් හිම භාග්‍යවතුන් වහන්සේගේ පෙරටුව උන්නේය.

41. මේ සර්වලොකයෙහි තමන් වහන්සේ හා සදෘශවූ අන්පුද්ගලයක්හු නැති බැවින් අප්‍රති පුද්ගලවූ තථාගතත්වාදී කාරණයෙන් යුක්තවූ සර්වඥතෙම පැහැදිදියඇත්තාවූ රසවත්වූ මිහිරිපැන්ඇත්තාවූ විශෙෂයෙන් ප්‍රසන්නව පැහැදි දිය ඇත්තාවූ කකුත්ථා නම් ගංගාව කරා එළඹ අතිසේක්ම ක්ලාන්ත ස්වරූප ඇත්තාවූ ශාස්තෘවූ බුදුරජතෙම ගඞ්ගා ජලයෙහි නිමග්නවූසේක.

නහත්වා පීත්වා චුදතාරි සත්ථා
පුරක්ඛතො භික්ඛුගණස්ස මජ්ඣෙ,

සත්ථා පවත්තා භගවා ‘ධ ධම්මෙ
උපාගමි අම්බවනං මහෙසී.

ආමන්තයී චුන්දකං නාම භික්ඛුං
චතුග්ගුණං සන්ථර මෙ නිපජ්ජං

සොමොදිතො භාවිතත්තෙන චුන්දො
චතුග්ගුණං සන්ථරි ඛිප්පමෙව

නිපජ්ජි සත්ථා සු කිලන්තරූපො
චුන්දෙපි තත්ථපමුඛෙ නිසීදි.

42. අථඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. සියාඛො පනානන්ද චුන්දස්ස කම්මාරපුත්තස්ස කොචි විප්පටිසාරං උපද හෙය්‍ය තස්ස තෙ ආවුසො චුන්ද අලාභා තස්ස තෙ දුල්ලද්ධං යස්ස තෙ තථාගතො පච්ඡිමං පිණ්ඩපාතං භුඤ්ජිත්වා පරිනිබ්බුතොති.

---

ජලස්නානයකොටද පැන්පානය කොටද භික්ෂුසඞ්ඝයා වහන්සේගේ මධ්‍යයෙහිශාස්තෲවූබුදුරජතෙම ගඟින්ගොඩනැඟීවදාළසේක. ශාසන ධර්‍මයන්පවත්වන ලද්දාවූ මහෙසීවූ භාග්‍ය වත්වූ ශාස්තෲන්වහ න්සේ භික්ෂු සඞ්ඝයාවිසින් පිරිවරණ ලදුව. එම ගඞ්ගා තීරයෙ හිවූ අඹවනයට පිවිසිසේක. පිවිසචුන්‍දක නම්වූ භික්ෂුහට ඇමතූසේක. මට වැදහෝනා පිණිස සඟල සිවුර සතරපටින් ආසනයක් කොට අතුරව. සතුටුවනලද සිත් ඇති ඒ චුන්‍දකස්ථවිරතෙම පෙර පුරුදු බැවින් වහාම සඟල සිවුර සතරපටින් ආසනයක් කොට පැණවූ සේක. අතිසයින් ක්ලාන්ත ස්වරූප ඇති ශාස්තෲන් වහන්සේ පණ වනලද ඒ ආසනයෙහි වැදහොත් සේක. චුන්‍දකස්ථවිරතෙමේද ඒ වැදහොත්නාවූ ශාස්තෲන් වහන්සේගේ අභිමුඛයෙහිම උන්සේක.

42. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයන් ආමන්ත්‍රණය කරවදාළ සේක. ආනන්‍දය, චුන්‍දනම් කර්‍මා රපුත්‍රයාහට කිසියම් විපිළිසරයෙක්වන්නේ නම් එය මෙසේ දුරුක රව. ඇවැත්වූ චුන්‍ද නම් කර්‍මාරපුත්‍රය, යම්බඳුවූ තාගේ පශ්චිම පිණ්ඩ පාතය වළඳා තථාගතයන්වහන්සේ පරිනිවන්පෑයේයයි කියාසි.

චුන්දස්ස ආනන්ද කම්මාරපුත්තස්ස එවං විප්පටිසාරො පටිවිනෙතබ්බො. තස්ස තෙ ආවුසො ලාභා තස්ස තෙ සුලද්ධං යස්ස තෙ තථාගතො පච්ඡිමං පිණ්ඩපාතං භුඤ්ජිත්වා පරිනිබ්බුතො. සම්මුඛා මෙතං ආවුසො චුන්ද භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං ද්වෙ මෙ පිණ්ඩපාතා සමසම ඵලා සම සම විපාකා අතිවිය අඤ්ඤෙහි පිණ්ඩපාතෙහි මහප්ඵලතරාච මහානිසංසතරාච. කතමෙ ද්වෙ යඤ්ච පිණ්ඩපාතං භුඤ්ජිත්වා තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති යඤ්ච පිණ්ඩපාතං භුඤ්ජිත්වා තථාගතො අනුපාදිසෙසාය. නිබ්බාණධාතුයා පරිනිබ්බායති. ඉමෙ ද්වෙ පිණ්ඩපාතා සම සම ඵලා සම සම විපාකා අතිවිය අඤ්ඤෙහි පිණ්ඩපාතෙහි මහප්ඵලතරාච මහානිසංසතරාච.

---

ඒතට අලාභයෙක් වූයේයයිද ඒතාගේ මිනිසත්බව නපුරුකොට ලබනලද්දේයයි කියාද විපිළිසරයෙක් වීනම් ආනන්දය චුන්දනම් කර්මාරපුත්‍රයාගේ ඒ විපිළිසරය මෙපරිද්දෙන් ප්‍රතිවිනොදනය කටයුත්තේය. යම්බඳුවූ තාගේ පශ්චිම පිණ්ඩ පාතය වළඳ තථාගතයන් වහන්සේ පිරිනිවන් පා වදාළසේක්ද. ඒතට ලාභයෙක් වන්නේය. කුසලකර්මයෙන් ලබනලද ඒතාගේ මනුෂ්‍යත්වයද මනාකොට ලබන ලද්දේ නම් වන්නේය. ඇවැත්වූ චුන්දනම් කර්මාරපුත්‍රය; සදෘශවූ දානඵල ප්‍රදානය කරන්නාවූ සමසම විපාකඇත්තාවූ අනික්නුත් පිණ්ඩ පාතයන්ට වඩා අතිශයින් මහත්ඵල මහානිසංසතරවූ පිණ්ඩ පාතයෝ මොහු දෙදෙනෙක් වන්නාහුයයි කියා භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙන්ම මාවිසින් අසනලද්දේය. භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙන්ම පිළිගන්නා ලද්දේය. ඒ පිණ්ඩ පාතවයනම් කවරේද, තථාගතතෙම යම් පිණ්ඩපාතයක් වළඳ නිරුත්තරවූ සම්‍යක්සම්බොධිය මනාකොට අවබොධ කිරීම් වශයෙන් ලොව්තුරා බුදුවූ සේක්ද. යම් බඳු පිණ්ඩපාතයක් වළඳ තථාගතොත්තමතෙම නිරුපධිශෙෂනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පාවදාරණසේක්ද. යන මේ පිණ්ඩපාත දෙකයි. මේ දෙකසමසමවූ ඵලවිපාකානිසංස ඇතිවන්නාහුය. සෙසු පිණ්ඩපාතයන්ට වඩා අතිශයින් මහත් ඵල මහානිසංස විපාකතර වන්නේමය.

ආයු සංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතං. වණ්ණසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාර පුත්තෙන කම්මං උපචිතං. සුඛසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාර පුත්තෙන කම්මං උපචිතං. යසසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතං. සග්ගසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතං. ආධිපතෙය්‍යසංවත්තනිකං ආයස්මතා චුන්දෙන කම්මාරපුත්තෙන කම්මං උපචිතන්ති. චුන්දස්ස ආනන්ද කම්මාරපුත්තස්ස එවං විප්පටිසාරො පටිවිනෙතබ්බොති. අථඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි

---

එහෙයින් ආයුෂ්මත්වූ චුන්දනම් කර්මාරකුල පුත්‍රයාවිසින් ආයුෂය පිණිස පවත්නා කුසලකර්මයක් රැස්කරණ ලද්දේය. ආයුෂ්මත් චුන්ද කර්මාරපුත්‍රයාවිසින් ශ රී ර ව ර්‍ණ ය පිණිස පවත්නාවූ කුසල කර්මයක් රැස්කරණලද්දේය. ආයුෂ්මත් චුන්දකර්මාරපුත්‍රයාවිසින් දිව්‍ය මනුෂ්‍යාදි සුඛසම්පත්තියපිණිස ප ව ත් නා වූ කුසලකර්මයක් රැස් කරණලද්දේය. ආයුෂ්මත් චුන්දකර්මාර පුත්‍රයාවිසින් පිරිවර සම්පත්තිය පිණිස පවත්නාවූ කුසලකර්මයක් රැස්කරණ ලද්දේය. ආයුෂ්මත් චුන්දකර්මාරපුත්‍රයාවිසින් ස්වර්ගසම්පත්ති ප්‍රතිලාභයපිණිස පවත්නාවූ කුසලකර්මයක් රැස්කරණලද්දේය. ආයුෂ්මත් චුන්දකර්මාරපුත්‍රයාවිසින් අධිපතිභාවයපිණිස පවත්නාවූ කුසලකර්මයක් රැස්කරණ ලද්දේය. ආනන්දය, චුන්දනම්කර්මාරපුත්‍රයාගේ විපිළිසරය මේ යථොක්තවූ ධර්මදෙශනාවෙන් දුරුකටයුත්තේයයි වදාළසේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මෙසේ ඒ කර්මාරපුත්‍රයාගේ විපිළිසර විනොදනය දැනවදාරා ඒ වේලාවෙහි මේ මතුකියන උදාන ගාථාවෙන් මෙසේ උදන් අනා වදාළ සේක.

දදතොපුඤ්ඤං පවඩ්ඪති
සඤ්ඤමතො වෙරං න චියති
කුසලොච ජහාති පාපකං
රාගදොසමොහක්ඛයා සනිබ්බුතොති.

ආළාරවෙදල්ල භාණවාරං
නිඨිතං චතුත්‍ථං.

**5.** 1. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ආයාමානන්ද යෙන හිරඤ්ඤවතියා නදියා පාරිමතීරං යෙන කුසිනාරා උපවත්තනං මල්ලානං සාලවනං තෙනුපසඞ්කමිස්සාමාති. එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන හිරඤ්ඤවතියා නදියා පාරිමතීරං යෙන කුසිනාරා උපවත්තනං මල්ලානං සාලවනං තෙනුපසඞ්කමි.

---

දන්දෙන්නාහට පුණ්‍යවර්ධනය වන්නේය. ශීල සංයමයෙන් සංවරණය කරන්නාහට වෛරය නොවැඩෙන්නේය. ඥානසම්පන්න පුද්ගලතෙම ලාමකවූ අකුසලය දුරුකරන්නේය. රාගද්වේෂමොහාදි සකල ක්ලෙශයන්ගේ ක්‍ෂයකිරීම හෙතුකොටගෙණ ඒ තථාගත තෙම ක්ලෙශපරිනිර්වාණයෙන් පිරිනිවීසේකැයි වදාළසේක.

සතරවෙනිවූ ආළාර වෙදල්ල බණවර මෙතෙකින්
කියා නිමවනලදි.

**5.** I. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ආමන්ත්‍රණයකර වදාළසේක. ආනන්දය, එව. යම්හ. හිරඤ්ඤවතීනම් ගඞ්ගාහුගේ පරතෙර යම්තැනෙක්හිද කුසිනාරා නුවර මල්ලරජුන්ගේ උපවත්තනනම්වූ සල්වනඋයන යම් තැනෙක්හිද එතනට එලඹෙම්හයි වදාළසේක. එසේය ස්වාමීන් වහන්සැයි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචන දුන්නේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මහත් භික්‍ෂුසඞ්ඝයා සමග හිරඤ්ඤවතීනම් ගඞ්ගාවගේ පරතෙර යම්තැනකද කුසිනාරානුවර මල්ලරජුන්ගේ උපවත්තනම් සල්වන උයන යම් තැනකද එතනට එළඹිසේක.

උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද අන්තරෙන යමකසාලානං උත්තරසීසකං මඤ්චකං පඤ්ඤපෙහි. කිලන්තොʼස්මි ආනන්ද නිපජ්ජිස්සාමීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා අන්තරෙන යමකසාලානං උත්තරසීසකං මඤ්චකං පඤ්ඤපෙසි. අථ ඛො භගවා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො.

2. තෙන ඛො පන සමයෙන යමකසාලා සබ්බඵාලිඵුල්ලා හොන්ති අකාලපුප්ඵෙහි. තෙ තථාගතස්ස සරීරං ඔකිරන්ති අජ්ඣොකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි මන්දාරවපුප්ඵානි අන්තලික්ඛා පපතන්ති. තානි තථාගතස්ස සරීරං ඔකිරන්ති.

---

එලඹ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට ආමන්ත්‍රණයකර වදාළසේක. ආනන්දය, තෙපි මට තරුණසල්රුක් දෙදෙනා අතුරෙහි උතුරුදිගට හිසකොට අස්නක් පණවව. ආනන්දය, ක්ලාන්තයෙමි. සයනය කරන්නෙමියි වදාළසේක. එසේය ස්වාමින්වහන්සැයි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචනදී යමකසාලවෘක්ෂයන් අතුරෙහි උත්තරශීර්ෂකොට අස්නක් පැණවූසේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ දකුණු ශ්‍රීපාද මස්තකයෙහි වාම ශ්‍රීපාදය තබා සිහියෙන් යුක්තව දැනව දකුණැලයෙන් සිංහසය්‍යාවෙන් සයනයකළසේක.

2. එසමයෙහිදී යමකසාලවෘක්ෂයෝ අකාලපුෂ්පයෙන් සියලු අතුවෙළෙප් නොහැර පිපුනු මල් ඇතිවූහ. ඒ යමකසාලවෘක්ෂයෝ තථාගතයන්වහන්සේගේ ශරීරයෙහි මල් වගුරුවන්නාහුය. බොහොසෙයින්ම මල්අතුලාක්මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන් හාත්පස මල්වගුරුවන්නාහුය. තථාගතයන්වහන්සේට පුජාපිණිස දිව්‍යමයවූ පරසතුමදුරු මල්ද අහසින් වැටෙන්නාහුය. ඒ අහසින් එන්නාවූ දිව්‍යපුෂ්පයෝද තථාගතයන්වහන්සේගේ ශරීරයෙහිම වැගිරෙන්නාහුය.

අපෙක්ඛාකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි චන්දන චුණ්ණානි අන්තලික්ඛා පපතන්ති. තානි තථාගතස්ස සරීරං ඔකිරන්ති අජ්ඣොකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි තුරියානි අන්තලික්ඛෙ වජ්ජෙන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි සඞ්ගීතානි අන්තලික්ඛෙ වත්තන්ති තථාගතස්ස පූජාය.

3. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. සබ්බඵාලි ඵුල්ලා ඛො ආනන්ද යමකසාලා අකාලපුප්ඵෙහි තථාගතස්ස සරීරං ඔකිරන්ති. අජ්ඣොකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි මන්දාරවපුප්ඵානි අන්තලික්ඛා පපතන්ති. තථාගතස්ස සරීරං ඔකිරන්ති අජ්ඣොකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස පූජාය.

---

බොහෝසෙයින් මල්අතුලාක්මෙන් වගුරුවන්නානාහුය. නිරන් තරයෙන් හාත්පස වගුරුවන්නාහුය. තථාගතයන්වහන්සේට පූජාපිණිස දිව්‍යමයවූ චන්දනචූර්ණයෝද අහසින් හෙන්නාහුය. ඒ දිවසඳුන් සුණුද තථාගතයන්වහන්සේගේ ශරීරයෙහිම වැගි රෙන්නාහුය. බොහෝසෙයින්ම සඳුන්සුණු අතුලාක්මෙන් වගුරු වන්නාහුය. නිරන්තරයෙන් හාත්පස වගුරුවන්නාහුය. තථාගත යන්වහන්සේට පූජාපිණිස දිව්‍යමයවූ පඤ්චතූර්‍ය්‍ය භාණ්ඩයෝද අව කාශයෙහි ශබ්දවත්නාහුය. තථාගතයන්වහන්සේට පූජාපිණිස දිව්‍ය මය සඞ්ගීතිහුද අහසෙහි පවත්නාහුය.

3. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් ආනන්දස්ථවිර යන්ට අඬගා වදාළසේක. ආනන්දය, යමකසාලවෘක්ෂයෝ අකාලපුෂ් පයෙන් සියලු වෙළෙප් නොහැර පිපුනු මල්ඇත්තෝ තථාගතයන් වහන්සේගේ ශරීරයෙහි මල්වගුරුවන්නාහ. බොහෝසෙයින්ම මල් අතුලාක්මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන් හාත්පස මල් වගුරුවන්නාහුය. තථාගතයන්වහන්සේට පූජාපිණිස දිව්‍යමයවූ පර සතුමදුරු මල්ද අහසින් වැටෙන්නාහ. ඒ අහසින් එන්නාවූ දිව්‍යපුෂ් පයෝද තථාගතයන්වහන්සේගේ ශරීරයෙහි වැගිරෙන්නාහ. බොහෝසෙයින් මල්අතුලාක්මෙන් වගුරුවන්නාහුය. නිරන්තර යෙන් හාත්පස වගුරුවන්නාහුය.

දිබ්බානිපි චන්දචුණ්ණානි අන්තලික්ඛා පපතන්ති. තථාගතස්ස
සරීරං ඔකිරන්ති අජ්ඣොකිරන්ති අභිප්පකිරන්ති තථාගතස්ස
පූජාය. දිබ්බානිපි තුරියානි අන්තලික්ඛෙ වජ්ජන්ති තථාගතස්ස පූජාය.
දිබ්බානිපි සඞ්ගීතානි අන්තලික්ඛෙ වත්තන්ති තථාගතස්ස පූජාය.
න ඛො ආනන්ද එත්තාවතා තථාගතො සක්කතො වා හොති ගරු
කතො වා මානිතො වා පූජිතො වා අපචිතො වා. යො ඛො ආනන්ද
භික්ඛු වා භික්ඛුනී වා උපාසකො වා උපාසිකා වා ධම්මානුධම්මපටි
පන්නො විහරති සාමීචිපටිපන්නො අනුධම්මචාරී. සො තථාගතං
සක්කරොති ගරුකරොති මානෙති පූජෙති පරමාය පූජාය. තස්මා
තිහානන්ද ධම්මානුධම්මපටිපන්නා විහරිස්සාම සාමීචිපටිපන්නා
අනුධම්මචාරිනොති. එවං හි වො ආනන්ද සික්ඛිතබ්බන්ති.

---

තථාගතයන්වහන්සේට පූජාපිණිස දිවසඳුන්සුණුද අහසින්
හෙන්නාහ. ඒ දිවසඳුන්සුණුද තථාගතයන්වහන්සේගේ ශරීර
යෙහිම වැගිරෙන්නාහ. බොහෝසෙයින් සඳුන්සුණු අතුළාක්
මෙන් වගුරුවන්නාහුය. නිරන්තරයෙන් හාන්පස වගුරුවන්
නාහුය. තථාගතයන්වහන්සේට පූජාපිණිස දිව්‍යමයවූ පඤ්ච
තූර්‍ය්‍ය භාණ්ඩයෝද අහසෙහි ශබ්දවන්නාහුය. තථාගතයන්
වහන්සේට පූජාපිණිස දිව්‍යමය සඞ්ගීතිහුද අහසෙහි පවත්නාහුය.
ආනන්දය, මෙපමණ පූජාවෙන් තථාගතතෙම සත්කාරකරණලද්දේ
නම් නොවන්නේය. ගරුකරණලද්දේද නොවන්නේය. බුහුමන්
කරණලද්දේත් නොවන්නේය. පූජාකරණලද්දේත් නොවන්නේය,
උපස්ථානකිරීම් වශයෙන් පුදනලද්දේත් නොවන්නේය. ආනන්දය.
යම්කිසි භික්ෂුකෙනෙක් හෝ භික්ෂුනියක් හෝ උපාසකයෙක් හෝ
උපාසිකාවක් හෝ නවවිධවූ ලොකොත්තරධර්‍මයට අනුධර්‍මවූ පූර්‍ව
භාග ප්‍රතිපත්තියට පැමිණ වාසයකරන්නේ වේද, සාමීචි ප්‍රතිපදා
වට පිළිපන්නේ වේද, අනුධර්‍මචාරිවූයේ වේද. ඒ පුද්ගලතෙම තථා
ගතයන්වහන්සේට සත්කාරකරන්නේනම් වෙයි. ගරුකාරම්න්
සිහින් බුහුමන්කරන්නේද වෙයි. පූජාකරන්නේද වෙයි, උතුම්වූ
ප්‍රතිපත්ති පූජාවෙන් පුදන්නේද වෙයි. ආනන්දය, එහෙයින් ධර්‍මානු
ධර්‍ම ප්‍රතිපත්තියෙන් යුක්තව වාසයකරම්හයි සාමීචිප්‍රතිපදාවට පැමිණ
අනුධර්‍මචාරිව වාසයකරම්හයි කියා තොපවිසින් මෙසේ හික්මියයුතු
වන්නේයයි වදාළසේක,

4. තෙන ඛො පන සමයෙන ආයස්මා උපවාණො භගවතො පුරතො ඨිතො හොති භගවන්තං වීජයමානො. අථ ඛො භගවා ආයස්මන්තං උපවාණං අපසාදෙසි, අපෙහි භික්ඛු මා මෙ පුරතො අට්ඨාසිති. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි, අයං ඛො ආයස්මා උපවාණො දිඝරත්තං භගවතො උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී. අථච පන භගවා පච්ඡිමෙ කාලෙ ආයස්මන්තං උපවාණං අපසාදෙසි. අපෙහි භික්ඛු මා මෙ පුරතො අට්ඨාසිති. කොනු ඛො හෙතු කො පච්චයො යං භගවා ආයස්මන්තං උපවාණං අපසාදෙසි. අපෙහි භික්ඛු මා මෙ පුරතො අට්ඨාසිති.

5. අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච, අයං භන්තෙ ආයස්මා උපවාණො දිඝරත්තං භගවතො උපට්ඨාකො,

---

4. එසමයෙහි ආයුෂ්මත් උපවාණ ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට පවන්සලමින් භාග්‍යවතුන්වහන්සේගේ අභිමුඛයෙහි සිටියේ වෙයි. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් උපවාණ ස්ථවිරයන් මහණ තෝ මාගේ ඉදිරියෙහි නොසිට පහවෙවයි කියා පහකරවා වදාළසේක. එකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට මෙසේවූ සිතිවිල්ලෙක් වූයේය. මේ ආයුෂ්මත් උපවාණස්ථවිරතෙම ඉතා බොහෝකලක් භාග්‍යවතුන්වහන්සේට උපස්ථානකළ කෙනෙක, සමීපයෙහි කැටිව හැසුරුනේය. එසේදවුවත් භාග්‍යවතුන්වහන්සේ දැන් මේ පශ්චිමකාලයෙහි මහණ, මාගේ ඉදිරියෙහි නොසිට පහවෙවයි ආයුෂ්මත් උපවාණස්ථවිරයන් පහකර වදාළසේක. ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද, භාග්‍යවත්තෙම මහණ, මාගේ ඉදිරියෙහි නොසිට පහවෙවයි කියා යම්බඳුවූ මේ ආයුෂ්මත් උපවාණස්ථවිරයන් පහකර වදාළසේක්දැයි කියා සිතුයේය.

5. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළසේක. ස්වාමීන්වහන්ස; මේ ආයුෂ්මත් උපවාණ ස්ථවිරතෙම බොහෝකලක් භාග්‍යවතුන්වහන්සේට උපස්ථාන්කළේය.

---

සන්තිකාවචරො සම්පචාරි. අථච පන භගවා පච්ඡිමෙ කාලෙ ආයස්මන්තං උපවාණං අපසාදෙති. අපෙහි භික්ඛු මා මෙ පුරතො අට්ඨාසීති. කොනු ඛො භන්තෙ හෙතු කො පච්චයො යං භගවා ආයස්මන්තං උපවාණං අපසාදෙසි අපෙහි භික්ඛු මා මෙ පුරතො අට්ඨාසීති, යෙභුය්‍යෙන ආනන්ද දසසහස්සි ලොකධාතුසු දෙවතා සන්නිපතිතා තථාගතං දස්සනාය. යාවතා ආනන්ද කුසිනාරා උපවත්තනං මල්ලානං සාලවනං සමන්තතො ද්වාදසයොජනානි නත්ථි සො පදෙසො වාලග්ගකොටිනිත්තුදනමත්තොපි මහෙසක්ඛාහි අප්ඵුටො. දෙවතා ආනන්ද උජ්ඣායන්ති දූරාචවතම්හා ආගතා තථාගතං දස්සනාය. කදාචි කරහචි තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මා සම්බුද්ධා. අජ්ජච රත්තියා පච්ඡිමෙ යාමෙ තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති. අයඤ්ච මහෙසක්ඛො භික්ඛු.

---

සමීපයෙහි හැසිරෙන්නේ සමග හැසුරුණසේක. එසේනමුත් භාග්‍යවතුන්වහන්සේ පශ්චිම කාලයෙහි උපවාණ ආයුෂ්මතුන් පහකළසේක; මහණ, පහවෙව. මාගේ ඉදිරියෙහි නොසිටුවයි කියායි. මහණ, මාගේ ඉදිරියෙහි නොසිට පහවෙවයි. යම්හෙයකින් භාග්‍යවතුන්වහන්සේ උපවාණ ආයුෂ්මතුන් පහකළසේක්ද, ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේදැයි විචාළසේක. ආනන්දය, දසදහසක් ලෝදූහි දෙවියෝ තථාගතයන්වහන්සේ දක්නාපිණිස බොහෝසෙයින්ම රැස්වූහ. ආනන්දය, කුසිනාරානුවර පවත් මල්ලරජුන්ගේ උපවත්තනනම් සල්වන උයන දක්වා යම්තාක් හාත්පසින් දොළොස්යොදනක් පමණ වේද්ද, ඒ සියලුතන්හි අස්ලොමුඅගක් හෙලාලන පමණවූද හිස් ප්‍රදේශයක් නැන්නේය. ආනන්දය, මහේශාක්‍යදෙවියන්විසින් ගැවසිගන්නාලද්දේය. ආනන්දය, දෙවියෝ මෙසේ හෙලාදකින්නාහුය. තථාගතයන්වහන්සේ දක්නට ඉතා දුරසිට ආයෙමු. මේ ලොකයෙහි අභිත්සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්වහන්සේලා කිසියම් දිඝීකාලයකින්ම උපදනාහුය. මේ රැය පිළිබඳ පැසුලු යාමෙහි තථාගතයන්වහන්සේගේ පිරිනිවන් පැමද වන්නේය. මේ මහෙශාක්‍යවූ භික්ෂුතෙමේද.

භගවතො පුරතො ඨිතො ඔවාරෙන්තො. න මයං ලභාම පච්ඡිමෙ කාලෙ තථාගතං දස්සනායාති දෙවතා ආනන්ද උජ්ඣායන්තීති.

6. කථං භූතාපන භන්තෙ භගවා දෙවතා මනසි කරොන්තීති. සන්තා'නන්ද දෙවතා ආකාසෙ පඨවි සඤ්ඤිනියො. කෙසෙ පකිරිය කන්දන්ති බාහාපග්ගය්හ කන්දන්ති ඡිණ්ණපපාතං පපතන්ති ආවට්ටෙන්ති විවට්ටෙන්ති. අතිඛිප්පං භගවා පරිනිබ්බායිස්සති අතිඛිප්පං සුගතො පරිනිබ්බායිස්සති අතිඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරධායිස්සතීති. සන්තා'නන්ද දෙවතා පඨවියා පඨවිසඤ්ඤිනියො කෙසෙ පකිරිය කන්දන්ති බාහාපග්ගය්හ කන්දන්ති ඡිණ්ණපපාතං පපතන්ති ආවට්ටෙන්ති විවට්ටෙන්ති.

---

භාග්‍යවතුන්වහන්සේගේ අභිමුඛයෙහි අවුරාගෙණ සිටියේය. අපි පශ්චිමකාලයෙහි තථාගතයන්වහන්සේ දක්නට නොලබම්හයි කියා ආනන්දය, දෙවියෝ හෙලාදකිත්යයි වදාළසේක.

6. ස්වාමිනි භාග්‍යවතුන්වහන්සේ මෙබඳුවූ දෙවිකෙනෙක් මෙනෙහිකරණසේක්දැයි විචාළසේක. ආනන්දය, ආකාශයෙහි පෘථිවිය යන සංඥාඇති දෙවතාවෝ ඇත්තාහ. ඒ දෙවතාවෝ භාග්‍යවතුන්වහන්සේ ඉතා වහාම පිරිනිවන්පාවදාරණසේකැයි කියා හිසකෙස් විසුරුවාගෙණ හඬත්නාහ. සුගතොත්තමයානන්වහන්සේ ඉතා වහාම පිරිනිවන්පාවදාරණසේකැයි කියා හිස අත්බැඳගෙණ මහාසෝකිව හඬන්නාහ. සර්වලෝකයා හට අසහාය චක්ෂුභූත විශුද්ධවූ බුද්ධනැමති ඇස ඉතාඉක්මණින් අතුරුදහන්වන්නේයයිකියා මැදින් කැඩුනාක් නොයෙක්තැන වැටෙන්නාහුය. පෘථිවියෙහි වැටී පෙරළෙමින් වැටුනුතැනටම එන්නාහ. පෘථිවියෙන් ප්‍රපතිත ස්ථානයෙන් පෙරළෙමින් හඬාගෙණ අපරභාගයට යත්නාහුය. ආනන්දය, පෘථිවියෙහි පෘථිවිසංඥාඇති දෙවිකෙනෙක් ඇත්තාහ. ආනන්දය, භාග්‍යවතුන්වහන්සේ ඉතා වහාම පිරිනිවන්පාවදාරණසේකැයි කියා පොළවෙහි පෘථිවිසංඥාඇති ඒ දෙවතාවෝ කෙස් විසුරුවාගෙණ හඬත්. හිස අත් බැඳගෙණ හඬත්. මහා ප්‍රපාතයක වැටුනාක්මෙන් බලවත් ශෝකයෙන් පෙරළෙත්. ඔබ්මොබ පෙරළෙත්. කවරහෙයකින්දයත්.

අතිඛිප්පං භගවා පරිනිබ්බායිස්සති අතිඛිප්පං සුගතො පරිනිබ්බායිස්සති, අති ඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරධායිස්සතීති' යා පන තා දෙවතා විතරාගා තා සතා සම්පජානා අධිවාසෙන්ති අනිච්චා සඞ්ඛාරා තං කුතෙ'ත්ථ ලබ්භාති.

7. පුබ්බෙ භන්තෙ දිසාසු වස්සං වුත්ථා භික්ඛූ ආගච්ඡන්ති තථාගතං දස්සනාය තෙ මයං ලභාම මනොභාවනීයෙ භික්ඛූ දස්සනාය. ලභාම පයිරුපාසනාය. භගවතො පන මයං භන්තෙ අච්චයෙන න ලභිස්සාම මනොභාවනීයෙ භික්ඛූ දස්සනාය. න ලභිස්සාම පයිරුපාසනායාති.

8. චත්තාරි'මානි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි, කතමානි චත්තාරි.

---

ඉතා ඉක්මණට භාග්‍යවතුන්වහන්සේ පරිනිර්වාණය කරන්නේය. සුගතයන්වහන්සේ ඉතා ඉක්මණට පරිනිර්වාණය කරන්නේය. ඉතා ඉක්මණින් මුලුලෝවැස්සන්ගේ බුඩනැමැති ඇස ලෝකයෙහි අතුරුදහන්වන්නේය කියායි. අනාගාමි ක්ෂිණාශ්‍රවවූ යම් දෙවි කෙනෙක් ඇද්ද ඒ දෙවියෝ සියලුසංස්කාර ධර්මයෝම අනිත්‍යවන්නාහුය. ඒ මෙතැන්හි සපිරව කොහින් ලබමෝද්දැයි සිහිඇයන් යුක්තව දැනම සොක ඉවසන්නාහුය.

7. ස්වාමින්වහන්ස, පූර්වයෙහි ඒ ඒ දිශාවන්හි වස්එලඹියාවූ භික්ෂූහු තථාගතයන්වහන්සේ දක්නාපිණිස එන්නාහුය. අපිසිතින්වඩනලද මෛත්‍රීභාවනාදිය ඇති ඒ භික්ෂූන් දකින්ටදලබමු. පයුරුපාසනය කරන්ටද අපිලබම්හ. ස්වාමින්වහන්ස, භාග්‍යවතුන්වහන්සේගේඇවෑමෙන් අපි මෛත්‍රීභාවනාදියෙහි යෙදී වාසයකරන්නාවූ ඒ භික්ෂූන් වහන්සේලා දැකීමට නොලබම්හ. පයුරුපාසනය කරන්නටද අපි නොලබම්හයි සැලකළසේක.

8. ආනන්දය, ශ්‍රද්ධාවත්ත පුද්ගලයාවිසින් දැකීමට සුදුසුවූද, දැක සංවෙගඉපදවීමට හේතුවූද, මේ කාරණයෝ සතර දෙනෙක් වන්නාහුය. ඒ සතර කාරණයෝ කවරහුදයත්,

ඉධ තථාගතො ජාතොති ආනන්ද සද්ධස්සකුලපුත්තස්ස දස්සනීයංසංවෙජනීයංඨානං, ඉධ තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉධතථාගතෙනඅනුත්තරං ධම්මචක්කං පවත්තිතන්ති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉධ තථාගතො අනුපාදිසෙසායනිබ්බාණධාතුයා පරිනිබ්බුතොති ආනන්ද සද්ධස්සකුලපුත්තස්ස දස්සනීයංසංවෙජනීයං ඨානං, ඉමානිඛො ආනන්ද චත්තාරි සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි. ආගමිස්සන්තිඛො ආනන්ද සද්ධා භික්ඛුභික්ඛුනියො උපාසක උපාසිකායො, ඉධ තථාගතො ජාතොතිපි ඉධ තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොතිපි ඉධ තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතන්තිපි.

---

ආනන්දය, මෙහි තථාගතතෙමඋපන්නේය, යනුඅසා ශ්‍රද්ධාවන්තකුලපුත්‍රයාහට දශිනියවූ සංවෙග උපදින්නේවෙයි, මේපළමුවෙනි කාරණයනම් වන්නේය. මෙහිතථාගතතෙම නිරුත්තරවූසම්‍යක් සම්බොධිය අවබොධකරවදාලසේකැ යනු අසා ශ්‍රද්ධාවන්තකුලපුත්‍රයාහටදශීනියවූසංවෙගඋපදින්නේයි. මේ දෙවෙනිවූකාරණයනම් වන්නේය. ආනන්දය, මෙහි තථාගතයානන්විසින්නිරුත්තරවූ ධම්චක්‍රය පවත්වනලද්දේයයි ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාහට දශීනියවූ, සංවෙග උපදින්නේවෙයි. මේතුන්වෙනිවූ කාරණය වන්නේය. ආනන්දය, මෙහි තථාගතතෙම නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පාවදාළසේකැ යනු අසා ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාහට දශීනියවූ සංවෙග උපදින්නේය. මේසතරවෙනිවූ කාරණයනම් වන්නේය. ආනන්දය ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාහට දශිනියවූ සංවෙග උපදින්නාවූ මේසතර කාරණයෝ වන්නාහුයයි වදාළසේක. ආනන්දය, මෙහි තථාගතතෙම ලොව උපන්නේයයි කියාද, මෙහි තථාගතතෙම නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධකර වදාළසේකැයිද, මෙහි තථාගතයන්වහන්සේවිසින් නිරුත්තරවූ ධම්චක්‍රය පවත්වන ලද්දේයයි කියාද,

ඉධ තථාගතො අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා පරිනිබ්බු තොතිපි. යෙහි කෙචි ආනන්ද චෙතියචාරිකං ආහිණ්ඩන්තා පසන්න චිත්තා කාලං කරිස්සන්ති, සබ්බෙ තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජිස්සන්තීති.

9. කථං මයං භන්තෙ මාතුගාමෙ පටිපජ්ජාමාති, අදස්සනං ආනන්දාති, දස්සනෙ භගවා සති කථං පටිපජ්ජිතබ්බන්ති, අනාලාපො ආනන්දාති, ආලපන්තෙන පන භන්තෙ කථං පටිපජ්ජිතබ්බන්ති, සති ආනන්ද උපට්ඨාපෙතබ්බාති.

10. කථං මයං භන්තෙ තථාගතස්ස සරීරෙ පටිපජ්ජාමාති, අව්‍යාවටා තුම්හෙ ආනන්ද හොථ තථාගතස්ස සරීරපූජාය,

---

මෙහි තථාගතතෙම නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පා වදාළසේකැයිද, ශ්‍රද්ධාවන්තභික්ෂු භික්ෂුනී උපාසක උපාසිකාදීහු එන්නාහුවෙද්ද, ආනන්දය, බොධිචෛත්‍යාදිය වඳිමින් චෛත්‍යචාරිකාවෙන් ඇවිදිනාවූ යම්කිසි සත්වකෙනෙක් පැහැදිසිතින් කාලක්‍රියා කරන්නාහුද ඔහුසියල්ලෝම කාබුන්මරණින්මත්තෙහි සුගතිසඞ්ඛ්‍යාත ස්වර්ගලොකයෙහි උපදින්නාහුයයි වදාළසේක.

9 ස්වාමීන්වහන්ස, අපි මාගමුන්කෙරෙහි කෙසේ පිළිපදුමෝදැයි විචාළසේක. ආනන්දය, යම් මේ මාගමුන්ගේ නොදැක්මෙක් ඇද්ද. ඒනොදැක්මම උතුම්වූ ප්‍රතිපත්තියකැයි වදාළසේක. භාග්‍යවතුන්වහන්ස දැකීමක් ඇතිකල්හි කෙසේ පිළිපදුමෝදැයි වදාළසේක. ආනන්දය, අනාලපනයයි කියනලද කථානොකිරීමම උතුමැයි වදාළසේක. ස්වාමීන්වහන්ස, කථාකරන්නහුවිසින් කෙසේ පිළිපැද්ද යුත්තේදැයි විචාළසේක. ආනන්දය, මාතෘභගිනීදුහිතෘස්ථානීයවූවන්කෙරෙහි මෙන් යන සිහිය එළඹ සිටවියයුත්තියයි වදාළසේක.

10. ස්වාමින්වහන්ස, අපි තථාගතයන්වහන්සේගේ මෘතශරීරයෙහි කෙසේ පිළිපදුමෝදැයි විචාළසේක. ආනන්දය, තථාගතයන්වහන්සේගේ ශරීර පූජාවපිණිස තෙපි ව්‍යාවෘත නොව

ඉඞ්ඝ තුම්හෙ ආනන්ද සදත්ථෙ ඝටථ. සදත්ථමනුයුඤ්ජථ. සදත්ථෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථ, සන්තානන්ද ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණ පණ්ඩිතාපි ගහපතිපණ්ඩිතාපි තථාගතෙ අභිප්පසන්නා, තෙ තථාගතස්ස සරීරපූජං කරිස්සන්තීති.

11. කථං පන භන්තෙ තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බන්ති, යථා ඛො ආනන්ද රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති එවං තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බන්ති, කථං පන භන්තෙ රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්තීති, රඤ්ඤො ආනන්ද චක්කවත්තිස්ස සරීරං අහතෙන වත්ථෙන වෙඨෙන්ති, අහතෙන වත්ථෙන වෙඨෙත්වා විහතෙන කප්පාසෙන වෙඨෙන්ති,

---

ආනන්දය, එබැවින් තෙපි උත්තමාර්ථයවූ අර්හත්වයෙහි ගැටෙව්. අර්හත්වයට පැමිණීමට අනුයොගවශයෙන් උත්සාහ කරව්. සදර්ථ නම්වූ අර්හත්වයෙහි අප්‍රමාදව කාය ජීවිතදෙක්හි නිරපෙක්‍ෂතාවයෙන් හරණලද ආත්ම සංඥ ඇතිව වාසයකරව්යයි වදාළසේක. තථාගතයන්වහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසන්නවූ ක්‍ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද, ඇත්තාහුය. ඔව්හු තථාගතයන්වහන්සේගේ ශරීරපූජාව කරන්නාහුයයි වදාළසේක.

11. ස්වාමීන්වහන්ස, තථාගතයන්වහන්සේගේ ශරීරයෙහි කෙසේනම් පිළිපැදිය යුතුදැයි විචාළසේක. ආනන්දය, චක්‍රවර්තිරජහුගේ ශරීරයෙහි යම්සේ පිළිපැද්ද යුත්තේවේද තථාගතයන්වහන්සේගේ මෘතශරීරයෙහිද එපරිද්දෙන්ම පිළිපැද්ද යුත්තේයයි වදාළසේක. ස්වාමීන්වහන්ස, චක්‍රවර්ති රජහුගේ මෘතශරීරයෙහි කෙසේ පිළිපැද්ද යුතුදැයි විචාළසේක. ආනන්දය, චක්‍රවර්ති රජහුගේ මෘතශරීරය අලුත්වූ කාසික වස්ත්‍රයෙන් වෙළන්නාහුය. අලුත්වූකාසික වස්ත්‍රයෙන් වෙළා මනාකොට පාදනලද කපුපුළුනෙන් වෙළන්නාහුය.

විහතෙනකප්පාසෙනවෙඨෙත්වාඅහතෙනවත්ථෙන වෙඨෙන්ති, එතෙ
න උපායෙන පඤ්චහි යුගසතෙහි රඤ්ඤො චක්කවත්තිස්ස සරීරං වෙ
ඨෙත්වාඅයසාය තෙලදොණියා පක්ඛිපිත්වා අඤ්ඤිස්සා අයසාය දො
ණියාපටිකුජ්ජිත්වාසබ්බගන්ධානංචිතකංකරිත්වා රඤ්ඤොචක්කවත්
තිස්ස සරීරං ඣාපෙන්ති, චාතුම්මහාපථෙ රඤ්ඤො චක්කවත්තිස්ස
ථූපං කරොන්ති, එවංඛො ආනන්ද රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ
පටිපජ්ජන්ති, යථාඛො ආනන්ද රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ
පටිපජ්ජන්ති එවං තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බං. චාතුම්මහා
පථෙ තථාගතස්ස ථූපො කාතබ්බො, තත්ථ යෙ මාලං වා ගන්ධං වා
වණ්ණකං වා ආරොපෙස්සන්තිවා අභිවාදෙස්සන්ති වා චිත්තං වා පසා
දෙස්සන්ති තෙසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය.

12. චත්තාරො මෙ ආනන්ද ථූපාරහා. කතමෙ චත්තාරො. තථාගතො
අරහං සම්මා සම්බුද්ධො ථූපාරහො.

---

නගාපාදනලද කපුපුලුනෙන් වෙළා අලුත්වූ කාසික වස්ත්‍ර
යෙන් වෙළන්නාහුය. මෙමක්‍රමයෙන්ම පන්සියයක් පමණ
කප්පාසික වස්ත්‍රයුගලයෙන් සක්විතිරජහුගේ මෘතශරීරයවෙළා
ස්වර්ණමයවූ තෙල්දෙණක ප්‍රක්ෂෙපකොට බහා අනිකුත් එබඳු රන්දෙ
ණකින්වසා සියලු සුවඳද රන්දරසෑයක්කොට චක්‍රවර්තිරජහුගේ ශරී
රාදහනය කරන්නාහුය. මහත්වූ සතරමන්සන්ධියෙක්හි චක්‍රවර්ති
රජහුගේ සෑයකරන්නාහුය. ආනන්දය, සක්විතිරජහුගේ ශරීරයෙහි
මෙපරිද්දෙන් පිළිපදින්නාහුය. ආනන්දය, සක්විතිරජහුගේ ශරීර
යෙහි යම්ආකාරයකින් පිළිපදින්නාහු වෙද්ද. එපරිද්දෙන්ම තථා
ගතයන්වහන්සේගේ ශරීරයෙහිද පිළිපැද්ද යුත්තේය. සතරමන්
සන්ධියෙක්හි තථාගතයන්වහන්සේගේ චෛත්‍යය කටයුත්තේය.
යම්සත්වකෙනෙක් මල්ගඳවිලවුන් පනාදිය ආරොපනයයි කියනලද
නැඟිම්වශයෙන් පුදන්නාහු වෙද්ද. අභිවාදනය කරන්නාහුද,
සිත හෝ පහදවන්නාහුද ඒකුසලය ඔවුන්ට ඉතාබොහෝකාලය
කට හිත සැප පිණිස වන්නේයයි වදාළසේක.

12. ආනන්දය චෛත්‍යයට සුදුසුවූ මේ පුද්ගලයෝ සතර
දෙනෙක් වන්නාහුය. ඒසතරදෙන්නම් කව්රුහුදයත් අර්හත් සම්‍යක්
සම්බුද්ධවූ තථාගතතෙම ථූපාර්හවන්නේය.

පච්චෙකබුද්ධො ථූපාරහො තථාගතසාවකො ථූපාරහො චක්කවත්ති ථූපාරහො. කතමානන්ද අත්ථවසං පටිච්ච තථාගතො අරහං සම්මාසම්බුද්ධො ථූපාරහො. අයං තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ථූපොති ආනන්ද බහුජනො චිත්තං පසාදෙති, තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්සභෙදාපරම්මරණා සුගතිංසග්ගං ලොකං උපපජ්ජන්ති. ඉදං ඛො ආනන්ද අත්ථවසං පටිච්ච තථාගතො අරහං සම්මාසම්බුද්ධො ථූපාරහො. කඤ්චානන්ද අත්ථවසං පටිච්ච පච්චෙක සම්බුද්ධොථූපාරහො අයං තස්සභගවතො පච්චෙකසම්බුද්ධස්ස ථූපොති ආනන්ද බහුජනො චිත්තංපසාදෙති.තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්ස භෙදා පරම්මරණාසුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. ඉදං ඛො ආනන්ද අත්ථවසං පටිච්ච පච්චෙක සම්බුද්ධො ථූපාරහො, කඤ්චානන්ද අත්ථවසං පටිච්ච තථාගතසාවකො ථූපාරහො.

---

පසේ බුදුරජතෙම ථූපාර්හවන්නේය. සර්වඥ ශ්‍රාවකතෙම ථූපාර්හවන්නේය. සක්විති මහරජතෙම චෛත්‍යාර්හවන්නේය. ආනන්දය කවර නම් අර්ථසිද්ධියක් පිණිස අර්හත් සම්‍යක්සම්බුද්ධවූ තථාගතතෙම චෛත්‍යාර්හවනසේක්දැයි යතහොත්, මේ ඒ භාග්‍යවත්අර්හත් සම්‍යක්සම්බුද්ධ සර්වඥයන්වහන්සේගේචෛත්‍යයයිකියාආනන්දය බොහෝ ජනතෙම සිත්පහදවාගන්නේය.ඔව්හුචෛත්‍යයකෙරෙහි සිත්පහදවාගෙණ කාබුන්මරණින්මත්තෙහිසුගතිසඞ්ඛ්‍යාතවූස්වර්ගලොකයෙහි උපදනාහුය ආනන්දය මේ යථොක්තවූ අර්ථසිද්ධිය හෙතුකොටගෙණ අර්හත්සම්‍යක් සම්බුද්ධවූ තථාගතතෙම ථූපාර්හවන්නේයයිකියා වදාළසේක. ආනන්දය කවරනම් අර්ථසිද්ධියක් හෙතුකොටගෙණ පසෙබුදුරජතෙම ථූපාර්හවන්නේද, මේ ඒ භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේගේ චෛත්‍යයයි කියා ආනන්දය බොහෝ ජනතෙම සිත්පහදවා ගන්නේය. ඒ සත්වයෝ ඒ චෛත්‍යයකෙරෙහි සිත්පහදවාගෙණ කාබුන් මරණින් මත්තෙහි සුගතිසඞ්ඛ්‍යාතවූ ස්වර්ගලොකයෙහි උපදනාහුය. ආනන්දය මේ යථොක්තවූ අර්ථසිද්ධිය හෙතුකොටගෙණ පසේබුදුරජතෙම ථූපාර්හවන්නේයයි වදාළසේක. ආනන්දය කවරනම් අර්ථසිද්ධියක් හෙතුකොටගෙණ තථාගත ශ්‍රාවකතෙම ථූපාර්හවන්නේද

අයං තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස . සාවකථූපොති ආනන්ද බහුජනො චිත්තං පසාදෙති. තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, ඉදං ඛො ආනන්ද අත්ථවසං පටිච්ච තථාගත සාවකො ථූපාරහො. කතමානන්ද අත්ථවසං පටිච්ච රාජා චක්කවත්ති ථූපාරහො. අයං තස්ස ධම්මිකස්ස ධම්මරඤ්ඤො ථූපොති ආනන්ද බහුජනො චිත්තං පසාදෙන්ති. තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. ඉදං ඛො ආනන්ද අත්ථවසං පටිච්ච රාජා චක්කවත්ති ථූපාරහො. ඉමෙ ඛො ආනන්ද චත්තාරො ථූපාරහාති.

13. අථ ඛො ආයස්මා ආනන්දො විහාරං පවිසිත්වා කපිසීසං ආලම්බිත්වා.

---

මේ ඒ භාග්‍යවත් අර්හත්සම්‍යක්සම්බුද්ධයන්වහන්සේගේ ශ්‍රාවකයන්ගේ චෛත්‍යයයි ආනන්දය බොහෝජනතෙම සිත්පහදවාගන්නේය. ඔව්හු ඒ චෛත්‍යය කෙරෙහි සිත්පහදවාගෙණ කාබුන් මරණින්මත්තෙහි සුගතිසඞ්ඛ්‍යාතවූ ස්වර්ගලෝකයෙහි උපදනාහුය. ආනන්දය මේ අර්ථසිද්ධිය හෙතුකොටගෙණ තථාගතශ්‍රාවකතෙම ථූපාර්හවන්නේයයි වදාළසේක. ආනන්දය කවරනම් අර්ථසිද්ධියක් පිණිස චක්‍රවර්ති රජතෙම ථූපාර්හවන්නේද මේ ඒ ධාර්මික ධර්මරාජන්වූ සක්විති රජහුගේ චෛත්‍යයයිකියා ආනන්දය බොහෝජනතෙම සිත්පහදවා ගන්නේය. ඒ සත්වයෝ ඒ චෛත්‍යය කෙරෙහි සිත්පහදවාගෙණ ශරීරයාගේ භේදයෙන් මරණින් මත්තෙහි සුගතිසඞ්ඛ්‍යාතවූ ස්වර්ග ලොකයෙහි උපදනාහුය. ආනන්දය මේ යථොක්තවූ අර්ථසිද්ධිය හෙතුකොටගෙණ සක්විති රජතෙම ථූපාර්හවන්නේය. ආනන්දය චතුර්විධවූ චෛත්‍යාර්හ පුද්ගලයෝනම් මොහු සතරදෙනා වන්නාහුයයි වදාළසේක.

13. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරතෙම මණ්ඩලමාල විහාරයට ප්‍රවිෂ්ටව කපිශීර්ෂයයිකියනලද දොරබා කෙළවරසිටි අගුල් කණුවඑල්බගෙණ.

රොදමානො අඨාසි, අහඤ්ච වතම්හි සෙඛො සකරණීයො. සත්ථුච මෙ පරිනිබ්බාණං භවිස්සති යො මමං අනුකම්පකොති. අථඛො භගවා භික්ඛූ ආමන්තෙසි, කහන්නුඛො භික්ඛවෙ ආනන්දොති. එසො භන්තෙ ආයස්මා ආනන්දො විහාරං පවිසිත්වා කපිසීසං ආලම්බිත්වා රොදමානොඨිතො, අහඤ්ච වතම්හි සෙඛො සකරණීයො සත්ථුච මෙ පරිනිබ්බාණං භවිස්සති මමං අනුකම්පකොති. අථඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි, එහි ත්වං භික්ඛු මම වචනෙන ආනන්දං ආමන්තෙහි සත්ථා තං ආවුසො ආනන්ද ආමන්තෙතීති. එවම්භන්තෙතිඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා ආනන්දො තෙනුපසංකමි. උපසංකමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච.

---

මම එකාන්තයෙන් සකරණීයවූ ශෛඛපුද්ගලයෙක් වීමි. මාගේ ශාස්තෘන්වහන්සේද අද දූත් පිරිනිවන් පාවාදරණසේක. ඒ භාග්‍යවතුන්වහන්සේ මට අනුශාසනාකරවනසේක. හෙවත් මාකෙරෙහි අනුකම්පාකර වදරණකෙනෙකැයිකියා හඬ හඬා වැඩඋන්සේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට අඬගා වදාළසේක. මහණෙනි, ආනන්ද ස්ථවිරතෙම කොතැන්හි දූයි අසා වදාලසේක. ස්වාමීන්වහන්ස ඒ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරතෙම මණ්ඩලමාල විහාරයට ප්‍රවිෂ්ටව අගුලුකණුව එල්වගෙණ එකාන්තයෙන් මම සකරණීයවූ ශෛඛ පුද්ගලයෙක්වීමි. මාගේ ශාස්තෘන්වහන්සේද අද දූත් පිරිනිවන්පාවදරණසේක. ඒ භාග්‍ය වතුන්වහන්සේ මට අනුශාසකවනසේකැයිකියා හඬමින් වැඩසිටි සේකැයි සැලකළසේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ එක්තරා භික්ෂූනමකට අඬගා වදාළසේක. මහණෙනි, මෙහි එව මාගේ වචනයෙන් ඇවැත්වූ ආනන්දය ශාස්තෘන්වහන්සේ තොප කැඳවත්නේයයිකියා ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් කැඳවාගෙණ එවයිවදාළසේක. එසේය ස්වාමීන්වහන්සැයිකියා ඒ භික්ෂූතෙම භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ප්‍රතිවචනදී ආයුෂ්මත්ආනන්ද ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතනට එළඹිසේක. එලඹ ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන්ට මෙසේ සැලකෙළේය.

සත්ථා තං ආවුසො ආනන්ද ආමන්තෙතීති- එවමාවුසොති ඛො ආයස්මා ආනන්දො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

14. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච. අලං ආනන්ද මා සොචි මා පරිදෙවි. නනු එතං ආනන්ද මයා පටිගච්චෙව අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො තං කුතෙත්ථ ආනන්ද ලබ්භා. යන්තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජති. දීඝරත්තං ඛො තෙ ආනන්ද තථාගතො පච්චුපට්ඨිතො මෙත්තෙන කායකම්මෙන හිතෙන සුඛෙන අද්වයෙන අප්පමාණෙන මෙත්තෙන වචීකම්මෙන. ....පෙ....

---

ඇවැත්වූ ආනන්දය ශාස්තෲන්වහන්සේ තොප කැඳවන්නේයයි කීයේය. එසේය ඇවැත්නැයි කියා ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම ඒ භික්ෂූහට ප්‍රතිවචනදී භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතනට එළඹිසේක. එළඹ භාග්‍යවතුන්වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක්හි උන්නේය.

14. එකත්පසෙක්හි උන්නාමවූ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට භාග්‍යවතුන්වහන්සේ මෙසේවදාළසේක. ආනන්දය, නොහඬව. සොකනොකරව. ආනන්දය, සියලුම ප්‍රියමනාප වස්තුවෙන් වෙන්වීම් වශයෙන් අන්‍යථාභාවයට පැමිණෙනබව මාවිසින් පළමුකොටම කියනලද්දේ නොවේද, ආනන්දය ඒකාරණය දැන්මෙ තැන්හි කොයින් ලැබේද, ජාතභූතසඞ්ඛතාදිවූ යම් ඒ පලුජ්ජනධර්ම කෙනෙක් ඇද්ද එනටමනාවූ ඒ පලුජ්ජන ධර්මය එකාන්තයෙන් නොනසිවයි යන යමක් ඇද්ද මේකාරණය වනාහි විද්‍යමාන නොවන්නේය. ආනන්දය, හිතසුඛසෞම්‍යනස්‍යවශයෙන් කරණලද්දවූ සම්මුඛී සම්මුඛවශයෙන් මෙසේ දෙකොටසක් කොට නොකරණලද්දවූ අප්‍රමාණවූ මෛත්‍රීමයවූ කායකර්මයෙන්ම මෛත්‍රීමයවූ වාක්කර්මයෙන්ද සෙස්ස පෙරමෙනි.

මෙත්තෙන මනොකම්මෙන හිතෙන සුඛෙන අද්වයෙන අප්පමාණෙන. කතපුඤ්ඤොසි ත්වං ආනන්ද පධානමනුයුඤ්ජ ඛිප්පං අහොසි අනාසවොති.

15. අථඛො භගවා භික්ඛූ ආමන්තෙසි. යෙපි තෙ භික්ඛවෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙසම්පි භගවන්තානං එතපරමායෙව උපට්ඨාකා අහෙසුං සෙය්‍යථාපි මය්හං ආනන්දො. යෙපි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙසම්පි භගවන්තානං එතපරමායෙව උපට්ඨාකාභවිස්සන්ති සෙය්‍යථාපි මය්හං ආනන්දො. පණ්ඩිතො ඛො භික්ඛවෙ ආනන්දො. ජානාති අයං කාලො තථාගතං දස්සනාය උපසඞ්කමිතුං භික්ඛූනං අයං කාලො භික්ඛුනීනං අයං කාලො.

---

හිත සුව දෙකින් කරණලද්දවූ දෙකොටසක් කොට නොකරණලද්දවූ ප්‍රමාණයක් නැත්තාවූ මෛත්‍රීමයවූ මනොකර්මයෙන්ද ආනන්දය, තාවිසින් ඉතාදීඝීකලක්වූ පස්විසිහවුරුද්දක්මුලුල්ලෙහි තථාගතයන්වහන්සේට උපස්ථානකරණලද්දේය. ආනන්දය, තෝ පෙර කරණලද පින්ඇත්තෙහිය. ප්‍රධාන භූමියොගකරවූ [illegible]වහාම අර්හත්වයට ශෙවත් රහත්බවට පැමිණෙන්නෙහියයි වදාලසේක.

15. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භික්‍ෂූන්ට අඩගාවදාලසේක. මහණෙනි, ඉකුත්වගියාවූ අතීතකාලයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුඩ කෙනෙක්වූවාහුද ඒ භාග්‍යවතුන්වහන්සේලාගේද මාගේ උපස්ථායකවූ මේ ආනන්දස්ථවිරතෙම යම්සේද මෙබඳුමවූ උපස්ථායක භික්‍ෂුහුවාහුය. මහණෙනි, මතුවන්නාවූ දීඝිවූ අනාගතකාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුඩකෙනෙක් උපදින්නාහුවෙද්ද ඒ භාග්‍යවතුන්වහන්සේලාගේද මාගේ උපස්ථායකවූ මේ ආනන්දස්ථවිරතෙම යම්සේද මෙබඳුවූම උපස්ථායක භික්‍ෂුහුවන්නාහුය. මහණෙනි, ආනන්දස්ථවිරතෙම ප්‍රඥාවන්තාවූයේය. තථාගතයන්වහන්සේගේ දැක්මට භික්‍ෂූන්ගේ එලඹීම මේකල්වන්නේයයි කියාදන්නේය. භික්‍ෂුණීන්ගේ එලඹීමට මේ කල්වන්නේයයි කියාදන්නේය.

උපාසකානං අයං කාලො උපාසිකානං අයං කාලො රඤ්ඤො රාජමහමත්තානං තිත්ථියානං තිත්ථියසාවකානනති.

16. චත්තාරො මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ. කතමෙ චත්තාරො. සචෙ භික්ඛවෙ භික්ඛුපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති දස්සනෙන සා අත්තමනා හොති තත්‍රචෙ ආනන්දෙ ධම්මං භාසති භාසිතෙන පි සා අත්තමනා හොති. අතිත්තාව භික්ඛවෙ භික්ඛුපරිසා හොති. අථ ආනන්දෙ තුණ්හී හොති. සචෙ භික්ඛවෙ භික්ඛුනී පරිසා උපාසකපරිසා උපාසිකා පරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති දස්සනෙන සා අත්තමනා හොති තත්‍ර චෙ ආනන්දෙ ධම්මං භාසති භාසිතෙන පි සා අත්තමනා හොති.

උපාසකයන්ගේ එලඹීමට මේකල්වන්නේයයි දන්නේය. උපාසිකාවන්ගේ එලඹීමට මේකල්වන්නේයයි දන්නේය. තථාගතයන්වහන්සේගේ දර්ශනය පිණිස රජදරුවන්ගේද, රාජමහාමාත්‍යාදීන්ගේද; එලඹීමට මේකල්වන්නේයයි දන්නේය. තීර්ථකයන් හා තීර්ථකශ්‍රාවකයන්ගේද එලඹීමට මේකල්වන්නේයයි දන්නේය.

16. මහණෙනි, ආනන්‍දස්ථවිරයන් කෙරෙහි මේ චතුර්විධවූ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මකෙනෙක් ඇතිවන්නාහුය. ඒ චතුර්විධවූ ආශ්චර්‍ය්‍ය ධර්මයෝ කවරහුද, මහණෙනි, ඉදින් භික්ෂුපිරිස්තොමෝ ආනන්‍දස්ථවිරයන් දක්නට එලඹෙන්නේ වේද. භික්ෂුපර්ෂත්තොම ආනන්‍දස්ථවිරයන්ගේ දර්ශනයෙන්ම සතුටුවන්නීය. ඉදින් ඒ භික්ෂුපර්ෂදෙහි ආනන්‍දස්ථවිරතෙම ධර්මය දෙශනාකරන්නේ වේද. භාෂිතයයි කියනලද වචනයෙන්ද ඒ පිරිස්තොම සතුටුවන්නිය. මහණෙනි, පර්ෂද්තොම අතෘප්තිවන්නීය. එකල්හි ආනන්‍දස්ථවිරතෙම තුෂ්ණීම්භූත වන්නේය. මහණෙනි, ඉදින් භික්ෂුනීපර්ෂද්තොමෝද උපාසකපිරිස්තොමෝද උපාසිකාපර්ෂද්තොමෝද ආනන්‍දස්ථවිරයන් දක්නාපිණිස එලඹෙන්නාහු වෙද්ද, ඒ පිරිස්තොමෝ ආනන්‍දස්ථවිරයන්ගේ දර්ශනයෙන්ම සතුටුවන්නීය. ඉදින් පර්ෂදෙහි ආනන්‍දස්ථවිරතෙම ධර්මදෙශනා කරන්නේවේද. ධර්මදෙශනාකිරීමෙන් ඒ උපාසිකාපිරිස්තොමෝ සතුටුවන්නීය.

අතිත්තාව භික්ඛවෙඋපාසිකා පරිසාහොති අථ ආනන්දො තුණ්හී
හොති. චත්තාරො මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භූතා ධම්මාරඤ්ඤො චක්ක
වත්තිම්හි. සචෙ භික්ඛවෙ බ්‍රාහ්මණපරිසා ගහපතිපරිසා සමණපරිසා.
රාජානං චක්කවත්තිං දස්සනාය උපසඞ්කමති දස්සනෙන සා අත්ත
මනා හොති. තත්‍රචෙ රාජා චක්කවත්තී භාසති භාසිතෙනපිසා අත්ත
මනා හොති අතිත්තාව භික්ඛවෙ සමණපරිසා හොති. අථ රාජා චක්ක
වත්ති තුණ්හී හොති එවමෙව ඛො භික්ඛවෙ චත්තාරො අච්ඡරියා
අබ්භූතා ධම්මා ආනන්දෙ. සචෙ භික්ඛවෙ භික්ඛුපරිසා භික්ඛුනී
පරිසා. උපාසකපරිසා උපාසිකාපරිසා ආනන්දං දස්සනාය උපසඞ්
කමති දස්සනෙන සා අත්තමනා හොති තත්‍ර චෙ ආනන්දො ධම්මං
භාසති භාසිතෙනපිසා අත්තමනා හොති අතිත්තාව භික්ඛවෙ උපා
සිකාපරිසා හොති.

---

මහණෙනි, උපාසිකාපිරිස් තොම අතෘප්තිවත් නිය. ඉක්බිත්
තෙන් ආනන්‍දස්ථවිරතෙම තුෂ්ණීම්භූතවන්නේය. මහණෙනි, ආනන්‍ද
ස්ථවිරයන් කෙරෙහි මේ චතුර්විධවූ ආශ්චර්‍ය්‍යාද්භූත ධර්‍මයෝ වන්නා
හුය. මහණෙනි, චක්‍රවර්ත්‍තිරජ්ජුරුවන් කෙරෙහි මේ චතුර්විධවූ ආශ්
චර්‍ය්‍යාද්භූත ධර්‍මකෙනෙක් ඇත්තාහුය. ඒ චතුර්විධාශ්චර්‍ය්‍ය අද්භූත
ධර්‍මයෝ නම් කවරහුද. ඉදින් මහණෙනි, බ්‍රාහ්මණ පිරිසද, ගෘහපති
පිරිසද, ශ්‍රමණ පිරිසද, චක්‍රවර්ත්‍ති රජ්ජුරුවන් දක්නාපිණිස එළ
ඹෙත්නාහුය. දැකීමෙන්ම ඒ පිරිස්තොමෝ සතුටුවන්නිය. ඉදින් ඒ
පිරිසෙහි ඒ චක්‍රවර්ත්‍ති මහරජතෙම යමක් කියන්නේ වේද. කිමෙත්ද
ඒ පිරිස්තොමෝ රජහට සතුටුවන්නිය. මහණෙනි, ඒ ශ්‍රමණ පිරිස්
තොම අතෘප්තිඇත්තී වන්නීමය. ඉක්බිත්තෙන් චක්‍රවර්ත්‍ති මහරජ
තෙම තුෂ්ණීම්භූතවන්නේය. මහණෙනි, එපරිද්දෙන්ම ආනන්‍ද
ස්ථවිරයන් කෙරෙහි මේ චතුර්විධවූ ආශ්චර්‍ය්‍යාද්භූත ධර්‍මයෝ ඇතිවන්
නාහුය. ඉදින් මහණෙනි—පෙ—ආනන්‍දස්ථවිරයන්ගේ දර්‍ශනයපිණිස
එළඹෙන්නාහු වේද්ද. ආනන්‍දස්ථවිරයන්ගේ දර්‍ශනයෙන්ම සතුටු
වන්නාහුය. ඉදින් ඒ භික්‍ෂුපර්‍ෂදෙහි ආනන්‍දස්ථවිරතෙම ධර්‍මදේශනා
කරන්නේ වේද. භාසිතයයි කියනලද ආනන්‍දස්ථවිරයන්ගේ වචන
යෙනුදු සතුටුවන්නේය. මහණෙනි, උපාසිකාපිරිස්තොමෝ අතෘප්ති
වන්නිය,

අථ ආනන්දො තුණ්හී හොති. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙති.

17. එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. මා භන්තෙ භගවා ඉමස්මිං කුඩ්ඩනගරකෙ උජ්ජඞ්ගලනගරකෙ සාඛනගරකෙ පරිනිබ්බායතු. සන්ති භන්තෙ අඤ්ඤානි මහානගරානි, සෙය්‍යථීදං චම්පා රාජගහං සාවත්ථි සාකෙතං කොසම්බි බාරාණසී එත්ථ භගවා පරිනිබ්බායතු එත්ථ බහූ ඛත්තියමහාසාලා බ්‍රාහ්මණමහාසාලා ගහපති මහාසාලා තථාගතෙ අභිප්පසන්නා. තෙ තථාගතස්ස සරීරපූජං කරිස්සන්තීති. මාහෙවං ආනන්ද අවච මාහෙවං ආනන්ද අවච. ඛුද්දකනගරකං උජ්ජඞ්ගලනගරකං සාඛනගරකන්ති.

---

ඉක්බිත්තෙන් ආනන්‍දස්ථවිරතෙම තුෂ්ණීම්භූතවන්නේය. මහණෙනි, ආනන්‍දස්ථවිරයන්කෙරෙහි මේ චතුර්විධවූ ආශ්චය‍ර්‍ය්‍යාද්භූත ධර්‍මයෝ ඇතිවන්නාහුයයි වදාළසේක.

17. මෙසේ වදාළකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැලකළසේක. ස්වාමිවූ භාග්‍යවතුන් වහන්ස, මුල්නුවරින් අන්‍යහෙයින් කුඩ්ඩ නගරනම්වූද ගල්සෙල් ආදියෙන් විෂමව කෘරවන හෙයින් උජ්ජංගල නගරනම්වූද සාඛා නගරනම්වූද මේ කුඩා නුවරෙහි නහමක් පිරිනිවන්පාවදාරණ සේක්වා. ස්වාමින්වහන්ස, මෙයින් අන්‍යවූ මහානුවරවල් ඇත්තාහුය. ඒ කවරහුද. චම්පානුවරය, රජගහනුවරය, සැවැත්නුවරය, සාකෙතනුවරය, කොසඹෑනුවරය, බරණැස්නුවරය. මේ නුවරවල් අතරෙන් යම්කිසිනුවරෙක්හිදී භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන් පාවදාරණසේක්වා. මෙහි තථාගතයන්වහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසන්නවූ බොහෝවූ ක්‍ෂත්‍රිය මහාසාලයෝද, බමුණු මහාසාලයෝද, ගෘහපති මහාසාලයෝද ඇත්තාහ. ඒ ත්‍රිවිධ මහාසාලකුලයෝ තථාගතයන්වහන්සේගේ ශරීරපූජාකරන්නාහුයයි සැලකළසේක. ආනන්දය, කුඩානුවරයයි, කියාද, නිසරු නුවරයයි කියාද, අතුනුවරයයි කියාද මෙසේ නහමක් කියව හෙවත් මෙසේ නොකියවයි වදුරා මතු පහලවන මේ මහාසුදර්‍ශන දෙශනාව වදාළසේක.

18. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො නාම අහොසි චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන සමන්නාගතො. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස අයං කුසිනාරා කුසාවතී නාම රාජධානී අහොසි, පුරත්ථිමෙනච පච්ඡිමෙනච ද්වාදසයොජනානි ආයාමෙන උත්තරෙනච දක්ඛිණෙනච සත්තයොජනානි විත්ථාරෙන. කුසාවතී ආනන්ද රාජධානී ඉද්ධාචෙව අහොසි ඵීතාච බහුජනාච ආකිණ්ණමනුස්සාච සුභික්ඛාච. සෙය්‍යථා පි ආනන්ද දෙවානංආලකමන්දානාම රාජධානී ඉද්ධාචෙව ඵීතාච බහුජනාච ආකිණ්ණයක්ඛාච, සුභික්ඛාච, එවමෙව ඛො ආනන්ද කුසාවතී රාජධානී ඉද්ධාචෙව අහොසි ඵීතාච බහුජනාච ආකිණ්ණමනුස්සාච සුභික්ඛාච.

---

18. ආනන්දය, පෙරවූකාලයෙහි සාගරපරියන්තකොට ඇති සතර මහාද්වීපය ඛඩ්ග කුන්ත තොමරාදි කිසි ආයුධයක් නොගෙණ තමාගේ කුසලානුභාවයෙන්ම ජයගත්තාවූ ජනපදයන්හි ස්ථිරභාවයට පැමිණියාවූ ධාර්මිකවූ ධර්මරාජන්වූ සප්තවිධරත්නයෙන් යුක්තවූ මහාසුදර්ශනනම්වූ සක්විතිරජෙක් වූයේය. ආනන්දය, ඒ මහා සුදර්ශන නම් රජහුගේ මේ කුසිනාරායයි කියනලද කුසාවතීනම් රාජධානියෙක් වූයේය. ආනන්දය, ඒ මේ කුසාවතීනම් රාජධානිතොම පූර්ව දිග්භාගයෙහි පටන් පශ්චිම දිග්භාගයට දිගින් දොළොස් යොදුනක් වූයේය. උත්තරදිශාභාගයෙහි පටන් දක්ෂිණදිශාභාගයට පුලුලින් සොදුන්පමණ වූයේය. ආනන්දය, ඒ කුසාවතිනම් රාජධානිතොමෝ සකලසම්පත්තියෙන් සමෘඬවූවාය. එහෙයින් ප්‍රමුදිතවූ බොහෝ ජනයෝද එහි හැසිරෙන්නාවූ මනුෂ්‍යයන්ගෙන් ආකීර්ණවූවාය. සුභික්ෂවූවාය, ආනන්දය, යම්සේ දෙවියන්ගේ ආලකමන්‍දනම් රාජධානීතොමෝ සමෘඬිවීමෙන් ප්‍රමුදිතවූ බොහෝ ජනයන් ඇත්තේද සෙසු දෙවියන් හා දිව්‍යාඞ්ගනාවන්ගෙන් ගැවසීගත්තේද ආනන්දය, එපරිද්දෙන්ම කුසාවතීනම් රාජධානිතොමෝ සකලසම්පත්තියෙන් සමෘඬවූවාය. එහෙයින් ප්‍රමුදිතවූ බොහෝ ජනයන් ඇත්තීය. අවශෙෂ සත්පුරුෂාදී මනුෂ්‍යයන්ගෙන් ගැවසීගත්තීය. සුභික්ෂවූවාය.

කුසාවතී ආනන්ද රාජධානී දසහි සද්දෙහි අවිවිත්තා අහොසි දිවා චෙව රත්තිංච. සෙය්‍යථිදං හත්ථිසද්දෙන අස්සසද්දෙන රථසද්දෙන භෙරිසද්දෙන මුදිඞ්ගසද්දෙන වීණාසද්දෙන ගීතසද්දෙන සම්ම සද්දෙන තාලසද්දෙන අස්නාථ පිවථ ඛාදථාති දසමෙන සද්දෙන.

19. ගච්ඡ ත්වං ආනන්ද කුසිනාරයං පවිසිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙහි, අජ්ජ ඛො වාසෙට්ඨා රත්තියා පච්ඡිමෙ යාමෙ තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති අභික්කමථ වාසෙට්ඨා අභික්කමථ වාසෙට්ඨා මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ අම්හාකඤ්ච නො ගාමක්ඛෙත්තෙ තථාගතස්ස පරිනිබ්බාණං අහොසි න මයං ලභිම්හා පච්ඡිමෙ කාලෙ තථාගතං දස්සනායාති.

ආනන්දය, කුසාවතීනම් රාජධානී තොමෝ රෑදවල් දෙක්හි දශවිධශබ්දයෙන් නොවෙනස්ව එකනින්නාදවූවාය. ඒ දශවිධ ශබ්දනම් කවරහුද, ඇතුන්ගේ කුඤ්චනාද ශබ්දයෙන්ද, අසුන්ගේ හේසාරවයෙන්ද, රථශබ්දයෙන්ද, බෙර ශබ්දයෙන්ද, මුහිඬග ශබ්දයෙන්ද, පණව ශබ්දයෙන්ද, වීණා ශබ්දයෙන්ද, ගීතිකා ශබ්දයෙන්ද, සම්ම ශබ්දයෙන්ද, තාලශබ්දයෙන්ද අනුභවකරව පානයකරව. කව. කියාද යන මේ දශවිධ ශබ්දයන්ගෙන් අතුරු නැත්තේය.

19. ආනන්දය, තෝ යව. ගොස් කුසිනාරානම් නුවරට ප්‍රවෙසව කුසිනාරානුවර වාසයකරන්නාවූ මල්‍යරජදරුවන්ට මෙසේ කියව. වාසෙට්ඨ ගොත්‍රොද්භූතවූ මල්‍යරජදරුවෙනි, අදරාත්‍රියගේ පශ්චිම යාමයෙහි තථාගතයන්වහන්සේගේ පරිනිර්වාණය වන්නේය. වාසෙට්ඨ ගොත්‍රාභිජාත මල්‍යරජදරුවෙනි, අභිමුඛව වහාම එව්. ගොත්‍ර වශයෙන් වාසෙට්ඨනම්වූ එම්බා මල්‍යරජදරුවෙනි, වහා අභිමුඛව එව්. අපගේ ග්‍රාමක්ෂෙත්‍රයෙහිම අප තථාගතයන්වහන්සේගේ පිරිනිවන් පෑම වූයේය. පශ්චිමකාලවූ මේ පිරිනිවන්පානා සමයෙහි තථාගතයන්වහන්සේගේ දර්ශනය අපි නොලද්දමෝවම්හයි කියා පසුව විපිළිසර නොවව්.

එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා නිවාසෙත්වා පත්තචීවරං ආදාය අත්තදුතියො කුසිනාරායං පාවිසි.

20. තෙන ඛො පන සමයෙන කොසිනාරකා මල්ලා සන්ථාගාරෙ සන්නිපතිතා හොන්ති. කෙනචිදෙව කරණීයෙන. අථ ඛො ආයස්මා ආනන්දො යෙන කොසිනාරකානං මල්ලානං සන්ථාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙසි. අජ්ජ ඛො වාසෙට්ඨා රත්තියා පච්ඡිමෙ යාමෙ තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. අභික්කමථ වාසෙට්ඨා අභික්කමථ වාසෙට්ඨා මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ අම්හාකඤ්ච නො ගාමක්ඛෙත්තෙ තථාගතස්ස පරිනිබ්බානං අහොසි න මයං ලභිම්හා පච්ඡිමෙ කාලෙ තථාගතං දස්සනායාති.

---

එසේය. පින්වතුන්වහන්සැයි කියා ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ප්‍රතිවචනදී මනාකොට හැඳ පොරවා පාත්‍රා සිවුරු ගෙණ තමන්වහන්සේ දෙවෙනිකොට ඇතිව කුසිනාරානම් පුරප්‍රවරයට ප්‍රවිෂ්ටවූයේය.

20. එසමයෙහිදි කුසිනාරා වැසි මල්‍යරජදරුවෝ යම්කිසි කාර්‍ය්‍යයක් හෙතුකොටගෙණ සන්ථාගාරසාලාවෙහි රැස්ව උන්නාහු වෙත්. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම කුසිනාරා වැසි මල්‍යරජදරුවන්ගේ සන්ථාගාරසාලාව යම්තැනෙක්හිද එතනට එලඹිසේක. එලඹ කුසිනාරා වැසි මල්‍යරජදරුවන්ට මෙසේ කීයේය. වාසෙට්ඨනාම්වූ මල්‍යරජදරුවෙනි, අද මේ රාත්‍රියගේ පශ්චිම යාමයෙහි තථාගතොත්තමයානන්වහන්සේගේ පිරිනිවන්පෑම වන්නේය. මල්‍යරජදරුවෙනි වහා අභිමුඛව එව්. වාසෙට්ඨ ගොත්‍රාභිජාත මල්‍යරජදරුවෙනි අභිමුඛව වහාම එව්. අපගේ ග්‍රාමක්ෂෙත්‍රයෙහිම අප තථාගතයන්වහන්සේගේ පිරිනිවන්පෑම වූයේය. පශ්චිමකාලවූ පිරිනිවන්පානා සමයෙහි තථාගතයන්වහන්සේගේ දර්ශනය අපි නොලද්දහම්යයිකියා පශ්චාත්තාපයට පැමිණෙමින් විපිළිසරනොවෙව්යයි වදාළසේක.

21. ඉදමායස්මතො ආනන්දස්ස සුත්වා මල්ලාච මල්ලපුත්තාච මල්ලසුණිසාච මල්ලපජාපතියොච අඝාවිනො දුම්මනා චෙතො දුක්ඛ සමප්පිතා අප්පෙකච්චෙ කෙසෙපකිරිය කන්දන්ති බාහාපග්ගය්හ කන්දන්ති ඡින්නපපාතං පපතන්ති ආවට්ටෙන්ති විවට්ටෙන්ති අතිඛිප්පං භගවා පරිනිබ්බායිස්සති අතිඛිප්පං සුගතො පරිනිබ්බායිස්සති අතිඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරධායිස්සතීති. අථ ඛො මල්ලාච මල්ලපුත්තාච මල්ලසුණිසාච මල්ලපජාපතියොච අඝාවිනො දුම්මනා චෙතො දුක්ඛසමප්පිතා යෙන උපවත්තනං මල්ලානං සාලවනං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු.

22. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි. සචෙ ඛො අහං කොසිනාරකෙ මල්ලෙ එකමෙකං භගවන්තං වන්දාපෙස්සාමි අවන්දිතොව භගවා කොසිනාරකෙහි මල්ලෙහි භවිස්සති. අථායං රත්ති-

---

21. ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරයන්වහන්සේගේ මේ වචනය අසා මල්‍යරජුන් හා මල්‍යරාජපුත්‍රයෝද මල්‍යසුණිසාවන් හා මල්‍ය ප්‍රජාපතීහුද උපදනාලද දුක්ඇතිව දෙම්නසින් යුක්තවසිත්හටගත් බලවත් දෙම්නසින් යුක්තව භාග්‍යවතුන්වහන්සේ ඉතාවහාම පිරිනිවන්පා වදාරණසේක්යැයි කියා ඉතාඉක්මනින් සුගතතෙම පිරිනිවන්පාන්නේයයිද ඉතාඉක්මනින් බුදු ඇස ලොකයෙහි අතුරුදහන්වන්නේයයිද සමහරකෙනෙක් කෙස්විසුරුවා හඬත් හිසඅත්බැඳගෙණ හඬත් මැදින් කැඩුනාක්මෙන් වැටෙත් පෙරළෙත්. වෙසෙසින් පෙරළෙත්. ඉක්බිත්තෙන්. මල්‍යරජුන් හා මල්‍යරාජ පුත්‍රයෝද මල්‍යසුණිසාවන් හා මල්‍යප්‍රජාපතීහුද උපදනාලද දුක්ඇතිව නොසතුටුසිත් ඇතිව සිත්හටගත් දෙම්නසින් යුක්තව මල්‍යරජදරුවන්ගේ උපවතීනම් සාලවනොද්‍යානය යම්තැනකද ආයුෂ්මත්වූආනන්දස්ථවිරතෙමයම් තැනකද එතැනට එළඹියාහුය.

22. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට මෙසේවූ කල්පනාවෙක් වූයේය. ඉදින් වනාහි මම කොසිනාරකනම්වූ මල්‍යරජදරුවන්වෙන වෙනම එක එක රජක්හු බැගින් භාග්‍යවතුන්වහන්සේට දක්වා වැන්දවූයෙම්ව්මිනම් එකල්හි මේරාත්‍රිතොමෙමෝ.

විහායිස්සති යන්නූනාහං කොසිනාරකෙ මල්ලෙ කුලපරිවත්තසො කුලපරිවත්තසො ඨපෙත්වා භගවන්තං වන්දාපෙය්‍යං ඉත්ථංනාමො භන්තෙ මල්ලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො භගවතො පාදෙ සිරසා වන්දතීති. අථ ඛො ආයස්මා ආනන්දො කොසිනාරකෙ මල්ලෙ කුලපරිවත්තසො කුලපරිවත්තසො ඨපෙත්වා භගවන්තං වන්දාපෙසි ඉත්ථන්නාමො භන්තෙ මල්ලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො භගවතො පාදෙ සිරසා වන්දතීති.අථ ඛො ආයස්මා ආනන්දො එතෙන උපායෙන පඨමෙනෙව යාමෙන කොසිනාරකෙ මල්ලෙ භගවන්තං වන්දාපෙසි.

23, තෙන ඛො පන සමයෙන සුභද්දො නාම පරිබ්බාජකො කුසිනාරායං පටිවසති.

---

පිරිහෙන්නීය, කුසිනාරාවාසි මල්‍ලරජදරුවන් විසින් භාග්‍යවත්තෙම නොවන්දවනලද්දේනම් වන්නේය.මම කොසිනාරකනම් මල්‍ලරජදරුවන් එක එක කුලපරිවර්‍තන වශයෙන් වෙන වෙනම සිටුවා සවාමීන්වහන්ස මෙනම් නමක්ඇති මල්‍ලරජතෙම පුත්‍රභාය්‍ය්‍යා පිරිවර අමාත්‍යාදීන් සහිතව භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදවන්දය මස්තකය කරණකොටගෙණ වඳින්නේයයි කියා භාග්‍යවතුන්වහන්සේට වැන්දවූයෙම්වීනම් ඉතායෙහෙකැයි කියා සිතුයේය. මෙසේ සිතා ඊට ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම කුසිනාරාවැසි මල්‍ලරජදරුවන් එක එක කුලපරිවර්‍තන වශයෙන් වෙන වෙනම සිටුවා සවාමීන්වහන්ස මෙනම් සේනාවක්ඇති මල්‍ලරජතෙම පුත්‍රභාය්‍ය්‍යා පිරිවර අමාත්‍යාදීන් සමගව භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදවන්දය මස්තකය කරණකොටගෙණ වඳින්නේයයි කියා භාග්‍යවතුන්වහන්සේට වැන්දවූයේය. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම මෙම ක්‍රමයෙන්ම ප්‍රථමයාමයෙහිම කුසිනාරාවැසි මල්‍ලරජදරුවන් භාග්‍යවතුන්වහන්සේට වැන්දවූයේය.

23. එසමයෙහි වනාහි සුභද්‍රනම්වූ පරිබ්‍රාජකයෙක් කුසිනාරානම් පුරප්‍රවරයෙහි වාසයකරයි.

අස්සොසි බො සුභද්දො පරිබ්බාජකො අජ්ජකිර රත්තියා පච්ඡිමෙ යාමෙ සමණස්ස ගොතමස්ස පරිනිබ්බාණං භවිස්සතීති. අථ බො සුභද්දස්ස පරිබ්බාජකස්ස එතදහොසි, සුතං බොපන මෙතං පරිබ්බාජකානං වුඩ්ඪානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං කදාචි කරහචි තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා. අජ්ජච රත්තියා පච්ඡිමෙ යාමෙ සමණස්ස ගොතමස්ස පරිනිබ්බාණං භවිස්සති, අත්ථිච මෙ අයං කඞ්ඛාධම්මො උප්පන්නො එවං පසන්නො අහං සමණෙ ගොතමෙ. පහොති මෙ සමණො ගොතමො තථා ධම්මං දෙසෙතුං යථා අහං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යන්ති.

24. අථ බො සුභද්දො පරිබ්බාජකො යෙන උපවත්තනං මල්ලානං සාලවනං යෙන ආයස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා.

---

ඒ සුභද්‍රනම් පරිබ්‍රාජකතෙමඅදරාත්‍රියගේ පශ්චිමයාමයෙහිදී ශ්‍රමණ භවත් ගෞතමයානන් වහන්සේගේ පරිනිර්වාණයවන්නේයයි ඇසුයේමය. ඉක්බිත්තෙන් සුභද්‍රනම් පරිබ්‍රාජකයාහට මෙසේවූ සිතෙක් වූයේය. අහිත් සම්‍යක්සම්බුද්ධවූ තථාගතවරයෙ ඉතාබොහෝවූ දීර්ඝකාලයකින් ලොවඋපදනාහුයයි කියා වෑඩිහිටිවූ මහලුවූ තමාගේ ආචාර්‍ය්‍යයන්විසින් හා පාචරියභාවොපගත පරිබ්‍රාජකයන්විසින් කියනලද මේ වචනය මාවිසින් අසන ලද්දේය. අදරාත්‍රියගේද පශ්චිමයාමයෙහි ශ්‍රමණ භවත් ගෞතම යානන්වහන්සේගේ පිරිනිවන්පෑමද වන්නේය. මට උපන් නාවූ විමතිධර්ම්යකුදු ඇත්තේය. යම්සේ මම මේ විමතිධර්ම්ය දුරුකෙරෙම්ද එපරිද්දෙන් මට ධර්මදෙශනා කරන්ට ශ්‍රමණ භවත් ගෞතමතෙම පොහොසත්වනසේක්යැයිකියා මම ශ්‍රමණ භවත් ගෞතමයන්වහන්සේ කෙරෙහි මෙසේ ප්‍රසන්නයෙමි. හෙවත් මෙසේ පහන්වීම් කියා සිතුයේය.

24. ඉක්බිත්තෙන් සුභද්‍රනම් පරිබ්‍රාජකතෙම මල්ලරජදරුවන්ගේ උපවර්තනනම් සාලවනොද්‍යානය යම් තැනකද ආයුෂ්මත් ආනන් දස්ථවිරතෙම යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ,

ආයස්මන්තං ආනන්දං එතදවොච. සුතංමෙතං භො ආනන්ද පරිබ්බාජකානං වුඩ්ඪානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං කදාචි කරහචි තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධාති. අජ්ජ ච රත්තියා පච්ඡිමෙ යාමෙ සමණස්ස ගොතමස්ස පරිනිබ්බාණං භවිස්සති අත්ථි ච මෙ අයං කඞ්ඛාධම්මො උප්පන්නො එවං පසන්නො අහං සමණෙ ගොතමෙ, පහොති මෙ සමණො ගොතමො තථා ධම්මං දෙසෙතුං යථා අහං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යං ස්වාහං භො ආනන්ද ලභෙය්‍යං සමණං ගොතමං දස්සනායාති. එවං වුත්තෙ ආයස්මා ආනන්දො සුභද්දං පරිබ්බාජකං එතදවොච. අලං ආවුසො සුභද්ද මා තථාගතං විහෙඨෙසි කිලන්තො භගවාති. දුතියම්පි ඛො ......පෙ......තතියම්පි ඛො සුභද්දො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං එතදවොච. සුතං මෙතං භො ආනන්ද පරිබ්බාජකානං වුඩ්ඪානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං කදාචි කරහචි තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා.

---

ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්ට මෙසේකියේය. පින්වත්වූ ආනන්දස්ථවිරය අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතවරයෝ ඉතාබොහෝවූ දීර්ඝ කාලයකින් ලොවඋපදනාහුයයි කියා වෘද්ධශීලීවූ මහලුවූ තමාගේ ආචාර්‍ය්‍යවරයන්ගෙන් භාපාචරියභාවොපගත පරිබ්‍රාජකයන් කෙරෙන්ද මේ වචනය මා විසින් අසනලද්දේය. අදරාත්‍රියගේ පශ්චිම යාමයෙහි ශ්‍රමණ භවත් ගෞතමයන්වහන්සේගේ පිරිනිවන්පෑම වන්නේය. මට උපන්නාවූ මේ විමතිධර්මයකුදු ඇත්තේය. යම්සේ මම මේ විමතිධර්මය දුරුකෙරෙම්ද එපරිද්දෙන් ධර්මදෙශනාකරන්ට ශ්‍රමණ භවත් ගෞතමතෙම පොහොසත්වන්නේයයි කියා මම ශ්‍රමණ භවත් ගෞතමයන්වහන්සේ කෙරෙහි මෙසේ ප්‍රසන්නයෙමි. පින්වත්වූ ආනන්දස්ථවිරයන්වහන්ස ඒමම ශ්‍රමණ භවත් ගෞතමයානන්වහන්සේ දර්ශනයට ලබන්නෙමියි කියා යාච්ඤාකළේය. සුභද්‍ර පරිබ්‍රාජකයා මෙසේ කීකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම සුභද්‍රනම් පරිබ්‍රාජකයාහට මෙසේ වදාළසේක. ඇවැත්වූ සුභද්‍රය පමණි. භාග්‍යවත්තෙම ක්ලාන්තසේක තථාගතයන්වහන්සේ නොවෙහෙසවයි වදාළසේක. දෙවෙනි වරෙහිද සෙස්ස කීනයිනි. තුන්වෙනි වරෙහිද—පෙ—සුභද්‍රපරිබ්‍රාජකතෙම ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට මේ කාරණය සැලකළේය. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස වෘද්ධවූ මහලුවූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යවූ කියන්නාවූ පරිබ්‍රාජකයන්ගේ සමීපයෙන් මේ කාරණය අසනලද්දේය. ඉතා බොහෝකලකින් අර්හත්සම්‍යක්සම්බුද්ධවූ තථාගතයන්වහන්සේලා ලොකයෙහි උපදින්නාහුය යනුයි.

අජ්ජ ච රත්තියා පච්ඡිමෙ යාමෙ සමණස්ස ගොතමස්ස පරිනිබ්බාණං. භවිස්සති. අත්ථි ච මෙ අයං කඞ්ඛාධම්මො උප්පන්නො එවං පසන්නො අහං සමණෙ ගොතමෙ පහොති මෙ සමණො ගොතමො තථා ධම්මං දෙසෙතුං යථා අහං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යං. ස්වාහං භො ආනන්ද ලභෙය්‍යං සමණං ගොතමං දස්සනායාති. තතියම්පි ඛො ආයස්මා ආනන්දො සුභද්දං පරිබ්බාජකං එතදවොච. අලං ආවුසො සුභද්ද මා තථාගතං විහෙඨෙසි. කිලන්තො භගවාති.

25. අස්සොසි ඛො භගවා ආයස්මතො ආනන්දස්ස සුභද්දෙන පරිබ්බාජකෙන සද්ධිං ඉමං කථාසල්ලාපං. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. අලං ආනන්ද මා සුභද්දං වාරෙසි. ලභතං ආනන්ද සුභද්දො තථාගතං දස්සනායයං. කිඤ්චි මං සුභද්දො පුච්ඡිස්සති සබ්බන්තං අඤ්ඤාපෙක්ඛොව පුච්ඡිස්සති.

---

මේ රැය පිළිබඳ පශ්චිමයාමයෙහි ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේගේ පරිනිර්වාණය වන්නේය. මට මේ උපන්නාවූ ශඞ්කා ධර්මයක් ඇත්තේමය. ශ්‍රමණ ගෞතමයන්වහන්සේ කෙරෙහි මම මෙසේ ප්‍රසන්න වෙම්ද එසේ මට ධර්මදේශනාකරන්ට ශ්‍රමණ ගෞතමයන්වහන්සේ සමර්ථවෙයි. යම්සේ මම මේශඞ්කා ධර්මය දුරුකරන්නෙම්ද එසේයි. පින්වත්වූ ආනන්දස්ථවිරයන් වහන්ස ඒ මම ශ්‍රමණ භවත් ගෞතමයන්වහන්සේගේ දර්ශනය ලබන්නෙමියි යාච්ඤාකළසේක. තුන්වෙනි වරෙහිද ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම සුභද්‍රනම් පරිබ්‍රාජකයාහට මෙසේ වදාළසේක. අවැත්වූ සුභද්‍රය භාග්‍යවත්තෙම ක්ලාන්තසේක. තථාගතයන්වහන්සේ නොවෙහෙසවනු වදාළසේක.

25 භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරයන්වහන්සේ හා සුභද්‍රනම් පරිබ්‍රාජකයා ගේ මේකථාසල්ලාපය අසාවදාළසේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරයන්වහන්සේට අඬගාවදාළසේක. ආනන්දය නුසුදුසුයි සුභද්‍රයානොවලක්වව. සුභද්‍ර පරිබ්‍රාජකතෙම තථාගතයන්වහන්සේගේ දැකීම ලබන්නේය. සුභද්‍රතෙම මාගෙන් යම්කිසිවක් විචාරන්නේද ඒ සියල්ල දැනගන්ට කැමතිවම විචාරන්නේය.

නො විහෙඨා පෙඛො. යඤ්චස්සාහං පුට්ඨො ව්‍යාකරිස්සාමි තංඛිප්පමෙව ආජානිස්ස තීති. අථඛො ආයස්මා ආනන්දො සුභද්දං පරිබ්බජකං එතදවොච. ගච්ඡාවුසො සුභද්ද කරොති තෙ භගවා ඔකාසන්ති.

26. අථ ඛො සුභද්දො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුභද්දො පරිබ්බාජකො භගවන්තං එතදවොච. යෙ මෙ භො ගොතම සමණබ්‍රාහ්මණා සඞ්ඝිනො ගණිනො ගණාචරියා ඤාතා යසස්සිනො තිත්ථකරා සාධුසම්මතා ච බහුජනස්ස, සෙය්‍යථීදං පූරණො කස්සපො මක්ඛලි ගොසාලො අජිතො කෙසකම්බලී පකුධො කච්චායනො සඤ්ජයො බෙලට්ඨිපුත්තො නිගණ්ඨො නාථපුත්තො. සබ්බෙ තෙ සකාය පටිඤ්ඤාය

---

මා වෙහෙසනු කැමතිව නොවන්නේය. ඔහු විසින් යමක් විචාරණ ලදුව මම ඔහට ප්‍රකාශකෙරෙම්ද ඒ ප්‍රකාශකොට කියනලද කාරණය වහාම ඔහු දැනගන්නේයයි වදාළසේක. ඉක්බිත්තෙන් ආයුමත්වූ ආනන්ද ස්ථවිරතෙම සුභද්‍රනම් පරිබ්‍රාජකයාහට මෙසේ කීසේක. ඇවැත්වූ සුභද්‍රය යව භාග්‍යවතුන්වහන්සේ තට අවසරදෙවා වදුරණසේකැයි කීයේය.

26. ඉක්බිත්තෙන් සුභද්‍ර පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ සුභද්‍ර පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන්වහන්සේට මේ මතුකියන වචනය සැළකළේය. භවද් ගෞතමයන්වහන්ස, අතවැසි සඞ්ඝයා ඇත්තාවූ ගණසමූහයා ඇත්තාවූ ශ්‍රාවකගණාචාර්‍ය්‍යවූ ලොකප්‍රසිද්ධවූ යශස පිරිවරඇත්තාවූ ලබ්ධිඇතිකරන්නාවූ බොහෝ ජනයාවිසින් මැනවැයි සම්මත කරණලද්දාවූ යම් මේ ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක් ඇත්තාහුද ඔව්හු කවරහුදයත්. පූරණකාශ්‍යපය, මක්ඛලිගොසාලය, අජිතකෙශකම්බලිය, පකුධකාත්‍යායනය, සඤ්ජයබෙලට්ඨිපුත්‍රය, නිගණ්ඨනාථපුත්‍රය යන මොව්හුයි. ඔව්හු සියල්ලෝම ඔවුන්ගේ ස්වකීය ප්‍රතිඥාව යම්සේද.

අබ්භඤ්ඤංසු සබ්බෙව නඅබ්භඤ්ඤංසු එකච්චෙවඅබ්භඤ්ඤංසු එකච්චෙව න අබ්භඤ්ඤංසූති……අලං සුභද්ද තිට්ඨතෙතං සබ්බෙ තෙසකාය පටිඤ්ඤාය අබ්භඤ්ඤංසු සබ්බෙව නඅබ්භඤ්ඤංසු උදාහු එකච්චෙව නාබ්භඤ්ඤංසූති. ධම්මං තෙ සුභද්ද දෙසිස්සාමි තං සුණාහි සාධුකං මනසි කරොහි භාසිස්සාමීති. එවං භන්තෙති ඛො සුභද්දො පරිබ්බාජකො භගවතො පච්චස්සොසි භගවා එතදවොච.

27. යස්මිංඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො නඋපලබ්භති සමණොපි තත්ථ නඋපලබ්භති දුතියොපි තත්ථ සමණො නඋපලබ්භති තතියොපි තත්ථ සමණො න උපලබ්භති චතුත්ථොපි තත්ථ සමණො නඋපලබ්භති. යස්මිඤ්ච ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති සමණොපි තත්ථ උපලබ්භති.

යම්සේද එපරිද්දෙන්ම දැනගත්තාහුද සියල්ලෝම නොදැනගත්තාහුද නොහොත් සමහරෙක් දැනගත්තාහුද සමහරෙක් නොමදැනගත්තාහුදැයි කියා ඔහුවිසින් මෙසේ විචාරණලද්දේ වෙයි. එම්බා සුභද්‍රය, පමණි. ඔහු සියල්ලෝම තමතමන්ගේ ස්වකීය ප්‍රතිඥාවෙන්ම දැනගත්තාහුයයි කියාද සියල්ලෝම දැනනොගත්තාහුයයි කියාද නොහොත් සමහරෙක් නොමදැනගත්තාහුයයි යන තාගේ ඒ වචනය සිටුව. සුභද්‍රය,තට ධර්මදෙශනාකරන්නෙමි. ඒ ධර්මය මනාකොට අසව. යහපත්කොට සිත්හි කරව. දෙශනාකරන්නෙමියි වදාළසේක. එසේය ස්වාමීන්වහන්සැයි කියා සුභද්‍රපරිබ්‍රාජකතෙම භාග්‍යවතුන්වහන්සේගේ වචනයට ප්‍රතිවචන දුන්නේය. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.

27. එම්බා සුභද්‍රය යම් ධර්මවිනයෙක්හි ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නොලැබෙන්නේද ඒ ධර්මවිනයෙහි පළමුවෙනි මහණතෙමේද නොලැබෙන්නේය. ඒ ධර්මවිනයෙහි දෙවෙනි මහණතෙමේද නොලැබෙන්නේය. ඒ ධර්මවිනයෙහි තුන්වෙනි මහණතෙමේද නොලැබෙන්නේය. ඒ ධර්මවිනයෙහි සතරවෙනි මහණතෙමේද නොලැබෙන්නේය. එම්බා සුභද්‍රය යම් ධර්මවිනයෙක්හි ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයතෙම ඇත්තේද ඒ ධර්මවිනයෙහි පළමුවෙනි ශ්‍රමණතෙමේද ඇත්තේවෙයි.

දුතියොපි තත්‍ථ සමණො උපලබ්භති තතියොපි තත්‍ථ සමණො උපලබ්භති චතුත්‍ථොපි තත්‍ථ සමණො උපලබ්භති. ඉමස්මිංඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති ඉධෙව සුභද්ද සමණො ඉධ දුතියො සමණො ඉධ තතියො සමණො ඉධ චතුත්‍ථො සමණො සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ. ඉමෙව සුභද්ද භික්ඛූ සම්මාවිහරෙය්‍යුං අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්ස.

එකූනතිංසො වයසා සුභද්ද
යං පබ්බජිං කිං කුසලානුඑසී,
වස්සානි පඤ්ඤාස සමාධිකානි
යතො අහං පබ්බජිතො සුභද්ද.
ඤායස්ස ධම්මස්ස පදෙසවත්ති
ඉතො බහිද්ධා සමණොපි නත්‍ථි.

ඒ ධර්මවිනයෙහි දෙවෙනිමහණතෙමේද ඇත්තේවෙයි. ඒ ධර්මවිනයෙහි තුන්වෙනිමහණතෙමේද ඇත්තේවෙයි ඒධර්මවිනයෙහි සතරවෙනි මහණතෙමේද ඇත්තේවෙයි. සුභද්‍රය මාගේ මේ ධර්මවිනයෙහි ආය්‍ය්‍ෂී අෂ්ටාඞ්ගික මාගීය ඇත්තේය. එම්බා සුභද්‍රය මාගේ මේ ශාසනයෙහිම පළමුවෙනි ශ්‍රොතාපත්තිශ්‍රමණතෙමේද ඇත් තේය මේ ශාසනයෙහි දෙවෙනිවූ සකෘදාගාමිශ්‍රමණතෙමේද ඇත්තේය. මාගේ මේ ශාසනයෙහි තුන්වෙනිවූ අනාගාමි ශ්‍රමණතෙමේද ඇත්තේය. මෙහි සතරවැනිවූ අර්හත් ඵලප්‍රාප්ත ශ්‍රමණතෙමේද ඇත්තේය. අන්‍යවාදයෝ ශ්‍රමණයන් කෙරෙන් හිස් වන්නාහුයයි වදාළසේක. එම්බා සුභද්‍රය මාගේ මේ ශාසනයෙහිමෙන් අන්‍යවාදි භික්ෂුහු. සම්‍යක් විහරණයෙන් යුක්තව වාසය කරන් නාහු නම් මේ ලොකය රහතුන් කෙරෙන්ශූන්‍ය නොවන්නේමය. එම්බා සුභද්‍රය වයසින් එකුන්තිස් හැවිරිදි ඇත්තේම සර්වඥතාඥනය සොයමින් මම යම් කාලයෙක්හි පැවිදිවූයෙමද එතැන් පටන් අදදක්වා මේ අතුරෙහි අවුරුද්දක් අධිකකොට ඇති පණස් අවුරුද්දක් වන්නාහුය. මාගේ මේ ශාසනයෙන්. පිටත්වූ අන්‍යවාද යෙක්හි ආය්‍ය්‍ෂී මාගී ධර්මයට ප්‍රදෙශ වර්තීවූ විදර්ශක ශ්‍රමණයෙකුත් නැත්තේය

දුතියොපි සමණො නත්ථි තතියොපි සමණො නත්ථි. චතුත්ථොපි සම ණො නත්ථි සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ ඉමෙව සුභද්ද භික්ඛූ සම්මා විහරෙය්‍යුං අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්සාති.

28. එවං වුත්තෙ සුභද්දො පරිබ්බාජකො භගවන්තං එතදවොච. අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්සවා මග්ගං ආචික්ඛෙය්‍ය. අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛු මන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යාහං උපසම්පදන්ති.

---

දෙවෙනි ශ්‍රමණයෙකුත් නැත්තේය. තුන්වෙනි ශ්‍රමණයෙකුත් නැත්තේය. අභිත්ඵලප්‍රාප්තවූ සතරවෙනි ශ්‍රමණයෙකුත් නැත්තේය. එහෙයින් අන්‍යවාදයෝ ශ්‍රමණයන්කෙරෙන් ශූන්‍යවන් නාහුය. සුභද්‍රය, මාගේ මේ ශාසනයෙහිමෙත් අන්‍යාගම්හිද භික්ෂූහු සම්‍යක් විහරණයෙන් යුක්තව වාසයකරන්නාහුනම් මේ ලොකය තෙම රහතුන්ගෙන් ශූන්‍ය නොවන්නේයයි වදාළසේක.

28. මෙසේ වදාළකල්හි සුභද්‍රපරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන් සේට මෙසේ සැලකළේය' ස්වාමීන් වහන්ස., ධර්මදෙශනාව ඉතා මැනව. ස්වාමීන් වහන්ස, ධර්මදෙශනාව වැඩියක් මැනැව. ස්වාමීන් වහන්ස, අධොමුඛකොට තබනලද භාජනයක් උඩුකුරුකොට තබන්නේහෝ යම්සේද තෘණපණ්ණාදියෙන් ප්‍රතිච්ඡන්නවූ යම් කිසි වස්තුවක් විවෘතකොට දක්වන්නේහෝ යම්සේද මංමුලාවූ පුරුෂ යෙකුට මඟ කියන්නේ හෝ යම්සේද ඇස් ඇත්තෝ නීලපීතාදි රූප යන් දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කාරණයෙන් ධර්මය ප්‍රකාශ කරණලද්දේය. ස්වාමීන්වහන්ස, මේ මම භාග්‍යවතුන් සේද නව ලොකොත්තර ශ්‍රී සද්ධර්මයද අෂ්ටාර්‍ය්‍ය පුද්ගල භික්ෂු සඞ්ඝයා වහන්සේද සරණකොටයමි. මම භාග්‍යවතුන්වහන්සේගේ සමීප යෙහි පැවිද්දහා උපසම්පදාවද ලබන්නෙමියි සැලකෙළේය.

යො ඛො සුභද්ද අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං ආකඞ්ඛති උපසම්පදං සො චත්තාරො මාසෙ පරිවසති චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපිච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතාති.

29. සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා පබ්බජ්ජං ආකඞ්ඛන්තා උපසම්පදං චත්තාරො මාසෙ පරිවසන්ති චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි. චතුන්නං වස්සානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්තු උපසම්පාදෙන්තු භික්ඛුභාවායාති. අථඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි.

---

සුභද්‍රය, පෙර අන්‍යතීර්ථකවූ යම් පුද්ගලයෙක්තෙම මේ ශාසනයෙහි පැවිදිවීම කැමති වන්නේවේද උපසම්පදාව කැමති වන්නේවේද, ඒ පුද්ගලතෙම සාරමසක් භික්ෂු සඞ්ඝයාවෙත වෙසේද· සාරමසක්හුගේ ඇවෑමෙන් සුශික්ෂිතභාවයෙන් ආරාධනය කරණලද(සතුටුකරණලද) සිත්ඇති භික්ෂූහු ඔහු පැවිදි කරවන්නාහුය. භික්ෂුභාවයපිණිස උපසම්පදාද කරවන්නාහුයයි වදාළ සේක. තවද මෙතැන්හි හෙවත් මේ කාරණයෙහි පුද්ලයාගේ විමතිතාවය දන්නාලද්දී වෙයි.

29. ස්වාමින්වහන්ස ඉදින් පෙර අන්‍යතීර්ථකවූ යම් පුද්ගලකෙනෙක් නුඹ වහන්සේගේ මේ ශාසනයෙහි පැවිද්දහා උපසම්පදාව කැමති වන්නාහුවෙද්ද ඔහුවිසින් සාරමාසයක් භික්ෂුසඞ්ඝයාවෙත විසියයුතුයෙත්. සාරමසක්හුගේ ඇවෑමෙන් සුශික්ෂිත භාවයෙන් සිත්ගන්නාලදභික්ෂූහුඔහු පැවිදිකරවන්නාහුවෙද්ද. භික්ෂුභාවයපිණිසඋපසම්පදා කරවන්නාහුද මම සතර හවුරුද්දක් භික්ෂුසඞ්ඝයාවහන්සේවෙත උවටැන් කරමින් වාසය කරමි. සතර හවුරුද්දක්හුගේ ඇවෑමෙන් ආරාධනය කරණලද සිත් ඇති භික්ෂූහු මාපැවිදි කරත්වා, භික්ෂුභාවයපිණිස උපසම්පදාද කරත්වායි සැලකළේය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට අඩගාවදාළසේක.

තෙනහානන්ද සුභද්දං පබ්බාජෙථාති. එවම්භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

30. අථ ඛො සුභද්දො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං එතදවොච. ලාභා වො ආවුසො ආනන්ද. සුලද්ධං වො ආවුසො ආනන්ද යෙ එත්ථ සත්ථරි සම්මුඛා අන්තෙවාසාභිසෙකෙන අභිසිත්තොති. අලත්ථ ඛො සුභද්දො පරිබ්බාජකො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා සුභද්දො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති,

---

ආනන්දය, එසේවීනම් සුභද්‍රයා පැවිදි කරවයි වදාළ සේක. ස්වාමීන් වහන්ස, ඒ මැනවයි අයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ප්‍රතිවචන දුන්නේය.

30. ඉක්බිත්තෙන් සුභද්‍ර පරිබ්‍රාජකතෙම අයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ සැලකළේය. ඇවැත්වූ ආනන්ද ස්ථවි රයන්වහන්ස, නුඹවහන්සේටමහත්වූ ලාභයෙක, ආනන්දස්ථවිරයන් වහන්ස' නුඹ වහන්සේවිසින් ලබනලද ජීවිතය මනා කොට ලබන ලද්දේය. යම්බදුවූ නුඹවහන්සේ මේ ශාසනයෙහි ශාස්තෲන් වහන් සේගේ සම්මුඛයෙන්ම අතවැසිබව නැමති අභිෂෙකයෙන් අභිසෙක කරණ ලද්දේද එහෙයිනි. සුභද්‍ර පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාවහා උපසම්පදාවද ලැබූයේය. උපසම්පදාවූ නොබෝකල් ඇත්තාවූ ආයුෂ්මත් සුභද්‍රස්ථවිරතෙම කාය විවෙකයෙන්හා චිත්තවිවෙකයෙන් විශෙෂයෙන්, භාව නාවට පැමිණ එකඟබවට පැමිණියේ අප්‍රමාදභාවයෙන් යුක්තව කායික චෛතසිකවීර්‍ය්‍යඇතිව හරණලද ආත්මස්නෙහ ඇතිව වාසය කරණසේක්. නොබෝ කලකින්ම යම් අර්හත් ඵලයක් පිණිස කුල පුත්‍රයෝ මනාකොටම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවැදි වන් නාහුවෙද්ද.

තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ඛො පනායස්මා සුභද්දො අරහතං අහොසි. සො භගවතො පච්ඡිමො සක්ඛිසාවකො අහොසීති.

**හිරඤ්ඤවතිය භාණවාරං**
**නිට්ඨිතං පඤ්චමං.**

**6.** 1. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. සියා ඛො පනානන්ද තුම්හාකං එවමස්ස.

---

ඒනිරුත්තරවූ ශාසනමාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවරකොටඇති අර්හත්ඵලය ඉහාත්ම භාවයෙහිම තෙමේ ස්වයම්භූඥාන යෙන්දැන සාක්ෂාත් කොට ඊට පැමිණ වාසය කෙළේය. ක්ලෙශ ප්‍රහාණියෙන් ක්ෂයකරණලද ජාති ඇතිව මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යා වෙන්යෙදී වාසය කරණලද්දේ මාර්ග කෘත්‍යය කරණ ලද්දේය. මේ ක්ලෙශක්ෂය පිණිස අතිකුත් මාර්ගභාවනාවක් නැත්තේයයි කියා ප්‍රත්‍යක්ෂඥාන යෙන් මනාකොට විශෙෂයෙන්ම දැනගත්තේය. ආයුෂ්මත්වූ සුභද්‍ර ස්ථවිරතෙම රහතුන් වහන්සේලා අතුරෙන් එක්තරා රහත්කෙනෙක්වූසේක. ඒසුභද්‍රස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ පශ්චිමවූ සාක්ෂිදායක ශ්‍රාවකවූසේක.

**පස්වෙනිවූ හිරඤ්ඤවතිය බණවර**
**මෙතෙකින් කියා නිමවනලදී.**

**6.** 1. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ආමන්ත්‍රණයකර වදාළසේක. ආනන්දය මේ මතුකියන කාරණය මෙසේවන්නේයයිතොපට මෙබඳු අදහසක්වන්නේය

අතීතසත්ථුකං පාවචනං නත්ථි නො සත්ථාති. න ඛො පනෙතං ආනන්ද එවං දට්ඨබ්බං යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා.

2. යථා ඛො පනානන්ද එතරහි භික්ඛූ අඤ්ඤමඤ්ඤං ආවුසොවාදෙන සමුදාචරන්ති න වො මමච්චයෙන එවං සමුදාචරිතබ්බං. ථෙරතරෙන ආනන්ද භික්ඛුනා නවකතරො භික්ඛු නාමෙන වා ගොත්තෙන වා ආවුසොවාදෙන වා සමුදාචරිතබ්බො. නවකතරෙන භික්ඛුනා ථෙරතරො භික්ඛු භන්තෙති වා ආයස්මාති වා සමුදාචරිතබ්බො.

3. ආකඞ්ඛමානො ආනන්ද සඞ්ඝො මමච්චයෙන ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහන්තු.

---

මාවිසින් දෙසනලද පාලිත්‍රිපිටකධර්මය ශාස්තෘත්වහන්සේ නැති කළ අතික්‍රාන්තවන්නේය. එහෙයින් අපට අනුශාසකවූ ශාස්තෘන්වහන්සේ කෙනෙක් නැත්තේයකියා තොපට මෙසේවූ කල්පනාවෙක්වන්නේනම් මේ කාරණය මෙසේ නොදක්ක යුත්තේය. ආනන්දය, මාවිසින් තොපට යම් ධර්මයක් මනාකොට දෙශනාකරණ ලදද එසේම යම් විනයප්‍රඥප්තියක් දෙශනාකිරීම් වශයෙන් පිහිටුවනලදද ඒ ධර්මවිනයදෙක මාගේ ඇවෑමෙන් තොපට ශාස්තෘවින්නේයයි වදාළසේක.

2 ආනන්දය යම්සේ දැන් මේකාලයෙහි භික්ෂූහු ඔවුනොවුන් ආවුසොයනුකීමෙන් කථාකරන්නාහුද මාගේ ඇවෑමෙන් තොපවිසින් මෙසේ කථානොකටයුත්තීය. ආනන්දය ස්ථවිරවූ භික්ෂූහුවිසින් නවකතර භික්ෂුතෙම නම්වශයෙන් හෝ ගොත්වශයෙන් හෝ ආවුසොයයි කීමෙන් හෝ කථාකටයුත්තේය. බාලවූ භික්ෂූහුවිසින් ස්ථවිර භික්ෂුතෙමේ ස්වාමිනිකියා හෝ ආයුෂ්මතුන්වහන්ස කියා හෝ කථාකටයුත්තේය.

3. ආනන්දය සඞ්ඝතෙම ඉදින් කැමැතිවන්නේනම් මාගේ ඇවෑමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍රවූ ශික්ෂාපදයන් සමූහනනය කෙරේවා.

4. ඡන්නස්ස ආනන්ද භික්ඛුනො මම'ච්චයෙන බ්‍රහ්මදණ්ඩො කාතබ්බොති. කතමො පන භන්තෙ බ්‍රහ්මදණ්ඩොති. ඡන්නො ආනන්ද භික්ඛු යං ඉච්ඡෙය්‍ය තං වදෙය්‍ය, සො භික්ඛූහි නෙව වත්තබ්බො න ඔවදිතබ්බො න අනුසාසිතබ්බොති.

5. අථඛො භගවා භික්ඛූ ආමන්තෙසි. සියා ඛො පන භික්ඛවෙ එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා. පුච්ඡථ භික්ඛවෙ මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. සම්මුඛීභූතො නො සත්ථා අහොසි, න මයං සක්ඛිම්හ භගවන්තං සම්මුඛා පටිපුච්ඡිතුන්ති, එවං වුත්තෙ තෙ භික්ඛූ තුණ්හී අහෙසුං. දුතියම්පි ඛො භගවා,, තතියම්පි ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. සියා ඛො පන භික්ඛවෙ එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා.

---

4. ආනන්දය ඡන්නභික්ෂුහට මාගේ ඇවෑමෙන් බ්‍රහ්මදණ්ඩය කටයුත්තේයයි වදාළසේක. ස්වාමීන්වහන්ස බ්‍රහ්මදණ්ඩයනම් කවරේදැයිවිචාළේය. ආනන්දය ඡන්නභික්ෂුතෙම තමාට යමක් කැමැත්තේද එයම කියන්නේය. ඔහුතෙම භික්ෂූන්විසින් කිසිවක් නොකියයුත්තේය. අවවාදද නොකටයුත්තේය, අනුශාසනාද නොකටයුත්තේයයි වදාළසේක.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කර වදාළසේක. මහණෙනි තොපඅතුරෙන් එකමභික්ෂුකෙනෙකුටත් බුදුන්කෙරෙහිහෝ ධර්මයකෙරෙහිහෝ සඞ්ඝයාකෙරෙහිහෝ ප්‍රතිපදාව කෙරෙහි හෝ සැකයක් හෝ විමතියක් වූයේනම් මහණෙනි, එය විචාරව්, අපගේ ශාස්තෘන්වහන්සේ සම්මුඛවූයේය, නමුත් අපිඑ භාග්‍යවතුන්වහන්සේ සම්මුඛයෙහි විචාරන්ට නොහැකිවූම්හයි කියා පසුව විපිළිසර නොවව්යයි වදාළසේක. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළකල්හි ඒ භික්ෂූහු නිශ්ශබ්දවූහ. භාග්‍යවතුන්වහන්සේ දෙවෙනිවරද—පෙ—තුන්වෙනිවරද භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණයකරවදාළසේක, මහණෙනි, තොප අතුරෙන් එකම භික්ෂුවකටත් බුදුන්කෙරෙහි හෝ ධර්මයකෙරෙහි හෝ.

සඞ්ඝෙ වා පටිපදාය වා පුච්ඡථ භික්ඛවෙ මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, සම්මුඛීභූතො නො සත්ථා අහොසි. න මයං සක්ඛිම්හ භගවන්තං සම්මුඛා පටිපුච්ඡිතුන්ති. තතියම්පි ඛො තෙ භික්ඛූ තුණ්හී අහෙසුං. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. සියා ඛො පන භික්ඛවෙ සත්ථුගාරවෙනපි නපුච්ඡෙය්‍යාථ සහායකො භික්ඛවෙ සහායකස්ස ආරොචෙතූති. එවං වුත්තෙ තෙ භික්ඛූ තුණ්හී අහෙසුං.

6. අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච, අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ. එවං පසන්නො අහං භන්තෙ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ, නත්ථි එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා පටිපදායවා ති. පසාදා ඛො ත්වං ආනන්ද වදෙසි.

---

සඞ්ඝයා කෙරෙහි හෝ ප්‍රතිපත්තියෙහි හෝ සැකයක් හෝ විමතියක් වූයේනම් එය විචාරව්, අපගේ ශාස්තෘන්වහන්සේ සම්මුඛවූයේය. නමුත් අපි ඒ භාග්‍යවතුන්වහන්සේගේ සම්මුඛයෙන් මේකරුණු විචාරන්ට නොහැකිවූම්හයි. මහණෙනි පසුව විපිළිසරනොවව්යයි වදාළ සේක. තුන්වෙනිවරද ඒ භික්ෂූහු නිශ්ශබ්දවූහ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක. මහණෙනි, ශාස්තෘන්වහන්සේ කෙරෙහි ගෞරවයෙනුදු ඉදින් නොවිචාරන් නාහුනම් මහණෙනි, යහලු භික්ෂුකෙනෙක් යහලුභික්ෂුවට කියාවයි වදාළසේක. මෙසේ වදාළකල්හිද ඒ ක්ෂූහු නිශ්ශබ්දවූහ.

6. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මේකාරණය සැළකලසේක. ස්වාමින්වහන්ස මේකාරණය අසිරිමත්වෙයි. ස්වාමින්වහන්ස මේකාණය පෙරනූවූවක. ස්වාමීන්වහන්ස මම මෙසේ පහන්වූයෙමි. කෙසේද, මේ භික්ෂුසඞ්ඝයා වහන්සේකෙරෙහි එකම භික්ෂුවකටවත් බුදුන්කෙරෙහි හෝ ධර්මය කෙරෙහි හෝ සඞ්ඝයාකෙරහි හෝ ප්‍රතිපත්තියෙහි හෝ සැකයක් හෝ විමතියක් නැත්තේයකියායි. ආනන්දය තෝ පැහැදීම හේතු කොටගෙණම මෙසේ සැකරහිතයයි මේකරුණයම ප්‍රකාශකළෙහිය .

ඤාණමෙවහෙත්ථ ආනන්ද තථාගතස්ස නත්ථි ඉමස්මිං භික්ඛු සඞ්ඝෙ, නත්ථි එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමතී වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා පටිපදාය වා. ඉමෙසං හි ආනන්ද පඤ්චන්නං භික්ඛුසතානං යො පච්ඡිමකො භික්ඛු සො සොතාපන්නො අවිනිපාත ධම්මො නියතො සම්බොධිපරායනොති.

7. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථාති. අයං තථාගතස්ස පච්ඡිමා වාචා.

8. අථ ඛො භගවා පඨමජ්ඣානං සමාපජ්ජි. පඨමජ්ඣානා වුට්ඨහිත්වා දුතියජ්ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා තතියජ්ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා චතුත්ථජ්ඣානං සමාපජ්ජි.

---

ආනන්දය තථාගතයන්වහන්සේගේ මේ භික්ෂුසඞ්ඝයා අතුරෙන් එක් භික්ෂුවකටත් බුදුන්කෙරෙහිහෝ ධර්මයකෙරෙහිහෝ සඞ්ඝයාකෙරෙහි හෝ ප්‍රතිපදාවකෙරෙහි හෝ සැකයක් හෝ විමතියක් නැත්තේය. ආනන්දය මේ පන්සියයක් භික්ෂූන් අතුරෙන් පශ්චිමවූ යම් භික්ෂු කෙනෙක්වේද ඒ භික්ෂුතෙම සතරඅපායෙහි නොහෙළන ස්වභාව ඇත්තාවූ නියතවූ අභිත්ඵලඥානයෙන් සමන්විතවන බැවින් සම්‍යක් සම්බොධිය පිහිටකොට ඇත්තාවූ ශ්‍රොතආපත්තිඵලයට පැමිණියේ යයි වදාළසේක.

7. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක. මහණෙනි එබැවින් දැන් තොපට ආමන්ත්‍රණයකරමි. සංස්කාරධර්මයෝ විනාශවනබව ස්වභාවකොට ඇත්තාහුය. එහෙයින් ස්මෘතිමත්ව අප්‍රමාදභාවයෙන් සියලුකටයුතු සම්පාදනය කරව්යයි වදාළසේක. (භාග්‍යවතුන්වහන්සේ වදාළතාක්ධර්මය මේ එකම අප්‍රමාදපදයෙහි සඞ්ග්‍රහකළබැව් සැළකියයුතු) මේදක්වනලද්දේ තථාගතයන් වහන්සේගේ පශ්චිමවූ වචනයයි.

8. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ප්‍රථමධ්‍යාන සමාපත්තියට සමවන්සේක. ප්‍රථමධ්‍යානයෙන් නැගීවදාරා ද්විතීයධ්‍යානයට සමවන්සේක. ද්විතියධ්‍යාන සමාපත්තියෙන් නැගීවදාරා තෘතියධ්‍යාන සමාපත්තියට සමවන්සේක. තෘතියධ්‍යාන සමාපත්තියෙන් නැගී වදාරා චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවන්සේක.

චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා ආකාසානඤ්චායතනං සමාපජ්ජි. ආකාසානඤ්චායතනසමාපත්තියා වුට්ඨහිත්වා විඤ්ඤාණඤ්චායතනං සමාපජ්ජි. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියා වුට්ඨහිත්වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජි. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියා වුට්ඨහිත්වා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං සමාපජ්ජි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියා වුට්ඨහිත්වා සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජි. අථ ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච. පරිනිබ්බුතො භන්තෙ අනුරුද්ධ භගවාති. න ආවුසො ආනන්ද භගවා පරිනිබ්බුතො. සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නොති.

9. අථ ඛො භගවා සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියා වුට්ඨහිත්වා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං සමාපජ්ජි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනසමාපත්තියා වුට්ඨහිත්වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජි.

---

චතුර්ථධ්‍යාන සමාපත්තියෙන් නැගීවදුරා ආකාසානඤ්චායතන සමාපත්තියට සමවන්සේක. ආකාසානඤ්චායතන සමාපත්තියෙන් නැගී වදුරා විඤ්ඤාණඤ්චායතන සමාපත්තියටසමවන්සේක. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් නැගීවදුරා ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවන්සේක. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් නැගීවදුරා නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට සමවන්සේක. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන් නැගීවදුරා සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට සමවැද වදාළසේක. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන්වහන්සේ මෙසේ විචාළසේක. ස්වාමිනි, අනුරුද්ධස්ථවිරයන්වහන්ස, භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාළසේක්දැයනුයි. ඇවැත්වූ ආනන්දස්ථවිරය භාග්‍යවත් බුදුරජතෙම තව පිරිනිවන්නොපෑවදාළසේක. සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට සමවන්සේකැයි කීසේක.

9. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගී වදුරා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට සමවන්සේක. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන් නැගී වදුරා ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවන්සේක.

ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියා වුට්ඨහිත්වා විඤ්ඤාණඤ්චායතනං සමාපජ්ජි. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියා වුට්ඨහිත්වා ආකාසා නඤ්චායතනං සමාපජ්ජි. ආකාසානඤ්චායතන සමාපත්තියා වුට්ඨහිත්වා චතුත්ථජ්ඣානං සමාපජ්ජි. චතුත්ථජ්ඣාන සමාපත්තියා වුට්ඨහිත්වා තතියජ්ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා දුතියජ්ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා පඨමජ්ඣානං සමාපජ්ජි. පඨමජ්ඣානා වුට්ඨහිත්වා දුතියජ්ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා තතියජ්ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා චතුත්ථජ්ඣානං සමාපජ්ජි. චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා සමනන්තරා භගවා පරිනිබ්බායි.

10. පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බාණා මහාභූමිචාලො අහොසි. භිංසනකො සලොමහංසො.

---

ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් නැගී වදාරා විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට සමවන්සේක. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් නැගී වදාරා ආකාසානඤ්චායතන සමාපත්තියට සමවන්සේක. ආකාසානඤ්චායතන සමාපත්තියෙන් නැගී වදාරා චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවන්සේක. චතුර්ථධ්‍යාන සමාපත්තියෙන් නැගී වදාරා තෘතියධ්‍යාන සමාපත්තියට සමවන්සේක. තෘතියධ්‍යාන සමාපත්තියෙන් නැගී වදාරා ද්විතීයධ්‍යාන සමාපත්තියට සමවන්සේක. ද්විතීයධ්‍යාන සමාපත්තියෙන් නැගී වදාරා ප්‍රථමධ්‍යාන සමාපත්තියට සමවන්සේක. ප්‍රථමධ්‍යාන සමාපත්තියෙන් නැගී වදාරා ද්විතීයධ්‍යාන සමාපත්තියට සමවැද වදාළසේක. ද්විතීයධ්‍යාන සමාපත්තියෙන් නැගී වදාරා තෘතීයධ්‍යාන සමාපත්තියට සමවන්සේක. තෘතියධ්‍යාන සමාපත්තියෙන් නැගී වදාරා චතුර්ථධ්‍යාන සමාපත්තියට සමවැද වදාළසේක. චතුර්ථධ්‍යාන සමාපත්තියෙන් නැගී වදාරා ඒ චතුර්ථධ්‍යාන සමවතින් නැගීම හා සමග භාග්‍යවතුන්වහන්සේ නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පෑ වදාළසේක.

10. මෙසේ භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාලකල්හි ඒ පිරිනිවන්පෑම හා සමගම බිහිසුණුවූ ලොමුදූහැගැණුම් සහිතවූ මහත් පෘථිවිකම්පාවක් වූයේය.

දෙවදුන්දුභියො ච ඵලිංසු. පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බාණා බ්‍රහ්මා සහම්පති ඉමං ගාථං අභාසි.

සබ්බෙ'ව නික්ඛිපිස්සන්ති
භූතා ලොකෙ සමුස්සයං,
යත්ථ එතාදිසො සත්ථා
ලොකෙ අප්පටි පුග්ගලො,
තථාගතො බලප්පත්තො
සම්බුද්ධො පරිනිබ්බුතො'ති.

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බාණා සක්කො දෙවානමින්දො ඉමං ගාථං අභාසි.

අනිච්චා වත සඞ්ඛාරා
උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති
තෙසං වූපසමො සුඛො'ති.

---

ආකාසයෙහි දිව්‍යදුන්දුභිහුද මහත් ශබ්දපැවැත්වූහ. භාග්‍ය වතුන්වහන්සේ පි රි නි ව න් පෑ ව දා ල ක ල් හි ඒ පරිනිර්වාණය හා සමග සහම්පති බ්‍රහ්මතෙමේ මේ මතුකියන ගාථා ධර්මය කීයේය. සත්වලොකයෙහි සියලු සත්වයෝම එකාන්තයෙන් ජීවිතෙන්ද්‍රිය ප්‍රහීණවීමෙන් ශරීරය බහාතබන්නාහුය. කුමක්හෙයින්ද, යම්පරිද්දෙකින් මේ ලොකයෙහි අප්‍රතිපුද්ගලවූ ලොකානුශාසකවූ තථාගතවූ දසවිධකායඥාණබලයට පැමිණියාවූ මෙබඳුවූ සම්‍යක්සම්බුධයන්වහන්සේ පිරිනිවිසේක්ද. එහෙයිනි, භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාළකල්හි ඒ පිරිනිවන්පෑම හා සමගම සක්දෙවිරජ තෙම මේ මතුකියන ගාථාව කීයේය. සංස්කාර ධර්මයෝ එකාන්තයෙන් අනිත්‍යවන්නාහ. ඉපදීම නැසීම සවභාවකොට ඇත්තාහුය. ඉපද නිරොධයට පැමිණෙත්' ඔවුන්ගේ ව්‍යපසමනයකිරීමයයි කියන ලද නිවන්ලැබීම සැපයයි කීයායි.

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බාණා ආයස්මා අනුරුද්ධො ඉම ගාථායො අභාසි.

නාහු අස්සාස පස්සාසා
ඨිතචිත්තස්ස තාදිනො,
අනෙජො සන්තිමාරබ්භ
යං කාලමකරි මුනි.

අසල්ලීනෙන චිත්තෙන
වෙදනං අජ්ඣවාසයි,
පජ්ජොතස්සෙ'ව නිබ්බාණං
විමොක්ඛො චෙතසො අහුති.

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බාණා ආයස්මා ආනන්දො ඉමං ගාථං අභාසි,

---

භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාළකල්හි ඒ පිරිනිවන්පෑම හා සමගම ආයුෂ්මත් අනුරුඬසථ්විරයන්වහන්සේ මේ මතුකියන ගාථාධර්මයන් මෙසේ වදාළසේක.සිටිනලද සිත්ඇති හෙවත් ස්ථිර සිත්ඇත්තාවූ නික්ලේශිවූ භාග්‍යවතුන්වහන්සේගේ ආශ්වාසප්‍රාශ්වාසයෝ නොවූහ හෙවත් නොපවත්නාහ.එජාසඞ්ඛ්‍යාත තෘෂ්ණාක්ෂය කළාවූ ඒ මුනිශ්‍රෙෂ්ඨතමයන්වහන්සේ ශාන්තියයි කියනලද නිර්වාණය අරබයා කාලක්‍රියාකරවදාළසේක යනුයි. නොසැලවුනාවූ හෙවත් මනාකොට පුබුදුවූ සිතින්මරණවෙදනාව ඉවසාවදාළසේක.ප්‍රදීපයක්හුගේ නිවීමක් මෙන් ස්වාමිදරුවන්වහන්සේගේ විමොක්ෂයහෙවත් පහනක් නිවීගියාක්මෙන් පිරිනිවන්පෑ වදාළසේකැයි කීසේක. භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාළකල්හි ඒ පිරිනිවන්පෑම හා සමගම ආයුෂ්මත් ආනන්දසථ්විරතෙම මේ මතුකියන ගාථාධර්මය මෙසේ වදාළසේක.

තදා'සි යං භිංසනකං
තදා'සි ලොමහංසනං,
සබ්බාකාරවරූපෙතෙ
සම්බුද්ධෙ පරිනිබ්බුතෙ'ති.

පරිනිබ්බුතෙ භගවති තත්‍ථ යෙ තෙ භික්ඛූ අවීතරාගා අප්පෙකච්චෙ බාහාපග්ගය්හ කන්දන්ති ඡින්නපපාතං පපතන්ති ආවට්ටන්ති විවට්ටන්ති අතිඛිප්පං භගවා පරිනිබ්බුතො අතිඛිප්පං සුගතො පරිනිබ්බුතො අතිඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරහිතන්ති. යෙ පන තෙ භික්ඛූ වීතරාගා තෙ සතා සම්පජානා අධිවාසෙන්ති, අනිච්චා සඞ්ඛාරා තං කුතෙත්‍ථ ලබ්භාති.

සියලු උත්තම කාරණාවෙන් සමන්විතවූසම්‍යක්සම්බුද්ධයන්වහන්සේ පිරිනිවන්පෑවදාළකල්හිමහත්වූලොමුදැහැගැණීමෙක්වූයේය.එකල්හි මෙසේ මහත් භයානකවූ පෘථිවීචාලනයක් වූයේය යනුයි. මෙසේ භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාළකල්හි එතැන්හි රැස්වූ භික්ෂුසඞ්ඝයා අතුරෙහි වීතරාගීනුවූ යම් ඒ පෘථග්ජන භික්ෂූහු කෙනෙක් වූවාහුද ඒ භික්ෂූහු ඉතා වහාම භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාළසේකැයි කියාද සුගත තථාගතතෙම ඉතා වහාම පිරිනිවන්පෑ වදාළසේකැයි කියාද මේ ලොකයෙහි අත්‍යන්ත නිර්මලවූ බුද්ධ නැමති ඇස ඉතා වහාම අන්තර්ධානවූයේය කියාද සමහර භික්ෂූ කෙනෙක් හිස අත්බැඳගෙණ මහාසොකීව හඬත්. මැදින් කැඩූ නාක්මෙන් ප්‍රපතිත වන්නාහුය. පෘථිවියෙහි පෙරලෙමින් ප්‍රපතිස්ථානයටම එන්නාහුය. පෘථිවියෙහි ප්‍රපතිතස්ථානයෙන් පෙරලෙමින් අපරභාගයටම යන්නාහුය. යම්පමණ වීතරාගීනම්ලද රහත් භික්ෂු කෙනෙක් වූවාහුද ඒ රහත් භික්ෂූහු සියලු සංස්කාරධර්මයෝම අනිත්‍ය වන්නාහුය. මෙතැන්හි ස්ථිර කාරණයක් කොයින් ලබමෝදැයි කියා සිහියෙන්යුක්තව දැනම සොක ඉවසත්.

11. අථ ඛො ආයස්මා අනුරුද්ධො භික්ඛූ ආමන්තෙසි. අලං ආවුසො මා සොචිත්ථ මා පරිදෙවිත්ථ. නනු එතං ආවුසො භගවතා පටිකච්චෙව අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො තං කුතෙත්ථ ආවුසො ලබ්භා යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති. නෙතං ඨානං විජ්ජති. දෙවතා ආවුසො උජ්ඣායන්තීති. කථම්භූතා පන භන්තෙ ආයස්මා අනුරුද්ධො දෙවතා මනසි කරොතීති. සන්තාවුසො ආනන්ද දෙවතා ආකාසෙ පථවිසඤ්ඤිනියො. කෙසෙ පකිරිය කන්දන්ති බාහා පග්ගය්හ කන්දන්ති ඡින්නපපාතං පපතන්ති ආවට්ටෙන්ති විවට්ටෙන්ති අතිඛිප්පං භගවා පරිනිබ්බුතො අතිඛිප්පං සුගතො පරිනිබ්බුතො අතිඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරහිතන්ති.

---

11. ඉක්බිත්තෙන් ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන්වහන්සේ එසේ හඬන්නාවූ භික්ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක. ඇවැත්නි හැඬීමෙන්කම්නැත. සොකනොකරව්, විලාප නොකියව්, ඇවැත්නි භාග්‍යවතුන්වහන්සේවිසින් සියලු ප්‍රියමනාප වස්තුවෙන් අන්‍යථාභාවයට පැමිණීම වශයෙන් නානාස්වභාව ඇතිබව මීට ප්‍රථමයෙන්ම වදාරණලද්දේ නොවේද. ජාත භූත සඞ්ඛතාදීවූ යම් ඒ වැනසෙන ස්වභාවඇති ධර්මකෙනෙක් ඇද්ද ඒතටමනා පලුජ්ජනධර්මය එකාන්තයෙන් විනාශනොවේවයි යන යමක් ඇද්ද මේකාරණයවනාහි විද්‍යමානනොවේමය. ඇවැත්නි, ඒ කාරණාව දැන්කොහින් ලබමෝද. ඇවැත්නි, දෙවියෝ හෙලාදකින්නාහුයයි වදාළසේක. ස්වාමිවූ ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන්වහන්සේ, කවර ප්‍රකාරවූ දෙවිකෙනෙක් සිත්හි කරණසේක් දැයි විචාළසේක. ආනන්දය ආකාශයෙහි පෘථිවිසංඥා ඇත්තාවූ දෙවිකෙනෙක් ඇත්තාහුය. භාග්‍යවතුන්වහන්සේ ඉතාවහාම පිරිනිවන්පෑ වදාළසේකැයි කියා ඒ දෙවතාවෝ කෙස්විසුරුවාගෙණ හඬත් හිසඅත්බැඳගෙණ හඬත් මැදින්කැඩුනාක්මෙන් වැදහෙව වැටෙත් පෙරළෙත් සම්ප්‍රකාරයෙන් පෙරළෙත්. ඉතාඉක්මනින් භාග්‍යවතුන්වහන්සේ පිරිනිවියේය. ඉතා ඉක්මනින් සුගතයන්වහන්සේ පිරිනිවියේය. ඉතාඉක්මනින් ලොකයෙහි බුද්ධනැමැතිඇස අතුරුදහන් වූයේය කියාති.

සන්තාවුසො ආනන්ද දෙවතා පඨවියා පඨවිසඤ්ඤිනියො. යා පන දෙවතා වීතරාගා තා සතාසම්පජානා අධිවාසෙන්ති අනිච්චා සංඛාරා තං කුතෙත්ථ ලබ්භාති.

12. අථ ඛො ආයස්මාච අනුරුද්ධො ආයස්මාච ආනන්දො තං රත්තාවසෙසං ධම්මියා කථාය වීතිනාමෙසුං. අථ ඛො ආයස්මා අනුරුද්ධො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ගච්ඡාවුසො ආනන්ද කුසිනාරං පවිසිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙහි පරිනිබ්බුතො වාසෙට්ඨා භගවා. යස්සදානි කාලං මඤ්ඤථාති. එවම් භන්තෙති ඛො ආයස්මා ආනන්දො ආයස්මතො අනුරුද්ධස්ස පටිස්සුත්වා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය අත්තදුතියො කුසිනාරං පාවිසි.

---

ආනන්දය මේ පෘථිවියෙහි පෘථිවිසංඥා ඇති දෙවිකෙනෙක් ඇති වන්නාහ. භාග්‍යවතුන්වහන්සේ ඉතාවහාම පිරිනිවන්පෑ වදාළ සේකැයි කියා සෙස්සපලමු වාරවලමෙනි. යම්පමණ විතරාගීවූ දෙවතාකෙනෙක්වූවාහුද ඔව්හු සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය වන්නාහුය. ඒ මෙතැන්හි කොයින් ලබමෝදැයිකියා සිහියෙන් යුක්තව දැනම සොක ඉවසන්නාහුය.

12. ඉක්බිත්තෙන් ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන්වහන්සේද ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේද ධර්මාන්විතවූ කථාවෙන් ඒ රාත්‍රිහුගේ අවශෙෂව තුබූ මුහුර්තප්‍රමාණකාලය අතික්‍රාන්තකළාහුය. තවද ආයුෂ්මත්වූ අනුරුද්ධස්ථවිරයන්වහන්සේ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට ආමන්ත්‍රණය කළසේක. ඇවැත්වූ ආනන්දස්ථවිරය, තෝ යව. ගොස් කුසිනාරානුවරට ප්‍රවිෂ්ටව කුසිනාරාපුරවැසි මල්‍යරජදරුවන්ට මේකාරණය දන්වව. කෙසේද විශිෂ්ඨ ගොත්‍රොද්භූතවූ එම්බා මල්‍යරජදරුවෙනි භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාළසේක. එසේ හෙයින් යම්ගමනකට කල්යයිදන්නෙහිනම් එයකරව්යයිවදාළසේක. එසේය ස්වාමින්වහන්සැයිකියා ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරතෙම ආයුෂ්මත්වූ අනුරුද්ධස්ථවිරයන්වහන්සේගේ වචනයට ප්‍රතිවචනදී පෙරවරුකාලයෙහි මනාකොට හැඳපොරවා පාසිවුරු ගෙණ තමන්වහන්සේ දෙවෙනිකොට ඇතිව කුසිනාරානුවරට පිවිසිසේක.

තෙනඛො පන සමයෙන කොසිනාරකාච මල්ලා සන්ථාගාරෙ සන්නිපතිතා හොන්ති, තෙනෙවකරණීයෙන. අථ ඛො ආයස්මා ආනන්දො යෙන කොසිනාරකානං මල්ලානං සන්ථාගාරං තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙසි පරිනිබ්බුතො වාසෙඨා භගවා යස්සදානි කාලං මඤ්ඤථාති. ඉදමායස්මතො ආනන්දස්ස සුත්වා මල්ලාච මල්ලපුත්තාච මල්ලසුණිසාච මල්ලපජාපතියොච අඝාවිනො දුම්මනා චෙතොදුක්ඛසමප්පිතා අප්පෙකච්චෙ කෙසෙ පකිරිය කන්දන්ති බාහාපග්ගය්හ කන්දන්ති ඡින්නපපාතං පපතන්ති ආවට්ටෙන්ති විවට්ටෙන්ති අතිඛිප්පං භගවා පරිනිබ්බුතො අතිඛිප්පං සුගතො පරිනිබ්බුතො අතිඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරහිතන්ති.

13. අථ ඛො කොසිනාරකා මල්ලා පුරිසෙ ආණාපෙසි. තෙනහි භණෙ කුසිනාරායං ගන්ධමාලඤ්ච සබ්බඤ්ච තාලාවචරං සන්නිපාතෙථාති.

---

එසමයෙහිදී කුසිනාරාපුරවැසි මල්ලරජදරුවෝ ඒ පරිනිර්වාණ මඞ්ගල්‍ය කාරණාවම කරණකොටගෙණ සන්ථාගාරශාලාවෙහි රැස්ව උන්නාහුවෙති. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම කුසිනාරානුවර මල්ලරජදරුවන්ගේ සන්ථාගාර සාලාව යම්තැනකද එතනට එළඹිසේක. එළඹ කුසිනාරාවැසි මල්ලරජදරුවන්ට මේකාරණය දැන්වීය. විශිෂ්ඨ හොත්‍රොද්භූතවූ එම්බා මල්ලරජදරුවෙනි භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ වදාළසේක. තොපියම්ගමනකට කල්යයිදන්නාහුනම් එය කරව්යයි වදාළසේක ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේගේමේවචනය අසා මල්ලරජහුද මල්ලරාජපුත්‍රයෝද මල්ලසුණිසාවෝද මල්ල ප්‍රජාපතීහුද දුක්ඇත්තෝ නොසතුටුසිත්ඇත්තෝසිතෙහිඋපදවනලද දුක්ඇත්තෝකෙස් විසුරුවාගෙණ හඬත්. හිසඅත්බැඳගෙණ හඬත්. මැදින්කැඩුනාක් මෙන් බිඳීවැටෙත්. පෙරළෙත්. ඔබිමොබ පෙරළෙත්. භාග්‍යවතුන්වහන්සේ ඉතා ඉක්මණින් පිරිනිවිසේක. සුගතයන්වහන්සේ ඉතා ඉක්මනින් පිරිනිවිසේක. ඉතා ඉක්මනින් ලොකයෙහි බුඩනමැති ඇස අතුරුදහන් වූයේය කියායි.

13. ඉක්බිත්තෙන් කුසිනාරාපුරවැසි මල්ලරජදරුවෝ පුරුෂයන් ඇණවුහ. බොල එහෙනම් අපගේ මේ කුසිනාරානුවර විද්‍යමානවූ සුගන්ධපුෂ්පයන්ද සියලුම තාලාවචර ජනයන්ද රැස්කරව්යයි කියායි.

අථ ඛො කොසිනාරකා මල්ලා ගන්ධමාලං සබ්බඤ්ච තාලාවචරං පඤ්චදුස්සයුගසතානි ආදාය යෙන උපවත්තනං මල්ලානං සාලවනං යෙන භගවතො සරීරං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතො සරීරං නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා චෙලවිතානානි කරොන්තා මණ්ඩලමාලානි පටියාදෙන්තා එවං තං දිවසං වීතිනාමෙසුං. අථ ඛො කොසිනාරකානං මල්ලානං එතදහොසි. අතිවිකාලො ඛො අජ්ජ භගවතො සරීරං ඣාපෙතුං, ස්වෙ දානි මයං භගවතො සරීරං ඣාපෙස්සාමාති. අථ ඛො කොසිනාරකා මල්ලා භගවතො සරීරං නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා.

---

එකල්හි කුසිනාරාපුරවැසි මල්‍යරජදරුවෝ ගන්ධමාලාදියත සියලුම තාලාවචර ජනයන්ද පන්සියයක් පමණ කාසිකවස්ත්‍ර යුගලයන්ද ගෙණ මල්‍යරජදරුවන්ගේ උපවර්තනම් සල්උයන යම්තැනෙක්හිද භාග්‍යවතුන්වහන්සේගේ මෘතශරීරය යම්තැනෙක්හිද එතනට එලඹියාහුය. එළඹ භාග්‍යවතුන්වහන්සේගේ මෘතදෙහය නෘත්‍යවලින්ද, ගීතවලින්ද, වාද්‍යවලින්ද මල්වලින්ද, සුවඳවලින්ද සත්කාරකරන්නෝ ගරුකරන්නෝ බුහුමන්කරන්නෝ පුදන්නෝ චෙලයයි කියනලද මාහැඟි විචිත්‍ර පට්ටවස්ත්‍රාදියෙන් වියන්බඳවා සැරහීමෙන් හා චෙලමයවූ මණ්ඩල මාලාදිය පිළියෙළ කිරීමෙන් ඒදවස හෙවත් ඒ පිරිනිවන්පෑ වදාළ පළමූවෙනි දිනය මෙසේ මේ විශෙෂවූ පූජාසත්කාර සජ්ජිත කිරීමෙන් අතික්‍රාන්ත කළාහුය ඉක්බිත්තෙන් කුසිනාරාවැසි මල්‍යරජදරුවන්ට මෙසේවූ කල්පනාවෙක්වූයේය. අද භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශරීරය ආදාහනයකරන්ට නුසුදුසුකල් මය. එහෙයින් දැන් අපි භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශරීරය සෙට දවසෙහි ආදාහනය කරම්හයි සිතුවාහුය. තවද කුසිනාරාවැසි මල්‍ය රජදරුවෝ භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශරීරය නෘත්‍යවලින්ද, ගීතවලින්ද, වාද්‍යවලින්ද, මල්වලින්ද සුවඳවලින්ද, සත්කාරකරන්නෝ ගරුකරන්නෝ බුහුමන්කරන්නෝ පුදන්නෝ.

චෙලවිතානානි කරොන්තා මණ්ඩලමාලානි පටියාදෙන්තා දුතියම්පි දිවසං වීතිනාමෙසුං. තතියම්පි දිවසං වීතිනාමෙසුං. චතුත්ථම්පි දිවසං වීතිනාමෙසුං. පඤ්චමම්පි දිවසං වීතිනාමෙසුං. ඡට්ඨම්පි දිවසං වීතිනාමෙසුං.

14. අථ ඛො සත්තමං දිවසං කොසිනාරකානං මල්ලානං එතදහොසි. මයං භගවතො සරීරං නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා දක්ඛිණෙන දක්ඛිණං නගරස්ස හරිත්වා බාහිරෙන බාහිරං දක්ඛිණතො නගරස්ස භගවතො සරීරං ඣාපෙස්සාමාති.

---

චෙලයයි කියනලද මාහැඟි විචිත්‍ර පටවස්ත්‍රාදියෙන් වියන් බඳවා සැරසීමෙන් හා චෙලමයවූ මණ්ඩලමාලාදින් පිළියෙල කිරීමෙන් ඒ දවස හෙවත් ඒ පිරිනිවන්පෑ වදාළ දෙවෙනි දිනය මෙසේ මේ විශෙෂවූ පූජාසත්කාර සජ්ජිත කිරීමෙන් අතික්‍රාන්ත කළාහුය. ඉක්බිත්තෙන් කුසිනාරාවැසි මල්ල රජදරුවන්ට මෙසේවූ කල්පනාවෙක්වූයේය. අද භාග්‍යවතුන්වහන්සේගේ ශරීරආදාහනය කරන්ට නුසුදුසු කල්මය. එහෙයින් දැන් අපි භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශරීරය සෙට දවසෙහිආදාහනය කරම්හයි සිතුවාහුය. මෙසේ දෙවෙනි දවසද ඉක්මවූහ. තුන්වෙනි දිනයද ඉක්මවූහ. සතරවෙනි දිනයද එසේම ඉක්මවූහ. පස්වෙනිදිනයද එසේම අතික්‍රාන්තකළාහුය. සවෙනි දිනයද එසේම මහත් පූජෝත්සව පැවැත්වීමෙන් අතික්‍රාන්ත කළාහුය.

14. ඉක්බිත්තෙන් සත්වෙනි දවසෙහි කුසිනාරාවැසි මල්ලරජදරුවන්ට මෙසේවූ කල්පනාවෙක්වූයේය. අපි භාග්‍යවතුන් වහන්සේගේ මෘත දෙහය නෘත්‍ය වලින්ද ගීතවලින්ද වාද්‍යවලින්ද මල්වලින්ද සුගන්ධවලින්ද සත්කාරකරන්නෝ ගරුකරන්නෝ බුහුමන් කරන්නෝ පුදන්නෝ නුවරට දක්ෂිණදිශාභාගයෙන්ම දක්ෂිණ දිශාභාගයට ගෙණගොස් පිටතින්ම ඒ පුරයසම්බන්ධි බාහිර පාශ්වීයටහැර නුවරට දක්ෂිණ දිශාවෙහිභාග්‍යවතුන්වහන්සේගේ මෘත දෙහය ආදාහනය කරම්හයි කියායි.

තෙනඛොපන සමයෙන අට්ඨමල්ලපාමොක්ඛා සීසං නහාතා අහතානි වත්ථානි නිවත්ථා මයං භගවතො සරීරං උච්චාරෙස්සාමාති, නසක්කොන්ති උච්චාරෙතුං. අථ ඛො කොසිනාරකා මල්ලා ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං. කොනුඛො භන්තෙ අනුරුද්ධ හෙතු කොපච්චයො. යෙන මෙ අට්ඨ මල්ලපාමොක්ඛා සීසං නහාතා අහතානි වත්ථානි නිවත්ථා මයං භගවතො සරීරං උච්චාරෙස්සාමාති නසක්කොන්ති උච්චාරෙතුං. අඤ්ඤථා ඛො වාසෙට්ඨා තුම්හාකං අධිප්පායො. අඤ්ඤථා දෙවතානං අධිප්පායොති

15, කථංපන භන්තෙ දෙවතානං අධිප්පායොති. තුම්හාකං ඛො වාසෙට්ඨා අධිප්පායො මයං භගවතො සරීරං නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා දක්ඛිණෙන දක්ඛිණං නගරස්ස හරිත්වා.

---

ඒ කාලයෙහිදී බලමැදුම් මල්ලරජ අටදෙනෙක් සුවඳ පැනින් ඉස් සෝදා නහාගෙණ අභිනව වස්ත්‍රයන් ඇඳගෙණ අපි භාග්‍යවතුන් වහන්සේගේ මෘත ශරීරය උසුලම්හයි උත්සාහ කොට උසුලන්ට නොහැකිවූවාහුය. ඉක්බිත්තෙන් කුසිනාරා වැසි "මල්ලරජ දරුවෝ ආයුස්මත් අනුරුඩ ස්ථවිරයන්වහන්සේට මෙසේ සැලකළාහුය. යම් හෙයකින් මේ බල මැඳුම්වයස් ඇති මල්ලරජ දරුවෝ අටදෙනෙක් ශිර්ෂ ස්නානය කොට අභිනව වස්ත්‍රයන් අඳනාලදුව අපි භාග්‍යවතුන් වහන්සේගේ මෘත දෙහය උසුලම්හයි කියා උත්සාහ කොට උසුලන්ට නොහැකි වන්නාහුය, එම්බා මල්ල රජදරුවෙනි. තොපගේ අභිප්‍රාවෝ අනිකෙක්වන්නාහුය. දෙවියන්ගේ අභිප්‍රාවෝ අනිකෙකැයි වදාළසේක.

15 ස්වාමිනි දෙවියන්ගේ අභිප්‍රාවෝ කෙසේ වන්නාහුදැයි විචාලහුය. වාසෙඨයෙනි තොපගේ අභිප්‍රාය වනාහි අපි භාග්‍ය වතුන් වහන්සේගේ මෘත දෙහය නෘත්‍යවලින්ද ගීතවලින්ද වාද්‍ය වලින්ද මල්වලින්ද සුවඳ වලින්ද සත්කාරකරන්නෝ ගරුකරන්නෝ බුහුමන්කරන්නෝ නුවර පිළිබඳ දක්‍ෂිණ දිශාභාගයෙන්ම දක්‍ෂිණ දිශා භාගයට ගෙණගොස්.

බාහිරෙන බාහිරං දක්ඛිණතො නගරස්සභගවතො සරීරංඣාපෙස්සාමාති. දෙවතානං ඛො වාසෙට්ඨා අධිප්පායො මයං භගවතො සරීරං දිබ්බෙහි නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා උත්තරෙන උත්තරං නගරස්ස හරිත්වා උත්තරෙන ද්වාරෙන නගරං පවෙසෙත්වා මජ්ඣෙන මජ්ඣං නගරස්ස හරිත්වා පුරත්ථිමෙන ද්වාරෙන නික්ඛමිත්වා පුරත්ථිමතො නගරස්ස මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං එත්ථ භගවතො සරීරං ඣාපෙස්සාමාති. යථා භන්තෙ දෙවතානං අධිප්පායො තථා හොතූති.

16, තෙනඛොපන සමයෙන කුසිනාරා යාව සන්ධි සමල සංකටීරා ජණ්ණුමත්තෙන ඕධිනා මන්දාරව පුප්ඵෙහි සන්ථතා හොන්ති:

---

ඇතුළු නුවරට ප්‍රවෙශ කොට පිටතින් ඒපුරයා ගේ බාහිර පාර්ශ්වයෙහැර නුවරට දකුණු දිශාභාගයෙහි භාග්‍යවතුන්වහන්සේගේ මෘත දෙහය ආදාහන කරම්හයි මේ තොපගේ අභිප්‍රාවෝ වන්නාහුය. එම්බා මල්‍යරජ දරුවෙනි දෙවියන්ගේ අභිප්‍රාවෝ වනාහි අපි භාග්‍යවතුන් වහන්සේගේ මෘත දෙහය දිව්‍යමයවූ නෘත්‍ය වලින්ද ගීතවලින්ද වාද්‍ය වලින්ද මල් වලින්ද සුගන්ධ වලින්ද සත්කාර කරන්නෝ ගරුකරන්නෝ බුහුමන් කරන්නෝ පුදන්නෝ. ශේෂසකී ක්‍රමයෙන් විස්තරයට පැමිණ වියයුතු. නුවරට උතුරු දිගින්ම උතුරු දිගට වඩාගෙණගොස් උතුරු වහසල් දොරින් නගරාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටකොට නුවර මධ්‍යයට පමුණුවා පූර්වදිශා භාගයෙහිවූ මල්‍ය රජ දරුවන්ගේ මකුට බන්ධන නම්ලත් ශාලාව යම් තැනෙක්හිද මේ ස්ථානයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීශරීරය ආදාහනය කරම්හ යනු මේ දෙවියන්ගේ අභිප්‍රාය වන්නේයයි' වදාළසේක. ස්වාමීන් වහන්ස දෙවියන්ගේ අභිප්‍රායවේවයි සැකළාහුය.

16. එසමයෙහිදී කුසිනාරානුවර යම්තාක් ගෘහසන්ධි ගූථපණාලි කචවරස්ථානයම්තාක්දඒතාක්දනක්පමණ ඝනවමදාරුමලින් අතුරණලද්දේවෙත්.

අථ ඛො දෙවතා ච කොසිනාරකා ච මල්ලා භගවතො සරීරං දිබ්බෙහි ච මානුසකෙහි ච නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා උත්තරෙන උත්තරං නගරස්ස හරිත්වා උත්තරෙන ද්වාරෙන නගරං පවෙසෙත්වා මජ්ඣෙන මජ්ඣං නගරස්ස හරිත්වා පුරත්ථිමෙන ද්වාරෙන නික්ඛමිත්වා පුරත්ථිමතො නගරස්ස මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං එත්ථ භගවතො සරීරං නික්ඛිපිංසු.

17. අථ ඛො කොසිනාරකා මල්ලා ආයස්මන්තං ආනන්දං එතදවොචුං කථං මයං භන්තෙ ආනන්ද තථාගතස්ස සරීරෙ පටිපජ්ජාමාති. යථා ඛො වාසෙට්ඨා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ.

---

ඉක්බිත්තෙන් ඒ පරිනිර්වාණයට රැස්වූ දසදහසක් සක්වල දෙවියෝද කුසිනාරාවැසි මල්ලරජ දරුවෝද භාග්‍යවතුන් වහන්සේගේ මෘතදෙහය දිව්‍යමයවූද මනුෂ්‍යමයවූද නෘත්‍යවලින්ද ගීතවලින්ද වාද්‍යවලින්ද මනහරව පුෂ්පාදියෙන්ද සුගන්ධයෙන්ද සත්කාර කරන්නෝ ගරු කරන්නෝ සිතින් බුහුමන් කරන්නෝ පූජාකරන්නෝ නුවරට උතුරුදිශා භාගයෙන් උතුරුදිශා භාගයට වැඩමවාගෙණ ගොස් උතුරු වහසල් දොරින් නුවරට ප්‍රවෙශකරවා නුවරමධ්‍යයෙන් නුවර මධ්‍යයට වැඩමවාගෙණ ගොස් පූර්වදිග වහසල් දොරින් පිටතට නික්මවා නුවරට පූර්වදිසාභාගයෙහිවූ මල්ලරජදරුවන්ගේ මකුටබන්ධනනම්වූ මඞ්ගල්‍යශාලාව යම්තැනකද භාග්‍යවතුන්වහන්සේගේ මෘතදෙහය එතැන්හි තැබූවාහුය.

17. ඉක්බිත්තෙන් කුසිනාරාවැසි මල්ලරජදරුවෝ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේට මේකාරණය සැලකලාහුය. ස්වාමීනි ආනන්දස්ථවිරයන්වහන්ස, අපි තථාගතයන්වහන්සේගේ මෘතදෙහයෙහි කෙසේනම් පිළිපදුමෝදැයි විචාලාහුය. එම්බා වාසෙඨයෙනි චක්‍රවර්තිමහාරජහුගේ මෘතශරීරයෙහි.

පටිපජ්ජන්ති එවං තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බංති. කථම්පන භන්තෙ ආනන්ද රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්තීති. රඤ්ඤො වාසෙට්ඨා චක්කවත්තිස්ස සරීරං අහතෙන වත්ථෙන වෙඨෙන්ති. අහතෙන වත්ථෙන වෙඨෙත්වා විහතෙන කප්පාසෙන වෙඨෙන්ති. විහතෙන කප්පාසෙන වෙඨෙත්වා අහතෙන වත්ථෙන වෙඨෙන්ති. එතෙන උපායෙන පඤ්චහි යුගසතෙහි රඤ්ඤො චක්කවත්තිස්ස සරීරං වෙඨෙත්වා ආයසාය තෙලදොණියා පක්ඛිත්වා අඤ්ඤිස්සා ආයසාය දොණියා පටිකුත්වා සබ්බගන්ධානං චිතකං කරිත්වා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරං ඣාපෙන්ති. චාතුම්මහාපථෙ රඤ්ඤො චක්කවත්තිස්ස ථූපං කරොන්ති. එවං ඛො වාසෙට්ඨා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති. යථා ඛො වාසෙට්ඨා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති එවං තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බං.

---

යම් ආකාරයකින් පිළිපදනාහුද ඒ ආකාරයෙන්ම තථාගතයන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහිද පිළිපැද්ද යුත්තේයයි වදාළසේක. ස්වාමීනි ආනන්දස්ථවිරයන් වහන්ස සක්විතිරජහුගේ මෘතශරීරයෙහි කෙසේ පිළිපදිත් දැයි විචාළාහුය. වාසෙට්ඨයෙනි චක්‍රවර්ති මහරජහුගේ මෘතශරීරය අලුත්වූ කාසිකවස්ත්‍රයෙන් වෙළත්. අභිනව කාසික වස්ත්‍රයෙන් වෙළාමනාකොට තෙලනලද කපුපුලුනෙන් වෙළත් තෙලුකපුපුලුනෙන් වෙළා අලුත්වූ කාලක වස්ත්‍රයෙන් වෙළත්. මෙම ක්‍රමයෙන් පන්සියයක් පමණ කප්පාසිකවස්ත්‍ර යුගලයෙන් සක්විතිරජහුගේ මෘතශරීරය වෙළා ස්වර්ණමයවූ තෙල්දෙණක බහා එබඳුමවූ අනිකුත් රත්දෙණකින් වසා සියලු සුවඳ දරින් දරසෑයක් කොට චක්‍රවර්ති රජහුගේ ශරීරාදහනය කරත්. සතරමංසන්ධියෙක්හි චක්‍රවර්ති රජහුගේ චෛත්‍යය කරත්. වාසෙට්ඨයෙනි සක්විතිරජහුගේ මෘතශරීරයෙහි මෙපරිද්දෙන් පිළිපදිත්. මල්ලරජ දරුවෙනි සක්විතිරජහුගේ මෘතශරීරයෙහි යම් ආකාරයකින් පිළිපදිත්ද. තථාගතයන් වහන්සේගේ මෘතදෙහයෙහිද මෙසේම පිළිපැද්ද යුත්තේය.

චාතුම්මහාපථෙ තථාගතස්ස ථූපො කාතබ්බො. තත්‍ථ යෙ මාලං වා ගන්‍ධං වා වණ්ණකං වා ආරොපෙස්සන්ති අභිවාදෙස්සන්ති වා චිත්තං වා පසාදෙස්සන්ති. තෙසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛායාති.

18. අථ ඛො කොසිනාරකා මල්ලා පුරිසෙ ආණාපෙසුං. තෙන හි භණෙ මල්ලානං විහතං කප්පාසං සන්නිපාතෙථාති. අථ ඛො කොසිනාරකා මල්ලා භගවතො සරීරං අහතෙන වත්‍ථෙන වෙඨෙසුං. අහතෙන වත්‍ථෙන වෙඨෙත්වා විහතෙන කප්පාසෙන වෙඨෙසුං. විහතෙන කප්පාසෙන වෙඨෙත්වා අහතෙන වත්‍ථෙන වෙඨෙසුං. එතෙන උපායෙන පඤ්චහි යුගසතෙහි භගවතො සරීරං වෙඨෙත්වා ආයසාය තෙලදොණියා පක්ඛිපිත්වා අඤ්ඤිස්සා ආයසාය දොණියා,

---

සතරමංසන්ධියෙක්හි තථාගතයන්වහන්සේගේ චෛත්‍යය කටයුත්තේය. ඒ සර්වඥචෛත්‍යයෙහි යම් කෙනෙක්මල්හෝ සුවඳහෝ විලවුන්හෝ ආරොපනය කරන්නාහුද මනාකොට වඳින්නාහුද සිත හෝ පහදවන්නාහුද ඔවුන්ට ඒ කුසලකර්මය ඉතාබොහෝවූ දීර්ඝකාලයකට වැඩපිණිසද සැපපිණිසද වන්නේයයි වදාළසේක.

18. ඉක්බිත්තෙන් කුසිනාරාවැසි මල්ලරජදරුවෝ පුරුෂයන් ඇණවූහ. කොල එසේවීනම් මල්ලරජදරුවන්ගේ මනාකොට තෙලනලද කපුපුලුන් රැස්කරව්යයි. ඉක්බිත්තෙන් කුසිනාරාවැසි මල්ලරජදරුවෝ භාග්‍යවතුන්වහන්සේගේ මෘතදෙහය අලුත්වූ කාසිකවස්ත්‍රයෙන් වෙළුවාහුය. අලුත්වූ මාහැඟි කාසිකවස්ත්‍රයෙන් වෙළා මනාකොට තෙලනලද කපුපුලුනෙන් වෙළූහ. තෙලනලද කපුපුලුනෙන් වෙළා අලුත්වූ කාසිකවස්ත්‍රයෙන් වෙළූහ. මෙම ක්‍රමයෙන්ම පන්සියයක් පමණ කප්පාසික වස්ත්‍ර යුගලයෙන් භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රී ශරීරය වෙළා ස්වර්ණමයවූ රන්දෙණකට බහා එබඳුවූ අනිකුත් රන්දෙණකින්

පටිකුජ්ජෙත්වා සබ්බගන්ධානං චිතකං කරිත්වා භගවතො සරීරං චිතකං ආරොපෙසුං.

19. තෙන ඛො පන සමයෙන ආයස්මා මහාකස්සපො පාවාය කුසිනාරං අද්ධානමග්ග පටිපන්නො හොති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. අථ ඛො ආයස්මා මහාකස්සපො මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො ආජීවකො කුසිනාරාය මන්දාරවපුප්ඵං ගහෙත්වා පාවං අද්ධානමග්ග පටිපන්නො හොති. අද්දසා ඛො ආයස්මා මහාකස්සපො තං ආජීවකං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වා තං ආජීවකං එතදවොච. අපාවුසො අම්හාකං සත්ථාරං ජානාසීති. ආම ආවුසො ජානාමි. අජ්ජ සත්තාහ පරිනිබ්බුතො සමණො ගොතමො. තතො මෙ ඉදං මන්දාරවපුප්ඵං ගහිතන්ති.

---

වස්‍ා සඳුන් තගුරු ආදි සියලු සුවඳ දරින් දරසෑයක් කොට භාග්‍යවතුන්වහන්සේගේ මෘතදෙහය (එකසියවිසිරියනක් උසැති) සඳුන් දරසෑයට නැගුවාහුය හෙවත් වැඩුවාහුය.

19. එසමයෙහිදී ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ පන්සියයක් පමණවූ මහද් භික්ෂුසඞ්ඝයා සමග පාවානුවරින් කුසිනාරානුවරට යන දීඝීමාර්‍ගයට පිළිපන්නේ වෙයි. ඉක්බිත්තෙන් ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරතෙම මගින් ඉවත්ව එක් රුකක්මුල වැඩ උන්සේක. ඒ කාලයෙහිදි එක්තරා ආජීවකයෙක් මඳරු මලක්ගෙණ කුසිනාරානුවරින් පාවානුවරට යන දීඝීමාර්‍ගයට පිළිපන්නේ වෙයි. ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ දුරින්ම එන්නාවූ ආජීවකයා දුටුසේක. දැක ඒ ආජීවකයාට මේ කාරණාව වදාළේය. ඇවත, කිමෙක්ද, අපගේ ශාස්තෲන්වහන්සේ දන්නෙහිදැයි විචාළේය. එසේය ඇවත දනිමි. ශ්‍රමණභවද් ගෞතමතෙම අදින් සත්වෙනිදින යෙහි පිරිනිවියේය නොහොත් පිරිනිවි සත්දවසක් වූයේය. ඒ ස්ථානයෙන් මාවිසින් මේ මඳරුමල ගන්නාලද්දේයයි කියේය.

තත්‍ථ යෙ තෙ භික්ඛූ අවීතරාගා අප්පෙකච්චෙ බාහා පග්ගය්හ කන්දන්ති ඡිණ්ණපපාතං පපතන්ති ආවට්ටෙන්ති විවට්ටෙන්ති අතිඛිප්පං භගවා පරිනිබ්බුතො අතිඛිප්පං සුගතො පරිනිබ්බුතො අතිඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරහිතන්ති. යෙ පන තෙ භික්ඛූ වීතරාගා තෙ සතා සම්පජානා අධිවාසෙන්ති. අනිච්චා සඞ්ඛාරා තං කුතෙ'ත්ථ ලබ්භාති.

20. තෙනඛොපන සමයෙන සුභද්දො නාම බුඩ්ඪපබ්බජිතො තස්සං පරිසායං නිසින්නො හොති. අථඛො සුභද්දො බුඩ්ඪපබ්බජිතො තෙ භික්ඛූ එතදවොච. අලං ආවුසො මා සොචිත්ථ මා පරිදෙවිත්ථ. සුමුත්තා මයං තෙන මහාසමණෙන. උපද්දුතාච හොම ඉදං වො කප්පති ඉදං වො න කප්පතීති. ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාමාති.

---

ඒ භික්ෂු පිරිසෙහි පහ නොකළ රාගය ඇති යම් භික්ෂුකෙනෙක් වූවාහුද උන්වහන්සේලා අතුරෙන් සමහරකෙනෙක් හිස අත්බැඳගෙණ හඬත්. මැදින් කැඩුනාක් මෙන් බිම වැටෙත්. පෙරළෙත්. ඔබිමොබ පෙරළෙත්. භාග්‍යවතුන්වහන්සේ ඉතා ඉක්මනින් පිරිනිවියේය. ඉතා ඉක්මනින් සුගතයන්වහන්සේ පිරිනිවියේය. ඉතා ඉක්මනින් ලොකයෙන් බුඩ නැමති ඇස අතුරුදහන්වූයේය කියායි. යම්පමණ විතරාගීවූ රහත්භික්ෂුකෙනෙක් වූවාහුද, ඒ රහත් භික්ෂූහු සියලු සංස්කාරධර්මයෝම අනිත්‍යවන්නාහුය. ඒ මෙතැන්හි කොයින් ලබන්නෙමෝදැයි කියා සිහියෙන් යුක්තව දැනම ශෝක ඉවසන්නාහුය.

20. එසමයෙහිදී සුභද්දනම් මහලු පැවිද්දෙක් ඒ භික්ෂුපිරිසෙහි උන්නේවේ. ඉක්බිත්තෙන් ඒ සුභද්ද මහලු පැවිදිතෙමේ ඒ භික්ෂූන්ට මෙසේ කීයේය. ඇවැත්නි, නුසුදුසුයි. තොපි ශොක නොකරව්. විලාප නොකියව්. ඒ මහාශ්‍රමණයා කෙරෙන් අපි මනාකොට මිදුණෝ වූම්හ. තොපට මේදෙය කැපවන්නේය. තොපට මේදෙය නොකැපනොවන්නේයයි අපි පෙර උපද්‍රැතවූම්හ. දැන්වනාහි අපි යමක් කැමතිවන්නමුනම් ඒදෙය කරන්නෙමු. යමක් නොකමැතිවන්නමෝනම් ඒදෙය නොකරන්නෙමුයි කියායි.

අථඛො ආයස්මා මහාකස්සපො භික්ඛූ ආමන්තෙසි. අලං ආවුසො මා සොචිත්ථ. මා පරිදෙවිත්ථ. නනු එතං ආවුසො භගවතා පටිගච්චෙව අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො. තං කුතෙත්ථ ආවුසො ලබ්භා. යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති නෙ තං ඨානං විජ්ජතීති.

21. තෙනඛො පන සමයෙන චත්තාරො මල්ලපාමොක්ඛා සීසං නහාතා අහතානි වත්ථානි නිවත්ථා මයං භගවතො චිතකං ආලිම්පෙස්සාමා ති න සක්කොන්ති ආලිම්පෙතුං. අථඛො කොසිනාරකා මල්ලා ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං. කො නු ඛො භන්තෙ අනුරුද්ධ හෙතු කො පච්චයො යෙන මෙ චත්තාරො මල්ලපාමොක්ඛා සීසං නහාතා.

---

ඉක්බිත්තෙන් ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ භික්‍ෂූන්ට ආමන්ත්‍රණයකරවදාළසේක. ඇවැත්නි, නුසුදුසුයි. තොපගේ හැඬීමෙන්කම්නැත. තොපි ශෝක නොකරව්. විලාපනොකියව්. ඇවැත්නි, භාග්‍යවතුන්වහන්සේවිසින් සියලු ප්‍රිය මනාප වස්තුවෙන් අන්‍යථාභාවයටපැමිණීම් වශයෙන් නානා ස්වභාව ඇතිබව මීට ප්‍රථමයෙන්ම වදාරණලද්දේ නොවේද. ඇවැත්නි, ජාතභූත සංඛාතාදිවූ යම් පලුජ්ජන ධර්මකෙනෙක් ඇද්ද, ඒ විනාශවනධර්මය ඒකාන්තයෙන් විනාස නොවෙව යන මේකාරණය වනාහි විද්‍යමාන නොවන්නේමයයි වදාළසේක.

21 එසමයෙහිදි බලමැඳුම් මල්‍යරජ සතරදෙනෙක් සුවඳපැනින් ඉස් සොදා නහාගෙණ අභිනව වස්ත්‍ර හැන්දෙ. අපි භාග්‍යවතුන් වහන්සේගේ දරසෑය ගිනිදල්වම්හයි උත්සාහකොට ගිනිදල්වාගත නොහැකිවූහ. ඉක්බිත්තෙන් කුසිනාරාපුරවැසි මල්‍ය රජදරුවෝ ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන්වහන්සේට මෙසේ සැලකළාහුය. ස්වාමිනි අනුරුද්ධස්ථවිරයන්වහන්ස යම්හෙයකින් මේ බලමැඳුම් මල්‍යරජදරුවෝ සතරදෙන ස්නානයකළෝ.

අහතානි වත්ථානි නිවත්ථා මයං භගවතො චිතකං ආලිම්පෙස්සාමාති. නසක්කොන්ති ආලිම්පෙතුනති. අඤ්ඤථා ඛො වාසෙට්ඨා දෙවතානං අධිප්පායොති. කථංපන භන්තෙ දෙවතානං අධිප්පායොති. දෙවතානං ඛො වාසෙට්ඨා අධිප්පායො අයං ආයස්මා මහාකස්සපො පාවාය කුසිනාරං අද්ධානමග්ග පටිපන්නො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි නතාව. භගවතො චිතකො පජ්ජලිස්සති යාව'යස්මා මහාකස්සපො භගවතො පාදෙ න සහත්ථා සිරසා වන්දිස්සතීති. යථා භන්තෙ දෙවතානං අධිප්පායො තථා හොතූති.

22. අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන කුසිනාරා මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං.

---

අලුත්වූ වස්ත්‍ර නිවාසනයකළෝ. අපි භාග්‍යවතුන්වහන්සේගේ මෘතදෙහය තබා කරණලද දරසෑය ගිනිදල්වම්හයි උත්සාහකොට ගිනිදල්වාගත නොහැකිවූද, ඊට හේතුකවරේද ඊට ප්‍රත්‍යය කවරේදැයි විචාළාහුය. එම්බා මල්ල රජදරුවෙනි, දෙවියන්ගේ අභිප්‍රාය අන් පරිද්දෙකැයි වදාළසේක. ස්වාමින්වහන්ස, දෙවියන්ගේ අභිප්‍රාය කෙබඳුදැයි විචාළාහුය. එම්බා මල්ලරජදරුවෙනි, මේ ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරතෙම මේසාමහත් භික්ෂුසඞ්ඝයා හා සමග කෙපමණවූදයත්, පන්සියයක් පමණ භික්ෂූන් සමග පාවානම් නුවරසිට කුසිනාරානම් නුවරට යෙම් සිතා අතර දීඝීමාගීයට පිළිපන්නේවෙයි. ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාද වන්දන යම්තාක්කලකින් සියතින් යුක්ත හිසින් නොවඳිනසේක්ද ඒතාක්කල් භාග්‍යවතුන්වහන්සේගේ දරසෑය ගිනිනොදැල්වේවයි කියා දෙවියන්ගේ අභිප්‍රායයි වදාළසේක. ස්වාමින්වහන්ස දෙවියන්ගේ අභිප්‍රාය යම් ආකාරයක්වේද, එසේමවේවයි සැලකළාහුය.

22. ඉක්බිත්තෙන් ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ කුසිනාරානුවරමල්ලරජදරුවන්ගේ මකුටබන්ධන නම් චෛත්‍යස්ථානය යම් තැනෙක්හිද.

යෙන භගවතො චිතකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා පාදතො විවරිත්වා භගවතො පාදෙ සිරසා වන්දි. තානිපි ඛො පඤ්ච භික්ඛුසතානි එකංසං චීවරං කත්වා අඤ්ජලිම්පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා භගවතො පාදෙ සිරසා වන්දිංසු. වන්දිතෙච පනායස්මතා මහා කස්සපෙන තෙහිච පඤ්චහි භික්ඛුසතෙහි සයමෙව භගවතො චිතකො පජ්ජලි.

23. ඣායමානස්ස පන භගවතො සරීරස්ස යං අහොසි ඡවීති වා චම්මන්ති වා මංසන්ති වා නහාරූති වා ලසිකාති වා තස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ.

---

භාග්‍යවතුන්වහන්සේගේ දරසෑය යම්තැනකද එතනට එළඹිසේක. දරසෑය කරා එළඹ සිව්ර එකාංශකොට පොරවා ගෙණ නමස්කාරකොට තුන්වරක් දරසෑය ප්‍රදක්ෂිණකොට ඇවිද ශ්‍රීපාදදිසාවෙන් රත්දෙණය හා චන්දන චිතකය විවෘතකොට ශාස්තෘවූ බුදුරජානන්වහන්සේගේ ශ්‍රීපාදම න්දය වැන්දසේක. ඒ පන්සියයක් පමණවූ භික්ෂුසඞ්ඝයාද සිවුරු එකාංශකොට පොරවාගෙණ ඇඳිලිබැඳගෙණ තුන්යලක් දරසෑය ප්‍රදක්ෂිණකොට භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදමන්දය මුදුනෙන් වැන්දහුය. ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ විසින්ද ඒපන්සියයක් පමණ භික්ෂුසඞ්ඝයාවිසින්ද භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදමන්දය මස්තකයෙන් නමස්කාරකරණලදකල්හි භාග්‍යවතුන් වහන්සේගේ දරසෑය දෙවතානුභාවයෙන් තෙමේම හාත්පසින් ගිනි දල්වී ගියේය.

23. ආදාහනය වන්නාවූ භාග්‍යවතුන්වහන්සේගේ මෘතශරීරය සම්බන්ධිවූ ඡවියයිකියා හෝ සමයකියා හෝ මස්යකියාහෝ නහරය කියා හෝ සඳමිදුලුයයි කියා හෝ යම්කොඨාසයක් වූයේද ඒ ඒ කොඨාසයාගේ හලුද නොපෙණුනේය.

න මසි සරීරානෙව අවසිස්සිංසු, සෙය්‍යථාපි නාම සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායති න මසි. එවමෙව භගවතො සරීරස්ස ඣායමානස්ස යං අහොසි ඡවීති වා චම්මන්ති වා මංසන්ති වා නහාරුති වා ලසිකාති වා තස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ න මසි සරීරානෙව අවසිස්සිංසු තෙසඤ්ච පඤ්චන්නං දුස්සයුගසතානං මෙව දුස්සානි දය්හිංසු යඤ්ච සබ්බ අබ්භන්තරිමං යඤ්ච බාහිරං. දඩ්ඪෙඛොපන භගවතො සරීරෙ අන්තලික්ඛා උදකධාරා පාතුභවිත්වා භගවතො චිතකං නිබ්බාපෙසි. උදකං සාල තොපි අබ්භුන්නමිත්වා භගවතො චිතකං නිබ්බාපෙසි කොසිනාරකාපි මල්ලා සබ්බගන්ධොදකෙන භගවතො චිතකං නිබ්බාපෙසුං.

---

මසියයි කියනලද දැලිද අවශෙෂනුවූහ. ශාරීරිකධාතු මාත්‍රයක්ම අවශෙෂවූවාහුය. හෙවත් ශාරීරිකධාතු පමණක්ම ආදහනයෙනාවී ඉතිරිවූවාහුය. දවනලද ගිතෙලේ හෝ තිල තෙලාදියගේ හෝ යම්සේ හළුනොදක්කා ලද්දේවේද. දැලිනැත්තේ වේද එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේගේ ආදහනය වනලද මෘතශරීරයාගේ ඡවියයි යම් කොඨාසයක්වූයේ වේද චර්මයයිද මාංශයයිද නහරයයිද සඳමිදුලුයයිද යම් කොඨාසයක්වූයේද ඒ ඒ කොඨාසයන්ගේ හළුද නොදක්නාලද්දාහුය. මසියයිකියනලද දැලිද ශෙෂනුවූහ. ශාරීරිකධාතුමාත්‍රයක්ම අවශෙෂවූවාහුය. අභ්‍යන්තරගතවූ යම් ශාරීරික මාංශයක් ඇද්ද. ඒ මාංශයද බාහිරවූ පඤ්චශතප්‍රමාණ අභිනව වස්ත්‍රයුගලයද යන මේසියල්ල දැවාහුය. භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශරීරය ආදහනයවූකල්හිම ආකාශයෙන් ජලධාරාවෝ ප්‍රාදූර්භූතව භාග්‍යවතුන්වහන්සේගේ දරසෑය නොහොත් දරසෑයෙහි ගිනි නිවූයේය. පිරිවරාසිටි සාලවෘක්ෂයන්ගේ ඛන්ධසාඛාන්තරයෙන්ද ජලධාරා පිටත්ව ස්වාමිදරුවන්වහන්සේගේ දරසෑයෙහි ගිනි නිවූහ. කුසිනාරාවැසි මල්‍යරජදරුවෝද, සියලු සුවඳ පැනින් භාග්‍යවතුන්වහන්සේගේ දරසෑයෙහි ගිනි නිවූවාහුය.

අථ ඛො කොසිනාරකා මල්ලා භගවතො සරීරානි සත්තාහං සන්ථාගාරෙ සත්තිපඤ්ජරං කත්වා ධනුපාකාරං පරික්ඛිපිත්වා නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරිංසු ගරුකරිංසු මානෙසුං පූජෙසුං.

24. අස්සොසි ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතොති. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසි. භගවාපි ඛත්තියො අහම්පි ඛත්තියො අහම්පි අරහාමි භගවතො සරීරානං භාගං. අහම්පි භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමාති. අස්සොසුං ඛො වෙසාලිකා ලිච්ඡවී භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතොති.

---

ඉක්බිත්තෙන් කුසිනාරාපුරවැසි මල්ලරජදරුවෝ භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරිකධාතූන් සන්ථාගාරශාලාවෙහි තබාගත් අත්ඇති යොධපුරුෂයන් ලවා හාත්පසින්ම වටකොට ආරක්ෂා පිහිටුවා දුනුකෙලවරින් දුනුකෙලවරපහරමින් සිටියාවූ ධනුර්ධරයන්ගේ ධනුඃ ප්‍රකාරයෙන් පරික්ෂෙපකොට සත්දවසක් මුලුල්ලෙහි නෘත්‍යවලින්ද ගීතවලින්ද වාද්‍යවලින්ද මල්වලින්ද සුවඳ වලින්ද සත්කාර කළාහුය. සිතින් බුහුමන් කිරීම්වශයෙන් ගරුකළාහුය. බුහුමන්කලාහුය. පූජාද කළාහුය.

24. විදෙහපුත්‍රවූ මගධදෙශාධිපතිවූ අජාතසත්‍රු නම් මහරජතෙම භාග්‍යවතුන්වහන්සේ කුසිනාරා නුවරදී පිරිනිවන්පෑවදාළසේකැයි ඇසුයේමය. ඉක්බිත්තෙන් මගධෙශ්වරවූ විදෙහ පුත්‍රවූ අජාසත් මහරජතෙම කුසිනාරා පුරවැසි මල්ලරජුන් වෙතට දූතයන් යැවීය. භාග්‍යවතුන්වහන්සේද ක්ෂත්‍රියසේක. මමද ක්ෂත්‍රිය වෙමි. භාග්‍යවතුන්වහන්සේගේ ශරිරධාතු ලාභයක් ලබන්ට මමද සුදුසුයෙමි. මමද සර්වඥයන්වහන්සේගේ ශ්‍රීශාරීරික ධාතූන්වහන්සේලාට චෛත්‍යක්කරවා පූජාසත්කාරකරණු කැමැත්තෙමි කියාය. විසල් පුරවැසි ලිච්ඡවිරජදරුවෝද භාග්‍යවතුන්වහන්සේ කුසිනාරා නුවරදී පිරිනිවන්පෑවදාළසේකැයි ඇසුවාහුමය.

අථ ඛො වෙසාලිකා ලිච්ඡවී කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං. භගවාපි ඛත්තියො මයම්පි ඛත්තියා. මයම්පි අරහාම භගවතො සරීරානං භාගං මයම්පි භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමාති. අස්සොසුං ඛො කාපිලවත්ථවා සක්‍යා භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතොති. අථ ඛො කාපිලවත්ථවා සක්‍යා කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං. භගවා අම්හාකං ඤාතිසෙට්ඨො. මයම්පි අරහාම භගවතො සරීරානං භාගං මයම්පි භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමාති. අස්සොසුං ඛො අල්ලකප්පකාපි බුලයො භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතොති. අථ ඛො අල්ලකප්පකා බුලයො කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං භගවාපි ඛත්තියො මයම්පි ඛත්තියා.

---

ඉක්බිත්තෙන් විසල්පුරවැසි ලිච්ඡවිරජදරුවෝ කුසිනාරාපුරවැසි ලිච්ඡවිරජුන්වෙතට දූතයෙකුයැවූහ. භාග්‍යවතුන්වහන්සේද ක්‍ෂත්‍රියසේක. අපිද ක්‍ෂත්‍රියයෝ වම්හ. භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරික ධාතුභාගයක් ලබන්ට අපිද සුදුසුවම්හ. අපිද භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරික ධාතුන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජාසත්කාරකරණු කැමැත්තම්හයි කියායි. කිඹුල්වත්පුරවැසි ශාක්‍යරජදරුවෝද භාග්‍යවතුන්වහන්සේ කුසිනාරානුවරදී පිරිනිවන්පෑ වදාළසේකැයි ඇසුවාහුය. ඉක්බිත්තෙන් කිඹුල්වත්පුරවැසි ශාක්‍යරජදරුවෝද කුසිනාරාපුරවැසි මල්ලරජුන්ට දූතයෙකු යැවූහ. භාග්‍යවතුන්වහන්සේ අපගේ ඥාතිශ්‍රේෂ්ඨසේක. භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරික ධාතුකොටසක් ලබන්ට අපිද සුදුස්සම්හ. අපිද භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරික ධාතුන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජාසත්කාරකරණු කැමැත්තම්හයි අල්ලකප්පනම් නුවරවාසය කරන්නාවූ බූලයනම් ක්‍ෂත්‍රිය රජහුද භාග්‍යවතුන්වහන්සේ කුසිනාරානුවරදී පිරිනිවන්පෑ වදාළසේකැයි ඇසුවාහුමය. ඉක්බිත්තෙන් අල්ලකප්ප නාම නුවර වාසයකරන්නාවූ බූලයනම් ක්‍ෂත්‍රිය රජදරුවෝද කුසිනාරාපුරවැසි මල්ලරජුන්වෙතට දූතයෙකු යැවූහ. භාග්‍යවතුන්වහන්සේද ක්‍ෂත්‍රියසේක. අපිද ක්‍ෂත්‍රියවූම්හ.

මයම්පි අරහාම භගවතො සරීරානං භාගං. මයම්පි භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමාති. අස්සොසුං බො රාමගාමකා කොලියා භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතොති. අථ බො රාමගාමකා කොලියා කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං. භගවාපි ඛත්තියො මයම්පි ඛත්තියා. මයම්පි අරහාම භගවතො සරීරානං භාගං. මයම්පි භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමාති. අස්සොසි බො වෙඨදීපකො බ්‍රාහ්මණො භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතොති. අථ බො වෙඨදීපකො බ්‍රාහ්මණො කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසි භගවාපි ඛත්තියො. අහමස්මි බ්‍රාහ්මණො. අහම්පි අරහාමි භගවතො සරීරානං භාගං. අහම්පි භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමීති.

භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරික ධාතුකොටසක් ලබාගන්ට අපිද සුදුස්සම්හ. අපිද භාග්‍යවතුන්. වහන්සේගේ ශාරීරික ධාතුන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පුදනුකැමැත්තම්හයි කියාසි. රාමග්‍රාමයෙහි වාසයකරන්නාවූ කොලියරජදරුවෝද භාග්‍යවතුන්වහන්සේ කුසිනාරානම් නුවරදි පිරිනිවන්පෑ වදාළ්සේකැයි ඇසුවාහුමය. ඉක්බිත්තෙන්රාමග්‍රාමයෙහි වාසයකරන්නාවූ කොලිය රජදරුවෝද භාග්‍යවතුන් වහන්සේද ක්‍ෂත්‍රියසේක. අපිද ක්‍ෂත්‍රියවම්හ භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරිකධාතු කොඨාසයක් ලබන්ට අපිද සුදුසුවම්හ. භාග්‍යවතුන්වහන් සේගේ ශාරීරික ධාතුන්වහන්සේලාට අපිද චෛත්‍යයක්කොට පුජා සත්කාර කරණු කැමැත්තෙමු කියා කුසිනාරාවැසි මල්ලරජදරුවන්ට පඬුරු හා සමග දූතයෙකු යැවුවාහුය. වෙඨදිපනම් බ්‍රාහ්මණ තෙමේද භාග්‍යවතුන්වහන්සේගේ කුසිනාරානුවරදී පිරිනිවන්පෑ වදාළසේකැයිකියා ඇසුයේමය, ඉක්බිත්තෙන් වෙඨදිපනම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන්වහන්සේද ක්‍ෂත්‍රිය වංශෝද්භූත වූසේක. මමද බ්‍රාහ්මණවූයෙමි. ත්‍රෛලොකාචාර්‍ය්‍යවූ භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රී ශාරීරික ධාතුකොඨාසයක් ලබන්ටමමද සුදුස්සෙක්වීමි. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතුන්වහන්සේලාට මමද චෛත්‍යයක් කරවා පුජාසත්කාර කරණු කැමැත්තෙම්සි කියා කුසිනාරාවැසි මල්ල රජදරුවන්ට දූතයෙකු යැවූයේය.

අස්සොසුං ඛො පාවෙය්‍යකා මල්ලා භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතොති. අථ ඛො පාවෙය්‍යකෙ මල්ලා කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං භගවාපි ඛත්තියො මයම්පි ඛත්තියා මයම්පි අරහාම භගවතො සරීරානං භාගං මයපි භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමාති.

25. එවං වුත්තෙ කොසිනාරකා මල්ලා තෙ සඞ්ඝෙගණෙ එතදවොචුං. භගවා අම්හාකං ගාමක්ඛෙත්තෙ පරිනිබ්බුතො න, මයං දස්සාම භගවතො සරීරානං භාගන්ති. එවං වුත්තෙ දොණො බ්‍රාහ්මණො තෙ සංඝෙ ගණෙ එතදවොච.

සුණන්තු භොන්තො මම එකවාක්‍යං
අම්හාක බුද්ධො අහු ඛන්තිවාදො,
නහි සාධයං උත්තමපුග්ගලස්ස
සරීර භඞ්ගෙ සියා සම්පහාරො.

---

පාවෙය්‍ය නම් නුවරවාසයකරන්නාවූ මල්ලරජදරුවෝද භාග්‍යවතුන්වහන්සේ කුසිනාරානුවරදී පිරිනිවන්පෑ වදාළසේකැයි ඇසුවාහුමය. ඉක්බිත්තෙන් පාවෙය්‍යකනම් නුවර මල්ලරජදරුවෝ භාග්‍යවතුන්වහන්සේද ක්ෂත්‍රියවූසේක. අපිද ක්ෂත්‍රියයෝ වම්හ. භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශාරීරිකධාතු කොටඨාසයක් ලබන්ට අපිද සුදුසුවූවම්හ. භාග්‍යවතුන්වහන්සේගේ සාරීරිකධාතුන් වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජාසත්කාරකරණු කැමැත්තෙමු කියා කුසිනාරාවැසි මල්ලරජදරුවන්ට දූතයෙකු යැවූයේය.

25. ඒ ඒ රජදරුවන් මෙසේකී කල්හී කුසිනාරාපුරවැසි මල්ල රජදරුවෝ ඒ සඞ්ඝය ගණය යන සමූහයාට මෙසේ කීවාහුය' භාග්‍ය වතුන් වහන්සේ අපගේ ග්‍රාමක්ෂෙත්‍රයෙහිදී පිරිනිවන් පෑවදාළ සේක. අපි භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරකධාතු භාගයක් නොදෙම්හයි කීවාහුය. මෙසේ කීකල්හි ද්‍රොණනම් බ්‍රාහ්මණතෙම රාජ සමූහ සඞ්ඛ්‍යාත රාජ සඞ්ඝයාට මේමතු කියන කාරණය මෙසේ කීයේය. පින්වත්වූ රජ දරුවෙනි මා කියන්නාවූ මේ එකම වචනයක් අසත්වා· අපගේ බුදුරජතෙම ක්ෂාන්තිවාදීවූසේක. ලොකොත්තමවූ භාග්‍යවතුන්ගේ ශරීරභෙදය නිමිත්තකොට ඇති ධාතුකොඨාසය හෙතුකොටගෙණ ආයුධ සම්ප්‍රහාරයක් වූයේනම් ඒ යුද්ධයතෙම යහපත් නොවේමය.

සබ්බෙව හොන්තු සහිතා සමග්ගා
සම්මොදමානා කරොමට්ඨ භාගෙ,
විත්ථාරිකා හොන්තු දිසාසු ථූපා
බහුජ්ජනො චක්ඛුමතො පසන්නොති.

තෙනහි බ්‍රාහ්මණ ත්වඤ්ඤෙව භගවතො සරීරානි අට්ඨධා සමං සුවිභත්තං විභජාහීති. එවං භොතිඛො දොණො බ්‍රාහ්මණො තෙසං සඞ්ඝානං ගණානං පටිස්සුත්වා භගවතො සරීරානි අට්ඨධා සමං සුවිභත්තං විභජිත්වා තෙ සඞ්ඝෙ ගණෙ එතදවොච. ඉමං මෙ භොන්තො කුම්භං දදන්තු, අහම්පි කුම්භස්ස ථූපඤ්ච මහඤ්ච කරිස්සාමීති. අදංසුඛො තෙ දොණස්ස බ්‍රාහ්මණස්ස කුම්භං.

26. අස්සොසුංඛො පිප්ඵලිවනියා මොරියා භගවාකිර කුසිනාරායං පරිනිබ්බුතොති.

---

සියලු පින්වත්හුම හිතෛෂී භාවයෙන් යුක්තවූවෝ සාමග්‍රී භාවයට පැමිණ සතුටුවෙමින් ධාතූන් අට භාගයක් කරම්හ. ඒ ඒ දික්හි චෛත්‍යයෝ විස්තීර්ණ වෙත්වා. හෙවත් බහුලව පවතිත්වා. පසැස් ඇත්තාවූ බුදුරජානන් වහන්සේට බොහෝවූ ජනතෙමේ ප්‍රසන්නව වාසය කෙරේයයි කියායි. එම්බා ද්‍රොණ බ්‍රාහ්මණය එහෙනම් තෝම භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් මනා කොට බෙදීම්වශයෙන් සමසමව අට භාගයක් කොට දෙවයි කීහ. එසේය පින්වත්නි කියා ඒ ද්‍රොණ බ්‍රාහ්මණතෙම ඒ රාජසඞ්ඝගණ සමූහයාගේ වචනයට ප්‍රතිවචනදී භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරිකධාතූන් මනාකොට බෙදීම් වශයෙන් සමසමව අට කොටසක් කොටදී ඒ සඞ්ඝගණ සමූහයාට මෙසේ කියේය, පින්වත්නිමට ඒ ධාතු භාජන කුම්භයයි කියනලද ස්වර්ණනාලිකාව දෙත්වා. මමද ධාතුබෙදනලද කුම්භ සංඛ්‍යාත නාලිකාව තබා චෛත්‍යයක් කොට පූජාසත්කාර කෙම්රෙයි යාච්ඤා කෙළේය. ඒ රජදරුවෝ ද්‍රොණ බ්‍රාහ්මණයාහට ධාතු බෙදූ නාලිකාව දුන්නාහුය.

26. පිප්ඵලිවනියනම් මෝරියරජදරුවෝද භාග්‍යවතුන්වහන්සේ වනාහි කුසිනාරානම් පුරයෙහිදී පිරිනිවන්පෑවදාළසේකැයි ඇසූවාහුමය.

අථඛො පිප්ඵලිවනියා මොරියා කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං. භගවාපි ඛත්තියො. මයම්පි ඛත්තියා. මයම්පි අරහාම භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමාති. නත්ථි භගවතො සරීරානං භාගො. විභත්තානි භගවතො සරීරානි. ඉතො අඞ්ගාරං හරථාති. තෙ තතො අඞ්ගාරං හරිංසු.

27. අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො රාජගහෙ භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච අකාසි. වෙසාලිකාපි ලිච්ඡවී වෙසාලියං භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. කාපිලවත්ථවාපි සක්‍යා කපිලවත්ථුස්මිං භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු.

---

ඉක්බිත්තෙන් පිප්ඵලිවනියනම් මෝරිය රජදරුවෝද කුසිනාරා පුරවැසි මල්ලරජුන්වෙතට දූතයෙකු යැවූහ. භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රියවූසේක. අපිද ක්ෂත්‍රියවම්හ. අපිද භාග්‍යවතුන් වහන්සේගේ ශරීරධාතු භාගයක් ලබන්ට සුදුස්සම්හ. අපිද භාග්‍ය වතුන්වහන්සේගේ ශාරීරික ධාතූන්වහන්සේලාට චෛත්‍යයක් කරවා පූජසත්කාරකරණු කැමැත්තම්හයිකියායි. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතුභාගයක් නැත්තේය. භාග්‍යවතුන්වහන් සේගේ ධාතු බෙදනලද්දේය. මේ ආදාහනස්ථානයෙන් අඟුරුගෙණ යත්වයි කීවාහුය. ඒ මෝරියරජදරුවෝ භාග්‍යවතුන්වහන්සේගේ ආදාහනස්ථානයෙන් අඟුරු හැරගෙණ ගියාහුය.

27. ඉක්බිත්තෙන් විදෙහපුත්‍රවූ මගධදේශාධිපති අජාතශත්‍රුනම් මහරජතෙම රජගහනුවර භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශාරීරික ධාතූන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජසත්කාර කළේය. විසාලාමහනුවර නිවාසීවූ ලිච්ඡවි රජදරුවෝද ඒ විසාලනම්පුරප්‍රවර යෙහි භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශාරීරික ධාතූන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජසත්කාරකළාහුය. කපිලවස්තු පුරනිවාසීවූ ශාක්‍යරජදරුවෝද ඒ කපිලවස්තුනම්පුරප්‍රවරයෙහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීශාරීරිකධාතූන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජ සත්කාරකළාහුය.

අල්ලකප්පකාපි බුලයො අල්ලකප්පෙ භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. රාමගාමකාපි කොලියා රාමගාමෙ භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. වෙඨදීපකොපි බ්‍රාහ්මණො වෙඨදීපෙ භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච අකාසි. පාවෙය්‍යකාපි මල්ලා පාවායං භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. කොසිනාරකා මල්ලා කුසිනාරායං භගවතො සරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු, දොණොපි බ්‍රාහ්මණො කුම්භස්ස ථූපඤ්ච මහඤ්ච අකාසි. පිප්ඵලිවනියාපි මොරියා පිප්ඵලිවනෙ අඞ්ගාරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. ඉති අඨස්ස සරීරත්ථූපානඤ්ච නවමො කුම්භථූපො එව මෙතං භූතපුබ්බන්ති.

අල්ලකප්පනම් නුවර නිවාසිවූ බුලයනම්රජදරුවෝද අල්ලකප්පනම් පුරප්‍රවරයෙහි භාග්‍යවතුන්වහන්සේගේශාරීරිකධාතූන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජාසත්කාරකළාහුය.රාමග්‍රාමයෙහි වාසයකරන්නාවූ කොලියරජහුද ඒ රාමග්‍රාමයෙහි භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරික ධාතූන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජාසත්කාරකළාහුය. වෙඨදීපනම්නුවරනිවාසිවූබ්‍රාහ්මණතෙමේදවෙඨදීපයෙහි භාග්‍යවතුන්වහන්සේගේ ශාරීරිකධාතූන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජාසත්කාරකෙළේය. පාවානුවරනිවාසිවූ මල්ලරජදරුවෝද පාවානම්පුරප්‍රවරයෙහිභාග්‍යවතුන්වහන්සේගේ ශාරීරිකධාතූන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජාසත්කාරකළාහුය. කුසිනාරාපුරවැසි මල්ලරජදරුවෝද කුසිනාරානම්පුරප්‍රවරයෙහි භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීශාරීරික ධාතූන්වහන්සේලාට චෛත්‍යයක්කරවා පූජාසත්කාරකළාහුය.ද්‍රෝණනම්බ්‍රාහ්මණතෙමේදකුම්භථූපයයිකියා ධාතුමැනබෙදනලදනාලිකාවතබා චෛත්‍යයක්කරවා පූජාසත්කාර කළේය. පිප්ඵලිවනියනම් මෞර්ය රජහුදපිප්ඵලිවනනම්පුරයෙහි අඞ්ගාරථූපනම්වූ දාගැබක්කරවා පූජාසත්කාරකළාහුය. මෙසේ ශාරීරික චෛත්‍යයෝ අටනමක්පමණවූවෝය. කුම්භථූපයසමග චෛත්‍යනවයක්වූයේය. අඞ්ගාරචෛත්‍යය සමග චෛත්‍යදශයක් වූයේය. මෙසේ මේදාගැබ්. දසය පළමුකොට පිහිටුවනලද්දේ වූයේය.

28. අට්ඨදොණං චක්ඛුමතො සරීරං
සත්තදොණං ජම්බුදීපෙ මහෙන්ති,
එකඤ්ච දොණං පුරිසවරුත්තමස්ස
රාමගාමෙ නාගරාජා මහෙන්ති.

එකාහි දාඨා තිදිවෙහි පූජිතා
එකාපන ගන්ධාර පුරෙ මහීයති,
කාලිඞ්ගරඤ්ඤො විජිතෙ පුනෙකං
එකං පුන නාගරාජා මහෙන්ති.

තස්සෙව තෙජෙන අයං වසුන්ධරා
ආයාගසෙට්ඨෙහි මහී අලං කතා,
එවං ඉමං චක්ඛුමතො සරීරං
සුසක්කතං සක්කතසක්කතෙහි.

28. පසැස් ඇත්තාවූ බුදුරජානන්වහන්සේගේ ශාරීරික ධාතු ද්‍රොණඅටක් පමණවූයේය. එයින් සත්ද්‍රොණයක් දඹදිව්තෙලෙහි දඹදිව්වැස්සෝ පුදත්. පුරුෂොත්තමවූ බුදුරජානන්වහන්සේගේ එක් ධාතුද්‍රොණයක් රාමග්‍රාමයෙහි නාගරාජයෝ පුදත්. එක්දන්ත ධාතුන්වහන්සේ නමක් දෙව්ලොව දෙවියන්විසින් පුදනලද්දීය. එක්දංෂ්ට්‍රා ධාතුන්වහන්සේනමක් ගාන්ධාරදෙශයෙහි රාජරාජ මහාමාත්‍යාදීන්විසින් පුදනලද්දිය, එක් ධාතූන්වහන්සේනමක් කාලිංගරජුගේ රාජ්‍යයෙහි පුදපවත්වනලද්දේය. එක්දන්තධාතුන් වහන්සේනමක් නාලොව නාරජහු පුදත්. ඒ ශ්‍රීදංෂ්ටා ධාතූන්වහන්සේගේ තෙජානුභාවයෙන් යාගයයිකියනලද ශ්‍රෙෂ්ඨතර වස්තු පරිත්‍යාගයෙන් කරණලද පූජොත්සව මඞ්ගල්‍යයෙන් මේ පෘථිවි තොමෝ අලඞ්කෘතවූවාය. සත්කාරකරණුලබන්නන්විසින් සත් කාරකරණලද්දාවූ මනාකොට විශෙෂයෙන්ම සත්කාරකරණලද්දාවූ පසැස්ඇත්තාවූ බුදුරජානන්වහන්සේගේ මේ යථොක්ත ශරීර ධාතුන්වහන්සේ.

දෙවින්දනාගින්ද නරින්ද පූජිතො
මනුස්ස සෙට්ඨෙහි තථෙව පූජිතො,
තං වන්දථ පඤ්ජලිකා භවිත්වා
බුද්ධා හවෙ කප්පසතෙහි දුල්ලභාති.

මහාපරිනිබ්බාණ සුත්තං
නිට්ඨිතං සොළසමං.

---

මෙපරිද්දෙන් දෙවෙන්ද්‍රනාගෙන්ද්‍රනරෙන්ද්‍රාදීන්විසින් පුදනලද්දේය. එසේම අජාතශත්‍රු ධර්‍මාශොකාදි නරෙන්ද්‍රොත්තමයන්විසින්ද පුදනලද්දේය. එහෙයින් ඇදිලිබැඳගෙණ ඒ සර්‍වඥ ශාරීරිකධාතූන්වහන්සේලාට නොහොත් සර්‍වඥශාරීරිකධාතූචෛත්‍යයටසාදරයෙන්නමස්කාරකෙරෙත්වා. සර්‍වඥවරොත්තමයානන්වහන්සේලා එකාන්තයෙන් කල්පසියයකිනිදු කල්පලක්‍ෂයකිනිදු දක්මට දුර්ලභවන්නාහ.

සොළොස්වෙනිවූ මහාපරිනිර්‍වාණ සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව
මෙතෙකින් නිමියේයි.

---

Bar
12.12.18

## XVII මහාසුදස්සන සුත්තං.

1. ඒවමෙම සුතං. එකං සමයං භගවා කුසිනාරායං විහරති උපවත්තනෙ මල්ලානං සාලවනෙ අන්තරෙන යමකසාලානං පරිනිබ්බාණ සමයෙ.

2. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. මා භන්තෙ භගවා ඉමස්මිං කුඩ්ඩනගරකෙ උජ්ජඞ්ගලනගරකෙ සාඛානගරකෙ පරිනිබ්බායි. සන්ති භන්තෙ අඤ්ඤානි මහානගරානි. සෙය්‍යථිදං.

---

## මහා සුදර්ශනසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

1. මේ සූත්‍රධර්මය මාවිසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි ඒනම් පරිනිර්වාණකාලයෙහි භාග්‍යවතුන්වහන්සේ කුසිනාරානුවර උපවත්තනනම්වූ මල්ලරජුන්ගේ සල්වන උයන්හි තරුණ ශාල වෘක්ෂයුග්මාභ්‍යන්තරයෙහි වැඩවාසයකරණසේක.

2. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වනාකොට වැඳ එකත්පසෙක උන්සේක. එකත්පසෙක උන්නාවූ ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය මෙසේ සැලකළසේක. ස්වාමිනි භාග්‍යවතුන්වහන්සේ බාරාණසී ආදී ප්‍රසිද්ධ නුවරට ඇතුළත්නොවූ හෙයින් කුඩ්‍යනගර නම්වූ ගල්සෙල් ආදියෙන් විෂමතර හෙයින් උජ්ජඞ්ගල නගරනම්වූ මූල් නුවරින් අන්‍යවූ හෙයින් ශාඛානගරනම්වූ මේ කුසිනාරා නුවරෙහි නහමක් පිරිනිවන්පා වදාළමැනව. ස්වාමීන්වහන්ස, මෙයින් අන්‍යවූ මහනුවරවල් ඇත්තාහ. ඒ කවරහුද,

චම්පා රාජගහං සාවත්ථි සාකෙතං කොසම්බි බාරාණසී. එත්ථ භගවා පරිනිබ්බායතු. එත්ථ බහූ ඛත්තිය මහාසාලා බ්‍රාහමණමහාසාලා ගහපතිමහාසාලා තථාගතෙ අභිප්පසන්නා. තෙ තථාගතස්ස සරිර පූජං කරිස්සන්තීති.

3. මා හෙවං ආනන්ද අවච කුඩ්ඩනගරකං උජ්ජඞ්ගලනගරකං සාඛනගරකන්ති. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො නාම අහොසි ඛත්තියො මුද්ධාභිසිත්තො චාතුරන්තො විජිතාවී ජනපදත්ථා වරියප්පත්තො. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස අයං කුසිනාරා කුසාවතීනාම රාජධානි අහොසි. සා ඛො ආනන්ද කුසාවතී.

---

චම්පානුවරය, රජගහනුවරය, සැවැත්නුවරය, සාකෙතනුවරය, කොසඹෑනුවරය, බරණැස්නුවරය යන මොව්හුය. මේ මහනුවරවල් අතරෙන් එක්තරා නුවරකදී භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පා වදාරණසේක්වා. මේ නුවරවල බොහෝවූ ක්‍ෂත්‍රිය මහාසාරකුලයෝද, බ්‍රාහ්මණ මහාසාරකුලයෝද, ග්‍රහපති මහාසාරකුලයෝද ඇත්තාහ. ඔව්හු තථාගතයන්වහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසන්නයහ, ඒ ත්‍රිවිධ මහාසාරකුලයෙහි වූවෝ තථාගතයන්වහන්සේගේ ශරීරපූජාව කරන්නාහුයයි සැලකළසේක.

3. එම්බා ආනන්දය, කුඩානුවරයයිද, නොසමනුවරයයිද, අතු නුවරයයිද මෙසේ නහමක් කියව හෙවත් මෙසේ නොකියවයි වදාළ සේක. එම්බා ආනන්දය, පෙරකාලයෙහි අභිෂෙකප්‍රාප්තවූ ක්‍ෂත්‍රිය වංශයෙහි උපන්නාවූ සාගරය කෙළවරකොටඇති සතරමහාද්වීපයට නායකවූ ඛඩ්ග කුන්ත තොමරාදි කිසි ආයුධයක් නොගෙණ තමා ගේ කුසලානුභාවයෙන්ම සතුරන්ජයගත්තාවූ කිසි සතුරුකෙනෙකුන් විසින් සොල්වාලියනොහැකිහෙයින් ජනපදයාගේ ස්ථිරභාව යට පැමිණියාවූ මහාසුදර්ශනනම් රජෙක් වූයේය. ආනන්දය, ඒ මහා සුදර්ශන රජහට මේ කුසිනාරානුවර කුසාවතීනම් රාජධානිවූයේය. එම්බා ආනන්දය, ඒ කුසාවතීනම් රාජධානිය වනාහී.

පච්ඡිමෙනච පුරත්ථිමෙනච ද්වාදසයොජනානි අහොසි ආයාමෙන, උත්තරෙනච දක්ඛිණෙනච සත්තයොජනානි විත්ථාරෙන. කුසාවතී ආනන්ද රාජධානී ඉද්ධාචෙව අහොසි ඵීතාච බහුජනාච ආකිණ්ණමනුස්සාච සුභික්ඛාච. සෙය්‍යථාපි ආනන්ද දෙවානං ආලකමන්දානාම රාජධානී ඉද්ධාචෙව ඵීතාච බහුජනාච ආකිණ්ණයක්ඛාච, එවමෙව ඛො ආනන්ද කුසාවතී රාජධානී ඉද්ධාචෙව අහොසි ඵීතාච බහුජනාච ආකිණ්ණමනුස්සාච සුභික්ඛාච. කුසාවතී ආනන්ද රාජධානී දසහි සද්දෙහි අවිවිත්තා අහොසි දිවාචෙව රත්තිංච. සෙය්‍යථීදං, හත්ථිසද්දෙන අස්සසද්දෙන රථසද්දෙන භෙරිසද්දෙන මුතිඞ්ගසද්දෙන වීණාසද්දෙන ගීතසද්දෙන සම්මසද්දෙන තාලසද්දෙන අස්නාථ පිවථ ඛාදථා'ති දසමෙන සද්දෙන.

---

පූර්වදිශාභාගයෙන්ද පශ්චිම දිශාභාගයෙන්ද දිගින් දොළොස්යොදුන් විය. උත්තරදිශාභාගයෙන් හා දක්ෂිණදිශාභාගයෙන් පුළුලින් සත් යොදුන් විය. ආනන්දය, කුසාවතී රාජධානිතොම සකලසම්පත්තීන් සමෘඬවිය. සියල්ලෙන් පිරුණේද විය. බොහෝ සත්වයෝද ඇතිවූහ. එහි හැසිරෙන්නාවූ මනුෂ්‍යයන්ගෙන් ගැවසිගත්තීය. ඛාද්‍යභොජ්‍යාදියෙන්ද ඉතා සුභික්ෂ විය. ආනන්දය, යම්සේ දෙවියන්ගේ ආලකමන්දානම් රාජධානීතොමෝ සකලසම්පත්තින් සමෘඬවීමෙන් පිරුණේද බොහෝ ජනයන් ඇත්තීද යක්ෂාකීර්ණ විද ආනන්දය, එපරිද්දෙන්ම කුසාවතීනම් රාජධානිතොමෝ සකලසම්පත්තීන් සමෘඬවූවාය. එහෙයින් පිරුණේද විය. බොහෝ සත්වයෝ ඇතිවූහ. අවශෙෂවූ සත්පුරුෂාදින්ගෙන්ද ගැවසිගත්තීය. ඛාද්‍යභොජ්‍යාදියෙන් සුභික්ෂද වූවාය. ආනන්දය, කුසාවතී රාජධානිතොමෝ රෑදවල් දෙක්හිම දශවිධ ශබ්දයෙන් එකනින්නාද පැවැත්වීමෙන් අවිවෙකවූවාය. ඒ දශවිධ ශබ්දය කවරේද, ඇතුන්ගේ කුඤ්චනාදයෙන්ද, අසුන්ගේ හෙෂාරවයෙන්ද, රථශබ්දයෙන්ද, භෙරිශබ්දයෙන්ද, මුතිඞ්ග ශබ්දයෙන්ද, වීණාශබ්දයෙන්ද, ගීතශබ්දයෙන්ද, සම්මශබ්දයෙන්ද, තාලශබ්දයෙන්ද, අනුභවකරව පානයකරව කවයි යන දශවෙනිවූ මේ ශබ්දයෙන්ද අතුරුනැතිවූයේය,

4. කුසාවතී ආනන්‍ද රාජධානි සත්තහි පාකාරෙහි පරික්ඛිත්තා අහොසි. තත්‍ථ එකො පාකාරො සොවණ්ණමයො. එකො රූපිමයො. එකො වෙළුරියමයො. එකො ඵලිකමයො. එකො ලොහිතඞ්කමයො. එකො මසාරගල්ලමයො. එකො සබ්බරතනමයො.

5. කුසාවතියා ආනන්‍ද රාජධානියා චතුන්නං වණ්ණානං ද්වාරානි අහෙසුං. එකං ද්වාරං සොවණ්ණමයං එකං රූපිමයං එකං වෙළුරියමයං එකං ඵලිකමයං. එකමෙකස්මිං ද්වාරෙ සත්ත එසිකා නිඛාතා අහෙසුං. තිපොරිසඞ්ගා චතුපොරිසා ඛාතා දසපොරිසා උබ්බෙධෙන. එකා එසිකා සොවණ්ණමයා එකා රූපිමයා එකා වෙළුරියමයා එකා ඵලිකමයා එකා ලොහිතඞ්කමයා එකා මසාරගල්ලමයා එකා සබ්බරතනමයා.

---

4. ආනන්දය, කුසාවතී රාජධානිතොමෝ ප්‍රකාර සතකින් වටවූවාය. ඒනම්, එක් ප්‍රාකාරයක් ස්වර්ණමයවූයේය. එකක් රජතමය වූයේය. එකක් වෛඩූර්‍ය්‍යමාණික්‍යමය වූයේය. එකක් ස්ඵටිකමාණික්‍යමය වූයේය. එකක් ලොහිතඞ්කමාණික්‍යමය වූයේය. එකක් මසාරගල්ලමය වූයේය. එකක් සර්‍වරත්නමය වූයේය.

5. ආනන්දය, කුසාවතී රාජධානියෙහි චතුර්විධවර්ණයන් සම්බන්ධවූ නොහොත් සතරවැදෑරුම් පැහැයකින් යුක්තවූ ද්වාරයෝ වූවාහුය. ඒනම්, එක් දොරටුවක් ස්වර්ණමය වූයේය. එකක් රජතමය වූයේය. එකක් වෛඩූර්‍ය්‍යමය වූයේය. එකක් ස්ඵටිකමය වූයේය. එකිඑකී දොරටුවෙක්හි සත් සත් එසිකාස්ථම්භයෝ හිඳුවනලද්දාහුය. තුන් සතර පුරුෂප්‍රමාණ තැන් ගිඳුවනලද්දහ. උසින් දසපුරුෂප්‍රමාණ වූයේය. එක් ටැඹක් ස්වර්ණමය වූවාය. එකක් රජතමය වූවාය. එකක් වෛඩූර්‍ය්‍යමය වූවාය. එකක් ස්ඵටිකමය වූවාය. එකක් ලොහිතඞ්කමය වූවාය. එකක් මැසිරිගල්මුවාවූවාය. එකක් සර්‍වරත්නමය වූවාය.

6. කුසාවති ආනන්ද රජධානි සත්තහි තාලපන්තීහි පරික්ඛිත්තා අහොසි. එකා තාලපන්ති සොවණ්ණමයා එකා රූපිමයා එකා වෙළුරියමයා එකා ඵලිකමයා එකා ලොහිතඞ්කමයා එකා මසාරගල්ලමයා එකා සබ්බරතනමයා. සොවණ්ණමයස්ස තාලස්ස සොවණ්ණමයො ඛන්ධො අහොසි රූපිමයානි පත්තානිච ඵලානිච. රූපිමයස්ස තාලස්ස රූපිමයො ඛන්ධො අහොසි සොවණ්ණමයානි පත්තානිච ඵලානිච. වෙළුරිය මයස්ස තාලස්ස වෙළුරියමයො ඛන්ධො අහොසි ඵලිකමයානි පත්තානිච ඵලානිච. ඵලිකමයස්ස තාලස්ස ඵලිකමයො ඛන්ධො අහොසි. වෙළුරියමයානි පත්තානිච ඵලානිච. ලොහිතඞ්කමයස්ස තාලස්ස ලොහිතඞ්කමයො ඛන්ධො අහොසි මසාරගල්ලමයානි පත්තානිච ඵලානිච. මසාරගල්ලමයස්ස තාලස්ස මසාරගල්ලමයො ඛන්ධො අහොසි ලොහිතඞ්කමයානි පත්තානිච ඵලානිච. සබ්බරතනමයස්ස තාලස්ස සබ්බරතනමයො ඛන්ධො අහොසි සබ්බරතනමයානි.

6. ආනන්දය, කුසාවතීනම් රජධානිතොමෝ තල්පෙල සතකින් පරික්ෂිප්ත වූයේය. ඒනම්, එක් තල්පෙලක් ස්වර්ණමය වූයේය. එක් පෙලක් රිදීමය වූයේය. එක් පෙලක් වෛඩූර්‍ය්‍යමය වූයේය. එක් පෙලක් ස්ඵටිකමය වූයේය. එක් පෙලක් ලොහිතඞ්කමය වූයේය. එක් පෙලක් මැසිරිගල්මුවාවූයේය. එක් පෙලක් සර්වරත්නමය වූයේය. ස්වර්ණමයවූ තාලවෘක්ෂයාගේ ස්වර්ණමයවූ කඳවූයේය. රිදීමය පත්‍ර හා ඵලවූවාහුය. රිදීමයවූ තාලවෘක්ෂයාගේ රිදීමයවූ කඳ වූයේය. ස්වර්ණමය පත්‍ර හා ඵලද වූවාහුය. වෛඩූර්‍ය්‍යමයවූ තාලවෘක්ෂයාගේ වෛඩූර්‍ය්‍යමය කඳ ඇතිවූයේය. ස්ඵටික මාණික්‍යමයවූ පත්‍ර හා ඵල ඇතිවූවාහුය, ඵළිකමයවූ තාලවෘක්ෂයාගේ ඵළිකමයවූකඳ ඇතිවූයේය. වෙරළුමිණිමුවාපත්‍රහාඵල ඇතිවූවාහුය. ලොහිතඞ්කමය තාලවෘක්ෂයාගේ ලොහිතඞ්කමයවූ කඳ ඇතිවූයේය. මසාරගල්ලමය පත්‍ර හා ඵල ඇතිවූයේය. මරකතමාණික්‍යමයවූ තා වෘක්ෂයාගේ මරකතමාණික්‍යමයවූ කඳඇතිවූයේය. ලොහිතඞ්කමයවූ පත්‍ර හා ඵල ඇතිවූවාහුය සර්වරත්නමයවූ තාලවෘක්ෂයාගේ සර්වරත් නමයවූ කඳ ඇතිවූයේය. සර්වරත්නමයවූ.

පත්තානිව ඵලානිව. තාසං ඛො පනානන්‍ද තාලපන්තීනං වාතෙරිතානං සද්‍දො අහොසි වග්ගුච රජනීයොච ඛමනීයොච. මදනීයොච සෙය්‍යථාපි ආනන්‍ද පඤ්චඞ්ගිකස්ස තුරියස්ස සුවිනීතස්ස සුප්පටිතාලිතස්ස කුසලෙහි සමන්‍නාගතස්ස සද්‍දො හොති වග්ගුච රජනීයොච ඛමනීයොච මදනීයොච. එවමෙව ඛො ආනන්‍ද තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්‍දො අහොසි වග්ගුච රජනීයොච ඛමනීයොච මදනීයොච. යෙ ඛො පනානන්‍ද තෙන ඛො පන සමයෙන කුසාවතියා රාජධානියා ධුත්තා අහෙසුං සොණ්ඩා පිපාසා තෙ තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්‍දෙන පරිචාරෙසුං.

7. රාජා ආනන්‍ද මහාසුදස්සනො සත්තහි රතනෙහි සමන්‍නාගතො අහොසි. චතූහිච ඉද්ධීහි. කතමෙහි සත්තහි.

---

පත්‍ර හා ඵල ඇතිවූවාහුය. එම්බා ආනන්‍දය, සුලඟින් කම්පා වන්නාවූ ඒ තාලපන්තීන්ගේ මනොරම්‍යවූද සිත්අලවන්නාවූද ප්‍රීතිකරන්නාවූද විශෙෂයෙන් චිත්තප්‍රීණනය කරන්නාවූද ශබ්දය වූයේය. ආනන්‍දය, යම්සේ විශෙෂයෙන් හික්මුනාවූ බෙර ආදිය ගැසීමෙහි දක්‍ෂවූ වාද්‍යකාරයක්හුවිසින් වයනලද්දවූ පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය ශබ්දයාගේ මනොරම්‍යවූද සිත්අලවන්නාවූද ප්‍රීතිකරවූද විශෙෂයෙන් චිත්තප්‍රමොදය කරන්නාවූද ශබ්දය ඇතිවේද එපරිද්දෙන්ම ආනන්‍දය, වාතයෙන් කම්පාවනලද්දවූ ඒ තාලපන්තීන්ගේ මනොරම්‍යවූද සිත්අලවන්නාවූද ප්‍රීතිකරවූද චිත්තප්‍රමොදය කරවූද පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාදයක් පවත්වන්නාක් මෙන් ශබ්දය ඇතිවූයේය. ආනන්දය, එසමයෙහිදී කුසාවතී නම් රාජධානියෙහි වසන්නාවූ සුරාපානයෙහි ලොල්වූ පිපාසයෙන් යුක්තවූ යම් ධූර්තකෙනෙක් වූවාහු වෙද්ද. ඒ ධූර්තයෝ අනිලවෙගයෙන් කම්පාවන්නාවූ ඒ තාලපඞ්ක්තීන්ගේ ශබ්දයෙන් ප්‍රමුදිතවූ සිත්ඇත්තාහු ඉන්ද්‍රියයන් හැසිරවූවාහුය.

7. ආනන්දය, මහාසුදර්ශනරජතෙම සප්තවිධරත්නයකින්ද සතර ඍද්ධියකින්ද, සමන්විත වූයේය. කවරසත්රුවනකින්දයත්.

ඉධානන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතුරහොසි සහස්සාරං සනෙමිකං සනාභිකංසබ්බාකාරපරිපූරං. දිස්වා රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි. සුතං ඛො පන මෙතං යස්ස රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතු භවති සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාර පරිපූරං. සො හොති රාජා චක්කවත්තීති. අස්සං නුඛො අහං රාජා චක්කවත්තීති.

8. අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වා මෙන හත්ථෙන භිඞ්කාරං ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන.

එම්බා ආනන්දය, ඒ පුර ප්‍රවරයෙහි පසළොස්වක්ලත් පොහෝදින යෙහි සුවඳපැන් සොළොස්කලයකින් ස්නානයකළාවූ අෂ්ටාඞ්ග ශීලයෙන් යුක්තව ප්‍රාසාදයාගේ මතුමහල්තලයට පැමිණ සිරියහන් ගබඩාවෙහි බඩපයඞ්ඛකයෙන් උපලක්‍ෂිතව ශීලය ආවර්ජනා කරන් නාවූ මහාසුදර්ශනරජහට අරදහසකින් සම්පූර්ණවූ නිම්වලලු සහිතවූ නැඹබඹුලු සහිතවූ යථොක්ත ක්‍රමයෙන් සර්වාකාරපරිපූර්ණවූ දිව්‍යචක්‍රරත්නය පහළවූයේය. ඒ දැක මහාසුදර්ශන රජහට මෙබඳු සිතිවිල්ලක්වූයේය. මාවිසින් මෙබන්දක් අසනලද්දේය. ඒනම් පසළොස්වක් පොහෝදිනයෙහි සුවඳපැන් සොළොස්කලයකින් ඉස්සොඳා නහා අෂ්ටාඞ්ගශීලයෙන් උපලක්‍ෂිතව ප්‍රාසාදයාගේ මතුමහල්තලයට පැමිණියාවූ ක්‍ෂත්‍රිය වංශයෙහි උපන්නාවූ අභිෂෙක ප්‍රාප්තවූ යම් රජෙක්හට ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ දහසක් අරසහිතවූ නිම් වලලු සහිතවූ සර්වාකාර සම්පූර්ණවූ දිව්‍යමයවූ චක්‍රරත්නයක් පහළවේද හෙතෙම සක්විතිරජවේයයි. මම සක්විති රජවෙම්දෝ හෝයි යන මේ සිත පහළවූයේය.

8. ආනන්දය, ඉක්බිත්තෙන් විශිෂ්ට දර්ශනඇති ඒ මහාසුදර්ශන රජතෙම හුනස්නෙන් නැගීසිට දිවසළුවක් එකාංශකොට පොරවා වම්අතින් රන්කෙන්ඩියගෙණ දකුණු අතින්.

චක්කරතනං අබ්භුක්කිරි, පවත්තතු භවං චක්ක රතනං අභිවිජිනාතු භවං චක්කරතනන්ති. අථ ඛො තං ආනන්ද චක්කරතනං පුරත්ථිමං දිසං පවත්ති අන්වදෙව රාජා මහාසුදස්සනො සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය, යස්මිං ඛො පනානන්ද පදෙසෙ චක්ක රතනං පතිට්ඨාසි තත්ථ රාජා මහාසුදස්සනො වාසං උපගඤ්ජි සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය.

9. යෙ ඛො පනානන්ද පුරත්ථිමාය දිසාය පටිරාජානො තෙ රාජා නං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු. එහි ඛො මහාරාජ සාගතං මහාරාජ. සකන්තෙ මහාරාජ. අනුසාස මහාරාජාති, රාජා මහා සුදස්සනො එවමාහ. පාණො න හන්තබ්බො. අදින්නං නාදාතබ්බං. කාමෙසු මිච්ඡා න චරිතබ්බා.

---

පින්වත් චක්‍රරත්නය මාගේ අණසක සතරමහත් දිවයින ජයගෙණ දෙවයි කියා චක්‍රරත්නයට පැන් ඉස්සේය, ආනන්දය, ඉක්බින්තෙන් ඒ චක්‍රරත්නය මහාසුදශීන රජතැටුවම සිව්රඟ සෙනඟ සමඟ පෙරදිගට අහස්හමන් ගතී. ආනන්දය, යම් පෙදෙසෙක්හි චක්‍රරත් නය පිහිටියේද ඒ පෙදෙසෙහි සිව්රඟසෙනඟ සමඟමහාසුදශීන රජතෙම වාසයට එළඹියේය.

9. ආනන්දය, පූර්විදිශාවෙහි යම්බඳු ප්‍රතිවිරුඬ රජකෙනෙක් වූද ඔව්හු මහාසුදශීන රජුවෙතට එලඹ මෙසේ දැන්වූහ, මහරජ් ජුරුවන්වහන්ස, මෙහි වඩිනු මැනව. මහරජ්ජුරුවන්වහන්ස. නුබවහන්සේගේ ගමන ඉතාසඟපත්වේවය, මහරජ්ජුරුවන්වහන්ස සතරමහාද්වීපය නුබවහන්සේ සන්තකය මහරජ්ජුරුවන්වහන්ස අපටඅනුශාසනා කළමැනවයි සැලකළාහුය. මහාසුදශීන රජතෙමේ මෙසේ අනුශාසනාකළේය, සතුන් නොමැරිය යුත්තේය, පරසන් තක හිරණ්‍යසුවර්ණාදිවස්තුව සොරකම් කිරීම්වශයෙන් නොගත යුත්තේය. රූපාදී පඤ්චකාම කොට්ඨාසයෙහි මිථ්‍යාප්‍රතිපත්ති තොමෝ නොහැසිරිය යුත්තීය.

මුසා න භාසිතබ්බා. මජ්ජං න පා තබ්බං. යථා භුත්තඤ්ච භුඤ්ජථාති. යෙ ඛො පනානන්ද පුරත්ථිමාය දිසාය පටිරාජානො තෙ රඤ්ඤො මහාසුදස්සනස්ස අනුයුත්තා අහෙසුං.

10. අථ ඛො තං ආනන්ද චක්කරතනං පුරත්ථිමං සමුද්දං අජ්ඣොගහෙත්වා පච්චුත්තරිත්වා දක්ඛිණං දිසං පවත්ති—පෙ—දක්ඛිණං සමුද්දං අජ්ඣොගහෙත්වා පච්චුත්තරිත්වා පච්ඡිමං දිසං පවත්ති. පච්ඡිමං සමුද්දං අජ්ඣොගහෙත්වා උත්තරං දිසං පවත්ති අන්වදෙව රාජා මහාසුදස්සනො සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යස්මිං ඛො පනානන්ද පදෙසෙ චක්කරතනං පතිට්ඨාසි තත්ථ රාජා මහාසුදස්සනො වාසං උපගඤ්ඡි සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යෙ ඛො පනානන්ද උත්තරාය දිසාය පටිරාජානො තෙ රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු. එහි ඛො මහාරාජ.

---

නැතිදෙය ඇතිකොට නොකිය යුත්තේය. සුරාපානය නොකට යුත්තේය. තොප කැමති පරිද්දෙන් අනුභවකරවයි කියා ඒ ඒ රජ දරුවන්ටම රාජ්‍යයන් පාවා දෙයි. ආනන්දය පූර්විදිශාභාගයෙහි සම්ප්‍රතිවිරුඩ රජකෙනෙක් ඇද්ද ඔහුතුමූ මහාසුදර්‍ශන රජහට. අනුව පැවැත්තාහුය හෙම්බත් යටත්වූහ.

10. ආනන්දය, ඉක්බිත්තෙන් ඒ චක්‍රරත්නය පූර්විදිශාවෙහි සමුද්‍රයට බැසගෙණ එයින්නැගී දකුණුදිශාවට අහස්ගමන් ගන්නේය. සෙස්ස ප්‍රථමවාරයෙහි විස්තරයෙන් දතයුතු—පෙ—දකුණු සමුද්‍රයට බැසගෙණ ඉන්නැගී පැදුම්දිගට ගමන්ගන්නේය. සංක්‍ෂෙප කරණලදි. පශ්චිම සමුද්‍රයට බැසගෙණ සිව්රඟසෙන් සහිත මහාසුදර්‍ශන රජ සමග ඉන්නැගී උතුරු දිශාවට ගමන්ගන්නේය. ආනන්දය යම් පෙදෙසෙක්හි චක්‍රරත්නය පිහිටියේද එතැන්හි මහාසුදර්‍ශන රජතෙමේ සිව්රඟ සෙන් සමග වාසයට පැමිණියේය. ආනන්දය උතුරුදිග යම් පිළිමල් රජකෙනෙක්වූද ඔව්හු මහාසුදර්‍ශන රජුවෙතටඑලඹ මෙසේ කීහ. මහරජ්ජුරුවන්වහන්ස, මෙහි වඩිනු මැනව.

සාගතං මහාරාජ. අනුසාස මහාරාජාති. රාජා මහාසුදස්සනො එවමාහ. පාණො න හන්තබ්බො අදින්නං නාදාතබ්බං කාමෙසු මිච්ඡා නචරිතබ්බා. මුසා නභාසිතබ්බා. මජ්ජං නපාතබ්බං. යථාභුත්තඤ්ච භුඤ්ජථාති. යෙඛො පනානන්ද උත්තරාය දිසාය පටිරාජානො තෙ රඤ්ඤො මහාසුදස්සනස්ස අනුයුත්තා අහෙසුං.

11- අථඛො තං ආනන්ද චක්කරතනං සමුද්දපරියන්තං පථවිං අභිවිජිනිත්වා කුසාවතිං රාජධානිං පච්චාගන්ත්වා රඤ්ඤො මහාසුදස්සනස්ස අන්තෙපුරද්වාරෙ අත්ථකරණපමුඛෙ අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසි. රඤ්ඤො මහාසුදස්සනස්ස අන්තෙපුරං උපසොභයමානං. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං චක්කරතනං පාතුරහොසි.

---

මහරජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ ගමන ඉතා යහපති. මහරජ්ජුරුවන්වහන්ස, අපට අනුශාසනා කළ මැනවයි ආරාධනා කළාහ. මහසුදසුන් රජතෙමේ මෙසේ අනුශාසනා කළේය. සත්ව ඝාතනය නොකට යුත්තේය. නුදුන්දෙය නොගත යුත්තේය. කාමයන්හි වරදවා නොහැසිරිය යුත්තේය. බොරුනොකිය යුත්තේය. රහමෙර පානය නොකට යුත්තේය. තෙපි සවකිය රාජ්‍ය සුඛය කැමති පරිද්දෙන් විඳිව් කියායි. ආනන්දය උතුරුදිග සම්ප්‍රතිවිරුඩ රජකෙනෙක්වූද ඔව්හු මහාසුදර්ශන රජහට යටත් වූහ.

11. ආනන්දය ඉක්බිත්තෙන් ඒචක්‍රරත්නය සමුද්‍රය කෙළවරකොට ඇති මුලුපොළොව ජයගෙණ කුසාවතී රාජධානියට පෙරළා අවුත් මහාසුදර්ශනරජහුගේ අන්තඃ පුරවාරයෙහි හෙවත් ඇතුළුවහසල් දොර විනිශ්චයශාලාව ඉදිරියෙහි මහාසුදර්ශනරජහුගේ අන්තඃපුරය වැඩියක් හොබවමින් අකුරෙහි ප්‍රවෙශකරණලද්දක්මෙන් සිටියේය. එම්බා ආනන්දය මහාසුදර්ශන රජහට මෙබඳුවූ අනුභාවසම්පන්නවූ චක්‍රරත්නය පහළවූයේය.

12. පුනචපරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස හත්ථිරතනං පාතුරහොසි. සබ්බසෙතො සත්තප්පතිට්ඨො ඉද්ධිමා වෙහාසඞ්ගමො උපොසථො නාම නාගරාජා. දිස්වා රඤ්ඤො මහාසුදස්සනස්ස චිත්තං පසීදි, භද්දකං වත භො හත්ථියානං, සචෙ දමථං උපෙය්‍යාති. අථ ඛො තං ආනන්ද හත්ථිරතනං සෙය්‍යථාපි නාම භද්දො හත්ථාජානීයො දීඝරත්තං සුපරිදන්තො, එවමෙවං දමථං උපගච්ඡි. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො තමෙව හත්ථිරතනං වීමංසමානො පුබ්බණ්හසමයං අභිරුහිත්වා සමුද්දපරියන්තං පඨවිං අනුසංයායිත්වා කුසාවතිං රාජධානිං පච්චාගන්ත්වා පාතරාසමකාසි. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං හත්ථිරතනං පාතුරහොසි.

13. පුනචපරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස අස්සරතනං පාතුරහොසි. සබ්බසෙතො කාළසීසො මුඤ්ජකෙසො ඉද්ධිමා.

---

12. ආනන්දය, තවද මහාසුදර්ශනරජහට සර්වාඞ්ගයෙන් ධවලවූ සප්තස්ථානයකින් භූමිය ස්පර්ශකරන්නාවූ ඍද්ධිඇත්තාවූ අහසින් යන්නාවූ උපොසථනම් නාගරාජන්වූ හස්තිරත්නයක් පහළවූයේය. එදැක මහාසුදර්ශනරජහුගේ සිත පහන්වූයේය. පින්වත්නි, එකාන්තයෙන් හස්ති යානාව ඉදින් හික්මීමට පැමිණියේනම් ඉතා යහපතැයි කියායි. ආනන්දය, ඉක්බිත්තෙන් ඒහස්තිරත්නයතෙමේ ඉතාබොහෝ කලක් යහපත්ව දමනයකරණලද්දාවූ උතුම්වූ ආජානීය හස්තිරාජයෙක් යම්සේද එපරිද්දෙන්ම දමනයටපැමිණ ඉතා සුශික්ෂිතවූයේය. එම්බා ආනන්දය, පුරාතනකාරණයක් කියමි. ඒනම්, ඒ මහාසුදර්ශන රජතෙම හස්තිරත්නය විමසන්නේ පෙරවරුකාලයෙහි හස්ති යානාවට නැගී සමුද්‍රය කෙළවරකොටඇති මුලුපොළොව අනුශාසනාකොට කුසාවතී රාජධානියට පෙරළා අවුත් උදය බත නිමවූයේය. ආනන්දය, මහාසුදර්ශනරජහට මෙබඳුවූ හස්තිරත්නය පහළවූයේය.

13. නැවතද අනිකක් කියමි. ආනන්දය, මහාසුදර්ශනරජහට සර්වාඞ්ගයෙන් ධවලවූ කාකශීර්ෂවූ දක්ෂිණාවෘත්තව මුඩුවහිබෙන්නාවූ කෙසකලාප ඇතිහෙයින් මුඤ්ජකෙසනම්වූ ඍද්ධිමත්වූ.

වෙහාසඞ්ගමො වලාහකො නාම අස්සරාජා. දිස්වා රඤ්ඤො මහාසුදස්සනස්ස චිත්තං පසීදි. භද්දකං වත භො අස්සයානං සචෙ දමථං උපෙය්‍යාති. අථ ඛො තං ආනන්ද අස්සරතනං සෙය්‍යථාපි නාම භද්දො අස්සාජානීයො දීඝරත්තං සුපරිදන්තො එවමෙවං දමථං උපගච්ඡි. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො තමෙව අස්සරතනං වීමංසමානො පුබ්බණ්හසමයං අභිරුහිත්වා සමුද්දපරියන්තං පථවිං අනුසංයායිත්වා කුසාවතිං රාජධානිං පච්චාගන්ත්වා පාතරාසමකාසි. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං අස්සරතනං පාතුරහොසි.

14. පුනචපරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස මණිරතනං පාතුරහොසි. සො අහොසි මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො.

---

ආකාශචාරිවූ වලාහකනම් අශ්වරාජයාවූ අශ්වරත්නයක් පහළවූයේය ඒ දැක මහාසුදර්ශනරජහුගේ සිත පැහැදුනේය. පින්වත්නි, ඒකාන්තයෙන් ඉදින් අශ්වයානාව දමනයවූයේනම් ඉතා යහපත්වන්නේය කියායි. ආනන්දය, ඉක්බිත්තෙන් බොහෝකලක් යහපත්වදමනයකරණ ලද්දාවූ උතුම් ආජානීය සෛන්ධවයෙක් යම්සේද එපරිද්දෙන්ම ඒ අශ්වරත්නය තෙමේම සුශික්ෂිතවූයේය. ආනන්දය, පෙරවූ කාරණයක් කියමි. මහාසුදර්ශනරජතෙමේ ඒ අශ්වරත්නය විමසනුයේ පෙරවරුකාලයෙහි අසුපිටට නැගී සමුද්‍රය කෙළවරකොටඇති මුළු පොළොව ධාවනයකරවා කුසාවතී රාජධානියට පෙරළා අවුත් පෙරවරු බත නිමවූයේය. එම්බා ආනන්දය, මහාසුදර්ශනරජහට මෙබඳු අශ්වරත්නය පහළවූයේය.

14. තවද අනිකක් කියමි. ආනන්දය ඒ මහාසුදර්ශනරජහට මාණික්‍යරත්නයක් පහළවූයේය. ඒ මාණික්‍යරත්නය වෛරෛමිණි මුවාවිය. ඉතා සුන්දරවූයේය. ජාතිසම්පන්නවූයේය. අටැස්වූයේය. මනාකොට ඔප්නගනලද්දේය. නිර්මලවූයේය. විශේෂයෙන් ප්‍රසන්නවූයේය.

සබ්බාකාරසම්පන්නො. තස්ස ඛො පනානන්ද මණිරතනස්ස ආභා සමන්තා යොජනං ඵුටා අහොසි. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො තමෙව මණිරතනං වීමංසමානො චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා මණිං ධජග්ගං ආරොපෙත්වා රත්තන්ධකාරතිමිසායං පායාසි. යෙ ඛො පනානන්ද සමන්තා ගාමා අහෙසුං තෙ තෙනොභාසෙන කම්මන්තෙ පයොජෙසුං දිවාති මඤ්ඤමානා. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං මණිරතනං පාතුරහොසි.

15. පුනචපරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස ඉත්ථිරතනං පාතුරහොසි, අභිරූපා දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා නාතිදීඝා නාතිරස්සා.

---

සර්වාකාරයෙන් සම්පූර්ණවූයේය. ආනන්දය ඒ මාණික්‍යරත්නයාගේ ප්‍රභාතොමෝ හාත්පසින් යොදුනක්තැන පැතිරසිටියාය. ආනන්දය පෙරවූ කාරණයක්අසව. මහාසුදර්ශනරජතෙම ඒ මාණික්‍යරත්නය විමසනුයේ සිව්රඟසෙන් සරහා ඒ මාණික්‍යරත්නය ධජාග්‍රයට නංවා චක්ෂුරින්ද්‍රිය අඳුරුකරන්නාවූ ඝන කලුවරරාත්‍රියෙහි නුවර ප්‍රදක්ෂිණා කෙරේ. ආනන්දය ඒ කුසාවතීපුරියට හාත්පසින් යොදුනක් පමණ තැන යම්පමණ ගම්වූවාහුද ඒ ගම්වාසි මනුෂ්‍යයෝ ඒ මාණික්‍යාලොකයෙන් දවලැයි සිතන්නාහු කර්මාන්තයන් ආරම්භකලාහුය. ආනන්දය මහාසුදර්ශන රජහට මෙබඳු මහිමඇති මිණිරුවන පහළවූයේය.

15. නැවතද අනිකක් කියමි. ආනන්දය මහාසුදර්ශන රජහට ස්ත්‍රීරත්නයක් පහළවූයේය. කෙබඳුදයත්? මනා රූ ඇත්තිය. දක්නුම්කටයුත්තීය. ප්‍රසාද එලවන්නීය. උත්තම වර්ණ සෞන්දර්යයෙන් සමන්විතවූ දෙහඇත්තිය. ඉතා උස්නොවිය, ඉතා මිටිද නොවීය

නාතිකිසා නාතිථූලා නාතිකාළී නාච්චොදාතා අතික්කන්තා මානුසං වණ්ණං අප්පත්තා දිබ්බං වණ්ණං. තස්සා ඛො පනානන්ද ඉත්ථිරතනස්ස එවරූපො කායසම්ඵස්සො හොති සෙය්‍යථාපිනාම තූලපිචුනො වා කප්පාසපිචුනො වා තස්සා ඛො පනානන්ද ඉත්ථිරතනස්ස සීතෙ උණ්හානි ගත්තානි හොන්ති. උණ්හෙ සීතානි. තස්සා ඛො පනානන්ද ඉත්ථිරතනස්ස කායතො චන්දනගන්ධො වායති. මුඛතො උප්පලගන්ධො. තං ඛො පනානන්ද ඉත්ථිරතනං රඤ්ඤො මහාසුදස්සනස්ස පුබ්බුට්ඨායිනී අහොසි පච්ඡා නිපාතිනී කිංකාර පටිස්සාවිනී මනාපචාරිනී. පියවාදිනී. තං ඛො පනානන්ද. රාජානං මහාසුදස්සනං මනසාපි නෙව අතිචාරි කුතො පන කායෙන. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං ඉත්ථිරතනං පාතුරහොසි.

16. පුනචපරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස ගහපතිරතනං පාතුරහොසි තස්ස කම්මවිපාකජං දිබ්බ චක්ඛුං පාතුරහොසි.

---

ඉතා කෘශද ස්ථූලද කළුද නොවීය. ඉතා එළලුද නොවීය. මිනිස්රූපය ඉක්මුණාවූ දිව්‍යාත්මභාවයට නොපැමිණියාවූ දෙවඟනක්හා සමානවූවාය. එම්බා ආනන්දය ඒ ස්ත්‍රීරත්නයාගේ මෙබඳුවූ ශරීර ස්පර්ශයක් වේ. ඉඹුල්පුළුනේ හෝ කපුපුළුනේ හෝ යම්බඳු පහසක් ඇත්තේද එබඳු පහස් ඇත්තීය. ආනන්දය සීතකාලයේ ඒ ස්ත්‍රීරත්නයාගේ උණුසුම් ගාත්‍රා ඇතිවෙත්. උෂ්ණකාලයෙහි සිහිල්වූ ගාත්‍රා ඇතිවෙත්. එම්බා ආනන්දය ඒ ස්ත්‍රීරත්නයාගේ ශරීරයෙන් සඳුන්සුවඳ වහනය වෙයි. මුඛයෙන් මහනෙල්මල් සුවඳ වහනය වෙයි. එම්බා ආනන්දය ඒ ස්ත්‍රීරත්නය වනාහි මහාසුදර්ශනරජහට පළමුකොටම නැගිසිටින්නියක් වූවාය. පසුව සැතපෙන්නීය. දාසස්ත්‍රියක් මෙන් හැසිරෙන්නිය. රජහට ප්‍රියමනාපව හැසිරෙන්නිය. ප්‍රිය තෙපුල් කියන්නිය. ඒ ස්ත්‍රීරත්නය වනාහි මහාසුදර්ශන රජහු සිතින්පවා ඉක්මවා නොහැසිරෙන්නිය. ශරීරයෙන් හෙවත් ශරීර ස්පර්ශයෙන් කියනුම කවරිද ? එම්බා ආනන්දය මහාසුදර්ශන රජහට මෙබඳුවූ ස්ත්‍රීරත්නය පහළවූයේය.

16 නැවතද අනිකක් කියමි. එම්බා ආනන්දය මහාසුදර්ශන රජහට ගෘහපතිරත්නයක් පළවූයේය. ඒ ගෘහපතිරත්නයාගේ කුසල කර්මවිපාකයෙන් දිවැස පළවූයේය.

යෙන නිධිං පස්සති සස්සාමිකම්පි අස්සාමිකම්පි. සො රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහ. අප්පොස්සුක්කො ත්වං දෙව හොහි. අහංතෙ ධනෙන ධනකරණීයං කරිස්සාමීති. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො තමෙව ගහපතිරතනං වීමංසමානො නාවං අභිරූහිත්වා මජ්ඣෙගඞ්ගාය නදියා සොතං ඔගාහෙත්වා ගහපතිරතනං එතදවොච. අත්ථො මෙ ගහපති හිරඤ්ඤසුවණ්ණෙනාති. තෙනහිමහාරාජ එකං වා තීරං නාවං උපෙතූති. ඉධෙව මෙ ගහපති අත්ථො හිරඤ්ඤ සුවණ්ණෙනාති, අථඛො තං ආනන්ද ගහපතිරතනං උභොහි හත්ථෙහි උදකං ඔමසිත්වා පූරං හිරඤ්ඤසුවණ්ණස්ස නිධිකුම්භිං උද්ධරිත්වා රාජානං මහාසුදස්සනං එතදවොච. අලමෙත්තාවතා මහාරාජ කතමෙත්තාවතා මහාරාජාති. රාජා මහාසුදස්සනො එවමාහ. අලමෙත්තාවතා ගහපති, කතමෙත්තාවතා ගහපති, පූජිතං එත්තාවතා ගහපතීති. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං ගහපතිරතනං පාතුරහොසි.

---

යමකින් ස්වාමින් සහිතවූද ස්වාමින් රහිතවූද නිධානය දකීද එබඳු දිවැසයි. ඒ ගෘහපතිරත්නයතෙම මහාසුදර්ශන රජුවෙකට එළඹ මෙසේ කීයේය. දෙවයන්වහන්ස නුඹ වහන්සේ මන්දොත්සාහි වූවමැනව. මම නුඹ වහන්සේගේ ධනයෙන් වුවමනාකටයුතු කරන්නෙමියි ධනයෙන් පැවරිය. ආනන්දය පෙරපැවති කාරණයක්කියමි. මහාසුදර්ශන රජතෙම ඒ ගෘහපතිරත්නය විමසනුයේ නැවකට නැගී ගඞ්ගානම්නදිය මධ්‍යයෙහි ජලශ්‍රොතසට වැදසිට ගෘහපති රත්නයට මෙසේ කීයේය. එම්බා ගෘහපතිය මට හිරණ්‍යසුවර්ණයෙන් ප්‍රයොජන ඇත්තේයයනුයි. මහරජ්ජුරුවෙනි එසේහෙනම් එක් තීරයක්කටනැව පමුණුවනුමැනවයිකීයේය. ගෘහපතිය මට මෙහිදීම රන්රුවනින් ප්‍රයොජන ඇත්තේය. ආනන්දය, ඉක්බිත්තෙන් ඒගෘහපතිරත්නයතෙම දෙඅතින් දියතාගා රන්රුවනින් පිරිසිටි නිධිකුම්භියක් ඔසවා මහාසුදර්ශන රජහට මෙසේකීයේය. මහරජ්ජුරුවන්වහන්ස මෙපමණකින් ප්‍රමාණය, මහරජ්ජුරුවන්වහන්ස මෙපමණකින් නුඹවහන්සේගේ කටයුතුකරණලද්දේයයනුයි, මහාසුදර්ශනරජතෙම මෙසේකීයේය, ගෘහපතිය මෙපමණකින් ප්‍රමාණය. ගෘහපතිය මෙපමණකින් කටයුතුකරණලද්දේය, ගෘහපතිය මෙපමණකින් පුදන ලද්දේයයිකීයේය, එම්බා ආනන්දය මහාසුදර්ශන රජහට මෙබඳු ගෘහපති රත්නය පහළවූයේය,

17. පුනචපරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස පරිනායකරතනං පාතුරහොසි, පණ්ඩිතො වියත්තො මෙධාවී පටිබලො රාජානං මහාසුදස්සනං උපයාපෙතබ්බං උපයාපෙතුං අපයාපෙතබ්බං අපයාපෙතුං ඨපෙතබ්බං ඨපෙතුං. සො රාජානං මහාසුදස්සනං උපසංකමිත්වා එවමාහ. අප්පොස්සුක්කො ත්වං දෙව හොහි, අහමනුසාසිස්සාමීති. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං පරිනායකරතනං පාතුරහොසි. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමෙහි සත්තහි රතනෙහි සමන්නාගතො අහොසි.

18. පුනචපරං ආනන්ද රාජා මහාසුදස්සනො චතූහි ඉද්ධීහි සමන්නාගතො අහොසි. කතමෙහි චතූහි ඉද්ධීහි. ඉධ ආනන්ද රාජා මහාසුදස්සනො අභිරූපො අහොසි දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි.

---

17. නැවතද අනිකක් කියමි. එම්බා ආනන්දය මහාසුදර්ශන රජහට පරිනායකරත්නයක් පහළවූයේය. හෙතෙම පණ්ඩිතවූයේය. කිම් බිණීම් ආදියෙහි දක්ෂවූයේය. ප්‍රඥාවන්තවූයේය. මහාසුදර්ශන රජ්ජුරුවන් සමීපයෙහි විසීමට ලංකටයුත්තන් ලංකිරීමටද පහකටයුත්තන් පහකිරීමටද තනතුරු ආදියෙහි ව්‍යක්තයන් ඒ ඒ තනතුරෙහි තැබීමටද සමර්ථවූ ඥාණයක් ඇත්තේය. හෙතෙම මහාසුදර්ශන රජ්ජුරුවන් කරා එළඹ මෙසේ කියේය. දේවයන් වහන්ස නුඹ වහන්සේ මන්දෝත්සාහි වුවමැනව. මම අනුශාසනා කරන්නෙමි කියේය. එම්බා ආනන්දය මහාසුදර්ශන රජහට මෙබඳුවූ පරිනායකරත්නය පහළවූයේය. එම්බා ආනන්දය සුදර්ශන මහරජ තෙමේ මේ සම්විධරත්නයෙන් සමන්විතවූයේය.

18. නැවතද අනිකක් නම් එම්බා ආනන්දය මහාසුදර්ශනරජ තෙමේ සතර ඍද්ධියකින් සමන්විතවූයේය. කවර නම් සතර ඍද්ධියකින්දයත්, එම්බා ආනන්දය මේ මනුෂ්‍යාත්භාවයෙහි සුදර්ශන මහරජතෙම සෙසු මනුෂ්‍යයන්ට වඩාමනාවූ රූපසොභා ඇති දර්ශනීයවූ ප්‍රසාදවහවූ, උතුම්වර්ණ සම්පත්තින් සමන්විතවූයේය.

රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාය ඉද්ධියා සමන්නාගතො අහොසි

19. පුනචපරං ආනන්ද රාජා මහාසුදස්සනො දීඝායුකො අහොසි චිරට්ඨිතිකො අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාය දුතියාය ඉද්ධියා සමන්නාගතො අහොසි.

20. පුනචපරං ආනන්ද රාජා මහාසුදස්සනො අප්පාබාධො අහොසි අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාය තතියාය ඉද්ධියා සමන්නාගතො අහොසි.

21. පුනචපරං ආනන්ද රාජා මහාසුදස්සනො බ්‍රාහ්මණ ගහපතිකානං පියො අහොසි මනාපො. සෙය්‍යථාපි ආනන්ද පිතා පුත්තානං පියො හොති මනාපො. එවමෙවඛො ආනන්ද රාජා මහාසුදස්සනො බ්‍රාහ්මණගහපතිකානං පියො අහොසි මනාපො.

---

එම්බා ආනන්දය සුදර්ශන මහරජතෙම අතිශයින්ම මේ පළමුවෙනි සෘද්ධියෙන් සමන්විත වූයේය.

19. එම්බා ආනන්දය නැවතද අනිකක් නම් සුදර්ශන මහරජතෙම දීර්ඝායුෂකවූ සෙසුමනුෂ්‍යයන්ට වඩාබොහෝකාලක් ජීවත්වසිටින්නෙක්විය. එම්බා ආනන්දය සුදර්ශන මහරජතෙම අතිශයින්ම මේ දෙවෙනි සෘද්ධියෙන් සමන්විත වූයේය.

20. ආනන්දය නැවතද අනිකක් නම්. මහාසුදර්ශනරජතෙමේ සවල්පවූ ආබාධා අත්තේවෙයි. සවල්ප රොග ඇත්තේවෙයි. ඉතා සීත නොවූ උෂ්ණනොවූ අන්මිනිසුන්ගේ උදරයටවඩා සම්විපාකදායකවූ උදරයෙන් යුක්තවේ. ආනන්දය මහා සුදර්ශන රජතෙම මේ තුන්වෙනි සෘද්ධියෙන් සමන්විතවේ.

21. එම්බා ආනන්දය නැවත අනිකක්නම් සුදර්ශන මහරජතෙම බ්‍රාහ්මණ ගෘහපතීන්ට ප්‍රියවූයේය මනාපවූයේය. එම්බා ආනන්දය යම්සේ පුත්‍රයන්ට පියතෙම ප්‍රියවේද මනාපවේද එපරිද්දෙන්ම ආනන්දය සුදර්ශන මහරජතෙම බ්‍රාහ්මණ ගෘහපතීන්ට ප්‍රියවූයේය. මනාපවූයේය.

රඤ්ඤොපි ආනන්ද මහාසුදස්සනස්ස බ්‍රාහ්මණගහපතිකා පියා අහෙසුං මනාපා. සෙය්‍යථාපි ආනන්ද පිතු පුත්තා පියා හොන්ති මනාපා. එවමෙව ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස බ්‍රාහ්මණගහපතිකා පියා අහෙසුං මනාපා. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො චතුරඞ්ගිනියා සෙනාය උය්‍යානභූමිං නිය්‍යාසි. අථඛො ආනන්ද බ්‍රාහ්මණගහපතිකා රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු. අතරමානො දෙව යාහි යථා තං මයං චිරතරං පස්සෙය්‍යාමාති. රාජාපි ආනන්ද මහාසුදස්සනො සාරථිං ආමන්තෙසි. අතරමානො සාරථි රථං පෙසෙහි යථාහං බ්‍රාහ්මණගහපතිකෙ චිරතරං පස්සෙය්‍යන්ති. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාය චතුත්ථාය ඉද්ධියා සමන්නාගතො අහොසි. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාහි චතූහි ඉද්ධීහි සමන්නාගතො අහොසි.

---

එම්බා ආනන්දය, සුදර්ශන මහරජ්ජුරුවන්ටද බ්‍රාහ්මණ ගෘහපතීහු ප්‍රියවූවාහුය. මනාපවූවාහුය, එම්බා ආනන්දය. යම්සේ පිතෘහට පුත්‍රයෝ ප්‍රියවෙද්ද මනාප වෙද්ද එපරිද්දෙන්ම ආනන්දය සුදර්ශන මහරජහට බ්‍රාහ්මණ ගෘහපතීහු ප්‍රියවූවාහුය. මනාපවූවාහුය. එම්බා ආනන්දය. පෙර වෙබන්දක්වූයේය, සුදර්ශන මහරජතෙම සිව්රඟ සෙනඟ සමඟ උද්‍යාන භූමියට ගියේය, ආනන්දය ඉක්බිත්තෙන් බ්‍රාහ්මණ ගෘහපතීහු සුදර්ශන මහරජ්ජුරුවන් සමීපයට එළඹ මෙසේ කිඩාහුය දෙවයන්වහන්ස තුඹවහන්සේ අපි යම්පරිද්දෙකින් ඉතා බොහොකාලයක් දක්නෙමිද. එපරිද්දෙන් යුහුසුලු නොවමින් සාතාවෙන් වැඩිය මැනවයි කිවාහුය. එම්බා ආනන්දය සුදර්ශන මහරජතෙමේද රථාචාර්‍ය්‍යයා ආමන්ත්‍රණය කොළේය, එම්බල රථාචාර්‍ය්‍යය ඉක්මන් නොව යාමපිණිස රථය හරුව, බ්‍රාහ්මණ ගෘහපතීන් මම යම් පරිද්දෙකින් ඉතා බොහෝ කාලයක් දක්නෙම්දැයි කීයේය. එම්බා ආනන්දය සුදර්ශන මහරජ තෙම මේ සතරවෙනිවූ සෘද්ධියෙන් සමන්විතවූයේය. එම්බා ආනන්දය මහාසුදර්ශන රජතෙම මේ සතර සෘද්ධියෙන් සමන්විත විය.

22. අථඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි. යන්නූනාහං ඉමාසු තාලන්තරිකාසු ධනුසතෙ ධනුසතෙ පොක්ඛරණියො මාපෙය්‍යන්ති. මාපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තාසු තාලන්තරිකාසු ධනුසතෙ ධනුසතෙ පොක්ඛරණියො. තාඛො පනානන්ද පොක්ඛරණියො චතුන්නං වණ්ණානං ඉට්ඨකාහි චිතා අහෙසුං එකා ඉට්ඨකා සුවණ්ණමයා එකා රූපිමයා එකා වෙළුරියමයා එකා ඵලිකමයා, තාසුඛො පනානන්ද පොක්ඛරණීසු චත්තාරි චත්තාරි සොපාණානි අහෙසුං චතුන්නං වණ්ණානං. එකං සොපාණං සොවණ්ණමයං එකං රූපිමයං එකං වෙළුරියමයං එකං ඵලිකමයං. සොවණ්ණමයස්ස සොපාණස්ස සොවණ්ණමයා ථම්භා අහෙසුං රූපිමයා සූචියොච උණ්හීසඤ්ච. රූපිමයස්ස සොපාණස්ස රූපිමයා ථම්භා අහෙසුං. සොවණ්ණමයා සූචියොච උණ්හීසඤ්ච. වෙළුරියමයස්ස සොපාණස්ස වෙළුරියමයා ථම්භා අහෙසුං ඵලිකමයා සූචියොච උණ්හීසඤ්ච. ඵලිකමයස්ස සොපාණස්ස ඵලිකමයා ථම්භා අහෙසුං.

22. ආනන්දය ඉක්බිත්තෙන් ඒ මහාසුදර්ශනරජහට මෙබඳු සිතිවිල්ලෙක් වූයේය. මම මේ තාලපන්තීන් අතුරෙහි දුනු සියයකින් දුනු සියයකින් ඔබ්බෙහි පොකුණු මවන්නෙම්නම් ඉතා යෙහෙකැයි කියායි. ආනන්දය මහාසුදර්ශනරජතෙම ඒ තාලපන්තීන් අතුරෙහි දුනු සියයකින් දුනු සියයකින් ඔබ්බෙහි පොකුණු නිර්මිතකළේය. ආනන්දය ඒ පොකුණු චතුර්වර්ණයන් සම්බන්ධවූ ගඩොලින් වටකරණලද්දෝ වූහ. එක් ගඩොලක් රුවන්මයවූවාය. එකක් රිදීමුවාවිය. එකක් වෛරෝඩිමිණිමුවාවිය. එකක් පිළිමිණිමුවාවිය. ආනන්දය ඒ පොකුණුවල චතුර්වර්ණයන් සම්බන්ධවූ ඉණිපෙති සතරසතර වූවාහුය. එක් ඉණිකක් ස්වර්ණමයවූයේය. එකක් රිදීමයවූයේය. එකක් වෛරෝඩිමිණිමය වූයේය. එකක් පිළිමිණිමය වූයේය. ස්වර්ණමයවූ සොපාණයාගේ ස්වර්ණමය ටැම්වූවාහුය. රිදීමය පියගැට හා හිණිහිසය වූයේය. රිදීමය සොපාණයාගේ රිදීමයවූ ටැම් වූවාහුය. ස්වර්ණමයවූ පියගැට හා හිණිහිසය වූයේය. වෛරෝඩිමිණිමයවූ සොපාණයාගේ වෛරෝඩිමිණිමය ටැම්වූවාහුය. ඵලිකමයවූ පියගැට හා හිණිහිස වූයේය. ඵලිකමයවූ සොපාණයාගේ ඵලිකමයවූ ටැම් වූවාහුය.

වෙළුරියමයා. සූචියො ච උණ්හීසඤ්ච. තාසු ඛො පනානන්ද පොක්ඛරණියො ද්වීහි වෙදිකාහි පරික්ඛිත්තා අහෙසුං. එකා වෙදිකා සොවණ්ණමයා එකා රූපිමයා. සොවණ්ණමයාය වෙදිකාය සොවණ්ණමයා ථම්භා අහෙසුං රූපිමයා සූචියො ච උණ්හීසඤ්ච. රූපිමයාය වෙදිකාය රූපිමයා ථම්භා අහෙසුං සොවණ්ණමයා සූචියො ච උණ්හීසඤ්ච.

23. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි. යන්නූනාහං ඉමාසු පොක්ඛරණීසු එවරූපං මාලං රොපාපෙය්‍යං උප්පලං පදුමං කුමුදං පුණ්ඩරීකං සබ්බොතුකං සබ්බජනස්ස අනාවටන්ති. රොපාපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තාසු පොක්ඛරණීසු එවරූපං මාලං උප්පලං පදුමං කුමුදං පුණ්ඩරීකං සබ්බොතුකං සබ්බජනස්ස අනාවටං. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි, යන්නූනාහං ඉමාසං පොක්ඛරණීනං තීරෙ නහාපකෙ පුරිසෙ ඨපෙය්‍යං යෙ ආගතාගතං ජනං නහාපෙස්සන්තීති.

---

වෙරළුමිණිමයවූ පියගැට හා හිණිගිසවූයේය. එම්බා ආනන්දය ඒ පුෂ්කරණීහුවනාහි වෙදිකාදෙකකින් පරික්ෂෙපවූවාහුය. එක්වෙදිකාවෙක් ස්වර්ණමය වූයේය. එකක් රිදීමයවූයේය. රන්මුවාවෙදිකාවෙහි රුවන්මය ටැම්වූවාහුයි, ස්වර්ණමයවූ පියගැට හා හිණිගිසය වූයේය.

23. ආනන්දය, ඉක්බිත්තෙන් ඒ මහාසුදස්සන රජහට මෙසේවූ සිතිවිල්ලෙක් වූයේය. මම මේ පොකුණුවල මෙබඳුවූ මල්රොපනය කරවූයෙම්නම් ඉතා යෙහෙකැයි සිතුයේය. ඒනම්, නිල්මහනෙල්ය පියුම්ය කුමුදුය හෙලපියුම්ය යන මේයි, සියලු සෘතුවට මල්පිපීම් ඇත්තේය. සියලු ජනයාට ආවරණනැත්තේය කියායි. එම්බා ආනන්දය, මහාසුදර්ශන රජතෙම ඒ පොකුණුවල මෙබඳුවූ මල් රොපනය කරවූයේය. නිල්මහනෙල්ය පියුම්ය කුමුදුය හෙලපියුම්ය සියලු සෘතුවට මල්පිපෙන සුලුය. සියලුජනයාට ආවරණයනැතිසේ අණ කෙළේය. ආනන්දය, ඉක්බිත්තෙන් මහාසුදර්ශනරජහට මෙබඳු සිතිවිල්ලෙක් වූයේය. මම මේ පොකුණුතීරයෙහි යම් කෙනෙක් පැමිණි පැමිණි ජනයන් නහවන්නාහුද. එබඳුවූ නහාපක පුරුෂයන් මවන්නෙම්නම් ඉතායෙහෙකැයි යන මේ සිතයි.

ඨපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තාසං පොක්ඛරණීනං තීරෙ නහාපකෙ පුරිසෙ යෙ ආගතාගතං ජනං නහාපෙස්සුං. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි, යන්නූනාහං ඉමාසං පොක්ඛරණීනං එවරූපං දානං පට්ඨපෙය්‍යං අන්නං අන්නත්ථිකස්ස පානං පානත්ථිකස්ස වත්ථං වත්ථත්ථිකස්ස යානං යානත්ථිකස්ස සයනං සයනත්ථිකස්ස ඉත්ථිං ඉත්ථත්ථිකස්ස හිරඤ්ඤං හිරඤ්ඤත්ථිකස්ස සුවණ්ණං සුවණ්ණත්ථිකස්සාති. පට්ඨපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තාසං පොක්ඛරණීනං තීරෙ එවරූපං දානං අන්නං අන්නත්ථිකස්ස පානං පානත්ථිකස්ස වත්ථං වත්ථත්ථිකස්ස යානං යානත්ථිකස්ස සයනං සයනත්ථිකස්ස ඉත්ථිං ඉත්ථත්ථිකස්ස හිරඤ්ඤං හිරඤ්ඤත්ථිකස්ස සුවණ්ණං සුවණ්ණත්ථිකස්සාති.

24. අථ ඛො ආනන්ද බ්‍රාහ්මණගහපතිකා පහූතං සාපතෙය්‍යං ආදාය රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු.

---

ආනන්දය, ඒ මහාසුදර්ශනරජතෙම ඒ පුෂ්කරණීතීරයෙහි යම් කෙනෙක් පැමිණි පැමිණි පුරුෂයන් නහවන්නාහුද එබඳුවූ නාවන පුරුෂයන් තැබ්බවූයේය. තවද ආනන්දය, මහාසුදර්ශනරජහට මෙසේවූ සිතිවිල්ලෙක් වූයේය. මම මේ පොකුණුතීරයෙහි ආහාර කැමැත්තාහට ආහාරයද පානයකැමැත්තාහට පානවර්ගයද වස්ත්‍ර කැමැත්තාහට වස්ත්‍රද යානා කැමැත්තාහට යානාවන්ද සැතපෙන්ට නිසිවූ සයන කැමැත්තාහට සයනාසනද ස්ත්‍රීන් කැමැත්තාහට ස්ත්‍රීන්ද අමුරන් කැමැත්තාහට අමුරන්ද රත්රන් කැමැත්තාහට රත්රන්ද යන මෙබඳුවූ දානයක් තැබ්බවූයෙම්නම් ඉතා යෙහෙකැයි කියාසී. ආනන්දය, මහාසුදර්ශනරජතෙම ඒ පොකුණුතීරයෙහි ආහාර කැමැත්තාහට ආහරද පානය කැමැත්තාහට පානවර්ගද වස්ත්‍ර කැමැත්තාහට වස්ත්‍රද යානාකැමැත්තාහට යානාද සයන කැමැත්තාහට සයනාද ස්ත්‍රීන් කැමැත්තාහට ස්ත්‍රීන්ද අමුරන්කැමැත්තාහට අමුරන්ද රත්රන් කැමැත්තාහට රත්රන්ද තැබ්බවූයේය.

24. ආනන්දය, ඉක්බිත්තෙන් බමුණුගැහැවියෝ බොහෝ වස්තුවගෙණ මහාසුදර්ශනරජු වෙතට එළඹ මෙසේ කීහ.

ඉදං දෙව පහූතං සාපතෙය්‍යං දෙවඤ්ඤෙව උද්දිස්ස ආභතං තං දෙවො පටිග්ගණ්හාතු. අලං භො මමපි පහූතං සාපතෙය්‍යං ධම්මිකෙන බලිනා අභිසඞ්ඛතං තං වො හොතු. ඉතොච භිය්‍යො හරථාති, තෙ රඤ්ඤා පටික්ඛිත්තා එකමන්තං අපක්කම්ම එවං සමචින්තෙසුං. නඛො එතං අම්හාකං, පතිරූපං යං මයං ඉමානි සාපතෙය්‍යානි පුනදෙව සකානි ඝරානි පටිහරාම, යන්නූන මයං රඤ්ඤො මහාසුදස්සනස්ස නිවෙසනං මාපෙය්‍යාමාති, තෙ රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු, නිවෙසනන්තෙ දෙව මාපෙස්සාමාති. අධිවාසෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තුණ්හීභාවෙන.

25. අථ ඛො ආනන්ද සක්කො දෙවානමින්දො රඤ්ඤො මහාසුදස්සනස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය විස්සකම්මං දෙවපුත්තං ආමන්තෙසි.

---

දේවයන්වහන්ස, බොහෝවූ මේ වස්තුව නරදෙවොත්තමයානන් උදෙසාම ගෙණඑන ලද්දේය. මේ වස්තුව දෙවයන්වහන්සේ පිළිගන්නාසේක්වාසියායි. පින්වත්නි, ඒ නොකැමැත්තෙමි. මාගේ ධාර්මික බලියෙන් රැස්කරණලද්දාවූ මේ බොහෝ වස්තුවද ඇත්තේය. ඒ වස්තුව තොපට වේවා. මෙයින්ද බොහෝවූ වස්තුව ගෙණයව්. කියා රජහුවිසින් ප්‍රතික්ෂෙපකරණලද්දාවූ ඒ මනුෂ්‍යයෝ එතනින් පහව එකත්පසෙක සිට මෙසේ සිතුවාහුමය. යම්බඳුවූ අපි මේ වස්තුව නැවතද ස්වකීය ගෘහවලට ගෙණයන්නමෝනම් මේකාරණය අපට සුදුසු නොවන්නේමය. අපි මහාසුදර්ශන රජහට විසීම පිණිස ගෙයක් කලමෝනම් යෙහෙකැයි කියායි. ඒ මනුෂ්‍යයෝ මහාසුදර්ශන රජ්ජුරුවන්කරා එළඹ මෙසේ කිවාහුය. දේවයන් වහන්ස, අපි නුඹවහන්සේට ගෘහයක් කරම්හයි කීවාහුය. ආනන්දය, මහාසුදර්ශනරජතෙම ඒකාරණය තුෂ්ණීම් භාවයෙන් ඉවසූයේමය.

25. තවද ආනන්දය, සක්දෙවිඳුතෙමේ මහාසුදර්ශනරජහුගේ සිතපිළිබඳ හාත්පස විතර්කය තමාගේ සිතින් දැනගෙණ විස්කම් දෙව්පුත්හු ඇමතුයේය.

එහි ත්වං. මම විස්සකම්ම රඤ්ඤො මහාසුදස්සනස්ස නිවෙසනං මාපෙහි ධම්මිකං නාම පාසාදන්ති. එවං භද්දන්තෙති ඛො ආනන්ද විස්සකම්මො දෙවපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය. එවමෙවං දෙවෙසු තාවතිංසෙසු අන්තරහිතො රඤ්ඤො මහාසුදස්සනස්ස පුරතො පාතුරහොසි. අථ ඛො ආනන්ද විස්සකම්මො දෙවපුත්තො රඤ්ඤො මහාසුදස්සනස්ස එතදවොච. නිවෙසනන්තෙ දෙව මාපෙස්සාමිති ධම්මං නාම පාසාදන්ති. අධිවාසෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තුණ්හීභාවෙන මාපෙසි ඛො ආනන්ද විස්සකම්මො දෙවපුත්තො. රඤ්ඤො මහාසුදස්සනස්ස නිවෙසනං ධම්මං නාම පාසාදං.

26. ධම්මො ආනන්ද පාසාදො පුරත්ථිමෙනච පච්ඡිමෙනච යොජනං ආයාමෙන අහොසි. උත්තරෙනච දක්ඛිණෙනච අඩ්ඪයොජනං විත්ථාරෙන.

---

යහලු විශ්වකර්මය, මෙහි එව. තෝ මාගේ මහාසුදසුන් රජහට විසිමට ධම්මිකප්‍රාසාදනම්වූ ගෙයක් මවවයි කීයේය. ආනන්දය, ඒ විස්කම්දෙව්පුත්තෙමේ ස්වාමීන්වහන්ස, ඒ මැනවැයි සක්දෙව්දුහට පිළිවදන්දී යම්සේ බලවත් පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගහරින්නේ හෝ දිගහරිනලද අතක් හකුළුවන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම තව්තිසාවැසි දෙවියන් විසයෙහි අතුරුදහන්වූයේ මහාසුදර්ශනරජහුගේ ඉදිරියෙහි පහළවූයේය. ආනන්දය, ඉක්බිත්තෙන් විශ්වකර්මදිව්‍යපුත්‍රතෙම මහාසුදර්ශනරජහට මෙසේ කීයේය. දේවයන්වහන්ස, තුබවහන්සේට ධර්මප්‍රාසාදනම්වූ නිවෙසනයක් මවන්නෙමි යනුයි. ආනන්දය, ඒ මහාසුදර්ශනරජතෙම නිශ්ශබ්දභාවයෙන් ඉවසූයේමය. ආනන්දය, විශ්වකර්මදිව්‍යපුත්‍රතෙම මහාසුදර්ශනරජහට ධර්මප්‍රාසාදනම්වූ ගෘහයක් මැවූයේමය.

26. ආනන්දය, ධර්මප්‍රාසාද පූර්වදිශාභාගයෙහි පටන් පශ්චිම දිශාභාගයට දිගින් යොදුනක් පමණ වූයේය. උත්තරදිශාභාගයෙහි පටන් දක්ෂිණදිශාභාගයට පුලුලින් අඩයොදුනක් පමණ වූයේය.

ධම්මස්ස ආනන්ද පාසාදස්ස තිපොරිසං උච්චත්තනෙන වත්ථුං චිතං අහොසි චතුන්නං වණ්ණානං ඉට්ඨකාහි. එකා ඉට්ඨකා සොවණ්ණමයා එකා රූපිමයා. එකා වෙළුරියමයා. එකා ඵලිකමයා. ධම්මස්ස ආනන්ද පාසාදස්ස චතුරාසීති ථම්භසහස්සානි. අහෙසුං චතුන්නංවණ්ණානං.එකො ථම්භො සොවණ්ණමයො. එකො රූපිමයො, එකො වෙළුරියමයො, එකො ඵලිකමයො. ධම්මෙ ආනන්ද පාසාදෙ චතුන්නං වණ්ණානං ඵලකෙහි සන්ථතො අහොසි එකං ඵලකං සොවණ්ණමයං එකං රූපිමයං එකං වෙළුරියමයං එකං ඵලිකමයං. ධම්මස්ස ආනන්ද පාසාදස්ස චතුවීසති සොපාණානි අහෙසුං චතුන්නං වණ්ණානං. එකං සොපාණං සොවණ්ණමයං එකං රූපිමයං එකං වෙළුරියමයං එකං ඵලිකමයං —පෙ— ඵලිකමයස්ස සොපාණස්ස ඵලිකමයා ථම්භා අහෙසුං වෙළුරියමයා සූචියොච උණ්හිසඤ්ච. ධම්මෙ ආනන්ද පාසාදෙ.

ආනන්දය,ධර්මප්‍රාසාදයාගේ භූමිය උසින් තුන්පුරුෂ ප්‍රමාණ වූයේය. චතුර්වර්ණයන් සම්බන්ධවූ උළින් වසනලද්දේය. එක් උළක් රුවන්මය විය. එකක් රිදීමුවාවි. එකක් වෛරූර්‍යමාණික්‍යමුවාවි. එකක් පිළිමිණිමුවාවි. ආනන්දය, ධර්මප්‍රාසාදයාගේ චතුර්වර්ණයන් සම්බන්ධවූ වැම් සුවාසූදහසක් වූවාහුය. චතුර්වර්ණයන් සම්බන්ධවූ එක් ටැඹක් ස්වර්ණමය විය. එකක් රිදීමුවාවිය. එකක් වෛරූර්‍යමාණික්‍යමුවාවිය. එකක් පිළිමිණිමුවාවිය. ආනන්දය, ධර්මප්‍රාසාදයතෙම චතුර්වර්ණයන් සම්බන්ධවූ පුවරුකඩින් අතුරණලද්දේ විය. එක් පුවරුවක් රුවන්මයවි. එකක් රිදීමයවි. එකක් වෛරූර්‍යමාණික්‍යමුවාවි. එකක් පිළිමිණිමුවාවිය. ආනන්දය, ධර්මප්‍රාසාදයාගේ චතුර්වර්ණයන් සම්බන්ධවූ හිණිපෙති සූවිස්සක් වූවාහුය. එක් හිණක් ස්වර්ණමය වූයේය. එකක් රිදීමය විය එකක් වෛරූර්‍යමාණික්‍යමුවාවිය. එකක් පිළිමිණිමුවාවිය. ආනන්දය, ධර්මප්‍රාසාදයට චතුර්වර්ණයන් සම්බන්ධවූ හිණිපෙති සූවිස්සක් වූවාහුය. පිළිමිණිමුවා සොපාණයාගේ පිළිමිණිමුවා ටැම්වූවාහුය. වෛරූර්‍යමාණික්‍යමුවා සූචින් හා හිණිහිසවිය. ආනන්දය, ධර්මප්‍රාසාදයෙහි.

චතුරාසීති කූටාගාර සහස්සානි අහෙසුං. චතුන්නං වණ්ණානං එකං කූටාගාරං සොවණ්ණමයං එකං රූපිමයං එකං වෙළුරියමයං එකං ඵලිකමයං. සොවණ්ණමයෙ කූටාගාරෙ රූපිමයො පල්ලඞ්කො පඤ්ඤත්තො අහොසි. රූපිමයෙ කූටාගාරෙ සොවණ්ණමයො පල්ලඞ්කො පඤ්ඤත්තො අහොසි. වෙළුරියමයෙ කූටාගාරෙ දන්තමයො පල්ලඞ්කො පඤ්ඤත්තො අහොසි. ඵලිකමයෙ කූටාගාරෙ මසාරගල්ලමයො පල්ලඞ්කො පඤ්ඤත්තො අහොසි. සොවණ්ණමයස්ස කූටාගාරස්ස ද්වාරෙ රූපිමයො තාලො ඨිතො අහොසි. තස්ස රූපිමයො ඛන්ධො සොවණ්ණමයානි පත්තානිච ඵලානිච. රූපිමයස්ස කූටාගාරස්ස ද්වාරෙ සොවණ්ණමයො තාලො ඨිතො අහොසි. තස්ස සොවණ්ණමයො ඛන්ධො. රූපිමයානි පත්තානිච ඵලානිච. වෙළුරියමයස්ස කූටාගාරස්ස ද්වාරෙ ඵලිකමයො තාලො ඨිතො අහොසි. තස්ස ඵලිකමයො ඛන්ධො වෙළුරියමයානි පත්තානිච ඵලානිච.

---

චතුර්වර්ණයන් සම්බන්ධවූ සුවාසූදහසක් කූටාගාර වූවාහුය. එක් කුළුගෙයක් ස්වර්ණමය වූයේය. එකක් රිදීමය වූයේය. එකක් වෛරළුමිණිමුවා විය. එකක් ඵලිකමය වූයේය. ස්වර්ණමය කූටාගාරයෙහි රිදීමයවූ පර්‍යඞ්කයක් පණවනලද්දේ විය. රිදීමය කූටාගාරයෙහි ස්වර්ණමය පර්‍යඞ්කයක් පණවනලද්දේ විය. වෛරළුමිණිමුවා කූටාගාරයෙහි දන්තමය පර්‍යඞ්කයක් පණවනලද්දේ විය. පිළිමිණිමුවා කුළුගෙහි මැසිරිගල්මුවා පර්‍යඞ්කයෙක් පණවනලද්දේ විය. ස්වර්ණමයවූ කූටාගාරයාගේ දොරටුව සමීපයෙහි රිදීමය තල්ගසෙක් පිහිටියේ විය, ඒ තාලවෘක්ෂයාගේ කඳ රිදීමය වූයේය. ස්වර්ණමයවූ පත්‍ර හා ඵල ඇතිවූහ. රජතමයවූ කූටාගාරයාගේ දොරටුව සමීපයෙහි ස්වර්ණමයවූ තල්ගසෙක් පිහිටියේ විය. ඒ තාලවෘක්ෂයාගේ කඳ ස්වර්ණමය වූයේය. රජතමයවූ ඵල හා පත්‍ර ඇතිවූහ. වෛරළුමිණිමුවා කූටාගාරයාගේ දොරටුව සමීපයෙහි පිළිමිණිමුවා තල්ගසෙක් පිහිටියේ විය. ඔහුගේ කඳ පිළිමිණිමුවා විය. වෛරළුමිණිමුවා ඵල හා පත්‍ර ඇතිවූහ.

ඵලිකමයස්ස කූටාගාරස්සවාරෙ වෙළුරියමයො තාලො ඨිතො අහොසි, තස්ස වෙළුරියමයො ඛන්ධො ඵලිකමයානි පත්තානිච ඵලානිච.

27. අථඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි. යන්නූනාහං මහාබ්‍යූහස්ස කූටාගාරස්ස වාරෙ සබ්බසොවණ්ණමයං තාලවනං මාපෙය්‍යං යත්‍ථ දිවාවිහාරං නිසීදිස්සාමිති. මාපෙසිඛො ආනන්ද රාජා මහාසුදස්සනො මහාබ්‍යූහස්ස කූටාගාරස්ස වාරෙ සබ්බසොවණ්ණමයං තාලවනං යත්‍ථ දිවාවිහාරං නිසීදති.

28. ධම්මො ආනන්ද පාසාදො ද්වීහි වෙදිකාහි පරික්ඛිත්තො අහොසි. එකාවෙදිකා සොවණ්ණමයා එකාරූපිමයා. සොවණ්ණමයාය වෙදිකාය සොවණ්ණමයා ථම්භා අහෙසුං. රූපිමයා සූචියොච උණ්හිසඤ්ච. රූපිමයාය වෙදිකාය රූපිමයා ථම්භා අහෙසුං, සොවණ්ණමයා සූචියොච උණ්හිසඤ්ච.

පිළිමිණිමුවා කූටාගාරයාගේ දොරටුව සමීපයෙහි වෙරළුමිණිමුවා තල්ගසෙක් සිටියේ විය, ඔහුගේ කඳ වෙරළුමිණිමුවාවිය, පිළිමිණිමුවා ඵල හා පත්‍ර ඇතිවූහ.

7. ආනන්දය ඉක්බිත්තෙන් මහාසුදශ්ශනරජහට මෙසේවූ සිතිවිල්ලෙක් වූයේය. මම සවියම්තැනෙත්හි දිවාවිහරණය පිණිස හිඳිම්ද එත්තන්හි මහාබ්‍යූහනම් කූටාගාරයාගේ වාරාශිමුඛයෙහි සියල්ල සවණිමයවූ තල්වනයක් නිර්මිතකලෙම්නම් ඉතායෙහෙකැයි කියාහ, ආනන්දය මහාසුදශ්ශනරජතෙම මහාබ්‍යූහනම් කූටාගාරයාගේ වාරාශිමුඛයෙහි යම්තැනෙත්හි දිවාවිහරණය පිණිස හිඳිද එතන්හි සවිරන්නමයවූ තල්වනයක් නිර්මිතකලේමය.

28, ආනන්දය ධම්ප්‍රසාදයතෙම වෙදිකාදෙකකින් පරික්ෂිප්තවිය. එක්පිළක් සවණිමයවූයේය. එකක් රිදීමය විය. සවණිමය වෙදිකාවෙහි සවණිමය ටැම් වූහ. රිදීමයවූ පියගැටහා හිණිහිස විය. රිදීමය වෙදිකාවෙහි රිදීමයවූ පියගැටහා හිණිහිස විය.

29. ධම්මො ආනන්ද පාසාදො ද්වීහි කිංකිණිකජාලෙහි පරික්ඛිත්තො අහොසි. එකං ජාලං සොවණ්ණමයං එකං රූපිමයං. සොවණ්ණමයස්ස ජාලස්ස රූපිමයා කිංකිණියො අහෙසුං. රූපිමයස්ස ජාලස්ස සොවණ්ණමයා කිංකිණියො අහෙසුං. තාසං ඛො පනානන්ද කිංකිණිකජාලානං වාතෙරිතානං සද්දො අහොසි. වග්ගු ච රජනීයො ච කමනීයො ච මදනීයො ච. සෙය්‍යථාපි ආනන්ද පඤ්චඞ්ගිකස්ස තූරියස්ස සුවිනීතස්ස සුප්පටිතාළිතස්ස කුසලෙහි සමන්නාහතස්ස සද්දො හොති වග්ගු ච රජනීයො ච කමනීයො ච මදනීයො ච. එවමෙව ඛො ආනන්ද තාසං කිංකිණිකජාලානං වාතෙරිතානං සද්දො අහොසි වග්ගු ච රජනීයො ච කමනීයො ච මදනීයො ච. යෙ ඛො පන තෙන සමයෙන කුසාවතියා රාජධානියා ධුත්තා අහෙසුං. සොණ්ඩා පිපාසා තෙ තාසං කිංකිණිකජාලානං වාතෙරිතානං සද්දෙන පරිචාරයිංසු.

29. ආනන්දය ධර්මප්‍රාසාදයතෙම කිකිණිදැල් දෙකකින් පරික්ෂිප්ත වූයේය. එක්දැලක් ස්වර්ණමය වූයේය. එකක් රිදීමය වූයේය. ස්වර්ණමයවූ ජාලයාගේ රිදීමයවූ කිංකිණික වූවාහුය. රිදීමයවූ ජාලයාගේ ස්වර්ණමයවූ කිංකිණික වූවාහුය. ආනන්දය සුලංවේගයෙන් චංචල වන්නාවූ ඒ කිංකිණිකජාලයන්ගේ මනොරම්‍යවූද සිත්අලවන්නාවූද ප්‍රීතිකරන්නාවූද මනොනන්දනීයවූද ශබ්දයක් වූයේය. ආනන්දය යම්සේ විශෙෂයෙන් හික්මුනාවූ බෙරආදිය ගැසීමෙහි දක්ෂවූ වාද්‍යකාරයන්හුවිසින් වයනලද්දවූ පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යනාදයාගේ මනොරම්‍යවූද සිත්අලවන්නාවූද ප්‍රීතිකරවූද මනොනන්දනීයවූද ශබ්දයක්වේද, එපරිද්දෙන්ම ආනන්දය වාතවේගයෙන් චඤ්චල වන්නාවූ ඒ කිංකිණිකජාලයන්ගේ මනොරම්‍යවූද සිත්අලවන්නාවූද ප්‍රීතිකරවූද මනොනන්දනීයවූද ශබ්දය වූයේය. ආනන්දය එසමයෙහි කුසාවතී රාජධානිවාසීවූ සුරාසොඬවූ පිපාසයෙන්යුක්තවූ යම්කිසි ධූර්තකෙනෙක් වූවාහුද ඒධූර්තයෝ වාතයෙන් චඤ්චලවන්නාවූ ඒ කිංකිණිකජාලයන්ගේ ශබ්දයෙන් ඉන්ද්‍රියයන් හැසිරවූහ.

30. නිඨිතො බො පනානන්ද ධම්මො පාසාදො දුද්දික්ඛො අහොසි, මුසති චක්ඛූනි. සෙය්‍යථාපි ආනන්ද වස්සානං පච්ඡිමෙ මාසෙ සරද සමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සක්කමානො දුද්දික්ඛො හොති. මුසති චක්ඛූනි. එවමෙව බො ආනන්ද ධම්මො පාසාදො දුද්දික්ඛො අහොසි. මුසති චක්ඛූනි.

31. අථ බො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි. යන්නූනාහං ධම්මස්ස පාසාදස්ස පුරතො ධම්මං නාම පොක්ඛරණිං මාපෙය්‍යන්ති. මාපෙසි බො ආනන්ද රාජා මහාසුදස්සනො ධම්මස්ස පාසාදස්ස පුරතො ධම්මං නාම පොක්ඛරණිං. ධම්මා ආනන්ද පොක්ඛරණී පුරත්ථිමෙන ච පච්ඡිමෙන ච යොජනං ආයාමෙන අහොසි. උත්තරෙන ච දක්ඛිණෙන ච අඩ්ඪයොජනං විත්ථාරෙන ධම්මා ආනන්ද පොක්ඛරණී චතූහි වණ්ණෙහි ඉට්ඨකාහි චිතා අහොසි. එකා ඉට්ඨකා සොවණ්ණමයා.

---

30. ආනන්දය, නිමියාවූ ධර්මප්‍රාසාදයතෙම නොබැලියහැක්කේවිය ඇස්බමන්නේය. ආනන්දය, යම්සේ වර්ෂාඍතුව සම්බන්ධවූ පශ්චිම මාස යෙහි සරත්කාලයෙහි පහවූ වලාඇත්තාවූ ආකාසයෙහිපැන නැංගාවූ සූර්‍ය්‍ය දිව්‍යපුත්‍රතෙම බැලියනොහැක්කේවේද, ඇස්බමන් නේවේද එපරිද්දෙන්ම ආනන්දය; ධර්මප්‍රාසාදයතෙම බැලිය නොහැක්කේවිය ඇස්බමන්නේවිය.

31. ඉක්බිත්තෙන් ආනන්දය, මහාසුදර්ශනරජහට මෙසේවූ සිත් විල්ලෙක්වූයේය. මම ධර්මප්‍රාසාදයාගේ ඉදිරියෙහි ධර්මනම්වූ පුස්කරණියක් මවන්නෙම්නම් ඉතායෙහෙකැයි කියායි. ආනන්දය, මහාසුදර්ශන රජතෙම ධර්මප්‍රාසාදයාගේ ඉදිරියෙහි ධර්මනම්වූ පොකුණක් මැවූයේය. ආනන්දය, ධර්මනම්වූ පුෂ්කරණීතොමෝ පූර්වදිශාභාග යෙහි පටන් පශ්චිමදිශාභාගයට දිගින් යොදුනක් පමණවූයේය. උත්තර දිශාභාගයෙහිපටන් දක්ෂිණ දිශාභාගයට පුළුලින් අඩයොදු නක්වූයේය. ආනන්දය, ධර්මනම්වූ පුස්කරණීතොමෝ චාතුර්වණී යන්ගේ ගඩොලින් නිමියේ වෙයි. එක උළක් සවර්ණමයවූයේ.

එකා රූපිමයා එකා වෙළුරිය මයා එකා ඵලිකමයා ධම්මාය ච ආනන්ද පොක්ඛරණියා චතුවීසති සොපානානි අහෙසුං. චතුණ්ණං වණ්ණානං· එකං සොපානං සොවණ්ණමයං එකං රූපිමයං එකං වෙළුරියමයං එකං ඵලිකමයං සොවණ්ණමයස්ස සොපානස්ස සොවණ්ණමයා ථම්භා අහෙසුං රූපිමයා සූචියො ච උණ්හීසඤ්ච. රූපිමයස්ස සොපානස්ස රූපිමයා ථම්භා අහෙසුං. සොවණ්ණමයා සූචියො ච උණ්හීසඤ්ච. වෙළුරියමයස්ස සොපානස්ස වෙළුරියමයා ථම්භා අහෙසුං. ඵලිකමයා සූචියො ච උණ්හීසඤ්ච. ඵලිකමයස්ස සොපානස්ස ඵලිකමයා ථම්භා අහෙසුං. වෙළුරියමයා සූචියො ච උණ්හීසඤ්ච. ධම්මා ආනන්ද පොක්ඛරණී විහි වෙදිකාහි පරික්ඛිත්තා අහොසි, එකාය වෙදිකාය සොවණ්ණමයා ථම්භා අහෙසුං. රූපිමයා සූචියො ච උණ්හීසඤ්ච. රූපිමයාය වෙදිකාය රූපිමයා ථම්භා අහෙසුං. සොවණ්ණමයා සූචියො ච උණ්හීසඤ්ච.

32. ධම්මා ආනන්ද පොක්ඛරණී සත්තහි තාලපන්තීහි පරික්ඛිත්තා අහොසි. එකා තාලපන්ති සොවණ්ණමයා එකා රූපිමයා.

---

එකක් රිදීමයවූයේය. එකක් වෙරළුමිණිමයවූයේය. එකක් ඵලිකමය වූයේය. ආනන්දය, ධම්නම්වූ පුෂ්කරණියෙහිද චාතුර්වර්ණයන් සම්බන්ධවූ සූවිසි හිණක්වූයේය. එකහිණක් ස්වර්ණමයවූයේය. එකක් රිදීමයවිය. එකක් වෙරළුමිණිමුවාවිය. එක්හිණක් පිළිමිණිමුවාවිය. ස්වර්ණමයවූ සොපානයාගේ ස්වර්ණමයවූ ටැම්වූවාහුය. රිදීමයවූ පියගැටහා උෂ්ණීසයවූයේය. රිදීමය හිණ පිළිබඳව රිදීමයවූ ටැම්වූවාහුය. ස්වර්ණමයවූ පියගැටහා උෂ්ණීසයවූයේය. වෛඩූර්‍යමාණික්‍යමයවූ සොපානයාගේ වෛඩූර්‍යමාණික්‍යමයවූ ටැම්වූවාහුය. පිළිමිණිමුවා පියගැටහා උෂ්ණීසයවිය. පිළිමිණිමුවා සොපානයාගේ පිළිමිණිමුවා ටැම්වූවාහුය. වෙරළුමිණිමුවා පියගැටහා උෂ්ණීසයවීය. ආනන්දය, ධම්නම්වූ පුෂ්කරණීතොමෝ වෙදිකා දෙකකින් පරික්ෂිප්තවිය. එක් වෙදිකාවෙක්හි ස්වර්ණමයටැම්වූහ. රිදීමයවූටැම්හා පියගැටවූහ. රිදීමයවෙදිකාවෙහි රිදීමය ටැම්වූවාහුය, ස්වර්ණමයවූ පියගැටහා උෂ්ණීසයවීය.

32. ආනන්දය ධම්නම් පුෂ්කරණීතොමෝ තාලපඞ්ක්තිසතකින් පරික්ෂිප්තවූවාය. එක් තල්පෙළක් රුවන්මයවිය. එකක් රිදීමයවිය.

ඒකාවෙළුරියමයා ඒකා ඵලිකමයා ඒකා ලොහිතංකමයා ඒකා මසාරගල්ලමයා ඒකා සබ්බරතනමයා. සොවණ්ණමයස්ස තාලස්ස ඵලිකමයො බන්ධො අහොසි. රූපිමයානි පත්තානි ච ඵලානි ච. රූපිමයස්ස තාලස්ස රූපිමයො බන්ධො අහොසි. සොවණ්ණමයානි පත්තානි ච ඵලානි ච. වෙළුරියමයස්ස තාලස්ස වෙළුරියමයො බන්ධො අහොසි. ඵලිකමයානි පත්තානිච ඵලානිච. ඵලිකමයස්ස තාලස්ස ඵලිකමයො බන්ධො අහොසි. ලොහිතඞ්කමයානි පත්තානි ච ඵලානි ච. සබ්බරතනමයස්ස තාලස්ස සබ්බරතනමයො බන්ධො අහොසි. සබ්බරතනමයානි පත්තානි ච ඵලානි ච. තාසං ඛො පන ආනන්ද තාලපන්තීනං වාතෙරිතානං සද්දො අහොසි. වග්ගුච රජනියොච කමණීයොච මදනියොච. සෙය්‍යථාපි ආනන්ද පඤ්චඞ්ගිකස්ස තුරියස්ස සුවිනීතස්ස සුප්පටිතාලිතස්ස කුසලෙහි සමන්නාගතස්ස සද්දො හොති. වග්ගුච රජනීයොච කමණීයොච මදනීයොච. එවමෙව ඛො ආනන්ද තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්දො අහොසි. වග්ගුච.

---

එකක් වෙරළුමිණිමයවිය. එකක් පිළිමිණිමයවිය. එකක් ලොහිතඞ්ක මයවිය. එකක් මැසිරිගල්මයවිය. එකක් සර්වරත්නමයවිය. සවර්ණමය තාලවෘක්ෂයාගේ ස්ඵටිකමාණික්‍යමය කඳක් ඇතිවිය. රිදීමය පත්‍රහා ඵලඇතිවූහ. රිදීමය තාලවෘක්ෂයාගේ රිදීමයකඳක් ඇතිවිය. සවර්ණමය පත්‍රහා ඵලඇතිවූහ. වෛඩූර්‍ය්‍යමාණික්‍යමය තාලපඞ්ක්තිහුගේ වෙරළුමිණිමුවා කඳක්ඇතිවිය. පිළිමිණිමුවා පත්‍රහා ඵලඇතිවිය. පිළිමිණිමුවා තාලවෘක්ෂයාගේ පිළිමිණිමුවා කඳඇතිවිය. ලොහිතඞ්කමය පත්‍රහාඵලද ඇතිවූහ. සර්වරත්නමය තාලපඞ්ක්තිහුගේ සර්වරත්නමය ස්කන්ධයක් ඇතිවිය. සර්වරත්නමය පත්‍රහා ඵලඇතිවූහ. ආනන්දය සුලංවේගයෙන් චඤ්චලවන්නාවූ ඒ තාලපඞ්ක්තීන්ගේ ශබ්දයතෙම මනොහඳ සිත්ඇලවියයුතුද මනවඩන්නේද සතුටින් මත්කරන්නේදවිය. ආනන්දය, සම්සේ විශෙෂයෙන් හික්මුනාවූ බෙරආදිය ගැසීමෙහි දක්ෂවූ වාද්‍යකාරයක්හුවිසින් වයනලද්දවූ පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යනාදයාගේ මනොරම්‍යවූද සිත් අලවන්නාවූද ප්‍රීති කරවූද මනොනන්දනීයවූද ශබ්දයක්වේද, ආනන්දය, එපරිද්දෙන්ම වාතයෙන් කම්පාකරණලද්දවූ ඒ තාලපඞ්ක්තීන්ගේ නාදය මනොඥවිය.

රජනියොච කමනියොච මදනියොච. යෙ ඛොපනානන්ද තෙන සමයෙන කුසාවතියා රාජධානියා ධුත්තා අහෙසුං සොණ්ඩා පිපාසා තෙ තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්දෙන පරිචාරෙසුං

33. නිට්ඨිතෙ ඛො පනානන්ද ධම්මෙච පාසාදෙ ධම්මායච පොක්ඛරණියා රාජා මහාසුදස්සනො යෙ තෙන සමයෙන සමණෙසුවා සමණසම්මතා බ්‍රාහ්මණෙසුවා බ්‍රාහ්මණසම්මතා තෙ සබ්බකාමෙහි සන්තප්පෙත්වා ධම්මං පාසාදං අභිරුහි.

පඨමකභාණවාරං නිට්ඨිතං.

---

2 1. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි. කිස්සනු ඛො මෙ ඉදං කම්මස්ස ඵලං.

---

සින් ඇලවියයුතුද විය. මනවඩන්නේවේද විය. ප්‍රිනියෙන් මත් කරන්නේද විය. ආනන්දය ඒ කාලයෙහිදි කුසාවති රාජධානියෙහි සොඬවූ පිපාසිතවූ යම් ඒධූර්තකෙනෙක්වූවාහුද ඔව්හු වාතයෙන් කම්පාකරණලද ඒ තාලපඞ්ක්තින්ගේ ශබ්දයෙන් ඉන්ද්‍රියයන් හැසිර වූහ.

33. ආනන්දය, ධර්මප්‍රාසාදයද ධර්ම නම්වූ පුස්කරණියද නිමිකල්හි මහාසුදර්ශනරජතෙම ඒ සමයෙහි ශ්‍රමණයන් අතුරෙහි හෝ යම් කෙනෙක් ශ්‍රමණ සම්මුති ඇත්තාහුද, බ්‍රාහ්මණයන් අතුරෙහි හෝ යම්කෙනෙක් බ්‍රාහ්මණ සම්මුතිඇත්තාහුද, ඒ ශ්‍රමණබ්‍රාහ්මණයන් කැමති කැමති සියලු ආහාරපානාදියෙන් සන්තර්පණයකොට ධර්මප්‍රාසාදයට නැංගේය.

පළමුවෙනි භාණවර මෙතෙකින් කියා නිමවනලදි.

---

2 1. ඉක්බිත්තෙන් ආනන්දය, මහාසුදර්ශනරජහට මෙබඳු සිතිවිල්ලෙක් වූයේය. මාගේ මේ සම්පත්තිය කවර කුසලකර්මයක් හුගේ ඵලයක්ද.

කිස්ස කම්මස්ස විපාකො, යෙ නාහං එතරහි එවං මහිද්ධිකො එවං
මහානුභාවොති. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතද
හොසි. තිණ්ණං ඛො මෙ ඉදං කම්මානං ඵලං තිණ්ණං කම්මානං
විපාකො යෙනාහං එතරහි එවං මහිද්ධිකො එවං මහානුභාවො.
සෙය්‍යථිදං දානස්ස දමස්ස සංයමස්සාති.

2. අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො යෙන මහාබ්‍යූහං කූටා-
ගාරං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මහාබ්‍යූහස්ස කූටාගාරස්ස
ද්වාරෙ ඨිතො උදානං උදානෙසි. තිට්ඨ කාම විතක්ක තිට්ඨ ව්‍යාපාද
විතක්ක තිට්ඨ විහිංසා විතක්ක, එත්තාවතා කාමවිතක්ක, එත්තාවතා
ව්‍යාපාද විතක්ක, එත්තාවතා විහිංසා විතක්කාති.

---

කවරකර්මයක්හුගේ විපාකයෙක්ද, යම්හෙයකින් මම දැන් මෙබඳු
සෘද්ධි ඇත්තෙම්ද මෙබඳු මහානුභාව සම්පන්න වෙම්ද එහෙයිනි.
ආනන්දය, ඉක්බිත්තෙන් මහාසුදර්ශනරජහට මෙබඳු සිතිවිල්
ලෙක් වූයේය. මාගේ මේ සම්පත්තිය ත්‍රිවිධ කුසලකර්මයාගේ
ඵලය වෙයි. ත්‍රිවිධකර්මයන්ගේ විපාකය වෙයි. යම්හෙයකින් මම
ඉහාත්මභාවයෙහි මෙබඳුවූ මහත් සෘද්ධි ඇත්තෙම්ද මෙබඳු මහත්
ආනුභාව ඇත්තෙම්ද යනුයි. ඒ කවරේද දානයාගේද කායවාක්
දමනයාගේද කායවාක් මනඃ සඞ්ඛ්‍යාත ද්වාරත්‍රය සංයමකිරීමය
යන ත්‍රිවිධ කුසලකර්මයන්ගේ ඵල විපාකය යනුයි.

2. තවද ආනන්දය, ඒ මහාසුදර්ශනරජතෙම මහාබ්‍යුහ කූටා
ගාරද්වාරය යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ මහාබ්‍යුහ
කූටාගාරද්වාරයෙහි සිටියේ ප්‍රීතිවාක්‍යයක් උදන් ඇණවූයේය.
කාමවිතර්කය සිටුව. ව්‍යාපාද විතර්කය සිටුව. විහිංසා විතර්කය සිටුව.
කාමවිතර්කය මෙපමණකින් සිටීවා, ව්‍යාපාද විතර්කය මෙපමණ
කින් සිටීවා. විහිංසා විතර්කය මෙපමණකින් සිටීවා කියායි.

3. අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො මහාබ්‍යූහං කූටාගාරං පවිසිත්වා සොවණ්ණමයෙ පල්ලඞ්කෙ නිසින්නො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහාසි. විතක්ක විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහාසි. පීතියාච විරාගා උපෙක්ඛකොච විහාසි සතොච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති. තතියජ්ඣානං උපසම්පජ්ජ විහාසි. සුඛස්සච පහාණා දුක්ඛස්සච පහාණා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහාසි.

---

3. තවද ආනන්දය, මහාසුදර්ශන රජතෙම මහාබ්‍යූහ කූටාගාරය. ප්‍රවිෂ්ටව ස්වර්ණමය පර්‍ය්‍යඞ්කයෙහි හුන්නේ පඤ්චකාමයෙන් වෙන්වම අකුසල කර්‍මයන්කෙරෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපඇති ප්‍රථමධ්‍යානය උපදවා විසුයේය. විතර්ක විචාර දෙදෙනාගේ ව්‍යුපසමනය හේතුකොටගෙණ සියසතන්තුළ පැහැදීම ඇතිකරන්නාවූ සිතේ එකඟබව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් උපන්නාවූ ප්‍රීතිය හා සැපඇති මීතියධ්‍යානය උපදවා වාසයකෙළේය. ප්‍රීතිවිරාගය හේතුකොටගෙණද උපෙක්‍ෂා සහගතව ස්මෘතිසම්පන්නවූයේ සම්‍යක් ප්‍රඥවෙන් දැන කරන්නේ කයින් සැපයද විඳිනසුලුවූයේ. උපෙක්‍ෂාවෙන් යුක්තවූයේ සිහියෙන් යුක්තවූයේ සැප විහරණ ඇත්තේයයි යමක් ආර්‍ය්‍යයෝ කියද්ද එබඳුවූ තෘතීය ධ්‍යානය උපදවා විසුයේය. සැපයාගේ ප්‍රහාණයෙන්ද දුකාබයාගේ ප්‍රහාණියෙන්ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරලීමෙන් හෙවත් බැහැර කිරීමෙන් දුක් නැත්තාවූ සැප නැත්තාවූ උපෙක්‍ෂා ස්මෘතීන්ගේ පාරිසුද්ධිය ඇති චතුර්ථධ්‍යානය උපදවා විසුයේය.

4. අථ බො ආනන්ද රාජා මහාසුදස්සනො මහාබ්‍යූහා කූටාගාරා නික්ඛමිත්වා සොවණ්ණමයං කූටාගාරං පවිසිත්වා රූපිමයෙ පල්ලඞ්කෙ නිසින්නො මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙණ අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි. කරුණා සහගතෙන චෙතසා. මුදිතා සහගතෙන චෙතසා, උපෙඛා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි.

---

4. ඉක්බිත්තෙන් ආනන්දය, මහාසුදර්ශනරජතෙම මහාබ්‍යූහ කූටාගාරයෙන් නික්ම ස්වර්ණමයවූ කූටාගාරයට ප්‍රවිෂ්ටව රිදීමයවූ පය්‍යඞ්කයෙහි හුන්නේ මෛත්‍රිසහගතචිත්තයෙන් එක් දිසාභාගයක් පතුරුවා විසුයේය. එසේම දෙවෙනි දිශාභාගයද. එසේම තුන්වෙනි දිශාභාගයද. එසේම සතරවෙනි දිශාභාගයද. මෙසේ උඩින් අරූපි බ්‍රහ්මලොකය දක්වාද, යටින් නාලොව දක්වාද සරසින් චක්‍රවාටාභ්‍යන්තරය අවසන්කොටඇති සැමතන්හි සකලප්‍රාණීන් සහිතවූ සියලුමලොකය මෛත්‍රිසහගතචිත්තයෙන් පතලාවූ මහත්බවටගියාවූ අප්‍රමාණවූ අවෛරීවූ ව්‍යාපාදරහිතවූ චිත්තයෙන් පතුරුවා විසුයේය. කරුණාසහගතචිත්තයෙන්. සෙස්ස පෙරපරිද්දෙනි. පතුරුවා විසුයේය. මුදිතාසහගතචිත්තයෙන්ද. සෙස්ස පෙර කියූ පරිද්දෙන් විස්තරයට පැමිණවියයුතු. පතුරුවා විසුයේය. උපෙක්ෂාසහගතචිත්තයෙන්ද එක්දිගක් පතුරුවා විසුයේය. එසේම දෙවෙනිදිගද එසේම තුන්වෙනිදිගද එසේම සතරවෙනිදිගද ඒසේම උඩද යටද සරසද සැමතන්හි සකලප්‍රාණීන් සහිතවූ සියලුලොකය උපෙක්ෂාසහගතවූ පතලාවූ මහත්බවටගියාවූ අප්‍රමාණවූ ව්‍යාපාදරහිත චිත්තයෙන් පතුරුවා විසුයේය.

5. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස චතුරාසීති නගරසහස්සානි අහෙසුං කුසාවතී රාජධානී පමුඛානි. චතුරාසීති පාසාදසහස්සානි අහෙසුං ධම්මපාසාදපමුඛානි. චතුරාසීති කූටාගාරසහස්සානි අහෙසුං මහාබ්‍යූහ කූටාගාර පමුඛානි. චතුරාසීති පල්ලඞ්කසහස්සානි අහෙසුං සොවණ්ණමයානි රූපියමයානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදනානි උභතො ලොහිතකූපධානානි. චතුරාසීති නාගසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථ නාගරාජපමුඛානි. චතුරාසීති අස්සසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහක අස්සරාජපමුඛානි. චතුරාසීති රථසහස්සානි අහෙසුං සීහචම්මපරිවාරානි ව්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්මපරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි.

---

5. ආනන්දය, මහාසුදර්ශනරජහට කුසාවතී රාජධානිය ප්‍රමුඛකොටඇති සුවාසූදහසක් නගරයෝ වූවාහුය. ධර්මප්‍රාසාදය ආදිකොට ඇති සුවාසූදහසක් ප්‍රාසාද වූවාහුය. මහාබ්‍යූහ කූටාගාරය ප්‍රමුඛකොටඇති සුවාසූදහසක් කූටාගාර වූවාහුය. ස්වර්ණමයවූද, රජතමයවූද, දළකඩමයවූද, මසාරමයවූද, එක්පිටක ලොම්ඇති එළුලොම්මුවා ඇතිරියෙන් යුක්තවූද, දෙපිටලොම්ඇති එළුලොම්මුවා ඇතිරියෙන් යුක්තවූද, රන්කසුම්කල දික්දහ ඇතිරියෙන් යුක්තවූද, උතුම් කෙසෙල්මුවසමින්කළ පසතුරුණින් යුක්තවූද, මත්තෙහි බඳනාලද රන්වියන්සහිතවූද, ඉස්දෙර පාමුල රත්කන්වයින් සහිතවූද, සුවාසූදහසක් පර්‍ය්‍යඞ්කවූවාහුය. ස්වර්ණාලඞ්කාරයෙන් සරසනලද්දාවූ රන්ධජනගණලද්දාවූ රන්දැලින් වසනලද්දාවූ උපොසථ හස්තිරාජයා ප්‍රධානකොට ඇත්තාවූ සුවාසූදහසක් හස්තිහු වූවාහුය. ස්වර්ණාලඞ්කාරවූ රන්ධජනගනලද්දාවූ රන්දැලින් වසනලද්දාවූ වලාහක අශ්වරාජයා ප්‍රමුඛකොටඇති සුවාසූදහසක් අශ්වයෝ වූවාහුය. සිහචර්මයෙන් වටකරණලද්දාවූද ව්‍යාඝ්‍රචර්මයෙන් වටකරණලද්දාවූද දිවිසමින් වටකරණලද්දාවූද පාණ්ඩුකම්බලයෙන් වටකරණලද්දාවූද ස්වර්ණාලඞ්කාරවූද රන්ධජනගනලද්දාවූද.

හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථපමුඛානි. චතුරාසීති මණි සහස්සානි අහෙසුං මණිරතනපමුඛානි. චතුරාසීති ඉත්ථි සහස්සානි අහෙසුං සුභද්දදෙවිපමුඛානි. චතුරාසීති ගහපති සහස්සානි අහෙසුං ගහපතිරතනපමුඛානි. චතුරාසීති ඛත්තිය සහස්සානි අහෙසුං අනුයුත්තානි පරිනායකරතන පමුඛානි. චතුරාසීති ධෙනු සහස්සානි අහෙසුං දුකූලසන්දනානි කංසූපධාරණානි. චතුරාසීති වත්ථකොටිසහස්සානි අහෙසුං ඛොමසුඛුමානං කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං. චතුරාසීති ථාලිපාකසහස්සානි අහෙසුං සායං පාතං භත්තාභිහාරො අභිහරියිත්ථ.

6, තෙන ඛො පනානන්ද සමයෙන රඤ්ඤො මහාසුදස්සනස්ස චාතුරාසීති නාගසහස්සානි සායංපාතං උපට්ඨානං ගච්ඡන්ති. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි.

---

රන්දැලින් වසනලද්දාවූද වෛජයන්තරථය ප්‍රධානකොටඇති සුවාසූදහසක් රථවූවාහුය. මාණික්‍යරත්නය ප්‍රධානවූ සුවාසූද හසක් මාණික්‍යරත්න වූවාහුය. සුභද්‍රාදේවී ප්‍රධානකොට ඇති සුවාසූදහසක් ස්ත්‍රීහු වූවාහුය. ගෘහපතිරත්නය ප්‍රධාන කොටඇති සුවාසූදහසක් ගෘහපතිහු වූවාහුය. පරිනායකරත්නය ප්‍රමුඛවූ අනුවහැසිරෙන්නාවූ සුවාසූදහසක් ක්‍ෂත්‍රිය රජහු වූවාහුය. දුකූලසන්ථනවූ කංසූපධාරණවූ සුවාසූදහසක් ධේනූහු වූවාහුය. සියුම්වූ කොමුපිළිද සියුම්වූ කපුපිළිද සියුම්වූ කොසෙය්‍ය වස්ත්‍රද සියුම්වූ කම්බලසාටකද යන මෙසින් සම්පූර්ණවූ සුවාසූදහසක් වස්ත්‍ර කොටි වූවාහුය. ආනන්දය, මහාසුදර්ශනරජහුගේ සුවාසූදහසක් බත් සැල් වූවාහුය. ඒනම්, සවස උදය මෙහෙනිමවීවපිළිස යමක්එලවා තබත්නම් ඔව්හුයි.

6. ආනන්දය එසමයෙහිදී මහාසුදර්ශනරජහට සුවාසූදහසක් නාගයෝ සවස උදයඋපස්ථානයටඑන්නාහ.ආනන්දය ඉක්බිති මහා සුදර්ශන රජහට මේ අදහසවිය.

ඉමානි ඛො මෙ චතුරාසීති නාගසහස්සානි සායං පාතං උපට්ඨානං ආගච්ඡන්ති. යන්නූනාහං වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන ද්වෙචත්තාරීසං නාගසහස්සානි ද්වෙ චත්තාරීසං නාගසහස්සානි සකිංසකිං උපට්ඨානං ආගච්ඡෙය්‍යුන්ති. අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො පරිණායකරතනං ආමන්තෙසි. ඉමානි ඛො මෙ සම්මපරිණායකරතන චතුරාසීති, නාගසහස්සානි සායංපාතං උපට්ඨානං ආගච්ඡන්ති, තෙනහි සම්මපරිණායකරතන වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන ද්වෙචත්තාරීසං නාගසහස්සානි ද්වෙ චත්තාරීසං නාගසහස්සානි සකිංසකිං උපට්ඨානං ආගච්ඡන්තීති. එවං දෙවාති ඛො ආනන්ද පරිණායකරතනං රඤ්ඤො මහාසුදස්සනස්ස පච්චස්සොසි. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස අපරෙන සමයෙන වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන ද්වෙ චත්තාරීසං නාගසහස්සානි ද්වෙචත්තාරීසං නාගසහස්සානි සකිං සකිං උපට්ඨානං ආගමංසු.

---

මේ අසුසාර දහසක් නාගයෝ සවස උදය මට උපස්ථානයට එන්නාහ. යම්හෙයකින් දෙසතළිස්දහසක් දෙසතළිස්දහසක් නාගයෝ වර්ෂලක්ෂයකට වර්ෂලක්ෂයකට එකවරක් පාසා මට උපස්ථානයට එන්නාහු නම් ඉතා යෙහෙකැයි කියාසි. ඉක්බිත්තෙන් ආනන්දය මහාසුදර්ශනරජ තෙම පරිනායක රත්නයට ආමන්ත්‍රණය කළේය. කල්‍යාණ මිත්‍රවූ පරිනායක රත්නය මට මේ සුවාසුදහසක් නාගයෝ සවසඋදය උපස්ථානය පිණිස එන්නාහ. එසේ හෙයින් කල්‍යාණ මිත්‍රවූ පරිනායක රත්නය සියක්අවුරුදු සියක් අවුරුදු ඇවෑමෙන්වෙන් වෙන්ව දෙසාළිස් දහසක් දෙසාළිස්දහසක් නාගයෝ උපස්ථානයට එනසේක්වයි කියාසමතකළේය. ආනන්දය, පරිනායකරත්නය එසේය. දෙවයන්වහන්සැයි මහාසුදර්ශන රජහුගේ වචනයට ප්‍රතිවචන දුන්නේය. ඉක්බිත්තෙන් ආනන්දය, මහාසුදර්ශන රජහට එයින් මෑතභාගයෙහි සියක් හවුරුදු ඇවෑමෙන් එක් එක්වර දෙසාළිස් දහසක් දෙසාළිස් දහසක් නාගයෝ උපස්ථානය පිණිස ගියාහුය.

7. අථ ඛො ආනන්ද සුභද්දාය දෙවියා බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසතසහස්සානං අච්චයෙන එතදහොසි. චිරදිට්ඨො ඛො මෙ රාජා මහාසුදස්සනො, යන්නූනාහං රාජානං මහාසුදස්සනං දස්සනාය උපසඞ්කමෙය්‍යන්ති, අථ ඛො ආනන්ද සුභද්දා දෙවී ඉත්ථාගාරං ආමන්තෙසි. එථ තුම්හෙ සීසානි නහායථ පීතානි වත්ථානි පාරුපථ චිරදිට්ඨො නො රාජා මහාසුදස්සනො. රාජානං මහාසුදස්සනං දස්සනාය උපසඞ්කමිස්සාමාති. එවං දෙවීති ඛො ආනන්ද ඉත්ථාගාරං සුභද්දාය දෙවියා පටිස්සුත්වා සීසං නහායිත්වා පීතානි වත්ථානි පාරුපිත්වා යෙන සුභද්දා දෙවී තෙනුපසඞ්කමි. අථ ඛො ආනන්ද සුභද්දා දෙවී පරිණායක රතනං ආමන්තෙසි. කප්පෙහි සම්ම පරිණායක රතන චතුරඞ්ගිනිං සෙනං. චිරදිට්ඨො නො රාජා මහාසුදස්සනො. රාජානං මහාසුදස්සනං දස්සනාය උපසඞ්කමිස්සාමාති.

7. ඉක්බිත්තෙන් ආනන්දය, සුභද්‍රා දෙවියට බොහෝ වර්ෂයන්ගේද බොහෝ වර්ෂ සියයන්ගේද බොහෝ වර්ෂසහශ්‍රයන්ගේද ඇවෑමෙන් මෙසේ සිතිවිල්ලෙක් වූයේය. මහාසුදර්ශන රජතෙම මාවිසින් බොහෝකාලයකින් යටදක්නා ලද්දේය. එහෙයින් මම මහාසුදර්ශන රජ්ජුරුවන් දක්නාපිණිස එළඹෙන්නෙම්නම් ඉතා යෙහෙකැයි කීයායි. ඉක්බින්තෙන් ආනන්දය සුභද්‍රාදෙවිතොමෝ අන්තඃපුර ස්ත්‍රීන්ට ආමන්ත්‍රණය කළාය. තෙපි මෙහි එව්. ස්නානය කරව්. රන්වන්වූ වස්ත්‍ර පොරවව්. අපගේ මහාසුදර්ශන රජතෙම බොහෝකලකින්යට දක්නාලද්දේය. මහාසුදර්ශන රජ්ජුරුවන් දක්නා පිණිස සමීපයට යම්හයි කීවාය. එසේය. ආය්‍ය්‍යාවෙනිකියා ආනන්දය, අන්තඃපුර ස්ත්‍රීහු සුභද්‍රාදෙවියට ප්‍රතිවචනදී ස්නානයකොට රන්වන්වූ වස්ත්‍ර පොරවා සුභද්‍රා දෙවිතොමෝ යම් තැනකද එතනට එළඹියාය. ඉක්බින්තෙන් ආනන්දය, සුභද්‍රාදෙවිතොමෝ පරිනායක රත්නයට ආමන්ත්‍රණය කළාය. කල්‍යාණසතායවූ පරිනායකරත්නය සිව්රඟසෙනග සදවා. අපගේ මහාසුදර්ශන රජතෙමේ බොහෝකලකින් යට දක්නාලද්දේය. මහාසුදර්ශනරජ්ජුරුවන් දක්නාපිණිස සමීපයට යම්හයි කීවාය.

එවං දෙවීතිබො ආනන්ද පරිනායකරතනං සුභද්දය දෙවියා පටිස්සුත්වා චතුරඞ්ගිනිං සෙණං කප්පාපෙත්වා සුභද්දාය දෙවියා පටිවෙදෙසි කප්පිතා බො තෙ දෙවි චතුරඞ්ගිනීසෙනා යස්සදානි කාලං මඤ්ඤසීති.

8. අථ බො ආනන්ද සුභද්ද දෙවි චතුරඞ්ගිනියා සෙනාය සද්ධිං ඉත්ථාගාරෙන යෙන ධම්මො පාසාදො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ධම්මං පාසාදං අභිරුහිත්වා යෙන මහාබ්‍යූහං කූටාගාරං තෙනුපසඞ්කාමි. උපසඞ්කමිත්වා මහාබ්‍යූහස්ස කූටාගාරස්ස වාරබාහං ආලම්බිත්වා අඨාසි. අථ බො රාජා මහාසුදස්සනො කිංනුඛො මහතො විය ජනකායස්ස සද්දොති මහාබ්‍යූහා කූටාගාරා නික්ඛමන්තො අද්දස සුභද්දං දෙවිං වාරබාහං ආලම්බිත්වා ඨිතං. දිස්වා සුභද්දං දෙවිං එතදවොච. එත්ථෙව දෙවි තිට්ඨ මා පාවිසීති.

---

එසේය දෙවීති කියායි. ආනන්දය, පරිනායකරත්නය සුභද්‍රාදෙවියට ප්‍රතිවචනදී සිව්රඟසෙනග සජ්ජිතකරවා සුභද්‍රාදෙවියට කල්දැන්නුවේය. එම්බා දෙවිනි නුඹට සිව්රඟසෙනඟ සදනලද්දේය. දැන් ඊට කල් දැනගණුවයි දැන්වූයේය.

8. නවද ආනන්දය, සුභද්‍රාදෙවිතොමෝ සිව්රඟසෙන් සමගවූ අන්තඃපුර ස්ත්‍රීන්සමග ධර්‍මප්‍රාසාදයතෙම යම්තැනකද එතනට එලඹියාය. එලඹ ධර්‍මප්‍රාසාදයටනැගී මහාබ්‍යූහ කූටාගාරය යම්තැනකද එතනට එලඹියාය. එලඹ මහාබ්‍යූහකූටාගාරයාගේ දොරබාවෙහි එල්බ සිටියාය. ඉක්බිත්තෙන් ආනන්දය, මහාසුදර්‍ශනරජතෙම ශබ්දය අසා කිමෙක්ද, මේ මහත් සේනාවක්හුගේ ශබ්දයෙක් වනැයි සිතා මහාබ්‍යූහ කූටාගාරයෙන් නික්මුනේ දොරබාවෙහි එල්බ සිටියාවූ සුභද්‍රාදේවිය දුටුයේය. දැක සුභද්‍රාදේවියට මෙසේ කීයේය. එම්බා දේවිය, මෙතන්හිම සිටුව. කූටාගාරයට නොනැඟෙවයි කීයේය.

9. අථ ඛො රාජා මහාසුදස්සනො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි. එහි ත්වං අම්භො පුරිස මහාබ්‍යූහා කූටාගාරා සොවණ්ණමයං පල්ලඞ්කං නීහරිත්වා සබ්බසොවණ්ණමයෙ තාලවනෙ පඤ්ඤපෙහිති. එවං දෙවාති ඛො ආනන්ද සො පුරිසො රඤ්ඤො මහාසුදස්සනස්ස පටිස්සුත්වා මහාබ්‍යූහා කූටාගාරා සොවණ්ණමයං පල්ලඞ්කං නීහරිත්වා සබ්බසොවණ්ණමයෙ තාලවනෙ පඤ්ඤපෙසි. අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො.

10. අථ ඛො ආනන්ද සුභද්දාය දෙවියා එතදහොසි. විප්පසන්නානි ඛො රඤ්ඤො මහාසුදස්සනස්ස ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. මා හෙව ඛො රාජා මහාසුදස්සනො කාලමකාසීති. රාජානං මහාසුදස්සනං එතදවොච. ඉමානි ඛො තෙ දෙව චතුරාසීති නගරසහස්සානි කුසාවතී රාජධානිපමුඛානි.

---

9. ඉක්බිත්තෙන් මහාසුදර්ශනරජතෙම එක්තරා පුරුෂයෙකු ආමන්ත්‍රණය කෙළේය. පින්වත් පුරුෂය, තෝ මෙහි එව. මහාබ්‍යුහ කූටාගාරයෙන් ස්වර්ණමයවූ පර්‍ය්‍යඞ්කයක් නිකුත්කොට සර්වරත්නමයවූ තල්වනයෙහි පණවවයි කීයේය. ආනන්දය, එසේය දේවයන්වහන්සැයි කියා ඒ පුරිස්තෙම මහාසුදර්ශනරජහට ප්‍රතිවචනදී මහාබ්‍යුහ කූටාගාරයෙන් ස්වර්ණමයවූ පර්‍ය්‍යඞ්කයක් නිකුත්කොට ගෙණ සර්වරත්නමයවූ තල්වනයෙහි පැණවූයේය. ඉක්බිත්තෙන් ආනන්දය, මහාසුදර්ශනරජතෙම පයෙහි පය මඳක් ඉක්මවා තබා ස්මෘතිසම්පන්නවූයේ දකුණැලයෙන් සිංහශය්‍යාව කළසේක.

10. තවද ආනන්දය, සුභද්‍රාදේවියට මෙසේවූ සිතිවිල්ලෙක් වූයේය. මහාසුදර්ශනරජහුගේ ඉන්ද්‍රියයෝ ඉතා ප්‍රසන්නයහ. ශරීරවර්ණය පිරිසිදුවූයේය. අත්‍යර්ථයෙන් බබලන්නේය. මහාසුදර්ශනරජතෙම කාලක්‍රියා නොකරණසේක්වායි සිතියායි. මෙසේ සිතා මහාසුදර්ශන රජහට මෙසේ දැන්විය. දේවයන්වහන්ස, නුඹවහන්සේගේ කුසාවතී රාජධානිය ප්‍රධානකොට ඇත්තාවූ මේ සුවාසූදහසක් නගරයෝ වෙත්.

එත්ථෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති පාසාදසහස්සානි ධම්මපාසාදපමුඛානි. එත්ථෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති කූටාගාරසහස්සානි මහාබ්‍යූහකූටාගාරපමුඛානි එත්ථෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති පල්ලඞ්කසහස්සානි සොවණ්ණමයානි රූපිමයානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදානි උභතොලොහිතකූපධානානි—පෙ—ඉමානි තෙ දෙව චතුරාසීති නාගසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජපමුඛානි. එත්ථෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි.

---

දෙවයන්වහන්ස මෙහි ආසාව උපදවනුමැනව. ජීවිතයෙහි අපෙක්ෂාවකරණුමැනව. දෙවයන්වහන්ස, නුඹවහන්සේගේ ධර්‍මප්‍රාසාදය ප්‍රමුඛවූ මේ සුවාසූදහසක් ප්‍රාසාදයෝවෙත්. දෙවයන්වහන්ස, මෙහි ආසාව උපදවනුමැනව ජීවිතයෙහි අපෙක්ෂාවකරණුමැනව. දෙවයන්වහන්ස, නුඹවහන්සේගේ මහාබ්‍යූහකූටාගාරය ප්‍රමුඛකොටඇති මේසුවාසූදහසක් කූටාගාරවෙත්. දෙවයන්වහන්සේ මෙහි ආසාව උපදවනුමැනව. ජීවිතයෙහි අපෙක්ෂාව් කරනුමැනව. සංක්‍ෂෙපකරණලදී. දෙවයන්වහන්ස, නුඹවහන්සේගේ සවර්ණමයවූද රිදීමයවූද දළකඬමයවූද සාරමයවූ එළුලොම්මුවා ඇතිරියෙන් යුක්තවූ ඝනපුප් ඇතිරියෙන් යුක්තවූ රන්කසුම්කළ ඇතිරියෙන් යුක්තවූ උතුම්වූ කෙහෙල්මුවසමින්කළ පසතුරුනින් යුක්තවූ මත්තෙහි බඳනාලද රන්වියන් සහිතවූ ඉස්දෙර පාමුල තබනලද රන්කන් වයින් සහිතවූ මේ සුවාසූදහසක් පර්‍යඞ්කයෝවෙත්. සංක්‍ෂෙප කරණලදී. —පෙ— දෙවයන්වහන්ස නුඹවහන්සේගේ රුවන්ලකරඇත්තාවූ රන්ඔප්නගනලද්දාවූ රන් දැලින් වසනලද්දාවූ උපොසථහස්තිරාජයා ප්‍රමුඛකොටඇති මේසුවාසූ දහසක් හස්තිහුවෙත්ද දේවයන්වහන්ස මෙහි ඡන්දය උපදවනු මැනව. ජීවිතයෙහි අපෙක්ෂාව කරණුමැනව.

ඉමානි තෙ දෙව චතුරාසීති. අස්සසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණ ධජානි හෙමජාල පටිච්ඡන්නානි වලාහක අස්සරාජ පමුඛානි එත්ථදෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහිති. ඉමානි තෙ දෙව චතුරාසීති රථසහස්සානි සීහචම්මපරිවාරානි ව්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්මපරිවාරානි පණ්ඩු කම්බල පරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණ ධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්ත රථපමුඛානි. එත්ථදෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති මණි සහස්සානි මණිරතනපමුඛානි. එත්ථදෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති ඉත්ථිසහස්සානි ඉත්ථි රතනපමුඛානි. එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති ගහපති සහස්සානි ගහපතිරතන පමුඛානි.

---

දේවයන්වහන්ස, නුඹවහන්සේගේ වලාහක අශ්වරාජයා ප්‍රමුඛකොට ඇති මේ සුවාසූදහසක් අශ්වයෝවෙත්. ඔව්හු රුවන්ලකර ඇත්තාවූද රන්ධජනගනලද්දාවූද රන්දැලින්වසනලද්දාවූදවෙත්. දේවයන්වහන්සේ මෙහි ඡන්දය උපදවනුමැනව. ජීවිතයෙහි අපේක්ෂාවකරනුමැනවි. දේවයන්වහන්ස, නුඹවහන්සේට සිංහසමින් වටකරණලද්දාවූද ව්‍යාඝ්‍රසමින්වටකරණලද්දාවූද දිවිසමින්වටකරණලද්දාවූද පඬුවත්කම්බලයෙන් වෙළනලද්දාවූද ස්වර්ණාලඞ්කාරඇත්තාවූද ස්වර්ණධ්වජ ඇත්තාවූද රුවන්දැලින් වසනලද්දාවූද වෛජයන්තරථය ප්‍රධාන කොට ඇති සුවාසූදහසක් රථවෙත්. දේවයන්වහන්සේ මෙහි ඡන්දය උපදවනුමැනව. ජීවිතයෙහි අපේක්ෂාව කරණුමැනව. දේවයන්වහන්ස, නුඹවහන්සේගේ මාණික්‍ය රත්නය ප්‍රධාන කොට ඇති අසූසාරදහසක් මාණික්‍යයෝ වෙත්, මෙහි දේවයන් වහන්සේ ඡන්දය උපදවනු මැනව. ජීවිතයෙහි අපේක්ෂාව කරණු මැනවි. දේවයන්වහන්ස, නුඹවහන්සේගේ ස්ත්‍රී රත්නය ප්‍රධාන කොටඇති අසූසාර දහසක් ස්ත්‍රීහු වෙත්. දේවයන්වහන්ස, මෙහි ඡන්දය උපදවනු මැනව. ජීවිතයෙහි අපේක්ෂාව කරණු මැනව. දේවයන්වහන්ස, නුඹවහන්සේගේ ගෘහපති රත්නය ප්‍රධානකොට ඇති මේ අසූසාරදහසක් ගෘහපතිහු වෙත්.

එත්ථ දෙව ඡන්දං ජනෙහි. ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති ඛත්තියසහස්සානි අනුයුත්තානි පරිණායකරතනපමුඛානි. එත්ථ දෙව ඡන්දං ජනෙහි. ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති ධෙනුසහස්සානි දුකූලසන්දනානි කංසූපධාරණානි. එත්ථදෙව ඡන්දං ජනෙහි, ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති වත්ථකොටිසහස්සානි ඛොම සුඛුමානං කප්පාසික සුඛුමානං කොසෙය්‍ය සුඛුමානං කම්බලසුඛුමානං. එත්ථදෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීති ථාලිපාකසහස්සානි සායපාතං භත්තාභිහාරෙ අභිහරියන්ති. එත්ථදෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහීති.

---

දේවයන්වහන්ස, මෙහි ඡන්දය උපදවනුමැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව කරණුමැනවි. දේවයන්වහන්ස, මේ නුඹවහන්සේගේ පරිනායක රත්නය ප්‍රධානකොටඇති අනුවයෙදුනාවූ අසූසාරදහසක් ක්ෂත්‍රියයෝවෙත්. දේවයන්වහන්ස, මෙහි ඡන්දය හරිණු මැනව, ජීවිතයෙහි අපෙක්ෂාවකරණුමැනවි. දේවයන්වහන්ස, නුඹවහන්සේගේ දුකුල වස්ත්‍රයෙන් අතුරණලද්දවූ කාංසාභරණයෙන් දරන්නාවූ මේ අසූසාරදහසක් ධෙනූහු වෙත්. දේවයන්වහන්ස, මෙහි ඡන්දය හරිණුමැනව. ජීවිතයෙහි අපෙක්ෂාව කරව. දේවයන්වහන්ස, නුඹවහන්සේගේ සියුම්වූ කොමු පිළිද සියුම්වූ කපුපිළිද සියුම්වූ කොසෙය්‍ය වස්ත්‍රද සියුම්වූ කම්බල වස්ත්‍රද යන මෙයින් සම්පූර්ණවූ මේ වස්ත්‍ර කෝටි සහශ්‍රයක් වෙත්. මෙහි දේවයන්වහන්සේ, ඡන්දය උපදවනු මැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව කරණු මැනවි. දේවයන්වහන්ස, නුඹවහන්සේගේ අසූසාරදහසක් බත් සැලිවෙත්. එනම් සවස උදය භත්ත කෘත්‍යයපිණිස සම්පයටඑලවන්නාහුනම් ඔව්හුයි. දේවයන්වහන්ස මෙහි ඡන්දය හරිනු මැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව කරණු මැනවැයි යාච්ඤා කළාය.

11. එවං වුත්තෙ ආනන්ද රාජා මහා සුදස්සනො සුභද්දං දෙවිං එතදවොච. දීඝරත්තං ඛො මත්ත්වං දෙවි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි, සමුදාචරිත්ථ, අථ ච පන මත්ත්වං පච්ඡිමෙ කාලෙ අනිට්ඨෙහි අකන්තෙහි අමනාපෙහි සමුදාචරසීති. කථඤ්චරහි තං දෙව සමුදාචරාමීති. එවං ඛො මං ත්වං දෙවි සමුදාචර, සබ්බෙහෙව දෙව පියෙහි මනාපෙහි නානා භාවො විනා භාවො අඤ්ඤථා භාවො. මා ඛො ත්වං දෙව සාපෙක්ඛො කාලමකාසි. දුක්ඛා සාපෙක්ඛස්ස කාලකිරියා. ගරහිතා ච සාපෙක්ඛස්ස කාලකිරියා. ඉමානි තෙ දෙව චතුරාසීති නගරසහස්සානි කුසාවතී රාජධානී පමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති පාසාදසහස්සානි ධම්මපාසාද පමුඛානි. එත්ථදෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති කූටාගාරසහස්සානි මහාබ්‍යූහ කූටාගාර පමුඛානි.

---

11. ආනන්දය මෙසේ කීකල්හි මහාසුදර්ශනරජතෙම සුභද්‍රා දේවියට මේ කාරණය කීයේය. දේවිනි, තී, බොහෝකලකපටන් මා ඉෂ්ටවූ මනොඥවූ මනවඩන්නාවූ වචන්වලින්කථාකෙළෙහිය. එසේ නමුත් තී මට පැසුලුකාලයෙහි අනිෂ්ටවූ අමනොඥනොවූ මන නොවඩන්නාවූ කාරණාවලින් කථාකෙරෙහිය. දේවයන්වහන්ස දැන් තුඹවහන්සේට කෙසේ කථාකෙරෙම්දැයි විචාළාය. දේවිනි මෙසේනම් මට තී කථාකරව. දේවයන්වහන්ස, ප්‍රියවූ මනොඥවූ සියල්ලෙන්ම නානා ස්වභාව ඇත්තේය. වෙන්වන ස්වභාව ඇත්තේය. අන්‍යථාවයට පැමිණෙන ස්වභාව ඇත්තේය. දේවයන්වහන්ස. තුඹවහන්සේ අපෙක්ෂාසහිත්ව නහමක් කාලක්‍රියාකරණු මැනවි. අපෙක්ෂාසහිතවූ වහුගේ කාලක්‍රියාතොමෝ දුක්වන්නීය. අපෙක්ෂාසහිතවූවහුගේ කාලක්‍රියාතොමෝ නිඳුකටයුතුමය. දේවයන්වහන්ස, තුඹවහන්සේගේ කුසාවතී රාජධානිය ප්‍රමුඛකොටඇති මේ සුවාසූදහසක් නගරයෝ වෙත්. දේවයන්වහන්ස, මෙහි ඡන්දය හරිනු මැනව. ජීවිතය අපෙක්ෂා නොකළ මැනවැයි කියායි. දේවයන්වහන්ස තුඹවහන්සේගේ මහාබ්‍යූහ කූටාගාරය ප්‍රධානකොටඇති අසූසාරදහසක් කූටාගාරයෝ වෙත්.

එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති පල්ලඞ්කසහස්සානි සොවණ්ණමයානි රූපිමයානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි ස උත්තරච්ඡදනානි උභතො ලොහිත කූපධානානි. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති නාගසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජපමුඛානි. එත්ථදෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති අස්සසහස්සානි සොවණ්ණාලඞ්කාරානි. සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහක අස්සරාජපමුඛානි. එත්ථදෙව ඡන්දං පජහ ජීවිතෙ අපෙඛං මාඅකාසි.

---

දේවයන්වහන්සේ මෙහි ඡන්දය හරිනු මැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව නොකරණු මැනවි, දේවයන්වහන්ස, නුඹවහන්සේගේ ස්වර්ණමයවූද, රිදීමයවූද, දන්තමයවූද, සාරමයවූද, එක්පිටක ලොම්ඇති එළුලොම්මුවා ඇතිරියෙන් යුක්තවූද, දෙපිට ලොම්ඇති එළුලොම්මුවා ඇතිරියෙන් යුක්තවූද, රත්කසුම් කල දික්දහ ඇතිරියෙන් යුක්තවූද, උතුම් කෙසෙල් මුව සමින් කල පසතුරුණින් යුක්තවූද, මත්තෙහි බඳනාලද රත්වියන් සහිතවූද, ඉස්දෙර පාමුල රත්කන්වයින් සහිතවූද, සුවාසූදහසක් පර්‍යඞ්කයෝ වෙත්. දේවයන්වහන්සේ මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව නොකල මැනවි. දේවයන්වහන්ස ස්වර්ණාලඞ්කාරවත්වූ ස්වර්ණධවජ ඇත්තාවූ ස්වර්ණජාලයෙන් වසනලද්දාවූ උපොසථ හස්තිරාජයා ප්‍රධානකොටඇති මේ අසූහාරදහසක් හස්තිහු වෙත්. දේවයන්වහන්ස මෙහි ඡන්දය හරිනු මැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව නොකරණු මැනවි. දේවයන්වහන්ස, නුඹවහන්සේට ස්වර්ණාලඞ්කාර ඇත්තාවූ ස්වර්ණධවජ ඇත්තාවූ රන්දැලින් වසනලද්දාවූ වලාහක අශ්වරාජයා ප්‍රධානකොටඇති මේ අසූහාරදහසක් අශ්වයෝ වෙත්. දේවයන්වහන්සේ මෙහි ඡන්දය හරිණු මැනවි ජීවිතයෙහි අපෙක්ෂාව නොකරණු මැනවි.

ඉමානි තෙ දෙව චතුරාසීති රථසහස්සානි සීහචම්මපරිවාරානි ව්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්මපරිවාරානි පාණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණද්ධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථපමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මා අකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති මණිසහස්සානි මණිරතනපමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මා අකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ඉත්ථිසහස්සානි සුභද්දාදෙවි පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මා අකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ගහපතිසහස්සානි ගහපතිරතනපමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මා අකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ඛත්තියසහස්සානි අනුයුත්තානි පරිනායකරතනපමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ.

---

දේවයන්වහන්ස, තුඹවහන්සේට සිංහසමින් වසනලද්දාවූද ව්‍යාඝ්‍ර සමින් වසනලද්දාවූද දිවිසමින් වසනලද්දාවූද පඬුවන් කම්බල වස්ත්‍රයෙන් වසනලද්දාවූද ස්වර්ණාලඞ්කාර ඇත්තාවූ ස්වර්ණධ්වජ ඇත්තාවූ රන්දැලින් වසනලද්දාවූද වෛජයන්ත රථය ප්‍රධානකොට ඇත්තාවූ මේ අසූසාරදහසක් රථයෝ වෙත්. දේවයන්වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපේක්ෂාව නොකරණු මැනවි. දේවයන්වහන්ස තුඹවහන්සේට මාණික්‍යරත්නය ප්‍රධානකොට ඇති මේ අසූසාරදහසක් මාණික්‍යයෝ වෙත්. දේවයන්වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපේක්ෂාව නොකරණු මැනවි දේවයන්වහන්ස තුඹවහන්සේට සුභද්‍රාදේවිය ප්‍රධානකොට ඇති මේ අසූසාර දහසක් ස්ත්‍රීහු වෙත්. දේවයන්වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපේක්ෂාව නොකරණු මැනවි. දේවයන්වහන්ස තුඹවහන්සේට ගෘහපතිරත්නය ප්‍රධානකොට ඇති මේ අසූසාරදහසක් ගෘහපතිහු වෙත්. දේවයන්වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපේක්ෂාව නොකරණු මැනවි. දේවයන්වහන්ස තුඹවහන්සේට අනුව යෙදුනාවූ පරිනායකරත්නය ප්‍රධානකොට මේ අසූසාර දහසක් ක්ෂත්‍රියයෝ වෙත්. දේවයන්වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපේක්ෂාව නොකරණු මැනවි. දේවයන්වහන්ස තුඹවහන්සේට දුහුලින් අතුරණලද්දාවූද රන්මුවාසැට්ට පොරවනලද්දාවූද මේ අසූසාරදහසක් ධෙනුහු වෙත්. දේවයන්වහන්සේ මෙහි ඡන්දය හරිණු මැනවි.

ජීවිතෙ අපෙක්ඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ධෙනු සහස්සානි දුකූලසන්දනානි කංසූපධාරණානි. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති වත්ථ කොටිසහස්සානි ඛොමසුඛුමානං කප්පාසික සුඛුමානං කොසෙය්‍ය සුඛුමානං කම්බලසුඛුමානං. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ථාලිපාක සහස්සානි සායපාතං භත්තාභිහාරො අභිහරීයිත්ථ. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙක්ඛං මාඅකාසි.

12 එවං වුත්තෙ ආනන්ද සුභද්දා දෙවී පරොදි. අස්සූනි පවත්තෙසි. අථ ඛො ආනන්ද සුභද්දා දෙවී අස්සූනි පමජ්ජිත්වා රාජානං මහාසුදස්සනං එතදවොච. සබ්බෙහෙව දෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො. මා ඛො ත්වං දෙව සාපෙක්ඛො කාලමකාසි.

---

ජීවිතයෙහි අපෙක්ෂාව නොකරණු මැනවි. දේවයන්වහන්ස නුඹවහන්සේට සියුම් කොමුපිළි සම්බන්ධවූද සියුම් කපුපිළි සම්බන්ධවූද සියුම් කොසෙය්‍යවස්ත්‍ර සම්බන්ධවූද මේ වස්ත්‍ර කෝටි අසූසාරදහසක් වේත්. දේවයන්වහන්සේ මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව නොකරණු මැනවි. දේවයන් වහන්ස නුඹවහන්සේට සවස උදය මෙහෙතිමවීම පිණිස යම්බතක් එලවාතබත්ද එබඳුවූ මේ අසූසාරදහසක් බත්සැල් වේත්. දේවයන් වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව නොකරණු මැනවැයි සැලකළාය.

12 ආනන්දය මෙසේ කී කල්හි සුභද්‍රාදෙවිතොමෝ හැඬූවාය. ඇසින් කඳුලු ධාරාහෙළුවාය. ඉක්බිත්තෙන් ආනන්දය සුභද්‍රාදෙවීතොමෝ කඳුලු පිසදමා මහාසුදර්ශන රජ්ජුරුවන්ට මෙසේ කීවාය. දෙවයන් වහන්ස ප්‍රියවූ මනාපවූ සියල්ලන්ගෙන් නානාභාවය වන්නේය. වෙන්වන්නාවූ සවභාවය ඇත්තේය. අන්‍යථාභාවයට යන්නාවූ සවභාව ඇත්තේය. දෙවයන් වහන්ස නුඹ වහන්සේ අපෙක්ෂා සහිතව නහමක්කාල ක්‍රියාකළ මැනවි.

දුක්ඛා සාපෙඛස්සකාලකිරියා. ගරහිතාච සාපෙඛස්ස කාලකිරියා. ඉමානි තෙ දෙව චතුරාසීති නගරසහස්සානි කුසාවතී රාජධානී පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති පාසාදසහස්සානි ධම්මපාසාද පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති කූටාගාරසහස්සානි මහාබ්‍යූහකූගාරපමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති පල්ලංක සහස්සානි සොවණ්ණමයානි රූපිමයානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි ස උත්තරච්ඡදනානි උභතො ලොහිත කූපධානි. එත්ථදෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති නාගසහස්සානි සොවණ්ණාලංකාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජ පමුඛානි.

---

අපෙක්ෂා සහිත වූවහුගේ කාලක්‍රියා තොමෝ දුක්වන්නීය. අපෙක්ෂා සහිත වූවහුගේ කාලක්‍රියා තොමෝ ගර්හිතමය. දේවයන් වහන්ස නුබවහන්සේගේ කුසවතීරාජධානිය ප්‍රමුඛවූ මේ සුවාසුදහසක් නුවරවූවෝය. දේවයන් වහන්ස මෙහි ඡන්දය හරුව. ජීවිතයෙහි අපෙක්ෂාව නොකළ මැනව. දේවයන්වහන්ස නුබවහන්සේට ධර්මප්‍රසාදය ප්‍රධානකොට ඇතිමේ අසුසාරදහසක් ප්‍රාසාදයෝවෙත්. දේවයන් වහන්ස මෙහි ඡන්දය හරිනුමැනවි. ජීවිතයෙහි අපෙක්ෂාව නොකරණු මැනවි. දේවයන් වහන්ස නුබවහන්සේට මහාබ්‍යූහකූටාගාරය ප්‍රධානකොටඇති මේ අසූසාර දහසක් කූඨගෙවල්වෙත්. දේවයන්වහන්ස නුබවහන්සේට ස්වර්ණමයවූද රිදීමයවූද දළකඩමයවූද හරමයවූද එලුලොම් ඇතිරිලි අතුරණලද්දුවූද සුදුඑලුලොම් ඇතිරි අතුරණලද්දුවූද දික්දහඇති සුදුඑලුලොම් ඇතිරි අතුරණලද්දුවූද උතුම් කෙසෙල්මුව සමින් කළ පසතුරණින්යුක්තවූද මත්තෙහි බඳනලද රත්වියන් සහිතවූද සුවාසුදහසක් පර්‍යඞ්කයෝ වෙත්. දේවයන් වහන්ස මෙහි ඡන්දයහරිනු මැනව. ජීවිතයෙහි අපෙක්ෂාව නොකළ මැනවි. දේවයන් වහන්ස ස්වර්ණාලඞ්කාරවත්වූ ස්වර්ණධජඇත්තාවූ ස්වර්ණජාලයෙන් වසනලද්දාවූ උපොසථහස්තිරාජයා ප්‍රධානකොටඇති මේ අසූසාර දහසක් හස්තීහු වෙත්.

එත්‍ථ දෙව ඡන්‍දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති අස්සසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරාජ පමුඛානි. එත්‍ථදෙව ඡන්‍දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති රථ සහස්සානි සීහචම්මපරිවාරානි ව්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්මපරි වාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණ ධජානි හෙමජාල පටිච්ඡන්නානි වෙජයන්තාරථපමුඛානි. එත්‍ථ දෙව ඡන්‍දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති මණිසහස්සානි මණිරතනපමුඛානි. එත්‍ථදෙව ඡන්‍දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ඉත්‍ථිසහස්සානි ඉත්‍ථි රතනපමුඛානි එත්‍ථ දෙව ඡන්‍දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ගහපතිසහස්සානි ගහපතිරතනපමුඛානි.

---

දේවයන් වහන්ස මෙහි ඡන්‍දයහරිනු මැනව. ජීවිතයෙහි අපෙක්‍ෂාව නොකරණු මැනවි. දෙවයන් වහන්ස නුබවහන්සේට සවණ්ණාලඞ්කාර ඇත්තාවූ සවණ්ණධජ ඇත්තාවූ රන්දැලින් වසන ලද්දාවූ වලාහක අශ්වරාජයා ප්‍රධානකොටඇති. මේ අසූසාර දහ සක් අශ්වයෝවෙත්. දේවයන් වහන්ස මෙහි ඡන්‍දයහරිනු මැනවි. ජීවිතයෙහි අපෙක්‍ෂාව නොකරණු මැනවි. දේවයන් වහන්ස නුබ වහන්සේට සිංහ සමින් වසනලද්දාවූද ව්‍යාඝ්‍ර සමින් වසනලද්දාවූද දිවි සමින් වසලද්දාවූ ද පඬුවන් කම්බිලවස්ත්‍රයෙන් වසනලද්දාවූද සවණ්ණා ලඞ්කාර ඇත්තාවූ සවණ්ණධජඇත්තාවූ රන්දැලින් වසනලද්දාවූ වෛජයන්තරථය ප්‍රධානකොට ඇත්තාවූ මේ අසූහාරදහසක් රථයෝ වෙත්. දේවයන් වහන්ස නුබවහන්සේ මෙහි ඡන්‍දය හරිනු මැනවි. ජීවිතයෙහි අපෙක්‍ෂාව නොරකණු මැනවි. දේවයන්වහන්ස සුභද්‍රා දේවිය ප්‍රධානකොටඇති මේ අසූසාරදහසක් ස්ත්‍රීහුවෙත්, දේවයන් වහන්ස මෙහි ඡන්‍දය හරිණු මැනවි. ජීවිතයෙහි අපෙක්‍ෂාව නොකරණු මැනවි. දේවයන් වහන්ස නුබවහන්සේට ගෘහපතිරත්නය ප්‍රධානකොටඇති මේ අසූසාර දහසක් ගෘහපතිහුවෙත්.

එත්ථ දෙව ඡන්දං පජහ ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිඛත්තියසහස්සානි අනුයුත්තානි පරිනායකරතනපමුඛානි එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ධෙනුසහස්සානි දුකූලසන්දනානි කංසූපධාරණානි. එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති වත්ථ කොටිසහස්සානි ඛොමසුඛුමානං කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං එත්ථ දෙව ඡන්දං පජහ. ජීවිතෙ අපෙඛං මාඅකාසි. ඉමානි තෙ දෙව චතුරාසීති ථාලිපාකසහස්සානි සායපාතං භත්තාභිහාරො අභිහරීයන්ති. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙඛං මාඅකාසි.

13 අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො න චිරස්සෙව කාලමකාසි.

---

දේවයන්වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපෙක්‍ෂාව නොකරණු මැනවි. දේවයන් වහන්ස තුඹවහන්සේට අනුවයෙදුනාවූපරිනායකරත්නය ප්‍රධානකොටඇති මේ අසූසාර දහසක් කුලපුත්‍රයෝවෙත්. දේවයන් වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපෙක්‍ෂාව නොකරණු මැනවි. දේවයන් වහන්ස තුඹවහන්සේට දුහුලින් අතුරණලද්දාවූ රන් මුවාසැට්ට පොරවනලද්දාවූ මේ අසූසාර දහසක් ධෙනුහුවෙත්. දේවයන් වහන්ස මෙහි ඡන්දය හරිණුමැනවි. අපෙක්‍ෂාව නොකරණු මැනවි. දේවයන් වහන්ස සියුම් කොමුපිළි සම්බන්ධවූද සියුම් කපුපිළි සම්බන්ධවූද සියුම් කොසාය්‍යවස්ත්‍ර සම්බන්ධවූද මේ වස්ත්‍ර කොටිඅසූසාර දහසක්වෙත්. දේවයන් වහන්සේ මෙහි ඡන්දය හරිනු මැනවි. ජීවිතයෙහි අපෙක්‍ෂාව නොකරණු මැනවි. දේවයන් වහන්ස තුඹවහන්සේට සවස උදය මෙහෙනිමවීම පිණිස යම් බතක් එලවාතබත්ද එබඳුවූ ඒඅසූසාර දහසක් බත්සැල්වෙත්. දේවයන් වහන්ස මෙහි ඡන්දය හරිණු මැනවි. ජීවිතයෙහි අපෙක්‍ෂාව නොකරණු මැනවැයි සැලකළාය.

13 ඉක්බිත්තෙන් ආනන්දය මහාසුදශ්ශන රජතෙම නොබෝකලකින්ම කාලක්‍රියා කළේය.

සෙය්‍යථාපි ආනන්ද ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා මනුඤ්ඤං භොජනං භුත්තාවිස්ස භත්තසම්මදො හොති, එවමෙව ඛො රඤ්ඤො මහාසුදස්සනස්ස මාරණන්තිකා වෙදනා අහොසි. කාලකතො චානන්ද රාජා මහාසුදස්සනො සුගතිං බ්‍රහ්මලොකං උපපජ්ජි. රාජා ආනන්ද මහාසුදස්සනො චතුරාසීති වස්සසහස්සානි කුමාරකීළිකං කීළි. චතුරාසීති වස්සසහස්සානි ඔපරජ්ජං කාරෙසි, චතුරාසීති වස්සසහස්සානි ගිහිභූතො ධම්මෙ පාසාදෙ බ්‍රහ්මචරියං චරි සො චත්තාරො බ්‍රහ්මවිහාරෙ භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මලොකූපගො අහොසි.

14. සියාඛො පන තෙ ආනන්ද එවමස්ස. අඤ්ඤො නූන තෙන සමයෙන රාජා මහාසුදස්සනො අහොසීති. න ඛො පනෙතං ආනන්ද එවං දට්ඨබ්බං. අහං තෙන සමයෙන රාජා මහාසුදස්සනො අහොසිං.

---

ආනන්දය යම්සේ මනොඥවූ භෝජනයක් අනුභවකළාවූ ගෘහපතියෙකුට හෝ ගෘහපතිපුත්‍රයෙකුටහෝ යම්සේ භුක්තාලස්‍යයවේද එපරිද්දෙන්ම ආනන්දය මහාසුදර්ශනරජහට මරණාන්තික වේදනාව වූයේය. ආනන්දයකාලක්‍රියාකළාවූමහාසුදර්ශනරජතෙම සොභනගති ඇතිහෙයින් සුගතිනම්වූ බ්‍රහ්මලොකයෙහි උපන්නේය. ආනන්දය මහාසුදර්ශන රජතෙම සුවාසූ දහසක් හවුරුදු කුමාර ක්‍රීඩා කළේය. සුවාසූ දහසක් හවුරුදු යුවරජය කරවිය, සුවාසූ දහසක් හවුරුදු සතරමහද්වීපයට අධිපතිවූ චක්‍රවර්තිරාජ්‍යයකරවිය. සුවාසූ දහසක් හවුරුදු ගෘහස්ථභාවයෙහි සිටියේම. ධර්මප්‍රසාදයෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවකළේය. ඒ රජතෙම සතරබ්‍රහ්මවිහරණය වඩා කාබුන් මරණින්මතු බඹලොවඋපන්නේය.

14. ආනන්දය, ඒසමයෙහිදී එකාන්තයෙන් අනිකෙනෙක් මහාසුදර්ශනරජවූයේයයි කියා තට මෙබඳුසිතක්වන්නේද, ආනන්දය, ඒ කාරණය එසේ නොදැක්ක යුතුය, මම ඒසමයෙහිදී මහාසුදර්ශනරජ විම්වදැලසේක.

තෙසං ඛො පනානන්ද චතුරාසීති නාගසහස්සානං එකො යෙව සො නාගො හොති යෙනාහං සමයෙන අභිරූහාමි යදිදං උපොසථො නාගරාජා. තෙසං ඛො පනානන්ද චතුරාසීති අස්සසහස්සානං එකො යෙව සො අස්සො හොති යෙනාහං සමයෙන අභිරූහාමි යදිදං වලාහකො අස්සරාජා. තෙසං ඛො පනානන්ද චතුරාසීති රථසහස්සානං එකො යෙව සො රථො හොති යෙනාහං සමයෙන අභිරූහාමි යදිදං වෙජයන්තරථො. තෙසං ඛො පනානන්ද චතුරාසීති ඉත්ථි සහස්සානං එකායෙව සා ඉත්ථි හොති. යෙනාහං සමයෙන පච්චුපට්ඨාති ඛත්තියානි වා වෙස්සාවා. තෙසං ඛො පනානන්ද චතුරාසීති වත්ථකොටි සහස්සානං එකං යෙව තං දුස්සයුගං හොති යෙනාහං සමයෙන පරිදහාමි. ඛොමසුඛුමං වා කප්පාසිකසුඛුමං වා කොසෙය්‍යසුඛුමං වා කම්බලසුඛුමං වා. තෙසං ඛො පනානන්ද චතුරාසීති ථාලිපාකසහස්සානං එකො යෙව සො ථාලිපාකො හොති යතො නාලිකොදනපරමං භුඤ්ජාමි තදූපියඤ්ච සූපෙය්‍යං.

---

ආනන්දය, ඒ සූවාසූදහසක් හස්තීන් සම්බන්ධවූ යම් ඒ අසහාය වූ හස්තියෙක්වේද එසමයෙහි යම් උපොසථ හස්තිරාජයෙක් වේද ඔහුම වාහනකොට ඇත්තෙමි. ආනන්දය, ඒ සූවාසූදහසක් අශ්වයන් සම්බන්ධවූ යම් ඒ අතුල්‍යවූ අශ්වයෙක්වේද ඒ සමයෙහිදී යම් ඒ වලාහක අශ්වරාජයෙක්වූයේද ඔහුම වාහනකොට ඇත්තෙමි. ආනන්දය, ඒ සූවාසූදහසක් රථයන් සම්බන්ධවූ යම් ඒ එකම රථයෙක් වේද ඒ සමයෙහි යම් ඒ වෛජයන්ත රථය වන්නේද ඒ රථයම වාහනකොට ඇත්තෙමි. ආනන්දය, ඒ සූවාසූදහසක් ස්ත්‍රීන් සම්බන්ධවූ යම් ඒ එකම ස්ත්‍රියෙක්වේද එසමයෙහි ක්ෂත්‍රියවූ හෝ වෛශ්‍යවූ හෝ ඕ තොමෝ මට උපස්ථායිව සිටින්නීය. ආනන්දය, ඒ සූවාසූදහසක් වස්ත්‍ර කෝටි සම්බන්ධවූ යම් ඒ එකම පිළිසනලෙක් වේද ඒ සමයෙහි කොමු පිළියෙන් සියුම්වූ හෝ කපු පිළියෙන් සියුම්වූ හෝ කොසෙය්‍ය වස්ත්‍රයෙන් සියුම්වූ හෝ කම්බල වස්ත්‍රයෙන් සියුම්වූ හෝ ඒ පිළිසඟල හඳිනෙමි. ආනන්දය, ඒ සූවාසූදහසක් ථාලිපාක සම්බන්ධවූ යම් එකම බත් සැලෙක්විද යම්හෙයකින් නැලියක් පමණ ආහර පරමකොට ඇති එය එපමණ සූපව්‍යඤ්ජන සහිතව අනුභව කෙරෙමි.

16. පස්සානන්ද සබ්බෙ තෙ සංඛාරා අතීතා නිරුද්ධා විපරිණතා. එවං අනිච්චා ඛො අනන්ද සංඛාරා, එවං අද්ධුවා ඛො ආනන්ද සංඛාරා, එවං අනස්සාසිකා ඛො අනන්ද සංඛාර සාවඤ්චිදං ආනන්ද අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං.

17. ජානාමි ඛො පනාහං ආනන්ද අභිජානාමි ඉමස්මිං පදෙසෙ සරීරං නික්ඛිපිතං. තඤ්ච ඛො රාජා ච සමානො චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. අයං සත්තමො සරීරනික්ඛෙපො. න ඛො පනාහං ආනන්ද තං පදෙසං සමනුපස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යත්ථ තථාගතො අට්ඨමං සරීරං නික්ඛිපෙය්‍යාති.

---

16. ආනන්දය සංස්කාරයන්ගේ අනිත්‍යතාවබලව. සියලුම ඒසංස්කාරධර්මයෝ ඉකුත්වූවාහ. නිරුද්ධවූවාහ. පෙරළිම ස්වභාවකොට ඇත්තාහ. ආනන්දය මෙසේ සංස්කාරයෝ. නිත්‍යනොවන්නාහුමය. ආනන්දය මෙසේ සියලුම සංස්කාරයෝ ස්ථිර නොවන්නාහුමය. ආනන්දය මෙසේ සියළුම සංස්කාරයෝ ආශ්වාසයක් නැත්තාහුමය. ආනන්දය යම් මේ සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි නිර්වේදය කරන්ට හෙවත් කලකිරෙන්ට සුදුසු වන්නේමය. විරාග කරන්නට හෙවත් නොඇලෙන්නට සුදුසු වන්නේමය. මිදෙන්ට සුදුසු වන්නේමය.

17. ආනන්දය මම මේ ප්‍රදේශයෙහි සවරක් ම ශරීර නික්ෂෙපය කළ බව දනිමි. හෙදවනාහී ධාර්මිකවූ ධර්මරාජන්වූ චක්‍රවර්තිය කෙළවර කොට ඇති සතර මහත් දිශාව ජයගන්නාවූ ඉන්ද්‍රබිලයක් මෙන් ජනපදයන්හි ස්ථිරභාවයට පැමිණියාවූ සප්තවිධරත්නයෙන් සමන්විතවූ සක්විතිරජමවූයේමවෙයි. මේ සත්වෙනි සරීරනික්ෂෙපය වන්නේය. ආනන්දය දෙවියන්සහිතවූ මරුන්සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ශ්‍රමණබ්‍රාහ්මණ පඬිත්සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ ලොකයෙහි යම් තැනෙක්හි තථාගතතෙම අටවැනිකොට ශරීරනික්ෂෙපය කරන්නේ නම්. එබඳුවූ ප්‍රදෙසයක් මම නොම දක්නෙමියි වදාළසේක.

ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

අනිච්චා වත සංඛාරා
උප්පාදවය ධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති
තෙසං වූපසමො සුඛොති.

ම හා සු ද ස්ස න සු ත්තං
නිට්ඨිතං සත්තදසමං.

---

රාගවෙෂාදි සකලකෙලෙසුන් භග්නකළ හෙයින්ද චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් සත්‍යඥාන කෘත්‍යඥානාදි වශයෙන් විභාගකළ හෙයින්දයනා දී නානා අර්ථයෙන් භගවත් නම්වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජොත්තම යානන් වහන්සේ බොධිසත්ව භූමියෙහි කළාවූ චක්‍රවර්ති රාජ සම්පත්තියද කුසිනාරා නුවර බුදුන්ගේ පිරිනිවන් පෑමට නියත භූමියක් බවද ප්‍රකාශකොට වදළාවූ මේ මහා සුදර්ශන සූත්‍රාන්ත ධර්මය දෙශනාකර වදළසේක. මේ සූත්‍රය මෙසේ වදාරා එහින් මත්තෙහි සොභනගති ඇතිහෙයින් සුගතනම්වූ සංසාර කාන්තාරයෙන් සත්වයන් තරණයකළ හෙයින් ශාස්තෘනම්වූ සර්වඥයන් වහන්සේ මෙය මෙසේ වදළසේක. ඉපිද නැසෙන සුලුවූ සංස්කාර ධර්මයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඉපද නිරුද්ධවෙත්. ඔවුන්ගේ ව්‍යුප සමනයතෙම ශක්‍රසම්පත් බ්‍රහ්ම සම්පත් ආදී දිව්‍ය සම්පත්තියද චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ආදී මනුෂ්‍ය සම්පත්තියද යන ලෞකික සම්පත්තිය නිස්සාර බවද ක්ලේශයන්ගේ ව්‍යුපසමනය නිරිවෙන් තෘෂ්ණාහුගේසිඳීමයි කියනලද ලොකොත්තර නිර්වාණ සම්පත්තියම සැපයයි වදළසේක.

සත්ලොස්වෙනිවූ මහාසුදර්ශන සූත්‍රාර්ථව්‍යාඛ්‍යාව
මෙතෙකින් නිමියේයි.

---

## xviii. ජනවසභ සුත්තං.

1. එවමෙමෙ සුතං. එකං සමයං භගවා නාදිකෙ විහරති ගිඤ්ජකාවසථෙ. තෙන ඛො පන සමයෙන භගවා පරිතො පරිතො ජනපදෙසු පරිචාරකෙ අබ්භතීතෙ කාලඞ්කතෙ උපපත්තීසු ව්‍යාකරොති. කාසිකොසලෙසු වජ්ජිමල්ලෙසු චෙතිවංසෙසු කුරුපඤ්චාලෙසු මච්ඡසූරසෙනෙසු අසු අමුත්‍ර උපපන්නො අසු අමුත්‍ර උපපන්නො. පරෙ පඤ්ඤාස නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලඞ්කතා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්‍ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා. සාධිකනවුති නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලඞ්කතා.

---

## ජනවසභ සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යා.

1. මේ සූත්‍රධර්මය මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ නාදික නම් ගමෙහි ගිඤ්ජකාවසථ නම් විහාරයෙහි වාසයකරණසේක. ඒ කාලයෙහිදී භාග්‍යවතුන්වහන්සේ නාදිකගමට හාත්පස හාත්පස දනව්හි සම්ප ඉකුත්කල්හි කළුරියකළාවූ බුද්ධ ධර්ම සඞ්ඝ යන රත්නත්‍රයෙහි ප්‍රසන්නවූ උපාසකයන් උත්පත්තීන්ගේ වශයෙන් හෙවත් උත්පත්තිස්ථාන වශයෙන් ප්‍රකාශකරණසේක. කවරනම් හාත්පස දනව්හිදැයත්, වජ්ජිමල්ල දනව්හිද, චෙතිවංස දනව්හිද, කුරුපඤ්චාල දනව්හිද, මච්ඡසූරසෙන දනව්හිද, මෙන්. අසවල් නම් ඇති උවසුතෙමේ අසවල්තන්හි උපන්නේය. අසවල් නම් ඇති උවසුතෙමේ අසවල් තන්හි උපන්නේය සම්ප ඉකුත්කල්හි කළුරියකළාවූ නාදික ගමෙහිවිසූ උවසුවෝ පණසකට වැඩිවෙත්. ඒ රත්නත්‍රය මාමක උපාසකයෝ ඔරම්භාගිය සංයොජනයන් පස්දෙනාගේ ක්ෂයකිරීමෙන් ඖපපාතිකවූවෝ ඒ බඹතලයෙහිදීම පිරිනිවන්පානා ස්වභාව ඇත්තෝ ඒ ශුද්ධාවාස බ්‍රහ්මලොකයෙන් ආවර්ත්තන ස්වභාව නැත්තෝ හෙවත් පුනරුත්පත්තියට පැමිණෙන ස්වභාව ඇත්තෝ නොවෙත්. සම්ප ඉකුත්කල්හි කළුරියකළාවූ නාදික නම් ගම්වැසි උපාසකයෝ අනූවකට වැඩිවෙත්.

තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො. සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. සාතිරෙකානි පඤ්චසතානි නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා. තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායනාති.

2. අස්සොසුං ඛො නාදිකියා පරිචාරකා භගවා කිර පරිතො පරිතො ජනපදෙසු පරිචාරකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තීසු ව්‍යාකරොති කාසිකොසලෙසු වජ්ජිමල්ලෙසු චෙතිවංසෙසු කුරුපඤ්චාලෙසු මච්ඡසූරසෙනෙසු. අසු අමුත්‍ර උප්පන්නො අසු අමුත්‍ර උප්පන්නො පරොපඤ්ඤාස නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා.

---

ඔව්හු සත්කායදෘෂ්ටි ආදි ත්‍රිවිධ සංයෝජනයන්ගේ ක්ෂයකිරීමෙන් රාග ද්වෙෂ මොහයන්ගේ තුනී බැවින් සකෘදාගාමි ආර්‍ය්‍යපුද්ගලයෝ වෙත්. ඔව්හු එකවරක්ම මේ ලොකයට උත්පත්ති වශයෙන් අවුත් සංසාරික දුඃඛයාගේ කෙළවරකරන්නාහුය. සමීප ඉකුත්කල්හි කලුරියකළාවූ නාදික ගම්වැසි උවසුවෝ පන්සියයකටද වැඩිවෙත්, ඔව්හු සක්කායදෘෂ්ටි ආදී ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්ෂයකිරීමෙන් ශ්‍රොතආපන්න ආර්‍ය්‍ය පුද්ගලයෝ වෙත්. ඔව්හු විනිපාතස්වභාව හෙවත් භවදුඃඛයට පෙරළෙන ස්වභාව ඇත්තෝ නොවෙත්. චතුස්සත්‍යාවබොධය නියතකොට ඇත්තාහු වෙත්. සම්‍යක්සම්බොධිය පිහිට කොට ඇත්තෝ වෙත්යයි වදාළසේක.

2. නාදික ගම්වැසි උවසුවෝ මේ කාරණ ඇසුවාහුය. ඒ නම්, භාග්‍යවතුන් වහන්සේ හාත්පස හාත්පස දන්වහිවූ සමීප ඉකුත් කල්හි කලුරිය කළාවූ උවසුවන් උපත්ති වශයෙන් ප්‍රකාශකරණසේක. කවර හාත්පස දනව්හිද, කාසි කොසල දනව්හිද වජ්ජි මල්ල දනව්හිද චෙති වංස දනව්හිද කුරුපඤ්චාල දනව්හිද මච්ඡ සූරසෙන දනව්හිද යන නාදිකගමට හාත්පසවූ ප්‍රදෙසයන්හිසි. කෙසේ ප්‍රකාශ කෙරේදයත්, අසවල් නම් ඇති උවසුතෙම අසවල් තන්හි උපන්නේය. අසවල් නම්ඇති උවසුතෙම අසවල් තන්හි උපන්නේය. සමීපවූ ඉකුත් කල කලුරියකළාවූ නාදික ගම්වැසි උවසුවෝ පණසකට වැඩිවෙත්

පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්ති ධම්මා තස්මා ලොකා. සාධික නවුති නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො. සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. සාතිරෙකානි පඤ්ඤාසතානි නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාත ධම්මා නියතා සම්බොධිපරායනාති. තෙනච නාදිකියා පරිචාරකා අත්තමනා අහෙසුං පමුදිතා පීතිසොමනස්සජාතා භගවතො පඤ්හ. වෙය්‍යාකරණං සුත්වා.

---

ඔව්හු ඔරම්භාගිය සංයොජනයන් පස්දෙනාගේ ක්‍ෂයකිරීමෙන් ඔපපාතිකවූවෝ ඒ සුද්ධාවාස බඹතෙලෙහිදීම පිරිනිවන්පානා ස්වභාව ඇත්තෝවෙත්. ඒ ශුද්ධාවාස බ්‍රහ්ම තලයෙන් ආවර්තීන ස්වභාව ඇත්තෝ හෙවත් පුනරුපත්තියට නොපැමිණෙන සවභාව ඇත්තෝ/ වෙත්. සම්පවූ ඉකුත් කල්හි කලුරිය කළාවූ නාදික ගම්වැසි උවසුවෝ අනූවකට වැඩිවෙත්. ඔව්හු ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්‍ෂය කිරීමෙන් රාගද්වෙෂ මොහයන්ගේ තුනීබැවින් සකෘදාගාමී ආය්‍ය්‍ර පුද්ගලවෙත්. ඔව්හුඑකවරක්මමෙලොවට උත්පත්ති වශයෙන්පැමිණ සංසාරිකදුඃඛයාගේ කෙළවර කරන්නාහුය. සම්පවූ ඉකුත් කල්හි කලුරිය කළාවූ නාදික ගම්වැසි උවසුවෝ පන්සියකට වැඩිවෙත්. ඔව්හුත්‍රිවිධ සංයොජනයන්ගේ ක්‍ෂයකිරීමෙන් ශ්‍රොත ආපන්න ආය්‍ය්‍ර පුද්ගලවෙත්. විනිපාත සවභාව හෙවත් භවදුඃඛයට පෙරළෙන සවභාව ඇත්තෝ නොවෙත්. චතුස්සත්‍යාව බොධය නියත කොට ඇත්තාහ. සම්‍යක් සම්බොධිය පිහිටකොට ඇත්තෝවූහයි කියායි. භාග්‍ය වතුන්වහන්සේගේ මේ ප්‍රශ්න විසඳීම අසා නාදික ගම්වැසි උවසුවෝ ඒ අනාගාමි භාවාදී උත්තම කාරණයෙන් සතුටු සිත් ඇත්තෝ ප්‍රමුදිතසිත් ඇත්තෝ හටගත් ප්‍රීතිභා සොම්නස් ඇත්තෝවූහ.

3. අසෙසාසිඛො ආයස්මා ආනන්‍දො භගවා කිර පරිතො පරිතො ජනපදෙසු පරිචාරකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තීසු ව්‍යාක රොති. කාසිකොසලෙසු වජ්ජිමල්ලෙසු චෙතිවංසෙසු කුරුපඤ්චා ලෙසු මච්ඡසූරසෙනෙසු' අසු අමුත්‍ර උපපන්නො අසුඅමුත්‍ර උපපන් නො. පරොපඤ්ඤාස නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකා, තත්‍ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා. සාධික න වුති නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා තිණ්ණං සඤ්ඤො ජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති.

---

3. ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ මේකාරණය ඇසුයේමය. එනම් භාග්‍යවතුන්වහන්සේ නාදිකගමට හාත්පස හාත්පස දන ව්හි සම්පවූ ඉකුත්කල්හි කලුරියකළාවූ රත්නත්‍රයෙහි ප්‍රසන්නවූ උපාසකයන් උත්පත්තින්ගේවශයෙන් හෙවත් උත්පත්තිස්ථානවශ යෙන් ප්‍රකාශකරණසේක. කවරනම් හාත්පස දනව්හිදයත්. වජ්ජි මල්ලදනව්හිද චෙතිවංශදනව්හිද කුරුපඤ්චාල දනව්හිද මච්ඡසූර සෙන දනව්හිද වෙත්. අසවල්නම්ඇති උවසුතෙමේ අසවල්තැනෙ ක්හි උපන්නේය, අසවල්නම්ඇති උවසුතෙමේ අසවල්තන්හි උපන් නේය. ඉකුත්කල්හි කලුරියකළාවූ නාදිකගමෙහි විසු උපාසකයෝ පණසකටවැඩිවෙත්. ඒ උපාසකයෝ ඔරම්භාගීය සංයොජනයන් පස්දෙනාගේ ක්ෂයකිරීමෙන් ඕපපාතිකවූවෝ ඒ සුදවැසී බඹතල යෙහිදීම පිරිනිවන්පානා සවභාවඇත්තෝ ඒශුද්ධාවාස බ්‍රහ්මලොක යෙන් ආවත්තිනස්වභාව නැත්තෝ හෙවත් පුනරුත්පත්තියට පැමි ණෙන සවභාව නැත්තෝවෙත්, සම්පවූ ඉකුත්කල්හි කලුරිය කළාවූ නාදිකගම්වැසි උවසුවෝ අනූවකටවැඩිවෙත්. ඔව්හු සත් කාය දෘෂ්ටිආදි ත්‍රිවිධසංයොජනයන්ගේ ක්ෂයකිරීමෙන් රාගද්වේෂ මොහයන්ගේ තුණීබැවින් සකෘදගාමී ආර්‍ය්‍යපුද්ගල වෙත්. ඔව්හු එක්වරක්ම මේලොකයට උත්පත්තිවශයෙන් අවුත් සසරදුක් කෙ ළවර කරන්නාහුය.

සාතිරෙකානි පඤ්චසතානි නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායනානි. තෙනව නාදිකියා පරිචාරකා අත්තමනා අහෙසුං පමුදිතා පීතිසොමනස්ස ජාතා භගවතො පඤ්හ වෙය්‍යාකරණං සුත්වානි.

4. අථඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි. ඉමෙඛො පනපි අහෙසුං මාගධකා පරිචාරකා බහුචෙව රත්තඤ්ඤූච අබ්භතීතා කාලකතා. සුඤ්ඤා මඤ්ඤෙ අඞ්ගමාගධා මාගධකෙහි පරිචාරකෙහි අබ්භතීතෙහි කාලකතෙහි. තෙ ඛො පනපි අහෙසුං බුද්ධෙ පසන්නා ධම්මෙ පසන්නා.

---

ඉකුත්කල්හි කලුරියකළාවූ නාදික ගම්වැසි උවසුවෝ පන්සියය කට වැඩිවෙත්. ඔව්හු සක්කායදෘෂ්ටිආදි ත්‍රිවිධ සංයෝජන යන්ගේ ක්ෂයකිරීමෙන් ශ්‍රොතආපන්න ආර්‍ය්‍යපුද්ගල වෙත්. ඔව්හු විනිපාත ස්වභාව හෙවත් භවදුඃඛයට පෙර ලෙන ස්වභාව ඇත්තෝ නොවෙත්, චතුසත්‍යාවබොධය නියතකොට ඇත්තෝවෙත්. සම්‍යක්සම්බොධිය පිහිටකොට ඇත්තෝ වෙත්ය කියායි. භාග්‍යවතුන්වහන්සේගේ ඒපැණ විසඳීම අසා ඒඅනාගාමිතාදි උත්තම කාරණයෙන් නාදිකගම්වැසි උවසුවෝ සතුටුසිත් ඇත්තෝ ප්‍රමුදිත සිත්ඇත්තෝ හටගත් ප්‍රීතිහා සොම්නස් ඇත්තෝ විලු යනුයි.

4. එකල්හි ආනන්ද ආයුෂතුන්වහන්සේට මේ අදහස වූයේය. සම්පවූ ඉකුත් කල්හි කලුරිය කළාවූ මේ මගධ ජනදවාසීවූ උවසුවෝ බොහෝවූහ. චිරරාත්‍රිදන්නොදවූහ. ඉකුත්වූ සමීපකාලයෙහි ක්‍රියාකළාවූ මගධජන පදවාසී උපාසකයන්ගෙන් අඟුමගධ දෙරට වැස්සෝ සූන්‍යයහයි සිතමි. මේ අඟුමගධ දෙරට වැසි උවසුවෝද බුදුන්කෙරෙහි ප්‍රසන්න වෙත්. ධර්‍මය කෙරෙහි ප්‍රසන්නවෙත්.

සඞෙඝ පසන්නා සීලෙසු පරිපූරකාරිනො, තෙ අබ්භතීතා කාල කතා භගවතා. අව්‍යාකතා තෙසම්පස්ස සාධු වෙය්‍යාකරණං බහුජනො පසීදෙය්‍ය. තතො ගච්ඡෙය්‍ය සුගතිං, අයං ඛො පනාපි අහොසි රාජා මාගධො සෙනියො බිම්බිසාරො ධම්මිකො ධම්මරාජා හිතො බ්‍රාහ්මණගහපතිකානං නෙගමානඤ්චෙව ජාන පදානඤ්ච. අපිස්සුදං මනුස්සා කිත්තයමානරූපා විහරන්ති. එවං නො සො ධම්මිකො ධම්මරාජා සුඛාපෙත්වා කාලකතො, එවමයං තස්ස ධම්මිකස්ස ධම්මරඤ්ඤො විජිතෙ ඵාසු විහරිම්හාති. සොඛො පනාපි අහොසි බුද්ධෙ පසන්නො ධම්මෙ පසන්නො සඞ්ඝෙ පසන්නො සීලෙසු පරිපූරකාරී. අපිස්සුදං මනුස්සා එවමාහංසු. යාව මරණකා ලාපි රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවන්තං කිත්තයමා නරූපො කාලකතොති.

---

සඞ්ඝයා කෙරෙහි ප්‍රසන්නවෙත්' චතුපාරිසුද්ධිශීලවිෂයෙහි ඒ සිල යන් සම්පූර්ණ කරන්නෝවෙත්; සම්පවූ ඉකුත්කල්හි කලුරිය කළා වූ ඒ උවසුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරණලද් දහුය. ඒ උපාසකයන්ගේද යහපත් විසඳීමක්වන්නේ නම් මහ ජනතෙමේ පහදින්නේය, ඒ පැහදීම හෙතුකොටගෙණ සුගතියට යන්නේය. තවද මගධජනපදාධිපතිවූ සෙනා ඇත්තාවූ මේ බිම්බි සාර රජ තෙමේද ධාර්මික වෙයි. ධර්මයෙන් ජනයන් රඤ්ජනය කරන්නේවෙයි. බමුණු ගැහැවියන්ටද නියමගම් වැස්සන්ට සහ දනව් වැස්සන්ටද වැඩ කැමැත්තේය. තවද මනුෂ්‍යයෝ මේ කාර ණය වර්ණනා කරමින් වාසය කෙරෙත්. ධාර්මිකවූ ඒ ධර්මරාජන් තෙමේ අප මෙසේ සැපයට පමුණුවා කලුරිය කෙළේය. මෙසේ අපිධාර්මිකවූ ඒ ධර්මරාජන්හුගේ විජිතයෙහි පහසුසේ වාසය කෙළෙ මුය, කියායි. ඒ මගධෙශ්වර බිම්බිසාර රජතෙමේද බුදුන් කෙරෙහි පහන්වූයේය, ධර්මයෙහි ප්‍රසන්නවූයේය සඞ්ඝයා කෙරෙහි ප්‍රසන්න වූයේය. චතුපාරිසුද්ධිශීලයන් සම්පූර්ණ කරන්නෙක් වූයේය. තවද මිනිස්සු මෙසේ කීහ. මරණ කාලයදක්වාද මගධෙශ්වරවූ සේනා ඇත්තාවූ බිම්බිසාර රජතෙම භාග්‍යවතුන්වහන්සේගේ ගුණවර්ණ නාකරන්නෙක්වූයේම කලුරිය කළේය.

සො අබ්භතීතො කාලකතො භගවතා අව්‍යාකතො. තස්ස පස්ස සාධු වෙය්‍යාකරණං. බහුජනො පසීදෙය්‍ය, තතො ගච්ඡෙය්‍ය සුගතිං භගවතො බොපන සම්බොධි මගධෙසු. යත්‍ථබො පන භගවතො සම්බොධි මගධෙසු. කථං තත්‍ථ භගවා මාගධකෙ පරිචාරකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තිසු න ව්‍යාකරෙය්‍ය, භගවාචෙබොපන මාගධකෙ පරිචාරකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තිසු න ව්‍යකරෙය්‍ය දීනමනා තෙනස්සු මාගධකා පරිචාරකා යෙනබොපනස්සු දිනමනා මාගධකා පරිචාරකා කථං තං භගවා න ව්‍යාකරෙය්‍යාති.

5. ඉදමා යසමා ආනන්‍දො මාගධකෙ පරිචාරකෙ ආරබ්භ එකො

---

සම්පවූ ඉකුත් කල්හි කලුරිය කළාවූ ඒ බිම්බිසාර රජ තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශනොකරණ ලද්දේය. ඒ බිම්බිසාර මහරජ පිළිබඳවත් යහපත් ප්‍රකාශ කිරීමක් වන්නේ නම් මහා ජනතෙමේ පහදින්නේය. ඒ හෙතුකොටගෙණ සුගතියට යන්නේය. භාග්‍යවතුන්වහන්සේගේ සම්‍යක් සම්බොධියවූ කලි මගධ දනව්හිවූයේය. භාග්‍යවතුන්වහන්සේගේ සම්‍යක් සම්බොධිය මගධ දනව්හි යම් පෙදෙසෙක්හිදී වූයේද. භාග්‍යවතුන් වහන්සේ ඒ පෙදෙසෙහි මගධ දනව් වාසිවූ සම්ප ඉකුත්කල්හි කලුරිය කළාවූ උවසුවන් උත්පත්ති වශයෙන් හෙවත් උත්පත්තිස්ථාන වශයෙන් කෙසේ නම් ප්‍රකාශ නොකරන්නේද ඉදින් භාග්‍යවතුන් වහන්සේ සම්පවූ ඉකුත් කල්හි කලුරිය කළාවූ මගධ දනව් වැසි උපාසකයන් උත්පත්තිස්ථාන වශයෙන් ප්‍රකාශ [illegible] නොකරන්නේද ඒ කරණකොටගෙණ මගධ දනව් වැසි උවසුවෝ බැගැපත්සිත් ඇත [illegible] වන්නාහ. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය කෙසේ නම් ප්‍රකාශ නොකරන්නේදැයි කියායි.

5. ආනන්‍ද ආ්යුෂ්මතුන්වහන්සේ මගධ ජනපද වාසීවූ රත්නත්‍රය මාමක උපාසකයන් අරබයා මේ කාරණය හුදකලාවූයේක්.

රහො අනුවිචින්තෙන්තො රත්‍යා පච්චූසසමයං පච්චුට්ඨාය යෙන
භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එක
මන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භග
වන්තං එතදවොච. සුතං මෙතං භන්තෙ භගවා කිර පරිතො
පරිතො ජනපදෙසු පරිචාරකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තීසු
ව්‍යාකරොති කාසිකොසලෙසු වජ්ජිමල්ලෙසු චෙතිවංසෙසු කුරුපඤ්චා
ලෙසු මච්ඡසූරසෙනෙසු. අසු අමුත්‍ර උපපන්නො අසු අමුත්‍ර උපප
න්නො, පරොපඤ්ඤාස නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා
පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකා
තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා.

---

රහසිගතව නැවත නැවත සිතාවදුරු රැය පිළිබඳ අළුයම් කාලයෙහි
නැගිට භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතනට එළඹියේය.
එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්නේය.
එකත්පසෙක උන්නාවූ ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ භාග්‍ය
වතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. ස්වාමින්වහන්ස මා
විසින් මේ මතු කියනුලබන කාරණය අසනලද්දේය. ඒනම්–භාග්‍ය
වතුන්වහන්සේ නාදිකගමට හාත්පස හාත්පස දනව්හිවූ සම්ප
ඉකුත් කල්හි කළුරියකළාවූ උපාසකයන් උත්පත්ති වශයෙන්
හෙවත් උත්පත්තිස්ථාන වශයෙන් ප්‍රකාශකෙරෙයි. කවර දනව්හිද
යත්, කාසිකොසල දනව්හිද වජ්ජිමල්ල දනව්හිද චෙතිවංශ දනව්හිද
කුරුපඤ්චාල දනව්හිද මච්ඡසූරසෙන දනව්හිද වෙත්. අසවල්නම්
උවසුතෙමේ අසවල් තැන්හි උපන්නේය. අසවල්නම් තැනැත්
අසවල් තන්හි උපන්නේය. සම්පවූ
කල්හි කළුරියකළාවූ
නාදික ගමෙහි උපන් වූ රත්නත්‍රය මාමක උපාසකයෝ පණසකට
වැඩිවෙත්. ඔව්හු ඔරම්භාගීය සංයොජනයන් පස්දෙනාගේ ක්ෂය
කිරීමෙන් ඔපපාතිකවූවෝ ඒ බඹතෙලෙහිදීම පිරිනිවන්පානා
ස්වභාව ඇත්තෝ වෙත්. ඒ ශුද්ධාවාස බ්‍රහ්මලොකයෙන් ආවතින
ස්වභාව ඇත්තෝ නොවෙත්.

සාධිකා නවුති නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. සාතිරෙකානි පඤ්චසතානි නාදිකියා පරිචාරකා අබ්භතීතා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායනාති. තෙනව නාදිකියා පරිචාරකා අත්තමනා පමුදිතා පීතිසොමනස්සජාතා භගවතො පඤ්හවෙය්‍යාකරණං සුත්වාති.

6. ඉමෙඛොපනපි භන්තෙ අහෙසුං මාගධකා පරිචාරකා බහූචෙව රත්තඤ්ඤූච අබ්භතීතා කාලකතා.

---

සමීපවූ ඉකුත්කල්හි කලුරියකළාවූ නාදික ගම්වැස්සෝ අධිකයක් සහිත අනූවක් වෙත්. ඔව්හු ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්ෂයකිරීමෙන් රාග ද්වේෂ මෝහයන්ගේ තුනීබැවින් සකෘදාගාමි ආර්‍ය්‍ය පුද්ගල වෙත්. එකවරක්ම මේලොවට උත්පත්ති වශයෙන් පැමිණ සංසාරික දුඃඛය කෙළවරකරන්නෝ වෙත්. සමීපවූ ඉකුත්කල්හි කලුරියකළාවූ නාදික ගම්වැසි උපාසකයෝ පන්සියයකට වැඩිවෙත්. ඔව්හු ත්‍රිවිධ සංයොජනයන් ක්ෂය කිරීමෙන් ශ්‍රොත ආපන්න ආර්‍ය්‍ය පුද්ගල වෙත්. භවදුඃඛයට පෙරළෙන ස්වභාව ඇත්තෝ නොවෙත්. චතුස්සත්‍යාවබොධය නියමකොට ඇත්තෝ සම්‍යක් සම්බොධිය පිහිටකොට ඇත්තෝ වෙත්ය කියායි. භාග්‍යවතුන්වහන්සේගේ මේ ප්‍රශ්නවිසඳීම අසා ඒ අනාගාමි භාවාදි කාරණයෙන් නාදික ගම්වැසි රත්නත්‍රය මාමක පුද්ගලයෝ සතුටු සිත් ඇත්තෝ ප්‍රමුදිත සිත් ඇත්තෝ ප්‍රීති සොම්නස් ඇත්තෝ වූහ.

6. ස්වාමීන්වහන්ස සමීපවූ ඉකුත්කල්හි කලුරියකළාවූ මගධදනව්වැසි මේ උපාසකයෝද බොහෝ වූහ. චිරරාත්‍රි දත්තෝද වූහ.

සුභද්දො මසෙද්දො අඞ්ගමාගධා මාගධකෙහි පරිචාරකෙහි අබ්භතීතෙහි කාලකතෙහි. තෙබොපනපි භනෙතා අහෙසුං බුද්ධෙ පසනනා ධමෙම පසනනා සඞ්ඝෙ පසනනා සීලෙසු. පරිපූරකාරිනො. තෙ අබ්භතීතා කාලකතා භගවතා අව්‍යාකතා. තෙසං පස්සං සාධු වෙය්‍යාකරණං බහුජනො පසීදෙය්‍ය. තතො ගච්ඡෙය්‍ය සුගතිං. අයංඛො පනපි භනෙත අහොසි රාජා මාගධො සෙනියො බිම්බිසාරො ධම්මිකො ධම්මරාජා හිතො බ්‍රාහ්මණ ගහපතිකානං නෙගමානඤ්චෙව ජනපදානඤ්ච. අපිස්සුදං මනුස්සා කිත්තයමානරූපා විහරන්ති ධම්මිකො ධම්මරාජා. අම්හෙ සුඛාපෙත්වා කාලකතො. එවං මයං තස්ස ධම්මිකස්ස ධම්මරඤ්ඤො විජිතෙ ඵාසුං විහරිම්හාති. සොබොපනපි භනෙත අහොසි බුද්ධෙ පසනෙනා

සම්පවූ ඉකුත්කල්හි කලුරියකළාවූ මගධ ජනපදවාසී පරිවාරකයන්ගෙන් අඟු මගධ දෙරට වැස්සෝ සූන්‍යයහයි සිතමි, ස්වාමීන්වහන්ස ඒ අඟු මගධ දෙරට වැස්සෝද බුදුන් කෙරෙහි ප්‍රසන්නයෝ වූහ ධර්මය කෙරෙහි ප්‍රසන්නයෝ වූහ, සඞ්ඝයා කෙරෙහි ප්‍රසන්නයෝ වූහ, චතුපාරිසුද්ධිසීලයන් සම්පූර්ණකරන්නෝ වූහ. සම්පවූ ඉකුත් කල්හි කලුරියකළාවූ ඒ අඟු මගධ දෙරට වැසි උපාසකයෝ භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රකාශ නොකරණලද්දුහුය. ඔවුන් පිළිබඳවද යහපත් වියරණයක් වන්නේනම් මහජනතෙමේ පහදින්නේය. ඒ හේතුකොටගෙණ සුගතියට යන්නේය. ස්වාමීන්වහන්ස මගධෙශ්වරවූ සෙනා ඇත්තාවූ මේ බිම්සර රජතෙමේද ධාර්මිකවිය, ධර්මයෙන් ජනයන් රඤ්ජනයකරන්නෙක් වූයේය. බමුණු ගෘහැවියන්ටද නියම්ගම් වැස්සන්ට හා දනව් වැස්සන්ටද අභිවෘද්ධි සම්පාදක වූයේය. තවද මනුෂ්‍යයෝ ඒ මහරජහු ගුණවර්ණනා කරමින් වාසයකරත්. කෙසේද-ධාර්මිකවූ ඒ ධර්මරජන්තෙමේ අප සැපයට පමුණුවා කලුරියකළේය. මෙසේ අපි ඒධාර්මිකවූ ධර්මරජන්හුගේ රටෙහි පහසුසේ වාසය කෙළෙමුය කියාසි. ස්වාමීන්වහන්ස ඒ බිම්බිසාර රජතෙමේද බුදුන් කෙරෙහි පහන්වූයේය.

ධම්මෙ පසන්නො සඞ්ඝෙ පසන්නො සීලෙසු පරිපූරකාරී, අපිස්සුදං මනුස්සා එවමාහංසු. යාව මරණකාලාපි රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවන්තං කිත්තයමානරූපො කාලකතොති, සො අබ්භතීතො කාලකතො භගවතා අව්‍යාකතො, තස්ස පස්ස සාධු වෙය්‍යාකරණං බහුජනො පසීදෙය්‍ය, තතො ගච්ඡෙය්‍ය සුගතිං, භගවතො බොපන හන්ත සම්බොධි මාගධෙසු, කථං නයිධ භගවා මාගධකෙ පරිචාරකෙ අබ්භතීතෙ කාලකතෙ උපපත්තිසු න ව්‍යාකරෙය්‍ය. දිනමනා තෙනස්සු මාගධකා පරිචාරකා, යෙනබොපන'ස්සු හන්ත දීනමනා මාගධකා පරිචාරකා. කථං තං භගවා,

ධර්මය කෙරෙහි පහන්වූයේයස, සඞ්ඝයා කෙරෙහි පහන්වූයේය, චතුපාරිශුද්ධිසීලයන් සම්පූර්ණකරන්නෙක් වූයේය, තවද මිනිස්සු මේකාරණය මෙසේ කිහ, මගධ ජනපදාධිපතිවූ සේනා ඇත්තාවූ බිම්බිසාර රජතෙමේ මරණකාලය දක්වාද භාග්‍යවතුන්වහන්සේ ගුණ වර්ණනාවෙන් ගුණ සලකණ ස්වභාව ඇතිව වැස කලුරියකළේය, සමීපවූ ඉකුත්කල්හි කලුරියකළාවූ ඒ බිම්සර රජතෙම භාග්‍යවතුන්වහන්සේවිසින් ප්‍රකාශ නොකරණලද්දේය, ඒ බිම්සර රජ පිළිබඳවත් යහපත් විසඳීමක් වන්නේනම් මහාජනතෙමේ පහදින්නේය' ඒ හේතුකොටගෙණ සුගතියට යන්නේය. ස්වාමින්වහන්ස භාග්‍යවතුන්වහන්සේගේ සම්‍යක් සම්බෝධිය මගධ දනව්හිදී වූයේය. ස්වාමින්වහන්ස මගධ දනව්හිවූ යම් පෙදෙසෙක්හිදී භාග්‍යවතුන්වහන්සේගේ සම්‍යක් සම්බෝධිය වූයේද ඒ මගධ දනව් වැසි සමීපවූ ඉකුත් කල්හි කලුරියකළාවූ උපාසකයන් උත්පත්තිවශයෙන් හෝ උත්පත්තිස්ථාන වශයෙන් භාග්‍යවතුන්වහන්සේ කෙසේනම් ප්‍රකාශ නොකරන්නේද? භාග්‍යවතුන්වහන්සේ සමීප ඉකුත් කල්හි කලුරියකළාවූ මගධ දනව් වැසි උපාසකයන් උත්පත්තිස්ථානයන්ගේ වශයෙන් ඉදින් ප්‍රකාශ නොකරණසේක්ද ඒ කරණකොටගෙණ මගධ දනව් වැසි උවසුවෝ බැගෑපත් සිත්ඇත්තෝ වූහ. ස්වාමින්වහන්ස මගධ දනව් වැසි උවසුවෝ යමක් කරණකොටගෙණ බැගෑපත් සිත් ඇත්තෝ වන්නාහුද ඒ කාරණය භාග්‍යවතුන්වහන්සේ

න ව්‍යාකරෙය්‍යාති. ඉදමායස්මා ආනන්දො මාගධකෙ පරිචාරකෙ ආරබ්භ භගවතො සම්මුඛා පරිකථං කත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

7. අථ ඛො භගවා අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ආනන්දෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය නාදිකං පිණ්ඩාය පාවිසි. නාදිකෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො පාදෙ පක්ඛාලෙත්වා ගිඤ්ජකාවසථං පවිසිත්වා මාගධකෙ පරිචාරකෙ ආරබ්භ අට්ඨි කත්වා මනසි කත්වා සබ්බං චෙතසො සමන්නාහරිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, ගතිං තෙසං ජානිස්සාමි අභිසම්පරායං යං ගතිකා තෙ භවන්තො යං අභිසම්පරායාති.

---

කෙසේනම් ප්‍රකාශනොකරන්නේදැයි කියායි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ මගධ දනව් වැසි උපාසකයන් අරබයා මේ විස්තර කථාව භාග්‍යවතුන්වහන්සේගේ ඉදිරියෙහිදී ප්‍රකාශකොට හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ පැදකුණු කොට වැඩියේය.

7. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද ආයුෂ්මතුන් බැහැරගිය නොබෝවේලාවූ කල්හි පෙරවරු කාලයෙහි හැඳ පොරවා අතින් පාත්‍රයහා කසීන් සිව්රුද රැගෙණ නාදිකගමට පිඬුපිණිස පිවිසිසේක. නාදික ගමෙහි පිඬු පිණිස හැසිර පසුබත් කල්හි පිණ්ඩපාත භොජනයෙන් පෙරළා වැඩිසේක් පාදයන් සෝදා තෙල් ගල්වා ගිඤ්ජකාවසථ නම් විහාරයට ප්‍රවිෂ්ටව මගධදනව් වැසි රත්නත්‍රය මාමක උපාසකයන් අරබයා කරුණු සළකා එයමවමනාසේ මෙනෙහිකොට හෙවත් සම්‍යක්ප්‍රඥාවෙන් පිරිසිඳ දැනවදුරා ඊට අනතුරුව පැණවූ අස්නෙහි වැඩඋන් සේක. ඒ පින්වත්හු යම් ඥාණගතියක් ඇත්තෝ ද හෙවත් පඤ්චවිධ ඕරම්භාගීය සංයොජනයන්ගේ ක්ෂය කිරීමෙන් උපදවනලද යම් මාර්ගඥාන ඇත්තෝද එසේම ඒ මාර්ගඥාන ගතිහුගේ වශයෙන්ම ඒ ඒ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ ඕපපාතික තාදි විශෙෂ ඇත්තෝද ඒ පුද්ගලයන්ගේ ගතියද දන්නෙමි. ඔවුන්ගේ පුද්ගල විශෙෂයද දන්නෙමියි කියායි.

අද්ද ඛො භගවා මාගධකෙ පරිචාරකෙ යං ගතිකා තෙ භවන්තො යං අභිසම්පරායා. අථඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො ගිඤ්ජකාවසථා නික්ඛමිත්වා විහාරපච්ඡායායං පඤ්ඤත්තෙන ආසනෙන නිසීදි.

8. අථඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නොඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. උපසන්තපපදිස්සො භන්තෙ භගවා භාතිරිව භගවතො මුඛවණ්ණො පසන්නත්තා ඉන්ද්‍රියානං. සන්තෙන නූනජ්ජ භන්තෙ භගවා විහාරෙන විහාසීති.

---

ඒ පින්වත්හු යම් ඥනගතියක් ඇත්තෝවූද යම් පුද්ගල වෙසෙස් ඇත්තෝද ඒ මගධ දනව් වැසි රත්නත්‍රය මාමකවූ (සුවිසි දහසක්) උපාසකයන් භාග්‍යවතුන්වහන්සේ දිව්‍යඥනයෙන් දකවදාලසේක්මය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵලසමාපත්තියෙන් නැඟීසිටිසේක් ගිඤ්ජකාවසථ විහාරයෙන් නික්ම විහාරය පිළිබඳ සෙවනැල්ලෙහි පණවනලද අස්නෙහි වැඩඋන්සේක.

8. ඉක්බිත්තෙන් ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට එලඹියේය. එලඹ භාග්‍යවතුන් වහන්සේ [illegible] එකත්පසෙක උන්නේය. එකත් පසෙක [illegible] උන්නාවූ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ භාග්‍යවතුන වහන්සෙට මේ කාරණය සැලකළේය. ස්වාමිනි භාග්‍යවතුන් වහන්සේ අතිසයින් සාන්ත දූකුම් ඇත්තේය. මනස සවෙනිකොට ඇති ඉන්ද්‍රියයන්ගේ ප්‍රසන්නභාවය හේතුකොටගෙණ භාග්‍යවතුන්වහන්සේගේ මුහුණේ ශොභාව අත්‍යර්ථයෙන් බබලාමය. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අද ශාන්ත විහරණයකින් යුක්තව වාසය කළසේකැයි හඟිමි යනුයි.

9. යදෙව ඛො මෙ ඉදං ආනන්ද මාගධකෙ පරිචාරකෙ ආරබ්භ සම්මුඛා පරිකථං කත්වා උට්ඨායාසනා පක්කන්තො තදෙවාහං නාදිකෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො පාදෙ පක්ඛාලෙත්වා ගිඤ්ජකාවසථං පවිසිත්වා මාගධකෙ පරිචාරකෙ ආරබ්භ අට්ඨිකත්වා මනසිකත්වා සබ්බං චෙතසො සමන්නාහරිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිං. ගතිං නෙසං ජානිස්සාමි අභිසම්පරායං යංගතිකා තෙ භවන්තො යංඅභිසම්පරායාති. අද්දසං ඛො අහං ආනන්ද මාගධකෙ පරිචාරකෙ යංගතිකා තෙ භවන්තො යංඅභිසම්පරායා.

---

9. ආනන්දය තෝ මගධ දනව් වැසි රත්නත්‍රය මාමක උපාසකයන් අරබයා යම් විස්තර කථාවක් මාගේ ඉදිරියෙහි කොට හුනස්නෙන් නැඟිට බැහැරගියෙහිද මම ඒ නාදික ගමෙහිම පිඬුපිණිස හැසිර පසුබත් කල්හි පිණ්ඩපාත භොජනයෙන් නැවත්තෙමේ පාදයන් සෝදා තෙල්ගල්වා ගිඤ්ජකාවසථ විහාරයට ප්‍රවිෂ්ටව මගධ දනව් වැසි රත්නත්‍රය මාමක උපාසකයන් අරබයා අර්ථවශයෙන් සලකා මනාසේ මෙනෙහිකොට සියල්ල සම්‍යක් ප්‍රඥාවෙන් පිරිසිඳ දැන ඊට අනතුරුව පසුබත් කල්හි පණවනලද අස්නෙහි උන්නෙමි. කෙසේ මෙනෙහිකොටදයත්, ඒ පින්වත්හු යම් ඥානගතියක් ඇත්තෝද ඒ පින්වත්හු යම්බඳු පුද්ගල විශෙෂත්වයක් ඇත්තෝද ඔවුන්ගේ ඥානගතියත් දැනගන්නෙමි. ඔවුන්ගේ පුද්ගල විශෙෂත්වයත් දැනගන්නෙමියි කියායි. ආනන්ද යම් පින්වත්හු යම් ඥානගතියක් ඇත්තෝද යම් පුද්ගල විශෙෂත්වයක් [illegible] දනව්
[illegible] ඇත්තෝද ඒ මගධ [illegible]
වැසි රත්නත්‍රය මාමක උපාසකයන් මම ඥානචක්ෂුසින් දුටුවෙමි. (මෙසේ දැක මෙපමණ ජනසමූහතෙමේ මානිසා සංසාර දුකින් අත්‍යර්ථයෙන් මිදුනේයයි බලවත් සොම්නසක් උපන්නේය. සිත පැහැදුනේය. සිතපහන්වූ බැවින් චිත්තසමුට්ඨානජවූ ලේ පැහැදුනේය. ලේ පැහැදුන බැවින් සිත සවෙනිකොට ඇති ඉන්ද්‍රියයෝ පැහැදුනාහුය.)

අථ ඛො ආනන්ද අන්තරහිතො යක්ඛො සද්දමනුස්සාවෙසි, ජනවසභො අහං භගවා ජනවසභො අහං සුගතාති. අභිජානාසි නො ත්වං ආනන්ද ඉතො පුබ්බෙ එවරූපං නාමධෙය්‍යං සුතං යදිදං ජනවසභොති. නඛො අහං භන්තෙ අභිජානාමි ඉතො පුබ්බෙ එවරූපං නාමධෙය්‍යං සුතං යදිදං ජනවසභොති, යදිනි මෙ භන්තෙ ලොමානි හට්ඨානි, ජනවසභොති නාමධෙය්‍යං සුත්වා, තස්සමය්හං භන්තෙ එතදහොසි නහනූන සො ඔරකො යක්ඛො භවිස්සති යස්සිදං එවරූපං නාමධෙය්‍යං යදිදං ජනවසභොති.

10. අනන්තරාඛො ආනන්ද සද්දපාතුභාවා උළාර වණ්ණො සොමයක්ඛො ම මපමුඛෙ පාතුරහොසි. දුතියම්පි සද්ද මනුස්සා වෙසි,

---

ආනන්දය ඉක්බිත්තෙන් අතුරුදහන්වූ අමනුෂ්‍යයෙක් භාග්‍යවතුන්වහන්ස මම ජනවසභ නම් වෙමි, හෙවත් ජනශ්‍රෙෂ්ඨ වෙමි. සුගතයන්වහන්ස මම ජනවසභවෙමියි ශබ්දානුශ්‍රාවණය කළේය හෙවත් මුරගා කියේය. (ජනයන් ලක්ෂයට අධිපතිව වැස සම්ඥ ධර්මය අසා සෝවාන්වූ ජනවසභ නම් ඒ දෙව්පුත්තෙම මෙසේ ශබ්ද කළබැව් දතයුතු.) ආනන්දය ජනවසභ යන මේ නාමය යම් සේද, මෙයින් පෙර මෙබඳු අන්‍ය නාමයක් අසනලදැයි තෝ කිමෙක දන්නෙහිදැයි විචාලසේක. සවාමින්වහන්ස මම මෙයින් පෙර ජනවසභ යන මෙබඳු අන්‍ය නාමයක් ඇසුවා නොදනිමි, වැලි අන් කරුණෙක් ඇති. ජන වසභ යන මේ නාමය අසා මාගේ ලොමු දූහැගැණීමට පැමිණියාහුය. සවාමින්වහන්ස ඒ මට මේ අදහස විය, යමෙකුට යම් මේ ජනවසභය යන මේ නාමය වීද ඒකාන්ත යෙන් ඒ යක්ෂතෙම ලාමකයෙක් නොවන්නේය කියායි.

10. ආනන්දය ශබ්දය පහළවීමට අනතුරුව උදාර ශරීර වර්ණ ඇති සොමනම් යක්ෂයෙක් භාග්‍යවතුන් වහන්සේගේ (මාගේ) ඉදිරියෙහි පහලවූයේය. දෙවනවරද ශබ්දානු ශ්‍රාවණය කළේය. කෙසේද

බිම්බිසාරො අහං භගවා බිම්බිසාරො අහං සුගත. ඉදං සත්තමං ඛො අහං භන්තෙ වෙස්සවණස්ස මහාරාජස්ස සහබ්‍යතං උපපජ්ජිං. සො තතො චුතො මනුස්සරාජා, අමනුස්සරාජා පිභොමි.

ඉතො සත්ත තතො සත්ත
සංසාරානි චතුද්දස
නිවාසමභිජානාමි
යත්ථ මෙ වුසිතං පුරෙ.

දීඝරත්තං ඛො අහං භන්තෙ අවිනිපාතො අවිනිපාතං සඤ්ජානාමි. ආසා ච පන මෙ සන්තිට්ඨති සකදාගාමිතායාති. අච්ඡරියමිදං ආයස්මතො ජනවසභස්ස යක්ඛස්ස, අබ්භුතමිදං ආයස්මතො ජනවසභස්ස යක්ඛස්ස, දීඝරත්තං ඛො අහං භන්තෙ අවිනිපාතො අවිනිපාතං.

---

භාග්‍යවතුන්වහන්ස මම බිම්බිසාර වෙමි, සුගතයන් වහන්ස මම බිම්බිසාරවෙමි. ස්වාමීන් වහන්ස මම මේ සත්වෙනි ජාතියෙහි වෙසමුණු මහරජහුගේ සහ භාවයට පැමිණියෙමි. ඒ මම එයින්චුතවූයෙම් මනුෂ්‍ය රාජයෙක් හෝ අමනුෂ්‍ය රාජයෙක් හෝ වෙමි හෙවත් වන්නට පොහොසත් වෙමිකියායි. මේජාතියෙන් සත්වරක් වෙත්. ඒ අත් බැවින් සත්වරක්වෙයි. තුදුස් අත්බැවෙක දෙව් මිනිස් දෙක්හි සංසරණය කෙළෙමි. මාවිසින් පූර්වකාලයෙහි යම් තැනෙක වාසය කෙළෙම්ද ඒ පෙරවිසූ කඳපිළිවෙළ මනාසේ දනිමි. ස්වාමීන් වහන්ස මම බොහෝ කාලයක පටන් විනිපාත ස්වභාව නැත්තෙම් හෙවත් භවදුඃඛයට පෙරළෙන ස්වභාව නැත්තෙම් වෙමි. නියත ස්වභාවය මම දනිමි. එසේ නමුත් මාගේ ආසාව හෙවත් විදග්ධතාව මොනවට සිටිමය. සකෘදාගාමි මාර්ගලාභය සඳහායි. ආයුෂ්මත් ජනවසභ යක්ෂයාගේ මේ කාරණය අසිරිමත්වෙයි, ආයුෂ්මත් ජනවසභ යක්ෂයාගේ මේකාරණය අභූද්තවෙයි. ස්වාමීන් වහන්ස, මම බොහෝ කලක පටන් විනිපාත ස්වභාව නැත්තෙමි. හෙවත් නොපෙරළෙන ස්වභාව ඇත්තෙමි. නොපෙරළෙන බව

සඤ්ජානාමීතිව වදෙසි. ආසාව පන මෙ සනතිඪ්ඨති සකදාගාමිතායා තිව වදෙසි. කුතො නිදානං පනායස්මා ජනවසභො යක්ඛො එව රූපං උළාරං විසෙසාධිගමං සඤ්ජානාතීති.

11. න අඤ්ඤත්‍ර භගවා තව සාසනා, න අඤ්ඤත්‍ර සුගත තවසාසනා. යදග්ගෙ අහං භන්තෙ භගවති එකන්තගතො අභිප්පසන්නො, තදග්ගෙ අහං භන්තෙ දීඝරත්තං අවිනිපතො, අවිනිපාතං සඤ්ජානාමි. ආසාව පන මෙ සන්තිඪ්ඨති සකදාගාමිතාය. ඉධාහං භන්තෙ වෙස්සවණෙන මහාරාජෙන පෙසිතො විරූළ්හකස්ස මහාරාජස්ස සන්තිකෙ කෙනචි දෙවකරණීයෙන. අද්දසං භගවන්තංඅන්තරාමග්ගෙ ගිඤ්ජකාවසථං පවිසිත්වා මාගධකෙ පරිචාරකෙ ආරබ්භ අභිකන්වා

---

මනාකොට දනිමියි. කියන්නෙහිය. මාගේ ආසා තොමෝ සකෘදාගාමි මාර්ගලාභය පිණිස එලඹසිටි හෙවත් සකෘදාගාමි මාර්ගලාභය පිණිස මාවිසින් විදර්ශනාව පටන් ගන්නාලද්දීයයි කියන්නෙහිය, කුමක්මුල කාරණකොටගෙණ ආයුෂ්මත් ජනවසභ යක්‍ෂතෙමේ මෙබඳු මහත් විශෙෂාධි ගමයක් දනිද්දැයි කියායි.

11. භාග්‍යවතුන් වහන්ස නුඹවහන්සේගේ සස්නෙන් පිටත් අන්‍ය සස්නකින් නොලබන ලද්දේය, සුගතයන් වහන්ස, නුඹවහන්සේ ගේ සස්නෙන් පිටත් අන් සස්නකින් නොලබන ලද්දේය. ස්වාමින් වහන්ස මම යම් දවසක පටන් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඒකාන්තයෙන් මනාකොට පහන්වූයෙම්ද ස්වාමින්වහන්ස එදවස පටන් කොට ඇතිමේ දිඝීකාලයක් විනිපාත ස්වභාව නැත්තෙක්විමි. අවිනිපාතයසිකියුු සෝවාන් මාර්ගය මනාකොට දනිමි. සෝවාන් මාර්ගයට පැමිණ වසන මාගේ ආසාතෙමෝ හෙවත් විදර්ශනාතොමෝ සකෘදාගාමි මාර්ගලාභය පිණිස එලඹ සිටී, ස්වාමින් වහන්ස මේ මම වෙසමුණු මහරජ විසින් විරූළ්හක මහරජහුගේ සම්පයෙහි කිසියම් කටයුත්තකින් යවන ලද්දෙමි. ඒඅතරමගදී භාග්‍යවතුන් වහන්සේ දුටුවෙමි. කෙබඳු භාග්‍යවතුන්වහන්සේදයත්. ගිඤ්ජකාවසථ විහාර යට ප්‍රවිෂ්ටව මගධරට වැසි රත්නත්‍රය මාමක උපාසකයන් අරබයා කරුණු සලකා.

මනසිකත්වා සබ්බංචෙතසොසමන්නාහරිත්වා නිසින්නං. ගතිං තෙසං ජානිස්සාමි අභිසම්පරායං. යං ගතිකා තෙ භවන්තො යං අභිසම්පරායන්ති. අනච්ඡරියං ඛො පනෙතං භන්තෙ යං වෙස්සවණස්ස මහාරාජස්ස යං පරිසායං භාසතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං යං ගතිකා තෙ භවන්තො යං අභිසම්පරායන්ති. තස්ස මය්හං භන්තෙ එතදහොසි. භගවන්තඤ්ච දක්ඛාමි. ඉදඤ්ච භගවතො ආරොචෙස්සාමීති. ඉමෙ ඛො භන්තෙ වෙ පච්චයා භගවන්තං දස්සනාය පක්කමිතුං.

12. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි තදහුපොසථෙ පන්නරසෙ වස්සූපනායිකාය පුණ්ණාය පුණ්ණමාය රත්තියා කෙවලකප්පාච දෙවා තාවතිංසා සුධම්මායං සභායං

---

එසේම මනාසේ මෙනෙහි කොට සියල්ල සම්‍යක් ප්‍රඥාවෙන් පිරිසිඳ දැනවදාරා වැඩ උන්භාග්‍යවතුන් වහන්සේසි. කෙසේද ඒ පින්වත්හු යම් ඥානගතියක් ඇත්තෝවෙත්ද ඔවුන්ගේ ඥානගතිය මනාකොට දැනගන්නෙමි. ඔවුන්ගේ පුද්ගල විශෙෂයද මනාකොට දැනගන්නෙමියි කියායි. ස්වාමින් වහන්ස වෙසමුණු මහාරජහුගේ පිරිසෙහි කියන්නහුගේ ඉදිරියෙන් යමක් අසන ලද්දේද. යමක් ඔවුන්ගේමසම්මුඛයෙන් පිළිගන්නා ලද්දේද ස්වාමින් වහන්ස මේ කාරණය නැවත නැවත ආශ්චය්‍යීයට කාරණාවෙයි. කෙසේද ඒපින්වත්හු යම් ඥානගතියක් ඇත්තෝද යම් පුද්ගල වෙසෙසක් ඇත්තෝද්‍යි කියායි' ස්වාමින් වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේද දකින්නෙමි. මේ කාරණයද භාග්‍යවතුන් වහන්සේට, සැලකරන්නෙමියි ඒ මට මේ අදහසවිය. ස්වාමින් වහන්ස භාග්‍යවතුන් වහන්සේ දක්නට ඒම පිණිස මේ කරුණු දෙකක්වෙත්යයි සැලකළේය.

12. ස්වාමින්වහන්ස පුර්පුර් දවස්හිවූ එදවස් පැමිණි පසළොස්වක් පොහොයපවත්නා කල්හි වස්එලඹිම ඇති සම්පූර්ණවූ පෞර්ණමාශිය රාත්‍රියෙහි සියලු තව්තිසාවැසි දෙවියෝද සුධර්මා සභාවෙහි

සන්නිසින්නා හොන්ති සන්නි පතිතා මහතීච දිබ්බා පරිසා සමන්තතො නිසින්නා හොති චත්තාරො ච මහාරාජා චතුද්දිසා නිසින්නා හොන්ති. පුරත්ථිමාය දිසාය ධතරට්ඨො මහාරාජා පච්ඡිමාභි මුඛො නිසින්නො හොති. දෙවෙ පුරක්ඛත්වා. දක්ඛිණාය දිසාය විරූළ්හකො මහාරාජා උත්තරාභිමුඛො නිසින්නොහොති දෙවෙ පුරක්ඛත්වා. පච්ඡිමාය දිසාය විරූපක්ඛො මහාරාජා පුරත්ථි මාභිමුඛො නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා. උත්තරාය දිසාය වෙස්සවණො මහාරාජා දක්ඛිණාභිමුඛො නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා, යදා භන්තෙ කෙවලකප්පාච දෙවා තාව තිංසා සුධම්මායං සභායං සන්නිසින්නා හොන්ති සන්නිපතිතා මහතීච දිබ්බා පරිසා සමන්තතො නිසින්නා හොන්ති චත්තාරොච මහාරාජා චතුද්දිසා නිසින්නා හොන්ති ඉදං තෙසං හොති ආසනස්මිං. අථ පච්ඡා අම්හාකං ආසනං හොති. යෙ තෙ භන්තෙ දෙවා භගවති බ්‍රහ්මචරියං චරිත්වා අධුනුපපන්නා තාවතිංසකායං.

---

රැස්වූවෝ එක්ව උන්නාහු වෙත්. මහත් දිව්‍යපිරිසක්ද හාත්පසින් උන්නාවෙයි. සිව්වරම් මහරජහුද සිව්දිග උන්නාහුවෙත්. පෙරදිග ධෘතරාෂ්ට්‍ර මහරජතෙම පැසුලුදිගට අභිමුඛවූයේ දෙවියන් පෙරටුකොට උන්නේවේ. දකුණුදිග විරූළ්හක මහරජතෙම උතුරුදිගට අභිමුඛවූයේ දෙවියන් පෙරටුකොට උන්නේවේ. පැසුලුදිග විරූපාක්ෂ මහරජතෙම පෙරදිගට අභිමුඛවූයේ දෙවියන් පෙරටුකොට උන්නේවේ, උතුරුදිග වෙසමුණු මහරජතෙම දකුණුදිගට අභිමුඛවූයේ දෙවියන් පෙරටුකොට උන්නේවේ. ස්වාමීන්වහන්ස යම් කලෙක්හි සියලු තව්තිසාවැසි දෙවියෝ සුධර්මා නම් දිව්‍යසභාවෙහි රැස්වූවෝ එක්ව උන්නෝ වෙත්ද, මහත් දිව්‍යපිරිසද හාත්පසින් එක්ව උන්නාහු වෙත්ද සිව්වරම් මහරජදරුවෝද සිව්දිග එක්රැස්ව උන්නාහු වෙත්ද, මේ ඔවුන්ගේ ආසනය ඉදිරියෙහි වේ. අනතුරුව පශ්චාත් භාගයෙන් අපගේ ආසනය වේ. ස්වාමීන්වහන්ස යම් ඒ දෙවිකෙනෙක් භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි බඹසරකොට තව්තිසා දිව්‍යනිකායෙහි අලුත උපන්නාහුද.

තෙ අඤ්ඤෙ දෙවෙ අතිරොචන්ති වණ්ණෙන චෙව යසසා ච. තෙන සුදං භන්තෙ දෙවා තාවතිංසා අත්තමනා හොන්ති පමුදිතා පීතිසොමනස්සජාතා. දිබ්බා වත භො කායා පරිපූරෙන්ති හායන්ති අසුර කායාති.

13. අථ භන්තෙ සක්කො දෙවානමින්දො දෙවානං තාවතිංසානං සම්පසාදං විදිත්වා ඉමාහි ගාථාහි අනුමොදි.

මොදන්ති වත භො දෙවා
තාවතිංසා ස ඉන්දකා
තථාගතං නමස්සන්තා
ධම්මස්ස ච සුධම්මතං.

නවෙ දෙවෙ ච පස්සන්තා
වණ්ණවන්තෙ යසස්සිනො
සුගතස්මිං බ්‍රහ්මචරියං
චරිත්වාන ඉධාගතා.

ඔව්හු ශරීර වර්ණයෙන්ද යසසින්ද අන් දෙවියන් ඉක්මවා වැඩියක් බබලත්. ස්වාමින්වහන්ස ඒ කාරණයෙන් තව්තිසාවැසි දෙවියෝ සතුටුසිත් ඇත්තෝ වෙත්. ප්‍රමුදිත සිත් ඇත්තෝ වෙත්. හටගත් ප්‍රීතිසොම්නස් ඇත්තෝ වෙත්. පින්වත්නි ඒකාන්තයෙන් දිව්‍ය සමූහයෝ සම්පූර්ණ වෙත්. අසුර සමූහයෝ පිරිහෙත්ය කියාති.

13. ස්වාමීන්වහන්ස එකල්හි සක්දෙවිඳු තෙමේ තව්තිසාවැසි දෙවියන්ගේ උත්තම ප්‍රසාදය දැනගෙණ මේ ගාථාවලින් ඔවුන් සතුටු කළේය. පින්වත්නි ඒකාන්තයෙන් ඉන්ද්‍රයා සහිතවූ තව්තිසා වැසි දෙවියෝ තථාගතයන් වහන්සේටද ධර්මයටද සුප්‍රතිපන්න සඞ්ඝයාටද නමස්කාර කරමින් සතුටු වෙත්. උත්තම ශරීර වර්ණ ඇත්තාවූ යසස්ඇත්තාවූ දෙවියන් නොදක්නාවූම ඒජනයෝ සුගතයන්වහන්සේ කෙරෙහි බඹසරකොට මේ දෙව්ලොවට උත්පත්ති වශයෙන් පැමිණියාහුය.

තෙ අඤ්ඤෙ අතිරොචන්ති
වණ්ණෙන යසසා යුතා
සාවකා භූරිපඤ්ඤස්ස
විසෙසූප ගතා ඉධ.

ඉදං දිස්වාන නන්දන්ති
තාවතිංසා සඉන්දකා
තථාගතං නමස්සන්තා
ධම්මස්සච සුධම්මතන්ති.

තෙන සුදං භන්තෙ දෙවා තාවතිංසා භිය්‍යොසො මත්තාය අත්තමනා හොන්ති පමුදිතා පීතිසොමනස්සජාතා. දිබ්බා වත භො කායා පරිපූරෙන්ති හායන්ති අසුරකායාති.

14. අථ භන්තෙ යෙනත්ථෙන දෙවා තාවතිංසා සුධම්මායං සභායං සන්නිසින්නා හොන්ති සන්නිපතිතා, තං අත්ථං චින්තයිත්වා

---

ඒ දිව්‍යපුත්‍රයෝ ශරීරවර්ණයෙන්ද යසසින්ද ආයුෂයෙන්ද අන්‍ය දෙවතාවන් ඉක්මවා බබලත්. විපුල ප්‍රඥා ඇති භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ මේ දෙව්ලොවෙහි විශිෂ්ට භාවයට පැමිණියාහුය. ඉන්ද්‍රයා සහිතවූ තව්තිසාවැසි දෙවියෝ යථො ක්ත මේ කාරණය දැක තථාගතයන් වහන්සේටද ධර්මයටද සුප්‍රතිපන්න සඞ්ඝයාටද නමස්කාර කරමින් සතුටුවෙත්. ස්වාමීන් වහන්ස ඒ කාරණය කරණකොටගෙණ තව්තිසාවැසි දිව්‍යසමූහයෝ බොහෝසෙයින්ම සතුටුසිත් ඇත්තෝ ප්‍රමුදිතසිත් ඇත්තෝ හටගත් සොම්නස් ඇත්තෝ වෙත්. පින්වන්නි ඒකාන්තයෙන් දිව්‍යසමූහයෝ සම්පූර්ණවෙත්. අසුර සමූහයෝ පිරිහෙත්ය කියායි.

14. තවද ස්වාමින්වහන්ස යම් ප්‍රයොජනයක් කරණකොටගෙණ තව්තිසාවැසි දෙවියෝ සුධර්මානම් දිව්‍යසභාවෙහි රැස්වූවෝ එක්ව උන්නෝ වෙද්ද, වස්එලඹිම් අපියෙන් රැස්වනහෙයින් ඒකාරණය සිතා.

තං අත්‍ථං මන්තයිත්වා වුත්තවචනාපි තං චත්තාරො මහාරාජානො තස්මිං අත්‍ථෙ හොන්ති. පච්චනුසිඨ වචනාපි තං චත්තාරො මහාරාජානො තස්මිං අත්‍ථෙ හොන්ති සකෙසු ආසනෙසු ඨිතා අවි පක්කන්තා.

තෙ වුත්තවාක්‍යා රාජානො පරිගය්හානුසාසනිං
විප්පසන්නමනා සන්තා අට්ඨංසු සම්හි ආසනෙති.

15. අථ ඛො භන්තෙ උත්තරාය දිසාය උළාරො ආලොකො සඤ්ජායි, ඔභාසො පාතුරහොසි· අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. අථ භන්තෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. යතොඛො මාරිසා නිමිත්තා දිස්සන්ති ආලොකො

---

වනවාසී භික්ෂු සඞ්ඝයාට ආරක්ෂා සංවිධානය සිව්වරම් මහ රජුන් සමග මන්ත්‍රණයකොට ගෙණ කියනලද වචන ඇත්තෝය යන අර්‍ථයෙන් වුත්තවාක්‍ය නම්ලද ඒ සිව්වරම් මහරජදරුවෝද ඒ අර්‍ථයෙහි පවතිත්' තෙතිස් දෙව්පුතුන්හැර ප්‍රත්‍යනුශාසනා කරණලද අන්‍ය දිව්‍යපුත්‍රයෝද සිව්රවම් මහරජදරුවෝද බැහැර නොගොස් ස්වකීය ආසනයන්හිම සිටියාහු ඒ අර්‍ථයෙහි පවතිත්. ඒ සිව්වරම් මහරජහු අනුශාසනා රැගෙණ නොහොත් අනුශාසනා මෙනෙහිකොට අතිශයින් ප්‍රසන්න සිත් ඇත්තෝම, ස්වකීය ආසන යෙහිම සිටියාහුය.

15. තවද ස්වාමින්වහන්ස උතුරුදිසාවෙහි මහත් ආලොකයක් හටගත්තේය. මහත් දීප්තිමත් භාවයක් පහලවූයේය. කෙසේද; දෙවියන්ගේ වස්ත්‍රාලඞ්කාරාදීන් පිළිබඳ ආලොකය ඉක්මවා හෙවත් මැඩපවත්වා පහලවූයේය· ස්වාමින්වහන්ස එකල්හි සක් දෙවිඳු තෙමේ තව්තිසාවැසි දෙවියන් ඇමතූයේය. නිදුකානෙනි යම් හෙයකින් යම්දිගකින් පෙරනිමිති දක්නාලැබෙත්ද ආලොකයක්

සඤ්ජායති, ඔභාසො පාතුභවති. බ්‍රහ්මා පාතුභවිස්සති බ්‍රහ්මුණො එතං පුබ්බනිමිත්තං පාතුභවාය යදිදං ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවතීති.

යථා නිමිත්තා දිස්සන්ති බ්‍රහ්මා පාතු භවිස්සති
බ්‍රහ්මුනො හෙතං නිමිත්තං ඔභාසො විපුලො මහාති.

16. අථ ඛො භන්තෙ දෙවා තාවතිංසා සකෙසු ආසනෙසු නිසීදිංසු. ඔභාස මෙතං ඤස්සාම යං විපාකො භවිස්සති සච්ඡිකත්වා වනං ගමිස්සාමාති. චත්තාරොපි මහාරාජා යථා සකෙසු ආසනෙසු නිසීදිසුං. ඔභාසමෙතං ඤස්සාම යො විපාකො භවිස්සති, සච්ඡිකත්වාව නං ගමිස්සාමාති, ඉදං සුත්වා තාවතිංසා එකග්ගා සමාපජ්ජිංසු ඔභාසමෙතං ඤස්සාම යො විපාකො භවිස්සති. සච්ඡිකත්වාව නං ගමිස්සාමාති.

---

හටගණීද මහත් දීප්තියක් පහලවේද ඒ දිගින් බ්‍රහ්මතෙමේ පහල වන්නේය, මහබඹහුගේ පහලවීමට මේ පූර්ව නිමිත්ත යයි කියේය. ඒ නම්, යම් මේ ආලොකයක් හටගණීද, අවභාෂයක් පහලවේ නම් එයයි. යම්සේ සූර්‍ය්‍යයාගේ පහලවීමට පළමුකොටම අරුණු නැගීමාදි නිමිති දක්නා ලැබෙත්ද එපරිද්දෙන්ම පෙර කියූ පරිදි නිමිති දක්නා ලැබෙත්නම් එහෙයින් බ්‍රහ්මතෙමේ පහල වන්නේය. පැතිර පවත්නාවූ, මහත් ආලොකය යම්සේ පහල වන්නේද එසෙයින් මේ බ්‍රහ්මයාගේ පහලවීමට පෙර නිමිත්ත වන්නේය:

16. ස්වාමීන් වහන්ස ඉක්බින්තෙත් තව්තිසා වැසි දෙවියෝ තම තමන්ගේ අසුන්හි උන්නාහුය. මේ ආලොකය දැනගන්නෙමු කියාද ඒ සම්බන්ධව යම් ඵලයක් වන්නේ නම් එයත් ප්‍රත්‍යක්ෂකොටම යමු කියායි. සිව්වරම් මහරජහුද ස්වකීය ආසනයන්හිම උන්නාහුය. මේ ආලොකය දැනගන්නෙමු. යම් විපාකයක්වන්නේ නම් එයත් ප්‍රත්‍යක්ෂකොටම යන්නෙමුයි කියායි.

17. යදා භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති ඔලාරිකං අත්තභාවං අභිනිම්මිණිත්වා පාතුභවති යො ඛො පන භන්තෙ බ්‍රහ්මුණො පකතිවණ්ණො අනභිසම්භවනීයො සො දෙවානං තාවතිංසානං චක්ඛුපථස්මිං. යදා භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති සො අඤ්ඤෙ දෙවෙ අතිරොචති වණ්ණෙන චෙව යසසා ච. සෙය්‍යථාපි භන්තෙ සොවණ්ණවිග්ගහො මානුසවිග්ගහං අතිරොචති, එවමෙව ඛො භන්තෙ යදා බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති සො අඤ්ඤෙ දෙවෙ අතිරොචති වණ්ණෙන චෙව යසසා ච. යදා භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති න තස්ස පරිසායං කොචි දෙවො අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙති. සබ්බෙව, තෙ.

---

17. ස්වාමින්වහන්ස යම් කලෙක්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසා වැසි දෙවියන් විෂයෙහි පහලවන්නේද එකල්හිඖදාරික ශරීරයක් මවාගෙණ පහලවෙයි. ස්වාමින් වහන්ස මහබ්‍රහ්මුගේ යම් ඒ ප්‍රකෘති ශරීර වර්‍ණයක් වේද එය තව්තිසා වැසි දෙවියන්ගේ චක්‍ෂුඃ පථයෙහි නොපැමිණිය හැක්කේවේ. හෙවත් බ්‍රහ්මයන්ගේ ශරීර වර්‍ණය තව්තිසාවැසි දෙවියෝ දක්නට නොහැකිවෙත්. ස්වාමින් වහන්ස යම් කලෙක්හි සනත් කුමාර බ්‍රහමතෙමේ තව්තිසාවැසි දෙවියන් විෂයෙහි පහලවේද. ඒ බ්‍රහ්මතෙමේ අන්දෙවියන් තමාගේ ශරීර වර්‍ණයෙන්ද යසසින්ද මැඩපවත්වා වැඩියක් බබලයි. ස්වාමින් වහන්ස ස්වර්‍ණමය ශරීරය යම්සේ මනුෂ්‍ය ශරීරය ඉක්මවා වැඩියක් බබලාද, ස්වාමින් වහන්ස එපරිද්දෙන්ම යම් කලෙක්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ ශරීර වර්‍ණයෙන් හා යසසින් අන් දෙවියන් මැඩපවත්වා වැඩියක් බබලයි. ස්වාමීන්වහන්ස යම් කලෙක්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ තවතිසා වැසි දෙවියන් විසයෙහි පහලවේද. ඒ පිරිසෙහි කිසිදෙවිතා කෙනෙක් ඔහටඅභිවාදනයක් හෝනොකෙරෙයි. දැක හුනස්නෙන් නැගිසිටිමද නොකෙරේ. ආසනයෙන් හෝ නොපවරයි. ඒ සියලු දෙවියෝම.

තුණ්හිභූතා පඤ්ජලිකා පල්ලඞ්කෙ. න නිසීදන්ති. යස්සදානි දෙවස්ස ඉච්ඡිස්සති බ්‍රහ්මා සනංකුමාරෙ තස්ස ඛො පන භන්තෙ දෙවස්ස බ්‍රහ්මා සනං කුමාරෙ පල්ලඞ්කෙ නිසීදිස්සති උළාරං සො ලභති දෙවො සොමනස්සපටිලාභං සෙය්‍යථාපි භන්තෙ රාජා ඛත්තියො මුඬාවසිත්තො අධුනාභිසිත්තො රජ්ජෙන, උළාරං සො ලභති වෙදපටිලාභං උළාරං සො ලභති සොමනස්ස පටිලාභං. එවමෙව ඛො සො භන්තෙ යස්ස දෙවස්ස බ්‍රහ්මා සනංකුමාරෙ පල්ලඞ්කෙ නිසීදති උළාරං සො ලභති දෙවො වෙදපටිලාභං. උළාරං සො ලභති දෙවො සොමනස්සපටිලාභං,

18. අථ භන්තෙ බ්‍රහ්මා සනංකුමාරෙ ඔළාරිකං අත්තභාවං අභිනිම්මිණිත්වා කුමාරවණ්ණී හුත්වා පඤ්චසිඛො දෙවානං තාවතිංසානං පාතුරහොසි සො වෙහාසං අබ්භුග්ගනත්වා.

---

නිශ්ශබ්දවූවෝ ඇඳිලිබැඳගත්තෝ පය්‍යංඞ්කයන්හි නොහිඳිත්. දැන් සනත් කුමාර බ්‍රහ්මතෙමේ යම් දෙවියෙකුගේ පය්‍යංඞ්කයක් කැමති වන්නේද ස්වාමිනි ඒ දෙවිහුගේ පය්‍යංඞ්කයෙහි සනත් කුමාර බ්‍රහ්ම තෙමනිසීදනය කරන්නේයකියායි. ස්වාමීන් වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ යම් දෙවියෙකුගේ පය්‍යංඞ්කයෙහි නිසීදනයක රන්නේද ඒ දේවතෙමේ මහත්වූසන්තුෂ්ටි ප්‍රතිලාභයක් විඳිමය. ස්වාමින්ව හන්ස අලුත රාජ්‍යයෙන් අභිෂෙක කරණලද මුඩාව ශික්තවූ ක්‍ෂත්‍රිය රජෙක්වේද හෙතෙමේ මහත්වූ ප්‍රිතිප්‍රමොද්‍යයක් ලබන්නේද හෙතෙමේ මහත්වූ සන්තුෂ්ටි ප්‍රතිලාභයක් විඳින්නේද ස්වාමින්වහන්ස එප රිද්දෙන්ම සනත් කුමාරබ්‍රහ්මතෙමේ යම් දෙවියෙකුගේ පය්‍යංඞ්ක යෙහි හිඳීදි ඒ දේවතෙමේ මහත්වූ ප්‍රීතිප්‍රමොද්‍යයක් ලබන්නේය. ඒ දේව තෙමේ මහත්වූ සන්තුෂ්ටි ප්‍රතිලාභයක් විඳින්නේය.

18. ස්වාමින්වහන්ස එකල්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ ඖදාරිකවූ ආත්ම භාවයක් මනාකොට මවාගෙණ පඤ්චශිඛ දිව්‍යපුත්‍රයා මෙන් කුමාරවෙස්ගෙණ තව්තිසා වැසි දෙවියන් අතරෙහි පහල වූයේය. ඒ බ්‍රහ්ම රජතෙමේ අහසට නැගී.

ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසීදි. සෙය්‍යථාපි භන්තෙ බලවාපුරිසො සුපච්චත්‍ථතෙ වා පල්ලඞ්කෙ සමෙ වා භූමිභාගෙ පල්ලඞ්කෙන නිසීදෙය්‍ය, එවමෙව ඛො භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසිදිත්වා දෙවානං තාවතිංසානං සම්පසාදං විදිත්වා ඉමාහි ගථාහි අනුමොදි.

මොදන්ති වත භො දෙවා
තාවතිංසා සඉන්දකා,
තථාගතං නමස්සන්තා
ධම්මස්සච සුධම්මතන්ති'

නෙ චෙව දෙවෙ පස්සන්තා
වණ්ණවන්තෙ යසස්සිනො
සුගතස්මිං බ්‍රහ්මචරියං
චරිත්වාන ඉධාගතො.

---

පිහිටිම්රහිතවූ අහසෙහි පලගින්යුක්තව උන්නේය. කෙසේදයත්, ස්වාමින් වහන්ස බලවත්පුරුෂයෙක් මනාකොට වස්ත්‍රාදියෙන් අතුරණලද පය්‍යීඞ්කයෙක්හි හෝ සමවූභූමිභාගයෙක්හි යම්සේපය්‍යීඞ්කයෙන් නිසිදනය කරන්නේද. ස්වාමින්වහන්ස එපරිද්දෙන්ම සනත්කුමාරබ්‍රහ්මතෙමේ අහසට පැණනැගී පිහිටිම්රහිතවූ අහසෙහි පය්‍යීඞ්කයෙන් නිසිදනයකොට තව්තිසාවැසි දෙවියන්ගේ යහපත්ප්‍රසාදය දූණගෙණ මේ කියනු ලබන ගාථාවලින් අනුමෝදන් කළේය. පින්වත්නි සක්දෙව්දු ප්‍රධානකොට ඇති දෙවියෝ තථාගතයන් වහන්සේටද ධර්‍මයටද සුප්‍රනිපන්න සඞසයාටද නමස්කාර කරමින් අතිශය ප්‍රිතිමත්වෙත්මය. වර්‍ණවත්වූද යසස් ඇත්තාවූද දෙවියන් නොදක්නාවූම ජනයෝ සුගතයන් වහන්සේකෙරෙහි බඹසරකොට මේ දෙව්ලොවට උත්පත්ති වශයෙන් පැමිණියෝය.

තෙ අඤ්ඤෙ අතිරොචන්ති
වණ්ණෙන යසසායුනා
සාවකා භූරිපඤ්ඤස්ස
විසෙසූපගතා ඉධ

ඉදං දිස්වා න නන්දන්ති
තාවතිංසා සහින්දකා
තථාගතං නමස්සන්ති
ධම්මස්සච සුධම්මතන්ති.

19. ඉදමත්ථං භණෙත බ්‍රහ්මා සනං කුමාරො භාසිත්ථ. ඉදමත්ථං භණෙත බ්‍රහ්මුනො සනංකුමාරස්ස භාසතො සරොඅට්ඨඞ්ගසමන්නාගතො හොති විස්සට්ඨොච විඤ්ඤෙය්‍යොච මඤ්ජුච සවනීයොච බින්දුච අවිසාරීච ගම්භීරොච.

---

ඒ දෙවතාවෝ වර්ණයෙන්ද යසසින්ද ආයුෂයෙන්ද අන් දෙවියන් ඉක්මවා බබලත්. විපුල ප්‍රඥඇති ශාස්තෘන්වහන්සේගේ ශ්‍රාවකයෝ මේ දෙව්ලොව දිව්‍යාත්මභාවයට පැමිණියාහුය. උත්තම ඉන්ද්‍රයා ප්‍රධානකොට ඇති දෙවියෝ මේ උත්තම කාරණය දැක තථාගතයන් වහන්සේටද ධර්මයටද සුප්‍රතිපන්න සඞ්ඝයාටද නමස්කාර කරමින්සතුටුවෙත්ය කියාසි.

19. ස්වාමීන්වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කීයේය. ස්වාමීන්වහන්ස ඒ සනත් කුමාර බ්‍රහ්මයාවිසින් මේ අර්ථය කියනලද භාෂිතයතෙම අඞ්ග අටකින් යුක්තවේ. පීඩා රහිතව මනාකොට නික්මෙන විස්සට්ඨනම් ස්වරයද, වහා අර්ථාවබොධය කරවන්නාවූ විඤ්ඤෙය්‍ය නම් ස්වරයද, මෘදුගුණ යුක්තවූ බින්දු නම් ස්වරයද, ඇසීමට මිහිරිවූ කණට සැපඑලවන සවනීයනම් ස්වරයද, එකඝනවූ බින්දුනම් ස්වරයද, නොවිසිර පවත්නාවූ අවිසාරීනම් ස්වරයද, නාභිමූලයේ පටන් ගැඹුරුව නික්මුණ ගම්භීර නම් ස්වරයද,

නින්නාදීච, යථා පරිසං ඛො පන භන්තෙ බ්‍රහ්මාසනංකුමාරො සරෙන විඤ්ඤාපෙති, නාවස්ස බහිද්ධා පරිසාය ඝොසො නිච්ඡරති. යස්ස ඛො පන භන්තෙ එවං අට්ඨඞ්ගසමන්නාගතො සරො හොති සො වුච්චති බ්‍රහ්මස්සරොති.

20. අථ ඛො භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො තෙත්තිංසෙ අත්තභාවෙ අභිනිම්මිණිත්වා දෙවානං තාවතිංසානං පච්චෙක පල්ලංකෙසු පල්ලංකෙන නිසීදිත්වා දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. තං කිම්මඤ්ඤන්ති භොන්තො දෙවා තාවතිංසා. යාවඤ්ච සො භගවා බහුජනහිතාය පටිපන්නො බහුජනසුඛාය ලොකානුකම්පකාය අත්ථාය, හිතාය සුඛාය දෙවමනුස්සානං, යෙහි කෙචි හො බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා සඞ්ඝං සරණං ගතා සීලෙසු පරිපූරකාරිනො, තෙ

---

මහ මිහිඟුබෙර හඬක් මෙන් මිහිරිව පවත්නා නින්නාදී නම් ස්වරයද යන අටයි. ස්වාමීන්වහන්ස සනත් කුමාරබ්‍රහ්මතෙමේ පිරිස් පරිද්දෙන් ස්වරයෙන් හඟවයි ඒ බඹරදගේ ඝොෂාව පිරිසෙන් පිටත නොනික්මේ. ස්වාමීන්වහන්ස යමෙකුගේ ස්වරය මෙසේ අෂ්ටාඞ්ග සමන්විතවේද ඒ ස්වරයතෙම බ්‍රහ්ම ස්වරයැයි කියනුලැබේ.

20. ස්වාමීන්වහන්ස ඉක්බිත්තෙන් සනත් කුමාර බ්‍රහ්ම තෙමේ ආත්මභාව තෙතිසක් මනාකොට මවා තව්තිසාවැසි දෙවියන්ගේ වෙනවෙනම පර්‍ය්‍යඞ්කයන්හි පලඟින් නිසීදනයකොට තව්තිසාවැසි දෙවියන් ඇමතූයේය. පින්වත්නි, තව්තිසාවැසි දෙවියෝ ඒ කුමකැයි සිතත්ද, ඒ භාග්‍යවතුන්වහන්සේ යම්තාක් බොහෝදෙනාට වැඩ පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩ පිණිසද සැප පිණිසද පිළිපන්සේක්ද, එහෙයින් යම් කිසිවෙක් බුදුන් සරණගියාහුද, දහම් සරණගියාහුද, සඟ සරණගියාහුද, චතුපාරිසුද්ධි ශීලයන් සම්පූර්ණකරන්නෝ වූදැ ඒ සත්වයෝ

කායස්ස භෙදා පරම්මරණා අප්පෙකච්චෙ පරනිම්මිතවසවත්තීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ නිම්මාණරතීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජන්ති, අප්පෙකච්චෙ තුසිතානං දෙවානං, අප්පෙකච්චෙ යාමානං දෙවානං, අප්පෙකච්චෙ තාවතිංසානං දෙවානං, අප්පෙකච්චෙ චාතුම්මහාරාජිකානං දෙවානං, සහබ්‍යතං උපපජ්ජන්ති, යෙ සබ්බනිහිනං කායං පරිපූරෙන්ති, තෙ ගන්ධබ්බකායං පරිපූරෙන්තීති.

21. ඉදමත්ථං භනෙත බ්‍රහ්මා සනංකුමාරො භාසිත්‍ථ. ඉදමත්‍ථං භනෙත බ්‍රහ්මුනො සනංකුමාරස්ස භාසතො සොසො යෙව දෙවො මඤ්ඤති යොයං මම පල්ලඞ්කෙ සොයං එකොව භාසතීති.

---

ඇතම් කෙනෙක් කාබුන් මරණින් මතු පරනිම්මිත වසවර්තිදෙවි යන්ගේ සහභාවයට පැමිණෙත්. ඇතැම් කෙනෙක් නිර්මාණරති දෙවි යන්ගේ සහභාවයට පැ මිණෙත්. ඇතැම් කෙනෙක් තුෂිත දෙවිය න්ගේස හභාවයට පැමිණෙත්. ඇතැම් කෙනෙක් යාම දෙවියන් ගේ සහභාවයට පැමිණෙත්· ඇතැම් කෙනෙක් තව්තිසාවැසි දෙවි යන්ගේ සහභාවය ට පැමිණෙත්. ඇතැම් කෙනෙක් චාතුර්මහාරාජික දෙවියන්ගේ සහභාවයට පැමිණෙත්. යම් කෙනෙක් සියල්ලටම පහත්වූ ශරීරයක් හෙවත්ගතියක් සම්පූණි කෙරෙත්ද, ඔව්හු ගන්ධර්ව නිකාය සම්පූර්ණ කෙරෙත්කියායි.

21. ස්වාමීන්වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කියේය. ස්වාමීන්වහන්ස සනත් කුමාර බ්‍රහ්මයාවිසින් කියනලද්දාවූ මේ කාරණය ඒ ඒ දෙවි්‍ෂතමේම සිතයි. යම් මේ දෙවිකෙනෙක් මාගේ පර්‍යඞ්කයෙහි හිඳීද ඒ මේ දෙවිතෙමේම හුදකලාව බබලාග කියායි.

එකස්මිං භාසමානස්මිං
සබ්බෙ භාසන්ති නිම්මිතා
එකස්මිං තුණ්හිමාසීනෙ
සබ්බෙ තුණ්හී භවන්තිතෙ.

තදාසු දෙවා මඤ්ඤන්ති
තාවතිංසා සඉන්දකා
යොයං මම පල්ලඞ්කෙ
සො යං එකොව භාසතීති.

22. අථ ඛො භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො එකන්තෙ අත්තානං උපසංහාසි. එකන්තෙ අත්තානං උපසංහරිත්වා සක්කස්ස දෙවානමින්දස්ස පල්ලඞ්කෙ නිසීදිත්වා දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. තං කිමමඤ්ඤන්ති භොන්තො දෙවා තාවතිංසා යාව සුපපඤ්ඤත්තාව ඉමෙ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන චත්තාරො ඉද්ධිපාදා.

---

එක් දෙවතාවෙකු කථා කරණ කල්හි මවනලද සියලු දෙවතාවෝ කථාකෙරෙත්, එක් දෙවතාවෙකු නිශ්ශබ්දව උන් කල්හි ඒ සියලු දෙව්පුත්හුම නිශ්ශබ්ද වෙත්. එකල්හි සක්දෙවිඳු ප්‍රධාන කොට ඇති තව්තිසාවැසි දෙවියෝ මෙසේ සිතත්. මාගේ පයඞ්කයෙහි යම් මේ දෙව්පුත් කෙනෙක් වේද, ඒ මේ දෙව්පුත් තෙමේ හුදකලාවම කථාකෙරේය කියායි.

22. ස්වාමීන්වහන්ස ඉක්බිත්තෙන් සනත්කුමාර බ්‍රහ්මතෙමේ එක් පෙදෙසෙක්හි එකක්කොට ශරීරය හැකිලවිය. එක්පෙදෙසෙක්හි ශරීරයහකුලුවා සක්දෙවිඳුගේ පයඞ්කයෙහි හිඳ තව්තිසාවැසි දෙවියන් ඇමතුයේය. පින්වත්නි තව්තිසාවැසි දෙවියෝ. ඒකුමකැයි සිතන්නාහුද, භාග්‍යවත්වූ අභිත් සම්‍යක් සම්බුද්ධයන්වහන්සේවිසින් යම් පමණ මේචතුර්විධ ඍද්ධිපාදකෙනෙක් මනාකොට පණවන ලද් දහුද,

ඉද්ධිපහුතාය ඉද්ධිවිසෙවිතාය ඉද්ධි විකුබ්බණාය. කතමෙ චත්තාරො. ඉධ භො භික්ඛු ඡන්දසමාධි පධාන සඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි–පෙ–චිත්තසමාධි–පෙ– විමංස සමාධි පධානසඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙ ඛො භො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන චත්තාරො ඉද්ධිපාදා පඤ්ඤත්තා ඉද්ධිපහුතාය ඉද්ධිවිසෙවිතාය ඉද්ධිවිකුබ්බණාය. යෙහි කෙචි භො අත්තමද්ධානං සමණාවා බ්‍රාහ්මණාවා ඉද්ධිවිධං පච්චනුභොසුං. සබ්බෙ තෙ ඉමෙසං යෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙහිකෙචි භො අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං

---

කුමක් පිණිසදයත්. බහුලසෘද්ධිමත් භාවය පිණිසද සෘද්ධිහුගේ ආසෙවනයයි කියනලද විශෙෂවසී භාවයපිණිසද නානා ප්‍රකාරයෙන් සෘද්ධිදක්වීම පිණිසද වෙත්. ඒසතර කවරහුදයත්, පින්වත්නි, මේ සම්බුද්ධශාසනයෙහි යම් භික්ෂුකෙනෙක්, කත්තුකම්‍යතා කුශලච්ඡන්දය අධිපතිකොට ලබනලද චතුර්විධ කෘත්‍යයන් සිද්ධකරන්නාවූ සම්‍යක් ප්‍රධාන විය්‍යීයෙන් සමන්විතවූ අභිඥ සිත් හා යෙදුනාවූ ඡන්දසමාධි පධාන සංස්කාරයන් පාදකවූ සෘද්ධිපාදය වඩාද, විය්‍යී සමාධියෙන්. සවලප කරණලදි. චිත්ත සමාධියෙන්, ප්‍රථමවාරයෙහි මෙනි, විමසීම අධිපතිකොට ලබනලද සම්‍යක් ප්‍රධාන වීය්‍යීයෙන් සමන්විතවූ සෘද්ධිපාදය වඩාද පින්වත්නි, ඥානයෙන් දන්නාවූද දක්නාවූද අහින් සම්‍යක්සම්බුද්ධවූ ඒභාග්‍යවතුන්වහන්සේ විසින් මේ සෘද්ධිපාද සතර බහුලසෘද්ධිමත් භාවය පිණිසද සෘද්ධිහුගේ ආසෙවනයපිණිසද නානාප්‍රකාරයෙන් සෘද්ධිදක්වීම පිණිසද පණවනලද්දහුය. පින්වත්නි. අතීතවූ දීර්ඝකාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රහ්මණයෝ හෝ සෘද්ධිවිධිවැලඳුවාහුද ඒසියලු මහණ බමුණෝ, මේ චතුර්විධ සෘද්ධිපාදයන් වැඩුබැවින්ද බහුලකළ බැවින්ද ඒසෘද්ධිවිධි දැක්වූහ. පින්වත්නි නො පැමිණි දීර්ඝකාලයෙහි යම් කිසි ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් නා නාවිධවූ

ඉද්ධිවිධං පච්චනුභොස්සන්ති. සබ්බෙ තෙ ඉමෙසං යෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යෙහි කෙචි භො එතරහි සමණාවා බ්‍රාහ්මණාවා අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්ති සබ්බෙ තෙ ඉමෙසං යෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. පස්සන්ති නො භොනෙන්තා දෙවා තාවතිංසා මමපිනං එවරූපං ඉධානුභාවන්ති. එවං බ්‍රහ්මෙති. අහම්පි ඛො භො ඉමෙසං යෙව චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා එවං මහිද්ධිකො එවං මහානුභාවොති.

23. ඉද මත්ථං භනෙත බ්‍රහ්මා සනං කුමාරො භාසිත්ථ. ඉද මත්ථම් භනෙත බ්‍රහ්මා සනං කුමාරො භාසිත්වා දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. තං කිමඤ්ඤන්ති භොනෙන්තා දෙවා තාවතිංසා යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන තයො ඔකාසාධිගමා අනුබුද්ධා සුඛස්සාධිගමාය. කතමෙ තයො,

---

සෘද්ධිවිධි වලදන්නාහුද ඒසියල්ලෝ මේචතුර්විධ සෘද්ධිපාදයන් වැඩු බැවින්ද බහුල කළබැවින්ද ඒසෘද්ධිවිධි වලදන්නාහ. පින්වත්නි; මේකාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ නානාවිධ සෘද්ධිවලදත්ද ඒසියල්ලෝ මේචතුර් විධසෘද්ධිපාදයන් වැඩු බැවින්ද බහුලකළ බැවින්ද ඒසෘද්ධිවිධිවලදත්. පින්වත්නි, අපගේ තව්තිසාවැසි දෙවියෝද මාගේත් එබඳුවූම සෘද්ධිමහිමයක් දක්නාහු දැයි විචාළේය. බ්‍රහ්මය ඒ එසේයයි දැන්වූහ. දෙවතාවෙනි මමද මේ චතුර්විධ සෘද්ධිපාදයන් වැඩුබැවින්ද බහුලකළ බැවින්ද මෙබඳු මහත් සෘද්ධි ඇත්තෙක්ද මෙබඳු මහත් ආනුභාව ඇත්තෙක්ද වෙමි.

23. ස්වාමීන්වහන්ස, සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කීයේය. ස්වාමීන්වහන්ස, සනත්කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කියා තව්තිසා වැසි දෙවියන් ඇමතුයේය. පින්වත්නි තව්තිසා වැසි දෙවියෙනි, ඒ කුමකැයි සිතන්නහුද? ඥානයෙන් දන්නාවූ දක්නාවූ ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන්වහන්සේ විසින් ධ්‍යාන මාර්ග සුඛාදින්ගේ ලැබීම පිණිස මේ ඔකාසාධිගම තුණක් අවබොධ කරණ ලද්දහුය. ඒතුණ කවරහුදයත්.

ඉධභො එකච්චො සංසට්ඨො විහරති කාමෙහි. සංසට්ඨො අකුසලෙහි ධම්මෙහි, සො අපරෙන සමයෙන අරියං ධම්මං සුණාති යොනිසො මනසි කරොති ධම්මානුධම්මං පටිපජ්ජති සො අරියධම්මසවණං ආගම්ම යොනිසො මනසිකාරං ධම්මානුධම්මපටිපත්තිං අසංසට්ඨො විහරති කාමෙහි. අසංසට්ඨො අකුසලෙහි ධම්මෙහි. තස්ස අසංසට්ඨස්ස කාමෙහි අසංසට්ඨස්ස අකුසලෙහි ධම්මෙහි උප්පජ්ජති සුඛං. සුඛාභිය්‍යො සොමනස්සං සෙය්‍යථාපි භො මුදා පාමුජ්ජං ජායෙථ. එවමෙව ඛො භො අසංසට්ඨස්ස කාමෙහි අසංසට්ඨස්ස අකුසලෙහි ධම්මෙහි උප්පජ්ජති සුඛං. සුඛාභිය්‍යො සොමනස්සං. අයං ඛො භො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමො ඔකාසාධිගමො අනුබුද්ධො සුඛස්සාධිගමාය.

---

පින්වත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කාමයන් හා සම්ප්‍රයුක්ත සිත් ඇතිවද අකුසල ධර්‍මයන් හා සම්ප්‍රයුක්ත සිත් ඇතිවද වාසය කෙරේද ඉදින් ඒ පුද්ගල තෙම මදකලකදී ආර්‍ය්‍යධර්‍මය අසාද ඒ ධර්‍මය නුවණින් මෙනෙහි කෙරේද ධර්‍මානුධර්‍ම ප්‍රතිපත්තියෙහි පිළිපදීද ඒ පුද්ගල තෙම ආර්‍ය්‍යධර්‍ම ශ්‍රවණයටද එය නුවණින් මෙනෙහිකිරීමටද ධර්‍මානුධර්‍ම ප්‍රතිපත්තියටද පැමිණ කාමයන් හා සම්ප්‍රයුක්ත සිත් නැතිවද අකුසල ධර්‍මයන් හා සම්ප්‍රයුක්ත සිත් නැතිවත් වාසයකෙරේද කාමයන් හා නොයෙදුනු සිත් ඇත්තාවූද අකුසල ධර්‍මයන් හා සම්ප්‍රයුක්ත සිත් නැත්තාවූද ඒ පුද්ගලයාහට සැපසක් උපදී. සැපයෙන් මත්තෙහි සොම්නස උපදී. පින්වත්නි යම්සේ සන්තෝෂයට අනතුරුව ප්‍රමුදිතභාවය උපදින්නේද, පින්වත්නි එපරිද්දෙන්ම කාමයන්හා සම්ප්‍රයුක්තසිත් නැත්තාවූද අකුසල ධර්‍මයන් හා සම්ප්‍රයුක්ත සිත් නැත්තාවූද ඒ පුද්ගලයාහට සැපයක් උපදී. සැපයෙන් මත්තෙහි සොම්නසක් උපදී. පින්වත්නි ඥානයෙන් දන්නාවූද දක්නාවූද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් මේ ප්‍රථම ඔකාසාධිගමය තෙම ධ්‍යාන මාර්‍ගාදිවූ සැප ලැබීමපිණිස අවබොධකරණ ලද්දේය.

24. පුනචපරං හො ඉධෙ කච්චස්ස ඔලාරිකා කාය සංඛාරා අප්ප ටිප්පස්සද්ධා හොන්ති ඔලාරිකාවචී සංඛාරා—පෙ—චිත්ත සංඛාරා අප්ප ටිප්පස්සද්ධා හොන්ති. සො අපරෙණ සමයෙන අරියධම්මං සුණාති යොනිසො මනසි කරොති ධම්මානු ධම්මං පටිපජ්ජති. තස්ස අරිය ධම්ම සවණං ආගම්ම යොනිසො මනසිකාරං ධම්මානු ධම්ම පටි පත්තිං ඔලාරිකා කායසංඛාරා පටිප්පස්සම්භන්ති ඔලාරිකාවචී සංඛාරා—පෙ—ඔලාරිකා චිත්තසංඛාරා පටිප්පස්සම්භන්ති. තස්ස ඔලා රිකානං කාය සංඛාරානං පටිප්පස්සද්ධියා ඔලාරිකානං වචීසංඛාරානං —පෙ—චිත්ත සංඛාරානං පටිපස්සද්ධියා උප්පජ්ජති සුඛං. සුඛාභියොයා සොමනස්සං. සෙය්‍යථාපි හො මුදා පාමුජ්ජං ජායෙථ. එව මෙව බො හො ඔලාරිකානං කායසංඛාරානං පටිප්පස්සද්ධියා ඔලාරිකානං වචී සංඛාරානං—පෙ—චිත්තසංඛාරානං පටිප්පස්සද්ධියා උප්පජ්ජති සුඛං සුඛාභියොයා සොමනස්සං.

---

24. නැවතද අනිකක් නම්, පින්වත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුගේ කාය සංස්කාරයෝ මැඩ නොපැවැත්තාහු වෙද්ද ඖදාරික වාක් සංස්කාරයෝද, සංක්‍ෂෙප කරණලදී. චිත්ත සංස්කාර යෝ මැඩ නොපැවැත්තාහු වෙද්ද ඒ පුද්ගල තෙම මැත කලකදී ආර්‍ය්‍යධර්මය අසාද ඒ ධර්මය නුවණින් මෙනෙහි කෙරේද, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපදීද, ඔහුගේ ඖදාරික කායසංස්කාරයෝ මැඩ පවතිත්. ඖදාරික වාක් සංස්කාරයෝද, ප්‍රථම වාරයෙහි මෙනි. ඖදාරික චිත්ත සංස්කාරයෝ මැඩපවත්වා ලාමක කාය සංස්කාර යන්ගේ මැඩලීම හේතුකොටගෙණද ලාමක වාක් සංස්කාරයන්ගේ මැඩලීම හේතුකොටගෙණද ලාමක චිත්ත සංස්කාරයන්ගේ මැඩලීම හේතුකොටගෙණද සැපයක් උපදී. සැපයෙන් මත්තෙහි සොම්න සක් උපදී. පින්වන්නි යම්සේ සන්තොෂයට අනතුරුව ප්‍රමුදිත භාවය උපදීද, පින්වත්නි එපරිද්දෙන්ම ඖදාරික කායසංස්කාරයන් ගේද. විස්තරය පෙරමෙනි චිත්ත සංස්කාරයන්ගේද මැඩලීමෙන් සැප යක් උපදී. සැපයෙන් මත්තෙහි සොම්නසක් උපදී.

අයං ඛො භො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන දුතියො ඔකාසාධිගමො අනුබුද්ධො සුඛස්සාධිගමාය.

25 පුනචපරං භො ඉධෙකච්චො ඉදං කුසලන්ති යථා භූතං නප්පජානාති ඉදං අකුසලන්ති යථා භූතං නප්පජානාති ඉදං සාවජ්ජං ඉදං අනවජ්ජං ඉදං සෙවිතබ්බං ඉදං නසෙවිතබ්බං ඉදං හීනං ඉදං පණීතං ඉදං කණ්හසුක්කසප්පටිභාගන්ති යථා භූතං නප්පජානාති. සො අපරෙන සමයෙන අරියං ධම්මං සුණාති. යොනිසො මනසිකරොති ධම්මානුධම්මං පටිපජ්ජති. සො අරියධම්මස්ස සවණං ආගම්ම යොනිසො මනසිකාරං ධම්මානුධම්මපටිපත්තිං ඉදං කුසලන්ති යථා භූතං පජානාති ඉදං අකුසලන්ති යථා භූතං පජානාති ඉදං සාවජ්ජං ඉදං අනවජ්ජං ඉදං සෙවිතබ්බං ඉදං නසෙවිතබ්බං ඉදං හීනං ඉදං පණීතං ඉදං කණ්හසුක්කසප්පටිභාගන්ති යථා භූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො.

---

පින්වත්නි, ඥානයන් දන්නාවූද දක්නාවූද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේවිසින් දෙවෙනිවූ මේ ඔකාසාධිගමය සැප ලැබීම පිණිස අවබොධකරණ ලද්දේය කියායි.

25 තවද අතිකක්නම් පින්වත්නි මේ ලොකයෙහි ඇතම් පුද්ගලයෙක් මේ කුසලයයි තත්වූ පරිද්දෙන් නොදනිද, මේ අකුසලයයි තත්වූ පරිද්දෙන් නොදනිද, මෙය වරද සහිතය මෙය වරද රහිතය මෙය සේවනය කටයුතුය මෙය සේවනය නොකටයුතුය මෙය ලාමකය මෙය ශ්‍රෙෂ්ඨය මේ කුසලාකුසලයන්ට සමානකොටස් ඇති ධර්මයෝයයි තත්වූ පරිද්දෙන් නොදනිද එපුද්ගලතෙම මෑතකලකදී ආර්‍ය්‍ය ධර්මය අසාද ඒ ධර්මය නුවණින් මෙනෙහි කෙරේද ඊට අනතුරුව ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපදිද, මේ පුද්ගලතෙම ආර්‍ය්‍යධර්ම ශ්‍රවණයටද එය නුවනින් මෙනෙහිකිරීමටසහ ධර්මානුධර්ම ප්‍රතිපත්තියටත් පැමිණ මේ කුසලයයි තත්වූ පරිද්දෙන් දැනගණී. මේ අකුසලයයි තත්වූ පරිද්දෙන් දැනගණී. මේ වරද සහිත කාරණයයි කියාද මේ නිරවද්‍ය කාරණයයි කියාද මේ සේවනය කටයුතු කාරණයයි කියාද මේ සේවනය නොකටයුතු කාරණයයි කියාද මේ ලාමක කාරණය කියාද මේ ශ්‍රෙෂ්ඨකාරණය කියාද මේ කුසලාකුසල ධර්ම ප්‍රතිභාග ධර්මයයි කියාද තත්වූ පරිද්දෙන් දැනගණී. මෙසේ දන්නාවූද මෙසේ දක්නාවූද

අවිජ්ජා පහීයති. විජ්ජා උප්පජ්ජති. තස්ස අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා උප්පජ්ජති සුඛං සුඛා භිය්‍යො සොමනස්සං. සෙය්‍යථාපි භො මුදා පාමුජ්ජං ජායෙථ. එවමෙව ඛො භො අවිජ්ජා විරාගා විජ්ජුප්පාදා උප්පජ්ජති සුඛං සුඛාභිය්‍යො සොමනස්සං. අයං ඛො භොතෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන තතියො ඔකාසාධිගමො අනුබුද්ධො සුඛස්සාධිගාමය. ඉමෙ ඛො භො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන තයො ඔකාසාධිගමා අනුබුද්ධා සුඛස්සාධිගමායාති.

26. ඉදමත්ථං භන්තෙ බ්‍රහ්මා සනං කුමාරො භාසිත්ථ. ඉදමත්ථං භන්තෙ බ්‍රහ්මා සනං කුමාරො භාසිත්වා දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. තං කිම්මඤ්ඤන්ති භොන්තො දෙවා තාවතිංසා යාව සුප්පඤ්ඤත්තා ච ඉමෙ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සමමාසමබුද්ධෙන.

---

ඒ පුද්ගලයාගේ අවිද්‍යා තොමෝ ප්‍රහීණවෙයි. ආර්‍ය්‍යමාර්ගී විද්‍යාව උපදී. ඒ පුද්ගලයාගේ අවිද්‍යාවිරාගයෙන්ද විද්‍යාසඞ්ඛ්‍යාත අර්හත් ඵලයාගේ ඉපදීමෙන්ද සැපයක් උපදී. සැපලැබීමට අනතුරුව සොම්නස උපදී, පින්වත්නි, යම්සේ සන්තුෂ්ටියට අනතුරුව ප්‍රමුදිත භාවය උපදීද, පින්වත්නි එපරිද්දෙන්ම අවිද්‍යාහුගේ විරාගයෙන් විද්‍යා සඞ්ඛ්‍යාත අර්හත් ඵලයාගේ ඉපදීමෙන් සැපයක් උපදී. සැපයට මත්තෙහි සොම්නසක් උපදී. පින්වත්නි, ඥනයෙන් දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුඬවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සැප ලැබීම පිණිස මේ තුන් වෙනි ඔකාසාධිගමය අවබොධ කරණ ලද්දේය. පින්වත්නි, ඥනයෙන් දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුඬවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සැප ලැබීම පිණිස මේ ඔකාසාධිගම තුණ අවබොධ කරණලද්දාහුයයි කියේය.

26. ස්වාමින්වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කියේය. සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කියා තව්තිසා වැසි දෙවියන් ඇමතුයේය. පින්වත්නි තව්තිසා වැසි දෙවියෝ ඒ කුමකැයි සිතද්ද, ඥනයෙන් දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුඬවූ ඒ භාග්‍යවතුන්වහන්සේ විසින්.

චත්තාරො සතිපට්ඨානා කුසලස්සාධිගමාය. කතමෙ. චත්තාරො. ඉධ භො භික්ඛු අජ්ඣත්තං කායෙ කායානුපස්සී විහරති අතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අජ්ඣත්තං කායෙ කායානුපස්සී විහරන්තො තත්ථ සම්මා සමාධියති සම්මා විප්පසීදති. සො තත්ථ සම්මාසමාහිතො සම්මාවිප්පසන්නො බහිද්ධා පරකායෙ ඤාණදස්සනං අභිනිබ්බත්තෙති. අජ්ඣත්තං වෙදනාසු—පෙ—චිත්තෙ—පෙ—ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං, අජ්ඣත්තං ධම්මෙසු ධම්මානුපස්සී විහරන්තො තත්ථ සම්මා සමාධියති.

---

කුසල සංඛ්‍යාත ආර්‍ය්‍ය මාර්‍ග ඵලයන්ගේ ලාභය පිණිස මේ සතර සතිපට්ඨාන ධර්‍මකෙනෙක් පණවන ලද්දාහුය. ඒ සතර සතිපට්ඨානධර්‍මයෝ කවරහුදයත්. පින්වත්නි, මේ සස්නෙහි මහණෙක් ආධ්‍යාත්මික කයෙහි කය අනුව දක්නා ස්වභාව ඇත්තේ කෙලෙස් තවනවීර්‍ය්‍ය ඇත්තේ සම්‍යක්ප්‍රඥා ඇත්තේ සිහි ඇත්තේ කාය සංඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාව හා දෞර්මනස මැඩපවත්වා වාසයකෙරේද, ස්වකීය කයෙහි කය අනුව දක්නා ස්වභාවඇතිව වාසයකරන්නාවූ ඒ භික්ෂුතෙම එහි මනාකොට සිතපිහිටුවයි හෙවත් සිත එකඟ කෙරෙයි. මනාකොට වෙසෙසින් පහදී. ඒ යොගාවචර භික්ෂුතෙම එහි මනාසේ සමාධිගත සිත්ඇත්තේ මනාකොට වැඩියක් ප්‍රසන්නවූයේ පිටත අනුන්ගේ කය නිමිති කොටගෙණද සම්‍යක් ඥානදර්‍ශනය මනාකොට උපදවයි. සියසතන් තුළවූ වේදනාවන් කෙරෙහි, ප්‍රථමවාරයෙහිමෙන් විස්තරය සැලකිය යුතුයි. සිතෙහි. සංක්ෂෙප කරණලදී. ධර්‍මයන් නිමිතිකොටගෙණ ඒ ධර්‍මයන් අනුව දක්නා ස්වභාව ඇත්තේ කෙලෙස් තවනවීර්‍ය්‍ය ඇත්තේ සිහිඇත්තේ සම්‍යක්ප්‍රඥා ඇත්තේ ලොකයෙහි අභිධ්‍යාව හා දෞර්මනස මැඩපවත්වා වාසයකෙරෙයි. සියසතන්තුළවූ ධර්‍මයන් නිමිතිකොටගෙණ ධර්‍මයන් අනුවදක්නා ස්වභාවඇතිව වාසයකරන්නේ එහි මනාකොට සිත සමාධිගත කෙරෙයි.

සම්මා සමාහිතො සම්මා විප්පසන්නො බහිද්ධා පර ධම්මෙසු ඤාණ දස්සනං අභිනිබ්බත්තෙති. ඉමෙ ඛො භො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො සතිපට්ඨානා පඤ්ඤත්තා කුසලස්සාධිගමායාති.

27 ඉදමවොච භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො භාසිත්ථ. ඉදමවොච භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො භාසිත්වා දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. තං කිං මඤ්ඤන්ති භොන්තො දෙවා තාවතිංසා යාව සුපඤ්ඤත්තා චිමෙ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සත්තසමාධි පරික්ඛාරා සම්මාසමාධිස්ස භාවනාය සමාධිස්ස පාරිපූරියා. කතමෙ සත්ත, සෙය්‍යථීදං, සම්මාදිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති.

---

ඒ පුද්ගලතෙම එහි මනාකොට සමාධිගත සිත් ඇත්තේ මනාකොට වැඩියක් ප්‍රසන්නවූයේ පිටත අන්‍යධර්ම විෂයෙහිද ඥනදර්ශනයක් මනාකොට උපදවයි. පින්වත්නි, ඥනයෙන් දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සතර සතිපට්ඨාන ධර්මයෝ කුසල සඞ්ඛ්‍යාත මාර්ගඵලාදීන්ගේ ලාභය පිණිස පණවණ ලද්දුහුය.

27 ස්වාමින් වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කියේය. ස්වාමීන් වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කියා තව්තිසාවැසි දෙවියන් ඇමතුයේය. පින්වත්නි, තව්තිසා වැසි දෙවියෝ මේ මතුකියනුලබන කාරණය කුමැයි සිතත්ද, ඥනයෙන් දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සම්‍යක් සමාධිහුගේ භාවනාව පිණිසද චිත්තසමාධිහුගේ සම්පූර්ණකිරීම පිණිසද මේ පරිවාරක සමාධි සතක් යම්සේ මනාකොට පණවනලද්දුහුද, ඒ සත කවරහුදයත්, ඒනම් සම්‍යක්දෘෂ්ටිය සම්‍යක් සංකල්පනාය සම්‍යක් වචනය සම්‍යක් කර්මාන්තය සම්‍යක් ආජීවය. සම්‍යක් ව්‍යායාමය සම්‍යක් සමාධිය යන මොව්හුයි.

යාබොහො ඉමෙහි සත්තහි අඞ්ගෙහි චිත්තස්සෙකග්ගතාය පරික්ඛත්තා. අයං වුච්චති භො අරියො සම්මාසමාධීතිපි සඋපනිසොතිපිසපරික්ඛාරොතිපි. සම්මාදිට්ඨිස්සභො සම්මා සංකප්පො පහොති සම්මාසංකප්පස්ස සම්මාවාචා පහොති, සම්මාවාචස්ස සම්මාකම්මන්තො පහොති, සම්මාකම්මන්තස්ස සම්මා ආජීවො පහොති සම්මාආජීවස්ස සම්මා වායාමො පහොති සම්මාවායාමස්ස සම්මාසති පහොති සම්මාසතිස්සසම්මාසමාධි පහොති සම්මාසමාධිස්සසම්මාඤාණං පහොති සම්මාඤාණස්ස සම්මාවිමුත්ති පහොති. යංහි තං භො සම්මාවදමානො වදෙය්‍ය. ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

---

පින්වත්නි මේසප්තාඞ්ගධර්මයෙන් සිතේඑකාග්‍රභාවපිණිස යමක් පිරිවරණලද්ද ඒ පුද්ගලතෙම ආර්‍ය්‍යසමාධි ඇත්තේයයිද උපනිශ්‍රය සහිතයයිද පිරිවර සහිතයයිද කියනුලැබේ. පින්වත්නි, සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටියාහට සම්‍යක් සංකල්පනාව පවතී. සම්‍යක් සංකල්පනා ඇත්තාහට සම්‍යක්වචනය පවතී. සම්‍යක් වචනය ඇත්තාහට සම්‍යක්කර්මාන්තය පවතී. සම්‍යක් කර්මාන්තය ඇත්තාහට සම්‍යක් ආජීවය පවතී. සම්‍යක් ආජීවය ඇත්තාහට සම්‍යක් ව්‍යායාමය පවතී. සම්‍යක් ව්‍යායාමයෙහි පිහිටියාහට සම්‍යක් ස්මෘතිය පවතී. සම්‍යක් ස්මෘති ඇත්තාහට සම්‍යක් සමාධිය පවතී. සම්‍යක් සමාධි ඇත්තාහට සම්‍යක් ඥානය පවතී. සම්‍යක් ඥානය ඇත්තාහට සම්‍යක් විමුක්තිය පවතී. පින්වත්නි, යම් ඒ කාරණයක් මනාකොට කියන්නාවූ පුද්ගලතෙම කියන්නේද, කෙසේද, භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මයතෙම මනාකොට ප්‍රකාශකරණලද්දේය. ඉහාත්මභාවයෙහි ලැබියයුතු ඵල ඇත්තේය. කල්නොයවා ලැබියයුතු ඵල ඇත්තේය. එව බලව යන විධියට සුදුසුවෙයි. තමතමන් කෙරෙහි උපනයනයට සුදුසුවෙයි. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුත්තේය.

අපාරුතා අමතස්සද්වාරාති. යෙ හි කෙචි භො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා, අරියකන්තෙහි සීලෙහි සමන්නාගතා, යෙ හි කෙචි ඉමෙ ඔපපාතිකා ධම්මවිනීතා සාතිරෙකානි චතුවීසති සතසහස්සානි මාගධකා පරිචාරකා අබ්භතීතා කාලකතා තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා. අත්ථි චෙවෙත්ථ සකදාගාමිනො.

අථායං ඉතරා පජා
පුඤ්ඤභාගාති මෙ මනො.
සංඛාතුං නොපි සක්කොමි
මුසාවාදස්ස ඔත්තප්පන්ති.

28. ඉදමත්ථං භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො භාසිත්ථ. ඉදමත්ථං භන්තෙ බ්‍රහ්මුනො සනංකුමාරස්ස භාසතො වෙස්සවණස්ස මහාරාජස්ස.

---

අමෘත ද්වාරයෝ විවෘතකරණලද්දාහුය කියායි. පින්වත්නි යම් කෙනෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවෙද්ද, ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවෙද්ද, සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවෙද්ද, ආර්‍ය්‍යයන් විසින් මැනවැයි සම්මත කරණලද සීලයන්ගෙන් යුක්තවෙද්ද, ආර්‍ය්‍ය ධර්මයෙහි හික්මුණාවූ යම්කිසි මේ ඖපපාතික පුද්ගල කෙනෙක් අතිරේකයක් සහිත සූවිසි දහසක් වෙත්ද සම්පවූ ඉකුත්කල්හි කළුරියකළාවූ මගධ ජනපදවාසිවූ රත්නත්‍රය මාමක ඒ උවසුවෝ ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්ෂයකිරීමෙන් ශ්‍රොත ආපන්න ආර්‍ය්‍ය පුද්ගල වෙත්, භව දුඃඛයට පෙරළෙන ස්වභාව ඇත්තෝ නොවෙත්. චතුස්සත්‍යාව බෝධය නියමකොට ඇත්තෝ වෙත්. සම්‍යක් සම්බෝධිය පිහිටකොට ඇත්තෝ වෙත්. මේ බුද්ධශ්‍රාවක පිරිසෙහි සකෘදාගාමී ආර්‍ය්‍ය පුද්ගලයෝ ඇත්තාහුමය. තවද මේ අනාගාමී අන්‍ය ප්‍රජාහොවෝ කුශලභාගිකයෝය යනු මාගේ අදහසයි. ඒ ගණන නියමකරන්නට මුසාවාද බියහෙතුකොටගෙණ නොහැක්කෙමි කීවේය.

28. ස්වාමීන්වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කීයේය. ස්වාමීන්වහන්ස සනත් කුමාර බ්‍රහ්මයා මේ කාරණය කියද්දී වෙසමුණු මහරජහට.

එවං චෙතසො පරිවිතක්කො උදපාදි. අච්ඡරියං වත භො. අබ්භුතං වත භො. එවරූපො පි නාම උළාරො සත්ථා භවිස්සති එව රූපං උළාරං ධම්මක්ඛානං, එවරූපා උළාරා විසෙසාධිගමා පඤ්ඤායිස්සන්ති. අථ භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො වෙස්සවණස්ස මහාරාජස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය වෙස්සවණං මහාරාජං එතදවොච. තං කිම්මඤ්ඤති භවං වෙස්සවණො මහාරාජා. අතීතම්පි අද්ධානං එවරූපො උළාරො සත්ථා අහොසි. එවරූපං උළාරං ධම්මක්ඛානං. එවරූපා උළාරා විසෙසාධිගමා පඤ්ඤායිංසු. අනාගතම්පි අද්ධානං එවරූපො උළාරො සත්ථා භවිස්සති. එවරූපං උළාරං ධම්මක්ඛානං එවරූපා උළාරා විසෙසාධිගමා පඤ්ඤායිස්සන්තීති.

29. ඉදමත්ථං බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං අභාසි ඉදමත්ථං වෙස්සවණො මහාරාජා බ්‍රහ්මුණො සනංකුමාරස්ස දෙවානං තාවතිංසානං භාසතො සම්මුඛා සුතං.

---

මෙසේ සිත පිළිබඳ විශෙෂ විතර්කයක් උපන්නේය. පින්වත්නි ඒකාන්තයෙන් ආශ්චර්ය්‍යයි. පින්වත්නි, ඒකාන්තයෙන් අද්භූතයි. මෙබඳුවූම උදාරවූ ශාස්තෲන්වහන්සේ කෙනෙක් වන්නේද, මෙබඳු මහත්වූ ධර්මදෙශනාවක් වන්නේද, මෙබඳුවූ මහත් විශෙෂාධිගමයෝ පෙණෙන්නාහුදැයි කියාසි. ස්වාමීන්වහන්ස ඉක්බිත්තෙන් සනත් කුමාරබ්‍රහ්මතෙමේ වෙසමුණු මහරජහුගේ සිතේ පැවති විශෙෂඅදහස් තමන්ගේ සිතින් දැනගෙණ වෙසමුණුමහරජහට මෙසේ කියේය. පින්වත් වෙසමුණු මහරජතෙමේ මේ මතු දක්වන කාරණය කුමකැයි සිතාද, ඉකුත් කාලයෙහිද මෙබඳු මහත් ශාස්තෘ කෙනෙක් වූයේද, මෙබඳු මහත් ධර්ම දෙශනාවක් වූයේද, මෙබඳු මහත් විශෙෂාධිගමයෝ පෙණුනාහුද, අනාගත කාලයෙහිද මෙබඳු උදාරවූ ශාස්තෲන්වහන්සේකෙනෙක් වන්නේද, මෙබඳු මහත් ධර්ම දෙශනාවක් වන්නේද, මෙබඳු මහත් විශෙෂාධිගමයෝ පෙණෙන්නාහුදැයි කියාසි.

29. සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය තව්තිසාවැසි දෙවියන්ට කීයේය, මේ කාරණය වෙසමුණු මහරජතෙමේ තව්තිසාවැසි දෙවියන්ට කියන්නාවූ සනත් කුමාර බ්‍රහ්මයාගේසම්මුඛයෙන් අසා

සම්මුඛා පටිග්ගහෙත්වා සපරිසායං ආරොචෙසි. ඉදමත්ථං ජනවසභො යක්ඛො සයං වෙස්සවණ්ණස්ස මහාරාජස්ස පරිසායං භාසතො සම්මුඛා සුත්වා සම්මුඛා පටිග්ගහෙත්වා භගවතො ආරොචෙසි. ඉදමත්ථං භගවා ජනවසභස්ස යක්ඛස්ස සම්මුඛා සුත්වා සම්මුඛා පටිග්ගහෙත්වා සාමං පඤ්චාභිඤ්ඤාය ආයස්මතො ආනන්දස්ස ආරොචෙසි. ඉදමත්ථං ආයස්මා ආනන්දො භගවතො සම්මුඛා සුත්වා සම්මුඛා පටිග්ගහෙත්වා ආරොචෙසි. භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං. තයිදං බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිතං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙවමනුස්සෙහි සුප්පකාසිතන්ති.

## ජනවසභ සුත්තං නිට්ඨිතං.

### අට්ඨ දසමං.

ඔහුගේ සම්මුඛයෙන්ම පිළිගෙණ තමාගේ පිරිසෙහි කීයේය. මේ කාරණය ජනවසභ යක්ෂතෙමේ ස්වකීය පිරිසෙහි කියන්නාවූ වෙසමුණු මහරජහුගේ සම්මුඛයෙන් අසා ඔහුගේ සම්මුඛයෙන්ම පිළිගෙණ භාග්‍යවතුන් වහන්සේට සැලකළේය. මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ ජනවසභ යක්ෂයාගේ සම්මුඛයෙන් අසා සම්මුඛයෙන් පිළිගෙණ පඤ්චාභිඥ ඇත්තාවූ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේට වදාළේය. මේකාරණය ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේගේ සම්මුඛයෙන් අසා උන්වහන්සේගේ සම්මුඛයෙන්ම පිළිගෙණ භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ටහා උපාසිකාවන්ටද වදාළේය. ඒ මේ ශාසන මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව යම්තාක්කල් හෙවත් යම්පමණ; දෙවිමිනිසුන්විසින් මනාකොට ප්‍රකාශ කරණලද්දේද ඒ තරමට සමෘද්ධ වෙයි. ලොකයෙහි පතලේද වෙයි. විස්තාර්‍ය්‍යයට පැමිණියේද වෙයි. මහාජනයා අතර චිරප්‍රසිද්ධියට පැමිණියේද වෙයි. ධ්‍යානාදිය ලැබූවන්ගේවශයෙන් සර්වප්‍රකාරයෙන් ස්ථිරභාවයටද පැමිණියේයයි වදාළසේක.

### අටළොස් වෙනිවූ ජනවසභ සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව මෙතෙකින් නිමියේයි.

## xix. මහාගොවින්ද සූත්තං.

ඒවමෙමසුතං. ඒකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො භගවන්තං එතදවොච. යං මෙ භන්තෙ දෙවානං තාවතිංසානං සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. ආරොචෙමෙතං භන්තෙ භගවතොති. ආරොචෙහි මෙ ත්වං පඤ්චසිඛාති භගවා අවොච.

## මහාගොවින්ද සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යා.

1. මේ සූත්‍රධර්මය මාවිසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර ගිජුකුළු පව්වෙහි වාසයකරණසේක. ඉක්බිත්තෙන් පඤ්චශිඛ ගන්ධර්වපුත්‍රතෙම රාත්‍රිහුගේ මධ්‍යම යාමයෙහි වස්ත්‍රාලඞ්කාරාදීන් මනොඥ වෙස් ඇත්තේ ගිජුකුළුපව්ව මුලුල්ල බබුලුවා භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ පඤ්චශිඛ ගන්ධර්වපුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකලේය. ස්වාමින්වහන්ස මාවිසින් තව්තිසාවැසි දෙවියන්ගේ සමමුඛයෙන් යමක් අසනලද්දේද ඔවුන්ගේම සමමුඛයෙන් පිළිගත්නාලද්දේද ස්වාමින්වහන්ස ඒ කාරණය භාග්‍යවතුන්වහන්සේට සැලකරමියි කීයේය. පඤ්චශිඛය තෝ ඒ කාරණය මට දන්වවයි භාග්‍යවතුන්වහන්සේ වදාළේය.

2. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි. තදහුපොසථෙ පණ්ණරසෙ පවාරණාය පුණ්ණාය පුණ්ණමාය රත්තියා කෙවලප්පා ච දෙවා තාවතිංසා සුධම්මායං සභායං සන්නිසින්නා හොන්ති සන්නිපතිතා මහතිච දිබ්බාපරිසා සමන්තතො නිසින්නා හොන්ති. චත්තාරොච මහාරාජා චතුද්දිසා නිසින්නා හොන්ති, පුරත්ථිමාය දිසාය ධතරට්ඨො මහාරාජා පච්ඡාභිමුඛො නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා. දක්ඛිණාය දිසාය විරූළ්හකො මහාරාජා උත්තරාභිමුඛො නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා, පච්ඡිමාය දිසාය විරූපක්ඛො මහාරාජා පුරත්ථාභිමුඛො නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා. උත්තරාය දිසාය වෙස්සවණො මහාරාජා දක්ඛිණාභිමුඛො නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා. යදා භන්තෙ කෙවලකප්පා ච දෙවා තාවතිංසා සුධම්මායං සභායං සන්නිසින්නා හොන්ති සන්නිපතිතා මහතිච දිබ්බා පරිසා සමන්තතො නිසින්නා හොන්ති, ඉදං තෙසං හොති ආසනස්මිං. අථ පච්ඡා අම්හාකං ආසනං හොති.

---

2. ස්වාමීන්වහන්ස පූර්ව පූර්ව දවස්හිවූ එදවස් පැමිණි පසළොස්වක් පොහොය පවත්නා කල්හි වස්පවාරණ කිරීම ඇති සම්පූර්ණවූ පෞර්ණමාශිය රාත්‍රියෙහි සියලු තව්තිසාවැසි දෙවියෝ සුධර්මා සභාවෙහි රැස්වූවෝ එක්ව උන්නාහු වෙත්. මහත් දිව්‍යපිරිසක්ද හාත්පසින් උන්නා වෙයි. සිව්වරම් මහරජහුද සිව්දිග උන්නාහු වෙත්. පෙරදිග ධෘතරාෂ්ට්‍ර මහරජතෙමේ පැසුලුදිගට අභිමුඛවූයේ දෙවියන් පෙරටුකොට උන්නේවේ. දකුණුදිග විරූළ්හක මහරජතෙමේ උතුරුදිගට අභිමුඛවූයේ දෙවියන් පෙරටුකොට උන්නේවේ, පැසුලුදිග විරූපාක්ෂ මහරජතෙම පෙරදිගට අභිමුඛවූයේ දෙවියන් පෙරටුකොට උන්නේවේ. ස්වාමීන්වහන්ස යම්කලෙක්හි සියලු තව්තිසාවැසි දෙවියෝ සුධර්මා නම් දිව්‍යසභාවෙහි රැස්වූවෝ එක්ව උන්නෝ වෙත්ද, මහත් දිව්‍යපිරිසක්ද හාත්පසින් එක්ව උන්නාහු වෙත්ද සිව්වරම් මහරජදරුවෝද සිව්දිග එක්රැස්ව උන්නිද මේ දෙවියන්ගේ ආසනය ඉදිරියෙහි වේ. අනතුරුව පශ්චාත් භාගයෙන් අපගේ ආසනය වේ.

යෙ තෙ භන්තෙ දෙවා භගවති බ්‍රහ්මචරියං චරිත්වා අධුනූපපන්නා තාවතිංසකායං තෙ අඤ්ඤෙ දෙවෙ අතිරොචන්ති වණ්ණෙනචෙව යසසාච. තෙන සුදං භන්තෙ දෙවා තාවතිංසා අත්තමනා හොන්ති පමුදිතා පීති සොමනස්ස ජාතා දිබ්බා වත භො කායා පරිපූරෙන්ති හායන්ති අසුරකායාති.

3. අථ භන්තෙ සක්කො දෙවානමින්දො දෙවානං තාවතිංසානං සම්පසාදං විදිත්වා ඉමාහි ගාථාහි අනුමොදි.

මොදන්ති වත භො දෙවා
තාවතිංසා සහින්දකා,
තථාගතං නමස්සන්තා
ධම්මස්සච සුධම්මතන්ති.

---

ස්වාමින්වහන්ස යම් ඒ දෙවිකෙනෙක් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසරකොට තව්තිසා දිව්‍යනිකායෙහි අලුත උපන්නාහුද ඔව්හු ශරීර වර්‍ණයෙන්හා යසසින්ද අන් දෙවියන් ඉක්මවා වැඩියක් බබලත්. ස්වාමින්වහන්ස ඒ කාරණයෙන් තව්තිසාවැසි දෙවියෝ සතුටුසිත් ඇත්තෝ වෙත්. ප්‍රමුදිත සිත් ඇත්තෝ වෙත්. හටගත් ප්‍රීති හා සොම්නස් ඇත්තෝ වෙත්. පින්වත්නි, ඒකාන්තයෙන් දිව්‍යසමූහයෝ සම්පූර්‍ණවෙත්. අසුර සමූහයෝ පිරිහෙත්ය යන අදහසිති.

3. ස්වාමින්වහන්ස එකල්හි සක්දෙවිඳුතෙමේ තව්තිසාවැසි දෙවියන්ගේ උත්තම ප්‍රසාදය දැනගෙණ මේ ගාථාවලින් ඔවුන් සතුටු කෙළේය. පින්වත්නි, එකාන්තයෙන් ඉන්ද්‍රයා සහිතවූ තව්තිසාවැසි දෙවියෝ තථාගතයන් වහන්සේටද ධර්‍මයටද සුප්‍රතිපන්න සඞ්ඝයාටද නමස්කාර කරමින් සතුටුවෙත්.

නෙවෙව දෙවෙ පස්සන්තා
වණ්ණවන්තෙ යසස්සිනො
සුගතස්මිං බ්‍රහ්මචරියං
චරිත්වාන ඉධා ගතා.

තෙ අඤ්ඤෙ අතිරොචන්ති
වණ්ණෙන යසසා යුනා
සාවකා භූරිපඤ්ඤස්ස
විසෙසූපගතා ඉධ.

ඉදං දිස්වාන නන්දන්ති
තාවතිංසා සඉන්දකා
තථාගතං නමස්සන්තා
ධම්මස්ස ච සුධම්මතන්ති.

තෙන ඉදං භන්තෙ දෙවා තාවතිංසා භීය්‍යොසොමත්තාය අත්තමනා හොන්ති පමුදිතා පීති සොමනස්ස ජාතා. දිබ්බා වත භො කායා පරිපූරෙන්ති හායන්ති අසුරකායාති.

---

උත්තම ශරීරවර්ණ ඇත්තාවූ යසස් ඇත්තාවූද දෙවියන් නොදක් නාවූම ඒ ජනයෝ සුගතයන්වහන්සේ කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යාකොට මේ දෙව්ලොවට උත්පත්ති වශයෙන් පැමිණියාහුය. ඒ දිව්‍ය පුත්‍රයෝ ශරීරවර්ණයෙන්ද යසසින්හා ආයුෂයෙන්ද අන්‍ය දෙව තාවන් ඉක්මවා බබලත්. විපුල ප්‍රඥා ඇති භාග්‍යවතුන් වහන් සේගේ ශ්‍රාවකයෝ මේ දෙව්ලොවෙහි විශිෂ්ටභාවයට පැමිණියා හුය. ඉන්ද්‍රයා සහිතවූ තව්තිසාවැසි දෙවියෝ මේ කාරණය දැක තථාගතයන් වහන්සේටද ධර්මයටද සඞ්ඝයාටද නමස්කාර කරමින් සතුටුවෙත්. ස්වාමින්වහන්ස ඒ කාරණය කරණකොට ගෙණ තව්තිසාවැසි දිව්‍යසමූහයෝ බොහෝසෙයින්ම සතුටුසිත් ඇත්තෝ ප්‍රමුදිතසිත් ඇත්තෝ හටගත් සොම්නස් ඇත්තෝ වෙත්. පින්වත්නි, ඒකාන්තයෙන් දිව්‍යසමූහයෝ සම්පූර්ණවෙත්. අසුර ස භයෝ පිරිහෙත්ය කියාති.

4. අථ භන්තෙ සක්කො දෙවානමින්දො දෙවානං තාවතිංසානං සම්පසාදං විදිත්වා දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. ඉච්ඡෙය්‍යාථ නො තුම්හෙ මාරිසා තස්ස භගවතො අට්ඨ යථාභුච්චෙ වණ්ණෙ සොතුන්ති. ඉච්ඡාම මයං මාරිසා තස්ස භගවතො අට්ඨ යථා භුච්චෙ වණ්ණෙ සොතුන්ති. අථ භන්තෙ සක්කො දෙවානමින්දො දෙවානං තාවතිංසානං භගවතො අට්ඨ යථා භුච්චෙ වණ්ණෙ පයිරුදාහාසි.

5. තං කිම්මඤ්ඤන්ති භොන්තො දෙවා තාවතිංසා යාව චස්ස සො භගවා බහුජනහිතාය පටිපන්නො බහුජනසුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

---

4. ස්වාමීන්වහන්ස ඉක්බිත්තෙන් සක්දෙව්දුතෙමේ තව්තිසාවැසි දෙවියන්ගේ සම්‍යක් ප්‍රසාදය දැනගෙණ ඒ තව්තිසාවැසි දෙවියන් ඇමතුයේය. නිදුකානෙනි, ඒ භාග්‍යවතුන්වහන්සේගේ අෂ්ට ප්‍රකාරවූ විද්‍යමාන ගුණවර්‍ණනාව අසන්නට කිමෙක් කැමැත්තහුද්දැයි විචාළේය. නිදුකානෙනි, අපි ඒ භාග්‍යවතුන්වහන්සේගේ අෂ්ට ප්‍රකාරවූ විද්‍යමාන ගුණවර්‍ණනාව අසන්නට කැමැත්තෙමුයි කීවාහුය. ස්වාමීන්වහන්ස එකල්හි සක්දෙව්දුතෙමේ තව්තිසාවැසි දෙවියන්ට භාග්‍යවතුන් වහන්සේගේ අෂ්ටප්‍රකාර යථාභූත ගුණවර්‍ණනාව ප්‍රකාශ කෙළේය.

5. පින්වත්නි තව්තිසාවැසි දෙවියෝ ඒකුමකැයි සිතන්ද, ඒ භාග්‍යවතුන්වහන්සේ බොහෝදෙනාට වැඩපිණිසද බොහෝදෙනාට සැපපිණිසද ලොවට අනුකම්පා පිණිස දෙවිමිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩපිණිසද සැපපිණිසද යම්තාක් හෙවත් යම්සේ මනාකොට පිළිපන්සේක්ද,

එවං බහුජනහිතාය පටිපන්නං බහුජනසුඛාය ලොකානුතම්පාකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං ඉමිනා පඞ්ගෙනසමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම න පනෙතරහි අඤ්ඤත්‍ර තෙන භගවතා.

6. ස්වක්ඛාතොඛො පන තස්ස භගවතො ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහිතී එවං. ඔපනයිකස්ස ධම්මස්ස දෙසෙතාරං ඉමිනාපඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙවඅතීතංසෙ මනුපස්සාම නපනෙතරහි අඤ්ඤත්‍ර තෙන භගවතා.

7. ඉදං කුසලන්ති ඛොපන තෙන භගවතා සුපඤ්ඤත්තං. ඉදං අකුසලන්ති සුපඤ්ඤත්තං. ඉදං සාවජ්ජං ඉදං අනවජ්ජං ඉදං සෙවිතබ්බං.

---

මෙසේ බොහෝදෙනාට වැඩ පිණිසද බොහෝ දෙනාට සැපපිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙව්මිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩ පිණිසද සැප පිණිසද පිළිපන්නාවූ මේ අඞ්ගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු ඒ භාග්‍යවතුන්වහන්සේ හැර අතීත කොට්ඨාස යෙහි නොම දක්නෙමු. මේ කාලයෙහිද නොම දක්නෙමු.

6. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්‍මයවූකලි මනාකොට ප්‍රකාශ කරණලද්දේය. ඉහාත්ම භාවයෙහි ලැබියයුතු ඵල ඇත්තේය. කල්නොයවා ලැබියහැකි ඵල ඇත්තේය. එව බලව යනවිධියට සුදුසුවෙයි. උපනායනය කටයුතුවෙයි. නුවනැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුත්තේය කියායි. මෙසේ උප නයනයට යුතුවූ ධර්‍මයක් දෙශනාකරන්නාවූ මේ අඞ්ගයෙන් සමන්විතවූ ශාස්තෘකෙනෙකු අතීත කොට්ඨාසයෙහි නොමදක්නෙමි. මේ කාලයෙහිද නොමදක්නෙමි. දැන් ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

7. මේ කුසලයයි ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට පණවනලද්දේය. මේ අකුසලයයි මනාකොට පණවන ලද්දේය. මේ වරද සහිත කාරණය මේ නිවරද කාරණය මේ සෙවනායකට යුතු ධර්‍මය

ඉදං නසෙවිතබ්බං ඉදං හීනං ඉදං පණීතං ඉදං කණ්හසුක්ක සප්පටිභාගන්ති. සුප්පඤ්ඤත්තං. එවං කුසලාකුසල සාවජ්ජානවජ්ජ සෙවිතබ්බාසෙවිතබ්බ හීනප්පණීත කණ්හසුක්ක සප්පටිභාගානං ධම්මානං පඤ්ඤපෙතාරං ඉමිනා පඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම න පනෙතරහි අඤ්ඤත්‍ර තෙන භගවතා.

8. සුපඤ්ඤත්තා ඛොපන තෙන භගවතා සාවකානං නිබ්බාණගාමිනී පටිපදා සංසන්දති නිබ්බාණඤ්ච පටිපදාච, සෙය්‍යථාපි නාම ගඞ්ගොදකං යමුනොදකෙන සංසන්දති සමෙති, එවමෙවං සුපඤ්ඤත්තා තෙන භගවතා සාවකානං නිබ්බාණගාමිනී පටිපදා සංසන්දති නිබ්බාණඤ්ච පටිපදාච.

---

මේසේවනය නොකටයුතු ධර්මය මේ ලාම ධර්මය මේ ප්‍රණීත ධර්මය මේ කුසලාකුසල ධර්මයන්ටසමානකොට ස්ඇති ධර්මයෝයයි. කියා මනාකොට පණවන ලද්දේය. මෙ සේ කුසල් අකුසල්ය වරද නිවරදය සෙවනය කටයුත්තය. සේවනය නොකටයුත්තය හීනය ප්‍රණීතය කුසලා කුශල ධර්මයන්ට සමාන කොටස් ඇති ධර්මය යන මේධර්මයන් පණවන්නාවූ මේ අඞ්ගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු අතීත කොඨාසයෙහි නොමදක්නෙම්. මේ වත්මන්හිද නොම්දක්නෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

8. ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිර්වාණගාමිනී ප්‍රතිපදා තොමෝ මනාකොට පණවනලද්දීමය. ඒ ප්‍රතිපදා තොමෝද නිර්වාණයට පැමිණේ. යම්සේ ගඞ්ගානම් ගඟෙහි ජලය යමුනා ගඟෙහි ජලයහා සංසන්දනයවේද එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට මනාකොට පණවනලද්දාවූ නිර්වාණගාමිනී ප්‍රතිපදා තොමෝ නිර්වාණයටද ප්‍රතිපදාවටද සංසන්දනයවේ.

එවමෙවං නිබ්බාණගාමිනී පටිපදාය පඤ්ඤපෙතාරං ඉමිනා පඨඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙස මනුස්සාම නපනෙතරහි, අඤ්ඤත්‍ර තෙන භගවතා.

9. ලද්ධසහායො ඛො පන සො භගවා සෙඛානංචෙව පටිපන්නානං ඛීණාසවානඤ්ච වුසිතවතං තෙ භගවා අනු පජ්ජ එකාරාමතං අනුයුත්තො විහරති. එවං එකාරාමතං අනුයුත්තං ඉමිනං පඨඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම න පනෙතරහි අඤ්ඤත්‍ර තෙන භගවතා.

10. අභිනිප්පනෙනා ඛො පන තස්ස භගවතො ලාභො අභිනිප්පන්නො සිලොකො යාව මඤ්ඤෙ ඛත්තියාසම්පියායමානා රූපා විහරන්ති. විගතමදො ඛො පන සො භගවා ආහාරං ආහාරෙති,

---

මෙසේ නිර්වාණගාමිනී ප්‍රතිපදාවක් පණවන්නාවූ මේ අඞ්ගයෙන් සමන්විතවූ ශාස්තෘකෙනෙකු අතීත කොට්ඨාසයෙහිද නොමදක් නෙමු. මේ වත්මන් කල්හිද නොමදක්නෙමු. ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

9. ඒ භාග්‍යවතුන් වහන්සේ ශෛක්ෂ ප්‍රතිප්‍රදාවන්ගේද වැසනිම වනලද බඹසර ඇත්තාවූ ක්ෂීණාශ්‍රවයන්ගේද ලබනලද සහායත්වය ඇත්තේමය. ඒ භාග්‍යවතුන්වහන්සේ ඒ ශෛක්ෂාදින් දුරුනොකොට එකාරම භාවයෙහි යෙදුනෙක්ව වාසය කරණසේක. මෙසේ එකාරම තාවයෙහි යෙදුනාවූ මේ අඞ්ගයෙන් සමන්විතවූ ශාස්තෘකෙනෙකු අතීත කොට්ඨාසයෙහි නොමදක්නෙමි. මේ වර්තමාන කාලයෙහිද නොමදකිමි. ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

10. ඒ භාග්‍යවතුන් වහන්සේට චතුර්විධ ප්‍රත්‍යය මනාකොට නිපන්නේය. කීර්තියද මනාකොට උපන්නේය. යම්සේ අන්‍යක්ෂත්‍රියයෝ මනාකොට භාග්‍යවතුන් වහන්සේට ප්‍රියකරමින් වාසය කෙරෙත්ද එහෙයිනි. ඒ භාග්‍යවතුන් වහන්සේ පහවූ මානමදාදිය ඇතිසේක්ම ආහාරගණී හෙවත් සොයයි.

එවං විගතමදං ආහාරං ආහරියමානං ඉමිනා පඞ්ගෙන සමන්නා ගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම, න පනෙතරෙහි, අඤ්ඤත්‍ර තෙන භගවතා.

11. යථාවාදී ඛොපන සො භගවා තථා කාරී, යථාකාරී තථාවාදී, ඉති යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී එවං ධම්මානුධම්ම පටිපන්නං ඉමිනා පඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම න පනෙ තරහි, අඤ්ඤත්‍ර තෙන භගවතා.

12. තිණ්ණවිචිකිච්ඡොඛොපන සො භගවා විගතකථංකථො පරියොසිත සංකප්පො අජ්ඣාසයං ආදිබ්‍රහ්මචරියං එවං, තිණ්ණවිචි කිච්ඡං විගතකථංකථං පරියොසිතසංකප්පං අජ්ඣාසයං.

---

මෙසේ විගතමදඇතිව ආහාර සෙවීමෙහි යෙදුනාවූ මේ අඞ්ගයෙන් සමන්විතවූ ශාස්තෘකෙනෙකු අතීත කොඨාසයෙහි නොමදක්නෙමු. මේ වර්තමානකාලයෙහිද නොමදක්නෙමු, දැන් ඒ භාග්‍යවතුන්වහන් සේ හැරයි.

11. ඒ භාග්‍යවතුන්වහන්සේ යම්පරිද්දෙකින් ධර්මානුශාසනා කිය නසේක්ද එසේම කරණසේක. යම්සේ කටයුතුකරණසේක්ද එසේම කියනසේක, යම්සේ කියන්නේද එසේ කරන්නාවූ යම්සේ කරන් නේද එසේකියන්නාවූදැයි මෙසේ ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තවූ මේ අඞ්ගයෙන් සමන්විතවූ ශාස්තෘ කෙනෙකු අතීත කොඨාසයෙහි නොමදක්නෙමු. මේවත්මන් කල්හිද නොමදක්නෙමු. දැන් ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

12. ඒ භාග්‍යවතුන් වහන්සේ තරණය කරණලද විචිකිත්සා ඇත් තේමය, පහවූකෙසේ කෙසේදැයි පැවති සැක ඇත්තේය. සම්ඥ තාඥනයෙන් සම්පූර්ණවූ මනොරථඇතිසේක, ආදිබ්‍රහ්මචරිය සඞ්ඛ්‍යා ත ආර්‍ය්‍යමාර්ගයෙන් කෙලෙස් වැනසූසේක, මෙසේ තරණයකරණකල සැක ඇත්තාවූ පහවගිය කෙසේ කෙසේදැයි පැවති සැක ඇත්තාවූ, සම්පූර්ණ මනොරථ ඇත්තාවූ.

ආදිබ්‍රහ්මචරියං ඉමිනාපඞ්ගෙනසමන්නාගතං සත්ථාරං නෙවඅතීතංසෙ සමනුපස්සාම. න පනෙතරහි. අඤ්ඤත්‍ර තෙන භගවතාති. ඉමෙ බො භන්තෙ සක්කො දෙවානමින්දො දෙවානං තාවතිංසානං භගවතො අට්ඨ යථාභුච්චෙ වණ්ණෙ පයිරුදාහාසි, තෙනසුදං භන්තෙ දෙවාතාවතිංසා භිය්‍යොසොමත්තාය අත්තමනා හොන්ති පමුදිතා පීතිසොමනස්සජාතා භගවතො අට්ඨ යථාභුච්චෙ වණ්ණෙ සුත්වා.

13. තත්‍රබො භන්තෙ එකච්චෙ දෙවා එවමාහංසු. අහො වත මාරිසා චත්තාරො සම්මා සම්බුද්ධා ලොකෙ උප්පජ්ජෙය්‍යුං ධම්මඤ්ච දෙසෙය්‍යුං යථරිව භගවා, තදස්ස බහුජන හිතාය බහුජනසුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

---

ආය්‍යීමාර්ගයෙන් ක්ලෙශක්ෂයකොට වාසය කරන්නාවූ මේඅඞ්ගයෙන් යුක්තවූ ශාස්තෘකෙනෙකු අතීත කොට්ඨාසයෙහි නොමදක්නෙමු, මේ වත්මන්කල්හිද නොමදක්නෙමු. දැන් ඒභාග්‍යවතුන්වහන්සේහැරයි. ස්වාමීන්වහන්ස සක්දෙවිඳු තෙමේ තව්තිසා වැසි දෙවියන්ට භාග්‍යවතුන් වහන්සේගේ මේ අෂ්ටප්‍රකාරවූ විද්‍යමාන ගුණවර්ණනාව ප්‍රකාශ කළේය. ස්වාමින් වහන්ස ඒ කාරණයෙන් තව්තිසා වැසි දෙවියෝ භාග්‍යවතුන්වහන්සේගේ විද්‍යමානවූ ගුණවර්ණනාව අසා බොහෝ සෙයින්ම සතුටු සිත් ඇත්තෝවෙත්, ප්‍රමුදිත සිත් ඇත්තෝ වෙත්, හටගත් ප්‍රීතිසහගත සොම්නස් ඇත්තෝවෙත්.

13. ස්වාමීන්වහන්ස ඒ දෙවසමාගමයෙහි සමහර දෙවිකෙනෙක් මෙසේ කීහ, නිදුකානෙනි, මේ කාලයෙහි ගොයුම්ගොත් භාග්‍යවතුන්වහන්සේ මෙන් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා සතරනමක් ලොකයෙහි උපදින්නාහුනම් ධර්මයන් දෙශනා කරන්නාහුනම් එකාන්තයෙන් එයඉතා අසිරිමත් කරුණකි. ඒ භාග්‍යවතුන් වහන්සේලාගේ ඇතිවීම බොහෝදෙනාට වැඩ පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩ පිණිසද සැප පිණිසද වන්නේයයි කීවාහුය.

එකච්චෙ දෙවා එවමාහංසු, තිට්ඨන්තු මාරිසා චත්තාරො සම්මාසම්බුද්ධා, අහො වත මාරිසා තයො සම්මා සම්බුද්ධා ලොකෙ උප්පජ්ජෙය්‍යුං ධම්මඤ්ච දෙසෙය්‍යුං යථරිව භගවා, තදස්ස බහුජනහිතාය බහුජන සුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති. එකච්චෙ දෙවා එවමාහංසු, තිට්ඨන්තු මාරිසා තයො සම්මා සම්බුද්ධා අහො වත මාරිසා ද්වෙ සම්මාසම්බුද්ධා ලොකෙ උප්පජ්ජෙය්‍යුං. ධම්මඤ්ච දෙසෙය්‍යුං යථරිව භගවා, තදස්ස බහුජනහිතාය බහුජන සුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙව මනුස්සානන්ති.

14. එවං වුත්තෙ භන්තෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ එතදවොච.

---

ඇතැම් දෙව්කෙනෙක් මෙසේකිහ. නිදුකානෙනි, සම්‍යක්සම්බුද්ධයන් වහන්සේලා සතරනමක් සිටිත්වා. හෙවත් තුබුනාවේ. නිදුකානෙනි, මේකාලයෙහි ගොයුම්ගොත් භාග්‍යවතුන්වහන්සේ මෙන් සම්මාසම්බුදුන්වහන්සේලා තුන්නමක් ලොකයෙහි උපදින්නාහුනම් ධර්‍මයත් දෙශනා කරන්නාහුනම් එකාන්තයෙන් එය ඉතා අසිරිමත් කරුණක ඒ සම්මාසම්බුදුන් වහන්සේලාගේ පහලවිම බොහෝදෙනාට වැඩපිණිසද බොහෝදෙනාට සැපපිණිසද ලොවට අනුකම්පාපිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩ පිණිසද සැප පිණිසද වන්නේයයි කිහ. සමහර දෙව්කෙනෙක් මෙසේ කිහ. නිදුකානෙනි, සම්මාසම්බුදුන් වහන්සේලා තුන්නම සිටිත්වා, නිදුකානෙනි, මෙ කල්හි අප ගොයුම්ගොත් භාග්‍යවතුන්වහන්සේ මෙන් සම්මාසම්බුදුන්වහන්සේලා දෙනමක් ලොකයෙහි උපදින්නාහුනම් ධර්‍මයත් දෙශනා කරන්නාහුනම් ඒ පහලවිම බොහෝදෙනාට වැඩ පිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩ පිණිසද සැප පිණිසද වන්නේය කියායි.

14. ස්වාමීන්වහන්ස මෙසේ කීකල්හි සක්දෙව්දුතෙමේ තව්තිසා වැසි දෙවියන්ට මේ කාරණය දැන්විය.

අඨානං බො එතං මාරිසා අනවකාසො යං එකිස්සා ලොකධාතුයා වෙ අරහන්තො සම්මාසම්බුද්ධා අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං. නෙතං ඨානං විජ්ජති. අහො වත මාරිසා සො භගවා අප්පාබාධො අප්පාතඞ්කො චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති. අථ ඛො යෙන'ත්ථෙන දෙවා තාවතිංසා සුධම්මායං සභායං සන්නිසින්නා හොන්ති සන්නිපතිතා, තං අත්ථං චින්තයිත්වා තං අත්ථං මන්තයිත්වා වුත්තවචනාපිතං චත්තාරො මහාරාජා තස්මිං අත්ථෙ හොන්ති. පච්චනුසිට්ඨවචනාපිතං චත්තාරො මහාරාජා තස්මිං අත්ථෙ හොන්ති. සකෙසු ආසනෙසු ඨිතා අවිපක්කන්තා.

---

නිදුකානෙනි, එක් ලොකධාතුවෙක්හි අභිත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා දෙනමක් පෙර පසු නොව උපදින්නාහුය යන මේ කාරණය හෙතු ප්‍රතිෂෙපසි. මේ කාරණය අවකාස රහිතයි. මේ කාරණය නැත්තේමය. නිදුකානෙනි, ඒ භාග්‍යවතුන් වහන්සේ ස්වල්ප පීඩා ඇත්තේ ස්වල්ප රොග ඇත්තේම බොහෝ දීඝී කාලයක් සිටින්නේනම් ඉතා යෙහෙක. ඒ කාරණය බොහෝදෙනාට වැඩපිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයොජනය පිණිසද වැඩපිණිසද සැපපිණිසද පවත්නේය කියායි. ස්වාමීන් වහන්ස, ඉක්බිති යම් කාරණයකින් තව්තිසාවැසි දෙවියෝ සුධර්‍මා දිව්‍ය සභාවෙහි රැස්වූවෝ එක්ව උන්නාහු වෙද්ද ඒ කාරණය සිතා ඒ කාරණය මන්ත්‍රණයකොට වුත්තවචන නම්වූ ඒ සිව්වරම් මහරජහු ඒ කාරණයෙහි පවතිත්. පච්චනුසිඨවචන නම්වූ සිව්වරම් මහරජහුද බැහැර නොගොස් ස්වකීය ආසනයන්හිම සිටියාහු ඒ කාරණයෙහි පවතිත්.

තෙ වුත්තවාක්‍යා රාජානො
පටිග්ගය්හානුසාසනිං,
විප්පසන්නමනා සන්තා
අට්ඨංසු සම්හි ආසනෙති.

15. අථ ඛො උත්තරාය දිසාය උළාරො ආලොකො සඤ්ජායි ඔභාසො පාතුරහොසි අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. අථ ඛො සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි, යථා ඛො මාරිසා නිමිත්තා දිස්සන්ති ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවති බ්‍රහ්මා පාතුභවිස්සති. බ්‍රහ්මුණො හෙතං පුබ්බනිමිත්තං පාතුභාවාය. යදිදං ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවතීති.

---

වුත්තවාක්‍ය නම්වූ ඒ සිව්වරම් මහරජහු අනුශාසනාව පිළිගෙණ අතිසයින් පහන්සිත් ඇත්තෝම ස්වකීය ආසනයෙහිම සිටියාහුය.

15. තවද ස්වාමීන්වහන්ස උතුරුදිසාවෙහි මහත් ආලොකයක් හටගත්තේය. මහත් දීප්තිමත් භාවයක් පහලවූයේය. කෙසේද, දෙවියන්ගේ වස්ත්‍රාලඞ්කාරාදීන් පිළිබඳ ආලොකය ඉක්මවා හෙවත් මැඩපවත්වා පහලවූයේය. ස්වාමීන්වහන්ස එකල්හි සක්දෙවිඳු තෙමේ තව්තිසාවැසි දෙවියන් ඇමතුයේය. නිදුකානෙනි, යම්හෙයකින් යම්දිගකින් පෙරනිමිති දක්නාලැබෙත්ද, ආලොකයක් හටගණීද, මහත් දීප්තියක් පහලවේද, ඒ දිගින් බ්‍රහ්මතෙමේ පහලවන්නේය. මහබඹහුගේ පහලවීමට මේ පූර්ව නිමිත්තයයි කීයේය. ඒනම්, යම මේ ආලොකයක් හටගණීද, අවභාෂයක් පහලවේනම් එයයි.

යථානිමිත්තාදිස්සන්ති
බ්‍රහමා පාතුභවිස්සති,
බ්‍රහ්මුණොහෙතං නිමිත්තං
ඔභාසො විපුලොමහාති.

අථ ඛ‍ො දෙවා තාවතිංසා යථාසකෙසු ආසනෙසු නිසීදිංසු ඔභාස මෙතං ඤස්සාම,යං විපාකො භවිස්සති සච්ඡිකත්වාව නං ගමිස්සාමාති. චත්තාරොච මහාරාජා යථාසකෙසු ආසනෙසු නිසීදිංසු, ඔභාසමෙත ඤාඤස්සාම, යං විපාකො භවිස්සති සච්ඡිකත්වා'ව නං ගමිස්සාමාති. ඉදං සුත්වා දෙවා තාවතිංසා එකග්ගතා සමාපජ්ජිංසු ඔභාසමෙතඤාඤස්සාම, යං විපාකො භවිස්සති සච්ඡිකත්වා'ව නං ගමිස්සාමාති.

---

යම්සේ සූර්‍ය්‍යයාගේ පහලවීමට පළමුකොටම අරුණුනැගීමාදි නිමිති දක්නා ලැබෙත්ද, එපරිද්දෙන්ම පෙර කියූ පරිදි නිමිති දක්නා ලැබෙන්නම් බ්‍රහ්මතෙමේ පහලවන්නේය. යම්සේ පැතිර පවත්නාවූ මහත් ආලොකය පහල වන්නේද එහෙයින් මේ බ්‍රහ්මයාගේ පහලවීමට පෙරනිමිත්ත වන්නේය. ස්වාමීන්වහන්ස ඉක්බිත්තෙන් තව්තිසාවැසි දෙවියෝ තම තමන්ගේ අසුන්හි උන් නාහුය. මේ ආලොකය දැනගන්නෙමු කියාද ඒ සම්බන්ධව යම් ඵලයක් වන්නේනම් එයත් ප්‍රත්‍යක්‍ෂකොටම යමු කියාය. සිව්වරම් මහරජහුද ස්වකීය ආසනයන්හිම උන්නාහුය. මේ ආලොකය දැන ගන්නෙමු, යම් විපාකයක් වන්නේනම් එයත් ප්‍රත්‍යක්‍ෂකොටම යන්නෙමුයි කියායි. මේකාරණය අසා තව්තිසාවැසි දෙවියෝ එක්පා ර්‍ශ්වයකට එකඟබවට පැමිණියාහුය. මේ ආලොකය දැනගන්නෙමු. යම්ඵලයක් වන්නේනම් එයත් ප්‍රත්‍යක්‍ෂකොටම යන්නෙමුයි කියායි.

16. යදා භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති ඔළාරිකං අත්තභාවං අභිනිම්මිණිත්වා පාතුභවති. යො ඛො පන භන්තෙ බ්‍රහ්මුනො පකතිවණ්ණො අනභිසම්භවනීයො සො දෙවානං තාවතිංසානං චක්ඛුපථස්මිං. යදා භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති, සො අඤ්ඤෙ දෙවෙ අතිරොචති වණ්ණෙන චෙව යසසා ච. සෙය්‍යථාපි භන්තෙ සොවණ්ණො විග්ගහො මානුසං විග්ගහං අතිරොචති, එවමෙව ඛො භන්තෙ යදා බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති සො අඤ්ඤෙ දෙවෙ අතිරොචති වණ්ණෙන චෙව යසසා ච. යදා භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති.

---

16. ස්වාමින්වහන්ස යම් කලෙක්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසාවැසි දෙවියන් විෂයෙහි පහලවන්නේද එකල්හි ඖදාරික ශරීරයක් මවාගෙණ පහලවෙයි. ස්වාමින්වහන්ස මහබඹහුගේ යම් ඒ ප්‍රකෘතිශරීර වර්ණයක් වේද එය තව්තිසාවැසි දෙවියන්ගේ චක්ෂුඃ පථයෙහි නොපැමිණිය හැක්කේවේ. නොහොත් බ්‍රහ්මයන්ගේ ශරීර වර්ණය තව්තිසාවැසි දෙවියෝ දක්නට නොහැකි වෙත්, ස්වාමින්වහන්ස යම්කලෙක්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසාවැසි දෙවියන් විෂයෙහි පහලවේද. ඒ බ්‍රහ්මතෙමේ අන් දෙවියන් තමාගේ ශරීරවර්ණයෙන්ද යසසින්ද මැඩපවත්වා වැඩියක් බබලයි. ස්වාමින් වහන්ස සුවර්ණමය ශරීරය යම්සේ මනුෂ්‍ය ශරීරය ඉක්මවා වැඩියක් බබලාද, ස්වාමින් වහන්ස එපරිද්දෙන්ම යම කලෙක්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසාවැසි දෙවියන් විෂයෙහි පහලවේද ඒ බ්‍රහ්මතෙම ශරීර වර්ණයෙන් හා යසසින් අන් දෙවියන් මැඩපවත්වා වැඩියක් බබලයි. ස්වාමින්වහන්ස යම්කලෙක්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසාවැසි දෙවියන් විෂයෙහි පහලවේද,

න තස්සං පරිසායං කොචි දෙවො අභිවාදෙතිවා පච්චුට්ඨෙතිවා ආසනෙනවා නිමන්තෙති. සබ්බෙව තුණ්හිභූතා පඤ්ජලිකා පල්ලංකෙන නිසීදන්ති. යස්ස දානි දෙවස්ස ඉච්ඡිස්සති බ්‍රහ්මා සනං කුමාරො තස්ස දෙවස්ස පල්ලංකෙ නිසීදිස්සතීති. යස්සඛො පන භන්තෙ දෙවස්ස බ්‍රහ්මා සනංකුමාරො පල්ලංකෙ නිසීදති උළාරං සො ලභති දෙවො වෙදපටිලාභං. උළාරං සො ලභති දෙවො සොමනස්ස පටිලාභං. සෙය්‍යථාපි භන්තෙ රාජා ඛත්තියො මුද්ධාව සිත්තො අධුනාභිසිත්තො රජ්ජෙන, උළාරං සො ලභති වෙදපටිලාභ උළාරං සො ලභති සොමනස්ස පටිලාභං, එවමෙව ඛො භන්තෙ යස්ස දෙවස්ස බ්‍රහ්මා සනං කුමාරො පල්ලංකෙ නිසීදති උළාරං, සො ලභති දෙවො වෙදපටිලාභං. උළාරං සො ලභති දෙවො සොමනස්ස පටිලාභං.

17. අථභන්තෙ බ්‍රහ්මා සනං කුමාරො දෙවානං තාවතිංසානං සම්පසාදං

---

එකල්හි ඒ පිරිසෙහි කිසි දෙවතාකෙනෙක් ඔබට අභිවාදනයක් හෝ නොකෙරෙයි, දක හුනස්නෙන් නැගිසිටී මද නොකෙරේ, ආසනයෙන් හෝ නොපවරයි. ඒ සියලු දෙවියෝම නිශ්ශබ්ද වූවෝ ඇඳිලිබැඳගත්තෝ පය්‍යඞ්කයන්හි හිඳිත්. දැන් සනත් කුමාර බ්‍රහමතෙමේ යම් දෙවියෙකුගේ පය්‍යඞ්කයක් කැමතිවන්නේද ඒ දෙවිහුගේ පය්‍යඞ්කයෙහි සනත් කුමාර බ්‍රහ්මතෙම නිසීදනය කරන්නේය කියායි. ස්වාමින්වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ යම් දෙවියෙකුගේ පය්‍යඞ්කයෙහි නිසීදනය කරන්නේද ඒ දේවතෙමේ මහත්වූ සන්තුෂ්ටි ප්‍රතිලාභයක් විඳිමය. ස්වාමීන් වහන්ස අලුත රාජ්‍යයෙන් අභිෂෙක කරණලද මූර්ධාභිශික්තවූ ක්‍ෂත්‍රිය රජෙක් වේද හෙතෙම මහත්වූ ප්‍රීතිප්‍රමොද්‍යය ලබන්නේද හෙතෙමේ මහත්වූ සන්තුෂ්ටි ප්‍රතිලාභයක් විඳින්නේද ස්වාමින්වහන්ස එප රිද්දෙන්ම සනත් කුමාර බ්‍රහ්මතෙමේ යම් දෙවියෙකුගේ පය්‍යඞ්කයෙහි හිඳීද ඒ දේවතෙමේ මහත්වූ ප්‍රීතිප්‍රමොද්‍යයක් ලබන්නේය. ඒ දේවතෙමේ මහත්වූ සන්තුෂ්ටි ප්‍රතිලාභයක් විඳින්නේය.

17. ස්වාමින්වහන්ස එකල්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ තව්තිසාවැසි දෙවියන්ගේ සම්‍යක්ප්‍රසාදය.

විදිත්‍වා අන්තරහිතො ඉමාහි ගාථාහි අනුමොදි.

මොදන්ති වත භො දෙවා
තාවතිංසා සඉන්‍දකා.
තථාගතං නමස්සන්තා
ධම්මස්සච සුධම්මතං.

නෙවෙව දෙවෙ පස්සන්තා
වණ්ණවන්තෙ යසස්සිනො.
සුගතස්මිං බ්‍රහ්මචරියං
චරිත්වාන ඉධාගතෙ.

තෙ අඤ්ඤෙ අතිරොචන්ති
වණ්ණෙන යස සායුනා.
සාවකා භූරිපඤ්ඤස්ස
විසෙසූපගතා ඉධ.

ඉදං දිස්වාන නන්‍දන්ති
තාවතිංසා සඉන්‍දකා,
තථාගතං නමස්සන්තා
ධම්මස්සච සුධම්මතන්ති.

---

දූණගෙණ අතුරු දහන්වූයේ මේ කියනුලබන ගාථාවලින් අනුමෝදන් කළේය. පින්වත්නි සක්දෙවිඳු ප්‍රධානකොට ඇති දෙවියෝ තථාගතයන්වහන්සේටද ධර්‍මයටද සුප්‍රතිපන්න සඞ්ඝයාටද නමස්කාර කරමින් අතිශය ප්‍රීතිමත් වෙත්මය. වර්‍ණවත්වූද යසස් ඇත්තාවූද දෙවියන් නොදක්නාවූම ජනයෝ සුගතයන් වහන්සේ කෙරෙහි බඹසරකොට මේ දෙව්ලොවට උත්පත්ති වශයෙන් පැමිණියෝය. ඒ දෙවතාවෝ වර්‍ණයෙන්ද යසසින්ද ආයුෂයෙන්ද අන් දෙවියන් ඉක්මවා බබලත්. විපුල ප්‍රඥඇති ශාස්තෘන්වහන්සේගේ ශ්‍රාවකයෝ මේ දෙව්ලොව දිව්‍යානුභාවයට පැමිණියාහුය. උත්තම ඉන්‍ද්‍රයා ප්‍රධානකොට ඇති දෙවියෝ මේ උත්තම කාරණය දැක තථාගතයන් වහන්සේටද ධර්‍මයටද සුප්‍රතිපන්න සඞ්ඝයාටද නමස්කාර කරමින් සතුටුවෙත්ය කියාති.

18. ඉද මහං භන්තෙ බ්‍රහ්මා සනං කුමාරො අභාසිත්ථ. ඉදමහං භන්තෙ බ්‍රහ්මුණො සනංකුමාරස්ස භාසතො අට්ඨඞ්ග සමන්නා ගතො සරො හොති විස්සට්ඨොච විඤ්ඤෙය්‍යොච මඤ්ජුච සවණීයොච බින්දුච අවිසාරීච ගම්භීරොච නින්නාදීච. යථාපරිසංඛොපන භන්තෙ බ්‍රහ්මා සනං කුමාරො සරෙන විඤ්ඤාපෙති. නාස්ස බහිද්ධා පරිසාය ඝොසො නිච්ඡරති. යස්සඛොපන භන්තෙ එවං අට්ඨඞ්ගසමන්නාගතො සරො හොති සො වුච්චති බ්‍රහ්මස්සරොති.

19. අථ භන්තෙ දෙවා තාවතිංසා බ්‍රහ්මානං සනංකුමාරං එතදවොචුං. සාධු බ්‍රහ්මෙ එතදෙව මයං සංඛාය මොදාම.

---

18. ස්වාමීන්වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ මේ කාරණය කීයේය. ස්වාමීන්වහන්ස සනත් කුමාර බ්‍රහ්මයාවිසින් මේ අවිය කියනලද භාෂිතයතෙම අඞ්ග අටකින් යුක්තවේ. පීඩා රහිතව මනා කොට නික්මෙන විස්සට්ඨනම් ස්වරයද, වහා අවබොධය කරවන් නාවූ විඤ්ඤෙය්‍ය නම් ස්වරයද, මෘදුගුණ යුක්තවූ බිඤ්ජු නම් ස්වර යද, ඇසීමට මිහිරිවූ කණට සැපඑලවන සවණීය නම් ස්වරයද එකඝනවූ බින්දු නම් ස්වරයද, නොවිසිර පවත්නාවූ අවිසාරීනම් ස්වර යද, නාභිමූලයේ පටන් ගැඹුරුව නික්මුණ ගම්භීර නම් ස්වරයද, මහ මිහිගුබෙර හඬක් මෙන් මිහිරිව පවත්නා නින්නාදී නම් ස්වරයද යන අටයි. ස්වාමීන්වහන්ස සනත් කුමාර බ්‍රහ්මතෙමේ පිරිස් පරිද්දෙන් ස්වරයෙන් හඟවයි. ඒ බඹරදගේ ඝොෂාව පිරිසෙන් පිටත නොනික්මේ. ස්වාමීන්වහන්ස යමෙකුගේ ස්වරය මෙසේ අෂ්ටාඞ්ග සමන්විත වේද ඒ ස්වරයතෙම බ්‍රහ්ම ස්වරයයි කියනුලැබේ.

19. ස්වාමීන්වහන්ස ඉක්බිත්තෙන් තව්තිසාවැසි දෙවියෝ සනත් කුමාර බ්‍රහ්මයාට මේ කාරණය කීවාහුය. මහාබ්‍රහ්මය යහපති. අපි මේ මතු කියනුලබන කාරණය දැනගෙණම සතුටුවෙමු.

අට්ඨච සක්කෙන දෙවානමින්දෙන තස්ස භගවතො අට්ඨ යථා භූච්චා වණ්ණා භාසිතා. තෙච මයං සඬ්ඛාය මොදමාති. අථඛො භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො සක්කං දෙවානමින්දං එතදවොච, සාධු දෙවානමින්ද මයම්පි තස්ස භගවතො අට්ඨ යථාභුච්චෙ වණ්ණෙ සුණෙය්‍යාමාති, එවං මහා බ්‍රහ්මෙති ඛො භන්තෙ සක්කො දෙවානමින්දො බ්‍රහ්මුණො සනංකුමාරස්ස භගවතො අට්ඨ යථාභුච්චෙ වණ්ණෙ පයිරුදාහාසි.

20. තං කිම්මඤ්ඤන්ති භවං මහාබ්‍රහ්මා යාවච සො භගවා බහුජනහිතාය පටිපන්නො බහුජනසුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. එවං බහුජනහිතාය පටිපන්නං බහුජනසුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං

---

සක්දෙවිඳු විසින් කියනලද ඒ භාග්‍යවතුන්වහන්සේගේ අෂ්ටප්‍රකාරවූ ගුණවර්ණනාවෝ ඇත්තාහුමය. අපි ඒගුණවර්ණනාවන් දැනගෙණ සතුටුවෙමුයි කීවාහුය. ස්වාමීන්වහන්ස ඉක්බිත්තෙන් සනත් කුමාර බ්‍රහ්මතෙමේ සක්දෙව්දුහට මේ කාරණය කියේය. දෙවේන්‍ද්‍රය අපිත් ඒ භාග්‍යවතුන් වහන්සේගේ අෂ්ටප්‍රකාරවූ යථාභූත ගුණවර්ණනාව අසන්නෙමුනම් ඉතා යෙහෙක. යනුයි. මහාබ්‍රහ්මය ඒ මැනවැයි සක්දෙවිඳුතෙමේ සනත් කුමාර බ්‍රහ්මයාට භාග්‍යවතුන් වහන්සේ පිළිබඳවූ අෂ්ටප්‍රකාර ගුණවර්ණනාව ප්‍රකාශ කෙළේය.

20. පින්වත් මහාබ්‍රහ්මතෙම ඒකුමකැයි සිතාද, ඒ භාග්‍යවතුන් වහන්සේ දීර්ඝකාලයක් බොහෝදෙනාට වැඩපිණිසද බොහෝදෙනාට සැප පිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද වැඩපිණිසද සැප පිණිසද යම්සේ මනාකොට පිළිපන්සේක්ද, මෙසේ බොහෝදෙනාට වැඩ පිණිසද බොහෝදෙනාට සැපපිණිසද ලොවට අනුකම්පා පිණිසද දෙවිමිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිසද වැඩ පිණිසද සැප පිණිසද පිළිපන්නාවූ.

ඉමිනා පඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුප ස්සාම න පනෙතරහි. අඤ්ඤත්‍ර තෙන භගවතා.

21. ස්වාක්ඛාතො ඛො පන තස්ස භගවතො ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූ හීති. එවං ඔපනයිකස්ස ධම්මස්ස දෙසෙතාරං ඉමිනාපඞ්ගෙන සම න්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම. න පනෙතරහි, අඤ්ඤත්‍ර තෙන භගවතා.

22. ඉදංකුසලන්ති ඛො පන තෙන භගවතා සුපඤ්ඤත්තං, ඉදං අකුසලන්ති සුපඤ්ඤත්තං, ඉදං සාවජ්ජං ඉදං අනවජ්ජං ඉදං සෙවි තබ්බං ඉදං නසෙවිතබ්බං ඉදං හීණං ඉදං පණීතං ඉදං කණ්හසුක්ක සප්පටිභාගන්ති. සුපඤ්ඤත්තං.

---

මේ අඞ්ගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීත කොඨාසයෙහිද නොමදක්නෙමු. මේ කාලයෙහිද නොම දක්නෙමු. දූත්ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

21. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්‍මයවූකලී මනාකොට ප්‍රකාශ කරණලද්දේය. ඉහාත්ම භාවයෙහි ලැබියයුතු ඵල ඇත්තේය. කල්නොයවා ලැබියහැකි ඵල ඇත්තේය. එව බලව යනවිධියට සුදුසුවෙයි. උපනයනය කටයුතුවෙයි. නුවනැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුත්තේය කීයායි. මෙසේ උප නයනයට යුතුවූ ධර්‍මයක් දෙශනාකරන්නාවූ මේ අඞ්ගයෙන් සමන්විතවූ ශා ස්තෘකෙනෙකු අතීත කොඨාසයෙහි නොමදක්නෙමු. මේ කාලයෙහිද නොමදක්නෙමු. දූත් ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

22. මේ කුසලයයි ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට පණවනලද්දේය. මේ අකුසලයයි මනාකොට පණවන ලද්දේය. මේ වරද සහිත කාරණය මේ නිවරද කාරණය මේ සේවනයකට යුතුධර්‍මය මේසේවනය නොකටයුතු ධර්‍මය මේලාමක ධර්‍මයමේ ප්‍රණීත ධර්‍මය මේ කුසලා කුසල ධර්‍මයන්ට සමානකොටස් ඇති ධර්‍මයෝයයි මනාකොට පණවන ලද්දේය,.

වං කුසලාකුසල සාවජ්ජානවජ්ජ සෙවිතබ්බා සෙවිතබ්බං හීනප්ප
ණීත කණ්හසුක්ක සප්පටිභාගානං ධම්මානං පඤ්ඤාපෙතාරං. ඉමි
ාපඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම.
න පනෙතරහි. අඤ්ඤත්‍ර තෙන භගවතා.

23. සුපඤ්ඤත්තා බො පන තෙන භගවතා සාවකානං නිබ්බාණගා
මිනී පටිපදා සංසන්දති නිබ්බාණඤ්ච පටිපදාච. සෙය්‍යථාපි නාම ග
ඞ්ගොදකං යමුනොදකෙන සංසන්දති සමෙති. එවමෙව සුපඤ්ඤත්තා
තෙන භගවතා සාවකානං නිබ්බාණගාමිනී පටිපදා සංසන්දති
නිබ්බාණඤ්ච පටිපදාච. එවංනිබ්බාණගාමිනී පටිපදාය පඤ්ඤාපෙ
තාරං ඉමිනා පඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ
සමනුපස්සාම. න පනෙතරහි, අඤ්ඤත්‍ර තෙන භගවතා.

---

මෙසේ කුසල් අකුසල්ය වරද නිවරදය සේවනය කටයුත්තය. සේවනය නොකටයුත්තය හීනය ප්‍රණීතය කුශලා කුශල ධර්මයන්ට සමාන කොටස් ඇතිධර්මය යන මේධර්මයන් පණවන්නාවූ මේ අඞ්ගයෙන් යුක්තවූ ශාස්තෘ කෙනෙකු අතීත කොඨාසයෙහි නොමදක්නෙමු. මේවත්මන්හිද නොමදක්නෙමු. දැන්ඒභාග්‍යවතුන් වහන්සේ හැරයි.

23. ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිර්වාණගාමිනී ප්‍රතිපදාතොමෝ මනාකොට පණවනලද්දීමය. ඒ ප්‍රතිපදා තොමෝද නිර්වාණයට පැමිණේ. යම්සේ ගඞ්ගානම්ගඟෙහි ජලය යමුනා ගඟෙහි ජලයහා සංසන්දනයවේද එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට මනාකොට පණවනලද්දාවූ නිර්වාණගාමිනී ප්‍රතිපදා තොමෝ නිර්වාණයටද ප්‍රති පදාවටද සංසන්දනයවේ. මෙසේ නිර්වාණගාමිනී ප්‍රතිපදාවක් පණවන්නාවූ මේ අඞ්ගයෙන් සමන්විතවූ ශාස්තෘකෙනෙකු අතීත කොඨාසයෙහිද නොමදක්නෙමු. මේ වත්මන් කල්හිද නොමදක්නෙමු. දැන් ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

24. ලඛසභායො බොපන සො භගවා සෙඛානඤ්චෙව පටිපදුනා ඛීණාසවානඤ්ච වුසිතවතං. තේ භගවා අපනුජ්ජ එකාරාමතං අනුයුත්තො විහරති. එවං එකාරාමතං අනුයුත්තං ඉමිනාපඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම නපනෙතරහි. අඤ්ඤත්‍ර තෙන භගවතා.

25. අභිනිප්පන්නො බො පන තස්ස භගවතො ලාභො, අභිනිප්ප න්නො සිලොකො යාවමඤ්ඤෙ ඛත්තියා සම්පියායමානරූපා විහර න්ති. විගතමදො බො පන සො භගවා ආහාරං ආහාරෙති. එවං විග තමදං ආහාරං ආහරියමානං ඉමිනාපඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම න පනෙතරහි අඤ්ඤත්‍ර තෙන භගවතා.

26. යථා වාදි බො පන සො භගවා තථාකාරි. යථාකාරී තථාවාදී.

---

24. ඒ භාග්‍යවතුන්වහන්සේ ශෛක්‍ෂ ආයතීප්‍රතිපදාවෙහි සිටියවුන් ගේද වැසනිමවනලද බඹසරඇත්තාවූ ක්ෂීණාශ්‍රවයන්ගේද ලබනලද ශ්‍රේෂ්ඨභාවය ඇත්තේමය. භාග්‍යවතුන් වහන්සේ ඒ ශෛක්‍ෂාදින් සිතින්පවා දුරුනොකොට එලසමාපත්තියෙහි යෙදී වාසය කරණ සේක. මෙසේ පලසමවත්හි යෙදුනාවූ මේ අඞගයෙන් සමන්විතවූ ශාස්තෘකෙනෙකු අතීත කොඨාසයෙහි නොමදක්නෙමු. මේවත්මාන කාලයෙහිද නොමදක්නෙමු. දූන් ඒ භාග්‍යවතුන්වහන්සේ හැරයි.

25. ඒ භාග්‍යවතුන් වහන්සේට චතුර්විධ ප්‍රත්‍යය මනාකොට නිපන්නේය. කීර්තියද මනාකොට උපන්නේය, යම්සේ ක්‍ෂත්‍රිය සෝද මනාකොට භග්‍යවතුන් වහන්සේට ප්‍රියකරමින් වාසය කෙරෙත්ද එහෙයිනි. ඒ භාග්‍යවතුන්වහන්සේ පහතවූ මානමදදිය ඇතිසේක්ම ආහාර සොයයි, මෙසේ පහවූ මදඇතිව ඇහර සොයන් නාවූ මේ අඞගයෙන් සමන්විත්වූ ශාස්තෘ කෙනෙකු අතීත කොඨාස යෙහි නොමදක්නෙමු. මේ වත්මන් කල්හිද නොම දක්නෙමු. දූන් ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි.

26. ඒ භාග්‍යවතුන්වහන්සේ යම්පරිද්දෙකින් ධර්මානුශාසනා කියන සේක්ද එසේම කරණසේක. යම්සේ වදාරණසේක්ද එසේම කරණ සේක.

ඉති යථාවාදී තථා කාරි යථාකාරී තථාවාදී එවං ධම්මානුධම්ම පටිපන්නං ඉමිනා අඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතීතංසෙ සමනුපස්සාම, න පනෙතරහි, අඤ්ඤත්‍ර තෙන භගවතා.

27. තිණ්ණංවිචිකිච්ඡො ඛො පන සො භගවා විගතකථංකථො පරියොසිත සංකප්පො අජ්ඣාසයං ආදිබ්‍රහ්මචරියං. එවං තිණ්ණවිචිකිච්ඡං විගතකථංකථං පරියොසිත සංකප්පං අජ්ඣාසයං ආදිබ්‍රහ්මචරියං ඉමිනා අඞ්ගෙන සමන්නාගතං සත්ථාරං නෙව අතිතංසෙ සමනුපස්සාම න පනෙතරහි. අඤ්ඤත්‍ර තෙන භගවතා ති. ඉමෙ ඛො භන්තෙ සක්කො දෙවානමින්දො බ්‍රහ්මුණො සනං කුමාරස්ස භගවතො අට්ඨ යථාභුච්චෙව වණ්ණෙ පයිරුදාහාසි.

---

යම්සේ කටයුතුකරන්නේද එසේමකියන්නේය යම්සේ කියන්නේද එසේ කරන්නේයමෙසේ ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තවූමේඅඞ්ගයෙන් සමන්විතවූ ශාස්තෘකෙනෙකු අතීත කොඨාසයෙහි නොම දක්නෙමු. මේවත්මන් කල්හිද නොමදක්නෙමු. දැන් ඒ භාග්‍යවතුන්වහන්සේ හැරයි.

27. ඒ භාග්‍යවතුන්වහන්සේ තරණයකරණලද විචිකිත්සා ඇත්තේවය. පහවූ කෙසේ කෙසේද්‍යයි පැවති සැක ඇත්තේය, පර්‍ය්‍යෝසනාය කරණලද හෙවත් සම්පූර්ණමනොරථ ඇතිසේක. කෙසේද, උත්තමාධ්‍යාශයෙන් ආර්‍ය්‍ය මාර්ග ඵලයෙහි යෙදීමෙනි. මෙසේ තරණයකල සැක ඇත්තාවූ පහවගිය කෙසේ කෙසේද්‍යයි පැවති සැක ඇත්තාවූ සම්පූර්ණමනොරථ ඇත්තාවූ උත්තමාධ්‍යාශයෙන් ආර්‍ය්‍යමාර්ගයෙහියෙදිවාසයකරන්නාවූ මේඅඞ්ගයෙන්යුක්තවූ ශාස්තෘකෙනෙකු අතීතකොඨාසයෙහි නොම දක්නෙමු, මේවත්මන් කල්හිද නොම දක්නෙමු. දැන් ඒ භාග්‍යවතුන් වහන්සේ හැරයි, ස්වාමීන්වහන්ස සක්දෙවිඳුතෙමේ සනත් කුමාර බ්‍රහ්මයාහට භාග්‍යවතුන් වහන්සේගේ මේ ගුණවර්ණනා අට ප්‍රකාශ කළේය.

තෙන සුදං බ්‍රහ්මා සනංකුමාරො අත්තමනො හොති පමුදිතො පීතිසොමනස්සජාතො භගවතො අට්ඨ යථාභුච්චෙව වණ්ණෙ සුත්වා.

28. අථ භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො ඔළාරිකං අත්තභාවං අභිනිම්මිණිත්වා කුමාරවණ්ණී හුත්වා පඤ්චසිඛො දෙවානං තාවතිංසානං පාතුරහොසි. වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසීදි. සෙය්‍යථාපි භන්තෙ බලවා පුරිසො සුපච්චත්ථතෙ වා පල්ලඞ්කෙ සමෙ වා භූමිභාගෙ පල්ලඞ්කෙන නිසීදෙය්‍ය, එවමෙව ඛො භන්තෙ බ්‍රහ්මා සනංකුමාරො වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ පල්ලඞ්කෙන නිසීදිත්වා දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි.

29. තං කිමඤ්ඤන්ති භොන්තො දෙවා තාවතිංසා යාව දීඝරත්තං මහාපඤ්ඤො ච සො භගවා අහොසි.

---

ඒ කාරණයෙන් සනත් කුමාර බ්‍රහ්මතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ අෂ්ටප්‍රකාරවූ විද්‍යමාන ගුණවර්ණනාව අසා සතුටුසිත් ඇත්තේවේ. වැඩියක් සතුටුසිත් ඇත්තේවේ. හටගත් ප්‍රීති හා සොම්නස් ඇත්තේ වෙයි.

28. ස්වාමීන්වහන්ස එකල්හි සනත් කුමාර බ්‍රහ්මතෙමේ ඖදාරිකවූ ආත්ම භාවයක් මනාකොට මවාගෙණ පඤ්චශිඛ දිව්‍යපුත්‍රයා මෙන් කුමාරවෙස්ගෙණ තව්තිසා වැසි දෙවියන් අතරෙහි පහළවූයේය. ඒ බ්‍රහ්ම රාජතෙමේ අහසට නැගී පිහිටීම්රහිතවූ අහසෙහි පලඟින්යුක්තව උන්නේය. කෙසේදයත්, ස්වාමීන් වහන්ස බලවත් පුරුෂයෙක් මනාකොට වස්ත්‍රාදියෙන් අතුරණලද පර්‍ය්‍යඞ්කයෙක්හි හෝ සමවූභූමිභාගයෙක්හි යම්සේ පර්‍ය්‍යඞ්කයෙන් නිසිදනය කරන්නේද. ස්වාමීන් වහන්ස එපරිද්දේන්ම සනත් කුමාර බ්‍රහ්මතෙමේ අහසට පැණ නැගී පිහිටීම් රහිතවූ අහසෙහි පර්‍ය්‍යඞ්කයෙන් නිසීදනය කොට තව්තිසා වැසි දෙවියන් ඇමතුයේය.

29. පින්වත්නි තව්තිසා වැසි දෙවියෝ ඒ කුමකැයි සිතත්ද, ඒ භාග්‍යවතුන් වහන්සේ ඉතා බොහෝ දීර්ඝ කාලයක් මුළුල්ලෙහි මහත් ප්‍රඥා ඇතිවූසේක.

භූතපුබ්බං භො රාජා දිසම්පති නාම අහොසි. දිසම්පතිස්ස රඤ්ඤො, ගොවින්දොනාම බ්‍රාහ්මණො පුරොහිතො අහොසි. දිසම්පතිස්ස රඤ්ඤො රෙණුනාම කුමාරො පුත්තො අහොසි. ගොවින්දස්ස බ්‍රාහ්මණස්ස ජොතිපාලො නාම මාණවො පුත්තො අහොසි ඉති රෙණුච රාජපුත්තො ජොතිපාලොච මාණවො අඤ්ඤෙච ඡඛත්තියා ඉච්චෙතෙ අඩ සහායා අහෙසුං. අථඛො අහොරත්තානං අච්චයෙන ගොවින්දො බ්‍රාහ්මණො කාලමකාසි. ගොවින්දෙ බ්‍රාහ්මණෙ කාලකතෙ රාජා දිසම්පති පරිදෙවෙසි. යස්මිං වත භො මයං සමයෙ ගොවින්දෙ බ්‍රාහ්මණෙ සබ්බකිච්චානි සම්මාවොස්සජ්ජිත්වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙම තස්මිං සමයෙ ගොවින්දො බ්‍රාහ්මණො කාලකතොති. එවං වුත්තෙ භො රෙණු රාජපුත්තො රාජානං දිසම්පතිං එතදවොච. මාඛො ත්වං දෙව ගොවින්දෙ බ්‍රාහ්මණෙ කාලකතෙ අතිබාළ්හං පරිදෙවෙසි. අත්ථි දෙව ගොවින්දස්ස බ්‍රාහ්මණස්ස ජොතිපාලොනාම මාණවො පුත්තො පණ්ඩිතතරොචෙව පිතරා අලමත්ථදසතරොචෙව පිතරා, යෙපිස්ස පිතා අත්ථෙ අනුසාසි, තෙපි ජොතිපාලස්සෙව මාණවස්ස අනුසාසනියාති. එවං කුමාරාති, එවං දෙවාති.

පින්වත්නි, පූර්වකාලයෙහි දිසම්පති නම් රජෙක් වූයේය. දිසම්පති නම් රජහට ගොවින්ද නම් බ්‍රාහ්මණයෙක් පෙරෙවිවූයේය. දිසම්පති රජහට රේණුනම් කුමරෙක් පුත්වූයේය. ගොවින්ද බ්‍රාහ්මණයාහට ජොතිපාල නම් මාණවකයෙක් පුත් වූයේය. මෙසේ රේණු නම් රජ පුත් තෙමේද ජොතිපාලනම් තරුණ තෙමේද අන්‍යවූද ක්‍ෂත්‍රියකුලයෙහි උපන් කුමරුවෝ සදෙනෙක් දැයි මෙසේ මේ යහලුවෝ අටදෙනෙක්වූහ. ඉක්බිත්තෙන් දීර්ඝකාලයක් හුගේ ඇවෑමෙන් ගොවින්ද බමුණුතෙමේ කලුරිය කළේය. ගොවින්ද බමුණා කලුරිය කළ කල්හි දිසම්පති රජතෙමේ විලාප කීයේය. පින්වත්නි යම්කලෙක්හි සියලුකටයුතු ගොවින්දබ්‍රාහ්මණයා කෙරෙහි පමුණුවා පස්කම්කොටස්වලින් පමුණුවනලද්දෙ එයින්ම යුක්තවූවෝ ඉන්ද්‍රියයන් හසුරුවාලමුද ඒකාලයෙහිම ගොවින්දබ්‍රාහ්මණතෙම කලුරිය කළේය කියායි. පින්වත්නි, මෙසේ කිකල්හි රේණු නම් රජ පුත්‍ර තෙම දිසම්පති රජහට මේ කාරණ සැලකළේය. දේවයන් වහන්ස, ගොවින්ද බ්‍රාහ්මණයා කලුරියකළේයයි විලාප නොකියනු මැනවි. දේවයන්වහන්ස ගොවින්දබ්‍රාහ්මණයාගේ ජොතිපාලනම් තරුණපුත්‍රයෙක් ඇත්තේය. ඒමාණවක තෙමේ පියාට වඩා අතිශයෙන් පණ්ඩිතදවෙයි. පියාටවඩා සුදුසු නුවණඇත්තේදවෙයි. ඔහුගේ පියතෙම් යම්බඳු අර්ථානුශාසනාකළේද ඒ අර්ථානුශාසනාද ජොතිපාල මාණවකයා විසින් කරන්ට හැක්කෝ වෙත්ය කියායි. කුමාරය එසේද, දෙවයෙනි එසේය.

30. අථඛො භො රාජාදිසම්පතී අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි, එහි ත්වං අම්භො පුරිස යෙන ජොතිපාලො මාණවො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා ජොතිපාලං මාණවං එවං වදෙහි. භවමත්ථු භවන්තං ජොතිපාලංමාණවං, රාජාදිසම්පතී, භවන්තං ජොතිපාලංමාණවං ආමන්තයති. රාජාදිසම්පතී භොතො ජොතිපාලස්ස මාණවස්ස දස්සනකාමොති. එවං දෙවාති ඛො සො පුරිසොදිසම්පතිස්ස රඤ්ඤො පටිස්සුත්වා යෙනජොතිපාලොමාණවොතෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ජොතිපාල මාණවං එතදවොච. භවමත්ථු භවන්තං ජොතිපාලමාණවං. රාජාදිසම්පතී භවන්තං ජොතිපාලං මාණවං ආමන්තයති. රාජා දිසම්පතී භොතො ජොතිපාලස්ස මාණවස්ස දස්සනකාමොති. එවං භොතිඛො භො ජොතිපාලො මාණවො තස්ස පුරිසස්ස පටිස්සුත්වා යෙන රාජා දිසම්පතී තෙනුපසඞ්කමි.

---

30 පින්වත්නි ඉක්බිත්තෙන් දිසම්පති රජතෙමේ එක්තරා පුරුෂයෙකු ආමන්ත්‍රණයකළේය. එම්බල පුරුෂය, තෝ මෙහි එව. ජෝතිපාලමාණවකතෙමේ යම්තැනෙක්හිද එතනට එළඹෙව. එළඹ ජෝතිපාල මාණවකයාට මෙසේකියව. පින්වත් ජෝතිපාල මාණවකයාට කල්‍යාණයක්වේවා. දිසම්පති රජතෙමේ පින්වත් ජෝතිපාල මාණවකයාට ආමන්ත්‍රණය කෙරේ. දිසම්පතී රජතෙමේ පින්වත් ජෝතිපාල මාණවකයාගේ දැකීම කැමැත්තේය කියායි. දේවයන් වහන්ස, ඒ මැනවැයි ඒ පුරුෂයතෙම දිසම්පති රජ හට පිළිවදන්දී ජෝතිපාලමාණවක තෙමේ යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ ජෝතිපාල මාණවකයාට මේ කාරණය කියේය. පින්වත් ජෝතිපාල මාණවකයාට යහපතක්වේවා. දිසම්පති රජතෙමේ ජෝතිපාල මාණවකයාට ආමන්ත්‍රණය කෙරෙයි. දිසම්පතී රජ තෙමේ පින්වත් ජෝතිපාල මාණවකයාගේ දැකීම කැමැත්තේය කියායි. පින්වත, පින්වත්නි, ඒමැනවැයි ජෝතිපාල මාණවකතෙමේ ඒ පුරුෂයාට පිළිවදන්දී දිසම්පතී රජ තෙමේ යම් තැනෙක්හිද එතනට එළඹියේය.

උපසඞ්කමිත්වා දිසම්පතිනා රඤ්ඤා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො භො ජොතිපාලං මාණවං රාජා දිසම්පතී එතදවොච. අනුසාසතු නො භවං ජොතිපාලොමාණවො. මා භවං ජොතිපාලො අනුසාසනියා පච්චාව්‍යාහාසි පෙත්තිකෙ තං ඨානෙ ඨපෙස්සාමි, ගොවින්දියෙ අභිසිඤ්චිස්සාමීති. එවංභොති ඛො භො ජොතිපාලො මාණවො දිසම්පතිස්ස රඤ්ඤො පච්චස්සොසි.

31. අථඛො භො රාජා දිසම්පතී ජොතිපාලං මාණවං ගොවින්දියෙ අභිසිඤ්චි, පෙත්තිකෙ ඨානෙ ඨපෙසි. අභිසිත්තො ජොතිපාලො මාණවො ගොවින්දියෙ පෙත්තිකෙ ඨානෙ ඨපිතො යෙ පිස්ස පිතා අත්ථෙ අනුසාසි.

---

එලඹ දිසම්පති රජසමග සතුටුවූයේය· සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත් පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ ජොතිපාල මාණවකයාට දිසම්පතී රජතෙමේ මේ කාරණය කියේය. පින්වත් ජොතිපාල මාණවකතෙමේ අපට අනුශාසනා කෙරේවා. ජොතිපාල මාණවක තෙමේ අනුශාසනාව ප්‍රතික්ෂෙප නොකෙරේවා. නොහොත් අනුශාසනා කෙරේවා. තාපසවූ ගොවින්ද බමුණන්ටඅයිති තනතුරෙහි තා තබන්නෙමි. ගොවින්දබ්‍රාහ්මණයාට අයත් තනතුරෙහි අභිෂෙක කරන්නෙමියි කියේය. පින්වත්නි ඒ මැනවයි. ඒ ජොතිපාල බ්‍රාහ්මණ තෙම දිසම්පතිරජහට පිළිවදන් දුන්නේය.

31. පින්වත්නි ඉක්බිත්තෙන් දිසම්පති රජතෙමේ ජොතිපාල මාණවකයා ගොවින්ද ස්ථානාන්තරයෙහි අභිෂෙක කළේය. ඔහුගේ පියානන්ට අයිති තනතුරෙහි තැබුයේය. ගොවින්දස්ථානාන්තරයෙහි අභිෂෙක කරණලද්දාවූ පියාට අයත් තනතුරෙහි තබනලද්දාවූද ජොතිපාල මාණවක තෙමේ ඔහුගේ පියතෙමේ යම්බඳු අර්ථානුශාසනා කළේද.

තෙ අත්ථෙ අනුසාසති යෙපිස්ස පිතා අත්ථෙ නානුසාසි තෙපි අත්ථෙ නානුසාසති, යෙපිස්ස පිතා කම්මන්තෙ අභිසම්භොසි තෙපි කම්මන්තෙ අභිසම්භොති යෙපිස්සපිතා, කම්මන්තෙ නාභිසම්භොසි තෙපි කම්මන්තෙ, නාභිසම්භොති, තමෙනං මනුස්සා එවමාහංසු ගොවින්දො වත භො බ්‍රාහ්මණො, මහා ගොවින්දො වත භො බ්‍රාහ්මණොති. ඉමිනා ඛො එවං භො පරියායෙන ජොතිපාලස්ස මාණවස්ස මහාගොවින්දො, මහාගොවින්දොත්වෙව සමඤ්ඤා උදපාදි.

32. අථඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන තෙ ඡත්තියා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තෙ ඡත්තියෙ එතදවොච. දිසම්පති භො රාජා ජිණ්ණො වුඩ්ඪො මහල්ලකො අද්ධගතො වයොඅනුප්පත්තො. කොනුඛො භො ජානාති ජීවිතානං. ඨානං ඛො පනෙතං විජ්ජති.

---

ඒ අර්ථයන් අනුශාසනා කෙරෙයි. ඔහුගේ පියතෙමේ යම් අර්ථානුශාසනා නොකළේද. ඒ අර්ථානුශාසනාද නොකෙරේ. ඔහුගේ පියතෙමේ යම් කර්මාන්තයන් සංවිධාන කළේද, හෙවත් පිහිටෙව්වේද. ඒ කර්මාන්ත සංවිධාන කෙරෙයි. හෙවත් පිහිටුවයි. ඔහුගේ පියතෙම යම් කර්මාන්තයන් සංවිධාන නොකළේද ඒ කර්මාන්තයන් සංවිධාන නොකෙරේ. ඒ ජොතිපාල මාණවකයාට මනුෂ්‍යයෝ මෙසේ කීහ. ඒකාන්තයෙන් මහා ගොවින්ද බ්‍රාහ්මණය ඒකාන්තයෙන් මහාගොවින්ද බ්‍රාහ්මණය කියායි. මේ කාරණයෙන්ද ජොතිපාල මාණවකයාට මහාගොවින්දය මහාගොවින්දය යන නාමයම ඇතිවිය.

32. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ ක්ෂත්‍රියයෝ සදෙන යම් තැනෙක්හිද එතනට එළැඹියේය. එළඹ ඒ ක්ෂත්‍රියයන් සදෙනාට මේ කාරණය සැලකළේය. පින්වත්නි, දිසම්පති රජතෙමේ ජරපත්වූයේය. වැඩිවයසට පැමිණියේය. මහලුවූයේය. ඉක්මගිය කල්ඇත්තේය. පැසුලු වයසට පැමිණියේය. පින්වතුනි, කෙසේනම් ජීවිතයන්ගේ පැවැත්ම කියනුම කවරේද ? මේ මතු කියනුලබන කාරණය විද්‍යමාන වේමය.

යං දිසම්පතිම්හි රඤ්ඤෙ කාලකතෙ රාජකත්තාරො රෙණුං රාජපුත්තං රජ්ජෙ අභිසිඤ්චෙය්‍යුං. ආයන්තු භොන්තො යෙන රෙණු රාජපුත්තො තෙනුපසඞ්කමථ. උපසඞ්කමිත්වා, රෙණුං රාජපුත්තං එවං වදෙථ, මයං භොතො රෙණුස්ස සහායා පියා මනාපා අප්පටික්කූලා' යං සුඛො භවං තං සුඛා මයං. යං දුක්ඛො භවං තං දුක්ඛා මයං. දිසම්පතී භො රාජා ජිණ්ණො වුඩ්ඪො මහල්ලකො අද්ධගතො වයොඅනුප්පත්තො. කොනුඛො පන භො ජානාති ජීවිතානං. ඨානං ඛොපනෙ'තං විජ්ජති යං දිසම්පතිම්හි රඤ්ඤෙ කාලකතෙ රාජකත්තාරො භවන්තං රෙණුං රජ්ජෙ අභිසිඤ්චෙය්‍යුං. සචෙ භවං රෙණු රජ්ජං ලභෙථ සංවිභජෙථ නො රජ්ජෙනාති.

---

යම්හෙයකින් දිසම්පතී රජහු කලුරියකළ කල්හි ඇමතියෝ රෙණු රාජපුත්‍රයා රාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහුය. පින්වත්නි, මෙහි එත්වා. පින්වත් රෙණු රාජපුත්‍රතෙම යම්තැනෙක් හිද එතනට එළඹෙව්. එළඹ රෙණු රාජ පුත්‍රයාට මෙසේ කියව්. අපි පින්වත් රෙණු රාජපුත්‍රයාගේ ප්‍රියවූ මනාපවූ යහලුවෝ වෙමු. ඔවුනොවුන් කෙරෙහි පිළිකුල් නොකරන්නෝ වෙමු. පින්වත් තෙමේ යම් සැපයක් ඇත්තේද අපි ඒ සැපය ඇත්තෙමු. පින්වත්තෙමේ යම් දුකක් ඇත්තේද අපි ඒ දුක ඇත්තම්හ. පින්වත්නි, දිසම්පතී රජතෙමේ ජරපත්වූයේය. වැඩිවයසට පැමිණියේය. මහලුවූයේය. කල්ඉක්මගියේය. පැසුලු වයසට පැමිණියේය. පින්වත්නි, කවරෙක්නම් ජීවිතයන්ගේ පැවැත්ම දනගණීද ? මේ මතු කියනුලබන කාරණය ඇත්තේමය. යම්හෙයකින් දිසම්පතී රජහු කලුරියකළ කල්හි රජ ඇමතියෝ පින්වත් රෙණු නම් කුමරහු රාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහුය යන මේයි. පින්වත් රෙණු කුමාර තෙමේ ඉදින් රාජ්‍යය ලබන්නේනම් අප රාජ්‍යයෙන් කිමෙක සංවිභාග කරන්නේද්‍යයි විචාළාහුය.

33. එවං භොතිඛො තෙ ඡක්ඛත්තියා මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන රෙණු රාජපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා රෙණුං රාජපුත්තං එතදවොචුං. මයං භො භොතො රෙණුස්ස සහායා පියා මනාපා අප්පටික්කූලා. යං සුඛො භවං තං සුඛා මයං, යං දුක්ඛො භවං තං දුක්ඛා මයං. දිසම්පතිඛො භො රාජා ජිණ්ණො වුඩ්ඪො මහල්ලකො අද්ධගතො වයොඅනුප්පත්තො, කොනුඛො භො පන ජානාති ජීවිතානං. ඨානං ඛොපනෙතං විජ්ජති යං දිසම්පතිම්හි රඤ්ඤෙ කාලකතෙ රාජ කත්තාරො භවන්තං රෙණුං රජ්ජෙ අභිසිඤ්චෙය්‍යුං. සචෙ භවං රෙණු රජ්ජං ලභෙථ, සංවිභජෙථ නො රජ්ජෙනාති. කොනුඛො භො අඤ්ඤෙ මම විජිතෙ සුඛමෙධෙය්‍යාථ. අඤ්ඤත්‍ර භවන්තෙහි.

33. පින්වත්නි, පින්වත ඒ මැනවැයි ඒ ක්‍ෂත්‍රියකුමාරයෝ සදෙන මහාගොවින්ද බ්‍රාහ්මණයාට පිළිවදන් ආදී රේණු නම් රාජපුත්‍රතෙම යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ රේණු රාජපුත්‍රයාට මේ කාරණය දැන්වූහ. අපි පින්වත් රේණු කුමරහුගේ ප්‍රියවූ මනවඩන්නාවූ පිළිකුල් නොකරන්නාවූ යහළුවෝ වෙමු. පින්වත්තෙමේ යම්සැපයක් ඇත්තේද අපිද ඒ සැපය ඇත්තෙමු. පින්වත්තෙමේ යම් දුකක් ඇත්තේද අපිද ඒ දුක ඇත්තෙමු. පින්වත, පින්වත් දිසම්පතී රජතෙමේ ජරපත් වූයේය. වැඩිවයසට පැමිණියේය. මහලූය. කල් ඉක්මගියේය. පැසුලුවයසට පැමිණියේය. පින්වත්නි, කවරෙක්නම් සත්වයන්ගේ පැවැත්ම දැනගණිද ? මේ කාරණය වූකලි විද්‍යමානවේමය. ඒනම්, යම්හෙයකින් දිසම්පති රජහු කලුරියකළ කල්හි රජ ඇමැතියෝ පින්වත් රේණු කුමරහු රාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහුය යනුයි. ඉදින් පින්වත් රේණුතෙමේ රාජ්‍යය ලබන්නේනම් අප රාජ්‍යයෙන් සංවිභාග කරන්නේදැයි විචාළේය. පින්වත්නි, පින්වතුන්හැර අන් කවරෙක්නම් මාගේ රටෙහි සැපයට පැමිණෙන්නාහුද.

සචා'හං භො රජ්ජං ලභිස්සාමි සංවිභජිස්සාමි භො රජ්ජෙනාති.

34. අථඛො භො අහොරත්තානං අච්චයෙන රාජා දිසම්පති කාලමකාසි. දිසම්පතිම්හි රඤ්ඤෙ කාලකතෙ රාජකත්තාරො රෙණුං රාජපුත්තං අභිසිඤ්චිංසු. අභිසිත්තො රෙණු රජ්ජෙන පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති. අථඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන තෙ ඡක්ඛත්තියා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ ඡක්ඛත්තියෙ එතදවොච. දිසම්පති ඛො භො රාජා කාලකතො අභිසිත්තො භවං රෙණු රජ්ජෙන පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති.

---

පින්වත්නි, ඉදින් මම රාජ්‍යය ලබන්නෙම්නම් තොප රාජ්‍යයෙන් සංවිභාගකරන්නෙමි. හෙවත් තොපට රාජ්‍යය බෙදාදෙන්නෙමියි කියේය.

34. පින්වත්නි, ඉක්බිත්තෙන් අහෝ රාත්‍රයන්ගෙ ඇවෑමෙන් දිසම්පති රජතෙමෙ කලුරිය කළේය. දිසම්පතී රජහු කලුරියකල කල්හි රජ ඇමතියෝ රෙණු රාජ පුත්‍රයා රාජ්‍යයෙහි අභිෂෙක කළාහුය. රාජ්‍යයෙන් අභිෂෙක කරණලද්දාවූ රෙණු කුමාරතෙමේ පස්කම් කොටස්වලින් පමුණුවනලද්දේ එයින්ම යුක්තවූයේ ඉන්‍ද්‍රියයන් හසුරුවාලයි. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ ක්‍ෂත්‍රියයෝ සදෙන යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ ඒ ක්‍ෂත්‍රිය කුමාරයන් සදෙනාට මේ කාරණය කියේය. පින්වත්නි' දිසම්පතී රජතෙමේ කලුරිය කළේය. රෙණු නම් කුමාරතෙමේ රාජ්‍යයෙන් අභිෂෙක කරණලද්දේය. හෙතෙමේ පඤ්චකාම ගුණයන්ගෙන් පමුණුවනලද්දේ එයින්ම යුක්තවූයේ ඉන්‍ද්‍රියයන් හසුරුවාලයි.

කොනුඛොපන භො ජානාති මදනීයා කාමා. ආයන්තුභොන්තොයෙන රෙණු රාජා තෙනුපසඞ්කමථ, උපසඞ්කමිත්වා රෙණුං රාජානං එවං වදෙථ. දිසම්පති ඛො භො රාජා කාලකතො අභිසිත්තො භවං රෙණු රජ්ජෙන. සරති භවං තං වචනන්ති, එවං භොතිඛො භො තෙ ඡක්ඛත්තියා මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්සපටිස්සුත්වා යෙන රෙණු රාජා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා රෙණුං රාජානං එතදවොචුං. දිසම්පතිඛො භො රාජා කාලකතො අභිසිත්තො භවං රෙණු රජ්ජෙන. සරති භවං තං වචනන්ති. සරාමහංභො තං වචනං, කොනුඛො භො පහොති ඉමං මහා පඨවිං උත්තරෙණ ආයතං දක්ඛිණෙන සකටමුඛං සත්තධා සමං සුවිභත්තං විභජිතුන්ති.

---

පින්වත්නි, ප්‍රමාදකාරකවූ කාමයෝ කෙබඳුදැයි කවරෙක්නම් දනගණිද නොහොත් ප්‍රමාදය ඇතිකරන්නාවූ කාමය හෙතුකොට ගෙණ කවරෙක් මෙය දනගණිද (කල්යන කල්හි මේ කාරණය සිහිනොකෙරේය යනුයි.) පින්වත්නි, මෙහි එන්වා. රෙණු රජ තෙම යම්තැනෙක්හිද එතනට එලඹෙව්. එලඹ රෙණු රජහට මෙසේ කියව්. පින්වතුන්වහන්ස, දිසම්පති රජතෙමේ කලුරිය කළේය. පින්වත් රෙණු නම් කුමාරතෙමේ රාජ්‍යයෙන් අභිෂෙකකරණලද්දේය. භවත්තෙමේ ඒ වචනය සිහිකෙරේදැයි විචාරව්. පින්වත්නි, ඒ මැනවැයි ඒ පින්වත් කැත් කුමරුවෝ සදෙනා මහාගොවින්ද බ්‍රාහමණයාට පිළිවදන්දී රෙණු රජතෙම යම් තැනෙක්හිද එතානට එලඹියාහුය. එලඹ රෙණු රජහට මේ කාරණය කීවාහුය. පින්වතුන්වහන්ස, දිසම්පති රජතෙමේ කලුරියකළේය. පින්වත් රෙණුතෙමේ රාජ්‍යයෙන් අභිෂෙකකරණලද්දේය. පින්වතුන්වහන්ස, ඒ වචනය සිහිකෙරෙහිදැයි විචාලාහුය. පින්වත්නි, මම ඒ වචනය සිහිකරමි. පින්වත්නි, මේ මහපොළව උතුරුපසින් දිගටද දකුණුපසින් ගැල්මුඛයක් ලෙසටද සත්පරිද්දෙන් සමලෙසසංවිභාග කරණලද්දක්කොට බෙදන්නට කවරෙක්නම් සමර්ථවේද්ද'යි විචාළේය.

කො නුඛො භො අඤ්ඤො පහොති අඤ්ඤත්‍ර මහාගොවින්දෙන බ්‍රාහ්මණෙනාති.

35 අථ ඛො භො රෙණුරාජා අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි. එහි ත්වං අම්භො පුරිස යෙන මහාගොවින්දො බ්‍රාහ්මණො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මහාගොවින්දං බ්‍රාහ්මණං එවං වදෙහි. රාජා තං භවන්තං රෙණු ආමන්තෙතීති. එවං දෙවාති ඛො සො පුරිසො රෙණුස්ස රඤ්ඤො පටිස්සුත්වා යෙන මහාගොවින්දො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මහාගොවින්දං බ්‍රාහ්මණං එතදවොච. රාජා තං භවන්තං රෙණු ආමන්තෙතීති. එවං භොති ඛො මහාගොවින්දො බ්‍රාහ්මණො තස්ස පුරිසස්ස පටිස්සුත්වා යෙන රෙණු රාජා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රෙණුනා රඤ්ඤා සද්ධිං සම්මොදි.

---

පින්වත්නි, මහාගොවින්ද බ්‍රාහ්මණයා හැර අන් කවරෙක් මේ රාජ්‍ය විභාගය කරන්නට සමර්ථවේදැයි කීවාහුය.

35. පින්වත්නි ඉක්බිත්තෙන් රෙණු රජතෙමේ එක්තරා පුරුෂයෙකු ඇමතුයේය. එම්බල පුරුෂය, තෝ මෙහි එව. මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ යම් තැනෙක්හිද එතනට එළඹෙව. එළඹ මහාගොවින්ද බ්‍රාහ්මණයාට මෙසේ කියව. පින්වත, රෙණු රජතෙමේ ඔබට ආමන්ත්‍රණය කෙරේය යනුයි. පින්වත්නි දේවයන්වහන්ස, ඒ මැනවයි ඒ පුරුෂතෙම රෙණු රජහට පිළිවදන්දී මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ මහාගොවින්ද බ්‍රාහ්මණයාට මේ කාරණය කීයේය, කෙසේද පින්වතුන්වහන්ස රෙණු, රජතෙමේ ඔබවහන්සේට ආමන්ත්‍රණය කෙරේය යනුයි. පින්වත්නි ඒ මැනවයි ! භවත් මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ පුරුෂයාට පිළිවදන්දී රෙණු රජතෙමේ යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ රෙණු රජ සමග සතුටුවූයේය.

සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො හො මහාගොවින්දං බ්‍රාහ්මණං රෙණු රාජා එතදවොච. එතු භවං ගොවින්දො ඉමං මහාපථවිං උත්තරෙන ආයතං දක්ඛිණෙන සකටමුඛං සත්තධා සමං සුවිභත්තං විභජතූති. එවං භොති ඛො මහාගොවින්දො බ්‍රාහ්මණො රෙණුස්ස රඤ්ඤො පටිස්සුත්වා ඉමං මහාපථවිං උත්තරෙන ආයතං දක්ඛිණෙන සකටමුඛං සත්තධා සමං සුවිභත්තං විභජි, සබ්බානි සකටමුඛානි අඨපෙසි.

36 තත්‍ර සුදං මජ්ඣෙ රෙණුස්ස රඤ්ඤො ජනපදො හොති.

දන්තපුරං කාලිඞ්ගානං
අස්සකානඤ්ච පොතනං
මහිස්සති අවන්තීනං
සොවීරානඤ්ච රොරුකං

---

සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොටනිමවා එකත්පසෙක උන්නේය. පින්වත්නි, එකත්පසෙක උන්නාවූ මහාගොවින්ද බ්‍රාහ්මණයාට රෙණු රජතෙමේ මේ කාරණය කියේය. පින්වත් ගොවින්ද තෙමේ මෙහි ඒවා. මේ මහ පොළව උතුරු පසින් දිගටද දකුණු පසින් ගැල්මුවයක්ලෙසද සත්පරිද්දෙකින් එක්සමව සංවිභාග කරණලද්දක්කොට බෙදුවායි කියේය. පින්වත්නි, ඒ මැනවැයි. භවත් මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ රෙණු රජහට පිළිවදන්දී මේ මහා පොළව උතුරු පසින් දිගටද දකුණු පසින් ගැල්මුඛයක්ලෙසටද සත්පරිද්දෙකින් එක්සමව සංවිභාග කරණලද්දක්කොට බෙදූයේය. සියලු නගරයන්ම සකට මුඛාකාරකොට තැබීය.

36. එහි ඒ සියලු නගරයන්ගේ මධ්‍යයෙහි රෙණු රජහුගේ ජනපදය පිහිටියේවේ. කලිඟුරජුන්ගේ දන්තපුරයද අස්සකනම්රජුන්ගේ පොතන නම් නගරයද අවන්තිරජුන්ගේ මහිස්සති නම් නගරයද සුවිරනම් රජුන්ගේ රොරුකනම් නගරයද

මිථිලාච විදෙහානං
චම්පා අඞ්ගෙසු මාපිතා,
බාරාණසී ච කාසීනං
එතෙ ගොවින්‍ද මාපිතා'ති.

අථ ඛො තෙ ඡ ඛත්තියා යථා සකෙන ලාභෙන අත්තමනා අහෙසුංපරිපුණ්ණ සඞ්කප්පා. යං වත නො අහොසි ඉච්ඡිතං යං ආකඞ්ඛිතං යං අධිප්පෙතං යං අධිපත්ථිතං, තං නො ලද්ධන්ති.

සත්තභූ බ්‍රහ්මදත්තොච
වෙස්සභූ භරතො සහ
රෙණු චෙව ධතරට්ඨො
තදා සුං සත්තභාරතානි.

**පඨමක භාණවාරං නිට්ඨිතං.**

---

විදෙහරජුන්ගේ මිථිලානම් නගරයද අඟුරජුන් කරණකොටගෙණ මවණලදචම්පා නම්නගරයදකසීරජුන්ගේබාරණසීනගරයදයනමේ සප්ත නගරයෝ ගොවින්‍ද බ්‍රාහ්මණයා විසින් මවනලද්දාහුය. පින්ව ත්නි, ඉක්බිත්තෙන්ඒක්‍ෂත්‍රියයෝසදෙන විඩිවූ පරිද්දෙන් තමහට අනි තිවූ රාජ්‍ය ලාභයෙන් සතුටුසිත්ඇත්තෝවූහ. සම්පූර්ණ චිත්තසං කල්පනා ඇත්තෝදවූහ. කෙසේදයත්, ඒකාන්තයෙන් අප විසින් යමක් කැමතිවනලද්දේද, යමක් ආකාංක්‍ෂා කරණලද්දේද, යමක් අභිප්‍රාය කරණලදද, යමක් බොහෝ සෙයින් පතනලද්දේද ඒ කාර ණය අප විසින් ලබනලදූයි කියායි. සත්තභූය, බ්‍රහ්මදත්තය, වෙස්සභූය, භරතය, (ඔවුන් සමග) රෙණුය, ධතරට්ඨය, යන භරත රජුන් සත්දෙනෙක් ඒ කාලයෙහි ඇතිවූහ.

**පළමුවෙනි බණවර මෙතෙකින් කියා නිමවනලදී.**

37. අථ ඛො තෙ ඛත්තියා යෙන මහාගොවින්දො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා මහාගොවින්දං බ්‍රාහ්මණං එතදවොචුං. යථා භවං ගොවින්දො රෙණුස්ස රඤ්ඤො සහායො පියො මනාපො අප්පටික්කූලො, එවමෙව භවං ගොවින්දො අම්හාකම්පි සහායො පියො මනාපො අප්පටික්කූලො. අනුසාසතු නො භවං ගොවින්දො, මා නො භවං ගොවින්දො අනුසාසනියා පච්චබ්‍යාහාසීති. එවං හොතීති ඛො සො මහාගොවින්දො බ්‍රාහ්මණො තෙසං ඛත්තියානං පච්චස්සොසි. අථ ඛො මහාගොවින්දො බ්‍රාහ්මණො සත්තච රාජානො ඛත්තියෙ මුද්ධාවසිත්තෙ රජ්ජෙ අනුසාසි,

---

37. පින්වත්නි, ඉක්බිත්තෙන් ක්ෂත්‍රියයෝ සදෙන මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ යම් තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ මහාගොවින්ද බ්‍රාහ්මණයාට මේ කාරණය කීවාහුය. පින්වත් ගොවින්ද තෙමේ රේණු රජහට යම්සේ ප්‍රියවූ මනවඩන්නාවූ පිළිකුල් නොකරන්නාවූ මිත්‍රවේද, එපරිද්දෙන්ම පින්වත් ගොවින්දතෙමේ අපගේද ප්‍රියවූ මනවඩන්නාවූ පිළිකුල්නොකරන්නාවූ මිත්‍රවෙයි. පින්වත් ගොවින්ද බ්‍රාහ්මණ තෙමේ අපට අනුශාසනා කෙරේවා. පින්වත භවද් ගොවින්ද බ්‍රාහ්මණතෙමේ අනුශාසනාවෙන් බැහැර නොයේවා. නොහොත් අපට අනුශාසනා කෙරේවායි කීවාහුය. (සෙනෙවිරත් තනතුරහා පෙරවි තනතුර පිළිගණුමැනවයි කීවාහුය.) පින්වත්නි, ඒ මැනවයි භවද් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ක්ෂත්‍රිය රජුන් සදෙනාට පිළිවදන් දුන්නේය. පින්වත්නි, ඉක්බිත්තෙන් භවද් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ මුදුනෙහි පැන්වත් කිරීමෙන් රාජ්‍යයෙහි අභිෂෙක කරණලද්දවූ ක්ෂත්‍රිය රජුන් සත්දෙනාට අනුශාසනා කෙළේය.

සත්තච බ්‍රාහ්මණ මහාසාලෙ, සත්තච නහාතක සතානි මන්තෙ වාචෙසි.

38. අථ ඛො භො මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස අපරෙණ සමයෙන එවං කල්‍යාණො කිත්තිසද්දෙ අබ්භුග්ගඤ්ජි. සක්ඛි මහාගොවින්දො බ්‍රහ්මණො බ්‍රහ්මානං පස්සති, සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති. අථ ඛො භො මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි. මය්හං ඛො එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො, සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මානං පස්සති සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති.

---

බමුණු මහ සල්කුලයන් සතකටද අනුශාසනා කෙලේශ ජලස්නාන කරණකොට ගෙණ නහාතකයයි ලබනලද නම් ඇති බ්‍රාහ්මණයන් සත්සියයකටද වේද මන්ත්‍ර කියෙව්වේය. ( ගොවින්ද බමුණුතෙමේ පෙරෙවි සෙනෙවිරත් යන තනතුරුවලට පැමිණ උපපුරෝහිත බමුණන් සත්දෙනෙක්ද රාජ්‍යානු ශාසනාව පිණිස විධාන කළබැව් දතයුතුයි.

38. පින්වත්නි, ඉක්බිත්තෙන් මෑත කලකදී මහාගොවින්ද බ්‍රාහ්මණයාගේ මෙසේ යහපත්වූ කීර්ති ඝොෂාවක් ඉතා උස්ව නැංගේය. කෙසේදයත්, මහාගොවින්ද බ්‍රාහ්මණ තෙම ප්‍රත්‍යක්‍ෂ වශයෙන් මහබඹහුදකී මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ප්‍රත්‍යක්‍ෂවශයෙන් මහබඹහු සමග කථාකෙරෙයි. එක්ව කථාකෙරෙයි ඔහු හා රහස්කථා කෙරේය කියායි. පින්වත්නි, එකල්හි මහාගොවින්ද බ්‍රාහ්මණයාට මේ අදහසවිය· මාගේ මෙබඳු යහපත් කීර්ති ඝොෂාවක් උස්ව නැංගේය. කෙසේද, මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ සියැසින් මහාබඹහු දකී. මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ප්‍රත්‍යක්‍ෂව බ්‍රහ්මයා සමග කථාකෙරෙයි එක්ව කථාකෙරෙයි ඔහු හා මන්ත්‍රණය කෙරෙයි කියායි.

නඛො පනාහං බ්‍රහ්මානං පස්සාමින බ්‍රහ්මුනා සාකච්ඡෙමි න බ්‍රහ්මුනා සල්ලපාමි. න බ්‍රහ්මුනා මන්තෙමි, සුතං ඛො පන මෙතං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරිය පාචරියානං භාසමානානං යො වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලීයති කරුණං ඣානං ඣායති, සො බ්‍රහ්මානං පස්සති බ්‍රාහ්මුනා සාකච්ඡති සල්ලපති මන්තෙතීති. යන්නූනාහං වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලීයෙය්‍යං කරුණං ඣානං ඣායෙය්‍යන්ති.

39. අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන රෙණුරාජා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රෙණුං රාජානං එතදවොච.

---

මමවූකලි බ්‍රහ්මයා නොදක්නෙමි. එසේම බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග කථානොකරමි. බ්‍රහ්මයාසමග මන්ත්‍රණයද නොකරමි. වැඩිවයසට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය ප්‍රාචාර්‍ය්‍යවූ කියන්නාවූ බ්‍රාහ්මණයන්ගේ සම්මුඛයෙන් මේ කාරණය මවිසින් අසනලද්දේමය' ඒනම් යමෙක් වර්ෂා සෘතුවට අයත්වූ සාරමාසයෙහි ප්‍රතිසංලීනයයි හිඳු එකීභාවය කෙරේද කරුණාධ්‍යානය ධ්‍යාන කෙරේද හෙවත් කරුණා බ්‍රහ්මවිහාර භාවනා කෙරේද හෙතෙම බ්‍රහ්මයාදකී. බ්‍රහ්මයා සමග සාකච්ඡාකෙරෙයි එක්ව කථාකෙරෙයි ඔහුහා මන්ත්‍රණය කෙරේය යනුයි. යම්හෙයකින් මම එකාන්තයෙන් වර්ෂා සෘතුවටඅයත් සාරමාසයෙහි එකඟව වාසය කරන්නෙම් නම් කරුණාධ්‍යානය කරන්නේනම් හෙවත් කරුණා බ්‍රහ්මවිහාර භාවනාව කරන්නෙම්නම් ඉතා යෙහෙක යනුයි.

39. පින්වත්නි ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ රෙණු රජතෙමේ යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ රෙණු රජහට මේ කාරණය දැන්විය,

මය්හං ඛො භො එවං කල්‍යාණො කිත්තිසද්දෙ අබ්භුග්ගතො, සක්ඛි මහාකොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මානං පස්සති සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති. නඛො පනාහං භො බ්‍රහ්මානං පස්සාමි, න බ්‍රහ්මුනා සාකච්ඡෙමි න බ්‍රහ්මුනා සල්ලපාමි න බ්‍රහ්මුනා මන්තෙමි. සුතං ඛො පන මෙතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං ; යො වස්සිකෙ චත්තාරො මාසෙ පතිසල්ලීයති කරුණං ඣානං ඣායති සො බ්‍රහ්මානං පස්සති බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති. ඉච්ඡාමහං භො වස්සිකෙ චත්තාරො මාසෙ පතිසල්ලීයිතුං කරුණං ඣානං ඣායිතුං. නාම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන භත්තාභිහාරෙනාති, යස්සදානි භවං ගොවින්දො කාලං මඤ්ඤතීති.

---

පින්වත්නි, මගේ වූකලී මෙසේ යහපත්කීර්ති ඝෝෂාවක් ඉතා උස්ව නැංගේය. කෙසේද මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ප්‍රත්‍යක්‍ෂ වශයෙන් මහාබ්‍රහ්මයා දකියි. මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ප්‍රත්‍යක්‍ෂවශයෙන් මහා බ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරෙයි. එක්ව කථාකෙරෙයි. මන්ත්‍රණය කෙරේයයි කියායි. පින්වත, මම බ්‍රහ්මයා නොමදකිමි. බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග එක්ව කථාද නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. වැඩි වයසට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍යවූ කියන්නාවූ බ්‍රාහ්මණයන්ගේ සම්මුඛයෙන්මවිසින් මේ කාරණය අසනලද්දේය. යමෙක් වර්‍ෂා සෘතුවට අයත් සාරමාසයෙහි විවේකයට පැමිණ වාසය කෙරේද, කරුණාධ්‍යානය හෙවත් කරුණා බ්‍රහ්ම විහාරය ධ්‍යාන කරන්නේද හෙවත් වඩන්නේද. ඒ පුද්ගල තෙමේ බ්‍රහ්මයා දකී. බ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරේ. එක්ව කථා කෙරේ. ඔහු සමග මන්ත්‍රණයද කෙරේ. පින්වත, මම වර්‍ෂා සෘතුවට අයිති සාරමාසයෙහි විවේක භාවයෙන් කාලාතික්‍රමණය කරන්නටද කරුණාධ්‍යානය ධ්‍යානකරන්ටද හෙවත් කරුණා බ්‍රහ්ම විහාරයවඩන්ටද කැමැත්තෙමි. ඒකාලයෙහිදී බත් ගෙණඑන්නාවූ එක්කෙනෙකුන් හැර අන්කිසිවෙකු විසින් නොඑළඹිය යුත්තේ වෙමි. පින්වත් ගොවින්ද බ්‍රාහ්මණතෙමේ දැන්යමක් සම්බන්ධවකල්යයි සිතන්නේ නම් එය කරණු මැනවැයි කියායි.

.49 අථඛො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන තෙ ඛත්තියා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තෙ ඛත්තියෙ එතදවොච මය්හං ඛො එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මානං පස්සති සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති න ඛො පනාහං භො බ්‍රහ්මානං පස්සාමි න බ්‍රහ්මුනා සාකච්ඡෙමි න බ්‍රහ්මුනා සල්ලපාමි න බ්‍රහ්මුනා මන්තෙමි සුතං ඛො පන මෙතං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං යො වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලීයති කරුණං ඣානං ඣායති සො බ්‍රහ්මානං පස්සති බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති.

---

40. පින්වත්නි, ඉක්බින්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ක්ෂත්‍රියරජුන් සදෙනා යම් තැනෙකත්හිද එතනට එළඹියේය. එළඹ ක්ෂත්‍රියරජුන් සදෙනාට මේ කාරණය දන්වීය. පින්වත්නි, මා සම්බන්ධව මෙසේ යහපත්වූ කීර්තිඝෝෂාවක් ඉතා උස්ව නැංගේය. මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ප්‍රත්‍යක්ෂවශයෙන් මහාබ්‍රහ්මයාදකී. මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ප්‍රත්‍යක්ෂවශයෙන් මහා බ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරෙයි. එසේම කථා කෙරෙයි. ඔහුසමග මන්ත්‍රණය කෙරෙයිකියායි. පින්වත්නි, මමවූකලී බ්‍රහ්මයා නොදකිමි. බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග කථාදනොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. වැඩි වයසට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යවූ කියන්නාවූ බ්‍රාහ්මණයන්ගේ සම්මුඛයෙන් මාවිසින් මේකාරණය අසන ලද්දේය. ඒනම් යමෙක් වර්ෂාසෘතුවපිළිබඳ සාරමාසයෙහි ප්‍රතිසංලීනය කෙරේද හෙවත් විවේකවවාසය කෙරේද කරුණා ධ්‍යානය ධ්‍යාන කෙරේද හෙවත් කරුණා බ්‍රහ්ම විහාර භාවනා කෙරේද ඒතැනැත්තේ බ්‍රහ්මයාදකී. බ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරේ ඔහුහා එක්ව කථා කෙරේ. ඔහුහා මන්ත්‍රණයද කෙරේයි කියායි.

ඉච්ඡාමහං භො වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලීයිතුං කරුණං ඣානං ඣායිතුං. නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර ඒකෙන භත්තාභිහාරෙනාති. යස්ස 'දානි භවං ගොවින්දො කාලං මඤ්ඤතීති.

41 අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන සත්ත ච බ්‍රාහ්මණ මහාසාලා සත්ත ච නහාතක සතානි තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා සත්ත ච බ්‍රාහ්මණමහාසාලෙ සත්ත ච නහාතකසතානි එතදවොච. මය්හං ඛො භො එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො. සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මානං පස්සති, සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මුණා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති. න ඛො පනාහං භො බ්‍රහ්මාණං පස්සාමි,

---

පින්වත්නි මම වර්ෂා ඍතුවට අයත්වූ සාරමාසයෙහි විවෙකව වාසය කරන්නටද කරුණා බ්‍රහ්ම විහාර භාවනා කරන්නටද කැමැත්තෙමි. ඒ කාලයෙහිදී බත්ගෙණ එන්නාවූ එක් පුරුෂයෙකු හැර අන් කිසිවෙකු විසින් නොඑළඹිය යුත්තේවෙමි දැන්විය. පින්වත් ගොවින්ද තෙමේ දැන් යමක් සම්බන්ධව සුදුසු කල්යයි දන්නේනම් එය කරණු මැනවැයි කීහ.

41. පින්වත්නි, ඊට අනතුරුව මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ බමුණු මහසල් කුලසත යම්තැනෙක්හිද ව්‍රතවයස්ථාදිය හෙතුකොටගෙණ ජලස්නානය කරන්නාවූ නහාතක සත්දෙනා යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ බමුණු මහසල්කුලයන් සතටද නහාතකයන් සත්දෙනාටද මේ කාරණය දැන්විය. පින්වත්නි, මාසම්බන්ධව මෙසේ යහපත්වූ කීර්ති ඝොෂාවක් ඉතා උස්ව නැංගේය. කෙසේද, මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ප්‍රත්‍යක්‍ෂවශයෙන් මහාබ්‍රහ්මයාදකී. මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ප්‍රත්‍යක්‍ෂවශයෙන් මහාබ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරෙයි. එක්ව කථා කෙරෙසී. ඔහුහා මන්ත්‍රණයද කෙරේය කියාසී. පින්වත්නි, මමවුකලි බ්‍රහ්මයා නොමදකිමි.

න බ්‍රහ්මුණා සාකච්ඡෙමි න බ්‍රහ්මුණා සල්ලපාමි න බ්‍රහ්මුණා මන්තෙමි. සුතං ඛො පන මෙතං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං. යො වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලීයති කරුණං ඣානං ඣායති සො බ්‍රහ්මානං පස්සති බ්‍රහ්මුණා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති. තෙනහි භො යථාසුතෙ යථාපරියත්තෙ මන්තෙ විත්ථාරෙණ සජ්ඣායං කරොථ, අඤ්ඤමඤ්ඤං ච මන්තෙ වාචෙථ. ඉච්ඡාමහං භො වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලීයිතුං කරුණං ඣානං ඣායිතුං නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන භත්තාභාරෙනාති. යස්සදානි භවං ගොවින්දො කාලං මඤ්ඤතීති.

බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග එක්ව කථාද නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. වැලිඑක් කරුණෙක්ඇති. වැඩි වයසට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යවූ කියන්නාවූ බ්‍රහ්මණයන්ගේ සම්මුඛයෙන් මාවිසින් මේ කාරණය අසනලද්දේය. යමෙක් වර්ෂා කාලය පිළිබඳ සාරමාසයෙහි ප්‍රතිසංලීනය කෙරේද. හෙවත් විවෙකයට පැමිණ වාසය කෙරේද. කරුණා ධ්‍යානය ධ්‍යානකෙරේද. හෙවත් කරුණා බ්‍රහ්ම විහාර භාවනා කෙරේද. ඒ තැනැත්තේ බ්‍රහ්මයාදකී. බ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරෙයි. එක්ව කථා කෙරෙයි. ඔහු සමග මන්ත්‍රණය කෙරේයයි කියාති. පින්වත්නි එබැවින්තොපි ඇසූපරිදිවූද පුහුණුකල පරිදිවූද මන්ත්‍රණයන් විස්තර වශයෙන් සජ්ඣායනා කරව්. ඔවුනොවුන්ටද ඒවේද මන්ත්‍ර කියවව්. පින්වත්නි මම වර්ෂාඍතුවට අයත්වූ සාරමාසයෙහි ප්‍රතිසංලීනය කරන්ටද කරුණා ධ්‍යානය ධ්‍යානකරන්ටහෙවත් කරුණාදි බ්‍රහ්ම විහාර සතර වඩන්නටද කැමැත්තෙමි. බත්ගෙණ එන්නාවූ එක්කෙනෙකුන් හැර අන් කිසිවෙකුන් විසින් මම එළඹිය යුත්තේ නොවෙමි. පින්වත් ගොවින්ද බ්‍රහ්මණ තෙමේ යමක් සම්බන්ධව කල්යසිදන්නේ නම් එය කරණුමැණවයි කීහ.

42 අථ ඛො භො මහගොවින්දො බ්‍රාහ්මණො යෙන චත්තාරීසා භරියා සාදිසියො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා චත්තාරීසා භරියා සාදිසියො එතදවොච. මය්හං ඛො භොති එවං කල්‍යාණො කිත්ති සද්දො අබ්භුග්ගතො. සක්ඛි මහාගොවින්දො බ්‍රහ්මණො බ්‍රහ්මානං පස්සති, සක්ඛි මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති. න ඛො පනාහං භොති බ්‍රහ්මානං පස්සාමි න බ්‍රහ්මුනා සාකච්ඡෙමි න බ්‍රහ්මුණා සල්ලපාමි න බ්‍රහ්මුනා මන්තෙමි. සුතං ඛො පන මෙතං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං. යො වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලීයති කරුණං ඣානං ඣායති, සො බ්‍රහ්මානං පස්සති බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපති මන්තෙතීති. ඉච්ඡාමහං භොති වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලීයිතුං කරුණං ඣානං ඣායිතුං.

---

42. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙම සමානවූ සතළිස් භාර්‍ය්‍යාවෝ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ සමානවූ සතළිස් භාර්‍ය්‍යාවන්ට මේකාරණයකීයේය. පුණ්‍යවන්තියෙනි මාගේවූකලි මෙබඳු යහපත් කීර්ති ඝොෂාවක් ඉතා උස්ව නැංගේය. කෙසේද මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ප්‍රත්‍යක්‍ෂ වශයෙන් මහාබ්‍රහ්මයා දකීය. කියාද මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ප්‍රත්‍යක්‍ෂ වශයෙන් මහාබ්‍රහ්මයා සමග සාකච්ඡාකෙරෙයි. එක්ව කථාකෙරෙයි. මන්ත්‍රණයකෙරෙයි කියායි. පුණ්‍යවන්තියෙනි, මමවූකලි බ්‍රහ්මයා නොමදකිමි. බ්‍රහ්මයා සමග සාකච්ඡා නොකරමි. බ්‍රහ්මයා එක්ව කථා නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකරමි. වැලි එක් කාරණෙක් ඇති. වැඩිවයසට පැමිණියාවූ මහලුවූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යවූ කියන්නාවූ බ්‍රාහ්මණයන්ගේ සම්මුඛයෙන් මා විසින් මේ කාරණය අසනලද්දේය. යමෙක් වර්‍ෂාකාලය පිළිබඳ සාරමසෙහි විවෙකව වාසයකෙරේද, කරුණාධ්‍යානය වඩාද හෙතෙමේ බ්‍රහ්මයා දකී. බ්‍රහ්මයා සමග සාකච්ඡා, කෙරෙයි සල්ලාප කෙරෙයි ඔහු හා මන්ත්‍රණය කෙරේයකියායි. පින්වත්නි, මම වර්‍ෂාකාලය පිළිබඳ සාරමසෙහි විවෙකව වාසය කරන්නටද කරුණා බ්‍රහ්මවිහරණය ආදි චතුර්විධ ධ්‍යාන කරන්නටද කැමැත්තෙමි.

නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන භත්තාභිහාරෙනාති. යස්සදානිභවං ගොවින්දො කාලං මඤ්ඤතීති.

43 අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො පුරත්ථිමෙන නගරස්ස නවං සන්ථාගාරං කාරාපෙත්වා වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලියි, කරුණං ඣානං ඣායි. නාස්ස කොචි උපසඞ්කමි, අඤ්ඤත්‍ර එකෙන භත්තාභිහාරෙන. අථ ඛො භො මහා ගොවින්දස්ස බ්‍රාහ්මණස්ස චතුන්නං මාසානං අච්චයෙන අහුදෙව උක්කණ්ඨනා අහු පරිතස්සනා. සුතං ඛො පන මෙ තං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරිය පාචරියානං භාසමානානං. යො වස්සිකෙ චත්තාරො මාසෙ පටිසල්ලියති කරුණං ඣානං ඣායති, සො බ්‍රහ්මානං පස්සති,

---

බත් ගෙණ එන්නාවූ එක්කෙණෙකුන් හැර අන් කිසිවෙකුන් විසින් නොඑලඹිය යුත්තේවෙමි කීයේය. පින්වත් ගොවින්දතෙමේ දැන් යමක් සම්භන්ධව කල්යයි සිතන්නේනම් එය කෙරේවායි කීහ.

43. පින්වත්නි, ඉක්බිත්තේ හේ මහාගොවින්ද බ්‍රාහ්මණතෙම නුවරට පූර්වදිසාවෙහි අභිනව සන්ථාගාරයක්හෙවත් ධ්‍යානශාලාවක් කරවා වර්ෂාසෘතුව පිළිබඳ සාරමාසයෙහි ප්‍රත්සංලීනය කොළේය. හෙවත් විවේකයට පැමිණියේය. කරුණා ධ්‍යානය ධ්‍යානකෙළේය. හෙවත් කරුණා බ්‍රහ්ම විහාරය ආදිකොට සතර බඹ විහරණයන්වැඩුයේය. බත් ගෙණ එන්නාවූ එක් පුරුෂයෙක් හැර අන් කිසිවෙක් ඔහුවෙතට නොපැමිණියේය. තවද පින්වත්නි සාරමසක්හුගේ ඇවෑමෙන් මහාගොවින්ද බ්‍රාහ්මණයාට මහ බඹහුගේ පැමිණීම පිළිබඳ ආසාවක්වූයේය. එයම මනාකොට පැතීමක්ද වූයේය. කුමක් හෙයින්ද වෘඩ වයසට පැමිණියාවූ මහලු ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යවූ කියන්නාවූ බ්‍රාහ්මණයන්ගේ සම්මුඛයෙන් මා විසින් මේ කාරණය අසන ලද්දේය. කෙසේද යමෙක් වර්ෂා සෘතුව පිළිබඳ සාරමාසයෙහි විවේකයට පැමිණ වාසය කෙරේද. කරුණා ධ්‍යානය වඩාද ඒ තැනැත්තේ බ්‍රහ්මයා දකී.

බ්‍රහ්මුනා සාකච්ඡෙති සල්ලපතිමන්තෙතීති. නචොපනාහං බ්‍රහ්මානං පස්සාමි, න බ්‍රහ්මුනා සාකච්ඡෙමි න බ්‍රහ්මුනා සල්ලපාමි, න බ්‍රහ්මුනා මන්තෙමීති.

44. අථ ඛො භො බ්‍රහ්මා සනංකුමාරො මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස පමුඛෙ පාතුරහොසි. අථ ඛො භො මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස අහුදෙව භයං අහු ඡම්භිතත්තං අහු ලොමහංසො, යථා තං අදිට්ඨපුබ්බං රූපං දිස්වා. අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො බ්‍රහ්මානං සනංකුමාරං ගාථාය අජ්ඣභාසි.

---

බ්‍රහ්මයා සමග සාකච්ඡා කෙරෙයි. එක්වකථාකෙරෙයි. ඔහු සමග මන්ත්‍රණය කෙරෙයි කියායි. මම වූකලී බ්‍රහ්මයා නොමදකිමි. බ්‍රහ්මයා සමග සාකච්ඡාද නොකරමි. බ්‍රහ්මයා සමග එක්ව කථාද නොකරමි. බ්‍රහ්මයා සමග මන්ත්‍රණයද නොකෙරෙමියි කියායි.

44. පින්වත්නි, ඉක්බිත්තෙන් සනත් කුමාර බ්‍රහ්මතෙමේ මහාගොවින්ද බ්‍රාහ්මණයාගේ සිත පිළිබඳ සියලු අදහස තමන්ගේ සිතින් දැනගෙණ යම්සේ බලවත්පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගහරින්නේ හෝ දිගුකළ අතක් හකුළුවන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම බඹලොවදී අතුරුදහන්වූයේ මහාගොවින්දනම් බමුණාගේ ඉදිරියෙහි පහලවූයේය. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණයාට විතෙතාත්‍රාස භීතියක්ම වූයේය. තැතිගැන්මක්ද වූයේය. ලොමුදූගැගැන්මක්ද වූයේය. පෙර නොදක්නාලද රූපයක් දැක යම්සේ භයාදිය උපදනේද එපරිද්දෙන්ම බ්‍රහ්මරූපය දැක භයාදිය උපන්නේය. ඉක්බින්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ බියපත් වූයේ සංවෙගයට පැමිණි සිත්ඇත්තේ හටගත් ලොමුදූහැගැණුම් ඇත්තේ සනත් කුමාර බ්‍රහ්මයාව ගාථාවකින් අභිභාෂනය කළේය.

වණ්ණවා යසවා සිරීමා
කොනු ත්වමසි මාරිස,
අජානන්තා තං පුච්ඡාම
කථං ජානෙමු තං මයං.

මං වෙ කුමාරං ජානන්ති
බ්‍රහ්මලොකෙ සනන්තනං,
සබ්බෙ ජානන්ති මං දෙවා
එවං ගොවින්ද ජානහි.

ආසනං උදකං පජ්ජං
මධුපාකඤ්ච බ්‍රහ්මුනො,
අග්ඝෙ භවන්තං පුච්ඡාම
අග්ඝං කුරුතු නො භවං.

පතිගණ්හාම තෙ අග්ඝං
යං ත්වං ගොවින්ද භාසසි,
දිට්ඨධම්ම හිතත්ථාය
සම්පරාය සුඛාය ච.

නිදුකානෙනි, ශරීරවර්‍ණ ඇත්තාවූ යසස් ඇත්තාවූ ශ්‍රීමත්වූ නුඹ කව රෙක්වෙහිද නොදන්නාවූ අපි තා විචාරමු. අපිමේ කිනම් තැනැක්ද යනාදි වශයෙන් තා කෙසේ දැනගණිමුද, ශ්‍රෙෂ්ඨ ලොකයෙහි බවත් බඹලොව පුරාතනවූ කුමාරයයි එකාන්තයෙන්ම දනිත්. සියලු දෙවියෝ සනත් කුමාර බ්‍රහ්මයයි මා මෙසේ දැනගණිත්. පින්වත් ගොවින්ද පණ්ඩිතය මෙසේ, දැනගණුව. මේ අස්නද පිරිසිදු ජලයද පාදයට හිතවූ තෙලද මධුපාකයද යන මේසියල්ල බ්‍රහ්මයාගේ ඉදිරියෙහි වේ. පින්වත්හු විචාරමු. පින්වත් තෙමේ අපගේ මේ ආගන්තුක සඞ්ග්‍රහය පිළිගන්නා සේක්වා. එම්බා ගොවින්ද පණ්ඩිතය, නුඹ යමක් කියන්නෙහිද තාගේ ඒ ආගන්තුක සඞ්ග්‍රහය පිළිගණිමු. මේ අත්බැව්හි වැඩපිණිසද පරලොව සැපපිණිසද පවත්නාවූ.

කතාවකාසො පුච්ඡස්සු
යං කිඤ්චි අභිපත්ථිතන්ති.

45. අථ ඛො භො මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි. කතාවකාසො ඛොම්හි බ්‍රහ්මුනා සනංකුමාරෙන යන්නූනාහං බ්‍රහ්මානං සනංකුමාරං පුච්ඡෙය්‍යං දිට්ඨධම්මිකං වා අත්ථං සම්පරායිකං වාති. අථ ඛො භො මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි. කුසලො ඛො අහං දිට්ඨධම්මිකානං අත්ථානං. අඤ්ඤෙපි මං දිට්ඨධම්මිකං අත්ථං පුච්ඡන්ති, යන්නූනාහං බ්‍රහ්මානං සනංකුමාරං සම්පරායිකඤ්ඤෙව අත්ථං පුච්ඡෙය්‍යන්ති. අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො බ්‍රහ්මානං සනං කුමාරං ගාථාය අජ්ඣභාසි.

---

යම්කිසිවක් මනාකොට පතනලද්දේද ඒකාරණය විචාරව. පින්වත්හු කරණලද අවකාශ ඇත්තෙහිය. (ආසනාදිවූ මේ ආගන්තුක සඞ්ග්‍රහය පිළිගණු මැනවැයි කියනලද බ්‍රහ්මතෙමේ ඒ සියල්ල මාවිසින් පිළිගන්නාලද්දේම වේවා. එය තිබියදී දෙලෝ වැඩපිණිස පවත්නා කරුණක් විචාරවයි කීයේය.)

45. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණයාහට මේ අදහස විය. මමවූකලි සනත් කුමාර බ්‍රහ්මයාවිසින් කරණලද අවකාශ ඇත්තෙමි. මේ ආත්මභාවය පිළිබඳවූ අර්ථය හෝ පරලොකාර්ථය හෝ කුමක්නම් මම සනත් කුමාර බ්‍රහ්මයා විචාරන්නෙම්දැයි සිතීය. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණයාට මේ අදහස විය. මම මේ ලොකය පිළිබඳ අර්ථයන් පිළිබඳව දක්ෂවෙමි. අන්‍යයෝද දෘෂ්ටධාර්මිකඅර්ථයකවරේදැයි මාවිචාරත්. එකාන්තයෙන්ම පරලොකාර්ථය කෙබඳුදැයි සනත් කුමාර බ්‍රහ්මයා විචාරත්නෙම්නම් ඉතා යෙහෙකැයි සිතීය. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ සනත් කුමාර බ්‍රහ්මයාට ගාථාවකින් අධිභාෂනය කෙළේය.

පුච්ඡාමි බ්‍රහ්මානං සනංකුමාරං
කඞ්ඛී අකඞ්ඛිං පරවෙදියෙසු,
කත්ථට්ඨිතො කිම්හිච සික්ඛමානො
පප්පොති මච්චො අමතං බ්‍රහ්මලොකන්ති.

හිත්වා මමත්තං මනුජෙසු බ්‍රහ්මෙ
එකොදිභූතො කරුණාධිමුත්තො,
නිරාමගන්ධො විරතො මෙථුනස්මා
එත්ථට්ඨිතො එත්ථච සික්ඛමානො
පප්පොති මච්චො අමතං බ්‍රහ්මලොකන්ති.

46. හිත්වා මමත්තං තාහං භො තො ආජානාමි, ඉධෙකච්චො අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තංවා භොගක්ඛන්ධං පහාය අප්පංවා ඤාතිපරිවට්ටං පහාය මහන්තංවා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා

---

සැක ඇත්තාවූ මම අනුන්විසින් සංසාරණය කරණලද ප්‍රශ්න විෂයෙහි සැකනැත්තාවූ සනත් කුමාර බ්‍රහ්මයා විචාරමි. කවර ප්‍රතිපදාවෙක්හි සිටියාවූ කවරනම් ධර්මයෙක්හි හික්මෙන්නාවූ මනුෂ්‍ය තෙම උතුම්බඹලොවට පැමිණේදැයි කියායි. එම්බා ශ්‍රේෂ්ඨය. මනුෂ්‍යයන් විෂයෙහි යම්කිසිවෙක් මමත්වය හෙවත් තෘෂ්ණාව හැර හුදකලාවූයේ කරුණාධ්‍යාන උපදවා කෙලෙසුන් කෙරෙන් මිදුනේ හෙවත් නිපදවනලද ධ්‍යාන ඇත්තේ කාම ක්‍රොධාදිවූ පතළ ගන්ධ ඇත්තේ මෛථුන ධර්මයෙන් වැළැක්කෝ හෙවත් බ්‍රහ්මචාරීවූයේවේද ඒ මනුෂ්‍ය තෙම මේ ධර්මයන් කෙරෙහි සිටියේ වේ ධර්මයන් කෙරෙහි හික්මෙන්නේ උතුම බ්‍රහ්මලොකයට පැමිණේ.

46. පින්වත්නි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මමය මාගේ යයි පැවති ලබ්ධිය හැර ස්වල්පවූ භොගරාශිය හැර හෝ මහත්වූ භොගරාශිය හැර හෝ ස්වල්පවූ ඥාතිසමූහය හැර හෝ මහත්වූ ඥාති සමූහය හැර හෝ කෙස් දැළිරැවුලු හරවා කාෂාය වස්ත්‍රයන් අන්දවා

අගාරස්මා අනගාරියං පබ්බජති. ඉති ඤත්වා මමන්තං නාහං භො තං අජානාමි. එකොදිභූතො තිචාහං භො තං ආජානාමි. ඉධෙ කච්චො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. ඉති එකොදි භූතොති පජහං භො තං ආජානාමි. කරුණාධි මුත්තොති පහං භො තං ආජානාමි. ඉධෙ කච්චො කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං, ඉති උද්ධමධොතිරියං සබ්බධි සබ්බත්ථතාය සබ්බාවන්තං ලොකං කරුණා සහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. ඉති කරුණාධිමුත්තො ති පහං භොතො ආජානාමි, ආමගන්ධෙච ඛො අහං භො තො භාසමානස්ස. න ආජානාමි.

---

ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවේද මම ඒ කාරණය පින්වත්හු සම්බන්ධව දනිමි, මෙසේ මමත්වය හැරය, යන මේ කාරණය මම පින්වත්හු සම්බන්ධව දනිමි, එකාග්‍රවූයේය යන මේ කාරණයද පින්වත්හු සම්බන්ධව මම දනිමි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ජනයන් රහිතවූ සෙනසුන් ආශ්‍රය කෙරේද, එනම්, අරණ්‍යය වෘක්ෂමූලය පර්වතය කඳුරැලිය පර්වත ගුහාව සොහොන ඉතා දුරවන සෙනසුන අවකාශස්ථානය පිදුරු රැසය යන මේයි, මෙසේ එකාග්‍රවූයේයයි පින්වත්හු සම්බන්ධව මම මේ කාරණය දනිමි. මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් කරුණාව සමග පැවැත්තාවූ සිතින් එක් දිසාවක් පතුරුවා වාසයකෙරේද එසේම දෙවන දිගද එසේම තුන්වන දිගද එසේම සතරවන දිගදයි මෙසේ සියලු කල්හි සියලු තන්හි පැහිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය කරුණාව සමග පැවැත්තාවූ විපුලත්වයට පැමිණියාවූ එහෙයින්ම ධ්‍යානවශයෙන් මහත්බවට පැමිණියාවූ ප්‍රමාණාතික්‍රාන්තවූ වෛර රහිතවූ ව්‍යාපාද රහිතවූ සිතින් පතුරුවා වාසය කෙරේද, මෙසේ කරුණා ධ්‍යානය හේතුකොටගෙණ කෙලෙසුන් කෙරෙන් මිදුනේයයිද පින්වත්හු සම්බන්ධව මම මේ කාරණය දනිමි, පින්වත්හු විසින් කියන්නාවූ ආමගන්ධ කාරණයන් මම නොදනිමි.

කෙ ආමගන්‍ධා මනුජෙසු බ්‍රහ්මෙ
එතෙ අවිද්වා ඉධ බ්‍රෑහි ධීර,
කෙනාවටාවාති පජාකුරුකුරූ
ආපායිකා නිවුතබ්‍රහ්මලොකාති.

කොධො මොසවජ්ජං නිකතීචදුබ්භො
කදරියතා අතිමානො උසුයා,
ඉච්ඡා විවිච්ඡා පරහෙඨනාච
ලොභොච දොසොච මදොච මොහො.
එතෙසු යුත්තා අනිරාමගන්‍ධා
ආපායිකා නිවුත බ්‍රහ්මලොකාති.

යථා ඛො අහං භොතො ආමගන්‍ධෙ භාසමානස්ස ආජානාමි තෙ න සුනිම්මදය අගාරං අජ්ඣාවසතා.

---

පින්වත් බ්‍රහ්මය, මනුෂ්‍යයන් විෂයෙහි කවරනම් කාරණයෝ ආමගන්‍ධය යන නම් ඇත්තෝද්දැයි මේ කාරණයන් මම නොදනිමි. පණ්ඩිතය, එහෙයින් මට මෙහිදී ඒ කාරණයන් කියව. කවරනම් ක්ලෙශාවරණයකින් ආවරණය කරණලද ප්‍රජාතොමෝ දුර්ගන්ධය වහනය කෙරේද අපායට පමුණුවන ක්ලෙශධර්ම ඇත්තෝ වසනලද බ්‍රහ්මලොකය ඇත්තෝ වෙත්ද හෙවත් කවරනම් අකුශලයක් කරණකොටගෙණ සත්වයෝ බඹලොවට නොපැමිණෙත්ද ? ක්‍රොධකිරිමද බොරුකීමද වංචාවද මිත්‍රද්‍රොහිභාවයද තද මසුරුබවද අධික මානයද ඊර්ෂ්‍යාකිරීමද තෘෂ්ණා ලක්ෂණකොටඇති කැමැත්තද සැකයද අනුන්ට හිංසා කිරීමද ලොභයද ද්වෙෂයද මදයද මොහයද යන මේ ක්ලෙශධර්ම විෂයෙහි යෙදුනාවූ සත්වයෝ දුගඳ ඇත්තෝම වෙත්. අපායට යන සවභාව ඇත්තෝ ආවරණය කරණලද බඹලොව ඇත්තෝ වෙත්. පින්වත්නු විසින් කියනලද්දාවූ ආමගන්‍ධ කාරණයන් මම යම් පරිද්දෙකින් දනිම්ද, ඒ දුර්ගන්ධ වහනයවන කාරණයන් ගිහිගෙහිවාසයකරන්නහු විසින් සුවසේ බැහැරකටහැක්කෝ නොවෙත්. හෙවත් බැහැරලීම දුස්කරවෙත්.

පබ්බජිස්සාමහං භො අගාරස්මා අනගාරියන්ති. යස්ස'දානි භවං ගොවින්දො කාලං මඤ්ඤතීති.

47. අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන රෙණුරාජා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රෙණුරාජානං එතදවොච. අඤ්ඤං දානි භවං පුරොහිතං පරියෙසතු, යො භොතො රජ්ජං අනුසාසිස්සති. ඉච්ඡාමහං භො අගාරස්මා අනාගාරියං පබ්බජිතුං. යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්ධෙ භාසමානස්ස තෙ න සුනිම්මදයා අගාරං අජ්ඣාවසතා, පබ්බජිස්සාමහං භො අගාරස්මා අනගාරියන්ති.

ආමන්තයාමි රාජානං
රෙණුං භූමිපතිං අහං,
ත්වං පජානස්සු රජ්ජෙන
නාහං පොරොහච්චෙ රමෙ

---

පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කීයේය. දැන් ගොවින්ද පණ්ඩිතතෙමේ යමක් සම්බන්ධව කල්යයි දන්නේනම් ඒ කාරණය කෙරේවායි කීයේය.

47 පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ රේණු රජ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ රේණු රජහට මේ කාරණය දැන්විය. අනෙක් පින්වතුන්හුගේ රාජ්‍යය අනුශාසනාකරන්නේද පින්වත්තෙමේ දැන් එබඳු පෙරවිබමුණෙකු සොයන සේක්වා; පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවෙන්නට කැමැත්තෙමි. සනත් කුමාර බ්‍රහ්මයා විසින් කියනලද්දවූ ආමගන්ධකාරණයත් මා විසින් අසනලද්දේද ගිහිගෙයි වාසය කරන්නහු විසින් ඒ ආමගන්ධකාරණයෝ සුවසේ බැහැරකටහැක්කෝනොවෙත්. හෙවත් ඉතා දුගසේ බැහැරකටයුත්තෝයි, පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කීයේය. මම පෘථිවිය පාලනය කරන්නාවූ රේණු රජහු ආමන්ත්‍රණය කරමි. නුඹ රාජ්‍යයෙන් හෙවත් රාජ්‍යය පිළිබඳ කටයුතු දැනගණුව. මම පෙරවිබැව්හි අභිරමනය නොකරමි හෙවත් පැවිදිවෙමි. ඉක්බිති රේණු රජතෙමේ මෙසේ කියයි.

සචෙ තෙ ඌනං කාමෙහි
අහං පරිපූරයාමි තෙ.
යො තං හිංසති වාරෙමි
භූමි සෙනාපතී අහං

ත්වං පිතා සි අහං පුත්තො
මානො ගොවින්දපාජහි,
නචත්ථි ඌනං කාමෙහි
හිංසිතා මෙ න විජ්ජති.

අමනුස්ස වචො සුත්වා
තස්මාහං නගෙහෙරමෙ.
අමනුස්සො කථං වණ්ණො
කන්තෙ අත්ථං අභාසථ.

යං සුත්වා පජහාසි
නො ගෙහෙ අමෙධපි කෙවලෙ,
උපවුත්ථස්ස මෙ පුබ්බෙ
යඤ්ඤ කාමස්ස මෙ සතො,

---

ඉදින් ඔබට කාමයන්ගෙන් කිසි අඩුවක්වීනම් ඒ සියල්ල මම ඔබට සම්පූර්ණකරමි. (තවද) යම් කෙනෙක් ඔබ බියගන්වාද මම එය වළක්වමි. මම පොළොවෙහි ජනසමූහයාගේ අධිපතිවෙමි හෙවත්. රජවෙමි. නුඹවහන්සේ පියා තෙමේය. මම පුත්‍රවෙමි. පින්වත් ගොවින්ද පණ්ඩිතය අප අත්නොහැරිය මැනවි. කිසි යම් කාමසම්පත්තියකින් අඩුවක් නැත්තේය. එසේම අපට භයඋපදවන්නෙක්ද නැත්තේය. එහෙයින් බ්‍රහ්මයාගේ කථාව අසා මම ගිහිගෙයි නොඇලෙමි කියේය. යමෙකුගේ යමක් අසා අපද ගෙයිවැසි සියල්ල හා සියලු දඹදිව් වැස්සන් හරින්නෙහිද ඒ බ්‍රහ්මතෙම කෙබඳු වර්ණඇත්තේද ඒ බ්‍රහ්මතෙමේ ඔබට කවරනම කාරණයක් කීයේදැයි විචාලේය. මින් පෙර කායවිවේකය වැඩීම් වශයෙන් එකී භාවයට පැමිණ තපඃකර්මයෙන් යුක්තව වාසය කෙළෙමි. යාගකරණු කැමැත්තාවූම මා විසින්.

අග්ගිපජ්ජලිතො ආසි
කුසපත්ත පරිළාහතො,
තතො මෙ බ්‍රහ්මා පාතුරහු
බ්‍රහ්මලොකා සනන්තනො.

සො මෙ පඤ්හං ව්‍යාකාසි
තං සුත්වා නාගමෙ හරමෙ
සද්දහාමි අහං භො තො
යං ත්වං ගොවින්ද භාසසි.

අමනුස්සවචො සුත්වා
කථං වත්තෙතථ අඤ්ඤථා,
තෙ තං අනුපබ්බජිස්සාම
සත්ථා ගොවින්ද නො භව.

මණියථා වෙළුරියො
අකාචො විමලො සුභො,
එවං සුද්ධා චරිස්සාම
ගොවින්දස්සානු සාසනෙති.

---

වෙණරපිල් කලප්වලින් පිළුක්මෙන් අතුරණලද්දේ ගිනිදල් වන ලද්දේවිය. එකල්හි බ්‍රහ්මලොකයෙන් මාගේ ඉදිරියෙහි සනත්කුමාර බ්‍රහ්මතෙම පහලවූයේය. ඒ සනත් කුමාරබ්‍රහ්මතෙමේ මාගේ ප්‍රශ්න විසඳූයේය, ඒප්‍රශ්නවිසඳීම් අසා ගිහිගෙයි සිත් නොඅලවමි. පින්වත් ගොවින්දපණ්ඩිතය තුබයම් කථාවක් කියෙහිද පින්වත්හුගේ ඒකථාව මම අදහාගණිමි. බ්‍රහ්මයාගේ වචනය අසා අන්පරිද්දෙකින් කෙසේ නම් පවත්නේද අපි ඔබට අනුව පැවිදිවෙමු. ගොවින්ද පණ්ඩිතය, තුබ වහන්සේ අපට අනුශාසකවනසේක්වායි සැලකළේය, කකීශනුවූ නිර්මලවූ යහපත්වූ වෛඩූර්‍ය්‍යමාණික්‍යයක් යම්සේද එපරිද්දෙන්ම ගොවින්දශාස්තෲහුගේ අනුශාසනාවෙහි පිරිසිදු ලෙස හැසිරෙන්නෙමුයිකීහ.

සචෙ භවං ගොවින්දො අගාරස්මා අනගාරියං පබ්බජිස්සති, අහම්පි අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමි. අථ යා තෙ ගති සා නො ගති භවිස්සතීති.

48. අථ ඛො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන තෙ ඛත්තියා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ඛත්තියෙ එතදවොච. අඤ්ඤං දානි භවන්තො පුරොහිතං පරියෙසන්තු. යො භවන්තානං රජ්ජෙ අනුසාසිස්සති' ඉච්ඡාමහං භො අගාරස්මා අනගාරියං පබ්බජිතුං. යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්ධෙ භාසමානස්ස තෙ න සුනිම්මදයා අගාරං අජ්ඣාවසතා. පබ්බජිස්සාමහං භො අගාරස්මා අනගාරියන්ති. අථ ඛො තෙ ඛත්තියා එකමන්තං අපක්කම්ම එවං සමචින්තෙසුං. ඉමෙ ඛො බ්‍රාහ්මණා නාම ධනලුද්ධා, යන්නූන මයං මහාගොවින්දං බ්‍රාහ්මණං ධනෙන සික්ඛෙය්‍යාමාති.

---

ඉදින් පින්වත් ගොවින්ද පණ්ඩිත තෙමේ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නේනම් මමත් ගිහිගෙයින් නික්ම සසනෙහි පැවිදි වන්නෙමියි. ඔබගේ යම්ගතියක්වේද ඔතොමෙ ඒම අපගේ ගතිය වන්නේයයි රේණු රජතෙමේ කීයේය.

48. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණ තෙමේ ඒ ක්ෂත්‍රියයෝසදෙන යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ ඒ ක්ෂත්‍රියයන් සදෙනාට මේ කාරණය දැන්විය. යමෙක් පින්වතුන්ගේ රාජ්‍යයෙහි අනුශාසනා කෙරේද දැන් පින්වත්හු එබඳු අන් පෙරවියෙකු සොයත්වා. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නට කැමැත්තෙමි. සනත්කුමාර බ්‍රහ්මයා විසින් කියන ලද්දාවූ ආමගන්ධකාරණයන් යම් පරිද්දෙකින් මා විසින් අසන ලද්දේද ගිහිගෙයි වාසයකරන්නහු විසින් ඒ කාරණයෝ ඉතා දුකසේ බැහැරලියයුත්තෝ වෙත්. පින්වත්නි, මම එගෙයින් ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කීයේය. පින්වත්නි, ඉක්බිත්තෙන් ඒ ක්ෂත්‍රියයෝ සදෙන එකත්පසකට පැමිණ මෙසේ සිතූහ. මේ බ්‍රාහ්මණයෝ නම් ධනයෙහිලෝභිහු වෙත්. එකාන්තයෙන් අපි මහාගොවින්ද බ්‍රාහ්මණයා ධනයෙන් සන්තර්පණය කරන්නෙමු නම් ඉතා යෙහෙකැයි සිතී.

තෙන මහාගොවින්දං බ්‍රාහ්මණං උපසඞ්කමිත්වා එවමාහංසු. සංවිජ්ජන්ති ඛො භො ඉමෙසු සත්තසු රජ්ජෙසු පහූතං සාපතෙය්‍යං තතො භොතො යාවතකෙන අත්ථො තාවතකං ආහරෙය්‍යතන්ති. අලං භො මමපිදං පහූතං සාපතෙය්‍යං භවන්තානං යෙව වාහසා, තමහං සබ්බං පහාය අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමි. යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්ධෙ භාසමානස්ස, තෙන සුනිම්මදයා අගාරං අජ්ඣාවසතා. පබ්බජිස්සාමහං භො අගාරස්මා අනගාරියන්ති.

49. අථ ඛො භො තෙ ඡ ඛත්තියා එකමන්තං අපක්කම්ම එවං සමචින්තෙසුං. ඉමෙ ඛො බ්‍රාහ්මණා නාම ඉත්ථිද්ධා. යන්නූනමයං මහාගොවින්දං බ්‍රාහ්මණං ඉත්ථිහි සික්ඛෙය්‍යාමාති.

---

ඔව්හු මහාගොවින්ද බ්‍රාහ්මණයා වෙතට එළඹ මෙසේ කීහ. පින්වතුන්, මේ අපගේ රාජ්‍යසතෙහි බොහෝ ධනය ඇත්තේමය. ඒ ධනයෙන් පින්වතුන්හට යම්පමණ ප්‍රයෝජන ඇත්තේනම් එපමණ ගන්නා ලැබේවායි කීහ. පින්වත්නි, මට කම්නම නැත. මාගේද බොහෝවූද ධනය ඇත්තේය. ඒ සියල්ල පින්වතුන්ටම වේවා. හෙවත් පින්වතුන් විසින් හැරගන්නා ලැබේවා. මම ඒ සියල්ල හැර ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමි. සනත්කුමාර බ්‍රහ්මයා විසින් කියන ලද ආමගන්ධ කෙලෙස් කාරණය මා විසින් යම් පරිද්දෙකින් අසන ලද්දේද ගිහිගෙයි වාසයකරන්නවුන් විසින් ඒ ආමගන්ධකාරණයෝ දුකසේ බැහැරලියහැක්කෝ වෙත්. නොහොත් දුරුකරන්ට දුෂ්කරයි. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කීයේය.

49. පින්වත්නි, ඉක්බිත්තෙන් ඒ ක්‍ෂත්‍රියයෝ සදෙන එක් පාර්ශ්වයකට රැස්ව මෙසේ සිතූහ. මේ බ්‍රාහ්මණයෝ නම් බොහෝ ස්ත්‍රීන් ඇත්තෝය. හෙවත් ස්ත්‍රීන් කෙරෙහි ආසා ඇත්තෝය. එකාන්තයෙන් අපි මහාගොවින්ද බ්‍රාහ්මණයා ස්ත්‍රීන්ගෙන් සිත් ගන්නෙමුනම් ඉතා යෙහෙකැයි කියායි.

ත්තෙ මහාගොවින්දං බ්‍රාහ්මණං උපසඞ්කමිත්වා එවමාහංසු. සංවිජ්ජන්ති ඛො භො ඉමෙසු සත්තසු රජ්ජෙසු පහුතා ඉස්සියො. තතො භොතො යාවතිකානි අම්හෙ, තාවතිකා ආනියන්තනානි. අලං භො මමපි චත්තාරිසා භරියා සාදිසියො. නාපහං සබ්බා පහාය අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමි. යථා ඛො පන මෙසුතං බ්‍රාහ්මුනො ආමගන්ධ භාසමානස්ස, තෙන සුනිමමදයා අගාරං අජ්ඣාවසතා, පබ්බජිස්සාමහං භො අගරස්මා අනගාරියන්ති.

50. සචෙ භවං ගොවින්දො අගාරස්මා අනගාරියං පබ්බජිස්සති මයම්පි අගාරස්මා අනගාරියං පබ්බජිස්සාම, අථ යා තෙ ගති සා නො ගති භවිස්සතීති.

සචෙ ජහාථ කාමානි
යත්ථ සත්තො පුථුජ්ජනො,
ආරභව්හො දළ්හා හොථ
ඛන්ති බලසමාහිතා

---

ඔව්හු මහාගොවින්ද බ්‍රාහ්මණයා වෙතට එළඹ මෙසේ කීහ. පින්වත්නි, මේ රාජ්‍යසතෙහි බොහෝ ස්ත්‍රීහු ඇත්තාහ. ඒ ස්ත්‍රීන් අතුරෙන් පින්වත්හට යම්පමණ ස්ත්‍රීන්ගෙන් ප්‍රයොජන ඇත්තේද එපමණ ස්ත්‍රීහු ගෙණසනු ලැබෙත්වායි කීහ. පින්වත්නි, නුසුදුසුයි, සමාන ජාතිගොත්‍රතාදිය ඇති භාය්‍යාවෝ මටද සතළිසක් වෙත්. මම ඒ සියල්ලන්ද හැර ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමි, ආමගන්ධකාරණයෙන් කියන්නාවූ සනත්කුමාර බ්‍රහ්මයාගේ කථාව මාවිසින් යම් පරිද්දෙකින් අසන ලද්දේද ඒ ආමගන්ධ කාරණයෝ ගිහිගෙයි වසන්නාහු විසින් ඉතා දුකසේ බැහැරකටහැක්කෝ වෙත්, පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සාසනයෙහි පැවිදිවන්නෙමියි කීයේය.

50. ඉදින් පින්වත් ගොවින්ද පණ්ඩිත තෙමේ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නේනම් අපිත් ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇතිකල්හි ඔබගේ යම් ගතියක් ඇතිවේද අපගේද ඒ ගතිය වන්නේය. යම්බඳු කාමයන් කෙරෙහි පෘථග්ජන තෙම ඇලුනේද ඉදින් ඒ වස්තුකාම ක්ලෙශකාමයන් දුරුකරන්නාහු නම් වීය්‍යාරම්භ කරව්, කුසීතභාවයෙන් නික්මුනු පධන් වීය්‍යීයෙහි පිහිටා දෘඪවව්, ක්‍ෂාන්ති බලයෙන් යුක්ත වව්.

එසමග්ගො උජුමග්ගො
එසමග්ගො අනුත්තරො,
සද්ධම්මො සබ්භිරක්ඛිතො
බ්‍රහ්මලොකූපපත්තියාති,

51. තෙනහි භවං ගොවින්දො සත්තවස්සානි ආගමෙතු, සත්තන්නං වස්සානං අච්චයෙන මයම්පි අගාරස්මා අනගාරියං පබ්බජිස්සාම. අථ යා තෙ ගති සා නො ගති භවිස්සතීති. අතිචිරං ඛො භො සත්ත වස්සානි. නාහං සක්කොමි භවන්තෙ සත්තවස්සානි ආගමෙතුං. කො ඣා පන භො ජානාති, ජීවිතානං. ගමනීයො සම්පරායො, මන්තාය බොද්ධබ්බං, කත්තබ්බං කුසලං: චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං.

---

මේ කරුණා ධ්‍යානමාර්ගය සෘජුවූ මාර්ගයවේ. බඹලොව ඉපදීම පිණිස මේ උත්තම මාර්ගයවේ. ඒ මේ සද්ධර්මමාර්ගය සාධුන්විසින් රක්ෂාකරණ ලද්දේය යනුයි.

51 එහෙනම් පින්වත් ගොවින්ද පණ්ඩිතතෙමේ අවුරුදු හතක් බලාපොරොත්තුවේවා, අවුරුදු හතක්හුගේ ඇවෑමෙන් අපිද ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ යම් ගතියක්වේද ඕතොමෝ අපගේ ගතියවන්නේයයි කීහ, පින්වත්නි, අවුරුදු හත ඉතා කල් බොහෝවෙත්. මම අවුරුදු සතක් පින්වතුන් සඳහා බලාපොරොත්තුවන්නට නොහැක්කේවෙමි. පින්වත්නි, කවරෙක්නම් ජීවිතයන්ගේ පැවැත්ම දනීද (ජීවිතය දියබුබුල කට බදු උපමා ඇත්තේ සර්වප්‍රකාරයෙන් අස්ථිරවෙයිසේයි) එකාන්තයෙන් පරලොව යායුත්තේවෙයි. ඥානයෙන් දැන අවබොධ කටයුතුවෙයි. කුසලය කටයුතුයි. ජීවිතයේ පැවැත්ම දැනගැණීම දුස්කර බැවින්ද අවශ්‍යයෙන් පරලොව යායුතු බැවින්ද මේ කරුණු සර්වප්‍රකාරයෙන් දැනගෙණ කුසල් කටයුතුයි. බඹසරකටයුතුයි. උපන් සත්ත්වයානට ජරාමරණ රහිත බවක් නැත්තේය.

යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්ධෙ භාසමානස්ස තෙන සුනිම්මදයා අගාරං අජ්ඣාවසතා, පබ්බජිස්සාමහං භො අගාරස්මා අනගාරියන්ති.

52. තෙනහි භවං ගොවින්දො ඡවස්සානි ආගමෙතු–පෙ–පඤ්චවස්සානි ආගමෙතු, චත්තාරිවස්සානි ආගමෙතු, තිනි වස්සානි ආගමෙතු, ද්වෙවස්සානි ආගමෙතු, එකං වස්සං ආගමෙතු, එකවස්සස්ස අච්චයෙන මයම්පි අගාරස්මා අනගාරියං පබ්බජිස්සාම, අථ යා තෙ ගති සා නො ගති භවිස්සතීති.

53. අතිචිරං ඛො භො එකං වස්සං, නාහං සක්කොමි. භවන්තො එකං වස්සං ආගමෙතුං. කො ඛො පනභො ජානාති ජීවිතානං, ගමනියො සම්පරායො, මන්තාය බොද්ධබ්බං.

---

ආමගන්ධ කාරණයක් කියන්නාවූ සනත්කුමාර බ්‍රහ්මයාගේ කථාව මා විසින් යම් පරිද්දෙකින් අසනලද්දේද ඒ කාමක්‍රොධාදි ආමගන්ධ කාරණයෝ ගිහිගෙයි වසන්නහුවිසින් දුකසේ බැහැර කටහැක්කෝ වෙත්යයි කියේය.

52 එහෙනම් පින්වත් ගොවින්දපණ්ඩිතතෙමේ අවුරුදු සයක් බලාපොත්තුවේවා, මෙතැන් පටන් සංක්‍ෂෙපකරණලදි. ප්‍රථමවාරයෙහිමේත් විස්තරය සැලකියයුතු. අවුරුදු පසක් බලාපොරොත්තුවේවා,—පෙ—අවුරුදු සතරක් බලාපොරොත්තුවේවා,—පෙ—අවුරුදු තුණක් බලාපොරොත්තුවේවා,—පෙ—අවුරුදු දෙකක් බලාපොරොත්තුවේවා,—පෙ—එක් අවුරුද්දක් බලාපොරොත්තුවේවා, එක් අවුරුද්දක්හුගේ ඇවෑමෙන් අපිද ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ යම්ගතියක් වන්නේද ඕතොමෝ අපගේ ගතිය වන්නේයයි කීහ.

53 පින්වත්නි, එක් අවුරුද්දක් ඉතා බොහෝයි. මම එක් අවුරුද්දක් පින්වතුන් සඳහා බලාපොරොත්තුවන්නට නොහැක්කේවෙමි. පින්වත්නි, කවරෙක්නම් ජීවිතයන්ගේ පැවැත්ම දනීද, (ජීවිතය දියබුබුලකටබඳු උපමාඇත්තේ සර්වප්‍රකාරයෙන් අස්ථිරවෙයිසේයි) එකාන්තයෙන් පරලොව යායුත්තේවෙයි යන මේ සිල්ල ඥානයෙන් දැන අවබොධ කටයුතුවෙයි.

කත්‍තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්‍ථි ජාතස්‍ස අමරණං, යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්‍ධෙ භාසමානස්‍ස, නෙතෙ සුනිම්මදයා අගාරං අජ්ඣාවසතා, පබ්බජිස්‍සාමහං භො අගාරස්මා අනගාරියන්‍ති. තෙනහි භවං ගොවින්‍දො සත්‍තමාසානි ආගමෙතු, සත්‍තන්‍නං මාසානං අච්චයෙන මයම්පි අගාරස්මා අනගාරියං පබ්බජිස්‍සාම, අථ යා තෙ ගති සා නො ගති භවිස්‍සතීති.

54. අති චිරං ඛො භො සත්‍තමාසානි. නාහං සක්කොමි භවන්‍තෙ සත්‍තමාසානි ආගමෙතුං, කො ඛොපන ජානාති ජීවිතානං ගමනීයො සම්පරායො, මන්‍තාය බොද්ධබ්බං, කත්‍තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්‍ථි ජාතස්‍ස අමරණං.

කුසලය කටයුතුයි. ( ජීවිතයේ පැවැත්ම දැනගැණීම දුස්කර බැවින්ද අවශ්‍යයෙන් පරලොව යායුතු බැවින්ද මේ කරුණු සම්ප්‍රකාරයෙන් දැනගෙණ කුසල් කටයුතුයි. ) බඹසර කටයුතුයි. උපන් සත්‍වයාට ජරාමරණ රහිතබවක් නැත්තේය. කාමක්‍රොධාදි ලක්‍ෂණවත් ආමගන්‍ධකාරණයන් කියන්නාවූ සනත්කුමාර බ්‍රහ්මයාගේ කථාව මා විසින් යම් පරිද්දෙකින් අසන ලද්දේද ඒ කාමක්‍රොධාදීහු ගිහිගෙයි වසන්නහුවිසින් දුකසේ බැහැර කටයුත්තෝවෙත්යයි කීයේය. එහෙනම් පින්වත් ගොවින්‍ද පණ්ඩිත තෙමේ මාස හතක් බලාපොරොත්තු වේවා, මාස සතක් හුගේ ඇවෑමෙන් අපිද ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ යම්ගතියක් වන්නේද ඕතොමෝ අපගේ ගතිය වන්නේයයි කීහ.

54. පින්වත්නි, මාස සතක් ඉතා බොහෝයි. මම මාස සතක් පින්වතුන් සඳහා බලාපොරොත්තුවන්නට නොහැක්කෙමි. පින්වත්නි, කවරෙක්නම් ජීවිතයන්ගේ පැවැත්ම දනීද. ඒකාන්තයෙන් පරලොව යායුත්තේ වෙයි යනමේසියල්ල ඥානයෙන් දැන අවබොධ කටයුතුවෙයි. කුසලය කටයුතු. බඹසරකටයුතුයි. උපන් සත්‍වයාහට ජරා මරණ රහිත බවක් නැත්තේය.

යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්‍ධෙ භාසමානස්ස, තෙන සුනිම්මදයා අගාරං අජ්ඣාවසතා, පබ්බජිස්සාමහං භො අගාරස්මා අනගාරියන්ති. තෙනහි භවං ගොවින්‍දො, ඡමාසානි ආගමෙතු-පෙ-පඤ්චමාසානි ආගමෙතු-පෙ-චත්තාරි මාසානි ආගමෙතු-පෙ-තීණිමාසානි ආගමෙතු-පෙ-ද්වෙමාසානි ආගමෙතු-පෙ-මාසං ආගමෙතු-පෙ-අඩ්ඪමාසං ආගමෙතු, අඩ්ඪමාසස්ස අච්චයෙන මයම්පි අගාරස්මා අනගාරියං පබ්බජිස්සාම, යා තෙ ගති සා නො ගති භවිස්සතීති.

55. අතිචිරං ඛො භො අඩ්ඪමාසො. නාහං සක්කොමි භවන්‍තෙ අඩ්ඪමාසං ආගමෙතුං 'කො ඛො පන භො ජානාති ජීවිතානං ගමනීයො සම්පරායො මන්තාය බොද්ධබ්බං, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං.

---

කාම ක්‍රෝධාදි ලක්‍ෂණවත් ආමගන්‍ධ කාරණයන් කියන්නාවූ සනත් කුමාර බ්‍රහ්මයාගේ කථාව, මාවිසින් සම්පරිද්දෙකින් අසනලද්දේද ඒ කාරණයෝ ගිහිගෙයි වසන්නහු විසින් දුකසේ බැහැර කටයුත්තෝ වෙත්. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කීයේය. එහෙනම් පින්වත් ගොවින්‍ද පණ්ඩිතතෙමේ මාසයක් බලාපොරොත්තුවේවා, මෙතැන්පටන් ලුහුඬුකරණලදි. විස්තරය පළමුවාරයෙහි මෙනි. මාසපසක් බලාපොරොත්තු වේවා—පෙ—මාස සතරක් බලාපොරොත්තු වේවා—පෙ—මාස තුණක් බලාපොරොත්තු වේවා—පෙ—මාස දෙකක් බලාපොරොත්තු වේවා—පෙ—එක් මාසයක් බලාපොරොත්තු වේවා. අඩමසක් බලාපොරොත්තුවේවා. අඩමසක්හුගේ ඇවෑමෙන් අපිද ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇති කල්හි ඔබගේ යම් ගතියක් වන්නේද ඕතොමෝ අපගේ ගතියක් වන්නේයයි කීහ.

55. පින්වත්නි, අඩමසක් ඉතා කල් බොහෝයි. මම අඩමසක් පින්වතුන් සඳහා බලාපොරොත්තු වන්නට නොහැක්කෙමි. කවරෙක්නම් ජීවිතයන්ගේ පැවැත්ම දනගණිද, උපන්නහු විසින් පරලොව යායුත්තේමවෙයි. මේ සියල්ල ඥානයෙන් දනගෙණ අවබොධ කටයුතුයි. කුසල් කටයුතුයි, බඹසර හැසිරිය යුතුයි.

නත්ථි ජාතස්ස අමරණං ‘යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්ධෙ භාසමානස්ස තෙ න සුනිම්මදයා අගාරං අජ්ඣාවසතා, පබ්බජිස්සාම’හං භො අගාරස්මා අනගාරියන්ති. තෙනහි භවං ගොවින්දො සත්තාහං ආගමෙතු, යාව මයං සකෙ පුත්තභාතරො රජ්ජ අනුසාසාම. සත්තාහස්ස අච්චයෙන මයම්පි අගාරස්මා. අනගාරියං පබ්බජිස්සාම, අථ යා තෙ ගති සා නො ගති භවිස්සතීති. න චිරං ඛො භො සත්තාහං, ආගමිස්සාමහං භවන්තෙ සත්තාහන්ති.

56. අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන තෙ සත්ත බ්‍රාහ්මණ මහාසාලා සත්තච නහාතකසතානි තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා සත්ත බ්‍රාහ්මණමහාසාලෙ සත්තච නහාතකසතානි එතද වොච.

---

උපන් සත්වයාහට ජරා මරණරහිත බවක්නැත්තේය. කාම ක්‍රොධාදි ආමගන්ධකාරණයන් කියන්නාවූ සනත්කුමාරබ්‍රහ්මයාගේකථාව මාවිසින් යම්සේ අසනලද්දේද ඒ ක්ලේශයෝ ගිහිගෙයි වසන්නහුවිසින් ඉතාදුකසේ බැහැරලිය යුත්තෝ වෙත්. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කීයේය. එහෙනම් පින්වත් ගොවින්ද පණ්ඩිතතෙමේ සත්දවසක් බලාපොරොත්තු වේවා. යම්තාක් අපි තමතමන්ගේ පුතුන් හා සොහොයුරන් රාජ්‍යයන්හි අනුශාසනාකරමුද ඒ සඳහායි. සත්දවසක්හුගේ ඇවෑමෙන් අපිද ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇතිකල්හි ඔබගේ යම් ගතියක් වන්නේද ඕතොමෝ අපගේ ගතිය වන්නේයයි කීහ. පින්වත්නි, සත් දවස ඉතා බොහෝ කල් නොවෙයි. පින්වත්නි, මම සත්දවසක් බලාපොරොත්තු වන්නෙමියි කීයේය.

56. පින්වත්නි, ඉක්බිත්තෙන් මහාගොවින්දබ්‍රාහ්මණතෙම ඒ උප පෙරවි තනතුරට පැමිණි මහාසාරකුලවත් බ්‍රාහ්මණයෝ සත්දෙන යම්තැනෙක්හිද නහාතකයෝ සත්සියය යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ මහාසාර කුලවත් බ්‍රාහ්මණයන් සත්දෙනාටද නහාතකයන් සත්සියයටද මේ කාරණය දැන්වීය.

අඤ්ඤං දානි භවන්තො, ආචරියං පරියෙසන්තු. යො භව
න්තානං මන්තෙ වාචෙස්සති. ඉච්ඡාමහං භො අගාරස්මා අනගාරියං
පබ්බජිතුං. යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්ධෙ භාසමා
නස්ස, නෙ න සුකිමමදංසා අගාරං අජ්ඣාවසතා, පබ්බජිස්සාමහං භො
අගාරස්මා අනගාරියන්ති. මා භො භවං ගොවින්දො අගාරස්මා අනගා
රියං පබ්බජි. පබ්බජ්ජා අප්පෙසක්ඛා ච අප්පලාභා ච, බ්‍රහ්මඤ්ඤං
මහෙසක්ඛඤ්ච මහාලාභඤ්චාති. මා භවන්තො එවං අවචුත්ථ. පබ්බජ්ජා
අප්පෙසක්ඛා ච අප්පලාභා ච, බ්‍රහ්මඤ්ඤං මහෙසක්ඛඤ්ච මහාලාභ
ඤ්චාති. කො නු ඛො භො අඤ්ඤත්‍ර මයා මහෙසක්ඛතරොවා මහා
ලාභතරොවා. අහංහි භො එතරහි රාජා ච රඤ්ඤං, බ්‍රහ්මාච බ්‍රාහ්ම
ණානං, දෙවතාච ගහපතිකානං, තං පහංසබ්බං පහාය අගාරස්මා අනා
ගාරියං පබ්බජිස්සාමි. යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්ධෙ
භාසමානස්ස, නෙ න සුකිමමදංසා අගාරං අජ්ඣාවසතා,

---

දැන් යමෙක් පින්වතුන්ට මන්ත්‍රයන් කියවන්නේද පින්වත්හු එබඳු
අන්‍ය ආචාර්‍ය්‍යයෙකු සොයත්වා. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම
සස්නෙහි පැවිදිවන්නට කැමැත්තෙමි. පින්වත්තෙමේ ගිහිගෙයින්
නික්ම සස්නෙහි පැවිදි නොවේවා. පින්වත, ප්‍රව්‍රජ්‍යාතොමෝ ස්වල්
පවූ යසස් ඇත්තේද ස්වල්පවූලාභ ඇත්තේද වෙයි. බ්‍රාහ්මණභාවය
මහත් යසස් ඇත්තේද මහත් ලාභ ඇත්තේද වේයයි කිහ. පින්
වත්නි, මෙසේ නොකියව්, කෙසේද ප්‍රව්‍රජ්‍යාව ස්වල්ප යසස් ඇත්තේ
ද වෙයි, ස්වල්ප ලාභ ඇත්තේද වෙයි. බ්‍රාහ්මණභාවය මහත් යසස්
ඇත්තේද මහත් ලාභ ඇත්තේද වෙයි කියායි. පින්වත්නි, අන් කව
රෙක් නම් මට වඩා මහත් යසස් ඇත්තේ හෝ මහත් ලාභ ඇත්
තේදැයි විචාලේය. පින්වත්නි, දැන් මමවූකලි රජුන්ගේ රජවෙමි.
බ්‍රාහ්මණයන්ගේ බ්‍රහ්ම වෙමි. ගෘහපතිකයන්ගේ දෙවතාවෙමි.
මම ඒ සියල්ලද හැර ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වන්
නෙමි. ආමගන්ධකාරණයන් කියන්නාවූ සනත් කුමාර බ්‍රහ්මයාගේ
කථාව යම් පරිද්දෙකින් මා විසින් අසනලද්දේද ගිහිගෙයි වසන්නාහු
විසින් ඒ ක්ලෙශ ධර්‍මයෝ දුකසේ බැහැරලිය යුත්තෝ වෙත්.

පබ්බජිස්සාමහං භො අගාරස්මා අනගාරියන්ති. සචෙ භවං ගොවින්දො අගාරස්මා අනගාරියං පබ්බජිස්සති, මයමපි අගාරස්මා අනගාරියං පබ්බජිස්සාම, අථ යා තෙ ගති සා නො ගති භවිස්සතීති.

57. අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො යෙන චත්තාරීසා භරියා සාදිසියො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා චත්තාරීසා භරියා සාදිසියො එතදවොච, යා භොති න ඉච්ඡති සකානි වා ඤාති කුලානි ගච්ඡතු, අඤ්ඤං භත්තාරං පරියෙසතු. ඉච්ඡාමහං භොතී අගාරස්මා අනගාරියං පබ්බජිතුං. යථා ඛො පන මෙ සුතං බ්‍රහ්මුනො ආමගන්ධෙ භාසමානස්ස තෙ න සුනිම්මදයා අගාරං අජ්ඣාවසතා, පබ්බජිස්සාමහං භොති අගාරස්මා අනගාරියන්ති. ත්වඤ්ඤෙව නො ඤාති ඤාතිකාමානං. ත්වං පන භත්තා භත්තුකාමානං.

---

පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කීයේය. ඉදින් පින්වත් ගොවින්ද පණ්ඩිතතෙමේ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නේනම් අපිද ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇතිකල්හි ඔබගේ යම් ගතියක් වන්නේනම් ඕතොමෝ අපගේ ගතිය වන්නේයයි කීහ.

57. පින්වත්නි, ඊට අනතුරුව මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ සම ජාති ගොත්‍ර ඇති සතළිස් භාර්‍ය්‍යාවෝ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ සමාන ජාති ගොත්‍ර ඇති සතළිස් භාර්‍ය්‍යාවන්ට මේ කාරණයකියේය. යම්පින්වතියක් නොකැමැත්තීනම් ඕතොමෝ තමාගේ ඤාතිකුලයට හෝ යේවා, අන්‍ය ස්වාමියෙකු හෝ සොයාවා, පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නට කැමැත්තෙමි. කාම ක්‍රොධාදි ලක්‍ෂණවත් ආමගන්ධ කාරණයන් කියන්නාවූ සනත්කුමාර බ්‍රහ්මයාගේ කථාව යම් පරිද්දෙකින් මාවිසින් අසනලද්දේද ඒ ක්ලෙශ ධර්‍මයෝ ගිහිගෙයි වාසයකරන්නහුවිසින් ඉතා දුකසේ බැහැරකටයුත්තෝ වෙත්. පින්වත්නි, මම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමියි කියේය. ඔබම නෑයන් කැමැත්තාවූ අපගේ ඤාතිවෙයි. ඔබම ස්වාමින් කැමැත්තාවූ අපගේස්වාමිවෙයි කීහ.

සචෙ භවං ගොවින්දො අගාරස්මා අනගාරියං පබ්බජිස්සති, මයම්පි අගාරස්මා අනගාරියං පබ්බජිස්සාම, අථ යා තෙ ගති සා නො ගති භවිස්සතීති.

58. අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො තස්ස සත්තාහස්ස අච්චයෙන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි. පබ්බජිතස්ස ච පන මහාගොවින්දං බ්‍රාහ්මණං සත්තච රාජානො ඛත්තියා මුද්ධාවසිත්තා සත්තච බ්‍රාහ්මණ මහාසාලා සත්තච නහාතකසතානි චත්තාරීසා ච භරියා සාදිසියො. අනෙකානි ච ඛත්තිය සහස්සානි අනෙකානි ච බ්‍රාහ්මණසහස්සානි අනෙකානි ච ගහපතිසහස්සානි අනෙකානි ච ඉත්ථාගාරෙහි ඉත්ථිකායො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා මහාගොවින්දං බ්‍රාහ්මණං අගාරස්මා අනගාරියං පබ්බජිතං අනුපබ්බජිංසු. තාය සුදං භො පරිසාය පරිවුතො මහාගොවින්දො බ්‍රාහ්මණො ගාමනිගම රාජධානිසු චාරිකං චරති.

---

ඉදින් පින්වත් ගොවින්ද පණ්ඩිතතෙමේ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නේනම් අපිද ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇතිකල්හි ඔබගේ යම් ගතියක් වන්නේනම් ඕතොමෝ අපගේ ගතිය වන්නේයයි කීහ.

58. පින්වත්නි ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ සත්දවස ඉක්මගිය කල්හි කෙස් දැළිරැවුලු හරවා කාෂායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූයේය. පැවිදිවූ මහාගොවින්ද බ්‍රාහ්මණයා අනුව කැත්කුලයෙහි උපන්නාවූ මුදුනෙහි අභිෂෙක කරණලද්දාවූ සත්රජහුද මහසල්කුලවත් බමුණෝ සත්දෙනාද සත්සියයක් නහාතකයෝද සමාන ජාති ගොත්‍ර ඇති සම සතළිස් භාර්‍ය්‍යාවෝද පැවිදිවූහ. එසේම නොයෙක් දහස්ගණන් ක්ෂත්‍රියයෝද නොයෙක් දහස්ගණන් බ්‍රාහ්මණයෝද නොයෙක් දහස්ගණන් ගෘහපතීහුද අන්තඃපුර ස්ත්‍රීන් අතුරෙන් නොයෙක් ස්ත්‍රීහුද කෙස් දැළිරැවුලු හරවා කාෂාය වස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූ මහා ගොවින්ද බ්‍රාහ්මණයාට අනුව පැවිදිවූහ. පින්වත්නි, එකල්හි ඒ පැවිදි පිරිසවිසින් පිරිවරණ ලද්දාවූ මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ගම් නියම්ගම් රාජධානීවල චාරිකා කෙරේ.

යං ඛො පන භො තෙන සමයෙන මහාගොවින්දෝ බ්‍රාහ්මණො ගාමංවා නිගමංවා උපසඞ්කමති තත්‍ථ රාජාව හොති රඤ්ඤං, බ්‍රහ්මාව බ්‍රාහ්මණානං, දෙවතාව ගහපතිකානං. යෙච ඛො පන භො තෙන සමයෙන මනුස්සා ඛිපන්තිවා. උපක්ඛලන්තිවා, තෙ එවමාහංසු. නමත්‍ථු මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස, නමත්‍ථු සත්තපුරොහිතස්සාති.

59 මහාගොවින්දො භො බ්‍රාහ්මණො මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි, තථා දුතියං, තථා තතියං, තථා චතුත්‍ථං ඉති උද්ධමධොතිරියං සබ්බධි සබ්බත්‍ථතාය. සබ්බාවන්තං ලොකං මෙත්තා සහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි. කරුණාසහගතෙන චෙතසා-පෙ-මුදිතා සහගතෙන චෙතසා-පෙ-උපෙඛා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි.

---

පින්වත්නි, ඒ කාලයෙහි මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ යම් ගමකට හෝ නියම්ගමකට එලඹේද එහි රජුන්ගේ රජදවෙයි. හෙවත් රාජාධිරාජවෙයි. බ්‍රාහ්මණයන්ගේ බ්‍රහ්මවෙයි. ගෘහපතියන් ගේ දෙවතාවෙයි. පින්වත්නි ඒ කාලයෙහිදි යම් යම් මනුෂ්‍යකෙනෙක් නාසාවෘත හරින්නෝ හෝ කණුකටු ආදියක හැපෙන්නෝ හෝ වෙත්ද ඔව්හු මෙසේ කීහ. මහාගොවින්ද බ්‍රාහ්මණයාට නමස්කාර වේවා. පෙරවිසත්දෙනාටද නමස්කාරවේවා කියාති.

59. පින්වත්නි, මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ මෛත්‍රිය සමග පැවති සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවන දිගද එසේම තුන්වනදිගද එසේම සතරවන දිගද මෙසේ උඩද යටද සරසද්‍ද සියලුකල්හි සියලුතන්හි පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය විපුලවූ මහත් බවට පැමිණියාවූ ප්‍රමාණාතික්‍රාන්ත වූ වෛර රහිතවූ ව්‍යාපාද රහිතවූ මෛත්‍රිය සමග පැවති සිතින් පතුරවා වාසය කෙළේය. කරුණාව සමග පැවති සිතින්ද—පෙ—මුදිතාවසමග පැවති සිතින්ද—පෙ-මධ්‍යස්ථතාව සමග පැවති සිතින්ද එක් දිසාවක් පතුරවා වාසය කෙළේය.

සචෙ භවං ගොවින්දො අනාරස්මා අනගාරියං පබ්බජිස්සති, මයම්පි ආගාරස්මා අනගාරියං පබ්බජිස්සාම, අථ යා තෙ ගති සා නො ගති භවිස්සතීති.

58. අථ ඛො භො මහාගොවින්දො බ්‍රාහ්මණො තස්ස සත්තාහස්ස අච්චයෙන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි. පබ්බජිතස්ස පන මහාගොවින්දං බ්‍රාහ්මණං සත්තච රාජානො ඛත්තියා මුද්ධාවසිත්තා සත්තච බ්‍රාහ්මණ මහාසාලා සත්තච නහාතකසතානි චත්තාරීසාච භරියා සාදිසියො. අනෙකානිච ඛත්තිය සහස්සානි අනෙකානිච බ්‍රාහ්මණසහස්සානි අනෙකානිච ගහපතිසහස්සානි අනෙකානිච ඉත්ථාගාරෙහි ඉත්ථිකායො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා මහාගොවින්දං බ්‍රාහ්මණං අගාරස්මා අනගාරියං පබ්බජිතං අනුපබ්බජිංසු. තාය සුදං භො පරිසාය පරිවුතො මහාගොවින්දො බ්‍රාහ්මණො ගාමනිගම රාජධානිසු චාරිකං චරති.

---

ඉදින් පින්වත් ගොවින්දපණ්ඩිතතෙමේ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නේනම් අපිද ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙමු. එසේ ඇතිකල්හි ඔබගේ යම් ගතියක් වන්නේනම් ඕතොමෝ අපගේ ගතිය වන්නේයයි කීහ.

58. පින්වත්නි ඉක්බිත්තෙන් මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ඒ සත්දවස ඉක්මගිය කල්හි කෙස් දැළිරැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූයේය. පැවිදිවූ මහාගොවින්ද බ්‍රාහ්මණයා අනුව කැත්කුලයෙහි උපන්නාවූ මුදුනෙහි අභිෂෙක කරණලද්දාවූ සත්රජහුද මහසල්කුලවත් බමුණෝ සත්දෙනාද සත්සියයක් නහාතකයෝද සමාන ජාති ගොත්‍ර ඇති සම සතළිස් භාර්‍ය්‍යාවෝද පැවිදිවූහ. එසේම නොයෙක් දහස්ගණන් ක්ෂත්‍රියයෝද නොයෙක් දහස්ගණන් බ්‍රාහ්මණයෝද නොයෙක් දහස්ගණන් ගෘහපතීහුද අන්තඃපුර ස්ත්‍රීන් අතුරෙන් නොයෙක් ස්ත්‍රීහුද කෙස් දැළිරැවුලු හරවා කාෂාය වස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූ මහා ගොවින්ද බ්‍රාහ්මණයාට අනුව පැවිදිවූහ. පින්වත්නි, එකල්හි ඒ පැවිදි පිරිසවිසින් පිරිවරණ ලද්දාවූ මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ ගම් නියම්ගම් රාජධානීවල චාරිකා කෙරේ.

යං ඛො පන භො තෙන සමයෙන මහාගොවින්දො බ්‍රාහ්මණො ගාමංවා නිගමංවා උපසඞ්කමති තත්‍ථ රාජාව හොති රඤ්ඤං, බ්‍රහ්මාව බ්‍රාහ්ම ණානං, දෙවතාව ගහපතිකානං.යෙව ඛො පන භො තෙන සමයෙන මනුස්සා ඛිපන්තිවා. උපක්කලන්තිවා, තෙ එවමාහංසු. නමත්‍ථු මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස, නමත්‍ථු සත්තපුරොහිතස්සාති.

59 මහාගොවින්දො භො බ්‍රාහ්මණො මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි, තථා දුතියං, තථා තතියං, තථා චතුත්‍ථං ඉති උද්ධමධොතිරියං සබ්බධි සබ්බත්‍ථතාය. සබ්බාවන්තං ලොකං මෙත්තා සහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙණ අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි. කරුණාසහගතෙන චෙතසා-පෙ-මුදිතා සහගතෙන චෙතසා-පෙ-උපෙක්ඛා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි.

---

පින්වත්නි, ඒ කාලයෙහි මහාගොවින්ද බ්‍රාහ්මණතෙමේ යම් ගමකට හෝ නියම්ගමකට එලඹේද එහි රජුන්ගේ රජදවෙයි. හෙවත් රාජාධිරාජවෙයි. බ්‍රාහ්මණයන්ගේ බ්‍රහ්මවෙයි. ගෘහපතියන් ගේ දෙවතාවෙයි. පින්වත්නි ඒ කාලයෙහිදි යම් යම් මනුෂ්‍යකෙනෙක් නාසාවාත හරිත්නෙෝ හෝ කණුකටු ආදියක හැපෙන්නෙෝ හෝ වෙත්ද ඔව්හු මෙසේ කිහ. මහාගොවින්ද බ්‍රාහ්මණයාට නමස්කාර වේවා. පෙරවිසත්දෙනාටද නමස්කාරවේවා කියාති.

59. පින්වත්නි, මහා ගොවින්ද බ්‍රාහ්මණතෙමේ මෛත්‍රිය සමග පැවති සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවන දිගද එසේම තුන්වනදිගද එසේම සතරවන දිගද මෙසේ උඩද යටද සරසදැයි සියලුකල්හි සියලුතන්හි පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය විපුලවූ මහත් බවට පැමිණියාවූ ප්‍රමාණාතික්‍රාන්ත වූ වෛර රහිතවූ ව්‍යාපාද රහිතවූ මෛත්‍රිය සමග පැවති සිතින් පතුරවා වාසය කෙළේය. කරුණාව සමග පැවති සිතින්ද—පෙ—මුදිතාවසමග පැවති සිතින්ද—පෙ-මධ්‍යස්ථාව සමග පැවති සිතින්ද එක් දිසාවක් පතුරවා වාසය කෙළේය.

තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්ථතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛා සහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහාසි, සාවකානඤ්ච බ්‍රහ්මලොකසහබ්‍යතාය මග්ගං දෙසෙසි.

60 යෙ ඛො පන භො තෙන සමයෙන මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස සාවකා සබ්බෙන සබ්බං සාසනං ආජානිංසු, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං බ්‍රහ්මලොකං උපපජ්ජිංසු. යෙ න සබ්බෙන සබ්බං සාසනං ආජානිංසු, තෙ කායස්ස භෙදා පරම්මරණා අප්පෙකච්චෙ පරනිම්මිත වසවත්තීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු. අප්පෙකච්චෙ නිම්මාණරතීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු, අප්පෙකච්චෙ තුසිතානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු.

---

එසේම දෙවනදිගද එසේම තුන්වන දිගද එසේම සතරවන දිගද මෙසේ උඩද යටද සරසදයි සියලුකල්හි සියලුතන්හි සියල්ල ඇත්තාවූ ලොකය විපුලවූ මහත්බවට පැමිණියාවූ ප්‍රමාණ රහිතවූ වෛර රහිතවූ ව්‍යාපාද රහිතවූ උපෙක්ෂා සහගත සිතින් පතුරවා වාසය කෙළේය. ( ඒ ගොවින්ද මහාපුරුෂ තෙමේ අෂ්ටසමාපත්ති පඤ්චාභිඥාවන් උපදවා වාසයකළ බැව් සැලකියයුතු ) තමාගේ ශ්‍රාවකයන්ටද බඹ ලොව බ්‍රහ්මයාගේ සහ භාවය පිණිස මාර්ගය දෙසනා කළේය.

60. පින්වත්නි, ඒකාලයෙහිදී මහාගොවින්ද බ්‍රාහ්මණයාගේ යම් ඒ ශ්‍රාවකකෙනෙක් සර්වප්‍රකාරයෙන් සියලු අනුශාසනාව දැනගත්තාහුද හෙවත් අෂ්ටසමාපත්තීන් අතුරෙන් එක් සමාපත්තියක්වත් උපදවා වාසයකළෝද ඔව්හු කාබුන් මරණින් මතු යහපත් ගතිඇති බඹලොව උපන්හ. යම්කෙනෙක් සර්වප්‍රකාරයෙන් එක් අනුශාසනාවක් හෙවත් එක් සමාපත්තියකුත් නොඉපදවූද ඔව්හු කාබුන් මරණින්මතු ඇතැම් කෙනෙක් පරනිම්මිත වසවර්ති දෙවියන්ගේ සහභාවයට පැමිණියාහුය. ඇතැම් කෙනෙක් නිර්මාණරතී දෙවියන්ගේ සහභාවයට පැමිණියාහ. ඇතැම් කෙනෙක් තුෂිත දෙවියන්ගේ සහභාවයට පැමිණියාහ.

අප්පෙකච්චෙ යාමානං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු, අප්පෙකච්චෙ තාවතිංසානං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු, අප්පෙකච්චෙ චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජිංසු, යෙ සබ්බෙ සබ්බනිහීනං කායං පරිපූරෙසුං තෙ ගන්ධබ්බකායං පරිපූරෙසුං. ඉති ඛො පන සබ්බෙසංයෙව තෙසං කුලපුත්තානං අමොඝා පබ්බජ්ජා අහොසි අවඤ්ඣා සඵලා සඋද්‍රයා'ති.

61 සරති තං භගවා'ති, සරාමහං පඤ්චසිඛ, අහං තෙන සමයෙන මහාගොවින්දො බ්‍රාහ්මණො අහොසිං. අහං තෙසං සාවකානං බ්‍රහ්මලොකසහව්‍යතාය මග්ගං දෙසෙසිං. තං ඛො පන පඤ්චසිඛ බ්‍රහ්මචරියං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති, යාවදෙව බ්‍රහ්මලොකූපපත්තියා.

---

ඇතැම් කෙනෙක් යාම දෙවියන්ගේ සහභාවයට පැමිණියාහ. ඇතැම් කෙනෙක් තව්තිසාවැසි දෙවියන්ගේ සහභාවයට පැමිණියාහ. ඇතැම් කෙනෙක් චාතුර්මහාරාජික දෙවියන්ගේ සහභාවයට පැමිණියාහ. යම් කෙනෙක් සර්වප්‍රකාරයෙන් මේ සියල්ලට වඩා අතිශයින් ලාමකවූ ගතියක් සම්පූර්ණකළාහුද ඔව්හු ගාන්ධර්ව නිකාය සම්පූර්ණකළාහුය. පින්වත්නි, මෙසේ ඒ සියලු කුලපුත්‍රයන්ගේ පැවිද්ද සිස්නොවිය. හෙවත් විපාක සහිතවිය. වඳනොවිය. ඵලසහිත වීය. බ්‍රහමලොකොත්පත්තියට හේතුවිය.

61. භාග්‍යවතුන්වහන්සේ එය සිහිකෙරේදැයි විචාළේය. පඤ්චසිඛය මම එය සිහිකරමි. මම ඒකාලයෙහිදී මහාගොවින්ද බ්‍රාහ්මණ වූයෙමි. මම ඒ ශ්‍රාවකයන්ට බඹලොව බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස පවත්නාවූ මාර්ගය දෙශනාකෙළෙමි. පඤ්චසිඛය ඒ බ්‍රහ්මචර්‍ය්‍යාවවූකලී සසර කලකිරීම පිණිස නොපවතී. සසර නොඇලීම පිණිසද නොපවතී. ක්ලෙශ නිරොධය පිණිසද නොපවතී. කෙලෙස් සංසිඳවීම පිණිසද නොපවතී. සංසාරවර්තය විශෙෂයෙන් දැනගැනීම පිණිස හෙවත් විශිෂ්ට ඥානලාභය පිණිස නොපවතී. සම්‍යක් සම්බොධිය ලැබීම පිණිසද නොපවතී. ක්ලෙශපරිනිර්වාණය පිණිසද නොපවතී. බඹලොව ඉපදීම පිණිසම පවතී.

ඉදං ඛො පන මෙ පඤ්චසිඛ බ්‍රහ්මචරියං එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං, සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. ඉදං ඛො තං පඤ්චසිඛ බ්‍රහ්මචරියං එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

62 යෙ ඛො පන මෙ පඤ්චසිඛ සාවකා සබ්බෙන සබ්බං සාසනං ආජානන්ති, තෙ ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

---

පඤ්චසිඛය මාගේ මේ බ්‍රහ්මචර්‍ය්‍යාව ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිසද සසර නොඇලීම පිණිසද ක්ලේශ නිරොධය පිණිසද් කෙලෙසුන් සංසිඳවීම පිණිසද විශිෂ්ටඥානලාභය පිණිසද සම්‍යක් සම්බොධිය පිණිසද ක්ලේශ පරිනිර්වාණය පිණිසද පවතී. ඒනම්, මේ අඞ්ග අටකින් යුක්තවූ ආර්‍ය්‍යමාර්ගයටයි. ඒ අඞ්ග අට කවරහුදයත් ? සම්‍යක් දෘෂ්ටිය සම්‍යක් සඞ්කල්පනාය සම්‍යක් වචනය සම්‍යක් කර්මාන්තය සම්‍යක් ආජීවය සම්‍යක් ව්‍යායාමය සම්‍යක් ස්මෘතිය සම්‍යක් සමාධිය යන මේයි. පඤ්චසිඛය ඒ මේ බ්‍රහ්මචර්‍ය්‍යාව වූකලී ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිසද සසර නොඇලීම පිණිසද ක්ලේශ නිරොධය පිණිසද ක්ලේශ ව්‍යුපසමනය පිණිසද විශිෂ්ටඥානලාභය පිණිසද සම්‍යක් සම්බොධිය පිණිසද නිර්වාණය පිණිසද පවතීයයි වදාළසේක.

62. පඤ්චසිඛය යම් ශ්‍රාවකකෙනෙක් සර්වප්‍රකාරයෙන් මාගේ අනුශාසනාව දැනගණිත්ද ඒ ශ්‍රාවකයෝ කාමාදි ආශ්‍රවයන්ගේ ක්‍ෂයකිරීමෙන් ආශ්‍රව රහිතවූ චිත්තවිමුක්තියද ඵල ප්‍රඥාවද මේ අත්බැව්හිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ඊට පැමිණ වාසය කරත්.

යෙ න සබ්බෙන සබ්බං සාසනං ආජානන්ති. අප්පෙකච්චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා හොන්ති, තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා. යෙ න සබ්බෙන සබ්බං සාසනං ආජානන්ති. අප්පෙකච්චෙ තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො හොන්ති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොන්ති. යෙ න සබ්බෙන සබ්බං සාසනං ආජානන්ති අප්පෙකච්චෙ තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා හොන්ති අවිනිපාත ධම්මා නියතා සම්බොධිපරායනා.

---

යම් ශ්‍රාවකකෙනෙක් සර්වප්‍රකාරයෙන් සියලු අනුශාසනාව දැන නොගණිත්ද, ඒ ඇතැම් කෙනෙක් ඕරම්භාගිය යයි කියනලද කාම භවය භජනයකරණ පඤ්චවිධ සංයොජනයන්ගේ ක්‍ෂයකිරීමෙන් ඕපපාතික වෙත්. ඒ සුද්ධාවාස බ්‍රහ්මතලයෙහිදීම පිරිනිවන්පානා සවභාව ඇත්තෝ වෙත්. ඒ ශුද්ධාවාස බ්‍රහ්මලොකයෙන් පෙරළෙන සවභාව ඇත්තෝ නොවෙත්. යම් කෙනෙක් සර්වප්‍රකාරයෙන් සියලු අනුශාසනාව දැනගණිත්ද, ඒ ඇතැම් කෙනෙක් සත්කාය දෘෂ්ටි විචිකිත්සා ශීලව්‍රත පරාමාස යන ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්‍ෂයකිරීමෙන් රාග ද්වේෂ මෝහයන්ගේ තුණීකිරීමෙන් සකෘදාගාමි වෙත්. එකවරක්ම මේලොවට උත්පත්තිවශයෙන්පැමිණ සංසාරදුක කෙළවර කෙරෙත්. යම් ශ්‍රාවකකෙනෙක් සර්වප්‍රකාරයෙන් සියලු අනුශාසනාව නොදනිත්ද ඒ ඇතැම් කෙනෙක් සත්කායදෘෂ්ටි ආදි ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්‍ෂයකිරීමෙන් ශ්‍රොත ආපන්න ආර්‍ය්‍ය පුද්ගල වෙත්. භවදුඃඛයට පෙරළෙන සවභාව ඇත්තෝ නොවෙත්. නිර්‍වාණාවබොධය නියමකොට ඇත්තෝ වෙත්. සම්‍යක් සම්බොධිය පිහිටකොට ඇත්තෝ වෙත්යයි වදාළසේක.

ඉති ඛො පඤ්චසිඛ සබ්බෙසංයෙව ඉමෙසං කුලපුත්තානං අමොඝා පබ්බජ්ජා අවඤ්ඣා සඵලා උද්‍රයාති. ඉදමවොච භගවා, අත්තමනො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො භගවතො, භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙ'වන්තරධායීති.

### මහාගොවින්ද සුත්තං නිට්ඨිතං

### එකූනවීසතිකං.

---

පඤ්චසිඛය මෙසේ ඇතිකල්හි මේ සියලු කුලපුත්‍රයන්ගේ පැවිද්ද සිස්නොවිය, වඳනොවිය, විපාක සහිතවිය. අභිවෘද්ධි සහිතවියයි වදාලෝ. භාග්‍යවතුන්වහන්සේ මේ සූත්‍රධර්මය වදාළසේක, සතුටු සිත් ඇති පඤ්චසිඛ ගන්ධර්ව පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේගේ ධර්මභාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ පැදකුණුකොට එහිදීම අතුරුදහන් වූයේය.

### එකුන්විසිවන මහාගොවින්ද සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව

### මෙතෙකින් නිමියේයි.

උපසංකමිත්වා, භගවතො සන්තිකෙ පච්චෙකගාථං භාසෙය්‍යාමාති.

3. අථ ඛො තා දෙවතා සෙය්‍යථාපි නාම බලවා පුරිසො, සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා භගවතො පුරතො පාතුරහංසු.

අථ ඛො තා දෙවතා භගවන්තං අභිවාදෙත්වා, එකමන්තං අට්ඨංසු, එකමන්තං ඨිතා ඛො එකා දෙවතා, භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

මහාසමයො පවනස්මිං දෙවකායා සමාගතා,
ආගතම්හ ඉමං ධම්මසමයං දක්ඛිතායෙ අපරාජිතසංඝන්ති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

තත්‍ර භික්ඛවො සමාදහංසු චිත්තං අත්තනො උජුකමකංසු,
සාරථීව නෙත්තානි ගහෙත්වා ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතාති.

---

එලෙස භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි එකිඑකී ගාථාවක් කියන්නෙමුනම් ඉතා යෙහෙකැයි සිතූහ. ඉක්බිත්තෙන් ඒ දෙවතාවෝ බලවත් පුරුෂයෙක් හකුලුවනලද අතක් දිගුකරන්නේත් හෝ දිගුකරණලද අතක් හකුලුවන්නේ යම්සේද එපරිද්දෙන්ම සුදූවැසි දෙවියන් කෙරෙහි අතුරුදහන්වූවෝ භාග්‍යවතුන්වහන්සේගේ ඉදිරියෙහි පහළවූහ.

3. ඉක්බිති ඒදෙවතාවෝ භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටියාවූ එක් දෙවතාවෙක් භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේය. මහවනයෙහි මහත් සමාගමයෙකි, දෙවසමූහයෝ එක්රැස්වූහ, කෙලෙස් සතුරන් විසින් නොපරදවනලද ආර්‍ය්‍යසඞ්ඝයා දක්නා පිණිස මේ ධර්‍මසමාගමයට අපිත් ආවෙමු. ඉක්බිත්තෙන් අන්‍ය දෙවතාවෙක් භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේය. ඒ ධර්‍මසමාගමයෙහි භික්ෂූහු තමන්ගේ සිත සමාධියෙහි පිහිටෙව්හ. හෙවත් එකඟකළාහුය, ඍජුකළාහුය. රැහැන්ගෙණ රථාචාර්‍ය්‍යයෙක් රථය පදින්නාක් මෙන් නුවණැත්තෝ ඉඳුරන් රකිත්.

අථ ඛො අපරා දෙවතා, භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

ඡෙත්වා ඛිලං ඡෙත්වා පලිඝං ඉන්දඛීලං ඌහච්ච මනෙජා,
තෙ චරන්ති සුද්ධා විමලා චක්ඛුමතා සුදන්තා සුසු නාගාති.

අථ ඛො අපරා දෙවතා, භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ න තෙ ගමිස්සන්ති අපායං,
පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්තීති

4. අථ ඛො භගවා භික්ඛු ආමන්තෙසි, යෙභුය්‍යෙන භික්ඛවෙ දසසු ලොකධාතුසු දෙවතා සන්නිපතිතා, තථාගතං දස්සනාය භික්ඛු සඞ්ඝඤ්ච, යෙපි තෙ භික්ඛවෙ අහෙසුං, අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමා යෙව දෙවතා සන්නිපතිතා අහෙසුං සෙය්‍යථාපි මය්හං එතරහි. යෙපි තෙ භික්ඛවෙ භවිස්සන්ති, අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමා යෙව දෙවතා සන්නිපතිතා භවිස්සන්ති,

---

ඉක්බිත්තෙන් අනික් දෙවතාවෙක් භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි මේ ගය කීයේය. රාගාදි කෙලෙස් නැමැති උල සිඳ කෙලෙස් නැමැති කණයම සිඳ ඉන්ද්‍රඛිලය උදුරා එජායයි කියනලද තෘෂ්ණා රහිතවූ එහෙයින්ම පිරිසිදුවූ, නිර්මලවූපසැස් ඇත්තාවූ බුදුන් විසින් මනාකොට දමනයකරණලද්දවූ ඒ තරුණ රහත්හු සිව්දිග හැසිරෙත්. ඉක්බිත්තෙන් අන්‍ය දෙවතාවෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගය කීයේය. යම්කිසි කෙනෙක් බුදුන් සරණගියාහුද ඔව්හු අපායට නොයත්. මිනිස් සිරුර හැර දිව්‍යකාය හෙවත් දෙවසමූහයා සම්පූර්ණකරන්නාහුය. ( බුද්ධ රත්නයගන් හෙයින් ධර්මසඞ්ඝ රත්න දෙකම ගතයුතුයි.)

4. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන් ඇමතූසේක· මහණෙනි, දසදහස් ලෝදුවන්හි දෙවියෝ තථාගතයන්ද භික්ෂුසඞ්ඝයාද දැකීම පිණිස බොහෝසෙයින් රැස්වූහ. මහණෙනි, ඉකුත්කල්හි අර්හත්වූ යම් ඒ සම්‍යක්සම්බුද්ධයන්වහන්සේලා වූවාහුද ඒ භාග්‍යවතුන් වහන්සේලාටද මෙපමණම දෙවතාවෝ රැස්වූහ. දැන් මාගේ දැක්මට යම්සේ දේවතාවෝ රැස්වූද එසේයි. මහණෙනි, නොපැමිණි කාලයෙහි අර්හත්වූ යම් ඒ සම්‍යක්සම්බුද්ධවරයෝ වන්නාහුද ඒ භාග්‍යවතුන්වහන්සේලාටද මෙපමණම දෙවතාවෝ රැස්වන්නාහුය.

මිත්වා., භගවතො සන්තිකෙ පච්චෙකගාථං භාසෙය්‍යාමාති.
ඛො තා දෙවතා සෙය්‍යථාපි නාම බලවා පුරිසො, සම්මිඤ්ජි
බාහං පසාරෙය්‍ය,, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව
සසු දෙවෙසු අන්තරහිතා භගවතො පුරතො පාතුරහංසු.

ා තා දෙවතා භගවන්තං අභිවාදෙත්වා, එකමන්තං
එකමන්තං ඨිතා ඛො එකා දෙවතා., භගවතො සන්තිකෙ
ථං අභාසි.

ාසමයො පවනස්මිං දෙවකායා සමාගතා,,
ගතම්හ ඉමං ධම්මසමයං දක්ඛිතායෙ අපරාජිතසංඝන්ති.
අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.
භික්ඛවො සමාදහංසු චිත්තං අත්තනො උජුකමකංසු,
ිව නෙත්තානි ගහෙත්වා ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතාති.

---

භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි එකිඑකී ගාථාවක්
නමුනම් ඉතා යෙහෙකැයි සිතූහ. ඉක්බිත්තෙන් ඒ දෙව
බලවත් පුරුෂයෙක් හකුලුවනලද අතක් දිගුකරන්නේ
කරණලද අතක් හකුලුවන්නේ යම්සේද එපරිද්දෙන්ම
දෙවියන් කෙරෙහි අතුරුදහන්වූවෝ භාග්‍යවතුන්වහන්
ඉදිරියෙහි පහළවූහ.

ක්බිති ඒදෙවතාවෝ භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ එකත්
සිටියාහුය. එකත්පසෙක සිටියාවූ එක් දෙවතාවෙක් භාග්‍ය
වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේය. මහවනයෙහි
මාගමයෙකි, දෙවසමූහයෝ එක්රැස්වූහ, කෙලෙස් සතුරන්
නාපරදවනලද ආර්‍ය්‍යසඞ්ඝයා දක්නා පිණිස මේ ධර්‍මසමාගම
ආවෙමු. ඉක්බිත්තෙන් අන්‍ය දෙවතාවෙක් භාග්‍යවතුන්
ගේ සමීපයෙහි මේ ගාථාව කීයේය. ඒ ධර්‍මසමාගමයෙහි
මන්ගේ සිත සමාධියෙහි පිහිටෙව්හ. හෙවත් එකඟකළ
කළාහුය. රැහැන්ගෙණ රථාචාර්‍ය්‍යයෙක් රථය පදින්නාක්
වණැත්තෝ ඉඳුරන් රකිත්.

අථ ඛො අපරා දෙවතා, භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

ජෙත්වා ඛිලං ජෙත්වා පලිඝං ඉන්දඛිලං ඌහච්ච මනෙජා,
තෙ චරන්ති සුද්ධා විමලා චක්ඛුමතා සුදන්තා සුසු නාගා'ති.

අථ ඛො අපරා දෙවතා, භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ න තෙ ගමිස්සන්ති අපායං,
පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්තීති.

4. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි, යෙභුය්‍යෙන භික්ඛවෙ දසසු ලොකධාතුසු දෙවතා සන්නිපතිතා, තථාගතං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච, යෙපි තෙ භික්ඛවෙ අහෙසුං, අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමායෙව දෙවතා සන්නිපතිතා අහෙසුං සෙය්‍යථාපි මය්හං එතරහි. යෙපි තෙ භික්ඛවෙ භවිස්සන්ති, අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමා යෙව දෙවතා සන්නිපතිතා භවිස්සන්ති,

---

ඉක්බිත්තෙන් අනික් දෙවතාවෙක් භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි මේ ගය කියේය. රාගාදි කෙලෙස් නැමැති උළු සිඳ කෙලෙස් නැමැති කණයම සිඳ ඉන්ද්‍රඛිලය උදුරා එජයයි කියනලද තෘෂ්ණා රහිතවූ එහෙයින්ම පිරිසිදුවූ, නිර්මල්වූ පසැස් ඇත්තාවූ බුදුන් විසින් මනාකොට දමනයකරණලද්දාවූ ඒ තරුණ රහත්හු සිව්දිග හැසිරෙත්. ඉක්බිත්තෙන් අන්‍ය දෙවතාවෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගය කියේය. යම්කිසි කෙනෙක් බුදුන් සරණගියාහුද ඔව්හු අපායට නොයත්. මිනිස් සිරුර හැර දිව්‍යකාය හෙවත් දෙවසමූහයා සම්පූර්ණකරන්නාහුය. ( බුද්ධ රත්නයගත් හෙයින් ධර්මසඞ්ඝ රත්න දෙකම ගතයුතුයි.)

4. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, දසදහස් ලෝදුවන්හි දෙවියෝ තථාගතයන්ද භික්ෂුසඞ්ඝයාද දැකීම පිණිස බොහෝසෙයින් රැස්වූහ. මහණෙනි, ඉකුත්කල්හි අර්හත්වූ යම් ඒ සම්‍යක්සම්බුද්ධයන්වහන්සේලා වූවාහුද ඒ භාග්‍යවතුන් වහන්සේලාටද මෙපමණම දෙවතාවෝ රැස්වූහ. දැන් මාගේ දැක්මට යම්සේ දේවතාවෝ රැස්වූද එසේයි. මහණෙනි, නොපැමිණි කාලයෙහි අර්හත්වූ යම් ඒ සම්‍යක්සම්බුද්ධවරයෝ වන්නාහුද ඒ භාග්‍යවතුන්වහන්සේලාටද මෙපමණම දෙවතාවෝ රැස්වන්නාහුය.

සාතාගිරා තිසහස්සා යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

ඉච්චෙත සොළසසහස්සා යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

8. වෙස්සාමිත්තා පඤ්චසතා යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

කුම්භිරො රාජගහිකො වෙපුල්ලස්ස නිවෙසනං
භිය්‍යො නං සතසහස්සං යක්ඛානං පයිරුපාසති
කුම්භිරො රාජගහිකො සොපාග සමිතිං වනං.

---

සාතාගිරි නම් පර්වත වාසිවූ නොයෙක් පැහැඇති සෘද්ධි ඇත්තාවූ කාන්ති හෝ ආනුභාව ඇත්තාවූ ශරීරවර්ණ ඇත්තාවූ යසස් ඇත්තාවූ තුන්දහසක් යක්‍ෂයෝ සතුටුවෙමින් අභින් භික්‍ෂූන්ගේ සමූහය දක්නට මහවනයට පැමිණියාහ. මෙසේ නානාවිධ ප්‍රභා ඇත්තාවූ සෘද්ධි ඇත්තාවූ කාන්ති හෝ ආනුභාව ඇත්තාවූ ශරීරවර්ණ ඇත්තාවූ යසස් ඇත්තාවූ මේ සොළොස් දහසක් යක්‍ෂයෝ සතුටුවෙමින් අභින් භික්‍ෂු සමූහය දක්නට මහවනයට පැමිණියාහ.

8. වෙස්සාමිත්‍ර නම් පර්වතවාසිවූ නානාවිධ ප්‍රභාඇත්තාවූ සෘද්ධි ඇත්තාවූ කාන්ති හෝ ආනුභාව ඇත්තාවූ, ශරීරවර්ණ ඇත්තාවූ, යසස් ඇත්තාවූ පන්සියයක් යක්‍ෂයෝ සතුටුවෙමින් අභින් භික්‍ෂු සමූහය දක්නට මහවනයට පැමිණියාහ. රජගහනුවර උපන්නාවූ කුම්භීර නම් යක්සෙනෙවිරත් කෙනෙක් විය. ඔහුගේ නිවාසස්ථානය වෙපුල්ල පර්වතයයි. ඔහු වැඩියක් සහිත යක්‍ෂ ලක්‍ෂයක් ඇසුරු කෙරේ. රජගහනුවර උපන් ඒ කුම්භීරතෙමේද අභින් භික්‍ෂු සමූහය දක්නට මහවනයට ආයේය.

9. පුරිමඤ්ච දිසං රාජා ධතරට්ඨො තං පාසසති
ගන්ධබ්බානං ආධිපති මහාරාජා යසස්සිසො.

පුත්තාපිතස්ස බහවො ඉන්දනාමාමහබ්බලා
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

දක්ඛිණඤ්ච දිසං රාජා විරූළ්හො තං පසාසති
කුම්භණ්ඩානං ආධිපති මහාරාජා යසස්සිසො.

පුත්තාපි තස්ස බහවො ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

පච්ඡිමඤ්ච දිසං රාජා විරූපක්ඛො තං පසාසති
නාගානං ආධිපති මහාරාජා යසස්සිසො.

පුත්තාපි තස්ස බහවො ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

---

9. පෙරදිග රජවූ ධෘතරාෂ්ට්‍ර වරම්රජතෙමේ ඒ පෙරදිග අනුසාසනාකෙරේ. ගන්ධර්වයන්ට අධිපතිවූ යසස් ඇත්තාවූ ඒ ධෘතරාෂ්ට්‍රරජතෙමේද ඔහුගේ ඉන්‍ද්‍ර යන නම්ඇති මහත් ශක්ති ඇත්තාවූ සෘද්ධි ඇත්තාවූ කාන්ති හෝ ආනුභාව ඇති නොයෙක් පැහැ ඇති යසස් ඇත්තාවූ බොහෝ දිව්‍යපුත්‍රයෝද සතුටුවෙමින් අභිත් භික්ෂු සමූහය දක්නට මහවනයට පැමිණියාහ. දකුණුදිග රජවූ විරූඪ නම් වරම්රජතෙමේද ඒ දිග අනුසාසනාකෙරේ. කුම්භාණ්ඩයන්ට අධිපතිවූ යසස් ඇත්තාවූ ඒ මහරජතෙමේද සෘද්ධි ඇත්තාවූ කාන්ති හෝ ආනුභාව ඇති ශරීරවණී ඇති යසස් ඇත්තාවූ ඉන්‍ද්‍ර යන නම්ඇති ඔහුගේ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් අභිත් භික්ෂු සමූහය දක්නට මහවනයට පැමිණියාහ. පැසුළුදිග රජවූ විරූපාක්ෂතෙමේද ඒ දිග අනුසාසනාකෙරේ. නයින්ට අධිපතිවූ යසස් ඇති ඒ වරම් මහරජතෙමේද ඒ වරම් මහරජහුගේ ඉන්‍ද්‍ර යන නම්ඇති මහත් බල ඇත්තාවූ සෘද්ධි ඇත්තාවූ කාන්ති හෝ ආනුභාව ඇත්තාවූ ශරීරවණී ඇත්තාවූ යසස් ඇත්තාවූ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් අභිත් භික්ෂුසමූහය දක්නට මහවනයට පැමිණියාහ.

උත්තරඤ්ච දිසං රාජා කුවෙරො තප්පසාසති
යක්ඛානං ආධිපති මහාරාජා යසස්සිසො.
පුත්තාපි තස්ස බහවො ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.
පුරිමං දිසං ධතරට්ඨො දක්ඛිණෙන විරූළ්හකො
පච්ඡිමෙන විරූපක්ඛො කුවෙරො උත්තරං දිසං.
චත්තාරො තෙ මහාරාජා සමන්තා චතුරො දිසා
දද්දල්ලමානා අට්ඨංසු වනෙ කාපිලවත්ථවෙ.

10. තෙසං මායාවිනො දාසා ආගු වඤ්චනිකා සඨා
මායා කුටෙණ්ඩු වෙටෙණ්ඩු විටුච්ච විටුඩො සහ.
චන්දනො කාමසෙට්ඨො ච කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච
පනාදෙ ඔපමඤ්ඤො ච දෙවසූතො ච මාතලි
චිත්තසෙනො ච ගන්ධබ්බො නළො රාජා ජනෙසභො.

උතුරුදිග අධිපතිවූ කුවෙරාධිපති වෙසමුණු රජතෙමේද ඒ දිග අනුශාසනාකෙරේ. යක්ෂයන්ට අධිපතිවූ, යසස් ඇත්තාවූ ඒ මහරජතෙමේද ඉන්ද්‍ර යන නම් ඇති මහත් බල ඇත්තාවූ සෘද්ධි ඇත්තාවූ කාන්ති හෝ ආනුභාව ඇත්තාවූ ශරීරවර්ණ ඇත්තාවූ යසස් ඇත්තාවූ ඔහුගේ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් අර්හත් භික්ෂුසමූහය දක්නට මහවනයට පැමිණියාහ. පෙරදිග ධෘත රාෂ්ට්‍ර වරම්රජද දකුණුදිග විරූඪ නම වරම්රජද පැසුලුදිග විරූපාක්ෂ නම් වරම්රජද උතුරුදිග කුවෙරාධිපති වෛශ්‍රවණ මහරජද මේ සිව්වරම් මහරජදරුවෝ හාත්පසින් සිව්දිග කිඹුල්වතට සමීපවූ මහවනයෙහි ඒ මහවනය අරබයා දිලිසෙමින් සිටියාහ.

10. ඒ වරම් මහරජුන්ගේ මායා ඇත්තාවූ වංචාකාරන්නාවූ කෛරාටිකවූ දාසයෝද මායාකාරවූ කුටෙණ්ඩුය, වෙටෙණ්ඩුය, විටුය යන මොව්හුද විටුඩතෙමේද ඔවුන් සමගම ආවාහුය. චන්දනය, කාමසෙට්ඨය, කින්නුඝණ්ඩුය, නිඝණ්ඩුය යන නම්ඇති දාසයෝද ආවාහුය. පනාදය, ඔපමඤ්ඤය, දිව්‍යරථාචාර්‍ය්‍යවූ මාතලී දෙව්පුත්‍රය. ගන්ධර්ව්වූ චිත්‍රය, සෙනය යන දෙදෙනද නලකාර නම් දෙව්රජද ජනෙසභ දෙව්පුත්‍රද ආවාහුය.

ආගු පඤ්චසිඛො චෙව තිම්බරූ සුරියවච්චසා
එතෙ චඤ්ඤෙ ච රාජානො ගන්ධබ්බා සහ රාජුභි
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං

11. අථාගු නාභසා නාගා වෙසාලා සහ තච්ඡකා
කම්බලස්සතරා ආගු පායාගා සහ ඤාතිභි.
යාමුනා ධතරට්ඨා ච ආගු නාගා යසස්සිනො
එරාවණො මහානාගො සොපාග සමිතිං වනං.
යෙ නාගරාජෙ සහසා හරන්ති
දිබ්බා දිජා පක්ඛී විසුද්ධචක්ඛූ,
වෙහාසයා තෙ වනමජ්ඣපත්තා
චිත්‍රා සුපණ්ණා ඉති තෙසං නාමං.
අභයං තදා නාගරාජානමාසි
සුපණ්ණතො ඛෙමමකාසි බුද්ධො,
සණ්හාහි වාචාහි උපව්හයන්තා
නාගා සුපණ්ණා සරණමගංසු බුද්ධං.

---

පඤ්චසිඛ දෙව්පුත්ද, තිම්බරූගන්ධර්වද, සුරියවච්චසා නම් දෙව්දුවද ආවාහුය. මේ ගන්ධර්වරජහුද අන්‍ය ගන්ධර්වයෝද තමන්ගේ රජුන් සමග සතුටුවෙමින් අභිත් භික්ෂුසමූහය දක්නට මහවනයට පැමිණියාහ.

11. ඉක්බිති නාභසනම් නාගයෝද විසාලීනාලෝවැසි නාගයෝද තච්ඡකනම් නාපිරිස සමග ආවෝය. කම්බල අස්සතර කුලදෙක්හි නාගයෝද, පායාගනම් නාලෝවැසි නාගයෝද නෑදෑයන් සමග ආවෝය. යමුනාගඟවැසි නාගයෝද ධෘතරාෂ්ට්‍ර කුලයෙහි උපන් නාගයෝද යසස් ඇත්තාවූ නාගයෝද ආවෝය. එරාවනනම් ඒ මහා නාගතෙමේද භික්ෂුසමාගමය දක්නට මහවනයට ආයේය. දිව්‍යආනුභාවඇති විජනම්වූ පිරිසිදු ඇස්ඇත්තාවූ යම් ගරුඩ පක්ෂීහු නාරජුන් වහා ගෙණයෙද්ද ඒ පක්ෂීහුද අහසින් මහවනයට පැමිණියාහුය, චිත්‍රය, සුපණ්ණය යනු ඔවුන්ගේ නාමයෝයි. එකල්හි නා රජුන්ට නිර්භයවිය, සර්වඥයන්වහන්සේ ගුරුළන් කෙරෙන් නිර්භය කෙළේය. නාගයෝද ගුරුළෝද මොලොක් වචනවලින් කැඳවනු ලබන්නෝ බුදුන් සරණගියෝ.

12. ජිතා වජිරහත්ථෙන සමුද්දං අසුරාසිතා
භාතරො වාසවස්සෙතෙ ඉද්ධිමන්තො යසස්සිනො.

කාලකඤ්ජා මහාභිංසා අසුරා දනවෙඝසා
වෙපචිත්ති සුචිත්ති ච පහාරොදො නමුචී සහ.

සතඤ්ච බලිපුත්තානං සබ්බෙ වෙරොචනාමකා
සන්නය්හිත්වා බලිං සෙනං රාහුභද්දමුපාගමුං
සමයො දනි භද්දන්තෙ භික්ඛූනං සමිතිං වනං.

13. අපො ච දෙවා පඨවී ච තෙජො වායො තදගමුං,,
වරුණා වාරුණා දෙවා සොමො ච යසසා සහ.

මෙත්තා කරුණා කායිකා ආගු දෙවා යසස්සිනො,,
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්ත වණ්ණිනො.

ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො,,
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

---

12. විදුරත් නම්ලද සක්දෙව්රජහුවිසින් ජයගන්නාලද මුහුදු ඇසුරුකරන්නාවූ සක්දෙව් රජහුගේ සහොදරවූ ඍද්ධි ඇති යසස් ඇති මේ අසුරයෝද මහත්බියකරුවූ කාලකඤ්ජනම් අසුරයෝද දනවෙඝසනම් අසුරයෝද වෙපචිත්තිය, සුචිත්තිය, පහාරුදය යන අසුරෙන්ද්‍රයෝද වසවත් මර සමග ආවෝය. සියල්ලෝ වෙරොචය යන නම්ඇති බලිනම් අසුරයාගේ පුත්‍රයෝ සියයක්ද බලසෙනග ගෙණ සැරසී රාහුඅසුරිඳු කරා පැමිණියෝය. ඔබට යහපතක් වේවා. දැන් අභිත් භික්ෂුසමූහය දක්නට මහවනයට ආමට සුදුසුකාලය වේ.

13. එකල්හි ආපොදෙවතාවෝද, පඨවිදෙවතාවෝද, තෙජොදෙවතාවෝද, වායොදෙවතාවෝද, වරුණය, වාරුණය, යන දෙවියෝද, සොමනම් දෙවිතෙමේද, යසනම් දෙවියන් සමග ආවාහුය. යසස් ඇත්තාවූ මෙත්තාකායිකය, කරුණාකායිකය, යන දෙවියෝද ආවාහුය. සියල්ලෝ නානා වර්ණවත්වූ, දසපරිදිවූ, ඍද්ධිඇත්තාවූ, කාන්තිහෝ ආනුභාව ඇත්තාවූ, වර්ණවත්වූ යසස්ඇත්තාවූ මේ දෙවසමූහයෝ දසදෙන සතුටුවෙමින් අර්හත් භික්ෂුසමූහය දක්නට මහවනයට ආවාහුය.

14. වෙණ්හු ච දෙවා සහලී ච අසමා ච දුවෙ යමා,,
චන්දස්සූපනිසා දෙවා චන්දමාගු පුරක්ඛත්වා.
සුරියස්සූපනිසා දෙවා සුරියමාගු පුරක්ඛත්වා,,
නක්ඛත්තානි පුරක්ඛත්වා ආගු මන්ද වලාහකා.
වසූනං වාසවො සෙට්ඨො සක්කොපාග පුරින්දදො,,
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනෙ,,
මොදමානා අභික්කාමුං භික්ඛුනං සමිතිං වනං.
15. අථාගු සහභූ දෙවා ජලමග්ගිසිඛාරිව,,
අරිට්ඨකා ච රොජා ච උම්මාපුප්ඵනිභාසිනො.
වරුණා සහධම්මා ච අච්චුතා ච අනෙජකා,,
සූලෙය්‍යරුචිරා ආගු ආගු වාසවනෙසිනො.
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො,
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

14. වෙණ්හුය, සහලීය, අසමාය, යමනම් දෙවියෝ දෙදෙනාය යන මොව්හුද සඳඇසුරුකරණ දෙවියෝ සඳපෙරටුකොටද ආවෝය. හිරුඇසුරුකරණ දෙවියෝ හිරු පෙරටුකොටද නැකැත් තරු ඇසුරුකරණ දෙවියෝ නක්‍ෂත්‍රයන් පෙරටුකොටද ආවාහුය. මන්ද වලාහකනම් දෙවියෝද ආහ. වසුදෙවියන්ට අධිපතිවූ වාසවනම්වූද පුරින්දදනම්වූ සක්දෙව්තෙමේත් ආයේය. සියල්ලෝම නොයෙක් ප්‍රභාමත්වූ ඍද්ධිඇත්තාවූ, ආනුභාව හෝ කාන්තිඇත්තාවූ ශරීරවර්ණ ඇත්තාවූ යසස්ඇත්තාවූ මේ දෙවසමූහයෝ දසදෙන දසපරිද්දක්ව සතුටුවෙමින් අර්හත් භික්‍ෂුසමූහය දක්නට මහවනයට ආවාහුය.

15. නැවත සහභූනම් දෙවියෝ ගිනිසිළුමෙන් දිලිසෙමින් ආවෝය අරිට්ඨක නම් දෙවියෝද, රොජනම් දෙවියෝද, දියබෙරලිය මල් පැහැයෙන් බබලන උම්මාපුප්පනම් දෙවියෝද ආවෝය. වරුණය සහධම්මය, අච්චුතය, අනෙජකය, සූලෙය්‍යය, රුචිරය යනදෙවියෝද ආවාහුය. වාසවනෙසිනම් දෙවියෝද ආවෝය. සියල්ලෝ දසපරිද්දෙකින් නොයෙක් ප්‍රභා ඇත්තාවූ ඍද්ධිඇත්තාවූ ආනුභාව ඇත්තාවූ ශරීරවර්ණ ඇත්තාවූ යසස්ඇත්තාවූ මේ දෙවසමූහයෝ දසදෙන සතුටුවෙමින් භික්‍ෂුසමූහය දක්නට මහවනයට ආහ.

16. සමානා මහාසමානා මානුසා මානුසුත්තමා,,
ඛිඩ්ඩාපදූසිකා ආගු ආගු මනො පදූසිකා
අථාගු හරයො දෙවා යෙ ච ලොහිතවාසිනො,,
පාරගා මහාපාරගා ආගු දෙවා යසස්සිනො
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො,,
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො,,
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

17. සුක්කාකරුම්භා අරුණා ආගු වෙඝනසා සහ,,
ඔදාතගය්හා පාමොක්ඛා ආගු දෙවා විචක්ඛණා.
සදාමත්තා හාරගජා මිස්සකා ච යසස්සිනො,,
ථනයං ආග පජ්ජුන්නො යො දිසා අභිවස්සති.
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

---

16. සමානය, මහසමානය, මානුසය, මානුසුත්තමය, ඛිඩ්ඩාපදූසිකාය, මනොපදූසිකාය යන දෙවියෝද ආවෝ. නැවත හරිනම් ඇති දෙවියෝද රත්තල් වැසි යම් දෙවිකෙනෙක් වෙත්නම් ඔව්හුද පාරගනම්වූද මහාපාරගනම්වූද යසස්ඇත්තාවූ දෙවියෝද ආහ. සියල්ලෝම නානා ප්‍රභාවත්වූ, දසපරිදිවූ, සෘඩිඇත්තාවූ, කාන්ති මහෝ ආනුභාව ඇත්තාවූ, ශරීරවර්ණ ඇත්තාවූ යසස් ඇත්තාවූ, මේ දශ දිව්‍යසමූහයෝ සතුටුවෙමින් අර්හත් භික්ෂූන් දක්නට මහවනයට පැමිණියාහුය.

17. සුක්කාය, කරුම්භාය; අරුණය යන දෙවියන් සමග වෙඝනසා නම් දෙවියෝද ආවාහුය. ඔදාතගය්හනම්වූද පාමොක්ඛ දෙවියෝද ආවාහුය. සදාමත්තනම් දෙවියෝද හාරගජනම් දෙවියෝද යසස්ඇත්තාවූ මිස්සකනම් දෙවියෝද ආවාහුය. යම් දෙවිකෙනෙක් දිගුත්හි වර්ෂාකෙරේද ඒ පජ්ජුන්න නම් දෙවිතෙමේද මේඝනාදකරමින් ආයේය. සියල්ලෝම නොයෙක් ප්‍රභාමත්වූ සෘඩිඇත්තාවූ ආනුභාව හෝ කාන්තිඇත්තාවූ මේ දසදෙවසමූහයෝ දසපරිද්දක්ව සතුටුවෙමින් අර්හත් භික්ෂුසමූහය දක්නට මහවනයට ආවාහුය.

18. ඛෙමියා තුසිතා යාමා කට්ඨකා ච යසස්සිනො,,
ලම්බීතකා ලාමසෙට්ඨා ජොතිනාමා ච 'ආසවා
නිම්මාණරතිනො ආගු අථාගු පරනිම්මිතා.
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො,,
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

19. සට්ඨෙතෙ දෙවනිකායා සබ්බෙ නානත්තවණ්ණිනො,,
නාමන්වයෙන ආගඤ්ඡුං යෙචඤ්ඤෙ සදිසා සහ.
පවුට්ඨජාතිං අඛිලං ඔඝතිණ්ණමනාසවං,,
දක්ඛෙමොඝතරං නාගං චන්දංව අසිතාතිගං.

20. සුබ්‍රහ්මා පරමත්තො ච පුත්තා ඉද්ධිමතො සහ,,
සනංකුමාරො තිස්සො ච සොපාග සමිතිං වනං.

---

18. ඛෙමිය නම් දෙවියෝය, තුසිතදෙවියෝය, යාමදෙවියෝය යසස්ඇත්තාවූ කට්ඨකනම් දෙවියෝය, ලම්බිතකනම් දෙවියෝය, ලාමසෙට්ඨනම් දෙවියෝය, ජෝතිනම් දෙවියෝය, ආසවනම් දෙවියෝය, නිම්මාණරතීනම් දෙවියෝය, යන මොව්හුද ආවාහුය. නැවත පරනිම්මිත වසවත්ති දෙවියෝද ආවාහුය. සියල්ලෝම නොයෙක් ප්‍රභාවත්වූ දසවැදෑරුම්වූ ඍද්ධිඇත්තාවූ ආනුභාව හෝ කාන්ති ඇත්තාවූ මේ දස දෙවසමූහයෝ සතුටුවෙමින් අර්හත් භික්ෂුසමූහය දක්නාට මහවනයට ආවාහුය.

19. මේ සැටක් දිව්‍යසමූහයෝ සියල්ලෝම නානාප්‍රභාමත්වූවෝම අනුගත නාමවශයෙන් හෙවත් තමන්ගේ නම්ගොත්වශයෙන් ආවාහුය. යම් අනික් දෙවතාවෝත් නම්ආදියෙන් සමානවෙත්නම් ඔවුන් සමග ආවාහුය. වැසනිමවනලද ජාතිඇත්තාවූ කෙලෙස්උල් රහිතවූ, චතුරොඝ තරණය කළාවූ ආශ්‍රවරහිතවූ ආර්‍ය්‍යසඞ්ඝයාද, ඔඝයන් තරණයකළාවූ ඍද්ධියෙන් අගතියට නොයන හෙයින් නාගනම්වූ ඉක්මගිය කෘෂ්ණභාවය ඇති පුන්සඳවැනිවූ බුදුන්ද දක්නෙමු.

20. ඍද්ධිඇත්තාවූ බුදුන්ගේ (ආයති) පුත්‍රවූ සුබ්‍රහ්මය, පරමත්තය යන බ්‍රහ්මයෝ බොහෝ පිරිස් සමඟව ආවාහුය, සනත්කුමාර නම් බ්‍රහ්ම පුත්‍රද ප්‍රසිද්ධවූ තිස්සනම් මහබ්‍රහ්මද අයින් භික්ෂුසමූහය දක්නට මහ වනයට ආයේය.

සහස්සං බ්‍රහ්මලොකානං මහාබ්‍රහ්මාභි'තිට්ඨති,,
උපපන්නො ජුතිමන්තො භිස්මාකායො යසස්සි සො.
දසෙත්ථ ඉස්සරා ආගු පච්චෙකවසවත්තිනො,,
තෙසඤ්ච මජ්ඣතො ආග හාරිතො පරිවාරිතො.

21. තෙ ච සබ්බෙ අභික්කන්තෙ ස ඉන්දෙ දෙවෙ සබ්‍රහ්මකෙ,
මාරසෙනා අභික්කාමි පස්ස කණ්හස්ස මන්දියං.
එථ ගණ්හථ බන්ධථ රාගෙන බද්ධමත්ථු වො,,
සමන්තා පරිවාරෙථ මා වො මුඤ්චිත්ථ කොචි නං.
ඉති තත්ථ මහාසෙනො කණ්හසෙනං අපෙසයි,,
පාණිනා ථලමාහච්ච සරං කත්වාන භෙරවං
යථා පාවුස්සකො මෙඝො ථනයන්තො සවිජ්ජුකො,,
තදා සො පච්චුදාවත්ති සංකුද්ධො අසයං වසි.

බඹලෝ දහසකින් මහබඹුන් දහසක්ද ආයේය. බඹලොව උපන්නාවූ ශොභාමත්වූ බිහිසුණුකයක් ඇත්තාවූ, යසස් ඇත්තාවූ බඹ රජෙක් සක්වලක්පාසා බඹුන් මැඩසිටී. මේ බඹපිරිසෙහි වෙන්වශයෙන් තමපිරිස් වසයෙහි පවත්වන්නාවූ අධිපතිවූ බ්‍රහ්මරාජ දස දෙනෙක් ආයෝය.

21. ඔවුන් මැද බඹුන්විසින් පිරිවරණලද හාරිත නම් බඹරජ තෙමේද ආයේය. මනොඥවූ නොහොන් මහවනයට පැමිණියාවූ සක් දෙව්රජ සහිතවූ හෝ ප්‍රධානකොට ඇත්තාවූ බඹුන් සහිතවූ නොහොත් හාරිත බඹරජ ප්‍රධානකොට ඇත්තාවූද ඒ සියලු දෙවියන් වෙතට මාරසෙනාවෝ පැමිණියාහුය. මාරයාගේ මූඪතාවය බලව. එව්. අල්වාගණිව්, මේසියලූ දෙව්මඬල රාගයෙන් බඳනාලද්දේවේවා. හාත්පසින් පිරිවරව්, තෙපි කිසිවෙක් ඒ දෙව්පිරිස නොමුදව්, මෙසේ ඒ සමාගමයෙහි වසවත්තෙමේ අත්ලෙන් පොළෝතලයට ගසා විදුලි සහිතවූ වර්ෂාකාලයෙහිවූ මෙඝයක් යම්සේ මෙඝශබ්දකෙරේද එසේ බිහිසුණු ශබ්දකොට මරසෙනාග ඒ දෙව්පිරිස්මැද යැවීය. එකල්හි ඒ වසවත්තෙමේ දෙව්පිරිස තමාවසඟකොට ගතනොහැක්කේ අතිශයින් කිපියේ ආපසු ගියේය.

22. තඤ්ච සබ්බං අභිඤ්ඤාය වවක්ඛිත්වාන චක්ඛුමා,,
තතො ආමන්තයී සත්ථා සාවකෙ සාසනෙ රතෙ.
මාරසෙනා අභික්කන්තා තෙ විජානාථ භික්ඛවො,,
තෙ ච ආතප්පමකරුං සුත්වා බුද්ධස්ස සාසනං.
විතරාගෙ හ'පක්කාමුං න සංලොමම්පි ඉඤ්ජයුං,
සබ්බෙ විජිතසඞ්ගාමා භයාතීතා යසස්සිනො,
මොදන්ති සහ භූතෙහි සාවකා තෙ ජනෙ සුතා'ති.

**මහාසමය සුත්තං නිට්ඨිතං විසතිකං,**

22. ඉක්බිත්තෙන් පැණැස්ඇත්තාවූ ශාස්තෘන්වහන්සේ ඒ සියලල මනාසේ දනවදරා වෙන්කොට සස්නෙහි ඇලුනාවූ සව්වන් ඇමතූසේක. මහණෙනි, මරසෙන්හු පැමිණියාහුය. ඒ මරුන් දැනිව්. ඒ භික්ෂූහුද බුදුන්ගේ පර්‍ය්‍යාප්තිශාසනයයි කියනලද ධර්‍මවචනය අසා කෙලෙස්තැවීමට වීර්‍ය්‍යකලෝ. පහවූ රාගඇති ආර්‍ය්‍යයන් කෙරෙන් මරසෙන්හු පහවගියෝ. ඒ විතරාගීන්ගේ ලොමයකුදු කම්පා නොකලාහුය, ජයගත් මාරයුද්ධඇති ඉක්මවූකලද බියඇති යසස්ඇත්තාවූ ජනයන් අතුරෙහි ප්‍රකටවූ ඒ සියලු බුදුසව්වෝ දෙවබ්‍රහ්ම ආදි ආර්‍ය්‍ය ශ්‍රාවකයන් සමග සතුටුවෙත්.

**විසිවන මහාසමය සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව**

**මෙතෙකින් නිමියේයි.**

## XXI. සක්කපඤ්හ සුත්තං.

1. එවමෙම සුතං. එකං සමයං භගවා මගධෙසු විහරති පාචීනතො රාජගහස්ස අම්බසණ්ඩා නාම බ්‍රාහ්මණගාමො, තස්සුත්තරතො වෙදියකෙ පබ්බතෙ ඉන්දසාලගුහායං. තෙනඛොපන සමයෙන සක්කස්ස දෙවානමින්දස්ස උස්සුක්කං උදපාදි භගවන්තං දස්සනාය. අථ ඛො සක්කස්ස දෙවානමින්දස්සඑතදහොසි, කහං නු ඛො භගවා එතරහි විහරති අරහං සම්ම සම්බුද්ධොති, අද්දසා ඛො සක්කො දෙවානමින්දො භගවන්තං මගධෙසු විහරන්තං පාචීනතො රාජගහස්ස අම්බසණ්ඩානාම බ්‍රාහ්මණගාමො, තස්සුත්තරතො වෙදියකෙ පබ්බතෙ ඉන්දසාලගුහායං. දිස්වා දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි, අයං මාරිස භගවා මගධෙසු විහරති පාචීනතො රාජගහස්ස අම්බසණ්ඩානාම බ්‍රාහ්මණගාමො, තස්සුත්තරතොවෙදියකෙ පබ්බතෙ ඉන්දසාලගුහාය

---

### සක්කපඤ්හ සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යා.

1. මාවිසින් මේසූත්‍රධර්මය මෙසේ අසනලදී. එක්කලෙක්හි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ, මගධ දනව්හි රජගහනුවරට පශ්චිම දිග් භාගයෙන් අම්බසණ්ඩානම් බමුණුගමෙක් ඇත. ඊට උතුරුදිගින් වෙදියකනම් පර්වතයෙහි ඉන්ද්‍රසාල ගුහායෙහි වැඩවාසයකරණසේක. ඒ කාලයෙහිදී ශක්‍රදෙවෙන්ද්‍රයාට භාග්‍යවතුන්වහන්සේ දක්නපිණිස ධාර්මික උත්සාහයක් පහලවිය. නැවත ශක්‍රදෙවෙන්ද්‍රයාට මෙබඳු සිතක්දවිය. කෙබඳු සිතක්දයත්, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන්වහන්සේ දැන් කොහිනම් වැඩවෙසේද යනුයි. මගධ දනව්හි රජගහනුවරට පශ්චිමදිග්භාගයෙන් අම්බසණ්ඩානම් බමුණුගමක් වේද, ඊට උතුරුදෙසවූ වෙදියකනම් පර්වතයෙහි ඉන්ද්‍රසාලගුහායෙහි වාසයකරන්නාවූ භාග්‍යවතුන්වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍රතෙම දුටුයේමය. දැක තව්තිසාවැසි දෙවියන්ට ආමන්ත්‍රණය කෙලේය (ආමන්ත්‍රණයකොට) නිදුකානෙනි, මේ භාග්‍යවතුන්වහන්සේමගධ දනව්හි රජගහනුවරට පැදුම්දිගින් අම්බසණ්ඩානම් බමුණුගමෙක් වේද, ඊට උතුරුදිගින්වූ වෙදියකනම්පර්වතයෙහි ඉන්ද්‍රසාල ගුහායෙහි වැඩවාසයකෙරේ.

යදිපන මාරිසා මයං තං භගවන්තං දස්සනාය උපසඞ්කමෙය්‍යාම අරහන්තං සම්මාසම්බුද්ධන්ති. එවං භද්දන්තවාති ඛො දෙවා තාවතිංසා සක්කස්ස දෙවානමින්දස්ස පච්චස්සොසුං.

2. අථ ඛො සක්කො දෙවානමින්දො පඤ්චසිඛං ගන්ධබ්බපුත්තං ආමන්තෙසි. අයං තාත පඤ්චසිඛ භගවා මගධෙසු විහරති. පාචීනතො රාජගහස්ස අම්බසණ්ඩානාම බ්‍රහ්මණගාමො, තස්සුත්තරතො වෙදියකෙ පබ්බතෙ ඉන්දසාලගුහායං. යදිපන තාත පඤ්චසිඛ මයං තං භගවන්තං දස්සනාය උපසඞ්කමෙය්‍යාම අරහන්තං සම්මාසම්බුද්ධන්ති. එවං භද්දන්තවාති ඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා බෙලුවපණ්ඩුවීණං ආදාය සක්කස්ස දෙවානමින්දස්ස අනුචරියං උපාගමි. අථ ඛො සක්කො දෙවානමින්දො දෙවෙහි තාවතිංසෙහි පරිවුතො පඤ්චසිඛෙන ගන්ධබ්බපුත්තෙන පුරක්ඛතො.

---

නිදුකාණෙනි, අපි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒභාග්‍යවතුන්වහන්සේ දූක්ම පිණිස එලඹෙන්නෙමුනම් යහපත් නොවේදැයි කිය. පින්වත් මහරජ එසේවේවායි තව්තිසාවැසි දෙවියෝ ශක්‍රදෙවෙන්ද්‍රයාගේ වචනය මුදුනෙන් පිළිගත්හ.

2. ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රතෙම පඤ්චසිඛනම් ගන්ධර්වපුත්‍රයාට අමන්ත්‍රණය කෙළේය. ( ආමන්ත්‍රණයකොට ) දරුව පඤ්චශිඛය මේ භාග්‍යවතුන්වහන්සේ මගධදනව්හි රජගහ නුවරට පැදුම් දෙසින් අම්බසණ්ඩා නම් බමුණු ගමෙක් ඇත. ඊට උතුරු දික්හිවූ වෙදියක නම් පර්වතයෙහි ඉන්ද්‍රසාලගුහායෙහි වැඩ වාසය කෙරේ. දරුව පඤ්චශිඛය අපි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවත්න්වහන්සේ දූක්ම පිණිස එලඹෙන්නෙමුනම් යහපත්නොවේදැයි කිය. පඤ්චශිඛ නම් ගන්ධර්වපුත්‍රතෙම පින්වත් මහරජ ඒ එසේවේවායි ශක්‍රදෙවෙන්ද්‍රයාගේ වචනය මුදුනෙන් පිළිගෙණ බෙලුව පණ්ඩුනම්වූ ( පැසුනු බෙලිගෙඩියක් මෙන් පඬුවන්වූ ) වීණාව ගෙණ ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ සමීපයට පැමිණියේය. නැවත ශක්‍ර දෙවෙන්ද්‍රතෙම තව්තිසාවැසි දෙවියන් විසින් පිරවරණ ලද්දේ පඤ්චශිඛ නම් ගන්ධර්ව පුත්‍රයා විසින් පෙරටු කරණලද්දේ.

සෙය්‍යථාපිනාම බලවාපුරිසො සම්මිඤ්ජිතංවා බාහං පසාරෙය්‍ය පසාරිතංවා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං දෙවෙසු තාවතිංසෙසු අන්තරහිතො මගධෙසු පාචීනතො රාජගහස්ස අම්බසණ්ඩා නාම බ්‍රාහ්මණගාමො තස්සුත්තරතො වෙදියකෙ පබ්බතෙ පච්චුට්ඨාසි.

3. තෙන ඛො පන සමයෙන වෙදියකො පබ්බතො අතිරිව ඔභාසජාතො හොති අම්බසණ්ඩාච බ්‍රාහ්මණගාමො, යථාතං දෙවානං දෙවානුභාවෙන. අපිස්සුදං පරිතො ගාමෙසු මනුස්සා එවමාහංසු, ආදිත්තස්සුනාමජ්ජ වෙදියකො පබ්බතො, ඣායිතස්සු නාමජ්ජ වෙදියකො පබ්බතො, ජලිතස්සු නාමජ්ජ වෙදියකො පබ්බතො, කිංසුනාමජ්ජ වෙදියකො පබ්බතො අතිරිව ඔභාසජාතො අම්බසණ්ඩාච බ්‍රාහ්මණගාමොති සංවිග්ගා ලොමහට්ඨජාතා අහෙසුං.

4. අථ ඛො සක්කො දෙවානමින්දො පඤ්චසිඛං ගන්ධබ්බපුත්තං ආමන්තෙසි. දුරුපසඞ්කමා ඛො තාත පඤ්චසිඛ තථාගතා මාදිසෙන ඣායී ඣානරතා තදනන්තරං පටිසල්ලීනා.

---

ශක්තිමත් පුරුෂයෙක් හකුළුවනලද අතක් යම්සේ දිගහරින්නේද දිගහරිනලද අතක් හෝ යම්සේ හකුළුවන්නේද එපරිද්දෙන් තව්තිසාවැසි දෙවියන් කෙරෙහි අතුරු දහන්වූයේ මගධදනව්හි රජගහ නුවරට පැදුම් දෙසින් අම්බසණ්ඩා නම් බමුණු ගමෙක් වේද ඊට උතුරු දිගින්වූ වෙදියකනම් පර්වතයෙහි පහලවිය.

3. එකල්හිවනාහි වෙදියකනම් පර්වතයද අම්බසණ්ඩානම්වූ බමුණුගමද වැඩියක් හටගත් ආලොක ඇත්තේමවි. දෙවියන්ගේ දෙවානුභාවයෙන් ඇතිවූ ආලොකය යම්සේනම් එසේයි. එකල හාත්පස ගම්වැසි මනුෂ්‍යයෝ මෙසේ කීහු. වෙදියකනම් පර්වතය අද ඉතාබබලන්නේය, වෙදියකනම් පර්වතය අද ප්‍රකාශයෙන් දල්ලුනේවේ, වෙදියකනම්පර්වතය අද දිලිසුනේවේ, කුමක් සඳහා අද වෙදියකපර්වතයහා අම්බසණ්ඩානම් බමුණුගමත් අධිකව හටගත් ආලොක ඇත්තක් වූයේදැයි සංවෙගයට පැමිණියාහු හටගත් රොමොද්ගම ඇත්තෝ වූහ.

4. ඉක්බින්තෙන් ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ පඤ්චසිඛනම් ගන්ධර්වපුත්‍රයා ඇමතුයේය. දරුව පඤ්චසිඛය ධ්‍යානකරණ සුලුවූ ධ්‍යානයෙහි ඇලුනාවූ ඊට අනතුරුව ප්‍රතිසංලීනවූ හෙවත් එකඟකල සිත්ඇත්තාවූ තථාගතයන්වහන්සේලා මාවැන්නෙක්විසින් පර්යුපාසනාය කිරීමට දුකසේ එළඹියහැක්කෝ වෙත්.

යදිපන තාත පඤ්චසිඛ භගවන්තං පඨමං පසාදෙය්‍යාසි. තයා තාත පඨමං පසාදිතං පච්ඡාමයං තං භගවන්තං දස්සනාය උපසංකමෙය්‍යාම අරහන්තං සම්මා සම්බුද්ධන්ති. එවං භද්දන්තවාති ඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා බෙලුවපණ්ඩුවීණං ආදාය යෙනඉන්දසාලගුහා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එත්තාවතා මෙ භගවා නෙව අතිදූරෙ භවිස්සති. න අච්චා සන්නෙ සද්දඤ්ච ඛො සොස්සතීති. එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො බෙලුවපණ්ඩුවීණං අස්සාවෙසි. ඉමාච ගාථා අභාසි බුද්ධූපසංහිතා ධම්මූපසංහිතා අරහන්තූපසංහිතා කාමූපසංහිතා.

5. වන්දෙ තෙ පිතරං භද්දෙ තිම්බරුං සුරියවච්චසෙ
යෙන ජාතාසි කල්‍යාණී ආනන්දජනනී මම.

---

දරුව පඤ්චශිඛය නුඹ පළමුකොට භාග්‍යවතුන්වහන්සේ සතුටු කරන්නෙහිද හෙවත් මට අවකාශකරවාදෙන්නෙහිද, දරුව තා විසින් පළමුකොට චිත්තාරාධනාය කරණලද්දාවූ අභිත් සම්‍යක් සම්බුඬවූ ඒ භාග්‍යවතුන්වහන්සේ වෙත පසුව අපි දක්මපිණිස එලඹෙන්නෙමු. පින්වත් මහරජ එසේ වේවායි කියා පඤ්චශිඛනම් ගඬර්‍වපුත්‍රතෙමේ ශක්‍රදෙවෙන්ද්‍රයාගේ වචනය සතුටින් පිළිගෙණ බෙලුවපණ්ඩුවීණාව ගෙණ ඉන්ද්‍රසාල ගුහාව යම්තැනෙක්හිනම් එතනට එලඹියේය. එලඹී මෙපමණකින් භාග්‍යවතුන්වහන්සේ මට ඉතා දුරත් නොවන්නේමය. ඉතා ආසන්නත් නොවන්නේය. ශබ්දයත් ඇසෙන්නේයයි එකත්පසෙක සිටියේය. එකත්පස්ව සිටියාවූ පඤ්චශිඛ ගඬර්‍වපුත්‍රතෙමේ බෙලුවපණ්ඩුවීණාව ශබ්දකොළේය. බුදුන් නිශ්‍රයකොට පැවැත්තාවූද, ධර්‍මය නිශ්‍රයකොට පැවැත්තාවූද, රහතුන් නිශ්‍රයකොට පැවැත්තාවූද, කාමයන් නිශ්‍රයකොට පැවැත්තාවූද මේ මතු ප්‍රකාශකරණ ගාථාවන්ද කීයේය.

5. තරුණ සූර්‍යමණ්ඩලයක්වැනි ශරීරයක් ඇත්තාවූ සියලු අවයවයන්ගෙන් සොභමානවූ මට සතුටු උපදවන්නාවූ එම්බා සුන්දරිය තී යමක් කරණකොටගෙණ උපන්නෙහිනම් තිම්බරුනම්වූ ඒ තීගේ පියා වඳිමි.

වාතොව සෙදනංකන්තො පානීයංව පිපාසිනො
අඞ්ගිරසි පියාමෙසි ධමෙමා අරහතාම්ව
ආතුරසෙසව භෙසජජං භොජනංව ජිඝචඡතො
පරිනිබ්බාපය හදෙද ජලනතමිව වාරිනා.

සීතොදකිං පොකඛරණිං යුතං කිඤජකඛරෙණුනා,
නාගො ඝම්මාභිතතෙතාව ඔගහෙතෙ ථනූදරං.

අචචඞ්කුසොව නාගොව ජිතමෙම තුදනත තොමරං,
කාරණං නපපජානාමි සමමතෙතා ලකඛණූරුයා.

තයි ගඨිත චිතෙතාස්මි චිතතං විපරිණාමිතං,
පටිගනතුං නසකෙකාමි වඞකඝසෙතා ච අම්බුජො.

වාමූරු සජමං හදෙද සජමං මනද ලොචනෙ,
පලිස්සජමං කල්‍යාණි එතමෙම අභිපතථිතං.

---

හටගත් ඩාහඇත්තවුන්ට කමනීයවූ වාතයක් මෙන්ද පවස්ඇත්තෙකුට ඒ නැතිකරගැණීම පිණිසවූ පැනක්මෙන්ද රහතුන්ට නවලොකොත්තරධර්මයමෙන්ද රොගාතුරයෙකුට බෙහෙතක්මෙන්ද බඩසාඇත්තෙකුට භොජනයක්මෙන්ද එම්බා ශරීරකාන්තිඇත්තිය තී මට ප්‍රියවෙහිය. එම්බා සුන්දරිය දිලිසෙන ගින්නක් ජලයෙන් නිවන්නාක්මෙන් (මාගේ රාගපරිඩාහ) නිර්වාපනය කරව. ග්‍රීෂ්මයෙන් නැවූනාවූ හස්තියෙක් පද්ම කෙශරවලින් යුක්තවූ සිහිල් දිය ඇත්තාවූ පොකුණකට බසින්නාක් මෙන් (මම) තීගේ පයොධරවය මැදට හා උදරයට බසින්නෙමි. මාවිසින් කණමුල විදින කටුව හා පාවිදින කටුව දිනනලද්දේයයි ඉක්මවනලද අකුස්ස ඇති හස්තියෙක් වදදපියෙන් කරුණු නොදන්නාක්මෙන් ලක්‍ෂණ සම්පන්න ඌරුයුගලයෙන් මත්කරණලද්දාවූ මම රාගවිරාග කරුණක් නොදනිමි. තීකෙරෙහි පිළිබඳ සිත්ඇත්තෙක්මි. හිත පෙර එන්නේය. බිලිය ගිල්ලාවූ මත්ස්‍යයෙක් මෙන් නවතින්ට නොහැක්කෙමි. මනොඥ කලවාදෙකක් ඇත්තාවූ සුන්දරිය මා වැළඳගණුව. මද බැල්මෙන් බලන ඇස්ඇත්තිය මා වැළඳගණුව. එම්බා කල්‍යාණිය, මා හාත්පසින් වැළඳගණුව. මාවිසින් මෙය නිතර ප්‍රාර්ථනා කරණලද්දේය.

අප්පකො වත මෙ සන්තො කාමො වෙල්ලිතකෙසියා,
අනෙකභාගො සම්පාදි අරහන්තෙව දක්ඛිණා.
යං මෙ අත්ථි කතං පුඤ්ඤං අරහන්තෙසු තාදිසු,
තමෙම සබ්බඞ්ගකල්‍යාණි තයා සද්ධිං විපච්චතං.
යමෙම අත්ථි කතං පුඤ්ඤං අස්මිං පුථවි මණ්ඩලෙ,
තමෙම සබ්බඞ්ග කල්‍යාණි තයා සද්ධිං විපච්චතං.
සක්‍ය පුත්තොව ඣානෙන එකොදී නිපකො සතො,
අමතං මුනි ජිගිංසානො තමහං සුරියවච්චසෙ.
යථාපි මුනි නන්දෙය්‍ය පත්වා සම්බොධි මුත්තමං,
එවං නන්දෙය්‍ය කල්‍යාණි මිස්සීභාවඞ්ගතො තයා.
සක්කොච මෙ වරං දජ්ජා තාවතිංසානමිස්සරො,
තාහං භද්දෙ වරෙය්‍යාහෙ එවං කාමො දළ්හො මම.
සාලං වනං චිරං ඵුල්ලං පිතරං තෙසුමෙධසෙ,
වන්දමානො නමස්සාමි යස්සසෙතාදිසී පජා.

එකාන්තයෙන් මාගේ ස්වල්පවූම කාමය කුටිල කෙස්ඇති තීසම්බද්ධවූයේ අහිත් කෙනෙකුට දෙනලද දක්ෂිණාවක් මෙන් නොයෙක් කොටස් ඇතිවූයේය. මාවිසින් එබඳු රහතුන් විෂයෙහි කරණලද යම් පුණ්‍යයක් ඇත්තේද සර්වාඞ්ග කල්‍යාණිය මාගේ ඒ පිණ තීසමගම විපාකදේවා. සියලු අවයවයන්හි සුන්දර ස්වභාව ඇත්තිය මේ පෘථිවිමණ්ඩලයෙහි මාවිසින් කරණලද යම් පුණ්‍යයක් ඇත්තේද මාගේ ඒ සියලු පුණ්‍යය තීසමගම විපාකදේවා. ධ්‍යානයෙන් එකඟබවට පැමිණියාවූ ප්‍රඥාවෙන් හා ස්මෘතියෙන් යුක්තවූ ශාක්‍ය පුත්‍රවූ සර්වඥමුනිතෙමේ අමෘතමහානිර්වාණය සොයන්නාක් මෙන් තරුණ සූර්‍ය්‍යමණ්ඩලයක් වැනි ශරීරඇත්තිය මම තී සොයමින් හැසිරෙමි. බුඩමුනිතෙමේ උතුම්වූ සර්වඥතාඥානයට පැමිණ යම්සේ සතුටුවන්නේද, සුන්දරිය තිහා සමාගමයට පැමිණියාවූ මමද එපරිද්දෙන් සතුටුවන්නෙමි. තාවිතිසාවැසි දෙවියන්ට අධිපතිවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ දිව්‍යරාජ්‍යය ගණුවයි මට වරයක් දෙන්නේද, එම්බා සුන්දරිය, මම එය හැර තී පතන්නෙමි. මාගේ කාමය මෙසේ මහත්වේ. යමෙකුට මෙබඳුවූ දුවක් වීද, සුන්දර ප්‍රඥාඇත්තිය බොහෝ කලකින් මල්පිපියාවූ සල්වනයක් වැනි තීගේ ඒ පියාට වඳිමින් නමස්කාර කරන්නෙමි.

6. එවං වුත්තෙ භගවා පඤ්චසිඛං ගන්ධබ්බපුත්තං එතදවොච. සංසන්දති ඛො පන තෙ පඤ්චසිඛ තන්තිස්සරො ගීතස්සරෙන ගීතස්සරොච තන්තිස්සරෙන. නච පන තෙ පඤ්චසිඛ තන්තිස්සරො අතිවත්තති ගීතස්සරං. ගීතස්සරොවා තන්තිස්සරං. කදා සංයූළ්හා පන තෙ පඤ්චසිඛ ඉමා ගාථා බුද්ධූපසංහිතා ධම්මූපසංහිතා අරහන්තූපසංහිතා කාමූපසංහිතාති. එකමිදං භන්තෙ සමයං භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධමූලෙ පඨමාභිසම්බුද්ධො. තෙන ඛො පනාහං භන්තෙ සමයෙන භද්දානාම සුරියවච්චසා තිම්බරුනො ගන්ධබ්බරඤ්ඤො ධීතා තමභිකඞ්ඛාමි. සා ඛො පන භන්තෙ භගිනි පරකාමිනි හොති. සිඛණ්ඩිනාම මාතලිස්ස සඞ්ගාහකස්ස පුත්තො තම භිකඞ්ඛති. යතො ඛො අහං භන්තෙ තම්භගිනිං නාලත්ථං කෙනචි පරියායෙන අථාහං බෙලුවපණ්ඩුවීණං ආදාය යෙන තිම්බරුනො ගන්ධබ්බරඤ්ඤො නිවෙසනං තෙනුපසඞ්කමිං.

---

6. මෙසේ සැලකළකල්හි භාග්‍යවතුන්වහන්සේ පඤ්චශිඛ ගන්ධර්වපුත්‍රයාට මේ වදාළේය. පඤ්චශිඛය තාගේ වීණාතන්ත්‍රීස්වරය ගීතස්වරය සමගද ගීතස්වරය වීණාතන්ත්‍රීස්වරය සමගද සංසන්දනය වේමය. පඤ්චශිඛය තාගේ වීණාතන්ත්‍රීස්වරයතෙමේ ගීතස්වරය ඉක්මවා නාද නොකෙරේද, ගීතස්වරය හෝ තන්ත්‍රීස්වරය ඉක්මවා නාද නොකෙරේද, පඤ්චශිඛය තාගේ මේ බුදුන් ඇසුරුකොට පැවැත්තාවූ හෝ දහම් ඇසුරුකොට පැවැත්තාවූ හෝ රහතුන් ඇසුරුකොට පැවැත්තාවූ හෝ කාමයන් ඇසුරුකොට පැවැත්තාවූ හෝ ගාථාවෝ කවරකලෙක්හි ගොතනලද්දෝද ? ස්වාමිනි, මෙහි එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙල්දනව්හි නෙරඤ්ජරාගංතෙර අජපල් නුගරුකමුල බුදුබවට පැමිණි පළමුකල් ඇත්තේම වැඩවාසය කරණසේක. ස්වාමීන්වහන්ස, එකලයෙහිදී තරුණ සූර්‍ය්‍යමණ්ඩලයක් වැනි ශරීරයක් ඇත්තාවූ භද්‍රානම්වූ තිම්බරු ගන්ධර්වරජහුගේ දුවක්වීද, මම ඈ කැමැත්තෙමි. ස්වාමීන්වහන්ස, ඒ දෙව්දූතොමො අන්‍යයන් කැමතිවන්නියක් වේ. මාතලි සඞ්ග්‍රාහකයාගේ සිඛණ්ඩිනම්වූ පුත්‍රතෙමේ ඈ කැමතිවේ. ස්වාමීන්වහන්ස, යම්හෙයකින් මම ඒදෙව්දුව කිසියම් ක්‍රමයෙකින් නොලද්දෙම්ද, නැවත මම බෙලුවපණ්ඩුවීණාව ගෙණ තිම්බරුනම් ගන්ධර්වරජහුගේ නිවෙස යම්තැනෙක්හිද එතනට එළඹියෙමි.

උපසඞ්කමිත්වා බෙලුවපණ්ඩුවීණං අස්සාවෙසිං ඉමා ච ගාථා අභාසිං, බුද්ධූපසංහිතා ධම්මූපසංහිතා අරහන්තූපසංහිතා කාමූපසංහිතා.

7. වන්දෙ තෙ පිතරං භද්දෙ තිම්බරුං සුරියවච්චසෙ,
යෙන ජාතාසි කල්‍යාණී ආනන්දජනනී මම.
—පෙ—
සාලංව නං චිරං ඵුල්ලං පිතරා තෙ සුමෙධසෙ,
වන්දමානො නමස්සාමි යස්සාසතාදිසී පජා'ති.

එවං වුත්තෙ භන්තෙ භද්දා සුරියවච්චසා මං එතදවොච. නාබො මෙ මාරිස සො භගවා සම්මුඛා දිට්ඨො, අපිච සුතො යෙව මෙ සො භගවා දෙවානං තාවතිංසානං සුධම්මායං සභායං උපනච්චන්තියා, යතො බො ත්වං මාරිස තං භගවන්තං කිත්තෙසි හොතු නො අජ්ජසමාගමොති. සො යෙවනො භන්තෙ තස්සා භගිනියා සද්ධිං සමාගමො අහොසි. නච දානි තතො පච්ඡාති.

---

එලබ බෙලුවපණ්ඩුවීණාව ශබ්දකෙළෙමි. බුදුන්ඇසුරුකොට පැවැත්තාවූද දහම් ඇසුරුකොට පැවැත්තාවූද රහතුන් ඇසුරුකොට පැවැත්තාවූද කාමයඇසුරුකොට පැවැත්තාවූද මේ මතු ප්‍රකාශකරණලද ගාථාවන්ද කීයෙමි.

7. තරුණ සූර්‍ය්‍යමණ්ඩලයක්වැනි ශරීරයක් ඇත්තාවූ සියලු අවයවයන්ගෙන් ශොභමානවූ මට සතුටු උපදවන්නාවූ එම්බා සුන්දරිය නි යමෙක් කරණකොටගෙණ උපන්නෙහිනම් තිම්බරුනම්වූ ඒ තීගේ පියා වදිමි, මේ ගාථාවන්හි භාවය පෙරමෙන් දතයුතු. ස්වාමීන් වහන්ස,මෙසේකීකල්හි තරුණ සූර්‍ය්‍යමණ්ඩලයක් වැනි ශරීරකාන්ති ඇත්තාවූ භද්‍රාතොමෝ මට මෙසේ කීවාය, කෙසේද, නිදුකානෙනි මාවිසින් ඒ භාග්‍යවතුන්වහන්සේ ඉදිරියෙන් නොදක්නාලද්දේමය. එතකුදුවුවත් දෙවියන්ගේ සුධර්‍මානම්සභාවෙහි නටන්නාවූ මාවිසින් ගෙවත් නටද්දි ඒ භාග්‍යවතුන්වහන්සේ අසනලද්දේමය. නිදුකානෙනි, යම් හෙයකින් ඔබ ඒ භාග්‍යවතුන්වහන්සේ කීර්තනය කෙරෙහිනම් අද අපගේ එකතුවීම වේවායි කීයායි. ස්වාමීන්වහන්ස, ඒ දෙව්දුව සමග අපගේ ඒම සමාගමවූයේය. ඉන්පසු දත් නැත්තේයයි සැලකෙළේය.

8. අථ ඛො සක්කස්ස දෙවානමින්දස්ස එතදහොසි. පටිසම්මොදති ඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො භගවතා. භගවා ච පඤ්චසිඛෙනාති. අථ ඛො සක්කො දෙවානමින්දො පඤ්චසිඛං ගන්ධබ්බපුත්තං ආමන්තෙසි. අභිවාදෙහි මෙ ත්වං තාත පඤ්චසිඛ භගවන්තං, සක්කො භන්තෙ දෙවානමින්දො සාමච්චො සපරිජනො භගවතො පාදෙ සිරසා වන්දතීති. එවං භද්දන්තවාති ඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා භගවන්තං අභිවාදෙසි. සක්කො භන්තෙ දෙවානමින්දො සාමච්චො සපරිජනො භගවතො පාදෙ සිරසා වන්දතීති. සුඛී හොතු පඤ්චසිඛ සක්කො දෙවානමින්දො සාමච්චො සපරිජනො, සුඛකාමා හි දෙවමනුස්සා අසුරානාගා ගන්ධබ්බා. යෙච'ඤ්ඤෙ සන්ති පුථුකායාති, එවඤ්චපන තථාගතා එවරූපෙ මහෙසක්ඛෙ අභිවදන්ති.

---

8. ඉක්බිත්තෙන් දෙවෙන්ද්‍රවූ ශක්‍රයාට මෙබඳු සිතක් වීය. කෙසේද, පඤ්චශිඛ ගන්ධර්වපුත්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේ සමගද භාග්‍යවතුන්වහන්සේ පඤ්චශිඛ ගන්ධර්වපුත්‍රයා සමගද සතුටු පිළිසතුටු වේමය යනුයි. ඉක්බිත්තෙන් ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ පඤ්චශිඛනම් ගන්ධර්වපුත්‍රයාට දැන්නුයේය. මාගේ දරුවූ පඤ්චශිඛය තෝ භාග්‍යවතුන්වහන්සේ අභිවාදනයකරව. කෙසේද, ස්වාමිනි, අමාත්‍යයන් සහිතවූ පිරිවර ජනයන් සහිතවූශක්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදයන් මුදුනෙන් වඳීය කියායි. පින්වත් මහරජ එසේ වේවායි පඤ්චශිඛ ගන්ධර්වපුත්‍රතෙමේ ශක්‍රදෙවෙන්ද්‍රයාගේ වචනය සතුටින් පිළිගෙණ භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කෙළේය. කෙසේද, ස්වාමීන්වහන්ස, අමාත්‍යයන් සහිතවූ පරිජනයා සහිතවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදයන් මුදුනෙන් වඳීය කියායි. පඤ්චශිඛය ඇමතියන් සහිතවූ පරිජනයා සහිතවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ සැපඇත්තෙක් වේවා. දෙවියෝද මනුෂ්‍යයෝද අසුරයෝද නාගයෝද ගන්ධර්වයෝද මෙයින් අන්‍යවූ බොහෝ සත්ව සමූහයෝ වෙත්නම් ඔවුහුද සැපකැමැත්තෝමයයි වදාළේය. මෙසේද තථාගතවරයෝ මෙබඳු මහෙශාක්‍යයන්ට අභිවාදනය සම්ප්‍රතිච්ඡන වචනයෙන් වදරත්.

අභිවාදිතො සක්කො දෙවානමින්දො භගවතො ඉන්දසාලගුහං පවිසිත්වා, භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. දෙවාපි තාවතිංසා ඉන්දසාලගුහං පවිසිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. පඤ්චසිඛොපි ගන්ධබ්බපුත්තො ඉන්දසාලගුහං පවිසිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි.

9. තෙන ඛො පන සමයෙන ඉන්දසාලගුහා විසමාසන්ති සමාසමපාදි, සම්බාධාසන්ති උරුන්දා සම්පාදි අන්ධකාර ගුහායං ආලොකො උදපාදි. යථා තං දෙවානං දෙවානුභාවෙන අථ ඛො භගවා සක්කං දෙවානමින්දං එතදවොච. අච්ඡරියං ඉදං ආයස්මතො කොසියස්ස අබ්භුතං ඉදං ආයස්මතො කොසියස්ස තාව බහුකිච්චස්ස බහුකරණීයස්ස. යදිදං ඉධාගමනන්ති. චිරපටිකාහං භන්තෙ භගවන්තං දස්සනාය උපසඞ්කමිතුකාමො. අපිච දෙවානං තාවතිංසානං කෙහිචි කෙහිචි කිච්චකරණීයෙහි ව්‍යාවටො එවාහං නාසක්ඛිං භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං.

---

මෙසේ වදාරණලද්දවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ ඉන්ද්‍රශාල ගුහාවට ප්‍රවිෂ්ටව භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. තව්තිසාවැසි දෙවියෝද ඉන්ද්‍රශාල ගුහාවට ප්‍රවෙශව භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ එකත්පසෙක සිටියාහුය. පඤ්චශිඛ ගන්ධර්වපුත්‍රතෙමේද ඉන්ද්‍රශාල ගුහාවට ඇතුල්ව භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පස්ව සිටියේය.

9. එකාලයෙහිදී ඉන්ද්‍රශාල ගුහාතොමෝ විසමවන්නී සමවූවාය. සම්බාධවන්නී මහත්විචිත්‍රවූවාය. අන්ධකාරගුහායෙහි ආලොකය පහලවීය. එය දෙවියන්ගේ දෙවානුභාවයෙන්වූ ආලොකය යම්සේ නම් එසේයි. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ශක්‍ර දෙවෙන්ද්‍රයාට මෙයවදාලේය. ආයුෂ්මත්ශක්‍රදෙවෙන්ද්‍රයාපිළිබඳවූමෙයඅසිරියි. අයුෂ්මත්ශක්‍රදෙවෙන්ද්‍රයාපිළිබඳවූ මෙයඅද්භූතයි. කුමක්දයත්, එපමණ කෘත්‍ය ඇත්තාවූ එපමණ කටයුතු ඇත්තාවූ තොපගේ යම් බඳුවූ මේ මෙහි පැමිණීමක් ඇත්නම් එයයි. ස්වාමීන්වහන්ස මම බොහෝ කලක පටන් භාග්‍යවතුන්ගේ දශීනය පිණිස භාග්‍යවතුන්වහන්සේ වෙතඑළඹෙනු කැමැත්තෙමි. නුමුත් තව්තිසාවැසි දෙවියන්ගේ යම් කිසි කටයුතු කෘත්‍යයන්ගෙන් ව්‍යාවෘතවූයෙමි. මෙසේ දශීනය පිණිස භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹෙන්ට නොහැකිවූයෙමි.

එකමිදං භන්තෙ සමයං භගවා සාවත්ථියං විහරති සලලාගාරකෙ. අථ ඛොහං භන්තෙ සාවත්ථිං අගමාසිං භගවන්තං දස්සනාය.

10. තෙන ඛො පන භන්තෙ සමයෙන භගවා අඤ්ඤතරෙන සමාධිනා නිසින්නො හොති. භුඤ්ජති ච නාම වෙස්සවණස්ස පරිචාරිකා භගවන්තං පච්චුපට්ඨිතා හොති පඤ්ජලිකා නමස්සමානා. අථ ඛොහං භන්තෙ භුඤ්ජතිං එතදවොචං අභිවාදෙහි ත්වං මෙ භගිනි භගවන්තං සක්කො භන්තෙ දෙවානමින්දො සාමච්චො සපරිජනො භගවතො පාදෙ සිරසා වන්දතීති. එවං වුත්තෙ භුඤ්ජති මං එතදවොච. අකාලො ඛො මාරිස භගවන්තං දස්සනාය පටිසල්ලානො භගවාති. තෙනහි භගිනි යදා භගවා තම්හා සමාධිම්හා වුට්ඨිතො හොති. අථ මම වචනෙන භගවන්තං අභිවාදෙහි. සක්කො භන්තෙ දෙවානමින්දො සාමච්චො සපරිජනො භගවතො පාදෙ සිරසා වන්දතීති.

---

ස්වාමින්වහන්ස මෙහි එක් කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සලලාගාරනම් ගඳ කිළියෙහි වැඩ වාසයකරණසේක. ස්වාමිනි එකල්හි මෙ භාග්‍යවතුන්වහන්යේ දැකිම පිණිස සැවැත් නුවරට පැමිණියෙමි.

10. ස්වාමිනි එකල්හි භාග්‍යවතුන් වහන්සේ එක්තරා සමාධියකින් යුක්තව වැඩ උන්සේක. වෛශ්‍රවණයාගේ භුඤ්ජතිනම්වූ පරිචාරිකා තොමෝ දෙහොත් මුදුනෙහි තබා වඳිමින් භාග්‍යවතුන් වහන්සේට උපස්ථානය පිණිස එළඹ සිටියාය. ස්වාමිනි මම එකල්හි භුඤ්ජතිනම් පරිචාරිකාවට මෙය කීවෙමි. මාගේ නැගනියෙනි තිභාග්‍යවතුන්වහන්සේ වඳුව, කෙසේද ස්වාමින්වහන්ස ඇමතියන් සහිතවූ පිරිවරජනයා සහිතවූ ශක්‍රදෙවේන්‍ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් මුදුනෙන් වඳීය කියායි. මෙසේකීකල්හි භුජතීනම් පරිචාරිකා තොමෝ මට මෙසේකිය. නිදුකානෙනි භාග්‍යවතුන් වහන්සේ දක්මට කල්නොවන්නේමය. භාග්‍යවතුන් වහන්සේ පලසමවතින් යුක්තය යනුයි. නැගනිය එසේනම් යම් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ ඒ සමාධියෙන් නැගිට වදාළේ වේද, එකල්හි මාගේ වචනයෙන් භාග්‍යවතුන්වහන්සේ අභිවාදනය කරව. කෙසේද, ස්වාමිනි ඇමතියන් සහිතවූ පිරිවර ජනයා සහිතවූ ශක්‍ර දෙවේන්‍ද්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදයන් මුදුනෙන් වඳිය කියායි;

කච්චි මෙ සා භන්තෙ භගිනී භගවන්තං අභිවාදෙසි, සරති භගවා තස්සා භගිනියා වචනන්ති, අභිවාදෙසි මං සා දෙවානමින්ද භගිනී සරාමහං තස්සා භගිනියා වචනං. අපිචාහං ආයස්මතොච නෙමි සද්දෙන තම්හා සමාධිම්හා වුට්ඨිතොති.

11. යෙ තෙ භන්තෙ දෙවා අම්හෙහි පඨමතරං තාවතිංසකායං උපපන්නා තෙසං මෙ සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. යදා, තථාගතා ලොකෙ උප්පජ්ජන්ති. අරහන්තො සම්මා සම්බුද්ධා. දිබ්බා කායා පරිපූරෙන්ති. හායන්ති අසුරකායාති. තං මෙ ඉදං භන්තෙ සක්ඛි දිට්ඨං යතො තථාගතො ලොකෙ උප්පන්නො අරහං සම්මා සම්බුද්ධො දිබ්බා කායා පරිපූරෙන්ති, හායන්ති. අසුරකායාති. ඉධෙව භන්තෙ කපිලවත්ථුස්මිං ගොපිකා නාම සක්‍යධීතා අහොසි. බුද්ධෙ පසන්නා ධම්මෙ පසන්නා සංඝෙ පසන්නා සීලෙසු පරිපූරකාරිනී. සා ඉත්ථිචිත්තං විරාජෙත්වා පුරිසචිත්තං භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා.

---

ස්වාමීන්වහන්ස මාගේ නැගනීවූ ඕතොමෝ කිමෙක භාග්‍යවතුන් වහන්සේ අභිවාදනය කෙළේනම් භාග්‍යවතුන්වහන්සේ ඒ නැගනියගේ වචනය සිහිකරණසේක. ශක්‍ර දෙවේන්ද්‍රය ඒ භගිනී තොමෝ මා අභිවාදනය කළාය. මම ඇගේ වචනය සිහිකරමි. යලිදු මම ආයුෂ්මත්හුගේ රථ නිම්වලලු ශබ්දයෙන් ඒ සමාධියෙන් නැගිටියෙමි වදාළේය.

11. ස්වාමීන්වහන්ස යම් ඒ දෙවියෝ අපටවඩා අතිසඝීත් පළමු කොට තව්තිසාභවනයෙහි උපන්නාහුද මාවිසින් ඔවුන්ගේ සමීපයෙන් අසනලදී. ඔවුන්ගේ සමීපයෙන් පිළිගන්නාලදි. කුමක්දයත්, යම් කාලෙක්හි ලොකයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත වරයෝ උපදිත්ද, එකල්හි දිව්‍යනිකායවල් සම්පූර්ණවෙත්. අසුර නිකායවල් පිරිහෙත් යනුයි, ස්වාමීන්වහන්ස ඒ මේ කරුණ මා විසින් ශාක්ෂිවශයෙන් දක්නාලදි. කෙසේද, යම් කලෙක්හි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතතෙමේ ලොව උපන් සේක්ද; එකල්හි දිව්‍යනිකායෝ පිරෙත්ද, අසුරනිකායෝ පිරිහෙත්ද, එසේයි. ස්වාමීනි මේ කපිලවස්තු පුරයෙහිම බුදුන්කෙරෙහි ප්‍රසන්නවූද, ධර්මයකෙරෙහි ප්‍රසන්නවූද සඞ්ඝයා කෙරෙහි ප්‍රසන්නවූද ශීලයන් සම්පූර්ණ කරන්නාවූද ගොපිකා නම්වූ ශාක්‍යදුහිතෘවක්වූවාය. ඕතොමෝ ස්ත්‍රීභාවය සම්බන්ධ සිත පහකොට පුරුෂභාවය සම්බන්ධ සිත වඩා කාබුන්මරණින් මත්තෙහි සොභනගති ඇත්තාවූ සැපයෙන් අග්‍රවූ ලොකයට එනම් අපගේ පුත්‍රභාවයට පැමිණ

දෙවානං තාවතිංසානං සහව්‍යතං අම්හාකං පුත්තත්තං අජ්ඣුපගතා. තත්‍රාපි නාමෙවං ජානන්ති. ගොපකො දෙවපුත්තො ගොපකො දෙවපුත්තොති. අඤ්ඤෙපි භන්තෙ, තයො භික්ඛූ භගවති බ්‍රහ්මචරියං චරිත්වා හීනං ගන්ධබ්බකායං උපපන්නා. තෙ පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරයමානා අම්හාකං උපට්ඨානමාගච්ඡන්ති, අම්හාකං පාරිචරියං. තෙ අම්හාකං උපට්ඨානමාගතෙ අම්හාකං පාරිචරියං ගොපකො දෙවපුත්තො පතිචොදෙසි. කුතො මුඛා නාම තුම්හෙ මාරිසා තස්ස භගවතො ධම්මං අස්සුත්වා. අහංහි ඉත්ථිකා සමානා බුද්ධෙ පසන්නා ධම්මෙ පසන්නා සඞ්ඝෙ පසන්නා සීලෙසු පරිපූරකාරිනී ඉත්ථිචිත්තං විරාජෙත්වා පුරිසචිත්තං භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා දෙවානං තාවතිංසානං සහව්‍යතං. සක්කස්ස දෙවානමින්දස්ස පුත්තත්තං අජ්ඣුපගතා. ඉධාපි මං එවං ජානන්ති ගොපකො දෙවපුත්තො ගොපකො දෙවපුත්තොති.

තව්තිසා වැසි දෙවියන්ගේ සමගි බවට පැමිණියාය. එහිදිද ඔහු මෙසේ දැනගණිත්. කෙසේද ගොපක දිව්‍යපුත්‍රයාය. ගොපක දිව්‍යපුත්‍රයාය කියායි. ස්වාමීන්වහන්ස, අන්‍යවූ භික්ෂූන් තුන්නමක්ද භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි බඹසර කොට ලාමකවූ ගන්ධර්වනිකායක උපන්නාහුය. ඔහුතුමූ පඤ්චකාමගුණයන්ගෙන් තෘප්ණයකරණලද්දහු එයින් යුක්තවූවාහු එහි ඉන්ද්‍රියන් හසුරුවන්නාහු අපගේ පාදපරිචාරික උපස්ථානයට පැමිණෙත්. අපගේ පරිචාරික උපස්ථානයට පැමිණියාවූ ඔවුන්ට ගොපක දිව්‍යපුත්‍රතෙමේ සිහිකෙරෙව්යේය. නිදුකානෙනි, තෙපි කවරපරිද්දෙකින් ඒ භාග්‍යවතුන්වහන්සේගේ ධර්මය ඇසුවහුද ? මම වනාහි ස්ත්‍රියෙක්වම බුදුන් කෙරෙහි ප්‍රසන්නව ධර්මය කෙරෙහි ප්‍රසන්නව සඞ්ඝයා කෙරෙහි ප්‍රසන්නව ශීලපරිපූරණය කරන්නියක්ව ස්ත්‍රීභාවය සම්බන්ධවූ සිත දුරුකොට පුරුෂභාවය සම්බන්ධ සිත වඩා කාබුත් මරණින් මත්තෙහි යහපත්ගති ඇත්තාවූ සැපයෙන් අග්‍රවූ ලොකයට එනම් ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පුත්‍රභාවයට පැමිණ තව්තිසාවැසි දෙවියන්ගේ සහභාගීභාවයට පැමිණියෙමි. මෙහිද මා මෙසේ දැනගණිත්. කෙසේද, ගොපක දෙවපුත්‍රයාය, ගොපක දෙවපුත්‍රයාය කියායි.

තුම්හෙපන මාරිසා භගවති බ්‍රහ්මචරියං චරිත්වා හීනං ගන්ධබ්බකායං උපපන්නා. දුද්දිට්ඨරූපං වත අද්දසාම. යෙ මයං අද්දසාම සහධම්මිකෙ හීනං ගන්ධබ්බකායං උපපන්නෙති. තෙසං භගෙන ගොපකෙන දෙවපුත්තෙන පටිචොදිතානං එව දෙවා දිට්ඨෙව ධම්මෙ සතිං පටිලභිංසු කායං බ්‍රහ්මපුරොහිතං. එකොපන දෙවො තෙව කාමෙ අජ්ඣාවසි.

12. උපාසිකා චක්ඛුමතො අහොසිං නාමම්පිමය්හං අහුගොපිකාති,
බුද්ධෙච ධම්මෙච අභිප්පසන්නා සංඝඤ්චුපට්ඨාසිං පසන්නචිත්තා.

තස්සෙව බුද්ධස්ස සුධම්මතාය සක්කස්සපුත්තොම්හි මහානුභාවො
මහාජුතිකො තිදිවූපපන්නො ජානන්තිපි මං ඉධ ගොපකොති.

අථද්දසං භික්ඛවො දිට්ඨපුබ්බෙ ගන්ධබ්බකායූපගතෙ වසීනෙ,
ඉමෙහි තෙ ගොතම සාවකාසෙ යෙච මයං පුබ්බෙ මනුස්සභූතා.

අන්නෙන පානෙන උපට්ඨහිම්හා පාදූපසංගය්හ සකෙ නිවෙසනෙ,
කුතො මුඛානාම ඉමෙ භවන්තො බුද්ධස්ස ධම්මං න පටිග්ගහෙසුං.

---

නිදුකානෙනි, තෙපි වනාහි භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි බඹසර වස්වසා හීනවූ ගන්ධර්වනිකායට පැමිණියාහුය. එකාන්තයෙන් දක් මටඅයොග්‍ය ස්වරූපයක් දක්කෙමු. කුමක්දයත්, යම්බඳුවූ අපි හීන වූ ගන්ධර්වනිකායට පැමිණියාවූ සහධාර්මිකයන් දුටුයෙමුනම් එයයි, ස්වාමින්වහන්ස ගොපකනම් දෙවපුත්‍රයා විසින් සිහිකරවනලද්දාවූ ඔවුන් අතුරෙන් දෙවිවරු දෙදෙනෙක් මෙ අත්බැව්හිම ධ්‍යානස්මෘතියහා බ්‍රහ්ම පුරොහිත ශරීරයක්ද ලැබූහ. එක් දෙවිකෙනෙක් ඒ කාමයන්හිම ගැලී වාසය කෙළේය.

12. මම චක්ෂුෂ්මත්වූ සර්වඥයන්වහන්සේගේ උපාසිකාවක් වූයෙමි. මට ගොපිකා යන නමක්ද විය. බුදුන් කෙරෙහිද ධර්මය කෙරෙහිද විශෙෂයෙන් පහන්වූවා ප්‍රසන්නසිතින් යුක්තව සඞ්ඝයාට උවටන් කෙළෙමි. ඒ බුදුන්ගේම ධර්මයාගේ සුන්‍දරභාවයෙන් මහත් ආනුභාව ඇත්තාවූ මහත් කාන්ති ඇත්තාවූ ත්‍රිදශපුරයෙහි උපන්නාවූ ශක්‍ර පුත්‍රයෙක් වෙමි. මෙහි මා ගොපකදිව්‍යපුත්‍රයා යයිද දනගණිත්. එකල්හි මම ගන්ධර්වනිකායට ආවාස්කයන්ව පැමිණියාවූ පෙර නොදක්නාලද්දාවූ භික්ෂූන් දුටුයෙමි. පෙර මනුෂ්‍යවූ හෙතෙම ශ්‍රාවක වූ යම්බඳුවූ අපි ඒ මේ භික්ෂූන්ට ස්වකීය ගෘහයෙහිදී පාදධොවනාදියෙන් සඞ්ග්‍රහකොට ආහරයෙන්හා පියයුතු පැනින් උවටන් කෙළෙමු. මේ භවත්හු කවර උපායකින්නම් සර්වඥ ධර්මය නොපිළිගත්හුද?

පච්චත්තං වෙදිතබ්බො හි ධම්මො සුදෙසිතො චක්ඛුමතානුබුද්ධො,
අහම්පි තුම්හෙව උපාසමානා සුත්වාන අරියාන සුභාසිතානි.

සක්කස්සපුත්තොම්හි මහානුභාවො මහාජුතීකො තිදිවූපපන්නො
තුම්හෙ පනසෙට්ඨං උපාසමානා අනුත්තරෙ බ්‍රහ්මචරියං චරිත්වා,

හීණකායං උපපන්නා භවන්තො අනානුලොමා භවතූපපත්ති
දුද්දිට්ඨරූපං වත අද්දසාම සධම්මිකෙ හීනකායූපපන්නෙ.

ගන්ධබ්බකායූපගතා භවන්තො දෙවාන මාගච්ඡථ පාරිචරියං,
අගාරෙව සතො මය්හ මිදං පස්ස විසෙසතං

ඉත්ථිහුත්වා ස්වජ්ජපුමොම්හි දෙවො දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො
තෙ චොදිතා ගොතමසාවකෙන සංවෙගමාපාදු සමෙච්චගොපකං

හන්දවියායාම වියායමාම මානොමයං පරපෙස්සා අහුම්හ,
තෙසං දුවෙවීරිය මාරභිංසු අනුස්සරං ගොතමසාසනානි.

ඉධෙව චිත්තානි විරාජයිත්වා කාමෙසු ආදීනව මද්දසිංසු,
තෙ කාම සංයොජන බන්ධනානි පාපිමයොගානි දුරච්චයානි.

---

චක්ෂුෂ්මත්වූ සර්‍වඥයන්වහන්සේ විසින් අවබොධ කරණලද්දාවූ හෝ දෙශනාකරණලද්දාවූ ධර්‍මය වනාහි තමාවිසින්ම දතයුත්තේවේ. මමද තෙපිද ආය්‍ය්‍යීයන්ගේ සුභාෂිතයන් අසා බුද්ධොපාසනය කරන්නෝ වීමු. (මම) මහත් ආනුභාව ඇත්තාවූ මහත් කාන්තිඇත්තාවූ ත්‍රිදශපුරයෙහි උපන්නාවූ ශක්‍රයාගේ පුත්‍රයෙක්වෙමි. පින්වත්නි තෙපිවනාහි ශ්‍රෙෂ්ඨවූ බුදුන් උපාසනයකරමින් අනුත්තරවූ ශාසනයෙහි බඹසර වස්වසා ලාමකවූ ශරීරයකට පැමිණිහුය. භවතුන්ගේ උත්පත්තිය නුසුදුසුවේ. හීනදෙහයකට පැමිණියාවූ සහධාර්‍මිකයන් ඒකාන්තයෙන් දක්මට අයොග්‍යස්වරූපව දුටුයෙමු. පින්වත්නි, තෙපි ගන්ධර්‍වනිකායට පැමිණියාහු දෙවියන්ගේ දාසභාවයට පැමිණෙව්. ගිහිගේ මැද වසන්නාවූ මාගේ මේ විශෙෂභාවය බලව. ඒ මම ස්ත්‍රීයෙක්වී අද දිව්‍යකාමයන්ගෙන් යුක්තවූ දිව්‍යපුරුෂයෙක් වෙමි. ගෞතමශ්‍රාවකවූ මාවිසින් සිහිකරවනලද්දාවූ ඔවුහු ගොපක දිව්‍යපුත්‍රවූ මාවෙත පැමිණ සංවෙගයට පැමිණියාහුය. එබැවින් අපි උසස්බවට යමු. උත්සාහකරමු. අනුන්ගේ පතිවිඩකාරයෝ නොවෙමු. ඔවුන් අතුරෙන් දෙදෙනෙක් වීය්‍ය්‍යී පටන්ගත්තාහුය. ගෞතම ශාසනයන් හෙවත් ප්‍රථමධ්‍යානය සිහිකරන්නෝ වූහ. ඔහුතුමු මෙහිදීම සිත්නොඅලවා පඤ්චකාමයන්හි දොෂය විෂ්කම්භනවශයෙන් දැක්කාහුය. පාපීවූ මාරයාගේ යොගවූ දුකසේ පහකටයුත්තාවූ කාමසංයොජනයන්හා කාමබන්ධනයන් සමුච්ඡෙදවශයෙන් දැක්කාහ.

නාගොව සංදාන ගුණාභිඡෙත්වා දෙවෙ තාවතිංසෙ අතික්කමිංසු
ස ඉන්‍ද දෙවා සපජාපතිකා සබ්බ සු ධම්මාය සභායුපවිට්ඨිතො.

තෙ සන්නිසින්නානං අතික්කමිංසු වීරා විරාගා විරජංකරොන්තා
තෙ දිස්වා සංවෙගමකාසි වාසවො දෙවාභිභූ දෙව ගණස්සමජ්ඣෙතො.

ඉමෙහි තෙ හීණකායූපපන්නා දෙවෙ තාවතිංසෙ අතික්කමන්ති.
සංවෙගජාතස්ස වචො නිසම්ම සො ගොපකො වාසවං අජ්ඣභාසි.

බුද්ධොජනින්‍දත්ථි මනුස්සලොකෙ කාමාභිභූ සක්‍ය මුනීති, ඤායති,
තස්සෙ තෙ පුත්තා සතියාවිහීණා චුතාමයාතෙ සතිං පච්චලත්ථුං.

තිණ්ණංතෙසං අවසීනෙත්ථ එකො ගන්ධබ්බකායූපගතොවසීනො,
ද්වෙව සම්බොධි පථානුසාරිනො දෙවෙපි හීළෙන්ති සමාහිතත්තා.

එතාදිසීධම්ම පකාසනෙත්ථ න තත්ථ කිංඛති කොචි සාවකො
නිත්තිණ්ණඔඝං විචිකිච්ඡඡින්නං බුද්ධං නමස්සාම ජිනං ජනින්‍දං.

සන්‍දානබන්ධනයන් (දම්වැල්) කඩාගියාවූ හස්තියෙක්මෙන් තව්තිසාවැසි දෙවියන් ඉක්මවූහ. ඉන්ද්‍රයාසහිත දෙවියෝද ප්‍රජාපතියා සහිත දෙවියෝද යන සියල්ලෝම සුධර්මා නම් දිව්‍යසභාවෙහි උන්න හුය. එකට උන්නාවූ ඔවුන්අතුරෙන් අනාගාමි මාර්ගය උපදවන්නාවූ සූරවූ වීතරාගීහු ඔවුන්ඉක්මවූහ. දෙවියන් මැඩපවත්වන සුලුවූ ශක්‍රතෙමේ ඔවුන් දැක දෙවසමූහයා මධ්‍යයෙහි සංවෙගයක් කෙළේය. හීණදෙහයකට පැමිණියාවූ ඒ මොවුහු වනාහි තව්තිසාවැසි දෙවියන් ඉක්මවන්යයි හටගත් සංවෙග ඇත්තාවූ ශක්‍රයාගේ වචනය අසා ඒ ගොපක දිව්‍යපුත්‍රතෙමේ ශක්‍රයාට කීයේය. දෙවෙන්ද්‍රය මනුෂ්‍යලොකයෙහි බුදුකෙනෙක් වනාහි ඇත හෙතෙමේ කාමයන් මැඩපැවැත්තුවාවූ ශාක්‍යමුනීයයි ප්‍රසිද්ධවේ. මොවුහු උන්වහන්සේගේ පුත්‍රයෝවෙත්. මාකෙරෙන් චුතවූ සිහියෙන් වෙන්වූ ඔහුතුමූ සිහිය නැවත ලැබූහ. ඔවුන් තුන්දෙනා අතුරෙන් ගන්ධර්ව නිකායට පැමිණියාවූ එකෙක් මෙහි ආවාසිකයෙක් වූයේය. වසඟ ඇත්තාවූ අනාගාමි මාර්ගානුසාරීවූ සමාධිගතවූ සිත්ඇති දෙදෙනෙක්ම දෙවියන්ද යටකෙරෙත්. මේ ශාසනයෙහි මෙබඳු ධර්මප්‍රකාශයක් වේ. එහි කිසියම් ශ්‍රාවකයෙක් කුමකටවත් සැකනොකෙරේ. කාම ඔඝාදිය තරණය කළාවූ සිඳිනලද විචිකිච්ඡා ඇත්තාවූ සියලු ලොකයාට උත්තමවූ පච මාරයන් ජයගත්තාවූ බුදුන් වඳිමු.

යෙනාතධම්මං ඉධඤ්ඤාය විසෙසං අජ්ඣගංසු තෙ,
කායං බ්‍රහ්ම පුරොහිතං දුවෙ තෙසං විසෙසගූ.
තස්ස ධම්මස්ස පත්තියා ආගතම්හාසෙ මාරිස,
කතොකාසා භගවතා පඤ්හං පුච්ඡෙමමාරිසාති.

13. අථඛො භගවතො එතදහොසි. දීඝරත්තං විසුද්ධො ඛො අයං සක්කො යං කිඤ්චි මං පඤ්හං පුච්ඡිස්සති. සබ්බං තං අත්ථසංහිතං යෙව පුච්ඡිස්සති. නො අනත්ථ සංහිතං. යං අස්සාහං පුට්ඨො ව්‍යාකරිස්සාමි. තං ඛිප්පං එව ආජානිස්සතීති. අථඛො භගවා සක්කං දෙවානමින්දං ගාථාය අජ්ඣභාසි.

පුච්ඡ වාසව මං පඤ්හං යං කිඤ්චි මනසිච්ඡසි,
තස්ස තස්සෙව පඤ්හස්ස අහං අන්තං කරොමි තෙති.

**පඨමක භාණවාරං නිට්ඨිතං.**

---

මෙහි ඔබගේ යම් ධර්මයක් දැන ඔවුන් අතුරෙන් විශෙෂාධිගතවූ ඒ දෙදෙනෙක් බ්‍රහ්ම පුරොහිත බඹලොවට පැමිණ මාගීඵල විශෙෂයක් අවබොධකළාහුද, නිදුකාණෙනි. ඒ ධර්මය ලැබීමපිණිස ආයෙමු නිදුකාණෙනි, භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රශ්න පිළිවිසීමට කරණලද අවකාශඇති අපි ප්‍රශ්න පිළිවිසින්නෙමුයි කීය.

13. ඉක්බිත්තෙන් භග්‍යවතුන්වහන්සේට මේ සිතවීය. මේ ශක්‍ර තෙමේ බොහෝ කලක් මුලුල්ලෙහිම පිරිසිදුය. යම්කිසි ප්‍රශ්නයක් මා විචාරන්නේද, ඒ සියල්ලම අර්ථසංනිශ්‍රිතවම විචාරන්නේය. අනර්ථ සංහිතව නොවිචාරන්නේය. යමක් ඔහුවිසින්මම පිළිවිස්නාලද්දෙම් ප්‍රකාශකරන්නෙම්ද, එය වහාම දැනගන්නේයයි කියාසි. නැවත භාග්‍යවතුන්වහන්සේ ශක්‍රයාට ගාථාවකින් වදාලේය ශක්‍රය මා ප්‍රශ්න පිළිවිසුව. තට යම්කිසිවක් කැමැත්තෙහිනම් තාගේ ඒ ඒ ප්‍රශ්නයපිළිබඳ කෙළවර මම කරමි වදාළේය.

**පලමුවෙන් බණවර මෙතෙකින්**
**නිමවනලදී.**

**2.** 1. කතාවකාසො සක්කො දෙවානමින්දො භගවන්තං ඉමං පඨමං පඤ්හං පුච්ඡි. කිංසංයොජනානුඛො මාරිස දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා යෙ චඤ්ඤෙ සන්ති. පුථුකායා තෙ අවෙරා අදණ්ඩා අසපත්තා අව්‍යාපජ්ඣා විහරෙමු. අවෙරිනොති. ඉතිචෙතෙසං හොති. අථ ච පන සවෙරා සදණ්ඩා සසපත්තා සව්‍යාපජ්ඣා විහරන්ති. වෙරිනොති. ඉත්ථං සක්කො දෙවානමින්දො භගවන්තං ඉමං පඨමං පඤ්හං ආපුච්ඡි. තස්ස භගවා පඤ්හංපුට්ඨො ව්‍යාකාසි. ඉස්සාමච්ඡරිය සංයොජනාඛො දෙවානමින්ද දෙවමනුස්සා අසුරා නාගා ගන්ධබ්බා යෙ චඤ්ඤෙ සන්ති. පුථුකායා තෙ අවෙරා අදණ්ඩා අසපත්තා අව්‍යාපජ්ඣා විහරෙමු. අවෙරිනොති. ඉති චෙ තෙසංහොති. අථචපන සවෙරා සදණ්ඩා සසපත්තා සව්‍යාපජ්ඣා විහරන්ති. වෙරිනොති. ඉත්ථං භගවා සක්කස්ස දෙවානමින්දස්ස. පඤ්හං පුට්ඨො ව්‍යාකාසි.

---

**2.** 1. ප්‍රශ්න පිළිවිසීමට කරණලද අවකාශඇති ශක්‍රදෙවේන්ද්‍ර තෙම භාග්‍යවතුන්වහන්සේගෙන් මේ පළමුවෙනි ප්‍රශ්නය විචාළේය. නිදුකානන්වහන්ස, මනුෂ්‍යයෝද, අසුරයෝද, නාගයෝද, ගන්ධර්වයෝද මෙයින් අන්‍යවූ බොහෝ ජනයෝවෙත්නම් ඔවුහුද ක්‍රොධ නැත්තාහු දණ්ඩන නැත්තාහු සතුරන් නැත්තාහු දොම්නස් රහිතවූවාහු අපි අවෛරීව වසන්නෙමුයි ඔවුන්ගේ ප්‍රාර්ථනාවක් වේද ඒ ප්‍රාර්ථනාව ඇතිකල්හිත් ඔවුහු ක්‍රොධසහිතවූවාහු දණ්ඩන සහිතවූවාහු සතුරන්සහිතවූවාහු දොම්නස්සහිතවූවාහු වෛර ඇත්තෝව වසත්. ඒ කුමක්බන්ධනකොට ඇත්තෝද යනුයි. මෙසේ ශක්‍රදෙවේන්ද්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේගෙන් ප්‍රථමප්‍රශ්නය විචාළේය. ප්‍රශ්න විචාරණලද්දාවූ භාග්‍යවතුන්වහන්සේ ඕහට එය ප්‍රකාශකෙළේය. දෙවේන්ද්‍රය, ඊර්ෂ්‍යාමාත්සර්‍ය්‍යදෙක බන්ධනකොට ඇත්තාවූම දෙවියෝද මනුෂ්‍යයෝද අසුරයෝද නාගයෝද ගන්ධර්වයෝද මෙයින් අන්‍යවූ බොහෝ ජනයෝවෙත්නම් ඔවුහුද ක්‍රොධනැත්තාහු දණ්ඩන නැත්තාහු සතුරන් නැත්තාහු දොම්නස්රහිතවූවාහු අපි අවෛරීව වසන්නමුයයි ඔවුන්ගේ ප්‍රාර්ථනාවකුත්වේද එතකුදුවුවත් ඔවුහු ක්‍රොධ ඇත්තාහු දණ්ඩ ඇත්තාහු සතුරන් ඇත්තාහු දොම්නස් ඇත්තාහු වෛර ඇත්තෝව වෙසෙත්යයිවදාළේය. ශක්‍රදෙවේන්ද්‍රයා විසින් ප්‍රශ්නාවිචාරණලද්දාවූ භාග්‍යවතුන්වහන්සේ මෙසේ ප්‍රකාශකළේය.

අත්ත මනොසක්කො, දෙවානමින්දො භගවතො භාසිතං අභිනන්දි අනුමොදි එවමෙතං භගවා එවමෙවං සුගත. තිණ්ණා මෙත්‍ථ කංඛා විගත කථංකථා භගවතො පඤ්හ වෙය්‍යාකරණං සුත්වානි.

2. ඉතිහ සක්කො දෙවානමින්දො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි. ඉස්සාමච්ඡරියං පනමාරිසකිං නිදානං කිං සමුදයං කිං ජාතිකං කිං පභවං කිස්මිං සති ඉස්සා මච්ඡරියං හොති, කිස්මිං අසති ඉස්සාමච්ඡරියං නහොතීති. ඉස්සාමච්ඡරියං ඛො දෙවානමින්ද පියාප්පිය නිදානං පියාප්පිය සමුදයං පියාප්පිය ජාතිකං පියාප්පිය පභවං, පියාප්පියෙහි සති ඉස්සා මච්ඡරියං හොතීති, පියාප්පියෙහි අසති ඉස්සා මච්ඡරියං නහොතීති. පියාප්පියං පනමාරිස කිං නිදානං කිං සමුදයං කිංජාතිකං කිංපභවං, කිස්මිං සති පියාප්පියං හොති කිස්මිං අසති. පියාප්පියං නහොතීති.

---

සතුටුසිත් ඇත්තාවූ ශක්‍රදෙවෙන්‍ද්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්තේය. අනුමෝදන්දවිය. භාග්‍යවතුන් වහන්ස, මෙය මෙසේය, සුගතයන්වහන්ස, මෙය මෙසේය. මෙහි මාගේ කාංශාව දුරින්ම තරණයවූවාය. කෙසේ කෙසේදැයි පැවති සැකය පහවූවාය. කෙසේද භාග්‍යවතුන්වහන්සේගේ ප්‍රශ්න ප්‍රකාශ කිරීම අසායි.

2. මෙසේ මෙහි ශක්‍රදෙවෙන්‍ද්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව මත්තෙහිත් භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්නයක් විචාළේය. නිදුකානන්වහන්ස, ඊර්ෂ්‍යාව හා මසුරුබව කුමක් මූලකාරණාකොට ඇත්තේද කුමක්හෙතු කොට ඇත්තේද, කුමක් ජාතිකොට ඇත්තේද, කුමක් ප්‍රභවංකොට ඇත්තේද කුමක් ඇතිකල්හි ඊර්ෂ්‍යාව හා මාත්සර්‍ය්‍යයවේද කුමක් නැතිකල්හි ඊර්ෂ්‍යාවහා මාත්සර්‍ය්‍යය නොවේදැයිකියායි. දෙවෙන්‍ද්‍රය ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍යදෙක ප්‍රියවූද අප්‍රියවූද සත්වසමූහයා මූලකාරණා කොට ඇත්තේය. ප්‍රියා ප්‍රියයන් සමුදයකොට ඇත්තේය. ප්‍රිය අප්‍රියයන් ජාතිකොට ඇත්තේය. ප්‍රිය අප්‍රියයන් ප්‍රභවකොට ඇත්තේය. ප්‍රිය අප්‍රිය සත්වසමූහයා ඇතිකල්හිම ඊර්ෂ්‍යාවහා මසුරුබවවේ. ප්‍රියවූවෙක් හා අප්‍රියවූවෙක් නැතිකල්හි ඊර්ෂ්‍යාවහා මසුරු බව නොවේයයි වදාළේය. නිදුකානන්වහන්ස, ප්‍රියාප්‍රිය සත්ව සංසකාරය වනාහි කුමක් නිදානකොට ඇත්තේද කුමක් ජාතිකොට ඇත්තේද කුමක් ප්‍රභවකොට ඇත්තේද කුමක් ඇතිකල්හි ප්‍රියාප්‍රිය සත්වසංස්කාරය වේද, කුමක්නැතිකල්හි ප්‍රියාප්‍රිය සත්වසංස්කාරයනොවේදැයි ඇසීය.

පියාප්පියං ඛො දෙවානමින්ද ඡන්දනිදානං ඡන්දසමුදයං ඡන්දජාතිකං ඡන්දපපභවං. ඡන්දෙසති පියාප්පියං හොති ඡන්දෙ අසති පියාප්පියං නහොතීති. ඡන්දොපනමාරිස කිං නිදානො කිං සමුදයො කිං ජාතිකො කිං පභවො. කිස්මිංසති. ඡන්දො හොති කිස්මිං අසති ඡන්දො න හොතීති. ඡන්දො ඛො දෙවානමින්ද විතක්කනිදානො විතක්කසමුදයො විතක්කජාතිකො. විතක්කපභවො. විතක්කෙසති. ඡන්දොහොති විතක්කෙ අසති ඡන්දො නහොතීති. විතක්කො පන මාරිස කිං නිදානො කිං සමුදයො කිං ජාතිකො කිං පභවො. කිස්මිං සති. විතක්කො හොති. කිස්මිං අසති විතක්කො නහොතීති විතක්කො ඛො දෙවානමින්ද පපඤ්ච සඤ්ඤා සංඛානිදානො පපඤ්චසඤ්ඤා සංඛාසමුදයො පපඤ්ච සඤ්ඤා සංඛාජාතිකො පපඤ්චසඤ්ඤා සංඛාපභවො.

දෙවෙන්ද්‍රය, ප්‍රියාප්‍රිය සත්වසංස්කාරය වනාහි ඡන්දය නිදානකොට ඇත්තේය. ඡන්දය සමුදයකොට ඇත්තේය. ඡන්දය ජාතිකොට ඇත්තේය. ඡන්දය ප්‍රභවකොට ඇත්තේය. ඡන්දය ඇතිකල්හි ප්‍රියාප්‍රිය සත්වසංස්කාරයවේ. ඡන්දය නැතිකල්හි ප්‍රියාප්‍රිය සත්වසංස්කාරය නොවේයයි වදාළේය. නිදුකානන්වහන්ස, ඡන්දයවනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් සමුදයකොට ඇත්තේද, කුමක් ජාතිකොට ඇත්තේද, කුමක් ප්‍රභවකොට ඇත්තේද, කුමක් ඇතිකල්හි ඡන්දයවේද කුමක් නැතිකල්හි ඡන්දය නොවේදැයි විචාළේය. දෙවෙන්ද්‍රය, ඡන්දයවනාහි (විනිශ්චය)විතර්කය නිදානකොට ඇත්තේය විතර්කය සමුදයකොට ඇත්තේය. විතර්කය ජාතිකොට ඇත්තේය. විතර්කය ප්‍රභවකොට ඇත්තේය. විතර්කය ඇතිකල්හි ඡන්දයවේ. විතර්කය නැතිකල්හි ඡන්දය නොවේයයි වදාළේය. නිදුකානන්වහන්ස, (විනිශ්චය) විතර්කය වනාහි කුමක් නිදානකොට ඇත්තේද, කුමක් සමුදයකොට ඇත්තේද, කුමක් ජාතිකොට ඇත්තේද, කුමක් ප්‍රභවකොට ඇත්තේද, කුමක් ඇතිකල්හි විතර්කයවේද, කුමක්නැතිකල්හි විතර්කය නොවේදැයි විචාළේය. දෙවෙන්ද්‍රය, විතර්කය වනාහි තෘෂ්ණාදි ත්‍රිවිධ ප්‍රපඤ්ච සම්ප්‍රයුක්ත සංඥකොටස් නිදානකොට ඇත්තේය. ප්‍රපඤ්චසම්ප්‍රයුක්ත සංඥකොටස් සමුදයකොට ඇත්තේය. ප්‍රපඤ්චසම්ප්‍රයුක්තසංඥකොටස් ජාතිකොට ඇත්තේය. ප්‍රපඤ්චසම්ප්‍රයුක්ත සංඥාකොටස් ප්‍රභවකොටඇත්තේය.

පපඤ්චසඤ්ඤාසංඛාය සති. විතක්කො හොති. පපඤ්චසඤ්ඤාසංඛාය අසති. විතක්කො නහොතීති

3. කථං පටිපන්නො පන මාරිස භික්ඛු පපඤ්චසඤ්ඤාසංඛානිරොධසාරුප්පගාමිනිපටිපදං පටිපන්නො හොතීති. සොමනස්සං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බං පි අසෙවිතබ්බංපි. දොමනස්සං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි සෙවිතබ්බංපි අසෙවිතබ්බංපි. උපෙක්ඛං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බංපි අසෙවිතබ්බංපි. සොමනස්සං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බංපි අසෙවිතබ්බම්පීති. ඉති ඛො පනෙතං වුත්තං කිං චෙතං පටිච්ච වුත්තං. තත්‍ථ යං ජඤ්ඤා සොමනස්සං ඉමං ඛො මෙ සොමනස්සං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තීති.

---

ප්‍රපඤ්චසම්ප්‍රයුක්ත සංඥකොටස් ඇතිකල්හි විතර්කයවේ. ප්‍රපඤ්ච සම්ප්‍රයුක්ත සංඥකොටස් නැතිකල්හි විතර්කය නොවේයයි වදාළේය.

3. නිදුකානන්වහන්ස, කෙසේ පිළිපන්නාවූ භික්ෂුතෙමේ තෘෂ්ණාදි ත්‍රිවිධ ප්‍රපඤ්චසම්ප්‍රයුක්ත සංඥකොටස්හුගේ ව්‍යපසමයෙහි ස්වරූපභාවයහා එහි පැමිණවීමයයි කියනලද ප්‍රතිපදාවට පිළිපන් නේවේදැයි විචාළේය. දෙවේන්‍ද්‍රය මම සොම්නසද දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන දෙකයි දෙවේන්‍ද්‍රය දොම්නසද මම දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන දෙකයි. දෙවේන්‍ද්‍රය උපෙක්ෂාවද මම දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන දෙකයි. දෙවේන්‍ද්‍රය සොම්නස මම දෙපරිද්දෙකින් කියමි. එනම් සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන මේයයි. මෙය මෙසේ වනාහි කියනලද්දේය. මෙය කුමක් සඳහා කියන ලද්දේදයත්, එහි යම් සොම්නසක්මෙසේ දන්නේද, කෙසේද, මේ සොම්නස සෙවනය කරන්නාවූ මට අකුශලධර්මයෝ වැඩෙත්. කුශලධර්මයෝ පිරිහෙත්ය කියායි.

එවරූපං සොමනස්සං නසෙවිතබ්බං. තත්ථ යං ජඤ්ඤා සොමනස්සං ඉමං ඛො මෙ සොමනස්සං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති. එවරූපං සොමනස්සං සෙවිතබ්බං. තත්ථ යඤ්චෙ සවිතක්කං සවිචාරං යඤ්චෙ අවිතක්කං අවිචාරං යෙ අවිතක්කෙ අවිචාරෙ සෙ පණීතතරෙ. සොමනස්සං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බං පි අසෙවිතබ්බං පීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්චවුත්තං. දොමනස්සං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බංපි අසෙවිතබ්බං පීති. ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්චවුත්තං. තත්ථ යං ජඤ්ඤා දොමනස්සං ඉමං ඛො මෙ දොමනස්සං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තීති. එවරූපං දොමනස්සං නසෙවිතබ්බං. තත්ථ යං ජඤ්ඤා දොමනස්සං.

---

මෙබඳුවූ සොම්නස සෙවනය නොකට යුතුයි. එහි යම් සොම්නසක් මෙසේ දන්නේද, කෙසේද, මේ සොම්නස වනාහි සෙවනය කරන්නාවූ මගේ අකුශලධර්මයෝ පිරිහෙත්. කුශලධර්මයෝ වැඩෙත් යයි කියායි. මෙබඳුවූ සොම්නස සෙවනය කටයුතුයි. එහි යමක් විතර්කසහිතද, විචාරසහිතද, යමක් විතර්කරහිතද විචාරරහිතද, යම් කෙනෙක් විතර්කරහිතකොටහෝ විචාරරහිතකොට කියත්ද, ඔවුන් අතිශයින් ප්‍රණීතයයි කියත්. දෙවේන්ද්‍රය මම සොම්නස දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුතුනාද සෙවනය නොකටයුතුනාද යන මේයයි මෙසේ ඒ යමක් කියනලද්දේනම් මෙය මේ සඳහා කියනලදී. දෙවේන්ද්‍රය මම දොම්නස දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුතුනාද සෙවනය නොකටයුතුනාද යන මේයයි මේ මෙසේ කියනලද්දේනම්, මෙය කුමක් සඳහා කියනලද්දේද, එහි යම් දොම්නසක් මෙසේ දන්නේද, කෙසේද, මේ දොම්නස සෙවනය කරන්නාහට අකුශලධර්මයෝ වැඩෙත්. කුශලධර්මයෝ පිරිහෙත් යයි කියායි. මෙබඳුවූ දොම්නස සෙවනය නොකටයුතුයි. එහි යම් මෙසේ දොම්නසක් දන්නේද, කෙසේද,

ඉමං ඛො මෙ දොමනසසං සෙවතො අකුසලා ධමමා පරිහායනති, කුසලාධමමා අභිවඩ්ඪන්තීති, එවරූපං දොමනසසං සෙවිතබබං. තත්ථ යඤ්චෙ සවිතකකං සවිචාරං යඤ්චෙ අවිතකකං අවිචාරං යෙ අවිතකෙක අවිචාරෙ සෙ පණීතතරෙ දොමනසසං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි සෙවිතබබමපි අසෙවිතබබම්පීති. ඉති යනතං වුතතං ඉදමෙතං පටිචචවුතතං. උපෙඛං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි සෙවිතබබමපි අසෙවිතබබම්පීති. ඉති ඛො පනෙතං වුතතං කිඤ්චෙතං පටිචචවුතතං තත්ථ යං ජඤ්ඤා උපෙඛං ඉමං ඛො මෙ උපෙඛං සෙවතො අකුසලා ධමමා අභිවඩ්ඪනති කුසලා ධමමා පරිහායන්තීති එවරූපා උපෙඛා න සෙවිතබබා. තත්ථ යං ජඤ්ඤා උපෙඛං ඉමං ඛො මෙ උපෙඛං සෙවතො අකුසලා ධමමා පරිහායනති කුසලා ධමමා අභිවඩ්ඪන්තීති. එවරූපා උපෙඛා සෙවිතබබා. තත්ථ යඤ්චෙ සවිතකකං සවිචාරංයඤ්චෙ අවිතක්කං අවිචාරං යෙ අවිතක්කෙ අවිචාරෙ සෙ පණීතතරෙ.

---

මේදොම්නස සෙවනයකරන්නාහට අකුශලධර්මයෝ පිරිහෙත්, කුශලධර්මයෝ වැඩෙත්යයිකියායි, මෙබඳුවූ දොම්නසසෙවනයකටයුතුයි එහියමක් විතර්කසහිතද, විචාරසහිතද, යමක් විතර්කරහිතද, විචාරරහිතද, යම්කෙනෙක් අවිතර්කහෝ අවිචාරයයි කියානම් ඒ අතිශයින් ප්‍රණීතකොටකියත්. දෙවේන්ද්‍රය මමදොම්නස දෙපරිද්දකින් කියමි. සෙවනයකටයුතුනද සෙවනය නොකටයුතුනද යන මේයි මෙසේ යමක් කියනලද්දේනම් මෙයමෙම්සඳහා කියනලදී. දෙවේන්ද්‍රය උපෙක්ෂාව මම දෙපරිද්දකින් කියමිසෙවනය කටයුතුනද සෙවනය නොකටයුතුනද යන මේයයි. මේමෙසේ කියනලද්දේය. මෙය කුමක්සඳහා කියනලද්දේද යත්. එහි යම් උපෙක්ෂාවක් දන්නේද, කෙසේද, මේ උපෙක්ෂාව සෙවනයකරන්නාවූ මට අකුශලධර්මයෝ වැඩෙත්. කුශලධර්මයෝ පිරිහෙත් කියායි. මෙබඳුවූ උපෙක්ෂාව සෙවනය නොකටයුතුයි. එහි යම් උපෙක්ෂාවක් දන්නේද, කෙසේද, මේ උපෙක්ෂාව සෙවනය කරන්නාවූ මට අකුශලධර්මයෝ පිරිහෙත්. කුශලධර්මයෝ වැඩෙත් කියායි. මෙබඳු උපෙක්ෂාව සෙවනය කටයුතුයි. එහි යමක් විතර්කසහිතද විචාරසහිතද, යමක් විතර්කරහිතද, විචාරරහිතද, යම් කෙනෙක් අවිතර්ක හෝ අවිචාරයයි කියානම් ඒ අතිශයින් ප්‍රණීතයයි කියායි.

උපෙක්ඛං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති යං තං වුත්තං ඉදං මෙතං පටිච්චවුත්තං. එවං පටිපන්නො ඛො දෙවානමින්ද භික්ඛු පපඤ්චසඤ්ඤාසංඛා නිරොධ සාරුප්පගාමිනි පටිපදං පටිපන්නො හොතීති. ඉත්ථං භගවා සක්කස්ස දෙවානමින්දස්ස පඤ්හං පුට්ඨො ව්‍යාකාසි. අත්තමනො සක්කො දෙවානමින්දො භගවතො භාසිතං අභිනන්දි අනුමොදි එව මෙතං භගවා එව මෙතං සුගත තිණ්ණා මෙත්ථ කංඛා විගතා කථංකථා භගවතො පඤ්හ වෙය්‍යාකරණං සුත්වාති.

4. ඉතිහ සක්කො දෙවානමින්දො භගවතො භාසිතං අභිනන්දිත්වා භගවන්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි කථං පටිපන්නො පන මාරිස භික්ඛු පාතිමොක්ඛ සංවරාය පටිපන්නො හොතීති. කාය සමාචාරම්පහං දෙවානමින්ද දුවිධෙන වදාමි සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි.

---

දෙවෙන්ද්‍ර, මම උපෙක්ෂාවද දෙපරිද්දෙකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකට යුත්තද යන මේයි. මෙසේ ඒ යමක් කියනලද්දේනම්, මෙය මේසඳහා කියනලදී. දෙවෙන්ද්‍රය මෙසේ පිළිපන්නාවූ භික්ෂුතෙමේ තෘෂ්ණාදි ත්‍රිවිධ ප්‍රපඤ්චසම්ප්‍රයුක්ත සංඥා කොටස්හුගේ ව්‍යපසමයෙහි සරූපභාවය හා එහි පැමිණීමයයි කියනලද ප්‍රතිපදාවට පිළිපන්නේ වේයයි වදාළේය. මෙසේ භාග්‍යවතුන්වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍රයාවිසින් ප්‍රශ්න පිළිවිස්නාලද්දේ ප්‍රකාශකෙළේය. සතුටුසිත් ඇත්තාවූ ශක්‍රදෙවෙන්ද්‍ර තෙම භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතය මුදුනෙන් පිළිගත්තේය. අනුමෝදන්ද වූයේය. භාග්‍යවතුන්වහන්ස, මේ මෙසේය. සුගතයන් වහන්ස, මේ මෙසේය. මෙහිදී මාගේ කාංශාව බැහැරගියාය. මේ කෙසේ කෙසේදැයි පැවති සැකය පහවූවාය. කෙසේද. භාග්‍යවතුන්වහන්සේගේ ප්‍රශ්නවිසඳීම අසාය.

4. මෙසේ මෙහිදී ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ මත්තෙහිත් භාග්‍යවතුන්වහන්සේගෙන් ප්‍රශ්නයක් විචාළේය. නිදුකානන්වහන්ස, කෙසේ පිළිපන්නාවූ භික්ෂුතෙමේ ප්‍රාතිමෝක්ෂසංවරය පිණිස පිළිපන්නේවේද ? දෙවෙන්ද්‍රය මම කායසමාචාරයද දෙපරිද්දකින් කියමි. සෙවනයකටයුත්තද සෙවනය නොකටයුත්තද යන මේයි.

වචීසමාචාරං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි, පරියෙසනං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. කායසමාචාරං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීතිති, ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්චවුත්තං. තත්‍ථ යං ජඤ්ඤා කාය සමාචාරං ඉමං ඛො මෙ කායසමාචාරං සෙවතො අකුසල ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තීති. එවරූපො කායසමාචාරො න සෙවිතබ්බො. තත්‍ථ යං ජඤ්ඤා කායසමාචාරං ඉමං ඛො මෙ කාය සමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති. එවරූපො කාය සමාචාරො සෙවිතබ්බො කායසමාචාරං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීතිති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං වචී සමාචාරං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි.

---

දෙවේන්ද්‍රය මම වාක්සමාචාරයද දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන මේයි දෙවේන්ද්‍රය, මම පයෙෂණය දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන මේයි. දෙවේන්ද්‍රය මම කාය සමාචාරයද දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන මේයහි. මෙසේවනාහි මෙයකියන ලද්දේය. මෙය කුමක් සඳහා කියනලද්දේද ? එහි යම් කාය සමාචාරයක් දන්නේද, කෙසේද, මේ කායසමාචාරය සෙවනය කරන්නාවූ මට අකුශලධර්‍මයෝ වැඩෙත්. කුශලධර්‍මයෝ පිරිහෙත්ය කියායි. මෙබඳුවූ කායසමාචාරය සෙවනයනොකටයුතුයි එහි යම් කායසමාචාරයක් මෙසේ දන්නේද, කෙසේද, මේ කාය සමාචාරය වනාහි සෙවනය කරන්නාවූ මාගේ අකුශලධර්‍මයෝ පිරිහෙත්. කුශලධර්‍මයෝ වැඩෙත්ය කියායි. මෙබඳුවූ කායසමාචාරය සෙවනය කටයුතුයි. දෙවේන්ද්‍රය මම කායසමාචාරය දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන මේයි මෙසේ ඒ යමක් කියනලද්දේනම් මෙය මේසඳහා කියනලදී දෙවේන්ද්‍රය මම වාක්සමාචාරයද දෙපරිද්දකින් කියමි.

සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්චවුත්තං. තත්‍ථ යං ජඤ්ඤා වචීසමාචාරං ඉමං ඛො මෙ වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තීති. එවරූපො වචීසමාචාරො නසෙවිතබ්බො. තත්‍ථ යං ජඤ්ඤා වචීසමාචාරං ඉමං ඛො මෙ වචීසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති, එවරූපො වචීසමාචාරො සෙවිතබ්බො. වචීසමාචාරං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං. පරියෙසනං පහං දෙවානමින්ද දුවිධෙන වදාමි සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති ඛො පනෙතං වුත්තං කිං චෙතං පටිච්ච වුත්තං. තත්‍ථ යං ජඤ්ඤා පරියෙසනං ඉමං ඛො මෙ පරියෙසනං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තීති එවරූපා පරියෙසනා නසෙවිතබ්බා.

---

සෙවනය කටයුතුතද සෙවනය නොකටයුතුතද යන මේයි. මෙසේ මේ කියනලද්දේනම් මේ කුමක්සඳහා කියනලද්දේද? එහි යම් වාක් සමාචාරයක් මෙසේ දන්නේද, කෙසේද, මේ වාක්සමාචාරය සෙවනය කරන්නාවූ මාගේ අකුශලධර්මයෝ වැඩෙත්. කුශලධර්මයෝ පිරිහෙත්ය කියායි. මෙබඳුවූ වාක්සමාචාරය සෙවනය නොකට යුතුයි. එහි යමක් මෙසේ දන්නේද, කෙසේද, මේ වාක්සමාචාරය සෙවනය කරන්නාවූ මාගේ අකුශලධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්ය කියායි. මෙබඳුවූ වාක්සමාචාරය සෙවනය කට යුතුයි. දෙවේන්ද්‍රය මම වාක්සමාචාරය දෙපරිද්දකින් කියමි. සෙව නය කටයුතුතද සෙවනය නොකටයුතුතද යන මේයි. මෙසේ ඒ යමක් කියනලද්දේනම් මෙය මේසඳහා කියනලදි. දෙවේන්ද්‍රය පර්‍යෙෂ්ණයද (සෙවීමද) මම දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුතුතද සෙවනය නොකටයුතුතද යන මේයි. මෙසේ මේ කියනලද් දේය මේ කුමක්සඳහා කියනලද්දේදයත් ? එහි යම් පර්‍යෙෂණයක් මෙසේ දන්නේද, කෙසේද, මේ පර්‍යෙෂණය සෙවනයකරන් නාවූ මාගේ අකුශලධර්මයෝ වැඩෙත්. කුශලධර්මයෝ පිරිහෙත්ය කියායි. මෙබඳුවූ පර්‍යෙෂණාව සෙවනය නොකටයුතුයි,

තත්‍ථ යං ජඤ්ඤා පරියෙසනං ඉමං ඛො මෙ පරියෙසනං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති. එවරූපා පරියෙසනා සෙවිතබ්බා. පරියෙසනංපහං දෙවානමින්ද දුවිධෙන වදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්චවුත්තං. එවං පටිපන්නො ඛො දෙවානමින්ද භික්ඛු පාතිමොක්ඛසංවරාය පටිපන්නො හොතීති. ඉත්‍ථං භගවා සක්කස්ස දෙවානමින්දස්ස පඤ්හං පුට්ඨො ව්‍යාකාසි. අත්තමනො සක්කො දෙවානමින්දො භගවතො භාසිතං අභිනන්දි අනුමොදි. එවමෙතං භගවා එවමෙතං සුගත. තිණ්ණා මෙත්‍ථ කංඛා විගතා කථංකථා භගවතො පඤ්හා වෙය්‍යාකරණං සුත්වාති.

5. ඉතිහ සක්කො දෙවානමින්දො, භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං උත්තරිං පඤ්හං අපුච්ඡි.

---

යම් පර්‍ය්‍යේෂණයක් මෙසේ දන්නේද, කෙසේද, මේ පර්‍ය්‍යේෂණය සේවනයකරන්නාවූ මාගේ අකුශලධර්මයෝ පිරිහෙත්, කුශලධර්මයෝ වැඩෙත්ය කියායි. මෙබඳුවූ පර්‍ය්‍යේෂණාව සේවනය කටයුතුයි. දෙවේන්ද්‍රය මම පර්‍ය්‍යේෂණයද දෙපරිද්දකින් කියමි. සේවනය කටයුත්තද සේවනය නොකටයුත්තද යන මේයි. මෙසේ ඒ යමක් කියනලද්දේ නම් මෙය මේසඳහා කියනලදී. දෙවේන්ද්‍රය මෙසේ පිළිපන්නාවූම භික්ෂු තෙමේ ප්‍රාතිමෝක්ෂසංවරයපිණිස පිළිපන්නේවේයයි වදාළේය. මෙසේ භාග්‍යවතුන්වහන්සේ ශක්‍රදෙවේන්ද්‍රයන්විසින් ප්‍රශ්නපිළිවිසිනාලද්දේ ප්‍රකාශකළසේක. සතුටුසිත්ඇත්තාවූ ශක්‍රදෙවේන්ද්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්තේය. අනුමෝදන්දවිය කෙසේද, භාග්‍යවතුන්වහන්ස, මේ මෙසේයි. සුගතයන් වහන්ස, මේ මෙසේයි. මෙහිදී මාගේ කාංසාව බැහැරගියාය. කෙසේ කෙසේදැයි පැවති සැකය පහවූවාය. භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්නවිසඳීම අසායි.

5. මෙසේ මෙහි ශක්‍රදෙවේන්ද්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය මුදුනෙහි පිළිගෙණ අනුමෝදන්ව මත්තෙහිත් භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්නයක් විචාළේය. කෙසේද.

කථංපටිපන්නො, පන මාරිස භික්ඛු ඉන්ද්‍රියසංවරාය පටිපන්නො හොතීති, චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපංපහං දෙවානමින්ද දුවිධෙනවදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. සොතවිඤ්ඤෙය්‍යං සද්දං පහං දෙවානමින්ද ...පෙ... ඝාණ විඤ්ඤෙය්‍යංගන්ධං පහංදෙවානමින්ද ...පෙ... ජිව්හාවිඤ්ඤෙය්‍යංරසංපහංදෙවානමින්ද. ...පෙ... කාය වි ඤ්ඤෙය්‍යං ඵොට්ඨබ්බං පහං දෙවානමින්ද ...පෙ... මනො විඤ්ඤෙය්‍යං ධම්මංපහංදෙවානමින්ද. දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති, එවං වුත්තෙ සක්කො දෙවානමින්දො භගවන්තං, එතදවොච. ඉමස්ස ඛො අහං භන්තෙ භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවංවිත්ථාරෙන අත්ථං ආජානාමි, යථාරූපං භන්තෙ චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලාධම්මා පරිහායන්ති. එවරූපං චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපංන සෙවිතබ්බං යථා රූපංචඛො භන්තෙ චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං සෙවතො අකුසලාධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. එවරූපං චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං සෙවිතබ්බං.

නිදුකානන් වහන්ස, කෙසේ පිළිපදින්නාවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රිය සංවරය පිණිස පිළිපන්නේවේදැයි කියායි. දෙවේන්ද්‍රය, මම ඇසින් බලා දත යුතුවූ රූපය දෙපරිද්දකින් කියමි. සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන මේයි. දෙවේන්ද්‍රය කණින් අසා දතයුතුවූ ශබ්දයද, පෙරසේ දතයුතුයි. දෙවේන්ද්‍රය නාසයෙන් ආඝ්‍රාණය කොට දතයුතුවූ ගන්ධයද, දෙවේන්ද්‍රය දිවෙන් ආස්වාදනය කොට දතයුතුවූ රසයද, දෙවේන්ද්‍රය කයෙන් ස්පර්ශකොට දතයුතුවූ ස්පර්ශයද, දෙවේන්ද්‍රය සිතෙන් පරීක්ෂාකොටබලා දතයුතුවූ ධර්මයද දෙපරිද්දෙන් කියමි, සෙවනය කටයුත්තද සෙවනය නොකටයුත්තද යන මේයයි වදාළේය. මෙසේ වදාළ කල්හි ශක්‍රදෙවේන්ද්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ වක්ෂ්‍යමාන කාරණය ප්‍රකාශකළේය. ස්වාමීනි භාග්‍යවතුන්වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණලද මේ ධර්මයාගේ අර්ථය මම විස්තර වශයෙන් දනිමි. කෙසේද ස්වාමීන් වහන්ස, යම්බඳුවූ චක්ෂුර්විඥෙයවූ රූපයක් සෙවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද කුශලධර්මයෝ පිරිහෙත්ද, මෙබඳුවූ චක්ෂුර්විඥෙයවූ රූපය සෙවනය නොකටයුතුයි. ස්වාමීනි යම්බඳුවූ චක්ෂුර්විඥෙය රූපයක් සෙවනය කරන්නහුගේ අකුශලධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද මෙබඳු චක්ෂුර්විඥෙය රූපය සෙවනය කටයුතුයි.

යථා රූපඤ්චඛො භන්තෙ සොතවිඤ්ඤෙය්‍යං සද්දංසෙවතො…පෙ…ඝාණ විඤ්ඤෙය්‍යං ගන්ධං සෙවතො—පෙ—ජිව්හාවිඤ්ඤෙය්‍යං රසං සෙවතො…පෙ…කායවිඤ්ඤෙය්‍යං ඵොට්ඨබ්බං සෙවතො…පෙ…මනොවිඤ්ඤෙය්‍යං ධම්මං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලාධම්මා පරිහායන්ති. එවරූපො මනොවිඤ්ඤෙය්‍යො ධම්මො න සෙවිතබ්බො. යථාරූපඤ්චඛො භන්තෙ මනොවිඤ්ඤෙය්‍යං ධම්මං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්ති එවරූපො මනොවිඤ්ඤෙය්‍යො . ධම්මො සෙවිතබ්බො. ඉමස්ස ඛො මෙ භන්තෙ. භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානතො. තිණ්ණා මෙත්ථ. කංඛා විගතා කථංකථී භගවතො පඤ්හවෙය්‍යා කරණං සුත්වාති.

6. ඉතිහ සක්කො දෙවානමින්දො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා, භගවන්තං උත්තරිං පඤ්හං අපුච්ඡි.

---

ස්වාමීනි යම් බඳුවූ ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයක් සෙවනය කරන්නහුගේ, ඝ්‍රාණවිඥෙයවූ ගන්ධයක් සෙවනය කරන්නහුගේ, ජිහ්වාවිඥෙයවූ රසයක් සෙවනය කරන්නහුගේ, කායවිඥෙයවූ පහසක් සෙවනය කරන්නහුගේ, මනොවිඥෙයවූ ධර්මයක් සෙවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශලධර්මයෝ පිරිහෙත්ද මෙබඳු මනොවිඥෙය ධර්මය තෙමෙ සෙවනය නොකටයුතුයි. විස්තරය පෙරමෙන් දතයුතුයි. ස්වාමීන්වහන්ස යම් බඳුවූම මනොවිඥෙය ධර්මයක් සෙවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද කුශලධර්මයෝ වැඩෙත්ද, මෙබඳු මනොවිඥෙය ධර්මය සෙවනය කටයුතුය කියාය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණලද්දාවූ මේ ධර්මයාගේ අර්ථ විස්තරයෙන් දන්නාවූ මාවිසින් මෙහිදී භාග්‍යවතුන්වහන්සේගේ ප්‍රශ්න විසඳීම අසා කාංක්ෂාව බැහැරකරණලදී. කෙසේ කෙසේදැයි පැවති සැකය පහවූවායයි ප්‍රකාශකළේය.

6. මෙසේ මෙහි ශක්‍ර දෙවෙන්ද්‍රතෙමෙ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේගෙන් මත්තෙහිත් ප්‍රශ්න විචාළේය.

සබ්බෙවනුඛොමාරිස සමණබ්‍රාහ්මණා එකන්තවාදා එකන්තසීලා එක
න්තච්ඡන්දා එකන්ත අජ්ඣොසානාති. නඛො දෙවානමින්ද සබ්බෙ සමණ
බ්‍රාහ්මණා එකන්තවාදා එකන්තසීලා එකන්තච්ඡන්දා එකන්ත අජ්ඣොසා
සානාති. කස්මාපනමාරිස න සබ්බෙසමණ බ්‍රාහ්මණා, එකන්තවාදා එක
න්තසීලා එකන්තච්ඡන්දා එකන්ත අජ්ඣොසානාති. අනෙකධාතු නානා
ධාතුඛො දෙවානමින්ද ලොකො. තස්මිං අනෙක ධාතු නානා ධාතුස්මිං
ලොකෙ යං යදෙව. සත්තා ධාතුං අභිනිවිසන්ති තං තදෙව. ථාමසා
පරාමස්ස අභිනිවිස්ස වොහරන්ති. ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති.
තස්මා න සබ්බෙ සමණා බ්‍රාහ්මණ එකන්තවාදා එකන්තසීලා එකන්ත
ච්ඡන්දා එකන්ත අජ්ඣොසානාති. සබ්බෙවනුඛො මාරිස සමණබ්‍රාහ්මණා
අච්චන්තනිට්ඨා අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී, අච්චන්ත
පරියොසානාති.

---

නිදුකානන් වහන්ස. සියලුම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ එකවාද ඇත්
තාහුද, එක ආචාර ඇත්තාහුද, එකකෙළවර ඇත්තාහුද ?
දෙවේන්‍ද්‍රය සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝම එකවාද ඇත්තෝද එක
ආචාර ඇත්තෝද එක කෙළවර ඇත්තෝද නොවෙත්මයයි
වදාළේය. නිදුකානන් වහන්ස, කවරහෙයකින් වනාහි සියලු
ශ්‍රමණබ්‍රාහ්මණයෝම එකවාද ඇත්තෝ එක ආචාර ඇත්තෝ
එක කෙළවර ඇත්තෝ නොවෙත්ද ? දෙවේන්‍ද්‍රය ලොකසත්‍ව
තෙමේ අනෙක අදහස් නොයෙක් අදහස් ඇත්තේමය. ඒ
අනෙක අදහස් නොයෙක් අදහස් ඇති ලොකයෙහි සත්‍වයෝ
යම් යම් අදහසක් ගණිද්ද, ඒ ඒ අදහසම ශක්තියෙන් පරාමර්ශ
ණයකොට මනාකොටගෙණ කියත්ද. කෙසේද මේ අපගේ වචනයම
සත්‍යයි. අන්‍යයන්ගේ වචනය තුච්ඡය කියායි. එහෙයින් සියලුම
ශ්‍රමණ බ්‍රාහ්මණයෝ එකවාද ඇත්තෝද එකආචාර ඇත්තෝද
එකකෙළවර ඇත්තෝද නොවෙත්යයි වදාළේය. නිදුකානන්වහන්
ස, සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝම අත්‍යන්ත නිෂ්ඨාව ඇත්තෝද අත්‍ය
න්තවූ යොගක්ෂෙම සඞ්ඛ්‍යාත නිර්වාණය ඇත්තෝද? අත්‍යන්ත
බඹසර ඇත්තෝද අත්‍යන්ත අවශානය ඇත්තෝද?

නඛො දෙවානමින්ද සබ්බෙ සමණ බ්‍රාහ්මණා අච්චන්තනිට්ඨා අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්ත පරියොසානාති. කස්මා පන මාරිස න සබ්බෙ සමණ බ්‍රාහ්මණා අච්චන්තනිට්ඨා අච්චන්තයොගක්ඛෙමී. අච්චන්තබ්‍රහ්මචාරී. අච්චන්ත පරියොසානාති. යෙඛො තෙ දෙවානමින්ද, සමණබ්‍රාහ්මණා තණ්හා සංඛය විමුත්තා තෙ අච්චන්තනිට්ඨා අච්චන්ත යොගක්ඛෙමී අච්චන්ත බ්‍රහ්මචාරී අච්චන්තපරියොසානා, තස්මා න සබ්බෙසමණබ්‍රාහ්මණා අච්චන්තනිට්ඨා අච්චන්තයොගක්ඛෙමී. අච්චන්තබ්‍රාහ්මචාරී, අච්චන්ත පරියොසානාති. ඉත්ථං භගවා සක්කස්ස දෙවානමින්දස්ස පඤ්හං පුට්ඨො ව්‍යාකාසි. අත්තමනො සක්කො දෙවානමින්දො භගවතො භාසිතං. අභිනන්දි අනුමොදි. එවමෙතං භගවා එවමෙතං සුගත තිණ්ණා මෙත්ථ කංඛා විගතා කථංකථා භගවතො පඤ්හවෙය්‍යාකරණං සුත්වාති.

---

දෙවෙන්ද්‍රය සියලු ශ්‍රමණබ්‍රාහ්මණයෝ විනාශය ඉක්මෙව්වාවූ නිෂ්ඨා ඇත්තෝද, අත්‍යන්ත යොගක්ෂෙම සඞ්ඛ්‍යාත නිර්වාණය ඇත්තෝ අත්‍යන්ත බඹසර ඇත්තෝ අත්‍යන්ත කෙළවර ඇත්තෝ නොවෙත් මයයි වදාළේය. නිදුකාණන් වහන්ස කවරහෙයකින් සියලු මහණබමුණෝ අත්‍යන්තනිට්ඨා ඇත්තෝ අත්‍යන්තයොගක්ෂෙම සඞ්ඛ්‍යාත නිර්වාණය ඇත්තෝ අත්‍යන්ත බඹසර ඇත්තෝ අත්‍යන්ත කෙළවර ඇත්තෝ නොවෙත්ද? දෙවෙන්ද්‍රය යම් ඒ මහණබමුණෝ තණ්හා සඞ්ඛය සඞ්ඛ්‍යාත මාර්ගයෙහි හා නිර්වාණයෙහි විමුක්ත වෙත්ද ඔහුතුමු අත්‍යන්තනිට්ඨා ඇත්තෝ අත්‍යන්තයොගක්ෂෙම ඇත්තෝ අත්‍යන්ත බඹසර ඇත්තෝ අත්‍යන්ත කෙළවර ඇත්තෝ වෙත්. එහෙයින් සියලු මහණබමුණෝම අත්‍යන්ත නිෂ්ඨා ඇත්තෝ අත්‍යන්තයොගක්ෂෙම ඇත්තෝ අත්‍යන්තබඹසර ඇත්තෝ අත්‍යන්ත කෙළවරඇත්තෝ නොවෙත්යයි වදාළේය. මෙසේ භාග්‍යවතුන්වහන්සේ ශක්‍ර දෙවෙන්ද්‍රයන්විසින් ප්‍රශ්න පිළිවිස්නාලද්දේ ප්‍රකාශකළේය. සතුටුසිත් ඇත්තාවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයසතුටින් පිළිගත්තේය. අනුමෝදන්වූයේය. කෙසේද භාග්‍යවතුන්වහන්ස මේ මෙසේය. සුගතයන්වහන්ස, මේ මෙසේය. මෙහි භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීම අසා මාගේ කාංක්‍ෂාව බැහැර කරණලදි. කෙසේ කෙසේදැයි පැවති සැක දුරුවාවූවායයි ප්‍රකාශ කෙළේය.

7. ඉතිහ සක්කො දේවමින්දො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං එතදවොච. එජා භන්තෙ රොගො එජා ගණ්ඩො එජා සල්ලං එජා ඉමං පුරිසං පරිකඩ්ඪති. තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා. තස්මා අයං පුරිසො උච්චාවචමාපජ්ජති. යෙසාහං භන්තෙ පඤ්හානං ඉතො බහිද්ධා අඤ්ඤෙසු සමණ බ්‍රහ්මණෙසු ඔකාසකම්මම්පි නා ලත්ථං තෙ මෙ භගවතා ව්‍යාකතා දීඝරත්තානුසයිතො. යඤ්චපනමෙ විචිකිච්ඡා කථංකථා සල්ලං තඤ්ච භගවතා අබ්බූළ්හන්ති. අභිජනාති නොත්වං දෙවානමින්ද ඉමෙ පඤ්හෙ අඤ්ඤෙ සමණ බ්‍රාහ්මණෙ පුච්ඡිතාති. අභිජානාමහං භන්තෙ ඉමෙපඤ්හෙ අඤ්ඤෙ සමණ බ්‍රාහ්මණෙ පුච්ඡිතාති. යථාකථම්පන මෙ දෙවානමින්ද ව්‍යාකංසු සචෙතෙ අගරු භාසස්සූති.

7. මෙසේ ඉමහි ශක්‍ර දෙවේන්ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය මුදුනෙන් පිළිගෙණ අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේට මේවක්‍ෂ්‍යමාන කාරණය සැලකෙළේය. ස්වාමින්වහන්ස චලනාර්ථයෙන් රොගයවේ. තෘෂ්ණාතොමෝ ඇතුළත ප්‍රදුෂ්‍ය කිරීම් අර්ථයෙන් ගණ්ඩයවේ තෘෂ්ණාතොමෝ ඇතුළත ප්‍රවෙශවීම් අර්ථයෙන් උලක් වේ. තෘෂ්ණාතොමෝ මේ පුරුෂයා ඒ ඒ භවයාගේ නිපදවීම පිණිස පරිකර්ෂණය කෙරේ (අදී) එහෙයින් මේ පුරුෂ තෙමේ උසස් බවට හා නීච බවට පැමිණේ. ස්වාමින් වහන්ස යම් බඳු ප්‍රශ්නයන් සම්බන්ධව මෙයින් පිට අන්‍යවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් විෂයෙහිදී මම අවකාශ මාත්‍රයක්හුත් නොලද්දෙම්ද. ඒ ප්‍රශ්නයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බොහෝ කලක් පසුතැවිලිවූවට ප්‍රකාශකරණ ලද්දාහ මාගේ යම් බඳුවූ විචිකිච්ඡා සඞ්ඛ්‍යාත කෙසේ කෙසේදැයි පැවති සැකනැමති හුලක්වූයේ නම් භාග්‍යවතුන් වහන්සේ විසින් එයද උදුරණලද්දේ යයි සැළකෙළේය. දෙවෙන්ද්‍රය මේ ප්‍රශ්න අන්‍යවූ මහණබමුණන් පිළිවිසිහුයයි උඹදන්නෙහිද? ස්වාමීන් වහන්ස මේ ප්‍රශ්න අන්‍යවූ මහණබමුණන් පිළිවිස්සෙම්යයි මම දනිමි. දෙවෙන්ද්‍රය කෙසේනම් ඔවුහු ප්‍රකාශ කළාහුද. ඉදින් තොපට ගිරිහැර නැත්නම් කියවයි වදාළේය.

න බොමෙ භන්තෙ ගරුයථස්ස භගවා නිසින්නො භගවන්ත රූපා වාති. තෙනහි දෙවානමින්ද භාසස්සුති. යෙසාහං භන්තෙ මඤ්ඤාමි. සමණ බ්‍රාහ්මණෙ ආරඤ්ඤකාපන්ත සෙනාසනානි. ත්‍යාහං උපසඞ්කමිත්වා ඉමෙ පඤ්හෙ පුච්ඡාමි. තෙ මයා පුට්ඨා න සම්පායන්ති, අසම්පායන්තා. මමංයෙව පටි පුච්ඡන්ති. කො නාමො අයස්මාති, තෙසාහං පුට්ඨො ව්‍යාකරොමි, අහං ඛො මාරිස සක්කො දෙවානමින්දොති. තෙ මමං යෙව උත්තරිං පටිපුච්ඡන්තන්ති. කිංපන ආයස්මා දෙවානමින්ද කම්මං කත්වා ඉමං ඨානං පත්තොති. තෙසාහං යථාසුතං යථා පරියත්තං ධම්මං දෙසෙමි. තෙ තාවතකෙනෙව අත්තමනා හොන්ති. සක්කො ච නො දෙවානමින්දො දිට්ඨො යඤ්චනො අපුච්ඡිම්හා තඤ්ච නො ව්‍යාකාසීති. තෙ අඤ්ඤදත්ථු මමංයෙව සාවකා සංපජ්ජන්ති. නචාහං තෙසං, අහංඛොපන භන්තෙ භගවතො සාවකො සොතාපන්නො අවිනිපාත ධම්මො නියතො, සම්බොධි පරායනොති.

---

ස්වාමීන් වහන්ස යම් තැනෙක්හි භාග්‍යවතුන්වහන්සේ වැඩ උන්සේක් නම් නැතහොත් භාග්‍යවතුන් වහන්සේගේ ස්වරූප ඇත්තෝ හෝ උන්නාහුනම් මට ගිරිහැරයක් නැත. දේවේන්ද්‍රය එසේවීනම් කියවයි වදාළේය. ස්වාමීන් වහන්ස යම් මහණබමුණන් වනවාසීහුයයි කියා හෝ ප්‍රාන්තසෙනාසන ඇත්තෝයයි කියා හෝ මම හඟිම්ද, මම ඔවුන්වෙත පැමිණ මේ ප්‍රශ්නයන් පිළිවිසිමි. මාවිසින් පිළිවිස්නා ලද්දාවූ ඔහුතුමූ අවබෝධය නොකෙරෙත්. අවබෝධය නොකරන්නාහු මාම පිළිවිසිත් කෙසේද ආයුෂ්මත් තෙමේ කවරනම් ඇත්තේදැයිකියාය. මෙසේ පිළිවිස්නාලද්දාවූ මම ඔවුන්ට ප්‍රකාශකරමි. කෙසේද නිදුකාණෙනි මම ශක්‍රදෙවේන්ද්‍රයාය යනුයි. ඔහුතුමූ මත්තෙහින් මා පිළිවිසිත්. ආයුෂ්මත් දෙවෙන්ද්‍ර තෙමේ කවර කර්මයක්කොට මේ ස්ථානයට පැමිණියේදැයි අසත් ඔවුන්ට මම අසනලද පරිදිවූ ඉගෙණගත්නාලද පරිදිවූධර්මය දෙසමි. ඔවුහු එපමණකින්ම සතුටුසිත්ඇත්තෝ වෙත්. කෙසේද, අපවිසින් ශක්‍රදේවේන්ද්‍රතෙමේද දක්නාලද්දේය. අපි යමක් විචාළෙමුනම් එයද අපට ප්‍රකාශකෙළේයයි කියාති. ඔහුතුමූ මාසමීපයටම පැමිණෙත්. මම ඔවුන්ගේ සමීපයට නොපැමිණෙමි. ස්වාමීන්වහන්ස, මමවනාහි සෝවාන්වූ විනිපාතස්වභාව නැත්තාවූ එකාන්තවූ සම්බෝධිය පිහිටකොටඇත්තාවූ බුද්ධශ්‍රාවකයෙක්මි.

අභිජානාසි නො ත්වං දෙවානමින්ද ඉතොපුබ්බෙ එවරූපං වෙද පටිලාභං සොමනස්ස පටිලාභන්ති. අභිජානාම හං භන්තෙ ඉතො පුබ්බෙ එවරූපං වෙද පටිලාභං සොමනස්ස පටිලාභන්ති. යථා කථං පන ත්වං දෙවානමින්ද අභිජානාසි ඉතො පුබ්බෙ එවරූපං වෙදපටිලාභං සොමනස්ස පටිලාභන්ති. භූතපුබ්බං භන්තෙ දෙවා සුරසංගාමො සමුපබ්බුළ්හො අහොසි. තස්මිං ඛොපන භන්තෙ සංගාමෙ දෙවා ජිනිංසු අසුරාපරාජිංසු. තස්ස මය්හං භන්තෙ තං. තං සංගාමං අභිවිජිනිත්වා විජිතසංගාමස්ස එතදහොසි. යාවෙවදානි දිබ්බා ඔජා යාව අසුර ඔජා උභයමෙතං දෙවා පරිභුඤ්ජිස්සන්තීති. යොඛො පන මෙ භන්තෙ වෙදපටිලාභො සොමනස්ස පටිලාභො. සදණ්ඩා වචරෙ සසත්ථා වචරෙ න නිබ්බිදාය. නාවිරාගාය

---

තුෂ්ප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභය උඹ දන්නෙහිදැයි ඇසීය ස්වාමීන්වහන්ස මෙයින්පෙර මෙබඳුවූ තුෂ්ටිප්‍රතිලාභයක්හා සොම්නස් ප්‍රතිලාභයක් මම දනිමි. දෙවේන්ද්‍රය මෙයින්පෙර මෙබඳුවූ තුෂ්ටිප්‍රතිලාභයක් හෝ සොම්නස් ප්‍රතිලාභයක් උඹ ඒ කෙසේනම් දන්නෙහිද? ස්වාමීනි, පෙරකාලයෙහි දෙවියන්ගේහා අසුරයන්ගේ යුද්ධයක් පැමිණියේය. ස්වාමීනි ඒ යුද්ධයෙහිදී දෙවියෝ දිනූහ. අසුරයෝ පරාජයවූහ. ස්වාමීනි, ඒ විශෙෂයෙන් දිනනලද යුද්ධ ඇති ඒ මට මේ සිතවිය. දැන් යම්බඳුවූ දිව්‍යඖජසක් වේද, යම්බඳුවූ අසුරඖජසකුත්වේද මේ දෙකොටසම දෙවියෝ පරිභොගකරන්නාහුයයි කියායි. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේගේ ධර්මය අසා මාගේ යම්බඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයහෝ සොම්නස් ප්‍රතිලාභයක් වේද, ස්වාමීන්වහන්ස, යම්බඳුවූම මාගේ දණ්ඩාවරණ (දඬුගෙණහැසිරීම්) සහිතවූ ශස්ත්‍රාවචරණ (ආවුධගෙණ හැසිරීම) සහිතවූ තුෂ්ටිප්‍රතිලාභයක් හෝ සොම්නස් ප්‍රතිලාභයක් වේද එය සසර කලකිරීම පිණිස නොපවතී. විරාගය පිණිස නොපවතී.

න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බාණා-
ය සංවත්තන්ති. සො ඛො පන මෙ අයං භන්තෙ භගවතො ධම්මං සුත්වා
වෙදපටිලාභො සොමනස්සපටිලාභො සො අදණ්ඩාවචරො අසත්ථා-
වචරො එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය
සම්බොධාය නිබ්බාණාය සංවත්තතීති.

8. කිං පන ත්වං දෙවානමින්ද අත්ථවසං සම්පස්සමානො එවරූපං
වෙදපටිලාභං සොමනස්සපටිලාභං පවෙදෙසීති. ඡබො අහං භන්තෙ
අත්ථවසෙ සම්පස්සමානො එවරූපං වෙදපටිලාභං සොමනස්සපටි-
ලාභං පවෙදෙමීති.

ඉධෙව තිට්ඨමානස්ස දෙවභූතස්ස මෙ සතො,
පුනරායුච මෙ ලද්ධො එවං ජානාහි මාරිසාති.

ඉමං ඛො අහං භන්තෙ පඨමං අත්ථවසං සම්පස්සමානො එවරූපං වෙද
පටිලාභං සොමනස්සපටිලාභං පවෙදෙමි.

---

නිරුද්ධිය පිණිස නොපවතී. ක්ලේශව්‍යුපසමය පිණිස නොපවතී.
විශිෂ්ඨඥානයෙන් දැනගැණීම පිණිස නොපවතී. සම්‍යක් සම්බොධිය
පිණිස නොපවතී.නිර්‍වාණය පිණිස නොපවතී. ඒ දණ්ඩාවචරණ
රහිතවූයේ සත්ථාවචරණ රහිතවූයේ එකාන්තයෙන් සසර කළ
කිරීමපිණිස විරාගයපිණිස නිරොධයපිණිස ක්ලේශව්‍යුපසමය පිණිස
විසෙසා දැනගැණීම පිණිස සම්බොධිය පිණිසනිර්‍වාණය පිණිස
පවතීයයි ප්‍රකාශකෙළේය.

8. දෙවෙන්ද්‍රය උඹ කවරනම් කාරණයක් දක්නේ මෙබඳුවූ තුෂ්ටි
ප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් විඳින්නෙහිදැයි ඇසූසේක.
ස්වාමින්වහන්ස, මම කාරණා හයක්ම දක්නේ මෙබඳුවූ තුෂ්ටිප්‍රති
ලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් විඳිමි. ප්‍රකාශකෙළේය. මේ අවකා
ශයෙහිම සිටින්නාවූ දෙව්වූ මාවිසින් නැවත ජීවිතයද ලබනලදී.
නිදුකානන්වහන්ස මෙසේ දැන වදාළමැනවි. ස්වාමිනි මේ ප්‍රථම
කාරණය බලන්නාවූ මම මෙබඳුවූ තුෂ්ටිප්‍රතිලාභයක් හෝ සොම්නස්
ප්‍රතිලාභයක් විඳිමි. සැලකෙළේය.

චුතාහං දිබ්බා කායා ආයුං හිත්වා අමානුසං,
අමූළ්හො ගබ්භමිස්සාමි යත්ථ මෙ රමතී මනොති.

ඉමං ඛො අහං භන්තෙ දුතියං අත්ථවසං සම්පස්සමානො එවරූපං වෙදපටිලාභං සොමනස්ස පටිලාභං පවෙදෙමි.

සොහං අමූළ්හපඤ්ඤස්සු විහරං සාසනෙ රතො,
ඤායෙන විහරිස්සාමි සම්පජානො පටිස්සතොති.

ඉමං ඛො අහං භන්තෙ තතියං අත්ථවසං සම්පස්සමානො එවරූපං වෙදපටිලාභං සොමනස්ස පටිලාභං පවෙදෙමි.

ඤායෙනච මෙ චරතො සම්බොධි චෙ භවිස්සති,
අඤ්ඤාතා විහරිස්සාමි සෙවච අන්තො භවිස්සතීති.

ඉමං ඛො අහං භන්තෙ චතුත්ථං අත්ථවසං සම්පස්සමානො එවරූපං වෙදපටිලාභං සොමනස්ස පටිලාභං පවෙදෙමි.

චුතාහං මානුසා කායා ආයුං හිත්වාන මානුසං,
පුන දෙවො භවිස්සාමි දෙව ලොකස්මිං උත්තමොති.

---

මම දිව්‍යායුෂ හැර දිව්‍යලොකයෙන් චුතවූයෙම් මුළානොව යම් ක්ෂත්‍රියාදි කුලයෙක්හි සිත ඇලේනම් එහි ගර්භෝත්පත්තියට පැමිණෙන්නෙමි. ස්වාමීනි මේදෙවෙනි කාරණය බලන්නාවූ මම මෙබඳුවූ තුෂ්ටි ප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශකරමි. ඒ මම මුළානොවූ ප්‍රඥාඇත්තෙම් ශාසනයෙහිඇලී වාසයකරමින් සම්‍යක්ප්‍රඥාඇත්තෙම් සිහිඇත්තෙම් න්‍යායක්‍රමයෙන් වාසයකරන්නෙමි. ස්වාමීනි මේතුන්වෙනි කාරණය බලන්නාවූ මම මෙබඳුවූ තුෂ්ටිප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශකරමි. න්‍යායක්‍රමයෙන් හැසිරෙන්නාවූ මට සම්‍යක් සම්බෝධිය ශකෘදාගාමි මාර්ගය වන්නේනම් දැනගණු කැමතිව වාසයකරන්නෙමි. ඒ මනුෂ්‍යලොකයෙහි මාගේ කෙළවර වන්නේය. ස්වාමීනි මේ සිව්වෙනි කාරණය බලන්නාවූ මම මෙබඳුවූ තුෂ්ටිප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශකරමි. මම මනුෂ්‍යයන් සම්බන්ධ ආයුෂ හැර මනුෂ්‍යලොකයෙන් චුතවූයෙම් නැවත දිව්‍යලොකයෙහි උත්තමවූ දෙවියෙක් වන්නෙමි.

ඉමං ඛො අහං භන්තෙ පඤ්චමං අත්ථවසං සම්පස්සමානො එවරූපං වෙදපටිලාභං සොමනස්සපටිලාභං පවෙදෙමි.

තෙ පණීතතරා දෙවා අකනිට්ඨා යසස්සිනො,
අන්තිමෙ වත්තමානම්හි සො නිවාසො භවිස්සතීති.

ඉමං ඛො අහං භන්තෙ ඡට්ඨං අත්ථවසං සම්පස්සමානො එවරූපං වෙදපටිලාභං සොමනස්සපටිලාභං පවෙදෙමි. ඉමෙ ඛො අහං භන්තෙ ඡ අත්ථවසෙ සම්පස්සමානො එවරූපං වෙදපටිලාභං සොමනස්සපටිලාභං පවෙදෙමි.

9. අපරියොසිතසංකප්පො විචිකිච්ඡී කථංකථී
විචරිං දීඝමද්ධානං අන්වෙසන්තො තථාගතං.
යස්සු මඤ්ඤාමි සමණෙ පවිවිත්තවිහාරිනො
සම්බුද්ධා ඉති මඤ්ඤානො ගච්ඡාමි තෙ උපාසිතුං.
කථං ආරාධනා හොති කථං හොති විරාධනා
ඉති පුට්ඨා න සම්පායන්ති මග්ගෙ පටිපදාසු ච.

---

ස්වාමීනි මේ පස්වෙනි කාරණය දක්නාවූ මම මෙබඳුවූ තුෂ්ටිප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශකරමි. කීර්තිඇත්තාවූ අතිශයින් ප්‍රණීතවූ අකනිට්ඨ බඹලෙව්වාසීවූ ප්‍රසිද්ධ දෙවියෝ වෙත්ද, අන්තිම භවය පවත්නා කල්හි ඒ නිවාසස්ථානය වන්නේය. ස්වාමීනි මේ සවෙනි කාරණය බලන්නාවූ මම මෙබඳුවූ තුෂ්ටිප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශකරමි. ස්වාමීන්වහන්ස, මේ කාරණා සය දක්නාවූ මම මෙබඳුවූ තුෂ්ටිප්‍රතිලාභයක් සොම්නස් ප්‍රතිලාභයක් ප්‍රකාශකරමි.

9. නිමනොකරණලද මනොරථ ඇත්තේ විචිකිච්ඡා ඇත්තේ කෙසේ කෙසේදැයි පැවති සැක ඇත්තේ තථාගතයන්වහන්සේ සොයමින් බොහෝ කලක්හැසුරුණෙක්වෙමි. යම් ශ්‍රමණයන් ප්‍රකතියෙන් විවෙක විහරණ ඇත්තාවුන්කොට හඟිම්ද සම්බුද්ධයයි සිතමින් උන්වහන්සේලා උපාසනයකරන්ටයමි. මාර්ගයෙහි හෝ ප්‍රතිපදාවන්හි කෙසේ සම්පාදනයවේද, කෙසේ අසම්පාදනය වේදැයි මෙසේ පිළිවිස්සාලැබූ ඔව්හු සම්පාදනයකොට කියන්ට නොහැකිවෙත්.

තස්සාසු යදමිං ජානන්ති සකෙකා දෙවානං මාගධො
තස්සාසු මමෙවං පුච්ඡන්ති. කිං කත්වා පාපුණී ඉදං.

තෙසං යථා සුතං ධම්මං දෙසයාමි ජනෙසුතං
තෙනස්සන්තාමනා හොන්ති දිට්ඨො නො වාසවොතිච

යදාච බුද්ධං අද්දක්ඛිං විචිකිච්ඡාවිතාරණං,
සොම්හිවීතභයො අජ්ජ සම්බුද්ධං පයිරුපාසිය.

තණ්හාසල්ලස්ස හන්තාරං බුද්ධං අප්පටි පුග්ගලං
අහං වන්දෙ මහාවීරං බුද්ධමාදිච්චබන්ධුනං.

යං කරෙමසෙ බ්‍රහ්මුනො සමං දෙවෙහි මාරිස
තදජ්ජ තුය්හං කස්සාම හන්ද සාමං කාරෙම තෙ.

තුවමෙවසි සම් බුද්ධො තුවං සත්ථා අනුත්තරෙ.
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි තෙ පටිපුග්ගලොති

දෙවියන්ගේසමීපයට ශක්‍රතෙමේපැමිණියේයයි ඔහුතුමූ යම්කලෙක්හි මාද්‍රනාගණිත්ද,කුමක්කොටමිට පැමුණුනෙහිදැයි ඔහුතුමූමාමවිචාරත් ඔවුන්ට ජනයා කෙරෙහි ප්‍රසිද්ධවූ ධර්‍මය ඇසුපරිද්දෙන් ප්‍රකාශ කරමි. එයින් හෝ අප විසින් ශක්‍ර තෙමේ දක්නාලද්දේයයි කියාද ඔවුහු සතුටුසිත් ඇත්තෝවෙත්. යම් කාලෙක්හි මම විචිකිච්ඡාවත් දුරුකලාවූ බුදුරජානන් වහන්සේ දුටුයෙම්ද ඒ මම අද සර්‍වඥයන් වහන්සේ පර්‍ය්‍යුපාසනයකොට පහවූ භය ඇත්තෙක්වෙමි. තෘෂ්ණා නැමති හුල නැසුවාවූ ප්‍රතිපුද්ගලයෙක් නැතිහෙයින් අප්‍රතිපුද්ගලවූ බුදුරජානන්වහන්සේ මම වඳින්නෙමි. සූර්‍ය්‍යබන්ධුවූ මහාවීරයන්වහන්සේ වඳිමි. නිදුකානන් වහන්ස දෙවියන් සමග බ්‍රහ්මයාට අපි යම් නමස්කාරයක් කෙලෙමුද, ඒ නමස්කාරය අද නුඹ වහන්සේට කරමු. එබැවින් තුමූම නුඹවහන්සේට නමස්කාර කරමු. නුඹවහන්සේම සම්බුද්ධ වෙහිය. නුඹවහන්සේ නිරුත්තරවූ ශාස්තෘය. දෙවියන් සහිතවූ ලොකයෙහි නුඹවහන්සේට ප්‍රතිපුද්ගලයෙක් නැත්තේය.

10. අථඛො සක්කො දෙවානමින්දො පඤ්චසිඛං ගන්ධබ්බපුත්තං ආමන්තෙසි, බහූපකාරො ඛො මෙ ත්වං තාත පඤ්චසිඛ, යං ත්වං භගවන්තං පඨමං පසාදෙසි, තයා තාත පඨමං පසාදිතං පච්ඡා මයං භගවන්තං දස්සනාය උපසංකමිම්හ. අරහන්තං සම්මාසම්බුද්ධං පෙත්තිකෙ ඨානෙ ඨපයිස්සාමි. ගන්ධබ්බරාජා භවිස්සසි. භද්දඤ්ච තෙ සුරියවච්චසං දම්මි. සා හි තෙ අභිපත්ථිතාති. අථඛො සක්කො දෙවානමින්දො, පාණිනා පඨවිං පරාමසිත්වා තික්ඛත්තුං උදානං උදානෙසි, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස, නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්සාති. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සක්කස්ස දෙවානමින්දස්ස විරජං වීතමලං ධම්මක්ඛුං උදපාදි යං කිඤ්චි සම්මුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.

10. ඉක්බිත්තෙන් ශක්‍ර දෙවෙන්ද්‍රතෙමේ පඤ්චශිඛනම් ගන්ධර්වපුත්‍රයා ඇමතුයේය, දරුව පඤ්චශිඛය උඹ මට බොහෝ උපකාර ඇත්තෙහිමය. යම් හෙයකින් උඹ භාග්‍යවතුන් වහන්සේ පළමුකොට පැහැදෙව්වෙහිද එහෙයිනි, දරුව තා විසින් පළමුකොට පහදිනලද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ දක්මට අපි පසුව එළඹියෙමු. පියතනතුරෙහි තබන්නෙමි. උඹ ගන්ධර්ව රාජවන්නෙහිය. සූර්‍ය්‍ය මණ්ඩලයක් වැනි ශරීර කාන්තියඇති භද්‍රාවන් උඹට දෙමි. ඕතොමෝ වනාහි උඹ විසින් විශෙෂයෙන් පතනලද්දීයයි කීය. ඉක්බිත්තෙන් ශක්‍ර දෙවෙන්ද්‍රතෙමේ අතින් පෘථිවිය පරාමර්ශනය කොට තුන්යලක් උදන් ඇණුයේය. කෙසේද, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාරවේවා, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුයන් වහන්සේට නමස්කාරවේවා, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන්වහන්සේට නමස්කාරවේවාකියායි. මේ ව්‍යාකරණ ධර්මය කියනු ලබන කල්හි ශක්‍රදෙවෙන්ද්‍රයාට රාගාදිරජස් රහිතවූ පහවූමලඇති ධර්මචක්ෂුස උපන. කෙසේද. සමුදය ස්වභාවවූ යම්කිසිවක් වේනම් ඒ සියල්ල නිරොධස්වභාව ඇතැයි කියායි.

අඤ්ඤෙසඤ්ච අසීතියා දෙවතා සහස්සානං. ඉතිහ සක්කෙන දෙවානමින්දෙන අජ්ඣිට්ඨා පඤ්හා පුට්ඨා තෙ භගවතා ව්‍යාකතා. තස්මා ඉමස්ස වෙය්‍යාකරණස්ස සක්කපඤ්හාත්වෙව අධිවචනන්ති.

සක්කපඤ්හ සුත්තං නිට්ඨිතං.

එකවීසතිමං.

——o§o——

අන්‍යවූ අසූදහසක් දෙවතාවන්ටද මෙසේ ධර්මචක්ෂුස උපන. මෙසේ මෙහි ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින් ආරාධනා කරණලද්දාවූ යම් ප්‍රශ්නයෝ පිළිවිස්නාලද්දාහුද භාග්‍යවතුන්වහන්සේවිසින් ඒ ප්‍රශ්නයෝ ප්‍රකාශ කරණ ලද්දාහ. එහෙයින් මේ ව්‍යාකරණධර්මයට සක්ක පඤ්හයයි කියාම නාමය වූයේයි.

එක්විසිවන සක්කපඤ්හ සූත්‍රාර්ථව්‍යාඛ්‍යානය මෙතෙකින්

කියා නිමවනලදී.

——o§o——

## XXII. මහාසතිපට්ඨාන සුත්තං.

—— ०१० ——

1. එවමමෙසුතං. එකං සමයං භගවා කුරූසු විහරති කම්මාසස දම්මං නාම කුරූනං නිගමො. තත්‍රඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච. එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථගමාය ඤායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො, ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

---

## මහාසතිපට්ඨාන සූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

—— ०१० ——

1. මාවිසින් මේ සූත්‍රධර්මය මෙසේ අසනලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ කුරුදනව්හි කල්මාසදම්‍ය නම්වූ කුරුදනව් වැස්සන්ගේ නියම්ගමක් වේද, එහි වැඩවාසයකරණසේක. එකල්හිදී භාග්‍යවතුන්වහන්සේ මහණෙනි, කියා භික්ෂූන් අමතාවදාළසේක. ඒ කුරුරටවැසි භික්ෂූහු ස්වාමීන්වහන්ස කියා භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මේ සූත්‍රධර්මය වදාළසේක. මහණෙනි, යම්මේ සතරසතිපට්ඨානධර්මකෙනෙක් වෙත්නම් මේ එකම්මාර්ගයතෙම සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, සෝකකිරීමය වැළපීමය යනාදින්ගේ ඉක්මවීම පිණිසද, කයෙහි හටගන්නා දුක්ය සිතෙහි හටගන්නා දෞම්නසය යන මොවුන්ගේ දුරලීම පිණිස හෙවත් නැසීම පිණිසද, ඥායනම්ලද ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග ධර්මයට පැමිණීම පිණිසද, නිර්වාණය ප්‍රත්‍යක්ෂකිරීම පිණිසද, පවතීයයි වදාළසේක. ඒ සතරසතිපට්ඨාන ධර්මයෝ කවරහුදයත්? මහණෙනි. මේ සස්නෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ සිහිඇත්තේ මේ සිරුරෙහි ලොභයද දෞම්නසද සංසිඳුවා ගෙණ කය අනුව දක්නා ස්වභාව ඇතිව වාසයකෙරේද,

වෙදනාසු වෙදනානුපස්සි විහරති. ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

2. කථඤ්ච භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති. ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතොවා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො සතොව අස්සසති, සතො පස්සසති, දීඝංවා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝංවා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති.

---

වෙදනාවන් කෙරෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යඇත්තේ යහපත් ප්‍රඥාඇත්තේ සිහිඇත්තේ වෙදනාලොකයෙහි ලොභය හා දොම්නස සංසිඳුවාගෙණ වෙදනාවන් අනුව දක්නා සවභාව ඇතිව වාසයකෙරේද සිතෙහි කෙලෙසුන් තවන වීර්‍ය්‍යඇත්තේ සම්‍යක් ප්‍රඥාඇත්තේ සිහිඇත්තේ චිත්තලොකයෙහි ලොභය හා දොම්නස සංසිඳුවාගෙණ සිත අනුව දක්නා සවභාව ඇතිව වාසයකෙරේද, පඤ්චනීවරණාදි ධර්මයන් කෙරෙහි කෙලෙසුන් තවන වීර්‍ය්‍යඇත්තේ සිහිඇත්තේ සම්‍යක් ප්‍රඥාඇත්තේ ධර්මලොකයෙහි ලොභය හා දොම්නස සංසිඳුවාගෙණ ධර්මානුදර්ශනී භාවනාව සිත්හි කරමින් වාසය කෙරෙයි.

2. මහණෙනි, භික්ෂුතෙමේ රූපකායෙහි කායානුපශ්‍යනා භාවනා සිත්හි කරමින් කෙසේනම් වාසයකෙරේද, මහණෙනි, මේ සස්නෙහි මහණතෙමේ අරණ්‍යයකට ගියේ හෝ රුක්මූලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පර්‍ය්‍යඞ්කාභොග කොටගෙණ හෙවත් ඌරුබද්ධාසනයෙන් යුක්තව පූර්ව ශරීරය ඇදනැතිව පිහිටුවාගෙණ සිහිය අභිමුඛකොට පිහිටුවාගෙණ හිඳී ඒ යොගාවචරතෙම සිහිඇත්තේම ආශ්වාස කෙරෙයි. සිහිඇත්තේම ප්‍රාශ්වාස කෙරෙයි. දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ආශ්වාසකරමියි දැනගණී. දීර්ඝකොට ප්‍රාශ්වාසකරන්නේ හෝ දීර්ඝකොට ප්‍රාශ්වාස කරන්නෙමියි දැනගණී.

රස්සංවා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති, රස්සංවා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති, සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො භමකාරො වා භමකාරන්තෙවාසීවා දීඝංවා අඤ්ඡන්තො දීඝං අඤ්ඡාමීති පජානාති, රස්සංවා අඤ්ඡන්තො රස්සං අඤ්ඡාමීති පජානාති, එවමෙව ඛො භික්ඛු දීඝංවා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝංවා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති. රස්සංවා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති රස්සංවා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති.

---

ලුහුඬුකොට ආශ්වාසකරන්නේ හෝ ලුහුඬුකොට ආශ්වාස කරන්නෙමියි දැනගණී. ලුහුඬුකොට ප්‍රාශ්වාසකරන්නේ හෝ ලුහුඬුකොට ප්‍රාශ්වාසකරන්නෙමියි දැනගණී. සියලු කායප්‍රවෘත්තිය විශෙෂයෙන් වැටහී ආශ්වාසය පවත්වමියි සිතා ආසෙවන වශයෙන් අභ්‍යාසකරන්නේය. සියලු කායයාගේ ප්‍රවෘත්තිය විශෙෂයෙන් ප්‍රකාශව වැටහීමෙන් නුවනැසින් දක්නා තැනැත්තේ ප්‍රාශ්වාසකරන්නෙමියි දැන හික්මීමෙන් කායසංස්කාරය සංසිඳුවන්නේය. ආශ්වාස කරන්නෙමියි දැන හික්මීමෙන් අභ්‍යාසකරන්නේය. කායසංස්කාරය සංසිඳුවා වසන තැනැත්තේ එසේ ප්‍රාශ්වාසකරන්නෙමියි දැන හික්මීමෙන් වාසයකරන්නේය. මහණෙනි, දක්‍ෂවූ ලියනවඩුවෙක් හෝ ලියනවඩුවෙකුගේ අතවැස්සෙක් හෝ චක්‍රය දික්කොට අදනේ හෝ දීර්ඝකොට අදනෙමියි කියාද, ලුහුඬුව අදනේ හෝ ලුහුඬුකොට මදමදව අදනෙමියි කියාත් යම්සේ දන්නේවේද, එපරිද්දෙන්ම මහණෙනි, යොගාවචරතෙම දීර්ඝකොට ආශ්වාසකරන්නේ හෝ දීර්ඝකොට ආශ්වාසකරන්නෙමියි දැනගණී. දීර්ඝකොට ප්‍රාශ්වාසකරන්නේ හෝ දීර්ඝකොට ප්‍රාශ්වාසකරන්නෙමියි දැනගණී, ලුහුඬුකොට ආශ්වාස කරන්නේ හෝ ලුහුඬුකොට ආශ්වාසකරන්නෙමියි දැනගණී ලුහුඬුකොට ප්‍රාශ්වාස කරන්නේ හෝ ලුහුඬුකොට ප්‍රාශ්වාස කරන්නෙමි දැනගණී.

සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති—පෙ—ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති, සමුදයවය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාව දෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතො ච විහරති, න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

---

ආශ්වාස ප්‍රාශ්වාස කායයාගේ සියලු ප්‍රවෘත්තිය විශෙෂයෙන් වැටහි ආශ්වාස පවත්මයි සිතා හික්ම කායයාගේ ප්‍රවෘත්තිය නුවනැසින් දක්නා තැනැත්තේ ප්‍රාශ්වාස කරන්නෙමියි දැන හික්ම කායසංස්කාරය සංසිඳුවන්නේය. ආශ්වාසකරමියි දැන හික්මීමෙන් අභ්‍යාස කරන්නේය මහත්වූ කායසංස්කාරය සංසිඳීමෙන් වසන තැනැත්තේ එසේ ප්‍රාශ්වාසකරන්නෙමියි දැන හික් මෙයි සංක්ෂේප කරණලදි මෙසේ තමාගේ කයෙහි හෝ කායානුපස්සනා භාවනාව සිත්හි කරමින් වාසයකරන්නේය. අනුන්ගේ කයෙහි කයපිළිබඳව පැවති කමටහන් සිහිකරමින් වාසයකරන්නේය. අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ කයෙහි කායගතාසති භාවනාව මෙනෙහිකරමින් වාසයකරන්නේය. උත්පත්ති ධර්මයන් දන්නේ හෝ කය සිහිකරමින් වාසයකරන්නේය. විනාශස්වභාව දක්නේ හෝ කය සිහිකරමින් වාසයකරන්නේය. කලෙක උත්පත්තියහා කලෙක විනාශය දක්නේ හෝ කායයාගේ ඉපදීම නැසීම සිහිකරමින් වාසයකරන්නේය. ඒ යොගාවචරයාවිසින් ආශ්වාස ප්‍රාශ්වාස කයඇත්තේය කියා සිහිය පිහිටුවනලද්දේය. යම් සිහියක් එසේ මනාකොට පිහිටුවනලද්දේද, ඒ සිහිය ඥාණාභිවෘද්ධිය පිණිසද, සමෘතියයි කියනලද සිහිය වැඩීම පිණිසද, පවතී ඒ පුද්ගල තෙම තෘෂ්ණා දෘෂ්ටි යන අකුශල යන් දෙදෙනාගෙන් දුරුව වාසයකරන්නේය. සර්වලොකයෙහි කිසි රූපාදියක් ආත්මාදිවශයෙන් වරදවා ගැන්මක් නොකරන්නේය. මහණෙනි, මහණතෙම මෙසේද ආශ්වාස ප්‍රාශ්වාස කයෙහි කායගතාසති භාවනා සිහිකරමින් වාසයකරන්නේය.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛු ගච්ඡන්තොවා ගච්ඡාමීති පජානාති ඨිතොවා ඨිතොම්හීති පජානාති. නිසින්නොවා නිසින්නොම්හීති පජානාති. සයානොවා සයානොම්හීති පජානාති. යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති. සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. සමුදයවය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතොච විහරති.

---

3. නැවතද මහණෙනි, මහණතෙම යන්නේ හෝ යන්නෙමියි සිතා දන්නේය. සිටින්නේ හෝ සිටින්නෙමියි දන්නේය. හුන්නේ හෝ හිඳිනෙමියි දන්නේය. සයනය කරන්නේ හෝ සයනයකරන්නෙමියි දන්නේය. ඔහුගේ කය යම් යම් ඊර්‍යාපථයකින් පිහිටුවනලද්ද, ඒ ඒ ප්‍රකාරයෙන් ඒ ඊර්‍යාපථය දන්නේය. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කායගතාසතිය සිත්හි කරමින් වාසයකරන්නේය. තමාගේ හෝ අනුන්ගේ ශරීරයෙහි කායගතාසතිය සිත්හි කරමින් වාසයකරන්නේය. උත්පත්තික්‍රමවශයෙන් දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. විනාශක්‍රම වශයෙන් දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. උත්පත්ති විනාශක්‍රම වශයෙන් දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. ඒ යොගාවචරයාහට කය ඇත්තේයයි සිහිය පිහිටුවනලද්දේය. යම් සිහියෙක් එසේ මනාකොට පිහිටුවනලද්ද, ඒ සිහිය මිතුමත්තෙහි ඤාණයාගේ වැඩීම පිණිසද, ස්මෘතියගේ වැඩීම පිණිසද, අනිශ්‍රිතව හෙවත් තෘෂ්ණා දෘෂ්ටි යන අකුශලයන් දෙදෙනාගෙන් දුරුව වාසයකෙරේ.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛු ගච්ඡන්තොවා ගච්ඡාමීති පජානාති ඨිතොවා ඨිතොම්හීති පජානාති. නිසින්නොවා නිසින්නොම්හීති පජානාති. සයානොවා සයානොම්හීති පජානාති. යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති. සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. සමුදයවය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතොච විහරති.

---

3. නැවතද මහණෙනි, මහණතෙම යන්නේ හෝ යන්නෙමියි සිගා දන්නේය. සිටින්නේ හෝ සිටින්නෙමියි දන්නේය. හුන්නේ හෝ හිඳිනෙමියි දන්නේය. සයනය කරන්නේ හෝ සයනයකරන්නෙමියි දන්නේය. ඔහුගේ කය යම් යම් ඊර්‍යාපථයකින් පිහිටුවනලද්ද, ඒ ඒ ප්‍රකාරයෙන් ඒ ඊර්‍යාපථය දන්නේය. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කායගතාසතිය සිත්හි කරමින් වාසයකරන්නේය. තමාගේ හෝ අනුන්ගේ ශරීරයෙහි කායගතාසතිය සිත්හි කරමින් වාසයකරන්නේය. උත්පත්තික්‍රමවශයෙන් දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. විනාසක්‍රම වශයෙන් දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. උත්පත්ති විනාසක්‍රම වශයෙන් දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය ඒ යොගාවචරයාහට කය ඇත්තේයයි සිහිය පිහිටුවනලද්දේය. යම් සිහියෙක් එසේ මනාකොට පිහිටුවනලද්ද, ඒ සිහිය මිතුමත්තෙහි ඤාණයාගේ වැඩීම පිණිසද, ස්මෘතියගේ වැඩීම පිණිසද, අනිශ්‍රිතව හෙවත් තෘෂ්ණා දෘෂ්ටි යන අකුශලයන් දෙදෙනාගෙන් දුරුව වාසයකෙරේ.

නාව කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායා-
නුපස්සී විහරති.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්ප
ජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරීහොති
සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරීහොති. සඞ්ඝාටිපත්තචීවරධා
රණෙ සම්පජානකාරීහොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජාන
කාරීහොති. උච්චාර පස්සාව කම්මෙ සම්පජානකාරීහොති. ගතෙ
ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජාන
කාරීහොති. ඉති අජ්ඣත්තංවා කායෙ කායානුපස්සී විහරති.
බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධාවා කායෙ
කායානුපස්සී විහරති.

---

මේ සත්ව ලොකයෙහි කිසි රූපාදියක් වරදවාගැන්මක් නැත්තේය.
මහණෙනි, භික්ෂූතෙම මෙසේ මේ ශරීරයෙහි කායගතාසති භාවනාව
සිත්හි කරමින් වාසයකරන්නේය.

4. නැවතද මහණෙනි, මහණතෙම ඉදිරියට යාමෙහිද ආපසු
කරකැවීමෙහිද ප්‍රඥාවෙන් දැන පරාමර්ශනයකොට කරන්නේය. අභි
මුඛය බැලීමෙහිද අනුදික් බැලීමෙහිද ප්‍රඥාවෙන් දැන මෙසේයයි
බලන්නේය. හස්තපාදයන් හැකිලීමෙහිද දිගුකිරීමෙහිද ප්‍රඥාවෙන්
දැන කරන්නේය. සඞ්ඝාටිපාසිවුරු දැරීමෙහිද ප්‍රඥාවෙන් දැන සැලකී
මෙන් යෙදී වැලඳගන්නේය. අනුභවකිරීමෙහිද පානය කිරීමෙහිද
කෑමෙහිද රසවිඳීමෙහිද නුවණින් දැනසලකා ප්‍රයෝජන විඳින්නේය
මලමූත්‍ර පහකිරීමෙහිද ප්‍රඥාවෙන් දැන ආදීනව සලකා පවත්වන්
නේය යාමෙහිද සිටීමෙහිද හිඳීමෙහිද නිද්‍රාවකිරීම හා නිදි දුරුකිරී
මෙහිද කථාකිරීමෙහිද කථානොකිරීමෙහිද ප්‍රඥාවෙන් දැන ඒ
කෘත්‍යයන් පවත්වන්නේය. මෙසේ තමාගේ ශරීරයෙහි කායානු
පස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. අනුන්ගේ ශරීරයෙහි
හෝ කායානුපස්සනාවෙහි යෙදී වාසයකරන්නේය. තමන්ගේ හෝ
අනුන්ගේ හෝ ශරීරයෙහි කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය
කරන්නේය.

තාව කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායා-
නුපස්සී විහරති.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්ප-
ජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරීහොති
සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරීහොති. සඞ්ඝාටිපත්තචීවරධා-
රණෙ සම්පජානකාරීහොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජාන-
කාරීහොති. උච්චාර පස්සාව කම්මෙ සම්පජානකාරීහොති. ගතෙ
ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජාන-
කාරීහොති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති.
බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා කායෙ
කායානුපස්සී විහරති.

---

මේ සත්ව ලොකයෙහි කිසි රූපාදියක් වරදවාගැන්මක් නැත්තේය.
මහණෙනි, භික්ෂුතෙම මෙසේ මේ ශරීරයෙහි කායගතාසති භාවනාව
සිත්හි කරමින් වාසයකරන්නේය.

4. නැවතද මහණෙනි, මහණතෙම ඉදිරියට යාමෙහිද ආපසු
කරකැවීමෙහිද ප්‍රඥාවෙන් දැන පරාමර්ශනයකොට කරන්නේය. අභි-
මුඛය බැලීමෙහිද අනුදික් බැලීමෙහිද ප්‍රඥාවෙන් දැන මෙසේයයි
බලන්නේය. හස්තපාදයන් හැකිලීමෙහිද දිගුකිරීමෙහිද ප්‍රඥාවෙන්
දැන කරන්නේය. සඞ්ඝාටිපාසිවුරු දැරීමෙහිද ප්‍රඥාවෙන් දැන සැලකී-
මෙන් යෙදී වැලඳගන්නේය. අනුභවකිරීමෙහිද පානයකිරීමෙහිද
කෑමෙහිද රසවිඳීමෙහිද නුවණින් දැනසලකා ප්‍රයෝජන විඳින්නේය
මලමූත්‍ර පහකිරීමෙහිද ප්‍රඥාවෙන් දැන ආදීනව සලකා පවත්වන්-
නේය යාමෙහිද සිටීමෙහිද හිඳීමෙහිද නිද්‍රාවකිරීම හා නිදි දුරුකිරී-
මෙහිද කථාකිරීමෙහිද කථානොකිරීමෙහිද ප්‍රඥාවෙන් දැන ඒ
කෘත්‍යයන් පවත්වන්නේය. මෙසේ තමාගේ ශරීරයෙහි කායානු-
පස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. අනුන්ගේ ශරීරයෙහි
හෝ කායානුපස්සනාවෙහි යෙදී වාසයකරන්නේය. තමන්ගේ හෝ
අනුන්ගේ හෝ ශරීරයෙහි කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය-
කරන්නේය.

සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. වය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදයවය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාව දෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා.

---

උත්පත්තික්‍රමය දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. විනාශයත් අනුව දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. උත්පත්තිහා විනාශක්‍රම දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. ඒ යොගාවචරයාහට කයඇත්තේය කියා සිහිය පිහිටුවන ලද්දේය, යම් ඒ සිහියෙක් එසේ මනාකොට පිහිටුවන ලද්දේද, ඒ සිහිය මත්තුමත්තෙහි ඥාණයාගේ වෘද්ධිය පිණිසද සිහිය වැඩීම පිණිසද පවත්නේ අකුසලින් දුරුව වාසයකරන්නේය. ශරීර ලොකයෙහි කිසි ක්‍රියාවක් ගැන්මක් නොකරන්නේය. මහණෙනි, මහණතෙම මෙසේද, මේ කයෙහි කායගතාසති භාවනාව සිත්හි කරමින් වාසය කරන්නේය.

5. නැවතද මහණෙනි, මහණුතෙම පාදතලයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවරකොටඇති නානාවිධ අසූචීන් පිරිසිටි මෙම සරීරයම සිහි කරන්නේය. මේ සිරුරෙහි මෙ මේ දේ ඇත. කෙශයෝය. ලෝමයෝය. නියපොතුය. දන්තයෝය. සමය, මස්පිඩුය, නහරය, ඇටය, ඇට මිදුලුය, වස්පිඩු දෙකය, හෘදයමාංශයද, මස් පටල දෙකය, දළබුවය, බඩදිවය, පපුමසය, අතුනු වැටිය හෙවත් බඩ වැලය, අන්තගුණ නම්වූ අතුනුබහනය වැලඳු ආහාරය, වර්චසය පිතය, සෙමය, සැරවය, ලෙහෙය ඩහදියය, මේදනම් තෙලය කඳුලුය, වුරුණු තෙලය,

සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. වය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. සමුදයවය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතොච විහරති. නච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා.

---

උත්පත්තික්‍රමය දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. විනාශයන් අනුව දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. උත්පත්තිහා විනාශක්‍රම දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. ඒ යොගාවචරයාහට කයඇත්තේය කියා සිහිය පිහිටුවන ලද්දේය, යම් ඒ සිහියෙක් එසේ මනාකොට පිහිටුවන ලද්දේද, ඒ සිහිය මතුමත්තෙහි ඤාණයාගේ වෘද්ධිය පිණිසද සිහිය වැඩීම පිණිසද පවත්නේ අකුසලින් දුරුව වාසයකරන්නේය. ශරීර ලොකයෙහි කිසි ක්‍රියාවක් ගැන්මක් නොකරන්නේය. මහණෙනි, මහණතෙම මෙසේද, මේ කයෙහි කායානුපස්සනා භාවනාව සිත්හි කරමින් වාසය කරන්නේය.

5. නැවතද මහණෙනි, මහණතෙම පාදතලයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවරකොටඇති නානාවිධ අසූචීන් පිරීසිටි මෙම සරීරයම සිහි කරන්නේය. මේ සිරුරෙහි මේ මේ දේ ඇත. කෙශයෝය. ලොමයෝය. නියපොතුය. දත්තයෝය. සමය, මස්පිඩුය, නහරය, ඇටය, ඇට මිදුලුය, වස්පිඩු දෙකය, හෘදයමාංශයද, මස් පටල දෙකය, දලබුවය, බඩදිවය, පපුමසය, අතුනු වැටිය හෙවත් බඩ වැලය, අන්තගුණ නම්වූ අතුනුබහනය වැලදු ආහාරය, වර්චසය පිතය, සෙමය, සැරවය, ලෙහෙය ඩහදියය, මෙදනම් තෙලය කඳුලුය, වුරුණු තෙලය,

ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ උභතොමුඛා මුතොළී පූරා නානාවිහිතස්ස ධඤ්ඤස්ස සෙය්‍යථීදං, සාලීනං වීහීනං මුග්ගානං මාසානං තිලානං තණ්ඩුලානං. තමෙනං චක්ඛුමා පුරිසො මුඤ්චිත්වා පච්චවෙක්ඛෙය්‍ය ඉමෙ සාලී ඉමෙ වීහී ඉමෙ මුග්ගා ඉමෙ මාසා, ඉමෙ තිලා, ඉමෙ තණ්ඩුලාති, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං, උදරියං, කරීසං, පිත්තං, සෙම්හං, පුබ්බො ලොහිතං. සෙදො මෙදො අස්සු වසා.

කෙළය, මුකුණුය හෙවත් සොටුය, සඳමිදුලුය, මූත්‍රය යන මේ කුණපයෝ මේ ශරීරයෙහි ඇත. මහණෙනි, උඩයටදෙපසින් මුඛදෙකක්ඇත්තාවූ මුතොළියක් නොහොත් මල්ලක් අනෙක ප්‍රකාරවූ ධාන්‍යයන්ගෙන් පුරවනලද්දේවේද ඒ ධාන්‍යයෝ නම් කවරහුද හැල්වීය, මහවීය, මුද්ගයෝය. මෑය තලය සහල්ය යන මේ ධාන්‍යයෝය. ඇස් ඇති පුරුෂයෙක් ඒ ධාන්‍ය පිරූ මල්ල මුදා ඒ හැම ධාන්‍ය බලා මේ මෙපමණ හැල්ය, මේ මෙපමණ මහවීය. මේ මෙපමණ මුංය; මේ මෙපමණ මෑය, මේ මෙපමණ තලය, මේ මෙපමණ සහල්ය කියා ඒ ඒ ධන්‍ය කොඨාසයන්ගේ නාම සඞ්ඛ්‍යාදී වශයෙන් විභාගකොට ප්‍රත්‍යවේක්ෂා කරන්නෙක් යම්සේද ඒ පරිද්දෙන්ම මහණෙනි, මහණ තෙම පාදත්තයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවරකොට ඇති නානාවිධ අසුචි කොටසින් පිරිසිපි මේ ශරීරයම සිහිකරන්නේය. සිරුරෙහි මේදේ ඇත· කෙශයෝය, ලොමයෝය, නියපොතුය, දන්තයෝය, සමය, මස්පිඩුය, නහරය, ඇටය, ඇටමිදුලුය, වකු ගඩුය, හෘදයවස්තුවය, අක්මාවය, දලබුවය, බඩදිවය, පපුගඩුය, අතුනුය, අතුනුබහනය, උදරය මලය, පිතය ශ්ලෙෂ්මාවය, පූයාවය, ලේය, ඩහදියය, මෙදනම් තෙල්ය, කඳුලුය, වුරුණු තෙල්ය

ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ උභතො මුඛා මුතොළී පූරා නානාවිහිතස්ස ධඤ්ඤස්ස සෙය්‍යථීදං, සාලීනං වීහීනං මුග්ගානං මාසානං තිලානං තණ්ඩුලානං. තමෙනං චක්ඛුමා පුරිසො මුඤ්චිත්වා පච්චවෙක්ඛෙය්‍ය ඉමෙ සාලි ඉමෙ වීහී ඉමෙ මුග්ගා ඉමෙ මාසා, ඉමෙ තිලා, ඉමෙ තණ්ඩුලාති, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං, උදරියං, කරීසං, පිත්තං, සෙම්හං, පුබ්බො ලොහිතං. සෙදො, මෙදො, අස්සු වසා.

---

කෙළය, මුකුණුය හෙවත් සොටුය, සඳමිදුලුය, මූත්‍රය යන මේ කුණපයෝ මේ ශරීරයෙහි ඇත. මහණෙනි, උඩයටදෙපසින් මුඛදෙකක්ඇත්තාවූ මුතනාලියක් නොහොත් මල්ලක් අනෙක ප්‍රකාරවූ ධාන්‍යයන්ගෙන් පුරවනලද්දේවේද ඒ ධාන්‍යයෝ නම් කවරහුද හැල්වීය, මහවීය, මුද්ගයෝය, මෑය තලය සහල්ය යන මේ ධාන්‍යයෝය. ඇස් ඇති පුරුෂයෙක් ඒ ධාන්‍ය පිරූ මල්ල මුදා ඒ හැම ධාන්‍ය බලා මේ මෙපමණ හැල්ය, මේ මෙපමණ මහවීය. මේ මෙපමණ මුංය; මේ මෙපමණ මෑය, මේ මෙපමණ තලය, මේ මෙපමණ සහල්ය කියා ඒ ඒ ධන්‍ය කොට්ඨාසයන්ගේ නාම සඞ්ඛ්‍යාදී වශයෙන් විභාගකොට ප්‍රත්‍යවේක්ෂා කරන්නෙක් යම්සේද ඒ පරිද්දෙන්ම මහණෙනි, මහණ තෙම පාදත්තයෙන් උඩ හිසකේ මස්තකයෙන් යට සම කෙළවරකොට ඇති නානාවිධ අසුචි කොටසින් පිරිසිපි මේ ශරීරයම සිහිකරන්නේය. සිරුරෙහි මේදේ ඇත· කෙශයෝය, ලොමයෝය, නියපොතුය, දන්තයෝය, සමය, මස්පිඬුය, නහරය, ඇටය, ඇටමිදුලුය, වකු ගඩුය, හෘදයවස්තුවය, අක්මාවය, දලබුවය, බඩදිවය, පපුගඩුය, අතුනුය, අතුනුබහනය, උදරය මලය, පිතය ශ්ලෙෂ්මාවය, පූෂාවය, ලේය, ඩහදියය, මෙදනම් තෙල්ය, කඳුලය, වුරුණු තෙල්ය

ඛෙලො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා කාස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදයවයධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

6. පුනචපරං භික්ඛවෙ භික්ඛු ඉමමෙවකායං යථාඨිතං යථා පණිහිතං ධාතුසො පච්චවෙක්ඛති,

---

කෙළය, සොටුය, සන්ධියෙහි සිටි බෙලසුලය; මූත්‍රය, යනමේ කුණපයෝ මේ ශරීරයෙහි ඇතැයි දන්නේය. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසයකරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේද අනුන්ගේද ශරීරයෙහි හෝ සිතයවා බලමින් වාසය කරන්නේය. උත්පත්ති ක්‍රමදක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසය කරන්නේය. විනාශ වසයෙන් දක්නේ හෝ කායගතාසති භාවනාවෙහියෙදී වාසයකරන්නේය. උත්පත්ති විනාශ ක්‍රම දක්නේ හෝ කායගතාසති භාවනාවෙහියෙදී වාසය කරන්නේය. ඒ යොගාවචරයාහට කය ඇත්තේයයි සිහිය පිහිටුවන ලද්දේය. මනාකොට පිහිටුවනලද ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද ස්මෘතිසඞ්ඛ්‍යාත සිහිය හෝ වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනාගෙන් දුරුව අනිශ්‍රිතවවාසයකරන්නේය. ශරීර ලොකයෙහි කිසිවක් ආත්මාදි වශයෙන් ගැන්මක් නොකරන්නේය. මහණෙනි, භික්ෂුතෙම මෙසේ කයෙහි කායගතාසති භාවනාව සිහිකරමින් වාසය කරන්නේය.

6. නැවතද මහණෙනි භික්ෂුතෙම මේ ශරීරය යම්සේ සිටියේද; යම්සේ පිහිටුවනලදද එසේම ධාතුවශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය,

ඛෙලො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති' ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති, සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදයවයධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

6. පුරනවපරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථාඨිතං යථා පණිහිතං ධාතුසො පච්චවෙක්ඛති,

---

කෙලය, සොටුය, සන්ධියෙහි සිටි බෙලසුලය; මූත්‍රය, යනමේ කුණපයෝ මේ ශරීරයෙහි ඇතැයි දන්නේය. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසයකරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කය අනුව බලමින් වාසය කරන්නේය. තමාගේද අනුන්ගේද ශරීරයෙහි හෝ සිතයවා බලමින් වාසය කරන්නේය. උත්පත්ති ක්‍රමදක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසය කරන්නේය. විනාශ වසයෙන් දක්නේ හෝ කායගතාසති භාවනාවෙහියෙදී වාසයකරන්නේය. උත්පත්ති විනාශ ක්‍රම දක්නේ හෝ කායගතාසති භාවනාවෙහියෙදී වාසය කරන්නේය. ඒ යොගාවචරයාහට කය ඇත්තේයයි සිහිය පිහිටුවන ලද්දේය. මනාකොට පිහිටුවනලද ඒ සිහිය ඥාණයාගේ වැඩීම පිණිසද ස්මෘතිසඞ්ඛ්‍යාත සිහිය හෝ වැඩීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනාගෙන් දුරුව අනිශ්‍රිතවවාසයකරන්නේය. ශරීර ලොකයෙහිකිසිවක් ආත්මාදි වශයෙන් ගැන්මක් නොකරන්නේය. මහණෙනි, භික්ෂුතෙම මෙසේ කයෙහි කායගතාසති භාවනාව සිහිකරමින් වාසය කරන්නේය.

6. නැවතද මහණෙනි භික්ෂුතෙම මේ ශරීරය යම්සේ සිටියේද; යම්සේ පිහිටුවනලද්ද එසේම ධාතුවශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය,

අත්ථි ඉමස්මිං කායෙ පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලසො පටිවිභජිත්වා නිසින්නො අස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථාඨිතං යථා පනිහිතං ධාතුසො පච්චවෙක්ඛති, අත්ථි ඉමස්මිං කායෙ පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. ඉති අජ්ඣත්තංවා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. වයධම්මානුපස්සීවා කායස්මිං විහරති. සමුදයවය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. අත්ථිකායොතිවා පනස්ස සති. පච්චුපට්ඨිතා හොති.

මේ ශරීරයෙහි පඨවිධාතුය, ආපොධාතුය, තෙජොධාතුය, වායොධාතුයයනමොව්හු ඇත්තාහුය. මහණෙනි, දක්‍ෂවූගොඝාතකයෙක් හෙවත් ගවයින්මරන්නෙක්හෝ ගවයින් මරන්නෙකුගේ අතවැස්සෙක් හෝ ගවදෙනක් මරා සතරමන්සන්ධියෙක්හි කොට්ඨාස වශයෙන් වෙන්වෙන් කොටබෙදා යම්සේඋන්නේවේද. එපරිද්දෙන්මමහණෙනි, භික්‍ෂුතෙම මේ ශරීරය යම්සේ සිටියේද යම්සේ පිහිටුවනලද්ද, එසේධාතුවශයෙන් ප්‍රත්‍යවෙක්‍ෂාකරන්නේය. කෙසේද මේ ශරීරයෙහි පඨවිධාතුය, ආපොධාතුය, තෙජොධාතුය, වායොධාතුය, යන මේ ධාතුහු ඇතැයි කියායි. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කය සිහිකරමින් වාසයකරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කය සිහිකරමින් වාසයකරන්නේය. තමන්ගේද අනුන්ගේ පෘථිවීධාතු ආදි ඒ ඒ ධාතු කායයන්හි කයඅනුව සිහිකරමින් කායගතාසතියෙහි යෙදී වාසයකරන්නේය. උත්පත්ති ක්‍රම වශයෙන් දක්නේ හෝ කායානු පස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. විනාශ වශයෙන් දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසයකරන්නේය. උත්පත්ති විනාශ ලක්‍ෂණයෙන්; අනුව සිතහැර බලමින් කායානු පස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. ඒ යොගාවචරයාහට මෙසේ ධාතුමාත්‍රවූ ශරීර ඇත්තේයයි සිහිය මනාකොට එළඹ සිටියාවේ.

අත්ථි ඉමස්මිං කායෙ පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලසො පටිවිභජිත්වා නිසින්නො අස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථාඨිතං යථාපණිහිතං ධාතුසො පච්චවෙක්ඛති, අත්ථි ඉමස්මිං කායෙ පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදයවය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. අත්ථිකායොති වා පනස්ස සති. පච්චුපට්ඨිතා හොති.

---

මේ ශරීරයෙහි පඨවීධාතුය, ආපොධාතුය, තෙජොධාතුය, වායොධාතුයයනමොව්හු ඇත්තාහුය. මහණෙනි, දක්‍ෂවූගොඝාතකයෙක් හෙවත් ගවයින්මරන්නෙක්හෝ ගවයින් මරන්නෙකුගේ අතවැස්සෙක් හෝ ගවදෙනක් මරා සතරමන්සන්ධියෙක්හි කොට්ඨාස වශයෙන් වෙන්වෙන් කොටබෙදා යම්සේඋන්නේවේද. එපරිද්දෙන්මමහණෙනි, භික්‍ෂුතෙම මේ ශරීරය යම්සේ සිටියේද යම්සේ පිහිටුවනලදද, එසේධාතුවශයෙන් ප්‍රත්‍යවෙක්‍ෂාකරන්නේය. කෙසේද මේ ශරීරයෙහි පඨවීධාතුය, ආපොධාතුය, තෙජොධාතුය, වායොධාතුය, යන මේ ධාතුහු ඇතැයි කියායි. මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කය සිහිකරමින් වාසයකරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කය සිහිකරමින් වාසයකරන්නේය. තමන්ගේද අනුන්ගේ පෘථිවීධාතු ආදි ඒ ඒ ධාතු කායයන්හි කයඅනුව සිහිකරමින් කායගතාසතියෙහි යෙදී වාසයකරන්නේය. උත්පත්ති ක්‍රම වශයෙන් දක්නේ හෝ කායානු පස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. විනාශ වශයෙන් දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසයකරන්නේය. උත්පත්ති විනාශ ලක්‍ෂණයෙන් අනුව සිතහැර බලමින් කායානු පස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. ඒ යොගාවචරයාහට මෙසේ ධාතුමාත්‍රවූ ශරීර ඇත්තේයයි සිහිය මනාකොට එළඹ සිටියාවේ.

යාව දෙවඤාණ මත්තාය පතිස්සති මත්තාය අනිස්සිතොච විහරති. නච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

7. පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං එකාහමතංවා ද්විහමතංවා තීහමතංවා උද්ධුමාතකං විනීලකං විපුබ්බක ජාතං සො ඉමමෙව කායං උපසංහරති අයම්පිඛො කායො එවං ධම්මො එවංභාවී එතං අනතීතොති, ඉති අජ්ඣත්තංවා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති. සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. වයධම්මානුපස්සීවා කායස්මිං විහරති. සමුදයවයධම්මානුපස්සීවා කායස්මිං විහරති.

---

යම් සිහියක් මනාකොට පිහිටුවනලදද ඒ සිහිය ඥානයාගේ වෘද්ධිය පිණිසද ස්මෘතියගේ වැඩීම පිණිසදපවතී. ඔහුඅකුසලින් දුරුව වාසය කරන්නේය. ශරීර ලොකයෙහි කිසියම් ධාතුවාදියක් ගැන්මක් නොකරන්නේය. මහණෙනි, භික්ෂුතෙම මෙසේද කයෙහි කාය ගතාසති භාවනාව සිහිකරමින් වාසයකෙරේ.

7. මහණෙනි, නැවතද භික්ෂුතෙම අමුසොහොනෙක්හි දමන ලද්දාවූ මරණයට පැමිණ එක් දවසක් ගියාවූ හෝ මරණයට පැමිණ දෙදවසක් ගියාවූ හෝ මරණයට පැමිණ තුන්දවසක් ගියාවූ හෝ මේ ක්‍රමයෙන් ඉදිමුනාවූ නිල්වූ පූයාවහනයවන්නාවූ ශරීරයක් යම්සේ දක්නේද ඒ යොගාවචරතෙම තමාගේ මේ ශරීරය මෙහෙයා බලන්නේය. මේ ශරීරයද මෙබදු ස්වභාව ඇත්තේය. මෙබදු ස්වභාවට පැමිණෙන්නේය. මෙබදු ස්වභාව නොඉක්මවාසිටියේයයි කියායි මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කායගතාසති භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසය කරන්නේය. තමාගේ හෝ අනුන්ගේ හෝ ශරීරයෙහි කායානු පස්සනා භාවනාවෙහියෙදී වාසය කරන්නේය. උත්පත්ති ක්‍රම වශයෙන් ශරීරයාගේ ස්වභාව දක්නේ හෝ කායානුපස්සනාභාවනාවෙහි යෙදී වාසයකරන්නේය. ශරීරයාගේවිනාසස්වභාව දක්නේ හෝ කායානුපස්සනාභාවනාවෙහියෙදී වාසයකරන්නේය. උත්පත්ති විනාශ වශයෙන් දක්නේ හෝ කායගතාසති භාවනාවෙහියෙදී වාසය කරන්නේය.

අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පටිස්සතිමත්තාය අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

8. පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං කාකෙහි වා ඛජ්ජමානං කුලලෙහි වා ඛජ්ජමානං ගිජ්ඣෙහි වා ඛජ්ජමානං සුපානෙහි වා ඛජ්ජමානං විවිධෙහි වා පාණකජාතෙහි ඛජ්ජමානං සො ඉමමෙව කායං උපසංහරති අයම්පි ඛො කායො එවංධම්මො එවංභාවී එතං අනතීතොති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති.

---

ඒ යොගාවචරයාහට කයඇත්තේය කියා සිහිය මනාකොට පිහිටුවනලද්දේය, යම් සිහියක් මනාකොට පිහිටුවනලදද, ඒ සිහිය ඥාණයාගේ වෘද්ධිය පිණිසද කෙලෙස්නැසීම පිණිසද පවතී. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනාගෙන් දුරුව වාසය කරන්නේය. ශරීර ලොකයෙහි කිසිවක් ආත්මාදි වශයෙන් ගැන්මක් නොකරන්නේය. මහණෙනි භික්ෂුතෙම මෙසේද කයෙහි කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේය.

8. නැවතද මහණෙනි, භික්ෂුතෙම කවුඩන් විසින් කඩා කන ලද්දාවූ හෝ උකුස්සන් විසින් කඩාකනලද්දාවූ හෝ ගිජුලිහිණියන් විසින් කඩාකනලද්දාවූ හෝ සුනඛයන් විසින් කඩාකනලද්දාවූ හෝ සිවලුන් විසින් කඩාකනලද්දාවූ හෝ අනෙක ප්‍රකාරවූ ප්‍රාණීන් විසින් කඩාකනලද්දාවූ හෝ අමුසොහොණෙහි දමනලද මෘතශරීරයක් යම්සේ දක්නේද ඒ යොගාවචරතෙම තමාගේ මේ ශරීරයම මෙහෙයා බලන්නේය. මේ සිරුර මෙබඳු ස්වභාව ඇත්තේය මෙසේ වන්නේය. මේ ශරීරය එබඳුවූ ස්වභාවය නොඉක්මවා සිටියේයයි මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කායගතාසති භාවනාවෙන් යුක්තව වාසය කරන්නේය. අනුන්ගේ ශරීරයෙහි හෝ කායානු පස්සනා භාවනාවෙහියෙදී වාසය කරන්නේය. තමාගේ හෝ අනුන්ගේ හෝ ශරීරයෙහි කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසයකරන්නේය,

සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදයවය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. 'අත්ථි කායො'ති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතො ච විහරති 'න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

9. පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨික සඞ්ඛලිකං සමංස ලොහිතං නහාරු සම්බන්ධං —පෙ— අට්ඨි සඞ්ඛලිකං නිම්මංස ලොහිත මක්ඛිතං නහාරු සම්බන්ධං —පෙ— අට්ඨි සඞ්ඛලිකං අපගත මංසලොහිතං නහාරු සම්බන්ධං.

---

උත්පත්ති ක්‍රම වශයෙන් ශරීරයාගේ ස්වභාව දක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසය කරන්නේය. විනාශ ස්වභාවදක්නේ හෝ කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේය. උත්පත්ති විනාශ වසයෙන් දක්නේ හෝ කායගතාසති භාවනාවෙහි යෙදී වාසය කරන්නේය. ඒ යොගාවචරයා හට කය ඇත්තේය. කියා සිහිය මනාකොට පිහිටුවන ලද්දේය. යම් සිහියක් මනාකොට පිහිටුවනලද්ද ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. තෘෂ්ණාදීන් අනිශ්‍රිතව වාසය කරන්නේය. මේ ශරීර ලොකයෙහි කිසිවක් ආත්මාදීවශයෙන් ගැන්මක් නොකරන්නේය. මහණෙනි, භික්ෂු තෙමේ මෙසේද කයෙහි කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේය.

9. නැවතද මහණෙනි භික්ෂුතෙම ලේ මස් සහිතවූ නහර වලින් බැඳුනාවූ ඇට සැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මෘතශරීරයක් යම්සේ දක්නේවේද, මෙතැන් පටන් නවසීවථිකා පබ්බයෙහි විස්තරය සංක්ෂෙප කරණලදි. මාංශ නැතිව ලෙහෙයෙන් වැකුනාවූ නහරින් බැඳුනාවූ ඇට සැකිල්ලක්වූ සොහොනෙහි දමනලද මෘත ශරීරයක් යම්සේ දක්නේද. හකුළුවනලදී. මස් ලේ දෙකින් පහවූ නහරින් බැඳුනාවූ ඇට සැකිල්ලවූ සොහොනෙහි දමනලද මෘතශරීරයක් යම්සේ දක්නේද. හකුළුවනලදී. විස්තරය පළමු වාරයෙහිමෙන් සැලකියයුතු.

—පෙ— අට්ඨිකානි අපගත සම්බන්ධානි දිසාවිදිසා වික්ඛිත්තානි අඤ්ඤෙන හත්ථට්ඨිකං අඤ්ඤෙන පාදට්ඨිකං අඤ්ඤෙන ජඞ්ඝට්ඨිකං අඤ්ඤෙන ඌරට්ඨිකං අඤ්ඤෙන කටට්ඨිකං අඤ්ඤෙන පිට්ඨි කණ්ටකං අඤ්ඤෙන සීසකටාහං. සො ඉමමෙව කායං උපසංහරති, අයම්පි ඛො කායො එවං ධම්මො එවං භාවී එතං අනතීතොති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්ත බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සීවා කායස්මිං විහරති. සමුදයවය ධම්මානුපස්සීවා කායස්මිං විහරති. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතොච විහරති.

---

නැවතද මහණෙනි, භික්ෂුතෙම පහවූ නගර බැඳුම් ඇති දිශානු දිශාවන්හි විසුරුනාවූ ඇටකැබලිද අන් දිශාවෙක විසුරුණු පාඇටද අන් දිශාවෙක විසිරුණු කෙන්ඩා ඇටද අන් දිශාවෙක විසුරුණු කලවා ඇටද අන් දිශාවේක විසිරුණු කටි ඇටද අන් දිශාවෙක විසිරුණු පිට කටුද අන් දිශාවෙක විසිරුණු හිස් කැබලිද යනාමේ සියල්ල සොහොණෙහි දමනලද මෘතශරීරයක් යම්සේ දකීද ඒ යොගාවචරතෙම තමාගේ මේ ශරීරය එහි පමුණුවා බලයි. මේ සිරුර මෙබඳු ස්වභාව ඇත්තේය. මාගේ මේ සිරුරද මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවා සිටියේය කියායි. මෙසේ තමාගේ මේශරීරයෙහි හෝ කායානුපස්සනා භාවනාවෙන් යුක්තව වාසයකෙරේ. අනුන්ගේ ශරීරයෙහි හෝ කායානු පස්සනා භාවනාවෙහියෙදී වාසය කෙරේ. තමාගේ හෝ අනුන්ගේ ශරීරයෙහි කායානු පස්සනා භාවනාවෙහියෙදී වාසය කෙරේ. උත්පත්ති ක්‍රම වශයෙන් ශරීරයාගේ ස්වභාව දක්නේ හෝ කායානු පස්සනා භාවනාවෙහියෙදී වාසය කෙරේ. විනාශ ස්වභාව දක්නේ හෝ කායානු පස්සනා භාවනාවෙහියෙදී වාසය කෙරේ. උත්පත්ති විනාශ වසයෙන් දක්නේ හෝ කායානු පස්සනා භාවනාවෙහියෙදී වාසය කෙරේ. ඒ යොගාවචරයාහට කය ඇත්තේයයි සිහිය මනාකොට පිහිටුවනලද්දේය යම් සිහියක් මනාකොට පිහිටුවනලදද ඒ සිහිය ඤාණයාගේ වැඩීම පිණිසද පවතී. කෙලෙසුන් මැඩලීම පිණිසද පවතී. ඒපුද්ගලතෙම තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනාගෙන් දුරුව වාසය කෙරේ.

නච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙකායානු පස්සී විහරති.

10. පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිව ථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි සෙතානි සංඛවණ්ණූපනිභානි-පෙ-අට්ඨි කානි පුඤ්ජිකතානි තෙරොවස්සිකානි-පෙ-අට්ඨිකානි පූතීකානි චුණ්ණ කජාතානි. සො ඉමමෙව කායං උපසංහරති. අයම්පිඛො කායො එවං ධම්මො එවං භාවී එතං අනතීතොති. ඉති අජ්ඣත්තං වා කායෙ කා යානුපස්සී විහරති. බහිද්ධා වා කායෙ කායානු පස්සී විහරති. අජ්ඣ ත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදය වයධම්මානු පස්සීවා කායස්මිං විහරති.

---

මේ ශරීර ලොකයෙහි කිසිවක් ආත්මාදී වශයෙන් ගැන්මක් නොක රන්නේය. මහණෙනි, භික්ෂුතෙමෙ මෙසේ කායෙහි කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කෙරේ.

10. නැවතද මහණෙනි, භික්ෂුතෙම හක්ගෙඩියක පැහැයට සමා න ස්වභාවඇති සුදුවූ ඇට ඇත්තාවූ සොහොනෙහි දමනලද්දාවූ සිරු රක් යම්සේ දක්නේවේද, සංක්‍ෂෙප කරණලදී. රැස්ව සිටියාවූ ඉක්ම ගිය අවුරුදු ගණන් ඇති සොහොනෙහි දමනලද ශරීරයක් යම්සේ දක්නේවේද, සංක්‍ෂෙප කරණලදී. කුණුවූ සුණුවූ ඇට කැබලි ඇත් තාවූ සොහොනෙහි දමනලද මෘතශරීරයක් යම්සේ දකීද ඒ යොගාව චරතෙම තමාගේ මේ ශරීරය නුවන මෙහෙයා බලයි. මේ ශරීරය ද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවා සිටියේයයි මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කායගතාසති භාවනාවෙන් යුක්තව වාසය කෙරේ. අනුන්ගේ ශරීරයෙහි හෝ කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසය කෙරේ. තමාගේ හෝ අනුන්ගේ හෝ ශරීරයෙහි කායානු පස්සනා භාවනා වෙහි යෙදී වාසය කෙරේ. උත්පත්තික්‍රමවශයෙන් ශරීර ස්වභාව දක්නේ හෝ කායානු පස්සනා භාවනාවෙහි යෙදී වාසය කෙරේ. විනාශ ස්වභාව දක්නේහෝ කායානු පස්සනා භාවනාවෙහි යෙදී වා සය කෙරේ. උත්පත්ති විනාශයන් දක්නේ හෝ කායගතාසති භාවනාවෙහි යෙදී වාසය කෙරේ.

න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙකායානු පස්සී විහරති.

10. පුනචපරං භික්ඛවෙ භික්ඛු සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි සෙතානි සංඛවණ්ණූපනිභානි–පෙ–අට්ඨිකානි පුඤ්ජකිතානි තෙරොවස්සිකානි–පෙ–අට්ඨිකානි පූතිකානි චුණ්ණකජාතානි. සො ඉමමෙව කායං උපසංහරති. අයම්පිඛො කායො එවංධම්මො එවං භාවී එතං අනතීතොති. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායෙ කායානු පස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. සමුදය වයධම්මානු පස්සීවා කායස්මිං විහරති.

---

මේ ශරීර ලොකයෙහි කිසිවක් ආත්මාදී වශයෙන් ගැන්මක් නොකරන්නේය. මහණෙනි, භික්ෂුතෙමෙ මෙසේ කායෙහි කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කෙරේ.

10. නැවතද මහණෙනි, භික්ෂුතෙම හක්ගෙඩියක පැහැයට සමාන ස්වභාවඇති සුදුවූ ඇට ඇත්තාවූ සොහොනෙහි දමනලද්දාවූ සිරුරක් යම්සේදක්නේවේද, සංක්‍ෂෙප කරණලදී. රැස්ව සිටියාවූ ඉක්ම ගිය අව්රුදු ගණන් ඇති සොහොනෙහි දමනලද ශරීරයක් යම්සේ දක්නේවේද, සංක්‍ෂෙප කරණලදී. කුණුවූ සුණුවූ ඇට කැබලි ඇත්තාවූ සොහොනෙහි දමනලද මෘතශරීරයක් යම්සේදකීද ඒයොගාවචරතෙම තමාගේ මේ ශරීරය නුවන මෙහෙයා බලයි. මේ ශරීරය ද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොඉක්මවා සිටියේයයි මෙසේ තමාගේ ශරීරයෙහි හෝ කායගතාසති භාවනාවෙන් යුක්තව වාසය කෙරේ. අනුන්ගේ ශරීරයෙහි හෝ කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසය කෙරේ. තමාගේ හෝ අනුන්ගේ හෝ ශරීරයෙහි කායානු පස්සනා භාවනාවෙහි යෙදී වාසය කෙරේ. උත්පත්තික්‍රමවශයෙන් ශරීර ස්වභාව දක්නේ හෝ කායානු පස්සනා භාවනාවෙහි යෙදී වාසය කෙරේ. විනාශ ස්වභාව දක්නේහෝ කායානු පස්සනා භාවනාවෙහි යෙදී වාසය කෙරේ. උත්පත්ති විනාශයන් දක්නේ හෝ කායගතාසති භාවනාවෙහි යෙදී වාසය කෙරේ.

අත්ථි කායොති වා පන ස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණ මත්තාය පතිස්සති මත්තාය අනිස්සිතො ච විහරති, න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවං ඛො භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

11. කථඤ්ච භික්ඛවෙ භික්ඛු වෙදනාසු වෙදනානුපස්සී විහරති. ඉධ භික්ඛවෙ භික්ඛු සුඛං වෙදනං වෙදියමානො සුඛං වෙදනං වෙදියාමීති පජානාති, දුක්ඛං වෙදනං වෙදියමානො දුක්ඛං වෙදනං වෙදියාමීති පජානාති, අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමීති පජානාති, සාමිසං වා සුඛං වෙදනං වෙදියමානො සාමිසං සුඛං වෙදනං වෙදියාමීති පජානාති. නිරමිසං වා සුඛං වෙදනං වෙදියමානො නිරමිසං සුඛං වෙදනං වෙදියාමීති පජානාති සාමිසං වා දුක්ඛංවෙදනං වෙදියමානො සාමිසං දුක්ඛං වෙදනං වෙදියාමීති පජානාති.

---

ඒ යොගාවචරයාහට කය ඇත්තේමයයි සිහිය මනාකොට පිහිටුවන ලද්දේය. යම් සිහියක් මනාකොට පිහිටුවනලදද ඒ සිහිය ඥානවෘද්ධිය පිණිසද සිහිය වැඩීම පිණිසද පවතී. ඒ පුද්ගලතෙම තෘෂ්ණා දෘෂ්ටීන් දුරුව වාසය කෙරේ. ශරීර ලොකයෙහි ආත්මාදී වශයෙන් කිසිගැන්මක් නොකෙරේ. මහණෙනි, භික්ෂුතෙම මෙසේද කයෙහි කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කෙරේ.

11. මහණෙනි, භික්ෂුතෙම වෙදනාවන් කෙරෙහි ඒ ඒ වේදනාවන් අනුව බලමින් කෙසේ වාසය කෙරේද, මහණෙනි, මේ සස්නෙහි භික්ෂුතෙම සැපවේදනාවක් විඳින්නේ සැපවෙදනාවක් විඳිනෙමියි දැනගණී. දුඃඛ වේදනාවක් විඳින්නේ හෝ දුඃඛ වේදනාවක් විඳිනෙමියි. දැනගණී. උපෙක්ෂා වෙදනාවක් විඳින්නේ උපෙක්ෂා වේදනාවක් විඳිනෙමියි. දැනගණී ගෘහ නිශ්‍රිතවූ යම් කිසි සැප වේදනාවක් විඳින්නේ හෝ ගිහිගේ වැසියන් පිළිබඳවූ එක් සැප වෙදනාවක් විඳිමියි දැනගණී. නෛෂ්ක්‍රම්‍ය නිශ්‍රිතවූ යම්කිසි සැප වේදනාවක් විඳින්නේ හෝ ගිහිතැන් පිළිබඳ එක්සත්‍ුටු සොම්නස් වේදනාවක් විඳිනෙමියි දැනගණී. ගෘහ නිශ්‍රිතවූ එක්දුඃඛ වෙදනාවක් විඳින්නේහෝ ගිහින් පිළිබඳවූ එක් දුඃඛ වෙදනාවක් විඳිනෙමියි දැනගණී.

නිරාමිසං වා දුක්ඛං වෙදනං වෙදියමානො නිරාමිසං දුක්ඛං වෙදනං
වෙදියාමීති පජානාති. සාමිසං වා අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො
සාමිසං අදුක්ඛමසුඛං වෙදනං වෙදියාමීති පජානාති. නිරාමිසං
වා අදුක්ඛමසුඛං වෙදනං වෙදියමානො නිරාමිසං අදුක්ඛ
මසුඛං වෙදනං වෙදියාමීති පජානාති. ඉති අජ්ඣත්තං වා වෙදනාසු
වෙදනානුපස්සී විහරති. බහිද්ධා වා වෙදනාසු වෙදනානුපස්සී විහ
රති, අජ්ඣත්තබහිද්ධා වා වෙදනාසු වෙදනානුපස්සී විහරති. සමු
දය ධම්මානුපස්සී වා වෙදනාසු විහරති. වයධම්මානුපස්සී වා වෙද
නාසු විහරති. සමුදය වයධම්මානුපස්සී වා වෙදනාසු විහරති. අත්ථි
වෙදනාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය
පතිස්සතිමත්තාය.

---

පැවිදිවීම ඇසුර කළාවූ එක්වේදනාවක් විඳින්නේ හෝ මහණවීම
පිළිබඳ එක්දුක් වේදනාවක්විඳිනෙමියි දැනගණී. ගෘහවැසියන් ආශ්‍ර
යකොට සිටි එක්උපෙක්ෂා වේදනාවක් විඳින්නේ හෝ ගිහින් පිළි
බඳ එක් උපෙක්ෂා වේදනාවක් විඳිනෙමියි දැනගණී. මහ
ණවීම පිළිබඳ එක් උපෙක්ෂා වේදනාවක් විඳින්නේහෝ මහණවීම
පිළිබඳවූ එක් උපෙක්ෂා වේදනාවක් විඳිනෙමියි දැනගණී. මෙසේ
තමා පිළිබඳව පවත්නා වේදනාවන් කෙරෙහි හෝ වේදනාවන්ගේ
සවලක්ෂණවිසින් බලා වාසය කරන්නේය. අනුන් පිළිබඳව පවත්නා
වේදනාවන් කෙරෙහි හෝ වේදනානුපස්සනා භාවනාවෙහියෙදී වාස
ය කරන්නේය. තමන් පිළිබඳවූ හෝ අනුන් පිළිබඳවූ හෝ සියලු
වේදනාවන් කෙරෙහි වේදනාවන්ගේ සවලක්ෂණාදි වශයෙන් බලා
වාසය කරන්නේය. උත්පත්ති ක්‍රම වශයෙන් දක්නේ හෝ නවවිධ
වේදනාවන් කෙරෙහි වේදනානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය
කරන්නේය. විනාශ වසයෙන් දක්නේ හෝ වේදනාවන් කෙරෙහි
වේදනානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේය. කලෙක
ඉපදීමහා කලෙක නැසීමවශයෙන් දක්නේ හෝ වේදනාවන් කෙරෙ
හි සියලු වේදනාවන් අනුව බලමින් වාසය කරන්නේය. ඒ යොගා
වචරයාහට වේදනාවෝ ඇත්තාහුයයි සිහිය මනාකොට පිහිටුවන
ලද්දුහුය. යම් සිහියක් මනාකොට පිහිටුවනලදද ඒ සිහිය ඤාණයා
ගේ වැඩීම පිණිසද කෙලෙස් නැසීම පිණිසද පවතී.

අනිස්සිතොච විහරති, නච කිඤ්චි ලොකෙ උපාදියති එවංපො භික්ඛවෙ භික්ඛු වේදනාසු වෙදනානුපස්සී විහරති.

12. කථඤ්ච භික්ඛවෙ භික්ඛු චිත්තෙ චිත්තානුපස්සී විහරති. ඉධ භික්ඛවෙ භික්ඛු සරාගංවා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගංවා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසංවා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසංවා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහංවා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීත මොහංවා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තංවා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තංවා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතංවා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති.

---

තෘෂ්ණාදියෙන් දුරුව වාසය කරන්නේය. ලූජපන පලුජ්ජනාර්ථයෙන් ලොකනම්වූ වේදනාවිෂයෙහි එක කුත් වරදවාගැන්ම නොකරන්නේය. මහණෙනි, ඒ යොගාවචර තෙම මෙසේ වෙදනාවන් කෙරෙහිද ඒ වෙදනාවන් අනුව සලකාබලමින් වාසය කරන්නේය.

12, මහණෙනි. භාවනානුයොගී භික්ෂුතෙම චිත්තයෙහි සිත අනුව බලමින් කෙසේ වාසයකෙරේද, මහණෙනි, මේ ශාසනයෙහි යොගාවචරතෙම ලොභසහගත චිත්ත ය හෝ ලොභයහා එක්වූ සිතයයි දැනගණී. ලෞකික කුශල ප්‍රකාශ සිත හෝ ලෞකික කුශල ප්‍රකාශ චිත්තයයි දැනගණී. වෛෂසහගත චිත්තය හෝ දෞර්මනස්‍ය එක්වගිය සිතයයි දැනගණී. ලෞකික කුශල ප්‍රකාශ චිත්තය හෝ ලෞකික කුශල ප්‍රකාශ චිත්තයයි දැනගණී. විචිකිච්ඡාව හා උද්ධච්චය සහගත අකුශල චිත්තය හෝ විචිකිච්ඡාව හා ඖද්ධත්‍යය එක්වගිය අකුශල චිත්තයයි දැනගණී. ලෞකික කුශලයන් ප්‍රකාශ චිත්තය හෝ ලෞකික කුශලයන් ප්‍රකාශ සිතයයි දැනගණී. ථිනමිද්ධය හා අනුව පැවැත්තාවූ චිත්තය හෝ ථිනමිද්ධය හා අනුව පැවති සිතයයි දැනගණී. විසිර පවත්නා චිත්තය හෝ විසිර පවත්නා සිතයයි දැනගණී, රූපාවචර අරූපාවචර චිත්තය හෝ රූපාවචර අරූපාවචර බ්‍රහ්මලොකවල පැවති සිතයයි දැනගණී.

අමහග්ගතංවා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරංවා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරංවා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතංවා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතංවා චිත්තං අසමහිතං චිත්තන්ති පජානාති. විමුත්තංවා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තංවා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. ඉතිඅජ්ඣත්තංවා චිත්තෙ අජ්ඣත්ත බහිද්ධාවා චිත්තානුපස්සී විහරති, බහිද්ධාවා චිත්තෙ චිත්තානුපස්සී විහරති. චිත්තෙ චිත්තානුපස්සී විහරති, සමුදය ධම්මානුපස්සීවා චිත්තස්මිං විහරති. වයධම්මානුපස්සීවා චිත්තස්මිං විහරති. සමුදය වය ධම්මානුපස්සීවා චිත්තස්මිං විහරති. අත්ථිචිත්තන්ති වා පනස්ස සතිපච්චුපට්ඨිතං හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය

---

කාමාවචර චිත්තය හෝ කාමාවචර ලොකයෙහි පැවති සිතයයි දතයුතු. රූපාවචර අරූපාවචර චිත්තය හෝ රූපාවචර අරූපාවචර සිතයයි දතයුතු. චිත්තෛකාග්‍රතාවයෙන් උපදනා අර්පණසමාධි උපචාරසමාධි සහිත චිත්තය හෝ අර්පණසමාධි උපචාර සමාධි වශයෙන් එකඟවූ සිතයයි දතයුතු. එසේ නොසන්හුන් චිත්තය හෝ සමාධිවශයෙන් නොසන්හුන් සිතයයි දතයුතු. තදඞ්ග විෂ්කම්භන විමුක්තීන් යුක්තවූසිත හෝ තදඞ්ග විෂ්කම්භන විමුක්තීන් මිදීසිටි සිතයයි දතයුතු, තදඞ්ග විෂ්කම්භන විමුක්ති දෙකින් යුක්තනොවූ චිත්තය හෝ ක්ලෙශයන් හා එක්ව පවත්නා සිතයයි දතයුතු. මෙසේ තමාගේ හෝ චිත්තයෙහි ලෞකික චිත්තයන් අනුවගොස් නුවණැසින් බලමින් වාසයකරන්නේය. අනුන්ගේ සිත්හි හෝ ඒ ඒ චිත්තයන්ගේ සවභාවන් නුවණැස මෙහෙයා බලමින් වාසයකරන්නේය. තමාගේ හෝ අනුන්ගේ හෝ චිත්තයෙහි චිත්තයන්ගේ සවභාව නුවණැසින් බලමින් වාසයකරන්නේය. උත්පත්තික්‍රම වශයෙන් දක්නේ හෝ චිත්තානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. ලෞකික චිත්තයන්ගේ සවලක්‍ෂණ විසින් දක්නේ හෝ චිත්තානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. කලෙක උත්පත්තිය කලෙක විනාසය දක්නේ හෝ චිත්තානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකෙරේ ඒ යොගාවචරයාහට ලෞකික චිත්තය ඇත්තේයයි සිහිය පිහිටුවන ලද්දේය. යම් සිහියක් මනාකොට පිහිටුවනලද්දේද, ඒ සිහිය මතු ත්තෙහිඥාණයාගේ වැඩීමපිණිසද, කෙලෙස් නැසීම පිණිසද පවතී.

අනිස්සිතොච විහරති. නච කිඤ්චි ලොකෙ උපාදියති. එවං බො භික්ඛවෙ භික්ඛු චිත්තෙ චිත්තානුපස්සී විහරති.

13. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති. ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති. පඤ්චසු නීවරණෙසු. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති. පඤ්චසු නීවරණෙසු. ඉධ භික්ඛවෙ භික්ඛු සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං අත්ථි මේ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති. අසන්තංවා අජ්ඣත්තං කාමච්ඡන්දං නත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති. යථාච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථාච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහාණං හොති තඤ්ච පජානාති. යථාච පහීණස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදෙ හොති තඤ්ච පජානාති.

---

ඒ පුද්ගලතෙම තෘෂ්ණාදීන් නිශ්‍රිතනොව වෙසෙයි. මේ චිත්තලොකයෙහි කිසියම්චිත්තයක් වරදවාගැන්මක් නොකරයි. මහණෙනි, භාවනානුයොගී භික්‍ෂුතෙම මෙසේ චිත්තානුපස්සනා භාවනාවෙහි ලොභසහගත චිත්තාදි ඒ ඒ චිත්තයන්ගේ ස්වභාව නුවණැසින් බලා වාසයකරන්නේය.

13. මහණෙනි, භාවනානුයොගී භික්‍ෂුතෙම ධර්මයන් කෙරෙහි ඒ ධර්මයන් අනුව බලමින් කෙසේ වාසයකරන්නේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්‍ෂුතෙම පඤ්චනිවරණ ධර්මයන් කෙරෙහි ධර්මානුදර්ශීනයෙන් යෙදී වාසයකෙරේ. මහණෙනි, භික්‍ෂුතෙම පඤ්චනීවරණ ධර්මයන්කෙරෙහි ඒනිවරණධර්මයන් අනුවබලමින් කෙසේවාසයකෙරේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්‍ෂුතෙම පවත්නාවූ හෝ අධ්‍යාත්මිකවූ හෙවත් තමාකෙරෙහි ඇති කාමච්ඡන්දය මාගේ අධ්‍යාත්මිකවූ කාමච්ඡන්දයතෙම දැන් ඇතැයි දැනගණී. නොහැසිරීම්වශයෙන් නැත්තාවූ හෝ අධ්‍යාත්මිකවූ කාමච්ඡන්දය මාගේ අධ්‍යාත්මිකවූ කාමච්ඡන්දයතෙම දැන් නැතැයි දැනගණී. යම් කාරණයකින් නූපන්නාවූ කාමච්ඡන්දයාගේ ඉපදීම වේද, ඒ කාරණයද දැනගණී. යම් කාරණයකින් උපන්නාවූ කාමච්ඡන්දයාගේ ප්‍රහාණය වන්නේද, ඒ කාරණයද දැනගණී. යම් කාරණයකින් ප්‍රහීණකරණලද කාමච්ඡන්දයාගේ මත්තෙහි ඉපදීමක් නොවේද, ඒ කාරණයද දැනගණී.

සන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං අත්ථි මෙ අජ්ඣත්තං ව්‍යාපාදොති පජානාති. අසන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං නත්ථි මෙ අජ්ඣත්තං ව්‍යාපාදොති පජානාති. යථා ච අනුප්පන්නස්ස ව්‍යාපාදස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස ව්‍යාපාදස්ස පහාණං හොති තඤ්ච පජානාති. යථා ච පහීණස්ස ව්‍යාපාදස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති. සන්තං වා අජ්ඣත්තං ථිනමිද්ධං අත්ථි මෙ අජ්ඣත්තං ථිනමිද්ධන්ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං ථිනමිද්ධං නත්ථි මෙ අජ්ඣත්තං ථිනමිද්ධන්ති පජානාති. යථා ච අනුප්පන්නස්ස ථිනමිද්ධස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස ථිනමිද්ධස්ස පහාණං හොති තඤ්ච පජානාති. යථා ච පහීණස්ස ථිනමිද්ධස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති. සන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං අත්ථි මෙ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චන්ති පජානාති.

---

විද්‍යමානවූ හෝ අධ්‍යාත්මිකවූ ව්‍යාපාදය මාගේ ආධ්‍යාත්මිකවූ ව්‍යාපාදයතෙම දැන් ඇතැයි කියා දැනගණී. අවිද්‍යමානවූ හෝ ආධ්‍යාත්මිකවූ ව්‍යාපාදය මාගේ ආධ්‍යාත්මිකවූ ව්‍යාපාදයතෙම දැන් නැතැයි දැනගණී. යම් කාරණයකින් නූපන්නාවූ ව්‍යාපාදයාගේ ඉපදීම වේද, ඒ කාරණයද දැනගණී. යම් කාරණයකින් උපන්නාවූ ව්‍යාපාදයාගේ ප්‍රහාණය වන්නේද, ඒ කාරණයද දැනගණී. යම්හෙයකින් ප්‍රහීණවූ ව්‍යාපාදයාගේ මත්තෙහි නොඉපදීමක් වේද, ඒ කාරණයද දැනගණී. ඇත්තාවූ හෝ අධ්‍යාත්මිකවූ ථිනය හා මිද්ධයද යන මේ දෙක මාගේ ආධ්‍යාත්මිකවූ ථිනමිද්ධය ඇතැයි දැනගණී. තමාකෙරෙහි ඇත්තාවූ හෝ ථිනමිද්ධය මාකෙරෙහි අධ්‍යාත්මිකවූ ථිනමිද්ධය නැතැයි කියා දැනගණී. යම්හෙයකින් නූපන් ථිනමිද්ධයාගේ ඉපදීම්වේද, ඒ කාරණයද දැනගණී. යම්හෙයකින් උපන්නාවූ ථිනමිද්ධයාගේ ප්‍රහාණය වන්නේද, ඒ කාරණයද දන්නේය. යම් කාරණයකින් ප්‍රහීණවූ ථිනමිද්ධයාගේ මත්තෙහි ඉපදීමෙක් නොවේද, ඒ කාරණයද දන්නේය. විද්‍යමානවූ හෝ අධ්‍යාත්මිකවූ චිත්තයාගේ සංසිඳීමක් නොව විසිරපවත්නාවූ ඖද්ධත්‍යයද කෞකෘත්‍යයද යන උද්ධච්චකුක්කුච්චය මාගේ අධ්‍යාත්මිකවූ උද්ධච්චකුක්කුච්චය ඇතැයි දන්නේය.

අසන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං නත්ථි මෙ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චන්ති පජානාති. යථාච අනුප්පන්නස්ස උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථාච උප්පන්නස්ස උද්ධච්ච කුක්කුච්චස්ස පහානං හොති, තඤ්ච පජානාති. යථාච පහීනස්ස උද්ධච්චකුක්කුච්චස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති. සන්තංවා අජ්ඣත්තං විචිකිච්ඡං අත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති. අසන්තංවා අජ්ඣත්තං විචිකිච්ඡං නත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති. යථාච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදො හොති, තඤ්ච පජානාති, යථාච උප්පන්නාය විචිකිච්ඡාය පහානං හොති. තඤ්ච පජානාති. යථාච පහීනාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදො හොති. තඤ්ච පජානාති, ඉති අජ්ඣත්තංවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති.

---

අවිද්‍යමානවූ හෝ අධ්‍යාත්මිකවූ උද්ධච්චකුක්කුච්චය මාගේ අධ්‍යාත්මිකවූ උද්ධච්චකුක්කුච්චය දැන් නැතැයි කියා දන්නේය. යම් කාරණයකින් නූපන්නාවූ උද්ධච්චකුක්කුච්චයාගේ ඉපදීම වේද, ඒ කාරණයද දන්නේය, යම් කාරණයකින් උපන්නාවූ උද්ධච්චකුක්කුච්චයාගේ ප්‍රහාණයවේද, ඒද දන්නේය. යම් කාරණයකින් ප්‍රහීණවූ උද්ධච්චකුක්කුච්චයාගේ එයින් මත්තෙහි නොඉපදීමක්වේද, ඒද දන්නේය, තමා කෙරෙහි විද්‍යමානව ඇත්තාවූ හෝ සැකකිරීමයයි කියනලද විචිකිච්ඡාව මාගේ අධ්‍යාත්මිකවූ විචිකිච්ඡාව දැන් ඇතැයි දන්නේය. තමාකෙරෙහි අවිද්‍යමානවූහෝ සැකකිරීමයයි කියනලද විචිකිච්ඡාව මාගේ අධ්‍යාත්මිකවූ විචිකිච්ඡාව දැන් නැතැයි දන්නේය, යම් කාරණයකින් නූපන් විචිකිච්ඡාවගේ ඉපදීම වන්නේද, ඒ කාරණයද දන්නේය. යම් කාරණයකින් උපන්නාවූ විචිකිච්ඡාවගේ දුරුවීම වන්නේද, ඒද දන්නේය, යම් කාරණයකින් ප්‍රහීණවූ විචිකිච්ඡාවගේ මත්තෙහි නොඉපදීමක් වේද, ඒකාරණයද දන්නේය. මෙසේ අධ්‍යාත්මිකවූ පඤ්චනීවරණ ධර්මයන් කෙරෙහි හෝ ඒ නිවරණධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය. අනුන් පිළිබඳව පවත්නා නීවරණධර්මයන් කෙරෙහි හෝ ඒ නිවරණ ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය.

අජ්ඣත්ත බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. සමුදය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති. වයධම්මානුපස්සීවා ධම්මෙසු විහරති. සමුදයවයධම්මානු පස්සීවා ධම්මෙසු විහරති. අත්ථි ධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති. යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතොච විහරති, නච කිඤ්චි ලොකෙ උපාදියති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසු නීවරණෙසු.

14. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති. පඤ්චසු පාදානක්ඛන්ධෙසු.

---

අධ්‍යාත්මිකවූද බාහිරවූද නීවරණ ධර්මයන් කෙරෙහි හෝ ඒ නිවරණධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය. ඒ ඒ නිවරණ ධර්මයන්ගේ ඉපදීම් වශයෙන් දක්නේ හෝ ඒ ඒ නීවරණ ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය. ඒ නිවරණ ධර්මයන්ගේ නැතිවීම් වශයෙන් දක්නේ හෝ එම නීවරණ ධර්මයන් අනුවබලමින් වාසය කරන්නේය. නිවරණ ධර්මයන්ගේ කලෙක ඉපදීම්හා කලෙක නැසීම් වශයෙන් දක්නේ හෝ නිවරණ ධර්මයන්ගේ ආදීනවවශයෙන් සිහි කිරීමෙන් ධර්මානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය. ඒ යොගාවචරයාහට නිවරණධර්මයෝ ඇත්තාහුය. යන සිහිය මනාකොට පිහිටුවනලද්දේය. යම් සිහියක් එසේ මනාකොට පිහිටුවනලදද, ඒ සිහිය ඤාණයාගේ වැඩීම පිණිසද කෙලෙස් නැසීම පිණිසද පවතී. ඒපුද්ගලතෙම කෙලශ නිශ්‍රිතනොවී වාසයකරන්නේය. මේ නිවරණ ධර්ම ලෝකයෙහි කිසි රූපාදියක් මමය මාගේය කියා ගැන්මක් නොකරන්නේය. මහණෙනි, භික්ෂුනම්වූ ඒ යොගාවචරතෙම මෙසේ ඒ පඤ්ච නිවරණ ධර්මයන් කෙරෙහි නීවරණ ධර්මයන්ගේ ස්වභාවාදිනව දර්ශනයෙහියෙදී වාසයකරන්නේය.

14. මහණෙනි, භාවනානුයොගී භික්ෂුතෙම නැවතද රූපස්කන්ධාදී පඤ්චවිධ උපාදනස්කන්ධ ධර්මයන් කෙරෙහි ධම්මානුපස්සනා කර්මස්ථානයන් මෙනෙහිකරමින් වාසය කරේ.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසු උපාදානක්ඛන්ධෙසු. ඉධ භික්ඛවෙ භික්ඛු ඉති රූපං ඉති රූපස්ස සමුදයො ඉතිරූපස්ස අත්ථඞ්ගමො ඉති වෙදනා ඉති වෙදනාය සමුදයො ඉතිවෙදනාය අත්ථඞ්ගමො ඉති සඤ්ඤා ඉතිසඤ්ඤාය සමුදයො ඉතිසඤ්ඤාය අත්ථඞ්ගමො ඉතිසඞ්ඛාරා ඉති සඞ්ඛාරානං සමුදයො ඉති සඞ්ඛාරානං අත්ථඞ්ගමො ඉති විඤ්ඤාණං ඉතිවිඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමොති. ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති.

---

මහණෙනි, භාවනාවෙහි යෙදී වාසය කරණ භික්ෂුතෙම රූපස්කන්ධාදී පඤ්චවිධ උපාදානස්කන්ධ ධර්මයන් කෙරෙහි ඒ ඒ ස්කන්ධයන් අනුව සිතයෙවා බලමින් කෙසේ වාසයකරන්නේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම රූපයාගේ සවභාවය ඇති සැටියෙන් දන්නේය. රූප තෘෂ්ණාවද රූපයාගේ අස්තඞ්ගමයද දැනගණී. ඒ ඒ වෙදනාවන්ගේ ඇති සවභාව වශයෙන් දන්නේය. වෙදනාවෙහි පැවති තෘෂ්ණාවද වෙදනාවන්ගේ අස්තඞ්ගමයද දන්නේය. සංඥා තෘෂ්ණාවද සංඥාවන්ගේ අස්තංගමයද මෙසේ වන්නේයයි දන්නෙය. සඞ්ඛාර නම්ලද කුශලාකුශල චෙතනාවෝ ඇතැයි කියා සවභාවයෙහෙයින් දන්නේය. සංස්කාර තෘෂ්ණාවද සංස්කාරයන්ගේ අස්තංගමයද වන්නේයයිදන්නේය. මේ විඤ්ඤාණය මෙතෙක මෙයින් පිටත් විඤ්ඤාණයෝ නැතැයි කියා ඇති සවභාවයෙන් දන්නේය. විඥාන තෘෂ්ණාවද විඥානයාගේ අස්තංගමයද දන්නේය. මෙසේ ආධ්‍යාත්මිකවූ හෝ රූපස්කන්ධාදිවූ පඤ්චස්කන්ධ ධර්මයන් කෙරෙහි ඒ ඒ ස්කන්ධයන් අනුව නුවණැස මෙහෙයා බලමින් වාසයකරන්නේය. පඤ්චස්කන්ධ ධර්මයන් කෙරෙහි හෝ ඒ ඒ ස්කන්ධධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. තමා කෙරෙහිහෝ අනුන් කෙරෙහි විද්‍යමානව පවත්නා ස්කන්ධධර්මයන්කෙරෙහි ඒ ඒ ස්කන්ධධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය.

සමුදය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති. වයධම්මානු පස්සීවා ධම්මෙසු විහරති. සමුදය වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. අත්‍ථි ධම්මාතිවා පනස්ස සතිපච්චුපට්ඨිතා හොති, යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතොච විහරති. නච කිඤ්චි ලොකෙ උපාදියති, එවං ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසු උපාදානක්ඛන්ධෙසු.

15. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු.

---

රූපාදි ස්කන්ධධර්මයන්ගේ උත්පත්ති ක්‍රමවශයෙන් දක්නේ හෝ රූපස්කන්ධාදී ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය. රූපාදි ඒ ස්කන්ධධර්මයන් විනාශක්‍රම වශයෙන් දක්නේ හෝ ස්කන්ධාදී ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය. එම ස්කන්ධධර්මයන්ගේ උත්පත්ති විනාශක්‍රම අනුව නුවණැස මෙහෙයා දක්නේ හෝ ස්කන්ධධර්මයන් අනුවබලමින් භාවනාවෙහි යෙදී වාසයකරන්නේය ඒ යොගාවචරයාහට මෙසේ ස්කන්ධධර්මයෝ ඇත්තාහුමය යන සිහිය පිහිටුවනලද්දේය. යම් සිහියක් එසේ මනාකොට පිහිටුවනලදද ඒ සිහිය මතුමත්තෙහි ඤාණයාගේ වැඩීම පිණිසද කෙලෙස් තැවීම පිණිසද පවතී. ඒ පුද්ගලතෙම අනිශ්‍රිතව වාසය කරන්නේය පඤ්චස්කන්ධ ලොකයෙහි කිසි රූපාදියක් ගැන්මක් නොකරන්නේය. මහණෙනි, යොගාවචර භික්ෂුතෙම මෙසේ රූපස්කන්ධාදි ධර්මලොකයන් කෙරෙහි ස්කන්ධධර්මයන්ගේ ස්වභාවාදී නව දර්ශනයෙන්යෙදී වාසයකරන්නේය.

15. මහණෙනි, නැවතද යොගාවචර භික්ෂුතෙම චක්ෂුරාදී අධ්‍යාත්මකවූ ෂට් ආයතනයෙන්ද රූපශබ්දාදී බාහිරවූ ෂට් ආයතනයන්ද යනමේ ද්වාදශායතන ධර්මයන් කෙරෙහි චක්ෂුරාදි ඒ ඒ ධර්මයන් අනුව සිතහැර මෙනෙහි කරමින් වාසය කරන්නේය.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු. ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුඤ්ච පජානාති. රූපෙච පජානාති, යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤොජනං තඤ්ච පජානාති, යථාච අනුප්පන්නස්ස සංයොජනස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථාච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහාණං හොති. තඤ්ච පජානාති. යථාච පහීණස්ස සඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදො හොති. තඤ්ච පජානාති, සොතඤ්ච පජානාති. සද්දෙච පජානාති, ඝාණඤ්ච පජානාති. ගන්ධෙච පජානාති, ජිව්හඤ්ච පජානාති. රසෙච පජානාති කායඤ්ච පජානාති. ඵොට්ඨබ්බෙච පජානාති. මනඤ්ච පජානාති. ධම්මෙච පජානාති. යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති. සඤ්ඤොජනං තඤ්ච පජානාති. යථාච අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති, යථාච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහාණං හොති. තඤ්ච පජානාති, යථාච පහීණස්ස සඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදො හොති. තඤ්ච පජානාති.

---

මහණෙනි, භික්ෂුතෙම ආධ්‍යාත්මිකවූද බාහිරවූද මේ චාදශායතන ධර්මයන් කෙරෙහි ඒ ඒ ධර්මයන් අනුව බලමින් කෙසේ වාසය කරන්නේද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම චක්ෂුසද දන්නේය. රූපයන්ද දන්නේය. ඔවුනොවුන්ටවිෂයවූ චක්ෂුරූපයන් දෙදෙනාගේ එක්වීමහෙතුකොටගෙණ යම්කිසි සංයොජනකොනෙක් උපදනේද හෙද දන්නේය. යම් කාරණයකින් නූපන් සංයොජනයාගේ ඉපදීම වේද හෙදදන්නේය. යම්කාරණයකින් උපන් සංයොජනයාගේ ප්‍රහාණිය වේද හෙද දන්නේය. යම් කාරණයකින් සමුච්ඡෙද ප්‍රහාණියෙන් දුරුවූ සංයොජනයාගේ මත්තෙහි ඉපදීමක් නොවේද හෙද දූනගණී. කණියද දන්නේය. ශබ්දයන්ද දූනගණී. නාසයද දූනගණී. ගන්ධයන්ද දූනගණී. දිවද දූනගණී. රසයන්ද දූනගණී කයද දූනගණී. පහස්ද දූනගණී. ලුහුඬුකරණලදී. සිතද දූනගණී. ධර්මයන්ද දූනගණී. මේ දෙදෙනාගේ එක්වීම හෙතුකොටගෙණ ඔවුන්ගේ සමවායෙන් එක්තරා සංයොජන කෙනෙක් උපදින්නේද හෙද දන්නේය. යම් කාරණයකින් නූපන් සංයොජනයාගේ ඉපදීමවේද හෙද දන්නේය. යම් කාරණයකින් උපන්නාවූ සංයෝජනයාගේ ප්‍රහාණියවේද හෙද දන්නේය. යම් කාරණයකින් දුරුවූ සංයොජනයාගේ මත්තෙහි ඉපදීමක් නොවේද හෙද දන්නේය.

ඉති අජ්ඣත්තංවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති· සමුදය ධම්මානුපස්සී වා ධම්මෙසු විහරති, වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. සමුදය වයධම්මානුපස්සීවා ධම්මෙසුවිහරති, අත්ථි ධම්මාතිවා පනස්සසති පච්චුපට්ඨිතා හොති. යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය අනිස්සිතොච විහරති, නච කිඤ්චි ලොකෙ උපාදියති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු.

16. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු, කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති. සත්තසු බොජ්ඣඞ්ගෙසු.

---

මෙසේ අධ්‍යාත්මිකවූ ධර්මයන් කෙරෙහි ඒ ධර්මයන්ගේ ස්වභාවාදීනව සිහිකිරීම් වශයෙන් අනුව බලමින් වාසය කෙරේ, බාහිරායතන ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. ආධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ධර්මයන්කෙරෙහි ඒ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. ධර්මයන්ගේ උත්පත්තියට කාරණාවූ ඒ ධර්මයන් අනුව දක්නේ හෝ ධර්මයන් මෙනෙහි කෙරෙමින් වාසය කෙරේ. ධර්මයන්ගේ විනාසය අනුව දකිමින් හෝ ආයතන ධර්මයන් මෙනෙහි කිරීමෙන් වාසය කෙරේ. ධර්මයන්ගේ උත්පත්ති විනාශ වසයෙන් බලන්නේහෝ ආයතන ධර්මයන් සිහි කිරීමෙන් වාසය කෙරේ. ඒ යොගාවචරයාහට ධර්මමාත්‍රවූ ආයතනයන් ඇත්තේයයි. සිහිය පිහිටුවන ලද්දේය. යම් සිහියක් මනාව පිහිටුවන ලද්දේද, ඒ සිහිය මිතුඥණයාගේ වැඩීම පිණිසද කෙලෙසුන් නැසීම පිණිසදපවිති. හෙතෙම කෙලෙසුන් කෙරෙන් දුරුවවෙසේ. ලොකයෙහිකිසි රූපාදියක් ආත්මාදිවසයෙන් ග්‍රහණය නොකෙරේ. මහණෙනි, යොගාවචරතෙම මෙසේ ආධ්‍යාත්මික බාහිර වශයෙන්ෂිප්‍රකාරවූ අදශායතනධර්මයන්කෙරෙහි ඒආයතනධර්මයන් අනුවබලමින් වාසය කෙරේ.

16. මහණෙනි, නැවතද මහණතෙම සත්බොජ්ඣඞ්ග දහම්හි ධර්මයන් අනුව බලමින් වෙසේ. මහණෙනි, මහණතෙම කෙසේ සත්බොජ්ඣඞ්ග දහම්හි ධර්මයන් අනුව දකිමින් වෙසේදයත්.

ඉධ භික්ඛවෙ භික්ඛු සන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගොති පජානාති, අසන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං නත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගොති පජානාති. යථා ච අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනා පාරිපූරි හොති තඤ්ච පජානාති. සන්තං වා අජ්ඣත්තං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං ...පෙ... සන්තං වා අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගං ...පෙ... සන්තං වා අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගං ...පෙ... සන්තං වා අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං ...පෙ... සන්තං වා අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගං ...පෙ... සන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති පජානාති. අසන්තං වා අජ්ඣත්තං උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං නත්ථි මෙ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති පජානාති. යථා ච අනුප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති. තඤ්ච පජානාති.

---

මහණෙනි, මේ ශාසනයෙහි යොගාවචර භික්ෂුතෙම විද්‍යමානවූ අධ්‍යාත්මිකවූ සතිසම්බොධ්‍යඞ්ගය මාගේ අධ්‍යාත්මිකවූ සතිසම්බොධ්‍යඞ්ගය ඇතැයි දන්නේය. තමාකෙරෙහි නැත්තාවූ හෝ සතිසම්බොධ්‍යඞ්ගය මාගේ ආධ්‍යාත්මිකවූ සතිසම්බොධ්‍යඞ්ගය මාකෙරෙහි නැතැයි දන්නේය. යම්කාරණයකින් නූපන් සතිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීමවේද ඒ කාරණයද දන්නේය. යම්කාරණයකින් උපන්නාවූ සතිසම්බොධ්‍යඞ්ගයාගේ භාවනාවෙන් සම්පූර්ණවන්නේද ඒද දන්නේය. තමාකෙරෙහි ඇත්තාවූ හෝ ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය. සියසතන්තුළපවත්නා වීර්‍ය සම්බොධ්‍යඞ්ගය තමාකෙරෙහි පැවති ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය තමාකෙරෙහි පවත්නා පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය. තමාකෙරෙහි ඇත්තාවූ හෝ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය මාගේ අධ්‍යාත්මිකවූ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය මාකෙරෙහි ඇතැයි දැනගණී. සියසතක්තුළ නැත්තාවූ හෝ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය මාගේ අධ්‍යාත්මයෙහි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය නැතැයි දැනගණී, යම්හෙයකින් නූපන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීමක් වේද හෙද දැනගණී.

සථාච උපපනනසස උපෙඛාසම්බොජ්ඣඞ්ගසස භාවනා පාරිපූරී හොති තඤච පජානාති. ඉති අජ්ඣත්තංවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. අජ්ඣත්ත බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. සමුදය ධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. සමුදය වයධම්මානු පස්සී වා ධම්මෙසු විහරති. අත්ථි ධම්මාතිවා පනසස සති පච්චුපට්ඨිත හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය.

සම්කාරණයකින්උපන්නාවූ උපෙක්‍ෂා සම්බොධ්‍යඞ්ගයාගේ භාවනා වෙන් සම්පූණී වන්නේද,ඒද දැනගණී. මෙසේ තමාකෙරෙහි ඇත් නාවූහෝසප්තබොධ්‍යඞ්ග ධම්සන්කෙරෙහි ධම්ානුදර්ශීව ඒ බොධ්‍ය ඞ්ගධම්යන්අනුව බලමින් වාසය කරන්නේය.අනුන් පිළිබඳ බොධ්‍ය ඞ්ග ධම්යන් කෙරෙහි හෝ ධම්යන් අනුව බලමින් වාසය කරන් නේය. එසේම අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ බොධ්‍යඞ්ග ධම් යන් කෙරෙහි ධම්යන් අනුව බලමින් වාසය කරන්නේය. ඉපදීම පිණිස පවත්නා යොනිසොමනස්කාරාදි නොයෙක් ප්‍රභෙද ධම්යන් ගේ සවභාව වශයෙන් දක්නේ හෝ බොධ්‍යඞ්ග ධම්යන් මෙනෙහි කරමින් වාසයකරන්නේය. විනාසපිණිසය පවත්නා අවිද්‍යාදි හෙ තු ධම්යන් දක්නේ හෝ බොධ්‍යඞ්ග ධම්යන් මෙනෙහි කිරීමෙන් වාසය කරන්නේය. බොධ්‍යඞ්ග ධම්යන්ගේ උත්පත්ති විනාශ දක්නේ හෝ බොධ්‍යඞ්ග ධම්යන් මෙනෙහි කරමින් වාසය කර න්නේය. ඒ යෝගාවචරයාහට බොධ්‍යඞ්ග ධම්යෝ ඇතැයි යන සිහිය පිහිටුවන ලද්දේය. යම් සිහියක් මනාකොට පිහිටුවන ලද්දේද ඒ සිහිය ඥනයාගේ වැඩීම පිණිසද කෙලෙස් තැවීම පිණිසද පවති,

අනිස්සිතොච විහරති, න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවංඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති; සත්තසු සම්බොජ්ඣඞ්ගෙසු.

17. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති. චතූසු අරියසච්චෙසු. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චෙසු. ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති.

18. කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං අරියසච්චං, ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං.

---

තෘෂ්ණාවෙන දුරුව වාසයකරන්නේය. ලොකයෙහි කිසිවක් වරදවා ග්‍රහණය නොකරන්නේය. මහණෙනි, භාවනානුයොගී භික්ෂුතෙම මෙසේ සප්තබොධ්‍යඞ්ග ධර්මයන් කෙරෙහි ඒ බොධ්‍යඞ්ගධර්මයන් අනුව සිතයොදා නුවණින් සිහිකරමින් වාසයකරන්නේය.

17. මහණෙනි, භික්ෂුතෙම නැවතද චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන් කෙරෙහිච්චතුරාර්‍ය්‍යසත්‍යධර්මයන් අනුවබලමින්වාසයකෙරේ. මහණෙනි, යොගාවචර භික්ෂුතෙමචතුරාර්‍ය්‍යසත්‍යධර්මයන්කෙරෙහි ඒආර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අනුවබලමින් කෙසේ වාසයකරන්නේද, මහණෙනි, භාවනානුයොගී භික්ෂුතෙම මේ ශාසනයෙහි මේ දුඃඛාර්‍ය්‍යසත්‍යයයි කියා දුඃඛාර්‍ය්‍යසත්‍යය තත්වූ පරිද්දෙන් දන්නේය. මේ දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යයයි කියා දුඃඛොත්පත්තිකාරණවූ සමුදය සත්‍යය තත්වූපරිද්දෙන් දන්නේය. මේ දුඃඛනිරොධාර්‍ය්‍ය සත්‍යයයි කියා තත්වූ පරිද්දෙන්දන්නේය මේදුක් නිරුද්ධකිරීමට පවත්නාපිළිපැදීම යයි කියා තත්වූ පරිද්දෙන් දන්නේය.

18. මහණෙනි, දුඃඛාර්‍ය්‍යසත්‍යය කවරක්ද, ජාතිය හෙවත් ඉපදීමද දුක්වන්නේය. ජරාව හෙවත් දිරීමද දුක්වන්නේය. ව්‍යාධිය හෙවත් රොගයද දුක්වන්නේය. මරණයද දුක්වන්නේය.

සොක පරිදෙව දුක්ඛදොමනස්සූ පායාසාපි දුක්ඛා යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං. සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. කතමාච භික්ඛවෙ ජාති යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති, සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති භික්ඛවෙ ජාති. කතමාච භික්ඛවෙ ජරා යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො අයං වුච්චති භික්ඛවෙ ජරා. කතමංච භික්ඛවෙ මරණං, යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා හෙදො අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං හෙදො කලෙබරස්ස නික්ඛෙපො ඉදං වුච්චති භික්ඛවෙ මරණං.

---

ශොකකිරීමය, වැළපීමය, කයහටගන්නා දුකය, සිතහටගත්තා දුකය, සිතහටගන්නා දොම්නසය, දැඩි ආයාසය යන මොහු දුක්වන්නාහුය. යම් කැමති දෙයක් හෙවත් යමක් පතමින් නොලබාද ඒද දුක්වන්නේය. සංක්ෂෙපාර්ථයෙන් උපාදානස්කන්ධයෝ පස්දෙන දුක්වන්නාහුය. මහණෙනි, ජාතිය නම් කුමක්ද, ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්වසමූහයෙක්හි ඉපදීමය යන යම් සම්මතයක් ඇද්ද හටගැන්මක්වේද. උත්පත්තිස්ථානයට ඇතුළුවීමක් ඇද්ද විශෙෂයෙන් ඉපදීමක් ඇද්ද ස්කන්ධයන්ගේ පහළවීමක් ඇද්ද. ආයතනයන්ගේ ලැබීමක් ඇද්ද, මහණෙනි, මෝතොමෝ ජාතියයි කියනු ලැබේ. මහණෙනි, ජරාතොමෝ කවරක්වන්නීද, ඒ ඒ සත්වනිකායෙහි ඒ ඒ සත්වයන්ගේ යම් ජරාවක්වන්නීද ජරාවෙන් ස වයන් දිරණබවද ඛණ්ඩදන්තයන් ඇතිබවද පැසීසුදුවූ කෙස්ඇතිබවද, වලිඇතිබවද, ආයුෂයාගේහානිය ඉන්ද්‍රියයන්ගේමුහුකුරායාමක්ඇද්ද. මේ ජරාවයයි කියනු ලැබේ. මහණෙනි, මරණයතෙම ක රක්වන්නේද, ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්වනිකායෙන් චුතවීමක් ඇද්ද ජීවිතය ගැලවීයන බවද බිඳීමද අතුරුදන් වීමද මරණින් මියයාමද සම්මුති කාලක්‍රියාවද ශරීරයාගේ බැහැරදැම්මක් ඇද්ද මේකාරණයතෙම මහණෙනි, මරණයයි කියනු ලැබේ.

කතමො ච භික්ඛවෙ සොකො. යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො, අයං වුච්චති භික්ඛවෙ සොකො. කතමො ච භික්ඛවෙ පරිදෙවො, යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං අයං වුච්චති භික්ඛවෙ පරිදෙවො. කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං, යං ඛො භික්ඛවෙ කායිකං දුක්ඛං කායිකං අසාතං කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛං.

---

**මහණෙනි, ශොකයතෙම කවරක් වන්නේද, මහණෙනි, එක්තරු ව්‍යසනයකින් වැලඳගැන්මෙන් යුක්තවූ සත්වයාගේද, දුක් ස්වභාවන් අතුරෙන් එක්තරු එකක් විසින් ස්පර්ශකොට වැලඳගත්තාහුගේද යම් ශොක කිරීමක් ඇද්ද. ශොක කරණ බවය ශොක කළබවය ශරීරාභ්‍යන්තරය හාත්පසින් වියලන ස්වභාවවූ යමක් වේද, ඒ ශොකය ඇතුළත විශෙෂයෙන් යම් වියලීමක් ඇද්ද. මේ තෙම මහණෙනි, ශොකයයි කියනුලැබේ. මහණෙනි, පරිදෙවය තෙම කවරක් වන්නේද, මහණෙනි, එක්තරු ව්‍යසනයකින් සමන්විතවූ සත්වයාගේද, එක්තරු දුඃඛකාරණයකින් ස්පර්ශකරණලද පුද්ගලයාගේද, නම්පමණක් කියා හැඬීමවූ යම් ආදේවයක් ඇද්ද ගුණවර්ණනාකොට හැඬීමවූ පරිදෙවය නම් කියා හැඬීමවූ ආදෙවනාය ගුණවර්ණනාකොට හැඬීමවූ පරිදෙවනාය නම්කියා හැඬීමේ ස්වභාවය ගුණවර්ණනාකොට හැඬීමේ ස්වභාවය. මහණෙනි, මේතෙම පරිදෙවයයි කියනු ලැබේ. මහණෙනි, දුඃඛයනම් කවරේද මහණෙනි, කයෙහි හටගත් යම් දුකක් ඇද්ද. ඒ දුකවනාහි කයෙහි හටගත්තාවූ නොම්හිරිවූ ආපසු මරණය කය හා එක්ව ස්පර්ශීවීමෙන් උපදනාවූ අතිකර්කශ වෙදනාමවූ දුක දුකසේම ඉවසන අභියෙන් දුඃඛනම්වූයේ මහණෙනි, දුකයයි කියනු ලැබේ.**

කතමඤ්ච භික්ඛවෙ දොමනස්සං. යං ඛො භික්ඛවෙ චෙතසිකං දුක්ඛං චෙතසිකං අසාතං, මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදං වුච්චති භික්ඛවෙ දොමනස්සං. කතමො ච භික්ඛවෙ උපායාසො, යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙණ ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙණ දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං, අයං වුච්චති භික්ඛවෙ උපායාසො. කතමඤ්ච භික්ඛවෙ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, ජාතිධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න ජාතිධම්මා අස්සාම න ච වත නො ජාති ආගච්ඡෙය්‍යාති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං. ජරාධම්මානං භික්ඛවෙ සත්තානං......පෙ......

---

මහණෙනි, සිතෙහි හටගන්නා දොම්නසනම් කවරේද, මහණෙනි, සිතෙහි හටගන්නාවූ යම් දුකක් වේද, සිතෙහි හටගන්නාවූ අමධුර භාවයක් හෙවත් සැපනොවූවෙක් වේද සිතට ස්පර්ශ වීමෙන් උපදනාවූ දුකක්වේද සැපනොවූ විඳීමක්වේද මහණෙනි, මේතෙම දොම්නසයයි කියනු ලැබේ. මහණෙනි, උපායාසයනම් කවරේද, මහණෙනි, එක්තරා යම් ව්‍යසනයකින් යුක්තවූවාහුගේද එක්තරා යම් දුක් ස්වභාවයකින් යටකරණ ලද්දාහුගේ යම් ව්‍යසනයක් ඇද්ද බලවත් ආයාසයෙක් ඇද්ද ක්ලාන්තවූ ස්වභාවය දැඩි ක්ලාන්තවූ ස්වභාවය යන මේතෙම උපායාසයයි කියනුලැබේ. මහණෙනි, කැමතිවූ යමක් නොලබාද හෙද දුක්වන්නේය යනු කවරේද, මහණෙනි, සසර නොයෙක් ජාතිවල පිළිසිඳ ගන්නා ස්වභාව ඇත්තාවූ සත්වයන්ට මෙසේ තණ්හාවෙක් උපදී කෙසේද අපි භවයෙහි උපදින ස්වභාව නැතිවන්නමෝනම් අපට එකාන්තයෙන් භවයෙහි හටනැන්ම නොම එන්නේනම් ඉතා යෙහෙක යනුයි. මේකාරණයම කැමැත්තෙන් පැමිණිය හැකිනොවේ මේද ආසා කරණයමක් නොලබාද හෙද දුකය. මහණෙනි, ජරාවෙන් දිරායන ශරීර ස්වභාවය ඇත්තාවූ ප්‍රාණීන්ට මෙසේ ආසාවක් උපදනේය. කෙසේද අපි ජරාස්වභාව ඇතිනොවමුනම් අපට එකාන්තයෙන් ජරාව නොම එන්නේනම් ඉතා යෙහෙකැයි යන මේ කාරණය කැමැත්තෙන් නොහොත් ආසාවෙන්. නොපැමිණිය යුත්තේය. මේද කැමතිවූ යමක් නොලබානම් ඒද දුක්වන්නේය. මහණෙනි දිරීම ස්වභාවකොට ඇති සත්වයන්ට එහුඹුකරණලදී.

ව්‍යාධිධම්මානං භික්ඛවෙ සත්තානං ....පෙ.... මරණ ධම්මානං භික්ඛවෙ සත්තානං. ....පෙ.... සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාස ධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා අස්සාම නච වත නො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා ආගච්ඡෙය්‍යුන්ති. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

---

මහණෙනි, ව්‍යාධීන්ගෙන් පෙළෙන සවභාව ඇත්තාවූ සත්වයන්ට. මහණෙනි, මරණයට පැමිණෙන සවභාවඇත්තාවූ සත්වයන්ට. මහණෙනි, ශොකය හැඬීම වැලපීම සවභාවකොට ඇත්තාවූ ප්‍රාණීන්ට මෙබදු ආසාවක් උපදී. අපි හැඬීම් හා පරිදෙව සවභාව ඇත්තෝ නොවමුනම් අපට පරිදෙවය හෙවත් හැඬීමවැලපීම නොඑන්නාහුනම් ඉතායෙහෙකැයියන මෙකාරණය ආසාවෙන්නොපැමිණීයහැක්කේමය. මෙසේදකැමති දෙය නොලබිමෙන් වෙනයම් මේදුකකක්ඇදද හෙද දුක්වන්නේය. මහණෙනි, කායිකදුක සවභාවකොට ඇත්තාවූ ප්‍රාණීන්ට මෙබදු ආසාවෙක් උපදින්නේය. දුඃඛ සවභාව ඇත්තෝ නොවමු නම් අපට කායිකදුක එකාන්තයෙන් නොඑන්නේ නම් ඉතා යෙහෙකැයි යන මේ කරණය ආසාවෙන් නොපැමිණිය හැක්කේමය. මෙසේ කැමතිදෙය නොලැබිමෙන් වන යම් කාරණයක් ඇද්ද ඒ කාරණයද දුක්වන්නේය. මහණෙනි, දොම්නස් සවභාවකොට ඇත්තාවූ සත්වයන්ට මෙබදු ආසාවක් උපදී. දොම්නස් සවභාවකොට ඇත්තෝ නොවමු නම් අපට එකාන්තයෙන් දොම්නස් නොඑන්නාහු නම් ඉතා යෙහෙකැයි මෙය ආසාවෙන් නොපැමිණීය හැක්කේමය. මෙසේද කැමති දෙයක්හුගේ යම් නොලැබිමක් ඇද්ද හෙද දුක්වන්නේය. මහණෙනි; උපායාස සවභාව ඇත්තාවූ සත්වයන්ට මෙබදු ආසාවක් උපදී. අපි උපායාසය සවභාවකොට ඇත්තෝ නොවමු නම් අපට එකාන්තයෙන් එසේවූ බලවත් ආයාසය නොඑන්නේ නම් ඉතායෙහෙකැයි මෙය ආසාවෙන් නොපැමිණිය හැක්කේමය. මේද යම් කැමති දෙයක් නොලබාද එද දුක්වන්නේය.

කතමෙච භික්ඛවෙ සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා, දුක්ඛා සෙය්‍යථිදං රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සඞ්ඛිත්තෙන පඤ්චූපාදානක්ඛන්ධා දුක්ඛා, ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛං අරියසච්චං.

19. කතමඤ්ච භික්ඛවෙ දුක්ඛ සමුදයං අරියසච්චං. යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. සා බො පනෙසා භික්ඛවෙ තණ්හා කත්‍ථ උප්පජ්ජමානා උප්පජ්ජති කත්‍ථ නිවිසමානා නිවිසති.

---

මහණෙනි, සංක්‍ෂෙපයෙන් දුක්වූ පඤ්චවිධ උපාදානස්කන්ධයෝ කෙතෙක්ද, ඔහු කවරහුදයත්. රූපඋපාදානසකන්ධය කෙලෙස් සහිත වෙදනාඋපාදානස්කන්ධය සංඥා උපාදානසකන්ධය සංස්කාර උපාදානසකන්ධය කෙලෙස්සහිත විඥනාසකන්ධය යන මේයි. මහණෙනි, සංක්‍ෂෙපයෙන් දුක්වූ පඤ්ච උපාදානසකන්ධයෝ මොහුයයි කියනු ලැබෙත්. මහණෙනි, මේ තෙම දුඃඛාර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ.

19 මහණෙනි, දුංඛ සමුදය නම්වූ ආය්‍ය්‍යසත්‍යය කවරෙක් වන්නේද, නැවත නැවත සංසාරයෙහිසත්වයාගේ ඉපදීම ඇතිකරන්නාවූ සතුටු වන භෙවත් ඇලෙනරාගය සමග එකතුවූ ඒ ඒ උපන් ආත්මභාව යෙහි ඇල්ම කරන්නාවූ යම් මේ තණ්හාවක් නොහොත් ආසාවක් වේද ඒ කවරෙක්ද කාමරාග වශයෙන් පවත්නා ආසාවය ශාස්වත දෘෂ්ටිය සමග පවත්නා ආසාවය උච්ඡෙද දෘෂ්ටිය සමග පවත්නා ආසාවය. යන මොහුයි. මහණෙනි; උපදනාවූ කාම තණ්හාදි වශයෙන් තුන්වැදෑරුම්වූ ඒ මේ තණ්හා තොමෝ කවර තැනෙක්හි උපදනේද, නැවත ඉපදීම් වශයෙන් පවත්නා එම තණ්හාව කවර තැනෙක්හි නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටා සිටින්නේදයත්.

යං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං. චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති. සොතං ලොකෙ ...පෙ... ඝාණං ලොකෙ, ජිව්හා ලොකෙ. කායො ලොකෙ. මනො ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති. රූපං ලොකෙ ...පෙ... සද්දා ලොකෙ ...පෙ... ගන්ධා ලොකෙ ...පෙ... රසා ලොකෙ ...පෙ... ඵොට්ඨබ්බා ලොකෙ ...පෙ... ධම්මා ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති. චක්ඛුවිඤ්ඤාණං ලොකෙ ...පෙ...

---

ලෝකයෙහි යමක් ප්‍රිය ස්වභාව ඇත්තේවේද සැප ස්වභාව ඇත්තේවේද ප්‍රිය ජාතිකවස්තුවෙහි උපදින්නාවූ මේ තෘෂ්ණා තොමෝ මෙහි උපදී. මෙහි ඇතුල්වනුලබන්නී ඇතුල්වෙයි. ලෝකයෙහි කුමක් නම් ප්‍රිය ස්වභාව ඇත්තේවේද, සැප ස්වභාව ඇත්තේද ලෝකයෙහි ඇස ප්‍රියස්වභාව ඇත්තේය, සැප ස්වභාව ඇත්තේය. මෙහි මේ තෘෂ්ණා තොමෝ උපදින්නී උපදියි මෙහි ඇතුළත්වන්නී ඇතුළත්වෙයි. ලෝකයෙහි ශ්‍රෝත්‍රයහෙවත් කණ මෙතැන් පටන් සංක්ෂේප කරණලදී. ලෝකයෙහි ඝ්‍රාණය. ලෝකයෙහි දිව. ලෝකයෙහි කය. ලෝකයෙහිසිත. ප්‍රියස්වභාව ඇත්තේය. සැප ස්වභාව ඇත්තේය. මෙහි මේ තෘෂ්ණා තොමෝ උපදින්නී උපදියි' මෙහි ඇතුල්වන්නීඇතුල්වෙයි. ලෝකයෙහි රූපය. ලෝකයෙහි ශබ්දයෝ ලෝකයෙහිගන්ධයෝ. ලෝකයෙහි රසයෝ-ලෝකයෙහි පහස්හු. ලෝකයෙහි ධර්මයෝ ප්‍රියස්වභාව ඇත්තෝයි. සැප ස්වභාව ඇත්තෝවේත්. මෙහි මේතෘෂ්ණාතොමෝ උපදින්නීඋපදියි. මෙහි ඇතුලත් වන්නී ඇතුළත්වෙයි. සත්ව ලෝකයෙහිචක්ෂුසහාඑක්ව පැවති විඥනය ප්‍රියවූ ස්වභාව ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදනාවූ මේතෘෂ්ණාතොමෝ උපදනේය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය. විස්තර මාත්‍රයකි.

සොතවිඤ්ඤාණං ලොකෙ. ...පෙ... ඝාණවිඤ්ඤාණං ලොකෙ. ...පෙ... ජිව්හාවිඤ්ඤාණං ලොකෙ. ...පෙ... කායවිඤ්ඤාණං ලොකෙ. ...පෙ... මනොවිඤ්ඤාණං ලොකෙ පියරූපං, සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. චක්ඛුසම්ඵස්සො ලොකෙ. ...පෙ... සොතසම්ඵස්සො ලොකෙ ...පෙ... ඝාණසම්ඵස්සො ලෙකෙ ...පෙ... ජිව්හාසම්ඵස්සොලොකෙ ...පෙ... කාය සම්ඵස්සොලොකෙ. ...පෙ... මනොසම්ඵස්සො ලොකෙපියරූපං සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති.

---

මේ සත්වලොකයෙහි ශ්‍රොත්‍රවිඥානය ප්‍රියවූ ස්වභාව ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදනාවූ මේ තෘෂ්ණාතොමෝ උපදින්නීය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය. මේ සත්වලොකයෙහි ඝ්‍රාණද්වාර සහා එක්ව පැවතිඝ්‍රාණ විඥානය ප්‍රියවූ ස්වභාව ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදනාවූ මේ තෘෂ්ණතොමෝ උපදතේය. මේ සත්වලොකයෙහි ජිව්හාවිඥානය ප්‍රියවූස්වභාව ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදනාවූ මේ තෘෂ්ණතොමෝ උපදිතේය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නා එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය, මේ සත්වලොකයෙහි කායවිඥානය. ලොකයෙහි මනොවිඥානය ප්‍රියවූ ස්වභාව ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය, මෙහි උපදනාවූ මේ තෘෂ්ණාතොමෝ උපදතේය, මෙහි ඉපදීම් වශයෙන් පවත්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම වශයෙන් පවත්නේය, මේ ලොකයෙහි චක්ෂුර්වාරයෙහිවූ ස්පර්ශය. ලොකයෙහි ශ්‍රොතස්පර්ශය. ලොකයෙහි ඝ්‍රාණස්පර්ශය. ලොකයෙහි ජිහ්වාස්පර්ශය. ලොකයෙහි කායස්පර්ශය ලොකයෙහි මනස්පර්ශය ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදිනු ලබන්නාවූ මේ තෘෂ්ණතොමෝ උපදින්නේය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය.

චක්ඛු සම්ඵස්සජා වෙදනා ලොකෙ …පෙ… සොතසම්ඵස්සජාවෙද නාලොකෙ …පෙ… ඝාණසම්ඵස්සජාවෙදනාලොකෙ …පෙ… ජිව්හාසම්ඵස්සජාවෙදනාලොකෙ …පෙ… කායසම්ඵස්සජා වෙද නා ලොකෙ …පෙ… මනො සම්ඵස්සජාවෙදනාලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථනිවිසමානා නිවිසති.

---

මේ සත්ව ලොකයෙහි චක්ඛායතන රූපායතන දෙදෙනාගේ එක්විමෙන් දර්ශනාස්වාද වශයෙන් උපදනාපඤ්චකාමගුණ නිශ්‍රිත සැපයාගේ විඳීමය යන වේදනාතොමෝ …පෙ… ලොකයෙහි ශ්‍රොතායතන ශබ්දායතන මේ දෙදෙනාගේ එක්විමෙන් ශ්‍රවණාස්වාද වශයෙන් උපදනාවේදනා තොමෝ …පෙ… ලොකයෙහි ඝ්‍රාණායතනගන්ධායතන දෙදෙනාගේ සංසර්ගයෙන් ආඝ්‍රාණ වශයෙන් උපදනාකාම තෘෂ්ණා නිශ්‍රිතවෙදනාතොමෝ …පෙ… ලොකයෙහි ජිව්හායතනරසායතනදෙදෙනාගේඑකතුවිමෙන්සයනීයවශයෙන්උපදනාවේදනාතොමෝප්‍රියවූස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහිඋපදීනුලබන්නාවූමේතෘෂ්ණා තොමෝ උපදනේය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නේය. ලොකයෙහි කායා යතන ස්පර්ශායතන දෙදෙනාගේ එක්විමෙන් ස්පර්ශ වශයෙන් උපදනා වේදනාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදිනු ලබන්නාවූ මේ තෘෂ්ණාතොමෝ උපදින්නේය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය. ලොකයෙහි මනායතන ධම්මායතන දෙදෙනාගේ එක්වීමෙන් නොයෙක් අරමුණු නියමකොට දැන සැලකීම් වශයෙන් උපදනාවූ වේදනාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදිනු ලබන්නාවූ මේ තෘෂ්ණා තොමෝ උපදින්නේය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය.

රූපසඤ්ඤාලොකෙ-පෙ-සද්දසඤ්ඤාලොකෙ.—පෙ—ගන්ධසඤ්ඤාලොකෙ.—පෙ—රසසඤ්ඤාලොකෙ. —පෙ— ඵොට්ඨබ්බසඤ්ඤාලොකෙ —පෙ— ධම්මසඤ්ඤාලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති. රූපසංචෙතනාලොකෙ~පෙ~සද්දසංචෙතනා ලොකෙ-පෙ—ගන්ධසංචෙතනාලොකෙ—පෙ—රසසංචෙතනා ලොකෙ.—පෙ—ඵොට්ඨබ්බසංචෙතනාලොකෙ —පෙ— ධම්මසංචෙතනා ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. රූපතණ්හාලොකෙ~පෙ~සද්දතණ්හාලොකෙ. —පෙ—ගන්ධතණ්හාලොකෙ —පෙ— රසතණ්හාලොකෙ —පෙ— ඵොට්ඨබ්බතණ්හා ලොකෙ.—පෙ—

---

ලොකයෙහි රූපසංඥා තොමෝ~පෙ~මේ ලොකයෙහි ශබ්ද සංඥා තොමෝ~පෙ~ලොකයෙහි රසසංඥා තොමෝ~පෙ— ලොකයෙහි ස්පර්ශ සංඥා තොමෝ ~පෙ~ ලොකයෙහි ධර්මසංඥා තොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදිනු ලබන්නාවූ මේ තෘෂ්ණා තොමෝ උපදනේය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නාවූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය. ලොකයෙහි මේ රූපයෙහි දැන එහි පවත්නා සිතිවිලි තොමෝ~පෙ~ලොකයෙහි මේ ශබ්දය යන සිතිවිලි තොමෝ~පෙ~ලොකයෙහි සුහඳදුගඳ යන චේතනා තොමෝ~පෙ~ලොකයෙහි රසය යන චේතනා තොමෝ~පෙ ~ලොකයෙහි ස්පර්ශය යන චේතනා තොමෝ~පෙ~ලොකයෙහි ධර්මය යන චේතනා තොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහිඋපදිනුලබන්නාවූමේතෘෂ්ණාතොමෝඋපදනේය. මෙහි ඉපදීම්වශයෙන් පවත්නාවූඑමතෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය, ලොකයෙහි ඒ රූපයන් කෙරෙහි පවත්නා තණ්හා තොමෝ~පෙ~ ලොකයෙහි ශබ්දයෙහි පැවති තණ්හා තොමෝ~පෙ~ලොකයෙහි ගන්ධයෙහි පැවති තණ්හා තොමෝ~පෙ~ලොකයෙහි රසයෙහි පැවති තණ්හා තොමෝ ~පෙ~ ලොකයෙහි ස්පර්ශයෙහි පැවති තණ්හා තොමෝ. සංක්ෂේප කරණලදි.

මතණ්හා ලොකෙ. පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්ප
ජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති රූපවිතක්කො ලො
කෙ—පෙ—සද්ද විතක්කො ලොකෙ—පෙ—ගන්ධවිතක්කො
ලොකෙ —පෙ— රසවිතක්කො ලොකෙ—පෙ— පොට්ඨබ්බ
විතක්කො ලොකෙ—පෙ—ධම්මවිතක්කො ලොකෙ පියරූපං සා
තරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා
නිවිසති. රූපවිචාරො ලොකෙ —පෙ—සද්දවිචාරො ලොකෙ —
පෙ—ගන්ධවිචාරො ලොකෙ—පෙ—රසවිචාරො ලොකෙ—පෙ—
පොට්ඨබ්බවිචාරො ලොකෙ—පෙ—ධම්මවිචාරො ලොකෙ පියරූපං

---

ලොකයෙහි ධර්මයෙහි පැවති තෘෂ්ණාතොමෝ ප්‍රියවූ ස්වරූප
ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදිනු ලබන්නාවූ
මේ තෘෂ්ණා තොමෝ උපදනේය. මෙහි ඉපදීම්වශයෙන් පවත්නා
වූ එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය.
ලොකයෙහි රූපයෙහි පැවති විතර්කය තෙම—පෙ— ලොකයෙහි
ශබ්දයෙහි පැවති විතර්කය තෙම —පෙ— ලොකයෙහි ගන්ධයෙහි
පැවති විතර්කය තෙම—පෙ—ලොකයෙහි රසයෙහි පැවති විතර්කය
තෙම—පෙ—ලොකයෙහි ස්පර්ශයෙහි පැවති විතර්කය තෙම—පෙ—
ලොකයෙහි ධර්මයෙහි පැවති විතර්කය තෙම ප්‍රියවූ ස්වරූප ඇත්
තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි උපදිනු ලබන්නාවූ මේ
තෘෂ්ණා තොමෝ උපදනේය. මෙහි ඉපදීම් වශයෙන් පවත්නාවූ
එම තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් පවත්නේය. ලොක
යෙහි රූපයෙහි පැවති විචාරය තෙම —පෙ— ලොකයෙහි ශබ්දයෙහි
පැවති විචාරය තෙම —පෙ— ලොකයෙහි ගන්ධයෙහි පැවති විචා
රය තෙම—පෙ—ලොකයෙහි රසවිචාරයතෙම —පෙ— ලොකයෙහි
ස්පර්ශයෙහි පැවති විචාරයතෙම—පෙ—ලොකයෙහි ධර්මයන් සිතින්
අනුමර්ශනයකොට විචාරීම් වශයෙන් පවත්නාවූ විචාරයතෙම
ප්‍රියවූ ස්වරූප ඇත්තේය.

සොතවිඤ්ඤාණංලොකෙ —පෙ— ඝාණ වි ඤ්ඤා ණං ලොකෙ —පෙ— ජිව්හාවිඤ්ඤාණං ලොකෙ —පෙ— කා ය වි ඤ් ඤාණං ලොකෙ. මනොවිඤ්ඤාණංලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. චක්ඛුසම්ඵස්සො ලොකෙ—පෙ—මනොසම්ඵස්සොලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. චක්ඛුසම්ඵස්සජා වෙදනා ලොකෙ —පෙ—මනොසම්ඵස්සජා වෙදනාලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති එත්ථනිරුජ්ඣමානා නිරුජ්ඣති. රූප සඤ්ඤාලොකෙ. —පෙ— සද්දසඤ්ඤාලොකෙ ——පෙ—— ධම්මසඤ්ඤාලොකෙ. පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති.

ලොකයෙහි ශ්‍රොත්‍රවිඥනය——පෙ——ලොකයෙහි ඝ්‍රාණ විඥනය ———පෙ——— ලොකයෙහි ජිව්හා විඥනය———පෙ———ලොකයෙහි කායවිඥනය ———පෙ——— ලොකයෙහි මනොවිඥනය ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි පහවනු ලබන්නාවූ මේ තෘෂ්ණා තොමෝ පහවන්නේය. මෙහි නිරුඩවන්නාවූ මේ තෘෂ්ණාව නිරුඩවන්නේය. ලොකයෙහි චක්‍ෂු ර්‍වාරයෙහි ස්පර්‍ශය—පෙ—ලොකයෙහි ශ්‍රොතස්පර්‍ශය—පෙ—ලොකයෙහි මනස්පර්‍ශය ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි පහවන්නාවූ මේ තෘෂ්ණාව පහවන්නේය මෙහි නිරුඩවන්නාවූ මේ තෘෂ්ණාව නිරුඩවන්නේය. ලොකයෙහි ඇස හා රූපයයනදෙදෙනාගේස්පර්‍ශයෙන් උපදනා වේදනාතොමෝ—පෙ— ලොකයෙහි මනායතන ධම්මා යතන දෙදෙනාගේ එක්වීමෙන් නොයෙක් අරමුණු උපදනාවේදනා තොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි පහවන්නාවූ මේ තෘෂ්ණා තොමෝ පහවන්නේය, මෙහි නිරුඩවන්නාවූ මේ තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් නිරුඩවන්නේය. ලොකයෙහි රූප සංඥව හෙවත් එහි පැවති සිත—පෙ—ලොකයෙහි ශබ්ද සංඥාව—පෙ— ලොකයෙහි ධර්‍මසංඥාව ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි පහවන්නාවූ මේ තෘෂ්ණාව පහවන්නේය.

එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. රූපසඤ්චෙතනා ලොකෙ—පෙ—ධම්මසඤ්චෙතනා ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. රූපතණ්හා ලොකෙ—පෙ—ධම්මතණ්හා ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. රූපවිතක්කො ලොකෙ—පෙ—සද්දවිතක්කො ලොකෙ—පෙ—ගන්ධවිතක්කො ලොකෙ—පෙ—රසවිතක්කො ලොකෙ—පෙ—පොට්ඨබ්බවිතක්කො ලොකෙ—පෙ—ධම්මවිතක්කො ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති. එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

---

මෙහි නිරුඪ වන්නාවූ මේ තෘෂ්ණාව නැවත නැවත ඉපදීම් වශයෙන් නිරුඪවන්නීය. ලොකයෙහි මේ රූපයයි දැන එහි පැවති සිත —පෙ—ලොකයෙහි සිත හටගන්නා ධර්මය යන චෙතනාව ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි පහවන්නාවූ මේ තෘෂ්ණාව පහවන්නීය. මෙහි නිරුඪවන්නාවූ මේ තෘෂ්ණාව නැවත නොඉපදීම් වශයෙන් නිරුඪවන්නීය. ලොකයෙහි ඒ ඒ රූපයන් කෙරෙහි පවත්නා තණ්හාතොමෝ—පෙ—ලොකයෙහි පඤ්චකාමගුණ ධර්මයෙහි පැවති තණ්හාතොමෝ ප්‍රියවූ ස්වරූප ඇත්තේය. මධුරවූ ස්වභාව ඇත්තේය. මෙහි පහවන්නාවූ මේ තෘෂ්ණාව තොමෝ පහවන්නීය, මෙහි නිරුඪවන්නාවූ මේ තෘෂ්ණාව නැවත නොඉපදීම් වශයෙන් නිරුඪවන්නීය, ලොකයෙහි රූපයෙහි පැවති විතර්කය තෙම—පෙ—ලොකයෙහි ශබ්දයෙහි පැවති විතර්කය තෙම—පෙ—ලොකයෙහි ගන්ධයෙහි පැවති විතර්කයතෙම—පෙ—ලොකයෙහි රසයෙහි පැවති විතර්කයතෙම—පෙ—ලොකයෙහි ස්පර්ශයෙහි පැවති විතර්කයතෙම—පෙ—ලොකයෙහි ධර්මවිතර්කය තෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය, මෙහි පහවන්නාවූ මේ තෘෂ්ණා තොමෝ පහවන්නීය; මෙහි නිරුඪවන්නාවූ තෘෂ්ණාව නැවත නොඉපදීම් වශයෙන් නිරුඪවන්නීය,

රූපවිචාරො ලොකෙ -පෙ- සද්දවිචාරො ලොකෙ -පෙ- ගන්ධවිචාරො ලොකෙ -පෙ- රසවිචාරො ලොකෙ -පෙ- ඵොට්ඨබ්බවිචාරො ලොකෙ -පෙ- ධම්මවිචාරො ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛනිරොධං අරියසච්චං.

21. කතමඤ්ච භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං, සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. කතමා ච භික්ඛවෙ සම්මාදිට්ඨි. යං ඛො භික්ඛවෙ දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං,

---

ලොකයෙහි රූපයෙහි පැවති විචාරය තෙම ---පෙ--- ලොකයෙහි ශබ්දයෙහි පැවති විචාරය තෙම --පෙ-- ලොකයෙහි ගන්ධයෙහි පැවති විචාරය තෙම--පෙ--ලොකයෙහි රසයෙහි පැවති විචාරයතෙම--පෙ--ලොකයෙහි ස්පර්ශයෙහි පැවති විචාරය තෙම --පෙ--ලොකයෙහි පඤ්චකාමගුණ ධර්මයෙහි පැවති විචාරය තෙම ප්‍රියවූ ස්වරූප ඇත්තේය, මධුරවූ ස්වභාව ඇත්තේය, මෙහි පහවන්නාවූ මේ තෘෂ්ණාව පහවන්නීය, මෙහි නිරුද්ධවන්නාවූ මේ තෘෂ්ණාව නැවත නොඉපදීම් වශයෙන් නිරුද්ධවන්නීය, මහණෙනි, මේ දුඃඛ නිරොධාර්‍ය්‍ය සත්‍යයයිකියනු ලැබේ.

21. මහණෙනි, දුක්නිරුද්ධ කිරීමට යනසුලු ප්‍රතිපදාවවූ ආර්‍ය්‍ය සත්‍යය කවරේදයත්, මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයමයි. ඒනම, සම්‍යක් දෘෂ්ටිය සම්‍යක් සඞ්කල්පනාවය. සම්‍යක් වචනය. සම්‍යක් කර්මාන්තය. සම්‍යක් ආජීවය. සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය. සම්‍යක් සමාධිය යන මේයි- මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය කවරීදයත්, මහණෙනි, දුක් නිශ්චිතකොට දුකයයි යම් දැනගැනීමක් වේද, දුක් ඉපදීමට තෘෂ්ණාව මෙහි මේදුක් ඉපදවීමයයි යම් දැනගැනීමක් වේද, දුක් නිරුද්ධ කිරීමවූ නිර්වාණයෙහි යම් දැනගැනීමෙක් වේද. දුක් නිරුද්ධකිරීමට පමුණුවන සුලුවූ ප්‍රතිපදාවෙහි යම් දැනගැනීමෙක්වේද,

අයං වුච්චති භික්ඛවෙ සම්මාදිට්ඨි, කතමො ච භික්ඛවෙ සම්මා සංකප්පො, නෙක්ඛම්මසංකප්පො අබ්‍යාපාදසංකප්පො අවිහිංසා සඞ්කප්පො, අයං වුච්චති භික්ඛවෙ සම්මාසඞ්කප්පො. කතමා ච භික්ඛවෙ සම්මාවාචා, මුසාවාදා වෙරමණී පිසුණාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චති භික්ඛවෙ සම්මාවාචා, කතමො ච භික්ඛවෙ සම්මා කම්මන්තො. පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, අයං වුච්චති, භික්ඛවෙ සම්මා කම්මන්තො. කතමො ච භික්ඛවෙ සම්මා ආජීවො, ඉධ භික්ඛවෙ අරියසාවකො මිච්ඡා ආජීවං පහාය සම්මා ආජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චති භික්ඛවෙ සම්මා ආජීවො. කතමො ච භික්ඛවෙ සම්මා වායාමො, ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති. චිත්තං පග්ගණ්හාති.

---

මහණෙනි, මේ සම්‍යක් දෘෂ්ටියයි කියනු ලැබේ. මහණෙනි, සම්‍යක් සංකල්පනාව කවරේදයත්, නෛෂ්ක්‍රම්‍ය සංකල්පනාවය, ව්‍යාපාද නොකිරීමවූ සඞ්කල්පනාවය, සත්වහිංසා නොකිරීම්වූ සඞ්කල්පනාවයයි. මහණෙනි, මේතෙම සම්‍යක් සංකල්පනාවයයි කියනු ලැබේ. මහණෙනි, සම්‍යක් වචනය කවරේදයත්, මුසාවාදයෙන් වැළැක්මය. පෙහෙසුන් වදන්කීමෙන් වැළැක්මය. ඵරුෂ වචන කීමෙන් වැළැක්මය. නිෂ්ප්‍රයොජන වචන කීමෙන් වැළැක්ම යයි. මහණෙනි, මේතෙම සම්‍යක් වචනයයි කියනුලැබේ. මහණෙනි, සම්‍යක් කර්මාන්තය කවරේදයත්. ප්‍රාණඝාතයෙන් වැළැක්මය, අදින්නාදනින් වැළැක්මය. කාමමිථ්‍යාචාරයෙන් වැළැක්මය. මහණෙනි, මේතෙම සම්‍යක් කර්මාන්තයයි කියනු ලැබේ. මහණෙනි, සම්‍යක් ආජීවය කවරේදයත්. මහණෙනි, මේ සස්නෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මිථ්‍යා ආජීවය දුරුකොට සම්‍යක් ආජීවයෙන් ජීවිකාව කෙරේද, මහණෙනි, මේතෙම සම්‍යක් ආජීවයයි කියනු ලැබේ. මහණෙනි, සම්‍යක් ව්‍යායාමය කවරේදයත්. මහණෙනි, මේසස්නෙහි භික්ෂුතෙම නූපන් ලාමක අකුශලධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවාද ව්‍යායාම කෙරේද වීර්‍ය්‍යාරම්භ කෙරේද, සිතදැඩිකොට අල්වා ගණීද.

පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහාණාය ඡන්දං ජනෙති වායමති. විරියං අරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති. පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය. භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං අරභති චිත්තං පග්ගණ්හාති පදහති, අයංවුච්චති. භික්ඛවෙ සම්මාවායාමො. කතමාච භික්ඛවෙ සම්මාසති, ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති, ආතාපි සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු……පෙ……චිත්තෙ……පෙ…… ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො, සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, අයංවුච්චති භික්ඛවෙ සම්මාසති.

---

පධන්වීර්‍ය්‍යකෙරේද උපන්ලාමක අකුශල ධර්‍මයන්ගේ දුරුකිරීම පිණිසද දුරුකිරීම පිණිසද ඡන්දය උපදවාද ව්‍යායාම කෙරේද වීර්‍ය්‍යාරම්භ කෙරේද සිත දැඩිකොට ගණීද පධන් වීර්‍ය්‍ය කෙරේද, නූපන් කුසල ධර්‍මයන්ගේ ඉපදවීම පිණිස ඡන්දය උපදවාද ව්‍යායාම කෙරේද වීර්‍ය්‍යාරම්භ කෙරේද සිත දැඩිකොට අල්වා ගණීද පධන් වීර්‍ය්‍ය කෙරේද, උපන් කුසල ධර්‍මයන්ගේ සපිහිටීම පිණිසද නුමුළාබව පිණිසද බහුලබව පිණිසද විපුලබව පිණිසද භාවනාවෙන් සම්පූර්ණ කිරීම පිණිසද ඡන්දය උපදවාද ව්‍යායාම කෙරේද වීර්‍ය්‍යාරම්භ කෙරේද, සිත දැඩිකොට ගණීද පධන් වීර්‍ය්‍ය කෙරේද, මහණෙනි, මෙතෙම සම්‍යක් ව්‍යායාමයයි කියනු ලැබේ. මහණෙනි, සම්‍යක් සිහිය කවරේදයත්. මහණෙනි, මේ සස්නෙහි මහණතෙම කයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ සිහි ඇත්තේ කායසඞ්ඛ්‍යාත ලොකයෙහි ලොභය හා දෞර්මනස්‍ය සංසිඳුවාගෙණ කායගතාසති භාවනාව සිත්හි කරමින් වාසය කෙරේ. වෙදනාවන් කෙරෙහි සංක්‍ෂෙප කරණලදි. සිතෙහි—පෙ—ධර්‍මයන්කෙරෙහි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ සිහි ඇත්තේ ධර්‍මලොකයෙහි අභිධ්‍යාව හා දෞර්මනස්‍ය හික්මවා හෙවත් මැඩ පවත්වා වාසය කෙරේ. මහණෙනි, මේතෙමේ සම්‍යක් ස්මෘතියයි කියනු ලැබේ.

කතමො ච භික්ඛවෙ සම්මා සමාධි, ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාර සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති. සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛ විහාරීති. තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති.

---

මහණෙනි, සම්‍යක් සමාධිය කවරීදයත්. මහණෙනි, මේ සස්නෙහි මහණතෙම වස්තුකාම ක්ලේශ කාමයන් කෙරෙන් වෙන්වම පඤ්ච නීවරණාදී අකුශල ධර්‍මයන් කෙරෙන් වෙන්වම විතර්‍ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත්තාවූ ප්‍රීති හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ හෙවත් ප්‍රථමධ්‍යානය උපදවා වාසයකෙරේද, විතර්‍ක විචාර දෙදෙනාගේ සංසිඳවීමෙන් සියසතන්තුළ යහපත් පැහැදීම ඇතිකරන්නාවූ සිතේ එකඟබව ඇති විතර්‍ක රහිතවූ විචාර රහිතවූ චිත්තසමාධියෙන් හටගත්තාවූ ප්‍රීති හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ හෙවත් ද්විතීයධ්‍යානය උපදවා වාසය කෙරේද, ප්‍රීතිහුගේ විරාගයෙන්ද උපෙක්‍ෂා ඇත්තේ සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ කයින් සැපයකුත් විඳීද, ඒකවරක්දයත් ආර්‍ය්‍යයන් වහන්සේලා යම් කරුණක් සඳහා උපෙක්‍ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි කියත්ද ඒ තෘතියධ්‍යානයට පැමිණ හෙවත් ඒ තෘතීයධ්‍යාන සමාපත්තිය උපදවා වාසය කෙරේද සුඛප්‍රහාණියෙන්ද දුඃඛ ප්‍රහාණියෙන්ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරලීමෙන් දුක් නැත්තාවූ සැපනැත්තාවූ උපෙක්‍ෂා ස්මෘතීන්ගේ පිරිසිදු භාවය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ හෙවත් චතුර්ථධ්‍යාන සම්පත්තිය උපදවාගෙණ වාසය කෙරේද.

අයං වුච්චති, භික්ඛවෙ සම්මාසමාධි. ඉදං වුච්චති. භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනිපටිපදා අරියසච්චං. ඉති අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. බහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. අජ්ඣත්තබහිද්ධා වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති. සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. වයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. සමුදයවයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති. අත්ථි ධම්මාති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය, අනිස්සිතො ච විහරති. න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චෙසු.

---

මහණෙනි මේ සම්‍යක් සමාධියයි කියනු ලැබේ. මහණෙනි, මේ දුක් නැතිකිරීමට පමුණුවන සුලු පිළිවෙත් මගවූ ආර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ, මෙසේ ආධ්‍යාත්මිකයයි සම්මතවූ සියසතන්තුළ පවත්නා ධර්මයන් කෙරෙහි ඒ ධර්මයන් නැවත නැවත බලමින් වාසයකෙරේ. බාහිරවූ ධර්මයන් කෙරෙහි හෝ ධර්මයන් අනුව බලමින් වාසය කෙරේ. ආධ්‍යාත්මිකවූ හෝ ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේ. ධර්මයන් කෙරෙහි සමුදය ස්වභාව නැවත නැවත බලමින් හෝ වාසය කෙරේ. ධර්මයන් කෙරෙහි විනාශස්වභාව නැවත නැවත දකිමින් හෝ වාසය කෙරේ. ධර්මයන් කෙරෙහි පහලවීම් හා විනාශය නැවත නැවත දක්නා ස්වභාව ඇතිව වාසයකෙරේ. ඒ යොගාවචරයාහට ධර්මයෝ ඇතැයි කියාම සිහිය මනාකොට එළඹිසිටියාවේ. යම්සිහියක් මනාකොට පිහිටුවන ලද්දේනම් ඒ සිහිය ඥානයාගේ වැඩීම පිණිසද කෙලෙස් නැවීම පිණිසද පවතී. ඒ පුද්ගලතෙම තෘෂ්ණාදිවශයෙන් නිශ්‍රිත නොවව වාසය කෙරේ. ලොකයෙහි කිසිවත් තෘෂ්ණාදිවශයෙන් නොගණී. මහණෙනි, මෙසේ මහණතෙම චතුස්සත්‍යධර්මයන් කෙරෙහි ඒ ධර්මයන් අනුව දකිමින් වාසය කෙරේ.

22. යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපඨානෙ එවං භාවෙය්‍ය සත්තවස්සානි තස්ස විනනං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිඨෙව ධම්මෙ අඤ්ඤා සතිවා උපාදිසෙසෙ අනාගාමිතා. තිඨන්තු භික්ඛවෙ සත්තවස්සානි. ඡවස්සානි, පඤ්චවස්සානි, චත්තාරිවස්සානි, තීනිවස්සානි වෙවස්සානි එකං ව ස්සං... පෙ... යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපඨානෙ එවං භාවෙය්‍ය සත්තමාසානි, තස්ස විනනං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිඨෙව ධම්මෙ අඤ්ඤා සතිවා උපාදිසෙසෙ අනාගාමිතා. තිඨන්තු භික්ඛවෙ සත්තමාසානි. යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපඨානෙ එවං භාවෙය්‍ය ඡමාසානි... පෙ... පඤ්චමාසානි, චත්තාරිමාසානි තීනිමාසානි වෙමාසනි අඩ්ඪමාසං තස්සවිනනං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිඨෙව ධම්මෙ අඤ්ඤා සතිවා උපාදිසෙසෙ අනාගාමිතා; තිඨතු භික්ඛවෙ අඩ්ඪමාසො.

---

22. මහණෙනි, යම් භික්ෂුවක් තෙම මේ සතිපඨාන ධර්මයන් අවුරුදු සතක් මුලුල්ලෙහි කායානුස්මෘති ආදී භාවනාවන්ගේ වශයෙන් මෙසේ වඩන්නේද, ඔහුවිසින් ප්‍රධානඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවියයුතුයි. මේ අත්බැව්හිම අර්හත්ඵලය හෝ ක්ලේශයන්ගේ ඉතිරි බවක් ඇතිකල්හි අනාගාමී භාවය හෝ යි. මහණෙනි, අවුරුදු හතද, අවුරුදු සයද, අවුරුදු පසද, අවුරුදු සතරද, අවුරුදු තුණද, අවුරුදු දෙකද, අවුරුදු එකද, තුබුනා වේ. මහණෙනි, යම් කිසිවෙක් මාස සතක් සතර සතිපට්ඨානධර්මයන් කායානුස්මෘති ආදීන්ගේ වශයෙන් වඩන්නේද. ඔහු විසින් ප්‍රධාන ඵලදෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවියයුතු. මේ අත්බැව්හිම අර්හත් ඵලය හෝ අකුශල ධර්මශෙෂය ඇතිකල්හි අනාගාමිභාවය හෝ යි. මහණෙනි, මාස සත තුබුනාවේ. මහණෙනි, යම්කිසිවෙක් මේ සතර සතිපඨාන ධර්මයන් මාස සයක් මෙසේ වඩන්නේද. සංක්ෂෙප කරණලදි. මාස පසක්ද, මාස සතරක්ද, මාස තුණක්ද, මාස දෙකක්ද, අඩමසක්ද, එහුඹු කරණලදි. ඔහු විසින් ඵලදෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවියයුතුයි මේ අත්බැව්හි අර්හත්වය හෝ ක්ලේශයන්ගේ ඉතිරිබව ඇති කල්හි අනාගාමි භාවය හෝ යි. මහණෙනි, අඩමසක් සිටීවා.

යො හි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්තාහං තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං. දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසෙසෙ අනාගාමිතා. ඒකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානාති, ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති. ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාසතිපට්ඨාන සුත්තං නිට්ඨිතං.

බාවීසතිමං.

---

මහණෙනි, යම් කිසිවෙක් මේ සතිපට්ඨාන ධර්මයන් සත්දවසක් මෙසේ වඩන්නේද, ඔහු විසින් ඵලදෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවියයුතුයි. මේ අත් බැව්හි අර්හත්වය හෝ ක්ලේශයන්ගේ ඉතිරිබව ඇතිකල්හි අනාගාමිභාවය හෝයි. මහණෙනි, සත්වයන්ගේ පිරිසිදුබවලැබීම පිණිසද සොක කිරීමය. වැළපීමය. යන මොවුන්ගේ ඉක්මවීම පිණිසද, දුක් දොම් නස් දෙදෙනාගේ දුරලීම පිණිසද, අර්හත් ඵලලාභය පිණිසද,නිර්වාණය. ප්‍රත්‍යක්ෂකිරීම පිණිසද යම් මේ සතරසතිපට්ඨාන ධර්මයන්ගේ වැඩීමක් වේනම් මෙතෙම එකම මාර්ගයවේ.හෙවත් ශ්‍රේෂ්ඨ මාර්ගය වේයයි මෙසේ යමක් ප්‍රකාශකරණලද්දේනම් මේ ධර්මය ඒ කාරණය පිණිස වදාරණ ලද්දේයි. භාග්‍යවතුන්වහන්සේ මේ මහාසති පට්ඨාන සූත්‍රධර්ම දේශනාව වදාළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේගේ ධර්මකථාව සතුටින් පිළිගත්හ.

විසිදෙවෙනිවූ මහාසතිපට්ඨාන සූත්‍රාර්ථව්‍යාඛ්‍යාව

මෙතෙකින් නිමියේයි,

## XXIII. පායාසි සුත්තං.

1 එවමෙමසුතං. එකං සමයං ආයස්මා කුමාරකස්සපො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි යෙන සෙතව්‍යානාම කොසලානං නගරං තදවසරි. තත්‍රසුදං ආයස්මා කුමාරකස්සපො සෙතව්‍යායං විහරති උත්තරෙන සෙතව්‍යං සිංසපාවනෙ. තෙන ඛොපන සමයෙන පායාසි රාජඤ්ඤො සෙතව්‍යං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසෙනදිනා කොසලෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

---

### පායාසි සූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

—:0:—

1. මාවිසින් මේ සූත්‍රධර්මය මෙසේ අසනලදි. එක්කාලයෙක්හි ආයුෂ්මත් කුමාරකාශ්‍යපස්ථවිරයන්වහන්සේ භික්ෂූන් පන්සියයක් පමණවූ මහද් භික්ෂුසඞ්ඝයා සමග කොසල ජනපදයෙහි සැරිසරා වඩනාසේක් කොසල ජනපදවාසීන්ගේ සෙතව්‍යානම් නුවර යම්තැනකද එතනට පැමිණිසේක. එහිවූකලි ආයුෂ්මත් කුමාරකාශ්‍යපස්ථවිරයන්වහන්සේ සෙතව්‍යානම්නුවරට උත්තර දිශාභාගයෙහිවූ ඇට්වේරිය වනයෙහි වාසයකරණසේක. ඒකාලයෙහිදී පායාසි නමැති රජන්‍යතෙම පසේනදි කොසොල් රජහු විසින් දෙනලද් දවූ සත්ත්වයන්ගේ උත්සන්නතා ඇති හෙවත් නොයෙක් සත්ත්වයන්ගෙන් ගැවසිගත්තාවූ තෘණකාෂ්ඨෝදකාදිය හා ධාන්‍යසහිතවූ රජහු කෙරෙන් ලබනලද හෙයින් අනුභව කටයුතුවූ රජහුවිසින් දෙනලද දායාදයවූ ශ්‍රෙෂ්ඨ වශයෙන් දෙනලද හෙයින් බ්‍රහ්ම දෙය්‍යවූ හෙවත් රජස්වරූපයෙන් පරිභොගකටයුතුවූ සෙතව්‍යානම් නුවර අධිපතිව වාසය කෙරෙයි.

2. තෙන ඛොපන සමයෙන පායාසිස්ස රාජඤ්ඤස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති, ඉතිපි නත්ථි පරො ලොකො. නත්ථි සත්තා ඔපපාතිකා. නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. අස්සොසුං ඛො සෙතව්‍යකා බ්‍රාහ්මණගහපතිකා සමණො ඛලු භො කුමාරකස්සපො සමණස්ස ගොතමස්ස සාවකො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සෙතව්‍යං අනුප්පත්තො සෙතව්‍යායං විහරති. උත්තරෙන සෙතව්‍යං සිංසපාවනෙ. තංඛොපන භවන්තං කුමාරකස්සපං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො. පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභාණො වුඩ්ඪො චෙව අරහා ච. සාධුඛොපන තථාරූපානං අරහතං දස්සනං හොතීති. අථ ඛො සෙතව්‍යකා බ්‍රාහ්මණගහපතිකා

---

2. එකල්හි පායාසි රජන්‍යයාහට මේ මේ කාරණයෙන්ද මෙලොව සිටියාට පරලොව නැත්තේය. චුතව උපදනා (ඔපපාතික) සත්වයෝ නැත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේයයි මෙබඳුවූ ලාමක දෘෂ්ටියෙක් උපන්නේවෙයි. ඉක්බිත්තෙන් සෙතව්‍යා නුවරවාසීවූ බ්‍රාහ්මණ ගෘහපතීහු පින්වත්නි, ශ්‍රමණ භවද් ගෞතමයානන් වහන්සේගේ ශ්‍රාවකවූ කුමාර කාශ්‍යප ශ්‍රමණතෙමේ පන්සියයක් භික්ෂූන්වූ මහද් භික්ෂුසඞ්ඝයා සමග කොසල ජනපදයෙහි සැරිසරා වඩනාසේක් සෙතව්‍යා නුවරට පැමිණියේ සෙතව්‍යා නුවර සමීපයෙහිවූසෙතව්‍යානුවරටඋත්තරදිශාභාගයෙහිවූඇට්ටේරිය වනයෙහි වාසය කෙරෙයි.ඒකුමාර කාශ්‍යපස්ථවිරතෙම පණ්ඩිතය. ව්‍යක්තය, නුවනැත්තේය, බහුශ්‍රැතය, විසිතුරු කථා ඇත්තේය, යහපත් වැටහීම් ඇත්තේය. ඥානවෘද්ධත්වයෙන් හා අර්හත්වයෙන්ද යුක්තසේක. ඒ පින්වත් කුමාර කාශ්‍යපස්ථවිරයන් පිළිබඳවූ මෙබඳුවූ ප්‍රසිද්ධකීර්ති ශබ්දයෙක් පැණනැංගේයයිද එබඳු රහතන්ගේ දර්ශනය යහපත්ව වේයයිද ඇසුවාහුය. ඉක්බිත්තෙන් සෙතව්‍යා නුවර වැසි, බ්‍රාහ්මණ ගෘහපතිකයෝ.

සෙතව්‍යාය නික්ඛමිත්වා සඞ්ඝා සඞ්ඝී ගණීභූතා උත්තරෙන මුඛා ගච්ඡන්ති යෙන සිංසපාවනං තෙනුපසංකමන්ති.

3. තෙන ඛො පන සමයෙන පායාසිරාජඤ්ඤො උපරිපාසාදෙ දිවාසෙය්‍යං උපගතො හොති. අද්දසාඛො පායාසිරාජඤ්ඤො සෙතව්‍යකෙ බ්‍රාහමණගහපතිකෙ සෙතව්‍යාය නික්ඛමිත්වා සංඝසංඝී ගණීභූතෙ උත්තරෙන මුඛෙ ගච්ඡන්තෙ යෙන සිංසපාවනං තෙනුපසංකමන්තෙ. දිස්වා ඛත්තං ආමන්තෙසි. කින්නුඛො භො ඛත්තෙ සෙතව්‍යකා බ්‍රාහමණගහපතිකා සෙතව්‍යාය නික්ඛමිත්වා සංඝසංඝී ගණීභූතා. උත්තරෙන මුඛා ගච්ඡන්ති යෙන සිංසපාවනන්ති අත්ථිඛො භො සමණො කුමාරකස්සපො සමණස්ස ගොතමස්ස සාවකො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සෙතව්‍යං අනුප්පත්තො.

---

බොහෝ පරිද්දෙන් රැස්වූ සමූහයා ඇතිව නානා දිසාවන්හි රැස්වූ සමූහයා ඇතිව නුවරින් පිටතනික්මී රැස්වූ ගණයා ඇතිව උත්තර දිසාභිමුඛවූවාහු ගමන්කෙරෙත්. ඇට්ටේරිය වනය යම්තැනකද එතනට එලඹෙත්.

3. එවේලෙහිදී පායාසි රාජන්‍යතෙම ප්‍රාසාදයාගේ මතුමහල් තලයෙහි දිවාසෙය්‍යාවට පැමිණියේ වෙයි. ඉක්බිති බොහෝ පරිද්දෙන් රැස්වූ සමූහයා ඇතිව එක එක දිසායෙහි රැස්වූ සමූහයා ඇතිව නුවරින් පිටත නික්මී රැස්වූ ගණයා ඇතිව සෙතව්‍යානම් නුවරින් නික්ම උත්තර දිශාභි මුඛව යන්නාවූද ඇට්ටේරිය වනය යම් තැනකද එතනට එලඹෙන්නාවූද සෙතව්‍යා නගරවාසී බ්‍රාහ්මණ ගෘහපතිකයන් පායාසි රාජන්‍යතෙමේ දුටුයේය. දැක විචාළ ප්‍රශ්න ව්‍යාකරණයට සමර්ථවූ ඛත්තනම් මහාමාත්‍යයාහට ආමන්ත්‍රණය කළේය. පින්වත් ඛත්තය, සෙතව්‍යා නුවරවාසී බ්‍රාහ්මණ ගෘහපතිකයෝ බොහෝ පරිද්දෙන් රැස්වූ සමූහයා ඇතුව නානා දිශාවන්හි රැස්වූ සමූහයා ඇතිව නුවරින් පිටත නික්මී රැස්වූ ගණයා ඇතිව සෙතව්‍යා නුවරින් නික්ම උත්තරදිශාභි මුඛවූවාහු ඇට්ටේරිය වනය යම්තැනකද එහි කුමට එළඹෙද්දැයි විචාළේය. පින්වත, ඊට කාරණයෙක් ඇත්තේය. ගෞතම ශ්‍රමණයාගේ ශ්‍රාවකවූ කුමාර කාශ්‍යපශ්‍රමණතෙමේ පන්සියයක්පමණභික්ෂූන්වූ මහද්භික්ෂුසඞ්ඝයා සමග කොසොල් දනව්හි සැරිසරු වඩනාසේක් සෙතව්‍යානගරයට පැමිණියේ,

සෙතව්‍යායං විහරති, උත්තරෙන සෙතව්‍යං සිංසපාවනෙ. තං ඛො පන භවන්තං කුමාරකස්සපං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො. පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභාණො වුද්ධො චෙව අරහා චාති, තමෙතෙ භවන්තො කුමාරකස්සපං දස්සනාය උපසංකමන්තීති. තෙනහි භො ඛත්තෙ යෙන සෙතව්‍යකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසංකම. උපසංකමිත්වා සෙතව්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ එවං වදෙහි, පායාසි භො රාජඤ්ඤො එවමාහ, ආගමෙන්තු කිර භවන්තො පායාසිපි රාජඤ්ඤො සමණං කුමාරකස්සපං දස්සනාය උපසංකමිස්සතීති. පුරා සමණො කුමාරකස්සපො සෙතව්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ බාලෙ අව්‍යත්තෙ සඤ්ඤාපෙති. ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

---

සෙතව්‍යානම් නුවර සමිපයෙහිවූ ඒ සෙතව්‍යා නගරයට උත්තර දිශාභාගයෙහිවූ ඇට්වේරිය වනයෙහි වාසය කෙරෙති. ඒ කුමාරකාශ්‍යපස්ථවිරතෙමේ පණ්ඩිතය, නුවනැත්තේය, බහුශ්‍රැතය, විසිතුරු කථා ඇත්තේය. ඥානවෘද්ධත්වයෙන් හා අර්හත්වයෙන්ද යුක්තසේකැයි ඒ පින්වත් කුමාරකාශ්‍යපස්ථවිරයන් පිළිබඳවූ මේබඳු කීර්ති ශබ්දයෙක් පැනනැංගේය. ඒ පින්වත් කුමාරකාශ්‍යපස්ථවිරයන් දැකීම්පිණිස ඒ බ්‍රාහ්මණ ගෘහපතිකුයෝ එළඹෙත්'යයි සැලකෙළේය. පින්වත් ඛත්තය, එසේවීනම් සෙතව්‍යා නගරවාසී බ්‍රාහ්මණ ගෘහපතිකයෝ යම්තැනකද එතනට එළඹෙව. එළඹ සෙතව්‍යා නගරවාසී බ්‍රාහ්මණ ගෘහපතිකයන්ට මෙසේ කියව. කෙසේද පින්වත්නි; පායාසි රජන්‍යතෙමේ මෙසේ කියයි. පායාසි රජන්‍යතෙමේද කුමාර කාශ්‍යප මහණහු දැකීම පිණිස එළඹෙන්නේය. පින්වත්හු ඒතාක් නවතිත්වා'යි කියායි. ශ්‍රමණ කුමාරකාශ්‍යපස්ථවිරතෙමේ විහා අඥනවූ අව්‍යක්ත සෙතව්‍යානගරවාසී බ්‍රාහ්මණ ගෘහපතිකයන් මේකාරණයෙන්ද මොලොව සිටියාහට පරලොව ඇත්තේය, චුතව උපදනා ඔපපාතික සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාකයෙක් ඇත්තේයයි අවබොධ කරවයි.

නත්ථීති භො භොතො පරෙ ලොකො නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකොති. එවං භොතිඛො සො ඛත්තා පායාසිස්ස රාජඤ්ඤස්ස පටිස්සුත්වා යෙන සෙතව්‍යකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසංකමි, උපසංකමිත්වා සෙතව්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ එතදවොච පායාසි භො රාජඤ්ඤො එවමාහ, ආගමෙන්තු කිර භවන්තො පායාසිපි රාජඤ්ඤො සමණං කුමාරකස්සපං දස්සනාය උපසංකමිස්සතීති.

4. අථඛො පායාසි රාජඤ්ඤො සෙතව්‍යකෙහි බ්‍රාහ්මණගහපතිකෙහි පරිවුතො යෙන සිංසපාවනං යෙනායස්මා කුමාරකස්සපො තෙනුපසංකමි, උපසංකමිත්වා ආයස්මතා කුමාරකස්සපෙන සද්ධිං සම්මොදි.

---

පින්වත් ඛත්තය මෙලොව සිටියා හට පරලොව නැත්තේය. චුතව උපදනා ඕපපාතික සත්වයෝ නැත්තාහුය. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේයයි කියේය. එකල්හි ඒඛත්තානම් මහාමාත්‍යතෙම පින්වත, එසේයයි පායාසි රාජන්‍යයාගේ වචනය පිළිගෙණ සෙතව්‍යා නුවරවාසි බ්‍රාහ්මණ ගෘහපතිකයෝ යම්තැනකද එතනට පැමිණියේය. පැමිණ සෙතව්‍යානුවරවැසි බ්‍රාහ්මණ ගෘහපතිකයන්ට මේකාරණය කියේය. පින්වත්නි, පායාසි රාජන්‍යතෙමේ මෙසේ කියයි. පායාසි රාජන්‍යතෙමේද කුමාරකාශ්‍යප මහණහු දැකීම පිණිස එළඹෙන්නේය. පින්වත්හු ඒතාක් නවතින්වායි කියායි.

4. ඉක්බිත්තෙන් පායාසි රාජන්‍යතෙම සෙතව්‍යා නගරවාසී බ්‍රාහ්මණ ගෘහපතිකයන් විසින් පිරිවරණ ලද්දේ ඇටිඹෙටිරිය වනය යම්තැනකද ආයුෂ්මත් කුමාර කාශ්‍යපස්ථවිරයන්වහන්සේ යම්තැනකද එතනට එළඹියේය. එළඹ ආයුෂ්මත් කුමාර කාශ්‍යපස්ථවිරයන්වහන්සේ සමග සතුටුවූයේය.

සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. සෙතව්‍යකාපි ඛො බ්‍රාහ්මණගහපතිකා අප්පෙකච්චෙ ආයස්මන්තං කුමාරකස්සපං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ ආයස්මතා කුමාරකස්සපෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙනායස්මා කුමාරකස්සපො තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

5. එකමන්තං නිසින්නො ඛො පායාසි රාජඤ්ඤො ආයස්මන්තං කුමාරකස්සපං එතදවොච. අහඤ්හි භො කස්සප එවංවාදී එවංදිට්ඨි ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා

---

සතුටුවිය යුතුවූද සිහිකට යුතුවූද කථාව කොට නිමවා එකත්පසෙක උන්නේය. සෙතව්‍යා නගරවාසි බ්‍රාහ්මණ ගෘහපතිකයෝද සමහර කෙනෙක් ආයුෂ්මත් කුමාර කාශ්‍යපස්ථවිරයන් සකසා වැඳ එකත්පසෙක උන්නාහුය. කිසි කෙනෙක් ආයුෂ්මත් කුමාර කාශ්‍යපස්ථවිරයන් සමග සතුටුවූවාහුය. සතුටුවිය යුතුවූද සිහිකටයුතුවූද කථාව කොට නිමවා එකත්පස්ව උන්නාහුය. කිසිකෙනෙක් ආයුෂ්මත් කුමාරකාශ්‍යපස්ථවිරයන් වහන්සේ යම් තැනකද, ඒදෙසටඇඳිලිබැඳ එකත්පස්ව උන්නාහුය. කිසිකෙනෙක් නාමගොත්‍ර අස්වා එකත් පසෙක උන්නාහුය. කිසි කෙනෙක් නිශ්ශබ්දවූවාහු එකත්පසෙක උන්නාහුය.

5. එකත්පසෙක උන්නාවූ පායාසි රාජන්‍යතෙමේ ආයුෂ්මත් කුමාර කාශ්‍යපස්ථවිරයන්වහන්සේට මේකාරණය සැලකෙළේය. පින්වත් කාශ්‍යපය, මම වනාහි මෙසේ කියන සැහැව ඇත්තෙමි. මෙබඳු දෘෂ්ටි ඇත්තෙමි. කෙසේද, මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. ඕතුව උපදනා සත්වයෝ නැත්තාහුය.

නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. නාහං රාජඤ්ඤ එවංවාදිං එවං දිට්ඨිං අද්දසං වා අස්සොසිං වා. කථං හි නාම එවං වදෙය්‍ය. ඉතිපි නත්ථි පරෙලොකො. නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකොති තෙනහි රාජඤ්ඤ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි රාජඤ්ඤ ඉමෙ චන්දිමසුරියා ඉමස්මිං වා ලොකෙ පරස්මිං වා. දෙවා තෙ මනුස්සාවාති. ඉමෙ භො කස්සප චන්දිමසුරියා පරස්මිං ලොකෙ, න ඉමස්මිං. දෙවා තෙ. න මනුස්සාති. ඉමිනා ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු. ඉතිපි අත්ථි පරෙ ලොකො, අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

---

කුශලා කුශලකර්මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේය. කියායි. තවද රාජන්‍යය මෙසේ කියන ස්වභාව ඇත්තෙකු හෝ දෘෂ්ටි ඇත්තෙකු මම දිටුයෙම් හෝ නොවෙමි, ඇසුයෙම් හෝ නොවෙමි. මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුසලාකුශල කර්මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේය කියා කෙසේනම් මෙසේ කියන්නේද රාජන්‍යය එසේවීනම් තාම මේ කාරණයෙහි ලා විචාරන්නෙනමි. යම්පරිද්දෙකින් තට වැටහෙන්නේද එපරිද්දෙන් එය ප්‍රකාශකරව. රාජන්‍යය ඒ කුමකැයි සිතන්නෙහිද, මේ චන්ද්‍ර සූර්‍ය්‍යයෝ මේ ලොකයෙහි හෝ වෙද්ද පරලොකයෙහි හෝ වෙද්ද ඔව්හු දෙවියෝ හෝ වෙද්ද මිනුෂ්‍යයෝ හෝ වෙද්දැයි විචාළේය. එවිට රාජන්‍යතෙම පින්වත් කාශ්‍යපය මේ චන්ද්‍රසූර්‍ය්‍යයෝ පරලොකයෙහි වෙත්. මේ ලොකයෙහි නොවෙත්. මේ චන්ද්‍ර සූර්‍ය්‍යයෝ දෙවියෝ වෙත්. මනුෂ්‍යයෝ නොවෙත් යයි කීයේය. එවිට ස්ථවිරතෙම රාජන්‍යය මේ කාරණයෙන්ද තට මෙබඳු සිතෙක් ඇතිවේවා, මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාකයෙක් ඇත්තේය. කියායි.

6. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවං මෙ එත්ථ හොති ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකොති. අත්ථි පන රාජඤ්ඤ පරියායො යෙන තෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති, අත්ථි හො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා. නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. යථාකථං විය රාජඤ්ඤති, ඉධ මෙ හො කස්සප මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපී අභිජ්ඣාලූ ව්‍යපන්නචිත්තා මිච්ඡාදිට්ඨී.

---

6. පින්වත්වූ කාශ්‍යපතෙම් කිසිකාරණයක් සලකා මෙසේ කියයි. එසේමුත් මේකාරණයෙහි මාගේ අදහස මෙබඳුයි. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්‍මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේය කියායි. නැවත ක්ෂත්‍රියතෙමේ රාජන්‍යය මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්‍මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේයකියා තට යම් කාරණයකින් මෙබඳු සිතෙක් ඇතිවේද එසේවීමට කාරණයෙක් ඇත්තේදැයි විචාළේය. නැවත රාජන්‍යතෙම පින්වත් කාශ්‍යපය මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය කුශලා කුශල කර්‍මයන්ගේඵලවිපාකයෙක් නැත්තේයයිකියා යම්කාරණයකින් මටමෙබඳුසිතෙක්වේදඊටකාරණයෙක්ඇත්තේයයිකියේය. රාජන්‍යය ඒ කෙබඳුවූ කාරණයෙක්දැයි විචාළේය. පින්වත් කාශ්‍යපය ප්‍රාණඝාතකරණසුළුවූ නුදුන්දෙයගන්නාසුළුවූකාමයෙහි වරදවා හැසිරෙණ සුළුවූ බොරුකියන සුළුවූ කේලම් කියන්නාවූ පරුෂවචන කියන්නාවූ නිරර්ථක වචන කියන සුළුවූ විෂමලොභය ඇත්තාවූ ක්‍රොධසිත් ඇත්තාවූ මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ මාගේ මිත්‍රාමාත්‍යයෝද නෑ සහ ලේ නෑයෝද ඇත්තාහ.

තෙ අපරෙන සමයෙන ආබාධිකා හොන්ති. දුක්ඛිතා බාළ්හගිලානා. යදාහං ජානාමි න දානිමෙ ඉමම්හා ආබාධා වුට්ඨහිස්සන්තීති, ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි, සන්ති ඛො භො එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො යෙ තෙ පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුණාවචා ඵරුසාවාචා සම්ඵප්පලාපී අභිජ්ඣාලූ ව්‍යාපන්නචිත්තා මිච්ඡාදිට්ඨී. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සන්තීති. භවන්තො ඛො පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපී අභිජ්ඣාලූ ව්‍යාපන්නචිත්තා මිච්ඡාදිට්ඨී, සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං භවන්තො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සන්ති.

---

ඔව්හු' මෑතකාලයෙක්හි ආබාධ යෙන් යුක්තවූවාහු දුකට පැමිණි යාහු දැඩිවූ ගිලන්බැව් ඇත්තාහු වෙද්ද මොහු දැන් මේ ආබාධයෙන් නොනැගිටින්නාහුයයි යම්කලක මම දනිම්ද (එකල) මම ඔවුන්කරා එළඹ මෙසේ කියමි. පින්වත්නි, යම් ඒ සත්වයෙකනෙක් ප්‍රාණඝාත කරණ සුලුවෙද්ද නුදුන්දෙයගන්නා සුලුවෙද්ද කාමයන්හි වරදවා හැසිරෙණ සුලුවෙද්ද බොරුකියන සුලුවෙද්ද කේලාම් කියද්ද පරුෂ වචන කියද්ද නිරර්ථක වචන කියන සුලු වෙද්ද විෂමලොභය ඇත්තාහු වෙද්ද මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු වෙද්ද ඔව්හු ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු සැපතින් පහවූ දුර්ගති ඇත්තාවූ විවසව පවතින්නාවූ නරකයෙහි උපදින්නාහුයයි මෙසේ කියන සුලුවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහුය. ඒ පින්වත්හු ප්‍රාණඝාතකරණ සුලුය නුදුන්දේ ගන්නා සුලුය කාමයන්හි වරදවා හැසිරෙණ සුලුය බොරුකියන සුලුය කේලාම් කියනසුලුය පරුෂ වචන කියන සුලුය නිරර්ථක වචන කියනසුලුය විෂමලොභය ඇත්තාහු වෙත්ද ක්‍රොධසිත් ඇත්තාහු වෙත්ද මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුවෙත්ද ඉදින් ඒපින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේවචනය සත්‍යනම් පින්වත්හු ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු සැපතින් පහවූ දුර්ගතිඇත්තාවූ විවසව පතිතවන්නාවූ නිරයෙහි උපදින්නාහුය.

සමෙව හො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යාථ,යෙන මෙ ආගන්ත්වා අරොචෙය්‍යාථ, ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. භවන්තොබො පන මෙ සද්ධායිකා පච්චයිකා යං භවන්තෙහි දිට්ඨං යථා සාමං දිට්ඨං එවමෙතං භවිස්සතීති. තෙ මෙ සාධූති පටිස්සුත්වා නෙව ආගන්ත්වා ආරොචෙන්ති, නපන දූතං පහිණන්ති. අයම්පිඛො මෙ භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

7. තෙනහි රාජඤ්ඤ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි රාජඤ්ඤ.

---

පින්වතුන්ති ඉදින් ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු සැපතින් පහවූ දුර්ගති ඇත්තාවූ විවසව පතිතවත්නාවූ නිරයෙහි උපදින්නහු නම් මේ කාරණයෙන්ද මෙලොව සිටිනාහට පරලොව ඇත්තේය. ච්‍යුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයිකියා යම් පරිද්දෙකින් මාකරා අවුත් දන්වන්නාවිද, පින්වත්හු මට ඇදහියයුතු වචන ඇත්තෝය. විශ්වාසකටයුතු වචන ඇත්තෝය. පින්වතුන්විසින් යමක් දක්නාලදද තමාවිසින්දක්නාලද්දක්ය එසේද එපරිද්දෙන්ම මේ කාරණය වන්නේයයි කියායි. ඔව්හු මාගේ වචනය යහපතැයි පිළිගෙණ ( නැවත )අවුත් නොමදන්වත්. දූතයකුදු නොම එවත්. පින් වත් කාශ්‍යපය, මේකාරණයෙන්ද මෙලොව සිටිනාහට පරලොව නැත්තේය. ච්‍යුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා යම්කාරණයකින් මට මෙබඳු සිතෙක්ඇතිවේද මේද ඊට එක් කාරණයෙක්වේයයි කියේය.

7. එවිට ස්ථවිරතෙමේ රාජන්‍යය එසේවීනම් මෙකාරණයෙහි නාව විචාරන්නෙමි, යම්පරිද්දෙකින් තට කැමති වන්නේද එපරිද්දෙන් ඒප්‍රකාශකරවයි කියේය. රාජන්‍යය, ඒකුමකැයි සිතන්නෙහිද,

ඉධ තෙ පුරිසා චොරං අගුචාරිං ගහෙත්වා දස්සෙය්‍යුං, අයං තෙ භන්තෙ
චොරො ආගුචාරී ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති, තෙ ත්වං එවං
වදෙය්‍යාසි. තෙනහි භො ඉමං පුරිසං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං
ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන
පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා
දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස ආඝා
තනෙ සීසං ඡින්දථාති. තෙ සාධූති පටිස්සුණිත්වා තං පුරිසං දළ්හාය
රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා
ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං
පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නග
රස්ස ආඝාතනෙ නිසීදාපෙය්‍යුං, ලබ්භෙය්‍ය නු ඛො සො චොරො චො
රඝාතෙසු. ආගමෙන්තු තාව භවන්තො චොරඝාතා අමුකස්මිං මෙ
ගාමෙ වා නිගමෙ වා මිත්තාමච්චා ඤාතිසාලොහිතා.

---

මේ ලොකයෙහි තාගේ පුරුෂයෝ අපරාධ කරණසුලුවූ සොරෙකු
අල්වාගෙණ ස්වාමීනි මේතෙම තුඹවහන්සේගේ අණට විරුඬව අපරා
ධ කරණසුලුවූ සොරෙක. මෝහට යම්දඬුවමක් කැමැත්තෙහිද ඒ
දඬුවම පමුණුවයි. කියාදක්වන්නාහු නම් එකල තුඹ ඒපුරුෂයන්ට
මෙසේ කියන්නෙහිය. කෙසේද පින්වත්නි එසේනම් මේ පුරුෂයා
දෘඪවූ රැහැණින් පිටිතල හයා දෘඪවූ බන්ධනයෙන් බැඳ බුරයෙන්
හිස මුඩුකොට කෲරවූ නාදඇති වදබෙරගසමින් වීථියෙන් වීථියටද
සතරමං සන්ධියෙන් සතරමං සන්ධියටද ගෙණගොස් දක්ෂිණවාර
යෙන් නික්මවා නුවරට දකුණු දිගින් පිහිටි වධකස්ථානයෙහිදී හිස
සිඳිව්යයි කියායි. ඔව්හු යහපතැයි පිළිගෙණ ඒ චොරපුරුෂයා දෘඪ
වූ රැහැණින් පිටිතලහයා දෘඪවූ බන්ධනය බැඳ බුරයෙන් හිස මුඩු
කොට කෲරවූ නාදඇති වදබෙරයෙන් වීථියෙන් වීථියටද සතරමං
සන්ධියෙන් සතරමං සන්ධියටද ගෙණගොස් දක්ෂිණවාරයෙන් නික්
මවා නුවරට දකුණුදිගින් පිහිටි වධකස්ථානයෙහි හිඳුවන්නාහුනම්
ඒ සොරතෙම චොරඝාතකයන් කෙරෙහි පින්වත් චොරඝාතකයෙනි
අසවල් ගමෙහි හෝ නියම් ගමෙහි මාගේ මිත්‍රාමාත්‍යයෝද සහ
ල් නෑයොද ඇත්තාහුය.

යාවාහං තෙසං උද්දෙසසත්වා ආගච්ඡාමීති, උදාහු විප්පලපන්තස්සෙව චොරඝාතා සීසං ඡින්දෙය්‍යුන්ති. නහි සො භො කස්සප චොරො ලභෙය්‍ය චොරඝාතෙසු. ආගමෙන්තු තාව භවන්තො චොරඝාතා අමුකස්මිං ගාමෙ වා නිගමෙ වා මිත්තාමච්චා ඤාති සාලොහිතා යාවාහං තෙසං උද්දෙසසත්වා ආගච්ඡාමීති. අථඛො නං විප්පලපන්තස්සෙව චොරඝාතා සීසං ඡින්දෙය්‍යුන්ති. සො හි නාම රාජඤ්ඤ චොරො මනුස්සො මනුස්සභූතෙසු චොරඝාතෙසු න ලභිස්සති. ආගමෙන්තු තාව භවන්තො චොරඝාතා අමුකස්මිං මෙ ගාමෙ වා නිගමෙ වා මිත්තාමච්චා ඤාතිසාලොහිතා යාවාහං තෙසං උද්දෙසසත්වා ආගච්ඡාමීති.

---

යම්තාක් කල් මම ඔවුන්ට තමන්ද තැන්පත් කළයුතු භාණ්ඩද දක්වා එම්ද ඒතාක් නවතින්වායි අවකාශයක් ලබන්නේද හෙවත් විලාපකියන්නාහුගේම හිස චොරඝාතකයෝ සිඳින්නාහුදැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, ඒ සොරතෙම චොරඝාතකයන්කෙරෙහි පින්වත් චොරඝාතකයෙනි, අසවල් ගමෙහි හෝ නියම්ගමෙහි හෝ මාගේ මිත්‍රාමාත්‍යයෝද සහලේනෑයෝද ඇත්තාහුය. යම්තාක්කල් මම ඔවුන්ට තමන්ද තැන්පත්කළයුතු භාණ්ඩද දක්වා එම්ද ඒතාක්කල් නවතින්වා හෙවත් බලාපොරොත්තු වෙන්වායි. අවකාශයක් නොලබන්නේමය. කුමක්වේදයත් විලාප කියන්නාහුගේම හිස චොරඝාතකයෝ සිඳින්නාහුයයි කියේය. එවිට ස්ථවිරතෙම රාජන්‍යය, ඒ සොරාවනාහි මනුෂ්‍යයෙක. මනුෂ්‍යවූ චොරඝාතකයන් කෙරෙහි පින්වත් චොරඝාතයෙනි, අසවල් ගමෙහි හෝ නියම්ගමෙහි හෝ මාගේ මිත්‍රාමාත්‍යයෝද සහලේනෑයෝද ඇත්තාහ. යම් තාක් මම ඔවුන්ට තමන්ද තැන්පත් කළයුතු භාණ්ඩද දක්වා එම්ද ඒතාක්කල් බලාපොරොත්තු වෙන්වායි අවකාශයක් නොලබන්නේනම්

කිංපන තෙ මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාති අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපී අභිජ්ඣාලූ ව්‍යාපන්නචිත්තා මිච්ඡාදිට්ඨී කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පන්නා ලභිස්සන්ති නිරයපාලෙසු ආගමෙන්තු තාව භවන්තො නිරයපාලා යාව මයං පායාසිස්ස රාජඤ්ඤස්ස ගන්ත්වා ආරොචෙම, ඉතිපි අත්ථි පරො ලොකො. අත්ථි සත්තා ඕපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු. ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඕපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

8. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථඛො එවමෙම එත්ථ හොති.

---

කිමෙක්ද ප්‍රාණඝාත කරණසුලුවූ නුදුන්දේ ගන්නාසුලුවූ කාමයන්හි වරදවා හැසිරෙණ සුලුවූ බොරුකියන සුලුවූ කේලාම් කියන සුලුවූ පරුෂවචන කියන සුලුවූ නිරර්ථකවචන කියන සුලුවූ විෂමලොභය බහුලකොට ඇත්තාවූ ක්‍රොධසිත් ඇත්තාවූ මිථ්‍යාදෘෂ්ටිකවූ තගේ මිත්‍රාමාත්‍යයෝද සහ ලේ නෑයෝද ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු සැපතින්පහවූ දුගීතිවූ විවශව පතිතවෙන්නාවූ නරකයෙහි උපන්නාහු නිරයපාලයන් අතුරෙහි පින්වත් නිරයපාලයෙනි, යම්තාක්කල් අපි පායාසි රාජන්‍යයාහට ඔහුකරා පැමිණ මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කියා දන්වන්නමෝද ඒතාක්කල් බලාපොරොත්තු වෙත්වායයි කෙසේ නම් අවකාශ ලබන්නාහුද රාජන්‍යය, තට මේ කාරණයෙන්ද මෙබඳු සිතෙක් ඇතිවේවා කෙ. බදු සිතෙක්ද යත් මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේය යන මෙබඳුවූ සිතෙකැයි කීයේය.

8. පින්වත්වූ කාශ්‍යපතෙමේ කිසිසේත් මෙසේ කියයි. එසේ වී නමුත් මේ කාරණයෙහි මාගේ අදහස මෙබදු වෙයි.

ඉතිපි නත්ථි පරෙ ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකොති. අත්ථි පන රාජඤ්ඤ පරියායො යෙන තෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරෙ ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකොති. අත්ථි භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරෙ ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. යථාකථං විය රාජඤ්ඤාති. ඉධ මෙ භො කස්සප මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡා චාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා පිසුණාය වාචාය පටිවිරතා ඵරුසාය වාචාය පටිවිරතා සම්ඵප්පලාපා පටිවිරතා අනභිජ්ඣාලූ අව්‍යාපන්නචිත්තා සම්මාදිට්ඨී.

---

මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්‍මයන්ගේ ඵලවිපාක එයෙක්නැත්තේයයි කියායි. රාජන්‍යය, මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්‍මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේයයි කියා යම් කාරණයකින්නුනව මෙබඳු සිතෙක් ඇතිවේද ඊට කාරණයෙක් ඇත්තේදැයි සඵිර තෙම විචාළේය. පින්වත් කාශ්‍යපය, මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්‍මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේයයි කියා යම් කාරණයකින් මට මෙබඳු සිතෙක් ඇත්තේ වේද ඊට කාරණයෙක්ඇත්තේයයි රාජන්‍ය තෙම කියේය. රාජන්‍යය ඒ කෙබඳු කාරණයෙක් දැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, මේ ලොකයෙහි ප්‍රාණඝාතයෙන් වැළකුනාවූ නුදුන්දේ ගැනීමෙන් වැළකුනාවූ කාමමිථ්‍යාචාරයෙන් වැළකුනාවූ බොරුකීමෙන් වැළකුනාවූ කේලාම්කීමෙන් වැළකුනාවූ පරුෂ වචන කීමෙන් වැළකුනාවූ නිරර්ථක වචනකීමෙන් වැළකුනාවූ විෂම ලොභය බහුලකොට නැත්තාවූ ක්‍රොධ රහිත සිත්ඇත්තාවූ සම්‍යක් දෘෂ්ටි ඇත්තාවූ මාගේ මිත්‍රාමාත්‍යයන් හා සහලේ නෑ කෙනෙක් වෙද්ද.

තෙ අපරෙන සමයෙන ආබාධිකා හොන්ති. දුක්ඛිතා බාළ්හගිලා-
නා යදාහං ජානාමි. න දානි මෙ ඉමම්හා ආබාධා වුට්ඨහි
ස්සන්තීති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි සන්ති ඛො භො
එකෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො යෙ තෙ පාණාති
පාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවි
රතා මුසාවාදා පටිවිරතා පිසුණාය වාචාය පටිවිරතා ඵරුසාය වාචා-
ය පටිවිරතා සම්ඵප්පලාපා පටිවිරතා අනභිජ්ඣාලූ. අව්‍යාපන්නචි
ත්තා සම්මාදිට්ඨී තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං
උපපජ්ජන්තීති. භවන්තො ඛො පාණාතිපාතා පටිවිරතා අදින්නා
දානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා
පිසුණාය වාචාය පටිවිරතා ඵරුසායවාචාය පටිවිරතා සම්ඵප්පලාපා
පටිවිරතා අනභිජ්ඣාලූ අව්‍යාපන්නචිත්තා සම්මාදිට්ඨී.

ඔව්හු මෑත කාලයෙක්හි ආබාධයෙන් යුක්තවූවාහු දුකට පැමිණියාහු
දැඩිවූ ගිලන්බැව් ඇත්තාහු වෙද්ද, යම් කලක මම මොව්හු දැන් මේ
ආබාධයෙන් නොනැගිසිටින්නාහුයයි දනිම්ද, එකල මම ඔවුන් කරා
එළඹ මෙසේ කියමි. පින්වත්නි, යම් ඒසත්ව කෙනෙනක් ප්‍රාණඝාත
යෙන් වැළකුනාහුද අදත්තාදානයෙන් වැළකුනාහුද කාමමිථ්‍යාචා
රයෙන් වැළකුනාහුද බොරුකීමෙන් වැළකුනාහුද, කේලාම් කී
මෙන් වැළකුනාහුද, පරුෂ වචනකීමෙන් වැළකුනාහුද, නිරර්ථක
වචනකීමෙන් වැළකුනාහුද, විෂම ලොභය බහුලකොට නැත්තාහුද
ක්‍රොධ රහිත සිත් ඇත්තාහුද, සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුද, ඔව්හු
ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු මනාගති ඇත්තාවූ සැපතින්
අගුවූ දිව්‍ය ලොකයෙහි උපදින්නාහුයයි මෙසේ කියන සුළුවූ මෙසේ
දෘෂ්ටි ඇත්තාවූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇත්තාහුමය.
පින්වත්නි, ඔව්හු වනාහි ප්‍රාණඝාතයෙන් වැළකුනාහුය. අදත්තාදා
නයෙන් වැළකුනාහුය. කාමමිථ්‍යාචාරයෙන් වැළකුනාහුය. මුසාවා
දයෙන් වැළකුනාහුය. කේලාම් කීමෙන් වැළකුනාහුය. පරුෂ ව
චන කීමෙන් වැළකුනාහුය. නිරර්ථක වචන කීමෙන් වැළකුනාහුය.
විෂම ලොභය බහුලකොට නැත්තාහුය. ක්‍රොධයට පැමිණි සිත්
නැත්තාහුය. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුය.

සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. භවන්තො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සන්ති. සචෙ ඛො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාථ. යෙන මෙ ආගන්ත්වා ආරොචෙය්‍යාථ. ඉතිපි අත්ථි පරො ලොකො. අත්ථි සත්තා ඔපපාතිකා. අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකොති. භවන්තො ඛො පන මෙ සද්ධායිකා පච්චයිකා යං භවන්තෙහි දිට්ඨං යථා සාමං දිට්ඨං එවමෙතං භවිස්සතීති. තෙ මෙ සාධූති පටිස්සුණිත්වා නෙව ආගන්ත්වා ආරොචෙන්ති න පන දූතං පහිණන්ති. අයම්පි ඛො භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

---

ඉදින් ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහමණයන්ගේ වචනය සත්‍යවීනම් පින්වත්හු ශරිරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ සැපතින් අග්‍රවූ දිව්‍ය ලොකයෙහි උපදින්නාහුය. පින්වත්නි, ඉදින් ශරිරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගතිඇති සැපතින් අග්‍රවූ දිව්‍යලොකයෙහි උපදින්නාහුනම් මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශලකර්මයන් ඵලවිපාක ඇත්තේයයි කියා යම් හෙයකින් මාකරුපැමිණ මටසැලකරත් නම්ද පින්වත්හු වනාහි ඇදහියයුතු වචන ඇත්තාහුය. විශ්වාස කටයුතු වචන ඇත්තාහුය. පින්වත්හු විසින් යමක් දක්නාලද්දේද තමා විසින්ම දක්නාලද්දක් යම්සේද එපරිද්දෙන්ම මේකාරණය දත්තේයයි කියාය. ඔහු මැනවයි මාගේ වචනය පිළිගෙණ [නැවත මාකරු] අවුත් නොම දන්වත්. දූතයකුදු නොම එවත්. පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා මට මෙබඳුවූ අදහසෙක් වේද ඊට මේද එක්කාරණයෙක් වෙයි.

9. තෙනහි රාජඤ්ඤ උපමං තෙ කරිස්සාමි උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති සෙය්‍යථාපි රාජඤ්ඤ පුරිසො ගූථකූපෙ සසීසකො නිමුග්ගො අස්ස. අථ ත්වං පුරිසො ආණාපෙය්‍යාසි. තෙනහි භො තං පුරිසං තම්හා ගූථකූපා උද්ධරථාති තෙ සාධූති පටිස්සුණිත්වා තං පුරිසං තම්හා ගූථකූපා උද්ධරෙය්‍යුං තෙ ත්වං එවං වදෙය්‍යාසි, තෙනහි භො තස්ස පුරිසස්සකායා වෙළුපෙසිකාහි ගූථං සුනිම්මජ්ජිතං නිම්මජ්ජථාති. තෙ සාධූති පටිස්සුණිත්වා තස්ස පුරිසස්සකායෙ වෙළුපෙසිකාහි ගූථං සුනිම්මජ්ජිතං නිම්මජ්ජෙය්‍යුං තෙ ත්වං එවං වදෙය්‍යාසි, තෙනහි භො තස්ස පුරිසස්ස කායං පණ්ඩුමත්තිකාය තික්ඛත්තුං සුබ්බට්ටිතං උබ්බට්ටෙථාති. තෙ තස්ස පුරිසස්ස කායං පණ්ඩුමත්තිකාය තික්ඛත්තුං සුබ්බට්ටිතං උබ්බට්ටෙය්‍යුං තෙ ත්වං එවං වදෙය්‍යාසි.

---

9. රාජන්‍යය, එසේවීනම් තට උපමාවක් කරන්නෙමි. මේලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ උපමායෙන්ද කියනලද වචනයාගේ අර්ථය අවබොධ කෙරෙත්. රාජන්‍යය, යම්සේ පුරුෂයෙක් අසුචි වළෙක්හි හිසසහිතව ගිලුනේ වේද, එකල තෝ පින්වත්නි, එසේවීනම් ඒ පුරුෂයා අසුචිවළෙන් ගොඩනගව්යයි කියා [තාගේ] පුරුෂයන්ට ආඥාකරන්නෙහිය, ඔව්හු යහපතැයි ප්‍රතිවචනදී අසුචි වළෙහි ගිලුන ඒ පුරුෂයා අසුචිවළෙන් ගොඩනගන්නාහුය. එකල තෝ පින්වත්නි, එසේවීනම් ඒ පුරුෂයාගේ ශරීරයෙන් අසුචි උණපතුරුවලින් මනාකොට පහකරණ ලද්දක්වේද. එපරිද්දෙන් පහකරව්යයි කියා [තාගේ] පුරුෂයන්ට කියන්නෙහිය. ඔව්හු යහපතැයි ප්‍රතිවචනදී ඒ පුරුෂයාගේ ශරීරයෙහිවූ අසුචි උණපතුරු වලින් යම්සේ මනාකොට පිසදමන ලද්දක්වේද. එපරිද්දෙන් පහකරන්නාහුය. එකල තෝ ඔවුන්ට පින්වත්නි, එසේවීනම් ඒ පුරුෂයාගේ ශරීරය පඬුවන් මැටියෙන් තුන්වරක් උලනලද්දේ වේද, එපරිද්දෙන් මනාකොට උලව්යයි කියන්නෙහිය. ඔව්හු ඒ පුරුෂයාගේ ශරීරය පඬුවන් මැටියෙන් යම්සේ මනාකොට උලනලද්දේ වේද එපරිද්දෙන් උලන්නාහුය. එකල තෝ ඔවුන්ට මෙසේ කියන්නෙහිය.

තෙනහි භො තං පුරිසං තෙලෙන අබ්භඤ්ජිත්වා සුබුමෙන චුණ්ණෙන නික්ඛන්තුං සුප්පධොතං කරොථාති. තෙ තං පුරිසං තෙලෙන අබ්භඤ්ජිත්වා සුබුමෙන චුණ්ණෙන නික්ඛන්තුං සුප්පධොතං කරෙය්‍යුං. තෙ ත්වං එවං වදෙය්‍යාසි. තෙනහි භො තස්ස පුරිසස්ස කෙසමස්සුං කප්පෙථාති. තෙ තස්ස පුරිසස්ස කෙසමස්සුං කප්පෙය්‍යුං. තෙ ත්වං එවං වදෙය්‍යාසි. තෙනහි භො තස්ස පුරිසස්ස මහග්ඝඤ්ච මාලං මහග්ඝඤ්ච විලෙපනං මහග්ඝානිච වත්ථානි උපහරථාති. තෙ තස්ස පුරිසස්ස මහග්ඝඤ්ච මාලං මහග්ඝඤ්ච විලෙපනං මහග්ඝානිච වත්ථානි උපහරෙය්‍යුං තෙ ත්වං එවං වදෙය්‍යාසි. තෙනහි භො තං පුරිසං පාසාදං ආරොපෙත්වා පඤ්ච කාමගුණානි උපට්ඨපෙථාති තෙ තං පුරිසං පාසාදං ආරොපෙත්වා පඤ්ච කාමගුණානි උපට්ඨපෙය්‍යුං. තං කිං මඤ්ඤසි රාජඤ්ඤ.

පින්වත්නි, එසේවීනම් ඒපුරුෂයා තෙලින්නල්වා සියුම්වූ චූර්ණයෙන් තුන්වරක් යම්සේ මනාකොට සුඩකරණලද්දක් වේද එපරිද්දෙන් මනාකොට සුඩකරව්යයි කියාය. ඔව්හු ඒ පුරුෂයා තෙලින් ගල්වා සියුම්වූ චූර්ණයෙන් තුන්වරක් මනාකොට සුඩකරණලද්දකු කරන්නාහුය. නැවත තෝ ඒ පුරුෂයන්ට මෙසේ කියන්නෙහිය. පින්වත්නි, එසේවිනම් ඒ පුරුෂයාගේ ඉසකේ හා දැළිරැවුල් සරසව්යයි කියාය, ඔව්හු ඒ පුරුෂයාගේ ඉසකේ හා දැළිරැවුල් සරසන්නාහුය. නැවත තෝ ඔවුන්ටමෙසේ කියන්නෙහිය. පින්වත්නි, එසේවිනම් ඒ පුරුෂයාට මාහැඟිවූ විලවුන්ද මාහැඟිවූ වස්ත්‍රයන්ද එළවව්යයි කියාය. ඔව්හු ඒපුරුෂයාහට මාහැඟිවූ මල්ද මාහැඟිවූ විලවුන්ද මාහැඟිවූ වස්ත්‍රයන්ද එළවන්නාහුය. තෝ ඔවුන්ට මෙසේ කියන්නෙහිය- පින්වත්නි, එසේවිනම් ඒපුරුෂයා ප්‍රාසාදයට නන්වා පඤ්චකාම ගුණයන් එළවව්යයි කියාය. ඔව්හු ඒපුරුෂයන් ප්‍රාසාදයට නන්වා පඤ්චකාම ගුණයන් එළවන්නාහුය. රාජන්‍යය, ඒකුමකැයි සිතන්නෙහිද.

අපිනු තස්ස පුරිසස්ස සුනහාතස්ස [සුවිලිත්තස්ස කප්පිතකෙසමස්සුස්ස ආමුත්ත මාලාභරණස්ස ඔදාත වත්ථවසනස්ස උපරිපාසාදවරගතස්ස පඤ්චහි කාමගුණෙහි සමප්පිතස්ස සමඞ්ගීභූතස්ස පරිචාරියමානස්ස පුනදෙවතස්මිං ගූථකූපෙ නිම්මුජ්ජිතුකාමතා අස්සාති. නොහිදං භො කස්සප තං කිස්ස හෙතු. අසුචි හො කස්සප ගූථකූපො අසුචිචෙව අසුචි සංඛාතොච දුග්ගන්ධොච දුග්ගන්ධසංඛාතොච ජෙගුච්ඡොච ජෙගුච්ඡසඞ්ඛාතොච පටික්කූලොච පටික්කූල සංඛාතොචාති. එව මෙවඛො රාජඤ්ඤ මනුස්සා දෙවානං අසුචි චෙව අසුචිසඞ්ඛාතාච දුග්ගන්ධාච දුග්ගන්ධ සඞ්ඛාතාච. ජෙකුච්ඡාච ජෙගුච්ඡ සඞ්ඛාතාච පටික්කූලාච පටික්කූල සඞ්ඛාතාච. යොජනසතං ඛො රාජඤ්ඤ මනුස්සගන්ධො දෙවෙ උබ්බාහති.

---

කිමෙක්ද මනාකොටස්නානය කරණලද්දාවූ මනාකොට ආලේපනය කරණලද්දාවූ සරසනලද ඉසකේහාදැළිරැවුල් ඇත්තාවූ පලඳිනලද මාලාභරණයන් ඇත්තාවූ හඳිනලද සුදුපිළි ඇත්තාවූ උතුම්වූ ප්‍රාසාදයාගේ මතුමහල් තලයට පැමිණියාවූ පඤ්චකාමගුණයෙන් පිණාගියාවූ එයින්ම යුක්තවූ ඔබ මොබ හැසිරෙන්නාවූ ඒ පුරුෂයාට නැවතත් අසුචි වළෙහි ගිලෙනු කැමති බවෙක් වන්නේදැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, එසේ කැමතිබවෙක් නොවන්නේමය. ඊට කාරණා කවරේද පින්වත් කාශ්‍යපය, අසූචිවළ අමනාපවෙයි. අපවිත්‍රමවෙයි. අසූචියෙක්මවෙයි. අසුචි කොඨාසයෙක්වූයේද වෙයි. දුගඳවෙයි. දුගින්ධයෙක් වූයේද වෙයි. පිළිකුල්කටයුතු වෙයි. පිළිකුල්කටයුතු කොඨාසයෙක් වූයේද වෙයි. දකිනයෙන්ම පිළිකුල් වෙයි. දැකීමෙන්ම පිළිකුල් කොටසෙක් වූයේයයි කීයේය. රජන්‍යය, එපරිද්දෙන්ම මනුෂ්‍යයෝ දෙවියන්ට අමනාපයෝමය. අසූචි කොඨාසයෝද වෙත්. දුගින්ධයෝ දවෙත්. දුගීන්ධ කොඨාසයෝද වෙත්. පිළිකුල් කටයුත්තාහු වෙත්. පිළිකුල් කටයුතුකොඨාසයෝද වෙත්. දැකීමෙන්ම පිළිකුල්වෙත්. දැකීමෙන්ම පිළිකුල් කොඨාසයෝද වෙත්. රජන්‍යය, යොදුන් සියයක් තන්හි මනුෂ්‍ය ගන්ධයතෙම දෙවියන් බාධාකෙරෙයි. හෙවත් දවසට දෙවරක් ස්නානය කොට තුන්වරක් වස්ත්‍රයන් පරිවර්තනයකොටම ආභරණයෙන් සැරසුනාවූ සක්විති ආදීවූද මනුෂ්‍යයන්ගේ ශරීරගන්ධය යොදුන් සියයක් තැණිහි සිටියාවූ දෙවියන්ගේ බොටුවෙහි ඇලුනු කුණපයක්මෙන් බාධාකෙරෙයි.

කිම්පන තෙ මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා පිසුණාය වාචාය පටිවිරතා ඵරුසාය වාචාය පටිවිරතා සම්ඵප්පාලාපා පටිවිරතා අනභිජ්ඣාලූ, අව්‍යාපන්නචිත්තා සම්මාදිට්ඨී කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා. තෙ ආගන්ත්වා අරොචෙස්සන්ති. ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඔපපාතිකා. අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති, ඉමිනාපි බො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු. ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

10. කිඤ්චාපි භවං කස්සපො එවමාහ අථඛො එවමෙම එත්ථ හොති ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකොති.

---

කිමෙක්ද ප්‍රාණඝාතයෙන් වැලකුනාවූ අදත්තාදානයෙන් වැලකුනාවූ කාමමිථ්‍යාචාරයෙන් වැලකුනාවූ බොරුකිමෙන් වැලකුනාවූ කේලාම් කිමෙන් වැලකුනාවූ පරුෂ වචන කිමෙන් වැලකුනාවූ නිරර්ථක වචනකීමෙන් වැලකුනාවූ විෂමලොභය බහුලකොට නැත්තාවූ ක්‍රොධයට නොපැමිණි සිත් ඇත්තාවූ සම්‍යක් දෘෂ්ටි ඇත්තාවූ තාගේ මිත්‍රාමාත්‍ය සහ ලේ නෑයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු මනාගති ඇත්තාවූ සැපතින් අග්‍රවූ දිව්‍යලොකයෙහි උපත් නාහු මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කුමට කෙසේ නම් දන්වන්නාහුද රජ න්‍යය, මේ කාරණයෙන්ද තට මෙබඳු සිතෙක් වේවා. මේ කාරණ යෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත් තේයයි කියායි.

10. කිසිසේත් භවත් කාශ්‍යප තෙමේ මෙසේ කියන්නේය. එසේ වූයේ නමුත් මේකාරණයෙහි මාගේ අදහස මෙබඳු වෙයි. මේකාරණ යෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියාය.

අත්ථි පන රාජඤ්ඤ පරියායො ...පෙ... අත්ථි භො කස්සප පරියායො ...පෙ... යථා කථංවිය රාජඤ්ඤාති. ඉධ මෙ භො කස්සප මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා තෙ අපරෙන සමයෙන ආබාධිකා හොන්ති දුක්ඛිතා බාළ්හගිලානා යදාහං ජානාමි න දානිමෙ ඉමම්හා ආබාධා වුට්ඨහිස්සන්තීති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි සන්ති ඛො භො එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො. යෙ තෙ පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා. මුසාවාදා පටිවිරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජන්ති. දෙවානං තාවතිංසානං සහව්‍යත න්ති.

---

රාජන්‍යය, කාරණයෙක් ඇත්තේදැයි විචාලේය. පින්වත් කාශ්‍යපය, කාරණයෙක් ඇත්තේයයි කීයේය. ඒ කෙබඳු කාරණයෙක්දැයි විචාලේය. පින්වත් කාශ්‍යපය, මේ ලොකයෙහි ප්‍රාණඝාතයෙන් වැළකුනාවූ අදත්තාදානයෙන් වැළකුනාවූ කාමමිථ්‍යාචාරයෙන් වැළකුනාවූ මෘෂාවාදයෙන් වැළකුනාවූ මද ප්‍රමාදයට කාරණාවූ රහමෙර පානයෙන් වැළකුනාවූ මාගේ මිත්‍රාමාත්‍ය සහලේ නෑ කෙනෙක් වෙද්ද, ඔව්හු මෑතකාලයෙහි ආබාධයෙන් යුක්තවූවාහු දුකටපැමිණියාහු දැඩිවූ ගිලන්බැව් ඇත්තාහු වෙද්ද, යම් කලක මම මොව්හු දැන් මේ ආබාධයෙන් නොනැගිසිටින්නාහුයයි දනිම්ද එකල මම ඔවුන් කරා එළඹ ඔවුන්ට මෙසේ කියමි. පින්වත්නි, යම් ඒ සත්ව කෙනෙක් ප්‍රාණඝාතයෙන් වැළකුනාහුද අදත්තාදානයෙන් වැළකුනාහුද කාමමිථ්‍යාචාරයෙන් වැළකුනාහුද බොරුකීමෙන් වැළකුනාහුද මදප්‍රමාදයට කාරණාවූ රහමෙර පානය කිරීමෙන් වැළකුනාහුද ඔව්හු ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු මනාගති ඇත්තාවූ සැපතින් අගවූ දිව්‍ය ලොකයෙහි තව්තිසා වැසි දෙවියන්ගේ එක්භාවයෙහි උපදින්යයි මෙසේ කියන සුලුවූ මෙසේ දෘෂ්ටි ඇත්තාවූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහුය.

භවන්තො ඛො පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා සචෙ තෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං වචනං. භවන්තො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගංලොකං උප්පජ්ජිස්සන්ති, දෙවානං තාවතිංසානං සහව්‍යතං, සචෙ භොන්තො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජෙය්‍යාථ දෙවානං තාවතිංසානං සහව්‍යතං යෙන මෙ ආගන්ත්වා ආරොචෙය්‍යාථ, ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. භවන්තො ඛො පන මෙ සද්ධායිකා පච්චයිකා. යං භවන්තෙහි දිට්ඨං යථා සාමං දිට්ඨං. එවමෙතං භවිස්සතීති, තෙ මෙ සාධූති පටිස්සුණිත්වා නෙව ආගන්ත්වා ආරොචෙන්ති න පන දූතං පහිණන්ති.

---

පින්වත්හු, ප්‍රාණඝාතයෙන් වැළකුනාහුය අදත්තාදානයෙන් වැළකුනාහුය. කාමමිථ්‍යාචාරයෙන් වැළකුනාහුය. බොරුකීමෙන් වැළකුනාහුය. මද්‍යප්‍රමාදයට කාරණාවූ රහමෙරපානය කිරීමෙන් වැළකුනාහුය. ඉදින් ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ වචනය සත්‍ය වීනම් පින්වත්හු ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු මනාගති ඇත්තාවූ සැපතින් අගුවූ දිව්‍යලොකයෙහි තව්තිසාවැසි දෙවියන්ගේ එකීභාවයට පැමිණෙන්නාහුය. පින්වත්නි, ඉදින් ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු මනාගතිඇති සැපතින් අගුවූ දිව්‍යලොකයෙහි තව්තිසාවැසි දෙවියන්ගේ එකීභාවයෙහි උපදින්නවුනම් යම්පරිද්දෙකින් අවුත් මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කියා මටදන්වව්ද පින්වත්හු වනාහි ඇදහියයුතු වචන ඇත්තාහුය. විශ්වාස කටයුතු වචන ඇත්තාහුය. පින්වත්හු විසින් යමක් දක්නාලද්දේද, මාවිසින් දක්නා ලද්දක් යම්සේද එපරිද්දෙන්ම මේතෙම වන්නේයයි කියාය; ඔව්හු මට යහපතැයි ප්‍රතිවචනදී නැවත අවුත් නොමදන්වත්. දූතයකුදු නොම එවත්.

අයම්පි ඛො භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

11. තෙනහි රාජඤ්ඤ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි යථා තෙ ඛමෙය්‍ය තථානං ව්‍යාකරෙය්‍යාසි. යං ඛො රාජඤ්ඤ මානුස්සකං වස්සසතං දෙවානං තාවතිංසානං එසො එකො රත්තින්දිවො. තාය රත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදස මාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බං වස්සසහස්සං දෙවානං තාවතිංසානං ආයුප්පමාණං යෙ තෙ මිත්තාමච්චා ඤාතිසාලොහිතා පාණාතිපාතා පටිවිරතා අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා දෙවානං තාවතිංසානං සහව්‍යතං.

---

පින්වත් කාශ්‍යපය, මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා මට මෙබඳු අදහසක් වේද මේද ඊට එක්කාරණයෙක් වෙයි.

11. රාජන්‍යය, එසේවිනම් තාම මේකාරණයෙහි විචාරන්නෙමි. යම්පරිද්දෙකින් තට කැමති වන්නේද, එපරිද්දෙන් ප්‍රකාශ කරව. රාජන්‍යය, මනුෂ්‍යයන් පිළිබඳවූ යම් අවුරුදු සියයෙක්වේද ඒ අවුරුදු සියය තව්තිසාවැසි දෙවියන්ට එක් රෑ දවලෙක් වෙයි. ඒරාත්‍රියෙන් රාත්‍රි තිසෙක් තව්තිසාවැසි දෙවියන්ට මාසයෙක් වෙයි. ඒමාසයෙන් දොලොස් මසෙක් අවුරුද්දෙක් වෙයි. ඒ අවුරුද්දෙන් දිව්‍යවූ අවුරුදු දහසෙක් තව්තිසාවැසි දෙවියන්ගේ ආයුෂ ප්‍රමාණය වෙයි. ප්‍රාණඝාතයෙන් වැළකුනාවූ අදත්තාදානයෙන් වැළකුනාවූ කාමමිථ්‍යාචාරයෙන් වැළකුනාවූ මුසාවාදයෙන් වැළකුනාවූ මදප්‍රමාදයට කාරණාවූ රහමෙර පානයෙන් වැළකුනාවූ තාගේ යම් මිත්‍රාමාත්‍ය සහලේ නෑ කෙනෙක් වෙද්ද, ඔව්හු ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු තව්තිසාවැසි දෙවියන්ගේ ඒකීභාවයවූ යහපත් ගති ඇත්තාවූ සැපතින්අගුවූ දිව්‍යලොකයෙහි උපන්නාහුය.

සචෙ පන තෙසං එවං භවිස්සති. යාව මයං මෙව තීණිවා රත්තින්දිවානි දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙම. අථ මයං පායාසිස්ස රාජඤ්ඤස්ස ගන්ත්වා ආරොචෙස්සාම ඉතිපි අත්ථි පරලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. අපිනු තෙ ආගන්ත්වා ආරොචෙය්‍යුං ඉතිපි අත්ථි පරලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. නො හිදං භො කස්සප අපිහි මයං භො කස්සප චිරංකාලකථා පි භවෙය්‍යාම. කො පනෙතං භොතො කස්සපස්ස ආරොචෙති. අත්ථි දෙවා තාවතිංසාතිවා. එවං දීඝායුකා දෙවා තාවතිංසාතිවා න මයං භොතො කස්සපස්ස සද්දහාම අත්ථි දෙවා තාවතිංසාතිවා. එවං දීඝායුකා දෙවා තාවතිංසාති වාති.

---

ඉදින් ඔවුන්ට යම්තාක් අපි රෑදවල් දෙකක් හෝ තුණක් හෝ දිව්‍යවූ පඤ්චකාමගුණයෙන් පිණාගියාවූ යුක්තවූ අපි හැසිරෙමුයයිද නැවත අපි පායාසි රාජන්‍යයාගේ සමීපයට ගොස් මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කියාදන්වන්න මෝයයි මෙසේ සිතෙක් වන්නේද කිමෙක්ද ඔව්හු ඇවිත් මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය, කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කියා දන්වන්නාහුදැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, මේකාරණය නොවන්නේමය. පින්වත් කාශ්‍යපය, අපි කාලක්‍රියාකොට බොහෝකල් ඇත්තමෝවන්නම්හ. තව්තිසාවැසි දෙවියෝ ඇත්තාහුයයි කියා හෝ මෙසේ තව්තිසාවැසි දෙවියෝ දීඝායුෂ්කයෝයයි කියා හෝ කවරෙක් මේ කාරණය පින්වත් කාශ්‍යපයාහට ආරොචනය කෙරේද තව්තිසාවැසි දෙවියෝ ඇත්තාහුයයි කියා හෝ මෙසේ තව්තිසාවැසි දෙවියෝ දීර්ඝායුෂ්කයෝයයි කියා හෝ පින්වත්කාශ්‍යපයාගේ වචනයඅපි නොඅදහමුයයිකියේය.

සෙය්‍යථාපි රාජඤ්ඤ ජච්චන්ධො පුරිසො සෙ න පස්සෙය්‍ය කණ්හසුක්කානි රූපානි න පස්සෙය්‍ය නීලකානි රූපානි න පස්සෙය්‍ය පීතකානි රූපානි න පස්සෙය්‍ය ලොහිතකානි රූපානි න පස්සෙය්‍ය මඤ්ජෙට්ඨිකානි රූපානි න පස්සෙය්‍ය සමවිසමං න පස්සෙය්‍ය තාරකරූපානි න පස්සෙය්‍ය චන්දිමසුරියෙ. සො එවං වදෙය්‍ය නත්ථි කණ්හසුක්කානි රූපානි නත්ථි කණ්හසුක්කානං රූපානං දස්සාවී නත්ථි නීලකානි රූපානි නත්ථි නීලකානං රූපානං දස්සාවී නත්ථි පීතකානි රූපානි නත්ථි පීතකානං රූපානං දස්සාවී නත්ථි ලොහිතකානි රූපානි නත්ථි ලොහිතකානං රූපානං දස්සාවී. නත්ථි මඤ්ජෙට්ඨිකානි රූපානි නත්ථි මඤ්ජෙට්ඨිකානං රූපානං දස්සාවී. නත්ථි සමවිසමං නත්ථි සමවිසමස්ස දස්සාවී. නත්ථි තාරකරූපානි නත්ථි තාරකරූපානං දස්සාවී නත්ථි චන්දිමසුරියා නත්ථි චන්දිමසුරියානං දස්සාවී.

---

රාජන්‍යය, යම්සේ ජාත්‍යන්ධ පුරුෂයෙක් යම් කළු සුදු රූපයන් නො දක්නේද නීලවණීවූ රූපයන් නොදක්නේද රත්වන්වූ රූපයන් නොදක්නේද ලෙහෙවන්වූ රූපයන් නොදක්නේද මදටවන්වූ රූපයන් නොදක්නේද සමවිසමය නොදක්නේද තාරකා රූපයන් නොදක්නේද චන්ද්‍ර සූර්‍ය්‍යයන් නොදක්නේද ඒ ජාත්‍යන්ධ පුරුෂ තෙම මෙසේ කියන්නේය, කළු සුදු රූපයෝ නැත්තාහුය. කළු සුදු රූපයන් දක්නා සුළුකෙනෙක් නැත්තාහුය. නීලවණී රූපයෝ නැත්තාහුය. නීලවණීවූ රූපයන්දක්නා සුළුවූ කෙනෙක් නැත්තාහුය. රත්වන්වූ රූපයෝ නැත්තාහුය. රත්වන්වූ රූපයන්දක්නාසුළු කෙනෙක් නැත්තාහුය. ලෙහෙවන් රූපයෝ නැත්තාහුය. ලෙහෙවන්වූ රූපයන් දක්නාසුළුකෙනෙක් නැත්තාහුය. මදටවන්රූපයෝ නැත්තාහුය; මදටවන්වූ රූපයන්දක්නාසුලු කෙනෙක් නැත්තාහුය. සමවිසමය නැත්තේය. සමවිසමවූවාහු දක්නාසුලු කෙනෙක් නැත්තාහුය. තාරකාරූපයෝනැත්තාහුය තාරකාරූපයන් දක්නාසුලු කෙනෙක් නැත්තහුය. චන්ද්‍රසූර්‍ය්‍යයෝ නැත්තාහුය. චන්ද්‍රසූර්‍ය්‍යයන දක්නාසුලු කෙනෙක් නැත්තාහුය.

**අහමෙතං න ජානාමි අහමෙතං නපස්සාමි තස්මා තං නත්ථීති. සම්මා නුඛො සො රාජඤ්ඤ වදමානො වදෙය්‍යාති. නොහිදං භො කස්සප, අත්ථි කණ්හසුක්කානි රූපානි අත්ථි කණ්හසුක්කානං රූපානං දස්සාවි අත්ථි නීලකානි රූපානි අත්ථි නීලකානං රූපානං දස්සාවි අත්ථි පීතකානි රූපානි අත්ථි පීතකානං රූපානං දස්සාවි. අත්ථි ලොහිතකානි රූපානි අත්ථි ලොහිතකානං රූපානං දස්සාවී. අත්ථි මඤ්ජෙට්ඨිකානි රූපානි අත්ථි මඤ්ජෙට්ඨිකානං රූපානං දස්සාවී. අත්ථි සමවිසමං අත්ථි සමවිසමස්ස දස්සාවි. අත්ථි තාරකරූපානි අත්ථි තාරකරූපානං දස්සාවී අත්ථි චන්දිමසුරියා. අත්ථි චන්දිමසුරියානං දස්සාවී. අහමෙතං න ජානාමි. අහමෙතං න පස්සාමි. තස්මා තං නත්ථීති. නහි සො භො කස්සප සම්මා වදමානො වදෙය්‍යාති.**

---

මම මෙය නොදනිමි. මම මෙය නොමදකිමි. එබැවින් ඒ නැත්තේ යයි කියාය. රාජන්‍යය, මෙසේ කියන්නාවූ ඒ ජාත්‍යන්ධ පුරුෂතෙම මනාකොට කියන්නේදැයි විචාළේය පින්වත් කාශ්‍යපය, මේ වනාහි මනාකොට කියනලද කාරණයෙක් නොවෙයි. කළු සුදු රූපයෝ ඇත්තාහුය. කළු සුදු රූපයන් දක්නාසුලු අය ඇත්තාහුය. නීලවණීවූ රූපයෝ ඇත්තාහුය. නීලවණීවූරූපයන් දක්නාසුලුඅය ඇත්තාහුය. රන්වන්රූපයෝ ඇත්තාහුය. රත්වන්වූ රූපයන් දක්නාසුලුඅය ඇත්තාහුය. ලෙහෙවන් රූපයෝ ඇත්තාහුය. ලෙහෙවන් වූ රූපයන් දක්නා සුලුඅය ඇත්තාහුය. මදටවන් රූපයෝ ඇත්තාහුය, මදටවන් රූපයන් දක්නා සුලුඅය ඇත්තාහුය. සමවිසමය ඇත්තේය. සමවිසමයදක්නා සුලුඅය ඇත්තාහුය. තාරකා රූපයෝ ඇත්තාහුය. තාරකා රූපයන් දක්නා සුලුඅය ඇත්තාහුය. චන්ද්‍ර සූර්‍ය්‍යයෝ ඇත්තාහුය. චන්ද්‍රසූර්‍ය්‍යයන් දක්නාසුලුඅය ඇත්තාහුය. යමෙක් මම මෙය නොදනිමි. මම මෙය නොදකිමි. එබැවින් ඒ නැත්තේයයි කියාද, පින්වත් කාශ්‍යපය, මෙසේ කියන්නාවූ තෙතෙම මනාකොට කියන්නේ නොවෙයයි කියේය.

එවමෙව බො ත්වං රාජඤ්ඤ ජවවත්ථුපමෙමාමඤ්ඤ පටිභාසි යං මං ත්වං එවං වදෙසි. කො පනෙතං භොතො කස්සපස්ස ආරොචෙති අත්ථි දෙවා තාවතිංසාතිවා එවං දීඝායුකා දෙවා තාවතිංසාති වා න මයං භොතො කස්සපස්ස සද්දහාම, අත්ථි දෙවා තාවතිංසාති වා එවං දීඝායුකා දෙවා තාවතිංසාති වා ති. නඛො රාජඤ්ඤ එවං පරලොකො දට්ඨබ්බො. යථා ත්වං මඤ්ඤසි ඉමිනා මංසචක්ඛුනා. යෙ ඛො තෙ රාජඤ්ඤ සමණබ්‍රාහ්මණා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති අප්පසද්දානි අප්පනිග්ඝොසානි. තෙ තත්ථ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරන්තා විහරන්තා දිබ්බං චක්ඛුං විසොධෙන්ති. තෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ඉමඤ්චෙව ලොකං පස්සන්ති පරඤ්ච සත්තෙච ඔපපාතිකෙ. එවං ඛො රාජඤ්ඤ පරලොකො දට්ඨබ්බො, නත්වෙව යථා ත්වං මඤ්ඤසි ඉමිනා මංසචක්ඛුනා.

රාජන්‍යය, එපරිද්දෙන්ම තෝ ජනපදයකුමෙන් මට වැට හෙන්නෙහිය. තව්තිසාවැසි දෙවියෝ ඇත්තාහුයයි කියා හෝ මෙසේ තව්තිසාවැසි දෙවියෝ දීර්ඝායුෂ්කයෝය කියා හෝ මේකාරණය කවරෙක් පින්වත් කාශ්‍යපයාහට ආරොචනය කෙරේද. තව්තිසාවැසි දෙවියෝ ඇත්තාහුයයි කියා හෝ තව්තිසාවැසි දෙවියෝ මෙසේ දීර්ඝායුෂ ඇත්තෝය කියා හෝ අපි පින්වත් කාශ්‍යපයාගේ වචනය නොඅදහමුයයි මෙසේ යමක් තෝ මට කියෙහිද, රාජන්‍යය, තෝ මේමසැසින් යම්සේ සිතන්නෙහිද එපරිද්දෙන් පරලොව නොදතයුතු, රාජන්‍යය, සම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් නිශ්ශබ්දවූ ඝොෂාරහිතවූ අරණ්‍ය සෙනාසනද මහවන ලැහැබ්ඇති ඉතා දුරුවූ වන සෙනසුන් සෙවනය කෙරෙද්ද, ඔව්හු එහි අප්‍රමාදවූවාහු කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූවාහු හරණලද ආත්මාලය ඇතිව වාසයකරමින් දිව ඇසවිසොධනය කෙරෙත්. ඔව්හු මනුෂ්‍ය ඇස ඉක්ම පවත්නාවූ පිරිසිදුවූ දිවැසින් මෙලොවද, පරලොවද චුතව උපදනා සත්ත්වයන්ද, දකිත්, රාජන්‍යය, මෙසේ පරලොව දතයුතු. යම්සේ තෝ මේමසැසින් සිතන්නෙහිද එපරිද්දෙන් නොදතයුතුමය

ඉමිනාපිඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

12. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවමෙත්ථ එවං මෙ හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලංවිපාකොති. අත්ථි පන රාජඤ්ඤ පරියායො—පෙ—අත්ථි භො කස්සප පරියායො—පෙ—යථා කථංවිය රාජඤ්ඤාති. ඉධාහං භො කස්සප පස්සාමි සමණබ්‍රාහ්මණෙ සීලවන්තෙ කල්‍යාණධම්මෙ ජීවිතුකාමෙ අමරිතුකාමෙ සුඛකාමෙ දුක්ඛ පටික්කූලෙ. තස්ස මය්හං භො කස්සප එවං හොති. සචෙ ඛො ඉමෙ භොන්තො සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා එවං ජානෙය්‍යුං ඉතො නොමතානං සෙය්‍යො භවිස්සතීති. ඉදානි මෙ භොන්තො සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා විසංවා ඛාදෙය්‍යුං.

රාජන්‍යය, මේකාරණයෙන්ද තටමෙබඳු සිතෙක් ඇතිවේවා. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්ත්වයෝ ඇත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි කියායි.

12. පින්වත් කාශ්‍යපතෙමේයම්සේ මෙබන්දක්කියයිදඑසේදවුවත් මේ කාරණයෙහි මාගේ අදහස මෙබඳුයි. කෙසේද, මේකාරණයෙන්ද, මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්ත්වයෝ නැත්තාහුය. කුශලා කුශලකර්මයන්ගේ ඵලවිපාක නැත්තේය කියාය. රාජන්‍යය, ඊටකාරණයෙක් ඇත්තේදැයි විචාළේය. පින්වත් කාශ්‍යපය කාරණයෙක් ඇත්තේයයි කීයේය. රාජන්‍යය ඒ කෙබඳු කාරණයෙක්දැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, මම මේ ලොකයෙහි සිල්වත්වූ කල්‍යාණ ධර්මඇත්තාවූ ජීවත්වනු කැමැත්තාවූ නොමැරෙණ කැමතිවූ සැපකැමතිවූ දුකට පිළිකුල් කරන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් දකිමි. පින්වත් කාශ්‍යපය, එසේ දක්නාවූ මට මෙබඳු සිතෙක් වෙයි. ඉදින් සිල්වත්වූ සුන්දර ධර්මඇත්තාවූ පින්වත්වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙලොවින් චුතවූ අපට පර ලොව සුගති සැපවන්නේයයි මෙසේ දන්නාහුනම් දැන් සිල්වත්වූ සුන්දර ධර්මඇත්තාවූ මේ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ විෂ හෝ කන්නාහුය.

සත්ථං වා ආහරෙය්‍යුං උබ්බන්ධිත්වා වා කාලං කරෙය්‍යුං පපාතෙ වා පපතෙය්‍යුං, යස්මා ච ඛො ඉමෙ භොන්තො සමණබ්‍රාහ්මණා සිලවන්තො කල්‍යාණධම්මා න එවං ජානන්ති. ඉතො නො මතානං සෙය්‍යො භවිස්සතීති. තස්මා ඉමෙ භොන්තො සමණබ්‍රාහ්මණා සිලවන්තො කල්‍යාණධම්මා ජීවිතුකාමා අමරිතුකාමා සුඛකාමා දුක්ඛපටික්කූලා අත්තානං නමාරෙන්තීති. අයම්පි ඛො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඕපපාතිකා නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

13. තෙනහි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි, උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස ද්වෙපජාපතියො අහෙසුං.

---

ශස්ත්‍ර හෝ තමහට එළවත්තාහුය. බොටුවෙහි වැලලා ගෙණ හෝ කාලක්‍රියා කරන්නාහුය. ප්‍රපාතයෙක්හි හෝ පතිතවන්නාහුය. යම් හෙයකින් වනාහි සිල්වත්වූ සුන්දර ධර්‍මඇත්තාවූ මේ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙලොවින් චුතවූ අපට පරලොව සුගති සැපවත්තේයයි කියා මෙසේ නොදනිද්ද, එහෙයින් සිල්වත්වූ සුන්දර ධර්‍මඇත්තාවූ ජීවත්වනු කැමැත්තාවූ නොමැරෙණු කැමැත්තාවූ සැප කැමැත්තාවූ දුකට පිළිකුල්කරන්නාවූ මේ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ආත්මය (තමා) නොමරත්යයි කියාදී. පින්වත් කාශ්‍යපය, මේකාරණයෙන්ද මෙලොව සිටිසාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්ත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්‍මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා මෙබඳුවූ අදහසෙක් මට යම් කාරණයකින් වේද මේද ඊට එක්කාරණයෙක් වෙයි.

13. රාජන්‍යය, එසේවීනම් තට උපමාවක් කරන්නෙමි. උපමායෙන්ද මේලෞකයෙහි සමහර නුවණැති පුරුෂයෝ කියනලද වචනයාගේ අර්ථය දැනගණිත්. රාජන්‍යය, එහෙයින් පෙරපැවති කාරණයක් කියමි, රාජන්‍යය, එක්තරා බ්‍රාහ්මණයෙකුට භාර්‍ය්‍යාවෝ දෙදෙනෙක්වූවාහුය.

---

එකිස්සා පුත්තො අහොසි දස වස්සුද්දෙසිකොවා ද්වාදස වස්සුද්දෙසිකොවා, එකා ගබ්භිනී උපවිජඤ්ඤා, අථ ඛො සො බ්‍රාහ්මණො කාලමකාසි. අථ ඛො සො මාණවකො මාතුසපත්තිං එතදවොච, යං ඉදං භොති ධනංවා ධඤ්ඤංවා රජතංවා ජාතරූපංවා සබ්බන්තං මය්හං. නත්ථි තුය්හෙත්ථ කිඤ්චි. පිතුමෙ භොති දායජ්ජං නිය්‍යාතෙහීති, එවං වුත්තෙ සා බ්‍රාහ්මණී තං මාණවකං එතදවොච, ආගමෙහි තාව තාත යාව විජායාමි. සචෙ කුමාරකො භවිස්සති තස්සපි එකදෙසො භවිස්සති. සචෙ කුමාරිකා භවිස්සති. සාපි තෙ ඔපභොග්ගා භවිස්සතීති, දුතියම්පි ඛො මාණවකො මාතුසපත්තිං එතදවොච. යම්දං භොති ධනංවා ධඤ්ඤංවා රජතංවා ජාතරූපංවා සබ්බන්තං මය්හං. නත්ථි තුය්හෙත්ථ කිඤ්චි පිතු මෙ භොති දායජ්ජං, නිය්‍යාතෙහීති·

---

එක්භාර්‍ය්‍යාවක්හට දසඇවිරිදිවූ හෝදොළොස් හැවිරිදිවූ හෝ පුත්‍රයෙක්වූයේය. එක්භාර්‍ය්‍යාවක් තොමෝගැබ් ඇත්තී පැමිණිවදන කල්ඇත්තිවිය. ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණතෙම කාලක්‍රියා කළේය එකල්හි ඒ මාණවකතෙම සැතිරියවූ මවුට මේ කාරණය කියේය පිනැත්තිය, යම් මේධනයෙක් හෝ ධාන්‍යයෙක් හෝ රිදියෙක් හෙ සවර්ණයෙක් හෝ ඇද්ද, ඒ සියල්ල මාගේ වේයි. මෙ වස්තුව අ රෙන් කිසිත් තිට නැත්තේය, පිණැත්තිය, පියාගේ දායාදයවූ ෙ වස්තුව මට පාවාදෙවයි කියාය. එසේ කිකල්හි ඒ බැමිණිතොං ඒමාණවකයාට මේ වචනය කීය. පුත්‍රයානෙනි, යම්තාක් මම මිද ඒතාක්කල් බලාපොරොත්තුවෙව. ඉදින් කුමාරයෙක් වන්‍ නම් ඕහටද එක්කොටසෙක් වන්නේය. ඉදින් කුමාරියක් නිනම් ඕතොමෝද තට භාර්‍ය්‍යාවන්නේ යයි කියාය. දෙවද මාණවකතෙම සැතිරිවූ මාතෘවට මේකාරණය කියේය. පිණැත් යම් මේ ධනයෙක් හෝ ධාන්‍යයෙක් හෝ රිදියෙක් හෝ සවර්ණ හෝ ඇද්ද, ඒ සියල්ල මාගේ වෙයි. මේවස්තුව අතුරෙන් තිට නැත්තෙය. පිණැත්තිය, පියාගේ දායාදයවූ මේ වස්තුව මට දෙවයි කියාය.

දුතියම්පි ඛො සා බ්‍රාහ්මණී තං මාණවකං එතදවොච. ආගමෙහි තාව තාත යාව විජායාමි. සචෙ කුමාරකො භවිස්සති. තස්සපි එකදෙසො භවිස්සති. සචෙ කුමාරිකා භවිස්සති. සාපි තෙ ඔපභොග්ගා භවිස්සතීති. තතියම්පි ඛො සො මාණවකො මාතුසපත්තිං එතදවොච යම්දං හොති ධනංවා ධඤ්ඤං වා රජතංවා ජාතරූපංවා සබ්බන්තං මය්හං, නත්ථි තුම්හෙහෙත්ථ කිඤ්චි පිතුමෙ හොති දායජ්ජං නිය්‍යාතෙහීති. අථ ඛො සා බ්‍රාහ්මණී සත්ථං ගහෙත්වා ඔවරකං පවිසිත්වා උදරං ඔපාතෙසි යාව ජානාමි යදිවා කුමාරකො යදිවා කුමාරිකාති. සා අත්තානඤ්චෙව ජීවිතඤ්ච ගබ්භඤ්ච සාපතෙය්‍යඤ්ච විනාසෙසි යථා තං බාලා අව්‍යත්තා අනයව්‍යසනං ආපන්නා අයොනිසො දායජ්ජං ගවෙසන්ති. එවමෙව ඛො ත්වං රාජඤ්ඤ බාලො අව්‍යත්තො අනයව්‍යසනං ආපජ්ජිස්සසි අයොනිසො පරලොකං ගවෙසන්තො, සෙය්‍යථාපි සා බ්‍රාහ්මණී බාලා අව්‍යත්තා අනයව්‍යසනං ආපන්නා අයොනිසො දායජ්ජං ගවෙසන්තී.

---

දෙවෙනිවද ඒ බැමිණි තොමෝ ඒ මාණවකයාට මේවචනය කීය. පුත්‍රයානෙනි, යම්තාක් මම වදම්ද ඒතාක්කල් බලා පොරොත්තුවෙව. ඉදින් කුමාරයෙක් වන්නේනම් ඕහටද එක්කොටසක් වන්නේය. ඉදින් කුමාරියක්වන්නීනම් ඕතොමෝද තටභාගිනී වන්නීයයි කීහ. තුන්වෙනිවද ඒ මාණවකතෙමසැතිරියවූ මෑණියන්ට මේ කාරණය කීයේය. පිණැත්තිය, යම් මේ ධනයෙක් හෝ ධාන්‍යයෙක් හෝ රිදියෙක් හෝ සවර්ණයෙක් හෝ ඇද්ද ඒ සියල්ල මාගේ වෙයි. මේ වස්තුවෙහි කිසිත් තට නැත්තේය. පිණැත්තිය, පියාගේ දායාදයද මට පාවා දෙවයි කීහ. ඉක්බිත්තෙන් ඒ බැමිණි තොමෝ ආයුධයක් ගෙණ ගබඩාවට ප්‍රවිෂ්ටව මෙහි ඉදින් කුමාරයෙක් හෝ වේදැයි ඉදින් කුමාරියක් හෝ වේදැයි එසදනිමැයි උදරය පැලූයේය. ඕතොමෝ තමාද ජීවිතයද ගර්භයද වස්තුවද නැසූයේය. යම්සේ අඥනවූ අව්‍යක්තවූ තැනැත්තී අනුපායයෙන් දායාද සොයන්නී ඒ මහත්දුකට පැමිණියාද රාජන්‍යය, එපරිද්දෙන්ම අඥනවූ අව්‍යක්තවූ තෝ නුනුවනින් පරලොව සොයන්නේ මහත් දුකට පැමිණෙන්නෙහිය. අඥනවූ අව්‍යක්තවූ ඒ බැමිණිතොමෝ අනුපායයෙන් දායාද සොයන්නී මහත්දුකට යම්සේ පැමිණියාද එමෙනි.

නබො රාජඤ්ඤ සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා අපක්කං පරිපාචෙන්ති අපිච පරිපාකං ආගමෙන්ති පණ්ඩිතා අත්ථොහි රාජඤ්ඤ සමණබ්‍රාහ්මණානං සීලවන්තානං කල්‍යාණධම්මානං ජීවිතෙන, යථා යථා ඛො රාජඤ්ඤ සමණබ්‍රාහ්මණා සීලවන්තො කල්‍යාණධම්මා චිරං දීඝමද්ධානං තිට්ඨන්ති, තථා තථා බහුං පුඤ්ඤං පසවන්ති බහුජනහිතාය ච පටිපජ්ජන්ති බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං, ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු ඉතිපි අත්ථි පරො ලොකො, අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

14 කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවමෙත්ථ හොති. ඉතිපි නත්ථි පරොලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

---

රාජන්‍යය, සිල්වත්තවූ කල්‍යාණ ගුණධර්මයෙහි පිහිටියාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මුහුකිරීමක් නැත්තාවූ ඵලයනුවූ ආයුෂය අතරෙහිම නොසිඳිත්. එසේදවුවත් පණ්ඩිතයෝ මුහු කාරණ කාලය බලාපොරොත්තුවෙති. රාජන්‍යය, සිල්වත්තවූ සුඳර ගුණයෙහි පිහිටියාවූ ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ ජීවිතයෙන් ප්‍රයොජන ඇත්තේමය, රාජන්‍යය, යම් යම් පරිද්දෙකින් සිල්වත්වූ කල්‍යාණ ධර්මඇත්තාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඉතා දිර්ඝ කාලයක් සිටිද්ද, ඒඒප්‍රකාරයෙන් බොහෝ පින්රැස් කෙරෙත්, මහාජනයාගේ සැප පිණිසද ලොකයට අනුකම්පා පිණිසද පිළිපදිත්, දෙවිමිනිසුන්ගේ අර්ථය පිණිසද වැඩ පිණිසද සැප පිණිසද පිළිපදිත්. රාජන්‍යය, මේ කාරණයෙන්ද තට මෙබඳු සිතෙක් ඇතිවේවා. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කියායි.

14. යම්සේ පින්වත් කාශ්‍යපතෙමේ මෙසේ කියයිද, එසේ වී නමුත් මේ කාරණයෙහි මාගේ අදහස මෙබඳුයි. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේයයි කියාය.

අත්ථි පන රාජඤ්ඤ පරියායො ...පෙ... අත්ථි භො කස්සප පරියා, යො ...පෙ... යථා කථා විය රාජඤ්ඤාති. ඉධ මෙ භො කස්සප පුරිසා චොරං ආගුචාරිං ගහෙත්වා දස්සෙන්ති අයං තෙ භන්තෙ චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහිති. ත්‍යාහං එවං වදාමි. තෙනහි භො ඉමං පුරිසං ජීවන්තංයෙව කුම්භියා පක්ඛිපිත්වා මුඛං පිදහිත්වා අල්ලෙන චම්මෙන ඔනන්ධිත්වා අල්ලාය මත්තිකාය බහලාවලෙපනං කරිත්වා උද්ධනං ආරොපෙත්වා අග්ගිං දෙථාති. තෙ මෙ සාධූති පටිස්සුණිත්වා තං පුරිසං ජීවන්තං යෙව කුම්භියා පක්ඛිපිත්වා මුඛං පිදහිත්වා අල්ලෙන චම්මෙන ඔනන්ධිත්වා අල්ලාය මත්තිකාය බහලාවලෙපනං කරිත්වා උද්ධනං ආරොපෙත්වා අග්ගිං දෙන්ති. යදා මයං ජානාම කාලකතො සො පුරිසොති. අථ නං කුම්භිං ඔරොපෙත්වා උබ්භින්දිත්වා මුඛං විවරිත්වා සණිකං නිල්ලොකෙම. අප්පෙව නාමස්ස ජීවං නික්ඛමන්තං පස්සෙය්‍යාමාති. නෙවස්ස මයං ජීවං නික්ඛමන්තං පස්සාම,

---

රාජන්‍යය, තට කාරණයෙක් ඇත්තේදැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, කාරණයෙක් ඇත්තේයයි කියේය. රාජන්‍යය, ඒ කෙබඳු කාරණයෙක් දැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, මෙහි මාගේ පුරුෂයෝ අපරාධ කරණ සුලුවූ සොරෙකු අල්වාගෙණ ස්වාමීනි, මේ නුඹවහන්සේගේ අණටවිරුද්ධව අපරාධ කරණ සුලුවූ සොරෙක. මෝහට යමක් කැමැත්තෙහිනම් ඒ දණ්ඩනය නියමකළ මැනවයි දක්වත්ද, එකල ඒපුරුෂයන්ට මම මෙසේ කියමි. පින්වත්නි, එසේ විනම් ජීවත්වත්නාවූම මේ පුරුෂයා සැලියක බහා මුඛය වසා තෙත්වූ සමින් වෙළා තෙත්මැටියෙන් ඝනව ආලෙපනකොට උදුනට නගා ගිනිදල්වව්යයි කියායි. ඔව්හු යහපතැයි මාගේ වචනය පිළිගෙණ ජීවත්වත්නාවූම ඒ චෞර පුරුෂයා සැලියක බහා මුඛය වසා තෙත්වූ සමින් වෙළා තෙත්වූ මැටියෙන් ඝනව ආලෙපනකොට උදුනට නගා ගිනි දල්වත්. යම් කලෙක අපි ඒ පුරුෂයාය කාලක්‍රියා කළේයයි දනිමුද. එකල ඒසැලිය බාතබා මැටිආලෙපය බිඳ මුඛය විවෘතකොට නික්මෙන්නාවූ මොහුගේ ජීවිතය දක්නාමෝනම් යෙහෙකැයි කියා වහා බලමෝද අපි නික්මෙන්නාවූ මොහුගේ ජීවිතය නොමදකුම්හ.

අයම්පි ඛො භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

15 තෙනහි රාජඤ්ඤ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි අභිජානාසි නො ත්වං රාජඤ්ඤ දිවාසෙය්‍යං උපගතො සුපිනකං පස්සිතා ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකන්ති. අභිජානාමහං භො කස්සප දිවාසෙය්‍යං උපගතො සුපිනකං පස්සිතා ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකන්ති. රක්ඛන්ති තං තම්හි සමයෙ ජ්ජාපි වාමනිකාපි වෙලාවිකාපි කොමාරිකාපීති. එවම්පි භො කස්සප රක්ඛන්ති මං තස්මිං සමයෙ ඛුජ්ජාපි වාමනිකාපි වෙලාවිකාපි කොමාරිකාපීති.

---

මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵල විපාකයෙක් නැත්තේයයි කියා යම් කාරණයකින් මට මෙබඳු අදහසෙක් වේද ඒද ඊට එක් කාරණයෙක් වෙයි.

15. රාජන්‍යය, එසේවීනම් තාම මේකාරණයෙහි විචාරන්නෙමි. යම් පරිද්දෙකින් තට කැමතිවන්නේද එපරිද්දෙන් එය ප්‍රකාශ කරන්නෙහිය. රාජන්‍යය, තෝ දහවල් සයනයට පැමිණියේ සිත්කලුවූ ආරාමද සිත්කලුවූ වනද සිත්කලුවූ භූමිද සිත්කලුවූ පොකුණුදැයි යන මොවුන් පිළිබඳවූ ස්වප්නයක් දැක සිහි ඇත්තෙහිදැයි ඇසූයේය. පින්වත් කාශ්‍යපය, මම දහවල් සයනයට පැමිණියෙම් සිත්කලුවූ ආරාමද සිත්කලුවූ වනද සිත්කලුවූ භූමිද සිත්කලුවූ පොකුණුදැයි යන මොවුන් පිළිබඳවූ ස්වප්නයක් දැක සිහි ඇත්තෙමියි කීයේය. ඒකාලයෙහි තා කුදු ස්ත්‍රීහුද, මිටිස්ත්‍රීහුද, බාලස්ත්‍රීහුද, තරුණ දැරිකාවෝද රක්‍ෂාකෙරෙද්දැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, එසේමය. ඒකාලයෙහි මා කුදුස්ත්‍රීහුද, මිටිස්ත්‍රීහුද, බාලස්ත්‍රීහුද, තරුණ දැරිකාවෝද, රක්‍ෂා කෙරෙත්යයි කීයේය, ප්‍රවිෂ්ටවන්නාවූද නික්මෙන්නාවූද තාගේ සිතේපැවති අදහස් ඔව්හු දකිද්දැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, මේකාරණය නොවේමයයි, කීයේය.

අපිනු තා තුම්හං ජීවං පස්සන්ති පවිසන්තංවා නික්ඛමන්තංවාති. නො හිදං භො කස්සප. තාහිනාම රාජඤ්ඤ තුම්හං ජීවන්තස්ස ජීවන්තියො ජීවං න පස්සිස්සන්ති පවිසන්තංවා නික්ඛමන්තංවා, කිම්පන ත්වං කාලකතස්ස ජීවං පස්සිස්සසි පවිසන්තංවා නික්ඛමන්තංවා. ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු ඉතිපි අත්ථි පරලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

16. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථඛො එවමෙම එත්ථ හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. අත්ථි පන රාජඤ්ඤ පරියායො ....පෙ.... අත්ථි භො කස්සප පරියායො ....පෙ.... යථා කථං විය රාජඤ්ඤාති.

---

රාජන්‍යය, ජීවත්වන්නාවූ ඒ ස්ත්‍රීහු ප්‍රවිෂ්ට වන්නාවූද ජීවත් වන්නාවූද තාගේ ජීවිතය නොමද කින්නාහුනම් තෝ කාලක්‍රියා කළ තැනැත්තහුගේ ඇතුල් වන්නාවූද නික්මෙන්නාවූද ජීවිතය කෙසේනම් දක්නෙහිද, රාජන්‍යය, මේකාරණයෙන්ද තට මෙබඳු සිතෙක් වේවා. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය, චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කියාය.

16. කිසිසේත් පින්වත් කාශ්‍යපතෙමේ මෙසේ කියයි, එතකුදු වුවත් මේකාරණයෙහි මාගේ අදහස මෙබඳුවෙයි. මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා ඔපපාතික සත්වයෝ නැත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි කියාය. රාජන්‍යය, ඊට කාරණයෙක් ඇත්තේදැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, කාරණයෙක් ඇත්තේයයි කීයේය. රාජන්‍යය, ඒ කෙබඳු කාරණයෙක්දැයි විචාළේය.

ඉධ මෙ භො කස්සප පුරිසා චොරං ආගුචාරිං ගහෙත්වා දස්සෙන්ති. අයන්තෙ භන්තෙ චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති. ත්‍යාහං එවං වදාමි, තෙනහි භො ඉමං පුරිසං ජීවන්තං යෙව තුලාය තුලෙත්වා ජියාය අනස්සාසකං මාරෙත්වා පුනදෙව තුලාය තුලෙථාති. තෙ මෙ සාධූති. පටිස්සුණිත්වා තං පුරිසං ජීවන්තං යෙව තුලාය තුලෙත්වා ජියාය අනස්සාසකං මාරෙත්වා පුනදෙව තුලාය තුලෙන්ති. යදා සො ජීවති තදා ලහුතරො ච හොති, මුදුතරො ච කම්මඤ්ඤතරො ච, යදා පන සො කාලකතො හොති. තදා ගරුතරො ච හොති පත්ථින්නතරො ච අකම්මඤ්ඤතරො ච, අයම්පි ඛො භො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති, ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

---

පින්වත් කාශ්‍යපය, මේලොකයෙහි මාගේ පුරුෂයෝ අපරාධයෙහි හැසිරෙණ සුලුවූසොරෙකු අල්වා ගෙණවුත් ස්වාමිනි, මේ නුඹවහන්සේගේ අණට විරුඬව අපරාධ කරණ සුලුවූ සොරෙක. මෝහට යම් දඬුවමක් කැමැත්තෙහිනම් ඒකරණුමැනවයි මට දන්වද්ද එකල ඔවුන්ට මම මෙසේකියම්, පින්වත්නි, එසේවීනම් ජීවත්වන්නාවූ මේපුරුෂයා තරාදියෙන් කිරා දුනුදියෙන් ග්‍රීවය වෙළා ආශ්වාස නැතිකොට මරා නැවතත් තරාදියෙන් කිරව්යයි කියාය. ඔව්හු යහපතැයි මාගේ වචනය පිළිගෙණ ජීවත්වන්නාවූම ඒ පුරුෂයා තරාදියෙන් කිරා දුනුදියෙන් ග්‍රීවය වෙළා ආශ්වාසකොට මරා නැවතත් තරාදියෙන් කිරත්. යම් කලක ඒ පුරුෂතෙම ජීවත්වේද එකල අතිශයින් සැහැල්ලුවූයේද වෙයි. අතිශයින් මෘදුවූයේද වෙයි. අතිශයින් කර්මණ්‍යවූයේද වෙයි. යම්කලෙක හෙතෙම කාලක්‍රියා කෙළේවේද එකල්හි අතිශයින් බරවූයේද වෙයි, අතිශයින් දැඩිවූයේද වෙයි. අතිශයින් අකර්මන්‍යවූයේද වෙයි. පින්වත් කාශ්‍යපය, මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය, චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵල විපාක නැත්තේයයි කියා මෙබඳු සිතෙක් යම් කාරණයකින් මට ඇතිවේද, මේද ඊට එක්කාරණයෙක් වේයයි කීයේය.

17. තෙනහි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි, උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි රාජඤ්ඤ පුරිසො දිවස සන්තත්තං අයොගුළං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං තුලාය තුලෙය්‍ය, තමෙනං අපරෙන සමයෙන සීතං නිබ්බුතං තුලාය තුලෙය්‍ය, කදානු ඛො සො අයොගුළො ලහුතරො වා හොති. මුදුතරො වා කම්මඤ්ඤතරො වා, යදා වා ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො, යදා වා සීතො නිබ්බුතොති. යදා සො භො කස්සප අයොගුළො තෙජො සහගතො ච හොති වායො සහගතො ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො තදා ලහුතරො ච හොති මුදුතරො ච කම්මඤ්ඤතරො ච, යදා පන සො අයොගුළො නෙව තෙජො සහගතො හොති.

17. රජන්‍යය, එසේවීනම් තට උපමාවක් කරන්නෙමි. උපමයෙන්ද මේ ලොකයෙහි සමහර නුවනැති පුරුෂයෝ කියනලද කථාවේ අර්ථය දැනගණිත්. රජන්‍යය, යම්සේ පුරුෂයෙක් දවස මුළුල්ලෙහි රත්කරණලද්දවූ ගිනිගෙණ ඇවිලෙන්නාවූ මනාකොට ඇවිලෙන්නාවූ එකම ගිනිජලාවක්වූ යගුළියක් තරාදියෙන් යම්සේ කිරන්නේද මෑතකාලයෙක්හි සීතලවූ සන්සිඳුනාවූ තෙජස් ඇති ඒ යගුලිය තුරාදියෙන් කිරන්නේද යම්කලක වනාහි ඒ යගුලිය ගිනිගෙණ ඇවුලුනේ වේද, මනාකොට ඇවුලූනේ වේද, එකම ගිනිජලාවක් වේද, යම් කලක හෝ සීතල වේද, සන්සිඳුනාවූ තෙජස් ඇති වේද, යන මේ අවස්ථාදෙක අතුරෙන් කවරකලෙක ඒයගුළිය අතිශයින් සැහැල්ලුවූයේ හෝ වේද, අතිශයින් මෘදුවූයේ හෝ වේද, අතිශයින් කර්මන්‍යවූයේ හෝ වේදැයි ඇසූයේය. පින්වත් කාශ්‍යපය, යම් කලක ඒයගුළියතෙම තෙජස් සහගතවූයේ වේද, ගිනිගෙණ ඇවුලුනේ වේද; මනාකොට ඇවුලුනේ වේද, එකම ගිනිජලාවක්වූයේ වේද, එකල්හි අතිශයින් සැහැල්ලුවූයේද වෙයි. අතිශයින් මෘදුවූයේද වෙයි. අතිශයින් කර්මන්‍ය වූයේද වෙයි. යම්කලෙක්හි ඒ යගුළියතෙම තෙජස් සහගතවූයේ නොවේද,

න වායො සහගතො සීතො නිබ්බුතො. තදා ගරුතරෙච හොති. පත්ථිනතරෙච අකම්මඤ්ඤතරෙචාති. එවමෙව බො රාජඤ්ඤ යදා යං කායො ආයුසහගතොච හොති උස්මාසහගතොච විඤ්ඤාණසහගතොච, තදා ලහුතරෙච හොති මුදුතරෙච කම්මඤ්ඤතරෙච. යදා පනායං කායො නෙව ආයුසහගතොච හොති න උස්මාසහගතොච න විඤ්ඤාණසහගතො, තදා ගරුතරෙච හොති පත්ථිනතරෙච. අකම්මඤ්ඤතරෙච. ඉමිනාපි බො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු. ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

18. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ බො එවං මෙ එත්ථ හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති,

---

වාතය සහගතවූයේ නොවේද සීතලවූයේවේද නිවුණේවේද එකල්හි අතිශයින් බරවූයේද වෙයි. අතිශයින් දැඩි (තද) වූයේද වෙයි. අතිශයින් අකර්මන්‍යවූයේද වෙයි. රාජන්‍යය, එපරිද්දෙන්ම මේශරීරය තෙම යම් කලෙක ආයුසහගත වූයේවේද, උෂ්ණසහගත වූයේවේද, විඤ්ඤාණ සහගතවූයේ වේද, එකල්හි අතිශයින් සැහැල්ලුවූයේද වෙයි. අතිශයින් මෘදුවූයේද වෙයි. අතිශයින් කර්මන්‍ය වූයේද වෙයි. යම්කලෙක මේ ශරීරයතෙම ආයුසහගතවූයේ නොවේද. උෂ්ණ ගහගතවූයේ නොවේද, විඤ්ඤාණසහගත වූයේ නොවේද, එකල්හි අතිශයින් බරවූයේද වෙයි. අතිශයින් දැඩි (තද) වූයේද වෙයි. අතිශයින් කර්මන්‍යවූයේද නොවෙයි. රාජන්‍යය. මේ කාරණයෙන්ද තට මෙබඳු සිතක් ඇති වේවා. මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුලශා කුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කියායි.

18. කිසිසේත් පින්වත් කාශ්‍යපතෙමේ මෙසේ කියයි. එසේ වීනමුත් මේ කාරණයෙහි මාගේ අදහස මෙබඳුයි. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියායි.

අත්ථිපන රාජඤ්ඤ, පරියායො ...පෙ... අත්ථි හො කස්සප පරියා
යො ...පෙ... යථා කථං විය රාජඤ්ඤාති. ඉධ මෙ හො කස්සප පුරි
සා චොරං ආගුචාරිං ගහෙත්වා දස්සෙන්ති, අයන්තෙ භන්තෙ චොරො
ආගුචාරී ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති, ත්‍යාහං එවං වදාමි,
තෙනහි භො ඉමං පුරිසං අනුපහච්ච ඡවිඤ්ච චම්මඤ්ච මංසඤ්ච නහා
රුංච අට්ඨිඤ්ච අට්ඨිමිඤ්ජඤ්ච ජීවිතා වොරොපෙථාති. තෙ මෙ සාධූති
පටිස්සුණිත්වා තං පුරිසං අනුපහච්ච ඡවිඤ්ච චම්මඤ්ච මංසඤ්ච නහා
රුංච අට්ඨිඤ්ච අට්ඨිමිඤ්ජඤ්ච ජීවිතා වොරොපෙන්ති. යදා සො ආමතො
හොති, ත්‍යාහං එවං වදාමි තෙනහි භො ඉමං පුරිසං උත්තානං නිපා
තෙථ අප්පෙවනාමස්ස ජීවං නික්ඛමන්තං පස්සෙය්‍යාමාති. තෙ තං
පුරිසං උත්තානං නිපාතෙන්ති නෙවස්ස මයං ජීවං නික්ඛමන්තං
පස්සාම, ත්‍යාහං එවං වදාමි, තෙනහි භො ඉමං පුරිසං අවකුජ්ජං
නිපාතෙථ ...පෙ... පස්සෙන නිපාතෙථ ...පෙ... දුතියෙන
පස්සෙන නිපාතෙථ ...පෙ... උද්ධං ඨපෙථ.

---

**රාජන්‍යය,** ඊට කාරණයෙක් ඇත්තේදැයි විචාළේය. පින්වත් කාශ්‍ය
පය, කාරණයෙක් ඇත්තේයයි කීයේය. ඒ කෙබඳු කාර
ණයෙක් දැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, මේලොකයෙහි මාගේ
පුරුෂයෝ අපරාධ කරණ සුලුවූ සොරෙකු අල්වාගෙණවුත් ස්වාමීනි
මේතෙම නුඹවහන්සේගේ අණට විරුඬව අපරාධ කරණ සුලුවූ සො
රෙක, මොහට යම් දඬුවමක් කැමැත්තෙහිද ඒ පමුණුවවයි කිය
මට දන්වද්ද එකල ඔවුන්ට මම මෙසේ කියමි. පින්වත්නි, එසේ
වීනම් සිවියද, සමද, මාංසද, නහරද, ඇටද, ඇටමිදුලුද, විනාශ
නොකොට මේ පුරුෂයා ජීවිතයෙන් තොරකරව්යයි කියාපි. ඔව්හු
යහපතැයි මාගේ වචනය පිළිගෙණ සිවියද, සමද, මාංසද, නහරද,
ඇටද, ඇටමිදුලුද, විනාශ නොකොට ඒ පුරුෂයා ජීවිතයෙකෙරෙන්
තොරකෙරෙත්. යම්කලෙක ඒ පුරුෂතෙම නොමළේවේද, එකල
ඒපුරුෂයන්ට මම මෙසේ කියමි. පින්වත්නි, එසේවීනම් මේ පුරු
ෂයා උඩුකුරුකොට හෙළව්. මොහුගේ නික්මෙන්නාවූ ජීවිතය දක්
නාමෝනම් යෙහෙකැයි කියායි. ඔව්හු ඒ පුරුෂයා උඩුකුරුකොට
හෙළත්. මොහුගේ නික්මෙන්නාවූ ජීවිතයක් අපි නොදකුම්හයි
ඒ පුරුෂයෝ කියත්. එකල ඔවුන්ට මම මෙසේ කියමි. පින්වත්නි,
එසේවීනම් මේපුරුෂයා යටිකුරුකොට හෙළව්. සංක්ෂෙප කරණලදි.
පාශ්වයකින් හෙළව්. මිතිපාශ්වයෙන් හෙළව්. උඩුකුරුකොටතබව්.

ඔමුඩකං එපෙථ—පෙ—පාණිනා ආකොටෙථ—පෙ—ලෙඩ්ඩුනා ආකොටෙථ —පෙ— දණ්ඩෙන ආකොටෙථ—පෙ—සත්ථෙන ආකොටෙථ—පෙ—ඔධුනාථ—පෙ— සන්ධුනාථ —පෙ—නිද්ධුනාථ, අප්පෙවනාමස්ස ජීවං නික්ඛමන්තං පස්සෙය්‍යාමාති. තෙ තං පුරිසං ඔධුනන්ති සන්ධුනන්ති නිද්ධුනන්ති නෙවස්ස මයං ජීවං නික්ඛමන්තං පස්සාම තස්සච තදෙව චක්ඛු හොති. තෙ රූපා තඤ්චායතනං නප්පටිසංවෙදෙති. තදෙව සොතං හොති. තෙ සද්දා තඤ්චායතනං නප්පටි සංවෙදෙති. තදෙව ඝාණං හොති. තෙ ගන්ධා තඤ්චායතනං නප්පටිසංවෙදෙති, සායෙව ජිව්හා හොති. තෙ රසා තඤ්චායතනං නප්පටිසං වෙදෙති, සොයෙව කායො හොති. තෙ ඵොට්ඨබ්බා තඤ්චායතනං නප්පටිසංවෙදෙති. අයම්පි ඛො හො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

---

යටදිසාවට තබව්. අතින් ගසව්. කැටයෙන් ගසව්. දණ්ඩෙන් ගසව්. ආයුධයෙන් ගසව්. මැනවට පෙරළෙව්. ඇනට පෙරළෙව්. මබමොබ පෙරළව්. මොහුගේ නික්මෙන්නාවූ ජීවිතය දක්නමෝනම් යෙහෙකැයි කියාය. ඔහු ඒ පුරුෂයා මැනට පෙරළෙත්. ඇතට පෙරළෙත්. ඔබමොබ පෙරළීම කෙරෙත්. අපි මොහුගේ නික්මෙන්නාවූ ජීවිතයක් නොමදක්නම්හ. ඔහුගේද එම ඇසවෙයි. ඒරූපයෝ වෙත්. ඒඇසින් රූපායතනය ප්‍රකාශ නොකෙරෙයි. එම ශ්‍රොත්‍රය වෙයි. ඒ ශබ්දයෝ වෙත්. ඒ ශ්‍රොත්‍රයෙන් ශබ්දායතනය ප්‍රකාශ නොකෙරෙයි. එම ඝ්‍රාණය වෙයි. ඒගන්ධයෝ වෙත්. ඒ ඝ්‍රාණයෙන් ගන්ධායතනය ප්‍රකාශ නොකෙරෙයි. එම ජිව්හාව වෙයි. ඒ රසයෝ වෙත්. ඒ ජිව්හාවෙන් රසායතනය ප්‍රකාශ නොකෙරෙයි. එම කය වෙයි. ඒ ස්පර්ශයෝ වෙත්. ඒ කයින් ඵස්සායතනය ප්‍රකාශ නොකෙරෙයි. පින්වත් කාශ්‍යපය, මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්‍මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා මෙබදුවූ සිතෙක් යම්කාරණයකින් ඇතිවේද්ද මේද ඊට එක් කාරණයෙක් වෙයි.

19. තෙනහි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි, උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරො සඞ්ඛධමො සඞ්ඛං ආදාය පච්චන්තිමං ජනපදං අගමාසි. සො යෙනඤ්ඤතරො ගාමො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා මජ්ඣෙ ගාමස්සඨිතො තික්ඛත්තුං සඞ්ඛං උපලාසිත්වා සඞ්ඛං භූමියං නික්ඛිපිත්වා එකමන්තං නිසීදි. අථ ඛො රාජඤ්ඤ තෙසං පච්චන්තජානං මනුස්සානං එතදහොසි. අම්භො කිස්සනුඛො එසො සද්දො, එවං රජනියො එවං කමනීයො එවං මදනීයො එවං බන්ධනීයො එවං මුච්ඡනියොති, සන්නිපතිත්වා තං සඞ්ඛධමං එතදවොචුං. අම්භො කිස්සනු ඛො එසො සද්දො එවං රජනීයො එවං කමනීයො එවං මදනීයො එවං බන්ධනීයො එවං මුච්ඡනීයොති. එසො ඛො භො සඞ්ඛො නාම. යස්සෙසො සද්දො, එවං රජනීයො එවං කමනීයො එවං මදනීයො එවං බන්ධනීයො එවං මුච්ඡනීයොති. තෙ තං සඞ්ඛං උත්තානං නිපාතෙසුං, වදෙහි භො සඞ්ඛ, වදෙහි භො සඞ්ඛාති. නෙව සො සඞ්ඛො සද්දමකාසි.

---

19. රාජන්‍යය, එසේවීනම් තාට උපමාවක් කරන්නෙමි. මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ උපමායෙන්ද කියනලද වචනයාගේ අර්ථය දැනගණිත්. රාජන්‍යය, පෙරපැවති කරුණක් කියමි. එක්තරා සක්පිඹින්නෙක් සකක්ගෙණ ප්‍රත්‍යන්ත දෙශයෙහිවූ ජනපදයකට ගියේය. හෙතෙම එක්තරා ගමක් යම් තැනකද එහි එළඹියේය. එළඹ ග්‍රාමයාගේ මධ්‍යයෙහි තරයේ තුන්වරක් සඞ්ඛය පිඹ සඞ්ඛය භූමියෙහි දමා (තබා) එකත් පසෙක උන්නේය. රාජන්‍යය, ඉක්බිත්තෙන් ඒ ප්‍රත්‍යන්ත දෙශයෙහි උපන්නාවූ මිනිසුන්ට මෙබඳු සිතෙක් වූයේය. පින්වත්නි, මෙසේ සිත්ආසාවියයුතුවූ මෙසේ කැමතිවියයුතුවූ මෙසේ මත්වියයුතුවූ මෙසේ බැඳියයුතුවූ මෙසේ මූර්ඡා වියයුතුවූ මේ ශබ්දයතෙම කවරක්හුගේදැයි කියාය. නැවත ඒ ප්‍රත්‍යන්ත ජනපදවාසී මනුෂ්‍යයෝ රැස්ව ඒ සක්පිඹින්නාට මෙකාරණය කීවෝය. පින්වත, මෙසේ සිත් ඇලවියයුතුවූ මෙසේ කැමතිවියයුතුවූ මෙසේ මත්වියයුතුවූ මෙසේ බැඳියයුතුවූ මෙසේ මූර්ඡාවියයුතුවූ මේ ශබ්දයතෙම කවරක්හුගේදැයි කියාය. යමක්හුගේ මේ ශබ්දයතෙම මෙසේ සිත් ඇලවිය යුතුවේද මෙසේ කැමතිවියයුතු වේද මෙසේ මත්වියයුතුවෙද මෙසේ බැඳිය යුතු වේද පින්වත්නි, මේවනාහි සඞ්ඛ යන නම් ඇත්තේයයි කීයේය. නැවත ඒ ප්‍රත්‍යන්තජනපදවාසී මනුෂ්‍යයෝ පින්වත් සඞ්ඛය ශබ්දකරව. පින්වත් සඞ්ඛය ශබ්ද කරවයි කියා ඒ සඞ්ඛය උඩුකුරු කොට පෙරළූවාහුය. ඒ සඞ්ඛතෙම ශබ්ද නොකෙළේමය.

තෙ තං සඞ්ඛං අවකුජ්ජං නිපාතෙසුං ...පෙ... පස්සෙන නිපාතෙසුං ...පෙ... දුතියෙන පස්සෙන නිපාතෙසුං... උද්ධං ඨපෙසුං...ඔමුද්ධකං ඨපෙසුං...පාණිනා ආකොටෙසුං... ලෙඩ්ඩුනා ආකොටෙසුං...දණ්ඩෙන ආකොටෙසුං ...පෙ... සත්ථෙන ආකොටෙසුං...පෙ...ඔධුනිංසු...පෙ...සන්ධුනිංසු ...පෙ...නිද්ධුනිංසු, වදෙහි භො සඞ්ඛ, වදෙහි භො සඞ්ඛාති. නෙව සො සඞ්ඛො සද්දමකාසි. අථ ඛො රාජඤ්ඤ තස්ස සඞ්ඛධමස්ස එතදහොසි. යාව බාලා ඉමෙ පච්චන්තජා මනුස්සා, කථංහි නාම අයොනිසො සඞ්ඛසද්දං ගවෙසිස්සන්තීති. තෙසං පෙක්ඛමානානං සඞ්ඛං ගහෙත්වා තික්ඛත්තුං සඞ්ඛං උපලාසිත්වා සඞ්ඛං ආදාය පක්කාමි. අථ ඛො රාජඤ්ඤ තෙසං පච්චන්තජානං මනුස්සානං එතදහොසි. යදා කිර භො අයං සඞ්ඛො නාම පුරිසසහගතො ච හොති, වායාම සහගතො ච වායොසහගතො ච තදායං සඞ්ඛො සද්දං කරොති. යදා පනායං සඞ්ඛො නෙව පුරිසසහගතො හොති න වායාමසහගතො න වායො සහගතො නායං සඞ්ඛො සද්දං කරොතීති.

---

නැවතත් පුරුෂයෝ පින්වත් සඞ්ඛය, ශබ්දකරව, පින්වත් සඞ්ඛය, ශබ්දකරවයි කියා ඒසඞ්ඛය යටිකුරුකොටපෙරළුවාහුය. පාශ්වයෙන් පෙරළුවාහුය. මිත්‍ය පාශ්වයෙන් පෙරළුවාහුය. උඩුකුරුකොට තැබූවාහුය. යටිකුරුකොට තැබූවාහුය. අතින් ගැසූවාහුය. කැටයෙන්ගැසූවාහුය. දණ්ඩෙන් ගැසූවාහුය. ආයුධයෙන් ගැසූවාහුය. මෑතට පෙරළුවාහුය. ඈතට පෙරළුවාහුය. ඔබමොබ පෙරළුවාහුය, ඒ සඞ්ඛයතෙම ශබ්ද නොකෙළේමය. රාජන්‍යය, ඉක්බිත්තෙන් ඒ සක්පිඹින්නාහට මෙබඳු සිතෙක්වූයේය. ප්‍රත්‍යන්තයෙහි උපන්නාවූ මේ මනුෂ්‍යයෝ අඥානයෝවෙත්. කෙසේනම් නුවනින් සඞ්ඛශබ්දය සොයන්නාහුදැයි කියායි. ඔවුන් බලාසිටින්නදී සඞ්ඛයගෙණ තුන්වරක් සඞ්ඛය පිඹ සඞ්ඛයරැගෙණගියේය. රාජන්‍යය, ඉක්බිත්තෙන් ඒප්‍රත්‍යන්තයෙහිඋපන්නාවූ මනුෂ්‍යයන්ට මෙබඳු සිතෙක්වූයේය. පින්වත්නි, යම් කලෙක්හි වනාහි මේ සඞ්ඛයතෙම පුරුෂයකු සමග පැවැත්තේවේද, උත්සාහයසමග පැවැත්තේවේද, වාතය සමග පැවත්තේවේද, එකල්හි මේ සඞ්ඛයතෙම ශබ්ද කෙරෙයි. යම් කලෙක්හි වනාහි මේ සඞ්ඛයතෙම පුරුෂයකුහා නොපවත්තේවේද, උත්සාහය සමග නොපැවත්තේවේද, වාතය සමග නොපවතීද, එකල මේ සඞ්ඛයතෙම ශබ්ද නොකෙරේයයි කියාය.

එවමෙව ඛො රාජඤ්ඤ යදායං කායො ආයුසහගතොච හොති. උස්මාසහගතොච විඤ්ඤාණ සහගතොච තදා, අභික්කමතිපි පටික්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති චක්ඛුනාපි රූපං පස්සති සොතෙනපි සද්දං සුණාති,ඝාණෙනපි ගන්ධං ඝායති ජිව්හායපි රසං සායති කායෙනපි ඵොට්ඨබ්බං ඵුසති මනසාපි ධම්මං විජානාති. යදාපනායං කායො නෙව ආයුසහගතොච හොති න උස්මාසහගතොච න විඤ්ඤාණසහගතොච තදා නෙව අභික්කමති න පටික්කමති න තිට්ඨති න නිසීදති න සෙය්‍යං කප්පෙති චක්ඛුනාපි රූපං න පස්සති සොතෙනපි සද්දං නසුණාති ඝාණෙනපි ගන්ධං න ඝායති ජිව්හායපි රසං න සායති කායෙනපි ඵොට්ඨබ්බං න ඵුසති මනසාපි ධම්මං න විජානාති. ඉමිනාපි ඛො තෙ රාජඤ්ඤ පරියායෙන එවං හොතු ඉතිපි අත්ථි පරො ලොකො අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකොති.

---

රාජන්‍යය, එපරිද්දෙන්ම මේ ශරීරය තෙම ආයුෂසහගතවූයේවේද, උෂ්ණසහගතවූයේවේද, විඤ්ඤාණය සමග පැවත්තේවේද, එකල මේ ( ශරීරයතෙම ) ඉදිරියටද යෙයි. ආපසුද යෙයි, සිටීමද කෙරෙයි. හිඳීමද කෙරෙයි, සයනයද කෙරෙයි, ඇස කරණකොට ගෙණ රූපය දකියි. ශ්‍රොත්‍රය කරණකොටගෙණද ශබ්දය අසයි. ඝ්‍රාණය කරණකොටගෙණද ගන්ධය ආඝ්‍රාණය කෙරේ. දිව කරණකොටගෙණ රසය ආස්වාද කෙරෙයි. ( රසවිඳියි.) කය කරණකොටගෙණද ස්පර්ශය ස්පර්ශකෙරෙයි. සිත කරණකොටගෙණ ධර්මය දැනගණියි. යම් කලෙක්හි වනාහි මේ ශරීරයතෙම ආයුෂ සමග නොපවත්නේවේද, උෂ්ණයහා සමග නොපවත්නේවේද, විඤ්ඤාණයහා සමග නොපවත්නේවේද, එකල්හි ( මේ ශරීරයතෙම ) ඉදිරියට යාමද නොකෙරෙයි. ආපසු ඊමද නොකෙරෙයි. සිටීමද නොකෙරෙයි හිඳීමද නොකෙරෙයි. සයනයද නොකෙරෙයි. ඇසින්ද රූපය නොදකියි. කණින්ද ශබ්දය නොඅසයි. නාසයෙන්ද ගන්ධය ආඝ්‍රාණ නොකෙරෙයි, දිවින්ද රසාස්වාදනය නොකෙරෙයි. ශරීරයෙන්ද ස්පර්ශය ස්පර්ශනොකෙරෙයි. සිතින්ද ධර්මය නොදනියි. රාජන්‍යය, මේ කාරණයෙන්ද තට මෙබඳු සිතෙක් ඇතිවේවා. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව ඇත්තේය. චුතව උපදනා සත්වයෝ ඇත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේයයි කියාය.

20. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො එවම්මෙ එත්ථ හොති. ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. අත්ථි පන රාජඤ්ඤ පරියායො ...පෙ... අත්ථි භො කස්සප පරියායො ...පෙ... යථා කථංවිය රාජඤ්ඤාති. ඉධ මෙ භො කස්සප පුරිසා ආගුචාරිං චොරං ගහෙත්වා දස්සෙන්ති. අයං තෙ භන්තෙ චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡසි තං දණ්ඩං පණෙහීති, ත්‍යාහං එවං වදාමි. තෙනහි භො ඉමස්ස පුරිසස්ස ඡවිං ඡින්දථ, අප්පෙව නාමස්ස ජීවං පස්සෙය්‍යාමාති. තෙ තස්ස පුරිසස්ස ඡවිං ඡින්දන්ති නෙවස්ස මයං ජීවං පස්සාම, ත්‍යාහං එවං වදාමි. තෙනහි භො ඉමස්ස පුරිසස්ස චම්මං ඡින්දථ, මංසං ඡින්දථ, නහාරුං ඡින්දථ, අට්ඨිං ඡින්දථ අට්ඨිමිඤ්ජං ඡින්දථ, අප්පෙව නාමස්ස ජීවං පස්සෙය්‍යාමාති. තෙ තස්ස පුරිසස්ස අට්ඨිමිඤ්ජං ඡින්දන්ති, නෙවස්ස මයං ජීවං පස්සාම.

---

20. භවත් කාශ්‍යපතෙමේ කිසිසේත් මෙසේ කියන්නේද එතකුදුවූවත් මේකාරණයෙහි මාගේඅදහස මෙබඳුවෙයි. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්‍මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියාය. රජන්‍යය, තට කාරණයෙක් ඇත්තේදැයි විචාළේය. හකුළුව තලදි. පින්වත් කාශ්‍යපය, කාරණයෙක් ඇත්තේයයි කීයේය. රජන්‍යය, ඒ කෙබඳු කාරණයෙක්දැයි විචාළේය. පින්වත් කාශ්‍යපය, මේ ලොකයෙහි පුරුෂයෝ අපරාධ කරණ සුලුවූ සොරෙකු අල්වාගෙණ ස්වාමිනි, මේතෙම නුඹවහන්සේගේ අණට විරුඩව අපරාධ කරණ සුලුවූ සොරෙක. මෝහට යමක් කැමැත්තෙහිද ඒ දඬුවම පණවවයි කියාදක්වද්ද, එකල මම ඔවුන්ට මෙසේ කියම්. පින්වත්නි, එසේකල මොහුගේ ජීවිතය දක්නමෝනම් යෙහෙකැයි කියා මේ පුරුෂයාගේ සිවිය සිඳිව්යයි කියාය. ඔහු ඒ පුරුෂයාගේ සිවිය සිඳිත්. ඒපුරුෂයෝ අපි මොහුගේ ජීවිතය නොදක්කුම්හයි කියත්. එකල මම ඔවුන්ට මෙසේ කියම්. පින්වත්නි, එසේවීනම් මොහුගේ ජීවිතය දක්නමෝනම් යෙහෙකැයිකියා මේ පුරුෂයාගේ සම සිඳිව්, මාංස සිඳිව්, නහර සිඳිව්, ඇට සිඳිව්, ඇටමිඳුලු සිඳිව්යයි කියාය. ඔහුඒපුරුෂයාගේ ඇට මිඳුලු සිඳිත්. අපි මේපුරුෂයාගේ ජීවිතය නොදක්කුම්හයි කියත්.

අයම්පි ඛො හො කස්සප පරියායො යෙන මෙ පරියායෙන එවං හොති. ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති.

21, තෙනහි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි, උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරො අග්ගිකො ජටිලො අරඤ්ඤායතනෙ පණ්ණකුටියා වසති. අථ ඛො රාජඤ්ඤ අඤ්ඤතරො සත්ථො ජනපදපදෙසා වුට්ඨාසි. අථ ඛො සො සත්ථො තස්ස අග්ගිකස්ස ජටිලස්ස අස්සමස්ස සාමන්තා එකරත්තිං වසිත්වා පක්කාමි. අථ ඛො රාජඤ්ඤ තස්ස අග්ගිකස්ස ජටිලස්ස එතදහොසි. යන්නූනාහං යෙන සො සත්ථවාහො තෙනුපසඞ්කමෙය්‍යං, අප්පෙවනාමෙත්ථ කිඤ්චි උපකරණං අධිගච්ඡෙය්‍යන්ති, අථ ඛො සො අග්ගිකො ජටිලො කාලස්සෙව වුට්ඨාය යෙන සො සත්ථවාහො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අද්දස තස්මිං සත්ථවාහෙ දහරං කුමාරං මන්දං උත්තානසෙය්‍යකං ඡඩ්ඩිතං.

---

පින්වත් කාශ්‍යපය, මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා මට මෙබඳු සිතෙක් යම් කාරණයකින් වේද, මේද ඊට කාරණයෙක් වෙයි.

21. රාජන්‍යය, එසේවීනම් තට උපමාවක් කරන්නෙමි. මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ උපමායෙන්ද කියනලද වචනයාගේ අර්ථය දැනගණිත්. රාජන්‍යය, පෙරවූ කරුණක් කියමි. එක්තරා ගිනිපුදන්නාවූ ජටිලයෙක් අරණ්‍යායතනයෙහි පත්‍රවලින් සෙවිලිකරණලද කුටියක වෙසෙයි. රාජන්‍යය, ඉක්බිත්තෙන් එක්තරා සමූහයක් ජනපද ප්‍රදෙශයකින් නැගීසිටියේය. ඉක්බිත්තෙන් ඒ සමූහයතෙම ඒ ගිනි පුදන්නාවූ ජටිලයාගේ ආශ්‍රමයට හාත්පසින් එක්රැයක් වාසයකොට ගියේය. රාජන්‍යය, ඉක්බිත්තෙන් ඒ ගිනි පුදන්නාවූ ජටිලයාට මෙබඳු සිතෙක්වූයේය. ඒ සමූහයාගේ වාසය යම් තැනකද මම එහි එළඹෙන්නෙම්නම් යෙහෙක. මෙහි කිසිඋපකරණයක් ලබන්නෙම් නම් මැනවයි කියාය. ඉක්බිත්තෙන් ඒ ගිනිපුදන ජටිලතෙම උදයම නැගිට ඒ සමූහයාගේ ගම යම් තැනකද එහි එළඹියේය. එළඹ ඒ සමූහයාගේ වාසස්ථානයෙහි දමනලද්දවූ උඩුකුරුව සයනයකරන්නාවූ මන්දවූ ( කුඩාවූ ) ළදරුකුමාරයකු දුටුයේය.

දිස්වා තස්ස එතදහොසි, න ඛො මෙතං පතිරූපං යම්මෙ පෙක්ඛමානස්ස මනුස්සභූතො කාලංකරෙය්‍ය, යන්නූනාහං ඉමං දාරකං අස්සමං නෙත්වා ආපාදෙය්‍යං පොසෙය්‍යං වඩ්ඪෙය්‍යන්ති. අථ ඛො සො අග්ගිකො ජටිලො තං දාරකං අස්සමං ආනෙත්වා ආපාදෙසි පොසෙසි වඩ්ඪෙසි. යදා සො දාරකො දසවස්සුද්දෙසිකො වා හොති, ද්වාදසවස්සුද්දෙසිකො වා අථ ඛො තස්ස අග්ගිකස්ස ජටිලස්ස ජනපදෙ කිඤ්චිදෙව කරණීයං උප්පජ්ජි, අථ ඛො සො අග්ගිකො ජටිලො තං දාරකං එතදවොච, ඉච්ඡාමහං තාත ජනපදං ගන්තුං. අග්ගිං තාත පරිචරෙය්‍යාසි. මා ච තෙ අග්ගි නිබ්බායි. සචෙ තෙ අග්ගි නිබ්බායෙය්‍ය. අයං වාසි. ඉමානි කට්ඨානි, ඉදං අරණීසහිතං, අග්ගිං නිබ්බත්තෙත්වා අග්ගිං පරිචරෙය්‍යාසීති. අථ ඛො සො අග්ගිකො ජටිලො තං දාරකං එවං අනුසාසිත්වා ජනපදං අගමාසි. තස්ස ඛිඩ්ඩාපසුතස්ස අග්ගි නිබ්බායි, අථ ඛො තස්ස දාරකස්ස එතදහොසි, පිතා ඛො මං එවං අවච, අග්ගිං තාත පරිචරෙය්‍යාසි. මා ච තෙ අග්ගි නිබ්බායි.

---

දැක මේ ජටිලයාහට මෙබඳු සිතෙක් වූයේය. යම් හෙයකින් මා බලා සිටියදී මනුෂ්‍යවූවෙක් කාලක්‍රියා කරන්නේ නම් මේ කාරණය මට සුදුසු නොවෙයි මම මේ දරකයා ආශ්‍රමයට පමුණුවා නිෂ්පාදනය කරන්නෙම් නම් භොජනාදියෙන් පොෂ්‍යය කරන්නෙම් නම් වැඩීමට පමුණුවන්නෙම් නම් යෙහෙකැයි කියායි. ඉක්බිත්තෙන් ඒ ගිනි පුදන්නාවූ ජටිලතෙම ඒ දරකයා ආශ්‍රමයටගෙණවුත් ආයුෂයට පැමිණවූයේය. පොෂ්‍යය කෙළේය. වර්ධනය කෙළේය. යම් කලක ඒ දරකතෙම දස අවුරුදුවයස් ඇත්තේවේද, එකල ඒ ගිනි පුදන්නාවූ ජටිලයාහට ජනපදයෙහි කිසියම් කටයුත්තෙක් උපන්නේය. ඉක්බිත්තෙන් ඒ ගිනිපුදන්නාවූ ජටිලතෙම ඒ දරකයාට මේ කාරණය කීයේය. පුත්‍රය, මම ජනපදයට යන්ට කැමැත්තෙම් පුත තෝ ගිනි පුදව තාගේ ගිනි නොනිවව. ඉදින් තාගේ ගිනි නිවුනේ නම් මේ වෑයයි මේ කාෂ්ඨයෝය. මේ ගිනිගානා දඬුදෙකය. ගිනි උපදවා ගිනිපුදන්නෙහියයි කියාය. ඉක්බිත්තෙන් ඒ ගිනි පුදන ජටිලතෙම ඒ දරකයාට මෙසේ අනුසාසනාකොට ජනපදයට ගියේය. ක්‍රීඩායෙහි නියුක්තවූ ඒ දරකයාගේ ගිනි නිවුනේය. ඉක්බිත්තෙන් ඒ දරකයාහට මෙබඳු සිතෙක්වූයේය. (මාගේ ) පියතෙම මට මෙසේ කීයේය. පුත්‍රය ගිනිපුදව තාගේ ගිනිනොනිවව.

සචෙ තෙ අග්ගි නිබ්බායෙය්‍ය අයං වාසි ඉමානි කට්ඨානි. ඉදං අරණිසහිතං අග්ගිං නිබ්බත්තෙත්වා අග්ගිං පරිචරෙය්‍යාසීති. යන්නූනාහං අග්ගිං නිබ්බත්තෙත්වා අග්ගිං පරිචරෙය්‍යන්ති. අථ ඛො සො දාරකො අරණිසහිතං වාසියා තච්ඡි. අප්පෙව නාම අග්ගිං අධිගච්ඡෙය්‍යන්ති. නෙව සො අග්ගිං අධිගච්ඡි, අරණිසහිතං ද්විධා ඵාලෙසි, තිධා ඵාලෙසි, චතුධා ඵාලෙසි, පඤ්චධා ඵාලෙසි, දසධා ඵාලෙසි, සතධා ඵාලෙසි. සකලිකං සකලිකං අකාසි. සකලිකං සකලිකං කරිත්වා උදුක්ඛලෙ කොට්ටෙසි. උදුක්ඛලෙ කොට්ටෙත්වා මහාවාතෙ ඔපුණි අප්පෙව නාම අග්ගිං අධිගච්ඡෙය්‍යන්ති. නෙව සො අග්ගිං අධිගච්ඡි. අථ ඛො සො අග්ගිකො ජටිලො ජනපදෙ තං කරණීයං තීරෙත්වා යෙන සකො අස්සමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං දාරකං එතදවොච. කච්චි තෙ තාත අග්ගි න නිබ්බුතොති. ඉධ මෙ තාත ඛිඩ්ඩාපසුතස්ස අග්ගි නිබ්බායි. තස්ස මෙ එතදහොසි. පිතා ඛො මං එවං අවච, අග්ගිං තාත පරිචරෙය්‍යාසි. මා ච තෙ අග්ගි නිබ්බායි, සචෙ තෙ අග්ගි නිබ්බායෙය්‍ය.

---

ඉදින් තාගේ ගිනි නිවුනේ නම් මේ වාසිය (වෑය) මේ කාෂ්ඨයෝය. මේ ගිනිගානා දඬුදෙකය, ගිනි උපදවා ගිනි පුදන්නෙහියයි කියාය. මම ගිනි උපදවා ගිනි පුදන්නෙහි නම් යෙහෙකැයි ඒ දරුකතෙම සිතුයේය. ඉක්බිත්තෙන් ඒ දරුකතෙම ගිනි ලබන්නේ නම් යෙහෙකැයි කියා ගිනිගානා දඬුදෙක වෑයෙන් සැස්සේය. ගිනි ලබන්නෙම් නම් යෙහෙකැයි කියාය. හෙතෙම ගිනි නොලද්දේමය. ගිනිගානා දඬුදෙක දෙපරිද්දෙකින් පැලූයේය තුන්පරිද්දෙකින් පැළූයේය. සතර පරිද්දෙකින් පැළූයේය. පස් පරිද්දෙකින් පැළූයේය, දස පරිද්දෙකින් පැළූයේය. සියක් පරිද්දෙකින් පැළූයේය කැබලි කැබලි කෙළේය. කැබලි කැබලිකොට වනෙහිලා කෙටුයේය. වනෙහිලා කොටා මහාවාතයෙහි පිඹහැරියේය. හෙතෙම ගිනි නොලැබුයේමය. ඉක්බිත්තෙන් ඒ ගිනි පුදන ජටිලතෙම ජනපදයෙහි ඒ කටයුත්ත තීරණයකොට සවකීයාශ්‍රමය යම් තැනකද එහි එළඹියේය. එළඹ ඒ දරුකයාට මේ කාරණය කීයේය. පුත්‍රය කිමෙක්ද තාගේ ගිනි නොනිවුනේදැයි කියාය. පියාතෙනි, මෙහි ක්‍රීඩායෙහි නියුක්තවූ මාගේ ගිනි නිවුනේය. එකල ඒ මට මෙබඳු සිතෙක් වූයේය (මාගේ) පියාතෙම වනාහි මට මෙසේ කීයේය. පුත්‍රය තෝ ගිනිපුදව තාගේ ගිනි නොනිවේවා ඉදින් තාගේ ගිනි නිවුණේනම්

අයං වාසි, ඉමානි කට්ඨානි, ඉදං අරණිසහිතං, අග්ගිං නිබ්බත්තෙත්වා අග්ගිං පරිචරෙය්‍යාසීති. යන්නූනාහං අග්ගිං නිබ්බත්තෙත්වා අග්ගිං පරිචරෙය්‍යන්ති. අථ ඛො අහං තාත අරණිසහිතං වාසියා තච්ඡිං. අප්පෙව නාම අග්ගිං අධිගච්ඡෙය්‍යන්ති. නෙවාහං අග්ගිං අධිගච්ඡිං අරණිසහිතං. විධා ඵාලෙසිං, තිධා ඵාලෙසිං, චතුධා ඵාලෙසිං, පඤ්චධා ඵාලෙසිං,"දසධා ඵාලෙසිං,'සතධා ඵාලෙසිං, සකලිකං සකලිකං අකාසිං, සකලිකං සකලිකං කරිත්වා උදුක්ඛලෙ කොට්ටෙසිං, උදුක්ඛලෙ කොට්ටෙත්වා මහාවාතෙ ඔපුණිං. අප්පෙව නාම අග්ගිං අධිගච්ඡෙය්‍යන්ති. නෙවාහං අග්ගිං අධිගච්ඡින්ති. අථ ඛො තස්ස අග්ගිකස්ස ජටිලස්ස එතදහොසි, යාව බාලො අයං දාරකො අව්‍යත්තො, කථං හි නාම අයොනිසො අග්ගිං ගවෙසිස්සතීති. තස්ස පෙක්ඛමානස්ස අරණිසහිතං ගහෙත්වා අග්ගිං නිබ්බත්තෙත්වා තං දාරකං එතදවොච. එවං ඛො තාත අග්ගිනිබ්බත්තෙතබ්බො. නත්වෙව යථා ත්වං බාලො අව්‍යත්තො අයොනිසො අග්ගිං ගවෙසිස්සසීති.

---

මේවාසිය (වෑයය) මේ කාෂ්ටයෝය. මේ ගිනි ගානාදඬුදෙකය ගිනි උපදවා ගිනිදන්නෙහියයි කියාය. එබැවින් මම ගිනි උපදවා ගිනිපුදන්නෙම් නම් යෙහෙකැයි කියා සිතීමි. පියාණෙනි, ඉක්බිත්තෙන් මම ගිනි ලබන්නෙම් නම් යෙහෙකැයි කියා ගිනිගානාදඬුදෙක වෑයෙන් සැස්සේමි. මම ගිනි නොමලැබූයෙමි. ගිනිලබන්නෙම් නම් යෙහෙකැයි කියා ගිනිගානාදඬුදෙක දෙපරිද්දෙකින් පැළූයෙමි. තුන් පරිද්දෙකින් පැළූයෙමි. සතර පරිද්දෙකින් පැළූයෙමි. පස්පරිද්දෙකින් පැළූයෙමි. දසපරිද්දෙකින් පැළූයෙමි. සියක් පරිද්දෙකින් පැළූයෙමි, කෑබලි කෑබලි කෙළෙමි. කෑබලි කෑබලිකොට වනෙහිලා කෙටුයෙමි. වනෙහිලා කොටා මහාවාතයෙහි පිඹ හැරියෙමි. මම ගිනි නොමලැබූයෙමි. ඉක්බිත්තෙන් ගිනිපුදන්නාවූ ඒ ජටිලයාහට මෙබඳු සිතෙක්වූයේය. දරකතෙම අඥානවෙයි. කෙසේනම් අනුපායෙන් ගිනි සොයන්නේදැයි කියාය. නැවත ඔහුබලා සිටියදීම ගිනිගානාදඬුදෙකගෙණ ගිනිඋපදවා ඒ දරකයාට මේකාරණය කීයේය. පුත්‍රය මෙසේ වනෙහි ගිනී ඉපදවියයුතු අඥනවූ අව්‍යක්තවූ තෝ අනුපායයෙන් ගිනි නොම සොයන් නෙහියකියාය

එවමෙව ඛො ත්වං රාජඤ්ඤ බාලො අව්‍යත්තො අයොනිසො පරලොකං ගවෙසිස්සසි, පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං, මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

22. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො නෙවාහං සක්කොමි ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිතුං. රාජාපි මං පසෙනදි කොසලො ජානාති, තිරොරාජානොපි පායාසි රාජඤ්ඤො එවං වාදී එවං දිට්ඨී ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. සචාහං භො කස්සප ඉමං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිස්සාමි. භවිස්සන්ති මෙ වත්තාරො යාවබාලො පායාසි රාජඤ්ඤො අව්‍යත්තො දුග්ගහිතගාහීති. කොපෙනපි නං හරිස්සාමි. මක්ඛෙනපි නං හරිස්සාමි පලාසෙනපි නං හරිස්සාමීති.

---

රාජන්‍යය, එපරිද්දෙන්ම අඥනවූ අව්‍යක්තවූ තෝ අනුපායයෙන් පරලොව සොයන්නෙහිය. රාජන්‍යය, මේ ලාමකවූ දෘෂ්ටිය හරුව. රාජන්‍යය. මේ ලාමක දෘෂ්ටිය හරුව, තට දීර්ඝකාලයක් අහිතපිණිස දුක් පිණිස නොවේවායි කීයේය.

22. කිසිසේත් පින්වත් කාශ්‍යපතෙමේ මෙසේ කියයි. එසේවී නමුත් මේ ලාමකවූ දෘෂ්ටිය හරින්ට මම නොහැක්කෙමි. මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි. මෙසේ කියන සුලුවෙයි මෙසේ දෘෂ්ටි ඇත්තේයයි කියා පසේනදිකොසොල්රජතෙමේද මාදනිති. අන්දනවිහි රජහුද දනිත්. පින්වත් කාශ්‍යපය, ඉදින් මම මේ ලාමක දෘෂ්ටිය හරින්නෙම් නම් මට මෙසේ කියත් නෝ වන්නාහුය. පායාසි රාජන්‍යතෙමේ අඥානවෙයි. අව්‍යක්තවෙයි. වරදවාසලකණලද්ද ගන්නා සුලුවෙයි කියාය. යම්කෙනෙක් මට අව්‍යක්තය යනාදිවශයෙන් මෙසේ කියද්ද ඔවුන් කෙරෙහි උපදින කොපයෙන්ද ඒ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙමි. මකුගුණයෙන්ද ඒ මේ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙමි. යුගග්‍රාහයෙන්ද ඒ මේ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙමියි කීයේය.

23. තෙනහි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි, උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ මහාසකටසත්ථො සකටසහස්සං පුරත්ථිමාය ජනපදාය පච්ඡිමං ජනපදං අගමාසි. සො යෙන යෙන ගච්ඡති ඛිප්පමෙව පරියාදියති තිණකට්ඨොදකං හරිතකපණ්ණං. තස්මිං ඛො පන සත්ථෙ ද්වෙ සත්ථවාහා අහෙසුං එකො පඤ්චන්නං සකටසතානං, එකො පඤ්චන්නං සකටසතානං. අථ ඛො තෙසං සත්ථවාහානං එතදහොසි. අයං ඛො පන මහා සකටසත්ථො සකටසහස්සං. තෙ මයං යෙන යෙන ගච්ඡාම ඛිප්පමෙව පරියාදියති. තිණකට්ඨොදකං හරිතකපණ්ණං. යන්නූන මයං ඉමං සත්ථං ද්විධා විභජෙය්‍යාම. එකතො පඤ්ච සකටසතානි, එකතො පඤ්චසකට සතානීති. තෙ තං සත්ථං ද්විධා විභජිංසු එකතො පඤ්ච සකටසතානි එකතො පඤ්චසකටසතානි. එකො තාව සත්ථවාහො බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච ආරොපෙත්වා සත්ථං පායාපෙසි.

---

23. රාජන්‍යය, එසේවිනම් තට උපමාවක් කරන්නෙමි. උපමාවෙන්ද මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ කියනලද වචනයාගේ අර්ථය දැනගණිත්. රාජන්‍යය, පෙරපැවති කාරණයක් කියමි. ගැල් දහසකින් යුක්තවූ මහත් ගැල් සමූහයෙක් පූර්වදිග ජනපදයෙන් පශ්චිමදිග ජනපදයට ගියේය. ඒ ගැල් සමූහයතෙම යම් යම් මාර්ගයකින් යේද තණද දරද දියද යටත්පිරිසෙයින් නිල්තණ පමණකුදු ඉතිරිනොවෙයි. එකෙක් ගැල්පන්සියයකටද තවත් එකෙක් අනික් ගැල් පන්සියයටදැයි ඒ ගැල් සමූහයෙහි සාත්තුනායකයෝ දෙදෙනෙක් වූවාහුය. ඉක්බිත්තෙත් ඒ සාත්තුනායකයන්ට මෙබඳු සිතෙක්වූයේය. මේ වනාහි ගැල් දහසකින් යුක්තවූ මහත් ගැල් සමූහයෙක්වෙයි. ඒඅපි යම් යම්මාර්ගයකින් යන්න මෝද තණද දරද දියද යටත් පිරිසෙයින් නීලවර්ණවූද තෘණ මාත්‍රයකුදු ඉතිරිනොවෙයි. අපි එක් කොටසකට ගැල් පන්සියයබැගින් මේ ගැල් සමූහය දෙපරිද්දකින් බෙදන්නමෝනම් යෙහෙකැයි කියායි. ඔහු ඒ ගැල් සමූහය එක් කොටසකට ගැල් පන්සියයක්ද අනික් කොටසට ගැල් පන්සියයක්දැයි දෙපරිද්දෙකින් බෙදූවාහුය. එක් ශාස්තෘවාහකයෙක් බොහෝවූ තණද දරද දියද ගැල්වල පටවාගෙණ ගැල් සමූහය පැද්දවූයේය.

විහතීහ පායාතො බොපන සො සත්ථවාහො අද්දසපුරිසං කාළං ලොහිතක්ඛිං අපනද්ධකලාපං කුමුදමාලිං අල්ලවත්ථං අල්ලකෙසං කද්දමමක්ඛිතෙහි චක්කෙහි භද්‍රෙන රථෙන පටිපථං ආගච්ඡන්තං. දිස්වා එතදවොච. කුතො භො ආගච්ඡසීති, අමුකම්හා ජනපදාති. කුහිං ගමිස්සසීති. අමුකංනාම ජනපදන්ති. කච්චි භො පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවට්ටොති. එවං ඛො භො පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවට්ටො. ආසිත්තොදකානි වටුමානි. බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච. ඡඩ්ඩෙථ භො පුරාණානි තිණානි කට්ඨානි උදකානි. ලහුභාරෙහි සකටෙහි සීඝසීඝං ගච්ඡථ මා යොග්ගානි කිලමෙථාති. අථ ඛො සො සත්ථවාහො සත්ථිකෙ ආමන්තෙසි. අයං භො පුරිසො එවමාහ, පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවට්ටො, ආසිත්තොදකානි වටුමානි බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච. ඡඩ්ඩෙථ භො පුරාණානි තිණානි කට්ඨානි උදකානි ලහුභාරෙහි සකටෙහි සීඝසීඝං ගච්ඡථ මා යොග්ගානි කිලමෙථාති.

---

දෙතුන් දිනක් ගියාවූ ඒ සමූහයාතෙම මඩ තැවරුණාවූ චක්‍රවලින් යුක්තාවූ යහපත්වූ රථයකින් ඉදිරි මාර්ගයට එන්නාවූ රක්තවර්ණවූ ඇස් ඇති සන්නද්ධකරණලද ධනුකලාපඇති පළඳිනාලද හෙලඋපුල්මාලා ඇත්තාවූවස්ත්‍ර ඇත්තාවූ ඉසකේඇති කෘෂ්ණවර්ණවූ පුරුෂයෙකු දුටුයේය දූකපින්වත්නි,කිනම්ජනපදයකින්එන්නෙහිදැයිඇසීය.අසවල් ජනපදයෙනැයි කීයේය. කොතැනට යන්නෙහිදැයි ඇසීය. මෙනම් ජනපදයටයයි කීයේය පින්වත කිමෙක්ද ඉදිරිකාන්තාරයෙහි මහා මෙඝයතෙම වර්ෂාකෙරේදැයි ඇසීය. පින්වත එසේය. ඉදිරි කාන්තාරයෙහිමෙඝයතෙම පවත්නේවෙයි ජලයෙන් පිරුණාවූ මාර්ගයෝවෙත් බොහෝවූ තණද දරද දියද ඇත්තේවෙයි. පින්වත පරණවූ තණද දරද දියද බැහැර දමව්. සැහැල්ලුබරඇති ගැල්වලින් යුක්තව වහ වහා යව්, ගවයන් ක්ලාන්ත නොකරව්යයි කීයේය. ඉක්බිත්තෙත් ඒ ශාස්තෘවාහකතෙම ගැල්සමූහයෙහිවූ යුක්තයන්ට ආමන්ත්‍රණය ළේය. පින්වත්නි, මේ පුරුෂතෙම මෙසේ කීයයි. ඉදිරිකාන්තාරයෙහි මහාමෙඝයතෙම පැවැත්තේය. මාර්ගයෝ ජලයෙන් පිරුණාහුය. බොහෝවූ තණද දරද දියද ඇත්තේය. පින්වත පරණවූ තණද දරද දියද බැහැර දමව්. සැහැල්ලුවූබරඇති. ගැල්වලින් යුක්තව වහ වහා යව් ගවයන් ක්ලාන්ත නොකරව්යයි කීහය.

ඡඩ්ඩෙථ භො පුරාණානි තිණානි කට්ඨානි උදකානි, ලහුභාරෙහි සකටෙහි සත්ථං පායාපෙථාති. එවං භොති ඛො තෙ සාකටිකා තස්ස සත්ථවාහස්ස පටිස්සුත්වා ඡඩ්ඩෙත්වා පුරාණානි තිණානි කට්ඨානි උදකානි ලහුභාරෙහි සකටෙහි සත්ථං පායාපෙසුං. තෙ පඨමෙපි සත්ථවාසෙ න අද්දසංසු තිණං වා කට්ඨං වා උදකං වා —පෙ— දුතියෙපි සත්ථවාසෙ —පෙ— තතියෙපි සත්ථවාසෙ —පෙ— චතුත්ථෙපි සත්ථවාසෙ —පෙ— පඤ්චමෙපි සත්ථවාසෙ —පෙ— ඡට්ඨෙපි සත්ථවාසෙ —පෙ— සත්තමෙපි සත්ථවාසෙ න අද්දසංසු තිණං වා කට්ඨං වා උදකං වා, සබ්බෙව අනයව්‍යසනං ආපජ්ජිංසු. යෙ ච තස්මිං සත්ථෙ අහෙසුං මනුස්සා වා පසූ වා සබ්බෙව සො යක්ඛො අමනුස්සො භක්ඛෙසි. අට්ඨිකානෙව සෙසෙසි. යදා අඤ්ඤාසි දුතියො සත්ථවාහො බහුනික්ඛන්තො ඛො භො දානි සො සත්ථොති. බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච ආරොපෙත්වා සත්ථං පායාපෙසි.

---

ශාස්තෘවාහකතෙම පින්වත්නි, පරණවූ තණද දරද දියද බැහැරදමව්. සැහැල්ලුවූ බර ඇති ගැල්වලින් යුක්තව ගැල්සමූහය පද්දවව්යයි කීයේය. පින්වත, එසේයයි කියා ඒ ගැල්සමූහයෙහි යුක්ත පුරුෂයෝ ඒ ශාස්තෘවාහකයාට ප්‍රතිවචන දී පරණවූ තණද, දරද, දියද, බැහැරදමා සැහැල්ලු බර ඇති ගැල්වලින් යුක්තව ගැල්සමූහය පැද්දවූවාහුය. ඔහු පළමුවන සමූහයාගේ වාසස්ථානයෙහිද තණ, හෝ දර, හෝ ය, හෝ නුදුටුවාහුය. දෙවැනි සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—තුන්වන සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—සතරවන සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—පස්වන සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—සවන සමූහයාගේ වාසස්ථානයෙහිද සත්වන සමූහයාගේ වාසස්ථානයෙහිද තණහෝ, දරහෝ, දියහෝ, නුදුටුවාහුය. සියල්ලෝම මහත් විනාසයට පැමිණියාහුය. මනුෂ්‍යවූ හෝ සිව්පාවූ හෝ යම්කෙනෙක් ඒසමූහයෙහිවූවාහුද ඒ සියල්ලම අමනුෂ්‍යවූ යක්ෂතෙම භක්ෂණය කෙළේය. ඇට පමණක් ඉතිරිකෙළේය. දෙවන ශාස්තෘවාහකතෙම ඒසමූහයතෙම දුත්නික්ම බොහෝකල් ගියේයයි යම් කලක දැනගත්තේද එකල බොහෝ තණද, දරද, දියද, ගැල්වලට නගාගෙණ ගැල් සමූහය පැද්දවූයේය.

විගතිහ පායාසතො බො පනෙසො සත්‍ථෙ, අද්දස පුරිසං කාළං ලොහිතක්ඛං අපනද්ධකලාපං කුමුදමාලිං අල්ලවත්‍ථං අල්ලකෙසං කද්දම මක්ඛිතෙහි චක්කෙහි භද්‍රෙන රථෙන පටිපථං ආගච්ඡන්තං. දිස්වා එතදවොච. කුතො භො ආගච්ඡසීති. අමුකම්හා ජනපදාති. කුහිං ගමිස්සසීති, අමුකං නාම ජනපදන්ති, කච්චි භො පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවට්ටොති. එවං භො පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවට්ටො, ආසිත්තොදකානි වටුමානි බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච.. ඡඩ්ඩෙථ භො පුරාණානි තිණානි කට්ඨානි උදකානි. ලහුභාරෙහි සකටෙහි සීඝසීඝං ගච්ඡථ මායොග්ගානි කිලමෙථාති, අථ ඛො සො සත්‍ථවාහො සත්‍ථිකෙ ආමන්තෙසි. අයං භො පුරිසො එවමාහ පුරතො කන්තාරෙ මහාමෙඝො අභිප්පවට්ටො. ආසිත්තොදකානි වටුමානි. බහුං තිණඤ්ච කට්ඨඤ්ච උදකඤ්ච. ඡඩ්ඩෙථ භො පුරාණානි තිණානි කට්ඨානි උදකානි. ලහු භාරෙහි සකටෙහි සීඝසීඝං ගච්ඡථ. මායොග්ගානි කිලමෙථාති.

---

දෙතුන්දිනක්ගියාවූ මේගැල්සමූහයතෙම මඩතැවරුණාවූ චක්‍රවලින් යුක්තාවූයහපත්වූ රථයකින් ඉදිරි මාර්ගයට එන්නාවූ රක්තවර්ණවූඇස් ඇතිසන්නද්ධකරණලද ධනුකලාපඇති පලඳිනාලද හෙළඋපුල්මාලා ඇතිතෙත්වූ වස්ත්‍ර ඇති තෙත්වූ ඉසකේ ඇති කෘෂ්ණවර්ණ පුරුෂයකු දුටුයේය. දැක පින්වත, කිනම් ජනපදයකින් එන්නෙහිදැයි ඇසිය. අසවල් ජනපදයෙනැයි කියේය. කොතැනට යන්නෙහිදැයි ඇසීය, මේ නම් ජනපදයටයයි කීයේය. පින්වත, කිමෙක්ද, ඉදිරි කාන්තාරයෙහි මහාමේඝයතෙම පවත්නේය. මාර්ගයෝ ජලයෙන් පිරුණාහුය, බොහෝවූ තණද, දරද, දියද, ඇත්තේය, පින්වත. පරණවූ තණද, දරද, දියද, බැහැර දමව්. සැහැල්ලුවූ බරඇති ගැල්වලින් යුක්තාව වහවහා යව්. ගවයන් ක්ලාන්ත නොකරව්යයි කියේය. ඉක්බිත්තෙන් ඒ ශාර්ථවාහකතෙම ගැල්සමූහයෙහි නියුක්තයන්ට ආමන්ත්‍රණය කෙළේය. පින්වත්නි, මේ පුරුෂතෙම මෙසේ කියයි. ඉදිරි කාන්තාරයෙහි මහාමේඝයතෙම පවත්නේය, ජලයෙන් පිරුණු මාර්ගයෝ ඇත්තාහුය. බොහෝවූ තණද, දරද, දියද, ඇත්තේය. පින්වත, පරණවූ තණද, දරද, දියද, බැහැර දමව්. සැහැල්ලු බරඇති ගැල්වලින් යුක්තව වහ වහා යව්. ගවයන් ක්ලාන්ත නොකරව්යයි කියාය,

අයං ඛො භො පුරිසො නෙව අම්හාකං මිත්තො න ඤාතිසාලොහිතො කථං මයං ඉමස්ස සද්ධාය ගමිස්සාම, න ඛො ඡඩ්ඩෙතබ්බානි පුරාණානි තිණානි කට්ඨානි උදකානි. යථාභතෙන භණ්ඩෙන සත්ථං පායාපෙථ. න වො පුරාණං ඡඩ්ඩෙස්සාමාති. එවං භොතිඛො තෙ සාකටිකා තස්ස සත්ථවාහස්ස පටිස්සුත්වා යථාභතෙන භණ්ඩෙන සත්ථං පායාපෙසුං. තෙ පඨමෙපි සත්ථවාසෙ න අද්දසංසු තිණං වා කට්ඨං වා උදකං වා. දුතියෙපි සත්ථවාසෙ...පෙ...තතියෙපි සත්ථවාසෙ...පෙ...චතුත්ථෙපි සත්ථවාසෙ...පෙ...පඤ්චමෙපි සත්ථවාසෙ...පෙ...ඡට්ඨෙපි සත්ථවාසෙ...පෙ...සත්තමෙපි සත්ථවාසෙ න අද්දසංසු තිණං වා කට්ඨං වා උදකං වා. තඤ්ච සත්ථං අද්දසංසු අනයව්‍යසනං ආපන්නං. යෙ ච තස්මිං සත්ථෙ අහෙසුං මනුස්සා වා පසු වා තෙසඤ්ච අට්ඨිකානෙව අද්දසංසු තෙන යක්ඛෙන අමනුස්සෙන භක්ඛිතානං. අථ ඛො සො සත්ථවාහො සාකටිකෙ ආමන්තෙසි. අයං ඛො භො සො සත්ථො අනයව්‍යසනං ආපන්නො යථා තං තෙන බාලෙන සත්ථවාහෙන පරිනායකෙන.

---

පින්වත්නි, මේ පුරුෂයා වනාහි අපගේ මිත්‍රයෙක් නොවෙයි. සහලේ නෑයෙක්ද නොවෙයි. අපි කෙසේනම් මොහුගේ වචනයට විශ්වාසයෙන් යන්නමුද. පරණවූ තෘණයෝද කාෂ්ඨයෝද ජලයද බැහැර නොදැමියයුත්තාහුය. තෘණාදිය හා භාණ්ඩ ද්‍රව්‍යය තැන්පත්කරණලද පරිද්දෙන්ම ගැල්සමූහය පද්දවව්. අපගේ පුරාණවූ තෘණාදිය බැහැර නොදමව්යයි කියේය. පින්වත, එසේයයි ඒ ගැල් සමූහයෙහි නියුක්තයෝ ඒ ශාස්තෘවාහකයාට ප්‍රතිවචනදී තැන්පත්කරතබනලද භාණ්ඩ ඇති පරිද්දෙන් ගැල්සමූහය පැද්දෙවුවාහුය. ඔහු පළමුවන සමූහයාගේ වාසස්ථානයෙහිද තණහෝ, දරහෝ, දියහෝ, නුදුටුවාහුය. දෙවන සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—තුන්වන සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—සතරවන සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—පස්වන සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—සවන සමූහයාගේ වාසස්ථානයෙහිද—පෙ—සත්වන සමූහයාගේ වාසස්ථානයෙහිද තණහෝ, දරහෝ දියහෝ, නුදුටුවාහුය. මහාවිනාසයට පැමිණියාවූ ඒ සමූහයාම දුටුවාහුය. ඒ ගැල්සමූහයෙහි යම් මනුෂ්‍යයෝ හෝ සිව්පාවෝ වූවාහුද අමනුෂ්‍යවූ ඒ යක්ෂයාවිසින් භක්ෂණයකරණලද ඔවුන්ගේද ඇට පමණක්ම දුටුවාහුය. ඉක්බිත්තෙන් ඒ ශාස්තෘවාහක තෙම ගැල්සමූහයෙහි නියුක්තයන්ට ආමන්ත්‍රණය කෙළේය. පින්වත්නි, මේ සමූහයතෙම ඒ අඥානවූ ශාස්තෘවාහක පරිනායකයා කරණකොටගෙණ යම්සේ මහාවිනාසයට පැමිණියේද.

තෙනහි භො යානම්හාකං සකටෙ අප්පසාරානි පණියානි, තානි ඡඩ්ඩෙත්වා යානි ඉමස්මිං සකටෙ මහාසාරානි පණියානි තානි ආදියථානි. එවං භොති ඛො තෙ සත්ථිකා, තස්ස සත්ථවාහස්ස පටිස්සුත්වා යානි සකස්මිං සකටෙ අප්පසාරානි පණියානි තානි ඡඩ්ඩෙත්වා යානි තස්මිං සකටෙ මහාසාරානි පණියානි තානි ආදියිත්වා සොත්ථිනා තං කන්තාරං නිත්ථරිංසු, යථා තං පණ්ඩිතෙන සත්ථවාහෙන පරිනායකෙන. එවමෙව ඛො ත්වං රාජඤ්ඤ බාලො අව්‍යත්තො අනයව්‍යසනං ආපජ්ජිස්සසි අයොනිසො පරලොකං ගවෙසන්තො. සෙය්‍යථාපි සො පුරිසො සත්ථවාහො යෙපි තව සොතබ්බං සද්දහාතබ්බං මඤ්ඤිස්සන්ති. තෙපි අනයව්‍යසනං ආපජ්ජිස්සන්ති. සෙය්‍යථාපි තෙ සත්ථිකා, පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං. පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං. මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

24. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො නෙවාහං සක්කොමි ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිතුං,

---

පින්වත්නි, එසේහෙනම් අපගේ සමූහයෙහි අඩුවූ අගය ඇති යම් භාණ්ඩයෝ වෙද්ද ඒ භාණ්ඩයන් බැහැර දමා මේ ගැල්සමූහයෙහි වැඩිවූ අගයඇති යම් භාණ්ඩයෝ වෙද්ද. ඒ භාණ්ඩයන් ගණිව්යයි කීයේය. පින්වත, එසේය කියා ඒ ගැල්සමූහයෙහි නියුක්තයෝ ඒ ශාස්තෘවාහකයාට ප්‍රතිවචනදී ස්වකීය ගැල්සමූහයෙහි අඩුවූ අගය ඇති යම් භාණ්ඩයෝ වෙද්ද, ඒ භාණ්ඩයන් බැහැරදමා ඒ ගැල්සමූහයෙහි වැඩිවූ අගය ඇති යම් භාණ්ඩයෝ වෙද්ද ඒ භාණ්ඩයන්ගෙණ පණ්ඩිතවූ ඒ ශාස්තෘවාහකපරිනායකයා කරණකොටගෙණ යම්සේ සැපසේ ඒ කාන්තාරය එතරකළාහුද, රාජන්‍යය, එපරිද්දෙන්ම අඥානවූ අව්‍යක්තවූ අනුපායයෙන් පරලොව සොයන්නාවූ තෝ මහාවිනාසයට පැමිණෙන්නෙහිය. යම්සේ ඒ අඥානවූ ශාස්තෘවාහක පුරුෂතෙම මහාවිනාසයට පැමිණියේද එමෙන් යම් කෙනෙක් තාගේ වචනම ඇසියයුතුයයිද, ඇදහියයුතුයයිද, සිතන්නාහුද, ඔහුද, මහාවිනාසයට පැමිණෙන්නාහුය, ඒ සමූහයෙහි නියුක්ත පුරුෂයෝ යම්සේ විනාසයට පැමිණියාහුද එමෙනි. රාජන්‍යය මේ ලාමකවූ දෘෂ්ටිය හරුව. රාජන්‍යය මේ ලාමකවූ දෘෂ්ටිය හරුව. තට දීර්ඝ කාලයක් මුලුල්ලෙහි අහිත පිණිස දුක්පිණිස නොවේවා,

24. කිසිසේත් භවත් කාශ්‍යපතෙමේ මෙසේ කියයි. එසේදවුවත් මම මේ ලාමකවූ දෘෂ්ටිය දුරුකරන්ට නොහැක්කෙමි.

රාජාපි මං පසෙනදි කොසලො ජානාති තිරෙ රජ්ජතොපි. පායාසි රාජඤ්ඤො එවංවාදී එවං දිට්ඨි, ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. සචාහං භො කස්සප ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිස්සාමි, භවිස්සන්ති මෙ වත්තාරො යාවබාලො පායාසිරාජඤ්ඤො අව්‍යත්තො දුග්ගහිතගාහීති, කොපෙනපි නං හරිස්සාමි මක්ඛෙනපි නං හරිස්සාමි. පළාසෙනපි නං හරිස්සාමීති.

25. තෙනහි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරො සූකරපොසකො පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං අගමාසි, තත්ථද්දස පහූතං සුක්ඛගූථං ඡඩ්ඩිතං. දිස්වාන'ස්ස එතදහොසි.

---

මේකාරණයෙන්ද මෙලොවසිටියාහට පරලොව නැත්තේය චූතව උපදනාසත්වයෝ නැත්තාහුය. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා පායාසි රාජන්‍ය තෙම මෙසේ කියන සුලුවෙයිද මෙසේ දෘෂ්ටිඇත්තෙක්ද වෙයි කියා පසේනදි කොසොල් රජතෙමේද මා දනියි. අන්‍යජනපදවල රජහුද දනිත්. පින්වත් කාශ්‍යපය, මේලාමකවූ දෘෂ්ටිය හරින්නෙම්නම් පායාසි රාජන්‍යතෙම අඥන වෙයි. වරදවාසිතනලද්ද ගන්නා සුලු එකෙකැයි කියා මෙසේ මට කියන්නාහු ඇතිවන්නාහුය. යම්කෙනෙක් මට අව්‍යක්තය යනාදි වශයෙන් මෙසේ කියද්ද ඔවුන් කෙරෙහි උපදනා කොපයෙන්ද ඒ මේ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙම්. මකුගුණයෙන්ද ඒ මේ දෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙම්. යුගග්‍රාහයෙන්ද ඒ මේ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙමියි කීයේය.

25. රාජන්‍යය, එසේවීනම් තට උපමාවක් කරන්නෙමි. මේ ලොකයෙහි සමහර නුවනැති පුරුෂයෝ උපමායෙන්ද කියනලද වචනයාගේ අර්ථය දැනගණිත්. රාජන්‍යය, පෙරපැවති කාරණයක් කියමි, සූකරයන් පොෂ්‍යය කරන්නාවූ එක්තරා පුරුෂයෙක් සියගමින් අන්ගමකට ගියේය. ඒ ග්‍රාමයෙහි දමනලද බොහෝවූ වියළුනාවූ අසුචි දුටුයේය. ඒඅසුචි දැක ඔහට මෙබඳු සිතෙක් වූයේය.

අයං ඛො මෙ බහුකො සුක්ඛගූථො ඡඩ්ඩිතො මමඤ්ච සූකරභත්තො. යන්නූනාහං ඉතො සුක්ඛගූථං හරෙය්‍යන්ති. සො උත්තරාසඞ්ගං පත්ථරිත්වා පහූතං සුක්ඛගූථං ආහරිත්වා භණ්ඩිකං බන්ධිත්වා සීසෙ උබ්බාහෙත්වා අගමාසි. තස්ස අන්තරාමග්ගෙ මහාඅකාලමෙඝො පාවස්සි. සො උග්ඝරන්තං පග්ඝරන්තං යාව අග්ගනඛා ගූථෙන මක්ඛිතො ගූථභාරං ආදාය අගමාසි. තමෙනං මනුස්සා දිස්වා එවමාහංසු, කච්චිනො ත්වං භණෙ උම්මත්තො, කච්චි විචෙතො, කථංහි නාම උග්ඝරන්තං පග්ඝරන්තං යාව අග්ගනඛා ගූථෙන මක්ඛිතො ගූථභාරං හරිස්සසීති. තුම්හෙඛ්වෙත්ථ භණෙ උම්මත්තා තුම්හෙ විචෙතා. තථාහිපන මෙ සූකරභත්තන්ති. එවමෙව ඛො ත්වං රාජඤ්ඤ ගූථහාරිකූපමො මඤ්ඤෙ පටිභාසි. පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං. මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

මේදමනලද වියළුණු අසුචි මට බොහෝවෙයි. මාගේ සූකරයෝ ආහාර නැත්තාහුය. මෙයින් වියළි අසුචි ගෙණයන්නෙම් නම් යෙහෙකැයි කියාය. හෙතෙම උත්තරාසඞ්ගය දිගඇර බොහෝවූ වියළි අසුචි ගෙණ පොදියක්බැඳ හිසෙහි තබාගෙණ ගියේය. එසේ යන්නාවූ ඕහට අතරමග මහත් අකාල මේඝයක් වැස්සේය. හෙතෙම අග්නිය දක්වා අසුචියෙන් තැවරුණේ උඩින් වැගිරෙන්නාවූද යටින් පෙරෙන්නාවූද ගූථභාරය ගෙණ ගියේය. මනුෂ්‍යයෝ ඒ පුරුෂයා දැක මෙසේ කීවාහුය. කිමෙක්ද කොල, තෝ උම්මත්තකයෙක් වූයෙහිද, විකලසිත් ඇත්තෙක්වූයෙහිද, කෙසේනම් උඩින්වැගිරෙන්නාවූද යටින් පෙරෙන්නාවූද අග්‍ර නඛදක්වා ගූථයෙන් තැවරුණේ ගූථභාරය ගෙණයන්නෙහිදැයි කියාය. කොල, මේකාරණයෙහි තෙපි උම්මත්තකයෝය, විකලසිත් ඇත්තෝය. එසේදවූවත් මාගේ ඌරෝබත් නැත්තාහුය. රාජන්‍යය, එපරිද්දෙන්ම තෝ ගූථභාරය ගෙණගියාවූ පුරුෂයා වැනියයි වැටහෙන්නෙහිය. රාජන්‍යය, මේ ලාමකවූ දෘෂ්ටිය හරව. රාජන්‍යය, මේලාමකවූ දෘෂ්ටිය හරව. තට දීර්ඝකාලයක් මුලුල්ලෙහි අහිත පිණිසද දුක්පිණිසද නොවේවයි කීයේය.

26. කිඤ්චාපි භවං කස්සපො එවමාහ, අථ ඛො නෙවාහං සය්හාමි ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිතුං. රාජාපි මං පසෙනදිකොසලො ජානාති තිරො, රාජානොපි, පායාසිරාජඤ්ඤො එවං වාදී එවං දිට්ඨී ඉතිපි නත්ථි පරො ලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. සචාහං භො කස්සප ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිස්සාමි, භවිස්සන්ති මෙ වත්තාරො යාව බාලො පායාසිරාජඤ්ඤො අව්‍යත්තො දුග්ගහිතගාහීති. කොපෙනපි නං හරිස්සාමි. මක්ඛෙනපි නං හරිස්සාමි පළාසෙනපි නං හරිස්සාමීති.

27. තෙනහි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ ද්වෙ අක්ඛධුත්තා අක්ඛෙහි දිබ්බිංසු.

---

26. කිසිසේත් පින්වත් කාශ්‍යපතෙමේ මෙසේ කියයි. එසේවී නමුත් මේලාමක දෘෂ්ටිය හරින්ට නොහැක්කෙමි. පායාසි රාජන්‍යතෙමේ මේකාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තාහුය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේයයි කියා මෙසේ කියන සුළු වෙයි. මෙසේ දෘෂ්ටි ඇත්තේවෙයි කියා පසේනදි කොසොල් රජද මා දනියි- අන්‍යජනපදයෙහි රජහුද දනිත්යයි කියාය. පින්වත් කාශ්‍යපය, ඉදින් මම මේ ලාමකවූ දෘෂ්ටිය හරින්නෙම්නම් පායාසි රාජන්‍යතෙමේ අඥනවෙයි. අව්‍යක්ත වෙයි. වරදවාගන්නා ලද්ද ගන්නා සුළුයයි කියා මට කියන්නෝ ඇතිවන්නාහුය. යම් කෙනෙක් මට අව්‍යක්තය, යනාදිවශයෙන් මෙසේ කියද්ද ඔවුන් කෙරෙහි උපදනා කොපයෙන්ද ඒ මේ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙමි. මකුගුණයෙන්ද ඒ මේ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙමි. යුගග්‍රාහයෙන්ද ඒ මේ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙමියි කීයේය.

27. එසේවීනම් තට උපමාවක් කරන්නෙමි. මේ ලොකයෙහි නුවනැත්තාවූ සමහර මනුෂ්‍යයෝ උපමායෙන්ද කියනලද වචනයාගේ අර්ථය දැනගණිත්. රාජන්‍යය, පෙරවූ කරුණක් කියමි. අක්‍ෂධූර්තකයෝ දෙදෙනෙක් පසඇටවලින් ක්‍රීඩාකළෝය.

එකො අක්ඛධුත්තො ආගතාගතං කලිං ගිලති. අද්දසා ඛො දුතියො අක්ඛධුත්තො තං අක්ඛධුත්තං ආගතාගතං කලිං ගිලන්තං. දිස්වා තං අක්ඛධුත්තං එතදවොච. ත්වං ඛො සම්ම එකන්තිකෙන ජිනාසි. දෙහි මෙ සම්ම අක්ඛෙ, පජහිස්සාමීති. එවං සම්මාති ඛො සො අක්ඛධුත්තො තස්ස අක්ඛධුත්තස්ස අක්ඛෙ පාදාසි. අථ ඛො සො අක්ඛධුත්තො අක්ඛෙ විසෙන පරිභාවෙත්වා තං අක්ඛධුත්තං එතදවොච. එහි ඛො සම්ම අක්ඛෙහි දිබ්බිස්සාමාති. එවං සම්මාති ඛො සො අක්ඛධුත්තො තස්ස අක්ඛධුත්තස්ස පච්චස්සොසි. දුතියම්පි ඛො තෙ අක්ඛධුත්තා අක්ඛෙහි දිබ්බිංසු, දුතියම්පි ඛො සො අක්ඛධුත්තො ආගතාගතං කලිං ගිලති. අද්දසා ඛො දුතියො අක්ඛධුත්තො තං අක්ඛධුත්තං දුතියම්පි ආගතාගතං කලිං ගිලන්තං, දිස්වා තං අක්ඛධුත්තං එතදවොච.

ලිත්තං පරමෙන තෙජසා
ගිලමක්ඛං පුරිසො න බුජ්ඣති,
ගිලරෙ ගිල පාපධුත්තක
පච්ඡා තෙ කටුකං භවිස්සතීති.

---

එක් අක්ෂධූර්තකයෙක් තෙම පැමිණි පැමිණි පරාජය ගුලිය ගිළියි. දෙවන අක්ෂධූර්තකතෙමේ පැමිණි පැමිණි පරාජය ගුලිය ගිළින්නාවූ ඒඅක්ෂධූර්තකයා දුටුයේය. දැක ඒ අක්ෂධූර්තකයාට මේකාරණය කීයේය. යහලුව, තෝ වනාහි ඒකාන්තයෙන් දිනන්නෙහිය. යහලුව, පසඇට දෙව. වලිකම්කරන්නෙමියි කීයාය. යහලුව, එසේයයි කියා ඒ අක්ෂධූර්තක තෙම ඒ දෙවෙනි අක්ෂධූර්තකයාහට පසඇට දුන්නේය. ඉක්බිත්තෙන් ඒ දෙවෙනි අක්ෂධූර්තකතෙම ඒ පසඇට විෂයෙන් සොද ඒ අක්ෂධූර්තකයාහට මේකාරණය කීයේය. යහලුව, එව, පසඇටවලින් ක්‍රීඩාකරන්නෙමුයයි කියාය. යහලුව. එසේයයි කියා ඒ අක්ෂධූර්තකතෙමේ ඒ දෙවෙනි අක්ෂධූර්තකයාහට ප්‍රතිවචන දුන්නේය, දෙවනුවද ඒඅක්ෂධූර්තකයෝ දෙදෙන පසඇටවලින් ක්‍රීඩා කළෝය. දෙවෙනිවරද ඒ අක්ෂධූර්තකතෙම පැමිණි පැමිණි පරාජය ගුලිය ගිළියි. දෙවෙනි අක්ෂධූර්තකතෙම පැමිණි පැමිණි පරාජය ගුලිය ගිළින්නාවූ ඒ අක්ෂධූර්තකයා දුටුයේය. දැක ඒ අක්ෂධූර්තකයාට මේ ගාථාව කීයේය. තියුණුවූ විෂයෙන් ගල්වනලද පසඇට ගිළින්නාවූ පුරුෂතෙම නොදනියි. එම්බල පුරුෂය, ගිළුව පාපවූ ධූර්තකය, ගිළුපිය. පසුව තට දරුණුවූ විපාක වන්නේයයි කියාය.

එවමෙව ඛො ත්වං රාජඤ්ඤ අක්ඛධුත්තොපමො මඤ්ඤෙ පටිභාසි. පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං, පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං. මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

28. කිඤ්චාපි භවං කස්සපො එවමාහ. අථ ඛො නොවහං සය්හාමි සක්කොමි ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිතුං. රාජාපි මං පසෙනදිකොසලො ජානාති. තිරොරාජානොපි පායාසි රාජඤ්ඤො එවංවාදී එවංදිට්ඨි ඉතිපි නත්ථි පරොලොකො නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකොති. සචාහං භො කස්සප ඉදං පාපකං දිට්ඨිගතං පටිනිස්සජ්ජිස්සාමි භවිස්සන්තිමෙ වත්තාරො යාව බාලො පායාසි රාජඤ්ඤො අව්‍යත්තො දුග්ගහිතගාහීති, කොපෙනපි නං හරිස්සාමි මක්ඛෙනපි නං හරිස්සාමි. පලාසෙනපි නං හරිස්සාමීති.

---

රාජන්‍යය, එපරිද්දෙන්ම තෝ අක්ෂධූර්තකයකු වැනියයි වැටහෙන්නෙහිය, රාජන්‍යය, මේ ලාමකවූ දෘෂ්ටිය හරුව, දීර්ඝකාලයක් මුළුල්ලෙහි තට අහිතපිණිසද දුක් පිණිසද මෙබඳු සිතක් නොවෙවයි කීයේය.

28 කිසිසේත් භවත් කාශ්‍යපතෙමේ මෙසේ කියන්නේය. එසේ වූයේ නමුත් මේ ලාමකවූ දෘෂ්ටිය හරින්ට මම නොහැක්කෙම්වෙමි. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය. චුතව උපදනා සත්වයෝ නැත්තාහුය කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා පායාසි රජන්‍ය තෙමේ මෙසේ කියන සුලුවෙයි. මෙසේ දෘෂ්ටි ඇත්තේයයි කියා පසේනදි කොසොල් රජද මා දනියි. අන්‍යජනපදවල රජහුද දනිත්යයි කීයේය. පින්වත් කාශ්‍යපය, ඉදින් මම මේ ලාමකවූ දෘෂ්ටිය හරින්නෙම් නම් පායාසි රජන්‍ය තෙමේ අඥනවෙයි. අව්‍යක්තවෙයි. වරදවා ගන්නාදේද ගන්නා සුලුයයි මට මෙසේ කියන්නෝ ඇතිවන්නාහුය. යම් කෙනෙක් මට අව්‍යක්තය යනාදී වශයෙන් මෙසේ කියද්ද ඔවුන් කෙරෙහි උපදනා කොපයෙන්ද ඒ මේ දෘෂ්ටිය ගෙණහැසිරෙන්නෙමි. මකුගුණයෙන්ද ඒ මේ දෘෂ්ටියගෙණ හැසිරෙන්නෙමි. යුගග්‍රාහයෙන්ද ඒ මේදෘෂ්ටිය ගෙණ හැසිරෙන්නෙමියි. කීයේය.

29. තෙනහි රාජඤ්ඤ උපමන්තෙ කරිස්සාමි. උපමායපි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. භූතපුබ්බං රාජඤ්ඤ අඤ්ඤතරො ජනපදො වුට්ඨාසි. අථ ඛො සහායකො සහායකං ආමන්තෙසි. ආයාම සම්ම යෙන සො ජනපදො තෙනුපසංකමිස්සාම. අප්පෙවනාමෙත්ථ කිඤ්චි ධනං අධිගච්ඡෙය්‍යාමාති. එවං සම්මාති ඛො සහායකො සහායකස්ස පච්චස්සොසි. තෙ යෙන සො ජනපදො යෙනඤ්ඤතරං ගාමපට්ටනං තෙනුපසඞ්කමිංසු. තත්ථද්දසංසු පහූතං සාණං ඡඩ්ඩිතං, දිස්වා සහායකො සහායකං ආමන්තෙසි. ඉදං ඛො සම්ම පහූතං සාණං ඡඩ්ඩිතං. තෙනහි සම්ම ත්වඤ්ච සාණභාරං බන්ධ. අහඤ්ච සාණභාරං බන්ධිස්සාමීති උභො සාණභාරං ආදාය ගමිස්සාමාති. එවං සම්මාති ඛො සහායකො සහායකස්ස පටිස්සුත්වා සාණභාරං බන්ධිත්වා තෙ උභොපි සාණභාරං ආදාය යෙනඤ්ඤතරං ගාමපට්ටනං තෙනුපසංකමිංසු. තත්ථ අද්දසංසු පහූතං සාණසුත්තං ඡඩ්ඩිතං, දිස්වා සහායකො සහායකං ආමන්තෙසි.

---

29. රාජන්‍යය, එසේවීනම් තට උපමාවක් කරන්නෙමි. උපමායෙන්ද මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ කියනලද වචනයාගේ අර්ථය දැනගණිත්. රාජන්‍යය, පෙරවූ කාරණයක් කියමි. එක්තරා ජනපදයෙක් වැඩුනේය. ඉක්බිත්තෙන් යහළුවෙක් යහලුවෙකුට ආමන්ත්‍රණය කෙළේය. යහලුව යම්හ. ඒ ජනපදයතෙම යම් තැනකද එහි එළඹෙන්නම්හ. මෙහි කිසියම් ධනයක් ලබන්නේනම් යෙහෙකැයි කියාය. යහලුව, එසේයයි කියා යහලුතෙම යහලුවාට ප්‍රතිවචන දුන්නේය. ඔහු දෙදෙන ඒ ජනපදය යම් තැනකද එක්තරා ගම් පටුනක් යම් තැනකද එහි එළඹුනාහුය. එහි දමනලද බොහෝවූ සණවැහැරි දුටුවාහුය. යහලුතෙම අනික් යහලුවාට ආමන්ත්‍රණය කෙළේය. යහලුව, මේ බොහෝවූ සණවැහැරි දමනලද්දේය. යහලුව, එහෙයින් තෝද සණවැහැරි බරක් බැඳගනුව. මමද සණවැහැරි බරක් බැඳගන්නෙමියි. දෙදෙනාම සණවැහැරි බරක් ගෙණයන්නම්හයි කියාය. යහලුව, එසේයයි කියා යහලුතෙම යහලුවාට ප්‍රතිවචනදී සණවැහැරි බරක් බැන්දේය. ඔහු දෙදෙනම සණවැහැරි බරගෙණ එක්තරා ගම් පටුනක් යම් තැනකද එහි එළඹියාහුය. එහි දමනලද බොහෝවූ සණ නූල්දුටුවාහුය. දැක යහලුතෙම යහලුවාට ආමන්ත්‍රණය කෙළේය.

යස්ස ඛො සම්ම අත්ථාය ඉච්ඡෙය්‍යාම සාණං ඉදං පහූතං සාණසුත්තං ඡඩ්ඩිතං, තෙනහි සම්ම ත්වඤ්ච සාණභාරං ඡඩ්ඩෙහි අහඤ්ච සාණභාරං ඡඩ්ඩෙස්සාමි, උභො සාණසුත්තභාරං ආදාය ගමිස්සාමාති. අයං ඛො මෙ සම්ම සාණභාරො දූරාභතො ච සුසන්නද්ධො ච, අලං මෙ ත්වං පජානාහීති. අථ ඛො සො සහායකො සාණභාරං ඡඩ්ඩෙත්වා සාණසුත්තභාරං ආදියි. තෙ යෙනඤ්ඤතරං ගාමපට්ටනං තෙනුපසඞ්කමිංසු. තත්ථ අද්දසංසු පහූතා සාණියො ඡඩ්ඩිතා. දිස්වා සහායකො සහායකං ආමන්තෙසි. යස්ස ඛො සම්ම අත්ථාය ඉච්ඡෙය්‍යාම සාණං වා සාණසුත්තං වා ඉමා පහූතා සාණියො ඡඩ්ඩිතා, තෙනහි සම්ම ත්වඤ්ච සාණභාරං ඡඩ්ඩෙහි. අහඤ්ච සාණසුත්තභාරං ඡඩ්ඩෙස්සාමි. උභො සාණිභාරං ආදාය ගමිස්සාමාති, අයං ඛො මෙ සම්ම සාණභාරො දූරාභතො ච සුසන්නද්ධො ච, අලමෙ ත්වං පජානාහීති. අථ ඛො සො සහායකො සාණසුත්තභාරං ඡඩ්ඩෙත්වා සාණිභාරං ආදියි. තෙ යෙනඤ්ඤතරං ගාමපට්ටනං තෙනුපසඞ්කමිංසු,

---

යහලුව; යමක් සඳහා සණවැහැරි කැමතිවන්නමෝද මේ බොහෝවූ සණ නූල් බැහැර දමනලද්දේවෙයි. යහලුව, එහෙයින් තෝද සණ වැහැරි මිටිය බැහැරදමව. මමද සණවැහැරි මිටිය බැහැර දමන්නෙම්. දෙදෙනම සණනූල් මිටිගෙණයන්නමෝයයි කීයේය. දෙවෙනි (මිත්‍රතෙම ) යහලුව, මේ සණවැහැරි මිටිය මාවිසින් දුරසිට ගෙණෙන ලද්දේද මනාකොටබඳනා ලද්දේද වෙයි. මට ප්‍රයෝජන නොවෙයි. තෝ දැනගණුව හෙවත් ඉදින් ගණුකැමැත්තෙහිනම් ගණුවයි කියේය. ඉක්බිත්තෙන් ඒ යහලුතෙම හණවැහැරි මිටිය බැහැරදමා හණ නූල් මිටිය බැඳගත්තේය. ඔහු දෙදෙන එක්තරා ගම් පටුනක් යම් තැනකද එහි එළඹුනාහුය. එහි දමනලද බොහෝවූ හණ පිළිදුටුවාහුය. දැක යහලුතෙම යහලුවාට ආමන්ත්‍රණයකෙළේය. යහලුව, යමක් සඳහාසණවැහැරි හෝ සණනූල් හෝ කැමතිවන්නමෝද මේ බොහෝවූසණ පිළිදමනලද්දාහුය. යහලුව, එහෙයින් තෝද සණවැහැරිමිටිය බැහැර දමව සණනූල් මිටියබැහැර දමන්නෙමි. දෙදෙන සණවස්ත්‍ර හරයගෙණයම්හයි කීයේය. යහලුව, මේ හණ මිටියතෙම මාවිසින් දුරසිටගෙණෙනලද්දේද මනාකොට බඳනා ලද්දේදවෙයි. මට ප්‍රයොජන නොවෙයි. තෝ දැනගනුවයි කීයේය. ;ඉක්බිත්තෙන් ඒ යහලුතෙම සණනූල් මිටිය බැහැරලා සණපිළි මිටියක් බැඳ ගත්තේය. ඔහු දෙදෙන එක්තරා ගම්පටුනක් යම් තැනකද එහි එළඹුනාහුය.

තත්‍ථද්දසංසු පහූතං ඛොමං ඡඩ්ඩිතං, දිස්වා……පෙ……පහූතං ඛොමසුත්තං ඡඩ්ඩිතං දිස්වා……පෙ……පහූතං ඛොමදුස්සං ඡඩ්ඩිතං දිස්වා……පෙ……පහූතං කප්පාසං ඡඩ්ඩිතං දිස්වා, ……පෙ…… පහූතං කප්පාසිකසුත්තං ඡඩ්ඩිතං දිස්වා……පෙ…… පහූතං කප්පාසිකදුස්සං ඡඩ්ඩිතං දිස්වා ……පෙ…… පහූතං අයං ඡඩ්ඩිතං දිස්වා……පෙ……පහූතං ලොහං ඡඩ්ඩිතං දිස්වා ……පෙ……පහූතං තිපුං ඡඩ්ඩිතං දිස්වා……පෙ……පහූතං සීසං ඡඩ්ඩිතං දිස්වා……පෙ……පහූතං සජ්ඣුං ඡඩ්ඩිතං දිස්වා ……පෙ…… පහූතං සුවණ්ණං ඡඩ්ඩිතං දිස්වා සහායකො සහායකං ආමන්තෙසි. යස්ස ඛො සම්ම අත්ථාය ඉච්ඡෙය්‍යාම සාණං වා සාණසුත්තං වා සාණියො වා ඛොමං වා ඛොමසුත්තං වා ඛොමදුස්සං වා කප්පාසං වා කප්පාසික සුත්තං වා කප්පාසිකදුස්සං වා අයං වා ලොහං වා තිපුං වා සීසං වා සජ්ඣුං වා ඉදං පහූතං සුවණ්ණං ඡඩ්ඩිතං. තෙනහි සම්ම ත්වඤ්ච සාණභාරං ඡඩ්ඩෙහි. අහඤ්ච සජ්ඣුභාරං ඡඩ්ඩෙස්සාමි. උභො සුවණ්ණභාරං ආදාය ගමිස්සාමාති. අයං ඛො මෙ සම්ම සාණභාරො දූරාභතො ච සුසන්නද්ධො ච, අලං මෙ ත්වං පජානාහීති. අථ ඛො සො සහායකො සජ්ඣුභාරං ඡඩ්ඩෙත්වා සුවණ්ණභාරං ආදියි.

---

එහි දමනලද බොහෝවූ කොමුවැහැරි දුටුවාහුය.—පෙ—දමනලද බොහෝවූ කොමුවැහැරි නූල්දූක —පෙ—දමනලද බොහෝවූ කොමුපිළිදූක —පෙ— දමනලද බොහෝවූ කපුදූක දමනලද බොහෝවූ කපුනූල්දූක දමනලද බොහෝවූ කපුපිළිදූක දමනලද බොහෝවූ කාලලොහදූක දමනලද බොහෝවූ තාම්‍රලොහ දූක දමනලද බොහෝවූ කළුතුඹ (කළුඊයම්) දූක දමනලද බොහෝවූ සුදු ඊයම් දූක දමනලද බොහෝවූ රිදීදූක දමනලද බොහෝවූ රන්මසු (සුවර්ණමාසක) දූක යහළුතෙම යහළුවාට ආමන්ත්‍රණය කෙළේය. යහළුව, යමක්සඳහා සණවැහැරිහෝ සණනූල් හෝ සණවස්ත්‍ර හෝ කොමු හෝ කොමුනූල් හෝ කොමුපිළි හෝ කපුහෝ කපුනූල් හෝ කපුපිළි හෝ කාලලොහ හෝ තාම්‍රලොහ හෝ කළුතුඹ (කළුඊයම්) හෝ සුදු ඊයම් හෝ රිදී හෝ කැමති වන්නම්ද මේ දමනලද බොහෝවූ රන්මසු (සුවර්ණමාසක) ඇත්තේවෙයි. යහළුව එබැවින් තෝද සණම්පිය බැහැරදමව මමද රිදීබර බැහැර දමන්නෙමි. දෙදෙන රන්මසුබර (සුවර්ණමාසකභාරය] ගෙණයන්නම්හයි කීයේය. යහළුව මෙ හණම්පිය තෙම මාවිසින් දුරසිට ගෙණෙන ලද්දේද මනාකොට, බඳනාලද්දේදවෙයි. මට ප්‍රයෙජන නොවෙයි. තෝදනුව, ඉදින්ගණු කැමැත්තෙහිනම් ගණුවයි කීයේය. ඉක්බිත්තෙන් යහළුතෙම රිදී බර බැහැරලා රන්මසු බර බැඳගත්තේය.

තෙ යෙන සකො ගාමො තෙනුපසංකමිංසු. තත්‍ථ යො සො සහායකො සාණභාරං ආදාය අගමාසි තස්ස නෙව මාතා පිතරො අභිනන්‍දිංසු, නපුත්තදාරා අභිනන්‍දිංසු, න මිත්තාමච්චා අභිනන්‍දිංසු. නච තතො නිදානං සුඛං සොමනස්සං අධිගච්ඡි. යො පන සො සහායකො සුවණ්ණභාරං ආදාය අගමාසි, තස්ස මාතා පිතරොපි අභිනන්‍දිංසු, පුත්තදාරාපි අභිනන්‍දිංසු මිත්තාමච්චාපි අභිනන්‍දිංසු තතො නිදානඤ්ච සුඛං සොමනස්සං අධිගච්ඡි. එවමෙව ඛො ත්වං රාජඤ්ඤ සාණභාරකූපමො මඤ්ඤෙ පටිභාසි. පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං, පටිනිස්සජ්ජෙතං රාජඤ්ඤ පාපකං දිට්ඨිගතං, මාතෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායාති.

30. පුරිමෙනෙවාහං ඔපම්මෙන භොතො කස්සපස්ස අත්තමනො අභිරද්ධො, අපිචාහං ඉමානි විචිත්‍රානි පඤ්හපටිභානානි සොතුකාමො එවාහං භවන්තං කස්සපං පච්චනීකං කාතබ්බං අමඤ්ඤිස්සං. අභික්කන්තං භො කස්සප. අභික්කන්තං භො කස්සප.

---

ඔහු දෙදෙන සවකීය ග්‍රාමයතෙම යම් තැනකද එහි එළඹුනාහුය. එහි යම් ඒ යහලුවෙක්තෙම හණමිටිය ගෙණගියේද, ඔහුගේ මව්පියෝ නොමසතුටුවූවාහුය. පුත්‍රදාරවෝද සතුටුනුවූවාහුය. මිත්‍රාමාත්‍යයෝද සතුටුනුවූවාහුය. ඒ කරණකොටගෙණ හෙතෙම සැපතටද සොම්නසටද නොපැමිණියේය. යම් ඒ යහලුවෙක් වනාහි රන්මසුබර රැගෙණ ගියේද' ඔහුගේ මව්පියෝද සතුටුවූවාහුය. පුත්‍රදාරවෝද සතුටුවූවාහුය මිත්‍රාමාත්‍යයෝද සතුටුවූවාහුය. ඒ කරණකොටගෙණ සැපතටද සොනම්සටද පැමිණියේය. රාජන්‍යය, එපරිද්දෙන්ම තෝ හණමිටිය ගෙණගිය පුරුෂයාවැනියයි වැටහෙන්නෙහිය. රාජන්‍යය, මේ ලාමකවූ දෘෂ්ටිය හරුව, තට දීර්ඝකාලයක් මුළුල්ලෙහි අහිත පිණිස දුක්පිණිස නොවේවයි කීයේය.

30. මම පළමු උපමාවෙන්ම පින්වත් කාශ්‍යපයාහට සතුටුසිත් ඇත්තේ ඒ විශෙෂයෙන් ප්‍රසන්නවීමි. එසේද වුවත් මම මේ විසිතුරු ප්‍රශ්නප්‍රතිභානයන් අසනු කැමැත්තෙම්වීමි. මෙසේ මම පින්වත් කාශ්‍යපයන්ට විරුඬලෙස කරුණු සිතුයෙමි. පින්වත් කාශ්‍යපය, ධර්‍මදෙශනාව ඉතා මැනව, පින්වත් කාශ්‍යපය ධර්‍මදෙශනාව ඉතා මැනව.

සෙය්‍යථාපි භො කස්සප නික්කුජ්ජිතංවා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නංවා විවරෙය්‍ය, මූළ්හස්සවා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙවා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා කස්සපෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භො කස්සප තං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං කස්සපො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. ඉච්ඡාමහං භො කස්සප මහායඤ්ඤං යජිතුං, අනුසාසතු මං භව කස්සපො යං මමං අස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

31. යථාරූපෙ භො රාජඤ්ඤ යඤ්ඤෙ ගාවො වා හඤ්ඤන්ති අජෙලකා වා හඤ්ඤන්ති කුක්කුටසූකරාවා හඤ්ඤන්ති. විවිධාවා පාණා සංඝාතං ආපජ්ජන්ති. පටිග්ගාහකාච හොන්ති, මිච්ඡාදිට්ඨි මිච්ඡාසංකප්පා මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්තා, මිච්ඡාආජීවා, මිච්ඡාවායාමා, මිච්ඡාසතී, මිච්ඡාසමාධී,

---

පින්වත් කාශ්‍යපය, ධර්මදෙශනාව ඉතා මැනව, පින්වත් කාශ්‍යපය, යටිකුරු කරණලද්දක් උඩුකුරුකරන්නේ හෝ යම් සේද වැසුනාවූ දෙයක් විවෘත කරන්නේ හෝ යම්සේද මංමුළාවූවක්හට මාර්ගය කියන්නේ හෝ යම්සේද ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම පින්වත් කාශ්‍යපයන් විසින් නොයෙක් පරිද්දෙන් ධර්මය ප්‍රකාශ කරණලද්දේය. පින්වත් කාශ්‍යපය, ඒ මම ඒ භවත් ගෞතමයානන් වහන්සේද නවලොකොත්තර ධර්මයද ආර්ය භික්ෂුසඞ්ඝයාද සරණකොටයෙමි. භවත් කාශ්‍යපතෙමේ අද පටන් දිවිහිමියෙන් සරණ ගියාවූ උපාසකයෙකැයි මා දරණසේක්වා. පින්වත් කාශ්‍යපය, මම මහාදානයක්දීමට කැමැත්තෙමි. පින්වත් කාශ්‍යපතෙමේ යමක් මට දීර්ඝකාලයක් මුළුල්ලෙහි හිත පිණිස සැපපිණිස වන්නේද එසේ මට අනුශාසනා කෙරේවායි කීයේය.

31. රාජන්‍යය, යම්බඳුවූ යාගයෙක්හි ගවයෝ හෝ නසනු ලැබේද්ද, කුක්කුටසූකරයෝ හෝ නසනු ලැබෙද්ද, විවිධවූ ප්‍රාණීහු විනාශයට පැමිණෙද්ද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ මිථ්‍යාසංකල්පනා ඇත්තාවූ මිථ්‍යාවචන ඇත්තාවූ මිථ්‍යාකර්මාන්ත ඇත්තාවූ මිථ්‍යාජීවිකා ඇත්තාවූ මිථ්‍යාව්‍යායාම ඇත්තවූ මිථ්‍යාස්මෘති ඇත්තාවූ මිථ්‍යාසමාධි ඇත්තාවූ ප්‍රතිග්‍රාහකයෝ ත්වදේද,

එවරූපො ඛො රාජඤ්ඤ යඤ්ඤො නාම න මහප්ඵලො හොති න මහානිසංසො න මහාජුතිකො න මහාවිප්ඵාරො. සෙය්‍යථාපි රාජඤ්ඤ කස්සකො බිජනඞ්ගලමාදාය වනං පවිසෙය්‍ය, සො තත්ථ දුක්ඛෙත්තෙ දුබ්භූමෙ අවිහතඛාණුකණ්ටකෙ බීජානි පතිට්ඨපෙය්‍ය ඛණ්ඩානි පූතීනි වාතාතපහතානි අසාරදානි අසුඛසයිතානි, දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අපිනු තානි බිජානි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුං, කස්සකො වා විපුලඵලං අධිගච්ඡෙය්‍යාති. නො හිදං භො කස්සප. එවමෙව ඛො රාජඤ්ඤ යථාරූපෙ යඤ්ඤෙ ගාවො වා හඤ්ඤන්ති අජෙළකා වා හඤ්ඤන්ති කුක්කුටසූකරා වා හඤ්ඤන්ති විවිධා වා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති. පටිග්ගාහකා ච හොන්ති. මිච්ඡාදිට්ඨී මිච්ඡාසංකප්පා මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තා මිච්ඡාආජීවා මිච්ඡාවායාමා මිච්ඡාසතී මිච්ඡාසමාධී,

---

රාජන්‍යය, මෙබඳුවූ යාගයතෙම මහත්ඵල ඇත්තේ නොවෙයි, මහානිසංස ඇත්තේනොවෙයි. මහත් බැබලීම් ඇත්තේ නොවෙයි. මහත් පැතිරීම්ඇත්තේ නොවෙයි .රාජන්‍යය ගොවිතෙම යම්සේ බිජුවට හා නඟුලත්ගෙණ වනයට ප්‍රවිෂ්ට වන්නේද, හෙතෙම එහි නොනසන ලද කණුකටුඇති විෂම්භූමිප්‍රදෙශඇති නිසරුකෙතෙක්හි කැඩුනු නිස්සාරවූ අවුසුලගින්නසන ලද්දාවූ තණ්ඩුලසාරදනයෙන් තොරවූ තවාතෙන් නොදමන ලද්දාවූ බිජයන් වපුරන්නේ නම් මෙඝයද කලින්කල වර්‍ෂාධාරාව ප්‍රවේශ නොකරන්නේ නම් කිමෙක්ද ඒ බීජයෝ වෘඩියට විරූළ්හභාවයට විපුලභාවයට පැමිණෙන්නාහුද කර්‍ෂකතෙමේ හෝ විපුලඵලයට පැමිණෙන්නේදැයි ඇසුයේය. පින්වත් කාශ්‍යපය මේ කාරණය එසේ නොවේයයි කීයේය; රාජන්‍යය, එපරිද්දෙන්ම යම්බඳුවූ යාගයෙක්හි ගවයෝ හෙ-නසනු ලැබෙද්ද අජෙළකයෝ (එළුවන් හා තිරෙළුවෝ) හෝ නසනු ලැබෙද්ද කුක්කුට සූකරයෝ (කුකුලන් හා ඌරෝ) හෝ නසනු ලැබෙද්ද විවිධවූ ප්‍රාණීහු විනාශයට පැමිණෙද්ද මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ මිථ්‍යාසංකල්පනා ඇත්තාවූ මිථ්‍යාවචන ඇත්තාවූ මිථ්‍යාකර්මාන්ත ඇත්තාවූ මිථ්‍යාආජීවය ඇත්තාවූ මිථ්‍යාව්‍යායාම් ඇත්තාවූ මිථ්‍යාස්මෘති ඇත්තාවූ මිථ්‍යාසමාධි ඇත්තාවූ ප්‍රතිග්‍රාහකයෝත් වෙද්ද.

එවරූපො ඛො රාජඤ්ඤ යඤ්ඤො න මහප්ඵලො හොති න මහානිසංසො න මහාජුතිකො න මහාවිප්ඵාරෙ. එවරූපෙච ඛො රාජඤ්ඤ යඤ්ඤෙ නෙව ගාවො හඤ්ඤන්ති. න අජෙලකා හඤ්ඤන්ති. න කුක්කුටසූකරා හඤ්ඤන්ති. න විවිධා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති. පටිග්ගාහකාච හොන්ති. සම්මාදිට්ඨී සම්මාසංකප්පා සම්මාවාචා සම්මාකම්මන්තා සම්මාආජීවා සම්මාවායාමා සම්මාසතී, සම්මාසමාධී. එවරූපො ඛො රාජඤ්ඤ යඤ්ඤො මහප්ඵලො හොති, මහානිසංසො මහජ්ජුතිකො මහාවිප්ඵාරෙ. සෙය්‍යථාපි රාජඤ්ඤ කස්සකො බීජනඞ්ගලං ආදාය වනං පවිසෙය්‍ය. සො තත්ථ සුඛෙත්තෙ සුභූමෙ සුවිහතඛාණුකණ්ටකෙ බීජානි පතිට්ඨපෙය්‍ය අඛණ්ඩානි අපූතීනි අවාතාතපහතානි. සාරාදානි සුඛසයිතානි, දෙවොච කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය. අපිනු තානි බීජානි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුං. කස්සකො වා විපුලඵලං අධිගච්ඡෙය්‍යාති. එවං භො කස්සප.

---

රාජන්‍යය' මෙබඳුවූ දානයතෙම විපාකඵලයෙන් මහත් ඵල ඇත්තේ නොවෙයි. ගුණානිසංසයෙන් මහානිසංස ඇත්තේ නොවෙයි. ආනුභාවයෙන් මහත් බැබලීම් ඇත්තේ නොවෙයි, රාජන්‍යය, යම් බඳුවූදානයෙක්හි ගවයෝ නසනු නොලැබෙද්ද එළුවන් හා තිරෙළුවෝ නසනු නොලැබෙද්ද කුකුළන් හා ඌරෝ නසනු නොලැබෙද්ද විවිධවූ ප්‍රාණීහු විනාශයට නොපැමිණෙද්ද සම්‍යක්දෘෂ්ටි ඇත්තාවූ සම්‍යක්සංකල්පනා ඇත්තාවූ සම්‍යක්වචන ඇත්තාවූ සම්‍යක්කර්මාන්ත ඇත්තාවූ සම්‍යක් ආජීවය ඇත්තාවූ සම්‍යක් ව්‍යායාම ඇත්තාවූ සම්‍යක් ස්මෘති ඇත්තාවූ සම්‍යක් සමාධි යෙන්යුක්තවූ ප්‍රතිග්‍රාහයෝත් වෙද්ද' රාජන්‍යය මෙබඳුවූ දානයතෙම මහත් ඵලඇත්තේවෙයි. මහත්ආනිසංස ඇත්තේවෙයි. මහත්බැබලීම් ඇත්තේවෙයි, මහත්පැතිරීම් ඇත්තේවෙයි. රාජන්‍යය යම්සේ කෘෂිකතෙම බිජුවට හා නඟුල ගෙණ වනයට ප්‍රවිෂ්ට වන්නේද හෙතෙම එහි නසනලද කණුකටුඇති සමවූ භූමිප්‍රදෙශයෙක්හි සරුකෙතෙහි නොකැඩුනාවූ කුණුනුවූ අවුසුලඟින් නොනසනලද්දාවූ තණ්ඩුලසාර දානයෙන් යුක්තාවූ මනාකොට තවානෙහි දමනලද්දාවූ බීජයන් වපුරන්නේ නම් මෙඝයද කලින් කල මනාකොට වෘෂ්ටිධාරාව ප්‍රවෙශකරන්නේ නම් කිමෙක්ද ඒ බිජයෝ වැඩීමටද විරූළ්හ භාවයට විපුලභාවයටද පැමිණෙන්නාහු නම් කෘෂිකතෙමේ හෝ විපුලඵලයට පැමිණෙන්නේදැයි ඇසූයේය. පින්වත් කාශ්‍යපය එසේයයි කීයේය.

එවමෙව ඛො රාජඤ්ඤ යථාරූපෙ යඤ්ඤෙ නෙව ගාවො හඤ්ඤන්ති, න අජෙලකා හඤ්ඤන්ති, න කුක්කුටසූකරා හඤ්ඤන්ති. න විවිධා පාණා සඞ්ඝාතං ආපජ්ජන්ති, පටිග්ගාහකාච හොන්ති. සම්මාදිට්ඨී සම්මාසංකප්පා සම්මාවාචා, සම්මාකම්මන්තා, සම්මාආජීවා සම්මාවායාමා, සම්මාසතී, සම්මාසමාධී, එවරූපො ඛො රාජඤ්ඤ යඤ්ඤො මහප්ඵලො හොති, මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරොති.

32. අථ ඛො පායාසි රාජඤ්ඤො දානං පට්ඨපෙසි සමණබ්‍රාහ්මණ කපණද්ධිකවණිබ්බකයාචකානං. තස්මිං ඛොපන දානෙ එවරූපං භොජනං දීයති, කණාජකං බිලඞ්ගදුතියං ථෙරකානිච වත්ථානි ගුළවාලකානි. තස්මිං ඛො පන දානෙ උත්තරො නාම මාණවො ව්‍යාවටො අහොසි. සො දානං දත්වා එවමනුද්දිසති. ඉමිනාහං දානෙන පායාසි රාජඤ්ඤමෙව ඉමස්මිං ලොකෙ සමාගච්ඡිං මාපරස්මින්ති.

---

රජන්‍යය, එපරිද්දෙන්ම යම් බඳුවූ දානයෙක්හි ගවයෝ නසනු නොලැබෙද්ද කුකුළන් හා ඌරෝ නසනු නොලැබෙද්ද විවිධවූ ප්‍රාණීහු විනාශයට නොපැමිණෙද්ද සම්‍යක්දෘෂ්ටි ඇත්තාවූ සම්‍යක්සංකල්පනා ඇත්තාවූ සම්‍යග් වචන ඇත්තාවූ සම්‍යක් කර්මාන්ත ඇත්තාවූ සම්‍යක්ජීවිකාව ඇත්තාවූ සම්‍යක්ව්‍යායාම ඇත්තාවූ සම්‍යක්ස්මෘතියෙන් යුක්තවූ සම්‍යක්සමාධියෙන් යුක්ත වූ ප්‍රතිග්‍රාහකයෝත් වෙද්ද. රජන්‍යය, මෙබඳුවූ දානය තෙම මහත් ඵල ඇත්තේ වෙයි. මහානිසංස ඇත්තේ වෙයි. මහත් බැබලීම් ඇත්තේ වෙයි මහත්පැතිරීම් ඇත්තේයයි කීයේය.

32. ඉක්බිත්තෙන් පායාසි රජන්‍යතෙමේ ශ්‍රමණබ්‍රාහ්මණ දුගී මගී–වණිබ්බකයාචක යන මොවුන්ට දානය පිහිටෙව්වේය. ඒදානයෙහි වනාහි කාඩිදෙවැනිකොට ඇති නිවුඩුසාලේ බතින් යුක්ත වූ මෙබඳු භොජනයක් දෙනුලැබේ. ගොඩවල්වශයෙන් සිටියාවූ මහත් දවලු ඇති ස්ථූලවූ වස්ත්‍රද දෙනුලැබෙත්. ඒ දානයෙහි වනාහි උත්තරනම් මාණවකයෙක් ව්‍යාවෘතවූයේවී. හෙතෙම දන් දී මෙසේ නැවත නැවත කියයි. මේදානයෙන් පායාසිරජන්‍යයා හා සමග මේලොකයෙහි එක්වූයෙමි. පරලොව ඔහු කරා නොපැමිණෙම්වායයි කියාය.

අස්සොසි ඛො පායාසි රාජඤ්ඤො උත්තරො කිර මාණවො දානං දත්වා එවමනුද්දිසතීති. ඉමිනාහං දානෙන පායාසි රාජඤ්ඤමෙව ඉමස්මිං ලොකෙ සමාගච්ඡිං මාපරස්මින්ති. අථ ඛො පායාසි රාජඤ්ඤො උත්තරං මාණවං ආමන්තාපෙත්වා එතදවොච. සච්චං කිර ත්වං තාත උත්තර දානං දත්වා එවමනුද්දිසසි. ඉමිනාහං දානෙන පායාසි රාජඤ්ඤමෙව ඉමස්මිං ලොකෙ සමාගච්ඡිං මාපරස්මින්ති. එවං භොති. කිස්ස පන භො ත්වං තාත උත්තර දානං දත්වා එවමනුද්දිසසි. ඉමිනාහං දානෙන පායාසි රාජඤ්ඤමෙව. ඉමස්මිං ලොකෙ සමාගච්ඡිං මාපරස්මින්ති. නනු මයං තාත උත්තර පුඤ්ඤත්ථිකා දානස්සෙව ඵලං පටිකංඛිනොති. භො තො ඛො පන දානෙ එවරූපං භොජනං දීයති. කණාජකං බිලඞ්ගදුතියං. යම්භව පාදාපි න ඉච්ඡෙය්‍ය ඡුපිතුං කුතො භුඤ්ජිතුං, ථෙරකානිච වත්ථානි ගුළවාලකානි. යන් භවං පාදාපි න ඉච්ඡෙය්‍ය සම්ඵුසිතුං කුතො පරිදහිතුං.

---

මේ දානයෙන් පායාසි රාජන්‍යයා හා එක්වූ යෙමි. මේ ලොකයෙහිදී පැමිණියෙමි. පරලොව නොපැමිණෙන්නෙමියි උත්තර මාණවකතෙම මෙසේ නැවතනැවත කියායයි පායාසිරාජන්‍යතෙමේ ඇසූයේය. ඉක්බිත්තෙන් පායාසි රාජන්‍යතෙම උත්තර නම් මාණවකයා ආමන්ත්‍රණයකරවා මේ කාරණය කීයේය. පුත, උත්තරය තෝ දන්දී මේදානයෙන් මේ ලොකයෙහි පායාසි රාජන්‍යයා සමග එක්වූයෙමි. පැමිණියෙමි. පරලොව පායාසි රාජන්‍යයා හා නොපැමිණෙම්වායි මෙසේ නැවත නැවත කියන්නෙහි සැබෑදැයි ඇසූයේය. පින්වත එසේයයි කීයේය. පුත උත්තරය තෝ දන්දී මේ දානයෙන් මේ ලොකයෙහි පායාසි රාජන්‍යයා හා සමග එක්වූයෙමි. පරලොව නොපැමිණෙම්වායයි කියා මෙසේ කුමට නැවත නැවත කියන්නෙහිද. පුත, උත්තරය, අපි පින්කැමැත්තමෝ දානයාගේ ඵලය කැමැතිවන්නමෝ නොවෙමුදැයි ඇසීය. පින්වතුන්වහන්සේගේ දානයෙහි කාඩිදෙවෙනිකොට ඇති නිවුඩුසාලේබත්යයි කියනලද මෙබඳුවූ භොජනයක් දෙනුලැබේ. පින්වත්තෙමේ යමක් පාදයෙන් ස්පර්ශකරන්නටත් කැමැති නොවන්නේනම් කෙසේ අනුභවකරන්නට කැමැති වන්නේද, ගොඩවල් වශයෙන් පිහිටියාවූ මහත් දවලු ඇති ස්ථූලවස්ත්‍රද දෙනුලැබෙත් යම් වස්ත්‍රයන් පින්වත්තෙමේ පාදයෙන්ද මනාව ස්පර්ශකරන්නට කැමැති නොවන්නේනම් කෙසේ පරිදහනයකරන්නට කැමැතිවන්නේද.

භවං ඛො පනම්භාකං පියො මනාපො. කථං මයං පියං මනාපං අමනාපෙන සංයොජෙමාති. තෙන හි භො තාත උත්තර යාදිසාහං භොජනං භුඤ්ජාමි. තාදිසං භොජනං පට්ඨපෙහි. යාදිසානි චාහං වත්ථානි පරිදහාමි තාදිසානි ච වත්ථානි පට්ඨපෙහීති. එවං භොති ඛො උත්තරො මාණවො පායාසිරාජඤ්ඤස්ස පටිස්සුත්වා යාදිසං භොජනං පායාසිරාජඤ්ඤො භුඤ්ජති තාදිසං භොජනං පට්ඨපෙසි. යාදිසානි ච වත්ථානි පායාසිරාජඤ්ඤො පරිදහති තාදිසානි ච වත්ථානි පට්ඨපෙසි. අථ ඛො පායාසිරාජඤ්ඤො අසක්කච්චං දානං දත්වා අසහත්ථා දානං දත්වා අචිත්තීකතං දානං දත්වා අපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජි සුඤ්ඤං සෙරීසකං විමානං. යො පන තස්ස දානෙ ව්‍යාවටො අහොසි උත්තරො නාම මාණවො සො සක්කච්චං දානං දත්වා සහත්ථා දානං දත්වා චිත්තීකතං දානං දත්වා අනපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජි දෙවානං තාවතිංසානං සහව්‍යතං.

---

පින්වත්තෙමේ අපට ප්‍රියවෙයි මනාපවෙයි. කෙසේ නම් අපි ප්‍රියවූ මනාපවූ පින්වතුන් අමනාපයක් හා යොදවන්නමෝදැයි කීයේය. පුත, උත්තරය, එසේවීනම් තෝ යම්බඳුවූ භොජනයක් මම අනුභවකෙරෙම්ද එබඳුවූ භොජනද පිහිටුවවයි කීයේය. මම යම් වස්ත්‍ර ප්‍රයොජන ගණිම්ද එබඳු වස්ත්‍ර පිහිටුවව්යයි කීයේය. උත්තරනම් මානවකතෙමේ පින්වත එසේයයි කියා පායාසි රාජන්‍යයාහට ප්‍රතිවචනදී යම්බඳුවූ භොජනයක් පායාසි රාජන්‍යතෙමේ අනුභවකෙරේද එබඳුවූ භොජනය පිහිටෙවූයේය. යම්බඳුවූ වස්ත්‍රයත් පායාසි රාජන්‍යතෙමේ පරිදහනය කෙරේද එබඳුවූ වස්ත්‍රයන්ද පිහිටෙවූයේය. ඉක්බිත්තෙත් පායාසි රාජන්‍යතෙමේ සකස්නොකොට (අශ්‍රද්ධායෙන්) දන්දී සියතින් දත්නොදී අගෞරවයෙන් දන්දී බැහැරදමනු කැමැත්තකුමෙන් දන්දී ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු චාතුම් හා රජිකදෙවියන්ගේ ඒකී භාවයෙහි සිස්වූ සෙරිස්සකනම් රිදී විමනෙහි උපන්නේය. උත්තර නමැති යම්මාණවකයෙක්තෙම ඒ පායාසි රාජන්‍යයාගේ දනයෙහි ව්‍යාවෘතවූයේවීද හෙතෙම සකස්කොට (ශ්‍රද්ධායෙන්) දන්දී ගෞරවයෙන් දන්දී නිරතුරුව දන්දී ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු මනාගති ඇති සැපතින් අග්‍රවූ තව්තිසාවැසි දෙවියන්ගේ ඒකී භාවයවූ දිව්‍යලොකයෙහි උපන්නේය.

33. තෙන ඛො පන සමයෙන ආයස්මා ගවම්පතී අභික්ඛණං සුඤ්ඤං සෙරිස්සකං විමානං දිවාවිහාරං ගච්ඡති. අථ ඛො පායාසි දෙවපුත්තො යෙනායස්මා ගවම්පතී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ගවම්පතිං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො පායාසිං දෙවපුත්තං ආයස්මා ගවම්පති එතදවොච; කොසි ත්වං ආවුසොති. අහං භන්තෙ පායාසිරාජඤ්ඤොති. නනු ත්වං ආවුසො එවං දිට්ඨිකො අහොසි. ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකොති. සච්චාහං භන්තෙ එවං දිට්ඨිකො අහොසිං. ඉතිපි නත්ථි පරො ලොකො, නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකොති. අපිචාහං අය්‍යෙන කුමාරකස්සපෙන එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචිතොති. යො පන තෙ ආවුසො දානෙ ව්‍යාවටො අහොසි උත්තරොනාම මාණවො සො කුහිං උප්පන්නොති.

33. එසමයෙහි වනාහි ආයුෂ්මත් ගවම්පතිස්ථවිරතෙම සිස්වූ සෙරිස්සක විමානයට දිවා විහරණයට එක්වත් වැඩම කෙරෙයි. ඉක්බිත්තෙන් පායාසි දිව්‍ය පුත්‍රතෙමේ ආයුෂ්මත් ගවම්පතිස්ථවිරතෙමේ යම් තැනකද එහිඑළිඹියේය. උන්වහන්සේකරා එළඹ ආයුෂ්මත්ගවම්පතිස්ථවිරයන් සකසාවැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටියාවූ පායාසිදිව්‍ය පුත්‍රයාට ආයුෂ්මත් ගවම්පතිස්ථවිරතෙමේ මේ කාරණය කීයේය. ඇවැත්නි, තෝ කවරෙක්වූයෙහිදැයි කියාය. ස්වාමීනි, මම පායාසි රාජන්‍යයාවෙමියි කීයේය. [ඇවැත්නි, තෝ මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය, චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලා කුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා මෙබඳුවූ දෘෂ්ටි ඇත්තෙක්වූයේ නොවේදැයි ඇසූයේය. ස්වාමීනි, සත්‍යය. මේ කාරණයෙන්ද මෙලොව සිටියාහට පරලොව නැත්තේය, චුතව උපදනා සත්වයෝ නැත්තාහුය. කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක නැත්තේයයි කියා මම මෙබඳු දෘෂ්ටි ඇත්තෙම්වීමි. නැවතද මම ආර්‍ය්‍යවූ කුමාර කාශ්‍යපස්ථවිරයන් වහන්සේ විසින් මේ ලාමකවූ දෘෂ්ටියෙන් මුදවනු ලැබූයෙමි. ඇවැත්නි, උත්තරනමැති යම් මාණවකයෙක්තෙම තාගේ දනයෙහි ව්‍යාවෘතවූයේද, හෙතෙම කොතැන්හි උපන්නේදැයි විචාළේය.

යො මෙ භොතො දානෙ ව්‍යාවටො අහොසි උත්තරො නාම මාණවො,
සො සක්කච්චං දානං දත්වා සහත්ථා දානං දත්වා චිත්තීකතං දානං දත්වා
අනපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං
උපපන්නො දෙවානං තාවතිංසානං සහබ්‍යතං. අහං පන භොතො අස
ක්කච්චං දානං දත්වා අපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා
චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපන්නො සුඤ්ඤං සෙරි
ස්සකං විමානං. තෙනහි භොතො ගවම්පති මනුස්සලොකං ග
න්ත්වා එවමාරොචෙහි, සක්කච්චං දානං දෙථ, සහත්ථා දානං දෙථ
චිත්තීකතං දානං දෙථ, අනපවිද්ධං දානං දෙථ, පායාසි රාජඤ්ඤො
අසක්කච්චං දානං දත්වා අසහත්ථා දානං දත්වා අචිත්තීකතං
දානං දත්වා. අපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා
චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපන්නො සුඤ්ඤං සෙ
රිස්සකං විමානං.

---

ස්වාමිනි, මාගේ දානයෙහි උත්තර නමැති යම් මාණවකයෙක්තෙම
ව්‍යාවෘතවූයේද. හෙතෙම සකස්කොට ශ්‍රද්ධායෙන් දන්දී සියතින්
දන්දී ගෞරවයෙන් දන්දී නිරතුරුව දන්දී පිරිසිදුකොට දන්දී ශරීර
යාගේ භෙදයෙන් මරණින් මතු මනාගති ඇතිසැපතින් අග්‍රවූ තව්තිසා
වැසි දෙවියන්ගේ එකී භාවයවූ දිව්‍යලොකයෙහි උපන්නේය. ස්වාමි
නි, මමවනාහි සකස්නොකොට අශ්‍රද්ධායෙන් දන්දී සියතින් දන්නොදී
ගෞරවයෙන් දන්නොදී බැහැරදමනු කැමැත්තකුමෙන් දන්දී ශරී
රයාගේ භෙදයෙන් මරණින් මතුචාතුර්මහාරාජික දෙවියන්ගේ එකී
භාවයෙහි සිස්වූ සෙරිස්සක නම් රිදීවිමනෙහි උපන්නෙමි. ස්වාමිනි,
ගවම්පතිස්ථවිරයන් වහන්ස, එබැවින් නුඹවහන්සේ මනුෂ්‍යලොක
යට ගොස් මෙසේදැන්වුව මැනව. සකස්කොට දන්දෙව්. සියතින්
දන්දෙව්, සිතින්ගුණ සලකා දන්දෙව්, නිරතුරුව දන්දෙව්, පායාසි
රාජන්‍යතෙමේ සකස් නොකොට අශ්‍රද්ධායෙන් දන්දී සියතින් දන්
නොදී සිතින් ගුණනොසලකා දන්දී අහක දමනු කැමැත්තකුමෙන්
දන්දී ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු චාතුර්මහාරාජික දෙවියන්
ගේ එකී භාවයෙහි සිස්වූ සෙරිස්සක රිදීවිමනෙහි උපන්නේය.

යො පන තස්ස දානෙ ව්‍යාවටො අහොසි උත්තරො නාම මාණවො සො සක්කච්චං දානං දත්වා සහත්ථා දානං දත්වා චිත්තීකතං දානං දත්වා අනපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නො දෙවානං තාවතිංසානං සහව්‍යතන්ති.

34 අථ ඛො ආයස්මා ගවම්පති මනුස්සලොකං ආගන්ත්වා එවමාරොචෙසි. සක්කච්චං දානං දෙථ, සහත්ථා දානං දෙථ, චිත්තීකතං දානං දෙථ, අනපවිද්ධං දානං දෙථ, පායාසි රාජඤ්ඤො අසක්කච්චං දානං දත්වා අසහත්ථා දානං දත්වා අචිත්තීකතං දානං දත්වා අපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපන්නො සුඤ්ඤං සෙරීසකං විමානං. යො පන තස්ස දානෙ ව්‍යාවටො අහොසි උත්තරො නාම මාණවො සො සක්කච්චං දානං දත්වා සහත්ථා දානං දත්වා.

---

උත්තරනමැති යම්මාණවකයෙක් වනාහි ඒපායාසිරජනූයාගේදන යෙහි ව්‍යාවෘතවූයේද හෙතෙම සකස්කොට ශ්‍රද්ධායෙන් දන්දී සියතින් දන්දී සිහින් ගුණසලකා දන්දී ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු මනාගති ඇති සැපතින් අග්‍රවූ දිව්‍යලොකයෙහි තව්තිසා වැසි දෙවියන්ගේ එක්භාවයෙහි උපන්නේයයි කියාය.

34. ඉක්බිත්තෙන් ආයුෂ්මත්ගවම්පතිස්ථවිරයන්වහන්සේ මිනිස් ලොවට අවුත් මෙසේ දැන්වූයේය. සකස්කොට (ශ්‍රද්ධායෙන්) දන්දෙව්. සියතින් දන්දෙව්, සිහින්ගුණසලකා දන්දෙව්, නිරතුරුව දන්දෙව්, පායාසි රජනූතෙමේ සකස්නොකොට (අශ්‍රද්ධායෙන්) දන්දී, සිහින්ගුණ නොසලකා දන්දී අහකදමනු කැමැත්තෙක්මෙන් දන්දී ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු චාතුර්මහාරාජිකදෙවියන්ගේ එක් භාවයෙහි සිස්වූ සෙරිස්සක රිදී විමනෙහි උපන්නේය. උත්තර නැමති යම් මාණවකයෙක් ඒ පායාසි රජනූයාගේ දනයෙහි ව්‍යාවෘතවූයේද හෙතෙම සකස්කොට (ශ්‍රද්ධායෙන්) දන්දී සියතින් දන්දී.

විත්තිකතං දානං දත්වා අනපවිද්ධං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පන්නා දෙවානං තාවතිංසානං සහව්‍යතන්ති.

පායාසි සුත්තං නිට්ඨිතං තෙවීසතිමං.

පදානඤ්ච නිදානඤ්ච නිබ්බාණඤ්ච සුදස්සනං
ජනවසභඤ්ච ගොවින්දං සමයං සක්කමෙවච
සතිපට්ඨාන පායාසි මහාවග්ගස්ස සඞ්ගහො.

මහාවග්ගො නිට්ඨිතො දුතියො

සිහින්ගුණසලකා දත්දී නිරතුරුව දන්දී ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු මනාගති ඇති සැපතින් අග්‍රවූ දිව්‍යලොකයෙහි තව්තිසාවැසි දෙවියන්ගේ එක් භාවයෙහි උපන්නේය කීයායි.

තෙවිසිවක පායාසි සූත්‍රාර්ථව්‍යාඛ්‍යානනිමියේයි.

මහාපදාන සූත්‍රය, මහානිදාන සූත්‍රය, මහාපරිනිර්වාණ සූත්‍රය මහාසුදර්ශන සූත්‍රය, ජනවසභ සූත්‍රය, මහාගොවින්ද සූත්‍රය, මහාසමය සූත්‍රය, සක්කපඤ්හසූත්‍රය, මහාසතිපට්ඨාන සූත්‍රය, පායාසි සූත්‍රය, යන මේසූත්‍රදශයෙන් මහාවර්ගසඞ්ග්‍රහය වේ.

දෙවෙනිවූ මහාවර්ගය
මෙතෙකින් සමාප්තයි.

## ප්‍රධාන කාරණා.

අධ්‍යවසානය 655
අනිත්‍යතාවය 942
අනුරුද්ධස්ථවිරගාථා 860
අපරිහාණීයධර්ම 690-699
අප්‍රමාදය 783
අභිභායතනධර්මඅට 760-766
අශ්‍රද්ධායෙන් දීම 1233
ආත්මය පැණවීම 663
ආත්මය දැනීම 660
ආත්මය නොපැණවීම 666
ආදූහනය 864
ආනන්දස්ථවිර කථා 861
ආනන්දස්ථවිර ගුණධර්ම 834-833
ආනන්දස්ථවිර ආරාධනා 777-774
ආනුපුබ්බිකථා 621
ආමගන්ධය 1043
ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය 847-848
1052-1154-1158
ආර්‍ය්‍යසත්‍යසතර 1139-1158
ආයතනධර්මදොළස 1132?1136
ආරක්ෂාසංවිධානය 653
ආයුපරිච්ඡේදකථා 550
ආශ්වාසප්‍රශ්වාසකිරීම 1111-1113
ඉන්ද්‍රියසංවරය 1097
ඊර්‍ය්‍යාපථයන්දැනගැණීම 1114
1115
ඊෂ්‍ර්‍ය්‍යාමාත්සර්‍ය්‍යට හේතු 1088
උද්ධච්චකුක්කුච්චය 1130
උපස්ථායකභික්ෂුපරිච්ඡේද
කථා 553-554
උපාදානය 500
උපාදාන ප්‍රත්‍යය 650
උපාදානස්කන්ධධර්මපස 1132
1133
උපායාස 1142
උපෙක්ෂාව 1092
උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය 1137
උභතොභාගවිමුක්තිය 679-680
එක්මාර්ගය 1110
ඍද්ධිපාද සතර 972
ඔකාසාධිගමතුණ 974-978
කල්පසම්බන්ධ භාග්‍යවතුන්
වහන්සේලා 547
කාංක්ෂාවිදය 1135
කායසම්බන්ධ ස්වභාව 1111-1125
කායපහස 1135
කරුණාබ්‍රහ්මවිහාරය 1022
කල්පපරිච්ඡේදකථා 547
කාමච්ඡන්දය 1129
කාමතණ්හා 1144
කායසමාචාරය 1093-1094
ගොත්‍රපරිච්ඡේදකථා 549
චක්ෂුරූප 1135
චතුර්විධ ඍද්ධිපාද 972
චතුර්විධදෘෂ්ටිගතිය 664
චතුර්විධ ධර්මයන් 784-766
චතුරාර්‍ය්‍යසත්‍ය 720
චිත්තවිමුක්තිය 1052
ඡන්දරාගය 658
ඡන්දයට හේතු 1089
ජනවසභ සූත්‍රය 943
ජරා 1140
ජරාමරණ 599
ජාති 592—1140
ජාතිපරිච්ඡේදකථා 548
ජීවිතය ඇතිතැන නොපෙණී
මේ ප්‍රශ්නය 1204—1208
ජීවිතය නික්මීම නොපෙණීමේ
ප්‍රශ්නය 1199—1203
ජීවිතයෙහි බරසෙවීමේ
ප්‍රශ්නය 1199—1198
ජීවිත ප්‍රශ්නය 1193—1124
තණ්හා 600-658-1101
තණ්හා නැතිකිරීම 1150-1154
තණ්හා ත්‍රිවිධය 1144-1150
තණ්හා ප්‍රත්‍යය 651-1090
තමා පිහිටකොට ඇතිවීම 742
තුෂ්ටිප්‍රතිලාභ කාරණාසය 1104
1105
ත්‍රිවිධකුශලකර්ම 918

## පුද්ගල නාම.


| | |
|---|---|
| අඟුරජ | 1019 |
| අජාතසත්තුරජ | 681 |
| අම්බපාලිගණිකාව | 731 |
| අවන්ති රජ | 1018 |
| අස්සකනම් රජ | 1018 |
| උපවාණස්ථවිර | 882 |
| කකුධ උපාසක | 723 |
| කටිස්සභ උපාසක | 723 |
| කාසිරජ | 1019 |
| කුමාරකාශ්‍යපස්ථවිර | 1161 |
| කෝලිය රජවරු | 880 |
| ඛණ්ඩරාජපුත්‍ර | 619 |
| ගවම්පතිස්ථවිර | 1231 |
| ගෝපක දිව්‍යපුත්‍රයා | 1082 |
| ගෝවින්දබ්‍රාහ්මණ | 1009 |
| චුන්දනම්කම්මාරපුත්‍රයා | 795–798 |
| ජනවසභ දෙව්පුත් | 957 |
| ජෝතිපාලබමුණු මානවක | 1009 |
| තිම්බරු රජ | 1076 |
| තිස්ස පුරෝහිත පුත්‍ර | 616 |
| තුට්ඨ උපාසක | 724 |
| දිසම්පති රජ | 1009 |
| ද්‍රෝණ බ්‍රාහ්මණ | 881 |
| ධතරට්ඨ රජ | 1019 |
| නන්දනම් භික්ෂුනි | 723 |
| නිකට උපාසක | 723 |
| පායාසිරජ | 1161 |
| පුක්කුසනම් රජ | 803 |
| බිම්බිසාර රජ | 948 |
| භද්‍රානම් රජදුව | 1070 |
| භද්‍රානම් උපාසක | 724 |
| මහාසුදස්සන රජ | 888 |
| මහාකාශ්‍යපස්ථවිර | 872 |
| මාතලිසංගාහික | 1076 |
| රේණුනම් කුමාර | 1009 |
| රේණුරජ | 1014 |
| ලිච්ඡවි රජවරු | 733 |
| වස්සකාර බ්‍රාහ්මණ | 681 |
| වස්සකාර අමාත්‍යයා | 712 |
| විදෙහ රාජපුත්‍ර | 681 |
| විපස්සී කුමාර | 572–581 |
| වේඨදීපක බ්‍රාහ්මණ | 880 |
| වෙස්සභූරජ | 1019 |
| ශක්‍රදේවේන්ද්‍ර | 989–1071 |
| සනත්කුමාර බ්‍රහ්ම | 966 |
| සත්තභූ රජ | 1019 |
| සන්තුට්ඨ උපාසක | 724 |
| සාරිපුත්‍රස්ථවිර | 702 |
| සාළ්හනම් භික්ෂු | 723 |
| සුදත්ත උපාසක | 723 |
| සුභද්දනම් මහලු පැවිද්දහු | 873 |
| සුනිධ අමාත්‍ය | 712 |
| සුභද්‍ර පරිබ්‍රාජික | 842–848 |
| සුජාතා උපාසිකා | 723 |
| සෝමයක්ෂයා | 757 |

## පුද්ගල නාම,

අගුරජ 1019
අජාතසත්තුරජ 681
අම්බපාලිගණිකාව 731
අවන්ති රජ 1018
අස්සකනම් රජ 1018
උපවාණස්ථවිර 882
කකුධ උපාසක 723
කටිස්සභ උපාසක 723
කාසිරජ 1019
කුමාරකාශ්‍යපස්ථවිර 1161
කොලිය රජවරු 880
ඛණ්ඩරාජපුත්‍ර 619
ගවම්පතිස්ථවිර 1231
ගොපක දිව්‍යපුත්‍රයා 1082
ගොවින්දබ්‍රාහ්මණ 1009
චුන්දනම්කම්මාරපුත්‍රයා 795–798
ජනවසභ දෙව්පුත් 957
ජොතිපාලබමුණු මානවක 1009
තිම්බරු රජ 1076
තිස්ස පුරෝහිත පුත්‍ර 616
තුට්ඨ උපාසක 724
දිසම්පති රජ 1009
ද්‍රෝණ බ්‍රාහ්මණ 881
ධතරට්ඨ රජ 1019
නන්දානම් භික්ෂුණි 723
නිකට උපාසක 723
පායාසිරජ 1161
පුක්කුසනම් රජ 803
බිම්බිසාර රජ 948
භද්‍රානම් රජදුව 1070
භද්‍රානම් උපාසක 724
මහාසුදස්සන රජ 888
මහාකශ්‍යපස්ථවිර 872
මාතලිසංගාහික 1076
රේණුනම් කුමාර 1009
රේණුරජ 1014
ලිච්ඡවි රජවරු 733
වස්සකාර බ්‍රාහ්මණ 681
වස්සකාර අමාත්‍යයා 712
විදේහ රාජපුත්‍ර 681
විපස්සී කුමාර 572–581
වෙඨදීපක බ්‍රාහ්මණ 880
වෙස්සභූරජ 1019
ශක්‍රදේවේන්ද්‍ර 989–1071
සනත්කුමාර බ්‍රහ්ම 966
සත්තභූ රජ 1019
සන්තුට්ඨ උපාසක 724
සාරිපුත්‍රස්ථවිර 702
සාළ්හනම් භික්ෂු 723
සුදත්ත උපාසක 723
සුභද්දනම් මහලු පැවිද්දහු 873
සුනිධ අමාත්‍ය 712
සුභද්‍ර පරිබ්‍රාජක 842–848
සුජාතා උපාසිකා 723
සෝමයක්ෂයා 757

## ස්ථාන නාම.


| | |
|---|---|
| අම්බග්‍රාමය | 787 |
| අම්බලට්ඨික උයන | 700 |
| අම්සණ්ඩානම් බ්‍රාහ්මණගම | 1070 |
| අල්ලකප්පනුවර | 879 |
| ඉන්දසාලගුහාව | 1070 |
| ඉසිගිලි පර්වතය | 770 |
| උදෙන චෛත්‍යය | 774 |
| උරුවෙල් දනව්ව | 767 |
| උජ්ජඞ්ගල නගර | 887 |
| කකුධනදිය | 813 |
| කම්මාසදම්‍යනම්කුරුදනව්ව | 642 |
| එම | 1100 |
| කලන්දක නිවාපය | 770 |
| කාලශෛලය | 776 |
| කාලිඞ්ගරට | 1018 |
| කිඹුල්වත්පුර | 879–1055 |
| කුණ්ඩනගරය | 887 |
| කුසිනාරානුවර | 813–807–917 |
| කොටිග්‍රාමය | 719 |
| කොසලනගරය | 1161 |
| ගිජ්ඣකූටපර්වතය | 781–776 |
| ගොතම චෛත්‍යය | 744 |
| ගෞතමනිග්‍රොධාරාමය | 776 |
| චම්පානම් නගරය | 1016 |
| චාපාල චෛත්‍යය | 743 |
| චොරප්‍රපාතය | 776 |
| ජම්බුග්‍රාමය | 787 |
| ජීවකාම්බවනය | 776 |
| තපොදාරාමය | 776 |
| දන්තපුරය | 1018 |
| නාලන්දනුවර | 701 |
| පාටලිගම | 707 |
| පාවානම්පුරය | 794 |
| පොතනගරය | 1016 |
| බහුපුත්තක චෛත්‍යය | 744 |
| බාරාණසී නගරය | 1019 |
| භණ්ඩග්‍රාමය | 784 |
| මද්දකුච්ඡිනම් මිගදාය | 776 |
| මහාවන කූටාගාරශාලා | 780 |
| මහිස්සතීනම් නගරය | 1018 |
| මිථිලානම් නගරය | 1019 |
| රජගහනුවර | 681–776–985 |
| රාමග්‍රාමය | 880 |
| වෛභාර පර්වතය | 776 |
| වෙදියක පර්වතය | 1070 |
| ශාක්‍යදනව්ව | 1055 |
| සත්තම්බක චෛත්‍යය | 774 |
| සප්තපර්ණී ගුහාව | 776 |
| සාරන්දද චෛත්‍යය | 744 |
| සීතවනය | 776 |
| සෙතව්‍යානම් නගරය | 1161 |
| සැවැත්නුවර | 545 |
| හත්ථිග්‍රාමය | 787 |
| හිරඤ්ඤවතී ගඟ | 818 |


සමාප්තයි.